

# ශ්‍රී සද්ධර්මාවවාද සංග්‍රහය

# ශ්‍රී සද්ධර්මාවවාදසඞ්ග්‍රහය.

සෙංකඩගලනුවර
උපෝසථාරාමාධිවාසීවූ
වැලිවිට පිණ්ඩපාතික සරණඞ්කර සඞ්ඝරාජ
මහාස්ථවිර ස්වාමිපාදයන්වහන්සේගේ
ශිෂ්‍යවූ
සිද්ධාර්ථ බුද්ධරක්ෂිත මහාස්වාමිපාදයන් විසින්
සම්පාදිතයි.

විද්‍යෝදය පරිවෙණාධිපති
ත්‍රිපිටකවාගීශ්වරාචාර්ය ශ්‍රී සුමඞ්ගලාභිධාන
ප්‍රධාන සඞ්ඝනායක ස්වාමිපාදයන්ගේ ධර්මාන්තේවාසීවූ
මුල්ලෙරියාවේ විමලජෝති ස්ථවිරයන් විසින්
සංශෝධිතයි.

ඇම්. අයි. පෙරේරා විසින්
ශාස්ත්‍රාධාරයන්ත්‍රාලයෙහි
මුද්‍රණය කරවනලදී.

ශ්‍රී, බු, ව, 2445.
ක්‍රි, ව, 1901.

# පටුන.

—:—


පිට.

1 ආරම්භය ... ... ... ...

18 —— ධර්මානිශංසවර්ණනා පරිච්ඡේදය ... ...

240 —— සම්බුද්ධගුණවර්ණනා පරිච්ඡේදය ... ...

297 —— සද්ධර්මගුණවර්ණනා පරිච්ඡේදය ... ...

315 —— සඞ්ඝගුණවර්ණනා පරිච්ඡේදය ... ...

326 —— සරණගමන විභාගානිශංසවර්ණනා පරිච්ඡේදය...

390 —— අකුසලකර්මපථාදීනව වර්ණනා පරිච්ඡේදය ...

440 —— අකුසලකර්මඵලභූමි විභාග වර්ණනා පරිච්ඡේදය ..

473 —— ශීලවිභාගානිශංස වර්ණනා පරිච්ඡේදය .. ..

500 —— කුසලකර්ම විභාගානිශංස වර්ණනා පරිච්ඡේදය ..

530 —— කුසලඵලභූමි වර්ණනා පරිච්ඡේදය ... ...

543 —— රාජධර්මානුශාසනා පරිච්ඡේදය ... ...

559 —— ගෘහපති ධර්මානුශාසනා පරිච්ඡේදය ...

567 —— සාමාන්‍ය සද්ධර්මානුශාසනා පරිච්ඡේදය ...

# ශුද්ධිපත්‍රය.

| පිට. පෙළ. | අශුද්ධ. | ශුද්ධ. |
|---|---|---|
| 251—23 | පාරජික | පාරාජිකා |
| 254—30 | වහන්සේලම | වහන්සේලාම |
| 264—28 | ජවිපයෙන් | ජම්බුද්වීපයෙන් |
| 265—12 | මණයන් | ශ්‍රමණයන් |
| 266—20 | යහළව | යහළුවූ |
| 268—14 | කොලසයන්සනා | කෙලසයන් නාශ |
| 269—8 | ලඞ්කාවාසි | ලඞ්කාවාසී |
| 283—7 | මනතපාසා | සමන්තපාසා |
| 284—3 | ප්‍රකයණ | ප්‍රකරණ |
| 287—22 | පටවිත්‍යාය | පාටවිත්‍යාය |
| 304—12 | ඉදිරියවු | ඉරියවු |
| 304—14 | සත්වල | සඬල |
| 305—29 | කෙනෙකුක්ට | කෙනෙකුන්ට |
| 310—29 | වසික | වාසික |
| 316—32 | භවාත්තර | භවාන්තර |
| 322—18 | ආකශ | ආකාශ |
| 327—13 | අසාරණකාණ | අසාධාරණකාය |
| 327—36 | කෙරෛෂි | කෙරෙෂි |
| 328—15 | කෙමින් | කෙම්න් |
| 328—28 | කැතිවම | නැතිවම |
| 333—29 | පමිණිකල | පැමිණිකල |
| 342—6 | කැවැත්තත් | කැමැත්තත් |
| 346—29 | නැතාසී | නැතැයි |
| 456—28 | එයේම | එසේම |
| 364—28 | වාසිදීන්ට | වාසීන්ට |
| 368—28 | නිම නලදි | නිමවනලදි |
| 371—2[illegible] | අභිරත්මාගී | අර්හත්මාගී |
| 374—7 | අකශල | අකුශල |
| 374—19 | ලිජ්ජා | ලැජ්ජා |
| 381—16 | චප්පතුදිකයා | චතුප්පදිකයා |
| 382—15 | වන්නේනේය | වන්නේය |
| 385—17 | ජතක | ජනක |
| 390—11 | අතුශල | අකුශල |
| 395—2 | යභව | සභව |

# ශුද්ධිපත්‍රය

—— o ——

| පිට. | පෙල. | අශුද්ධ. | ශුද්ධ. |
|---|---|---|---|
| 1 | 6 | විජිත | විජිත |
| ,, | 19 | පද | පාද |
| ,, | 21 | පදයෙහිම | පාදයෙහිම |
| ,, | 25 | සමපද | සමපාද |
| 2 | 20 | මුනිගුණඞග | මුනිගුණාංග |
| ,, | 27 | සම්බුඩගුණඞග | සම්බුඩගුණාංග |
| 9 | 15 | කත්‍රසධම්ම | කත්‍රසධම්ම |
| 11 | 7 | විශිෂ්ඨ | විශිෂ්ට |
| 22 | 8 | අසඞ්ඛයාති | අසඞ්ඛෙය්‍යාති |
| ,, | ,, | නසඞ්ඛයා | නසඞ්ඛෙය්‍යා |
| ,, | ,, | අසංඛයා | අසඞ්ඛෙය්‍යා |
| ,, | 9 | සඞ්ඛයානාම | සඞ්ඛෙය්‍යානාම |
| ,, | 10 | අසඞ්ඛයානාම | අසඞ්ඛෙය්‍යානාම් |
| 25 | 5 | එහෙසින් | එහෙයින් |
| ,, | 10 | අණ්ක | අණික් |
| 27 | 14 | කණ්මුලිකා | කණ්චූලිකා |
| ,, | 27 | කොටකොට | කොටකොටා |
| 31 | 24 | ඇතිවීමට | ඇතිවටම |
| 32 | 9 | මහාභිණික්මන් | මහබිණික්මන් |
| ,, | 23 | භික්ෂුසඞ්ඝයා | භික්ෂුසඞ්ඝයා |
| 33 | 20 | මබෑතන් | මබෑයන් |
| ,, | 24 | බෑතන්වහන්සේට | බෑයන්වහන්සේට |
| ,, | 32 | රාජකුමාර්කාවන් තමයා නමින්ම | රාජකුමාරිකාවය් නමින්ම |
| 34 | 35 | කාරණ්ඩක | කරණ්ඩක |
| 35 | 7 | කරණ්ඩක | කරණ්ඩක |
| 38 | 33 | බොධිකයපිඩකාරුඒව | බොධිපයපිඩකාරුණ්ව |
| 43 | 5 | අනානතාපිරසිඳු | අනාථනාපිරිසිදු |
| 58 | 13 | වහසේගේ | වහන්සේගේ |
| 60 | 9 | එක්සියඅටලොකක් | එක්සියඅටලොසක් |
| ,, | 12 | අපගමබෝසතානෝ | අප්වගබෝසතාණෝ |
| 64 | 10 | වැලිබණීම | වැලිපිඹාව |

| පිට. | පෙළ. | අශුද්ධ. | ශුද්ධ. |
|---|---|---|---|
| 70 | 15 | තිරොධා | නිරොධා |
| 89 | 35 | වලඳ තවේලෙහි | වලඳනවේලෙහි |
| ,, | 38 | දත්වා | දක්වා |
| 92 | 10 | වෙදනාපරිග්‍රාගක | වෙදනාපරිග්‍රාහක |
| 94 | 25 | දිගුකලකල් | දිගුකලකල |
| 105 | 23 | ඉෂමයයි | විෂමයයි |
| 107 | 7 | එහිසිපි | එහිසිට |
| 111 | 4 | සතතයොජනතත්ත | සතතයොජනාවිජිත |
| 112 | 38 | රත්රුවන් | සත්රුවන් |
| 119 | 3 | සිදහෙලූ | සිඳහෙලු |
| 125 | 11 | සතුටුකරවමින් | සතුටුකරවමින් |
| 127 | 12 | රූපශ්‍රීෂොභාව | රූපශ්‍රීශොභාව |
| 128 | 4 | තුන්ය | තුන් |
| 135 | 36 | වැඩවත් | වැඩමවත් |
| 141 | 3 | සත්හිඳුවා | සන්හිඳුවා |
| 143 | 13 | උපසතෙනා | උපසමෙනා |
| 148 | 38 | නෙයෙක් | නොයෙක් |
| 159 | 6 | තා | තෝ |
| ,, | 30 | හිම්වුගල | හිමවුගල |
| 161 | 33 | බුරංගරුබුරං | ගරුබුරං |
| 164 | 35 | ඇවිදිනාකල | ඇවිදිනාකල |
| 165 | 28 | භාවිනාකල | භාවිතාකල |
| 173 | 16 | කුශලාධම්මා | කුසලාධම්මා |
| 182 | 3 | දල්වාඒ | දැල්වාඒ |
| 201 | 33 | සිටා | සිට |
| ,, | 34 | නාගාපලෙකන | නාගාපලොකන |
| 210 | 31 | සියතුලුයෂීයෝ | සියලුතුයෂීයෝ |
| 213 | 32 | ජිනසීමාවය | ජිනසීමාවය |
| 221 | 3 | වචනය | ඒවචනය |

| පිට. පේළි. | අශුද්ධ. | ශුද්ධ. |
|---|---|---|
| 395—27 | ඉායු | ආයු |
| 396—14 | එහිතුල | එහිතල |
| 387—3 | දෙශැත්තෑ | දෙශැත්තෑ |
| 398—29 | ද්‍රොහිතම් | ද්‍රොහිකම් |
| 410—16 | කියත්තට | කියන්නට |
| 422—11 | ගල්මැඩ | ගල්වැඹ |
| 421—32 | ශිෂ්‍යගතයෝ | ශිෂ්‍යගනයෝ |
| 435—1 | වක | වන |
| 453—3 | කරමයයන | කිරිමයයන |
| 447—21 | [illegible] | නිබඳ |
| 450—7 | ශිස්‍යා | ශිෂ්‍යා |
| 454—32 | සංසයා | සංඝා |
| 462—20 | වැතිරන්තේය | වැතිරෙන්නේය |
| 567—17 | ගඟදියෙහි | ගඟදියෙහි |
| 470—21 | කියනැවත | කියානැවත |
| 475—21 | අග්‍රදෘතයක් | අග්‍රදූතයක් |
| 476—5 | හෙතෙමි | හෙතෙම |
| 479—25 | දෘත | දූත |
| 486—8 | විත්තාවෙක් | චිත්තාවෙක් |
| 490—18 | දක්වතු | දක්වනු |
| 490—24 | පූජකනෙත් | පූජකරන්නේ |
| 502—18 | අන්තඃරයට | අන්තඃපුරයට |
| 502—21 | සිතේය | සිටිනේය |
| 503—9 | අශ්වරත්තය | අශ්වරත්නය |
| 503—31 | හැමකලිහිම | හැමකල්හිම |
| 504—17 | ග්‍රහපත | ග්‍රහපති |
| 507—16 | පිරිද්දෙන් | පරිද්දෙන් |
| 510—1 | පිරික්ෂිප්ත | පරික්ෂිප්ත |
| 512—23 | යම්කෙනොක් | යම්කෙනෙක් |
| 514—30 | ආයුධශත් | ආයුධයන් |
| 516—4 | ශැදහසක් | ශැටදහසක් |
| 522—8 | බ්‍රහ්මශසදේද | බ්‍රහ්මයපදේද |
| 527—26 | ප්‍රකැසකොට | ප්‍රකාශකොට |
| 528—7 | මත්ෂ්‍යාද | මනුෂ්‍යාදි |
| 528—7 | පාදකායෙහි | පාදකාලයෙහි |
| 534—2 | ප්‍රසිදක්ෂිණයෙන් | ප්‍රදක්ෂිණයෙන් |
| 535—9 | වහන්සේසෙ | වහන්සේගෙ |

| පිට. පෙළ, | අශුඩ. | ශුඩ. |
|---|---|---|
| 536—22 | පචක | පචකාම |
| 538— 1 | කුඹුම | කුමුම |
| 538--10 | පරීක්ෂාරී | පරීක්ෂාකාරීව |
| 538—16 | නොකලමැව | නොකලමැතිව |
| 539— 4 | කුංලී | කුංඩලී |
| 540— 3 | කුසල | කුල |
| 541—18 | පක්ඛිබසුත්තිය | පක්ඛිසුබත්තිය |
| 544— 8 | ඇතිති | ඇති |
| 552--11 | සෘදුගත | සාදෘගත |
| 555--34 | චැතුඩු | වැඩුතු |
| 556--21 | කමේම්ගෙයි | කම්මගෙයි |
| 561— 2 | පූරණ | පූරාණ |
| 567—24 | චරිධම් | වරධම් |

# ශ්‍රී සද්ධර්මාවවාදසඞ්ග්‍රහ

ප්‍රාරම්භය.

**නමො තස්ස භගවතො අරහතො සම්මාසම්බුද්ධස්ස.**

**ජිනසුගතමුනින්දං ධම්මසඞ්ඝඤ්ච නත්වා**
**විජිතනිඛිලපාපං තස්ස සම්බුද්ධසෙක්ඛා**
**තිභවවිතතවණ්ණෙසෙවකාවණ්ණං ගහෙත්වා**
**සකලජනහිතත්ථං වණ්ණයිස්සං ගුණංසු.**

ස්වර්ග මර්ත්‍ය පාතාල සඞ්ඛ්‍යාත ජගත්‍රය වාසී බ්‍රහ්මසුරාසුරගරුඩ ගන්ධර්වසිද්ධවිද්‍යාධර නරනාගාදී සමස්ත සත්ව සර්වාභිමතාර්ථසංසිද්ධියෙහි නිරතාභිලාෂ මහාකාරුණික පූජ්‍යපූජණීය දෙවාතිදෙවවූ බුද්ධාදී රත්නත්‍රයට නමස්කාර කිරීමෙන් සඤ්ජනිත කුශලානුභාවයෙන් සර්වොපද්‍රව දුරීකරණයෙන් ආයුෂ්‍යාදී චතුර්විධ ධර්මාභිවර්ධනය කොට ගෙණ සද්ධර්ම සඞ්ග්‍රහයක් කරණු කැමති අපවිසින් පළමුකොටම කේවල ගර්භවූ ඉෂ්ටදෙවතා නමස්කාරය පිණිස ආයාම විස්තාරයෙන් නවලක්ෂ පස් නහුත දෙසිය හැත්තෑ ඇඟුලක්පමණ භූමිප්‍රදෙශයෙක්හි ප්‍රස්තාර කටයුතුවූ තිස්දෙදූස් සත්සිය හැටඅටක් වෘත්ත ඇති අතිසක්වරී නම් ඡන්දසෙහි සාරදූස් සසිය හැත්තෑ දෙවෙනි තැනින් පද සතරම උගුළුවා ගෙණ නගණ දෙකක් මගණ එකක් හා යගණ දෙකකින් සමුපලක්ෂිතවූ මාලිනී නම් වෘත්තයට නගා රචනාකරණලද්දූවූ සතර පදයෙහි ම විසි ගණයකින් හා අකුරු සැටකින් ද මාත්‍රා අසූඅටකින් ද ගුරු විසිඅටකින් ද ලඝු දෙතිසකින් ද විශ්‍රාම අටකින් දූයී මෙසේවූ වර්ණ විශෙෂයක් ඇති සම ගණ සම වර්ණ සම මාත්‍රා සම ගුරු සම ලඝු සම විභාග සිටි සම පද සතරක් සම්බන්ධවූ ත්‍රිවිධ රත්නාභිවාදන මේ ගාථාවෙහි අභිප්‍රාය නම්.

සර්වක්ලෙශමාරදෙවපුත්‍රමාරාදී පස්මරුන් බිඳ දිනූ හෙයින් ද සර්වාකාර සොභන සසිරික මනොඥ දර්ශනීයවූ ගමන් ඇති හෙයින් ද එකාන්ත සුන්දරාමරාමෘත නිර්වාණපුරයට පැමිණි හෙයින් ද අගාරිකඅනගාරිකසෙඛාසෙඛප්‍රත්‍යෙකමුනි සංඛ්‍යාත පඤ්චප්‍රකාරවූ මුනීන්ට ශ්‍රෙෂ්ඨහෙයින් ද ජිනසුගතමුනීන්ද්‍රවූ සුරාසුරනරාදී සමස්ත

සකලචිත්තසන්තානප්‍රවෘත්ත පාපතිමිර විධ්වංශන චතුරතර සත
රංසි අසිසිර කිරණයමාන තථාගතවරධර්මචක්‍රවර්ත්තිස්වාමිවූ සම්‍යක්
සම්බුද්ධසර්වඥරාජෝත්තමයානන්වහන්සේ ද ඒ භාග්‍යවතුන්වහන්
සේ විසින්ම සුදෙසිතහෙයින් ස්වාක්ඛ්‍යාතතාදී ගුණෝපලක්ෂිතමාර්ග
ඵලනිර්වාණය හා පාලිධර්මය සහිතවූ දශප්‍රකාර සද්ධර්මය ද මනා
දෘෂ්ටිශීලශ්‍රාමාන්‍ය ගුණසමූහයන්ගේ සංඝටිත භාවයෙන් සඞ්ඝ නම්
වූ සුප්‍රතිපන්නතාදී ගුණගනාඞ්ග සංගත ජිනෞරස පර්‍යාප්ති ප්‍රති
පත්ති ප්‍රතිවෙධ සංඛ්‍යාත ත්‍රිවිධ සද්ධර්මානුපාලිත සමස්තලොකවා
සීන්ගේ නිරුත්තර පුණ්‍යක්‍ෂෙත්‍රවූ අෂ්ටාර්‍යපුද්ගල සංඝයාද යන
මේ සර්වසත්ව සර්වාභිමතාර්ථ ප්‍රධානයෙන් සුරද්‍රුමචින්තාමණිභද්‍රඝ
ටානුසාරවූ විසුද්ධ බුද්ධාදී රත්නත්‍රයට භයලොභකුලාචාරාදීන් දුරුව
භක්තිප්‍රේමාවනතවූ මාගේ උත්තමාඞ්ගය කරණකොටගෙණ කා
යාදි වාරත්‍රයෙන් සකසා වැඳ එම වන්දනාමය කුශලානුභාවයෙන්
සර්වාන්තරාය සර්වෝපද්‍රව විහතවිධ්වංසනය කිරීමෙන් ජයාභිප්‍රාප්ත
ව අනන්ත කරුණාසාගරවූ ඒ සවුනේ ගෙවා දත් බුදුරජානන්ව
හන්සේගේ තුන්ලෙව්හි පතළාවූ අතිවිස්තීර්ණ අභිඛ්‍යාදී නවවිධවූ
ගුණකරයන් අතුරෙන් එක්ගුණකරයකට වර්ණනාමුඛයෙන් බැස
ගුරූපදෙශ සද්ධර්මශ්‍රවණ යොනිසොමනස්කාරාදීන් නිපන් අපගේ
ප්‍රඥාශක්ති පමණකින් ලෝවැඩ පිණිස මුනිගුණාඞ්ග මාත්‍රයක්
වර්ණනා කෙරෙමි.

මෙසේ පූජාර්හවූ බුද්ධාදී රත්නත්‍රයට නමස්කාර පූජා පිණිස අප
විසින් දක්වූ මේ ගාථාවගේ පූර්වාර්ධයෙහි ප්‍රකාශවූ "ජිනසුගතමු
නින්දඤ්ච නත්වා ධම්මඤ්ච නත්වා සංඝඤ්ච නත්වා" යන මේ වන්දනා
මය පූර්වක්‍රියාවෙන් සර්වමඞ්ගලාර්ථ ප්‍රසවය කිරීම හෙතුකොටගෙණ
එහිම අපරාර්ධයෙහි ප්‍රකාශවූ "තස්ස සම්බුද්ධරඤ්ඤො වණ්ණෙසු
එකං වණ්ණං වණ්ණයිස්සං" යන්නෙන් සම්බුද්ධ ගුණාඞ්ගමාත්‍රයක්
වර්ණනා කෙරෙමි යන මේ අපරක්‍රියාවගේ අසම්මොහ අවිකීර්ණ
අඛණ්ඩ අවිකල අවිවර පරිසමාප්තිය හා බුද්ධශාසනාවසානව මේ
ප්‍රකරණයතෙම නිත්‍යධ්‍රුවසාරසුභසුඛස්ථිතිවීමෙන් ශ්‍රොතෘජනාදී
ලොකාර්ථප්‍රසවය කෙරේවා යනු මෙහි අභිප්‍රායයි.

——00——

ඉතිපි සො භගවා අරහං සම්මාසම්බුද්ධො විජ්ජාචරණ
සම්පන්නො සුගතො ලොකවිදූ අනුත්තරො පුරිසදම්ම
සාරථි සත්ථා දෙවමනුස්සානං බුද්ධො භගවාති.

සො භගවා, ඒ භාග්‍යවත් බුදුරජානන්වහන්සේ; ඉතිපි
අරහං, සියලු කෙලෙසුන් කෙරෙන් දුරුවූ බැවිනුදු සියලු කෙලෙ

සුත් නැසූ බැවිනුදු සංසාරචක්‍රයෙහි අර කැපූ බැවිනුදු ප්‍රත්‍යයාදීන්ට අහී හෙයිනුදු රහසත් පව් නොකරණ බැවිනුදු යන මෙතෙක් අර්ථයෙන් අර්හත් නම් වනසේක—සො භගවා, ඒ භාග්‍යවත් බුදුරජානන්වහන්සේ; ඉති'පි සම්මාසම්බුද්ධො, සම්මා, මනාකොට; සං, තමා විසින්ම; බුද්ධො, සර්වධර්මයන් සර්වාකාරයෙන් දත්සේක යන මෙතෙක් අර්ථයෙන් සම්‍යක්සම්බුද්ධ නම් වනසේක—සො භගවා, ඒ භාග්‍යවත් බුදුරජානන්වහන්සේ; ඉති'පි විජ්ජාචරණසම්පන්නො, අෂ්ටවිද්‍යාවෙන් හා පසළොස්චරණධර්මයෙන් සමන්විතය යන මේ අර්ථයෙන් විජ්ජාචරණසම්පන්න නම් වනසේක—සො භගවා, ඒ භාග්‍යවත් බුදුරජානන්වහන්සේ; ඉති'පි සුගතො, සොභණ ගමන් ඇති බැවිනුදු සුන්දරස්ථානයට ගිය බැවිනුදු මනා ගමන් ඇති බැවිනුදු මනා තෙපුල් ඇති බැවිනුදු යන මෙතෙක් අර්ථයෙන් සුගත නම් වනසේක—සො භගවා, ඒ භාග්‍යවත් බුදුරජානන්වහන්සේ; ඉති'පි ලොකවිදූ, සර්වාකාරයෙන් නිමවා සියලු ලොකය දත්සේක යන මේ අර්ථයෙන් ලොකවිදූ නම් වනසේක-සො භගවා, ඒ භාග්‍යවත් බුදුරජානන්වහන්සේ; ඉති'පි අනුත්තරො පුරිසදම්මසාරථී, තමහට වැඩි කෙනෙකුන් නැති බැවින්ද පුරුෂදම්‍යයන් විනයනය කරණ හෙයින් ද යන මෙතෙක් අර්ථයෙන් අනුත්තරපුරිසදම්මසාරථී නම් වනසේක—සො භගවා, ඒ භාග්‍යවත් බුදුරජානන්වහන්සේ; ඉති'පි සත්ථා දෙවමනුස්සානං, දෘෂ්ටධාර්මික සාම්පරායික පරමාර්ථ යන මෙයින් සුදුසු සුදුසු පරිද්දෙන් දෙව්මිනිස්නට අනුශාසනා කරණසේක යන මේ අර්ථයෙන් ශාස්තෘ නම් වනසේක—සො භගවා, ඒ භාග්‍යවත් බුදුරජානන්වහන්සේ; ඉති'පි බුද්ධො, සියලු ඥෙය්‍යමණ්ඩලය නිමවා දත්සේක යන මේ අර්ථයෙන් බුද්ධ නම් වනසේක; සො භගවා, ඒ භාග්‍යවත් බුදුරජානන්වහන්සේ; ඉති'පි භගවා, දානශීලාදී සමත්‍රිංශත් පාරමිතාවෙන් ජනිතවූ භාග්‍ය ඇති හෙයින් ද රාගාදී කෙලෙසුන් භග්නකළ හෙයින් ද මේ ආදී අර්ථයෙන් භගවත් නම් වනසේක.

මේ නව ගුණය වර්ණනාකරණ පූර්වාචාර්යවරයන් විසින් ඇතම් තැනෙක්හි "**සො භගවා බුද්ධො**" යි කියා ගාථාවගේ මුල කී "භගවත්" යන්න හා අන්තයෙහි කී "බුද්ධ" යන්නා ගෙණ ඒ භාග්‍යවත් බුදුරජාණන්වහන්සේ යයි කියා බුද්ධ නාමය කීමෙහි යොදා ගෙණ සෙසු පද නවයට බෙදූ අර්ථවර්ණනා කළහ, මෙහි නමුත් විසුද්ධිමාර්ග සන්නයෙහිවූ බුද්ධානුස්මෘති ඛණ්ඩයෙහි ප්‍රකාශක්‍රමයෙන් බලාගෙණ ගාථාව මුල කී "භගවත්" යන්න පමණක් බුද්ධ නාමය කීමෙහි යොදාගෙණ සෙසු පද නවයට බෙදූ අර්ථවර්ණනා අතිසංක්‍ෂෙපකොට දක්වනලද්දීයි අත්සුදු.

මෙසේ නවප්‍රකාරවූ අර්හාදි සකලගුණනිධානවූ කරුණාවෙන් සිනිල්වූ චිත්තසන්තාන ඇති අසාධාරණ බුද්ධඥාන නැමති මහාප්‍රදීපාලෝකයෙන් දුරුකරණලද ඝනතර මෝහාන්ධකාර ඇති අසරණීභූත දෙව්මිනිසුන් සහිත සියලු සත්ත්වලෝකයාහට අසහාය සරණවූ පාපතිමිර විධ්වංශන චතුරතර සහස්‍රාංශු ප්‍රතිභාග විවිධොවාද නිර පූරිත සද්ධර්මගංගාප්‍රවාහ සවර්ණාචල සමානවූ බුදුරජාණන් වහන්සේගේ නෛර්‍යාණික ශාසනාවචර සාධුජනහෘදයාභ්‍යන්තර ප්‍රතිෂ්ඨිත මාහැඟි පහන්රුකක් සේ අතිශයින් දීප්තිමත්ව බැබළීමෙන් චිත්තානුවෘත්ත මෝහාන්ධකාර විධ්වංශනය කොට සර්‍වසත්ත්වෝපකාරව යටින් අවීචිය පටන් උඩින් බඹලොව අවසන්ව වටින් අනන්තාපරිමාණ සක්වළවල ඉතා උස්ව විස්තීර්ණව පවත්නාවූ "ඉතිපි සො භගවා අරහං සම්මාසම්බුද්ධො" යනාදි මේ නවගුණගාථාවගේ නවපෙදෙහි සංගෘහීතව සිටි අතුල්‍යවූ අනොපමවූ අතිගම්භීරවූ අතිපරිශුද්ධවූ අතිප්‍රසිද්ධවූ අර්හාදි නවගුණනිධීන්ගේ මෙහි පළමුකොට දක්වූයේ අතිසංක්ෂෙපාර්ථය,විස්තරවශයෙන් වර්ණනාකරත් හොත් අනේකාර්ථ ඇති අර්හාදි නවපදයන් කෙරෙහි ඇතුළත්ව සිටි සියලු අර්ථයන් තෝරා වෙන් වෙන් කොට ගෙණ එකෙකී අර්ථයෙහි එකෙකී ධර්මප්‍රකරණයක් බැගින් පූජාවට සුදුසුය යන අර්ථයෙහි දක්වූ "පූජාවලිය" සේ එහි අර්ථගණනායෙන් වෙන් වෙන්ව ධර්මප්‍රකරණ උපදවා ලීමෙනුදු නොහෙවෙන නොනිමෙන අර්ථ ඇති චින්තාවිෂයාතික්‍රාන්තවූ බුදුසසුන් වැද හැසිරෙණ තාක් හැමදෙනාගේ තුඩක් තුඩක් පාසා සිතක් සිතක් පාසා අනවරතයෙන් පවත්නා සුළුවූ සිත් නැමති කෞමුදයන්ගේ සර්‍වකුශලදෘෂ්ටි නැමති මිණිදුරුකෙරෙමින් පුබුදුවා මහත් පෙම් වඩ වඩා සර්‍වසත්ත්වෝපකාරව ලෝකසම්භාවනාකටයුතුවූ මේ නවගුණගාථාවගේ නවමහාගුණයන් අතුරෙන් එක් එක් ගුණයක් වර්ණනාකෙරෙමියි යන මේ මාගේ චින්තාතොමෝ අනන්තවූ ආකාශය අඟුලෙන්ම මැන නිමවමියි කියාද මහමුහුද ජලස්කන්ධය බිඳුවශයෙන්ම ගණන්ලත්තබමියි කියාද අබඇටතුලෙහි මහමේරුව සඟවාලමියි කියාද නඛාග්‍රයෙහි මහපොළොව සඟවාලමියි කියාද පුලුන්රුලකින් හැන තුන්දහස් යොදුන් හිමවුගල සොලවාලමියි කියාද මදුරුතුඩින් එක්ලක්ෂ සැටඅටදහසක් යොදුන් පමණ වූ මහමෙරුපර්වතය විද නිමවමියි කියාද තෙළවිදඬුහුසින් මහත් ප්‍රචණ්ඩ හස්තියෙකු බැඳ සිටුවමියි කියාද ඉදිකටුමුලසිදුරෙන්ම මහගඟක ජලස්කන්ධය හරිමියි කියාද පවත්වන චින්තාවක් වැන්නීය. මේ හැම එසේකරන්ට ලෝවමහත් ඍද්ධිමත්නට හැකිවීනමුදු බුදුගුණ මුහුදු පරතෙර දක්ම

තුන්ලෙව්හි එබඳු කිසිවෙක්හු විසිනුත් නොපිළිවන්මය.

කීයේමැනෝ.

සක්කා චෙ නභමඞ්ගුලෙන මිනිතුං සින්ධූදකං බින්දුතො
මෙරුං සාසපගාජ්නෙ නිදහිතුං භූමිං නඛග්ගන්තරෙ
කම්පෙතුං ධරණීධරං හිමධරං ආකාසව තුලංසුතා
නො චෙ නාථගුණෙද්ධිං පතරිතුං කෙනාපි ලොකන්තයෙ-යි.

තවද සියල්ල දත් බුදුහුදු විසින් බුදුවූ දවස පටන් ආයුෂ්කල්පය මුළුල්ලෙහි වැඩහිඳ අනිකෙක නොයෙදී එක්බුදුකෙනෙකුන්ගේ ගුණම වදළත් කල්පය ගෙවියත් මුත් නොගෙවෙන බුදුගුණ එසේ අනිකෙකු විසින් වර්ණනාකිරීම ඒකාන්තයෙන්ම නොපිළිවන්මය.

වදළේ මැනෝ.

බුද්ධොපි බුද්ධස්ස භණෙය්‍ය වණ්ණං
කප්පම්පි චෙ අඤ්ඤමභාසමානො
ඛීයෙථ කප්පො චිරදීඝමන්තරෙ
වණ්ණො නඛීයෙථ තථාගතස්ස-යි.

මෙසේ අචින්ත්‍යානොපම අසාධාරණවූ බුදුගුණ වර්ණනාකිරීම අප වැනි පුහුදුන්ගේ නුවනට ඉතා අවිෂය විනමුදු ඉතා දුකසේම ලත් මේ ක්ෂණසම්පත් සාර්ථකකොට ගෙණ අෂ්ටධර්මසමොධාන යෙන් යෙදී මතු මෙත්බුදුන් දක්මෙන් පළමුවෙනි නියතවිවරණ ශ්‍රී ලැබ එතැන් පටන් ලොව ඇතිවන සියලූ බුදුවරයන් නොව ලාම දක්මෙන් ආමිෂපූජය ප්‍රතිපත්තිපූජය යන ද්විප්‍රකාරවූ පූජ වෙන් පූද කෘතාධිකාරව හැම පාරමිධර්මයන්ගේ මස්තකප්‍රාප්තව බුදුවෙම්වා යන මගේ අභිමතප්‍රාර්ථනා සංසිද්ධිය හා ලෝවැඩ පි ණිස ශාස්තෘගුණවර්ණනා මුඛයෙන් ම ධර්මප්‍රකරණයක් උපදව නු කැමැත්තෙමි. එතකුදු උවත් ලෝවැසි සත්‍වයන්ගේ සිත්හසර දැන හැඳින උගන්වා බණ කීම ධර්මරාජන්වූ බුදුන්ටම මුත් කප් කොළලක්ෂගණන් පාරමිතා පිරූ මහාපිනැති ආයුෂමත් රෙවත මහතෙරුන්වහන්සේය දම්සෙනෙවි සැරියුත් මහතෙරුන්වහන් සේය ආනන්දස්ථවිරයන්වහන්සේය යන මහාඋතුමන්ට ද නොපිළි වන්මය. එබැවින් ලොකයෙහි කාරණාකාරණ නොසලකාම දුටු යම් කිසි අරමුනෙක ඇලෙමින් ගැටෙමින් මෝහයෙන් මුළාව ගන්නා සවභාව ඇති සත්‍වයන්ගේ සිත්හසර දැන හැඳින සර්වාකාර යෙන් පහදවා බණ කීම ලොවුතුරාබුදුන්ට ම මුත් අප සේ වූ දිවස් නැති අනුන් සිත් නොහඳුනන පෘථජ්ජන අල්පශ්‍රුතවූ සත්‍වයන්ට ඒකාන්තයෙන්ම නොපිළිවන්මය එතකුදුඋවත් සියල්ල දත් හැම සතුන් සිත් හැඳින බණ වදාරණ ඒ මාගේ ස්වාමිදරුවූ බුදුරජානන්

වහන්සේ විසින්ම වදාරණලද පිටකත්‍රය පාලියද ඒ බුද්ධභාෂිත පෙල හා සම්වූ විසුද්ධිමාර්ග සුමඞ්ගලවිලාසිනාදි අට්ඨකථාද සාරාර්ථමඤ්ජුසාදි ටීකාර්ථකථාද එසේම මහාවිහාර පරම්පරානුගත මහා ස්ථවිරවරයන්වහන්සේලා විසින් රචනාකරණලද විසුද්ධිමාර්ග ව්‍යාඛ්‍යානාදි නොයෙක් සන්න ගැටපද හෙළපොත්ද බුද්ධභාෂිතවූ එම පෙලඅටුවාදියට සමව පෙණෙන හෙයින් ඒ හැම පොත් බලා සඞ්ග්‍රහකොට ස්වභාෂාවෙන් ධර්මප්‍රකරණ උපදවා ලිමෙන් බුදුරජානන්වහන්සේගේ ධර්මදෙශනාවට නොවිරුද්ධ හෙයින් ධර්ම සඞ්ග්‍රහ කරණයෙහි නිස්කාංශාව හටගත් උත්සාහ ඇතිව පාලි අර්ථකථාදිය බලා සැක දුරුකොට මෙහි ගතයුතු සද්ධර්මාර්ථකථාවන් විභාගකොට ගෙණ මෙම ගාථාවගේ නවපදය අතුරෙන් "අරහං" යන අකුරු තුනකින් උපලක්ෂිත පදය ගෙණ, එහි විද්‍යමාන පස්මහාඅර්ථයන් අතුරෙන් සතරක් හැර බුදුහු පූජාවට සුදුසුය යන අර්ථය ගෙණ වර්ණනා කිරිමෙන් මොණරපාපිරිවන් මහාස්ථවිරස්වාමීන් විසින් පින්වත් පණ්ඩිතපරාක්‍රමබාහු මහරජහට බොධිසත්ත්වචරිතය හඟවා බුදුබව පැතීමෙහි උත්සාහ වඩවන පිණිස කරණලද "පූජාවලි" නම් ධර්මප්‍රකරණය හා "බුද්ධො" යන අකුරු දෙකකින් සමුපලක්ෂිත පදය ගෙණ බුදුහු සියල්ල දත්සේකැයි යන අර්ථය වර්ණනා කිරීමෙන් නරෙන්ද්‍ර සිංහ මහරජානන්ගේ ආරාධනාවෙන් අපගේ ආචාර්යන්වහන්සේ විසින් කරණලද "සාරාර්ථසඞ්ග්‍රහය" ඇතුළුවූ නොයෙක් ධර්මප්‍රකරණයන්ද බලා එහි පැවති ගුරුපදෙශ ධර්මයන්ද ආශ්‍රයකොට ගෙණ මෙම නවගුණගාථාවගේ නවමහාගුණෝපලක්ෂිතවූ නවපදය අතුරෙන් "සත්‍ථා" යන තන්හි සාසු අනුසිට්ඨිම්හි යන ධාතු සාසු තියා සිටි කල්හි ඔහට "භූවාදයො ධාතවො" යන සූත්‍රයෙන් ධාතුසංඥාව ඒ ධාතුහු කෙරෙන් පරව "සාසාදීහි රත්‍ථු" යන සූත්‍රයෙන් රත්‍ථු ප්‍රත්‍යයව "පුබ්බමධොඨිතමස්සරං සරෙන වියොජයෙ" යන පරිභාෂාසූත්‍රයෙන් ඒ රත්‍ථුප්‍රත්‍යයා සම්බන්ධවූ "රකාරස්ථ ස්වර පහව රත්‍ථුබන්ධ ප්‍රත්‍යයා පරකල්හි ඒ රකාරයා හා සමග අනෙකස්වරවූ ධාතුහුගේ අන්තයට "රමිහි රන්තො රාදි නො" යන සූත්‍රයෙන් ලොප්ව ධාතුහුගේ පූර්ව සකාරස්ථ ස්වර පහව ප්‍රත්‍යයා පරනිමිතින් පූර්වස්වරයාහට "සරලොපාදි" සූත්‍රයෙන් ලොප්ව යට සිටි ස්වරරහිතවූ ව්‍යඤ්ජනතෙම "නයෙ පරං යුත්තෙ" යන පරිභාෂාසූත්‍රයෙන් පරාක්ෂරයා කරා පැමිණ කිතකප්‍රත්‍යයාන්තයා නමා අලිඟුහෙයින් "තද්ධිතසමාසකිතකා නාමංවාතවෙතුනාදිසු ච" යන සූත්‍රයෙන් නාම්වනු ඔහු කෙරෙන් පරව "තතො ච විභත්තියො" යන සූත්‍රයෙහි චශබ්දග්‍රහණයෙන් සි විභක්තිව සිවිභක්ති පරකල්හි සත්‍ථු ශබ්දයාගේ

අනන්‍යයට "සත්ථුපිතාදිනමා සිස්මිං සිලොපො ච" යන සූත්‍රයෙන් ආකාරාදේශ හා සිවිභක්ති ලොප්ව ශවර පැමිණ සිද්ධවූ. "සත්ථා"යන මේ අකුරු දෙකකින් සමුපලක්ෂිතවූ පදය ගෙණ එහි දිව්‍යමනුෂ්‍යාදීන් විසින් මෙලොවම දක්කයුතුවූ අනිත්‍යාදි ලක්ෂණ ත්‍රය හා ධාතු ආයතන පඤ්චස්කන්ධ ප්‍රතීත්‍යසමුත්පාද ධර්මයන් ප්‍රකාශකිරීමෙන් හා පරලොව දක්කයුතුවූ කුශලාකුශලකර්මවිපාක සතර අපායත් දෙව්ලොව සම්පත් ප්‍රකාශකොට දක්වීමෙන් සියලු දෙව්මිනිසුන්ට කරණලද උතුම් සද්ධර්මානුශාසනා ඇතිහෙයින් බුදුහු "ශාස්තෘ" නම් වනසේක්‍යැයි යන මේ අර්ථය වර්ණනාකිරීමෙන්ම බුද්ධානුශාසනාවන්ගේ සඞ්ග්‍රහයක් කරන්නෙමි.

ශාසනාභිධානය දක්වාම ලොකොපකාරව සියලු බුද්ධකෘත්‍යයන් සාධන අනුශාසනිප්‍රාතිහාර්‍ය්‍ය නම් ඒ ඒ තැන්හි විස්තීර්ණව පවත්නා බුද්ධානුශාසනාවන්ගේ සංග්‍රහකිරීම ම මහත් ලෝවැඩකැයි දක්නෙම්—ඒ කෙසේදයත්? අප බුදුහු නාලන්දායෙහි වූ පාවාරික නම් අඹවනයෙහි වැඩවසනකල කෙවට්ට නම්වූ එක් ගෘහපතිපුත්‍රයෙක් බුදුන් කරා ගොස් වැඳ එකත්පස්ව හිඳ ස්වාමීනි බුදුරජානන්වහන්ස මේ නාලන්දා නම්වූ රට සර්වසම්පත්තීන් සමෘද්ධය පිරීතිබෙන අටුකොටු ඇත්තේය බොහෝ ශ්‍රද්ධාසම්පන්න ජනසමූහයාගෙන් ගැවසීගත්තේය එහෙයින් ලෝවැඩ පිණිස අහසට නැගී මාසර්ධමාස අතුරතුරෙහි ඍද්ධිප්‍රාතිහාර්‍ය්‍ය දක්වන්නට භික්ෂූන්වහන්සේ නමකට අවසර දෙවාවදාළොත් බොහෝදෙන බුද්ධශාසනයෙහි පැහැදී දශකුශලධර්මයන් රැස්කරන්නාහුයයි කියා දෙතුන්විටෙකම යාඥව සිටි කල්හි ඒ ගෘහපතිපුත්‍රයාට බුදුරජානෝ වදාරණසේක් එම්බා ගෘහපතිපුත්‍රය මාගේ විශිෂ්ටවූ බුද්ධඥානයෙන් බුදුවූ දිනයෙහි ම බොධිමූලයෙහිදී සම්බන්ධවූ ප්‍රාතිහාර්‍ය්‍යයෝ තුන්දෙනෙක් වන්නාහුය, එයින් එකක්ව සිට බොහෝදෙනෙකු සේ පෙණීම බොහෝව සිට එකකුසේ පෙණීම පොළොව කිමිද යාම අහස්හි පලඟ බැඳ හිඳීම යාම ආදී වශයෙන් පවත්නාවූ ඍද්ධිප්‍රාතිහාර්‍ය්‍යද, අනුන් සිතූ සිත් බලා ඒ ඒ චිත්තප්‍රවෘත්තිවූ ලෙස කථාකිරීමය යන ආදෙශනාප්‍රාතිහාර්‍ය්‍යද, යන මේ ත්‍රිප්‍රකාර වූ ප්‍රාතිහාර්‍ය්‍යයන් දක්වූකල ඒ ප්‍රාතිහාර්‍ය්‍ය දෙකම ලොකසාධාරණ වන බැවින් මිථ්‍යාවාදීහු දැක මේ කිමෙක්දැයි නොසතුටුව ගන්ධාරී නම් විද්‍යායෙනුත් අහසින් යාම ආදී ඍද්ධි දක්වීම පළිවනැයි කියා ද, මණිකා නම් විද්‍යායෙනුත් අනුන් සිතූ සිත් දන්ම පිළිවනැයි කියාද පිරිහෙලා අවඥකොට මේ ඇති ගුණයෙක් නොවෙයි කියා නින්දාකළ කල්හි ඒ වචනය අසා ලෝවැසියොත් සැකකරන්නාහුය, එහෙයින් ගෘහපතිය ඒ ප්‍රාතිහාර්‍ය්‍ය දෙක දක්වීමෙහි මේ ආදී

නොයෙක් දොෂ දක්නෙම් මම ඒ ප්‍රාතිහාර්‍ය්‍ය දක්වීමට පිළිකුල්වෙම්යි ගර්හාකොට වදාරා, තවද ගෘහපතිය තුන්වැනි වූ අනුශාසනිප්‍රාතිහාර්‍ය්‍ය නම් ලද ගිහිගෙය හැර පැවිදිවෙව කුශලධර්ම්ම කාටයුතුය අකුශලධර්ම්ම නොකටයුතුයයි මේ ආදී ක්‍රමයෙන් දෙව්මිනිසුන් සහිතවූ සියලු ලෝවැසියන්ට වැඩ පිණිස මා විසින් කරණලද යම් යම් බුද්ධානුශාසනාවෙක් ඇද්ද ඒ සියලු අනුශාසනාවෝ ම මා ඇතිකල්හි දු සියලු ලෝවැඩ වැඩීමෙන් මා නැති පන් දහසක් අවුරුදු මුළුල්ලෙහිදු ලෝවැඩ වඩා මා සිටිනාක් මෙන් සියලු බුද්ධකෘත්‍යයන් කොට සත්වොපකාරවන හෙයින් ඒ මාගේ අනුශාසනිප්‍රාතිහාර්‍ය්‍යය ම මාගේ විශිෂ්ටවූ බුද්ධකෘතයෙන් විශෙෂයෙන් දැන මම උතුම්යැයි කියමි, දීඝනිකායෙහි වූ කෙවට්ටසූත්‍රයෙහි “න ඛො අහං කෙවට්ට භික්ඛූනං එවං ධම්මං දෙසෙමි--පෙ--ඉදම්පි වුච්චති කෙවට්ට අනුසාසනීපාටිහාරියං නාපරං ඉජ්ඣන්තායාති” යනාදි පාළිය ප්‍රකාශ හෙයින් එබඳුප්‍රශස්ත බුද්ධානුශාසනාවන්ගේ සඞ්ග්‍රහකිරීම මහත් ලෝවැඩකැයි දැන ත්‍රෛලොකෛකසරණ වූ භාග්‍යවත් බුද්ධරජානන්වහන්සේගේ උතුම් ශාසනනාමයෙන්ම ප්‍රසිද්ධවූ ඒ සියලු බුද්ධානුශාසනාවන් අතුරෙන් ත්‍රිවිධ කල්‍යාණාදි අප්‍රමාණ ගුණවිශෙෂ ඇති ත්‍රිවිධ ශික්ෂාවන් ප්‍රකාශකොට සියලු බුදුවරයන් විසින් ලොකානුශාසනා පිණිස වදාරණලදැ:—

සබ්බපාපස්ස අකරණං කුසලස්ස උපසම්පදා
සචිත්තපරියොදපනං එතං බුද්ධානසාසනං-සී.

මේ ගාථාරත්නයෙහි ප්‍රකාශව පෙණෙන ආදි මධ්‍ය අන්ත සොභණවීමෙන් ත්‍රිවිධ කල්‍යාණව සිටි ශීල සමාධි ප්‍රඥා යන මේ ත්‍රිවිධ ශික්ෂාවෝ මහත් ගුණානිශංස ඇත්තාහුයි, එහෙයින් අප විසින් දක්වනලද මේ ප්‍රකරණයෙහි දු “සීලසමාධිපඤ්ඤාමුඛෙන නිද්දිට්ඨ විසුද්ධිමග්ගො” යූ තැන්හි ශීලය සමාධිය ප්‍රඥාය යන මුඛත්‍රයෙන්ම බැස වර්ණනාකළ විසුද්ධි මාර්ගය සේ ශීලාදි මුඛමාත්‍රවූ මෙම ගාථාවෙහි “සබ්බපාපස්ස අකරණං” යන පදයෙන් ප්‍රකාශවූ පළමුවෙනි ශීලමුඛයෙන් බැස මේ ශාසනයෙහි ද සියලු වැඩට ශීලයම මුල්ව සිටි බැවින් එහි ප්‍රකාශව පෙණෙන විරති ශීලකථාදි නොයෙක් ශීලකථාවන්ගේ ප්‍රභෙද භෙදාදීනවානිශංස කථාවන් වෙන් වෙන්ව වර්ණනාකිරීමෙන්ද “කුසලස්ස උපසම්පදා” යන පදයෙන් ප්‍රකාශවූ දෙවෙනි සමාධිමුඛයෙන් බැස් ලෞකික ලොකොත්තර වශයෙන් ද්විප්‍රකාරව සිටි කර්මස්ථාන සමාධිභාවනාවන් පර්‍ය්‍යවසානවූ දානාදි අනෙකප්‍රකාර කුශලකර්ම්මපථ විභාගානිශංසකථාවන් වෙන් වෙන්ව වර්ණනාකිරීමෙන් ද “සචිත්තපරියොදපනං” යන පදයෙන් ප්‍රකාශවූ තුන්වෙනි ප්‍රඥාමුඛයෙන් බැස

ලොභාදී සියලු අකුශලධර්මයන් කෙරෙන් සිත මුදා පිරිසිදුකර ගැන්ම හා ලෞකික ලොකොත්තර සම්පත්තිප්‍රතිලාභයෙන් නිවන්පුර සත්වයාගේ පැමිණීම නුවණින් ම කළමනා කෘත්‍යයක් වන බැවින් මේ ශාසනයාගේ පර්‍ය්‍යවසානයෙහි වූ ප්‍රඥා සම්පත් විභාගානිශංස ලෞකිකලොකොත්තර සම්පත් වෙන් වෙන්ව වර්ණනාකිරීමෙන් ද මෙහි පවත්වන්නාවූ සියලු ම සද්ධර්මාර්ථකථාවන් “සත්‍ය”යන පදාර්ථයෙහි ම ඇතුළත්කිරීමෙන් අප විසින් කරණලද මෙම ප්‍රකරණයාගේ කරණ ප්‍රකාරය හා ධර්මානිශංස ත්‍රිවිධ ශික්ෂාප්‍රභෙදානිශංස ප්‍රකාශ කථාවන් සඞ්ග්‍රහවූ පළමුවෙනි “ධර්මානිශංසවර්ණනා පරිච්ඡෙදය” මනොප්‍රණිධානයෙහි පටන් ධාතුපරිනිර්වාණය දක්වා පැවති බුදුගුණ ප්‍රකාශ කථාවන් සඞ්ග්‍රහවූ දෙවෙනි “සම්බුද්ධගුණවර්ණනා පරිච්ඡෙදය”ප්‍රථමධර්මසඞ්ගායනාවෙහි පටන් පර්‍ය්‍යාප්ති අන්තර්ධානය දක්වා පිටකත්‍රයධර්මප්‍රවෘත්තිප්‍රකාශකථාවන් සඞ්ග්‍රහවූ තුන්වෙනි “සද්ධර්මගුණවර්ණනා පරිච්ඡෙදය” සුප්‍රතිපන්නතාදී අපරිමිත ලෞකික ලොකොත්තරගුණවිභාගය හා මහාශ්‍රාවකාදී ප්‍රතිපත්තිශාසනාවසානව සද්ධර්මභාජනව සිටි සඞ්ඝගුණ ප්‍රකාශ කථාවන් සඞ්ග්‍රහවූ සතරවෙනි “සඞ්ඝගුණවර්ණනා පරිච්ඡෙදය” සරණගමන ප්‍රභෙදානිශංස ප්‍රකාශ කථාවන් සඞ්ග්‍රහවූ පස්වෙනි “සරණගමන විභාගානිශංසවර්ණනා පරිච්ඡෙදය” ප්‍රාණාතිපාතාදී අකුශලකර්මපථ ප්‍රභෙදාදීනව ප්‍රකාශ කථාවන් සඞ්ග්‍රහවූ සවෙනි “අකුශලකර්මපථාදීනව වර්ණනා පරිච්ඡෙදය” සතරඅපායයන්ගේ ප්‍රභෙද දුඃඛවර්ණනා කථාවන් සඞ්ග්‍රහවූ සත්වෙනි“අකුශලකර්මඵලභූමි විභාගවර්ණනා පරිච්ඡෙදය” නිත්‍යශීලඋපොසථශීලාදීන්ගේ ප්‍රභෙද භෙදානිශංස ප්‍රකාශ කථාවන් සඞ්ග්‍රහවූ අටවෙනි “ශීලවිභාගානිශංස වර්ණනා පරිච්ඡෙදය” දානාදී කුශලකර්මප්‍රභෙදානිශංස ප්‍රකාශ කථාවන් සඞ්ග්‍රහවූ,, නවවෙනි “කුශලකර්මවිභාගානිශංස වර්ණනා පරිච්ඡෙදය” කාමාවචර රූපාවචරභූමි වශයෙන් ද්විප්‍රකාරවූ කුශලකර්මඵලභූමි සම්පත් ප්‍රකාශ කථාවන් සඞ්ග්‍රහවූ දශවෙනි “කුශලඵලභූමි වර්ණනාපරිච්ඡෙදය” රාජධර්මානුශාසනා ප්‍රකාශ කථාවන් සඞ්ග්‍රහවූ එකොළොස්වෙනි “රාජධර්මානුශාසනා පරිච්ඡෙදය” ගෘහස්ථොපාසකඋපාසිකා ධර්මානුශාසනාප්‍රකාශ කථාවන් සඞ්ග්‍රහවූ දොළොස්වෙනි “ගෘහපතිධර්මානුශාසනා පරිච්ඡෙදය” සර්වසාධාරණ සද්ධර්මානුශාසනා කථාවන් සඞ්ග්‍රහවූ තෙළෙස්වෙනි “සාමාන්‍ය සද්ධර්මානුශාසනා පරිච්ඡෙදය”මෙසේ තෙළෙසක් පමණ පරිච්ඡෙදයන්ගෙන් ප්‍රතිමණ්ඩිතවූ ශ්‍රී සද්ධර්මාවවාදසඞ්ග්‍රහ නම් ධර්මප්‍රකරණයක් හෙළබසින් දක්වම්හ.

[illegible]ය ප්‍රකාශකොට සියබසින් දැක්විම නම්–

ධම්මාරාමො ධම්මරතො ධම්මං අනුවිචින්තයං
ධම්මං අනුස්සරං භික්ඛු සද්ධම්මා න පරිහායති-සී·

යමෙක් ධර්මාභිරතද හැම වේලෙහි ම ධර්මචින්තා කරන්නේද හෙතෙම සත්තිස්බොධිපාක්ෂිකධර්මයන් කෙරෙන් හා නවවිධ වූ ලොකොත්තරධර්මයෙන් නොපිරිහෙන්නේයයි වදාළ හෙයින් ද තවද යමෙක් මාර්ගඵලප්‍රාප්තව ප්‍රතිවෙධමූලිකව වාසයකරන්නේ විනම් ඔහු ද බුදුන් පුදන්නා නම් වෙති, යමෙක් චාරිත්‍රධර්මයෙහි පිහිටා පිළිවෙත් පිරීමෙන් ප්‍රතිපත්තිමූලිකව වාසයකරන්නේ විනම් ඔහු ද බුදුන් පුදන්නා නම් වෙති, යමෙක් පිටකත්‍රයපාළිධර්මයාගේ ශ්‍රවණධාරණාදි වශයෙන් පර්‍ය්‍යාප්තිධර්මයෙහි යෙදී වාසයකරන්නේ විනම් ඔහුද බුදුන් පුදන්නා නම් වෙති, මෙසේ පර්‍ය්‍යාප්ති ප්‍රතිපත්ති ප්‍රතිවෙධ වශයෙන් තුන්ප්‍රකාරවූ ගුණ මූලිකවීමෙන් සිඩව න ප්‍රතිපත්තිපූජාව ම ශ්‍රද්ධාමූලිකවූ ආමිෂපූජාවට වඩා විශෙෂයෙන් ම උතුම්වන්නේයි·

තවද මෙසේ උතුම්වූ ඒ ප්‍රතිපත්තිපූජාව ම පවත්වන්නාවූ පුද්ගලයන්ගේ වශයෙන් සත්ප්‍රකාරවේ—ඒ කෙසේදයත්?

යම් කෙනෙක් කෙහෙලොමින් බැඳ එල්වූ කඩුව යට සයනය කරන්නෙකු සේ හැමවේලෙහි ම පාපයෙහි භය ඇතිව වාසයකෙරෙද්ද, යම් කෙනෙක් දුශ්ප්‍රතිපත්තීන් කෙලෙසීමක් නොව අනවතප්තජලයසේ නිර්මල පිරිසිදු ශීලය රක්‍ෂාකරමින් වාසයකෙරෙද්ද යම් කෙනෙක් පිනිදියෙන් සතුටුවන චනරෙඛාවන් සේ යථා ලාභාදි ත්‍රිවිධ සන්තොෂයෙන් සතුටුව වාසයකෙරෙද්ද,යම් කෙනෙක් පාංශුවෙන් වැසීගිය ජාතිරත්ත්‍නමාණික්‍ය්‍යරත්නයක් සේ ගණසඞ්ගනිකාවෙන් දුරුව විවෙකයෙහි ඇලුම් ඇතිව වාසයකෙරෙද්ද, යම් කෙනෙක් ඇත්ගොදුරු වටුගොදුරු දෙක්හිම සමවූ වීර්‍ය්‍ය ඇති සිංහරාජයන් සේ ලදදෙයකින් යැපී අල්පවූ ඉච්ඡාඇතිව වාසයකෙරෙද්ද, යම් කෙනෙක් නිධාන රක්‍ෂාකරන්නාවූ දිව්‍යනාගරාජයන් සේ සර්ව නැමති මහනිධානය තමන්ගේ ලෙහි ධරාගෙණ වාසයකෙරෙද්ද, යම් කෙනෙක් ප්‍රියපුත්‍රයන්ට ප්‍රෙමයෙන් අවවාද දෙන මව්පියන් සේ තමන් උගත් සර්වයෙන් තමන්ටද අනුන්ටද අවවාද කිරීමෙන් ස්වසන්තාන පරසන්තාන දමනයෙන් යෙදී යහපත්ව වාසයකෙරෙද්ද, මෙසේ කරණලද පුද්ගලයන්ගේ වශයෙන් සත්ප්‍රකාරවූ පර්‍ය්‍යාප්ති ප්‍රතිපත්ති ප්‍රතිවෙධ වශයෙන් තුන්

ප්‍රකාරව සිහි උතුම් ප්‍රතිපත්තිපූජාවෙන් යමෙක් බුදුන් පුදන්නේ වීනම් ඒ පූජාව ම අග්‍රවන්නේයි.

මෙම වදාළේ මැනෝ.

යෙ වජ්ජභීරූ පරිසුද්ධසීලා සන්තොසසාරා පවිවෙකරාමා
අප්පිච්ඡතා ධම්මධරානුයොගී තෙ ලොකනාථං අභිපූජයන්ති-යි·

මේසේ බුදුන් විසින් ම ප්‍රශස්තවූ විශිෂ්ටපූජාවකැයි වදාරණලද නොයෙක් ප්‍රභෙද ඇති. ප්‍රතිපත්තිපූජාවන් අතුරෙන් පර්‍ය්‍යාප්තිධර්ම සඞ්ඛ්‍යාත පිටකත්‍රයපාලිධර්මයෙන් යටත්පිරිසෙයින් එක්සූත්‍රයක් දෙසූත්‍රයක් පමණ වත් ලෙහි ලා ධරාගෙණ ඒ සද්ධර්මානුශාසනාවන්වූ පරිද්දෙන් තුමූත් පිළිපැද චතුපාරිසුද්ධිශීලයෙහි පිහිටා සමථවිදර්ශනා භාවනාදී ප්‍රතිපත්තිධර්මයෙහි යෙදී වසමින් තමන්පිහිටි ඒ ගුණධර්මයෙන් ම අනුන්ට ද අනුශාසනාකරන්නාවූ යම් පණ්ඩිත පුරුෂයෙක් ලොව ඇතිවූයේ වීනම් හෙතෙම සෙස්සන් කෙරෙන් නින්දා ගර්හා නොලබන්නේය නොකෙලෙසෙන්නේයි.

මෙම වදාරණලද මැයි.

අත්තානමෙව පඨමං පතිරූපෙ නිවෙසයෙ
අථඤ්ඤමනුසාසෙය්‍ය න කිලිසෙය්‍ය පණ්ඩිතො-යි.

එහෙයින් තුමූත් ධර්මයෙහි පිහිටා අනුන්ට ද සද්ධර්මයෙන් අනුශාසනාකිරීම උතුම්යැයි දැන එහි ආදර උපදවා යමෙක් ශීලසම්පන්නව පර්‍ය්‍යාප්තිධර්මයෙහි යෙදී මාගධභාෂාදියෙන් සංක්ෂෙපව වැසී තිබෙන සද්ධර්මානුශාසනාඅර්ථකථාවන් සඞ්ග්‍රහකොට සියබසින් ධර්මප්‍රකරණ උපදවා පාලිධර්මය දීප්තිමත් කොට පවත්වා ලිමෙන් උතුම් ප්‍රතිපත්තිපූජාවෙන් බුදුන් පුදන්නේ වීනම් හෙතෙම ඒ ප්‍රතිපත්තිපූජාව හෙතුකොටගෙණ ආත්මාර්ථ පරාර්ථ සඞ්ඛ්‍යාත උභයාර්ථසංසිද්ධියට පැමිනෙන්නේයි. එහි ආත්මාර්ථය අවිශෙෂව මෙහි එකක් උවද පරාර්ථය වූකලී රාජරාජමහාමාත්‍යාදීන්ගේ වශයෙන් අනෙකප්‍රකාරවේ—ඒ කෙසේදයත්?

ලෝකයෙහි රජසිරි පැමිණ ආදිනව බහුලවූ සියලු රාජ්‍යධූර විචාරීමෙන් හා අනෙකප්‍රකාරවූ රාජක්‍රියාවෙහි යෙදී ශ්‍රීසම්පත් විඳීමෙන් ප්‍රමාදව ශාස්ත්‍රධර්ම අභ්‍යාස කිරීමට අවකාශ නොලැබ වසන රජදරුවන්ට බුදුන්ගේ මහාසමුද්‍රය සේ ඉතා ගැඹුරුවූ ආකාශය සේ අනන්තවූ ධර්මය බලා ත්‍රිවිධරත්නගුණ හා නොයෙක් බුද්ධානුශාසනා රාජධර්මාදිය දැන හැඳින ගෙණ උභයාර්ථ නොනසා යහපත්ව රජකිරීම උගහට බැවින් ලද ලද අවකාශයෙහි නුවණින් යෙදී වැඩ අවැඩ නම් මේ මේ යයි දැන මෙසේ මෙසේවූ ස්වභාෂාලිඛිත ධර්මප්‍රකරණ ගෙන්වා බලා බුදුන්ගේ ආගමයෙහි

විශේෂමහත්ත්වය හා කුශලාකුශලකර්මඵලවිභාග රාජධර්මානුශා-
සනා අනේකප්‍රකාර විසිතුරු සූක්ෂ්ම ධර්මකථාවන් සැපසේ සිතට
නගාගෙණ වඩාගත් නුවණින් ලොකශාසන රක්ෂාවෙහි නොප
මාව ආත්මාර්ථ පරාර්ථ මෙලෝ පරලෝ වැඩ සැපසේ සිද්ධකොට
පෙර ලෙහපිණැති ධර්මාශොකාදි මහරජුන් සේ තමතමන්ගේ ගු
ණකීර්ත්තියත් පවත්වා තබා ලෝසසුන් බබුළුවා යහපත්ව රජකිරී
ම ද එක් ලෝවැඩෙක.

තවද රාජමහේසිකාවන් ආදිවූ ගේ මිස දෙර නොහඳුනන තරම්
ආරක්ෂා ඇතිව ඇතුළුරජගෙවල වසන ශ්‍රද්ධාවන්ත පින්වත් ස්ත්‍රීන්ට
ඔවුන්ගේ සිත් සේ ඒ ඒ තැන ඇවිද විහාරචෛත්‍ය වැඳ පුදා පින්
රැස්කිරීමෙන් හා බණ ඇසීමෙන් නුවණ වඩාගෙණ මෙලෝ පර
ලෝ කුශලාකුශලාදී නොයෙක් විභාග දැනගැන්මට අවකාශ මද
බැවින් හා යහපත් නුවණැති ධර්මකථික තැන් ගෙන්වා සිතූ සිතූ
විට බණ ඇසීමෙන් ධර්මාන්විත කථා කිරීමෙන් සිත ඇති ශංකා
දිය දුරුකොට ධර්මමාර්ගය දැනගැණීමට අවකාශ නැති හෙයින්
එසේවූ පින්වත් ස්ත්‍රීහු අකුරු කීම පමණක් ඉගෙණ මෙබඳු ධර්ම
කථාවන් ලියවි තිබෙන පොත් ගෙන්වා තමතමන් සිත් සේ බලා
සද්ධර්මදෙළ පිරීමෙන් ධර්මවිභාගය දැන හැඳින දානශීලාදි පින් රැස්
කිරීමෙන් අප්‍රමාදව වාසයකිරීමද එක් ලෝවැඩෙක.

තවද ශ්‍රද්ධාවන්තවූ මහත් රාෂ්ට්‍රසෙනාධිපති ප්‍රධානිවරුන්ටද හැම
වේලෙහිම රජදරුවන්ගේ කාර්‍ය්‍යාකාර්‍ය්‍යයෙහි යෙදී වසන හෙයින්
පිටකත්‍රයෙහි විස්තීර්ණව පවත්නා බුදුන්ගේ සද්ධර්මය සකසා තෝ
රා දැන හැඳිනගෙණ පිළිපැදීම දුෂ්කර හෙයින් ඒ ශ්‍රීමතුන්ට ලද
ලද අවකාශයෙහි මෙසේ මෙසේවූ සද්ධර්මාවවාද ත්‍රිවිධ රත්නගුණ
විචිත්‍රධර්මකථාවන් සිත් සේ බලාගෙණ රාජනීති ලොකනීති ධර්ම
නීති කාලව්‍යවහාර ලොකව්‍යවහාර දෙශව්‍යවහාර ධර්මව්‍යවහාර
මෙලෝ පරලෝ වැඩ අවැඩ විශෙෂයෙන් දැන හැඳින රජුන්ටද
ලෝවැසියන්ටද තමන්ටද අවැඩ වන සේ අමාර්ගයෙහි නොගොස්
සියල්ලටම දෙලොවින් වැඩ වන සේ නිසි මාර්ගයෙහි ගොස් ත
මතමන් ලද සම්පත් නිෂ්ප්‍රයොජන නොකොට පරලොවම නිධා
නකෙරෙමින් නොයෙක් ලෙසින් වැඩ සැදීම ද එක් ලෝවැඩෙක.

තවද ශාසනරක්ෂාවෙහි අප්‍රමාදවූ මහාස්ථවිරවරයෝ ගරුවූ
ස්ථානාන්තර ලදින් වසන හෙයිනුත් නොයෙක් ශාසනධුර විචාරා
පිරිමැසීමෙහි නියුක්ත හෙයිනුත් ලෝවැසියන් කෙරෙන් මහත්
ආදර ගෞරව බහුමාන ලැබෙන හෙයිනුත් අසඞ්ඛ්‍ය නයින් බබල
න සද්ධර්මසාගරයෙහි පෙළ අටුවාදිය බලා අර්ථ විමසීම් වශයෙන්

ෂිම්ද දුන් එහි විසිතුරු ධර්මකථා ආදිය උගුළුවා ගැන්ම සුලභ නොවන හෙයිනුත් ඔවුනුදු ලද ලද අවකාශයෙහි මෙබඳු ධර්මප්‍රකරණ ගෙන්වා සිත් සේ බලා තමතමන් දත් ආගමයෙහි පැවති ධර්මකථාවන් හා උපමා සහිත පූර්වකථිකයන්ගේ ව්‍යවහාර වාක්‍ප්‍රබන්ධ අසා දැන සතුටුව ප්‍රඥාවැඩීමද එක් ලෝවැඩෙක.

නැවද අධිකතර ශ්‍රද්ධාවෙන් බුදුසසුන් වැද මහණව අකුරු කීම් පමණක් ඉගෙණ විදර්ශනා භාවනාවෙහි යෙදී ශීලසුගන්ධය පතුරුවා වසන්නාවූ ශ්‍රද්ධාචරිත බොහෝ සබ්‍රහ්මචාරීහු මෙබඳු ධර්මප්‍රකරණ බලා ශාසනධර්මවිභාගය හා ශීලවිභාගය ද දැන හැඳින ශ්‍රද්ධා ප්‍රඥා වැඩීමෙන් ආදර ඇතිව පිළිවෙත් පුරා නිවන්සැප සාදගැන්මද එක් ලෝවැඩෙක.

තවද නොයෙක් සූත්‍රාන්ත ඉගෙණ බණ කීමෙහි දක්ෂවූ මහා පණ්ඩිතවරු මෙසේ මෙසේවූ පූර්වකථිකයන්ගේ වාක්‍ප්‍රබන්ධ බලා නොයෙක් අමුතු ධර්මප්‍රකරණාදිය උපදවාගැන්මට මග දැක ඒ ඒ පූර්වකථිකයන්කෙරෙහි ඉතා ප්‍රසන්නව තමතමන්ගේ වාක්පථ නැමති මහාගඞ්ගාවන් නිර්මලකිරීමෙන් අමුතු නොයෙක් ධර්මප්‍රකරණ උපදවා ලීමද එක් ලෝවැඩෙක.

තවද ශ්‍රද්ධාවන්තවූ මනාඅදහස් ඇත්තාහු අකුරු කීම පමණක් ඉගෙණ සාවද්‍යකර්මාන්ත හැර නිරවද්‍යවූ ධර්මයෙන් ආත්මාර්ථ පරාර්ථ සැදීමෙන් දැහැමෙන් ජීවත්ව ලෝකවාසීන්ට ඒ ඒ තැන ධර්මදානය දීමද එක් ලෝවැඩෙක.

තවද මහසම්පත් ඇත්තවුන් විසින් විසිතුරු ධර්මපූජා පවත්වා කරණලද ආරාධනාවෙන් අලඞ්කෘත ධර්මමණ්ඩප මධ්‍යයෙහි පනවනලද මාහැඟි ධර්මාසනමස්තකප්‍රාප්තව සම්ප්‍රජානසහිතව මහපිරිස් පිරිවරා නිසැකව පලඟ බැඳ ලීලොපෙතව හිඳ බණ කියන තරම් දක්ෂවූ ධර්මකථිකයන් හා එබඳු මහසම්පත් ඇති පින්වතුන් ලොව දුර්ලභ හෙයින් එබඳු ශ්‍රීමතුන්ගේ පැමිණීමක් වත් දැකීමක් වත් නොලබන නොයෙක් ප්‍රත්‍යන්තවාසී වූ බොහෝ ස්ත්‍රීපුරුෂයෝ මෙබඳු බණපොත් සපයා ගෙන්වා අකුරු දන්නවුන් ලවා කියවා අසා තමතමන්ගේ ස්වභාෂාවෙන් ප්‍රකාශව තිබෙන සද්ධර්මය අසා ඒ ඒ ප්‍රත්‍යන්තවාසීහු සියලු වැඩ සාදාගැන්මද එක් ලෝවැඩෙක.

මෙසේ ආත්මාර්ථාදි වශයෙන් නවප්‍රකාරව සිටි නවාඞ්ගයකින් උපලක්ෂිතවූ බුදුසස්න සේ නවසත්ත්වාවාසය සේ නව විධවූ බ්‍රහ්මලොව සේ නවප්‍රකාරවූ ලොකොත්තරධර්මය සේ දුරුකටයුතු නව ආඝාතවස්තූන් සේ නොසෙවියයුතු නවවිධ මානය සේ

නවප්‍රකාරවූ නවරත්නයන්සේ දතසුතුවූ නවවිධ වෙදනොපශමන ධර්මය සේ අඤ්ඤාකොණ්ඩඤ්ඤාදිස්ථවිරයන්ගේ නවඅග්‍රදානය සේ හැමසතුන් විසින් සිහිකටයුතු බුදුන්ගේ නවගුණය සේ සද්ධර්ම හෙළබසින් දක්වා ලීමෙන් වන්නාවූ නවමහාවැඩක් ප්‍රකාශව පෙණෙන හෙයින් ඒ සියලු වැඩ සාධන අභිප්‍රා ඇතිව ලෝකයෙහි ප්‍රකට රෝග වූ ජ්වරාතීසාරාදී අනෙකප්‍රකාර රෝගයෙන් පීඩිත සත්වයන්ට සුව පිණිස ධන්වන්තරී භාරද්වාජාදී ඍෂිවරයන් විසින් පහළකරණලද වෛද්‍යාගමය සේ ලොභද්වෙෂමොහ මදමානමාත්සර්‍ය්‍යාදී නොයෙක් කෙලෙස්රෝගයෙන් පීඩිතව සියලු සසරදුක් විඳිමෙන් වෙහෙසෙන සතුන්ට සුව පිණිස් කෙලෙස්රෝග පිළියම් ප්‍රකාශකොට බුදුන් විසින් වදාළ සද්ධර්මානුශාසනාවන් ඒ ඒ පරිද්දෙන් වෙන් වෙන්ව සඞ්ග්‍රහකොට අප විසින් සියලු ලක්දිව ඇවිද බණ කීම නොපිළිවන් බැවින් හා නොයෙක් උපද්‍රවයෙන් අස්ථිරවූ ඉතාමද ආයුඇති මේ ජීවිතයෙන් බොහෝ කලක් ජීවත්ව හිඳ අනවද්‍යවූ ධර්මදානය පැවැත්වීම උගහට හෙයින් මෙසේ එකතැනම හිඳ ලක්දිව නොයෙක් තැන හා මතු බොහෝ කලක් පින් කැමති ධර්මලොභීන්ට මෙසේ උතුම්ධර්මදානයක් පවත්වා දිමෙන් මතු බුදුව දහම් දෙසීමට නය නගා තබමි යන මහත් ප්‍රෙමයක් ඇතිව සියලු දුකට භාජනවූ මේ සංසාරසාගරයෙහි කෙලෙස් නැමති මහවතුරෙහි ගැලී සිට පවා දහම් රස පීමෙන් උපන් අස්වැසිලි ඇතිව සද්ධර්මයෙහි අකෝප්‍යව ද තදනුගත ප්‍රීතිවේගයෙන් මෙහි දක්වනලද මේ සද්ධර්මානුශාසනාකථාවෝ හෙළබසින් වී නමුත් නිවන්ම රසකොට බුදුන් දෙසූ ධර්මාමවන බැවින් බුද්ධභාෂිතමයයි දත කවර තරම් පාත්‍රයකින් ගෙණ පානය කළත් වෙනස් නොව ඒකාකාර රසව සිටිනා මධුරරසය සේ මේ ධර්මයද අමාමහනිවන්ම රසකොට ඇත්තේය.

සියලු සත්වයන්ට පිහිටම ස්වභාවකොට ඇත්තේයයි යනාදී ක්‍රමයෙන් අප්‍රමාණවූ ධර්මානිශංසමහත්තත්වය සැළකීමෙන් ආදර උපදවා මෙහි පූර්වාපරවිරොධයක් දුටද ඒ හැම නොසලකා දියමිශ්‍ර ක්ෂීරය වෙන්කොට තෝරා ගෙණ කිරීම පානය කරණ ධාතරාෂ්ට්‍රහංසයන් සේ ධෘතිස්මෘතිවීර්‍ය්‍යශ්‍රද්ධාදී ගුණසම්පන්න සත්පුරුෂයන් විසින් මෙහි මතු පහළවන ත්‍රිවිධ ශික්ෂාවෙහි ඇතුළත්ව සිටි අනුශාසනිප්‍රාතිහාර්‍ය්‍ය නම් ලද මේ සියලු බුද්ධානුශාසනාවෝ ශ්‍රවණධාරණාදී වශයෙන් මනාකොට ගතයුත්තාහුය.

එහි ත්‍රිවිධ ශික්‍ෂාවන්ගේ විභාගානිශංස කෙසේදයත්?

විශිෂ්ටවූ ත්‍රිවිද්‍යාවන් ආදිවූ අප්‍රමාණ ගුණානිශංසධර්මයන්ගේ ප්‍රතිලාභය හා අමෘතමහාපුර ප්‍රවෙශවනු කැමති සත්වයන් විසින් එම ශීලාදි ගුණධර්මයන් හික්මියයුතුබැවින්ම ඔහු ශික්‍ෂාවෝ නම් වෙත්.

සත්වතෙම සසර හැසිරීමෙන් වින්දයුතු භවභොගසම්පත් පිණිස රක්නා ශීලය ශීල නම් වෙයි, සසරින් මිදී නිවන්පුර වදනා පිණිස රක්නා ශීලය අධිශීලශික්‍ෂා නම් වෙයි, එසේම සසර සම්පත් පිණිසවූ භවගාමී සමාධිය සමාධි නම් වෙයි, විභවසඞ්ඛ්‍යාත නිර්වාණගාමී සමාධිය, අධිචිත්තශික්‍ෂා නම් වෙයි, එසේම සසර සම්පත් පිණිස වූ භවගාමී ප්‍රඥාව ප්‍රඥා නම් වෙයි, විභවසඞ්ඛ්‍යාත නිර්වාණගාමී ප්‍රඥාව අධිප්‍රඥාශික්‍ෂා නම් වෙයි, මෙසේ ත්‍රිවිධවූ මේ ශික්‍ෂාවෝම බුද්ධානුශාසනා නමුදු වන්නාහුයි, එසේ ලද නව ඇති ත්‍රිවිධ ශික්‍ෂාවන්ගේ ශ්‍රවණධාරණාදි වශයෙන් එහි යෙදුනු සත්වයන්ට ත්‍රිවිද්‍යාවන් ආදිවූ නොයෙක් විශෙෂ ගුණානිශංසධර්මයන්ගේ ප්‍රතිලාභය ඇතිවන්නේයි—ඒ කෙසේදයත්?

ත්‍රිවිධ ශික්‍ෂාවන් අතුරෙන් යමෙක් අඛණ්ඩාදි භාවයෙන් පිරිසිදු කොට රක්‍ෂාකරණලද අධිශීලසඞ්ඛ්‍යාත සම්පූර්ණ ශීලය ඇත්තේද ඔහට පුබ්බෙනිවාසානුස්සතිඥානයයි කියනලද සත්වයන් පෙර විසූ පඤ්චස්කන්ධයන්ගේ පිළිවෙළ දන්නා විද්‍යාවද, දිව්‍යචක්‍ෂුරභිඥානයයි කියනලද සත්වයන්ගේ චුතිඋත්පත්ති දෙක දක්නා දිවඇස් විද්‍යාවද, ආශ්‍රවක්‍ෂයකරඥානයයි කියනලද කාමාශ්‍රවාදි සියලු ආශ්‍රවයන් ක්‍ෂයකරණ විද්‍යාවද, යන මේ උතුම් ත්‍රිවිද්‍යාවන්ගේ ලැබීමද ඇතිවන බැවින් ඒ ශීලය උතුම්වේ.

සමාහිතෙ චිත්තෙ යථා භූතං පජානාති,, යි හෙයින් සිත එකඟ වශයෙන් අධිචිත්තසඞ්ඛ්‍යාත සමාධිභාවනාවෙහි යෙදී වසන සත්වයාට මහාප්‍රඥාය පුථුප්‍රඥාය හාසුප්‍රඥාය ජවනප්‍රඥාය තීක්‍ෂණප්‍රඥාය නිබ්බෙධිකප්‍රඥාය යන මේ ෂට්අභිඥාවන්ගේ ලැබීමද ඒ සමාධිභාවනාබලයෙන්ම ඇතිවනහෙයින් ඒ සමාධියද උතුම්වේ.

පජානනට්ඨෙන පඤ්ඤා,,යු බැවින් ප්‍රඥාසම්පත්තියෙහි යෙදී වසන සත්වයාට අර්ථ ධර්ම නිරුක්ති පටිභානය යන අතිප්‍රභෙදවූ සිව්පිළිසිඹියාවන්ගේ ලැබීමද අධිප්‍රඥාසඞ්ඛ්‍යාත එම උතුම් ප්‍රඥාබලයෙන්ම ඇතිවන හෙයින් ඒ ප්‍රඥාවද උතුම්වේ.

එපමණක් මතු නොවෙයි -පසේබුදුබවද ලොවුතුරාබුදුබවද ප්‍රඥාසම්පත්තිය නිසාම සිද්ධවන හෙයින් ප්‍රඥාවෙන් සිද්ධනොවෙන සම්පත්තියෙක් නම් නැති සියල්ලම සිද්ධකර දෙන්නියයි දතයුතු.

තවද ඒ ත්‍රිවිධ ශික්‍ෂාවන් අතුරෙන් ශීලය රක්‍ෂාකරන්නාහු වස්තුකාම ක්ලෙශකාම දෙක්හි නොයෙදී වසන හෙයින් දුරුකට

යුතුවූ කාමසුඛල්ලිකානුයෝගයයි කියනලද පළමුවෙනි. අන්තය සේවනය නොකිරීම හෙතුකොටගෙණ ඒ ශීලය උතුම්වේ. ධ්‍යාන භාවනාවෙහි මනාකොට යෙදී වසන්නාහුගේ ශරීරය ප්‍රණීත රූපයෙන් පැතිර සිටි ශ්‍රීසොභාව ඇතිවන බැවින් අත්තකිලමථානුයොගයයි කියනලද පඤ්චතාපනයෙන් තැවීම කටුපැලලිපිට සැතපීම ආදිවූ අනෙකප්‍රකාර දුඃඛයෙන් ආත්මයට පීඩාකිරීමෙන් දුක් අනුභවකොට සසරදුක් නැතිකෙරෙමි යන මිථ්‍යකල්පනාවෙන් කායක්ලමථයෙහි යෙදීමය යන දෙවෙනි අන්තයාගේ දුරු කිරීම හෙතුකොටගෙණ ඒ සමාධිභාවනාවද උතුම්වේ. බුදුව පළමුවෙන්ම දෙසූ ධර්මචක්‍රයෙහිද "මෙමෙ භික්ඛවෙ අන්තා පබ්බජිතෙන න සෙවිතබ්බා" යනාදීන් දුරුකටයුතුයයි වදාළ හීනවූ ග්‍රාම්‍යවූ පෘථුජ්ජනිකවූ අනාර්‍ය්‍යවූ අනර්ථයෙන් මිශ්‍රවූ මේ අන්තද්වය ශීලසමාධි දෙදෙනාගේ ආනුභාවයෙන් දුරුවනබව මෙසේ දත යුතු. නුවණින් දුන පිළිපැද්දයුතු සම්‍යක්දෘෂ්ටි ආදී මධ්‍යමප්‍රතිපදා සේවනයෙන් සත්‍වතෙම සියලු සසරදුක් ඉක්මවා නිවන්පුර වදනා හෙයින් ප්‍රඥාවද උතුම් වේ.

තවද ඒ ත්‍රිවිධ ශික්ෂාවන් අතුරෙන් ශීලසම්පන්න පුද්ගලතෙම මරණින් මත්තෙහි සතරඅපායට නොගොස් මිනිස්ලොව සහිතවූ සප්තවිධ කාමස්වර්ගයෙහි ම උපදනා හෙයින් ශීලය උතුම්වේ. ධ්‍යානභාවනාවෙහි යෙදුන සත්‍වතෙම කාමභූමි නම් ලද සදෙව් ලොවත් ඉක්මවා ගොස් බ්‍රහ්මලොකයෙහි උපදනා හෙයින් භාවනාවද උතුම්වේ. ප්‍රඥාවන්ත පුද්ගලතෙම සසර ආදීනව දැක කාමභවාදිවූ නවභවය ම ඉක්මවා ගොස් අමාමහනිවන්පුර වදනා හෙයින් ප්‍රඥාව ද උතුම්වේ.

තවද ඒ ත්‍රිවිධ ශික්ෂා අතුරෙන් "පාණාතිපාතා වෙරමණී" යනාදී ඒ ඒ ශික්ෂාපදාදීන්ගේ සමාදන්වීම හෙතුකොටගෙණ ආලෝකයෙන් දුරුවන අඳුරු සේ ඒ ඒ කුශලාඞ්ගයෙන් ඒ ඒ අකුශලාඞ්ගයන් තදඞ්ගප්‍රහාණයෙන් දුරුවන හෙයින් ශීලය උතුම් වේ. ඝටප්‍රහාරයෙන් ජලය මත්තෙහි පවත්නා දියසෙවෙල් පහ වීම සේ වඩනලද සමාධිභාවනා බලයෙන් කාමච්ඡන්දාදී ඒ ඒ පාපකර්මබලයට අවකාශ නොදී කෙලෙසුන් ඔබාගැන්මය යන විෂ්කම්භණප්‍රහාණයෙන් ඔවුන් දුරුවන හෙයින් සමාධිභාවනාවද උතුම්වේ. ප්‍රඥාවන්තතෙම නුවණින් සියලු කෙලශයන්ගේ දොෂ දැක ඔවුන් හැම මුලොච්ඡින්නව සමුච්ඡේදප්‍රහාණයෙන් නසාරගත්වන හෙයින් ප්‍රඥාව ද උතුම්වේ.

තවද ඒ ත්‍රිවිධ ශික්‍ෂාවන් අතුරෙන් ශීලසමාදානය හෙතුකොට ගෙණ කායද්වාර වාක්ද්වාර දෙකින් සිඬවන සියලු අකුසල් දුරු වන බැවින් ශීලය උතුම්වේ. ධ්‍යානභාවනාවෙහි යෙදීම හේතු කොටගෙණ සිත වැලඳගෙණ සිටිනා කෙලෙසුන් දුරුවන හෙයින් සමාධිය ද උතුම්වේ. ඥානවන්තතෙම තමාගේ ඥාන යෙන් බලා සිත උපදනා කාමරාගාදී පාපකර්මයන් දුරුකොට නසා ආර්‍ය්‍යමාර්ගඥානය සිඬකටයුතුහෙයින් ප්‍රඥාවද උතුම්වේ.

මෙබඳු විශිෂ්ට සොභණවූ මේ ත්‍රිවිධ ශික්‍ෂාවෙහි අඩුවක් නොව සම්පූර්ණව පිහිටන්නාහු කවුරුදයත්?

පළමුවෙනි සෝවාන්මාර්ගයෙන් දෘෂ්ටි විචිකිච්ඡා සීලබ්බතපරාමාස යන් අකුශලධර්මයන් මුල්සිඳ නැසූහෙයින්ද පාරාජිකා සඞ්ඝාදිශෙෂ යන මහාශීලශික්‍ෂාපද නොඉක්මවා රැකීමෙන්ද ක්‍ෂුද්‍රානුක්‍ෂුද්‍ර ශික්‍ෂාපද ඉක්මවා පැමිණි වරදෙන් වහා නැගීමෙන්ද නැවත පිරයයුතු ශීලයෙහි අඩුවක් නොව සම්පූර්ණවූ ශීලය ඇතිහෙයින්ද සොවාන් පුද්ගලතෙම ශීලයෙහි සම්පූර්ණකාරී වෙයි. සෙසු සියලු පෘථග්ජනසත්ත්වයෝ එසේ නොව ශීලයාගේ එක්ප්‍රදෙශයක්මරක්නා බැවින් ශීලයෙහි ප්‍රදෙශකාරී වෙත්. සකෘදාගාමි පුද්ගලතෙම ශීලයෙහි සම්පූර්ණකාරීවේ. සොවාන් සකෘදාගාමි යන මේ ආර්‍ය්‍යයෝ දෙදෙනම සමාධියට විරුඬවූ කාමරාග ව්‍යාපාද යන අකුශලයන් හා ප්‍රඥාවට විරුඬවූ මෝහය මුල්සිඳ සර්වාකාරයෙන් නොනැසූ බැවින් ඒ දෙදෙන් සමාධි ප්‍රඥා දෙක්හි ප්‍රදෙශයක්ම කරණ බැවින් එහි ප්‍රදෙශකාරීහුවෙත්. අනාගාමි පුද්ගලතෙම වනාහි කාමරාග ව්‍යාපාද යන මේ අකුශලයන් මුල්සිඳ නැසූ හෙයින් ශීලයෙහි ද සමාධියෙහි ද අඩුවක් නොව සම්පූර්ණකාරීවේ. රහත්තෙම සර්වාකාරයෙන් මුල්සිඳ මෝහයන් නැසූ හෙයින් ඔහට අවශ්‍යයතැනක් නැත්තුයි ශීල සමාධි ප්‍රඥා යන මේ ත්‍රිවිධ ශික්‍ෂාවෙහිම සම්පූර්ණකාරී වේ.

මෙසේ ශීලයෙන් වන කායවිවේකය ද සමාධියෙන් වන චිත්තවිවේකය ද ප්‍රඥාවෙන් වන නිරුපධි සඞ්ඛ්‍යාත උපධිවිවේකය ද යන මේ ත්‍රිවිධ විවේකය පහලවීම් ආදිවූ ප්‍රමාණාතික්‍රාන්ත ගුණානිශංසධර්මයන්ගේ ප්‍රතිලාභයට කාරණවූ විශිෂ්ට සොභණ මෙම ත්‍රිවිධ ශික්‍ෂාවන්ගේ ප්‍රභෙදානිශංස මේ ආදී ක්‍රමයෙන් ප්‍රකාශ කොට දෙවිමිනිසුන් සහිත සියලු ලෝකයාහට කාරණලද තුන් ලෙව්හි පතළාවූ උතුම් සඬර්මානුශාසනාවන් ඇති හෙයින්

සමන්තභද්‍ර ජගදෙකසරණවූ මාගේ බුදුරජාණන්වහන්සේගේ ශාසනය නම් වනාසේක.

එසේ හෙයින් කියනලදී.

දෙවයක්ඛමනුස්සානං ලොකෙ අග්ගඵලං දදං
දදන්තං දමයන්තානං පුරිසාජඤ්ඤ තෙ නමො-සි.

පළමුවෙනි පරිච්ඡේදය නිමි.

---

මෙසේ පළමුවෙනි ධර්මානිශංසවිභාගවර්ණනා පරිච්ඡේදයෙන් ධර්මානිශංසසඞ්ගහනාත්මය ප්‍රකාශකොට ලෝවැඩ දක්වා තදනන්තරව දැක්වියයුතු ශීලකථාවන් අතුරෙහි සරණගමනය ආදියෙහි වියයුතුය ඒ සරණගතවන්නාහු විසින්හුදු ත්‍රිවිධරත්නගුණානුස්මරණයෙන් ම ඒ සරණයට පැමිණියයුතු බැවින් තුන්ලොවට සිවඩසාවූ මෝහඳුරට දිවාකරවූ අපබුදුරජාණන්වහන්සේගේ පූර්වප්‍රණිධියෙහි පවන් ගුණාංශමාත්‍රයක් මෙහි දක්වනුලැබේ.

එහි පූර්වප්‍රණිධි සඞ්ඛ්‍යාත නිදානකථාව වනාහි බාහිරනිදානය මහානිදානය අනිදූරෙනිදානය දූරෙනිදානය අවිදූරෙනිදානය සන්තිකෙනිදානය යි කියා සවැදෑරුම්වේ.

එයින් අපමහබෝසතාණෝ යටගිය දවස පළමුවෙන් ම මාතුපොසකධර්මයෙහි පිහිටා තමා වැදූ මවට උපස්ථාන කරමින් වසනුවෝ සුද්ධාවාස වාසී බ්‍රහ්මරාජයාගේ සහායෙන් බුදුවීමෙහි සිත බැඳ ගත් තැන් පටන් අප්‍රමාණවූ බුද්ධකාරක ධර්මපූරණයෙන් සසර ඇවිදිනාසේක් ගජප්‍රියවූ ශස්ත්‍රතාප නම් රජව සසර කලකිරීමෙහුදු බ්‍රහ්මර්ෂී නම් තාපසව වනභ්‍රමධෙනුවට ස්වකීය ශරීරමාංශ දීනය දීමෙහුදු පුරාණදීපඞ්කර බුදුන් සමයෙහි සහෙතුක කුශලකර්මබලයෙන් රාජකුමාරිකාවක්ව ඉපද අබතෙල් දන්දීමෙහුදු සිතින් ම බුදුබව ප්‍රාර්ථනාකෙරෙමින් මෙසින් විසිනාසඞ්ඛ්‍යකල්පලක්ෂයකින් ඔබ්බෙහි දානශීලාදී සුචරිතධර්මපූරණයෙහි යෙදී හැසුරුණුබව බාහිරනිදාන නම් වේ.

ඒ සමීව සිට සිතින් ම බුදුබව ප්‍රාර්ථනාකළතැන් පටන් පුරාණගෞතම බුදුන් සමයෙහි මනොප්‍රණිධානයාගේ මුදුන් පත්ව වාක්ප්‍රණිධානයට පටන්ගත්තැන් දක්වා සත්අසඞ්ඛ්‍යයක් ඇතුළත පැවති බොධිසත්වචරිතය මහානිදාන නම් වේ.

ඒ වාක්ප්‍රණිධානය පටන්ගත්තැන් පටන් මැතදීපඞ්කරබුදුන් සමයෙහි අෂ්ටධර්මසමොධානයෙන් යෙදී නියතවූ විවරණශ්‍රී ලැබීම දක්වා නවඅසඞ්ඛ්‍යයක් ඇතුළත පැවති අපමහබෝසත්චරිතය අනිදූරනිදාන නම් වේ.

ඒ දීපඞ්කරපාදමූලයෙහිදී විවරණය ලත්තැන් පටන් වෙස්සන්තර රජවීම දක්වා පැවති බොධිසත්ත්වචරිතය දූරෙනිදාන නම් වේ.

ඒ වෙස්සන්තරරජ වූ තැන් පටන් බොධිමූලයෙහි වැඩහිඳ බුදුවීම දක්වා පැවති බොධිසත්ත්වචරිතය අවිදූරෙනිදාන නම් වේ.

ඒ බුදුවීමෙහි පටන් කුසිනාරානුවරදී පිරිනිවන්පෑම දක්වා ඒ ඒ තැන්හි පැවති භාග්‍යවතුන්වහන්සේගේ සියලු බුද්ධචරිතය සන්තිකෙනිදාන නම් වේ.

මෙසේ ෂට්ප්‍රභෙදවූ නිදානකථාවන්ගේ මේ දැක්වූයේ අතිසංක්ෂෙපය,විස්තර වශයෙන් දක්වත් හොත් ඉතා බෙහෙව එතකුදුළුවත් අසාධාරණවූ බොධිසත්ත්වචරිතය දැන එහි ආදර උපදවා බුද්ධකාරකධර්මපූරණයෙහි යෙදෙනු කැමති ශ්‍රද්ධාබුද්ධිසම්පන්න සත්රුෂ ජනයීන්ගේ උත්සාහ වඩවනු පිණිස සොළසාසකිනිදානයෙහි හා සොදන්තකනිදානයෙහි ද මහාසම්පිණ්ඩිනිදානයෙහි ද අනුක්‍රමයෙන් එම බාහිරනිදානාදී මෙහි දක්වියයුතු විසිතුරු නිදානකථාවන් සඞ්ග්‍රහකොට දක්වම්හ. ඒ වනාහි සත්පුරුෂජනයන් විසින් සිත්හි ලා සාදරව ඇසීමෙන් අත්වැඩ පරවැඩ සෑදීමෙහි උත්සාහ කටයුතු.

එහි මාතුපොසකධර්මයෙහි යෙදී බ්‍රහ්මරාජයාගේ සහායෙන් බුදුවීමට සිත් යොමුකළ පරිදී කෙසේදයත්?.

හේ මෙසේ දතයුතු.

මේ මහාභද්‍රකල්පයට විසතාසඞ්ඛ්‍යයක් හා කප් ලක්ෂයකින් ඔබ්බෙහි කප් අසඞ්ඛ්‍යයක් යනතුරු අතුරු බුදුකෙනෙකුන්වහන්සේගේ ලොව නො ඉපදීමෙන් බුද්ධශූන්‍යවිය. එහෙයින් ඒ අසඞ්ඛ්‍යය ශූන්‍ය අසඞ්ඛ්‍යයකැයි කියා නම ලුහුඬුකොට කීබව මුත් දවස් මස් අවුරුදු වශයෙන් කල්පය මෙතෙකැයි ගණන් ප්‍රමාණ නියම කොට දැක්කයුතු ලුහුඬු කාලයෙක් නොවෙයි, උපමා වශයෙන් කල්පනාකටයුතු වූ මහත් දීර්ඝකාලයෙක, අසඞ්ඛ්‍යය ද එසේම ඉතා මහත් දිර්ඝ දෙයක, අවුරුදු කල්පාදී වශයෙන් ඒ මෙතෙකැයි යන ගණනක් නැති හෙයින් ම අසඞ්ඛ්‍ය නම් වෙයි. එයට වඩා මහබෝසතානන්ගේ පාරමිතාභූමිය දීර්ඝකාලයක් වනබව ගහවනු පිණිස කල්පවිභාගය හා අසඞ්ඛ්‍යවිභාගය ප්‍රස්තානුගත පමණක් මෙහි දක්වනුලැබේ.

හේ කල්පයතෙම අන්තඃකල්පය සංවර්තකල්පය සංවර්තස්ථායීකල්පය විවර්තකල්පය විවර්තස්ථායීකල්පය මහාකල්පය යි පර්යාය වශයෙන් සයෙක් වේ.

එහි අන්තඃකල්පය නම් කවරහයුත්?

සත්ත්වයන්ගේ කුශලකර්මසමාදානය හෙතුකොටගෙණ දසහැවිරිදි මිනිසුන් පටන් මිනිසුන්ගේ ආයුෂය ක්‍රමයෙන් වැඩී ගොස් අසඞ්ඛ්‍යයට පැමිණ සත්ත්වයන්ගේ අකුශලකර්මසමාදානය හෙතුකොටගෙණ අසඞ්ඛ්‍යයෙහි පටන් නැවත ආයුෂය ක්‍රමයෙන් බැස දසහවුරුදු වන තැන් දක්වා මේ දෙඅතුර එක් අන්තඃකල්පයෙක් නම් වෙයි, ඒ දහසක් අවුරුද්දෙන් අඟලක් වඩනා පොළොව එක්යොදුන් තුන්ගව්වක් උස වඩනා පමණ කල් වන්නේයි

ඒ අන්තඃකල්පය පෙරළෙනකාලයෙහි මිනිසුන්ගේ ලොභාධිකවිනම් සත්ත්වයො රෝගයෙන් නස්නාහුය, ද්වෙෂාධිකවීනම් ශස්ත්‍රයෙන් නස්නාහුය, මොහාධිකවීනම් දුර්භික්ෂයෙන් නස්නාහුය.

සංවර්තාදි චතුස්ප්‍රකාරවූ අසඞ්ඛ්‍යකල්පයෝ නම් කවරහයුත්?

මොහු මෙතෙක් කල්ප සියයක දහසෙක ලක්ෂයකැයි යනාදී ක්‍රමයෙන් සඞ්ඛ්‍යා නොකොට හැක්කෙත් අසඞ්ඛ්‍යකල්ප නම් වූහ. හේ කල්පවිනාශ මහාමෙඝයෙහි පටන් ජ්වාලොපච්ඡෙදය දක්වා ලොව නස්මින් සිටි කාලය සංවර්තකල්ප නම් වේ. ඒ ජ්වාලා සිඳීමෙහි පටන් කෙළලක්ෂයක් සක්වළ එකපැහැර පිරී සිටි සම්පත්ති මහාමෙඝය දක්වා ලොව නැසී සිටි කාලය සංවර්තස්ථායී කල්ප නම් වේ. සම්පත්තිමහාමෙඝයෙහි පටන් නැවත චන්ද්‍රසූර්‍ය්‍යයන් පහළවීම දක්වා ලොව උපදිමින් සිටි කාලය විවර්ත්තකල්ප නම් වේ. චන්ද්‍රසූර්‍ය්‍යයන්ගේ පහළවීමෙහි පටන් නැවත කල්පවිනාශ මහාමෙඝය දක්වා ලොව ඉපදී සිටි කාලය විවර්ත්තස්ථායී කල්ප නම් වේ. මෙසින් එක්අසඞ්ඛ්‍යකල්පයෙක් නම් යටකී අන්තඃකල්ප ගණනින් සූසැටඅන්තඃකල්පයක් පමණ කල් වන්නේය. මෙම කීහ ලොකදීපසාරයෙහි "සංවට්ටට්ඨායී අසඞ්ඛ්‍යෙය්‍යං චතුසට්ඨී අන්තරා කප්පා සඞ්ගහන්ති" යි. එහෙයින් අන්තඃකල්ප දෙසිය පණසක් පමණවූ කාලය මහාකල්පයෙක් නම් වේ. හේ දිගින් සතර ගව් පළලින් සතර ගව් උසින් සතර ගව් පමණවූ අට්ටුවක මුදුන්ව චූලිකා බැඳ හබ පුරාලූකල එයින් පුරුෂයෙක් වර්ෂ සියයක් සියයක් ගියකල එක එක හබඇටක් නගා හැරීමෙන් සිඳුව ඒ මහාසර්ෂපරාශිය ගෙවියන්නේය කල්පයෙක අවුරුදු නොගෙවෙන්නේයයි කියාද, තවද එපමණ දිග පුළුල උස ඇති එකඝණවූ මහාපර්වතයක් වර්ෂ සියයක් සියයක් ගියකල කසීසළුවකින් එක එකවරක් බැගින් පිරිමැදීමෙන් සිඳුරු නැති එසා මහාපර්වතය වහා ගෙවියන්නේය කල්පෙක අවුරුදු එතෙක්කල් ගියත් නොගෙවෙන්නේයයි කියාද, බුදුන් විසින් ම වදාරණලදී. මෙසේ සඞ්

පොපමාවෙන් පර්වතොපමාවෙන් කල්පනාකටයුතුවන බැවින් කල්ප නම් වෙයි.

ඒ කල්පයද ශූන්‍යකල්පය අශූන්‍යකල්පයයි ද්විප්‍රකාරවේ. එහි බුද්ධප්‍රත්‍යෙකබුද්ධශ්‍රාවකචක්‍රවර්තිආදීන්ගේ ඉපදීමක් නැති කල්පය ශූන්‍යකල්ප නම් වෙයි. ඒ බුද්ධාදී උතුමන් උපදනා කල්පය අශූන්‍යකල්ප නම් වෙයි අශූන්‍යකල්පයද සාරකල්පය මණ්ඩකල්පය වරකල්පය සාරමණ්ඩකල්පය භද්‍රකල්පයයි කියා පඤ්චප්‍රකාරවේ. එයින් එකබුදුවරකෙනෙකුන් උපදනා කල්පය සාරකල්පනම් වෙයි. බුදුවරයෝ දෙදෙනකුන්වහන්සේලා උපදනා කල්පය මණ්ඩකල්ප නම් වෙයි. බුදුවරයෝ තුන්දෙනකුන්වහන්සේලා උපදනා කල්පය වරකල්ප නම් විය. බුදුවරයෝ සතරදෙනකුන්වහන්සේලා උපදනා කල්පය සාරමණ්ඩකල්ප නම් විය. බුදුවරයෝ පස්දෙනකුන්වහන්සේලා උපදනා කල්පය භද්‍රකල්ප නම් විය. ගුණසාරවිරහිතවූ සියලුම ශූන්‍යකල්පයන්ට වඩා උතුම්වූ සාරගුණ උපදවන බැවින් සාරකල්පයයි ලද නම් ඇති සාරකල්පාදී අශූන්‍යකල්පයෝ පස්දෙන ම තමතමන්ගේ අභිඛ්‍යානාව වශයෙන් එකිනෙකට වඩ වඩා විශිෂ්ටවූ ලෞකිකලොකොත්තරගුණයන් දෙව්මිනිසුන් සහිත සත්වයන්ට උපදනා හෙයින් හා පළමුව බුදුවූ බුදුහු දෙවැනිව උපදනා බුදුන් ප්‍රකාශකොට දක්වනසේක දෙවන තුන්වනසතරවන බුදුවරයන්වහන්සේලා ද එසේම වදාරණ්සේක්ලාය ඒ අසා සත්වයොද ඉතා සතුටුව ඒ ඒ බුදුන් දැක අප අප ලද ජීවිත සඵලකොට ගණ්ණම්හයි ප්‍රාර්ථනා කොට අතිශයින් අප්‍රමාදව වීර්‍ය්‍ය වඩමින් දානශීලාදී සුචරිත පිරීමෙන් අත්වැඩ පරවැඩ සාදාගැන්මෙහි යෙදෙන්නාහුය.

පස් බුදුකෙනෙකුන්වහන්සේ උපදනා කල්පයෙහි උපන්නාවූ සත්වයෝ බුද්ධප්‍රත්‍යෙකබුද්ධආර්‍ය්‍යශ්‍රාවකාදිවූ උතුම් කල්‍යාණමිත්‍රසේවනාශ්‍රයෙන් සැප බහුලවන්නාහුය, බොහෝ සේ ත්‍රිහෙතුක සත්වයෝ කෙලෙසුන් නසා රහත් වන්නාහුය, ද්විහෙතුක සත්වයො ෂඩ්විධ කාමස්වර්ගයෙහි උපදනාහුය, අහෙතුක සත්වයො කල්‍යාණමිත්‍රයොගය නිසා හෙතුසම්පත් ලබන්නාහුය, එසේ හෙයින් ඒ කල්පය බොහෝ සත්වයන්ට යහපත් සැප බහුලතාවයෙන් භද්‍රකල්ප නම් විය, ඒ භද්‍රකල්පයට වඩා බුද්ධාදීන්ගෙන් සැරහුණු අනික් කල්පයක් නැත එසේවූ භද්‍රකල්පයක් නැවත ලැබීමද නුග දිඹුල් රුක්වල මල් හටගැණීමක් සේ ඉතා දුර්ලභ වන්නේයි.

එකො බුද්ධො සාරකප්පෙ මණ්ඩකප්පෙ ජිනා දුවෙ
වරකප්පෙ තයො බුද්ධා සාරමණ්ඩෙ චතුජ්ජිනා
පඤ්ච බුද්ධා භද්දකප්පෙ තතො නත්‍ථාධිකා ජිනා'ති.

මෙසේ වූ මහාකල්පයන්ගේ ම අසඞ්ඛ්‍යයක් එක්වූ අතිදීර්ඝ මහාකාලයට කප් අසඞ්ඛ්‍යයයි යනු නමෙක, එහි අසඞ්ඛ්‍ය කෙපමණෙක් දැයි කිවහොත්?

තත්‍ථ අසඞ්ඛෙය්‍යන්ති, නසඞ්ඛෙය්‍යන්ති අසංඛෙය්‍යං එකාදිවසෙන ගණෙත්වා යාව පමාණං කතා තාව සඞ්ඛෙය්‍යන්ති නාම තතො පරං ලක්ඛණං වා පමාණං වා අකත්වා අසඞ්ඛෙය්‍යන්ති නාම වුච්චති.

යනාදී ක්‍රමයෙන් සොළසාසකී මහානිදානයෙහි දක්වූ බැවින් අසඞ්ඛ්‍ය නම් ගණිත් වශයෙන් සඞ්ඛ්‍යාවට නොපැමිණ නොසෑහී සිටි යම් කිසි ගණනෙක් වස්තූන්ගේ රාශියෙක් ඇද්ද ඒ රාශිය අසඞ්ඛ්‍ය නම්, එකය දෙකය යනාදි වශයෙන් සංඛ්‍යාවට නගා ගෙණ යම් තාක් ගණිතින් පමණ කරණලද්දාහුද ඒ තාක් සඞ්ඛ්‍යාවට සුදුසුවූ ගණනට නැගෙණ තරම් වස්තූහු සඞ්ඛ්‍ය නම් වෙති, එයින් මත්තෙහි ගණනක් හෝ ප්‍රමාණයක් හෝ නොකොට සිටියේ අසඞ්ඛ්‍ය නමැයි කියනලැබේ.

තවද එහි ම.

ගණනා නාම මෙ අනන්තානි හොන්ති කතමානි මෙ අනන්තානි ආද්‍යනන්තා ච ඔසානනන්තා චාති·

යනාදීන් කී බැවිනුදු ගණිත නම් ආදී අනන්ත ඔසානානන්ත විසින් කෙළවර දෙකෙක් වෙත්, අසඞ්ඛ්‍යයට එසේ අනන්ත කෙළවර නොපෙනෙන්නෙවීනම් එකම අසඞ්ඛ්‍යයකැයි නොකියා කවර කාරණයකින් දෙතුන් අසඞ්ඛ්‍යයකැ සතර පස් අසඞ්ඛ්‍යයක දස විසි අසංඛ්‍යයකැයි කියනලද්දාහුදයත්? මෙහි එසේ කියයුතු නොවෙයි, එකය දෙකය යනාදී ක්‍රමයෙන් ගැණෙනෙණ ගොස් සඞ්ඛ්‍යාවූ දෙකෙළවර ඇති මහාකල්පනය ගණනට ඔබ්බෙහි වූ අසඞ්ඛ්‍යය නාම ව්‍යවහාරයට පැමිණි තැන නැවතී දෙවන අසඞ්ඛ්‍ය යද එකය දෙකය යනාදින් විසින් යට කීපරිද්දෙන් සඞ්ඛ්‍යාකරණබව එම සොළසාසකී නිදානයෙහි ම දක්වූ හෙයින්ද අසඞ්ඛ්‍යයට ඔබ්බෙත් ගණනක් නැති හෙයින් ද මහාපෘථිවිය ආදී එසා මහත් වස්තු පවා අසඞ්ඛ්‍යයට ලත් තබන්ට නොසෑහෙනහෙයින් දැයි යනාදී නොයෙක් කාරණ සැලකීමෙන් අසඞ්ඛ්‍ය ප්‍රභේදය නුවනැත්තන් විසින් දතයුතු·

මෙසේ සඞ්ඛ්‍යාකටයුතුවූ අසඞ්ඛ්‍යගණනායෙන් ම විශිඅසඞ්ඛ්‍ය යක් හා කප් ලක්ෂණයින් ඔබ්බෙහි එසේ වූ මහාකල්ප අසඞ්ඛ්‍ය

යක් ඉක්ම යනතුරු එකම බුදුකෙනෙකුන් ලොව නූපන්හේක, එකල්හි ඒ ශූන්‍යඅසඞ්ඛ්‍යයට ඔබ්බෙහි වූ යටගිය දවස බුදුවරයන් ඇතිකල සෝවාන්ආදී මාර්ගඵල ලැබ සියලුම දිව්‍යලොක බ්‍රහ්මලොකවල ගහණව සිටියාහු යථාක්‍රමයෙන් දිව්‍යබ්‍රහ්මසුව විඳ ගොස් අකනිට්ඨාවට පැමිණ ස්කන්ධපරිනිර්වාණයවීමෙන් බොහෝ ආර්‍ය්‍යසත්වයෝ ක්ෂයව ගියකල්හි භවතණ්හා අධික බැවින් ඒ හැමට පසුව සිටි සෝවාන් සකෘදාගාමීහු ඒ ඒ දෙව්ලොව ආයුසම්පත් වූ පරිද්දෙන් සියලු පඤ්චකාමසැප අනුභවකොට නිම්මා පරනිම්මිතවසවත්ති දෙව්ලොව සිට කාමවිරාගභාවනා වඩා බඹලොව් ඉපද ඒ ඒ බ්‍රහ්මලොකවල ද ආයුසම්පත් වූ පරිද්දෙන් ධ්‍යානසුව විඳ වෙහප්ඵල නම් බඹලොව සිට භාවනා වඩා අනාගාමිව සුද්ධාවාසයෙහි ඉපද එහිදු ආයුසම්පත්වූ පරිද්දෙන් බ්‍රහ්මසුව විඳ ක්‍රමයෙන් ගොස් මහාකල්ප සොළොස්දහසකට ආයුෂ ඇති අකනිට්ඨබඹලොව ඉපද එහි අප්‍රමාණ ධ්‍යානසුව විඳිමින් රහත්ව වසන පශ්චිම වූ එක්බ්‍රහ්මරාජයෙක් ධ්‍යානයෙන් නැගී ලොව බලනුවෝ සුද්ධාවාසවල බ්‍රහ්මරාජයන් බොහෝ නැතිබව දැක මෙසේ ස්වල්පතරවීමට කාරණ කිම් දෝ හෝයි පරීක්ෂාකොට බුදුකෙනෙක් නූපන් හෙයිනැයි දැක මහත් සංවේගයට පැමිණ බුද්ධකාරකධර්මපූරණයෙහි දෘඪසිත් ඇති විරපුරුෂයන් සියලු සක්වළවල විමසා බලනුවෝ සෙසු අනන්තාපරිමාණ සක්වළවල නැති සේ දැක මේ මඟුල්සක්වළ බලා එකලට බුදුබව පැතී මෙහි නිෂ්කතව සිටි නොයෙක් දහස්ගණන් බොධිසත්වවරයන් දැක සතුටුසිත් ඇත්තේ තවද වඩ වඩා ලෝවැඩ වඩනු පිණිස කරුණාවීර්‍ය්‍යසම්පන්න පුරුෂයන් ලවා බුදුබව ප්‍රාර්ථනාකරවමි සිතා නැවත ලොව බලනුවෝ එකණෙහි කරුණාවීර්‍ය්‍යසමඞ්ගිතා වෙන් මුහුදු වැද පිහිණන අපමහබෝසතානන් දැක චිත්තාභ්‍යන්තරගතව බුදුබව ප්‍රාර්ථනාකරවිය.

අපම්හබෝසතානෝ මුහුද පීනූ පරිදි කෙසේදයත්?

යට කියනලද ශූන්‍යවූ අසඞ්ඛ්‍යයෙහි අපමහබෝසතානෝ ගන්ධාරරට දිළිඳු කුලයක ඉපිද වැඩිවිය පැමිණ මව්පියන් විසින් විවාහ කිරීමට යාඥකළකල්හි ගෙද නොකමැතිව දෙමව්පියන්ට කළමනා උපස්ථානය ම අප්‍රමාදව කරමියි කියා දෙමව්පියන්ට උපස්ථාන කරමින් වසනුවෝ කල්යාමෙන් පියානන් මිය පරලොව ගියකල්හි මැනියන් විසිනුදු පෙරසේම විවාහමඟුලක් කරදෙනු පිණිස යාඥකළකල්හි ඒ නොකමැතිව හෙතෙම එතැන් පටන් සිහිනුවණින් යෙදී අසරණවූ මව රක්ෂාකරන්නේ ආරණ්‍යට

වැද දර පලා සපයා ගෙණවුත් විකුනා එයින් ලද මිලයෙන් මෑණි
යන්ට උපස්ථාන කරමින් වසනුවෝ එක්දවසක් වල්වැද ඇවිද
ග්‍රීෂ්මාභිතාපතාව පිපාසිතව පැන් බී ගංතොටට නුදුරුවූ නුගරුකක්
මූල මඳකාලක් සැතපී නැවත නැවත පිබිද සිතනුයේ මම දැන්
තාරුණ්‍ය බලසම්පන්නවූයෙමි මෙපමණ දුක් ඉවසන්ට හැකියෙමි
මහලුකල හෝ ව්‍යාධියක් පැමිණිකල හෝ කුමක් කෙරෙම් දැයි
සිතා එංකාරණයෙහි සිතන්නාවූ මම වෙළඳුන් සමග සුවර්ණභූමියට
ගොස් රන් ගෙණවුත් සැපසේම මවට උපස්ථානකෙරෙම්යි සිතා
වෙළඳුන් කරා ගොස් ප්‍රධාන වෙළඳුනන් සමීපයෙහි සිටිකල හෙ
තෙම දරුව කුමක් පිණිස ආයෙහි දැයි විචාළේය· එවිට තමන්ගේ
අභිප්‍රාය වෙළඳජ්‍යෙෂ්ඨයාට දන්වන්නාවූ මහබෝසත්තෙම:—

දළිද්දොදුතාහං සාමි සක්කාගාමස්මිං ආගතො
සචෙ මං අනුකම්පසෙ තව සද්ධිං ගමිස්සහන්ති·

යන මේ ගාථාවෙන් තමා දිළිඳුබව හා මට අනුකම්පාකරන්නෙහි
වීනම් තොප හා සමග වෙළඳාමෙහි යන පිණිස ආමිහයි දැන්වූ
කල්හි ඒ ඇසූ නාවිකතෙම ආරොහ පරිනාහ බලසම්පන්නාවූ ඒ
පුරුෂයා දැක ඉතා සතුටුව දන්වනුයේ:-

සාධු තාත සුභාසෙහි ඛිප්පං එහි මම සන්තිකං
යන්තකං වෙතනං තුය්හං තත්තකං තෙ දදාමහං.

අඤ්ඤම්පි සම්බලං දෙමි යදා තං ධන ලච්ඡසි
තෙන ත්‍ව තාත සුඛි ජීව යාවජීවං යතිච්ඡිතන්ති.

යන මේ ගාථා දෙකෙන් දරුව තෝ කීයේ මැණව මා සමීපයට
එව යම් පමණ මිලයකින් තට ප්‍රයොජන වීනම් එපමණ දෙමි යම්
කාලක තෙප් ධන ලබන්නෙහි ද ඒතාක් අන්‍යවූ මාර්ගෝපකර
ණ ද දෙමි දරුව තොප දිව්හිමියෙන් කැමති සේ සුවයෙන් ජීවත්
වයි කීකල්හි ඒ ඇසූ බෝසතානෝ ඔහු වැද නිග්‍රොධමූලයට
ගොස් නැවත සිතනුවෝ ඉදින් මම සුවර්ණභූමියට ගොස් එතනු
රු මාගේ මවට කවරෙක් උපස්ථාන කරන්නෙහි ද එහෙයින් මා
සිතුයේ තුසුදුස්සක පළමුකොට මෑනියන් විචාරා ඔවුන්ගේ සිත
දැන පසුව දනිම්යි සිතා ඒ සපයාගත් දර පලා භාරයෙන් උසුලා
ගෙණ ගෙට ගොස් මඳක් කල් යවා බත් අනුභවකොට මුව සොඳ
මව් සමීපයට ගොස් වැඳ දන්වනුයේ මෑනියෙනි සෙසු දවසට
වඩා අද දවස මම වනයෙහි ඇවිද මහත් දුකට පැමිණියෙමි
එහෙයින් කියමි මෑනියෙනි මම දැන් තරුණව බලසම්පන්නයෙමි
මෙබඳු බර ඉසිලීම්ආදී කාර්යයෙහි සමර්ථයෙමි මහලුකල හෝ

විනාශ පැමිණි කල හෝ කුමක් කෙරෙම් ද එහෙයින් මැනියන්ව
ගන්ස ඉදින් මා හා සමග යන්නට පිළිවන්වීනම් සවර්ණභූමියට
යනු කැමැත්තෙමියි දන්වූහ. ඇ බෝසතානන්ගේ වචනය අසා
කියන්නී දරුව මාගේ ජීවිතය තා පිළිබඳය එහෙයින් යම් තැන
කට යනු කැමැත්තෙහි නම් තොප හා සමග නික්ම යෙමියි කී
වාය. ඒ ඇසූ බෝසත්තෙම මව වැඳ අවසර ගෙණ නැවත වෙළ
ඳුනන් සමීපයට ගොස් කියනුයේ ස්වාමීනි මම එකලාව නොයමි
මාගේ මැනිතොමෝ ස්වාමි මළ හෙයින් කණවැන්දඹු මැහැලිවූ
දිළිඳු දුක්පත් කෙණෙක මා හැර උපස්ථාන කරන්නාවූ අණික්
පුතෙක් දියෙනිකෙණෙක් මුණුබුරෙක් නැත එහෙයින් මැණි
යන් හැර යන්නට නොහැක්කෙමි මැනියන් සමග යන්නට අව
කාශ දුනහොත් යෙමි නැතහොත් නොයමියි දන්වූයේය. ඒ ඇසූ
වෙළඳ ශ්‍රේෂ්ඨතෙම සතුටුව දරුව මැණව තාගේ මැනියන් හෝ
පුත්‍රදාරාවන් හෝ වහා ගෙණ එව ඔවුන්ට වැටුප් වියදම් මම දෙ
මියි කීව, බෝසත්තෙම ඒ අසා සතුටුව තමාගේ ගෙට ගොස්
ගෘහයෙහි යම් කිසිවෙක් ඇත්නම් ඒ හැම ගෙණ මවුන්දැත්
එක්ව වෙළඳුනන් සමීපයට ගියහ. වෙළඳතෙම ඔවුන්ට සත්කාර
කොට කීපදවසක් වැස නැව් නැඟෙණකල්හි බෝසතුන් කැඳ
වා දරුව මෙතැන් පටන් සියලු ධනය හා මාර්ගෝපකරණ හා
නැව ද තොපට භාරයයි කියා සියලු කෘත්‍යයන් භාරකොට බෝ
සතුන්ට දියයුතු සියල්ලම දී සඞ්ග්‍රහකළේය. එකල්හි අපමහ
බෝසතාණෝ ම සියලු කෘත්‍යයන් කොට තමාගේ මව නැවට
නන්වා වෙළඳුන් හා නැව් නැගී යනුයේ සත්දවසක් මුහුදුපිට
නැව දිවනකල්හි ගමන් අධික බැවින් නැව බිඳී මුහුද ගැළිනා,
එකල්හි සියලු වෙළෙන්දෝ නොයෙක් විප්‍රකාරයට පැමිණියාහු
ය. බෝසතාණෝ තමන්ගේ දිවි රක්නා පිණිස මදක් නැත් පිණ
ගොස් මැනියන් සිඟිකොට නැවහි බලනුවෝ එක්දඬුනඩක එල්
බ සිටි මැනියන් දැක එතනට ගොස් මැනියන් උසුලාගෙණ මු
හුද පිහිනන්ට පටන්ගත, එකෙණෙහි යට කියනලද ක්‍රමයෙන්
සුද්ධාවාස වාසී බ්‍රහ්මරාජතෙම බුද්ධකාරකධර්මපූරණයට නිසි කා
රුණ වීර්‍ය්‍ය සම්පන්න සත්‍වයන් පරීක්ෂාකරණුයේ තමාගේ මැනි
යන් පිණිස ජීවිත පරිත්‍යාග කොට වීර්‍ය්‍යකරන්නාවූ ඒ මහාපුරු
ෂයා දැක මෙතෙම සමුද්‍රය ඉතාමහත් ගැඹුරුබව ද කෙළවරක්
ගොඩක් නොපෙණෙනබව ද නොසළකා තමාගේ ජීවිතය පරි
ත්‍යාග කොට ස්වකීය මව එතරකරණු කැමැත්තේය, මෙබඳු දෘඪ
වීර්‍ය්‍ය ඇති තැනැත්තේ බුද්ධකාරකධර්මපූරණයට සමර්ථයයි සිතා

ඔහුගේ සිතට ප්‍රවේශව බුදුබව පැතීමෙහි සිත් යොමුකැරවීය. මෙසේ ඒ බ්‍රහ්මරාජයා විසින් උත්සාහිතවූ මාතෘපොෂකධර්මයෙහි පිහිටි ඒ මහාපුරුෂතෙම රළපහරවේගයෙන් මුහුද ගැලෙන්ට ආරම්භවූ කල්හි මේ මුහුදමැද මෑනියන් හා සමග මරණපත්වෙම් එහෙයින් මම එක් සත්‍යක්‍රියාවක් කෙරෙම්යි සිතා:—

බුද්ධො'හං බොධයිස්සාමි මුත්තො'හං මොචයෙ පරෙ
තිණ්ණො'හං තාරයිස්සාමි සංසාරොඝා මහබ්භයා·

යනාදීන් මතු බුදුව මුළුලෝවැසීන් ගලවමියි සිතින්ම ප්‍රාර්ථනා කොට මෙසේ සිත හටගත් උත්තමධ්‍යාශයෙහි ආනුභාවයෙන් හා එම බ්‍රහ්මානුභාවයෙන් දෙතුන්දවසක් ගිය තැන මෑනියන් හා සමග යැපසේ මුහුදින් ගොඩනැග් එක්තරා ගමකට ඇමිණ මෑනියන්ට කළමනා උපස්ථාන දුකසේ කිරීමෙන් දිවිහිමියෙන් කුසල් කොට දෙව්ලොව ඉපද දිවසැප විඳින්ට වන්හ· මෑනිතොමෝ කම්වූපරිද්දෙන් මිය පරලොව ගියාය.

අපභාග්‍යවතුන්වහන්සේ බුදුව සහම්පතී මහාබ්‍රහ්මාදි දසදහසක් සක්වළින් රැස්වූ දිව්‍යසමූහයා විසින් ආරාධිතව ධර්මදෙශනා කරණ සමයෙහි තමන්වහන්සේගේ පූර්වප්‍රණිධිය සිහිකරව දූරා සොළසාසති මහානිදානයෙහි දක්වනලද ක්‍රමයෙන් මේ ගාථාව වදාළසේක:—

බුද්ධො'හං බොධයිස්සාමි ඉති යං පත්ථිතං කතං
තෙන පත්තො'ස්මි සම්බුද්ධො හන්ද බොධෙමි පාණිනං.
මුත්තො'හං මොචයිස්සාමි ඉති යං පත්ථිතං කතං
තෙන මුත්තො'ස්මි සංසාරා හන්ද මොචෙමි පාණිනං.
තිණ්ණො'හං තාරයිස්සාමි ඉති යං පත්ථිතං කතං
තෙන තිණ්ණො'ස්මි සංසාරා හන්ද තාරෙමි පාණිනං-යි.

මෙ පමණකින් අපමහබෝසතානන්ගේ පූර්වප්‍රණිධිකථාව කියා නිමවනලදී·

—*—

ශත්‍රුන්තාප නම් රජව සසර කලකිරී බුදුබව පැතූ පරිදි කෙසේදයත්?·

ඒ මහසත් දෙව්ලොවින් චුතව අවුත් නැවත දඹදිව මේකලට බරණැස් නම් වූ එකලට සිරිමතී නම් නුවර බ්‍රහ්මදත්ත නම් රජහට පුත්ව ඉපද ශත්‍රුන්තාප නමින් ප්‍රසිද්ධව සියලුම දඹදිව වැසි රජදරුවන් විසින් පුදනලදුව දිවසිරි වැනි රජ්‍යශ්‍රී විඳිමින් වසනුවෝ

ඇත්කෙළියෙහි නියුක්තවූසෙසු ඇතුන් හා දළින්දළ අන්වා නි
රන්තරයෙන් ඇත්කෙළි කෙළින්නේය. එකල්හි එම නුවර වසන
එක්තරා වැද්දෙක් අඩ ගොස් වනාන්තරයෙහි ඇවිදිනේ එක්වි
ලක් අසල සිටි සර්වලක්ෂණසම්පන්නාවූ මහත් ඇත්රජකු දැක නුව
රට අවුත් එපවත් රජහට දැන්වීය, රජ ඒ අසා මහසෙනඟ පිරිව
රා තුමූම ගොස් ඇතු බඳවා නුවරට ගෙණවුත් සියලු ඇතරුවන්ට
ප්‍රධානවූ එක් හස්තාචාර්‍ය්‍යයෙකු කැඳවා එම්බා ආචාර්‍ය්‍යනි මීට සත්
වනදවස් මොහු පිටට පැනනැගී මා නුවර ප්‍රදක්ෂිණකොට නැ
කත්කෙළි කෙළනා පරිද්දෙන් මේ ඇතු සුශික්ෂිතකොට හික්ම
වා වහා ගේණවයි කියා ඇතු පාවාදුන්හ. ඒ යහපතැයි ගිවිස
එම සත්දවස ඇතුලතම ඇතු සුශික්ෂිතකොට හික්මවා ගෙණ
වුත් රජ්ජහට පාවාදීන. රජ ඇතා ඉතා සුවිනීතසේ දැක සතුටුව
රන්සැත් රන්පොරෝදු කුම්භාලඞ්කාර සොවැනි කර්ණමූලිකා කො
කවැල ගලමුතුමාලාදිවූ නොයෙක් හස්ත්‍යලඞ්කාරයෙන් ඇතු
සරහවා ඒ ඇතුපිටට පැනනැගී සිවුරඟ සෙනඟ සමඟින් නුවර
ප්‍රදක්ෂිණකොට ඇවිදිනේ ඊට පළමුවෙනි තුදුස්වක් දින රාත්‍රියෙහි
බොහෝ ඇත්සෙනඟ වලින් අවුත් උයනට වැද අඹ දඹ පොල්
පුවක් ආදී නොයෙක් වෘක්ෂජාතීන් සිඳ බිඳ හෙළා සුනුවිසුනු කොට
දිය සලා ඉලානි ලා උයන පාළුකොට ගියහයි යන මේ ප්‍රවෘත්තිය
උයන්ගොවුවාගෙන් අසා ඒ මහරජ ඇතුපිටින්ම උයනට ගොස්
ඇත්සෙනඟ කළ විප්‍රකාරය බලා ඇවිදිනාකල්හි මඟුලැත් ඇ
තින්නන්ගේ ශරීරගන්ධය ආඝ්‍රාණය කොට මද නැගී මත්ව ශරීරය
සොලවා පිට හුන් ඇතරුවා ඇද හෙලා ඇතින්නන් ගිය දසාවට
අභිමුඛව දිවන්නට වන, එකල රජ්ජුරුවෝ උඩ බලා වැදහොත්
ඒ ඇතරුවා දැක තුමූම අකුස්ස ගෙණ තමාගේ වැර පමණින්
කොට කොට ඇදත් ඇතු සිටුවා ගත නොහී මහසෙනඟ නොබ
ලාම ඇතුකෙරෙහි ලොභයෙන් නොහැරම ගොස් වනමධ්‍යයට
වන්කල්හි ජීවිතලොභයෙන් වෘක්ෂශාඛාවෙක එල්බ සිටගත්හ.
ඇතු සිතුලෙස දිවගොස් ඇතින්නන් හා මිශ්‍රභාවයට පැමිණියේ
ය එකල්හි මහසෙනඟ හස්තිපාදානුසාරයෙන් වලට ගොස් රු
කට නැගි හුන් රජ්ජුරුවන් පිරිවරාගෙණ පෙරලා නුවරට ම
වන්හ. නැවත රජ්ජුරුවෝ ප්‍රධාන ඇතරුවා කැඳවා නොසතුටුව
එම්බල හස්තාචාර්‍ය්‍යය තාවසින් දමනය නොකළ ඇතුපිටට මෙ
සේ මා නන්වන්ට කාරණ කිම්දැයි විචාළහ. එවිට හස්තාචාර්‍ය්‍යතෙම
කියනුයේ දෙවයන්වහන්ස මට සුක්ෂ්මාකළමැණව ඇත්රජ ඉතා
සුශික්ෂිතව මනාකොට දමුනේය යහපත් කුලයෙහි උපන් ඇතෙ
ක ඇතින්නන්ගේ ගන්ධරාගයෙන් මෙසේ විප්‍රකාරවූයේය එතකු

දුටුවත් දෙවයන්වහන්ස සොක නොකළමැණව ඒ භාසන්තෙම විශෙෂයෙන් විනීතය තමාගේ ජාතිය සිහිකොට නොබෝදවස කින් එන්නේය ඊට සැක නොසිතාවදාළමැණවැයි දැන්විය. ඒ අසා මඳක් මොලොක් සිත්ඇති රජ්ජුරුවෝ එසේවීනම් ආචාරීනි තොප මෙයින් බැහැර නොයව ඇත්රජ එසේ නොආයේවීනම් තොපගේ ජීවිතය ද නොසිතවයි කීහ. ඇත්රජ ඇතිනිමුල කරා ගොස් තමාගේ මනොරථය පූරාගැන්මෙන් සදවසක් එහි වැස සත්වනදවස අවුත් ඇත්හලම සිටගත. හස්තාචාරීතෙම එදවස් අලුයම ඇත්හලට ගොස් ඒ ඇතු දැක එපවත් රජහට දැන්විය. ඒ බස් ඇසූ රජ්ජුරුවෝ ඇත්හලට දිවගෙණ ගොස් ඉතාසානනා දනාලිලාවෙන් සිටි ඇත්රජු දැක ඔහුගේ හිස පිරිමැද මැද හස්තාචාර්‍ය්‍යයාහට කියන්නාහු ආචාරීනි මෙබඳු සුවිනීතවූ ඇත් රජ මාගේ බත් පමණකින් අකුස්සෙන් කොට කොටා අඳමින් යන ගමන වලකන්ට නොහැකිවූයේ කුමක්දැයි විචාළහ එවිට හස්තාචාර්‍ය්‍යතෙම දන්වනුයේ දෙවයන්වහන්ස කවර කාරණ යකින් මෙසේ වදාරණසේක්ද රාගය නම් අඞ්කුසයටත් වඩා අති තිඛණය ගින්නට ද වඩා උෂ්ණය නාගවිෂට වැඩි ඝොරවිෂයක එහෙයින් යන ගමන වලකන්ට නොහැකිවියයි දැන්විය රජ තෙම ඒ අසා දැන් කුමකින් ඒ ඇතු තුමූම නැවත ආයෙහිදැයි විචාළහ. හස්තාචාර්‍ය්‍යතෙම මාගේ මන්ත්‍රෞෂධබලයෙන් ආයේ යයි දැන්වූකල එසේවිනම් තාගේ මන්ත්‍රෞෂධබලය මට දක්වා ලවයි කී රජහට යහපත දෙවයන්වහන්සැයි කියා මහත්වූ ලොහ ගුලක් ගෙන්වා දිලියෙන ගිනිඅඟුරු සේ කඹුරන් ලවා රත්කරවා අඬුයෙන් ඒ යවටය ගෙණ තමාගේ මන්ත්‍රානුභාවය කියා හස්තා චාර්‍ය්‍යතෙම ඇතු කැඳවා කියනුයේ මහාගජේන්ද්‍රය මේ ලොහො ගුල ගණුව මම නැවත කියනතාක් කල් නොදමවයි කියා ඕහට දීන. ඇත්රජ සොඬ දිගුකොට දිලියෙන යවට ගෙණ තමාගේ සොඬ දදූ සිටි කල්හි දු හස්තාචාර්‍ය්‍යයාහට හයින් අත්නොහැර සිටියේය. මහරජ ඒ දැක ඇතු මියයෙයි යන භයින් දිලියෙන යවට දමවා අහෝ රාගය නම් ඉතා චණ්ඩය මහත් ඝොරය බොහෝ උපද්‍රව ඇත්තේය රාගය නිසාම මේ සියලු සත්‍වයෝ ම සංසාරසාගරයෙහි ම ගැලෙන්නාහ රාගය නිසා අවීචිනිර යෙහි ද එක්සිය අටවිසි උත්සදනරකවලද පැසෙන්නාහුය එසේම ප්‍රෙතලෝකයෙහි ද අනෙකප්‍රකාර තිරිසන්ජාතිවල ද උපදනා හුයයි කියා සසර කලකිරුණාවූ අපමහබෝසතානෝ:—

රාගාතුරෙතිමෙ සත්තා පිතා පුත්තම්පි ඝාතයී
පුත්තොපි පිතරං හන්ති මාතා හන්ති ධීතරං.

රාගාතුරෙතිමෙ සත්තා ධීතා මාරෙති මාතරං
භාතා ච භාතරං හන්ති භගිනි ඝාතෙති භාගිනිං.
රාගාතුරෙතිමෙ සත්තා සුඛං භායන්ති සබ්බදා
නස්සන්ති කුසලා ධම්මා සුගතිමග්ගං නිවාරයෙ.
රාගාතුරෙතිමෙ සත්තා ලොභදොසවසංගතා
වඩ්ඪන්ති භවසංසාරා අපායවිනිපාතිකා.

මේආදී නොයෙක් ගාථායෙන් නොයෙක් සසරදුක් ප්‍රකාශකොට තෙපි කීයේ සැබෑයයි සතුටුව හස්තාචාර්‍ය්‍යාට බොහෝ සම්පත් දී මෙසේවූ සසර දුක් විඳිනා සත්‍වයන් කෙසේනම් සසරින් මුදම්දෝ හෝයි පරීක්‍ෂාකොට බුද්ධකාරකධර්‍මයන් හැර අන්කිසි උපායක් නැත එහෙයින් බුදුබව ප්‍රාර්‍ත්‍ථනාකෙරෙම්යි සිතා:—

බුද්ධො’හං බොධයිස්සාමි මුත්තො’හං මොචයෙ පරෙ
තිණ්ණො’හං තාරයිස්සාමි සංසාරොඝා මහබ්භයාති-යි

යනාදීන් මනොප්‍රණිධානය කොට රාජ්‍යය හැර හිමාලවනයට ගොස් තාපසප්‍රව්‍රජ්‍යාවෙන් මහණව දිවිහිමියෙන් තපස් කොට ආයුකෙළවර දෙව්ලොව උපන්සේක.

මෙපමණකින් දෙවැනිවූ මනොප්‍රණිධානකථාව කියා නිමවනලදී

—×—

බ්‍රහ්මඍෂි නම් තාපසව ව්‍යාඝ්‍රධෙනුවට ශරීරමාංසය දීමෙන් බුදුබව ප්‍රාර්‍ත්‍ථනාකළ පරිදි කෙසේදයත?.

ඒ අපමහබෝසත්හු අතීත් අත්බැවක දෙව්ලොවින් චුතව මගධරට දුලිද්දිය නම් බමුණුගම නායකබමුණාගේ දෙවීන් කුස පිළිසිද දසමස් ඇවෑමෙන් බිහිව බ්‍රහ්මරාජයාගේ වර්ණය වැනි ඉතා යහපත්ව බැලූබැලූවන්ට ප්‍රියමනාපවූ ශරීරවර්ණයක් ඇති බැවින් බ්‍රහ්මකුමාරයයි තබනලද නම් ඇතිව වසන්නාවූ අන් කිසි කර්‍මයක් නොකොට බ්‍රාහ්මණශිල්ප නම් ලද වෙදත්‍රයෙහි අක්‍ෂර ලිඛිත ගණිත ගන්ධර්‍වාදිවූ අෂ්ටාදශ විද්‍යාස්ථානයෙහි ද ශ්‍රුතිය ස්මෘතිය ව්‍යාකරණය යනාදිවූ සූසැටකලාශිල්පයෙහි ද යන සියලු ශාස්ත්‍රයෙහි තමන් ප්‍රඥා මහත් බැවින් සොළොස්ඇවිරිදි වයස් අතුරෙහි නිෂ්ප්‍රාප්තියට පැමිණියාහ. එකල්හි ඒ මහතානන් සමීපයෙහි පන්සියයක් පමණ බමුණුකුමරුවෝ ත්‍රිවේදය ඉගෙණ නිමවූහ. ඉක්බිති ඒ මහතානෝ මවුපියන්ට කළමනා අන්පාමෙහෙ නිමිකල්හි තමන්ගේ අතවැසි වූ ඒ පන්සියයක් පමණ බමුණුකුමරුන් ලඟට කැඳවා සෙසු උගැන්වුවමනා ශිල්පශාස්ත්‍ර ද උගන්වා තමන් සන්තක සියලු ධනරාසිය ඔවුන්ට

භයෙක්‍ෂනාදක කොට දන්දී අවවාදකොට ගිහිගෙන් නික්ම හිමාලවනයට වැද තාපසප්‍රව්‍රජ්‍යාවෙන් පැවිදිව මෙකල ඒරක නම්වූ එකල මුණ්ඩ නම් පර්වතය සමීපයෙහි පන්සලෙක වෙසෙති. එකල බොහෝ කුලපුත්‍රයෝ බෝසතුන්කෙරෙහි පැවිදිව කසුනු පිරියම් ඉගෙණ තමතමන්ගේ සිතට සැපවූ විවේකස්ථානවල ඉඳ කසුනුපිරියම් කොට ධ්‍යාන උපදවා අප්‍රහීණධ්‍යානයෙන්ගොස් බ්‍රහ්මලොකයෙහි උපන්හ· බෝසතුන්ගේ අතවැසිවූ යට කියන ලද පන්සියයක් පමණ බමුණුකුමරුවෝ ද තමතමන්ගේ මවුපියන් ඇවෑමෙන් බෝසතුන් සමීපයට ගොස් මහණව පූර්සෙනහයෙන් බෝසතුන් අත්නොහැර වසන්නාහුය. ඔවුන්අතුරෙන් මතු බුදුවන මෛත්‍රෙයබෝසතානෝ ඒ ශිෂ්‍යයන්ට ප්‍රධානව අපමහබෝසතාණන්ට අග්‍රශිෂ්‍යවූහ. එකල්හි එක්දවසෙක මහබෝසතානෝ සෙසු තාපසයන් ඵලාඵල සොයා ඒ ඒ දිග ගියකල්හි ප්‍රධානශිෂ්‍යයන් හා සමග තුමූද ඵලාඵල පිණිස ඒ මුණ්ඩ නම් පර්වතයට නැගී එක්දසාවකින් පර්වතප්‍රාන්තය බැලූවාහුය. එහි දරුවන් වද තිපදවසක්. නිරාහාරයෙන් කෘෂශරීර ඇතිව ක්‍ෂුධාව ඉවසිය නොහී කලානතව තමා හා සමග කොළනා දරුපැටවුන් කනුකැමතිව රූ රූ යන හෙරව ශබ්ද කරමින් ඇස් දල්ව දල්වා කණ්යන් හා නගුට සළමින් ඔත්තාවූ ව්‍යාඝ්‍රධේනුව දක කරුණා උපදවා සසර කලකිරී අහෝ සංසාරය ඒකාන්තයෙන් නිරර්ථකය තමාගේ දිවි රක්නා පිණිස තමාගේ ලෙයෙන් උපන් දරුවන් කනුකැමතිවූවාය එහෙයින් මේ සංසාරයට නින්දාවෙවයි යනාදී වශයෙන් මහත්වූ ඛෙදයට පැමිණ ප්‍රධානශිෂ්‍යයානන් කැඳවා සබද තෙපි මේ වනයෙහි බලා ඇවිද සිංහව්‍යාඝ්‍රාදීන් විසින් මරණලද මාංසයක් දුට හොත් එහා ගෙණවුත් මේ ව්‍යාඝ්‍රධේනුවට දෙවයි කියා මෛත්‍රේබෝසතුන් නික්මුවා නැවත සිතනසේක් මාවිසින් නුසුදුස්සක් කරණලද්දේය අනිකකුගේ මාංස සම්පාදනයෙන් මට ප්‍රයොජන කිම්දැයි සිතා හැමලෙසින් භය උපදව සහිතවූ නිස්සාර අසූචිදුර්ගන්ධවූ කුණපයෙන් පිරුණාවූ නුවණැස්ඇති පණ්ඩිතපුරුෂයන් විසින් නින්දිතවූ ශරීර නමැති නුවර නම් නොයෙක් ජාතිභය හා බොහෝ [illegible] ඇත්තේය ජරාරෝගව්‍යාධි[illegible] ඇත්තේය ව්‍යාධි නැමති [illegible] වාසය මරණීන් මඩනාලද්දේය සොකසන්තාප බහුලය. හැඬිම් වැලපීම් දුක් දෙම්නස් උපායාස පීඩා භය යන මේ[illegible] සියලු දුකට වස්තුවූයේය රාග නාමති ඇත්තුල්ලන්ට වාසස්ථානය වෙෂ නැමති සර්පාවාස බිලශයක මෝහ නැමති [illegible] වාසස්ථානය ක්‍රොධ නැමති

රාගාසේවිතය වෙර නැමති ව්‍යාඝ්‍රවාසය වෙර බහුලය මනු
ගුණ නැමති කුම්භාණ්ඩසේවිතය ඊර්ෂ්‍යා නැමති සතුරන් විසින්
ගැවසීගත්තේය දුශ්චරිත නැමති දිය ණිකැතිවිම් ඇත්තේය
විෂමලොභය පෙරදැරිකොට ඇත්තේය නාඝිරාග මිගාගෙයාධ
වාසස්ථානය මිථ්‍යාධර්ම නැමති විනිශ්චය ඇත්තේය නිගුණ
නැමති දුර්ගන්ධය බහුලය නොයෙක් සිත්විලි නැමති මැස්සන්
විසින් ආකුලය මිදය ප්‍රමාදය සෙවුනේය දෘෂ්ටිනිස්සද බහුලය
අනුසය නැමති බමුණන්ට වාසස්ථානය සංයෝජන නැමති
මයඇමතියන් ඇත්තේය. මෙසේ නොයෙක් ආදීනව ඇති
සක්කායනගර නම්ලද මේ ශරීරයෙහි අවිද්‍යා නැමති අඥානය ප්‍ර
ධානව රජකරන්නේයයි මේ ආදි ක්‍රමයෙන් ශරීරස්වභාව සලකා
ජීවිතයද අසාරය සාරවිරහිතය ඉතාස්වල්පතරය බොහෝ දුක්
ඇත්තේය මරණය කෙළවරකොට ඇත්තේය තණඅග පිණිබිඳු
මෙන් දියබුබුළුමෙන් නස්නා ස්වභාව ඇත්තේයයි දැන ශිෂ්‍යයා එ
න ගමන බලමින් නැවත සිතනුවෝ මෙබඳු අනෙකප්‍රකාර දුක්
අනුභවකරණ සංසාරගත සත්‍වයන් කවර ධර්මයකින් ඒ දුකින්
ගලවම්දෝ හෝයි සිතනුවෝ පෙර පුරුදු වශයෙන් බුද්ධකාරක
ධර්මයන් දැක සිතන්නාහු කරන්ට ඉතාදුෂ්කරවූ දේ නොකොට හ
රින්ට දුෂ්කරවූ දේ නොහැර දෙන්ට උගහටවූ දේ නොදී ඉවසීම
දුෂ්කර දෑ නොඉවසා බුදුවීම නොහැක්ක, එහෙයින් මම බුදුබව
පිණිස නොයේක් ආදීනව ඇති වහා බිඳෙනසුළු මේ ශරීරය ආශ්‍රය
කොට පවත්නා ජීවිතය එක අරමුණෙක නොසිටිනේය එහෙයින්
මේ ළිපත් ශ්‍රද්ධාව ඇතිවීමට සියලු සතුන්ට හිත පිණිස සජීව ශරී
රය මේ ව්‍යාඝ්‍රධේනුවට දන්දෙම් අතික් බාහිරදානයෙන් කිම්දැයි සි
තා මේ මාගේ ජීවිතය සහිතවූ ශරීරදානකුශලයෙන් මතු බුදුව
සසරදුකින් සතුන් මුදම්හයි සිතින්ම බුදුබව ප්‍රාර්ථනාකොට සතු
ටුසිත් ඇතිව දෙවියන්ට පින්දෙන්නාහු:—

තස්ස මෙ අනුමොදන්තු උභො නාරදපබ්බතා
ඉන්දො ච බ්‍රහ්මා ච පජාපතී ච
සොමො යමො වෙස්සවණො ච රාජා.
සබ්බෙ දෙවා නුමොදන්තු යම්මං දුක්කරං කතං මයා.

යනාදීන් දෙවියන්ට පින් දී මාංස සොයා යැවූ ශිෂ්‍යයාගේ ආග
මනට පළමුවෙන්ම "මන්‍දුර" පර්වතමුදුනට නැගී සිට ව්‍යාඝ්‍රධේනු
ව ගේ අභිමුඛයට පිනූහ. එවිට ව්‍යාඝ්‍රධේනුතොමෝ පර්වතයමුදු
නෙන් හෙන්නාවූ බෝසතුන් දැක ඇගේ දරුපැටවුන් හැරදී බෝ

සතුන්ගේ ශරීරමාංසය අනුභවකළාය. එකෙණෙහි බෝසතාණන් වහන්සේ දෙව්ලොව උපන්සේක.

මෙ පමණකින් තුන්වැනිවූ මනොප්‍රණිධානකථාව
නියා නිමවනලදී.

---

එකල්හි පුරාණදීපඞ්කර නම් බුදුරජානන්වහන්සේ සොළසාසඞ්ඛ්‍යකල්පලක්‍ෂයක් පිරූ පාරමිතා ඇතිව එක් සාර නම්වූ කල්පයෙක අඹුදුව චම්පාකවතී නම් නුවර රජකුලයෙහි ඉපද දසදහසක් හවුරුදු ගිහිගෙයි වැස සතරපූර්වනිමිති දැක මහාභිනිෂ්ක්‍රමන් නික්ම මහණව සත්දවසක් ප්‍රධන්වීර්‍ය්‍යකොට බෝමැඩ අරා බුදුව දහම් නැමති රුවන්වර්ෂා වස්වමින් සත්වයන් සතුටුකරවා වසනා සේක. එකල්හි පශ්චිමදීපඞ්කරබෝසතාණෝ මහත් භොගසම්පත් ඇති බ්‍රාහ්මණකුලයෙහි ඉපද යෞවනඅවස්ථාවට පැමිණ ගිහිසම්පත් විඳිනාහු කාමයෙහි ආදීනව දැක ගිහිගෙන් නික්ම බුඬශාසනයෙහි මහණව පඤ්චාභිඥා අෂ්ටසමාපත්ති ලැබීව වසන්නාවූ ඒ බෝසත්භික්ෂූන්වහන්සේ එක්දවසෙක නොයෙක් ලක්‍ෂගණන් රහතන් පිරිවරණලද්දාවූ පුරාණදීපඞ්කර නම් බුදුරජානන්වහන්සේගේ සොභාමත්වූ ආනුභාවය දැක මම ද මතු මේ සර්වඥයන්වහන්සේ සේම ලොව්තුරාබුදුවීම් නම් යහපතැයි සිතා තමන්ගේ පාත්‍රය ගෙණ තෙල් සිහා ගෙණවුත් බුදුන් වැඩහිඳිනා ගඳකිළියෙහි සිවුදැහගදින් පිරිබඩගෙණ බුදුන් උදෙසා රාත්‍රිය මුළුල්ලෙහි නොයෙක් ලක්‍ෂගණන් පහන් පූජාකොට ඒ රාත්‍රිය පහන්වූ කල සියලු භික්‍ෂුසඞ්ඝයාවහන්සේ බුදුන්කරා වැඩිකල්හි නැවත සඞ්ඝයාවහන්සේට ද පහන්පූජාකොට බුදුන් සමීපයට එළඹ පසඟ පිහිටුවා වැඳ ශ්‍රීපාදමූලයෙහි බැසගෙව බුදුන්ට දිවි පූද ස්වාමීනි භාග්‍යවත් බුදුරජානන්වහන්ස යම්සේ නුඹ දැන් දීපඞ්කර නම් ලොවුතුරා බුදුව සියලු සත්වයන් සංසාරබන්ධනයෙන් මුදා සුවපත් කළසේක් ද එපරිද්දෙන් මම ද මේ පහන්පූජාවෙහි අනුසසින් හා නුඹවහන්සේට දිවි පිදුවාවූ මේ කුශලානුභාවයෙන් මතු දීපඞ්කර නම් ලොව්තුරා බුදුව සංසාරගත සත්වයන් එයින් ගොඩනගා නිවන් දක්වියහෙම්වයි ප්‍රාර්ථනා කළහ. එකල බුදුහු අනාගතඥානය පතුරුවා ඔවුන්ගේ ප්‍රාර්ථනාව සිඬවන සේ දැක භික්‍ෂූන්වහන්සේට ආමන්ත්‍රණයකොට එම්බා මහණෙනි ඊයේරෑ තුන් යම් රාත්‍රියෙහි පහන් පූජාකොට දැන් මට දිවි පුද හොත්නාවූ මේ මහණතෙමේ මතු මාසේම දීපඞ්කර නම් බුදුවෙයි යනාදින් විවරණදී වදාලසේක. මෙසේ විවරණ ලද්දාවූ ඒ දීපඞ්කර නම් මහ

බෝසතාණෝ එතැන් පටන් නිරන්තරයෙන් තෙල් සිඟා ගෙණ
වුත් බුදුන්ට පහන් පූජාකරන්නාහු දවසෙක නුවර මුළුල්ලෙහි
සිඟා තෙල් නොලැබ රජගෙට ගොසින් වන්හ. එසමයෙහි යට
කියනලද අපමහබෝසතාණෝ පෙරජාතියෙහි තමන් විසින් කර
ණලද අපරාපය්‍ය්‍යවේද්‍යවූ කිසි අකුශලකර්මබලයකින් දෙව්ලොවින්
චුතව ඒ පුරාණදීපඞ්කර නම් බුදුරජානන්වහන්සේට දෙබිසින්
නක්ම රජකුලෙහි ඉපද රජගෙයි සත්මහල්පායක මතුමාල්තෙ
ලෙහි හුන්නී තොවේලේ රජගෙට වඩනාවූ දීපඞ්කර නම්
මහබෝසතුන් දැක එක් දාසියක කැඳවා එම්බල තෙල එක්
භික්ෂුකෙණෙකුන්වහන්සේ රජගෙට වැඩිසේක නෝ උන්වහන්
සේ සම්පයට ගොසින් කුමක් පිණිස වැඩියේද හෝයි විචාරා
නියම දැන වහා අවුත් මට කියාලවයි කියා යවූහ. හොඳය යහ
පතැයි ගිවිස ගොස් වැඩිය කාරණ විචාරා පහන්තෙල් සිඟා
වැඩිබව අසා එපවත් රාජකුමාරිකාවන්ට දැන්වූවාය. රාජකුමා
රිකාවෝ එතෙපුල් අසමින්ම හිඳිනා ආසනයක් පනවා එහි
වැඩහුන් දීපඞ්කර නම් මහබෝසතුන්ගේ පතුල් සෝදවා තෙල්
ගල්වා පසග පිහිටුවා වැඳ ඉක්බිති ඝණරන්තලියෙක රන්වන්
පැහැඇති අබතෙල් පුරා තමන් හිසමුදුනෙහි තබාගෙණ මේ
කුශලානුභාවයෙන් සියලු සත්‍වයන්ට හිත පිණිස මාබැනන්ව
හන්සේ පරිද්දෙන්ම මමද මතු ලොවුතුරාබුදුවෙම්වයි මා බුදු
වෙන ජාතියෙහි මේ සිදුහතුතෙල නමින්ම "සිද්ධාර්ථ" නම් වෙවයි
කියා මෙසේ සිතින්ම ප්‍රාර්ථනා කොට තෙල්තලිය ගෙණවුත්
මහබෝසතුන්ගේ පාත්‍රයෙහි වත්කොට බෝසතුන්ට කියන්නාහු
ස්වාමීනි බුද්ධපූජාවට මේ සිදුහතුතෙල් දුන්නාවූ කුශලයෙන් මමද
මතු ලොවුතුරාබුදුවෙනු කැමැත්තෙම් මා බුදුවූ කල්හි මේ සිදු
හතුතෙල නමින්ම පුතාව සිද්ධාර්ථ නම් වනු කැමැත්තෙම් එබැ
වින් මේ තෙල් ගෙණ ගොස් පහන්පූජා කොට ඉක්බිති මා මෙසේ
ප්‍රාර්ථනාකළබව මා බැනන්වහන්සේට දැන්වූව මැනවයි කීහ.
දීපඞ්කර නම් මහබෝසතාණෝද යහපතැයි ගිවිස බුදුන් කරා
එළඹ පහන්පූජාකොට ඉක්බිති බුදුන් වැඳ ස්වාමීනි අද මේ පහන්
සියල්ලම තුඹවහන්සේගේ නැගනිවූ රාජකුමාරිකාවන් තමන් න
මින්ම පූජාකෙළෙම් ඒතුඹවහන්සේගේ නැගනියෝදසිදුහතුතෙල්
දුන්නාවූ කුශලානුභාවයෙන් මතු බුදුවෙනු කැමැත්තාහ. බුදුවූ
කල්හි එම සිදුහතුතෙල නමින්ම සිද්ධාර්ථ නම් වනු කැමැත්
තාහයි දැන්වූහ. එතෙපුල් අසමින්ම බුදුහු එම්බල මා නැගනියෝ
ස්ත්‍රීබැවිහි සිටි හෙයින් විවරණ ලැබීමට අයොග්‍යහයි. වදුරා ඊට
කාරණ කාවරේදැයි විචාළකල්හි එම්බල මහණ බුද්ධකාරකධර්ම

පූරණය නම් ඉතා දුෂ්කරය එබැවින් යම් කිසි කෙනෙක් දෘඪ වීර්‍ය්‍යඇතිව නොයෙක් කප් කෙළගණින් මුළුල්ලෙහි පාරමිතා පූරා බොහෝකාලයක් ප්‍රාර්ථනාකොට හෙවත් සප්තාසංඛ්‍යකප් ලක්ෂයක් මුළුල්ලෙහි මනෝවීර්‍ය්‍ය කොට නවාසංඛ්‍යකප්ලක්ෂයක් මුළුල්ලෙහි වාක්වීර්‍ය්‍ය කොට මෙසේ සොළසාසංඛ්‍යකප් ලක්ෂයක් ගියකල්හි අෂ්ටධර්මසමෝධානයෙන් යුක්තවූවාහු වීනම් එකල්හි විවරණ ලදහැක්කැයි වදාළසේක. ඒ අසා දීපඞ්කර නම් මහබෝසතානන්වහන්සේ එසේකල ස්වාමීනි තුඹවහන්සේගේ නැගනියෝ බුදුවෙම්වයි කළාවූ ප්‍රාර්ථනාව සිද්ධවේදෝ හෝයි විචාළකල්හි බුදුරජානන්වහන්සේ අතීතාංශඥානය මෙහෙයා යට ගියදවස තුන්ආත්මභාවයෙක නමත් සිහින් බුදුවෙම්වයි පැතූ බව දැක නැවත අනාගතාංශඥානය මෙහෙයා මතු බුද්ධකාරකධර්මයන් පූරා බුදුවන්ට සමර්ථබව දැක මෙයින් මතු සොළසාසංඛ්‍ය කප්ලක්ෂයක් ගියකල්හි සාරමණ්ඩ නම් කප තොප මාසේම දීපඞ්කර නම් බුදුවූකල මා නැගනියෝ ඒ තොපගෙන් නියතවූ සම්මුඛවිවරණ ලැබ එයින් සාරාසංඛ්‍යකප්ලක්ෂයක් ගියකල ලොවුතුරාබුදුවන්නෝයයි වදාළසේක. දීපඞ්කර මහබෝසතානෝ ඒ අසා සතුටුව වැද ප්‍රදක්ෂිණකොට ගියාහ. අපමහබෝසතානෝ ද එකල අබතෙල් දුන් කුශලානුභාවයෙන් ඒ ස්ත්‍රීභාවයෙන් මිදී තුසිතපුර නම් දෙව්ලොව උපන්හ.

මෙසේ තමන්වහන්සේගේ පූර්වචරිත සංඛ්‍යාත බාහිරනිදානය ප්‍රකාශකොට දෙව්මිනිසුන් සහිතවූ සියලු ලෝකයාහට කරණ ලද සද්ධර්මානුශාසනා ඇති හෙයින් අසහායනෙත්‍රවූ මාගේ බුදු රජ"ශාස්තෲ"නම් වනසේක.

එසේහෙයින් කියනලදී.

දෙවයක්ඛමනුස්සානං ලොකෙ අග්ගඵලං දදං
දදන්තං අමියනතානං පුරිසාජඤ්ඤ තෙ නමො—යි.

ලෝවැඩ පිණිස කරණලද මේ ශ්‍රීසද්ධර්මාවවාදසංග්‍රහයෙහි මෙතෙකින් බාහිරනිදානය කියා නිමවනලදී.

—✳—

මේ මහාභද්‍රකල්පයට කල්ප ලක්ෂයක් ඉතුරුකොට ඇති විසි අසංඛ්‍යයෙන් පළමුවන නන්ද නම් අසංඛ්‍යයෙහි වූ සියලු ගුණ ජනක. සාර නම් කල්පයෙහි ඊට පූර්වයෙන් අටාසංඛ්‍යකල්ප ලක්ෂයක් පිරූ පාරමිතා ඇතිව බුදුවූ බ්‍රහ්මදෙව නම් බුදුරජානන් වහන්සේ ධර්මචක්‍රදේශනාව පිණිස කරණ්ඩක නුවර සමීපයෙහි වූ සියලු බුදුවරයන් විසින් අවිජහිත ස්ථානයට වැඩසේක.

එකල්හි බ්‍රහ්මදෙව බුදුරජානන්වහන්සේගේ ශරීරශොභාවෙන්
සියලු නුවර දහසක් හිරමඬල එකවිට නැංගා සේ ශොභාමත්ව
බැබලිගියේය. එකල්හි යට කියනලද අපමහබෝසත්තෙම දිව්‍ය
මනුෂ්‍යලොකදෙක්හි සැරිසරා නොයෙක් සියදහස්ගණන් ජාති
වල අප්‍රමාණ සැප විඳිමින් වසනුවෝ එම නඳ නම් අසඞ්ඛ්‍ය
යෙහි වූ සාර කප දෙව්ලොවින් චුතව කරණ්ඩක නම් නුවර
රජකුලයෙහි ඉපද වැඩිවිය පැමිණ පියරජ ඇවෑමෙන් රාජ්‍යාභි
ෂේකප්‍රාප්තව අතිදෙව නම් රජව චක්‍රවර්තිලීලායෙන් රජකරණ
කල්හි ඒ රජහට මෛත්‍රීබෝසතානෝද සිරිගුත්ත නම් අමා
ත්‍යව අර්ථයෙන් ධර්මයෙන් අනුශාසනාකරන්නේවිය. ඒ අතිදෙව
නම් රජ එක්දවසක් උඩුමහල්තෙලෙහි ඇමතිගණ පිරිවරා
රාජසන්‍යමස්තකයෙහි හුන්කල්හි මුළුනුවර එකාලොකකරමින්
වඩනා ඒ බ්‍රහ්මදෙව නම් බුදුරජානන්වහන්සේ දැක පළමු තමන්
බුදුරුවක් නුදුටු හෙයින් මෙතෙම දෙවියෙක් දෝහෝ බඹෙක්
දෝහෝ යනාදි වශයෙන් සැක සිතා කිසිවක් නොදත කම්පිතව
රාජාසනයෙන් බස්නා කැමතිවූහ. ඒ දැක රජහට අභිමුඛව හුන්
සිරිගුත්ත නම් ඇමතිතෙම මේ කිමෙක් දෝ හෝයි සිවුමැඳිරි
කවුළුවෙන් පිටත බලා දෙතිස්මහාපුරුෂලක්ෂණයෙන් හා අසූ
අනුබ්‍යඤ්ජනයෙන් ශොභමාණව බ්‍යාමප්‍රභාමණ්ඩලයෙන් පිරිවර
ණලදුව කෙතුමාලාලඞ්කාරයෙන් අලඞ්කෘතව නීලපීතාදි සව
ණක් රැසින් දිලිහි දිලිහී වඩනා බුදුන් දැක ඊට පූර්වභාගයෙහි
බුදුන් ලොව පහළවූහයි තමන් ඇසූ හෙයිනුත් පෙර නොයෙක්
සියගණන් බුදුවරයන් දැක දානමානාදි වශයෙන් බොහෝ සත්
කාරකොට තමන් බුදුබව ප්‍රාර්ථනාකරමින් ආවාවූ කෘතාධිකාර
මහාපිණැති හෙයිනුත් පළමුවන දැක්මෙහි ම බුදුන්බව දැන වහා
හුනස්නෙන් නැගී රජහට අභිමුඛව සිට දකුණත ඔසවා මහරජ
භය නොවුව මැණව මේ එනුයේ අන්කිසි සත්වකෙනෙක් නො
වෙයි මේ සර්වඥවූ බුදුරජානන්වහන්සේයයි බුදුගුණ ප්‍රකාශකොට
කියන්නාහු:—

එසබුද්ධො මහාරාජ ලොකෙ උත්තමපුග්ගලො
සබ්බසත්තහිතත්ථාය ලොකෙ උප්පජ්ජි සො ජිනො.
අයඤ්ච ඛො මහාරාජ බ්‍රහ්මදෙවො තථාගතො
භාසයන්තො විථියා මජ්ඣෙ පස්සථෙතං පුනප්පුනං.

යනාදීන් මහරජ මේ ආශ්චර්යශ්‍රීමත් මනහර පෙළහරක් ඇති
මහාපුරුෂයානෝ නම් සියලු සත්වයන්ට හිත සැප පිණිස ලෝ
කයෙහි පහළවූ දෙවාතිදෙවවූ ශක්‍රාතිශක්‍රවූ බ්‍රහ්මාතිබ්‍රහ්මවූ

බ්‍රහ්මදෙව නම් බුදුරජානන්වහන්සේය. එබැවින් තිසි හයක් නොවූව මැණවසී රජ්ජුරුවන් අස්වසා ඉක්බිති බුදුන්ට වඩනා පින් කෙතක් ලොවැ නැතිබව හඟවනු පිණිස:—

සතං හත්ථී සතං අස්සා සතං අස්සතරීරථා
සතං කඤ්ඤාසහස්සානි ආමුත්තමණිකුණ්ඩලා
එකස්ස පදවීතිහාරස්ස කලං නාග්ඝන්ති සොළසිං-ති.

මේ ගාථාව බ්‍රහ්මදෙව නම් බුදුන් සමයෙහි සිරිගුත්ත නම් මේ ත්‍රිබෝසනානන් විසින් කියනලදී. එයින් බුද්ධාදි රත්නත්‍රයෙන් එකම් රත්නයක් උදෙසා තමා හුන්තැනින් නික්ම යාමෙන් සිද්ධවන පදවීතිහාරකුශලය ම ඉතා මහත්බව වර්ණනාකොට දක්වා මහ රජ වහා හුනස්නෙන් නැගී ඒ ලොකාග්‍රවූ බුදුන්ට පෙරගමන් නික්ම ගිය මැණවැසී කීහ. එබස් අසමින් ම අතිදෙව නම් රජවූ අප මහබෝසතානෝ ප්‍රීතිවෙගයෙන් මත්ව උඩුමහලෙන් බස්නා හිණිමන් ආදී විභාගය දැනගත නොහී මතුමහල්තෙලෙහි සිවූ මැදුරුකවුළුවෙන් බිමට පැන තමන්ගේ ශුද්ධාබලයෙන් මහපොළොව පලාගෙණ දහසක් පෙත්තෙත් ගැවසීගත්තාවූ රථසකක් පමණ මහපියුමක් නැගී තමාගේ පාපියුම් පිළිගත්කල්හි ඒ පියුමෙන් බැස පියවිගමනින් බුදුන් කරා ගොස් සමන්මලින් පුද නැවත සප්තරත්නමයවූ රුවන්මල් තුනකින් හා ප්‍රණීතවූ පිණ්ඩපාතයෙන් බුදුන් පුද පසඟපිහිටුවා වැඳ ප්‍රදක්ෂිණකොට පූර්වහෙතු සම්පත් ඇතිහෙයින් පළමුවෙනි දක්මෙහි ම බුදුවීමෙහි ආලය උපදවා යට කී පරිද්දෙන් සිතින් ම බුදුබව ප්‍රාර්ථනාකොට ඒ අතිදෙව නම් රජ තමාගේ උයන්හි ලක්ෂයක් විහාර පිරිවරකොට ඇති ගඳකිළියක් කරවා බුදුපාමොක් මහසඟනට පිළිගන්වා ඒ බ්‍රහ්මදෙව බුදුන් ප්‍රධානවූ ලක්ෂයක් භික්ෂූන්වහන්සේට සිව්පසදනය දීමෙන් බුදුවීමෙහි ආදර උපදවා ආයුෂකෙළවර දෙව්ලොව උපන්හ. සිරිගුත්ත නම් ඇමතිද දෙව්ලොව උපන. බ්‍රහ්මදෙව නම් බුදුරජද සියලු බුද්ධකෘත්‍යයන් නිමවා පිරිණිවිසේක.

ඒ බ්‍රහ්මදෙව බුදුරජානන්වහන්සේට ඉක්බිතිව එම පළමුවෙනි නන්ද නම් අසඞ්ඛ්‍යයෙහි ලොවැ පහළවූ පන්දහසක් පමණ බුදුවරයන් හා දෙවෙනිවූ සුනන්ද නම් අසඞ්ඛ්‍යයෙහි ලොවැ පහළවූ නවදහසක් පමණ බුදුවරයන් හා තුන්වන පෘථිවි නම් අසඞ්ඛ්‍යයෙහි ලොවැ පහළවූ දසදහසක් පමණ බුදුවරයන් හා සතරවන මණ්ඩ නම් අසඞ්ඛ්‍යයෙහි ලොවැ පහළවූ එකොළොස්දහසක් පමණ බුදුවරයන් හා පස්වන ධරණී නම් අසඞ්ඛ්‍යයෙහි ලොව පහළවූ විසිදහසක් පමණ බුදුවරයන් හා සවන සාර නම් අසඞ්ඛ්‍ය

යෙහි ලෝව පහළවූ තිස්දහසක් පමණ බුදුවරයන් හා සත්වන පුණ්ඩරීක නම් අසංඛ්‍යයෙහි ලොවෑ පහළවූ සතළිස්දහසක් පමණ බුදුවරයන් හා මෙසේ මේ සත්අසංඛ්‍යයෑතුළත ලොවඋපන් එක්ලක්‍ෂපස්විසිදහසක් පමණවූ සර්‍වඥවරයන් නොවරදවා දක එක්ලක්‍ෂපස්විසිදහසක් ජාතිවල පූර්‍වයෙහි ද මහපිණෑතිබැවින් හෙතුසම්පන්නව උපන් අපමහබෝසතාණෝ මම ද මෙසේම මතු බුදුවෙම්වයි සිතින්ම බුදුබව පතා මහදන්දී මනොප්‍රණිධානය මස්තකප්‍රාප්තකළසේක.

මෙම වදාරණලදමැයි සොළසාසතිමහානිදානයෙහි.

නන්දං සුනන්දං පඨවී මණ්ඩා ධරණී සාගරො
පුණ්ඩරීකො'ති මෙ සත්තඅසඞ්ඛෙය්‍ය පකාසිතා
මනසා පත්ථිතා මය්හං නිද්දිට්ඨා සඞ්ඛියා ඉමෙ.

තම්හි නන්දෙ අසඞ්ඛෙය්‍යෙ නගරෙ කරකණ්ඩකෙ
අතිදෙවො නාම නාමෙන රාජා හුත්වා මහබ්බලො.

අහං තෙන සමයෙන පාසාදපවරෙ ඨිතො
සිරිගුත්තො නාම නාමෙකො නිසින්නො පුරතො මම
උක්ඛිප්ප දක්ඛිනං බාහුං දස්සෙසි ලොකනායකං.

තස්ස ඨත්වා විචින්තෙසිං සුත්වා අස්ස සුභාසිතං
බුද්ධො බුද්ධො'ති චින්තෙත්වා තස්ස බුද්ධං විලොකයිං.

දිස්වා අහං බ්‍රහ්මදෙවං පුඤ්ඤවන්තං ජිතින්ද්‍රියං
පාසාද පාතයිත්වාන අත්තානං පඨවීතලෙ
මම සබ්බඤ්ඤුභාවෙන උට්ඨිතෙ පදුමමත්ථකෙ.

තතො'හං ඔතරිත්වාන අගමා යෙන චක්ඛුමා
පූජෙසිං ජාතිපුප්ඵෙහි තෙජවන්තං මහායසං.

කාරාපෙත්වා තිනිගුම්බරතනමාලාය පූජයිං
සත්තාරතනපුණ්ණෙහි පූජයිත්වා තථාගතං.

අභිවාදිත්වා බ්‍රහ්මදෙවං පඨමෙ දස්සනෙ අහං
තම්හි නන්දෙ අසඞ්ඛෙය්‍යෙ අධිකාරො මයා කතො.

පඤ්චබුද්ධසහස්සානං මහාදානං පවත්තයිං
සුනන්දම්හි අසඞ්ඛෙය්‍යෙ අධිකාරො මයා කතො
නවබුද්ධසහස්සානං මහාදානං පවත්තයිං.

මේ ආදී ක්‍රමයෙන් සත්අසංඛ්‍යකල්පලක්‍ෂයක් ඇතුළත ලොව පහළවූ එක්ලක්‍ෂපස්විසිදහසක් පමණවූ සියලු බුදුවරයන් නොවරදවා දක බුදුබව පතා මහදන් දී අපමහබෝසතාණෝ මනොප්‍රණිධානය මුදුන්පත්කළසේක.

මෙසේ තමන්වහන්සේගේ මනොප්‍රණිධානය ප්‍රකාශකොට
දෙව්මිනිසුන්ට කරණලද සද්ධර්මානුශාසනා ඇති මාගේ බුදුරජ
"ශාස්තෘ" නම් වනසේක.

එසේහෙයින් කියනලදී.

දෙවයක්ඛමනුස්සානං ලොකෙ අග්ගඵලං දදං
දදන්තං දමයන්තානං පුරිසාජඤ්ඤ තෙ නමො-ති.

මේ ශ්‍රී සද්ධර්මාවවාදසඞ්ග්‍රහයෙහි මෙතෙකින්
මහානිදානකථාව කියා නිමවනලදී:—

—◦◦—

මෙසේ පූරණලද මනොප්‍රණිධානය ඇති අපමහබෝසතාණෝ
නොයෙක් සියගණන් ශූන්‍යකල්පවල දිව්‍යමනුෂ්‍යලොක දෙක්හි
අප්‍රමාණවූ ශ්‍රීසම්පත් විඳ ඇවිදිනාහු එක්ජාතියෙක මිනිස්ලොව
ඉපද වැඩිවිය පැමින පූර්වහෙතුබලයෙන් බුදුබව පතා තාපසප්‍රව්‍රජ
වෙන් මහණව ප්‍රථමධ්‍යානය ප්‍රණීත වශයෙන් භාවනාකොට
පඤ්චාභිඥා අෂ්ටසමාපත්ති උපදවා නොපිරිහුණුධ්‍යානයෙන් ගොස්
එකාසඞ්ඛ්‍යකල්පයකට ආයුඇති මහාබ්‍රහ්ම නම් බඹලොව ඉපද
එහි ආයු පමණින් ධ්‍යානසැප විඳ වසනුවෝ මේ මහාභද්‍රකල්පයට
තෙළෙසාසඞ්ඛ්‍යකප්ලක්ෂයකින් යට වාප්‍රණිධානයට පටන්ගත්කා
ල පළමුවන සර්වභද්‍ර නම් අසඞ්ඛ්‍යයෙහි බුදුවර සතරදෙනකුන්ව
හන්සේගෙන් ප්‍රතිපණ්ඩිතවූ සාරමණ්ඩ නම් කල්පයෙහි දඹදිව
ධඤ්ඤවතී නම් නුවර රාජවංශයෙහි උපන්හ. එකල ඔවුන්ට නම්
තබන්නාහු සාගරකුමාරයයි නම් තැබූහ. ඒ සාගරකුමාරතෙම පි
යරජ ඇවෑමෙන් රජපැමිණ දශරාජධර්මයෙන් රජකරණුයේ පු
රොහිත බ්‍රාහ්මණයෙකු විසින් උගන්වනලද දශවිධවූ ශක්විතිවත්
පූරා නිමිකල චක්‍රරත්නාදී සප්තවිධ රත්නයන් ලදින් සාගර නම්
චක්‍රවර්තිරජව මේ මුළු සක්වළට අධිපතිව චක්‍රවර්තිරාජ්‍යය කර
ණකල්හි සොළසාසඞ්ඛ්‍යකප්ලක්ෂයක් පිරූ පාරමිතා ඇති පූරාණ
ගෞතම නම් බුදුරජානන්වහන්සේ එම සර්වභද්‍ර නම් අසඞ්ඛ්‍යයෙහි
වූ සාරමණ්ඩ නම් කප දඹදිව මධ්‍යමණ්ඩලයෙහි සිරිනිවාස නම්
නුවර යසනිවාස නම් රජහු නිසා විමලා නම් මහදෙවින් කුස පිළි
සිඳ දසමස් ඇවෑමෙන් බිහිව ක්‍රමයෙන් වැඩිවිය පැමිණ පන්දහ
සක් හවුරුදු ගිහිගෙයි වැස සතරපූර්වනිමිති දැක මහබිනික්මන්
නික්ම අඩමසක් මහාවීර්‍ය්‍ය කොට බොධිකාය්‍යඞ්කාරූඪව මරසෙ
නහ බිඳ බුදුව සත්සති යවා බ්‍රහ්මාරාධනාවෙන් ධර්මචක්‍රය දෙසූ
කල්හි ඒ ධර්මචක්‍රානුභාවයෙන් දසදහසක්සක්ළ හා මේ මහාපො
ළොව කම්පාවිය මෙරගල්නැමීම හා නොයෙක් ආශ්චර්‍ය්‍ය පහළවූ

වාහුය. මේ මහාපෘථිවියගේ කම්පාවීමෙන් කියනලද සාගර නම් චක්‍රවර්ත්තිරජ්ජුරුවන්ගේ චක්‍රරත්නය පිහිටි ස්ථානයෙන් බැස මදක් පාත්විය. ඒකාරණය විමසනු පිණිස ඇමැතිවරු සවිරවූ මහත් සාරටැම් දෙකක් දෙපාර්ශ්වයෙහි හිඳුවා එහි හූ දෙකක් බැඳ එක්සූත්‍රයෙක් චක්‍රරත්නය මස්තකයෙන්ද එක්සූත්‍රයෙක් යටින්ද බැඳ චක්‍රරත්නය මැදිකොට තබති. එහෙයින් පොළොව කම්පාවීම ඇතිකල්හි චක්‍රරත්නයද අහස තුබූතැනින් චංචලව මදක් බැස ටැම් දෙකටද හූ දෙකටද පාත්ව සිටියේය. ඒ චක්‍රරත්නය පිදීමෙහි නියුක්ත පිරිවරජනයෝ ඒ කාරණය දැක රජහට දැන්වූහෙයින් රජ ඒ බලා කලකිරුණු සිත් ඇතිව පරීක්ෂාකරණුවෝ රාජමහාමාත්‍යාදී සියලු ලොවැසියන් විසින් නිරන්තරයෙන් පුදනලද මේ චක්‍රරත්නය දුන්තුබූ තැනින් පහවීමට කාරණ කිම්දෝ හෝ මාගේ ජීවිතයට අන්තරායෙක් වත් රාජ්‍යයට අන්තරායෙක් වත් වේදෝ හෝයි සිතා නිමිත්තපාඨකයන් අතින් විචාලතැන මහරජ්ජුරුවන්ගේ චුතවීමෙන් හෝ මහණවීමෙන් හෝ තථාගතවූ සම්බුද්ධවරයන්ගේ බුදුවීමෙන්හෝ චක්‍රරත්නය නිශේෂාභාව තුබූ තැනින් කම්පාවීමෙන් අතුරුදන්වන්නේය දැන් මේ ලෝකයෙහි බුදුන්උපන්හෙයින් ඒ බුද්ධානුභාවයෙන් කම්පාවිය එයින් නුඹවහන්සේට අනික් අන්තරායෙක් නැත මහරජ ගෞතම නම් ශාක්‍යබුදුකෙනෙකුන්වහන්සේ මේ ලොකයෙහි උපන්සේක ඒ බුදුරජානන්වහන්සේගේ මෙසේවූ කල්‍යාණවූ උතුම් කීර්තිශබ්දයෙක් කෙළලක්ෂයක් සක්වළ එකහෙලා පැතිර ගොස් උස්ව පැනනැංගේයයි "ඉතිපි සො භගවා අරහං සම්මාසම්බුද්ධො"යනාදී ක්‍රමයෙන් නොයෙක් බුදුගුණ වර්ණනාකළකල්හි රජතෙම බුදුනැයි යන නම ඇසූ පමණින් පස්වණක් ප්‍රීතීන් පිනාගිය ශරීර ඇතිව නැවතත් තෙපි බුදුනැයි කියන්නෙහි දැයි විචාරා අපි බුදුනැයි කියම්හයි දන්වනලදුව මෙසේ තුන්විටෙකම විචාරා දැන ඒ භාග්‍යවතුන්වහන්සේ දැන් කොහි වසනසේක්දැයි විචාළාවූ රජහට දන්වන්නාවූ එක් නුවනැති නිමිත්තපාඨකයෙක් උතුරුසළුව ඒකාංශකොට ගෙණ එකල බුදුන් වසන මිගාචීර උයන යම් දිශාභාගයෙක්හිද ඒ දිශාභාගයට පසඟ පිහිටුවා වැඳ නැගී දෙහොත් මුදුන්දී සිට බොහෝ දෙනාට ඇසෙනසේ මහත්කොට අඬගා කියනුයේ.

එසබුද්ධො මහාරාජ ලොකනාථො අනුත්තරො
ලොකෙ ච අසමො ජෙට්ඨො මහෙසී අග්ගපුග්ගලො.

සබ්බඤ්ඤූ බුද්ධා භගවා සක්‍යමුනීති විස්සුතො
නිස්සායිමං ධඤ්ඤවතිං මිගාචීරවනෙ වසීති.

යනාදී බුදුගුණ ප්‍රකාශකොට මහරජ ඒ ලෝකස්වාමීවූ සම්‍යක් සම්බුද්ධවූ ගෞතම නම් ශාක්‍යබුද්ධයූ දූන් මෙම ධඤ්ඤවතී නුවර නිසා මිගාචිරවන නම් උයන්හි වැඩවසනසේක්යැයි දූත්වූ කල්හි එබස් ඇසූ සාගර නම් ඒ චක්‍රවර්තිරජ මහත්වූ සන්තොෂයෙන් ජන පිනා ප්‍රීතින් පිරිගියා ශරීර ඇතිව එම්විට නොයෙක් යාලගණන් සුවඳමල් සුවඳසුණු අිපවූපාදීවූ බොහෝ පූජාභාණ්ඩයන් ගෙන්වාගෙණ සතිස්යොදනෙක පැතිර සිටි මහසෙනඟ සමගින් නුවරින් නික්ම ගොසින් මිගාචීර නම් උයනට වැද බුදුරුවට සලකුණුවූ දෙතිස්මහාපුරුෂලක්‍ෂණයෙන් හා අසූඅනුව්‍යඤ්ජනයන් හා බ්‍යාමප්‍රභාකෙතුමාලාලඞ්කාරයෙන් විරාජමානවූ ආත්මභාවයක් ඇතිව ස්වර්ණගිරිගුහාචාරයක හුන්නාවූ කෙසරසිංහරාජයෙකු මෙන් ද උදුගිරිමුදුන්පත් බාලසූර්‍ය්‍යයා මෙන්දඅලඞ්කෘතවූ බුද්ධාසනමස්තකයෙහි සවර්ණක්රැසින් දිලිහි දිලිහී වැඩහුන් බුදුන් දූන ඉතා විෂ්මයපත්ව අම්ගැල්ලක ගැලෙන්නාසේ සවර්ණක්රශ්මිමාලාවන් පිහිරාගෙණ බුදුන්කරා ගොස් තමා උපන් ජාතිය සඵලකෙරෙමින් පසහප්හිටුවා වැඳ අනොපම්වූ බුද්ධශ්‍රී බලබලා සිත උපන් ප්‍රීතිවෙගයෙ උතුරුවා කියන්නාහු:—

සුදිට්ඨං වත මෙ දිට්ඨං පස්සිතබ්බංව පස්සිනං
සඵලං ජීවිතං මය්හං යං පස්සාමි තථාගතං.

න තෙ සමො කොචි මනුස්සලොකෙ
සමො'පි තෙ නත්ථි ච දෙවලොකෙ
සදිසො'පි තෙ නත්ථි ච බ්‍රහ්මලොකෙ
තමෙව නාථං අසමං නමාමි.

යනාදීන් බුදුන්ගේ තුන්ලෙව්හි පතල නවඅරහාදී ගුණසමූහයන් අරභයා නොයෙක්ලෙසින් සතුතිකොට සුවඳින් ඉලින් බුදුන් පුදා දෙලොස්යොදනෙක පැතිර සිටිනා තුර්‍ය්‍යසෙනාවක් හා පස්විසියොදනෙක පැතිර සිටිනා බ්‍රාහ්මණමණ්ඩලයක් හා අටසාලිස්යොදනෙක පැතිර සිටිනා අමාත්‍යමණ්ඩලයක් හා අනූයොදනෙක රත්කොත ගෙණ සිටිනා යොධමණ්ඩලයක් හා පන්සියයක් යොදනෙක පැතිර සිටිනා මහාපණ්ඩිතමණ්ඩලයක් හා මෙසාමහත්පිරිසින් පිරිවරණලදුව දිලිහි දිලිහී චක්‍රවාටය වටකෙරෙමින් මහමෙර සිකාරා ගමන්ගත් චන්ද්‍රරත්නය සේ බුදුන් සිකාරා ප්‍රදක්ෂිණකොට පසහපිහිටුවා වැඳ අවසර ගෙණ නුවරට අවුත්

දෙව්තාවන් ලවා හිමාලවනයෙන් වර්ණගන්ධසම්පන්නවූ රත්හඳුන්හර ගෙන්වාගෙණ තුන්සතරපස්මහල්ආදිවූ ප්‍රභෙද ඇති රත්නාච්ඡන්නමයවූ ප්‍රාසාද ලක්ෂයෙක කූටාගාර ලක්ෂයෙක රාත්‍රිස්ථාන ලක්ෂයෙක දිවාස්ථාන ලක්ෂයෙක සක්මන්මළු ලක්ෂයෙක මණ්ඩප ලක්ෂයෙක ජන්තාඝර ලක්ෂයෙක භොජනසාලා ලක්ෂයෙක ගිනිහල්ගෙවල් ලක්ෂයෙක යනාදිවශයෙන් වහසල් දෙරටු පැන්පල් ආදිවූ සියල්ලම මාහැඟිකොට රත්හඳුන්හරින්ම කරවා විහාරවට සුරක්ෂිතකොට පවුරුපදනම් බදවා චාර යොදූ සඞ්ඝයාවහන්සේට කප්පියභාණ්ඩයන් සදවා සියලු විහාරකර්මාන්තය නිමිකල විහාරය හා රාජභවනය සතිනවූ මුළුනුවර සර්වාලඞ්කාරයෙන් අනූනව සරහා ක්‍රමවමින් සන්ස්යොදනෙක පැතිර සිටි මහසෙනග සමගින් බුදුන්කරා එළඹ පසඟ පිහිටුවා වැඳ නැගිසිට මුදුනෙහි ඇඳිලිබැඳ ස්වාමිවූ බුදුරජානන්වහන්ස තුඹවහන්සේ උදෙසා මාවිසින් විහාරයක් කරවණලද මාකෙරෙහි අනුකම්පායෙන් වැඩ දූන් ඒ විහාරය පිළිගනම්‍ැනවැයි ආරාධනාකොට මුළුලොව උතුරුවා යන පරිද්දෙන් මහත් පූජොත්සව කරවමින් බුදුන් වඩාගෙණවුත් විහාරය පිළිගන්වා ප්‍රණීතවූ නොයෙක් කනබොනදෑ ආදියෙන් බුදුන් වළඳවා නොයෙක් රත්නයෙන් බුදුන්ට පූජාකොට බුදුන්ගේ ශ්‍රීපාදමූලයෙහි බැසහෙව වැඳ දෙහොත් මුදුන්දී පළමුවෙනි වාක්භෙද ප්‍රාර්ථනාව කරණ අපඞ්ගබෝසතානන්වහන්සේ "ස්වාමිනි බුදුරජානන්වහන්ස තුඹවහන්සේ යම් සේ දූන් ශාක්‍යවංශයෙහි ඉපද ගෞතම නම් බුදුවූසේක්ද එසේම මම ද මේ කළාවූ කුශලයෙන්මතු ශාක්‍යවංශයෙහි ඉපද ගෞතම නම් බුදුවෙම්මැයි" කියා මෙසේ වචීප්‍රාර්ථනාව කළසේක.

එකල්හි පුරාණගෞතම බුදුරජානන්වහන්සේ බුද්ධකාරක ධර්මයන් පුරා බුදුවීම ඉතා දුෂ්කරතියාව නොයෙක් උපමාවෙන් දක්වා වදාරා එව්බල මහරජ බුද්ධකාරකධර්මයන් පිරීම නම් ඉතා දුෂ්කරය ඉදින් බුදුවනුකැමැත්තෙහි වී නම් අධිකතර වීර්‍ය්‍ය ඇතිව අනෙකප්‍රකාරවූ දුෂ්කරක්‍රියා කොට අෂ්ටධර්මසමොධානයෙන් යෙදී නියතවූ විවරණශ්‍රී ලදින් දානාදී දශපාරමිතාධර්මයන් අඛණ්ඩකොට රක්ෂාකළෝ නම් මාසේම මතු ලොවුතුරාබුදුවන්නාවේදැයි යනාදීන් මෙසේ අනියතවිවරණක් දුන්හ.

මෙසේ ඒ බුදුන්ගෙන් අනියත විවරණ පමණක් ලදින් එදවස්ම ලැබෙන බුදුබවක් සේ මහත්වූ සන්තොෂයට පැමිණියාවූ මහබෝසතානෝ සප්තවිධ රත්නයන් හා සියලු ම චක්‍රවර්තිසම්පත්තිය බුදුන්ට පූද සසුන් වැද මහණව ධ්‍යාන උපදවා බ්‍රහ්මලොකයෙහි උපන්හ.

මෙසේ ජාතියෙන් ජාතියෙහි සසර සැරිසරා ඇවිදිනාවූ අපමහ බෝසතානෝ තවද එම සර්වභද්‍ර නම් අසඞ්ඛ්‍යයෙහි ලොව පහළවූ පනස්දහසක් පමණ බුදුවරයන් හා දෙවන සර්වඵුල්ල නම් අසඞ්ඛ්‍යයෙහි ලොව පහළවූ අසූදහසක් පමණ බුදුවරයන් හා තුන්වන සර්වරත්න නම් අසඞ්ඛ්‍යයෙහි ලොව පහළවූ අනූදහසක් පමණ බුදුවරයන් හා සතරවන උසභක්ඛන්ධක නම් අසඞ්ඛ්‍යයෙහි ලොව පහළවූ හැත්තෑදහසක් පමණ බුදුවරයන් හා පස්වන මණිභද්‍ර නම් අසඞ්ඛ්‍යයෙහි ලොව පහළවූ සැටදහසක් පමණ බුදුවරයන් හා සවන පදුම නම් අසඞ්ඛ්‍යයෙහි ලොව පහළවූ විසිදහසක් පමණ බුදුවරයන් හා සත්වන උසභ නම් අසඞ්ඛ්‍යයෙහි ලොව පහළවූ දසදහසක් පමණ බුදුවරයන් හා අටවන ඛන්ධක නම් අසඞ්ඛ්‍යයෙහි ලොව පහළවූ පන්දහසක් පමණ බුදුවරයන් හා නවවන සර්වශෛල නම් අසඞ්ඛ්‍යයෙහි ලොව පහළවූ දෙදහසක් පමණ බුදුවරයන් හා මෙසේ මේ නවඅසඞ්ඛ්‍යය ඇතුළත ලොව පහළවූ තුන්ලක්ෂ අසූසත්දහසක් පමණ බුදුවරයන් දැක බුදුබව පතා අපමණ වස්තු පරිත්‍යාගයෙන් මහදන් පවත්වා වාක්ප්‍රණිධානය මස්තකප්‍රාප්තකළහ.

මෙම වදාරණලදමැයි බුදුන් විසින්:—

සබ්බභද්දො ච පුප්ඵලො ච රතනොසභක්ඛන්ධකො
මණිභද්දො ච පදුමො උසභො ඛන්ධකමෙව ච.

සබ්බසෙලො අසඞ්ඛ්‍යෙය නවමොති පවුච්චති
වචසා පත්ථිතා මය්හං තිද්දිට්ඨා සඞ්ඛියා ඉමෙ.

තෙසු නවඅසඞ්ඛෙය්‍යසු ජාතා ලොකහිතෙකතො
තීණිසතසහස්සානි සත්තාසීතිසහස්ස ච.

එත්තකානං මහෙසීනං වචසා පත්ථෙනෙ තදා
දානෙන මෙ සමො නත්ථි එසා මෙ දානපාරමී-යි.

මෙසේ අප්මහබෝසතානෝ යට කියනලද ක්‍රමයෙන් මනොප්‍රණිධානය පිරීමෙන් සත්අසඞ්ඛ්‍යයක් හා වාක්ප්‍රණිධානය පිරීමෙන් නවඅසඞ්ඛ්‍යයක් හා යන මේ සොළසාසඞ්ඛ්‍යයක් ඇතුළත ලොව පහළවූ පස්ලක්ෂදෙලොස්දහසක් පමණවූ බුදුවරයන් දැක බොහෝ පින් රැස්කෙරෙමින් මනොවචීප්‍රණිධානයන්ගේ මස්තකප්‍රාප්තව බුද්ධකාරකධර්මයන් සොයා සසර ඇවිදිනාහු එයින් මැතභාගයෙහි මේ මහාභද්‍රකල්පයට සාරාසඞ්ඛ්‍යකප්ලක්ෂයකින් යට බුදුවර සතරදෙනෙකුන්වහන්සේගෙන් ප්‍රතිමණ්ඩිතවූ සාරමණ්ඩ නම් එක් කල්පයෙක් විය, ඒ කල්පයෙහි තණ්හඞ්කරය මෙධඞ්කරය සරණඞ්කරය දීපඞ්කරය යි සතර බුදුවරකෙනෙක් වූහ,

එයින් සොළසාසඞ්ඛ්‍යකල්පලක්‍ෂයක් පිරූ පාරමිතා ඇතිව දඹදිව පුෂ්පවතී නම් නුවර සුනන්ද නම් රජහු නිසා සුනන්දා නම් බිසව කුස පිළිසිඳගෙණ එකෙණෙහි පැවිදිවීමෙහි සිත් උපන් හෙයින් බිසව එපවත් රජහට දන්වා එතැන්පටන් අත්‍යන්තප්‍රසිද්ධ බ්‍රහ්මචය්‍ය්‍යාව රැක්කිරීමෙන් දසමස් පිරුණුකල මව්කුසින් බිහිව වැඩිවිය පැමිණ දසදහසක් අවුරුදු ගිහිගෙයි වැස අත්යානින් මහාභිණික්මන් නික්ම සතියක් ප්‍රධන්වීය්‍ය්‍යකොට රුක්අත්තන බෝමුල්හි වැඩහිඳ බුදුව අවුරුදු ලක්‍ෂයක් ආසිරි වළඳා වැඩහුන් තණ්හඞ්කර බුදුන් සමයෙහි අපමහබෝසත්තානෝ සුරිඳුවතී නුවර සුදස්‍සන නම් චක්‍රවර්තිරජව දිවසිරිවැනි රජසිරි විඳිනුවෝ බුඩානුභාවයෙන් චක්‍රරත්නය පසුබැස සිටි හෙයින් බුඩානුභාව මහත්සේ දැන සිව්රඟසෙනග සමගින් චක්‍රරත්නය කරා ගොස් දණ්ඩනමස්කාරයෙන් වැඳ මාගේ පින්බෙලෙන් උපන් චක්‍රරත්නය යථාස්ථානයෙහි පිහිටාවා චක්‍රරත්නය නුඹගේ ආනුභාවයෙන් මාගේ චිත්තප්‍රසාද වශයෙන් බුදුන්ට සත්කාරකොට රාජ්‍යය පූදා පැවිදිවෙම්ද ඒ තාක් කල් බැලුවමැනවැයි යාඥාව චක්‍රරත්නයට ආරාධනාකොට යථාස්ථානයෙහි තබාගෙණ අනුයොදුන් පමණ වට ඇති මහපිරිස් පිරිවරා බුදුන් වඩනා පෙරමගට ගොස් පසඟ පිහිටුවා වැඳ ආරාධනාකොට චක්‍රරත්නානුභාවයෙන් තුන්ගව් පමණ වූ සත්රුවන් මණ්ඩපයක් මවා සර්වාලඞ්කාරයෙන් අලඞ්කෘතකොට බුඩාසනය පටන් සඞ්ඝනවකාසනය දක්වා යථාක්‍රමයෙන් මහානර්ඝවූ ආසන පනවා එහි වඩාහිඳුවනලද සාරලක්‍ෂයක් පමණවූ බුදුපාමොක් මහසඟනට සතියක් මහදන් දී අනියතවූ විවරණශ්‍රී ලදුන් සමුද්‍රය පය්‍ය්‍යන්තවූ සතරමහද්වීපචක්‍රවර්තිරාජ්‍යය බුදුපාමොක් මහසඟනට සිව්පසය පිණිස දන්දී දඹදිව අසූසාරදහසක් මහාවිහාර කරවා අසූසාරදහසක් රජුන් හා සමග බුදුසස්නෙහි පැවිදිව පිටකත්‍රධාරීව අවිහිම්යෙන් ගතපච්චාගතවත් පුරා සමථවිදර්ශනා දෙක්හි යෙදී වාසයකොට දෙව්ලොව උපන්හ.

තවද එම කප දෙවන අනන්තඃකල්පයෙහි අටාසඞ්ඛ්‍යකල්පලක්‍ෂයක් පිරූ පාරමිතා ඇතිව දඹදිව මෙඛලා නුවර සුදෙව නම් රජහු නිසා යසොධරා නම් අගබිසව කුස පිළිසිඳ බිහිව වැඩිවිය පැමිණ අටදහසක් අවුරුදු ගිහිසැප විඳ මහාබිනික්මන් නික්ම මහණව අඩමසක් ප්‍රධන්වීය්‍ය්‍යකොට රත්කැලබෝමුල්හි වැඩහිඳ බුදුව අසූදහසක් අවුරුදු ආසිරිවළඳා ලෝවැඩ වැඩූ මේධඞ්කර බුදුරජානන් සමයෙහි අපමහබෝසත්තානෝ සොමනස්‍ස නම් නුවර බමුණුමහසල්කුලයෙහි ඉපද සොමනස්‍ස නමින් ප්‍රසිඩව වෙදත්‍රයෙහි පාරප්‍රාප්තව ජනපදචාරිකාවෙන් එනුවරට පැමිණි මේධඞ්කර

බුදුන් දක තුමූ බුද්ධමන්ත්‍රයෙහි දක්‍ෂබැවින් නිසැකින්ම බුදුහුයයි දැන ආදර උපදවා සරණය ගෙණ ආරාධනාකොට සාරලක්‍ෂයක් භික්‍ෂූන් හා බුදුපාමොක් මහසඟනට මහදන් දී තිස්දහසක් මහවිහාර කරවා පිළිගන්වා සසුන් වැද මහණව පිටකත්‍රධාරීව ප්‍රතිපත්තිපූජාවෙනුදු පුද ඒ බුදුන් සමීපයෙන් අනියතවූ විවරණශ්‍රී ලැබ ස්වර්ගයෙහි උපන්හ.

නවද එම කප තුන්වන අනන්තකල්පයෙහි අටාසඞ්ඛ්‍යකල්පලක්‍ෂයක් පිරූ පාරමිතා ඇතිව විපුල නම් නුවර සුමඞ්ගල නම් රජහු නිසා යසවතී නම් අගබිසව කුස ඉපද වැඩිවිය පැමිණ සත්දහසක් හවුරුදු ගිහිසැප විඳ ඇත්වාහනයකින් මහබිණික්මන් නික්ම මහණව මසක් ප්‍රධන්විර්‍ය්‍යකොට පුලිලබෝමුල්හි වැඩහිඳ බුදුව සැත්තෑදහසක් හවුරුදු මුළුල්ලෙහි ආසිරිවළඳ ලෝවැඩකළ සරණංකර බුදුරජානන්වහන්සේගේ සමයෙහිදු අපමහබෝසතානෝ සුනන්දවතී නම් බමුණුගම අපරිමිතවූ කෙළගණන් ධනසම්පත්තීන් සම්බන්ධවූ බමුණුකුලයක ඉපද යස මහත්බැවින් යසවත්නාය යන නමින් ප්‍රසිද්ධව වසනුවෝ පන්සියයක් මාණවකයන් පිරිවරා ගොස් තමන් වසන ගමට සාරලක්‍ෂයක් පමණ භික්‍ෂුසඞ්ඝයාවහන්සේත් පිරිවරා වැඩි ඒ සරණංකර නම් බුදුන් දක ඉතා සතුටුව සියලු බුදුපාමොක් මහසඟනට උතුම් මධුරවූ ක්‍ෂීරපායාසය වළඳවා ආරාධනාකොට සත්රුවණින් මාහැඟි විහාර කරවා පිළිගන්වා වස්තුන්මසද කළමනා සියලු උපස්ථාන කෙරෙමින් ඔබගෙනුදු අනියතවිවරණශ්‍රී ලදින් ගිහිගෙයි ආලය හැර මහණව පඤ්චාභිඥ අෂ්ටසමාපත්ති උපදවා ආයුකෙළවර බ්‍රහ්මලොකයෙහි උපන්හ.

නවද එම සාරමණ්ඩ නම් කප සතරවන අනන්තකල්පයෙහි අවුරුදු ලක්‍ෂයකට ආයුබැස සිටිකල දඹදිව සර්වසම්පත්තීන් සම්බන්ධවූ ශක්‍රපුරය මෙන් ශොභාමත් මහත් අමරවතී නම් නුවරක් විය. එනුවර වට ශත්‍රුප්‍රතිබාහණය පිණිස කරණලද තිස්රියන් උස ඇති මනොසිලාවර්ණ ප්‍රාකාරයෙහි අතුරු නැතිව අමරය යන නාමක් ඇති මත්‍ස්‍යරූපවලින් අලංකෘතව ගැවසීගත්බැවින් එනුවර අමරවතී නම් විය. එසමයෙහි අපමහබෝසතානෝ සර්වසත්තනට සරණවූ සරණංකර බුදුන් දවස බඹලොව උපන් තැන්පටන් බුද්ධාන්තරයක් මුළුල්ලෙහි දෙව්මිනිස්සැප විඳ දීපංකර බුදුන් ලොව ඉපදීමට පළමුවෙන් ම අමරවතී නුවර නොයෙක් කෙළගණන් වස්තුවෙන් ආඪ්‍යවූ බ්‍රාහ්මණමහාසාරකුලයෙහි ඉපද පණ්ඩිතබලක්‍ෂණවූ ප්‍රඥාසම්පන්නතායෙන් සුමෙධපණ්ඩිත යන නමින් ප්‍රසිද්ධව වැඩිවිය පැමිණ තමන්ගේ පිතෘවූ ආනන්ද නම් අග්‍රපුරොහිතබමුණා විසින් ද මාතෘවූ වසී නම් බැමිණිය විසින් ද මෙහෙයනලදුව

ශිල්ප උගන්නා පිණිස කහවනු දහසක් ගෙණ තක්සලානුවරට ගොස් දිශාප්‍රමුඛාචාරීන්ගෙන් වෙදත්‍රය සහිත සියලු ශිල්පයන් අසා නොබෝකලකින් නිමවා ඉගෙණ ගුරුන් වැඳ අවසර ගෙණ තමන්ගේ නුවරට අවුත් දෙමව්පියන්ට ශිල්ප දක්වා සතුටුවූ දෙමව්පියන් විසින් කුටුම්බසණ්ඨාපනය කරණලදුව බොහෝ සියගණන් මාණවකයන්ට මන්ත්‍ර හදුරමින් ගෘහවාසයෙහි වසනුවෝ මව්පිය දෙදෙනම්ය පරලොව ගියකල්හි ඔවුන්ගේ ශරීර ආදහණකරවා හිස්සොධානහා සියලු ධනයප්ලිපදිනුයේ භාණ්ඩාගාරිකයන් විසින් ස්වාමීනි තුඹවහන්සේගේ මාතෘපිතෘ සන්තක රත්නගබඩා බැලුව මැනවැයි දන්වූකල්හි සුමෙධපණ්ඩිත සුවඳවිලවුන් ඇඟ ගල්වා සර්වාභරණවිභූෂිතව රුවන්ගබඩා බලනු පිණිස නික්ම යනුයේ භාණ්ඩාගාරිකයන් විසින් රත්න පිරු රුවන්ගබඩා ක්‍රමයෙන් දෙරටු හැර මාතෘපිතෘවංශානුගත සියලු භොගසම්පත් පළමු ලියමන් හා විභාග වශයෙන් දක්වනලදුව සුමෙධපණ්ඩිතතෙම භාණ්ඩාගාරිකයන් කැඳවා දරුව මේ මේ සම්පත් රැස්කළාහු දන් කොයි ගියෝදැයි විචාරණලදුව මිය පරලොව ගියාහුයයි දන්වූකල තුමකින් තමතමා රැස්කළ සම්පත් නොගෙණ ගියාහුදැයි විචාරා ස්වාමීනි නිමෙක්ද ලෝකයෙහි මේ කාරණය මවිසින් පෙර නොඅසනලද මේ සියලු භොගයෝ හැර යානුතුම්ය මිය පරලොව යනකල යටත්පිරිසෙයින් අඩස්සක් තණකොන්දක් පමණ ඉතාමදදෙයක්වත් මෙයින් ගෙණ යාමෙක් නැත සම්පත් ගෙණ යාම තබා තමාගේ ශරීරය නමුත් ගෙණ යාමෙක් නැත තමතමා කොට ගත් කර්මයම එකව යන්නේයයි දන්වූකල්හි සුමෙධපණ්ඩිතතෙම කලකිරුණු සිත ඇතිව කියනුයේ නිමෙක්ද දරුව මාවිසිනුදු ඔවුන් ගිය මාර්ගයෙන්ම යාම යුතුවේදැයි විචාරණලදුව ස්වාමීනි මේ කාරණය සියලු සත්වයන්ගේ ම ස්වභාවධර්මයයි දන්වූකල්හි සුමෙධපණ්ඩිතතෙම තමන් මහත් නුවනැති හෙයින් එකාන්තයෙන් උපන් සත්වයා විසින් මියයායුතුයයි දැන සසර කලකිරී අහෝ මම් සසරගත සියලු සත්වයෝ අවිද්‍යාන්ධකාරයෙහි ම ඇවිද්නාහුය භවාභවාදයෙන් මූර්ජාව ත්‍රිවිධ දුක් අනුභවකිරීමෙන් කෙලෙස්නැමති කටුයෙන් නැවසීගෙණ මිථ්‍යාදෘෂ්ටි නැමති ලතාගහණ අතුලෙහි බැඳි දුශ්චරිත නැමති ඩැහැලේබොන මැස්සන්ගෙන් බාධිතව මාන නැමති කණුයෙන් ගැවසීගත් වෙන වෙන උපමා කියත් නොගෙවෙන මහත් දුක් නොයෙක් ආදීනව ඇති සංසාරකාන්තාරයෙහි තමහට පිහිට සෙවීමක් නැතිව ම ඔබිනොබ ඇවිදිනාහුය මම වනාහි මේ අන්ධබාල හිතාහිත නොදන්නා නුවණ මද සත්වයන් මෙන් හිතාහිත සෙවීමක් නොව සසර ආලය

බැඳගෙණ නො හැසිරෙමි එහෙයින් මම් තමහට පිහිට සොයමින් හැසිරෙමියි සිතා එම කල්පයෙහිම බුදුවූ තණ්හඞ්කරාදී තුන්බුදුවර යන් කාලයෙහි දසසුන් වැද මහණව භාවනායෙහි යෙදී වඩා ගත් නුවණින් යෙදී ගෘහවාසයට හිත හැකිල මහණවීමට අභි මුඛව දිවන සිත් ඇති හෙයින් හෙතෙම සියලු සසරදුක නිවනැ යි යන දෙයක් ඇතිබව නොයෙක් උපමා කාරණ සැලකීමෙන් දැන මේ සංසාරයෙහි සත්වයාගේ විසීම නම් යොදනක් පලල ඇති මහදූලක් කටියෙහි බැඳගෙණ තුන්යොදුන් පමණවූ මහත් ක ණකගහණ ගෙවා යාම නොහැක්කා සේ ඉතා මහත් පලිබොධ ඇත්තේය එහෙයින් ගෘහවාසයෙහි වසන්නාවූ මාවිසින් එබඳු සං සාරදුඃඛයාගේ අන්තයට පැමිණීම නොපිළිවන පැවිදිවෙස් ගෙණ පිළිවනැයි දැන නොයෙක් උපමායෙන් ගිහිගෙන් නික්ම යෑම නි ශ්‍රිතවූ අභිප්‍රාය සලකා අපරිමිතවූ භොගස්කන්ධය හැර පැවිදිවනු කැමතිවූ ඒ සුමෙධපණ්ඩිතයන්වහන්සේට මෙසේවූ සිතිවිල්ලෙක් උපන මේ ධනය නම් සත්වයාගේ ලොභ උපදනා බැවින් මදවූ සතුන්ට අනර්ථකරන්නේය මාගේ වූ කලී අපරිමිතවූ මහත් සම්පත්තියෙක රජදරුවන්විසින් ද කැමතිවියයුතු දෙයක් අන්‍යවූ මදසම්පත් ඇත්තාවුන්ගේ චිත්තප්‍රවෘත්තිය කියනුම්කවරේද මම එසේ වූ මේ සම්පත් සෙස්සවුන්ට පරිත්‍යාග නොකොට වනයට ගියෙම් වීම් නම් අනර්ථකරය එහෙයින් මම රජ්ජුරුවන් විචාරා අඥවූ ද දිළිඳුවූ ද වස්තුයෙන් ප්‍රයොජන ඇති සියල්ලවුන්ට පරි ත්‍යාගකොට යෙමියි නියමකොටගෙණ රජ්ජුරුවන් කරා ගොස් දන්වන්නාහු මහරජ මාගේ ගෙයි අනන්තවූ ධනසම්පත් ඇත්තාහු ය මුහුදුවෙරල වැලි මෙන් නිමාවක් දක්නට නොහැක්ක සියලු දවස්හි ම මුහුදදිය මෙන් සියලු භාණ්ඩාගාරයෝ පිරී සිටිනාහ ඒ සියල්ල දෙවයන්වහන්ස නුඹවහන්සේ පිළිපැදවදාළ මැනව න මත්ගේ රාජපුරුෂයන් යවා ගෙන්වුව මැනව නොහොත් සියල්ල ලේකම්බලා ප්‍රත්‍යවෙක්ෂාකොට එහිම තැබුව මැනවැයි දැන්වූහ. ඒ අසා මහරජ තියනුයේ සුමෙධපණ්ඩිතයෙනි තෙපි කුමක්කරන් නෙහිදැයි විචාළතැන මහරජ මාවිසින් කාමයෙහි ආදීනව ද මහ ණවීමෙහි ආනිශංසද විශෙෂයෙන් දක්නාලද්දේය ඒ මම සියලු පළිබොධයන් සිඳ පැවිදිවනු කැමැත්තෙමියි දැන්වූහ. එකල්හි රජ සිතනුයේ මොහුගේ පිතෘවූ ආනන්ද නම් පුරොහිතබමුණු නැ සී ගියකල්හි මාවිසින් පටිසන්ථාර නොකරණලද්දේය එසේ හෙ යින් මෙතෙම දෞර්මනස්ව සියලු සම්පත් පරිත්‍යාගකොට පැවිදිවීම කැමතිවූයෙහිය එහෙයින් මම මොහුට වඩ වඩා සම්පත් දීමෙන් සන්තර්පණය කරවම් සිතා තියනුයේ සුමෙධපණ්ඩිතය පණ්ඩිතයෝ

නම් අපරාධ ඉවසීමෙන් පණ්ඩිතයයි කියනුලැබෙයි පණ්ඩිතයනු ඹගේ පියානන් දිව්‍යබවට පැමිණි කල නුඹට මම පටිසන්ථාරනො කළ කාරණයෙන් දොම්නස්වූයෙහි යයි මම හඟිමි තොපට සත්කාර නොකරණු කැමතිව නොකෙළෙමි නොවෙමි නුඹ පියානන් නැතිකලෙක පියානන් සන්තක පුරෝහිත තනතුර නුඹටම දෙමි සිතා කල් බලා සිටියෙමි දැන් වනාහි පුරෝහිත තනතුර හා පිත්‍ර සන්තකවූ සියලු ද්‍රව්‍යසම්පත් පිළිපැද්දෑනවැයි කීහ. ඒ ඇසූ සුමේධපණ්ඩිතතෙම මහරජ ධනයෙන් හෝ යසතනතුරෙකින් හෝ මට කටයුත්තෙක් නැත මේ සියල්ල අනවරාග්‍ර සංසාරයෙහි දුටු විඳිමි නොවින්ද විරූ නුදුටු විරූ නිරාමිෂ නිවන්සැප දක්නාකැමැත්තෙමි එහෙයින් මම ප්‍රව්‍රජ්‍යාවට කැමැත්තෙමියි දැන්වූකල්හි මහරජතෙම නැවත කියනුයේ සුමේධපණ්ඩිතය තොප කැමති පරිද්දෙන් සර්වලක්ෂණසම්පන්න නාටකස්ත්‍රීන් හා අන්‍යවූ ධන සම්පත් අනූනව දෙමි නුඹ මට අවවාදකරමින් මෙහිම වසව එසේ නොව මට අනාථ නොකරවයි කියා නොයෙක් ලෙසින් යාඥාකලහ.

ඉක්බිත්තෙන් සුමේධපණ්ඩිතතෙම කියනුයේ මහරජ මේ සියලු සත්වයන්ගේ ජීවිතය අනිත්‍යය විදුලියක් දියබුබුලක් මෙන් අස්ථිරය එහෙයින් අනිත්‍ය නොවන නිර්වාණධර්මය ම උතුම තොපට අවවාදකරන්ට මම නොහැක්කෙමි මෙහි තොප හා කථාසල්ලාප කිරීම ද මට ප්‍රමාදයක් මෙන් වැටහෙන්නේය කුතුස් නොව මාගේ ඒ ධනය ගෙන්වා ගතමැනව මම පැවිදිවෙමියි කීහ. මහරජ ඒ අසා පණ්ඩිතය තෙපි තමාගේ ධනය පිළිකුල්ව කෙළ පිඩක් මෙන් හැර පැවිදිවන්නෙහිය එසේ දැමියයුතු ධනය පිළිපැදීම මට සුදුසු නොවෙයි තෙපි තමන්ගේ සම්පත කැමතිසේ ප්‍රයෝජන ඇත්තවුන්ට දෙවයි කීහ. එවිට පණ්ඩිතතෙම කියනුයේ මහරජ එසේවී නම් තොපට ද අපට ද මේ ධනයෙන් ප්‍රයෝජන නැත අර්ථීන්ට දෙමිහ එහෙයින් මහරජ යාචකයෝ රැස්වන සේ මුළු නුවර බෙර ලැව්ව මැනවැයි කියා එසේ බෙරලවා රැස්වූ යාචකසමූහයාට සුමේධපණ්ඩිතයන්වහන්සේ භාණ්ඩාගාරයන් දොර හරවා පැමිණි පැමිණි යාචකයන්ගේ භාජන පුරා වස්තු දෙමින් සතියක් මුළුල්ලෙහි මහදන් පවත්වා එකරුවන්ගබඩාවෙක තුබූ රුවන් පමණ වත් නොනිමි හෙයින් ඒ දැක මෙසේ සත්දවසක් මුළුල්ලෙහි මහදන් දීමෙනුදු මේ එක රුවන්ගබඩාවෙක් පිරූ රුවන් නොනිමිකල අනිකුත් මාගේ දොළොස්දහස්පන්සියයක් පමණවූ රුවන්ගබඩාවල පුරා තිබෙන රත්න රාශිය මේ නියායෙන් දන්දී කවර දවසෙක නිමාවට යේද එසේ කල් යවා මෙහි ප්‍රමාද

විම මට නුසුදුසු ය. එහෙයින් මම ඒතාක් සියලු භාණ්ඩාගාරවල යතුරු මුද්‍රා පුරමැද තබා යමෙකුට ධනයෙන් ප්‍රයොජන ඇත් නම් හෙතෙම සිත්සේ ගැරගණිවා සියලු ධනය මාවිසින් දෙනලද් දේමයයි කියා නැවතත් එසේම බෙර ලවා රජ්ජුරුවන් කරා ගොස් තමාගේ සියලු දාසිදාසයන් හා නෑයගෑතියන්ට සිත්සේ සම්පත්දී ඔවුනොවුන් නිසා පැවති සිලුය ලියමත් විනාසකොට දාසිදාසයන් නිදහස්කොට නෑසමූහයාට අවවාද දී ගිනිගත් ගේකින් නික්ම යන්නකු මෙන් ගිහිගේ නමැති බන්ධනාගාරයෙහි අපෙක්ෂාවක් නැතිවම ශත්‍රුමර්දනගතවගත් භීරුකාපුරුෂයෙකු මෙන් වස්තුකා ම ක්ලේශකාම දෙක හැර අමරවතී නුවරින් නික්ම ගොස් තමන් සිත්සේ හිමාලවනයට වැද වනගහණ කඳුරැලි බලමින් උඩුගඟට යනුයේ ගහ කරකැවී ගිය තැන නෛෂ්ක්‍රම්‍යාභිරතව ඍෂිප්‍රව්‍රජ්ජා වෙන් පැවිදිවන බොධිසත්වවරයන්ගේ කුශලධර්මාභිවෘද්ධියට ස්ථා නවූ හෙයින් ධාර්මිකය යන නමින් ප්‍රසිද්ධවූ එක් පර්වතයක් විය ඒ ධාර්මික පර්වතයට සමීපවූ ඡායාඋදකපුෂ්පඵලපල්ලවාඞ්කුරයෙන් සමලඞ්කෘතවූ සුභ්‍රවර්ණ මටසිළුටු වැලිතලා ඇති භූමිභාගයෙහි ශක්‍රදෙවේන්ද්‍ර නියොගයෙන් විශ්වකර්මදිව්‍යපුත්‍රයා විසින් මව නලද ශ්‍රමණසාරූප්‍ය ගුණ අටකින් සමුපෙතව හිඳිනාලද සිං හාකාරවූ ගර්භාවාසච්ඡිද්‍රසම්බාධණාදී අනෙකප්‍රකාරවූ තවුස් පිරිකර රාත්‍රිස්ථාන දිවාස්ථාන සහිත පඤ්චදොෂයකින් දුරුව පඤ්චානිශංසයකින් යුක්තවූ පළල දෙරියන්හමාරක් හා දිග සැට රියන් පමණ ඇති සක්මණක් සහිතවූ පන්සලක් මවා යම් කිසි ප්‍රව්‍රජිතයෙකුට මෙයින් යම් උපකරණයකින් ප්‍රයොජන ඇත්නම් කුතුහ නොව පරිභොගකෙරෙවා මේ හැම දෙනලද්දේමයයි කියා භිත්තියෙහි අකුරු පහිටුවා තබූ ඒ පන්සලට පැමිණ කිසි සේත් පැවිදිකෙනෙකුන් නොදක දෙර හැර විමසා බලනුයේ භිත්තියෙහි අකුරු දක කියා සුමෙධපණ්ඩිතයන්වහන්සේ සතුටුව ගිහිවෙසවූ නවදෙෂයකින් යුත් සාටක යුගලය හැර ප්‍රව්‍රජිතයන්ට අනුරූපවූ දෙලොස් ගුණයකින් යුත් වැහැරිසිවුර හැඳ අනොදූමල්වණ්වූ කාසාවස්ත්‍රයක් පොරවා දෙබමල් වැනි සියුම් පූප් ඇති අඳුන්දිවිස මක් එකාංශකොට ගෙණ තුන්වකක් ඇති ඛාර්කාජය හා තවුස් පිරිකරද ගෙණ සිනිඳුවූ වට කාෂ්ඨසාරමය දික් සැරයටියක් දකුණ තින් ගෙණ පන්සලින් නික්ම සැටරියන් සක්මණෙහි සක්මන් කෙරෙමින් තමන් ගත් ප්‍රව්‍රජ්‍යවෙශය බලා ඉතා තුටුපහටු සිත් ඇතිව "අහො සුඛං අහො පරමසුඛං" යනුයෙන් උදන් අනා සු මෙධතාපසයන්වහන්සේ ප්‍රීතිවාක්‍ය පවත්වා තමන්වහන්සේ න මන්ට අවවාදකරණයේක් සුමේධපණ්ඩිතය නාවිසින් තාපසප්‍රව්‍ර

ජව ලබන්ලදුව එහෙයින් අද තාගේ මනොරථය පිරිගියේය ගෘහවාස නැමති සිරගෙන් මිදිගියෙහිය නිර්වාණඵලය උපදනා වි වෙකසැප·දෙන වනවාසයට පැමිණියෙහිය ඒ මම දැන් අකුසීතව මාර්ගඵලය උපදවාගැන්මට උත්සාහකෙරෙමි සිතා බාරිකාජය එක්පසෙක තබා සක්මණ ගර්මධ්‍යයෙහි මුංචන් ගල්පුවරුවපිට අභීතකෙසරසිංහරාජයෙකු මෙන් නිර්භීතව හිඳ සවස්වේලෙහි පන්සලට වැද යහන්හි සිංහසෙය්‍යාකොට අලුයම නැගී තමාගේ ආගමනය සිතනසේක් මම ගෘහවාස පළිබොධය සිඳ විවෙක කාම තිව වනයට පැණියෙමි තණ්හාදී අකුශල විතර්ක නැමති මැස්සෝ මා එනුබඳනාහූය එහෙයින් දේවනිර්මිතවූ මේ පන්සල විසීමත් දෙවැනි ගිහිගෙයක විසීමක් වන්නැයි සිතා දොෂ අටකින් ගැවසී ගත් පන්සල හැර දශගුණයකින් සමන්විතවූ වෘක්ෂමූලය අනුසස් සේ දැක හෙතෙම දෙවෙනිදා උදෑසන ගොදුරුගමට එළැඹ භි ක්ෂාටණය කොට එහි මිනිසුන් දුන් භික්ෂාව එහිම හිඳ වළඳා නැ වත එම ආශ්‍රමයට ගොස් රුක්මුලකට පැමිණ අටතපස් අතුරෙන් අති අල්පේච්ඡවූ උත්කෘෂ්ටවූ වීර්ය්‍ය තමන්ට ඇති බැවින් තුමූම නටු යෙන් ගිලිහී ගිය පතුඵල ආහාරකොට ඇති තාපසප්‍රව්‍රජ්‍යාව සමාදන් ව නිරන්තරයෙන් අනිත්‍ය දුඃඛ අනාත්ම යන ලක්ෂණයන් සිහිකිරී මෙන් සෙය්‍යාව හැර හිඳීම් සිටීම් සක්මන්කිරීම් යන ත්‍රිවිධවූ ඉරියව් පැවැත්වීමෙන් සත්දවස ඇතුළතම පඤ්චාභිඥා අෂ්ටසමාපත්තිඋපද වාගෙණ අහසින් ගොස් මහදඹරුකෙන් දඹඵල ගෙණවුත් මහ ජනමධ්‍යගතව වළඳා උතුරුකුරුද්වීපයනට ගොස් එහි දිවාවිහාර කොට සඳමඬල පිටාටුකොට හිඳ එයින් බැස පොළොව කිමිද ගොස් මෙරමුදුනට නැගී සිටිනාහ. ලෝවැසි සත්වයෝ ඒ. ප්‍රාතිහාර්ය්‍යී දැක මෙතෙම අභිත්සම්‍යක්සම්බුද්ධවූ බ්‍රහ්මරාජයයි සිතූහ. ඒ සුමෙධ තාපසයන්වහන්සේද මහජනසමූහයාට ධර්මකථායෙන් මෙලෝ පරලෝ දක්වා කුශලධර්මයෙහි සිත් සමාදන්කරවීමෙන් ත්ක්ෂණවතාසේ ප්‍රශංසාකරණසේක් අවවාදකරණසේක.

එසමයෙහි සොළසාසඞ්ඛ්‍යකල්පලක්ෂයක් පිරූ පාරමිතා ඇතිව දඹදිව රම්මවතී නුවර සුදෙව මහරජහු නියා සුමෙධා නම් අගබිසව කුස පිළිසිඳ දසඑකාඩමස් ඇවෑමෙන් මව්කුසින් බිහිව ක්‍රමයෙන් වැඩිවිය පැමිණ දසදහසක් අවුරුදු සුරඟනන් බඳු වරඟනන් පිරිවරා දිවසැප වැනි රජසැප විඳ සත්‍රින් ලක්ෂයකට ප්‍රධානවූ පියුම් නම් අගබිසව කුසින් උසභක්ඛන්ධ නම් පුත්රුවන වැදූ ද අසූසාරදහසක් ඇතුන් පිරිවරකොට ඇති මඟුලැත්වාහණයකින් මහබිණික්මන් නික්ම ගොස් කෙළක් පුරුෂයන් හා සමග මහණව

දසමසක් ප්‍රධන්වීර්‍ය්‍යකොට වෙසගමැදීපොහොද මහණගණ පිරිවරා එක්තරා ප්‍රත්‍යන්තනුවරකට පිඬු සිඟා වැඩ දෙවතාකෙනෙකුන්ට පිළියෙලකළ කිරිබතක් පිළිගෙණ තමන්වහන්සේට පැමිණි කොටස්හි දෙවතාවන් විසින් දිවඔජස් බහාළැකල්හි එකුන්පණස් පිඩක් කොට වළඳා නිල්තරා ගංතෙර සුපිපි සල්උයන්හි දහවල්දවස් යවා සවස්වේලෙහි සල්වෙනෙන් එකලාව නික්ම ගොස් සුනන්‍ද නම් ආජීවකයා දුන් හීතණ අටමිටක් ගෙණ පුලිල බොධිය කරා ගොස් හීතණ සලා හෙලා පණස්රියන් වජ්‍රාසනාරූඪව අනුරියන් බෝකඳට පිටලා ත්‍රිසන්ධිපර්‍ය්‍යඞ්කය බැඳ චතුරඞ්ගවීර්‍ය්‍යාධිෂ්ඨානයෙන් වැඩහිඳ මාරබල විධ්වංශනයකොට තාම්බ්‍රවර්‍ණ අරුණොදයෙහි සර්‍වඥතාඥනයට පැමිණ සත්සති යවා බ්‍රහ්මාරාධනාව පිළිගෙණ සුනන්‍දාරාමයෙහි දී ධර්‍මචක්‍රදෙශනාව වදාරා කෙළසියයක් දෙව්මිනිසුන් අධිගම ප්‍රාප්තකොට කෙළක් පමණ භික්ෂූන් රහත්ඵලයට පමුණුවා එහිභික්ෂුභාවයෙන් පැවිදිකොට සුමඞ්ගලය තිස්සය යන අග්‍රශ්‍රාවක දෙනමක් හා නන්‍දාය සුනන්‍දාය යන අග්‍රශ්‍රාවිකා යුගමයක් ඇතිව සාගර නම් භික්ෂුකෙනෙකුන්ගෙන් උපස්ථාන ලදින් සාරලක්‍ෂයක් පමණ මහරහතන් පිරිවරා අවුරුදු ලක්‍ෂයක් ආසිරි වළඳා ලෝවැඩකළ දීපඞ්කර බුදුරජානන්වහන්සේ ද මහාමණ්ඩලයෙහි දනව්සැරිසරා වඩනාසේක් රම්‍යගම්නුවරය යන ප්‍රත්‍යන්තනුවර සමීපයෙහි සුදර්‍ශන මහවිහාරයට පැමිණිකල්හි එනුවර වාසී මිනිස්සු බුදුන් වඩනාබව අසා පෙරගමන් ගොස් සතුටුසොම්නස්ව බුදුන් ප්‍රමුඛවූ සාරලක්‍ෂයක් භික්ෂූන්වහන්සේලාට ආරාධනාකොට දනවස්තු පිළියෙළකරමින් නුවරමධ්‍යයෙහි මහත් මණ්ඩපයක් කොට නිල්මහනෙල්මලින් සොයා ලදපස්මල් ඉස උඩුවියන් බඳවා සුවඳමල්දම් එල්වා අතිකුදු නොයෙක් පූජොපකරණ රැස්කොට ඉක්බිති කැති උදළු කුඩා යවුල් ආදිය ගෙණ ගොස් මාර්‍ගය විෂමතැන් සමකරමින් තොරන් නගමින් පුන්කලස් තබමින් ධජපතාක නන්වමින් සුදුවැලි ඉසිමින් සාධු සාධු කියමින් වැඩිමහත් සතුටින් පිණපිණා මග සරසන්ට පටන්ගත්හ.

එකල්හි යට කියලද ක්‍රමයෙන් පැවිදිව හිමාලයෙහි වසන සුමෙධ තාපසයන්වහන්සේ ඒ දීපඞ්කර මහබෝසතානෝ මවුකුස ඉපදීමෙහි ද නික්මීමෙහි ද බුදුවීමෙහි ද ධර්‍මචක්‍රය දෙසීමෙහි ද යන මේ සතරතැන්හි ම දසදහසක් සක්වළ කම්පාවීම මහත් ආලොක පැතිරීම් ආදිය ඇතිවනකල්හි ධ්‍යානයට සමවැද හුන් බැවින් එසින් කිසිවකුත් නුදුටුයේය ශබ්දයකුත් නොඇසූයේය එහෙයින්

බුදුන් ලොව පහළවූබව නොදැනම වසනුවෝ ලුණුඇඹුල් සෙවිනා
පිණිස හිමවත ආශ්‍රමපදයෙන් අහසට නැගී ගොදුරුගම් බලා
ක්‍රමයෙන් මනුෂ්‍යපථයට පැමිණ රඹගම්නුවර මුදුනෙන් යනුවෝ
මහත් සන්තොෂයෙන් මග සරසන්නාවූ මිනිසුන් දැක කාරණ
කිම්දෝ හෝයි සිතා ආකාශයෙන් බැස විචාරණුයේ පින්වත්නි
තොපවිසින් මේ මාර්ගය කවරක්හට සරහව්ද තොපි සෙසු දවස
මා දැක මහාබ්‍රහ්මයා මෙන් සිතා තමතමන්ගේ කර්මාන්ත හැර මට
අභිවාදන පච්චුට්ඨාන අඤ්ජලිකම්ම සාමීචිකම් කිරීමෙහි ව්‍යාවෘත
වන්නාහුයදැන්වනාහි මා භික්ෂාචාර ශ්‍රමණයෙකු මෙන් බලන්නාහු
ය මීට කාරණ කිම්දැයි විචාළකල එපවත් දන්වන මනුෂ්‍යයෝ කි
යන්නාහු මහාතාපසයන්වහන්ස අන්ධකාරවිධ්වංශන මහාප්‍රදීප
යක් මෙන් ඥානාලොකයෙන් අවිද්‍යාඅඳුර හරණ දීපඞ්කර නම් බුදු
රජානන්වහන්සේ ලොව පහළවූසේක ඒ බුදුන් වඩනාට මේ මාර්ග
ය අපි සරසම්හයි දැන්වූවාහුය.

එකල්හි සුමෙධ තාපසයන්වහන්සේ පස්වණක් ප්‍රීතීන් පිරීගිය
ශරීර ඇතිව සිතනසේක් අහෝ මහත් ආශ්චර්‍ය්‍ය අත්භූතයෙක මේ
බුදුනැයි යන ශබ්දය නොයෙක් කල්ප සියදහස් ගණින් ඉක්ම ගිය
නමුදු අසන්ට අතිශයින් දුලිහවූ දෙයක ඒ බුදුනැයි යන නාමය අද
දැන් මාවිසින් අසනලද්දේය එහෙයින් මාලද ජීවිතය සඵලැයි දැන
ඉතා සතුටුව ඉදින් සැබවින් ම ඒ බුදුන් වඩනා පිණිස සරහන
මාර්ගයෙක් වී නම් මට ද මෙයින් භාගයක් දෙවයි කීකල මනුෂ්‍ය
යො මේ තාපසයන්වහන්සේ මහත් ඍද්ධානුභාව ඇතිසේක එ
හෙයින් මහත් ගැඹුරුවූ දුර්ගස්ථානයක් නමුත් සමකළ හැක්කැයි
සිතා උදක වහණයවන කලල්මඩ ඇති මහත් ගැඹුරු කඳුරැලි
යක් දුන්හ.

එකල්හි සුමෙධතාපයන්වහන්සේ සිතනසේක් මා අත උදැල්
ලක් වත් කුඩයක් වත් නැත එහෙයින් ඍද්ධි වශයෙන් සත්රුවන්
පොළොව මවාලීම හැකි නමුදු කායවෙයාවෘත්‍යය මෙන් මා සි
ත සතුටු නොවන්නේයයි සිතා කුඩයක් ගෙණ මිනිසුන් බිම කැනි
තැනින් පස් ගෙණවුත් උදකශ්‍රොතයෙහි දමදමා පූරවමින් කලල්
මාර්ගප්‍රදෙශය නොනිමිකලම රඹගම්නුවර වාසීන්ගේ ආරාධනා
වෙන් සාරලක්ෂයක් පමණ රහතන්වහන්සේ පිරිවරා රන්මෙරක්
සේ ඒ මාර්ගයෙහි දීපඞ්කර බුදුරජානන්වහන්සේ වඩින්ට පටන්
ගත්සේක. එකෙණෙහි දසදහසක් සක්වළ දෙවියෝ අද සුමෙධ
තාපසයන්වහන්සේ දීපඞ්කර ජිනෙන්ද්‍රයන් සමීපයෙන් මුනීන්ද්‍රවූ
බුදුවීමට එකාන්තයෙන් විවරණ ලබනසේකැයි දැන ඔවුනොවුන්

කැඳවා ඇසිල්ලකින් මේ සක්වළට රැස්වූහ. එම නියතවිවරණශ්‍රී ලබන ධර්මතාබලයෙන් එදවස් ලොකවිවරණප්‍රාතිහාර්‍ය්‍යද ඇති විය. එහෙයින් දෙවියෝ මිනිසුන් දක්නාහ මනුෂ්‍යයො ද දෙවතාවන් දක්නාහ ඒ හැම ඇඳිලිබැඳ බුදුන් අනුවම යන්නාහ එසේම දිව්‍යවූද මානුසිකවූද අනෙකප්‍රකාර තූර්‍ය්‍යයෙන් දෙපාර්ශ්වයෙහි දෙවතාවන් හා මනුෂ්‍යයෝ පුදපූද යන්ට පටන්ගත්හ. එකල්හි සුමෙධ තාපසයන්වහන්සේ එසේ යන දෙව්මිනිසුන් හා මහරහතුන් පිරිවරා වඩනා බුදුන් දැක මාවිසින් ගත් භූමිප්‍රදෙශය අලඞ්කෘත නොවිය විෂමව මඩ සහිතව තිබෙන්නේය ඊට දුන් කුමක් කෙරෙම්ද අහෝ මේ ලෝකයෙහි බුද්ධොත්පාදයක් ලැබීම අත්‍යන්තදුර්ලභය එහෙයින් අද මම ශ්‍රාවකසඞ්ඝයා සහිතවූ බුදුන්ට ආත්මපරිත්‍යාගය කරමි සිතා තමන්ගේ ජටාකලාපයයි නම් ලද තිස්රියන් පමණ වූ කෙසකලාපය මුදු නිලවර්ණවූ කලල්මඩෙහි මුනින් හෙව මේ සාරලක්ෂයක් රහත්පිරිවර සහිතවූ දීපඞ්කර බුදුරජානන්වහන්සේ මඩ නොමැඩ මා පිට මැඩගෙණ වඩනාසේක්වා ඉදින් මම කැමැත්තෙම් විම් නම් අදම සකකෙලශයන් නසා අග්‍රවූ රහත්ඵලයට පැමිණ බුද්ධපාමොක් මහාසඞ්ඝයා හා රම්‍යගම් නුවරට වැද පිණ්ඩපාතය පිළිගන්ට සමර්ථයෙමි එසේ අප්‍රසිද්ධවෙශයෙන් එකලාව නිවන්පුර වැදීමෙන් මට ප්‍රයොජන කිම්ද එහෙයින් සර්වඥතාඥානයට පැමිණ දෙවියන් සහිතවූ සත්වලොකයා නිවන්පුරට පමුණුවම් ඉදින් මම බුදුනොවන්නෙම්, විම් නම් මා ඉස්මවා නොවැඩ මේ භාග්‍යවතුන්වහන්සේ වැඩසිටිනාසේක්වා නොහොත් බුදුවන්නෙම් නම් මා ඇස්ම ඉක්මවා වඩනාසේක්වා මෙසේ ඇතිකල්හි මාගේ ප්‍රාර්ථනාව සමෘද්ධයයි දනිම් සිතා සැතපුනුසේක.

එකල්හි අති උලාර බුද්ධවෙශයෙන් දිලිහි දිලිහි දෙව්මිනිසුන් විසින් පිරිවරණලද දීපඞ්කර බුදුරජානන්වහන්සේ සුමෙධපණ්ඩිතයන් සමීපයට වැඩ විශුද්ධවූ බුද්ධචක්ෂුසින් ඒ තාපසයන්ගේ චරිතය බලා මේ සත්වතෙම තීක්ෂණප්‍රඥාඇත්තේය මනාඅදහස් හා දෘඪවූ සමාදන ඇත්තේය මොහුගේ ප්‍රාර්ථනාව සිද්ධවේද්ද නොවේද්දහෝයි වෙතොපර්‍ය්‍යඥානයෙන් ඒ සුමෙධතාපසයන්ගේ සිත ගෙණ අඞ්ගුලිසණ්ඩාසයෙන් අනොදුමලක් ගත්තෙකු මෙන් අනාගතඥානයෙන් ඒ තාපසයන්ගේ කෘත්‍යපිළිවෙළ බලනසේක් එකාවජිනචිත්තයකින්ම සාරාසඞ්ඛ්‍යකල්පලක්ෂයක් පමණවූ මහත් දීර්ඝකාලය ගෙවා දැක මේ තාපසයන්ගේ ප්‍රාර්ථනාව සිද්ධවන්නේයයි දනවදුරා දිව්‍යමනුෂ්‍යසමූහ මධ්‍යගතව සුමෙධපණ්ඩිතයන්ට විව

රණ දෙවාවිදූරණ දීපඞ්කර බුදුරජානන්වහන්සේ අෂ්ටාඞ්ගසමන් විත අත්‍යන්ත කර්ණරසායන බ්‍රහ්මස්වර විහිදුවා භික්ෂුසඞ්ඝයාට ආමන්ත්‍රණය කොට වදාරණසේක්:-

පස්සථ ඉමං තාපසං ජටිලං උග්ගතාපනං
අපරිමෙය්‍යෙ ඉතො කප්පෙ බුද්ධො ලොකෙ භවිස්සති-යි.

යනාදීන් විවරණ දී ඉක්බිති ඒ තාපසයන්ට පුදනු කැමැත්ව බුදුරජානන්වහන්සේ සාමණේරයන් බලාවදාළසේක. එකල්හි ඒ බව දත් ඍද්ධිසම්පන්න සාමණේරයෝ ඇසිල්ලෙකින් හිමවතට ගොස් ජලජ ථලජ මනා සුවඳැති මල් ගෙණවුත් එළවූහ. භාග්‍යවතුන්වහන්සේ ශ්‍රීහස්තයෙන් එසින් සමන්මල් අටමිටක් ගෙණ තාපසසන් මත්තෙහි විගුරුවා හෙලමින් පූජාකළසේක. ඒ හිමවතින් ගෙණ මල් අටබාරියෙක් පමණ වන්නාහුයි:

ඉක්බිති දීපඞ්කර බුදුරජානන්වහන්සේ සුමේධතාපසයන් වට ප්‍රදක්ෂිණකොට වඩින්ට පටන්ගත්සේක. එකල්හි ඒ තාපසයන්ගේ ශුද්ධාබලයෙන් හොත්තාවූ ඒ භූමිප්‍රදේශය පමණක් කුඹල්සකක් මෙන් කරකැවී සුමේධතාපසයන්ගේ ශීර්ෂය බුදුන්ගේ ශ්‍රීපාදයටම අභිමුඛව සැදිගියේය. බුදුරජානන්වහන්සේ ද සාරලක්ෂයක් රහතන් හා සමන්මල් පුදා වට ප්‍රදක්ෂිණ කොට වැඩි පසු සෙසු දෙවියන් සහිත ලෝවැසියෝද ධාතු සහිත සුවර්ණස්ථූපයකාටමෙන් ප්‍රදක්ෂිණකොට පසඟ පිහිටුවා වැද සතුටුව ඒ තාපසයන්ගේ ගුණ කියා ප්‍රශංසාකරමින් නැවත නැවත බලමින් ගියාහ. සුමේධපණ්ඩිත තාපස වනාහි භාග්‍යවතුන්වහන්සේගේ දර්ශනූපචාරය ඉක්මගිය කල්හි මඩප්ට හොත් තැනින් නැගී සමාධිපර්‍ය්‍යඞ්කයෙන් හුන්සේක. එකණෙහි දසදහසක් සක්වළ පෙර බුදුවරයන් දුටු ශුද්ධාවාස බ්‍රහ්මලොකවල වසන මහාබ්‍රහ්මරාජයෝ අපමහබෝසතානෝ නියතව්වරණ ලැබූ ධර්මතාබලයෙන් උපන් නොයෙක් සියගණන් ප්‍රාතිහාර්‍ය්‍ය දැක සුමේධතාපසයන් කරා පැමිණ උත්සාහ දන්වා බුදුවීම නියතබව හා තථාගතයන්වහන්සේගේ වචනය නිබොරු බව ප්‍රකාශකරමින් ප්‍රශංසාකොට මේ ගාථා කීවාහුය.

යානි පුබ්බෙ බොධිසත්තානං පලලඞ්කවරමාභුජෙ
නිමිත්තානි පදිස්සන්ති තානි අජ්ජ පදිස්සරෙ.

සීතං ව්‍යපගතං හොති උණ්හඤ්ච උපසම්මති
තානි අජ්ජ පදිස්සන්ති ධුවං බුද්ධො භවිස්සසි.

මහාවාතා න වායන්ති න සන්දන්ති සවන්තියො
තානි අජ්ජ පදිස්සන්ති ධුවං බුද්ධො භවිස්සසි.

නිරයෙ'පි දසසහස්සී අග්ගීනිබ්බන්ති තාවදෙ
තෙ'පජ්ජ නිබ්බුතා අග්ගී ධුවං බුද්ධො භවිස්සසි.

රාගො තදා තනු හොති දොසො මොහො 'පි නස්සති
තෙ පජ්ජ විගතා සබ්බෙ ධුවං බුද්ධො භවිස්සසි.

චුති ච උප්පත්ති ච ඛණෙ තස්මිං න විජ්ජති
තානි'පජ්ජ පදිස්සන්ති ධුවං බුද්ධො භවිස්සසි.

දළ්හං පග්ගණ්හ විරියං මා නිවත්ත අභික්කම
මයං 'පෙතං විජානාම ධුවං බුද්ධො භවිස්සසීති.

යනාදී වශයෙන් නොයෙක් කාරණා දක්වා බ්‍රහ්මරාජයන් විසි තුදු එකාන්තයෙන් නුඹ බුදුවනසේකැයි දක්වූකල්හි සුමෙධතාපසයන්වහන්සේ දීපඞ්කර නම් භාග්‍යවතුන්වහන්සේගේ වචනය ද ශුද්ධාවාස වාසී බ්‍රහ්මරාජයන්ගේ වචනය ද අසා උපන් මහත් වීර්‍ය්‍ය හා අතිශයින් තුටුපහටුවූ සිත් ඇතිව:-

අනෙජ්ජවචනා බුද්ධා අමොඝවචනා ජිනා
විතථං නත්ථි බුද්ධානං ධුවං බුද්ධො භවාමහං.

හන්ද බුද්ධකරෙ ධම්මෙ විචිනාමි ඉතො චිතො
උද්ධං අධො දසදිසා යාවතා ධම්මධාතුයා.

යනාදී බොහෝ කාරණා සැළකීමෙන් තමන් බුදුවනබව නියත කොට දැන බුද්ධකාරකධර්මයන් සොයන්ට පටන්ගත්සේක.

ත්‍රෛභූමිකාවචරවූ සියලු සත්ත්වයන්ගේ ජීවත්වීම එකාන්තයෙන් ආහාරප්‍රත්‍යයෙන් ම වන්නේය ඒ භොජනවස්ත්‍රාදනාවසාදී ආහාර ප්‍රත්‍යයන් නැතිවීමෙන් මේ සියලු සත්ත්වයන්ගේ දිවි නැසීම වන්නේ ය එහෙයින් සත්පුරුෂයා විසින් පළමුකොට දන්දීම සුදුසුය ඒ දානය දෙන්නාවූ සුමෙධපණ්ඩිතය නාවිසින් පැමිණි යාචකයන්ට නිඹිසිතිකල දියකළයක් නිරවශෙෂව නික්මෙන්නාසේ නිරාලයව ධනාඞ්ගජීවිත පරිත්‍යාගයෙන් ත්‍රිවිධවූ පූර්වබොධිසත්ත්වවරයන් විසින් ආසෙවිත නිසෙවිතවූ පළමුවෙනි දානපාරමිතාව පූරවයි කියා දැඩිකොට ඉටාගෙණ-තමන්වහන්සේ ම තමන්ට අවවාදකොට ඉක්බිති බුද්ධකාරකධර්මයන් සොයනසේක් පූර්වබොධිසත්ත්වවරයන් විසින් ආසෙවිත නිසෙවිතවූ දෙවෙනි ශීලපාරමිතාව දක සුමෙධ

පණ්ඩිතය යම්සේ සෙමර නම් මෘගධෙනුතොමෝ තමාගේ ජීවිතය ද නොබලා වාළයම රක්නී ද එපරිද්දෙන් තෙපි මෙතැන් පටන් බාහිර යසධනාඞ්ගජීවිතය ද නොබලා චතුපාරිශුද්ධිශීලය අඛණ්ඩාච්ඡිද්‍රතාදී අෂ්ටාඞ්ගසමන්නාගතව රක්‍ෂා කිරීමෙන් ශීලපාරමිතාව පූරවයි කියා දෘඪකොට ඉටාගෙණ-ඉක්බිති පූර්වබොධිසත්වවරයන් විසින් ආසෙවිත නිසෙවිතවූ තුන්වෙනි නෛෂ්ක්‍රම්‍යපාරමිතාව දැක සුමෙධපණ්ඩිතය යම්සේ බන්ධනාගාරයෙක්හි දීර්ඝකාලයක් දුකින් පීඩිතව විසූ පුරුෂයෙක් එහි ආලය නූපදවා එයින් මිදීමට සොයන්නේවේද එපරිද්දෙන් සියලු සසරදුකින් මිදීම් පිණිස ගෘහවාසයෙන් නික්ම පැවිදිවීමට අභිමුඛවීමෙන් නෛෂ්ක්‍රම්‍යපාරමිතාව පූරවයි කියා දෘඪකොට ඉටාගෙණ-ඉක්බිති එසේම පූර්වබොධිසත්වවරයන් විසින් ආසෙවිත නිසෙවිතවූ සතරවෙනි ප්‍රඥාපාරමිතාව දැක මෙතැන් පටන් සුමෙධපණ්ඩිතය තෝ ප්‍රඥාපාරමිතාව පූරන්නෙහි වී නම් යම්සේ පිඬු පිණිස හැසිරෙණ භික්‍ෂුවක්හු හීනාදී නොයෙක් භෙද ඇති කුලයන් අතුරෙන් කිසියම් කුලගෙයක් නොහැර පිළිවෙළින් පිඬු සිඟා යාමෙන් වහා යැපෙන පමණ භික්‍ෂාව ලබන්නේවේද එපරිද්දෙන් හීනමධ්‍යම උත්කෘෂ්ට කිසිවෙකු නොහැර සියලු පණ්ඩිතපුරුෂයන් කරා පැමිණ ප්‍රශ්න විචාරීමෙන් බණ ඇසීමෙන් ප්‍රඥාපාරමිතාව පූරවයි කියා තරකොට ඉටාගෙණ-ඉක්බිති බුද්ධකාරකධර්මයන් සොයනසේක් පූර්වබොධිසත්වවරයන් විසින් ආසෙවිත නිසෙවිතවූ පස්වෙනි වීර්‍ය්‍යපාරමිතාව දැක සුමෙධපණ්ඩිතය මෙතැන්පටන් වීර්‍ය්‍යපාරමිතාව පූරන්නෙහි වී නම් යම්සේ සිංහරාජතෙම සියලු ඊර්‍ය්‍යාපථයෙහි දෘඪවීර්‍ය්‍ය ඇතිවේද එපරිද්දෙන් තොපිද උපනුපන් ජාතිවල සියලු ඊර්‍ය්‍යාපථයෙහි දෘඪවූ නොපසුබට වීර්‍ය්‍ය ඇතිව වීර්‍ය්‍යපාරමිතාව පූරවයි කියා තරකොට ඉටාගෙණ-ඉක්බිති බුද්ධකාරකධර්මයන් සොයනසේක් පූර්වබොධිසත්වවරයන් විසින් ආසෙවිත නිසෙවිතවූ සවෙනි ක්‍ෂාන්තිපාරමිතාව දැක සුමෙධපණ්ඩිතය මෙතැන්පටන් ක්‍ෂාන්තිපාරමිතාව පූරන්නෙහි වී නම් යම්සේ පෘථිවියෙහි සඳුන්කොකුම්සුවඳමල්ආදිවූ සුවිඳැද සපිසුනඛමනුෂ්‍යකුනපයන් හා ගූථමූත්‍රසෙලසොට්ටආදිවූ අසුචිදෑද බහාලනකල්හි එයින් පෘථිවිතොමෝ සෙනහ ප්‍රතිඝ දෙක මනාකොට සමව ඉවසා පවත්නීද එපරිද්දෙන් තෙපිද සියල්ලවුන්ගේ සම්මානන අවමානන දෙක්හි සමවූ සිත් ඇතිව ඉවසීමෙන් ක්‍ෂාන්තිපාරමිතාව පූරවයි කියා දෘඪකොට ඉටාගෙණ-ඉක්බිති බුද්ධකාරකධර්මයන් සොයනසේක් පූර්වබොධිසත්වවරයන් විසින් ආසෙවිත නිසෙවිතවූ සත්වෙනි සත්‍යපාරමිතාව දැක සුමෙධපණ්ඩිතය මෙතැන්පටන් සත්‍යපාරමිතාව පූරන්නෙහි

වී නම් යම්සේ ඔසධීතාරකාව හැම ඍතුවල තමාගේ ගමන්වීථිය නොහැර සවකීයවීථියෙහිම යන්නේද එපරිද්දෙන් තෙපිද මස්තකයෙහි අසනි සඞ්ඛ්‍යාත හෙණ ප්‍රපාතනය වන්නේ වී නමුදු ධනසම්පත් ආදී කිසිවක් නිසා ඡන්දාදී අගති වශයෙන් සත්‍යය හැර මුසා නොබිණීමෙන් සත්‍යපාරමිතාව පූරවයි කියා දැඩිකොට ඉටාගෙණ-ඉක්බිති මත්තෙහිදු බුද්ධකාරකධර්මයන් සොයනසේක් පූර්වබොධිසත්වවරයන් විසින් ආසෙවිත නිසෙවිතවූ අටවෙනි අධිෂ්ඨානපාරමිතාව දැක සුමෙධපණ්ඩිතය මෙතැන් පටන් අධිෂ්ඨානපාරමිතාව පූරන්නෙහි වී නම් යම්සේ සුප්‍රතිෂ්ඨිත පර්වතය සියලු දිගින් හමන බලවත් වාතයෙන් කම්පා නොවේද චලනය නොවේද සවකීය ස්ථානයෙහි ම සිටීනේද එපරිද්දෙන් තෙපිද යමක් ඉටුයෙහි වී නම් ඒ අධිෂ්ඨානයෙහි නිශ්චලව පිහිටා සිටීමෙන් අධිෂ්ඨානපාරමිතාව පූරවයි කියා දැඩිකොට ඉටාගෙණ-ඉක්බිති බුද්ධකාරක ධර්මයන් සොයනසේක් පූර්වබොධිසත්වවරයන් විසින් ආසෙවිත නිසෙවිතවූ නවවෙනි මෛත්‍රීපාරමිතාව දැක සුමෙධපණ්ඩිතය ඉදින් බුදුබව කැමත්තෙහි වී නම් යම්සේ ජලය යහපත් කල්‍යාණජනයන්ට හා නපුරු පව්වූ ජනයන්ට සමවූ ස්පර්ශව ඔවුනොවුන්ගේ ශරීර ප්‍රතිබද්ධ ආගන්තුක රජස් හා ශරීරමල පිරිසිදුකෙරේද එපරිද්දෙන් තෙපි ද අහිතයන්ටද හිතයන්ටද සතුරන්ට ද මිතුරන්ට ද යන හැමදෙනාට ම සමසිත්ව මෛත්‍රීසිත් වැඩීමෙන් මෛත්‍රීපාරමිතාව පූරවයි කියා දැඩිකොට ඉටාගෙණ-ඉක්බිතිව බුද්ධකාරක ධර්මයන් සොයනසේක් පූර්වබොධිසත්වවරයන් විසින් ආසෙවිත නිසෙවිතවූ දශවෙනි උපෙක්ෂාපාරමිතාව දැක සුමෙධපණ්ඩිතය ඉදින් මෙතැන් පටන් බුදුබව කැමැත්තෙහි වී නම් සුචි අසුචි දෙක බහාලීමෙහි යම්සේ මහපොළොව හිතාහිත නොව සමව පවත්නේවේද එපරිද්දෙන් තෙපිද සුව දුක් දෙක්හි හැමකල්හි ම වෙනසක් නොව තුලාවක් මෙන් මැදහත්ව උපෙක්ෂාපාරමිතාව පූරවයි කියා දැඩිකොට ඉටාගත්සේක.

ඉක්බිති සුමෙධපණ්ඩිතයන්වහන්සේ මේ දශපාරමිධර්මයන් ආදිමධ්‍යපර්යවසානාදි වශයෙන් විභාගකොට සිතා මේ ලෝකයෙහි බොධිසත්වවරයන් විසින් පිරියයුතුවූ බුද්ධකාරකධර්මයෝ මෙපමණකමය මෙයින් අන්‍යවූ බුද්ධකාරකධර්මයකතොත් නැත මේ දානාදී දශපාරමිතාවෝ වනාහි උඩ ආකාශයෙහිත් නැත යට පෘථිවියෙහිත් නැත පූර්වදිශාදී දික්හිදු නැත මාගේ හෘදයමාංසයාගේ ඇතුළත්හි වූ සිත්හි පිහිටා සිටිනාහුයයි දැන ඒ හැම පාරමිතාවන්ම මාරසතයන් විසිනුදු කම්පාකොටගතනොහැකිසේ දැඩිකොට ඉටාගෙණ-නැවත නැවත අනුලොමප්‍රතිලොමාදි වශයෙන් සම්මර්ශ

ණය කොට මෙසේ දානාදි සමත්‍රිංශත් පාරමිධර්මයන් අනෙකප්‍රකාරයෙන් සිහිකරණ මහබෝසතාණන්වහන්සේගේ ධර්මතෙජසින් දෙලක්‍ෂසතළිස්දහසක් යොදුන් ඝණය ඇති පළල්වූ මෙ දසදහසක් සක්වළ මහාපෘථිවිතොමෝ භ්‍රමණයකරණලද උක්යන්ත්‍රයක් තෙලයන්ත්‍රයක් මෙන් ද යදණ්ඩකින් ප්‍රහාරලත් ලොහෝතලියක් මෙන් ද සතරාව සහස්‍රාවයෙන් සාධුනාද පවත්වා කම්පාවූවාය.

මෙම කියනලදුයේ මැයි:—

එත්තකායෙව ගත ලොකෙ යෙ ධම්මා බොධිපාචනා
තදුද්ධං නත්ථි අඤ්ඤත්‍ර දළ්හං තත්ථ පතිට්ඨහා.

ඉමෙ ධම්මෙ සම්මසතො සභාවසරලක්ඛණෙ
ධම්මතෙජේන වසුධා දසසහස්සී පකම්පයී.

චළතීරවතී පඨවි උච්ඡුයන්තංව පීළිතං
තෙලයන්තෙ යථා චක්කං එවං කම්පයි මෙදිනි-ති·

මෙසේ මේ තමන්වහන්සේගේ වාක්ප්‍රණිධානය ප්‍රකාශකොට දෙව්මිනිසුන්ට කරණලද සද්ධර්මානුශාසනා ඇතිහෙයින් සර්වලොකපූජ්‍යවූ මාගේ බුදුරජ "ශාස්තෘ" නම් වනසේක.

එසේ හෙයින් කියනලදී.

දෙවයක්ඛමනුස්සානං ලොකෙ අග්ගඵලං දදං
දදන්තං දමයන්තානං පුරිසාජඤ්ඤ තෙ නමො-සී.

ලෝවැඩ පිණිස කරණලද මේ ශ්‍රීසද්ධර්මාවවාදසංග්‍රහයෙහි මෙතෙකින් අතිදූරෙනිදානය කියා නිමවනලදී·

——:ǂ:——

එයින් මැතභාගයෙහි සෙල නම් එක් අසඞ්ඛ්‍යයක් කප් ඉක්ම ගියකල කොණ්ඩඤ්ඤ නම් සර්වඥයන්වහන්සේ ලෝකයෙහි පහළවූසේක· එසමයෙහි පූරණලද බොධිසම්භාරධර්ම ඇති අපමහ බෝසතාණෝ විජිතාවී නම් චක්‍රවර්තිරජව කෙළලක්‍ෂයක් පමණ බුදුපාමොක් මහසඞ්ඝයාවහන්සේට මහදන් දී කොණ්ඩඤ්ඤ නම් බුදුන් සමීපයෙහුදු බුදුවිමට විවරණශ්‍රී ලැබ බණ අසා චක්‍රවර්ති රාජ්‍යයෙන් පූජාකොට මහණව තුන්පිටකය ඉගෙණ පඤ්චාභිඥ අෂ්ටසමාපත්ති උපදවා නොපිරිහුණාවූ ධ්‍යාන ඇතිව බ්‍රහ්මලොකයෙහි උපන්නාහුය· සල්කලණබෝරුක්මුල්හි වැඩහිඳ බුදුවූ ඒ කොණ්ඩඤ්ඤ බුදුරජාණන්වහන්සේ අපරිමිත ශ්‍රාවක ගණ පිරිවරා අවුරුදු ලක්‍ෂයක් මුළුල්ලෙහි වැඩසිට සියලු බුද්ධකෘත්‍ය කොට චන්ද්‍රාරාමයෙහිදී පිරිනිවන්පෑසේක.

එයින් මෑත භාගයෙහි හාස නම් වූ එක් අසඞ්ඛ්‍යයක් කප් ඉක්ම ගියකල එකම කල්පයෙක්හි මඞ්ගලය සුමනය රේවතය සොභිතය යී යන බුද්ධදිවාකරයෝ සතරදෙනෙක් ලෝකයෙහි පහළවූහ. එයින් මඞ්ගල නම් බුදුන් සමයෙහි අපමහබෝසතානෝ සුරුචි නම් බ්‍රාහ්මණව කෙළලක්‍ෂයක් පමණ බුදුපාමොක් මහසඟනට සතියක් මුළුල්ලෙහි ගවපාන නම් දානයක් දී බණ අසා මේ මහාපුරුෂ මෙයින් දෙයාසඞ්ඛ්‍යකප්ලක්‍ෂයකින් මත්තෙහි ගෞතම නම් බුදුවන්නේය යී විවරණශ්‍රී ලැබ ඒ බුදුන් සමීපයෙහි මහණව පිටකත්‍රයධාරිව පඤ්චාභිඥ අෂ්ටසමාපත්ති උපදවා ආයුකෙළවර බ්‍රහ්මලොකයෙහි උපන්සේක.

එයින් මෑත භාගයෙහි ලොවැ පහළවූ සුමන නම් බුදුරජානන් වහන්සේගේ සමයෙහි අපමහබෝසතානෝ මහත්වූ ඍද්ධ්‍යනුභාව ඇති අතුල නම් දිව්‍ය නාගරාජව ඉපද බන්ධුසමූහයා විසින් පිරිවරණලදුව නාගභවනයෙන් නික්ම අවුත් කෙළලක්‍ෂයක් භික්‍ෂූන්වහන්සේ පිරිවරකොට ඇති බුදුන්ට දිව්‍යමයවූ පඤ්චාඞ්ගිකතූර්‍ය්‍යනාදයෙන් පූජකරවා මහදන්දී බුදුපාමොක් මහසඟපිරිසට වෙන වෙනම එක එක දිවසළු සඟළ බැගින් දත් දී ශරණශීලයෙහි පිහිටා ඒ බුදුන් සම්පයෙහුදු අනාගතයෙහි මෙතෙම ගෞතම නම් බුදුවන්නේය යී යනාදින් විවරණශ්‍රී ලත්සේක.

එයින් මෑත භාගයෙහි බුදුවූ රේවත නම් බුදුන් සමයෙහි අපමහබෝසතානෝ අතිදෙව නම් බ්‍රාහ්මණව ඒ රේවත නම් සර්වඥයන් වහන්සේ කරා පැමිණ බණ අසා ශරණයෙහි පිහිටා ශ්ලෝක දහසකින් බුදුන්ට ස්තුතිකොට දහසක් වටිනා උතුරුසළුවෙන් පූජකොට මෙතෙම මතු ගෞතම නම් බුදුවන්නේය යී යනාදි ක්‍රමයෙන් විවරණශ්‍රී ලත්සේක.

එයින් මෑත භාගයෙහි බුදුවූ සොභිත නම් බුදුන් සමයෙහි අපමහබෝසතානෝ සුජාත නම් බ්‍රාහ්මණව ඒ බුදුන් කරා පැමිණ බණ අසා ශරණශීලයෙහි පිහිටා බුදුපාමොක් මහසඟපිරිසට මහදන්දී මෙතෙම මතු බුදුවන්නේය යී යට කී නයින්ම විවරණශ්‍රී ලත්සේක.

එයින් මෑත භාගයෙහි ජය නම් .එක් අසඞ්ඛ්‍යයක් කප් ඉක්ම ගියකල එකම කල්පයෙක්හි අනෝමදස්සීය පදුමය නාරදය යී සර්වඥවරයෝ තුන්දෙනෙක් උපන්නාහුය. එයින් අනෝමදස්සී නම් බුදුන් සමයෙහි අපමහබෝසතානෝ මහත්වූ ඍද්ධ්‍යනුභාව ඇති කෙළලක්‍ෂයක් පමණ යක්‍ෂයන්ට අධිපතිවූ මහේශාක්‍ය යක්‍ෂසේනාධිපතිව ඒ බුදුන් කරා පැමිණ බුදුපාමොක් මහසඟණට මහදන් පවත්වා මෙතෙම අනාගතයෙහි මෙයින් එකාසඞ්ඛ්‍යකප්

ලක්ෂයක් ඉක්ම ගියකල ගෞතම නම් බුදුවන්නේයයි යනාදීන් විවරණශ්‍රී ලත්සේක.

එයින් මැතභාගයෙහි ලොවැ පහළවූ පදුම නම් බුදුන් සමයෙහි අපමහබෝසතානෝ සිංහරාජන්ව ඉපද ඒ බුදුන් අගාමක ආරණ්‍යයෙහි වසනකල්හි නිරොධසමාපත්තියට සමවන්නාවූ බුදුන් දැක ප්‍රසන්නාවූ සිත්ඇතිව වැඳ පැදකුණුකොට තුන්ගලක් සිංහනාද කොට සතියක් මුළුල්ලෙහි බුද්ධාලම්බනප්‍රීතිසැපයෙන් ම ගොදුරු පිණිස නොගොස් ජීවිතපරිත්‍යාගය කොට උපස්ථානකෙරෙමින් සිටියේය. බුදුහු සතියක් ඇවෑමෙන් නිරොධසමාපත්තීන් නැගී සිංහයා බලා භික්ෂුසඞ්ඝයාකෙරෙහිත් සිත පහදවා සඞ්ඝයා වඳනේය යී භික්ෂුසඞ්ඝතෙම එවයී සිතූසේක. භික්ෂූන්වහන්සේත් එකෙණෙහි ම ආසේක. සිංහරාජතෙම සඞ්ඝයාකෙරෙහි සිත පැහැදවූයේය. සර්‍වඥයන්වහන්සේ ඔහුගේ අභිප්‍රාව බලා අනාගතයෙහි බුදුවන්නේයයි විවරණ දුන්සේක.

එයින් මැතභාගයෙහි නාරද නම් බුදුකෙනෙකුන්වහන්සේ ලෝකයෙහි පහළවූසේක. එසමයෙහි අපමහබෝසතානෝ සෘෂිප්‍රව්‍රජ්‍යාවෙන් පැවිදිව පඤ්චාභිඥා අෂ්ටසමාපත්තියෙහි පුරුදුකරණලද සිත් ඇතිව හිමවත වසනසේක. එකල්හි නාරද නම් බුදුරජානන්වහන්සේ අසූකෙළක් රහතන් හා අනාගාමිඵලප්‍රාප්ත දසදහසක් උපාසකවරුන් පිරිවරා ඒ ආශ්‍රමයට වැඩ ඔවුන් මවාලූ ආශ්‍රමයෙහි සතියක් වැස උතුරුකුරුදිවයිනෙන් ගෙණවුත් දුන් ආහාරය සපිරිවරින් වළඳා ධර්මදෙශනාකොට හිමවතින් ගෙණ පිදූ අනර්ඝ රත්සඳුන්හරය පිළිගෙණ මෙතෙම මතු ගෞතම නම් බුදුවන්නේය යි විවරණ දුන්සේක.

එයින් මැතභාගයෙහි සූන්‍යරුචි නම් එකාසඞ්ඛ්‍යයක් කප් ඉක්ම ගියකල්හි මෙයින් කප්ලක්ෂයකින් මත්තෙහි එක්කල්පයෙක එකම පියුමතුරා නම් සර්‍වඥකෙනෙක් ලොවැ පහළවූසේක. එසමයෙහි අපමහබෝසතානෝ ජටිල නම් මහරැටිව බුදුපාමොක් සමසඟනට සිවුරු සහිතවූ මහදන් දුන්නාහුය. ඒ සර්‍වඥද මෙතෙම මතු බුදුවන්නේය යි විවරණ දුන්සේක.

එයින් මැතභාගයෙහි සැත්තෑදහසක් කප් ගියකල එක්කපෙක සුමෙධය සුජාතය යි සර්‍වඥවරයෝ දෙදෙනෙක් ලොව පහළවූහ. එයින් සුමෙධ නම් බුදුන් සමයෙහි අපමහබෝසතානෝ උත්තර නම් මාණවකව නිධානකොට තුබූ අසූකෙළක් ධන වියදම්කොට බුදුපාමොක් මහසඟපිරිසට මහදන් දී බණ අසා ශරණයෙහිපිහිටා මහණව මෙතෙම මතු බුදුවන්නේය යි ඒ බුදුන්කෙරෙහුදු විවරණශ්‍රී ලත්සේක.

එයින් මැතභාගයෙහි ලොව පහළවූ සුජාත නම් බුදුන් සමයෙහි අපමහබෝසතානෝ චක්‍රවර්තිරජව බුදුන්කරා පැමිණ බණ අසා බුදුපාමොක් මහසඟනට සත්රුවන් හා සමග සතර මහද්වීපයෙහි රාජ්‍යය පුදා මහණවූසේක. සියලු රාජ්‍යවාසීහු රටින් උපන් අය ගෙණ ආරාමිකකෘත්‍ය සිඩකෙරෙමින් බුදුපාමොක් මහ සඟපිරිසට නිරන්තරයෙන් මහදන් දුන්නාහුය· ඒ සර්වඥයන්වහන්සේත් අනාගතයෙහි මෙතෙම බුදුවන්නේයයි විවරණ දුන්සේක.

එයින් මැතභාගයෙහි මෙයින් එක්සියඅටලොයක් කපින් මත්තෙහි එක්කල්පයෙක පියදස්සීය අත්‍ථදස්සීය ධම්මදස්සීය යි සර්වඥවරයෝ තුන්දෙනෙක් ලොව උපන්නාහුය. එයින් පියදස්සී නම් බුදුන් සමයෙහි අපහමබෝසතානෝ කාශ්‍යප නම් බ්‍රාහ්මණමාණවකව වෙදත්‍රයෙහි පරතෙරට පැමිණ ඒ බුදුන්කරා පැමිණ බණ අසා කෙළලක්‍ෂයක් ධන වියදම්කොට සඞ්ඝාරාමයක් කරවා දී ශරණශීලයෙහි පිහිටියහ. ඒ සර්වඥද මෙතෙම මෙයින් එක්සියඅටලොස් කපකින් මත්තෙහි බුදුවන්නේය යි විවරණ දුන්සේක·

එයින් මැතභාගයෙහි ලොවැ පහළවූ අත්‍ථදස්සී නම් බුදුන් සමයෙහි අපමහබෝසතානෝ මහත් සෘද්ධානුභාව ඇති සුසීම නම් තාපසව බුදුන්කරා පැමිණ බණ අසා පැහැද දිව්‍යමදාරාමල් පියුම් පරසතු කොබෝලීල ආදිවූ මල් ගෙණවුත් සතරමහද්වීපයෙහි එකපැහැර වස්නාවූ මහාමෙඝයක් මෙන් මල්වර්‍ෂාවක් වස්වා හාත්පස්හි මල් මණ්ඩප මල්ඇගෑ මල්තොරණ ආදිය ද මවා මදාරාමල්කුඩයකින් බුදුන් පිදූහ. ඒ සර්වඥද අනාගතයෙහි මෙතෙම බුදුවන්නේය යී විවරණ දුන්සේක.

එයින් මැතභාගයෙහි ලොව පහළවූ ධම්මදස්සී නම් බුදුන් සමයෙහි අපමහබෝසතානෝ සක්දෙව්රජව දිවසුවඳ දිවමල් දිව දුම් දිවපහන් ආදියෙන් ද දිව්‍යමයවූ පඤ්චාඞ්ගිකතූර්‍ය්‍යනාදයෙන් ද පූජා කළහ. ඒ සර්වඥයන්වහන්සේත් අනාගතයෙහි මෙතෙම බුදුවන්නේය යී විවරණ දුන්සේක.

එයින් මැතභාගයෙහි මීට සිව්අනූකපකින් මත්තෙහි එක්කල්පයෙක එකම සිද්ධාර්‍ත්‍ථ නම් සර්වඥකෙනෙකුන්වහන්සේ ලෝකයෙහි පහළවූසේක.එසමයෙහි අපමහබොධිසත්‍වයෝ උග්‍රවූ තෙජස් ඇති අභිඥබලයෙන් යුක්තවූ මඞ්ගල නම් තාපසව මහදඹදිවට සලකුණුවූ සියක්යොදුන් උසඇති මහදඹගසින් මහදඹ ගෙණවුත් සර්වඥයන්වහන්සේට පිළිගැන්වූහ· බුදුරජානන්වහන්සේ අනූකෙළක් භික්‍ෂූන් පිරිවරා සූරසෙන වෙහෙරදී ඒ දඹවළඳ මෙතෙම මෙයින් සිව්අනූකපින් මත්තෙහි බුදුවන්නේය යී විවරණ දුන්සේක.

එයින් මෑතභාගයෙහි මීට දෙයානූකපකින් මත්තෙහි එක්කල්පයෙක තිස්සය පුස්සය යී සර්වඥවරයෝ දෙදෙනෙක් උපන්නාහුය. එයින් තිස්ස නම් බුදුන් සමයෙහි අපමහබෝසතානෝ මහත්වූ සම්පත් හා මහත්වූ යසපිරිවර ඇති සුජාත නම් රජව ඒ රජසිරි හැර සෘෂිප්‍රව්‍රජ්‍යාවෙන් පැවිදිව මහත්වූ සෘද්ධ්‍යනුභාවයට පැමිණ බුදුන් ලොව පහළවූබව අසා දිව්‍යමඳාරාමල් හා දිව්‍යපියුම් පරසතු කොබොලීල ආදීවූ මල් ගෙණවුත් සිව්වණක් පර්ෂන්මධ්‍යයෙහි වැඩවුන් බුදුන්ට පිදූහ. ඒ සර්වඥද මෙතෙම මෙයින් දෙයානූකපින් මත්තෙහි බුදුවන්නේය යී විවරණ දුන්සේක.

එයින් මෑතභාගයෙහි පුස්ස නම් සර්වඥයන්වහන්සේ ලොව පහළවූසේක. එසමයෙහි අපමහබොධිසත්වයෝ විජිතාවී නම් රජව මහත්වූ රාජ්‍යය හැර බුදුන් සමීපයෙහි මහණව තුන්පිටකය උගෙණ මහජනයාට ධර්මදෙශනාකොට සීලපාරමිතාව පිරූහ. ඒ සර්වඥද මෙතෙම මතු බුදුවන්නේය යී විවරණ දුන්සේක.

එයින් මෑතභාගයෙහි මීට එකානූවන කප විපස්සී නම් සර්වඥකෙනෙක් ලොව පහළවූසේක. එසමයෙහි අපමහබෝසතානෝ මහත් සෘද්ධ්‍යනුභාව ඇත්තාවූ අතුල නම් නාගරාජව සත්රුවන් කර්මාන්තකළ ස්වර්ණමහාපීඨයක් බුදුරජානන්වහන්සේට පිළිගැන්වූවාහුය. ඒ සර්වඥයන්වහන්සේත් මෙයින් අනූවනකපින් මත්තෙහි මෙතෙම බුදුවන්නේය යී විවරණ දුන්සේක.

එයින් මෑතභාගයෙහි මීට එක්තිස්වන කප සිඛිය වෙස්සභූය යී බුදුවරයෝ දෙදෙනෙක් ලොව පහළවූවාහුය. එයින් සිඛී නම් බුදුන් සමයෙහි අපමහබෝසතානෝ අරින්දම නම් රජව බුදුපාමොක් මහසඟපිරිසට සිව්රු සහිතවූ මහදන් පවත්වා සත්රුවණින් අලංකෘතවූ ඇත්රුවන දන්දී ඒ ඇතු උසට කප්පියභාණ්ඩ දුන්නේය. ඒ සර්වඥයන්වහන්සේ ද මෙයින් තිස්වන කපින් මත්තෙහි මෙතෙම බුදුවන්නේය යී විවරණ දුන්සේක.

එයින් මෑතභාගයෙහි වෙස්සභූ නම් සර්වඥයන්වහන්සේ ලොව පහළවූසේක. එසමයෙහි අපමහබෝසතානෝ සුදර්ශන නම් රජව බුදුපාමොක් මහසඟපිරිසට මහදන් දී මහණව ආචාරගුණයෙන් යුක්තව බුද්ධරත්නයෙහි ආදර හා ප්‍රීති බහුලවූයේය. ඒ සර්වඥයන්වහන්සේ ද මෙයින් තිස්වනකපින් මත්තෙහි මෙතෙම බුදුවන්නේය යී විවරණ දුන්සේක.

එයින් මෑතභාගයෙහි එකුන්තිස්කල්පයක් බුද්ධශූන්‍යව පස්බුදුකෙනෙකුන්ගෙන් උතුම්වූ මේ භද්‍රකල්පයෙහි කකුසඳය කෝණාගමය කාශ්‍යපය යී සර්වඥවරයෝ තුන්දෙනෙක් ලෝකයෙහි පහළවූ

හ. එසින් කකුසඳ නම් බුදුන් සමයෙහි අපමහබෝසත්‍වයෝ ඛෙම නම් රජව බුදුපාමොක් මහසඟනට පාත්‍රසිවුරු සහිතවූ මහදන් හා අඳුන් ආදිවූ බෙහෙත්බඩු දන්දී බුදුන් ගෙන් බණ අසා මහණවූවාහුය. ඒ සර්වඥයන්වහන්සේ ද අනාගතයෙහි මෙතෙම බුදුවන්නේය යි විවරණ දුන්සේක.

එසින් මෑතභාගයෙහි කොණාගම නම් සර්වඥයන්වහන්සේ ලෝකයෙහි පහළවූසේක. එසමයෙහි අපමහබෝසත්‍වයෝ පර්වත නම් රජව අමාත්‍යසමූහයා විසින් පිරිවරණලදුව බුදුන්කරා ගොස් බණ අසා බුදුපාමොක් මහසඟනට මහදන් පවත්වා පත්තුනාදෙශයෙහි පිළිද චීනදෙශයෙහි පිළිද පලස් හා දුහුල්පිළිද රන්කම් කළ පටපිළිද දන්දී බුදුන් සමීපයෙහි මහණවූවාහුය. ඒ සර්වඥයන්වහන්සේ ද අනාගතයෙහි මෙතෙම බුදුවන්නේය යි විවරණ දුන්සේක.

එසින් මෑතභාගයෙහි කාශ්‍යප නම් සර්වඥයන්වහන්සේ ලොව පහළවූසේක. එසමයෙහි අපමහබෝසත්‍වයෝ ජෝතිපාල නම් මාණවකව වෙදත්‍රයෙහි පරතෙරට පැමිණ භූමියෙහි ද ආකාශයෙහි ද ප්‍රසිද්ධවූ ඝටිකාර නම් කුම්භකාරයා හා මිත්‍රව ඒ මිත්‍රයා හා එක්ව බුදුන්කරා එළඹ බණ අසා මහණව වඩනලද වීර්‍ය්‍ය ඇතිව තුන්පිටකය ඉගෙණ වතාවත් සංඝයෙන් බුදුසසුන් බැබලවූහ. ඒ සර්වඥයන්වහන්සේ ද අනාගතයෙහි මෙතෙම අපට දෙවෙනිව ගෞතම නම් බුදුවන්නේය යි විවරණ දුන්සේක.

මෙසේ දීපඞ්කරාදීවූ සුවිස්සක් පමණ සර්වඥයන්වහන්සේලාගෙන් ලබනලද විවරණ ඇති ඒ බෝසත්‍වයෝ අවීචිය ලොකාන්තරිකනරකය නිජ්ඣාමතණ්හිකා නම් ප්‍රෙතයොනිය කාලකඤ්ජක නම් අසුරයෝනිය වටුකුරුල්ලන්ට කුඩා තිර්සන්යෝනිය අසඥිසත්‍වය සුද්ධාවාසයෙහි උත්පත්තිය ජාත්‍යන්ධත්‍වය ජාතිබධිරත්‍වය ජාතිමූකත්‍වය ස්ත්‍රීභවය උභතොව්‍යඤ්ජනකභාවය පණ්ඩකභාවය සෝවාන් ආදී නොවන බැවින් වෘත්තමාත්‍රයෙහි පර්‍ය්‍යාපන්න නොවනබවය පඤ්චානන්තර්‍ය්‍යකර්මය හැමතන්හි අශුද්ධගොචරත්‍වය මිථ්‍යාදෘෂ්ටිය කර්මක්‍රියාවන්ගේ අදෘශ්‍යත්‍වය යන මේ අටලොස් අභව්‍යස්ථානයන් කරා නොපැමිණ සසජාතකය සඞ්ඛපාලජාතකය චූලසුතසොමජාතකය මූගපක්ඛජාතකය සත්තුභත්තජාතකය මහාසුතසොමජාතකය ඛන්තිවාදජාතකය මහාජනකජාතකය එකරාජ ජාතකය ලොමහංසජාතකය යන මේ ආදිවූ ජාති කොටිසතසහස්‍රයක්හි අඞ්ගපරිත්‍යාගය ධනපරිත්‍යාගය ජීවිතපරිත්‍යාගය කරන්නේ දනපාරමිතාව දනඋපපාරමිතාව දනපරමාර්ථපාරමිතා

ය යනාදී සමත්‍රිංශත් පාරමිතාධර්මයන් පූරා ධජවිහෙඨජාතකාදී අනෙක ජන්ම කොටිසතසහස්‍රයෙහි ලොකාර්ථචය්‍යාව පූරා භද්‍රසාලජාතකාදී අනෙක ජන්ම කොටිසතසහස්‍රයෙහි ඥාත්‍යර්ථචය්‍යාව පූරා මහාඋම්මග්ගජාතකාදී අනෙක ජන්ම කොටිසතසහස්‍රයෙහි බුද්ධිචය්‍යාව පූරා මේ ත්‍රිවිධ චය්‍යායෙහි කෙළ පැමිණ සිවිජාතකාදී අනෙකජන්ම කොටිසතසහස්‍රයෙහි අඞ්ගපරිත්‍යාගය කළහ. සසජාතකාදී අනෙක ජන්ම කොටිසතසහස්‍රයෙහි ජීවිතපරිත්‍යාගය කළහ. කුරුධර්මජාතකාදී අනෙක ජන්ම කොටිසතසහස්‍රයෙහි වරධන පරිත්‍යාගය කළහ වෙස්සන්තරජාතකාදී අනෙක ජන්ම කොටිසතසහස්‍රයෙහි පුත්‍රපරිත්‍යාගය කළහ· දාරපරිත්‍යාගය කළහ යි මෙසේ මේ පඤ්චමහාපරිත්‍යාගයන් ද පරිත්‍යාගකොට වෙස්සන්තරාත්මයෙහි සිට සත්වරෙක මහීකම්පාකිරීම පෙරදැරිකොට ඇති මහඳාන්දී වෙස්සන්තරාත්මභාවයෙන් චුතව ගොස් තුසිතදිව්‍යලොකයෙහි සේතකෙතු නම් දිව්‍යපුත්‍රව උපන්හ.

මෙසේ තමන්වහන්සේගේ පූර්වප්‍රණිධාන ප්‍රකාශකොට දෙව්මිනිසුන්ට කරණලද උතුම් සද්ධර්මානුශාසනා ඇතිහෙයින් ලොකාග්‍රවූ මාගේ බුදුරජ "ශාස්තෘ" නම් වනසේක·

එසේ හෙයින් කියනලදී.

දෙවානමනුස්සානං ලොකෙ අග්ගඵලං දදං
දදන්තං දමයන්තානං පුරිසාජඤ්ඤ තෙ නමො-සී.

ලෝවැඩ පිණිස කරණලද මේ ශ්‍රීසද්ධර්මාවවාදසඞ්ග්‍රහයෙහි මෙතෙකින් දූරෙනිදානය කියා නිමවනලදී.

——:※:——

මෙසේ පූරණලද බොධිසම්භාරධර්මයන් ඇතිව තුසිතභවනයෙහි උපන් අපමන බෝසතානන්වහන්සේගේ බුදුවීමට දහසක් හවුරුදුකල් තිබැද්දී ශුද්ධාවාසවාසීබ්‍රහ්මරාජයෙක් බ්‍රාහ්මණවෙශයෙන් සැරහී මහත් ප්‍රීතිසොම්නසින් පිරිගිය සිත් ඇතිව මෙයින් හවුරුදු දහසක් ගියකල බුදුවරකෙනෙක් ලොව පහළවනසේකැයි කියා මිනිස්ලොව ඇවිද හඬනැඟූකල්හි ඒ ශබ්දය ඇසූ දසදහසක්සක්වළ දිව්‍යබ්‍රහ්මයෝ මේ මඟුල්සක්වළට රැස්ව බුදුවන ඒ බෝසතානන් කරා පැමිණ දිව්‍යමල් දිව්‍යසුවඳ ආදියෙන් පුද බුදුවීමට යාඥා කළකල්හි කාලය දීපය දෙශය කුලය මාතෘවය යන පස්මහබැලුම් බලා "කාලොයං තෙ මාරිස බුද්ධභාවාය" යනුයෙන් දෙව්බඹනට සංග්‍රහකොට යමුදී ගව්‍ය තුසිතපුර වැසි දෙවියන් විසින් පිරිවරණලදුව සියලු දෙව්ලොවම ඇති බැවින් එහිදු ඇති නඳුනොද්‍යානයට වැද එහි සෙසු දෙවතාවන් විසින් නිදුකානන්වහන්ස මෙයින්

චුතව සුගතියට යව සුගතියට යව යි කියා පෙර කළ කුශලධර්මයන්
හා කාලය සිහිකරවනුලබමින් ඇවිදිනාමවූ අපමහබෝසතාණෝ
එයින් චුතව කපිලවස්තුපුරයෙහි සුද්ධොදන මහරජ්ජුරුවන්ගේ
අගමෙහෙසුන් වූ මහාමායාදේවීන්ගේ කුක්ෂියෙහි ගුරුදින උත්‍රස
ළේ නැකතින් පිළිසිඳගත්සේක.

එදින ඇසළපුණුපොහෝදවස වන්නේය එදවස්හි නැකත්කෙ
ළියට ඝොෂණය කළ හෙයින් මහජනයෝ රැස්ව නැකත්කෙළි
කෙළනාහුය. එකල්හි ඒ පෞර්ණමී දිනයට පළමුවෙන් ම සත්දව
සක පටන් සුරාපාන මාලාගන්ධවිලෙපන සෙවනයෙන් දුරුව ම
හත් වභූතිසම්පන්නවූ ඒ නැකත්කෙළි බලමින් ක්‍රීඩාවෙහි යෙදී
වසන මහාමායාදෙවීතොමෝ හත්වන දවස්හි උදෑසනම නැගී
සිට සුවඳපැන්හි හිස් සොදා නහා සාරලක්‍ෂයක් වස්තු වියදමෙන්
දන් දී සර්වාලඞ්කාරයෙන් සැරහී උතුම් භොජනය වළඳා උපෝසථා
ඞ්ගය සමාදන්ව අලඞ්කෘත ශ්‍රීයහන්ගෙට වැද නිද්‍රොපගතවූකල්හි
පශ්චිමයාමයෙහි දෙතිස්මහාපූර්වනිමිති පහළකරමින් මවුකුසපිළි
සිඳගත් ඒ මහබෝසතාණෝ දසමස් ඇවෑමෙන් මවුකුසින් බිහිව
ක්‍රමයෙන් වැඩිවය පැමිණ එකුන්තිස්හවුරුද්දක් ගිහිගෙයි වැස
යසොධරා නම් බිසව කුසින් රාහුල නම් පුත්‍රුවන උපන්කල්හි
සතරපූර්වනිමිති දැක කණ්ඨක නම් අශ්වයාවෙන් මහබිණික්මන්
නික්ම අනොමා නම් ගංතෙරදී මහබඹ දුන් අටපිරිකර පිළිගෙ
ණ පැවිදිව එතැන්පටන් සතියක් මුළුල්ලෙහි අන් කිසි ආහරයක්
නොවළඳා පැවිදිසැපයම වළඳා රජගහනුවරට වැඩ පිඬු සිඟිමෙන්
හැසිර නුවරවැසියන් හැම කුල්මත්කරවා පාණ්ඩව පර්වතච්ඡායා
වෙහි වැඩහිඳ ආහර වළඳා එතනට පැමිණි බිම්සර මහරජහු විසින්
රාජ්‍යයෙන් පැවරූකල්හී ඒ රාජ්‍යය ප්‍රතික්ෂෙපකොට බුදුව පළමු
කොට ම මේ නුවරට එම යි ප්‍රතිඥ දී එයින් නික්ම අනුක්‍රමයෙන්
දනව් සැරිසරා ඇවිදිනාසේක් මහත් යසපිරිවර ඇති සප්තසමා
පත්ති ලාභී වූ ආලාරතාපසයන් හා හරණිලද ලොකස්වාදවිෂය
ඇති අෂ්ට සමාපත්තිලාභී වූ උද්දකතාපසයන් දැක මේ තාපසව
රුන් දෙදෙනා කරා ගොස් කීපදවසක් එහි වාසයකොට අෂ්ටස
මාපත්තීන් උපදවාගෙණ ධ්‍යානමාත්‍රාවකින් බුදුව මිස ලෝවැඩක
ළනොහැක්කැයි සිතා එහිත් ලොභය හැර ඒ තපස්වීන්ගේ සමයෙ
හින් නිවන් නැතිබව විශෙෂයෙන් දැන එයිනිදු නික්ම දෙව්මිනි
සුන්ට තමන්වහන්සේගේ වීර්‍ය දක්වමි සිතා උරුවෙලා නම් දනව්
වට වැඩ නෙරඤ්ජරා නම් ගංගාතීරයෙහි වූ විසාල සාලවනයෙහි
දී මහත්වූ වීර්‍ය පූර්වාඞ්ගමවූ දුෂ්කරක්‍රියා කොට මෙසේ අපමහබෝ

සහාතෝ පළමුවෙන් දිව්‍යාඞ්ගනාවන් විසින් පිරිවරණලදුව දිව්‍යලෝකසැප අනුභවකරන්නාවූ ශක්‍රදෙවෙන්ද්‍රයන් මෙන් පළමු කිඹුල්වත්පුරයෙහි රාජ්‍යශ්‍රීසැපය බොහෝකලක් අනුභවකිරිමෙන් කාමසුඛල්ලිකානුයොග සඞ්ඛ්‍යාත රූපශබ්දාදිවූ විෂයාශ්වාදයෙහි සිතින් ඇලීමෙන් සහ කයින් යෙදීමෙන් නිවන් නැතිබව ලොවුට ප්‍රකාශකොට නැවත ආකාශපථය ගැටලන්නාක්හු මෙන් ද පෙළොව පෙරලන්නාක්හු මෙන් ද කිසිකෙනෙකුන් විසින් නොකොට හැකි දුෂ්කරක්‍රියා කෙරෙමින් අත්තකිලමථානුයොග සඞ්ඛ්‍යාතවූ ශරීරපීඩායෙහි යෙදීමෙන් නිවන් නැතිබව දක්වා මධ්‍යම ප්‍රතිපන්නිවූ ආර්‍ය්‍යඅෂ්ටාඞ්ගිකමාර්‍ගයෙහි පිළිපදනාසේක් ඖදාරිකවූ ආහාරපානවර්‍ගයන් අනුභවකිරීමෙන් ශරීරය පිණවාගෙණ වෙසක්මස මැදිපොහෝදිනයෙහි උදයගිරිපර්‍වතයට සිඛාමාණික්‍යයක් බඳුවූ හිරු නැඟිකල්හි උදෑසනම ගොස් පිඬු සිඟන්නාවූ වේලා පරීක්‍ෂාකරන්නේ අජපාලනිග්‍රොධරුක සමීපයෙහි සියලු වෘක්‍ෂයන් රන්වන්කොට මෙඝපටලයකින් නික්මුණු සූර්‍ය්‍යමණ්ඩලයක් මෙන් බබලමින් හුන්සේක. එකල්හි උරුවෙලානම් දනව්වෙහි සෙනානි නම් කෙළෙඹිපුත්‍රයාගේ දුවූ සුජාතා නම් උත්තම ස්ත්‍රියක් වැඩිවිය පැමිණ ඒ අජපාලනිග්‍රොධවෘක්‍ෂයෙහි ප්‍රාර්ථනාවක් කොට පිරුණාවූ මනදෙල ඇත්ති වෙසක්මස මැදිපොහෝදිනයෙහි අද වෘක්‍ෂදෙවතාවාට බලිකර්‍මය කෙරෙමි යි සිතා උදෑසනම අතිමධුරවූ ක්‍ෂීරපායාසය පිස ලක්‍ෂයක් වටනා සතරන්තලියක් මැද ඒ ක්‍ෂීරපායාසය පුරා එසේම ලක්‍ෂයක් වටනා ස්වර්ණරන්තලියකින් වසා ඉස තබාගෙණ සුවඳමල් හා වස්ත්‍රාභරණයෙන් සැදුම්ලද උතුම්වූ රූපශොභා ඇති ඒ සුජාතාතොමෝ අනෙකප්‍රකාරවූ ආභරණයෙන් හා විචිත්‍රවස්ත්‍රමල්දම්ආදියෙන් සැරහී සුගන්ධාඞ්ගරාගයෙන් යුක්තවූ හාවභාවයෙන් ලීලොපෙතවූ තරුණස්ත්‍රීන්විසින් පිරිවරණලදුව ස්ඵුටවූ පටහභෙරීධ්වනිප්‍රබන්ධයෙන් සියලු සක්වළ පුරන්නාක් වැන්නී සියලු ලොකධාතුව මලින් ගැවසීගන්නාක්මෙන් ද සුවඳින් ගැවසීගන්නාක්මෙන් ද කෙරෙමින් යන්නී ඒ නිග්‍රොධවෘක්‍ෂය හා අධිකවූ කුශලසම්භාරානුභාවයෙන් නිපන්බැවින් රූපවත්වූ ශ්‍රීමහාබොධිසත්වයන් දුරදීම දැක උපන්නාවූ ප්‍රීතිසොම්නස් ඇත්තී වෘක්‍ෂදෙවතාවාය යී සිතන්නී දැක්ම හා සමග නැමී නැමී ගොස් ලහිරුමඬලක් බඳු රන්තලිය ඉසින් බා ඒ මහාබොධිසත්වයන්ගේ රතැඹුලමලක් බඳුවූ කෝමලවූ අත්ලෙහි තබා පොළෝතෙලෙහි තබනලද නලල් තැමිනි අඩසඳ ඇත්තී මාගේ මනදෙල යම්සේ සමෘද්ධවිද එපරිද්දෙන් ම නුඹවහන්සේගේත් මනොරථය සිද්ධවේවයි

කියා ඉතා සිත්කළුවූ තෙපුල් කීමෙන් සතුටුව ගියාය. ඉක්බිත්
තෙන් ලොකස්වාමිවූ ඒ මහාබොධිසත්වයොද රන්තලිය ගෙණ
ගංගාතීරයෙහි හටගත්තාවූ වෘක්ෂයෙන් වගුළ මල්රොණින්
රන්වන්වූ නෙරඤ්ජරා නම් ගංතෙරට ගොස් ඒ ගංතෙර සුප්‍ර
තිෂ්ඨිත නම් තොට සුනුවූ වැලිතලාව මත්තෙහි ඒ ක්ෂීරපායාසය
තබා අපරසාගරයට බස්නාවූ සූර්ය්‍යමණ්ඩලයක් මෙන් ගංගාව
ට බැස පොළොවට බට ආකාශතලයක් බඳුවූ ජලතලාව දෙවූ
දුනු දහස්ගණන් බබුලුවන කලක් මෙන් ශර්රාලොකයෙන් බබු
ලුවමින් ගැලි ජලස්නානය කොට පූර්වසාගරතටයෙන් නැංගාවූ
සූර්ය්‍යයාමෙන් ගඟින් ගොඩනැගී ගංතෙර හිඳ ක්ෂීරපායාසය අනු
භවකොට උඩුගංබලා යෙවයි රන්තලිය ගඟ හැර ඒ ගංගාතීර
යෙහි ම සුවඳමලින් සැදුම්ලද සල්වෙනෙහි දිවාවිහරණය කොට
සවස්වේලෙහි දෙවියන්විසින් සරහා පිළියෙළකරණලද අටඉස්
බක් පමණ පළල ඇති මාර්ගයෙන් දෙවියන්විසින් සරහා පිළියෙ
ළකරණලද අනෙකප්‍රකාරවූ පූජා විඳිමින් වඩනාසේක් සොත්ථිය
නම් බමුණෙකු විසින් දෙනලද ඊතණ අටමිටක් ගෙණ ඉතා වට
මට සෑපුවූ කඳ ඇති ඝනකොට බඳනාලද මොනරපිල්කළඹෙක්හී
පිල් මඬුල්ලක් බඳුවූ නිල්වූ පත්‍රයෙන් හා පබලුපෙති වැනි රත්වූ
පල්ලවපත්‍රයෙන් සොභාමානවූ ශාඛාමණ්ඩලයක් ඇති තමන් උ
පන්දවස්හි ම උපන්නාවූ හැම බුදුන් බුදුවන ජයභූමියෙහි හට
ගත්තාවූ කරුණාවෙන් සිහිල්වූ තමන්ගේ ලයසේ සිහිල්වූ සෙව
න ඇති ඇසටුමහබෝරුක කරා එළඹ තුන්යලක් පැදකුණුකො
ට ඉසානකොන සිට තණ සලා තෙළිඅගින් පිරිහුන්නාක්වැනි
ව උපන්නාවූ තුදුස්රියන් පමණ තණඇතිරිය දක ඒ තෘණ
සතය මස්තකයෙහි මාගේ සම් මස් ලේ ඇට නහර වියලී සුණු
විසුනුවනකල්හි ද සම්‍යක්සම්බොධියට නොපැමිනමාගේ වීර්ය්‍ය
නොහකුළුවම්යි පලක් බැඳ බොධිවෘක්ෂයට පිටලා නැගෙණහි
රට අභිමුඛව වැඩහුන්සේක.

එකල්හි මහාබොධිසත්වයන්ට ශක්‍රදෙවෙන්ද්‍රතෙම එක්සියවිසි
රියනක් පමණ දිග ඇති භුවනොදරයෙහි ව්‍යාප්තවන ධ්වනි ඇ
ති විජයුත්තර නම් සක පිඹිමින් සිටියේය. එසේම පඤ්චසිඛ නාම
ගන්ධර්වදිව්‍යපුත්‍රතෙම තුන්ගවුවක් පමණ දිග ඇති බෙලුවපාණ්ඩු
වීනාව ගෙණ ගායනාකෙරෙමින් සිටියේය. සුයාම නම් දිව්‍යපුත්‍රද
තුන්ගවුවක් පමණ දිග ඇති ශරත්කාලයෙහි චන්ද්‍රමරීචිසමූහයක්
සේ සශ්‍රීකවූ දිව්‍යචාමරය මදින් මද සලමින් සිටියේය. සන්තුසි
ත නම් දිව්‍යපුත්‍රද මැණික්තල්වැටක් ගෙණ සැපවූ මාරුතපරම්
පරාවෙන් පිණවමින් සිටියේය. සහම්පති මහාබ්‍රහ්මතෙම තුන්

යොදනක් පළලඇති දෙවෙනි පුන්සඳක් වැනිවූ සේසත මස්තක යට දරමින් සිටියේය. කාල නම් නාගරාජතෙම අසූදහසක් පමණ නාටිකාවන් විසින් පිරිවරණලදුව ස්තුතිවචන සහස්‍රයෙන් ගායනාකෙරෙමින් සිටියේය. දෙතිස්දිව්‍යකුමාරිකාවෝ දිව්‍යපුෂ්පයෙන් පිරිපුණ්වූ අනෙකප්‍රකාර රන්කරඬු ගෙණ පුදමින් සිටියාහුය. සියලු දසදහසක්සක්වළ දෙවියෝ සැනවෙළ ගෙණ හාත්පසින් නගනලද ධවජපතාක හා කෙසෙල්තොරණ හා මල්දම් ගත් අත් ඇත්තාහු ගන්නාලද පුන්කලස් හා දුම්මාලා හා මිණිදඬුවැටපහන් ඇත්තාහු දරණලද අටමඟල හා රුවන්කැටපතපඞ්ක්ති ඇතිව පෘථිවියෙහි පටන් අකනිෂ්ඨබ්‍රහ්මලොකය දක්වා අතුරක් නැතිව ගිවි ගැවසී සිටියාහුය.

එකල්හි සියලු පෘථග්ජනලොකයා තමා වසඟයෙහි පවත්වන හෙයින් වසවර්ති නම් වූ වසවර්ති නම් දිව්‍යලොකයෙහි මාරදිව්‍ය පුත්‍රතෙමේ මේ සිද්ධාර්ථකුමාරයා එකාන්තයෙන් අසිද්ධවූ අර්ථඇත්තා කෙරෙමියි අත් දහසක් මවාගෙණ දිලිසෙන්නාවූ වහනිෂයවූ අසිසත්තිතෝමරභෙණ්ඩිවාලාදීවූ අනෙකප්‍රකාරවූ ආයුධයන් ගෙණ යෙළසියයක්යොදුන් උස ඇති ගිරිමෙඛලා නම් චණ්ඩහස්තිරාජයා පිට්ට පැනනැගී සිංහව්‍යාඝ්‍රයක්ෂරාක්ෂසාදිවූ අනෙකප්‍රකාරවූ මුහුණු ඇති ගිනි ඇවිලියාක් වැනි තඹවන් කෙස් ඇති රත්වූ පිටතට නික්මුණුවූ ඇස් ඇති පිටතොල් ඩැහැමෙන් භයඞ්කරවූ මුහුණු ඇති සර්පාභරණයෙන් සැරහී අනෙකප්‍රකාරවූ ආයුධ ගත් අත් ඇති පිටතට නික්මුණු මහත් දළඇති සකල ශරීරයෙන් හා මුඛයෙන් නික්මෙන්නාවූ වහ්නිජ්වාලාවන් ඇති සරොෂවූ කල්පාන්ත වහ්නියක්සේ දිලියෙන්නාවූ භයානක විසුළුවත්වූ ප්‍රමාණාතික්‍රාන්තවූ මාරසේනාවවිසින් පිරිවරණලද්දේ දහසක්යොත්නෙහි පටන් ගර්ජනාකරණලද ප්‍රළයකාලයෙහි මෙඝමාලාවන්ගේ ඝර්ෂණයෙන් උපන්නාවූ ප්‍රචණ්ඩවූ සෙනහඩ දහස්සුවහස් නැගෙණකලක් මෙන් දරුණුවූ ඝොරබිරම්හඬින් සියලු ලෝකය එකනින්නාදකොට සිද්ධාර්ථකුමාරයා ගනුව මරව විදුව දෙකකුල ගෙණ සමුද්‍රයෙන් එපිට දමවයි විධානකරන්නේ කල්පාන්තමාරුතවේගයෙන් ගසා දමනලද පුලුන්රලක් පරිද්දෙන් තමාගේ දූක්ම හා සමග දිව්‍යබ්‍රහ්මාදීවූ සියලු දෙවතාවන් පලවන්නේ හාත්පසින් පර්වතකූටකයක්සේ මැඩගෙණ අභිනව මෙඝධ්වනියක් බඳුවූ ගම්භීර ධීරනාද ඇති භයඞ්කරවූ ප්‍රචණ්ඩවූ ආරම්භ ඇති වායුවේගයක් මවා ඒ මාරුතවේගයෙන් කාඤ්ජිකාගේ දජිය දුරුකරන්නාවූ ඒ මහාපුරුෂයානන්වහන්සේගේ සිවුරුකොනක් පමණකුත් සොලවන්ට අසමර්ථවූයේ ප්‍රළයකාලයෙහි වර්ෂාවෙගයක් බඳුවූ වේග

ඇති මහත්වූ වර්ෂාවක් වස්වා ඒ වර්ෂාවෙන් හිමබින්දුවක්. පමණකුත්
ජලබින්දුවක් අනඞ්ගධ්වජය සිද හෙලූ ඒ මහබෝසතාණන්ගේ ස
මීපයටත් එළවන්ට අසමර්ථවූයේ හාත්පසින් නික්මෙනලද වහ්නි
ශිඛා සතසහස්‍රයෙහි ගිනිපුපුරුසමූහයෙන් ගැවසීගත්තා වහ්නිජ්ජ
ලාවෙන් වලදනාලද පාෂාණවර්ෂාවක්ද ආයුධවර්ෂාවක්ද ගිනිඅඟු
රුවර්ෂාවක්ද හුනුඅළුවර්ෂාවක්ද කලල්වර්ෂාවක්ද වැලිවර්ෂාවක්ද
වස්වා ඒ සියලු වර්ෂාවන් අතුරෙන් පාෂාණවර්ෂාව මල්වටබවට හා
ආයුධවර්ෂාව මල්දම්බවට හා අඟුරුවර්ෂාව මල්වැසිබවට හා බස්
මවර්ෂාව සඳුන්සුණුබවට හා වැලිවර්ෂාව මල්රොන්බවට හා ක
ලල්වර්ෂාව දිව්‍යසුවඳවිලවුන්බවට පැමිණියා දැක ලෝඇදිරිමහ
නරකයෙක අඳුරු සේ දරුණුවූ භයානකවූ අන්ධකාරයක් මවා විද්‍යා
නැමති අන්ධකාරය පවා නසන්නාවූ ඒ මහාපුරුෂයානන්වහන්
සේගේ ශරීරරශ්මියෙන් හිරුදහස් නැගිකලක් මෙන් උපන්නාවූ
ආලෝක දැක කෝපයෙන් රත්වූ මුඛමණ්ඩලයෙහි පැලඹෙනලද
බැම බිඳීමෙහි භයානකවූ වෙස් දරන්නේ මේරුමන්දරාදිවූ පර්
වතයන් හුණකිලලක්මෙන් කඩකරන්නාවූ ඉතානිපුණවූ දිව්‍යානු
භාවයෙන් යුක්තවූ කරමුවහත් ඇති චක්‍රායුධය දමා ඒ චක්‍රායුධය
ඒ මහාබෝධිසත්වයන්වහන්සේගේ මස්තකයෙහි මල්කුඩයක් මෙ
න් සිටියා දැක මාරසේනාව විසිතුරු දමනලද්දවූ මහත්වූ මාරානු
භාවයෙන් යුක්තවූ දුවන්නාවූ දිලිසෙන්නාවූ පර්වතකූටයන් මල්
වටබවට පැමිණියා දැක උපන්නාවූ සෝක ඇත්තාවූ වසවර්තිමාර
තෙම ඒ ශ්‍රීමහබෝසතාණන්කරා එළඹ සිද්ධාර්ථකුමාරයෙනි නැගී
සිටුව මේ පර්යංකය මට පැමිණෙන්නේ යයි කියා ඒ නොදිනිය
හැකි වික්‍රම ඇති මහාපුරුෂයානන්විසින් එම්බල වසවර්තිමාරය
මේ පර්යංකය ලබන්නට කාරණවූ කුශලධර්මයන් කිරීමෙහි තට
සාක්ෂි කවුරුදැයි කීකල්හි මොහු ඇමදෙනා සාක්ෂියයි මාරසේනාව
අභිමුඛකොට අත දික් කොට ප්‍රලයසාගරයෙහි ඝෝෂාව පරද
වන්නාවූ ඝෝරබිරම්හඬින් මම සාක්ෂිය මම සාක්ෂිය යි කියා මාර
සේනාවලවා සාක්ෂිබව කියවා සිද්ධාර්ථකුමාරයෙනි තොපට සාක්ෂි
කවුරුදැයි කියා ඒ අසාධාරණවූ පරාක්‍රම ඇති මහාපුරුෂයානන්
විසින් මට මෙතැන්හි සචේතනිකවූ සාක්ෂිකෙනෙක් නැතැයි කි
යා රත්වලාගැබකින් නික්මුනාවූ රත්විදුලියක් මෙන් චීවරගර්භ
යෙන් දක්ෂිණශ්‍රීහස්තය පිටත්කොට පොළොවට අභිමුඛකොට පා
රමිතාභූමියෙහි දී නොයෙක්වර ගර්ජනාකොට දැන් කවරකාරණ
යකින් නිශ්ශබ්දවූයෙහිදැයි කියා මහාපෘථිවියවිසින් එබස් අසා
නොයෙක් සියදහස් ගණන් ගර්ජනාසඞ්ඛ්‍යාතවූ ධ්වනි පැවැත්වූකල්
හි පෙර අනුන් තමාවිෂයෙහි පවත්වන්නාවූ ඒ වසවර්තිමාර

තෙම දුන් .තෙමේ තමාවූ සභයෙහි පවත්නට අපොහොසත්ව
හයින් ත්‍රස්තවූයේ ඉස් ලූ ලූ දිසාවෙන් දිවන මාරසේනාව හා සමග
ගන්නාලද ආයුධයන් හා වස්ත්‍රාභරණයන් දමා චක්‍රවාටපර්වතය
දක්වා පැරද පලාගියේය.

මෙසේ ඒ මහාපුරුෂයානන්වහන්සේ හිරුඅස්තයට යන්නට පූර්ව
භාගයෙහි ම මාරසේනාව විධ්වංශනයකොට අභෙද්‍යපර්‍යඞ්කය වී
රපර්‍යඞ්කය ජයපර්‍යඞ්කය වරපර්‍යඞ්කය මඞ්ගලපර්‍යඞ්කය යි කියු
නලද මහාබොධිපර්‍යඞ්කයෙහි හුන්සේක.

එකල්හි පූර්වොක්ත ක්‍රමයෙන් දසදහසක්සක්වළ දිව්‍යබ්‍රහ්මාදීන්
විසින් දිවමල්දිවසුවඳ ආදියෙන් සක්වළකුහරය පුරා අනෙකප්‍ර
කාර පූජෝත්සව පැවැත්වීමෙන් එකසොභා එකොජ්වලිත එකො
ත්සව එකකොලාහල කරන්ට පටන්ගත්හ එසේ ඇතිකල්හි මහා
පුරුෂයාණෝ පෙරයම්:—

එකම්පි ජාතිං ද්වෙ'පි ජාතියො තිස්සො'පි ජාතියො චතස්සො'පි
ජාතියො පඤ්චා'පි ජාතියො දස'පි ජාතියො වීසතිම්පි ජාතියො තිං
සම්පි ජාතියො චත්තාරීසම්පි ජාතියො පඤ්ඤාසම්පි ජාතියො ජාති
සතම්පි ජාතිසහස්සම්පි ජාතිසතසහස්සම්පි අනෙකෙ'පි සංවට්ටක
ප්පෙ අනෙකෙ'පි විවට්ටකප්පෙ අනෙකෙ'පි සංවට්ටවිවට්ටකප්පෙ
අමුත්‍රාසිං එවං නාමො එවං ගොත්තො එවං වණ්ණො එවමාහා
රො එවං සුඛදුක්ඛප්පටිසංවෙදී එවමායුපරියන්තො සො තතො චු
තො අමුත්‍ර උදපාදිං තත්‍රාපාසිං එවං නාමො එවං ගොත්තො එවං
වණ්ණො එවමාහාරො එවං සුඛදුක්ඛපටිසංවෙදී එවමායුපරිය
න්තො සො තතො චුතො ඉධූපපන්නොති ඉති සාකාරං සඋද්දෙ
සං අනෙකවිහිතං පුබ්බෙනිවාසං අනුස්සරාමි-යි.

මෙසේ දක්වනලද පෙර විසූ කඳපිළිවෙළ සිහිකරන්නේ ප්‍රමාණ
තික්‍රාන්තවූ අතීතකාලයෙහි පැවැත්තාවූ මොහ නැමති අන්ධකා
රය නසා, මධ්‍යමයාමයෙහි:-

සො දිබ්බෙන චක්ඛුනා විසුද්ධෙන අතික්කන්තමානුසකෙන ස
ත්තෙ පස්සාමි චවමානෙ උපපජ්ජමානෙ හීනෙ පණීතෙ සුවණ්ණෙ
දුබ්බණ්ණෙ සුගතෙ දුග්ගතෙ යථා කම්මූපගෙ සත්තෙ පජානාමි
ඉමෙ වත භොන්තො සත්තා කායදුච්චරිතෙන සමන්නාගතා ව
චීදුච්චරිතෙන සමන්නාගතා මනොදුච්චරිතෙන සමන්නාගතා
අරියානං උපවාදකා මිච්ඡාදිට්ඨිකා මිච්ඡාදිට්ඨිකම්මසමාදානා තෙ
කායස්ස භෙදා පරම්මරණා අපායං දුග්ගතිං විනිපාතං නිරයං උ
පපන්නා ඉමෙ වා පන භොන්තො සත්තා කායසුචරිතෙන සම
න්නාගතා වචීසුචරිතෙන සමන්නාගතා මනොසුචරිතෙන සම

නනාගතා අරියානං අනුපවාදකා සම්මාදිට්ඨිකා සම්මාදිට්ඨිකම්ම සමාදනා තෙ කායස්ස භෙදා පරම්මරණා සුගතිං සග්ගං ලොකං උපපන්නාති ඉති දිබ්බෙන චක්ඛුනා විසුද්ධෙන අතික්කන්තමානුස කෙන සත්තෙ පස්සාමි චවමානෙ උපපජ්ජමානෙ හීනෙ පණී තෙ සුවණ්ණෙ දුබ්බණ්ණෙ සුගතෙ දුග්ගතෙ යථා කම්මූපගෙ සත්තෙ පජානාමි-යි.

මෙසේ දක්වනලද චුතවන්නාවූ ද උපදනාවූ ද සත්වයන් දිව සින් බලන්නේ ප්‍රමාණාතික්‍රාන්තවූ අනාගතකාලයෙහි පවත්නාවූ මොහ නැමති අන්ධකාරයන් නසා, පශ්චිමයාමයෙහි වර්තමානකා ලයෙහි පැවැත්තාවූ අවිද්‍යා නැමති අන්ධකාරසමූහය ද නසන ප්‍රණී ස අසාධාරණවූ අපාරවූ ප්‍රතීත්‍යසමුත්පාද නැමති සාගරයෙහි මහාප්‍රඥ නැමති මෙරමත බහා අලලන්නාක්හු මෙන් “අවිජ්ජාප ච්චයා සඞ්ඛාරා” යනාදීන් නැඟී ජරාමරණ පර්‍යන්තවූ වාදශා ඞ්ගය වත්ත නම “අවිජ්ජාය නිරොධා සඞ්ඛාරනිරොධො” යනාදීන් නැඟී ජරාමරණ පර්‍යන්තවූ වාදශාඞ්ගය විවර්ත්තනම, මෙසේ වර්ත විවර්ත්තවශයෙන් ආදිය පටන් ගෙණ අන්තය දක්වා ලක්ෂණ රස ප්‍රත්‍යුපස්ථාන පදස්ථාන වශයෙන් සම්මර්ශනය කිරීම අනුලොම නම් වෙයි, අන්තයෙහි පටන් ගෙණ ආදිය දක්වා සම්මර්ශනයකිරීම ප්‍ර තිලොම නම් වෙයි, මධ්‍යයෙහි පටන් ආද්‍යන්තකෙළවර දක්වා ස ම්මර්ශනයකිරීම උභයතොවර්ධන නම් වෙයි, ආද්‍යන්තකෙළවර පටන් ගෙණ මධ්‍යය දක්වා සම්මර්ශනයකිරීම මධ්‍යසංක්ෂෙප නම් වෙයි, පළමුවන අවිද්‍යාප්‍රත්‍යය සම්මර්ශනය කොට දෙවැනි වූ සංස්කාරප්‍රත්‍යයානයට නොගොස් එයින් සම්මර්ශනය කොට නැව ත පළමුවන අවිද්‍යාප්‍රත්‍යයට බැස ක්‍රමයෙන් වාදශාඞ්ගය දක්වා නැඟී පළමුවන අවිද්‍යාප්‍රත්‍යය දක්වා බැස සම්මර්ශනයකිරීම ස තොත්තරවිංශතිප්‍රත්‍යයගත නම් වෙයි, මෙසේ අනුලොමප්‍රතිලො මාදි මහාපඤ්චකයන් වශයෙන් සම්මර්ශනය කරණසේක් දශබල චතුවෛශාරද්‍යාදිවූ ගුණ නැමති රත්නයෙන් පිරිවරණලද සර්වඥ තාඥාන නැමති අමෘතය සම්බන්ධකොට ගෙණ වාසනා සහිතවූ කාමාදිවූ ආශ්‍රවයන් සිඳ:—

ආසවානං ඛයා අනාසවං චෙතොවිමුත්තිං පඤ්ඤාවිමුත්තිං දිට්ඨෙව ධම්මෙ සයං අභිඤ්ඤා සච්ඡිකත්වා උපසම්පජ්ජ විහරාමි-යි:-

දක්වනලද ආශ්‍රවක්ෂයකරඥානය සම්මුඛිගමය කොට අතීතානා ගතවර්ත්තමානය යි කියනලද කාලත්‍රය වර්ජිතවූ සංස්කාර විකාර ලක්ෂණ නිර්වාණ ප්‍රඥප්තිය යන පඤ්චවිධඥෙයමණ්ඩල ලක්ෂණවූ සියලු පදාර්ථය අත්ලෙහි තුබූ නිර්මලමාණික්‍යරත්නයක් මෙන්

නිරවශෙෂක්‍ෂාට දැක සම්පූර්ණවූ මනොරථය ඇති ඒ තිලොගුරු බුදුරජානන්වහන්සේ ප්‍රීතිවෙගයෙන්:—

අනෙකජාති සංසාරං සන්ධාවිස්සං අනිබ්බිසං
ගහකාරකං ගවෙසන්තො දුක්ඛා ජාති පුනප්පුනං
ගහකාරක දිට්ඨොසි පුන ගෙහං න කාහසි
සබ්බා තෙ ඵාසුකා භග්ගා ගහකූටං විසඞ්ඛිතං
විසඞ්ඛාරගතං චිත්තං තණ්හානං ඛයමජ්ඣගා–යී.

මෙසේ සර්වඥපදප්‍රාප්තවූ මාගේ ස්වාමිදරුවූ බුදුරජානන්වහන්සේ බුදුවූ පළමුවන සතියෙහි මේ බොධිපර්‍ය්‍යඞ්කය කාරණකොට පඤ්ච මහාපරිත්‍යාගාදිය කිරීම්ආදී වශයෙන් පාරමීධර්මයන් පූරණයකිරී මෙන් ම මෙතෙක්කල් සසර දිව ඇවිද්දෙමි ඒ පර්‍ය්‍යඞ්කයෙහි ප්‍රාප්තනාවූ මාගේ සියලු මනදෙළ පිරිණියේය එහෙයින් තව මේ පර්‍ය්‍යඞ්කයෙන් නොනැගෙමියි සිතාවදාරා නොයෙක් කෙළගණන් සමාපත්ති සමවැද නිවන්සැප විළඳමින් වැඩඋන්සේක.

ඊට ඉක්බිතිව සමහර දෙවතාකෙනෙකුන්ගේ බුදුවූසේක්දෝ හෝ නොවේද්‍යෙහෝයි උපන් සැකය දුරුකරණ පිණිස ආකාශයට පැනනැගී ප්‍රාතිහාර්‍ය්‍ය දක්වා, තදනන්තරව බොධිපර්‍ය්‍යඞ්කයට පූර්වොත්තරදිශාභාගයෙහි වූ භූමිප්‍රදෙශයෙහි සිටිපියෙහි ම වැඩ සිට පස්පෑදිස්නා නෙත්‍රයුග්මයෙන් බොධිද්‍රැමය ඇසිපිය නොහෙලා ම බලාවදාරමින් අනිමිසලොචන පූජාවෙන් දෙවනසතිය අතික්‍රාන්තකළසේක.

ඉක්බිතිව බොධිවෘක්‍ෂයටද තමන්වහන්සේ වැඩසිටිස්ථානයටද දෙමාතුරෙහි අසදහසක්සක්වළ අසදහසක් මහමෙරමත්තෙහි මවනලද දිව්‍යමයවූ බිම්පලසෙවෙනි ආදී සර්වරත්නකර්ම නෙර්මිත රුවන්සක්මණෙහි අනෙකප්‍රකාර ප්‍රාතිහාර්‍ය්‍ය දක්වා සක්මින් කිරීමෙන් තුන්වනසතිය අතික්‍රාන්තකළසේක.

ඊට ඉක්බිතිව බෝමැඩට පශ්චිමොත්තරදිශාභාගයෙහි දෙවියන් මැවූ රුවන්ගෙයි වැඩහිඳ පන්සාළිස්හවුරුද්ද මුළුල්ලෙහි දෙසන සියලු ධර්මය සිහිකරවදාරමින් සතරවනසතිය අතික්‍රාන්තකළසේක.

ඊට ඉක්බිතිව අජපාල නම් නුගරුකමූල වැඩහිඳ නිවන්සැප වැළඳීමෙන් පස්වනසතිය අතික්‍රාන්තකළසේක.

ඊට ඉක්බිතිව මුචලිඳු නම් විලෙහි මහම්දෙල්රුකමූල සත්දවසක්මුළුල්ලෙහි ධාරානිපාතයෙන් වස්නා මහාවර්ෂාවට මුචලිඳු නම් නාගරාජයාගේ දරණගර්භයෙහි වැඩහිඳ ධ්‍යානසැපයෙන් සවනසතිය අතික්‍රාන්තකළසේක.

ඊට ඉක්බිති කිරිපළුරුකමුල ගලස්නක වැඩහිඳ සත්වනසති
ය ධ්‍යානසැප වැලඳිමෙන් අත්ක්‍රාන්තකළසේක.

මෙපමණකින් සත්සතිය සම්පූර්ණවිය, මේ එකුන්පණස්දවස මු
ළුල්ලෙහි මුඛශෞචාදී ශරීරප්‍රතිජග්ගනය කිරීමක් හා ආහාරකෘ
ත්‍යයක් නූවූයේය ධ්‍යානසුව මාර්ගසුව ඵලසුව විඳිමෙන් ම කා
ලාතික්‍රමණය කොට එකුන්පණස්වෙනි දිනයාගේ අවසානයෙහි
ඒ කිරිපලුරුකමුල වැඩඋන් බුදුරජානන්වහන්සේට මුව සෝදමි
යන සිතක් උපන, එවිට ශක්‍රදෙවේන්ද්‍රතෙම ශාස්තෘවූ බුදුරජානන්
වහන්සේගේ ඒ අභිප්‍රාව දැන හිමවතින් නාලියදැහැටි හා අනව
තප්තජලය ද ගෙණැවිත් පිළිගැන්විය, බුදුරජ ඒ දැහැටිදිය පිළි
ගෙණ මුව සොදාවදාරා එම රාජායතනමූලයෙහි වැඩඋන්සේක. ඒ
සමයෙහි තපස්සුභල්ලුක නම් වෙළඳදෙබෑයෝ උතුරුදනව්වෙහි
සිට පන්සියයක් ගැලින් බඩුපුරාගෙණ මධ්‍යමණ්ඩලයට යන්නාහු
ඒ කිරිපලුවනයට පැමිණිකල පෙර ඔවුන්ට නෑවූ දෙවතාදුවක් ඒ
වෙනෙහි වසන්නී ඒ මග යන වෙලඳදෙබෑයන් දැක මොවුන්ලවා
බුදුන්ට දානයක් දෙවමි සිතා ඒ ගෙණ යන පන්සියයක් ගැල් නා
හි දක්වා පොළොව ගලාපූව, ඒ දැක භයපත්වූ වෙලඳුන්ට දෙව්දූ
දෙව්පිරිස් පිරිවරා අහස සිට ඔවුන්ට පෙනී කියන්නී මාගේ බුදු
හු බුදුවූදපටන් එකුන්පණස්දවසක් මුළුල්ලෙහි ආහාරයක් නො
වළඳා නිරාහාරයෙන් මාගේ මේ වෙනෙහි පින්කෙත්ව වැඩඋන්
සේක, එහෙයින් තොපටත් මටත් පින් පුරාගන්නා පිණිස බුදුන්ට
අග්‍රභොජනයක් දෙවාලනුකැමැත්තෙමි කිව, ඒ යහපතැයි ගිවිස්
කල බිම ගැලී සිටි ගැල් හැරපූව, එකෙණෙහි පහන්සිත් ඇති
වෙලඳදෙබෑයෝ මීපිඬු ගෙණ ගොසින් බුදුන්ට පෙරටුව සිට ආරා
ධනාකළහ. මහණවූ ද බ්‍රාහ්මයා දුන් පාත්‍රය කිරිපිඬු පිළිගත්විට
අතුරුදන්වූහෙයින් කිරිපිඬු පිළිගත් තලිය නාගභවනයට ගියහෙ
යිනුත් මීපිඬු පිළිගන්නට පාත්‍රයක් නැත්තෙන් සතරවරම්හු
මුංවන් ශෛලමය පාත්‍ර සතරක් ගෙණවුත් පිළිගැන්වූහ, බුදුහු ඔ
වුන් සතරදෙනාට ම අනුකම්පා පිණිස ඒ සතරපාත්‍රයන් මතුමත්
තෙහි තබා එකක් වේවයි ඉටා චතුස්රෙඛා දක්වමින් එක්පාත්‍රයක්
ව සිටිකල ඒ පාත්‍රයෙන් මීපිඬු පිළිගෙණ වලදා ඒ වෙලඳදෙබෑ
යන්ට අනුමෙවෙනි බණ වදාළකල්හි බුද්ධසරණ ධම්මසරණ දෙක්
හි පිහිටා වෙවාචික නම් උපාසකව අපට නිති වැඳපුදාගන්නා
සේ පූජනීය වස්තුවක් දෙවාවදාළමැනවැයි කීහ. එවිට ස්වාමිදරු
වෝ ශ්‍රීහස්තයෙන් සිරස පිරිමැද කෙසධාතුමිටක් දුන්සේක. ඔහු
රුවන්කරඬුවකින් ඒ කෙසධාතුව පිළිගෙණ රථයෙහි තබා සිය
නුවරට ගෙණ ගොස් පිදුවාහුය.

බුදුරජානන්වහන්සේ ද කිරිපළුරුක්මුලින් නික්ම නැවත අටවෙනි සතියෙහි අජපාල නම් නුගරුකමුලට ම වැඩ එහි විවේකව වැඩහිඳ තමන්වහන්සේවිසින් අවබොධකරණලද ධර්මයාගේ ගම්භීරභාවය සියලු බුදුවරයන්ගේ ධර්මතාව වශයෙන් "අධිගතො ඛො මෙයං ධම්මො" යනාදී ක්‍රමයෙන් සිහිකරවදුරා එසේවූ ගැඹුරු ධර්ම රාගයෙන් රත්වූ ද්වෙෂයෙන් දුෂ්ටවූ මොහයෙන් මුළාවූ මේ ලෞකිකසත්වයො කෙසේ නම් අවබොධකෙරේද එසේවූ සත්වයන්ට මෙසේවූ ගැඹුරු ධර්ම දෙසීමෙන් ප්‍රයොජන කිම්දැයි කියා ධර්මගම්භීරභාවය සැළකීමෙන් හා එකලට ලොකසත්වයෝ බ්‍රහ්මරාජයා ම ශ්‍රෙෂ්ඨය යි කියා ගරුකොට වසන්නාහ එහෙයින් ඒ බ්‍රහ්මරාජයාගේ ආරාධනාවෙන් ම ධර්ම දෙසූකල එකාන්තයෙන් ශාන්තවූ ප්‍රණීතවූ උතුම්ධර්මයෙකැයි කියා ඇදහීම් වශයෙන් සත්වයෝ ශ්‍රවණයකරන්නාහුයයි යන කාරණයෙන් ද බුදුරජානන්වහන්සේ ධර්මදෙශනාවට මන්දොත්සාහව වැඩඋන්කල්හි ඒ පරිච්ඡේදය දුටු සහම්පති මහාබ්‍රහ්මරාජතෙම "නස්සති වත භො ලොකො විනස්සති වත භො ලොකො" යනාදී ක්‍රමයෙන් තමාගේ බ්‍රහ්මානුභාවයෙන් මහත් හඬ විහිදුවා කියමින් බඹලොවින් නික්මුණුකල්හි ඒ අඩ අසා එක්වූ දසදහසක් සක්වළ දිව්‍යබ්‍රහ්මසේනාව පිරිවරා ඇසිල්ලකින් අවුත් බ්‍රහ්මරාජතෙම බුදුරජානන්වහන්සේගේ ඉදිරිපිට දකුණුදනබඩල බිමට ඔබා උතුරුසළුව එකාංශකොට ගෙණ භාග්‍යවතුන්වහන්සේට දෙහොත් මුදුන්දී දන්වනුයේ ස්වාමීනි බුදුරජානන්වහන්ස මඳවූ කෙලෙසුන් ඇති අල්පරජස්ක සත්වයෝ ද ඇත්තාහ ඒ හැමදෙන නො ඇසීමෙන් ධර්මයෙන් පිරිහෙණ්නාහුය පූර්වබුදුවරයන්කෙරෙහි දශපූර්ණක්‍රියා වශයෙන් කෘතාධිකාරවූ සූර්ය්‍යරශ්මිස්පර්ශයෙන් ප්‍රබොධවන පද්මයන් සේ ධර්මදෙශනාවම පතා සිටිනා සත්වයෝ ඇත්තාහ චතුෂ්පදික ගාථාවකින් දෙසූ ධර්මයෙන් ආර්යභූමියට වදනාහු එකෙක් දෙන්නෙක් නොවෙයි නොයෙක්සත්වයො ධර්ම අවබොධකරන්නාහු වෙති තුඹවහන්සේ ධර්ම නො දෙසූකල්හි අනික් කවරෙක් ලොකයාට පිළිසරණවේද තුඹවහන්සේ විසින් අපරිමිත කල්පවල අනන්ත දුක් අනුභවකොට සියලු ලෝකයා සසරින් ගොඩනගණ පිණිස ම පාරමිතා පූරා මේ සර්වඥතාඥයට පැමිණීසේක තුඹවහන්සේගේ බුදුවීමට පලමුවෙන් මගධරට අශුද්ධධර්මයෙක් පහළ විය එහෙයින් අනාථවූ ලෝකයාට වැඩ පිණිස "දෙසෙතු භගවා ධම්මං දෙසෙතු සුගතො ධම්මං" යනාදීන් ධර්මදෙශනාවට ආරාධනාකලකල්හි මහාකරුණා උපදවා බුදුඇසින් ලොව බලනසේක් යම්සේ ලෝකයෙහි උපුල්වනයෙක්හිහෝ පියුම්වනයෙක්හි

හෝ එදවස් හෝ දෙතුන්වෙනි දවස්වල හෝ පිපෙන මල් වෙන් වෙන්ව ප්‍රකාශව පෙනේද්ද හැමට යට දියපත්ලෙහි සිටි කැකුළුමල් මස්කැසුප්ආදීන්ට ගොදුරුවීමෙන් විනාශවේද යන මෙසේ වූ සතරප්‍රකාරයක්ව සිටි පුෂ්පයන් සේ ලෝකයෙහි උත්ඝටිතඥ විපචිතඥ ඥෙය්‍ය පදපරම වශයෙන් චතුස්ප්‍රකාරවූ සත්වයන් දැක වදුරා ඔවුන් අතුරෙන් යමෙක්හට ගාථාර්ධයක් පමණ වූ සංක්‍ෂෙප ධර්මදෙශනාවක් ඇසීමෙන් ධර්මාභිසමය වන්නේවිනම් ඒ සත්ව උත්ඝටිතඥ නම් වේයි,යමෙක්හට චතුෂ්පදිකගාථාවකින් පමණ වූ සංක්‍ෂෙපදෙශනාවෙහි විස්තරයෙන් අර්ථවිභාගවූ ධර්මදෙශනාවක් ඇසීමෙන් ධර්මාභිසමය වන්නේවිනම් ඒ සත්ව විපචිතඥ නම් වෙයි, යමෙක්හට පාලිය ඇසීමෙන් අර්ථකථා ඇසීමෙන් යොනිසොමනස්කාර කල්‍යාණමිත්‍රසෙවනාදියෙන් ධර්මාභිසමය වන්නේවිනම් ඒ සත්ව ඥෙය්‍ය නම් වෙයි, යමෙක්හට බොහෝ ධර්මය ඇසීමෙනුදු දැරීමෙනුදු ඒ ජාතියෙහි ධර්මාභිසමය නොවන්නේවිනම් ඒ සත්ව පරපදම නම් වෙයි, මෙසේ එදවස ද දෙතුන්වෙනි දවස්වලද පිපෙන මල් වැනිවූ උත්ඝටිතඥාදී තුන්දෙනාට ම ඒ ජාතියෙහි ම අධිගම සිද්ධවීම හා නොපිපෙන මල් වැනි පදපරමසත්වයන්ට අනාගතභවයෙහි වාසනාවීම පිණිස හේතුවන්නේය ,එහෙයින් සියලු සත්වයන්ට ම වැඩ සාධකවූ ධර්මදෙශනාකිරීමට කරුණා උපදවා තුන්භවයෙහි ම සත්වයන් භව්‍යසත්වයන්වශයෙන් බලනසේක් එයින් කර්මාවරණාදියෙන් සමන්විත අහෙතුකපුද්ගලයන් හැර යම් පුද්ගලකෙනෙක් කර්මාවරණ ක්ලේශාවරණයෙන් සමන්විත නුවූවාහු ද ශ්‍රද්ධාප්‍රඥාදී ගුණසම්පන්නව නිවන්පුර වැදීමට නිසිව කුශලධර්මයෙහි යෙදී වසන්නාහු ද එසේවූ භව්‍යපුද්ගලයන් ඥානයෙන් තෝරා පරිග්‍රහණය කොට ඒ හැම ලෝකයෙහි පූර්වබුදුවරයන් කෙරෙහි කෘතාධිකාරවූ ලොකවෛනෙය්‍ය බුද්ධවෛනෙය්‍ය පුද්ගලයන් පස්කොටසක් කොට බලනසේක් ප්‍රථමබොධි නම් ලද බුදුවූ පසළොස්හවුරුද්ද ඇතුළත ද මධ්‍යමබොධි නම් ලද දෙවෙන් පසළොස්හවුරුද්ද ඇතුළත ද පශ්චිමබොධි නම් ලද තුන්වන පසළොස්හවුරුද්ද ඇතුළත ද පිරිනිවීකල ද බුදුන්විසින් විනයනයවන සත්වයෝ මෙතෙක ශ්‍රාවකයන්විසින් විනයනය වන සත්වයෝ මෙතෙක මෙතෙකැයි වෙන් වෙන්ව මෙසේ පස්කොටසක් කොට බලා හැම පිරිසිඳ අභිසම්බොධියෙහි පටන් පිරිනිවන්පෑම දක්වා විසිඅසඞ්ඛ්‍යයක් හා සතිස්කොටි සතසහස්‍රසත්සත්‍යකොටිසහස්‍රඅසූකෙළක් පමණ වූ බුද්ධවෛනෙය්‍යපුද්ගලයන් හා සතරඅසඞ්ඛ්‍යයක් හා සතළිස්කොටිසතසහස්‍රපණස්කොටිසහස්‍රසියකෙළක් පමණවූලොකවෛනෙය්‍ය පුද්ගලයන් දැකවදුරා මේ හැම පූර්වබුදුවර

සත් කෙරෙහි කාරුණ්‍යාධිකාරීව සූර්‍ය්‍යරශ්මිස්පර්ශයෙන් ප්‍රබෝධවන පියුම් වනයක් මෙන් දෙශනාරශ්මිසමාගමයෙන් නිවන්පුර වදනාහුය යි නියම්කොට බුදුඇසින් ම දැක මහාබ්‍රහ්මරාජයාගේ ආරාධනාව පිළිගෙණ සත්ත්වයන්ගේ කෙලශදරථ ව්‍යුපසමණය පිණිස උතුම් ධර්‍මවර්‍ෂා වස්වම්යි සිතාවදුරා මහාබ්‍රහ්මරාජයාහට මේ ගාථාව වදාළසේක.

අපාරුතා තෙසං අමතස්ස වරා
යෙ සොතවන්තො පමුඤ්චන්තු සද්ධං
විහිංසසඤ්ඤී පගුණං න භාසිං
ධම්මං පණීතං මනුජෙසු බ්‍රහ්මෙ-ති.

එකල්හි මහාබ්‍රහ්මරාජතෙම භාග්‍යවතුන්වහන්සේ විසින් ධර්‍මදෙශනාවට අවකාශකරණලදැයි දැන අතිශයින් සතුටුවූ සිත් ඇතිව භාග්‍යවතුන්වහන්සේට අප්‍රමාණ වචනයෙන් සතුතිකොට සවාමිවූ භාග්‍යවතුන්වහන්ස මහජනසඞ්ග්‍රහය සඳහා ආර්‍ය්‍යඅෂ්ටාඞ්ගික මාර්‍ගී නැමති කොස්සෙන් නිවන්පුර දොර හැර අදනපායන් දමනයකොට ගෙණ තුන්භවයෙහි චතුස්සත්‍යාවබොධයට නිසි බන්ධුන් සතරසතිපට්ඨාන නැමති භූමියෙහි හොවා සතරසෘද්ධිපාද නැමති සතරපයින් ඇක්ම ශ්‍රද්ධා නැමති හස්තයෙන් ධර්‍මදෙශනා නැමති ශස්ත්‍රය ගෙණ අවිද්‍යා නැමති ගඩ පලා කෙලෙස් නැමති අර්බුද දොෂය හැර විදර්ශනා නැමති ක්ෂාරය දී මෛත්‍රී නැමති දියෙන් සොදා චතුස්සත්‍ය නැමති බෙහෙත් ආලේපකොට මනා සිහිල් ශීල නැමති පවන් දී අභ්‍යන්තරය සිහිල්කරණ නිවන් නැමති රස පොවා දෘෂ්ටධර්‍මව්‍යුපවිහරණ නැමති බෙහෙත් කවා සියලු භවොත්පත්තිය ක්ෂයකොට සියලු දුක් නිවා සතුටුකරවදාළමැනවැයි කියා බ්‍රහ්මරාජතෙම බුදුන්ට දීපධූපමාලාදීන් පූජාකොට පසඟපිහිටුවා වැඳ තුන්යලක් ප්‍රදක්ෂිණකොට සපිරිවරින් අතුරුදන්ව බ්‍රහ්මලොකයටම ගියේය.

ඉක්බිති ශක්‍රදෙවෙන්ද්‍ර ද බුදුන් වැඳ "දෙසෙතු භගවා ධම්මං දෙසෙතු සුගතො ධම්මං" යනුයෙන් ධර්‍මදෙශනාවට ආරාධනාකොට භාග්‍යවතුන්වහන්ස යම් සත්ත්වකෙනෙක් තුඹවහන්සේගේ ආඥාවෙහි නොපවත්නාහු වී නම් ඔවුන්ට අපි ආඥාකරම්හ එහෙයින් තුඹවහන්සේට ධර්‍මචක්‍රය වේවා අපට ආඥාචක්‍රය වේවයි ප්‍රතිඥාකොට වැඳ අවසර ගෙණ සපිරිවරින් දෙව්ලොව ගියහ.

මෙසේ ලොකාග්‍රවූ භාග්‍යවතුන්වහන්සේ අටවනසතියෙහි කීප දවසක් බෝමැඩ සමීපයෙහි ම පිඬු පිණිස හැසිර වාසය කොට ඇසළමස ප්‍රථමපක්ෂයෙහි වූ තුදුස්වක්දිනයෙහි බ්‍රහ්මාරාධනාව

පිළිගෙණ මම පළමුකොට කවරක්හට දහම් දෙසම් ද කවරෙක්
මේ ධර්මය වහා දැනගණිද්දැයි ලොව බලනසේක් වහා ධර්මය දැන
ගන්ට නිසි ප්‍රඥාදී ගුණසම්පන්න ආලාරකාලාම උද්‍රකරාමපුත්‍ර
දෙදෙන මිය පරලොව ගිය බව දැන පස්වග්මහණුන් දුෂ්කරක්‍රියා
භූමියෙහි මට උපස්ථාන කිරීමෙන් බොහෝ උපකාරීහ එහෙයින්
මම පස්වගමහණුන්ට පළමුකොට ධර්මදෙශනාකරම් කෞණ්ඩ
ඤ්ඤ බ්‍රාහ්මණ ද මේ අග්‍රධර්ම පිණිස පියුමතුරා බුදුරජානන්වහන්
සේගේ සම්පයෙහි දී ප්‍රාර්ථනා කළතැන් පටන් කල්පලක්‍ෂයක් අධි
කතර පින්කොට කෙලෙස් විපස්සී නම් බුදුන්සමයෙහි සැටඅටලක්‍ෂ
යක් පමණ බුදුපාමොක් මහසඟනට නවවරෙක අග්‍රශස්‍යදානය
දුන්නේය ඒ කෞණ්ඩඤ්ඤබ්‍රාහ්මණයා හැර අග්‍රධර්ම ප්‍රතිවෙධකරන්
ට සමර්ථවූ අන් කිසිවෙක් නැත්තේය දැන් ඒ පස්වගමහණුහු කො
තැන්හි වාසයකෙරෙද්දැයි බලනසේක් බරණැස ඉසිපතන්හි වාස
යකරන්නාහුයයි දිවසින් දැකවදාරා නැවත භාග්‍යවතුන්වහන්සේ
ඇසළමස පුරපසළොස්වක්දා උදෑසන අජපාල නම් නුගරුකමු
ලින් නික්ම තමන්වහන්සේගේ පාසිවුරු ගෙණවදාරා උරුවෙලා
යෙහි වූ සෙනානී නම් නියම්ගම පිඬු පිණිස හැසිර වළඳා ඉක්බිති
බරණැසට යෙම් සිතාවදාරා පාසිවුරු ගෙණ අටළොස්යොදුන් මාර්ගී
යට චක්‍රලක්‍ෂණාදීන් ශොභාමාන ශ්‍රීපාදයුගමයෙන් පිළිපන්සේක.

එකල්හි බෝමැඩට ද ගයා නම් ගමට ද අතුරුගම වඩනා බු
දුන් දැක අචින්ත්‍යානොපම වූ රූපශ්‍රියෙහි පැහැද 'තුඹ කවරෙක්
දැයි විචාළාවූ උපක නම් ආජීවකයාට අනන්තජිනයො නම් මම
යයි වදාරා සුදුසු පටිසන්ථාරයෙන් ඔහු පහදවාගෙණ අටළොස්
යොදුන් මග ගෙවා බරණැස ඉසිපතනයට එදවස් සවස්වේලෙහි
වැසිසේක.

ඒ ආජීවක නැවත බුදුන්කරා අවුත් පැවිදිඋපසම්පදා ලදින්
අනාගාමීව ශුද්ධාවාසයෙහි උපන්නේය. ඒද විස්තරාර්ථීන් විසින්
පූජාවලියෙහි ප්‍රකාශ ක්‍රමයෙන් ම බලා දතයුතු.

පස්වග්මහණුහු දුරින්ම වඩනා ශාස්තෲවූ බුදුන් දැක මෙසේවූ ක
තිකාවක් කළාහුය, ඇවැත්නි ශ්‍රමණභවත්ගෞතමතෙම ප්‍රත්‍ය
ය බාහුල්‍යයෙන් සම්පූර්ණවූ ශරීරඉන්ද්‍රියයන් ඇතිව ස්වර්ණවර්ණව
දිලිහි දිලිහී වඩනාසේක, ශාක්‍යවංශයෙහි උපන්බැවින් හිඳිනා
අසුන් පනවා දෙන පමණ මුත් අභිවාදනාදියක් නොකරම්හයි
කතිකා කොට සිටිකල්හි බුදුරජානන්වහන්සේ ඒ පස්වගමහණුන්
ගේ චිත්තාචාරය දැනවදාරා සියලු ලොකධාතුගත සත්වයන් කෙ
රෙහි භින්විශෙෂනොකොට එකාකාරව පතුරුවාලීමෙහි සමර්ථවූ
තමන්වහන්සේගේ මෛත්‍රීචිත්තය හකුළුවා ඒ තාපසයන් පස්දෙ

නා කෙරෙහි පවත්වාවදාළසේක. මෙසේ භාග්‍යවතුන්වහන්සේගේ මෛත්‍රීචිත්තය විසින් සපත්ලද ඒ තාපසයෝ බුදුරජ සමීපව වඩනාකල්හි තමන් කළ කතිකාවෙහි නොසිට පෙරගමන් කොට අභිවාදනාදී සියලු ආගන්තුකවත් සම්පාදනය කළාහුය. භාග්‍යවතුන් වහන්සේ තමන්වහන්සේ බුදුවූබව ඔවුන්ට දන්වා සර්වඥභූමිවූ ඉසිපතනාරාමයෙහි පොළොව පලා පැනනැගී උතුම්වූ බුද්ධාසනයෙහි වැඩහිඳ උතුසලේනැකත පවත්නාකල්හි තුන්අසංඛ්‍යයක් දෙවියන් හා අටලොස්කෙළක් බ්‍රහ්මයන් විසින් පිරිවරණලද පස්වගමහණුන්ට අඩනාවදාරා මගුල්දම්සක්පැවතුන්සූත්‍රය දෙශනාකරවදාළකල්හි අඤ්ඤාකොණ්ඩඤ්ඤ ස්ථවිරයන්වහන්සේ කෙළදහසක් කෙලෙසුන් නසා දහසක්නයින් ප්‍රතිමණ්ඩිතවූ සෝවාන් ඵලය ෂසක්තිර්මෙන් පිරිවරා සිටි දෙව්බඹපිරිස් සමගින් නිවන් පුර පැමිණිසේක.

එකල්හි භාග්‍යවත් බුදුරජානන්වහන්සේ මේ කොණ්ඩඤ්ඤතෙම මාවිසින් දෙසූ දුෂ්කර ගම්භීරධර්මය පළමුකොට ම දැනගත්තේය එහෙයින් දෙව්බඹපිරිස්මැද "අඤ්ඤාසි වත භො කොණ්ඩඤ්ඤ අඤ්ඤාසි වත භො කොණ්ඩඤ්ඤා" යි වදාළසේක· එහෙයින් ඒ ආයුෂ්මත්වූ කොණ්ඩඤ්ඤස්ථවිරයන්ට මේ අඤ්ඤාකොණ්ඩඤ්ඤය යි යන නාමෙක්වූයේය.

ඉක්බිති දෘෂ්ටධර්මාදී අපරිමිත ලොකොත්තරගුණසම්පන්න අචලප්‍රසාදයෙහි පිහිට් ඒ කොණ්ඩඤ්ඤ ස්ථවිරතෙම හුනස්නෙන් නැගී භාග්‍යවතුන්වහන්සේගේ ශ්‍රීපාදමූලයෙහි වැදහෙව දෙහොත් මුදුන්දී සුගතවූ ස්වාමීන්වහන්ස මා පැවිදිකරවදාළමැනවැයි යාඥකොළේය· එකල්හි වෛනෙජන කුමුදුවන විකාසනප්‍රවීනවූ භාග්‍ය වතුන්වහන්සේ චීවරගර්භයෙන් දකුණුශ්‍රීහස්තයගෙණවදාරා දිගුකොට "එහි භික්ඛු චරථ බ්‍රහ්මචරියං සම්මා දුක්ඛස්ස අන්තකිරියා යාති" යනුවෙන් අඩනාවදාළකල්හි උන්වහන්සේගේ තාපසවෙසය අතුරුදන්ව පූර්වකුශලානුරූපවූ ඍද්ධිමය පාසිවුරුආදි අටපිරිකර ස්වකීයශරීරයෙහි පහළව ඊර්යාපථසම්පන්න භික්ෂුභාවයෙහි පිහිටියසේක.

ශාස්තෲවූ බුදුරජ දෙවෙනිදවස්හි එම ඉසිපතනාරාමයෙහි වස් ඉටාවදාරා වප්ප නම් තෙරුන්ට අවවාදකරමින් විහාරයෙහි ම වැඩළුන්සේක. සෙසු සතරනම පිඬු පිණිස නික්ම ගියකල්හි වප්ප තෙරුන්වහන්සේ ශාස්තෲන්වහන්සේගේ ධර්මකථා ශ්‍රවණයෙන් පෙරවරු ම සෝවාන්ව පැවිදී ඉල්වා එසේම එහිභික්ෂුභාවයෙන් පැවිදිවූසේක. මෙම නයින්ම ඊට දෙවෙනිදවස්හි භද්දිජ තෙරුන්

වහන්සේ ද ඊට දෙවෙනිදවස්හි මහානාම තෙරුන්වහන්සේ ද ඊට දෙවෙනිදවස්හි අස්සජි තෙරුන්වහන්සේ දැයි යන හැමදෙනම එක එක දවස සොවාන්ඵලයට පමුණුවා එහිභික්ෂුභාවයෙහි පැවිද් කොට පස්වෙනිදවස්හි භික්ෂූන් පස්නම එක්කොට "රූපං භික්ඛවෙ අනත්තා" යනාදි ක්‍රමයෙන් අනාත්මලක්ෂණසූත්‍රදෙශනාව දෙශනාකොටවදාළකල්හි පස්වගමහණුන්වහන්සේලා සකල ක්ලෙශයන් නසා රහත්ඵලයට පැමිණියාහුයි.

එකල්හි එම බරණැස සුජාතා නම් සිටුදුව වැදූ යස නම් කුලපුත්‍රයානෝ තුන්සෘතුවට කරවා දුන් තුන්පායෙහි දෙවඟණන් වැනි වරඟණන් පිරිවරා යටමාලයට නොබැස උඩුමහල්හි දවසිර වැන් මහත් ශ්‍රීසම්පත් අනුභවකරනුයේ එක්දවසක් නිදා පිබිද දිලියෙන පහන්ආලෝකයෙන් නාටකස්ත්‍රීන්ගේ විකාර දැක අනිත්‍ය ලකුණු මෙනෙහිකොට සසර කලකිරී විගස ම යහනින් නික්ම රත්මිරිවැඩි පය ලාගෙණ උඩුමහලින් බැස දෙවියන් හල දොරටුවෙන් නික්ම බලුවපව්චූසයෙහි ඉසිපතනාරාමයට අභිමුඛව යන්නෝය. බුදුරජ අලුයම්හි සියලු ලොව බලාවදාරණසේක් පැවිදිවීම පිණිස නික්ම එන ඒ කුලපුත්‍රයා දැකවදාරා උනස්නෙන් නික්ම ඒ කුලපුත්‍රයාගේ ආගමනය බලමින් සක්මන්කරණසේක් දුරින්ම එන්නාවූ සියලු ගෘහවාසය උපද්‍රව සේ දැක භයපත්ව එන ඒ යස කුලපුත්‍රයා දැක සක්මණින් බැස බුඬාසනයෙහි වැඩඋන්සේක. ඒ කුලපුත්‍රයා ද ඉසිපතනයට වැද උදුගිරිමුදුනෙන් පත් ලහිරුමඩල සේ දිළිහෙන බුදුන් දැක උපන් මහත් ප්‍රීතිසොම්නස් ඇතිව වහා පය ලූ වහන් ගලවා භාග්‍යවතුන්වහන්සේට නුදුරුතැන්හි සිටි කුලපුත්‍රයාට මෙසේ මාකරා එව යසය යි වදාළසේක. කන්හි අමාවක්කළාක් වැනි අත්මධුරවූ ඒ බුඬවචනය ඇසීමෙන් අතිශයින් සතුටුව ඉතා ඔදවැඩි සිත් ඇතිව හෙතෙම සමීපයට ගොස් බුදුන් වැද එකත්පස්ව හුන්නේය. එකල්හි ඔහුට භාග්‍යවතුන්වහන්සේ පිළිවෙළකථාවෙන් බණ වදාරා එම රාත්‍රියෙහි හුනස්නෙහිදීම සොවාන්ඵලයට පමුණුවාවදාළසේක.

එකල්හි දෙවනදා උදෑසනම සුජාතා නම් මැනිතොමෝ ප්‍රාසාදයට නැගී පුතනුවන් නොදැක වහා සිටානන්කරා ගොස් ඒ බව කීකල්හි හෙතෙම සතරදිගම් දුරුතැන්වල ගොස් විචාරණ සේ අසුන් දී මිනිසුන් යවා තුමූ ඉසිපතනයට ගොස් යස නම් පුත්‍රයාගේ පයින් ගලවා තිබූ රත්මිරිවැඩියගල දැක ඒ සලකුණෙන් යොස් බුදුන් දුට. මහාකාරුණික්කවූ බුදුරජද දුරින්ම එන ගෘහපතියා දැක යස නම් පුත්‍රයා ඔහුට නොපෙණෙන සේ අධිෂ්ඨානකළ

ලේක. බුදුන් දුක්මෙන් ම ඉතා සතුටුවූ ගෘහපතිතෙම බුදුන්සරා
ණෙහොස් වැඩ එකත්පස්ව හිඳ ස්වාමීන්වහන්ස යසකුලපුත්‍රයා දුටු
සේක් දැයි විචාළේය. එකල්හි වදාරණසේක් එසේවීනම් ගෘහපතිය
මෙහි හිඳුව මෙහි හුන් තෝ මෙහි හුන් යසකුලපුත්‍රයා දක්නෙහි
යයි වදාළකල්හි අතිශයින් තුටුපහටු සිත් ඇතිව එකත්පස්ව හුන්
නාවූ ඒ ගෘහපතියාට භාග්‍යවතුන්වහන්සේ පිළිවෙළකථාවෙන්
බණ වදාළසේක. එකල්හි සහස්‍රනයින් ප්‍රතිමණ්ඩිතවූ සෝවාන්ඵ
ලයට පැමිණ ප්‍රසන්නාකාර දක්වා බුදුන් වැඩ සරණගොස් ගෙ
තෙම මේ බුදුසස්නෙහි පළමුවෙනි උපාසකවූයේය. ඒ පියානන්ට
දෙශනාකරවදාළ ධර්මය අසා යසකුලපුත්‍රයාගේ සිතද සියලු කෙ
ලෙසුන්කෙරේන් මිදීගියේය. එකල්හි ඒ දෙදෙනා ඔවුනොවුන්
දක්නාලෙස අධිෂ්ඨානකළසේක. එකෙණෙහි ගෘහපතිතෙම එ
හිම හුන් යස නම් කුලපුත්‍රයා දැක විස්මපත්ව පුත්‍රසෙනහයෙන්
කම්පාවූ සිත් ඇතිව මැනියෝ ද දුක්දොම්නස්ව වසනබව නියා
එම්බා පින්වත් යස නම් මාගේ පුත්‍රය තුඹකෙරෙන් වෙන්වූ කාර
රණයෙන් මැනියන්ගේ මරණය වන්නේය එහෙයින් පුත්‍රය තුඹ
නැවත ගොස් මව ඇස පෙනීයාමෙන් උන්ගේ ජීවිතය දෙවයි කී
යේය. එකල්හි යසකුලපුත්‍ර භාග්‍යවතුන්වහන්සේගේ දසාව බැලි
ය. එවිට බුදුහු වදාරණසේක් ගෘහපතිය ඒ කුමකැයි නොහගිද යස
කුලපුත්‍රයාගේ අශෛක්ෂඥානදර්ශනය යි කියනලද අභිඥානදර්ශ
නයෙන් ධර්මය දක්නාලද්දේය සියලු ආශ්‍රවයන් කෙරෙන් සිත
මිදුන එහෙයින් ගිහිව පස්කම්රස විඳීමට යසකුලපුත්‍ර යොග්‍ය
නොවෙයි වදාළසේක. ඒ ඇසූ ගෘහපතිතෙම එසේය ස්වාමීන්ව
හන්සැයි ප්‍රතිවචන දී ස්වාමිවූ බුදුරජානන්වහන්ස එසේවීනම් ය
සකුලපුත්‍රයන් පසුමහණකොට වැඩ අදදවස පිණිස මාගේ බත
ඉවසාවදාළමැනවැයි ආරාධනාකළේය. බුදුරජ තුෂ්ණිම්භාවයෙන්
ඉවසාවදාළසේක. එකල්හි ගෘහපතිතෙම බුදුන් ඉවසාවදාළබව
දැන වැඩ අවසර ගෙණ ප්‍රදක්ෂිණකොට ගෙට ගියේය. යස කුල
පුත්‍රයෝ ගෘහපතියා ගිය නොබෝ ඇසිල්ලෙකින් බුදුන් වැඩ පැවි
දී ඉල්වීය. බුදුරජ එහිභික්ෂුභාවයෙන් පැවිදිකළසේක. එකල්හි
ලොව රහත්හු සත්නමක් ඇතිවූවාහුයි. භාග්‍යවතුන්වහන්සේ
පෙරවරු උදෑසන ම හැඳ පෙරව පාසිවුරු ගෙණ ආයුෂ්මත් යස
තෙරුන් හා සමඟ ගෘහපතිවූ සිටානන්ගේ ගෙට වැඩ පනවන
ලද උතුම් බුද්ධාසනයෙහි වැඩ උන්සේක. එකල්හි ආයුෂ්මත් යස
තෙරුන්ගේ මැනියෝ ද පුරාණදුතිකාව ද බුදුන් වැඩ එකත්පස්
ව හුන්නාහුය. එකල්හි භාග්‍යවතුන්වහන්සේ පිළිවෙළකථාවෙන්
බණවදාළසේක. ඒ දෙදෙන සෝවාන්ව ආර්යශ්‍රාවිකාබවට පැමිණ

බුදුන් වැඳ සරණගොස් මේ බුදුසස්නෙහි පළමුවෙනි උපාසිකා වූවාහුයි. නැවත ඔහු හැමදෙනම බුදුරජානන් ද යසතෙරුන් ද ප්‍රණීතවූ ඛාද්‍යභොජ්‍යයෙන් සියතින් වළඳවා ඉක්බිති වැඳ එකත්පස්ව හුන්නාහුය. එකල්හි භාග්‍යවතුන්වහන්සේ ඔවුන්ට අනුරූප ධර්‍මදේශනාකොට සතුටුකරවා ඉසිපතනයට ම වැඩිසේක.

එකල්හි යසතෙරුන්ගේ ගිහිකල යහළුවූ බරණැස විමලය සුබාහුය පූර්ණජිය ගවම්පතිය යන සිටුදරුවෝ සතරදෙනෙක් වූවාහුය. ඔහු මහත් යස ඇති යසකුලපුත්‍ර ගිහිගෙය හැර පැවිදිවූයේය යි අසා එකාන්තයෙන් ඒ ධර්‍මවිනය ලාමක නොවෙයි ඒ ප්‍රව්‍රජ්‍යාවද ලාමක නොවෙයි සිතාගෙණ ආයුෂ්මත්වූ යසතෙරුන්කරා ගොස් වැඳ එකත්පස්ව හුන්කල්හි ආයුෂ්මත් යසතෙරුන්වහන්සේ ඒ ගිහියහළුවන් සතරදෙන කැඳවාගෙණ බුදුන්කරා ගොස් වැඳ එකත්පස්ව හිඳ ස්වාමිවූ භාග්‍යවතුන්වහන්ස මෙනම් මෙනම් වූ මාගේ මේ ගිහියහළුවන් සතරදෙනාට අවවාදානුශාසනාකරවදාළ මැනවැයි ආරාධනාකළසේක. එකල්හි භාග්‍යවතුන්වහන්සේ පිළිවෙළකථාවෙන් බණ වදාළසේක. ඒ අසා සිටුපුත්‍රයෝ සතරදෙන හුනස්නෙහි ම ඉඳ සෝවාන්ව පැවිදිවීමට යාඥාව සිටිකල්හි බුදුරජ එහිභික්ෂුභාවයෙන් පැවිදිකළසේක. ඒ හැම ඍද්ධිමය පාසිවුරු ආදි අටපිරිකර දරා සියවස් පිරී සිටි තෙරුන් මෙන් ඊර්‍යාපථසම්පන්නව හුන්කල්හි නැවත වදාළ ධර්‍මදේශනාව අසා සියලු කෙලෙසුන් නසා රහත්වූවාහුය.

අන්‍යවූද ආයුෂ්මත් යසතෙරුන්ගේ යහළුවූ බරණැස දනව්වැසි පණස්දෙනෙක් යසකුලපුත්‍ර පැවිදිවිය යි අසා ඔවුනොවුන් එක්ව ගොස් පෙරසේම යසතෙරුන්ගේ සහායයෙන් බුදුන් වැඳ එකත්පස්ව හුන්කල්හි පිළිවෙළකථාවෙන් බණ වදාරා හැමදෙනම සෝවාන්කොට නැවත යාඥාව සිටිකල්හි බුදුහු එහිභික්ෂුභාවයෙන් පැවිදිකොට රහත්ඵලයෙහි පිහිටුවාවදාළසේක.

මේ යසාදි පස්පණස් යහළුවෝ ද පෙර කෙසේවූ පිණකින් මෙසේ ලොකාග්‍රවූ බුදුන් දැක සසරදුකින් මිදුනාහුදයත්?.

යට ගියදවස මේ පස්පණස්දෙන දැන්සේම ඔවුනොවුන් යහළුව ඇවිදිනාහු දරුඇති ගැහැණියක් අනාථව මිය වනමැද වැද හොත්තිය දැක ඈකෙරෙහි කරුණා උපදවා පින් නිසා දරසැයක් බැඳ ඈ දවන්නාහු මිනිය දණවෙලෙහි ඈ ඇඟින් දදා නැගෙණ බුබුළු දැක බුබුළු ගැසූ කුණුවේලෙහි පොතුගැලවූ කුකුලලාලයක්සේ සියොලඟ සුදුවූවා දැක අනිත්‍යලක්ෂණ උපදවා මේ හැමසතුන්ගේ ස්වභාවයෙකැයි තිලකුණු මෙනෙහිකළහ මෙසේ ඒ ජාතියෙහි ඒ

මිනිය දවාපු අනිත්‍යලක්ෂණ සිහිකළ පින්කමින් දිව්‍යමනුෂ්‍යලෝක දෙක්හි සැරිසරා ඇවිද බොහෝ සැප විඳ නැවත බරණැස ඉපද ඍද්ධිමයවූ පාසිවුරු ලදින් මේ පස්පණස්දෙනම රහත්වූහයි දතයුතු.

මෙසේ බුදුරජනන් හා සමග එක්සැටනමක් පමණ රහතන් ලොව ඇතිවූකල මාගේ ස්වාමිදරුවෝ වප්මස මැදිපොහෝදවස්හි පවරා ඉක්බිති සැටනමක් පමණවූ මහරහතන් ලඟට කැඳවා–

පරත්ථං චරන්තො අත්ථං කරොන්තා පඨවිං ඉමං
ව්‍යාහරන්තා මනුස්සානං ධම්මං චරථ භික්ඛවො.
විහරථ විවිත්තෙසු පබ්බතෙසු වනෙසු ච
පකාසයන්තා සද්ධම්මං ලොකස්ස සතතං මම.

යනාදී ගාථා සතකින් "මධුරත්ථවිලාසිනියෙහි" ආ ක්‍රමයෙන් බොහෝ වචන වදාරා, මහණෙනි මේ ලෝකයෙහි සත්ත්වයෝ බුදුරුවන් ලොව පහළවූබව නොදනිති එහෙයින් තෙපි හැම දෙදෙනෙක් එකමඟ නොයව සැටදෙන වෙනවෙනම සැටමාර්ගයකින් ගොස් ගිය ගිය දෙස දුටු දුටු සත්ත්වයන්ට මා උපන් පරිදි කියා ලොකාර්ථචය්‍යාව කරුව ලෝකයාට නොයෙක් උපමා කාරණ දක්වා තීමෙන් බුදුන් දක්මෙහි ලොභ වඩනසේ සසුන්වැද මහණවනසේ ධර්මදෙශනාකොට පැවිදිවනුකැමැත්තන් සරණගමනඋපසම්පදාවෙන් උපසම්පදා කරවයි අනුදැන භික්ෂූන් යවා තමන්වහන්සේ බරණැසින් නික්ම එකලාව පාසිවුරු ගෙණ උරුවෙලාවට වඩනාසේක් භද්‍රවර්ගික රජකුමාරවරුන්ගේ හේතුසම්පන්නබව දැකවදාරා කාරණා උපදවා මඟින් ඉවත්ව කප්පාසික වනයෙහි රුකක්මුල සවණක්රැසින් දිලිහි දිලිහී වැඩඋන්සේක.

එසමයෙහි කොසොල්රජහුගේ තිස්දෙනෙක් පමණ රජකුමරුවෝ රූපයෙන්ද චිත්තයෙන්ද යහපත්හෙයින් භද්‍රරජකුමාරයෝයයි ලද නම් ඇතිව යාම ඊම කෑම පීම හිඳීම ආදී නොයෙක් තැන බොහෝ සෙයින් එක්වම ඇවිදිනාහු කොසොල්රජ දුන් දනව්වෙක සමගව රජකරන්නාහු කප්පාසික නම් වනය ඉතා රමණීයයි අසා එහි කෙළින්ට යන්නාහු එක්කෙණෙකුන්ට ප්‍රජාපතීන් නැතිහෙයින් උන්නිසා වෛශ්‍යවක ගෙණ ගියහ. ඕතොමෝ රජකුමරුවන් ක්‍රීඩාවෙත් ඇවිදිනාකල්හි ඔවුන්ගේ ප්‍රමාදයක් දැක ඒරාජකුමාරයන්ගේ ආභරණ සඟවා ගෙණ වල් වැද ගියාය. එවේලෙහි ඔබිනොබ බලා ආභරණත් ඇත් නොදැක තිස්දෙනාම එක්වගෙන ඈ ගිය පදසලකුණෙන් වල සොයා ඇවිදිනාහු ඒ රුකමුල සවණක් රැසින් දිලියෙන බුදුන් දැක වැඳ එකත්පස්ව සිට මෙසේ ආ

වෛශ්‍යව පුටුයේක්ද ශූද්‍රවූයේක්දැයි විචාළහ. බුදුහු කුමක්නිසා අැ සොයව්දැයි විචාළසේක. එකල්හි රජකුමරුවෝ ඒ ප්‍රවෘත්තිය අැති තතු බුදුන්ට දැන්වූහ. බුදුහු තමා සෙවිම උතුම්ද අනුන් සෙවීම උතුම්දැයි විචාළසේක. ඔවුහු තමන් හෙතුසම්පත් ඇතිහෙයින් බුදුන් වදාළ වචනයෙහි අර්ථ දැන අනුන්සෙවීමට වඩා තමා සොයා ගතහොතින් ඒ සෙවිල්ලම උතුම්වේදැයි කීහ. එවේලෙහි ස්වාමි දරුවෝ එසේ තෙපි තොප සොයනුකැමතියානම් නොලස්සේ ඉඳුවයි වදාරා ඔවුන් එකත්පස්ව හුන්කල්හි අනුරූපවූ බණ වදාරා ඒ රජකුමරුවන් තිස්දෙනාම මාර්ගඵලප්‍රාප්තකොට එහිභික්ෂුභාවයෙන් පැවිදිකළසේක. එයින් හැමට බාල කුමාර සෝවාන්විය, හැමට ජ්‍යෙෂ්ඨකුමාර අනාගාමි විය, රහත්වූ හෝ පෘථග්ජනවූ හෝ කිසිවෙක්නැත, සෘද්ධිමය අටපිරිකර දරා සියවස් පිරී සිටි තෙරුන් මෙන් ඊර්යාපථසම්පන්නව බුදුන් පිරිවරා තෙළෙස්ධුතාඞ්ග සමාදන්ව සිටි කල්හි ඒ භික්ෂූන්ට පෙරසේම සුදුසු අවවාද වදාරා මහණෙනි තෙපි තිස්දෙන තිස්මාර්ගයකින් ගොස් බුදුරුවන් දම්රුවන් සඟරුවන් උපන්වග ලොවට කියා කුසල්හි හැසිරෙණසේ අවවාද බුදුගුණ කියා ලොකාර්ථචර්යාව කළමැණවැයි වදාරා පශ්චිමදිශාවට හැරවදාළසේක.

ඒ රජකුමරුවෝ තිස්දෙනද කෙසේවූ පිණක් කොට මෙසේවූ බුදුන් දැක නිවන්සැප ලද්ද්‍යෙදයත්?

පෙර මාගේ බුදුන් තුණ්ඩිලනම් සූකරරාජව ඉපද බරණැස්රජුට බණ වදාරණද බෝසතුන් බැඳ අල්වාගෙන මරා ඇඟමස් කම්හයි පොලු මල ගෙණ සිසාරා සිටගත් ඒ රාසොඬුන් තිස්දෙන තුණ්ඩිලොවාද නම් ඒ දෙශනාව දෙලොස්යොදනක් තැන් ඇසෙනසේ කරත් කරත් අත තුබූ පොලු මල හෙලා සාධුකාර දී බණ අසා එදා ලත් අවවාදයෙන් සැටදහසක් හවුරුදු පන්සිල් රක්‍ෂාකොට එතැන් පටන් සදෙව්ලොට සැරිසරා ඇවිද සැප විඳ එකල උතුම්වූ රජකුලයෙහි ඉපිද ඒ පන්සිල් රක්‍ෂාකළ පිණින් අසාධාරණවූ රූසිරි ලදින් මොහොතක් කල් පමණ බණ ඇසූ පිණින් අපබුදුන් දැක අමාමහනිවන් දුටුහයි දතයුතු.

මෙසේ ලෝකයෙහි එකාන්තුවක් රහත්සඟුරුවන් ඇතිවූකල මාගේ ස්වාමිදරුවෝ උරුවෙලා නම් දනව්වට වැඩ එහි නිල්නරා නම් ගංතෙර උරුවෙලකාශ්‍යපය නදීකාශ්‍යප්ය ගයාකාශ්‍යපයයි යන ජටිලයෝ තුන්බෑකෙණෙක් අපි රහතුම්හයි කියා මිථ්‍යාදෘෂ්ටි ගෙණ ලෝවැස්සන් වංචාවෙන් පහදවා ලාභයෙහි යසසෙහි අග්‍රව වෙසෙති. එයින් උරුවෙලකාශ්‍යපයන්ගේ පන්සියයක් අතවැසියෝය, නදීකාශ්‍යපයන්ගේ තුන්සියයක් අතවැසියෝය

ගයාකාශ්‍යපයන්ගේ දෙසියයක් අතවැසියෝය, මෙසේවූ මේ දහසක්දෙනාම හෙතුසම්පත් ඇතිසේක· මිථ්‍යාදෘෂ්ටි ගෙණ අපායගත වන ඔවුන්කෙරෙහි උපන් මහාකරුණාවෙන් මාගේ ස්වාමිදරුවානෝ උරුවෙලකාශ්‍යපයන්ගේ පන්සලට වැඩ "පූජාවලියෙහි" ප්‍රකාශ ක්‍රමයෙන් දක්වාලූ නාගදමනාදී තුන්දහස් පන්සියය සොළොස්ප්‍රාතිහාර්‍ය්‍යයන් දක්වත් හෙතෙම තමාගේ රහත්මි යන මිථ්‍යාදෘෂ්ටිය නොහැරියේමය. එසේහෙයින් බුදුහු මොහුගේ මිථ්‍යාදෘෂ්ටි නැමති ව්‍යාධියට මාගේ ධර්‍මනැමති දිව්‍යෞෂධය දී ගොඩනගමි සිතා මුඛ නැමති කරඬුවෙන් නික්මුණාවූ සුවඳගඳින් සියලු වන ලැහැබ සුවඳපිඩක් සේ කරවමින් මධුරස්වර විහිදුවා සද්ධර්‍මදේශනාවට පටන්ගෙණ මාගේ ස්වාමිදරුවානෝ ආකාශගංගාව ගෙණ හැර දක්වන්නා සේ මහානිධානයක් පිධානය හැර දක්වන්නා සේ චරිතානුකූලවූ ධර්‍මදේශනාව කරත් කරත් කෙළදහසක් පමණ කෙලෙසුන් නසා දහසක් නයින් ප්‍රතිමණ්ඩිතවූ සෝවාන්පෙලෙහි පිහිටා මහත් අඳුරෙක ප්‍රදීපාලොකයක් නැගුවාසේ මෙලොව මේය පරලොව මේය බුද්ධරත්නය නම් මේය ධර්‍මරත්නය නම් මේය රහත්හු නම් මේයයි විශෙෂයෙන් දැන හැඳින බුදුන්ගේ ශ්‍රීපාදය තමන්ගේ ඉස්මුදුනේ තබාගෙණ දනිම් ස්වාමිනි හැඳින්නෙමි ස්වාමීනි බුදුව සියල්ල දත්වේලෙහි පළමුකොට ගැත්තවූ මා දැකවදාළසේක් ද තුඹවහන්සේ බුදුවෙසින් මට හිතලයන් ම ආ මෑනිකෙනෙක පියානකෙනෙක ගුරුකෙනෙක කල්‍යාණ මිත්‍රකෙනෙක මෙතෙක්දවස් ස්වාමිබව නොදත්තෙමි දැන් හැඳින්නෙමි ගැත්තහු නොදැන කළවරද ක්ෂමාකළ මැනව ස්වාමීනි යනාදී නොයෙක් අඳෝනා සතුනිවචන කියකියා වැඳ ස්වාමීනි දැන්ම ගැති මහණවනු කැමැත්තෙමි ආරාධනාකළහ· එබසට බුදුහු කාශ්‍යපයෙනි තොපගේ පර්ෂන්හි අදහස් බලාගෙණ එවසී වදාළකල්හි උරුවෙලකාශ්‍යප පන්සියයක් ජටිලයන් කරා ගොස් දරුවෙනි අපගේ ආශ්‍රමපදයෙහි මෙතෙක් දවස්වේලාම ලොවුතුරාබුදුහු වැඩඋන්සේක. දැන් මම දනිමි ඇඳින්නෙමි බණ ඇසීමි ඒ මම ඒ බුදුන් කෙරෙහිම මහණවෙමි තෙපි කුමක්කරම්දැයි විචාළහ. එවිට ඒ පන්සියක්දෙනම තුඹ මහණවෙතොත් අපිදු මහණවෙම්හයි කියා ජටාමඬුලු හා තවුස්පිරිකර ගඟදියට දමා බුදුන්කරා දිව අවුදින් බුදුන් පිරිවරා සිටියාහ. එවේලෙහි මාගේ ස්වාමිදරුවෝ ඒ පන්සියක්දෙනාගේ චරිත බලා බණ වදරා සෝවාන් කොට හැම දෙනම එහිභික්ෂුභාවයෙන් ම මහණකළසේක.

ගඟදියෙහි යන ජටාමඬුලු හා තවුස්පිරිකර යටගඟ වසන නදීකාශ්‍යපය ගයාකාශ්‍යපය යන දෙබෑයෝද දැක පන්සියයක් ජටිලයන් හා සමඟ අවුදින් මෙපවත් දැන තුමූද ජටාමඬුලු කපා දමා බුදුන් දැක බණ අසා සෝවාන්ව එහිභික්ෂුභාවයෙන්ම පැවිදිවූහ.

මෙසේ පැවිදිලත් හැම දෙනම ගෙණ බුදුරජානන්වහන්සේ ගයා නම් ගං ඉස ගයා නම් පර්වතමුදුනට වැඩ එහිදී ආදිත්‍යපර්‍යාය සූත්‍රය දෙශනාකොට දහසක්දෙනාවහන්සේ ම රහත්කලසේක.

ඒ උරුවෙලකාශ්‍යප තුන්බෑආදිවූ දහසක්දෙනාවහන්සේ පෙර කෙබඳු පිණක් කොට මෙසේවූ බුදුසස්නෙහි මහණව සසරින් ගැලවී නිවන් දුටුසේක්දයත්?

මීට දෙයානූකපින් යට උපන් පුස්ස නම් බුදුන් සමයෙහි මේ තුන්බෑයන්වහන්සේ බුදුන් සුලුඹුවුන් දරුව මල්වූ තුන්බෑරජකුමාරව මෙකල පිරිවරවූවාසේ ම තුන්කොටසක්ව සිටිය අමාත්‍යපිරිවර හා දහසම එක්ව බුදුන් පවරා තුන්මසක් මහදන් දෙන්නාහු ඒ තුන්මස මුළුල්ලෙහි ඒ දහසම සමගිව සිල් රක්ෂාකළාහුය. ඒ පිණින් එකානූකපක් මුළුල්ලෙහි දෙව්මිනිස්සැපත් විඳ ඇවිද මෙකල අපබුදුන්ගේ ශාසනයෙහි මහණව අමාමහනිවන් දැක සසරින් ගැලවූනාහුයී.

ඉක්බිති බුදුරජ උරුවෙලකාශ්‍යපාදී දහසක් රහතන් පිරිවරා බිම්සරරජහට පළමුවෙන්ම දෙවාවදාළ ප්‍රතිඥව සඳහා දුරුතුමස මැදිපොහෝදා ප්‍රදීප සහස්‍රයෙන් දිලියෙන පහන්ඇගෑයක්සේ රජගහනුවරට තුන්ගව් පමණ තැන වැල්මිවැල වැළඳිහෙයින් ලෂ්ටිවන නම් වූ තල්උයනට වැඩ එක්රුකක්මුල සවණක්රැසින් දිලිහි දිලිහී දහසක්රැසින් දිලිහෙන හිරමඬලසේ දහසක් තරුමැද දිලියෙන සඳමඬලසේ දහසක් අඞ්කුරයෙන් දිලිහෙන ස්වර්ණාඞ්කුරයක්සේ දහසක් පමණ රහතන් පිරිවරා වැඩඋන්සේක. එකල බිම්සරරජ්ජුරුවෝ බුදුන් තමන්ගේ උයනට වැඩ වැඩහුන්පරිදී උයන්ගොව්වා අතින් අසා එක්ලක්ෂවිසිදහසක් ඇමතිබමුණුසිටුසෙනඟ ගෙණ දිවඅවුදින් සඳ සිසාරා සිටි මඬුල්ලක්සේ ශ්‍රීමුඛය සිසාරා වටින් සරියන් සරියන් පමණ තැන රැලි දිදී නොයෙක් පැහැයෙන් සිටගත් බුද්ධප්‍රභාමණ්ඩලය මැද දිලියෙන ශ්‍රීශරීරය ඇතිව වැඩහුන් මාගේ ස්වාමිදරුවූ බුදුරජානන් දැක පස්වණක් ප්‍රීතීන් පිණා පියුම්ගැබකට බස්නා රාජහංසයෙකුසේ ශ්‍රීපාදපද්මයට නැමී පසඟපිහිටුවා වැඳ එකත්පස්ව හිඳගත.

උරුවෙලකාශ්‍යපයෝ නම් එතුවර නැගූ ධජයක්සේ ඉතා ප්‍රසිද්ධයහ ඒ කාරණයෙන් සමහර පිරිසෙක් සිතන්නාහු කිමෙක්

දෝහෝ උරුවෙලකාශ්‍යපයන් නිසා ශ්‍රමණභවත්ගෞතමතෙම වෙසෙත් දෝ හෝ උරුවෙලකාශ්‍යපයෝ ශ්‍රමණභවත් ගෞතමයන් නිසා වෙසෙත් දෝ හෝයි සැක සිතුවාහුය. බුදුරජානන්වහන්සේ ඔවුන් සිතූ සිත් දැන ඒ මහතෙරුන් මුහුණ බලා:—

කිමෙව දිස්වා උරුවෙලවාසී
පහාසි අග්ගිං කිසකොව දනො
පුච්ඡාමි තං කස්සප එතමත්ථං
කථං පහීනං තව අග්ගිහුත්තං නති-සි.

යනමේ ගාථාව වදාරා උරුවෙලකාශ්‍යපය තාගේ පඤ්දෙහි සැක තෝම හරවයි වදාළසේක. එකෙණෙහි උරුවෙලකාශ්‍යප නම් මහතෙරුන්වහන්සේ භාග්‍යවතුන්වහන්සේගේ ශ්‍රීපාදය වැඳ අවසර ඉල්වාගෙණ:—

රූපෙ ච සද්දෙ ච අථො රසෙ ච
කාමිත්ථියො චාපි වදන්ති යඤ්ඤා
එතං මලන්ති උපධීසු ඤත්වා
තස්මා න යිට්ඨෙ න හුතෙ අරඤ්ජිං ති.

මේ ගාථාව කියා තමන්ගේ ශ්‍රාවකභාවය ප්‍රකාශකරමින් බිම හෙව ශාස්තෘවූ බුදුරජානන්වහන්ස ම ස්වාමීන්වහන්සේගේ ශ්‍රාවකයෙක් වෙමි කියා බුදුන්ගේ ශ්‍රීපාදය වැඳ චතුජ්ඣ්‍යානයට සමවැද අහසට තලක් පමණ තැන් පැනනැගී නොයෙක් වාරයෙහි දුමායාමෙන් දිලිහීමෙන් අතුරුදන්වීමෙන් සක්මන්කිරීමෙන් සෙසු නොයෙක් ප්‍රාතිහාර්‍ය්‍ය දක්වාලීමෙන් නැවතත් එසේම බුදුන් වැඳ අවසර ගෙණ දෙතලෙක තුන්තලෙක යනාදි ක්‍රමයෙන් එකිනෙකී වාරයෙහි වැඳ වැද එසේම දන්වා නැවත නැවත අහසට නැගීමෙන් ප්‍රාතිහාර්‍ය්‍ය දක්ව දක්වා සවෙනි වාරයෙහි අහසට නැගී එසේම ප්‍රතිහාර්‍ය්‍ය දක්වා බිමට බැස නැවතත් එසේම බුදුන් වැඳ අවසරගෙණ දෙතලෙක තුන්තලෙක යනාදි ක්‍රමයෙන් එකිනෙකී වාරයෙහි වැඳ වැද එසේමදන්වා නැවත නැවත අහසට නැගීමෙන් ප්‍රාතිහාර්‍ය්‍ය දක්ව දක්වා සත්වෙනි වාරයෙහි අහසට නැගී එසේම ප්‍රාතිහාර්‍ය්‍ය දක්වා බිමට බැස බුදුන් වැඳ ආදරයෙන් නැමී සිට ඒ පිරිසට දන්වනසේක් අශ්‍රුතසත්වයෙනි මාගේ ස්වාමිදරුවන් මා හා සමකොට නොසිතව බුදුහු මහමෙරසේ උස්වූ ගුණ නුවණ ඇතිසේක මම වනාහි ලිප්කැටසේ ඉතා මිටිවූ ගුණ නුවණ ඇතියෙමි යනාදි ක්‍රමයෙන් නොයෙක් උපමා කාරණා දක්වාලීමෙන් අචින්ත්‍ය අප්‍රමෙය්‍යවූ බුදුගුණ එක්ලක්‍ෂවිසිදහසක් පම

ණ වූ ඒ මහාසේනාවට ඇසෙනසේ කියා බුදුන් වැඩ එකත්පස්ව වැඩහුන්සේක. එවේලෙහි මහපිරිස මහතෙරුන් කළ ප්‍රාතිහාර්‍ය්‍ය දැක ඉතා මහත්වූ සාධුකාර දී තුල්‍යමත්වූවාහු බුදුහු ඥාතූහාව ඇතිසේක මෙසේවූ මිථ්‍යාදෘෂ්ටි ගෙණ රහතුම්හයි බොහෝකලක් ඇවිද්දාවූ උරුවෙලකාශ්‍යපයන්ගේ දෘෂ්ටි බිඳ විශේෂයෙන්ම දමනය කරණලද්දැයි සතුතිකළහ. එකල මාගේ ස්වාමිදරුවෝ ඒ කථාව අසා අද මේ මහපිරිසට මේ අතීතෝත්පත්තියෙහිදී "පන්සියපණස් ජාතකයට" පළමුවන ජාතකදෙශනාව වූ "මහානාරදකාශ්‍යපජාතකදෙශනාව" වදාරා චතුරාර්‍ය්‍යසත්‍යයන් ප්‍රකාශකොට වදාළසේක. ඒ ධර්මදෙශනාව අසා බිම්බිසාරරජ්ජුරුවන් ප්‍රධානකොට ඇති එක්ලක්‍ෂදසදහසක්දෙන දහසක් නයින් ප්‍රතිමණ්ඩිතවූ සෝවාන් ඵලප්‍රාප්තවූහ. රජ්ජු පිරිවරා ගොස් බණ ඇසූ දෙලොස්නහුතයෙන් ඉතිරි දසදහසක් දෙනද ශරණශීලයෙහි පිහිටා සසරදුකින් මිදී ගියහ.

ඒ බිම්බිසාර රජ්ජුරුවන් හා එක්ලක්‍ෂවිසිදහසක් පමණ වූ ඇමතියෝ පෙර කෙසේවූ පිණක් කොට මෙසේවූ බුදුවරකෙණකුන් දැක මෙසේ අග්‍රවූ ධර්මදෙශනාවක් අසා අග්‍රවූ නිවන්සැප ලද්දාහුදයත්?

මීට දෙයානූවන කල්පයෙහි පුෂ්‍ය නම් බුදුන්ට මල්බෑවූ තුන්බෑ රජ්ජුන් තුන්මසක් පවරා දන්දෙන . සමයෙහි මේ බිම්බිසාරරජ්ජුරුවෝ එක්ලක්‍ෂ විසිදහසක් පමණ අයකැමියන් ගෙණ තුමූ ඔවුන්ට ප්‍රධානවූ අයකැමිව තුන්මස මුළුල්ලෙහි අප්‍රමාදව දන් විධානකරවා අනුන් දෙන දනැයි නොසිතා තමන්ගෙන් ම දෙන දානයක් සේ සිතා ශ්‍රද්ධාවෙන්ම දන් විධානකළාහුය. ඒ කුශලබලයෙන් දෙයානූකල්පයක් මුළුල්ලෙහි දිව්‍යමනුෂ්‍යලෝකදෙක්හි බොහෝ සම්පත් විඳ මේ ජාතියට අටවන ජාතියෙහි චාතුර්මහාරාජික දෙව්ලොව දිව්‍යරාජව ඉපද අනූලක්‍ෂයක් අවුරුදු දිව්‍යසැප විඳ එයින් අවුදින් පිට පිට සවරක් මෙසේම අඹද්ව රාජ්‍යය කළහ. මේ ජාතියෙහි තුන්සියයක් යොදුන් අඟුමගධ දෙරටින් හා අසූදහසක් නියම්ගම්න් සැදියාවූ මේ රජගහනුවර සොළොස් හැවිරිදිව ඔටුනු පැළඳ එකුන්තිස්හැවිරිද්දෙහි අපමහගෞතමබුදුන් දැක බණ අසා පිරිවර හා එක්ව කළ පිණින් එකවිටම සෝවාන්ව එතැන් පටන් සතිස්හවුරුද්දක් මුළුල්ලෙහි බුදුන්ට උපාසකව මෙසේ සැට අවුරුද්දක් ජීවත්ව අනුන්ගේ දන් සමසිතින් ම විචාරාලූ පිණින් අමාමහනිවන් දැක සසරින් ගොඩනැංගාහුයයි දතයුතු.

ඉක්බිත්තෙන් රජ්ජුරුවෝ බුදුන් වැඩ ලොකොත්තර ශරණශීලයෙහි පිහිටා දෙවන දවසට ආරාධනාකොට බුදුන් ප්‍රදක්‍ෂිණාකර

වැඳ අවසර ගෙණ නුවරට ගියහ. දෙවනදා උදෑසන ඇතුළුනුවර
පිටිනුවර වසන අටළොස්කෙළක් පමණ මනුෂ්‍යයෝ ඊයේදවස
දුටු ලොවුතුරාබුදුන් යන උතුමානකෙණෙක් අපගේ නුවරට අවු
ය, අපගේ රජ්ජුරුවෝ බණයයි කියන හොඳදෙයක් ඇසූකල
නිවණැයි යන මනා රසයක් බෙදූදුන්හුය, ඒ බුදුහු කෙසේවූ කෙ
ණෙක් දැයි යනාදී කාරණ වෙන වෙන සලකා කියමින් එනුවර
ඇලලී ගොය් අළුයම්වේලෙහි පටන් මහසෙනග නික්ම බුදුන් වැඩ
හුන් උයනට තුන්ගවුවක් පමණ මග සිදුරක් නැතිව්ය උයනද
අවකාශ නැතිව පිරිසිටගත මනුෂ්‍යයෝ බුදුන්ගේ රුසිරු බලබලා
ඇස් අයාගත්තොහෙති බුදුන් සිඟා වඩනට මගෙහි අවකාශයෙක්
නැත බුදුහු ජනයන් කෙරෙහි කරුණාවෙන් රුසිර් දිදි වැඩහිඳි
නාසේක් මය එදා බුදුන් සුත්බත්වන හෙයින් බුදුන්ගේ පුණ්‍යානු
භාවයෙන් ශක්‍රයාගේ පාණ්ඩුකම්බලශෛලාසනය රත්කළ යවටක්
සේ හුණුවිය එකල්හි ශක්‍රයාගේ තුන්ගවු උස ශරීරය සූර්‍ය්‍යාතාප
යෙන් තැවූ ඉටිකඳක්සේ කතියා එකෙණෙහි ආසනයෙන් නැගී
ශක්‍රදෙවෙන්ද්‍ර බිමට පැන මරණභයින් භයපත්ව කිමෙක්ද්‍යෙහෝයි
පරීක්‍ෂාකරණ්නුයේ තමා උපෙක්‍ෂා උවහොත් එදා බුදුන් සුන්බත්වෙ
ති දැන තරුණවූ අභිසුක්තකවෙසක් මවාගෙණ සෝලූලියක් අතින්
ගෙණ බුදුන් අරහයා සතුති කොට කොට බුදුන් ඉදිරියෙහි සිටගෙ
ණ තමාගේ ශක්‍රානුභාවයෙන් තුන්ගවු පමණ තෙන සිටගත්
එසා මහත් පිරිස දෙබෑකොට පියා දකුණත ඔසවාගෙණ අඩනා
ඒ පිරිසට ඇසේනසේ:—

දන්තො දන්තෙහි සහ පුරාණජටිලෙහි විප්පමුත්තෙහි
සිඞ්ගීනික්ඛසවණ්ණො රාජගහං පාවිසි භගවා·

මේ ආදීන් බුදුගුණ කියකියා පිරිස් දෙබෑකොට නික්මින. එ
කල්හි දෙපාශ්වයෙහි බෙදී සිටි මහපිරිස හැම ඒ තරුණපුරුෂයා
ගේ රූපශ්‍රීය හා වික්‍රමය දැක අහෝ මේ දරු විශිෂ්ටවූ රූ ඇත්
තේය ඉතා දර්ශණීයය ඉතා බුහුටිය මෙවැනි තරුණ පුරුෂයෙකු
මෙතෙක් දවස් මෙනුවර අපවිසින් නුදුටුවිරුම්හ තෙපි කොයි
සිට ආකෙණෙක් දැයි විචාරති. එබස් ඇසූ මාණවකවෙස් ගත්
ශක්‍රතෙම:—

යො ධීරො සබ්බධී දන්තො බුද්ධො අප්පටිපුග්ගලො
අරහං සුගතො ලොකෙ තස්සාහං පරිචාරකොති-යි.

මේ ගාථායෙන් මම තුන්ලෝමුදුන් පත් බුදුන්ට පක්‍ෂපාතවූ
එක්තරා එක් අභියුක්තකකෙණෙක්මි කීය. එවිට බුදුරජනන්ව
හන්සේ ශක්‍රදෙවෙන්ද්‍ර අවකාශකොට දුන් මාර්ගයෙන් දහසක්

පමණ රහත්භික්ෂුසඞ්ඝයා පිරිවරා දුටුදුටුවන් ඇස් නිමවමින් සිත් නිමවමින් රූපශ්‍රියෙන් දිලිහි දිලිහී වැඩ රජගහනුවරට වන්සේක බිම්බිසාරරජ බුදුන් පෙරමගට අවුත් වඩාගෙණ ගොස් රජගෙයි පනවාලද ආසනවල වඩාහිඳුවා බුදුපාමොක් මහසඟනට මහදන් දී වළඳා අනතුයෙහි එකත්පස්ව හිඳ ස්වාමීනි මම ජීවිතාන්තය දක්වා තුනුරුවන් හැර වාසයකළ නොහෙම් එහෙයින් මා සිතුසිතු යම්ම විවේක වැදගන්නා කැමැත්තෙමි ලැබිවනත්ම උයන ඉතා දුරය මාගේ මේ වේළුවන නම් උයන ඉතා නුදුරු නොළන්ය ගමනාගමන සම්පන්නය විවේක සාරූප්‍යය සිසාරාසිටගත් නිශ්චලාරුසක්වන් හුනවනයකින් පරික්ෂිප්තව ඉතා ක්ෂෙම්වූ හෙයින් "වේළුවනය" යී කියාත් කියනුලැබෙයි. කලන්දක නම් ලෙහෙණුන්ගේ නම ඔවුන්ට ඒ උයන්හිදී තබා දුන් බතවැටුප් ඇතිහෙයින් "කලන්දකනිවාප" නමැතුදු වීය, මෙසේ නාමද්වයකින් ප්‍රසිඬ ඒ උයන පිළිගනුමැනවැයි ආරාධනාකොට බිම්සරරජ්ජුරුවෝ ඒ උයන නඳගොධ්‍රනයසේ පවිත්‍රකොට සරහා උයනපටන් රජගෙය දක්වා මග සුදුවැලි අතුට විසිතුරුකර ධජපුන්කලස්ආස් වියත්ලදපස්මලින් සදා බුදුන් වඩාගෙණ ගොස් ජනසම්බාධ නැති විවේකසැප යුත් ජ යුදකසම්පන්න සිහිල්ගල්තලායෙන් අලංකෘත උතුම් රමණීය භූමිප්‍රදෙශ ඇති සුරභිකුසුමඵලවෘක්ෂසංඛතින් අතුරු නැති රමණීය ප්‍රාසාදහම්මියවිමානවිහාරඅඩ්ඪයොගමණ්ඩපාදීන් ප්‍රතිමණ්ඩිතවූ මේ මාගේ වේළුවනාරාමය බුදුපාමොක් මහසඟනට දෙමියි භාග්‍යවතුන්වහන්සේගේ ශ්‍රීහස්තයෙහි සුවර්ණභිඞ්කාරයෙන් පැන් වත්කොට පිළිගැන්වූහ. භාග්‍යවතුන්වහන්සේ ආරාමය පිළිගත්සේක. එකෙණෙහි බුඬශාසනයාගේ මූල්බවැයි සතුටුව සාධුකාර දෙන්නිකමේ මහාපෘථිවිතොමෝ කම්පාවිය. දඹදිව වේළුවනාමහවිහාරය හැර මහපොළොව කම්පාකරවා පිළිගත් අනික් සෙනස්නක් නම් නැත මෙසේ භික්ෂුසඞ්ඝයාට සේනාසන ප්‍රණීය වේළුවනාරාමය පිළිගෙණ අනුමෙවෙන්බණ වදාරණ බුදුරජානන්වහන්සේ බිම්බිසාරරජහට විහාරදානානිසංස ප්‍රකාශ කොට වදාරා අනොපමවූ බුඬලීලාවෙන් හා අනන්තවූ බුඬශ්‍රීන් දිලිහි දිලිහී නොයෙක් බුඬවිහරණයෙන් වේළුවනාරාමයෙහි වෛනෙය්‍යනයන් බලබලා වාසයකරණසේක.

කීයේ මැනෝ·

අකීළණෙ වේළුවනෙ විහාරෙ
තථාගතො තත්‍ථ මනොභිරාමෙ
නානාවිහාරෙන විහාසි ධීරො
වෙනෙය්‍යකාලං සමුදික්ඛමානො.

එසමයෙහි රජගහනුවරට නුදුරු තෙන කොලිතය උපතිස්සය යන බමුණුගම් දෙකෙක් විය, එහි සත්මුත්තක සිට ඔවුනොවුන්ට මිත්‍රවූ බ්‍රාහ්මණමහාසාර දෙකුලයෙක උපන් පින්වත් කොලිතය උපතිස්සය යන කුමරුවෝ දෙදෙන පන්සියයක් පන්සියයක් පිරිවර ඇතිව උයන්කෙළි ආදියට යන්නාහ. එයින් කොලිත කුමාරයන් කැටුවම අසුන් යෙදූ රථ පන්සියයක් නික්ම යෙයි, උපතිස්ස කුමාරයන් කැටුවම රන්සිවිගෙවල් පන්සියයක් නික්ම යෙයි, මෙසේ ක්‍රීඩාභූමියෙහිදු එක්වම හැසිරීමෙන් කෙළිනාටකාදිය බලා දෙදෙනම මහත් නුවණැතිහෙයින් සසර කලකිරි මේ කෙළිනළු නාම් සසරින් ගැලවී යන උපායෙක් නොවෙයි එහෙයින් මෙතැන් පටන් කෙළිනළු නොසොයා නිවන් සොයම්හයි මන්ත්‍රණය කොට කවුරුන් ගුරුකොට වසමෝදෝහෝයි පරීක්ෂාකොට එසමයෙහි රජගහනුවර ලාභයෙන් යසසෙන් අග්‍රව වසන සඤ්ජය නම් පරිබ්‍රාජකයන්ගේ ස්වරූප අසා පන්සියයක් රථ හා පන්සියයක් සිවිගෙවල් පන්සියයක් දෙනා අත ගමට යවා පන්සියයක් අතවැස්සන් හැරගෙණ ගොස් ඒ සඤ්ජය පරිබ්‍රාජකයන් ලඟ තාපසව කීපදවසක් උන්කෙරේ වැස තමන් මහනුවණැතිහෙයින් උන්ගේ සමයෙහි නිවන්මගෙක් නැතැයි දැන මුළුදඹදිව තෙසැටදහසක් නුවරවල නුවණැත්තන් කරා ගොස් ඔවුන් විචාළ ප්‍රශ්නයන් තමන්දෙදෙන විසඳීම් මිස තමන් විචාළ ප්‍රශ්න විසඳන එකද කෙණෙකුන් නැතිහෙයින් නිවන්මග පානා තරම් ගුරුකෙණෙකුන් නොදැක නැවත රජගහනුවරටම අවුදින් අපදෙදෙනා අතුරෙන් යමෙක් පළමුව නිවන්මග දුටුවෝනම් ඔවුනොවුන්ට කියම්හයි මන්ත්‍රණය කොට වාසයකෙරෙති. එකල මාගේ ස්වාමීදරුවූ බුදුරජානන්වහන්සේ පෙර කී ලෙස වෙළුවනාරාමයෙහි වසනසේක.

පස්වගමහණුන්වහන්සේ අතුරෙහි අස්සජි නම් මහතෙරුන් මුළුදඹදිව ඇවිද බුදුන් උපන් පරිදි බොහෝදෙනාට කියා ලෝවැඩ කොට නැවත බුදුන්කරා අවුත් වෙළුවනාරාමයෙහිදී බුදුන් දැක එදා රෑ එහි වැස දෙවෙනිදා උදෑසන රජගහනුවරට වැද ගෙපිළිවෙළින් පිඬු සිඟනසේක.

එදවස් පෙර කී දෙයාළුවන් අතුරෙන් උපතිස්ස නම් පරිබ්‍රාජකයෝ ඒ අස්සජි මහතෙරුන් දැක මේ උපසමය ඉතා සත්හුන් වෙශයකැයි දැක පැහැද පසුපස්සෙහි ගොස් ඔබ වළඳනවේලෙහි තමන්ගේ පරිබ්‍රාජිකපුටුවපිට වඩාහිඳුවා වළඳ අනතයෙහි කෙණ්ඩිකාවේ පැන් අතට ගෙණ ලා මෙසේ පළමුකොට ඇවුරුවතින් ආදර දත්වා ස්වාමිනි තුඹගේ ඉන්ද්‍රියයෝද ඉතා ප්‍ර

සන්තානයහ තුඹගේ කායවාක්සමාචාරයෝද මට ප්‍රියවන්නාහ එසේ හෙයින් තුඹ නිවන්මග දුටුහයි සිතමි හිමි තුඹගේ ගුරු කවුරුදැයි විචාළහ. එබසට තෙරුන්වහන්සේ භවත මාගේ ගුරු සවනේ ගෙවා දත් බුදුරජයයි වදාළසේක. ඒ ඇසූපර්බ්‍රාජක නියනුයේ ස්වාමීනි තුඹගේ ගුරුන් වදාළ අවවාදපදයක් මටත් දී වදාළමැනවැයි කීහ. ඒ අසා අස්සජි මහතෙරුන්වහන්සේ මේ පර්බ්‍රාජකවරු නම් බුද්ධසස්නට ප්‍රතිපක්ෂයහ එබැවින් මොහට බුදුන්ගේ ධර්මය මහත්බව කියා හයගන්වමියි සිතාලා මම අලුත මහණවූයෙමි පින්වත දහම් ඉතාගරුය විශෙෂයෙන් කියා තට දක්වාලිම මට පිළිවන්දැයි වදාළසේක. එබසට උපතිස්ස පර්බ්‍රාජකතෙම ස්වාමීනි මට බොහෝකොට වදූරා දුන් නොග තමැනව සංක්ෂෙපකොට එකනයකින් කී දෙය මම සියක් දහසක් ලක්ෂයක් නයින් විස්තරයෙන් සිතාගන්නා නුවණ ඇතියෙමියි කීහ. එවිට අස්සජි මහතෙරුන් වහන්සේ:—

යෙ ධම්මා හෙතුප්පභවා තෙසං හෙතුං තථාගතො ආහ
තෙසං ච යො නිරොධො එවං වාදී මහාසමණො-ති.

මේ ගාථාවගේ පූර්වාර්ධදෙපාදයෙහි සොළොස්වන අක්ෂරයට වදාළ වේලෙහි සහසහස්‍රනයින් සමර්ථය කරතලාමලකයක් සේ දැන උපතිස්ස නම් පර්බ්‍රාජකයෝ සෝවාන්පෙළෙහි පිහිටා නැවත ඉතිරි දෙපාදය සෝවාන්ව සිට අසා නිමවා සාධුකාරදුන්නාහ.

මෙසේ සෝවාන්ව එම සෝවාන්භූමියෙහි නිශ්චලව පිහිටා ශ්‍රද්ධාදී ගුණ ඇතියහයින් නිවන්මග හා තුනුරුවන්ගුණ විමසා මහණෙනි බුදුහු දැන් හැඳිනු මාගේ බුදුහු දැන් කොයිදැයි විචාරා වේළුවනාරාමයෙහි වැඩවසනසේකැයි අසා තෙරුන්වහන්සේට පසඟ පිහිටුවා වැඳ අවසර ගෙණ කොලිත පර්බ්‍රාජකයන් කරා ගොස් නිර්වාණධර්මය දුටුයෙම්වේදැයි කියාලා බුදුන් උපන් පවත් කීහ. එබස් කොලිතපර්බ්‍රාජකතෙම බුදුනැයි යන බස හා නිවණැයි ගුණ නාමය ලොවු දැහැගන්වා සතුටුව තොප ඇසූ බණ මටත් කියව්‍යයි කීහ. උපතිස්සයෝ එවිට තමන් ඇසූ ගාථාව නොවරදවා කීහ. කොලිතයෝ ඒ ගාථාවගේ සතරපදයම අසා නිමි වේලෙහි අනන්තාක්ෂරය ඇසීම සමගම සෝවාන්ව බුදුහු දැන් කොයිදැයි විචාරා වෙළුවනයේයයි අසා අපගේ ගුරුන් සඤ්ජය පරිබ්‍රාජකයන්ටත් කියා අප ලද නිවන්රස දෙමිහයි ඔවුන්ගේ ආරාමයට ගොස් බුදුන් උපන් පරිදි කියා අපි දැන් බුදුන් කෙරේ මහණවන්ට යම්හ අප හා සමග බුදුන්කරා ගොස් මහණවුව මැනවැයි කීදවූහ, එවිට සඤ්ජයපර්බ්‍රාජක පෙර බොහෝකලක්

මම බොහෝදෙනාට ගුරුකම් කොට ඇවිද්දෙමි එහෙයින් භවත් ගෞතමයන් කරා ගොස් මහණව උන්ට අතවැසි නොවෙමි මෙලොව අඥානයෝ බොහෝ නුවණැතියෝ මඳ එහෙයින් අඥානයෝ මා කරා එති නුවණැතියෝ භවත් ගෞතමයන් කරා එති එසේහෙයින් මාගේ පක්ෂීත් බොහෝවෙයි එබැවින් මම නොයමි කියා එබස් නොගිවිස්සාහ. ඉක්බිති කොලිත උපතිස්ස නම් යහළුවෝ දෙදෙනා ආචාරීන් නොයෙක් ලෙස කැඳවා නොගිවිස්නා හෙයින් බුදුන්කරා අපි යම්හයි කියා නික්මුණාහ. එකෙණෙහි සඤ්ජයපරිබ්‍රාජකයන්ගේ පන්සියයක් ප෴ත් එකෙනුත් නොරඳම ආරාමය සිස්කොට ඒ දෙදෙනා හා කැටුවම නික්මුණාහුය. සඤ්ජයපරිබ්‍රාජකයෝ සිස්වූ ආරාමය දැක සෝකයෙන් ලය රත්ව හුණුලේහැල්ලක් නගාපීහ. එවේලෙහි ඒ පන්සියයක් පඤ්ජින් දෙසියපණස්දෙනෙක් ගුරුන්කෙරෙහි කරුණාවෙන් රඳාපීහ. අතික් දෙසියපණස්දෙනා හැරගෙණ දෙදෙන වේළුවනාරාමයෙහි බුදුන් දක්නට නික්මුණාහ.

එකල්හි ලොකානුකම්පා ඇති බුදුරජ සිව්වණක් පිරිස්මධ්‍යයෙහි ධර්මාසනාරූඪව වැඩහිඳ බණ වදාරණසේක් දුරින්ම එන්නාවූ උපතිස්ස කොලිත යන සැරියුත් මුගලන් දෙදෙනාවත් දැකවදාරා අෂ්ටාඞ්ගසමන්නාගත බ්‍රහ්මස්වරයෙන් භික්ෂූන්වහන්සේට අඩයා වදාරා මහණෙනි තෙල එන්නාවූ පරිබ්‍රාජකදෙදෙන මාගේ අග්‍රශ්‍රාවකයෝවන්නි වදාරා ඔවුන්ට පෙරගමන් පිණිස සවණක්රැස් හැර වදාළසේක. ඒ දෙදෙනා බුද්ධරශ්මිස්පර්ශයෙන් අතිශයින් ප්‍රසන්නවූ සිත් ඇතිව බුද්ධගෞරවයෙන් නැමිනැමී ගොස් භාග්‍යවතුන්වහන්සේගේ ශ්‍රීපාදමූලයෙහි බැසගෙව ඇවාම්වූ භාග්‍යවතුන්වහන්සේගේ සමීපයෙහි අපි පැවිදිඋපසම්පදා ලබනුකැමැත්තම්හයි දැන්වූකල්හි භාග්‍යවතුන්වහන්සේ චීවරගර්භයෙන් දක්ෂිණහස්තය නිකුත්කොට "එථ භික්ඛවො ස්වාක්ඛාතො ධම්මො චරථ බ්‍රහ්මචරියං සම්මා දුක්ඛස්ස අන්තකිරියාය" සී වදාළකල්හි ඒ වචනානන්තරයෙහිම සැරියුත් මුගලන් දෙදෙනාවහන්සේ ප්‍රබුද්ධවූ පරිබ්‍රාජක දෙසියපණස්දෙනාම පැමිණ ගලද සෘද්ධිමය පාත්‍රාසිවුරු ඇතිව සියක්වස්සියක් මහණදම්පිරූ මහාථෙරපෙළක්සේ ඊර්යාපථ සම්පන්නව බුදුන් වැඳ පිරිවරා වැඩඋන්සේක්ලාය. එකල්හි බුදුරජ කරවදාළ ධර්මදේශනාව අසා සැරියුත් මුගලන් දෙදෙනාවහන්සේ හැර සෙසු දෙසියපණසක්දෙනාවහන්සේම රහත්වූසේක. අග්‍රශ්‍රාවකදෙදෙනාවහන්සේට ශ්‍රාවකපාරමීඥාණයාගේ මහත් බැවින් උපරි මාර්ගත්‍රය සාධකවූ කෘත්‍යය නොවැටහෙන්නේය. මුග

ලන්මහතෙරුන්වහන්සේ මහණවූ සත්වෙනි දවස්හි මගධරට කල්ලවාල නම් ගම නිසා වසමින් ශ්‍රමණධර්මය කරමින් ථිනමිද්ධයට පැමිණි කල්හි ශාස්තෘවූ බුදුන් විසින් සංවේග ජනවා ථිනමිද්ධය දුරුකොට බුදුන්විසින් දුන්නාවූ ධාතුකර්මස්ථානය අස අසා සකෘදාගාමි අනාගාමි අර්හත් තුන්මාර්ගඵලයට පැමිණ අග්‍රශ්‍රාවකපාරමිතාඥානය මස්තකප්‍රාප්තකළසේක. සැරියුත් මහතෙරුන්වහන්සේද මහණවූ පසළොස්දවසකින් බුදුන් හා එම රජගහනුවරට තුදුරුතෙන හූරන්විසින් කළ ලෙන වසනසේක් තමන්වහන්සේගේ බෑණවූ දීඝනඛ නම් පරිබ්‍රාජකයන්ට වේදනාපරිග්‍රාහක නම් සූත්‍රදෙශනාව බුදුන් දෙශනාකරවදාළකල්හි ඒ දෙශනානුසාරයෙන් ඥානය හැර අනිකක්හට බෙදූ බතක් උදුරාගෙණ කන්නාක්සේ සැරියුත්මහතෙරුන්වහන්සේ සැදෑගැමි අනෑගැමි රහත් තුන්මාර්ගඵලයට පැමිණ අග්‍රශ්‍රාවකඥානයෙහි මුදුන් පැමිණිසේක.

මෙසේ ඒ සැරියුත් මුගලන් දෙදෙනාවහන්සේම රහත්ඵලයට පැමිණි ඉක්බිත්තෙන් ඒ සැරියුත්මහතෙරුන් රහත්වූ දවස්හි ම වෙළුවනාරාමයෙහිදී ශ්‍රාවකසඞ්ඝයාවහන්සේ රැස්කොට ඒ සැරියුත් මුගලන් දෙදෙනාවහන්සේටම අග්‍රශ්‍රාවකතනතුරු දෙවාවදාරා එම දවසටම පැමිණි නවම්මස මැදිපොහෝයෙහි චතුරාඞ්ගයකින් සමන්විතව රැස්වූ එහිභික්ෂුභාවයෙන්ම රහත්ව සිටි එක් දහස්දෙසියපණස් නමක් පමණවූ මහරහතන් හා සමග දසදහසක් සක්වළින් රැස්වූ දිව්‍යබ්‍රහ්මයන්ගේ මධ්‍යයෙහි වැඩහිද අනන්තාපර්යන්තතාවූ රජදරුවන්විසින් ලෝකයෙහි නොහැර දැරිය යුතු මුක්තාහාරයක්සේ අනන්තාපර්යන්තතාවූ බුදුවරයන්විසින් මුඛාලඞ්කාරකොට දෙශනාකරණලද:—

සබ්බපාපස්ස අකරණං කුසලස්ස උපසම්පදා
සචිත්තපරියොදපනං එතං බුද්ධානසාසනං.

යන මේ පූර්වෝක්ත ගාථාරත්නයෙන් අලඞ්කාරකොට ප්‍රාතිමොක් දෙශනාකරවදාළසේක.

එතැන් පටන් ආකාශය හොබවමින් ඇවිදිනා හිරසඳ දෙදෙනාසේ සැරියුත් මුගලන් දෙදෙනාවහන්සේද බුදුරජානන්වහන්සේට අනුවම ශාසන නැමති ආකාශය බබුලුවා වාසයක්ළසේක්ලාය.

මෙසේ කුද්‍රෂ්ටිපාපව්ධ්වංශන සමර්ථවූ මාගේ බුදුරජානන්වහන්සේ බුදුවූ ප්‍රථමවෙනි වර්ෂයෙහිම මහාපවාරණයට ඉක්බිතිව රජගහනුවර උරුවෙලාවට වැඩ එහි දූඩි මිථ්‍යාදෘෂ්ටි නැමති මහාප්‍රපාතයෙහි වැටී හුන් කාශ්‍යපාදී දහසක් ජටිලයන්ට අනෙකප්‍රකා

රවූ සද්ධර්මානුශාසනාද්‍යප්‍රාතිහාර්ය්‍යී කිරීමෙන් ඔවුන් ගොඩනගා රහත්ඵලභූමියෙහි පිහිටුවාලූ හෙයින්ද, බිම්බිසාරරජ පෙර දූරව එතනට පැමිණි මහපිරිස්හි අදහස් බලා ධර්මදේශනාකොට ඒ බිම්සරරජ ප්‍රධානවූ එක්ලක්ෂවිසිදහසක් ඇමතියන් සෝවාන් ඵලයට පමුණුවා දසදහසක්දෙනා ශරණශීලයෙහි පිහිටුවාලූ හෙයින්ද, දෙලක්ෂසතළිස්දහසක් යොදුන් ඝනය ඇති මේ මහ පොළොව වෙවුල්වා පිළිගත් වේළුවන මහාවිහාරයෙහි වාසයකරමින් එම බිම්බිසාර මහරජහුගේ ආරාධනාවෙන් ධර්මදේශනාකොට අසූසාරදහසක් ප්‍රේතයන් ප්‍රේතඅපායෙන් ගලවා දිව්‍යනාමශ්‍රී සම්පත්තියෙහි හා අමෘතමහානිර්වාණයෙහි පිහිටුවාලූ හෙයින්ද, අග්‍රශ්‍රාවකයන්දෙදෙනාවහන්සේ හා ඔවුන් අතවැසි දෙසියපණස්දෙනෙකු තමන්වහන්සේ නිවන්පුරටම ඒහිභික්ෂුභාවයෙන් රහත්ව වදනාපිස් කරණලද ප්‍රණීතවූ ධර්මදේශනාවන් ඇතිහෙයින්ද, එසේ ඒහිභික්ෂුභාවයෙන් රහත්ව සිටි එක්දහස්දෙසියපණසක් භික්ෂූන් හා දසදහසක්සක්වළින් රැස්වූ දිව්‍යසමාගම මධ්‍යයෙහි පවත්වනලද උතුම් ධර්මදේශනාවන් ඇතිහෙයින්ද, මෙසේ මෙසේ සත්වානුග්‍රහ පිණිස දිවසානුදිවස වශයෙන් පවත්වනලද ප්‍රමාණාතික්‍රාන්තවූ සද්ධර්මානුශාසනාවන් ඇතිහෙයින්ද, ලෝකශිවඞ්කරවූ මටම සරණවූ මාගේ බුදුරජ "ශාස්තෘ" නාමවනසේක.

එසේ හෙයින් කියනලදී

දෙවයක්ඛමනුස්සානං ලොකෙ අග්ගඵලං දදං
දදන්තං අම්යනානං පුරිසාජඤ්ඤ තෙ නමො-යි.

ලෝවැඩ පිණිස කරණලද මේ ශ්‍රීසද්ධර්මාවවාදසඞ්ග්‍රහයෙහි මෙතෙකින් අපබුදුන් බුදුව දනව්සැරිසරා රජගහනුවරට වැඩි පළමුවෙනි ගමනෙහි උරුවෙලකාශ්‍යප බිම්බිසාර නරවරාදී බොහෝ සතුන්ට වැඩ සැදීමෙන් වේළුවනාරාමය පිළිගෙණ ලෝවැඩකළ ප්‍රවෘත්තිය කියා නිමවනලදී.

——00——

ත්‍රිභුවනචූඩාමණිවූ ලෝකනායක මාගේ බුදුරජානන්වහන්සේ මෙසේ ලෝවැඩ-වැඩීමෙන් වේළුවන මහාවිහාරයෙහි වසනකල සුද්ධෝදන රජ්ජුරුවෝ මාගේ පුතනුවූ සිද්ධාර්ථකුමාරයෝ උතුම් සම්‍යක්සම්බොධියට පැමිණ දම්සක්පැවතුම් සූත්‍රදේශනාවන වදූරා දූන් රජගහනුවර බිම්බිසාර රජහුගේ වේළුවන නම් විහාරයෙක්හි වාසයකරණසේක්ලු තවදක්වාත් මා ඇස දක්නටවත් නොපැමිණ සෙස්සන්ට සඞ්ග්‍රහකොට උපකාරවූ මට සඞ්ග්‍රහ නොකරණසේකැයි සිතා එක් අමාත්‍යයෙකු කැඳව සොඳුරුවූ

අමාත්‍යය තෝ සුදුපිළි හැඳ මඟුල්වෙස් ගෙණ දහසක් පුරුෂයන් පිරිවරා රජගහනුවර වෙළුවනයට ගොස් මපුතනුවූ භාග්‍යවතුන්වහන්සේකරා පැමිණ මාගේ වචනයෙන් මෙසේ දන්වව "සුද්ධෝදන රජ්ජුරුවෝ තුඹවහන්සේ දක්නා කැමතිසේකැයි යනාබවද ඒ මම මහලුව ගියබව හා පුත්‍රවියෝගදුඃඛයත් ඉවසිය නොහෙනබව වද ලොව බොහෝදෙනාට දහම් දෙසා නිවන්යන අමාරසයක් බෙදූදෙති යනු බොහෝ දෙනාකෙරෙන් අසා මමත් ඒ දහම් යන දෙයක් අසා නිවන් යන උතුම් රසයක් ලැබීමෙහි මහත් තණ්හා ඇතිබවද ඉඳුරා කියා ඔබත් මාගේ පුතනුකෙණෙක් වීනම් මමත් ඔබගේ පියානකෙණෙක් වීනම් වහා නික්ම මාකරා එනසේක්වයි" යනාදී නොයෙක් සරූප දුන්විමෙන් මපුතනුවන් වහාගෙණ එවයි කියා නියෝගකළකල්හි ඒ ඇමත්ද මැනවැයි ගිවිස වහා නික්ම සැටයොදුන් මග ගෙවා ගොස් බුදුරජ මහපිරිස්මැද ධර්මාසනාරූඪව හිඳ බණ වදාරණවේලෙහි වෙළුවනාරාමයට වැද හිරුමඬල වැනි තේජසින් හා සඳමඬල වැනි සෞම්‍යගුණයෙන් යුත් අප්‍රමාණ ශ්‍රීවිභූතින් දිලිහෙන බුදුරජානන්වහන්සේගේ ශ්‍රීමුඛමණ්ඩලය දුරින්ම දැක උපන් ප්‍රීතිසෞමනස්සයෙන් ජනපුන්නා දමසභා මණ්ඩපයට ගොස් පිරිවර දහසක්දෙනා හා පිරිස කෙළවර සිට බණ අසන්නාහු මහරජ කී හසුන් තිබේවා අපි දැන් මෙසේ බණ ඇසීමට සුදුසුයයි දැන ශාස්තෲන්වහන්සේගේ සද්ධර්මදේශනාව සපිරිවරින් අසනුවෝ එසේ සිටිසේම සිට ඒ දහසක්පුරුෂයන් හා රහත්ඵලයට පැමිණ දෙශනාකෙළවර බුදුන්කරා ගොස් පසඟ පිහිටුවා වැඳ එකත්පස්ව සිට පැවිද්දීමට යාඥකළකල්හි භාග්‍යවතුන්වහන්සේ "එථ භික්ඛවෝති" යි වදාරා ශ්‍රීහස්තය දිගුකළකල් ඍද්ධිමය පාසිවුරු ධරා හැමදෙනාවහන්සේම සියක්වස් ගිය මහතෙරුන්සේ ඊර්යාපථසම්පන්නව බුදුන් පිරිවරා හුන්නාහුය. එසේ ඔව්හු රහත්වූ තැන් පටන් අනුනය ප්‍රතිඝයෙන් දුරුව මධ්‍යස්ථගුණයෙහි පිහිටිහෙයින් රජහුගේ හසුන් බුදුරජානන්වහන්සේට නොදන්වාම එහිම වාසයකළසේක්ලාය. එසේ රජ්ජුරුවන් සඳහන්කොට වචනමාත්‍රයක්වත් කියාගෙණ යන එන කෙණෙකුත් නැතිහෙයින් මේඝය පතන චාතකරාජයකු සේ බුදුන් දැකීමම පතා පතා පෙරමග බලබලා විඩාව නැවත අනික් අමාත්‍යයෙකු කැඳවා ඔහට දහසක් පුරුෂයන් පිරිවරා මඟුල්වෙස් ගෙණ යන ලෙස පෙරසේම උගන්වා යවා ඒ අමාත්‍යයාද එසේම පැමිණ පිරිවර සහිතව බණ අසා රහත්ව එහිභික්ඛුභාවයෙන්ම මහණව තුෂ්ණීම්භූතව එහිම වාසයකළහ. මහරජද මේ නියායෙන්ම නැවත නැවතත් සත්වරෙකැයි මෙසේ නවවරෙක නවදහසක්

පුරුෂයන් හා අමාත්‍යයන් නවදෙනෙකු යවා ඒ ගිය ගිය ඇමතියෝ සපරිවරින්ම බණ අසා රහත්ව එහිභික්ෂුභාවයෙන්ම මහණව නිවන්සැප විඳිමින් එයින් එකදෙකෙණෙකුත් ඒ රජ යැවූ හසුන් සඳහන්කොට නොඅහෙයින් රජ්ජුරුවෝ සත්රුවන් පතන සක්විතිරජෙකුසේ බුදුන්ගේ දක්මම පත පතා පෙරමඟ බලබලා විඩාව නැවතද මීට නුමක් කෙරෙම්දෝහෝයි කියා සියලු රජපිරිස බලනුවෝ බෝසතානන් හා එකදා උපන් වැලිකෙළියෙහි පටන් පුරුදුව විසූ "කාලුදායි" නම් ඇමතියන් දැක ඔහු කැඳවා පුත කාලුදායීනි තොප යහළුවූ මපුතණුවන් සිද්ධාර්ථකුමාරයන් කැඳවන පිණිස නවඅගසක් පුරුෂයන් හා ඇමති නවදෙනෙකු නවවරෙක යැවීමෙන් එයින් එක්හසුනමාත්‍රයක්වත් නොඇසීමි එසේහෙයින් දරුව දහසක්පුරුෂයන් පිරිවරා මගුල්වෙස් ගෙණ නික්ම වහා මපුතනුවූ බුදුන් මා ඇස දක්වන්ට නොහැකි වේදැයි විචාල කල්හි දෙවයන්වහන්ස පැවිදිවීමට අවසර ලදිම්නම් ඒ මට පිළිවනැයි දන්වය. එවිට රජ්ජුරුවෝ කියනුවෝ දරුව තෝ පැවිදි වෙවයි පැවිදි නොවෙවයි මපුතනුවූ බුදුන් මා ඇස දක්වවයි කී සේක.

ඉක්බිත්තෙන් ඒ උදායී නම් ඇමතිතෙම මැනවැයි සඳුගෙණ දහසක් පුරුෂයන් හා සුදුසඳුන් ඇඟ ගල්වා සුදුපිළි සුදුමල් පැළඳ පිරිසිදු බුදුන් දක්නට යනුවෝ පෙරසේම ගොස් වෙළුවන විහාරයෙහි බුදුන් බණ වදාරණවේලෙහිම පැමිණ පිරිස්කෙළවර සිට බණ අසා සපිරිවරින් රහත්ව එහිභික්ෂුභාවයෙන්ම මහණව පෙරසේම බුදුන් පිරිවරා හුන් ඒ උදායී ස්ථවිරයන්වහන්සේ එන නට පැමිණ පැවිදි වූත් සත් අටදවසක් ඉක්මගියකල මැදින්දින මැදිපොහොය සම්ප්‍රාප්තවිය. එදවස්හි උන්වහන්සේ සිතනසේක් දුන් හෙමන්තකාලය ඉක්ම ගොස් වසන්තකාලය පැමිණියේය එහෙයින් දශබලධාරීවූ බුදුන්ගේ ඥාතිසංග්‍රහය කිරීමට කල්වන්නේයයි දැන භාග්‍යවතුන්වහන්සේ කරා පැමිණ පසඟ පිහිටුවා වැඳ ශාක්‍යනවහන්සේට අභිමුඛව මහාබ්‍රහ්මයා මෙන් බිම දන හැන දෙහොත් මුදුන්දී ආදරගෞරව සහිතව හිඳ ගමන වර්ණනාකරණ උදායී ස්ථවිරයන්වහන්සේ:—

අඞ්ගාරිනො දානි දුමා භදන්තෙ ඵලෙසිනො ඡදනං විප්පහාය
තෙ අච්චිමන්තොව පභාසයන්ති සමයො මහාවීර භගීරසානං.

නාතිසීතං නාතිඋණ්හං නාතිදුබ්භික්ඛඡාතකං
සද්දලා හරිතා භූමි එසකාලො මහාමුනි·

මේ ආදී ගාථා සැටකින් මාර්ගය වර්ණනාකොට කියා ස්වාමිදරුවූ

බුදුරජනෙනි හෙමන්තය ඉක්ම දූන් වසන්තකාලය පැමිණියෙයින් නානාප්‍රකාර වෘක්ෂයෝ තමතමන්ගේ පුරාණපත්‍රයන් හැර අභිනව පත්‍රයෙන් ගැවසී සිටියහ, මාර්ගයෙහි පිටිමත් හැර මග අවුරා සිටි කෙත්වල ශස්‍යයන් කපාගෙණ වැටකඩුලු නැතිව නුඹ වඩනා මාර්ගයද නිරවුල් විය, සියලු ජනයන්ගේ රොගදුක් සන්සිඳී කොටුගෙවල් පිරී ඉතිර තිබෙන ධාන්‍ය ඇති කාලය හෙයින් බත් බුලත් ආදීන් ද සඹාධව්‍ය, ඉතා සිහිල් ඉතාග්‍රීෂ්ම නොව සමවූ කාලැයි යනාදීන් දන්පා ගමන පණිස යාඥව සිටිකල්හි බුදුරජානන් වහන්සේ තිමෙක් ද උදායි ස්ථවිරයෙනි කවරකාරණයකින් තෝ මාර්ග වර්ණනාකරන්නෙහි දැයි විචාරාවදාළකල්හි උදායි ස්ථවිරයන් වහන්සේ අන්වනසේක ස්වාමිදරුවූ බුදුරජානන්වහන්ස දූත් සුදොදන රජ්ජුරුවෝ ජීර්ණව මහලුසේක නුඹවහන්සේගේ වියෝ දුඃඛශෝකයෙන්ම අභිභූතව ඉතා කෘශවූ ලිහිල්ශරීරව නුඹවහන්සේ දක්නාකැමතිව මා ඇතුළුවූ දසදහසක් අමාත්‍යයන් දශවාරයක දූතමෙහෙවර පිණිසම එවා නවදක්වාත් දූකාගත නොහී මග බලබලා නුඹවහන්සේගේ දක්මම ප්‍රාර්ථනා කර කර හිඳිති එසේම නුඹවහන්සේගේ සියලු බන්ධුසමූහයෝද නුඹවහන්සේගේ දක්මම පත පතා හිඳිනාහුය එහෙයින් ඒ සුදොදන රජ්ජුරුවන් ප්‍රධානකොට ඇති හැම බන්ධුසමාගමයට අනුග්‍රහකොට වැඩවදාළ මනාකාලයයි ආරාධනාකළසේක.

එවේලෙහි ස්වාමිදරුවෝ පූර්වබුදුවරයන් බන්ධූන්ට සඞ්ග්‍රහකළාවූ කාලයද මේයයි දැන ඒ මාගේ ප්‍රවෙනිවංශචාරිත්‍රය කෙරෙමියි සිතාවදාරා උදායිය මම බන්ධුසඞ්ග්‍රහයට යෙමි එබැවින් ගම්කාවත් පුරා නික්මෙණසේ භික්ෂුසඞ්ඝයාට තෝම කියා රැස්කරවයි වදාළසේක· උන්වහන්සේ ද ඒ අසා බුදුන් වදාළ බස් මුදුනෙන් පිළිගෙණ එකෙණෙහිම එපවත් භික්ෂුසඞ්ඝයාවහන්සේට දැන්වූකල්හි අඟුමගද දෙරටින් මහණව රහත්වූ දසදහසක්දෙනාවහන්සේය කිඹුල්වත් නුවරින් රජමෙහෙවරින් අවුත් මහණව රහත්වූ දසදහසක්දෙනාවහන්සේයයි මෙසේ විසිදහසක් පමණ රහතන්වහන්සේ සියලු ගම්කාවත් සපයා සොභාසම්පන්නවූ සුරක්ත පාංශුකූල චීවරයන් ධරාගෙණ අවුත් බුදුරජානන් පිරිවරා සිටගත්සේක· එකෙණෙහි භාග්‍යවත් බුදුරජානන්වහන්සේ දුරුතුමස පටන් මැදින්දිනමස දක්වාම දෙමස මුළුල්ලෙහි නිබඳ වාසයකළාවූ වෙළුවනාරාමයෙන් එම මස මැදිපොහෝද නික්ම ඒ විසිදහසක් පමණ රහතුන්වහන්සේ පිරිවරාගෙණ ඒ රජගහනුවර පටන් කිඹුල්වත දක්වා සැටයොදුන් පමණ මාර්ග සැටදවසකින් යෙමියි සිතාවදාරා දවස දවස යොදුනකතැන් බැගින් මග ගෙවා අනර

මග ගමගම්හි මහත්වූ ධර්මදෙශනාවන් පැවැත්වීමෙන් බොහෝ සතුන් සගමොක්පුරට පමුණුව පමුණුවා අචින්ත්‍යානොපමවූ බුද්ධලීලාවෙන් තමන් වැනි වීතරාගී වීතද්වේෂී වීතමෝහී බුදුපිරිසෙන්ම පිරිවරණලදුව තරු පිරිවැරූ පුන්සඳමඬලසේ දුටු දුටුවන් ඇස් නිමවමින් සිත් නිමවමින් පින් පුරවමින් මහත් ආශ්චර්යවූ අපරිමිත බුද්ධවිලාසයෙන් වඩින්ට පටන්ගත්සේක. ඒ දැක කාලුදායී නම් තෙරුන්වහන්සේ බුදුන් නික්මුණු දෙවෙනිදා උදෑසනම බුදුන් වඩනාබව රජ්ජුරුවන්ට දන්වා පහදවමියි සිතා ආකාශයෙන් වැඩ රජගෙයි පෙනීගියසේක. එකල්හි සුද්ධොදන රජ්ජුරුවෝ ඒ මහතෙරුන්වහන්සේගේ ශාන්තදාන්ත සුවිනීතවූ විශිෂ්ට ශ්‍රී විලාසය දැක ඒ දුටු පමණින්ම මපුතනුවූ බුදුරජානන්වහන්සේද වඩනාබව නියතයයි දැන බුදුන් දුටුවාසේ සතුටුව පෙරමගට ගොස් තෙරුන්වහන්සේ අතින් පාත්‍රය ගෙණ සිංහාසනයෙහි වඩාහිඳුවා කිමෙක්ද මපුතනුවන්වහන්සේ මොබ එනසේ නුඹවිසින් කරණලද ආරාධනාව පිළිගත්සේක්ද උන්වහන්සේගේ වෙශයත් නුඹවැනිදැයි විචාළහ. එබසට තෙරුන්වහන්සේ එසේය මහරජ දැන් මොබට වඩනාපිණිස විසිදහසක් රහතන්වහන්සේත් පිරිවරා නික්ම මග් වඩනාසේක, ඒ වෙශයත් මාගේ මේ ප්‍රව්‍රජිතවෙශය හා සමවීනමුදු ඒ ශාස්තෘන්වහන්සේ මහත් බුද්ධලීලායෙන් සිය දහස්ගුණයෙන් විශිෂ්ටසේකැයි දන්වූසේක. ඒ අසා රජ්ජුරුවෝ බුද්ධලීලාව කෙබඳුදැයි විචාළහ. එවිට මහරජ සියලු දිව්‍යමනුෂ්‍යවූ ලීලාවන් අභිභවා සිටිසේකැයි යනාදීන් මහාසම්පිණ්ඩිනිදානයෙහි ප්‍රකාශ ක්‍රමයෙන් බුද්ධලීලාව වර්ණනාකොට වදාළසේක. ඒ අසා අතිශයින් සතුටුවූ රජතෙම තමන් පිණිස පිළියෙළකළ භොජනයෙන් පාත්‍රය පුරා දන්දී වළඳා ඉක්බිති ඒ පාත්‍රය සොඳා සුවඳසුන්නෙන් උලා පිරිසිදුකොට පෙර ගිහිව වසනකල අනුභවකොට පුරුදු අග්‍රවූ තුන්හවුරුදු සුවඳ කවා තුබූ සුවඳඇල් සාලේ බත් හා නොයෙක් සූපව්‍යඤ්ජනරසයෙන් පාත්‍රය පුරා මපුතනුවන් මාකෙරෙහි ප්‍රේමය ඇතහොත් අතික්‍රාන්තයක් නොවළඳා මාගෙන්ම යැවූ බත් වළඳන්ට වදාළමැනවැයි කියාත් ආරාධනාකොට මෙනුවරට වඩනාතාක් කල් අතුරුමගට මෙයින් පිණ්ඩපාතදානය නුඹවහන්සේම ගෙණ යනසේක්වයි කියා පාත්‍රය තෙරුන්වහන්සේ අතම තබාලූහ. එකල්හි තෙරුන්වහන්සේ මෙතන පටන් ආකාශයෙන් මා යන නියාවත් පාත්‍රය බුදුන්ට පිළිගන්වන නියාවත් බුදුන් බත් වළඳන නියාවත් රජහට පෙනේවයි අධිෂ්ඨානකොට භූතස්නෙන් නැගී හැමදෙනා බලබලා සිටියදී පාත්‍රය නීලභෘඞ්ගරාජයෙකුසේ පෙරටුව හැර අහ

සිත්ම වැඩ පාත්‍රය ගෙණ බුදුන්ගේ ශ්‍රීහස්තයෙහි තබාලූසේක. බුදුරජද ඒ බත් වළඳාවදාළසේක. මෙම ක්‍රමයෙන් තෙරුන් වහන්සේද දවස දවස බත් පාත්‍රයක් බැගින් එසේම ගෙණගොස් පිළිගන්වනසේක, බුදුහු ඒ බත්ම වළඳාවදාරණසේක්මය, වළඳා අනතුරුයෙහි එම තෙරුන්වහන්සේද දවස දවස රජගෙට ගොස් අද බුදුරජ මෙතෙක්තැන් ඉක්මවා වැඩිසේකැයි යනාදීන් එම මහාසම්පිණ්ඩි නිදානයෙහි ප්‍රකාශ ක්‍රමයෙන් අනේකප්‍රකාරවූ බුදුගුණ ප්‍රතිසංයුක්ත ධාර්මිකකථාවන් කියකියා ඒ සුද්ධොදන රජ ප්‍රමුඛවූ සියලු රජකුලය බුදුන්කෙරෙහි පහදවනසේක, ඒ කාරණයෙන් බුදුරජානන්වහන්සේ "එතදග්ගං භික්ඛවෙ මම සාවකානං භික්ඛූනං කුලප්පසාදකානං යදිදං කාලුදායී"ති,, යනුයෙන් එතදග්‍රපාලිය වදාරා මේ ශාසනයෙහි කුලයන් පහදවන්නාවුන්කෙරෙහි කාලුදායී තෙරුන්වහන්සේ අගතැන්පත්කොට තනතුරු දුන්සේක.

මෙසේ සැටදවසකින් වැඩ වෙසක්මස මැදිපොහෝද බුදුරජානන්වහන්සේ කිඹුල්වත්පුරයට පැමිණිසේක. එකල්හි එක්ලක්ෂ සැටදහසක පමණවූ ශාක්‍යරජදරුවෝ අපගේ නෑ උතුමානන්වහන්සේ දක්නට ලදුම්හයි සතුටින් රැස්ව විසිදහසක් රහතුන්වහන්සේ හා අපහාය්‍යවතුන්වහන්සේට විසීමට විවෙකස්ථානයක්ම වියයුතුබැවින් කවරනම් තැනක් සුදුසුවේදෝහෝයි පරීක්ෂා කරන්නාහු නිග්‍රෝධ නම් ශාක්‍යරජ්ජුරුවන්ගේ උයන ඉතා රම්‍යය එහි විහාරය කළමනායයි මන්ත්‍රණය කොට ඒ හැම ශාක්‍ය රජදරුවෝ අභිමානය බලවතරහෙයින් මෙසේවූද කතිකාවක් කළාහුය සිද්ධාර්ථකුමාරයෝ තමන් බුදුවූබව මිස අප අපගේ බාල මලනුවෝය බෑණනුවෝය පුතනුවෝය මුණුබුරානෝය එහෙයින් ඇමදෙනම වඳින්ටත් නොහැකිවම්හ සෙසු ලෝකයෙහි මහලු රජදරුවෝද දූන් උන් වඳිත්මය මිනිසුන් තබා දෙවියෝ දක්වාත් උන් වඳිත්මය එසේ ඇතිකල අපි නොවැඳ සිට ලොව මහත් අයස කුදු උපදනේය අහෝ මෙයට අප කුමක් කරමෝදැයි, කතිකා කරන්නාහුය. ඔවුන් අතුරෙන් සමහර කෙණෙක් කියන්නාහු අපි මෙයට හොඳ උපායක් දනුම්හ ඒ සියලුම ළදරුකුමාරයන් ඉදිරියෙන් සිටුවා, ඔහු හැම වඳිනාකල්හි අපිද වඳින්නාහු මෙන් ඔවුන්ගේ පිටිපස ලස්වම සිඳගණුම්හ එවිට මේ අපගේ සිදුර කිසිවෙක් නොදක්නේයයි කිවිය. ඒ අසා හැම ශාක්‍යරජදරුවෝම සම්බාධිව මේ උපාය අනිකක්හට නොහඟවා රැක්කයුතුයයි සම්මතකොටගෙණ බුදුන් වඩනා මග යොදනක් පමණ තැන් අලඞ්කෘතකරවා වඩනාට පෙරගමන්කරන්නාහු සියලු අලඞ්කාර

යෙන් ශොභමානවූ සොළොස්හැවිරිදි සිවුකුමරුවන් පන්සියයක් දෙනා සරහා සුවදමල් දී පළඳුකොටම් පෙරමගට යවා සොළොස්හැවිරිදි සිවුකුමරියන් පන්සියයක් සරහා මහනෙල් මල් මිටිඅතට දී දෙවැනව යවා ඊට ඉක්බිත්තෙන් පන්සියයක් ශාක්‍යකුමරුවන් සරහා මහපෙරහරින් තුන්වැනව යවා පන්සියයක් ශාක්‍යකුමරියන් සරහා එසේම සතරවැනව යවා අන් කුඩු ගිතෙල් මී ශර්කරාදී නොයෙක් පානවර්ගයන් හා විසිතුරු ධජපතාකදඬුවැටපහන්ආදී නොයෙක් පූජෝපකරණයන්ද යවා තෙපි හැම ශාක්‍යවූ අපභාග්‍යවතුන්වහන්සේ පිරිවරාගෙණ මේ සියලු පූජෝත්සව පැවැත්විමෙන් ගංගාතීරයට එවයි කියා සලස්වා තුමූ හැමදෙනද නිග්‍රොධශාක්‍යයන්ගේ උයන්හි සියලු ප්‍රාසාද කූටාගාරමණ්ඩපසාලා රාත්‍රිස්ථාන දිවාස්ථානාදීන් සමලඞ්කෘතකොට විහාරය කරවා එහි සිව්දෑගඳ සම්මිශ්‍ර නිලවර්ණගොමයෙන් උලා ලදපස්මල් විසුරුවා සුදුවියන් බඳවා සවර්ණතාරකායෙන් හා සුවදමල්දම්ආදීන් අලඞ්කෘතකොට ඒ ඒ තැන්හි සවර්ණරජතමයවූ අනෙකප්‍රකාර වෙශධරා සිටි ප්‍රදීපාධාරයන් පිහිටුවා හාත්පසින් පද්මොත්පලකුසුමයෙන් භාරවූ පූර්ණකලස් තබ්බවා විසිතුරු තොරණපඞ්කතීන් නගා අනෙකප්‍රකාරවූ මල්ඇගෑ පහන්ඇගෑයෙන් අලඞ්කෘතකොට ඒ උයන්හි වෘක්ෂයන්ගේ කඳ අතුපතරවල නානාප්‍රකාර වර්ණපිළියෙන් වෙළා ඒ උයනද ශක්‍රයන්ගේ නන්දනවනයසේ සරහා තත්කල්හි ඒ හැම ශාක්‍යරජදරුවෝම තමතමන්ගේ විභවානුරූප අලඞ්කාරයෙන් සැරසී තමන් පස්වැනිව එක්ලක්ෂසැටදහසක් ශාක්‍යරජදරුවෝ බුදුන් වඩනා පෙරට නික්මුණාහුය. එකල්හි භාග්‍යවතුන්වහන්සේ තමන්වහන්සේගේ බන්ධුවූ ශාක්‍යරජකුමරුවන් විසින් පිරිවරණසේක් අනොපමවූ බුද්ධවිලාසයෙන් දිලිහි දිලිහී රොහිණී නම් ගංගාතීරයට සම්ප්‍රාප්තවූසේක. ශාක්‍යරජදරුවෝ එහි භාග්‍යවතුන්වහන්සේටද විසිදහසක් පමණ භික්ෂුසඞ්ඝයාවහන්සේටද ඒ රොහිණී නම් ගඟින් එතරවන පිණිස විසිතුරු කර්මාන්තයෙන් හොබනා නැවුසදා එහි රත්නමණ්ඩපයන් තනවා හාත්පසින් ලල්දම් සවර්ණජාලයෙන් පරික්ෂෙපකොට නගනලද ධජපතාකාදීන් සශ්‍රීකවූ ඒ මණ්ඩපමධ්‍යයෙහි මනාකී රත්නපර්‍ය්‍යඞ්කයක් සාදා දිව්‍යවිමානයක් මෙන් සජ්ජිතකළාහුය, එකල්හි සර්වගුණරත්නාමන්දිරායමානවූ අප භාග්‍යවතුන්වහන්සේ ඒ රත්නාමණ්ඩපමධ්‍යගත රුවන්ආසනමස්තකයෙහි සහස්‍රරශ්මීන් ඔරපනා සූර්ය්‍යමණ්ඩලයක්සේ දිලිහි දිලිහී වැඩඋන්සේක. භික්ෂුසඞ්ඝයාවහන්සේද එසේම සජ්ජිතකරණලද ශොභමාන නැව්වල සැදී වැඩවුන්සේක. එසේ ඇතිවූකල්හි

අනන්ත ශ්‍රීඝන විලාසශ්‍රීන් විරාජමානවූ භාග්‍යවතුන්වහන්සේගේ හැම සතුන් නෙත් සිත් පැහැරගන්නා අචින්ත්‍යානොපමවූ බුද්ධශ්‍රී විලාසය දක දක දෙගොඩ සිට ශාක්‍යවංශඥාතිසමූහයෝ විචිත්‍ර වස්ත්‍ර සුවඳමාලාභරණයෙන් සැරහී ධවජපතාකපූර්ණඝටප්‍රදීපචාම රාදිය ගත් අත්ඇතිව බබලන්නාහු ගංගාමස්තකයෙහි අප්‍රමා නවූ ශ්‍රීවිලාසයෙන් දිලිහි දිලිහී වඩනා බුදුන්ම බල බලා සතුටු සතුටුව නොයෙක් පූජා පවත්වමින් සැදී සිටියාහුය. එවේලෙහි සර්වජනප්‍රියඞ්කරවූ භාග්‍යවතුන්වහන්සේ නැවෙන් බැස ගංගා තීරයෙහි විසිදහසක් පමණවූ මහරහතන්වහන්සේත් පිරිවරා සවර්ණක්රැසින් දිලිහි දිලිහී වැඩසිටිසේක. නැවත ඥාතිසමූහයා විසින් පිරිවරණලද සුද්ධොදන මහරජතෙම සර්වාකාර ප්‍රතිමණ්ඩිත රූපශ්‍රී ධරවූ ලදරු ලදරු රාජකුමාරයන් පෙරදැරිකොටගෙණ ඒ ගංගාතීරයපටන් නිග්‍රෝධාරාමය දක්වා මහත් උද්දූරතරවූ පූජාපෙරහරින් විසිදහසක් ක්ෂීණශ්‍රාවකයන්වහන්සේ හා බුදුරජානන්වහන්සේ වැඩම්කරවාගෙණ නිග්‍රෝධාරාමයට ගොස් සරහා පිළියෙළකරණලද ඒ විහාරය පිළිගැන්වූවාහුය. ලොකස්වාමිවූ බුදුරජනන්වහන්සේ එහි විසිදහසක් රහතන්වහන්සේ පිරිවරා බුද්ධාසනමස්තකයෙහි සවර්ණක්රැසින් දිලිහි දිලිහී උදයගිරිපර්වත මස්තකයට පැමිණි බාලාර්කමණ්ඩලයසේ වැඩඋන්සේක. ඒ දක බුදුගුණ නොදත් ඒ හැම ශාක්‍යරජදරුවෝ ලදරු රජකුමරුවන් ලඟට කැඳවා කන් කොඳුරමින් කතිකා කළලෙස මෙසේ මෙසේ කියති "දරුවෙනි තෙපි අපට පෙරට පෙරටව සිට සිද්ධාර්ථකුමාරයන් වැඳලව අපි තොප හැමට පසුවලා නොහඟවා හිඳුම්හ මේ වග කාටත් නොදන්වව"යි උගන්ව උගන්වාලූහ. එබස් අසා බුදුන්ට බාලවූ රජකුමරුවෝ පෙරටව සිට බුදුන් වැඳ මහලුනැයන්ට අවකාශ නොදීම දහස්ගණනෙක් ඉදිරිපිට ඉඳගත්හ. ඉක්බිතිව සුද්ධොදන රජ්ජුරුවන් ප්‍රමුඛවූ මහලුනැයෝද ඔවුන් අසූඅස්සෙහි සැඟවී හිඳගත්තාහුය.

මෙසේ ඒ ශාක්‍යනැයෝ තමන්වහන්සේ නොවැඳ උන්හෙයින් පස්පැදිස්නා නෙත්‍ර උන්මීලනය කොට ඥාතිගණයා බලනසේක් චෙතොපරියඥානයෙන් ඔවුන්ගේ අදහස් දැනවදාරා මාගේ මේ නැයෝ හැම මොහයෙන් වැඩිමහලුහෙයිනුත් බුදුන් බල නොදත් හෙයිනුත් මා නොවඳනාහුය, පූර්වබුදුවරයෝ නැයන්ගෙන් වැඳුම් කෙසේ ලද්දාහුදැයි බලනුවෝ ලොව අදහුතවූ බුදුබල ප්‍රකාශකොට යමකප්‍රාතිහාර්‍ය්‍ය දක්වා මුළුලොව විෂ්මයපත්කොට නැයන්ගෙන් වැඳුම් ලද්දාහුයයි දැන අනන්තාපර්‍ය්‍යන්තවූ බුදුවරයන්ගේ චාරිත්‍රවූ ඒ මාගේ වංශචාරිත්‍රය තිරීමෙන්ම නැයන්ගෙන් වැඳුම් ලබම්යි සිතාවදාරා:—

පීතකසිණසමාපත්තියට සමවැද මා ඇඟින් නික්මුණු ප්‍රභාස්කන්ධයෙන් දසදහසක් සක්වළ එකාලොකවේවායි අධිෂ්ඨාණකොට ශ්‍රීබුද්ධශරීරයෙහි අඟලක් සාතැනින් රන්වන්බුදුරැස්කඳෙක් නික්මවූසේක. ඒ බුදුරැස්කඳ දිවගොස් සතිස්ලක්‍ෂදසදහස්තුන්සියපණස්යොදුන් වට ඇති සක්වළගැබ මුළුල්ලෙහි වට තුන්යලක් දිව මේ සක්වළගැබ වට අවකාශ මදගෙයින් අකනිටාබඹලොව දක්වා නැගී මේ සියලු සක්වළතුහරය ඒ රන්වන්රැසින්ම පුරා සිට එයින් ඉතිර නික්මගොස් මේසක්වළට හාත්පස්හි දසදහසක් සක්වළ මුළුල්ලෙහිද මෙම ක්‍රමයෙන්ම රන්වන්බුදුරැසින්ම පුරාගෙණ හිරු දහස් සුවහස් පැනනැංගාසේ එකාලොකකෙරෙමින් සිටගත. ඒ ශරීරප්‍රභාව ඔබමොබ දිවත්නාදූක දසදහසක්සක්වළ දිව්‍යබ්‍රහ්මසෙනාව අපගේ බුදුහු අද විශෙෂවූ ධර්‍මදෙශනාවක් දෙශනාකරණසේක්වනැයි ඉතා සන්තුෂ්ටව අනෙකප්‍රකාර පූජාභාණ්ඩයන් ගෙණ ඔවුනොවුන් පරයා දිව ආකාශය මුළුල්ලෙහි විදුපු සිතියම්කඩක්සේ දිලිහි දිලිහී මේ සක්වළගැබ පිරී ගහණව සිටගත්හ. එකෙණෙහි මාගේම ස්වාමිදරුවූ භාග්‍යවතුන්වහන්සේ අභිඥාපාදක චතුර්ථධ්‍යානයට සමවැද මේ දසදහසක්සක්වළ පමණටම රුවන්සක්මණක් මැවීයෙවයි අධිෂ්ඨාණකොට ආකාශයා බලාවදාළසේක. ඒ ඇසිල්ලෙහිම දසදහසක් සක්වළ මුළුල්ලෙහි දසදහසක් වැම් හිඳුවාලූවාසේ දසදහසක් රන්මෙර බුද්ධානුභාවයෙන් එකපෙලක්ව සිටගත. ඒ මෙරගල්මුදුනෙහි දසදහසක්සක්වළම පූර්වචක්‍රවාටය පටන් පශ්චිමචක්‍රවාටය දක්වා දිගින් එක්දහස්දෙසියතුන්කෙළපන්සාළිස්ලක්‍ෂයක් යොදුන් භූ පළලින් දසදහසක් යොදුන් තැන් පැතිර සිටිනාවූ ඒ දසදහසක් යොදුන් තැන ලොහිතවර්ණවූ රුවන්වැලිතලාවෙන් හා ඒ ලොහිතාධිකරුවන්වැලිපටට දෙපාර්ශ්වයෙහි පළලින් දෙදූසක්යොදුන් පමණ තැන මුතුපබලුපලිඟුවෙදුර්‍ය්‍යමසාරගල්ලමරකතකොමලවිද්‍රුම ආදිවූ සර්වමිශ්‍රක රුවන්වැල්ලෙන් හා මිශ්‍රක රුවන්වැලිපට දෙකින් දෙපට පළල දෙදූසක් යොදුන් තැන ඉන්ද්‍රනීලමාණික්‍යමයවූ රුවන්වැල්ලෙන් හා මෙසේ ගැවසීගත්තාවූ පූර්සක්වළ පටන් පශ්චිමසක්වළ මුවවිට අතරදිග නානාවර්ණ රුවන්වැල්ලෙන් විසිතුරු සිතියමක් නඟා පැහැ සිව්ගා ඔප්ලූවාක් මෙන් අතිශයින් ශොභාසම්පන්නාවූ රුවන්සක්මණක් මැවීගියේය.

ඉක්බිත්තෙන් ස්වාමිදරුවෝ ඒ රුවන්සක්මණ දූකවදූරා උදයගිරිපර්වතයෙන් පැන නැඟි ලහිරුමඩලක්සේ කල්පාන්තවාතවේගයෙන් අහස්කුසට පැන නැගි ඝනරන්මෙරක්සේ සවණක් රැසින් දිලිහි දිලිහී ඒ රුවන්සක්මණට නැගීවදූරා තමන්වහන්සේම

අභිමානයෙන් නොවැද හුන් නෑයන්ගේ හිස්මුදුන්හි පස් වගුරු වන්නාසේ එහි සංක්‍රමන්කරන්ට පටන්ගෙණ මේ දසදහසක් සක්වළ මුළුල්ලෙහි බ්‍රහ්මයෝද දෙව්යෝද මනුෂ්‍යයෝද සිව්පාවෝද පක්ෂීහුද දියෙහි ගොඩෙහි වසන සත්හුද හැම නරකවල සත්හුද ලොකාන්තරිකනරකාදී. හැම නරකවල දුග්ගත්නා සත්වයන් හා ප්‍රෙතයෝද යටත්වශයෙන් මේ දසදහසක්සක්වළ මුළුල්ලෙහි කිනිඹිකුහුඹුවන් දක්වාත් හැම සත්වයෝම නොවැරද නොමුළාව මාගේ මේ බුද්ධලීලාසශ්‍රිය දක්ත්වයි අධිෂ්ඨාණයකාට වදළසේක. ඒ අධිෂ්ඨාණචිත්තය හා සමගම දසදහසක්සක්වළ මුළුල්ලෙහි කුරුකුහුඹුආදී ක්ෂුද්‍රප්‍රාණීන් පටන් මහබඹුන් දක්වා සියලු සත්හුම ඔවුනොවුන් සිත්සේ බුදුන් බලන්නට පටන්ගත්හ. එපමණක් මතු නොවෙයි ඒ හැමසත්හුම ඔවුනොවුන් දක්ති, එසේ බ්‍රහ්මයෝ කුහුඹුවන්ට පෙනෙති කුහුඹුවෝ බ්‍රහ්මයන්ට පෙනෙති දසදහසක්සක්වළ මනුෂ්‍යයෝ තමතමන් ගෙදොර සිට ඒ සක්මන්කරණ බුදුන් තමතමාගේ අභිමුඛයෙහි මෙන් දකිති එසේම වදරණ බණ අසන්නාහුය.

තවද දසදහසක් සක්වළ තෙළෙස්ලක්ෂසැටදහසක් පමණ නරකවල ගිනි නිවී එහි පයුම් පැනනැංගාහ. එකෙණෙහි ඒ නරකවල දුක් විඳිනා හැම සත්වයෝම දුකින් මිදී සිහිල්වූ ශරීර ලදින් පියුම්පිටට පැනනැගී බුදුන් දක දෙගොත් මුදුන්දී අනේ බුදුරජානෙනි තෙලෙ සක්මණින් පහනොවන්න අනේ හිමියානෙනි මේ නරකවල නිවූ ගිනි නැවත දල්වීය නොදෙන්න අනේ ස්වාමිනි බොහෝ දවසක් දුක් යෙණ දුන් මේ ගැලවීගියම්හයි යනාදීන් ඉතා බැගෑ අඳෝනාතෙපුල්ම කියකියා බුදුන්ම බලා බලා සතුටු සතුටුව සිටගත්තාහුය.

තවද මේ දසදහසක්සක්වළ මුළුල්ලෙහි අරූතල අසඥීභවතලවල සත්වයන් හැර සෙසු සියලු දිව්‍යබ්‍රහ්මනාගසුපර්ණගරුඩගන්ධර්වසිද්ධවිද්‍යාධරාදීහුද තමතමන් බල පමණින් අනේකප්‍රකාර පූජාභාණ්ඩ ගෙණ යට කී ක්‍රමයෙන්ම මේ සක්වළට රැස්ව ලෝකනාථකවූ බුදුරජානන්වහන්සේට පූජාකරමින් එකපැහැර සාධුකාර දුන්හ.

මෙසේ දසදහසක්සක්වළ එකම මඟුල්ගෙයක් මෙන් ලීලෝපෙතව සැරසී සිටගත්වේලෙහි සර්වඥසනබුද්ධරශ්මිමාලාවක් දසදිග විහිදුවා කෙළගණින් සමාපත්තියට සම්වැද පූර්වසක්වළ මුවවිටින් පශ්චිමසක්වළ මුවවිටටද පශ්චිමසක්වළ මුවවිටින් පූර්වසක්වළ මුවවිටටද ඔබිනොබ සතරරියන්. පමණවූ සක්මණෙක්හි

සක්මන්කරන්නාසේ බණ වදාරමින් සක්මන්කරණසේක් තෙජෝ
කසිනසමාපත්තියට සම්වැද දසදහසක්සක්වළ දුමාවයි ඉටා
සියලහින්ම ගිනිකඳ හරින්ට පටන්ගත්සේක. එකෙණෙහිම ආ
පොකසිනසමාපත්තියට සම්වැද එසේම දියකඳ හරින්ට පටන්ගත්
සේක. එයින් ගිනිකඳ සඳහා තෙජෝකසිනසමාපත්තියට සමවැද
දකුණුඋරමඬලෙන් නාභිතල්කඳක් සා ගිනිකඳක් හළසේක
එවිට බුදුසිරි බලබලා සිටි දිව්‍යමනුෂ්‍යසේනාව ඔවුනොවුන්
ඉඟිලා බලා අර තිමෙක්ද දකුණුඋරමඬලෙන් මහත් ගිනිකඳක්
නැගෙන්ටව නැයි කියා හුස්ම නොහෙලෙනතුරුම දියකඳ සඳහා
ආපොකසිනසමාපත්තියට සමවැද වම්උරමඬලෙන් නාභිතල්
කඳක් සා දියකඳෙක් හළසේක. ඒ දුක එම්බල කොල මෙවිට
බලාගන්නව වම්උරමඬලෙන්ද දියකඳක් නික්මී නැයි කියා
බස නොහරිණතුරෙහිම දියකඳ නැගී උරෙන්ම ගිනිකඳෙක්
බසින්ට වන, ඒ දුක මේ තිමෙක්ද දියකඳ නැගී නැතින්ගිනිකඳ
බසින්ටව නැයි ඔබ්නොබ බලනකලම දියකඳ බට උරෙහුදු ගිනි
කඳෙක් නැගෙන්ටවන, ඒ දුක මේ කවර ආශ්චර්යයෙක්දැයි
බලත්ම එවිගස දකුණුකන්සිදුරෙන් එසේම ගිනිකඳෙක් නැ
ගෙන්ට වන, ඒ දුක තෙල තිමෙක්ද දකුණුකන්සිදුරෙන් ගිනි
කඳක් නැගෙන්ටවනැයි කියත්ම වම්කන්සිදුරෙහුදු එසේම
නාභිතල්කඳක් සා දියකඳෙක් බසින්ට වන, ඒ දුක අහෝ මේ
කුමන විස්මයෙක්දැයි කියා නොනිමෙනතුරුම ගිනිකඳ නැගී
දකුණුකන්සිදුරෙන්ම නාභිතල්කඳක් සා දියකඳෙක් බසින්ට වන,
ඒ දුකද මේ කුමන විස්මයෙක්දැයි බලබලා සිටම සබඳින් මේ දිය
කඳෙහි සිහිලසයක් බලවයි කියති, එවිට සමහරු දියෙහි සිහි
ලස කියනුම කිම්ද මේ ගිනිකඳ දියකඳටත් වඩා ඉතා සිහිලසය
මෙ බලව බලවයි කියති, ඒ බලා ඇසිපිය නොහෙලනකල් අනු
රෙහිම දකුණුනාසාසිදුරෙහුදු වම්නාසාසිදුරෙහුදු දකුණුඇසෙ
හුදු වම්ඇසෙහුදු එසේම දියකඳ සා ගිනිකඳ බසින්ට වන, දිය
කඳ සා ගිනිකඳ නැගෙන්ටවන, දැත දසඟිලිවලිනුදු දෙපය දස
ඟිලිවලිනුදු එසියඅසූවක් සන්ධිවලිනුදු අසූහත්කොළක් පමණ
කෙසධාතූන්ගේ කැටිවූ තුන්සියසැටක් කෙස්මුඩුවලිනුදු එසේම
ගිනිකඳ සා දියකඳ බසින්ටවන, එසේම දියකඳ සා ගිනිකඳ නැ
ගෙන්ටවන, නවඅනූදහසක් රෝමකූපයන් අතුරෙහුදු එසේම
රෝමකූපයක් රෝමකූපයක් පාසා නාභිතල්කඳ සා ගිනිකඳ නික්
මෙන්නාහුය, එකෙණෙහි ඒ ඒ රෝමකූපයක් රෝමකූපයක් පාසා
දියකඳද නික්මෙන්නාහුය, නැවත එම අසූඅස්සෙහි සියලු බුද්ධ
ශරීරයෙන් හරණ සවණක්රැසින් දසදහසක්සක්වළ පිරී ගැවසී

ඉතිරගෙණ බැබලි බැබලී සිටියේය. එයින් ගිනිකඳ හරණ ක්‍ෂණ යෙහි තෙජෝකසිනසමාපත්තියට සමවදනාසේක, දියකඳහර ණ ක්‍ෂණයෙහි ආපොකසිනසමාපත්තියට සමවදනාසේක, නිල් බුදුරැස් හරණවේලෙහි නීලකසිනසමාපත්තියට සමවදනාසේ ක, රත්වන්රැස් හරණවේලෙහි පීතකසිනසමාපත්තියට සම වදනාසේක, සුදුබුදුරැස් හරණකල ඕදාතකසිනසමාපත්තියට සමවදනාසේක, සෙසු රැස් හරණකලත් වෙනවෙනම සමාපත්ති යට සමවදනාසේක, නොයෙක් රැස් එකුවිට හරණකලද නො යෙක් සමාපත්තියට එකවිටම සමවදනාසේක.

එදා බුදුන්ගේ ශ්‍රීශරීරයෙන් නික්මුණාවූ දියකදින් දසදහසක් සක්වළ මූඑල්ලෙහි චතුරෙන් උතුරුවා ගියබැවින් අල්ලක් සාත් නොතෙමුනාවූ බිමෙක් නැත්මය, එසේහෙයින් මේ දසදහසක් සක්වළය යන බුදුන්ගේ ජන්මක්‍ෂෙත්‍රයෙහි මහපොළොව පස් පවා විඝසා බැලුවහොත් ධාතුකොට සිතා පූදත් නමුත් සුදුසුමය– එදා එසේ ගලා යන දියෙන් කුහුඹුවකුටවත් වූ හාණියෙක් නැත, එහි තෙමෙනුකැමැත්තන් තෙමෙයි නොකැමැත්තන් නොතෙ මෙයි, එසේම දසදහසක්සක්වළ මූඑල්ලෙහි බමබමා දිවෙන ඒසා මහත් ගිනිකදින් මකුළුහුයක්වත් කළුවිමෙක් වන පමණ හාණියක්වත් නොවූයේය.

තවද එදා දසදහසක්සක්වළින් රැස්වූ බ්‍රහ්මසේනාව ඒ රුවන් සක්මණින් එක්ඇලයෙක තුන්ගවු සා සේසත් ගෙණ සිටගත්හ, එසේම දසදහසක් ශක්‍රසේනාවද එහිම අනික්භාගයෙහි එක්සිය විසිරියන් ජයතුරාසක් ගෙණ සැදී සිටගත්හ, එසේම සුයාම සන්තුසිතයෝ පෙළින් පෙළ සැදී මැණික්මය චාමර මැණික් මය තල්වැට ගෙණ මඳ මඳ පවන්පූජාවට පටන්ගත්හ, සෙසු දෙවියෝ මල්වරුෂා වැස්වීම්ආදී අනෙකප්‍රකාර පූජා පැවැත්වීමට පටන්ගත්හ.

මෙසේ දසදහසක්සක්වළ දිව්‍යබ්‍රහ්මාදීන්ගේ අප්‍රමාණ පූජෝ ත්සව පවත්වමින්ම සිටියදී ඒ මාගේම සවාමිදරුවූ බුදුරජනන් වහන්සේ ඒ සියලු පූජා විඳ විඳ රුවන්සක්මණ සක්මන්කරණ සේක් දසදහසක්සක්වළ මූඑල්ලෙහි ඇවිදමින් සක්මන්කරණ සේක, එසේ සක්මන්කරණසේක් නමුත් මේ දසදහසක්සක්වළ ඇම සතුන්ටම නොවරදවා එකවිටම පෙනිපෙනියනසේක, තවද යට කී ප්‍රමාණ යුත් එසා මහත් රුවන්සක්මණ මහතැයි කියා බුදුහු මහාශරීරයක් මවාගත්තේත් නැත, තමන්වහන්සේගේ ශරීර ප්‍රමාණය කුඩායයි කියා ඒ සක්මණ කුඩාකොට ගත්තේ

කුත් නොවෙයි, එසේඅවුවත් ඒ සක්මණටම හොබනාතරම් නිරූ රූපශ්‍රීයකින් යුක්තව හැමසතුන්ටම පෙනෙතසේක, ඒ මෙබඳුයයි බුද්ධවංශය අචින්ත්‍යවනබැවින් කිසිවකුහු විසිනුත් නොදක්ක හැක්ක නොසිතිය හැක්ක, එසේ අචින්ත්‍යවූ මේ බුදුගුණමහිමය මා ඇතුළුවූ හැමසතුන්ටම වාසනාවේවායි.

මෙසේ අචින්ත්‍යවූ රූපවිලාසයක් ඇති මාගේම ස්වාමිදරුවූ බුදුරජානන්වහන්සේ එසේම අචින්ත්‍යවූ දේශනාවිලාසයක්ද ඇති බැවින් බණක් වදාරණකලත් මේ අපගේ පැතිලපැතිල නොවදාරා දසදහසක් සක්වළින් රැස්වූ මෙසා පිරිසෙහි මේ සත්වයා රාගචරිතය ද්වේෂචරිතය යනාදී ක්‍රමයෙන් එකෙකී සත්වයකුගේ සිත සැටතුන් ආකාරයකින් වෙන වෙනම බලා ඇසිල්ලකින් තෝරාදන ඉතා නිපුනව තුඩ නොවකා අනන්තවූ අචින්ත්‍යවූ දේශනාවිලාසශ්‍රීන් යුක්තව බණ වදාරණසේක්මය.

මේ දසදහසක් සක්වල මෙසේ එකම්බුදුන්ගේ බුද්ධශ්‍රීයට අවකාශස්ථාන බැවින් එහි හැමසත්වයෝම අපබුදුරජානන්වහන්සේගේ රූපශ්‍රීප්‍රාතිහාර්යය බලබලා ඇස් සයාගතනොහී ඉතා විස්මයපත්ව සිටිකල දෙවෙනිහිරමඬලක් නැගෙන්නාසේ ලොව විස්මයපත්වීමටම කාරණවූ දෙවනබුදුකෙනෙකුන් මැවූසේක. එසඳ හුණුපුරුකක පූරාලූ රන්සුණුසමූහයක් මෙන් මේ සක්වළතුහරය පුරා ගලා සිටිනා මිනිසුන් හා සියලු දෙව්බඹපිරිස්හු කුල්මත්ව ඔද්වර ගුඩාසමින් අද්භූතිමෙක්ද? අපි එක්බුදුකෙනෙකුන්වහන්සේයදුත් මේ දෙදෙනෙකුන්වහන්සේයයි අහෝ ඉෂමයයි කියමින්ම එකපැහැර තුන්ලෝ වෙවුල්වා සාධුකාර දුන්හ. ඒ නිර්මිතබුදුහු සක්මන්කෙරෙමින් බණ වදාරණසේක්වීනම් අපබුදුහු වැඩහිඳ බණ වදාරණසේක, වැඩහුන් බුදුන් සක්මන්කරණසේක්වීනම් සක්මන්කළ බුදුහු වැඩහිඳිනාසේක, සමහරවිටෙක දෙදෙනාවහන්සේම සක්මන්කරණසේක, සක්මන්දෙකෙළවර සිට අවුත් මැදදී දෙදෙනාවහන්සේම ආදර දක්වා සමවම අවසර හැර සක්මන් දෙකෙළවරට වැඩ නැවතත් දෙදෙනාවහන්සේම ඉදිරියට අභිමුඛවනසේ වැඩ ලංවෙමින් ප්‍රශ්න විචාරණසේක, නිර්මිතබුදුහු විචාල ප්‍රශ්න අපබුදුහු විසර්ජනයකරණසේක,අපබුදුහු විචාළපැණ නිර්මිතබුදුහු විසඳිනාසේක, දෙදෙනාවහන්සේම එක්වැනිව සර්වකාරයෙන් සමානවූ රූපවිලාසයක් ඇතිසේක, එසේම සමානවූ ප්‍රභාවත් ඇතිසේක, සමානවූ බ්‍යාමප්‍රභාමණ්ඩලයක් ඇතිසේක, සමානවූ ගමන් ඇතිසේක, සමානවූ දේශනා ඇතිසේක, සමානවූ කටහඬ ඇතිසේක, මෙසේ හැමලෙසින්ම සමානවූ ඒ බුදුවරයන්

දෙදෙනාවහන්සේ මෙසේ දසදහසක්සක්වළ මුළුල්ලෙහි හැම සතුන්ගේ ඇස් පුරමින් සිත් පුරමින් අචින්ත්‍යවූ අනොපම්‍යවූ බුද්ධශ්‍රී පානාවේලෙහි අප්‍රමාණවූ ප්‍රීතිවේගයෙන් පනපිනා සතුටු සතුටුව බලා බලා සිටි හැම දිව්‍යබ්‍රහ්මමනුෂ්‍යාදීහුම අතිශයින් විස්මයපත්ව අහෝ මේ කුමනවිස්මයෙක්ද?පෙර අපි එකබුදුකෙනෙකුන්වහන්සේගේ බුද්ධශ්‍රිය දකිමින් සිටිකල ඒ හැම බුදු සිරි දක්නට අප අපගේ නෙත් මදවගියහ රූපශ්‍රියම මේ දසදහසක්සක්වළ ඉතිර ගියේය, එසේම එකබුදුකෙනෙකුන්වහන්සේගේ දෙශනා විලාස යද අස අසා සිටිකල ඒ දෙශනාශ්‍රිය අසාගැන්මට අපහැමගේ කන් මදවගියහ ඒ බුදුවරයන්වහන්සේගේ දෙශනාශ්‍රියම ඉතිර්ව සිටියහ, එසේම දුටු දුටු බුදුසිරි සලකණකල අපහැමගේම සිත් මදවගියහ අනන්තවූ බුද්ධමහිමම ඉතිර්ව ගියේය, එසේ ඇති කල දැන් මේ බුදුවරයන් දෙදෙනාවහන්සේගේ බුද්ධශ්‍රිය අපේ අපි කෙසේ දකිමෝද? අනේ අපි කෙසේ අසමෝද? අනේ අපි කෙසේ සිතමෝද? අහෝ අපහැමටත් ඔබසේවූ බුදුබලයම ලදමෝනම් ඒ හැම නොහැකිනමුදු මෙයට වඩා දක්නහැක්ක ඇසියහැක්ක සිතියහැක්ක එසේ නොව නොදතහැකි මේ බුදුවරු දෙදෙනාවහන්සේගේ බුද්ධශ්‍රියෙන්ම මේ හැමතැන පිරීගියේය, එකෙණෙහි සතරරියන් ගබඩාගෙයකට එකවිටම හිරමඩලදෙකක් සඳමඩල දෙකක් වැද ආලෝකව ගියාසේ මේසා දසදහසක් සක්වළ මේ බුදුවරදෙදෙනාවහන්සේගේ අප්‍රමාණවූ බුද්ධශ්‍රියට මේ ප්‍රමාණ නියම ඇති ලෝකශ්‍රිය ඉතා හකුළුව සම්බාධව ගියාය,මෙසේ හකුළුවූ මේ දසදහසක්සක්වළෙහි බුදුවරදෙදෙනෙකුවහන්සේ ප්‍රාතිහාර්‍ය පානාවේලෙහි ලොව කුඩාවූ නියාවටත් බුදුසිරි බොහෝවූ නියාවටත් තරම්වූ සුදුසු උපමාවෙක් අහෝ මාගේ ඇසට නොපෙනෙන්නේය අහෝ මාගේ සිතට නොහැඟෙන්නේය,එතකුදුළුවත් දෙළොස්යොදුන් පමණවූ ගව්‍යණිතින් සතළිස්අටගව් පමණ ඇති එසාම්හත් බ්‍රහ්මරාජයන් දෙදෙණෙකු එක්තැඩපතෙක පෙනී ගියබවමෙනැයි සිතනවගමුත් අනොපම්‍යයි මුල් කීහෙයින් ඒ කියන්නට ද මම නොහැක්කෙමි. මෙසේ අද්භූතවූ ආශ්චර්‍යවූ අසදෘශවූ අප්‍රමාණවූ මෙසේ ලොව එකාහෙලා විස්මයපත්වූ බුදුසිරි ප්‍රාතිහාර්‍යයන් ලොව ඇම දක්වදක්වා ඒ රුවන්සක්මණ සක්මන්කරණවේලෙහි මහත් ශ්‍රැත ඇති සොඩසවිධ ප්‍රඥායෙන් සමන්විත සිව්පිළිසිඹියාවට පැමිණි දම්සෙනෙවි සැරියුත්මහතෙරුන්වහන්සේ තමන්වහන්සේගේ දිවඇසින් සියළු පිරිස බලා සිතනසේක් මේ ඤාතිගන සහිත මහපිරිසෙහි ගම්භිරවූ බුදුගුණ ප්‍රකාශවීමෙන් වන ධර්මදෙශනාවක් පහළවීමට සුදුසුය එහෙයින් මම

මෙයින් පන්සියක්දෙනා හා අදෘශ්‍යමානව සැවහොදුන් තැන් රජගහනුවරට ගොස් ගිජ්ඣකූටපර්වතයෙහි සිට ලොව ඇමට පෙනෙනසේ සෘද්ධිවිකුර්වනය දක්වා එයින් රුවන්සක්මණට ගොස් ආරාධනා කෙරෙමියි සිතාවදුරා එකෙණෙහි නිලකසිනවතුත්ථධ්‍යාන සමාපත්තියට සමවැද මහපිරිසට නොගහවාම පිරිවර පන්සියයක් භික්ෂූන්වහන්සේ හා රජගහවෙහි ගිජ්ඣකූටයට වැඩ එහි සිටි ඒ තමන්පිරිවර කැඳවා ඇවැත්නි මේ සියලු දසදහසක් සක්වළ හැසිර සිටි මහපිරිස පෙනපෙනී බුදුන්කරා ගොස් කථාවක් කරම්හයි කියා ඔවුනොවුන් හා අහසට නැගී එසේ අධිෂ්ඨාන කොට හැමසතුන්ට පෙනිපෙනී රුවන්සක්මණ බලා නික්මුණුසේක. එවිට දසදහසක්සක්වළ සියලු සත්වයෝ සැරියුත්සාමීන් වඩනා ඒ ශ්‍රීවිලාසය දුක එම්බල කොල පළමු එක්බුදුකෙණෙක පසුව දෙබුදුකෙණෙක දුන් බල නවත් බුදුකෙණෙක් එහි ඒ තුන්බුදුන්ගේම බුදුසිර අත්නට ලදුමහයි කියකියා සතුටුව බලනකල පස්සෙහි වඩනා පන්සියක්දෙනාවහන්සේ දුක අනේ බල දෙනුත්බුදුකෙණෙකුත්වහන්සේලා නොවෙයි පන්සියක් බුදුවරයන්වහන්සේලාය තෙල අර ගැණහනුපයි කියකියා සතුටුසතුටුව සිටිද්දීම මහත්වූ ප්‍රාතිහාර්‍ය්‍ය දක්වදක්වා පන්සියක් රහතුන් පිරිවරාගෙණ රුවන්සක්මණ සොළවරට වැඩ චක්‍රවර්ත්තිරජක්හු සමීපයට පැමිණි ප්‍රධානපුත්‍රරුවණක්සේ මහත් ආදර දක්ව දක්වා අප්‍රමාණවූ සන්තොෂයෙන් බුදුන් වැඳවැඳ අහස්හි වොරජනා හිරමඩලසේ බුදුන්ගේ ශ්‍රීමුඛමණ්ඩලය බලබලා සිට:—

සාරිපුත්තො මහාපඤ්ඤො සමාධිජ්ඣානකොවිදො
ගිජ්ඣකූටෙ ඨිතොයෙව පස්සති ලොකනායකං.

සුඵුල්ලං සාලරාජංව චන්දංව ගගනෙ යථා
මජ්ඣන්තිකෙ ච සූර්‍යමිව ඔලොකෙති නරාසභං-යි.

යනාදී මහාසම්පිණ්ඩිනිදානයෙහි ආ ක්‍රමයෙන් බුදුන්කරා පැමිණි ඒ මාගේ හිමි සැරියුත්මහතෙරුන්වහන්සේ දෙහොත් මුදුනෙහි තබාගෙණ සියලු සතුන්ට පෙනිපෙනී ඒ හැමට ඇසෙනසේ මෙසේ ආරාධනාකළසේක. ඒ කෙසේදයත්?

කීදිසො තෙ මහාවීර අභිනීහාරො නරුත්තම
කම්හි කාලෙ තයා ධීර පත්ථිතා බොධිමුත්තමං—යි.

යත මේ ගාථාව වදාරා ස්වාමිදරුවූ ලොවුතුරා බුදුරජානන්වහන්ස මේ දසදහසක්සක්වළ මුළුල්ලෙහි තුඹවහන්සේගේ මේ සියලු බුද්ධශ්‍රී පැතිර ඉතිරගිය්‍ය මෙබඳුවූ බුදුසිරි ලැබීමට කවර

කාලෙක කවර බුදුකෙනෙකුන් දැක කවරතරම් පින්කමක් කොට කොසේවූ ප්‍රාර්ථනාවක් කළසේක්ද ඒ මට විශෙෂයෙන් වදාළමැනා වැයි කියා බුද්ධවංශදෙශනාවට ආරාධනාකළසේක. එකල්හි මාගේ ස්වාමිදරුවූ බුදුරජානන්වහන්සේ අසව ශාරිපුත්‍රස්ථවිරයයි වදාරා මෙහි යට කියනලද ක්‍රමයෙන් අෂ්ටධර්මසමොධානයෙන් යෙදී ප්‍රථමාභිනීහාරය කළතැන් පටන් ගෙණ තමන්වහන්සේගේ පූර්වචරිතයවූ අපදානය සූවිසිව්‍යාඛ්‍යානයකට පමුණුවා ත්‍රිවිධකල්‍යාණකොට අෂ්ටාඞ්ගසමුපෙත බ්‍රහ්මස්වරයෙන් දෙශනාකරණසේක් මෙසේ ශාරිපුත්‍රස්ථවිරය මේ ලොව්තුරාබුදුබව නම් එසේ මෙසේ සාධාගතහැකි සම්පත්තියෙක් නොවෙයි යම්සේ ලක්ෂගණන් මහගංගාජලය මහමුහුදට හැමවේලෙහිම වැදීමෙන් ඒ මුහුද උතුරුවා නොසේද කල්පයක් මුළුල්ලෙහි වස්නා වර්ෂාජලයෙන්වත් යම්සේ මුහුද පූරවාලිම නොහැකිවේද එසේම මේ ලොව්තුරා බුදුබවටද කෙතෙක් කුශලසම්භාරයන් රැස්කළත් පාරමිතාවන්ගේ අග් පැමිණීම නොහැකිමය පාරමිතාවන් වඩවඩා පිරූසේ බුද්ධශ්‍රීයාවත් වැඩිවැඩිම ඵල දෙන්නෝමය—එහි විභාග මඞ්ගලාදී බුදුවරයන්ගේ චරිතාපදානබුද්ධශ්‍රීය ඇසීමෙන් දතයුතු.

මෙසේ ප්‍රථමාභිනීහාරයෙහි පටන් ලොව පහළවූ සියලු බුදුවරයන් නොවරදවාම දැක මාගේ ධන පමණකින් ඒ ඒ බුදුවරයන්ට පූජාකිරීමෙන් සමත්‍රිංශත්පාරමිධර්මයන්ගේ කොටිප්‍රාප්තව ලොව්තුරාබුදුවීමෙන් දැන් මේ සියලු ලොවට අග්‍රව ධ්‍යානසුව විඳිනෙමියි යනාදීන් තමන්වහන්සේගේ පූර්වචරිතාපදාන සංඛ්‍යාත බුද්ධවංශය විසිතුරුවූ ගාථා දහසකින් ප්‍රතිමණ්ඩිතකොට ගෙණහැර නිමවා දක්වාවදාළසේක. මේ බුද්ධවංශදෙශනාවගේ කෙළවර අසංඛ්‍යයක් දෙවියෝ සෝවාන්ඵලයෙහි පිහිටියාහුය, අසංඛ්‍යයක් දෙවියෝ සකෘදාගාමිඵලයෙහි පිහිටියාහුය, අසංඛ්‍යයක් දෙවියෝ අනාගාමිඵලයෙහි පිහිටියාහුය, කෙළලක්ෂයක් දිව්‍යබ්‍රහ්මයෝ සතරවන අර්හත්මාර්ගයෙන් නිවන්පුර වැද සියලු සසරදුකින් මිදීගියාහුය.

මෙසේ අපබුදුරජානන්වහන්සේ තුන්අසංඛ්‍යයක් දෙවියන් හා කෙළලක්ෂයක් පමණ දිව්‍යබ්‍රහ්මයන් නිවන්පුර පමුණුවා බුද්ධවංශය නිමවාවදාළකල්හි දම්සෙනෙවි සැරියුත්මහතෙරුන්වහන්සේ පරසිත් දක්නානුවණින් දෙවතාවන්ගේ ධර්මශ්‍රවණලොභය තව නොසිඳුනේයයි දැකවදාරා සුරක්තචීවරය එකාංශකොට පෙරවගෙණ මහත් ආදරගෞරව දක්ව දක්වා පියවර ඔසව ඔසවා ඉදිරියට ගොස් බුදුරජානන්වහන්සේට මදක් ලංව නමනාහුතව දෙහොත් මුදුනෙහි තබාගෙණ දන්වනසේක් මාගේ ස්වාමිදරුවූ

බුදුරජාණන්වහන්ස තුඹවහන්සේගේ මේ විශෙෂවූ දෙශනාව අසා මාගේද සියලු සතුන්ගේද ශංකාවෝ දුරුවගියහ දූන් ඒ දෙශනායෙහි ඇතුලත්කොට මාගේ ස්වාමිදරුවූ තුඹවහන්සේවිසින්ම මෙම කප මතු මෛත්‍රී නම් බුදුවරකෙණෙක් උපදනාසේකැයි වදාරණලද ඒ මෛත්‍රීබුදුරජාණන්වහන්සේ කවර කලෙක උපදනාසේක්ද? කෙසේවූ බුද්ධශ්‍රීන් ඇතිසේක්ද? ඒ විශෙෂයෙන් අසනුකැමැත්තෙමි එසේහෙයින් ස්වාමිදරුවූ බුදුරජාණන්වහන්ස මේ හැම දෙව්බ්‍රහ්මපිරිස්මධ්‍යයෙහි ඒ කාරණය ප්‍රකාශකොට වදාළමැනවැයි ආරාධනාකළසේක.

කීයේ මැනෝ—:

සාරිපුත්තො මහාපඤ්ඤො උපතිස්සො විනායකො
ධම්මසෙනාපතී ධීරො උපෙච්චා ලොකනායකං—

අනාගතං ජිනාරම්භං අපුච්ඡි කඞ්ඛමත්තනො
තුය්හානන්තරිකො ධීරො බුද්ධො කීදිසකො භවෙ
විත්ථාරෙනෙව'හං සොතුං ඉච්ඡාමාචික්ඛ චක්ඛුම—

මෙසේ ධර්මසෙනෙවි සැරියුත්මහතෙරුන්වහන්සේ විසින් ආරාධිතවූ බුදුරජාණන්වහන්සේ වර්ෂාවක්පට වරුෂාවක් වස්නාසේ අනාගතවංශදෙශනාවට පටන්ගෙණ වදාරණසේක් ශාරිපුත්‍රය චිරය මේ මාගේ කරුණාශාසනය මා නැති පන්දහසක්හවුරුදු නොනැසී පවත්නේය එයින් මත්තෙහි ලොව අබුද්ධොත්පාදවන්නේය එකල්හි සත්වයන්ගේ ආයුෂය අකුශලයන්ගේ වැඩීමෙන් ක්‍රමක්‍රමයෙන් පිරිහීගොස් දශඅවුරුද්දකට පමණ ආයුෂය ඇතිවෙයි එකල ලොව මිනිස්සු තිරිසනුන් වැනියහ මවුපියයි දූන කරණ ලොකචාරිත්‍රය පමණක්වත් නොකරන්නාහ එහෙයින් මේ නැගණියෝය බුහුහානියෝය මයිලනුවෝය බෑණනුවෝය පුතනුවෝය දියනියෝය යනාදී ව්‍යවහාර නැතිව තමන්තමන්කෙරෙහිම ප්‍රෙම කෙරෙති පස්මැසිකුමරුවන්ට පස්මැසිකුමරියන් සරණපාවා දෙති සියලු රසයම අන්තර්ධානවෙයි හැල්වී අන්තර්ධානවෙයි වරාසාලේබත් රජදරුවන්ට අග්‍රභොජනවෙයි.

මෙසේ ලොව්, සියලු දෙයින් හීනවූකල ත්‍රිවිධ අන්තඃකල්පයන් අතුරෙන් දූන් සත්වයන්ගේ වෙෂය උත්සන්නවීම හෙතුකොට ගෙණ සත්‍රාන්තරනම් කල්පවිනාසයෙන් ලෝකවිනාසය වෙයි-එහි අන්තඃකල්පවිභාගය හා මහාකල්පවිභාගය කුශලඵලභූමිපරිච්ඡෙදයෙහි එක්තිස්තලවිභාගය දක්වන තැන මතු ප්‍රකාශවන්නේය, එය විස්තරාර්ථීන්විසින් එයින් බලා දතයුතු.

මෙසේ අකුශලයන්ගේ බහුලවීමෙන්ම ලොව විනාසවන කල්‍ප මහාසංවර්ත්‍යයි යන ලෝකසන්ධියක් සියලු ලොකවාසීන්ට පෙනී පවු කිරීමෙහි ආදීනව දැක කලකිරී භයපත්ව ඉතිරිව සිටි මනුෂ්‍යයෝ ප්‍රාණඝාතයෙහි දොෂ සලකා මහත් කරුණා උපදවා අපි ජීවත්වූ ගණන ඔවුනොවුන්ගේ ආත්මරක්‍ෂාවෙහි අප්‍රමාදවම්හයි කතිකාකොට ඔවුනොවුන් කෙරෙහි මෛත්‍රී ඇතිව ඒ හැම මෙතැන්පටන් අපි ප්‍රාණඝාත නොකරම්හයි නියා පළමුකොටම ප්‍රාණඝාතඅකුශලයෙන්ම දුරුවෙති, ඒ කුශලබලයෙන් ඔවුන් නිසා උපදනා දරුවන්ට විසිහවුරුද්දකට ආයුෂය ඇතිවෙයි— ඔහු දෙවැනව අදත්තාදානඅකුශලයෙන් දුරුවෙති, ඔවුන් නිසා උපදනා දරුවන්ට තිස්හවුරුද්දකට ආයුෂය ඇතිවෙයි— තුන්වැනිව පරදාර අකුශලයෙන් දුරුවෙති, ඔවුන් නිසා උපදනා දරුවන්ට සතළිස්හවුරුද්දකට ආයුෂය ඇතිවෙයි—සතරවැනිව මුසාවාදඅකුශලයෙන් දුරුවෙති, ඔවුන් නිසා උපදනා දරුවන්ට පණස්හවුරුද්දකට ආයුෂය ඇතිවෙයි—පස්වැනිව පිසුණවාචඅකුශලයෙන් දුරුවෙති, ඔවුන් නිසා උපදනා දරුවන්ට සැටහවුරුද්දකට ආයුෂය ඇතිවෙයි—මේ ආදී ක්‍රමයෙන් දශවිධවූ අකුශලධර්මයන්කෙරෙන් දුරුව දශවිධවූ කුශලධර්මයෙහි පිහිටන්නාහුය, ඒ කුශලධර්මයන්ගේම ආනුභාවයෙන් ක්‍රමක්‍රමයෙන්ම ආයුෂය වැඩිවැඩී ගොස් දෙසියයක් හවුරුද්දට ආයුෂය ඇතිවූකල්හි මේ දඹදිව ඉතා රමණීයවූ සම්බාධසම්පන්න බරණැස්නුවර නම පෙරලී එම නමින්ම ප්‍රසිද්ධ වෙයි, එයින් මත්තෙහිදු එසේම වඩවඩාම කුශලධර්මයන්ගේ සමාදානයෙන්ම ආයුෂය වැඩී ගොස් අනූදහසක් හවුරුද්දට ආයුෂ ඇතිවූකල්හි බරණැස්නුවර නම් පෙරලී දිගින් පුළුලින් යොදුන් පමණවූ උත්පල නම් නුවරෙක් වෙයි—එයින් මත්තෙහිදු එසේම ආයුෂය වැඩීලක්‍ෂයක් හවුරුද්දට ආයුෂයඇතිවූකල්හි එම නාමය පෙරලී අයම්විත්ථාරින් සත්යොදුන් පමණවූ පදුම නම් නුවරෙක් වෙයි-එයින් මත්තෙහිදු එසේම ආයුෂය වැඩී අසංඛ්‍යයකට ආයු ඇතිවූකල එම නාමය පෙරලී දෙළොස්යොදුන් පමණවූ මනාදූර නම් නුවරෙක් වෙයි-ඒ කාලයෙහි මිනිස්ලොව දෙව්ලොවටත් වැඩිතරම් ආයුසම්පත් ඇත්තේය, එහෙයින් උපන්කල් නොදනිති මියනකල් නොදනිති ජරාවිලිප්ලිනැත රොගාන්තරාය නැත, මෙසේ සුව විඳීම හෙතුකොටගෙණ දුක් නම් කෙසේ බවත් නොදන සත්වයෝ කුසල් කිරීමෙහි ප්‍රමාදවෙති, ඒ අකුශලයෙන් ආයු පරිහීමට පැමිණ අසංඛ්‍යයෙහි පටන් ක්‍රමක්‍රමයෙන් පිරිහීගොස් අසූදහසක්හවුරුද්දට ආයුෂය ඇතිවෙයි, එකාලට මනාදූර නාම් නුවරෙනි නම පෙරලී කෙතුමතී නම් රාජධානියෙක් වෙයි.

විදූලේ මැනෝ:—

තදා කෙතුමතී නාම රාජධානී භවිස්සති
ද්වාදසයොජනායාම සත්තයොජනවිත්ථතා—යි.

තවද යනාදී ක්‍රමයෙන් වදාරණසේක් ශාරිපුත්‍රස්ථවිරය ඒ කෙතුමතී නම් නුවර අගින් දෙලොස්යොදුන පළලින් සත්යොදුන අවටින් අවතිස්යොදුන් පමණ වන්නේය, එනුවර වටා සිටි පොළොව පලා පැනනැගී සත්රුවන්පවුරු සතකින් රුදූවල් දෙක වෙනසක් නොව ආලෝක පැතිර දිලිහිදිලිහී සිටින්නේය, එහි අතර තුරෙහි රිදීමයවූ කඳ ඇති ඉන්ද්‍රනීලමාණික්‍යමයවූ පත්‍ර ඇති සත රන්මයවූ ඵලඇති තල්රුක්පෙළවල් සතකින් අලංකෘතවීය, සතරදිශාවෙහි සත්රුවන්වාසල් සතරක් මැවී සත්සත්මහල් ඇතිව ද්වාරු වෙනසක් නොදක්වා බබලන්නාහුය, ඒ වාසල් සතරෙහි පොළොව පලා පැනනැගී කප්රුක් සතරෙක් ඇත්තේය, එහි අනේකප්‍රකාර විසිතුරු සම්පත්තීන් සැදී සිටි ඒ කප්රුක් අතුරෙන් එක්කප්රුකකින් මුළුදඹදිව වැසියන් තමතමන් කැමතිපරිද්දෙන් වස්ත්‍රාභරණාදි සම්පත් ඒ අසූදහසක් අවුරුදු මුළුල්ලෙහිත් ඇද නිම වාගත නොහැක්කේය.

තවද එනුවර මැද පැනනැගී සත්රුවන්මයවූ ශාලාවකුදු ඇත්තේය, ඒ ශාලාව සතරදිගද මහාකප්රුක් සතරෙක් මැවී තිබෙන්නේය, ඒ කෙතුමතී නම් නුවර අඩුපත්ආදියෙන් කළ ගෙයක වසන එකද සත්වයකුත් නැත්තේය, හැමදෙනම රන්රිදීමුතුමැණික්වෛදූර්‍යවජ්‍රප්‍රවාළසඞ්ඛ්‍යාතවූ සත්රුවන්මය ගෙවලම වාසයකරන්නාහුය, දිව්‍යමයවූ උයන්පොකුණුආදියෙන් සමලංකෘතය, එකලට එසා දඹදිව මුළුල්ලෙහි සියලු මිනිසුන්කෙරෙන් සාගතකෙණෙක් වපුරණකෙණෙක් වෙළඳාම් නවාම් කරණකෙණෙක්වත් බඩනිසා දුක්ගන්නා වෙහෙසෙන එකද මිනිසෙකුත් නැත්තේය, පොළොව පලාගෙණ සව්යඤ්ජනවූ රත්හැල් පැනනැගී කරල්වල කුඩුදසවෙයන නැතිව මුතුදැල්සේ සහල් ගෙණ තිබෙයි, එකබිජුවටක් හුණුහැනින් නැගී පඳුරෙන් කරල්කඩා මැඩගත්කල දෙදහස්දෙසියදෙසැත්තෑගැලක්පුරා දහසාමුණු අටලාස්සක් සාල් ඉතිරීව තිබෙයි, ඒ සාල් මැණික්බඳනෙහි ලා මැණික් උඳුනෙහිම පැසවා හැම සත්වයෝම අනුභවකෙරෙති, ඒ හැම මලමූත්‍ර පහකරම්හයි සිතූඇසිල්ලෙහි නිල්වලාකඩෙක් දිවගණ අඩින් තිරයක්සේ සිසාරා වටව සිටගණී, එකෙණෙහි පොළොව පැළි මහවලෙක් මැවීයෙයි, එහි ශරීරකිස පැවැත්වූකල වල අන්තර්ධානව පැන්පොකුණෙක් මැවීයෙයි, එයින් උදකකෘත්‍යයත් කළකල වටව තුබූ වලාකඩ අන්තර්ධානවෙයි, එසමයෙහි ඒ කෙතුමතීනම් නුවර මෙසේ දිව්‍යපුරයක්සේ සමෘද්ධවන්නේය.

තවද ඒ ශාරීපුත්‍රාචාර්ය්‍යය පෙර බවදඬුකර්මයෙන් ජීවත්ව සිටි
අඹුල්දණ්ඩන් ගෙයක් නංගා වස්වසවා පින් කළාවූ කුළුපොතු
දෙපුතුජයන් අතුරෙන් පූනාහුවෝ මාගේ ශාසනයෙහි භද්‍රියනම්
සිටුව නිවන් දකිති, පියානෝ තමන් කළ පින් මූකලහෙයින් මේ
බුද්ධාන්තරය මුළුල්ලෙහි සදෙව්ලොව සැරිසරා ඇවිද එකල ඒ
කෙතුමතීනම් නුවර සඞ්ඛනම් චක්‍රවර්ත්තිරජව උපදනේය, ඒ රජ
පෙරකළ ආවාසදානයාගේ කුශලයෙන් පෙර මහාපනාද රජ්ජුරු
වන් අසඞ්ඛ්‍යයක් හවුරුදු මුළුල්ලෙහි රාජ්‍යය කළ පස්විසියොදුන්
උසඇති සියක් මහල් ඇති අසූසාරදහසක් රුවන්ගබඩාඇති ඉන්ද්‍ර
නීලමාණික්‍යමය බිම් ඇති සතරත්‍යවූ වැම් ඇති රිදීමයවූ කො
තුරු හා ජේකඩ ඇති ප්‍රවාලමයවූ චන්ද්‍රසූර්ය්‍යකාන්ති ඇති රන්මයවූ පල
සෙවෙනි ඇති පස්විසියොදුන් පමණවූ ඒ රත්නමය ප්‍රාසාදය ආකා
ශයට පැන නැගී දෙවන සඳමඬලක්සේ දිලිහි දිලිහී අවුත් නුවර
මැද පිහිටායෙයි, එකල්හි එම පින්බෙලෙන් ඒ රජහට චක්‍රරත්නය
මාණික්‍යරත්නය හස්තිරත්නය අශ්වරත්නය පරිනායකරත්නය
ගෘහපතිරත්නය ස්ත්‍රීරත්නයයි යන සත්රුවන්හුදු පහළවෙයි, ඒ
රජහට තමා හා සම්බලඇති පුත්‍රයන් දහසක් ඇතිවෙයි, අහසින්
යන මහත් සෘද්ධි ඇතිවෙයි, ශරීරයෙන් සඳුන්සුවඳ හමයි, මුඛයෙන්
මහනෙල්මල්සුවඳ පැතිරෙයි, දෙවියෝ සතරදෙනෙක් සතරදිග
කඩුගත් අත් ඇතිව රැකවල්ගෙණ සිටිති, සතිස්යොදනක
පැතිර පවත්නා මහපිරිස ගෙණ සතරමහද්වීපයෙහි එකද ඇවිද
ඒ සියලු සතුන්ට පන්සිල් රකුවයි යනාදීන් අවවාද කියාලා දවල්
බතට තමන් වසන නුවරටම එන්නේය.

මෙසේම සඞ්ඛනම් චක්‍රවර්ත්තිරජ අඹුල්දඬු බටදඬු ගෙණ ගෙය
නංගා දානයෙන් වසා කළ ඒ ගෙයි කුශලානුභාවයෙන් එසා
මහත් ප්‍රාසාදයෙක් ලැබෙයි, ඒ ගෙයි සැදූ ඇඳෙහි ඵණින් අසූසා
රදහසක් යහන් ලැබෙයි, එක ඇතිරිලියෙහි පිණින් අසූසාරදහ
සක්වසිතුරු ආභරණ ලැබෙයි, බැලමෙහෙකොට දුන් ආහාරදාන
යෙහි ඵණින් උදය සවස එකසැලෙක දසදෙනාට සෑහෙන පම
ණ බත් බැගින් අසූසාරදහසක් අසූසාරදහසක් සැළපුරා දිව්‍ය
භොජන ලැබෙයි, ඒ ලැගුම්ගෙයි තැබූ පුටුවෙහි පිණින් අසූසාර
දහසක් සිංහාසන ලැබෙයි, මේසේ සඞ්ඛනම් එකල සමසිතින්
දන්පිදූ ස්ත්‍රිය ප්‍රධානකොට අසූසාරදහසක් බිසෝවරුන් පිරිවරයි,
පන්සලවටා වැට කළ පිණින් නුවරවටා සත්රුවන්පවුරු සතක්
ලැබෙයි, ඒ මෙහෙවරට ගිඳුවූ ඒ තල්පෙලෙහි අනුසසින් සත්රු
වන්මයවූ තල්ගස් නුවර සිසාරා සිටි සත්වලල්ලකින් සොභමාන
විය, ඒ පන්සලෙහි සත්වරෙක වස්වැසවූ පිණින් රත්රුවන්

ලැබෙයි, වස්අන්තයෙහි නොවරදවා දුන් වස්වාසිකසිවුරුපිළියෙහි ඵලින් එසා මහත් කප්රුක් ලැබෙයි, මෙසේ ඒ සඞ්ඛ නම් චක්‍රවර්ත්තිරජ එකල කේතුමතී නම් නුවර ශක්‍රදෙවේන්‍ද්‍රයාසේ අප්‍රමාණවූ මනුෂ්‍යසුව විඳිනේය.

වදාළේ මැනෝ:—

සඞ්ඛො නාම සො රාජා අනන්තබලවාහනො
සත්තරතනසම්පන්නො චක්කවත්ති මහබ්බලො—යි.

යනාදීන් සඞ්ඛ නම් චක්‍රවර්ත්තිරජ්ජුරුවන්ගේ කුශලවිශේෂය මෙසේ සංක්ෂෙපයෙන් වදාරා,

තවද ශාරිපුත්‍රස්ථවිරය ඒ මෛත්‍රී නම් බුදුහු පෙර මුහුන්ත නම් බුදුකෙණකුන් සමයෙහි ප්‍රභාවන්ත නම් චක්‍රවර්ත්තිරජව මාසේම අෂ්ටාඞ්ගධර්මයෙන් යෙදී ප්‍රර්ථනාභිනිර්හාරය ලදින් එතැන්පටන් සොළසාසඞ්ඛ්‍යකල්පලක්ෂයක් පාරමිධර්මයන් පුරා වේ දැනුරෙහි ලොව පහළවූ බුදුහු දහසක්දෙනාවහන්සේ අතින් විවරණ ලදින් සොළවර වෛසන්තරාත්මව තුසීපුරයෙහි ඉපද එසමයෙහි එසේ දිවසිරි විඳිමින් සිට දසදහසක් සක්වළ දිව්‍යබ්‍රහ්මයන්ගේ ආරාධනාව ඉවසා පස්මහබැලුම් බලා බ්‍රාහ්මණවංශය උතුම්සේ දැක ඒ කේතුමතී නම් නුවර සඞ්ඛ නම් චක්‍රවර්ත්තිරජ්ජුරුවන්ට අග්‍රපුරෝහිතවූ සුබ්‍රහ්ම නම් බ්‍රාහ්මණමහාසාරයන්ගේ බ්‍රහ්මවතී නම් බැමිණි දෙවීන් කුසප්‍රළිසිඳ දසම්ස පුරාවැස දසදහසක්සක්වළ දෙව්බඹුන් මධ්‍යයෙහි ශ්‍රෙමත්‍රුප්ඩස්සේ මහාබ්‍රහ්මයා අතට බිහිව අජිත නම් කුමාරව තරුපිරිවැරූ සඳසේ ක්‍රමයෙන් වැඩී දෙලොස් දෙලොස්ගවු උස ඇති වර්ධමානකය සිද්ධාර්ථය චන්‍ද්‍රකාන්ති යන සත්රුවන්මයවූ තුන් සෘතුවටම නිසිසේ වෙනවෙනම තුන්පායෙක් ඇතිවෙයි, එකිඑකී ප්‍රාසාදයෙක්හි සත්සත්මහල, එකිඑකී මහලෙක්හි ලක්ෂයක් ලක්ෂයක් කුළුගෙවල් ඇත්තේය, එකිඑකී පාය වට සත්සත් රුවන්පවුරුය, එසේම රුවන්මය සත්සත් වාසලය, ඒ තුන්පායෙහිම පඤ්චාඞ්ගිකතූර්‍යනාද පවත්නා රන්රසුදැල් එල්වා තිබෙයි, මුදුනෙහි සත්රුවන්මයවූ ධජ නගා තිබෙයි ඒ ධජකකුල්වල බඳනාලද රන්මිණි ඝොසාවෙන් නුවර එකනින් නාදවෙයි, ඒ ප්‍රාසාදයන් තුන්දෙනාගේ භිත්තිවල සත්රුවන්මයවූ තාලපඞ්ක්තිය මකරපඞ්ක්තිය සිංහපඞ්ක්තිය ව්‍යාඝ්‍රපඞ්ක්තිය හස්තිපඞ්ක්තිය අශ්වපඞ්ක්තිය රථපඞ්ක්තිය මයුරපඞ්ක්තිය හංසපඞ්ක්තිය යනාදිවූ නිර්මිතකර්මාන්තයෙන් ඉතා ශොභාමත්ව බබලන්නේය, දවස්පතා මල්වැසි වස්නේය, එකිඑකී මාලයෙක සත්සියයක් සත්සියයක් රුවන්ගබඩාගෙවලය, සත්සියයක් සත්සියයක් සිංහාසනය, සත්සියයක් සත්සියයක් සේසත්

ය, සත්සියයක් සත්සියයක් යහන්ය, එකිඑකී පායවට ඡද්දන්ත නම් හස්තිරාජයා ප්‍රමුඛවූ සත්දහසක් සත්දහසක් මඞ්ගලහස්තීහු සරහා සිටිති, වලාහකඅශ්වරාජයා ප්‍රමුඛවූ සත්දහසක් සත්දහසක් අශ්වයෝද සරහා සිටිති, සත්රුවන්ධජ නැගූ හිරුමඬල සඳමඬල වැනිවූ සත්සියයක් සත්සියයක් රථපඞ්ක්ති සරහා තිබෙයි, එකිඑකී මාලෙහි සත්දහසක් සත්දහසක් නාටකස්ත්‍රීහු සැරහී සිටිති, මෙසේ මහත්වූ ශ්‍රීවිභූතීන් යුත් තුන්සෘතුවට සුදුසුවූ ඒ තුන්පායෙහි මෙම ත්‍රිබෝසතානෝ වාසය කෙරෙති, සඞ්ඛ නම් චක්‍රවර්ත්තිරජ ආදිවූ දඹදිව අසූසාරදහසක් රජදරුවෝ මගුල්කඩු ගෙණ බෝසතුන් කරා අවුදින් ඒ හැමදෙනාම හිමි තුඹ සේවය කරලිහයි කියති, එවිට බෝසතානෝ මාගේ පඬිත් බෙහෙව තොප තොපගේම රාජ්‍යශ්‍රී විඳුවයි කියා යවන්නාහුය, බෝසතානන් කැටිව දෙව්ලොවින් අවුදින් එකද උපන් අටලොස්කෙළක් පමණ ඇමතියෝ නිරන්තරයෙන්ම ඒබෝසතුන්ට අරග්ගෙණ සිටිති. මෙසේ ඒ අජිතනම් මෛත්‍රිබෝසතානෝ බුදුවුබයකිහුත් කියා නිමවාගත නොහැකි මහත්වූ ශ්‍රීසම්පත් විඳ අටදහසක් හවුරුදු ගිහිගෙයි වැස දෙවියන්විසින් දක්වූ තුන්පූර්වනිමිති දක්මෙන් සසර කලකිරී සතරවැනිව දක්වූ පැවිදිවෙසක් දුක මහණවනු කැමතිව චන්ද්‍රමුඛීනම් අගබිසවූ බ්‍රහ්මවර්ධන නම් පුත්රුවන වැදූද මහණවෙමි සිතා එකෙණෙහිම එම රන්පායෙහිම පලක් බැඳ මතුමහල්තලෙහි හිඳ සත්දවසක් දුෂ්කරක්‍රියා පූරණතුරු සඞ්ඛ නාම චක්‍රවර්ත්තිරජ්ජුරුවෝ අසූසාරදහසක් රජ්ජුන් හා අසූසාරදහසක් බිසෝවරුන් පිරිවරා පූජාභාණ්ඩ ගෙණ බෝසතානන් වැඩහුන් ප්‍රාසාදය සිසාරා ඒ සත්දවසම අරග්ගෙණ සිටිනාහුය, එසේම දසදහසක් සක්වළ දෙවියෝද දිව්‍යපූජාභාණ්ඩ ගෙණ අහස්කුස් පුරා සිටිනාහුය, මෙසේ සද්දවසක් දුෂ්කරක්‍රියා පුරා කිසිකෙණෙකුන් හා මුවෙන් නොබැණ කිසිකෙණෙකුන්ගේ මුහුණ නොබලා දවස් යවා හැම බුදුන් බුදුවන වෙසක්මස මැදිපොහෝද මහාබිණික්මන් කෙරෙමි සිතූක්ෂණයෙහි ඒ රන්පාය සත්පවුරු සත්දොරටු පිරිවරා සිටි මහසෙනග හා සමගින්ම ආකාශයට පැනනැගී බෝමැඩදිසාවට නික්මෙයි, කැටිව මහණවනු කැමති සියලු මනුෂ්‍යයෝම සිටිසිටි පලින් අහසට පැනනැගී පියුම්විලකට දුවනා රාජහංසපෙළක්සේ යෙති, මෙසේ මහත්වූ පූණ්‍යප්‍රභාවයෙන් ගොස් ඒ රන්පාය මහසෙනග හා බෝසතුන් ගෙණ බෝමැඩකරා බසී, එකෙණෙහි මගුල්කඩුව විදුලියපතක්සේ හයා කෙස්වැටිය කපා අහසට දමා මහබඹු දුන් සිවුරුපිරිකර පිළිගෙණ මහණවනසේක.

තවද මේ බුද්ධොත්පාදයෙහි පින් කොට ප්‍රාර්ථනාකළාවූ ස්ත්‍රීපුරුෂයෝ බොහෝදෙන එම්විටම මහණවන්නාහුයි, චතුර්වේදයෙහි නිපුනවූ බ්‍රාහ්මණයෝ අසූසාරදහසක් එකවිට මහණවෙති, මේ ශාසනයෙහි පින් කළ ඉසිදත්තය පුරාණයයි යන දෙබෑකෙණෙක් අසූසාරදහසක් අසූසාරදහසක් පිරිස් ගෙණ මහණවෙති, තවද ජිතමිත්‍රය විජිතයයි යන මහාපණ්ඩිතවරු දෙදෙනෙක් අසූසාරදහසක් අසූසාරදහසක් පිරිස් ගෙණ මහණවෙති, තවද මේ ශාසනයෙහි පින්කළ සිද්ධාර්ථනම් සිටානකෙණෙකුන්හා සුධනානම් සිටුදියනිකෙණෙක් අසූසාරදහසක් අසූසාරදහසක් පුරුෂස්ත්‍රීන් හා මහණවෙති, තවද මේ ශාසනයෙහිම පින්කළ සඞ්ඝනම් උපාසකකෙණෙකුන් හා සඞ්ඝානම් උපාසිකාකෙණෙක් අසූසාරදහසක් අසූසාරදහසක් පුරුෂස්ත්‍රීන් හා සමග මහණවෙති, තවද මේ ශාසනයෙහි යසවත්ය විසාඛාය යන යෙහෙලියෝ දෙදෙණෙක් අසූසාරදහසක් අසූසාරදහසක් ස්ත්‍රීන්හා මහණවෙති, අවශෙෂවූ රජබමුණුවෙළඳගොවිත්ගෙන් නොයෙක් ලක්‍ෂගණන් එමදුම මහණවෙති,

ඉක්බිත්තෙන් බෝධිසත්වයෝ මහණව ලා එම චන්‍ද්‍රවුඩිනම් අග්‍රදෙවින් දුන් කිරිපිඩු වළඳා එමදා සවස අපරාජිතස්ථානයෙහි පැන නැගී විදුරසුන් නැගී නාගශ්‍රීබොධියට පිටලා වැඩහිඳිනාසේක.

ඒ නාගබෝධියනම් රිදීකඳක්සේ සම්ව වටවූ කඳ එක්සියවිසිරියන් උසය, පඤ්චමහාසාඛාවෝද එක්සියවිසිරියන් එක්සියවිසිරියන් උසය, මුලපටන් අග දක්වා දෙසියසතළිස්රියන් උසය, පූර්වසාඛාග්‍රයෙහි පටන් පශ්චිමසාඛාග්‍රය දක්වා දෙසියසතළිස්රියන, උත්තරසාඛාග්‍රයෙහි පටන් දක්‍ෂිණසාඛාග්‍රයට දෙසියසතළිස්රියන, සාඛාමණ්ඩලය වටින් සත්සියවිසිරියනය, ඉන්ද්‍රනිලමාණික්‍යමය ඡත්‍රයක්සේ හැමදුම ශොභාමත තිබෙයි, හැමදුම ඒ රුකෙන් වියලී ක්‍ෂයව වැග්රෙන පත්‍රයකුදු නැත, පඬෙරපැහැවත් පතකුදු නැත, මුහුකලපත් ඉන්ද්‍රනීලමාණික්‍යමයය, තවද අඞ්ගුඅස්සෙහි ලිය හා අඞ්කුරප්‍රවාලමයය, එසෙණෙහිම ඒ නාගශ්‍රීබෝධිය මුලපටන් අග දක්වා මලින් සැදී සිටියේය, දිය දෙළොස්නැළියක් ගන්නා පමණ කැකුලු වෙයි, පිපිමල් මහගැල්සක් පමණ වෙයි, එකිඑකී මලෙක්හි නැළියක් පමණ රේණු වෙයි, ඒ බුදුවනදා පිපිමල් අසූදහසක්හවුරුදු පරනොවී තිබී ඒ බුදුන්ගේ පරිනෙර්වාණය හා සමගම හැමමල් පරව නටුවෙන් ගිලිහී පෙත්තකුත් බිම නොවැටී ආකාශයෙන් ගොස් දරසැයෙහි වැගිර බුදුන් හා සමග ආදහන වෙයි.

තවද ඒ බෝමැඩ සිසාරා වටින් දෙගවු දෙගවු පමණ තැන සත් රුවන් වැලි තැනී තිබෙයි, ඒ වට සත්රුවන්මයවූ ප්‍රාකාරයෙක් වෙයි, එයින් පිටත වට දෙළොස් දෙළොස් ගව් පමණතැන නන් විසිතුරුවූ සුවඳමල්ගස් සමූහයෝ හැමදෙනම ඒ නාගශ්‍රීබොධියට වැඳුම්ගෙණ එකපඞ්ක්තීන් සිටිනාහුය.

මෙසේ ඒ මෛත්‍රිබුදුහු තමන් සොළසාසඞ්ඛ්‍යකල්පලක්‍ෂයක් මුළුල්ලෙහි උග්‍රව පිරූ පාරමිතාවන්ගේ මහිමයෙන්ම ලබනලද මෙබඳුවූ නාගශ්‍රීබොධියට පිටලා අටපණස්ජයන් විදුරසුන් නැඟී චතුරාඞ්ගවීර්‍ය්‍යාධිෂ්ඨානයෙන් දසදහසක්සක්වළ දෙව්බඹුන්ගේ පූජා විඳිමින් වැඩහිඳ එකෙනෙහි වසවර්ත්තිමාරයා මහත්වූ මරසෙනග යෙණ ඔහු අද බුදුවීම නොදී දෙකකුල ගෙණ පරසක්වළ ගසමි කිපී අව අවුත් සක්වළ මෝවිට සිට ඒ මෛත්‍රිනම් බුදුන්ගේ මෛත්‍රිපිඩක් බඳුවූ ශ්‍රීමුඛය දුක ලඟාවිය නොහී හයින් වෙවුලා පැරදී දිවෙයි, මෙසේ මරසෙන් බිඳ එදූ රැ අළුයම්රාත්‍රියෙහි ලොවුතුරා බුදුව අනන්තාපර්‍ය්‍යන්තවූ සක්වළවල බුදුරැස්කඳ විහිදුවනසේක.

තවද ශාරීපුත්‍රස්ථවිරය ඒ මෛත්‍රිනම් බුදුහු "අසොකය, බ්‍රහ්මදේවය" යි යන අගසවු දෙදෙනකු හා සමග මහත්වූ ශ්‍රාවකසමූහයාවිසින් පිරවරණසේක, හැමදා රැ දවල් දෙයනි පස්විසියොදනක පවත්නා බ්‍යාමප්‍රභාමණ්ඩලයක් ඇතිසේක.

තවද ඒ මෛත්‍රිබුදුහු අටඅසූරියන් උසනිත් අසාධාරණවූ බබලනශ්‍රීමත්වූ බුද්ධකායෙනින් දම්සක්පැවතුත්සූත්‍රදෙශනාදිවූ අප්‍රමාණවූ ධර්මදෙශනාකොට දනවූ සැරිසරා සියලු සතුන් සංසාරසාගරයෙන් ගොඩනගා නිවන්පුර පුරවමින් අසූදහසක් හවුරුදු ආයුසම්පත්වළඳා ලෝවැඩකරණසේක, එකල සඞ්ඛනම් චක්‍රවර්ත්තිරජ්ජුරුවෝ ඒ මෛත්‍රිබුදුරජානන්වහන්සේ දැක ධර්මචක්‍රය අසා පැහැද බුදුවූ ඇසිල්ලෙහි ධර්මචක්‍රානුභාවයෙන් පසුබැස සිටි චක්‍රරත්නය හා සත්රුවණින් චක්‍රවර්ත්තිරාජ්‍යයෙන් බුදුන් පුදා තමන්ගේ පස්විසියොදුන් පමණවූ රත්නප්‍රාසාදය බුදුපාමොක් මහසඟනට සඞ්ඝාරාමයක් කොට පිළිගන්වා සියලු චක්‍රවර්ත්තිරාජ්‍යය බුදුන්ට පුදා පෙර තමන් දිබුල්දණ්ඩත් ගෙය නගා වස්වසවා කළ පින්බලයෙන්ම කැටිව පින්කළ සතින් හා සමග නවකෙළදහසක් පුරුෂස්ත්‍රීන් ගෙණ මාර්ග්ගඵල ප්‍රාප්තව එහිභික්‍ෂුභාවයෙන් මහණව අමාම්හනිවන් දක්නාහුය.

මතු බුදුවන ඒ මෛත්‍රිනම් බුදුන් නොදක්නෝ කවුරුද? දැක සතුරින් ගැලවෙන්නෝ කවුරුදයත්?

මවුන් මැරූවෝ පියන් මැරූවෝ රහතුන් මැරූවෝ බුදුන් ඇඟින් ලේ සෙල්වූවෝ සංඝභේදකළෝ යන මේ පඤ්චානන්තරීකර්මය කළාවූ සත්ත්වයෝද දාගැබ් බිඳ බෝධිශාඛා කපා රන්පිළිම පොතු ලොලා බණපොත් සිඳ බිඳ විනාසකිරීමෙන් ආනන්තර්ය කර්මයෙහි ඇතුළත් අකුශලකර්ම කළෝද සංඝයාවහන්සේට ආක්‍රොශපරිභව බිණුවාවූ සත්ත්වයෝද සීලවන්තතැන්වලට බොරුවෙන් වරද ඉපදවූවෝද ධර්මයට අනාදර බිණූ සත්ත්වයෝද යන මොහු ඒ මෛත්‍රීබුදුන් දක්ක නොහෙත්මය— දන්වැට කැඩවෝද කුසලාන් ගසා කැඩෙවෝද බුදුන්සතුදෙය කෑවෝද ධර්මය සතුදෙය කෑවෝද සාංඝිකදෙය කෑවෝද අළුනා මිත්‍යාදෘෂ්ටිගෙණ මෙලෝ පරලෝ නැතැයි ඇවිද්නා සත්ත්වයෝද ක්ෂීරසඳදෙවියන්ට හා වැසිවලාහකදෙවියන්ට දෙස්කළාවූ සත්ත්වයෝද යන මේ හැම පව් කළ සත්ත්වයෝත් ඒ මෛත්‍රීබුදුන් දක්කනොහෙත්මය— නරක තිරිසන් අසුරය යන තුන් අපායෙහි උපන්නාවූ සත්ත්වයෝද ඒ බුදුන් දක්ක ගැලවිය නොහෙත්මය— ඇරූතල අසඟිඳුතල පරසක්වළ යනාදියෙහි උපන්නාවූ සත්ත්වයෝත් ඒ බුදුන් දක්ක නොහෙත්මය.

තවද මේ බුද්ධොත්පාදයෙහි බණ අසා මෙලෝ පරලෝ දැන තම්තමන්ශක්ති පමණින් දන්පින් කළෝ ඒ මෛත්‍රීබුදුන් දකිති- තවද සිල් රක්ෂාකළෝ දකිති—පෙහෙවස් සමාදන්ව රක්ෂාකළෝ දකිති—බඹසරවස් රක්ෂාකළෝ දකිති—දාගැබ් දාකරඬු කරවූවෝ දකිති—බෝධි පිහිටුවූවෝ දකිති—පුෂ්පාරාම ඵලාරාම කරවූවෝ දකිති—ශේදඬු ලෑවූවෝ දකිති—මාවත් හෙලිකළෝ දකිති-අම්බලම්ගොනටු කරවූවෝ දකිති--ළිංපැන්පොකුණු සෑදූවෝ දකිති-නටබුන් වෙහෙර කරවූවෝ දකිති—බණ කියා ලෝවැඩකළෝ දකිති—බණ කියවූවෝ දකිති—ධර්මසාලා නැංවූවෝ දකිති-ධර්මාසන කරවූවෝ දකිති—ධර්මශාලාවෙහි වියන් බැන්දෝ දකිති—බණපොත් ලියවා දන්දුන්නෝ ඒ පොත අකුරුගණිතින් චක්‍රවර්තිසම්පත් ආදිවූ බොහෝසැපත් ලදින් සුවවිඳ ඒ මෛත්‍රීබුදුන් දක ත්‍රිවත් දකිත්මය—කබලිදණ්ඩාසන බණවැසුන් ලෑවූවෝ දකිති—ධම්මකථිකයන්ගේ පා සේදූවෝ දකිති—බණ කියනවුන් උපචාරයෙන් සත්කාරයෙන් වඩාගෙණාවෝ දකිත්මය-බණ කියනකල සාධුකාරදුන්නෝ දකිත්මය—බණට අඩගෑවෝ දකිත්මය—විජිනිපත් දන්දුන්නෝ දකිත්මය—විජිනිපත් අතට ඔසවා දුන්නෝ දකිත්මය—ආවාසදාන කරවා දුන්නෝ දකිත්මය—ධර්මාසනයෙහි මල්සුවඳ පිදූවෝ දකිත්මය—වස්ත්‍රාභරණ පිදූවෝ දකිත්මය-බණ කියන ගෙයි පහන් දැල්වූවෝ දකිත්මය—මේ සියල්ලනිමවා බණ පැවැත්වූවෝ දකිත්මය—ශිලතුන් අත්පාමෙහෙ

කළෝ දැකිත්මය—චීවරපිණ්ඩපාත කරවා දන්දුන්නෝ දැකිත්මය—ලඟබත් පොහෝබත් අවධිබත් දන්දුන්නෝ දැකිත්මය—මවුපියන්ට අන්පාමෙහෙ කළෝ දැකිත්මය—යටත්වසයෙන් එක මලක් එකපහනක් එකබත්කෙනෙස්සක් පමණවත් දන්දී වෙවයි තුනුරුවන්කෙරෙහි සිත පහදවාවෙවයි යම් යම් කෙනෙක් මෛත්‍රීබුදුන් දකිම්වයි කියා මාගේ මේ බුද්ධොත්පාදයෙහි ප්‍රාර්ථනාකළාහු වීනම් ශාරිපුත්‍රස්ථවිරය ඔහු හැම ඒ මතු මෛත්‍රීබුදුන් දැක සංසාරසාගරයෙන් ගොඩනැගෙන්නාහුමයයි යනාදී ක්‍රමයෙන් මේ අනාගතවංශදෙශනාව නිමවාවදාළසේක.

මෙසේ මාගේ සවාම්දරුවෝ තමන් නොවදුම්හයි මානය කොට උන් කූතිඝණසාම්ඩයෙහි ආකාශයට පැනනැගී ඒ විසිතුරු රුවන්සක්මණෙහිදී යමකප්‍රාතිහාර්‍ය දක්වා ප්‍රථම අග්‍රශ්‍රාවකවූ දම්සෙනෙවි සැරියුත්මහතෙරුන්වහන්සේගේ ආරාධනාවෙන් මෙසේ බුද්ධවංශ අනාගතවංශ දෙශනාව ප්‍රකාශකොට නිමවාවදාරා නැයන්ගේ මානය බිඳ ආකාශයෙන් බස්නා පුන්සඳක්සේ බැස පළඹුව වැඩහුන් බුද්ධාසනයෙහිම පෙනිගියසේක.

ඒ ආශ්චර්‍ය්‍යය දුටු සුඩොදනරජ්ජුරුවෝ පුතනුවන්වහන්සේගේ ශ්‍රීපාදමූලයට ගොස් දෙහොත් මුදුනේ තබාගෙණ සතුටුකඳුලෙන් දෙනුවන් තෙමතෙමා ස්වාමිනි මාගේ බුදුරජානෙනි මාගේ සිඬාර්ථකුමාරවූ පුතනුවන්වහන්ස පුත්‍රවාත්සල්‍යයෙන් ලොව ඇමටවැඩ පිණිස මාගේ ගෙයි උපන් මාගේම පියානන්වහන්ස අදපටන් තුඹවහන්සේ මට දරු නොවනදැය මම තුඹවහන්සේගේ දරු වෙම් එසේහෙයින් මාසේවූ තුඹගේ දසයකුත් නොවටනා ඝිතවූ පියෙක්හට මෙබඳු ප්‍රාතිහාර්‍ය දක්වා මුළුලෝ වෙවුල්වා කුමක් නිසා වෙහෙසුනුසේක්ද? මම තුඹවහන්සේ උපන්දා කාලදෙවල නම් ඍෂීන්ගේ නලල්මැද තුඹගේ තෙල ශ්‍රීපතුල්දෙක පෙනිගිය ප්‍රාතිහාර්‍යය දැක සතුටුව එදවස්ම මමද මේ පතුල්දෙක නලළතබා වැන්දෙමි ඒ මාගේ පළමුවෙනි වැඳීමය—තවද තුඹවහන්සේ පස් මැසිකල වප්මඟුල්කරණද දඹගසමුලදී කළාවූ ප්‍රාතිහාර්‍ය දැක සතුටුව එදත් මේ සිරිපතුල්දෙක වැන්දෙමි ඒ මාගේ දෙවෙනි වැඳීමය—අද මාවැනි පියකු තබා දිව්‍යබ්‍රහ්මයන්විසිනුදු නුදුටු නොඇසූවිරූ මෙබඳු ප්‍රාතිහාර්‍ය දැක රාජ්‍යය පුදපියම්නම් ඒ තුඹ අලුයම දැමූ කෙළපිඩක්සේ පිළිකුල්කොට හැරපියාගිය රාජ්‍යයහෙයින් තරම්නොවෙයි ජීවිතය පුදපියම්නම් තුඹගේ බුද්ධශ්‍රී වඩවඩා දකිනා ලොභිය මාගේ වැඩිතරම් හෙයිනුත් ජීවිතපූජාව තුඹ නොයිවසන හෙයින් ජීවිතයත් පුදපිය නොහෙම් යනාදී නොයෙක් කාරණ කියකියා බුදුන්ගේ ශ්‍රීපාදදෙක හිස්මුදුනෙහි

තබාගෙණ මේ තුන්වන වැඳීමයයි කියකියා ඒ සුද්ධොදනරජ්ජුරු
වෝ සිටගත නොහී මුලින් සිඳගෙළු කනකරූපයක්සේ බුදුන්ගේ
පාමුල්හි වැඳ පෙරළීගියහ.

එසේ රජ්ජුරුවන් වැඳිකල එක්ලක්‍ෂසැටදහසක් පමණ ශාක්‍ය
රජදරුවෝ සිටිසිටිතැන සිටගතනොහී යුගාන්තවාතයෙන් හුනු
මහසල්වනයක්සේ වැඳ පෙරළිගියාහුය.

එවේලෙහි ශක්‍රදෙවෙන්ද්‍රයා මලාගිය මලස්නෙක පැන් දුන්නා
ශ්‍රද්ධාවන්තපුරුෂයකුසේ බුදුන්ගේ ශාක්‍යකුල නැමති බන්ධුකුසුම
යන් සන්තොෂකරවා මහත්වූ පොකුරුවැස්සක් වැස්වීය, ඒ පො
කුරුවැස්සෙහි තඹවන් දිය යට පොළොවින් දිවෙයි තෙමෙනුකැ
මැත්තෝ තෙමෙති නොතෙමෙනුකැමැත්තෝ නොතෙමෙති—
ඒ ආශ්චර්‍ය්‍යය දුක විසිදහසක් භික්‍ෂූහු බුදුන්ගේ බන්ධුසමාගමයෙහි
වට පොකුරුවැස්සෙක මහිම බලවයි සතුතිකළසේක. ඒ කාරණය
අත්‍ථොත්පත්ති කොටගෙණ මාගේ ස්වාමිදරුවූ බුදුරජානන්වහන්
සේ මහණෙනි දැන්මතු නොවෙයි පෙරත් මෙසේම මාගේ බන්ධු
සමාගමයෙහි පොකුරුවැසි වටුයේමවේදැයි වදාරා අහසක් යාචා
වෙන් ප්‍රතිමණ්ඩිතවූ මහාවෙස්සන්තරජාතකය ගෙණහැරදක්වා
ධර්‍මදෙශනාකොටවදාළසේක. එවේලෙහි බොහෝ ප්‍රාණීහු සෝ
වාන්ආදිවූ මාර්‍ගඵලයට පැමිණියාහුය.

ඉක්බිත්තෙන් ශාක්‍යරජදරුවෝ බුදුන් වැඳ ප්‍රදක්‍ෂිණකොට
සද්ධර්‍මාමෘතයෙන් අභිෂෙකය ලදින් සන්තොෂයෙන් පිණ මහ
නුවරට යන්නාහු සද්ධර්‍මප්‍රීතින්ම සිහිමදව එකරජෙක් වේවයි
එකබිසෝකෙණෙක් වේවයි බුදුරජානන්වහන්සේට පසුවද දවස්හි
දන්දෙන පිණිස ආරාධනාවක් නොකොට අභිමුඛව දැකවදාරණ
තාක් තැන් පසුබැස බැස ගොස් දර්‍ශනය මුවහවනතැන් සිට
නැවතනැවත පසඟ පිහිටුවා වැඳ ශාක්‍යසිංහ ශාක්‍යනේතු ය
නාදීන් බුදුන්ට ප්‍රසංසාකොට ගියාහුය.

මාගේ ස්වාමිදරුවූ බුදුරජානන්වහන්සේ එදා රෑ නිග්‍රොධාරාම
යෙහි දවස්යවා පසුවද උදෑසන කළමනා සියලු බුද්ධකෘත්‍යයන්
නිමවා ගන්ධකුටිවාරයෙහි වැඩසිටිකල්හි සුවිනීතවූ ශාන්තවූ ඉඳු
රන්ඇති ශාන්තවූ සිත්ඇති ශීලසමාධිප්‍රඥාවිර්‍ය්‍යසම්පන්නවූ තමන්
වහන්සේ වැනි විසිදහසක් පමණ රහතන්වහන්සේවිසින් පිරිව
රණලදසේක් පූර්‍වබුදුවරයෝ කුලගමට ගියදා කෙසේ පිඩු සිඟුවෝ
හෝයි පූර්‍වබුද්ධචරිතයන් බලාවදාරා ඒ හැම බුදුහුම ප්‍රාතිහාර්‍ය්‍ය
දක්ව දක්වා ගෙපිළිවෙළින්ම සිඟුහයි දැක අද මමද එසේම ප්‍රාති
හාර්‍ය්‍යයෙන් යෙදී සිඟවි සිතාවදාරමින් දකුණුශ්‍රීපාදය ඔසවාවදාළ

යේක. එකෙණෙහි මහත් ගැල්සකක් සා පියුමෙක් පැනනැගී ඒ ශ්‍රීපාදය පිළිගත්තේය, නැවත වාමශ්‍රීපාදය ඔසවාවදාළකල්හි එසේම අනික් මහපියුමෙක් පැනනැගී ඒ ශ්‍රීපාදයද පිළිගත්තේය, එසේ ඇතිකල්හි මාගේ ස්වාමිදරුවූ බුදුරජානන්වහන්සේ පියුමක්පිට පියුමක් තබන්නාසේ ඒ පැනනැගී පියුම්පිට ශ්‍රීපාපියුම් තබතබා වඩිනට නික්මුණුසේක නැගුනැගු පත්ලෙහි පියුම් පෙනේමය, එසවූ එසවූ පත්ලෙහි පියුම් අන්තර්ධානවේමය, මෙසේ මාගේ ස්වාමිදරුවූ බුදුරජානන්වහන්සේ කිඹුල්වත්පුරයට මෙසේ මහත්වූ ප්‍රාතිහාර්‍ය්‍ය දක්ව දක්වා තුන්ලොවම කියා ගිව්ස්වා ලිය නොහැකිවූ කියා අව ගනාගත නොහැකිවූ කිසි උත්තරයක් කීසාද්‍ර නොහැකි අනොපමෙයවූ අසදෘශවූ අද්භූතවූ අසාධාරණවූ බුද්ධශ්‍රීන් දිලිහි දිලිහී වැඩ දකුණුශ්‍රීපාදය එනුවර මහවාසලය මුදුනෙහි පළමුකොට තබාවදාළසේක. එකෙණෙහි ඒ ශ්‍රීපාදය ඇතුළට දිගුකිරීම හා සමගම ඒ පය පඤ්චාඞ්ගුලියෙහි පඤ්චනඛාග්‍රයෙන් පළමුකොටම බුදුරැස්කද පසෙක් පඤ්ච මහාගංගාව දිවූවාසේ ඇතුළුනුවරට දිවයන්නාහු සියොලඟින් නික්ම ගිය සවණ්නරැස්හාම එතවම ගොස් නුවර තුන්යලක් සිසාරා පවුරුභිත්ති අට්ටාලවල ගැසී කිරිමුහුදු රළපහරසේ පෙළින්පෙළ රළනැගී නැගී දිව හැම නුවරෙහි හැමතැන්හි වනපතව ප්‍රාසාද කූටාගාර භිත්තිපවුරු පදනම්තොරණ අටලුවාසල කවුළුවලද යනාදිය රත්පට රදීපට පොරවන්නාසේ රන්දිය නිරිදිය විත්කරන්නාසේ ඒ ඒ රසයෙන් පූරන්නාසේ හැමතැන්හි වනපතව එනුවර දිව්‍යපුරයක්සේ සියලු බුදුරැසින් සැරහී ආලෝකව ගියේය. එකල්හි ඒ හැම නුවරවාසීහු කුල්මත්ව කොල මේ මේ කාරණයෙන් බුදුහු වැඩියාහ තව මෙහි කුමක්කරමෝදැයි කියකියා මුලුනුවරවාසී සත්වයෝම මුහුද රළපහර දිවන්නාසේ බුදුන් වඩනා පෙරමගට දිවින්ට පටන්ගත්හ.

ඉක්බිත්තෙන් මාගේ ස්වාමිදරුවූ බුදුරජානන්වහන්සේ මෙබඳුවූ ප්‍රාතිහාර්‍ය්‍යයෙන් යෙදී ඒ වාසල්එළිපතෙහි වැඩසිට පෙරබුදුවරයෝ කුලනුවරට පැමිණ සුබිනයන්ගේ දොරම සිඟුදෝහෝ ගෙවල් පිළිවෙළ නොවරදවා ගෙපිළිවෙළින්ම සිඟුදෝහෝයි පූර්වබුද්ධවංශ චරිතය බලා අනන්තබුදුවරයන් අතුරෙන් එකද බුදුකෙනෙක්වත් ගෙපිළිවෙළ ඉක්මවා පිඬු පිණිස ගිය ගමනක් නොදක හැමබුදුවරයෝම ගෙපිළිවෙළින්ම සිඟූහයි දැක දැන මමද මාගේ ඒ බුද්ධවංශචාරිත්‍රය නොවරදවාම සිඟිමෙන් මාගේ ප්‍රවෙනිවංශයද රැක්කයුතුය මතු මා බලා මා අනුවම හික්මෙන මාගේ ශ්‍රාවකයෝද සපදානයෙන් පිඬුපිණිස හැසිරීමෙන් ධූතාඞ්ගචර්‍ය්‍යාවත් පූරා

උතුම් ශාසනප්‍රතිපත්තිපූජාවෙන් මා පුදන්නාහුයයි වදාරා සුවිඅසූව්
තැන් වෙනසක් නොව යමප් පවත්නා චන්ද්‍රකාන්තියගේ හීත
මධ්‍යමළුත්තාංශවූ හැමසතුන්කෙරෙහි සමව පවත්නා තමන්ව
හන්සේගේ මහාකරුණාව හැම්දෙනාකෙරෙහි පතුරුවා වාසල්
දොරසමීප කෙළවරගෙයපටන් ගෙයක් පන්වා ගෙයක් කරා නො
ගොසින් සපදානචාරිකාවෙන්ම ඒ විසිදහසක් රහතන් පිරිවරා
එදා ගෙපිළිවෙළින්ම සිඟන්ට පටන්ගත්සේක—එකල්හි ආරාධනා
කිරීමක පාත්‍රාගැණීමය යනාදි ව්‍යවහාරදන්නාකෙණෙකුන් ලොව
නැතිහෙයින් කිරිඉතිරවැගිරෙනකල සිත උපන් සන්සලයෙන්
අරබල අරබලුවයි කියනබව මුත්දරුහැදදමාපියන් නවූන් නැත්
තාසේ හැමමනුෂ්‍යයෝම බුදුන් දුක විෂමයපත්ව බලබලාම සිටිති
එබැවින් බත්සැන්දක් ගේණනසේත් නොදනිත්මය, එවේලෙහි
දෙමහල්, තුන්මහල් පස්මහල් සත්මහල් මහපාවල උඩුමහලින්
යටිමහලට නොබස්නා ශ්‍රීමත් බිසෝවරුන් හා ස්ත්‍රීසමූහයෝ සිවු
මැදුරුකවුළුවල දොර හැර මුඛමණ්ඩලයන් පිටත්කොට ඒ අනො
පමවූ බුද්ධශ්‍රී බලබලා එහි රසද විඳ විඳ අනිත්ට පටන්ගත්හ-එකෙ
ණෙහි රාහුලකුමාරයන්වහන්සේට මවුවූ යසොදරාදේවිද එසේ
බුදුන් දොර දොර පිඬු සිඟති අසා සිද්ධාර්ථකුමාරයෝ පෙර මෙමනු
වර රන්රථයකට පැනනැගී සුසැටක් ආභරණ පැලඳ රුවන්රසින්
දිලියෙන අනඝවූ ඔටුන්නක් පැලඳ ලක්ෂයක් අගනාවූ මුත්හරය
කින් උරමඬල පුරාගෙණ නොයෙක් ලක්ෂගණන්. ඇමතියෝද
නාථප්පර්ස් ප්‍රවරාශ්‍රගෙණ ශක්‍රදෙවෙන්ද්‍රලීලාවෙන් රාජශ්‍රී විඳ විඳ
ඒ ඇවිඳ කල්යවූ ඒ මාගේ ස්වාමියානෝ දැන් කෙස්වැටි දැළිරැවුලු
කපා ඒ ශරීරය වසා කාසායවස්ත්‍රයක් පෙරවා මැටිපාත්‍රයක් අතින්
ගෙණ මෙමනුවර පෙරලා මෙමජාතියෙහි දොර දොර සිඟමින් සිටි
යෝල උන්වහන්සේ මහණවීමට ගියදාම මාගේ දිවි නොනැසී තුබූ
ආදීනවයෙන් ලාමකවූ කණට අමධුරවූ සිතට අමනොඥවූ හෘද
යවසතුව ශ්‍රුණකරවන්නාවූ මෙසේවූ නපුරුතෙපුලක් ඇසිමි
අහෝ නිමෙක්දෝහෝ ඒ සිද්ධාර්ථකුමාරයන් දුටු යම්මකෙණෙක්
උන්ගේ මහත්වූ ආනුභාවයම කියති උන්ගේ සිහමුනූත් දුටුදුටු
වන්ට ඉතාම රිසියෙන ප්‍රියතරයයි කියති ඒ මහණවෙසයත් උන්ට
හොබ්දෝහෝ නොහොබ්දෝහෝ දැන් මාවිසින් බැලුවමැනවැයි
සිතාලා සත්බුමු මහපායෙහි සිංහපඤ්ජරකවුළුවෙහි දොර හැර
රන්කලස කරක්බඳු ග්‍රීවය දිගුකොට බලන්නී බුදුන්ගේ දෙතිස්
මහාපුරුෂලක්ෂණයෙන් හා අසූඅනුව්‍යඤ්ජනයෙන් බබලන සිය
ලඟින් දිවන සවණක් බුදුරැස්කදින් ලඟිරුමඩලක්සේ දිලිහිදිලිහී
විසිදහසක් මහරහතන් පිරිවරා ඉතා සන්සුන්වෙසයෙන් සිරි

ජේක. එකෙණෙහි මහත් ගැල්සකක් සා පියුමෙක් පැනනැගී ඒ ශ්‍රීපාදය පිළිගත්තේය, නැවත වාමශ්‍රීපාදය ඔසවාවදාළකල්හි එසේම අනික් මහපියුමෙක් පැනනැගී ඒ ශ්‍රීපාදයද පිළිගත්තේය, එසේ ඇතිකල්හි මාගේ ස්වාමිදරුවූ බුදුරජානන්වහන්සේ පියුමක්පිට පියුමක් තබන්නාසේ ඒ පැනනැගී පියුම්පිට ශ්‍රීපාපියුම් තබතබා වඩිනාට නික්මුණුසේක නැගුනැගු පත්ලෙහි පියුම් පෙනේමය, එසවූ එසවූ පත්ලෙහි පියුම් අන්තර්ධානවේමය, මෙසේ මාගේ ස්වාමිදරුවූ බුදුරජානන්වහන්සේ කිඹුල්වත්පුරයට මෙසේ මහත්වූ ප්‍රාතිහාර්ය්‍ය දක්ව දක්වා තුන්ලොවම කියා ගිව්ස්වා ලිය නොහැකිවූ කියා අව හසාගතනොහැකිවූ කිසි උපාරයක් කීකාප්‍රනොහැකි අනෝපමේයවූ අසදෘශවූ අද්භූතවූ අසාධාරණවූ බුද්ධශ්‍රීන් දිලිහි දිලිහී වැඩ දකුණුශ්‍රීපාදය එනුවර මහවාසලය මුදුනෙහි පත්‍රමුකොට තබාවදාළසේක. එකෙණෙහි ඒ ශ්‍රීපාදය ඇතුළට දිගුකිර්ම හා සමඟම ඒ පය පඤ්චාඞ්ගුලියෙහි පඤ්චනඛාග්‍රයෙන් පළමුකොටම බුදුරැස්කද පසෙක් පඤ්චමහාගංගාව අවුවාසේ ඇතුළුනුවරට අවයන්නාහු සියොලඟින් නික්ම ගිය සවර්ණරැස්හම එනවම නොස නුවර තුන්යලක් සිසාරා පවුරුහිසති අට්ටාලවල ගැසී කිර්මුහුදු රළපතරසේ පෙළින්පෙළ රළනැගීනැගී අව හැම නුවරෙහි හැමතැන්හි වනපනව ප්‍රාසාද කූටාගාර හිසති පවුරු පදනම්තොරණ අටලුවාසල කවුළුවලද යනාදිය රන්පට රඳිපට පොරවන්නාසේ රන්දිය කිරිදිය විත්කරන්නාසේ ඒ ඒ රසයෙන් පූරන්නාසේ හැමතැන්හි වනපනව එනුවර අවපූරයක්සේ සියලු බුදුරැසින් සැරහී ආලෝකව ගියේය. එකල්හි ඒ හැම නුවරවාසීහු කුල්මත්ව කොළ මේ මේ කාරණයෙන් බුදුහු වැඩියාහ නව මෙහි කුමක්කරමෝදැයි කියකියා මුළුනුවරවාසී සඛයෝම මුහුද රළපතර අවන්නාසේ බුදුන් වඩනා පෙරමගට අවිත්ට පටන්ගත්හ.

ඉක්බිත්තෙන් මාගේ ස්වාමිදරුවූ බුදුරජානන්වහන්සේ මෙබඳුවූ ප්‍රාතිහාර්ය්‍යයෙන් යෙදී ඒ වාසල්එළිපතෙහි වැඩසිට පෙරබුදුවරයෝ කුලනුවරට පැමිණ සුබිනායන්ගේ දොරම සිඟාදෙහෝ ගෙවල් පිළිවෙළ නොවරදවා ගෙපිළිවෙළින්ම සිඟාදෙහෝයි පූර්වබුද්ධවංශ චර්තය බලා අනන්තබුදුවරයන් අතුරෙන් එකද බුදුකෙණෙක්වත් ගෙපිළිවෙළ ඉක්මවා පිඩු පිණිස ගිය ගමනක් නොදක හැමබුදුවරයෝම ගෙපිළිවෙළින්ම සිඟුහයි දක දැන මමද මාගේ ඒ බුද්ධවංශචාරිත්‍රය නොවරදවාම සිඟිමෙන් මාගේ ප්‍රවෙනිවංශයද රැක්කයුතුය මිතු මා බලා මා අනුවම ශික්මෙන මාගේ ශ්‍රාවකයෝද සම්දනයෙන් පිඩුපිණිස හැසිරීමෙන් ධූණ්ඩචරියාවත් පූර

උතුම් ශාසනප්‍රතිපත්තිපූජාවෙන් මා පුදන්නාහුයයි වදාරා සුවිඅසූම්
තැන් චෙතසක් නොව සමව පවත්නා චන්ද්‍රකාන්තියසේ ශීත
මධ්‍යමලතාභාවූ හැමසතුන්කෙරෙහි සමව පවත්නා තමන්ව
හන්සේගේ මහාකරුණාව හැම්දෙනාකෙරෙහි පතුරුවා වාසල්
දොරසමීප කෙළවරගෙයපටන් ගෙයක් පන්වා ගෙයක් කරා නො
ගොසින් සපදානචාරිකාවෙන්ම ඒ විසිදහසක් රහතන් පිරිවරා
එදා ගෙපිළිවෙළින්ම සිඟන්ට පටන්ගත්සේක—එකල්හි ආරාධනා
කිරීමය පාත්‍රාගැණීමය යනාදි ව්‍යවහාරදන්නාකෙණෙකුන් ලොව
නැතිහෙයින් කිරිඉතිරවැගිරෙනකල සිත උපන් සන්සලයෙන්
අරබල අරබලුවයි කියනබව මුත්දරුහැදදමාපියන්නවුත් නැත්
තාසේ හැම්මනුෂ්‍යයෝම බුදුන් දැක විෂමයපත්ව බලබලාම සිටිති
එබැවින් බත්සැන්දක් ගේණනසේත් නොදනිත්මය, එවේලෙහි
දෙමහල් තුන්මහල් පස්මහල් සත්මහල් මහපාවල උඩුමහලින්
යට්මහලට නොබස්නා ශ්‍රීමත් බිසෝවරුන් හා ස්ත්‍රීසමූහයෝ සිවු
මැදුරුකවුළුවල දොර හැර මුඛමණ්ඩලයන් පිටත්කොට ඒ අනො
පමවූ බුද්ධශ්‍රී බලබලා එහි රසද විඳ විඳ අතින්ට පටන්ගත්හ-එකො
ණෙහි රාහුලකුමාරයන්වහන්සේට මවුවූ යශෝදරාදේවිද එසේ
බුදුන් දොර දොර පිඬු සිඟති අසා සිද්ධාර්ථකුමාරයෝ පෙර මේමනු
වර රත්රථයකට පැනනැගී සුසැටක් ආභරණ පැලඳ රුවන්රසින්
දිලියෙන අනඝවූ ඔටුන්නක් පැලඳ ලක්ෂයක් අගනාවූ මුත්හරය
කින් උරමඩල පුරාගෙණ නොයෙක් ලක්ෂගණන්. ඇමතියෝද
නාථපිරිස් පිරිවරාගෙණ ශක්‍රදෙවෙන්ද්‍රලීලාවෙන් රාජශ්‍රී විඳ විඳ
ඒ ඇවිඳ කල්යවූ ඒ මාගේ ස්වාමියානෝ දැන් කෙස්වැටි දැළිරැවුලු
කපා ඒ ශරීරය වසා කාසායවස්ත්‍රයක් පෙරවා මැටිපාත්‍රයක් අතින්
ගෙණ මේමනුවර පෙරලා මෙමජාතියෙහි දොර දොර සිඟමින් සිටී
යෝල උන්වහන්සේ මහණවීමට ගියදාම මාගේ දිවි නොනැසී තුබූ
ආදීනවයෙන් ලාම්කවූ කණට අමධුරවූ සිතට අමනොඥවූ හෑද
යවසතුව හුණුකරවන්නාවූ මෙසේවූ නපුරුතෙපුලක් ඇසිම්
අහෝ නිමෙක්දෝහෝ ඒ සිද්ධාර්ථකුමාරයන් දුටු යම්මකෙණෙක්
උන්ගේ මහත්වූ ආනුභාවයම කියති උන්ගේ සිඟමනුත් දුටුදුටු
වන්ට ඉතාම රසියෙන ප්‍රියතරයයි කියති ඒ මහණවෙෂයත් උන්ට
හොබ්දෝහෝ නොහොබ්දෝහෝ දැන් මාවිසින් බැලුවමැනවැයි
සිතාලා සත්බුමු මහපායෙහි සිංහපඤ්ජරකවුළුවෙහි දොර හැර
රන්කලස කරක්බඳු ග්‍රීවය දිගුකොට බලන්නී බුදුන්ගේ දෙතිස්
මහාපුරුෂලක්ෂණයෙන් හා අසූඅනුව්‍යඤ්ජනයෙන් බබලන සිය
ලඟින් දිවන සවණක් බුදුරැස්කඳින් ලඟිරුමඩලක්සේ දිලිහිදිලිහී
විසිදහසක් මහරහතන් පිරිවරා ඉතා සන්සුන්වෂයෙන් සිරි

පතුල් ඉදිරියෙන් තබතබා වැඩවැඩ සිඟන්නාවූ බුදුරජානන්වහන්සේ දැක දෙඅත් මුදුනෙහි තබාගෙණ තුන්යලක් සාධුකාරදී අමාවලෙක ගලා නගාලූ රත්රුවක්සේ සියලඟ ලොමු දැහගන්වමින් පස්වණ්ණප්‍රීතින් පිණා මත්ව අහෝ සිද්ධාර්ථකුමරයන්වහන්ස එදා මධ්‍යමරාත්‍රියෙහි මා වැනි උපපාත සත්‍රියකටත් නොකියා රාහුල කුමාරයන් වැනි එක්වැනි පුතනුකෙණකුන් බලබලා උන් ඇඟ අතගා සිඹ සැනසීමත් නොකොට අප හැර සැගවී එකලාව පලා ගියේ මෙසේවූ ඓශ්වර්යවිශෙෂයක් ඇතිගමනකටද මෙසේවූ ශරීරප්‍රභාවක් මෙසේවූ සුවිනිතපඤ්දක් සොයා මේ නුවර හැර ඔබ ගියසේ යහපත්මය ඔබ රජසිරි හැර මේ මහණවූසේ ඉතා යහපත් මය ඔබ ලද සැපත එකාන්තයෙන් ඔබමට හොබනේය පෙර ඔබගේ දිවසිරි වැනි මෙසා රාජ්‍යශ්‍රියට වඩා දැන් ඔබගේ සිඟනරාජ්‍යය මට ඉතා ප්‍රියවන්නේයයි කිය කියා:—

සිනිද්ධනීලමුදුකුඤ්චිතකෙසො
සූරියනිම්මලතලාභිනලාටො
යුත්තතුඞ්ගමුදුකායතනාසො
රංසිජාලවිතතො නරසීහො.

යනාදි නරසීහගාථා අටක් කියා බුදුන්ගේ කෙසාග්‍රය පටන් පාදාග්‍රය දක්වා රූපය වර්ණනාකොට, එමවිගසම මයිලනුවූ සුදොදන රජ්ජුරුවන්ගේ ගෙට ගොස් ස්වාමිවූ මයිලනුවන්වහන්ස තුඹ පුතනුවන් සිද්ධාර්ථකුමාරයන් දැන් සත්හවුරුද්දකින් තමන්ගේම නුවරට ආ තැනැත්තවුන්ට අද එකදවසකටවත් නොසිඟවා බතක් දී ලියනොහෙන්නේ තුඹ සිඟා කැකෙනණක්ද දැන් උන්වහන්සේ දෙරින්දෙර පිඬු සිඟමින් සිටිසේක තුඹසේවූ දරුවන්ට දඬිකෙණෙක් නැත තුඹ මේ නෙයී ගිද කුමක් කරන්නෙහිදැයි යනාදීන් සුදොදනරජහට කිය.

රජ්ජුරුවෝ බුදුන් හා විසිදහසක් මහරහතන්ට පැන් නොවකා වතුම්බුරයෙන් තිරිප්පු පසවන්නාහු යෙහෙලනියන් අතින් පුතනුවන්වහන්සේ සිඟනි යන බස් අසා කඳුලු පිරුණු ඇස් ඇතිව ඉතාමහත්වූ ලජ්ජාවෙන් එකනිත් සළුපට රඳව රඳවා දිවගොස් ස්වර්ණසාගරයෙහි දිය පීරා දිවන අනන්තනම් නාගරාජයාසේ රන්වන් බුදුරැස් පිහිර පිහිරා බුදුන්තරා දිව ක්ෂීරසාගරයෙහි ගැලෙන් නකුසේ පුතනුවන්වහන්සේගේ චරණනඛමයූඛයෙහි ගැලි ගැලී වැඳ ස්වාමිනි මාගේ ප්‍රියපුතනුවන්වහන්ස මට මෙසා නින්දාවක් කුමක් නිසා කරවදාළසේක්ද? අද මේ මුළුදඹදිව තෙසැටදහසක් නුවරවල තෙසැටදහසක් රජුන් හා මහසෙනග අව නමුත් පැන් නොවකා සුවදහැල්සාලේ කිරිබත් දෙනත් පොහොසත්මි එසේවූ

මම විසිදහසක් රහතන් හා තුඹවහන්සේට අදදවස බත් දීලිය
නොහෙනියි සිතූසේක්ද? ස්වාමීනි කුමක්නිසා මට නින්දාකොට
දෙරින් දෙර සිට සිඟාවදාරණසේක්දැයි කීහ. එකල්හි බුදුරජ වදාර
ණසේක් මහරජ මේ අපගේ වංශයෙහි සිරිතෙක්මය එහෙයින්
එසේ නොසිතාවයි වදාළසේක. ඒ ඇසූ රජතෙම ස්වාමීන්වහන්ස
කුමක් වදාරණසේක්ද තුඹවහන්සේගේ වංශයනම් මහාසම්මතාදී
රාජවංශය තුඹවහන්සේගේ ඒ වංශයෙහි මුත්තනුවූ එක්රජෙක්
ලත් සෙසු සම්පත් තබා කථාවක් කළකල එකෙණෙහි මහනෙල්
මල්සුවඳ මුඛයෙන් සතරගවුවක් තැන්දිවෙයි, එක්මුත්තනු රජෙක්
අහස බලා අත්පොලසන් දුන්කල එකෙණෙහි දෙව්ලොව වෙවුල්
වා සනිස්යොදනක්තන්හි දණ පමණ කටිපමණ සත්රුවන්වැසි
වස්වන්ය, එක්මුත්තනුරජෙක් අමාත්‍යයන්ට ප්‍රසාද දෙමි කියා
පතුල්දෙක ඉන්ජිටතගාලූවේලෙහි චින්තාමාණික්‍යසේ එයින් කැ
මති කැමති සම්පත් පහළවන්නේය, මෙසේ මෙසේවූ තුඹවහන්
සේගේ වංශයෙහි තුන්ලක්ෂසූනිස්දහස්පන්සිය ඒකානුවක් පමණ
මා ඇතුළුවූ මේ හැම රජුන් අතුරෙන් මේ තුඹසේ සිඟා කෑ එකද
රජෙකුත් නැත, එසේ ඇතිකල මෙසේ සිඟා වැළඳීම අපගේ වංශ
චාරිත්‍රයකැයි කියා මාගේ වංශයට නින්දාකොට නොවදාළමැන
වැයි කීහ. එවිට ස්වාමිදරුවෝ මහරජ තොපගේ මේ මහාසම්ම
තාදි රාජවංශය, මාගේ දීපඞ්කරාදි බුඩවංශය, ඒ මාගේ වංශයෙහි
පෙර එක්බුදුවරකෙණෙක් මවුකුස වසනකල පවා අසූරියන්
ගෙයි පහන් නැඟුවමැනවැයි යන්නක්නැත, එක්බුදුවරකෙණෙ
කුන්ගේ ඇතින් නික්මුණු රැසින් දසදහසක්සක්වළ බබලා හිරසඳ
පවාකද්‍යෝතිමියන්සේ නිස්ප්‍රභාකොට දිලිහුණුසේක,මෙසේ මෙසේ
වූආනුභාවසම්පන්නවූ මාගේවංශයෙහි දීපඞ්කරකොණ්ඩඤ්ඤමඞ්ග
ල සුමන රෙවත සොභිතාදි කාශ්‍යපාවසාණවූ සූවිසිබුදුවරයෝද
එයින් අන්‍යවූද අනන්තාපර්මාණවූ සර්වඥවරයෝ භික්ෂාචාරයෙහි
හැසිර ගෙපිළිවෙළින් සිඟිමෙන්ම දිවි පැවැත්වූවාහුය, එහෙයින්
මේ සිඟිඑත් ජීවිකාර්ථවූ ලාමකයන්ගේ සිඟිමසේ නොව අනන්තවූ
බුදුවරයන්ගේ වංශචාරිත්‍රය නොහැර පවත්වන මාගේ උතුම්
පිණ්ඩපාත ආර්යවංශනම් ලද මේ බුඩවංශයයි තමන්වහන්සේගේ
වංශය ප්‍රකාශකොට වදාරා ඇතුළුවීථියෙහිම වැඩසිට පියරජ්ජුරු
වන් මුහුණ බලා තමන්වහන්සේගේ සධර්මනැමති මහානිධාන
යෙන් ගාථානැමති රුවණක් දෙනුකැමතිව-ගෙපිළිවෙළින්ගොස්
දෙර දෙර සිට ලැබියයුතු භික්ෂාවෘත්තියෙහි ප්‍රමාද නොවන්නේය
එසේ පිණ්ඩචාරිකවත ගෙපිළිවෙළ නොඉක්මවා දෙර දෙර සිට
බික සිඟනබැවින් නොපමාව හැසිරීමෙන් එක්විසිඅනෙස්නෙන්

දුරුව සපදානචාරීව වසනසුලු මහණු මෙලෝ පරලෝ දෙක්හි සතරඉරියව්වෙහිම සැපසේ වාසයකරන්නේයි යන අර්ථය ප්‍රකාශ කරන්නේ:—

උත්තිට්ඨේ නප්පමජ්ජෙය්‍ය ධම්මං සුචරිතං චරෙ
ධම්මචාරී සුඛං සෙති අස්මිං ලොකෙ පරම්හි ච.

යන මේ ගාථාවෙන් පියරජහට බණ වදාළකල්හි ඒ සුද්ධොදන රජතෙම කෙළදහසක් කෙලෙසුන් ගෙවා දහසක් නයින් සම්පූර්ණවූ සෝවාන්ඵලයට පැමිණ දක්නාලද චතුස්සත්‍යධර්මයන් ඇතිව දෘෂ්ටිඕඝයෙන් එතරව සිට ශ්‍රද්ධාදී සප්තධනයෙන් සමන්විතව භාග්‍යවතුන්වහන්සේගේ පාත්‍රය ලබාගෙණ විසිදහසක් භික්ෂුසඞ්ඝයාවහන්සේ හා බුදුරජානන්වහන්සේ ඇතුළුරජගෙයි මහාප්‍රාසාදයට වැඩම්මවාගෙණ ගොස් පණවනලද ආසනවල වඩාහිඳුවා ප්‍රනීතාහාරයන් වළඳවා වළඳා ඉක්බිති එතනට රැස්වූ බුදුන් වැඳ එකත්පස්ව හුන් මහාප්‍රජාපතීගෞතමීනම් බිසව ප්‍රධානවූ අන්තඃපුරවාසී සතළිස්දහසක් පමණ නාටකස්ත්‍රීන් සහිතවූ මහපිරිසට බණ වදාරණ අප බුදුරජානන්වහන්සේ:—

ධම්මං චරෙ සුචරිතං න තං දුච්චරිතං චරෙ
ධම්මචාරී සුඛං සෙති අස්මිං ලොකෙ පරම්හි ච.

යන මේ ගාථාවෙන් බණ වදාළකල්හි ගාථාවගේ අන්තාක්ෂරයට පැමිණීම හා සමග මහාප්‍රජාපතීගෞතමී නම් බිසව සෝවාන්ඵලයට පැමිණියාය, පිතෘවූ සුද්ධොදන රජ සකෘදාගාමිඵලයට පැමිණියේය.

එකල්හි රජ්ජුරුවෝ අන්තඃපුරවාසීන් අතුරෙහි රාහුලමාතාවන් නොදැක ඒ යෙහෙළියන් සඳහන්ව මාගේ දරුවූ යශොධරාදේවීද අවුදින් බුදුන් දැක වැඳ ශොකදුරුකරගණුවයි කියා යැවූකල එපවත් ඇසූ යශොධරාදෙවී කම්පාවූ සිත් ඇතිව කඳුලෙන් පිරීගිය මුහුණින් යුක්තව කියන්නී "මම පෙර උන්වහන්සේට පක්ෂපාතව විසිම්නම් ඒ ස්වාමීන් කෙරෙහි සැබෑවූ සපිරගුණයකුත් ඇතිසේක්විනම් මා කෙරෙහිදු කාරුණකොට මේ ගෙටද ඒ හිමිතුමා නෝ වඩනාසේක්මය එසේ වැඩිකල වඳිමි" කියා නොගියාහ. සුද්ධොදනරජ්ජුරුවෝ එපවත් බුදුන්ට සැලකළකල්හි බුදුහු ඒ යශොධරාදෙවීන් සසර බොහෝකලක් පක්ෂපාතව ආ නිසා ඇමුල්කොටම පාරමිතාවන් කුළුගන්වා උන්ගේම සහායෙන් පුත්‍රභාර්‍ය්‍යාදී පරිත්‍යාග කොට දුන් ලොවුතුරාබුදුව මේ මුළුලොවට වැඩ කෙරෙමින් සිටියෙමි එහෙයින් කෘතොපකාරයෙහි මුදුන් පැමිණීමම සුදුසුයයි සිතාවදාරා බුද්ධාශනයෙන් පැනනැගී මහරජ

පාත්‍රය තෙපිම ගෙණ පෙරටුව යවයි වදූරා පියරජ්ජුරුවන් අතට පාත්‍රාධාතු න්වහන්සේ දීලා රජ පළමුකොට යවා තමන්වහන්සේ පස්සෙහි වඩනාසේක් සැරියුත් මුගලන් අගසවු දෙදෙනාවහන් සේ පමණක් කැටිව කැඳවාගෙණ වඩිමින් සිට උන්වහන්සේලාට වදූරණසේක් "මහණෙනි මම රාගාදී කෙලෙස්මුහුදු පීනා ගොඩ දූක සිටියෙමි ඒ යශෝධරාදෙවී තවද කෙලෙස්මුහුදම ඇවිදිනිය තව මා නැගී ඉවුරට නැංග නොහැකිවූවාහුය, ඈ සංසාරයෙහි දී මට බොහෝ දුක් ගත මාකෙරෙහි දීඝකාලයක් නොනැසී පැවති මහත්වූ ප්‍රෙමසමූහයත් ඇත්තීය ඈ සසරින් ගොඩනගාගන්නා තෙක් ඇගේම චරිතලෙස හැඩිමට අවසරදී සතුටුකරවමින් එසේ හඬාපියන ආස්වාදයක් ඕතොමෝ නොලද්දීනම් මාකෙරෙහි ශෝකයෙන් ලය පැලී මියෙයි එසේ ආස්වාදයක් ලද්දූනම් මාගේ සසුන් වැද මෙහෙණව දහසක් බිසෝවරුන් හා සමග අම්මාමහනිවන්පුර වදිනිය එහෙයින් ඈ තමා සිත්සේ හඬා වැලප ශොක නිවාගන්නා තෙක් කොයිකෙණෙක්වත් ඒහැඩීම නොවළක්වව"යි පළමුකොට වදූරමින් රාහුලමාතාවන්ගේ ශ්‍රීයහන්ගෙට පියරජ කැටිවම වැඩ පනවනලද බුඩාශනමඤ්චකයෙහි වැඩහුන්සේක. යශොධරාදේවීද එදූ බුදුන් හාමන්ගේ ගෙට වඩනාබැව් දූන පන්සියයක් පිරිවර ස්ත්‍රීන් හා සමග කෙස්වැටිය කපා හැර කසාවන්පිළි එකාංශ කොට පෙරවගෙණ වඩනාබව බල බලා සිටියාහු බුදුරජ අවුදින් වැඩඋන්වේලෙහි සාරාසඞ්ඛ්‍යකල්පලක්‍ෂයක් මුළුල්ලෙහි වැලැකමක් නැතුව් එක්ව අවූ ප්‍රෙම නැමති මහගංගාව තවතාගත නොහී එම ප්‍රෙමයෙන්ම උමතුව මම. වූකලී ස්ත්‍රීයක්වේද මුත්වහන්සේ ලොවුතුරාබුදුඋනසේක්දූයි සිහි එලවාගතනොහී බුදුන්ගේ ශ්‍රීපාදමූලයට ගොස් මුලින් සිඳ හෙලූ රන්ලියයක්සේ ශ්‍රීපාදමූලයෙහි වැටී බුදුන්දෙපය ගොජමස් අල්වාගෙණ ශ්‍රීපාපියුම් තමන් හිස්මුදුනෙහි තබාගෙණ හඩ හඬා ශොක සංසිඳුවා සිහි එලවාගෙණ නැවත බුදුන්කෙරෙහි හා මයිලණුවූ රජ්ජුරුවන්කෙරෙහි උපන් මහත්වූ ලජ්ජාභය ඇතිව මේ මා කෙළේ කුමක්දෝහෝයි සිතා භයපත්ව එකත්පස්ව උන්නාහුය· ඒ දුටු සුඩොදන රජ්ජුරුවෝ මේ කිමෙක්දෝහෝ මේ ලොකයෙහි කිසි දෙවියෙක් බඹෙක් මරෙක් රජෙක් සිටෙක් බමුණෙක් යන මොවුන් අතුරෙන් මාගේ බුදුන් ඇඟ අත්ගාහාට පොහොසත්වූ එකද සතෙක් නැත මා ලේලී ස්ත්‍රීව සිට බුදුන්ගේ පය අල්වාපුව එහෙයින් අනාදරවිදෝහෝයි සිතා දන්වන්නාහු ස්වාමීනි මාගේ යෙහෙළිණිවූ මේ යශොධරාදේවී නුඹවහන්සේකෙරෙහි අධිකවූ ප්‍රෙම ඇත්තිය නුඹවහන්සේට ඉතා බොහෝ පක්‍ෂපාතය නුඹවහන්සේ මහබිනික්මන්

කළද තුඹවහන්සේ සමහස්තයෙන් හිසකේවැටිය කපා දමුහයි අසා තුමූද ලෙයි අත් ගසාගෙණ මේ ශ්‍රායනන්ගෙටම දිව අවුදින් උනාප්කල වළඹ පැහැර තුන්පටකින් රැලි දිදී සිටගන්නාවූ අඳුන් රැසක්වන් හිසකේවැටිය නමා සියඅතින්ම කපාදමාපුව, තවද තුඹවහන්සේ කාශාවස්ත්‍ර හැඳ පෙරවනතැයි අසා තොමෝද නයි සළු නොහැඳ මේ සත්හවුරුද්ද මුළුල්ලෙහි මේ අද දක්වා කශා පිළිම හඳිනිය, තවද තුඹවහන්සේ එක්වේලේ වළඳින්සී අසා තොමෝද මේ සත්හවුරුද්ද මුළුල්ලෙහි අද දක්වාම රැබනෙත රය නොදන්නිය, තවද තුඹවහන්සේ මැටිපාත්‍රයක් ගෙණ සිඟා වළඳින්යී අසා තොමෝද මේ සත්හවුරුද්ද මුළුල්ලෙහි රන්වළඳ කින් නොකා මැටිපාත්‍රයකින්ම කැව, තවද තුඹවහන්සේ උසසුන් මහඅස්නෙන් මල්සුවඳ පැලඳිමෙන් දුරුසේකැයි අසා මේ සතහවු රුද්ද මුළුල්ලෙහි අද දක්වාම තොමෝද උසසුන්මහඅස්නෙන් දුරුව මල්සුවඳ දැරිමෙන් දුරුවූවාය, තවද මාගේ බොහෝවූ නෑ රජදරුවෝ අපි රකුම්හ අපි රකුම්හයි කියා වෙන වෙනම බොහෝ පඩුරු එවූකල ඒ තෙපුල් ගිවිස්නා තබා ඔවුන්ට තමාගෙන් තෙපු ලක් පමණකුත් නොදී තුඹවහන්සේට පක්ෂපාතව විසුව, මෙසේ මාගේ සෙහෙළිණියෝ තුඹවහන්සේ කෙරෙහි වෙන වෙනම ඉතාමහත්වූ ගුණපක්ෂපාතකම් ඇතියහ, එසේහෙයින් ඈ නොදුන කළ වරද ස්වාමිනි ක්ෂමාකොටවදාළමැනවැයි කීහ.

ස්වාමිදරුවූ බුදුරජානන්වහන්සේ වනාහි වෙස්සන්තර ජාතකයෙහි බමුණාට බැඳ දන්දෙනවේලෙහි කෘෂ්ණජිනා නම් ප්‍රියවූ දියනියන් තමන්වහන්සේගේ පය අල්වාගෙණ හඬනවේලෙහි උපන් මහාකරුණාවසේම ඒ දේවින් කෙරෙහිද ප්‍රියයෙකු පය අල්වාගෙණ හඬන දුවකකොට සිතා උපන් මහාකරුණා පතුරුවා වැඩහුන් සේක්මය—ඊට කාරණා කිමයත්?

පෙර සාරාසඞ්ඛ්‍යකල්පලක්ෂයකින් යට මාගේ බුදුත්ව පළමු වෙනි විවරණ දුන්නාවූ දීපඞ්කර නම් බුදුන් සමයෙහි එම රම්‍යවතී නම් නුවර කුලස්ත්‍රියක්ව සිට ඒ බුදුන් ගිහිකල අගමෙහෙසුන්වූ පදුමා නම් බිසවුන්ගේ ශරීරප්‍රභායෙන්ද අසූරියන්ගෙයි පහන් නොදල්වා ආලෝකව තිබෙන ශරීරාලෝකය හා රූපශ්‍රීය දැක ඒ කුලස්ත්‍රී තොමෝ මමද මෙසේවූ රූපශ්‍රීය ලද්දම්නම් යහපතැයි සිතා රූව ලබන පින්කම් කවරේදැයි කියා දනුමැතියන් අතින් විචාරා සිල්රක්ෂාකර ස්ත්‍රීහු රූපශ්‍රීන් අග්‍රවෙතියි අසා ඕතොමෝද බොහෝ ධන හැර තාපසවේශය හැරගෙණ පරිබ්‍රාජිකාව සිල් රක්ෂාකරන්නී මේ පිණින් මමද මතු රූපයෙන් අග්‍රව එක්තරා

බුදුකෙණෙකුන් බුදුවනජාතියෙහි මේ පදුමානම් අගබිසවසේම දහස්ගණන් ස්ත්‍රීන් පරිවරා අගබිසෝ වෙම්වයි පතපතා එම ජාතියෙහිදු බොහෝ! පින්කම් කරන්නාවූ ඒ පරිබ්‍රාජිකාවෝ එදු මාගේ බෝසතානන් විවරණ ලබනකල්හි බුදුන් පෙරමගට මල්ඇගෑ පහන්ඇගෑ බුලත්ඇගෑ මල්තොරණ පහන්තොරණ බුලත්තොරණ මල්විටි මල්කඩු සුවඳකඩු ගෙණ පින්ලොභයෙන් ඔවුනොවුන් පරයා දුවන මිනිසුන් දැක තුමූද මහනෙල්මල්මිටි අටක් ඉස තබාගෙණ දීපඞ්කරබුදුන් වඩනා පෙරමගට දුවගොස් ඒ බුදුන්ගේ අසූරියන් බුඩශරීරයෙන් දුවන සවණීඝන බුදුරැස්කඳින් හා දෙතිස්මහාපුරුසලක්ෂණයෙන් හා අසූඅනුව්‍යඤ්ජනලකුණෙන් දිලියෙන රූපශ්‍රීශොභාව දැක විස්මයපත්ව මහත්‍යතුටින් පිනා පිනා කියන්නී මේලොකයෙහි පින් ඇති ස්ත්‍රීහුනම් මේ ස්වාමීන් වැනි ස්වාමියකුහට පක්ෂපාතවූ ස්ත්‍රීයක්මයයි කිය කියා බල බලා සිටිනා තැනැත්ති පස්සෙහි වඩනා ඒ බුදුන් ගිහිකල පුතව උපන් සඳ එක්ව යන නැකත්තරුවක් වැනි උසභක්ඛන්ධනම්වූ පුත් මහතෙරුන්වහන්සේද දැක ඒ බුදුන්ගේ ශ්‍රීමුඛය හා පුතනුවන්වහන්සේගේ ශ්‍රීමුඛය ඒකාකාරසේ බලා අනේ මමද මෙසේ මතු බුදුකෙණෙකුන් හා එක්වැනිවූ මෙවැනිවූ පුත්රුවණක් වදුපීම්නම් ඉතා යෙහෙක එහෙයින් මෙබඳු පුත්සිරි මටත් වාසනා වෙවයි සිතූහ.

මෙසේ ලෝකයෙහි සෙසු ස්ත්‍රීන්ගේ මනාරූපශ්‍රී බල බලා මෙබඳු රූව මටත් ඇතිවේවායි සිතීමද, පුරුෂයන්ගේ ශොභාවික්‍රම බලා මේ පුරුෂයා මටම හිමිව වල්ලභවේවායි සිත්මද, අනුන් වැදූ දරුවන්ගේ සුරතල් ලීලා විලාස දැක මේවැනි දරුසිර මටත් ලැබේවායි සිතීමද, සියලු ස්ත්‍රීන්ගේම ස්වභාවධර්මයෙක්මය, ඒ කාරණයෙන් යට කීසේ සිත සිතා බුදුන්ගේ ශ්‍රී බල බලා ඔබට පුත් මහතෙරුන් එන ලීලාද බල බලා ඔවුන් මවු පදුමානම් බිසවුන්ගේ දරුසිරිද සිත සිතා දෑහොත් මුදුන් දිදී බුදුන් වැඳ වැඳ එන්නාවූ පරිබ්‍රාජිකාවෝ රත්හෙයක්සේ කඳුරැලිසේද දිවි පුදු වැදහොත් අපමහබෝසතානන් බුදුරජ දැකවදුරා මහණෙනි මේ සුමේධතාපසයෝ මතු ගෞතමනම් බුදු වෙතියි කියා යට කීසේ බුදුන්වදාළ විවරණකථා අසා මාගේ මේ ප්‍රාර්ථනාවද මේ වීරපුරුෂයා නිසා එකාන්තයෙන්ම සිඬවේමයයි සිතා එම්විටම බෝසතුන්කෙරෙහි ප්‍රෙම බැඳ තමා හිස තබාගෙණ යන මහනෙල්මල් අටමිටියෙන් පස්මිටියක් ගෙණ සුමෙධතාපසවූ බෝසතුන් නමට පුදා මේ ස්වාමීහු මතු බුදුවනකල් දක්වා මුහු සිත්සේ වාසය කොට ඔබ බුදුවන

ජාතියෙහි මේ බුදුහු දුන් විවරණකථාවෙහි වදාළ යශෝධරානම්
අයබිසෝ තනතුර මටම ලැබේවායි ඒ රාහුලනම් පුත්‍රරුවනද
ළාගේ කුසින් වදා දෙවම්මැයි කියා මහබෝසතානන් වට තුන්ය
ශලක් ප්‍රදක්ෂිණකොට පළමුවෙනි ප්‍රාර්ථනාව කළාය, එවිට බෝ
සතානෝ මුවෙන් නොබැණ ඉවසූ නිසා පරිබ්‍රාජිකාතොමෝ මේ
මා කළාවූ ප්‍රාර්ථනාව ඒකාන්තයෙන් සිද්ධවේමැයි කියා අතිශ
යින් සතොසාසදුවාය, ඒ පරිබ්‍රාජිකාවෝනම් දැන් මේ යශෝධරා
දේවීමය සෙසු අගසවු අසුමහසවු ආදිවූ මහාශ්‍රාවකයෝ පවා කප්
ලක්ෂයක් හෝ පෙරුම්පුරා ආවාහුය,මේ යශෝධරාදේවී දුරෙනිදා
නයෙහිදීම මෙසේ ප්‍රාර්ථනාකොට මේ සාරාසඞ්ඛ්‍යකල්පලක්ෂය
මුළුල්ලෙහි අපමහබෝසතානන් හා සමගම බෝසතානන් අත්
නොහැර මහත් පක්ෂපාතව ආවාහුය, මේ බුද්ධශාසනයෙහි මේ
යශෝධරාදේවීන්ට වඩා හෙතුසම්පත් ඇතිව ජාති ජාතිවල බුදුන්
හා එක්ව ජීන් කලාවූ අන්කිසිකෙණෙකුන් නැත්මය, එසේවූ පූර්
ප්‍රාර්ථනාබලයෙන්ම එක්වූතැන්පටන් මාගේ ස්වාමිදරුවානෝ
සසර ඇවිදින නොයෙක් අසඞ්ඛ්‍යගණන් ලක්ෂගණන් කල්පයන්
හැර බුදුවන මෙම කල්පයෙහි උපන් අනන්තජාතිදු හැර උදය
භද්‍රජාතකයෙහි උදයභද්‍රනම් රජව දශරාජධර්මයන් පුරා
ගන්නා සමයෙහි රත්රුවක් වැනි ස්ත්‍රීරූපයෙන් සත්සියයක් හවු
රුදු එකයහනේ සැතපී එතාක්කල් මුළුල්ලෙහි එකදවසක්වත්
බ්‍රහ්මචර්‍ය්‍යාව හෙදයක් නොකොට පිරිසිදු ශීලයම රක්ෂාකොට
බෝසතානන්වහන්සේ පළමුවෙන් මිය ශක්‍රදෙවේන්ද්‍රව ඉපද පෙර
කළාවූ ප්‍රතිඥාවලෙස උපන්තැන් හඟවන පිණිස දේවින්කරා
ගොස් ඔවුන්ගේ ශීලයද විමසනු පිණිස ලක්ෂයක් අගනා රත්න
ලියෙක අනඝ සතරන් පුරා අල්ලෙහි තබාගෙණ මධ්‍යමරාත්‍රි
යෙහි දෙවේන්ද්‍රවිලාසයෙන් තමා දක්වා කියනුයේ "දෙදෙව්ලොවට
අධිපති ශක්‍රදෙවේන්ද්‍රනම් මමය මාගේ අඩුතුන්කෙළක් සුරඟනන්
හැර තොපකෙරේ ලොභයෙන් ආයෙමි, තොප හිමි රජ මළහෙ
යින් තෙපි පරදූරාවෝද නොවෙති මිල පිණිස මේ සතරන් පුරාලූ
රත්තලිය දෙමි අද මේ එකරැයකට මට අවසර දෙව"යි කී වේ
ලෙහි "තෝ දෙවිරජෙක් වෙවයි මාගේ හිමිවූ උදයභද්‍රනම් රජ්
ජුරුවන් හැර අනිකෙකු නොපතමි ශක්‍රය තෝ අනික් දවසට මේ
දීසාවටවත් නොඅවුත් මාකෙරෙහි ආලය හැර යව්"යි අභිතනාද
පවත්වා ශක්‍රයා යවා දසදහසක්හවුරුදු මුළුල්ලෙහි පතිව්‍රතාධර්
යම මළහිමියන්වූ බෝසතානන් නාමටම රක්ෂාකොට සිල්ගුණ
පුරා පක්ෂපාතව සිටියේත් මේ යශෝධරාදෙවිමය.

මෙසේ මෙසේ අනෘවූද නොයෙක් ජාති කොටිසතසහස්‍රවල මහාවෙස්සන්තරජාතකයෙහි මද්‍රිදේවිව මහත් පක්ෂපාතකමින් මහබෝසතාණන් හා මහවල්වැද තපස් කරමින් පින් පුරාගත්කල් දක්වා ඒ බෝසතුන්ටම පක්ෂපාතව ඔතොමෝ පින්කම්හි හැසිරි මෙන් අපමහබෝසත් නිසාම දුක් ගත්බැව් වෙන්වෙන්ව ලියත් හොත් නොනිමෙනහෙයින් බුදුගුණආදී අන්කිසිවක් මෙහි නො ලියමෝද එහෙයින් එම දේවීන්ගේ ගුණකථාවන් විස්තරවශයෙන් අසනු ලබනු කැමැත්තන් විසින් ජාතකකථාවන් අසා බලා දතයුතු.

මෙසේ රාහුලමාතාවෝ බුදුන්ටම පක්ෂපාතව ආබැවින් ඒ ඒපූර්ව චරිතයන් පරීක්ෂාකොට අතීතාංශඥානයෙන් බලාවදාරා පියරජ තමන් යොහෙතිවූ ඒ යශෝධරාදේවීන්ගේ ගුණපක්ෂපාතකම් හඟවා කී බසට බුදුරජ වදාරණසේක් මහරජ මා මෙසේ බුදුවන ජාතියෙහි ඈ රහත්වන ජාතියෙහි ඉපද සිට මට මෙසේ පක්ෂපාතව විසූසේ ආශ්චර්යයෙක් නොවෙයි පෙර නුමුහුකළ නුවණ ඇතිකල සඳකිඳුරුව උපන්නැන පවා මාකෙරෙහි ප්‍රෙමයෙන්ම මාගේ ජීවිතය රැකදී නොයෙක්ලෙසින් උපකාර මාකෙරෙහි කළාවේදැයි යනාදීන් යශෝධරාදේවින්ගේ ගුණකථා ප්‍රතිසංයුක්තවූ "චන්දකින්නර ජාතක" දෙශනාව කරවදාළසේක. ඒ ධර්මය අසා සඳැට්ටුව එකොණ්හි යශෝධරාදෙවි පස්වණක් ප්‍රීතින් පිනාගියහ, පියරජහටද මහත් ප්‍රීති පහළවිය.

ඉක්බිත්තෙන් මාගේ ස්වාමිදරුවූ බුදුරජානන්වහන්සේ බුඩාසනයෙන් පැනනැගී එයින් නික්ම නිග්‍රොධාරාමයට වැඩ එහි එදා රාත්‍රිභාගයෙහි දවස් යවා ඊට දෙවනදා උදෑසනම රජගෙට වඩිනාසේක් ස්වකීයමාතෘවූ මහාමායාදේවීන්ගේ වියොගඅපදායෙහිතමන්වහන්සේ වඩා රක්ෂාකළ කුඩාම්ෑනියන්වූ මහාප්‍රජාපතිදේවින් විසින් වදනලද සුඬොදනරජ්ජුරුවන්ට දුව උපන් නන්දකුමාරයන්ගේ කඩු බඳනාමගුල ගෙවදනාමගුල ජනපදකල්‍යාණී නම් රාජකුමාරි සරණකරණමගුල යන මගුල් තුණම එ..වසට පැමිණියේය. මා හිමිවූ සියල්ල දත් බුදුරජද ඒ ප්‍රව්‍රාජිත බුඩඥානයෙන් දැකවදාරා, මාගේ මලණුවූ නන්දකුමරුවා කාමබන්ධනයෙහි බැඳී ගියේනම් සසරින් මුදාගතනොහැක්ක එහෙයින් මම දැන්ම ගොස් ඔහු මහණකරවාගණිමි සිතාවදාරා විසිදහසක් රහතන්වහන්සේ ගෙණ මහත්වූ බුඩශ්‍රීන් දිලිහි දිලිහී ඒ නන්දකුමාරයන්ගේ මගුල් මාලිගාවට වැඩ පනවනලද බුඩාසනයෙහි වැඩහිඳ:—

තපො ච බ්‍රහ්මචරියා ච අරියසච්චානදස්සනං
නිබ්බානසච්ඡිකිරියා ච එතං මඞ්ගලමුත්තමං.

යනාදීන් මඟුල්බණ වදුරා මලණුවන් පැවිදිකරගැන්මට විහාරයට ගෙණ යනු පිණිස පාත්‍රාධාතුව නන්දකුමාරයන්කරා දිගුකොට වදාළසේක එකෙණෙහි නන්දකුමාරයෝ සර්වාභරණයෙන් සැරහී මඞ්ගල්‍යවිධාන කරන්නාහුම බුදුරජ අඟුකළ පාත්‍රය ආදරයෙන්ම දෙඅත්ලෙහි තබාගෙණ සිටිකල්හි බුදුහු එකෙණෙහි බුද්ධාසනයෙන් පැනනැඟී නිග්‍රොධාරාමය බලා නික්මුණුසේක· නන්දකුමාරයෝත් පාත්‍රාධාතුව ගෙණ බුදුන්ට පසු යනුයේ හිණිමන්පඩිය මුලදී දොරකඩදී පාත්‍රය ගෙණවදාරණසේක්දෝහෝයි සිතා පසු පස්සෙහි එක්වම යන්නේය, බුදුහු පසු නොබලාම වඩනාසේක්මය, එකල ජනපදකල්‍යාණී නම් රාජකන්‍යාව ඒ යනා නන්දකුමාරයන් දැක තමා වසන ප්‍රාසාදයෙහි මතුමාලේ කවුළුව හැර ග්‍රීවය දිගුකොට කුමරුවන් මුහුණ බලා හිමි ඔබ නොරැඳ වහා දිව එවයි කිව, එතෙපුල් අසා නන්දකුමාරයන්ගේ ලය කම්පාව මහත් ආයාස විද විඳව යනුවෝ පාත්‍රය වහල්කඩදීවත් හැරගන්නාසේක්දෝහෝයි සිතා ගොස් බුදුරජ පසු නොබලාම වඩනාහෙයින් හැම ලෙසින්ම ජ්‍යෙෂ්ඨ බුදුන්කෙරෙහි ආදර ගෞරවසිතින් පාත්‍රය ගනුමැනවැයි කියාගත නොහී නොරිසියෙන්ම විහාරයට ගියේය. එකල්හි බුදුහු නන්දකුමාරයන් ලඟට කැඳවා නන්දය චක්‍රවර්තිරාජ්‍යය හැර මා වැනියන් මහණවූකල තා වැනියන්ට ගිහිගෙයි ආලය කිම දැන්මම තෝ මහණවෙවයි වදාළසේක. නන්දකුමාරතෙම බුදුන් වදාළබසට අනික් උත්තරයක් කියනොහී ජනපදකල්‍යාණීන් සිතසිතා සිටියහ· එවිටම බුදුහු නන්දයා මහණකරවයි සැරියුත් මුගලන් දෙදෙනාවහන්සේට වදුරා ඔහු හිසකෙස් කපා මහණකළසේක· මහණවූතැන්පටන් ඒ නන්දසාමණෙරතෙම භික්ෂුයයුතු ශීලාදී ගුණධර්මයන් හැර ජනපදකල්‍යාණීන්ගේ රුව සිතසිතා එද නුවන්කෙළවරින් බැලූ බැලුම් සිතසිතා එද කී බසම සිතසිතා කඳුළු ගෙණගෙණ ජනපදකල්‍යාණියකෙරෙහි ශොකකෙරෙයි, සමහර භික්ෂූහු ඒ කාරණය දැක ඇවැත්නි තෙපි බුදුන්ගේ මලණුව මහරජකුලෙන් පැවිදිවූ සුඛිතයහ, තොපට දුක් කිම්ද? දවසින් දවස දුර්වලවීමට කාරණ කිමැයි විචාළතැනනන්දසාමණේරයෝ ඒ අසා ස්වාමීනි අන්කිසිදෙයකින් මට දුකෙක් නැත ජනපදකල්‍යාණියට ශොක බලවත්හෙයින් දුර්වලවෙමියි කීසේක, භික්ෂූන්වහන්සේ එතෙපුල් අසා බුදුන්කරා ගොස් දැන්වූසේක, බුදුහු ඒ නන්දසාමණෙරයන් කැඳවා සැබෑද නන්දය තෝ මාවැනි බුදුකෙණකුන්කෙරෙහි මහණව ස්ත්‍රියකෙරෙහි කළ ලොභයෙන් ශොක කොට වාසයකෙරෙයිදැයි විචාළසේක. නන්දසාමණෙරයන්වහන්සේ එසේය ස්වාමීනි ජනපදකල්‍යාණී එදවස් මා පාත්‍රය

අතින් ගෙණ තුඹවහන්සේ කැටිව එනවේලෙහි හිමියානෙනි ලස්වම එවයි කියා රන්කලසක කරක්වන් තමාගේ කර දිගුකොට මා මුහුණ බැලුව ඇගේ රුසිරු සිතුකල මට ඉතා මහත් දුඃඛශොක උපදනේය ඉන් මාගේ ලය නිරන්තරයෙන් කැතියන්නේයයි කිව, ඒ අසා බුදුහු නන්දය තාගේ ජනපදකල්‍යාණි නම් ස්ත්‍රියගේ රුව හොඳදැයි විචාළසේක. එවිට නන්දසාමණේරතෙම ලොව මුලා හැම පිරිමි බඳෙන් බැඳෙනසේ සඳ ලූ මලක්වැනි ඒ ජනපදකල්‍යාණීන්ගේ රූපය තමා රුවලෙසින් දත්හෙයින් බුදුන් ඉදිරියෙහි සිට වර්ණනාකලේය, එකල ස්වාමදරුවෝ නන්දන බලා බෙංගහ කොට ව්‍යාධි සිංහිඳුවුන ඉතා දක්‍ෂ වෙදෙකුසේ මාගේ මලණුවන්ගේ ස්ත්‍රී ලොභය කෙසේ දුරුකෙරෙම්දැයි සිතාවදුරා ඊට නිසි උපදෙසක් දැක නන්දය තෝ ජනපදකල්‍යාණියට වඩනා රුව ඇති ගෑණුන් ලොව නැතැයි කිව ඇට වඩනා ගෑණුන් තෝ දක්නාකැමැත්තෙහිදැයි වදාළසේක. ඒ ඇසූ නන්දනම් මහණ තමාරුපමලෙහි බැඳිහුන්හෙයින් කියහුයේ ස්වාමීන් එසේවීනම් මට උන් දක්වාවදාළමැනවැයි කීහ. එකෙණෙහි මාගේ ස්වාමිදරුවෝ නන්දසාමණේරයන්ගේ අත අල්වාගෙණ සෘද්ධිබලයෙන් මහත් රුව මාගමුන් ඇති ශක්‍රපුරයට වඩනාසේක් අතරමග මහත් වනමධ්‍යයෙහි අලුත දැගිය දලිසේනක් මවාලා ගින්නෙන් දැ සිටි කණුයෙක එම ගින්නෙන්මදැ මිය ගිය කන් නාසා නගුටු නැති වැදිරිමැහැල්ලක දත් තියාගෙණ ඉතා විරූපිව උන් නාසේ දක්වා පෙන්නමින් නන්දය පොල දැගිය වැදිරිමැහැල්ල තොපි දිටිදැයි විචාරාවදාළසේක එවිට මමත් දිටිමයි ස්වාමීනි කියා කම්පාවුසේක. ඉක්බිත්තෙන් බුදුරජ ශක්‍රයාගේ නන්දනොද්‍යානයට වැඩ ඔහුගේ දිව්‍යස්ත්‍රීහු මෙතනට රැස්වෙත්වයි සිතාවදාළසේක. එකෙණෙහි ශක්‍රයාගේ අග්‍රමහෙසීවූ කකුටපාදිනී නම දිව්‍යාඞ්ගනාවෝ පන්සියයක් අවුත් බුදුන් වැඳ සිටිකල්හි ඔවුන්ට බණ වදරා නන්දසාමණේරයන්ට ඒ දිව්‍යස්ත්‍රීන්ද පෙන්වා ශක්‍රපුරයෙන් වැඩ නැවත නන්දසාමණේරයන් කැඳවා නන්දය මේ දිව්‍යාඞ්ගනාවෝ ජනපදකල්‍යාණියගේ රුවට වඩනා රූ ඇත්තාහුදැයි විචාළසේක. හෙතෙම කියහුයේ ස්වාමීන් දිව්‍යාඞ්ගනාවන් දුටු ඇසට ඒ ජනපදකල්‍යාණීන්ගේ රුව පළඹුව දුටුවාවූ දැගිය සේනන් දලිකණුවෙහි දැ මිය හොත් වැදිරිමැහැලිකුනසේම ඉතා පිළිකුල්ව සිතම් කීසේක. ඒ අසා බුදුහු නන්දය එසේවූ දිව්‍යාඞ්ගනාවන් ලබනුකැමැත්තේවීනම් තෝ මාගේ ශාසනයෙහි නිර්මලකොට සිල්රක්‍ෂාකරමැනව එසේ සිල් රක්‍ෂාකළවුන්කරා දිව්‍යාඞ්ගනාවෝ තුමූම එති ඒ දෙවඟණන් මාකරා අවුදින් වැඳසිටිලෙස තෝම දුටුසේවේදැයි වදුරා කුමටහන් උගන්වා

වැදළසේක. ඒ නන්දසාමණේරද අඛණ්ඩගුණවත් ලබම් යන සිතින් ඒ නිර්මලවූ ශීලයම රක්‍ෂාකොට නොබෝකලකින් කමටහන්ගත් ලෙස විදශිනා වඩා රහත්ව "නන්දමහතේරුන්වහන්සේය" යන නමින් බුදුසසුන නැමති ආකාශයෙහි පුන්සඳක්සේ ප්‍රසිඬවූසේක.

මෙසේ බුදුරජානන්වහන්සේ කිඹුල්වත්නුවරට වැඩි තුන්වෙනිදා නන්දකුමාරයන් මහණකරවා සත්වෙනිදා විසිදහසක් රහතන් පිරිවරා සවණක්රැසින් දිලිහිදිලිහී පියරජහුගේ රජගෙයිදී වළඳන්ට වඩනාසේක. එකල්හි යශොධරාදේවි තමන් පුත්වූ සත්හැවිරිදි රාහුලකුමාරයන් සැඳවා ඇකයෙහි හිඳුවාගෙණ සිඹ සනහා පුතණුව රාහුලකුමාරයෙනි තොප පියානන්වහන්සේගේ සත්රමහ නිධානයෙක් ඇත එයින් එක් නිධානයෙක් ගවුවෙක එක්නිධානයෙක් දෙ ගවුවෙක එක් නිධානයෙක් තුන්ගවුවෙක එක් නිධානයෙක් සතර ගවුවෙක ප්‍රමාණවට්න් ඇත් තාහුය, ගැඹුර මෙතෙකැයි පමණ දත් නෝ නැත, තොපගේ ඒ පියානන්වහන්සේ මහණවූතැන්පටන් එම සතරමහනිධානයෝ කොතනදබවත් දන්නෝ නැත, තවද ඔබට පහළවන්ට තිබූ සත්රුවන් හා චක්‍රවර්ත්තිරාජ්‍යයකුත් ඇත, පියානන් සතුසැවූ සම්පත් දරුවන්ට අයිතිවීම ලොකධර්මතා වෙති එහෙයින් තොපි පියානන්වහන්සේකරා ගොස් ඒ සතර මහානිධානය හා සත්රුවන් හා සක්විතිරාජ්‍යය ඉල්වා ගණුවයි කීහ, රාහුලකුමාරයෝ තමාගේ මුත්තානුවූ සුඬොදනරජ්ජුරුවන් හඳුනනබව මුත් තමන් උපන්කලම මහණවීමට නික්ම ගිය පියානන්වහන්සේ කවුරුද යනබවත් තමා නොදන්නාහෙයින් අම්ම මපියානෝනම් කවුරුදැයි විචාළහ. එවිට යශොධරාදෙවි ඒ රාහුල නම් පුතනුවන් වඩාගෙණ සිවුමැදුරුකවුළුවෙහි දොර හැර රාජවීථියෙහි දෙතිස්මහාපුරුෂලක්‍ෂණයෙන් හා අසූ අනුව්‍යඤ්ජන ලක්‍ෂණශ්‍රිශොභායෙන් දිලිහි දිලිහී රන්කඳක්සේ සවණක් රැස් විහිදුව විහිදුවා අනොපමවූ බුඬලීලායෙන් යුක්තව විසිදහසක් පමණ රහතන්වහන්සේන් පිරිවරාගෙණ දුරින්ම වඩනා බුදුන් දක පුතණුව අර වඩනා බුදුරජානන්වහන්සේ තොප පියානෝයයි අතදිගු කෝට පාලා:—

චක්කවරඞ්කිතරත්තසුපාදො
ලක්ඛණමණ්ඩිතආයතපණ්හි
චාමරඡත්තවිභූසිතපාදෙ
එස හි තුය්හපිතා නරසීහො.

සක්‍යකුමාරවරො සුකුමාලො
ලක්ඛණචිත්තිතපුණ්ණසරීරො
ලොකහිතාය ගතො නරවීරො
එස හි තුය්හ පිතා නරසීහො.

පුණ්ණසසඞ්කනිභො මුඛවණ්ණො
දෙවනරානපියො නරනාගො
මත්තගජින්දවිලාසිතගාමී
එස හි තුය්හ පිතා නරසීහො.

ඛත්තියසම්භවඅග්ගකුලීනො
දෙවමනුස්ස නමස්සිතපාදො
සීලසමාධි පතිට්ඨිතචිත්තො
එස හි තුය්හ පිතා නරසීහො.

ආයතයුත්තසුසණ්ඨිතනාසො
ගොපඛුමො අභිනීලසුනෙත්තො
ඉන්දධනූ අභිනීලභමූකො
එස හි තුය්හ පිතා නරසීහො.

වට්ටසුවට්ටසුසණ්ඨිතගීවො
සීහහනූ මිගරාජසරීරො
කඤ්චන සුච්ඡවි උත්තමවණ්ණො
එස හි තුය්හ පිතා නරසීහො.

සනිද්ධසුගම්භිරමඤ්ජුසුඝොසො
හිඞ්ගුලබන්ධුසුරත්තසුජිව්හො
වීසති වීසති සෙතසුදන්තො
එස හි තුය්හ පිතා නරසීහො.

අඤ්ජනවණ්ණසුනීලසුකෙසො
කඤ්චනපට්ටවිසුද්ධලලාටො
ඔසධිපණ්ඩරසුද්ධසුඋණ්ණො
එස හි තුය්හ පිතා නරසීහො.

ගච්ඡති නීලපථෙ විය චන්දො
තාරගණා පරිවෙඨිතරූපො
සාවකමජ්ඣගතො සමණින්දො
එස හි තුය්හ පිතා නරසීහො.

යත මේ නරසීහගාථාවන් බැඳගෙණ පෙර තමන් බුදුවන්ට පල මුව එක්ව විසූ ඒ බෝසතානන්ගේ වියොගදුඃඛයෙන් නිරතන

රයෙන් ශෝක කරමින් ගාථානාකොට හූන් ඔවුන්ගේම රූපවර්ණ
නාවූ ඒ ගාථාවන් පුතනුවන්ට උගන්වා පුතණුව තොප පියානන්
වහන්සේනම් එසේ මෙසේ ස්වල්පකෙණෙක් නොවෙයි දෙපතුල්
පුරා සිටි දෙසියසොළසක් මඟුල්ලකුණෙන් හා රන්වැටිබඳු ඇඟිලි
පෙළෙන්ද ක්‍රමොන්නතවූ රන්වන් ජඞ්ඝායුග්මයකින් හා රන්
කඳක්බඳු බුදුබඳෙනින් හා කල්පද්‍රැමශාඛායුග්මයක්බඳුවූ ශ්‍රීහස්ත
දෙකකින් හා පුන්සඳක් වැනි ශ්‍රීමුඛයෙනින් හා විදුලිය වැනි කන්
සහලෙකින් හා රන්අකුස්සක් වැනි උස්වූ නාසිකාවෙකින් හා පස්
පැයෙන් දස්නා ඉන්ද්‍රනීලමාණික්‍යයුගමයක් වැනි ඇස්සගලකින්
හා දෙවුදුනු වැනි බැම්සහලකින් හා රන්ගල් මුදුනෙහි දිලිහෙන
පුන්සඳක් වැනිවූ නළල්තෙල බබලන දක්ෂිණාවෘත්තව අක් උඩුව
සිටි ඌර්ණරෝමයකින් හා ඉන්ද්‍රනීලමාණික්‍යයසේ නිල්වන් සිරස
කින් හා වඩුරියනක් උස සිරසමුදුනෙන් නිකුත්ව දිලිහෙන කෙ
තුමාලා නම් ලද රශ්මිකදම්බයකින් හා හිරුරැස්කලඹ වැනි සිය
ලඟින් නික්ම යන ෂඩ්වර්ණරැසින් බබලන්නාවූ ඇත්රජකුගේ
ගමන් පරයන මනොහර ගමන් ඇති හැම ලෝවැඩ පිණිස අති
කක් මිශ්‍රනොව එකම කරුණාවෙන්ම මවාලූ රුවක් වැනි එසේම
මෛත්‍රියෙන් මුදිතායෙන් උපෙක්‍ෂාවෙන් දානයෙන් ශීලයෙන් ප්‍රඥා
වෙන් වෙන්වෙන්ව එකිනෙක ගුණයෙන්ම මවාලූ රුවක් වැනි
බඳුවදමල් වැනි සුරත්නවූ පාංසුකූලචීවරසහළෙකින් තමන්ව
හන්සේගේ රන්වන්වූ ශරීරය වසාගෙණ හිරු පරදවන තෙජසින්
සඳු පරයන සොම්ගුණෙන් බැලූබැලූවන් ඇස් නිවමින් කන් නිම
වමින් සිත් නිමවමින් පිදුපිදූවන්ට දෙව්බඹසැපත් දෙවමින් තුඩ
තුඩ සාධුකාර දෙවමින් විසිදහසක් රහතන් පිරිවරාගෙණ මඩුලු
සඳක්සේ සිසාරා සිටගත් බුද්ධප්‍රභාමණ්ඩලය මැද මහබඹුසේ රූ
සිරින් දිලිහිදිලිහී වඩිනේ තොප පියානන්වහන්සේයයි ඔබ
අතුල්පතුල්සේ තොපගේ අතුල්පතුල් එක්වැනිබව බැලූවමැනව
යනාදී නොයෙක් කාරණ කියා මේ මේ කාරණයෙන් සැබවින්ම
ඔබගේම පියානන්වහන්සේමය එහෙයින් භය නොවම ලඟට
ගොස් සිවුරුකොණ අල්වාගෙණ සිට හැමලෙසින් තොප සමා
නවූ එක්වැනි රූ ඇතිබව දක්වාලා සොඳ සුරතල්වූ ප්‍රියතෙපුල්
කියා ඔබකෙරෙහි දයාපෙම්බර වැඩිකොටගෙණ දරුදායාද ඉල්
වාගනමැනව එසේ ගෙණ පුතණුව තුඹ සතරමහදිවයිනට අධිප
තිව චක්‍රවර්තිරාජ්‍යය කරන්නැයි උගන්වා නැවත පුතනුවන්
වඩාගෙණම සත්බුමුමහපායෙහි යටමහලට බැස මහපඩිකදපිට
සිටුවා සර්වාභරණයෙන් සැරහූ රාහුලකුමාරයන් යවා තුමූ මතුමහ
ලට නැගී සිංහපඤ්ජරයෙන් බලබලා නොපෙනී සිටියාහ. එකල්හි

ඒ කුමාරතෙම කුමාරපිරිස් පිරිවරා යන්නෝ බුදුරජ පියානෝයයි
කියකියා අස අසා සතුටු සතුටුව අව මවුන්දැ කීලෙසම නොබා
ගොස් බුදුන්ගේ සිවුරුකොණ අතින් අල්වාගෙණ අටතුරාසියක්
මඟුල්ලකුණෙන් ශොභාමානවූ ශ්‍රීපාදයට තුදුරුතැන පියානන්ව
හන්සේය යනප්‍රෙමයෙන් භය නැතිව තමන්ගේ පතුල්සුත්දෙක
සමකොට තබා සිට බුදුන්ගේශ්‍රීමුඛය බලබලා මපියානවූ භගවතුන්
වහන්ස මට ඔබගේ දායාද හැම දුනමැනව මට ඔබගේ රූපම
ඉතා ප්‍රියතරය ඔබඇඟින් දිවනරැස් මා ඇඟට හොඳසැපය එහෙ
යින් ඔබ මාගේ පියානෝමයයි කියකියා ශ්‍රීමුඛයබලබලා ලදබොල
දවූ නොයෙක් සොඳ සුරතල්වචන කීහ· එකල්හි ඒකුමරුතේම සි
යල්ලෝ දරුකොට ගත් මාගේ බුදුරජානන්වහන්සේ රාහුලකුමාර
යන්ගේ ඇඟිල්ල ශ්‍රීහස්තයෙන්ම අල්වාගෙණ වරෝදරුව මා ලත්
දැනට දායාදකොට දෙමි කියකියා කුමරසිත නගනගා සිංහදැටව
කු එක්වම ගෙණ යන සිංහරාජයෙකුසේ පුත්රුවණ හා එක්වම
රජගෙයකරා වැඩිසේක. එදුදවස ශාක්‍යකෝලිය දෙනුවරින් රැස්
වූ රජදරුවන්ට හා සියලු අනුන්ට යමාමහපෙලහැරද මෙන් ඉතා
මහත් සනතොෂ උපන,ඒ දූත විස්මයපත්ව සාධුකාර නුදුන් එකද
සත්වකෙණෙක් නැත,අහෝ දරුසිරිනම් මෙබඳුදෙයකැයි සතුටුක
ඳුලෙන් දෙනුවන් නොතෙමු එකද දරුලත් කෙණෙක් නැත' හැම
සත්හුම මෙවෙනිපෙළහරෙක් මෙවෙනි මහිමයෙක් මෙවෙනි වික්‍ර
මයෙක් මෙවෙනි බුහුටිකමෙක් මෙවෙනි නිර්භිතකමෙක් අනේ
මා දරුවන්ටත් මාදරුවන්ටත් වෙවයි කියකියා සිතසිතා බලා සි
ටියාහුය· එසේ හැම දනන් සතුටුකරවා රජගෙට වැද පණවනලද
බුඩාසනමස්තකයෙහි වැඩසිට වළඳවදුළසේක. එවිට රාහුලකුමා
රද දායාද ඉල්ව ඉල්වා බුදුන්ලඟ සිවුරුකොණ අල්ව අල්වා සිටියම
ය, බුදුහු වළඳ අනතුයෙහි රජගෙන් නික්ම වඩනාකල්හිද රාහුල
කුමාරයෝත් සිවුරුකොණ ගැව්නැවීම දායාදලොභයෙන් පෙරසේම
ඉල්ව ඉල්වා යනකල්හි බුදුහු රාහුලය තෝ නැවතී සිටුවයි වදා
රණ අවසරයක් නැතිහෙයින් ඔවුන් නවත්වා සිටුවාගන්ට නිසි
අන්කිසිකෙණෙක් එහි නැත්මය,මවුවූ යශොදරාදේවී එසේ බුදුන්
කැටිවම යන පුතනුවන් බලබලා අනේ කිමෙක්දෝහෝ තාඳකුම
රුවාසේ මපුතනුවනුත් ගෙණ ගොස් මහණකරගන්නාසේක්දෝ
හෝ මම දායාදය ඉපත් තබා මපුතුන් පමණවත් ලදිම්නම් යහප
තැයි සිතසිතා කඳුලෙන් නුවන් තෙමතෙමා ශොකපත්ව හඬමින්
බලාසිටියාහ. බුදුරජ රාහුලකුමාරයන් එක්වම විහාරයට වැඩ
වත් සිතාවදූරණසේක් මේ කුමාරතෙම තමන් පිතුසන්තක ලෞ
කිකධනයම උතුමැයි සිතා ඉල්වන්නේය ඒ ධනය වනාහී තමා

බාලබැවින්ම පතයි සියලු දුක්සංසිඳීමය යන නෛර්වාණය පිණිස
නොවනබව නොදන්නේය ඒ ධනය ලොව ඇති හැම දුකට මුල්ව
සිටින්නේය තමා සපයා විඩාවූ කිසියන් හැර වෙන්වීමම ස්වභාවකොට
එකාන්තයෙන්ම ඇතියහ, එහෙයින් රන්රිදීකෙත්වත් ඇත්අස්ආදී
හැම ලෞකිකසම්පත්තිම ලොව රජදරුවෝද පැහැරගන්නාහුය
සොරුන්ද සොරාගන්නාහුය දියගිනිඅප්‍රියන් කෙරෙහුද නැසියන්
නේය එම ධනය ඊසා කායවච්මනෝ යන තුන්දොරින් සඞ්ඛ්‍යාට
හැම අකුසල්කර්ම පිරෙන්නේය තණ්හාවද විශේෂයෙන් වඩ්ගීය ඒ
තණ්හාදිය නිසාම අසුබදඬුමුගුරු ගැණීමෙන් කලහවිග්‍රහවිවා
දුදීසට පැමිණ අනෙකප්‍රකාරවූ ලාමක අකුශලධර්මයෝ පහළවන්
නාහුය, එහෙයින් මම පාරමිතාබලයෙන් බෝමැඩදී ලත් ශ්‍රද්ධාදී
සප්තාවිධවූ උතුම් ආර්‍ය්‍යධනයම එයට හිමිකරමියි සිතා·වදුරා සැරි
යුත්මහතෙරුන් කැඳවා සාරිපුත්‍රාචාර්‍ය්‍යය මේ රාහුලකුමාරමා අතින්
දායාදසම්පත් ඉල්වයි එහෙයින් මොහුට නොනස්නා ධනයම දෙන
පිණිස මහණකරවාලවයි වදාළසේක රාහුලකුමාරද තමා කෘතා
ධිකාර මහප්‍රණිධිහෙයිනුත් බොහෝජාතිවල බුදුන්ට දරුව තිකරු
වම ආහෙයිනුත් මහණකරවයි වදාළබස් අසා මපියානෝ මට අද
උතුම්ධනයක්ම දී වඩක්ම සාධහසේකැයි සිතසිතා සතුටුසතුටුව
උන්හ· එවේලෙහි සැරියුත්මහතෙරුන්වහන්සේ රාහුලකුමාරයන්
ගේ ඉසකේ කපා බුදුන් අභිමුඛයෙහිදීම මහණකළසේක·

සුද්ධොදරජ්ජුරුවෝ මුණුබුරානන් මහණකළහයි අසා මහත්වූ
ශොකයෙන් බුදුන්කරා අවු මහාඬින් හඬා බුද්ධරජානන්වහන්ස
තුඹවහන්සේගේ ශාසනය අව්වාරවූ සස්නෙක්ද මවුපියන්කෙරෙ
හි සරුහරු නොකරණ ශාසනයෙක්ද තුඹවහන්සේත් මටනොකී
යා සැඟවී ගොස් මහණවූකල්හි අනල්පවූ දුක් මට උපන, එසේම
මාගේ කුඩාපුතනුවූ නන්දකුමාරයිනුත් නොදන්වා උදුරාගෙණ
මහණකොට ගත්සේක, මාගේ මුණුබුරානන් උපන්දාම තුඹවහන්
සේ මහණවන්ට ගියහෙයින් මවිසින් වඩා ඇති කොට ගෙණ තුඹ
වහන්සේගේ අතුල්පතුල්ආදි හැම පුරුෂලක්ෂණ වැනි ඔහුන්ගේ
රුසිරුම් බලබලා ඔබ නොදුක්මෙන් මට උපන් මහාශොක තුනී
කොටගනිමි එසේවූ ඒ රාහුලකුමාරයන්ද මහණකොට ගත්සේක,
එයිනුදු මටනොඉවසියහැකිවූ අධිමාත්‍ර දුක් උපන ,ස්වාමිවූ භාග්‍ය
වතුන්වහන්ස මම වනාහි බුද්ධමාමිකය ධර්මමාමිකය සඞ්ඝමාමිකය
එසේත් ඇතිව සිට තමන්ගේ ජ්‍යානන්විසින්ම පුතනුවන් මහණ
කළකාරනයෙන් උපන්දුක් ඉවසාගතනොහෙනයාල· සෙසු ජන
යෝ දරුමුනුබුරන් පැවිදිවූකල්හි කෙසේනම් දුක් ඉවසන්නාහු
වෙද්ද එහෙයින් මාගේම ස්වාමිදරුවූ බුදුරජානන්වහන්ස අද මුට

උපන් දරුශොකයගේ දරු ලූත් ලොව සියලු දෙමවුපියන්ට ශොකයක් නොවනුකැමැත් තෙමි එහෙයින් මට අනුකම්පාපූර්ණස නුඹවහන්සේ දෙමවුපියන්විසින් අනුනොදත් දරුවන් මහණනොකකරණසේ ඒ වරය මට දුනමැනවයි කියා යාඥා කළහ. එකල්හි ඒ රජහට භාග්‍යවතුන්වහන්සේ ඒවරය දෙවාවදාරා මෙලෝපරලෝ දක්වා කරණලද ධර්මකථායෙන් රජ්ජුරුවන් සතුටුකරවා අවසර දීයවා, ඉක්බිතිව භික්ෂුසඞ්ඝයා රැස්කරවා "න භික්ඛවෙ අනනුඤ්ඤාතො මාතාපිතූහි පුත්තො පබ්බාජෙතබ්බො"යි යනුයෙන් දෙමවුපියන්විසින් අවසර නුදුන් දරුවන් පැවිදි නොකරණසේ ශික්ෂාපද පනවා වදාළසේක.

බුදුරජානන්වහන්සේ ඊට දෙවෙනි දිනයෙහි පෙරවරුහැඳ පෙරව විසිදහසක් රහතන්වහන්සේත් පිරිවරා රජගෙට ජබූ පිණිස වාඩ පනවනලද ආසනයෙහි වැඩහිඳ උදය කැඳ අවුලුපත් වළඳ දහවල්බත් වළඳන වේලා එනතෙක් පියරජ්ජුරුවන් හා සමග සතුටුවියයුතු ධර්මසාකච්ඡාවන කථාකරමින් වැඩහුන්සේක. එවිට සුඩොදනරජ්ජුරුවෝ ස්වාමීනි නුඹවහන්සේ දුෂ්කරක්‍රියා කරණකල එක් දෙවිදුවක් රාත්‍රිභාගයෙහි අවුදින් මට කියන්නී තොප පුතනුවෝ සිද්ධාර්ථකුමාරයෝ බත් නැතිව වියලිගොස් සක්මන්කෙළවර වැටී මළහයි කිව, ඈ කීබස් අසා මම මාගේ පුතනුවෝ ලොවුතුරාබුදුව මූත් නොමියනසේකැයි කීමි කීහ. ඒ අසා ඕතොමෝ දෙවැනි තුන්වැනිවත් එසේම කිව, ඒ මම නොඇදහිමියිකිව, බුදුහු ඒතෙපුල් අසා මහරජ දුන් මා බුදුවනජාතියෙහි තොප රහත්වන ජාතියෙහි සිට මා නැසි නැයි කීබස් මෙසේ නොගිවිසීම විශ්මයෙක් නොවෙයි තුමූහුකළ ඤාණයෙන් සසර ඇවිදින කල එසේ කීබස් නොගිවිසීමම විශ්මය,, යි වදාරා ඒ කෙසේදැයි ආරාධිතවූ බුදුරජානන්වහන්සේ:—

යට ගියදවස කසීරට ධර්මපාලනම් ගම එනම් ජ්‍යෙෂ්ඨයෙක් විය ඔවුන්ගේ කුලයෙහි කෙලිකොල්ලන් දක්වාත් හැමදෙනම රා නොබොති, බොරු නොකියති, සොරකම් නොකරති, සතුන්නොමරති, ස්ත්‍රීන්හා පරුෂබස් නොකියති, මහණබමුනන් කුලජ්‍යෙෂ්ඨයන්, දූක ආදර ඇතිව පුදන්නාහ, වැඩිසිටියන් දූක උසක නොඉඳිනාහ පන්සිල් රකිති, පෙහෙවස් රකිති, හැමලෙසින්ම කුසල් කිරීමෙන් ධර්මයම පාලනය කෙරෙති, එසින් ඒ කුලය" ධර්මපාලකුලය,, යි ප්‍රසිද්ධවිය. එසේ ධර්මිෂ්ඨව සත්මුත්තෙකු පටන් පවත්වන්නාවූ කුශලධර්මයන්ගේ බලයෙන් ඒ කුලයෙහි උපන් හැමදෙනම පිළිසිඳ ඌවත් ආයු කෙළවරවුත් අනතුරාය මරණින් මියනොයන්නාහ,

එකල්හි අපමහබෝසතාණෝ ධර්මපාල රජුනිසා එහි ධර්මපාලනම්
කුමාරව ඉපද වැඩිවිය පැමිණ ශිල්ප ඉගැන්මට ගියතැන "නැයි
ඔවුන් දවාලූ සොහොන්හි තුබූ මේ ඇටකෑබලිය,, යි වඤ්චාවෙන්
ගෙණවුත් දක්වූ ඇට දූත පවා එකලට ධර්මපාල නම් රජවූ ඔබ
නොඇදහූයේවේද යි යනාදී කාරණා ප්‍රකාශකොට විස්තරවශ
යෙන්" ධර්මපාලජාතකය,, ගෙණහැරදක්වාවදාළසේක. එකෙණෙ
හි සුද්ධොදනරජ්ජුරුවෝ අනේ මෙම පුතනුවන්වහන්සේ දූත්පම
ණක් මට දරුවූසේක් නොවෙයි පෙරත් මට දරුවූසේක්මයයි කියා
උපන් සතුටෙන් අනාගාමිමාර්ගඵලයට පැමිණියහ.

මෙසේ බුද්ධපිතෘවූ ඒ රජතෙම බුදුන් සිඟාවැඩිදූ වීථියෙහිදී වදාළ
ධර්මයෙන් සෝවාන්ව ඇතුළුරජගෙයිදී වදාළධර්මයෙන් සකෘදාගාමිව
නැවත එසේම වදාළ ධර්මපාලජාතකදේශනාවෙන් අනාගාමිව
පසුව පිරිනිවන්පානාදූ දළපුබුසේසතින් යුත් යහන්හි වැදහෙව
අර්හත්ව මහනිවන්පුර වැද සැනහීගියසේක.

මෙසේ මාගේ ස්වාමිදරුවූ බුදුරජානන්වහන්සේ පෙර වේළුවන
යෙහි වසනකල කිඹුල්වත්පුරයෙන්ම තමන්වහන්සේ කැඳවා
ගෙණ යන පිණිස ආ දසදහසක් ඇමතියන්ට ඔවුනොවුන්ගේ
චරිත බලා කරණලද අනෙකප්‍රකාරවූ සද්ධර්මානුශාසනාවන් ඇති
හෙයින්ද,එයින් නික්ම කිඹුල්වතට වඩනා සැටයොදුන් මග අතර
ඒ ඒ තැන රැස්වගිය මහජනයාට කරණලද අප්‍රමාණවූ සද්ධර්මානු
ශාසනාවන් ඇතිහෙයින්ද, නිග්‍රොධාරාමය පිළිගෙණ එයින් අහසට
පැනනැගී රුවන්සක්මණෙහි සක්මන්කරමින් සිට දසදහසක් සක්
වළ දිව්‍යබ්‍රහ්මගරුඩගන්ධර්ව නරනාගාදී සියලුම සත්තුන්ගේ චරිත
ලෙස බුද්ධවංශ අනාගතවංශ දෙක දෙශනාකරවදාරමින් සිනිපැනි
කුඹුවුවන් පටන් මහබඹුන් දක්වා හැමසතුන්ම සිත්ගෙණ අප්‍රමා
ණ සත්වයන්ට කරණලද අප්‍රමාණවූ සද්ධර්මානුශාසනාවන් ඇති
හෙයින්ද, සොවාන්මාර්ගාදී තුන්මගතුන්ඵලයෙන් නිවන්පුර වැදී
සැනහීගිය සුද්ධොදන නරවරාදී එක්ලක්ෂසැටදහසක් පමණ
ශාක්‍යනෑයන් හා අප්‍රමාණ සත්නට වැඩසැදීමෙන් ප්‍රාතිහාර්යයෙන්
යෙදී ජම්බු සිඟා වැඩ වීථිමග පුරා සිටි පියරජ ප්‍රධානවූ මහපිරිසට
උතුම් ගාථාරත්නයකින් දෙසනලද සද්ධර්මානුශාසනාවන් ඇතිහෙ
යින්ද, ඇතුළුරජගෙයි එම රජ හා මහාප්‍රජාපතීන් ප්‍රමුඛවූ සතළිස්
දහසක් පමණ අන්තඃපුර වාසී මහපිරිස සිත් බලා පවත්වනලද
උතුම් සද්ධර්මානුශාසනාවන් ඇතිහෙයින්ද, එම රජ සහිතවූ පිරිවර
සහින් පන්සියයක්දෙනා හා යශොධරාදේවීන්ගේ චරිතලෙස කර
ණලද සද්ධර්මානුශාසනාවන් ඇති හෙයින්ද, නන්දකුමාරයන් හා
රාහුලකුමාරයන් මහණකරවා පියරජ ප්‍රධානවූ ස්වකීයබන්ධු

වර්ගයෙහි සැමසැයන්ට තමන්වහන්සේ වන් නිවන්පුරටම පැමිණීමෙන් හා සෝවාන්සකෘදාගාමිඅනාගාමිරහත්මාර්ගයෙන්ම වැදී සැනහෙනසේ මෙසේ නොයෙක් වර කරණලද ප්‍රමාණාතික්‍රාන්ත වූ සද්ධර්මානුශාසනාවන් ඇතිහෙයින්ද, ලොවට සරණවූ මටම හිතවූ මටම පිහිටවූ මාගේම ස්වාමිදරුවූ බුදුරජානන්වහන්සේ "ශාස්තෲ" නම් වනසේක.

එහෙයින් කියනලදී

දෙවයක්ඛමනුස්සානං ලොකෙ අග්ගඵලං දදං
දදන්තං දමයන්තානං පුරිසාජඤ්ඤ තෙ නමො—සී—

ලෝවැඩ පිණිස කරණලද මේ ශ්‍රීසද්ධර්මාවවාදසඞ්ග්‍රහයෙහි මෙතෙකින් අපබුදුන් කිඹුල්වත්පුරයට වැඩී පළමුවෙනි ගමනෙහි බන්ධූන්ට වැඩ සෑදීමෙන් න්‍යග්‍රෝධාරාමයෙහි වැස සියලු ලෝවැඩ කළ ප්‍රවෘත්තිය කියා නිමවනලදී.

———

මෙසේ අපබුදුරජානන්වහන්සේ කිඹුල්වත්පුරයට වැඩී පළමුවෙනි ගමනෙහිම තමන්වහන්සේගේ පිතෘවූ සුද්ධෝදනනරවරාදී එක්ලක්ෂසැටදහසක් ශාක්‍යනෑයන් ඇතුළුවූ අප්‍රමාණ සත්වයන්ට වැඩ සාධාවදූරා එයින් නික්ම එම විසිදහසක් රහතන්වහන්සේත් පිරිවරා රජගහනුවරට වැඩ එහි සීතවනනම්වූ මහවෙනෙහි වාසය කළසේක.

එකල රජගහනුවර මහධනසිටානන් හා සැවැත්නුවර අනේපිඩු මහසිටානෝ ඔවුන්දෙදෙනාගේ නැගණිවරුන් ඔබිනොබ ආවාහ විවාහවශයෙන් ගණුදෙනුකිරීමෙන් නැවත ඥාතිබන්ධනයෙන් හා මිත්‍රබන්ධනයෙන් දෘඪතරව බැඳි විශ්වාසව ඔවුනොවුන් ඒ ඒ නුවරවලට යොදනක්පමණ තැන් එන යනවිට පෙරගමන් පසුගමන් යාම් ඊම් ආදී වශයෙන් කරණලද මහත් ආදරගෞරව සත්කාර ඇතිව වසන්නාහුය.

එයින් අනේපිඩුමහසිටානෝ එක්දිනයෙක ගැල් පන්සියයක් ගෙන්වාගෙණ රජගහනුවරට එන්නේය, එදවස රජගහනුවර සිටානෝ බුදුන්කරා ගොස් බණ අසා සෙටදවසට දන් දෙමියි කියා ආරාධනාකොට අවුත් දන් විධානකරමින් සිටිදවසෙක, එහෙයින් පෙරසේම ඉදිරියට එන ගමනක් නැතිහෙයින් අතරමගදී වහල්කඩදී දොරම්පුලේදීවත් දූන් දූත් මාගේ නෑමිත්‍රසිටානන් දැකීමියි සිතා ආවාවූ අනේපිඩුමහසිටානෝ එයින් කිසිතැනකදීත් නොදැක අහෝ මිහට කිසියම් ආයාසයක් ඇතිවනැයි සිතා ගෙදර ඇතුළටම පැමිණිකල්හි දැක වැඩි සාමිචිකථාවකටත් අවකාශ නැතිහෙයින් සිප්‍රගණු කිමෙක්ද මහසිටානෙනි මිහ නිදුක්ව සුවසේ

අදැද බාලදරුවන්ට දුක් නැද්ද යන මේ වචනදෙක පමණක් කියා දරපිය ගෙණෙව මෙසේ මෙසේ ඛාද්‍ය භොජ්‍ය සදව යනාදි වශයෙන් නොපමාව දානවිධානයම කරවමින්ම සිට සවස අනේ පිඬුම්හසිටානන්කරා ගොස් සුවදුක් කථාකරමින් සිටිහෙයින් ඒ සිටානන්කෙරෙන් විචාරණුවෝ පෙර මා මේනුවරට ආකලසේ පෙරගමන්ආදියත් නොකොට ගෙටම පැමිණිකලවත් එසේම සත්කාර වචන කථාආදියත් අද නොකලදැය මහත්වූ මඞ්ගල්‍ය විධානයකුත් කරව තිමෙක්ද සිටානෙනි මේනුවර රජ්ජුරුවන් හා මහසෙනඟට අමුතු බතක් දිමෙක්ද යනාදිකාරණා විචාළ තැන, රජගහනුවර සිටානෝ කිහනුවෝ අනේ මාගේ යහළුවූ අනේපිඬුම්හසිටානෙනි නුඹ නොඇසූසේද සුද්ධොදනරජ පුත් සිද්ධාර්ථකුමාරයෝ දැන් ලොව්තුරාබුදුව දහම්වැසි වස්වා සතුන් පිණවමින් දෙව්බඹුන් පවා පාමුල්හි වැඳවාගෙණ කුලදූසයන්සේ ඔවුන්ගෙන් මෙහෙකණිමින් සිටි බුදුරජානන්වහන්සේ දැන් අපගේ නුවරට වැඩ මේ සීනවෙනෙහි වාසයකරණසේක, මම ඒ බුදුන් කරා ගොස් බණ අසා දහම්රසයෙන් මත්ව සෙටදවය ඒ බුදුන්ට දන් දෙන පිණිස මහත්වූ දානවිධානයක් කෙරෙමි එසේවූ මම ගනාප හා කුමනකථාවක් කෙරෙම්දැයි කීහ ඒ ඇසූ අනේපිඬුම්හ සිටානෝ තමන් මහප්‍රාඥැතිහෙයින් බුදුහුයයි කී වචනය හා සම ගම උපන් මහත් සන්තොෂයෙන් සියලඟ ලොමුදැහැගත්වමින් ඉතා විෂ්මය පත්ව අනේ මාගේ යහළුව නොවලහා ඇතිතතු මට කියව සැබවින්ම ලොව්තුරාබුදුකෙණෙක්මදැයි විචාළහ. එවිට යහළුව සැබවින්ම ලොව්තුරාබුදුකෙණෙක්මය එයට තෙපි සැක නොකරවයි කීහ. දෙවැනි තුන්වැනිවත් විචාරා එසේම දැන්වූ හෙයින් අනේපිඬුම්හසිටානෝ මේ ඇසූ වචනය කප් කෙළසුව හසෙනිහුත් ලැබගත නොහැකි උතුම් වචනයෙකි එහෙයින් මට වූයේ මහවැඩෙක මේ නුවරට මා ආයෙන් ඉතායෙහෙක යහළු නුඹ දයා ඇතිනම් දැන්ම මා ගෙණගොස් බුදුන් දක්වාලවයි කීහ. ඒ අසා රජගහනුවර සිටානෝ කියත්නාහු මාගේ යහළුවූ මහසිටානෙනි බුදුන් ඒ සිතූ සිතූ විටම දකලිය නොහැක්ක නොවේලෙහි ගියකෙණෙක් ඇත්නම් බුදුහු බුද්ධාසනයෙහි වැඩහිඳිනාසේක් නමුත් ගන්ධකුටියෙහි ගන්ධමාලයෙහි වැඩහිඳිනාසේක් නමුත් නොපෙණනසේක්මය, ඇතම්විටෙක ධ්‍යානසුවයෙන් වැඩහිඳිනාසේක, දෙව්බඹුන්ගේ ප්‍රශන හෝ විසඳනසේක, සක්දෙවුරජහු වැනියෝ පවා නොවේලෙහි බුදුන්කරා ගොස් දක්ක නොහී ආපස්සෙනී පලායෙනි, බුදුන්ගේ අදහස් දැනගත නොහැක්ක, සොහොන්නි නමුත් වසනසේක, එහෙයින් දැන් බුදුන් දක්මට

වේලාවකුත් නොවේයි සේට උදෑසනම කැඳවාගෙණ ගොස් බුදුන් දක්වාලම් අද මේ එකරැයකට සැතපීගණුවයි කියා සන්හිඳුවා අනේපිඩුමහසිටානන් සත්මහල් මහාප්‍රාසාදයෙහි මතුමාලේ යහන්ගබඩාවෙ සැතැප්පූහ. ඒ අනේපිඩුමහසිටානෝද බුදුන්ගේ නම ඇසූවේලෙහි පටන් කිසිභාණ්ඩයකගේ විධානයකුදු නොකොට පිරිවරජනයන් හා කිසියම් කථාවකුත් නොකොට බුද්ධාලම්බනප්‍රීතින් මත්වගියාසේ "බුද්ධො බුද්ධො"යි කියකියා යහනේ වැදහෙව සෙසුදවස්සේ තිස්පැයකින්ම හිරු නොනැගී අද තිප පැයකින්ම පහන්වී නම් යහපතැයි සිතා නිදන්නාහු පළමුවනයම සිහිනෙන් පිබිදගියාසේ දැක ඇස දල්වා බුද්ධාලම්බනප්‍රීතිශ්‍රද්ධාවෙන් පහන් දහස්ගණන් දල්වූවාසේ ඇතුළ දැක පහන්විගිය හිර පෑනනැංගේවන අහෝ කල්යවා නිදූපිම් මා කෙලේ මේ කිමෙක්දැයි සිතසිතා ගබඩාවෙහි දොර හැර ගොස් සඳැල්ලට බැස අහස බලා හිරමඩල නොදැක අහසමුදුන් පත් සඳමඩල දැක සඳ පියවර බලා දසපෑ ගියේයයි දැන නැවත ඇතුළුගෙට වැද නිදන්නාහු දෙවන යාමෙහිදු එසේම ආලෝකව දොරට ගොස් එසේම බලා විසිපැය ගියේයයි දැන නැවතත් ගෙට වැද නිදන්නාහු තුන්වන යමෙහිදු එසේම ආලෝක දැක සැබවින්ම පහන්වූහයි සිතා අලුයම්රාත්‍රියෙහිම බුදුන් දක්නට නික්මින, එකෙණෙහි සිටානන්ගේ ශ්‍රද්ධාබලයෙන් දෙවියෝ මෙතෙම මතු තුණුරුවන්ට නමා ගෙයි දොර විවටාධගන කාරණ මහතානකෙනෙකැයි සිතා සිටානන්කෙරෙයි පැහැද සත්මහලෙහිම දොරවල් හැර ආලොකකොට සිටහත්හ, එසේ ඇතිකල්හි අනේපිඩුමහසිටානෝ මහවාසල්කඩින් පිටත්ව යනුවෝ අමුසොහොනකට පැමිණ එහි මිනිකුණු දෙනෙකක පයදෙකම පැකිලගියකල අතිසිහිල්බව වැටහින,මිණිකුණුගඳය නාසයට නැගී නිලම්ැස්සෝ දකිනලදී. එකෙණෙහි මිනිකුනපව නැයි උපන්නාවූ මහාපිළිකුල්සිතින් බුද්ධාලම්බනප්‍රීතිය අඩුවූහෙයින් සිටානන්ට පෙනීගිය ආලෝකය අන්ධකාරවිය, දසදිග අඳුරුවිය. එවේලෙහි රාත්‍රියබව දැන අමුසොහොනට පැමිණියෙමි සිතා මහත්වූ භයට පැමිණ ආපසු යෙමි සිතා මදක් පසුවිය,එකෙණෙහි ඒ සොහොන්හි රුක්දෙවතාවා ඒ සිටානන්ට උපන් භය දැක මෙතෙම මතු බුදුන්ගේ අග්‍රඋපස්ථායකවන මහපිණැත්තෙක ඔහට සහායවූව මැනවැයි සිතා ආකාශයෙහි විදුලියක්සේ පෙනී නඩකිණි කනාදයක්සේ භය නොගණුවයි කියා:—

සතං හත්ථි සතං අස්සා සතං අස්සතරී රථා
සතං කඤ්ඤා සහස්සානි ආමුත්තමණිකුණ්ඩලා
එකස්ස පදවීතිහාරස්ස කලං නාග්ඝන්ති සොළසිං·

යන මේ ගාථාව කියා, ඇතුන් ලක්‍ෂයක් අසුන් ලක්‍ෂයක් රථ ලක්‍ෂ
යක් දෙවගණන් බඳු වරඟණන් ලක්‍ෂයක් යාචකයන්ට දන්දුන්
නේවීනම් එසේවූ දානවිපාකයටත් වඩා යමෙක් බුඬාදී තුණුරු
වන් අරහයා වඩින්ට යෙමි බණ අසන්ට යෙමියි සිතා විහාරයකට
යේනම් ඔහු සන්සිඳි යන ගමනෙහි එක්පියවරක් ඉදිරියට ඔසවා
තිබූකල ඒ පය අග්‍රාඞ්ගුලිකෙළවර දක්වා අතුර මිටිරියන් පමණ
වූ පදවීතිහාර නම් භූමිය සොළොස්කොට්ඨාසයක් කොට එයින්
එකභාගයක් ගෙණ එයිදු සොළොස් කොට්ඨාසයක් කොට බෙදූ
මෙසේ මෙසේ සොළොස්වාරයක් බෙදූකල අශ්ලොමක් පමණ
ඉතා සූක්‍ෂමවූ භූමියක් වෙයි එපමණවූ භූමිය ගෙවා යාමෙන්
සිඬවූ කුශලසම්භාරයම සුවහස්ගුණෙණත් වඩනේමය, එහෙයින්
සිටානෙති නොමැලිව යව දන්ම ගොස් බුදුන් දකුව ආපසු නොයා
ව නොයවයි කීහ. ඒ අසා අනේපිඬුම්හසිටානෝ අහස බලා දෙව
තාවා දැක මම මෙතැන් පටන් එකලාව නොවෙමි දෙවියෝත් මා
හා සමග ඇත්තාහුයයි දැක උපන් භය සංසිඳුවාගෙණ නැවත
බුඬාලම්බණප්‍රීති උපදවාගෙණ පෙරසේම ආලොක උපදවාගෙණ
ඉදිරියට යන්නාහු නැවත දෙවන තුන්වනුවටමද මිනිකුණපවල
පැතිලිමෙන් උපන් භය දෙවතාවාම එසේම සංසිඳුවාලූ හෙයින්
දෙවතාවා සහායෙන් හා ශ්‍රඬාබලයෙන් අනේපිඬුම්හසිටානෝ අලු
යම්රාත්‍රියෙහි බුදුන් වසන විහාරයට යමින්සිට සිතනුවෝ ලෝක
යෙහි අපි බුදුම්හයි අපි බුදුම්හයි කියකියා ඇවිදිනෝත් ඇත
ඉදින් මුන්වහන්සේ සැබෑබුදුකෙණෙක්වීනම් මාගේ මවුපියන් තු
බූනම මාම්ස මාගේ අඹුදරුවෝවත් නොදනිති ඒ නම කියා මා
කැඳවා කථාකළසේක්වීනම් සැබෑබුදුකෙණෙක්මය එසේවීමසා
ගෙණ මම වඳිමි පුදමි සත්කාර කෙරෙමි එසේ නැතහොත් මේ
කිසිවක් නොකොට ආපසුම කරකැවී යෙමියි සිතූහ. එවේලෙහි
මාගේ ස්වාමිදරුවෝ එකසතෙකු තබා අනන්තලොකධාතුයෙහි
සතුන් සිතූ සිත් තමන්වහන්සේගේ එකසිතින් දැනගන්නාහරම්
අසාධාරණවූ බුඬඥාන ඇතිහෙයින් ඒ සිටානන් සිතූ සිත් දැක මා
වැනි බුදුකෙණෙකුන්ට අග්‍රඋපස්ථායකවෙමියි ප්‍රාර්ථනාකොට ආ
පුන්‍යවන්තයා පෙරමගට දන්ම යෙමියි සිතාවදූරා ගන්ධකුටියෙන්
බාහ්‍යව ගන්ධමණ්ඩලමාලකයෙහි සක්මන්කරමින් වැඩසිට සිටා
නන් එන පෙරමග බලාවදූරමින් ඔහට අභිමුඛව බුඬාසනයෙහි
වැඩහිඳ "සුදත්තය" මෙසේ මාකරා එවිසි වදාළසේක. සිටානෝ
සුදත්තායයි කී එකබස කනහීම හා සමගම මුන්වහන්සේ සව්නේ
ගෙවා දත් සැබෑබුදුකෙනෙකුන්වහන්සේමවනැයි විශෙෂයෙන්
දැන බුදුන්කෙරෙහි පැහැද බුදුන්කරා වහා දිවගොස් අමාවිලත්

දුටු පිපාසිතයකුගේ බුදුන්ගේ චරනකමලයුගල නැමැති අමාවිල්හි ගැලීනැලී සිත් සතනසතනා පසඟ පිහිටුවා වැඳ එකත්පස්ව දෙ හොත් මුදුන්දී හිඳ මහත්ප්‍රීතීන් පිනාගියා මුඛයෙන් බුදුන්ගේ මුඛ පද්මය බලබලා කිමෙක්ද මාගේ ස්වාමිදරුවූ සව්නෙන් ගෙවා දත් බුදුරජාණනි මාගේ නම කියාලූ එකබසින්ම තුඹවහන්සේට කුල ගැතිව්ම් ස්වාමීනි කෙසේ රාත්‍රිය ඉක්මවා ගියේද සුවයෙන් සැත පුනුසේක්දැයි විචාළහ. එසේ ලෙහි ඔහු කීබසම ගෙණ ඕහට බන කියා සසර්න් ඔහු ගොඩනගම්යී සිතාවදූරා:-

සබ්බදා වෙ සුඛං සෙති බ්‍රාහ්මණො පරිනිබ්බුතො
යො න ලිම්පති කාමෙසු සීතිභූතො නිරුපධි.
සබ්බා ආසත්තියො ඡෙත්වා විනෙය්‍ය හදයෙ දරං
උපසන්තො සුඛං සෙති සන්තිං පප්පුය්‍ය චෙතසො-යි.

යනමේ ගාථා දෙකින් එසේය සිටානෙනි යමෙක් සවාසනා කෙලෙසුන් නසා ශාන්තියට පැමිණියේවීනම් සුවයෙන් සැතපෙත්නේ වේදැයි යනාදී ක්‍රමයෙන් සිටානන්ට අනුරූපවූ ධර්ම්ම දෙශනාකළසේක. එවේලෙහි අනේපිඩුමහසිටානෝ කෙළදහසක් කෙලෙසුන් ගෙවා දහසක් නයින් ප්‍රතමණ්ඩිතවූ සොවාන්ඵලයෙහි පිහිටා විදුරුපොළවෙක ගලා හිඳුවූ වජ්‍රකීලයක්සේ බුඩ්ශාසනයෙහි ස්ථිරව පිහිටියාවූ අචලශ්‍රද්ධා ඇතිව බුදුන්ට සතසහස්‍රවචනයෙන් සතුතිකොට ස්වාමීනි ගැත්තහු මේ නුවරට ආගන්තුකව ආවත් මාගේ ශ්‍රද්ධා පමණින් දානයක් දීගන්නා කැමැත්තෙම් සෙටදවස ගැත්තවුට අනුග්‍රහකළ මැනවැයි බුදුන්ට ආරාධනාකොට සුහුරුබමුසිටානන්ගේ ගෙට ගොස් නොයෙක් භාණ්ඩයන් පරිත්‍යාග කොට දානවස්තූන් රැස්කරන්ට පටන්ගත්හ. රජගහනුවර සිටානෝ එපවත් දැන යහළු තෙපි මේ නුවරට ආගන්තුකලුව මම නේවාසිකවෙම් එහෙයින් තොප වෙනුවෙන් දානපරිත්‍යාගය මාගෙන්ම කෙරෙම්යි තෙපි යෙහෙන් හිඳුවයි කීහ. ඒ අසා අනේපිඩුමහ සිටානෝ එසේ නොකරමි මාගේ පන්සියයක් ගැල් පුරා ගෙණ බඩු එකදවසක් තබා තුන්මසක් මුළුල්ලෙහි දන් දෙතත් දානපරිත්‍යාගයට ඇතිබැවින් මාගෙන්ම දන් දෙම් කියා නොගිවිස්සාහ. එම රජගහනුවර අසූදහසක් නියම්ගමට නායකවූ නේසාදනම ජ්‍යෙෂ්ඨයානෝද අනේපිඩුමහසිටානන් හා අනිවිස්වාසබැවින් එසේම දැන්වූතැන උන්ගොහුදු කිසිවකුත් නොගත්හ. බිම්බිසාර රජ්ජුරුවෝද තොපගේ ගමක් රටක් නොව අපගේ භාණ්ඩාගාර යෙන්ම සියලු දැ ගෙණ දන් දීගණුවයි කීකල්හිදු අඩුදෙයක් ඇත් නම් සැළකරන්නෙම්යි කියා රජ්ජුරුවනුදු යවා තමාගේ පිරිවර

ජනයන්ලවා ගිණිදරපැන්ලිප්ගල් දක්වාත් මිලදීම හැරගෙණ
මහදන් සරහා දෙව්නදවස්හි බුදුන් වඩාගෙණවුත් තමන්ගේ
නැගණියන්ගේ මහාප්‍රාසාදයෙහිදීම බුදුන් ප්‍රධානවූ විසිදහසක්
මහරහතුන් වලදවා වළඳ අනතුරෙහි "ස්වාමීනි අපගේ සැවැත්
නුවර නාම ඉතාරම්‍යවූ නුවරෙක සත්පනස්ලක්‍ෂයක් කුලගෙවල්
ඇත්තේය, සන්කෙළක් මනුෂ්‍යයෝ ඇතියහ හවුරුදුපතා ලක්‍ෂ
නිමවන අසූදහසක් නියම්ගම් ඇතියේය තුන්තුන්සියක් යොදුන්
කසී කොසොල් දෙරට්හි නුවරට සතරද්ගින් වද්නාවූ අය මුහුද
රලපෙළ දිවන්නාසේ මුත් අනික් උපමාවෙක් නැත, ස්වාමීනි අප
ගේ එසේවූ නුවරට වැඩවදාළහොත් ගැත්තවුන්ගේද කෙළගණන්
ධන නිධානකොට තිබෙයි, කෙළගණන් ධන පොලිපිට තිබෙයි,
කෙළගණන් ධන අනුභවයට තිබෙයි, මුතුන් මිත්තන් රැස්කළ
ධන මෙතෙකැයි පමණ නැත, එයින් අටළොස්කෙළක් ධනය දුන්
තැන සිහි නැතිවගියේය, අටළොස්කෙළක් ධන නිධානකළතැන
මුහුදුබත්විය, ගැත්තවුගේ එසේ නිෂ්ප්‍රයෝජනයව නස්නා සිටු
සැපත ස්වාමිදරුවන්ගේ ශාසන නැමති සරුකුඹුරෙහි ඉසපියනු
කැමැත්තෙමි කරුණාකරවදාළ මැනවැ" යි ආරාධනාකළහ. එ
වේලෙහි බුදුරජ අනාවරණඥානයෙන් අනාගතාපයසිනාවූ බුදුන්
සද්ධර්මප්‍රවාහ කළාවූ ධනනාක්‍රීඩාමණ්ඩලභූමියක්ම වන නියාවත් දැ
නවදුරා එනුවරට මාත් ගිය මනාකල්මයයි සිතා සිටානෙනි සර්‍වඥ
වරයෝ නම් සූත්‍රගෘහයෙහි රමණයකරන්නාහුවේදැයි විදාළ
සේක. එවේලෙහි සිටානෝ ඒ ඇසූ පමණකින්ම බුදුහු මාලවා
විහාරයක් කරවනුකැමතිසේකැයි දැන අදහස් දනිම් ස්වාමීනි වෙ
හෙරක් කරවාලා ගැත්තවූ ආරාධනාකොට එවූ කළ වැඩවදාළමැ
නවැයි ආරාධනාකොට බුදුන් අතින්ම සියලු ප්‍රතිඥාලද්දින් වැද අව
සරගෙණ සැවැත්නුවරට යනුවෝ අතරමග යොදනින් යොදනෙ
හි මනුෂ්‍යයන් රැස්කොට "මනුෂ්‍යයෙනි බුදුරජානන්වහන්සේ මේ
මග වඩනාසේක තෙපි මාගීය සරසව විහාර කරවව පමා නොව
ව" යි කියනියා බුදුගුණයෙන් බොහෝදෙනා පහදව පහදවා පන්
සාළිස්යොදුන් පමණවූ මග යොදනෙන් යොදනෙහි එකිනෙක
විහාරයක් බැගින් පන්සාළිස්ලක්‍ෂයක් වසතු වියදම්කොට විහාර
පන්සාළිසක් කරවා සැවැත්නුවරට ගොස් නුවර සිසාරා බලා ඈ
විද ජෙතනම් රාජකුමාරයාගේ උයන නුදුරු නොලන්ව සභයන්
සිත්සේ ගොස් වැදපූදගත්නා පරිද්දෙන් විහාරය කරවන්ට ඉතා
හොබනේයයි දැක ඒ රාජකුමාරයන්කරා ගොස් "වහන්ස නුඹගේ
උයන්බිම මාගෙන් මිල ගෙණ වෙහෙරක් කරණපිණිස මට දුන

මැනවැයි කිව එබසට රාජකුමාරයෝ මදම්ලයක් තබා එබිම්මුළුල් ල කැණවනු ලස්සෙන් සිටුවා රණින් වසා පූරා මිල දුන්නේවීනමුත් මාගේ උයන නොදෙම්හයි කීහ. ඒ ඇසූ සිටුතෙම එකබසින්ම මට උයන දීපුදැය හැරගතිම් කියකියා ඇතයේ අත් ගසා සිනාසු නේය. එවිට රජකුමර උයන මම නුදුන්මි කිව, සිටානෝ නැවතත් එසේම කිව, එවිටද රාජකුමාරයෝ මා උයන දුන්නා නැත සිටා නෙනි කුමක් දෙඩාදැයි කීහ. මෙසේ ඔබ්නොබ දෙතුන්විටෙකම කීමෙන් වචනය නොනිමෙන හෙයින් සිටානෝද අපදෙදෙනා හා මේ කීමෙන් කම්නැත අධිකරණස්ථානයෙහි යුක්ති දන්නෝ කිවක් ගනුම්හයි කියා අධිකරණසභාවට ගොස් අපදෙදෙනාගේ මේ අධිකරණයුක්තිය මැදහත්ව කිව මැනවැයි කීහ. එකල්හි අධික රණනායකයෝ දෙදෙනාගේම බස් අසා රාජකුමාරයන් මුහුණ බලා යම් වෙළඳාමක් කරණකල වස්තුස්වාමියා නොවටිනා මහත් ගරු අගයක් පළමුකොට කියාපිනම් වස්තුව මිලකළනියාමය තුඹ ගරුකොට මිල කියාප්බැවින් ඒ සැටි සිටානෝ මිල දී යත් තේවීනම් උයන සිටානන්ගේමයයි කියා යුක්තිය විනිශ්චයකළහ. එවිට රාජකුමාරයෝ පැරද මාගේ උයන අයම්න් විතරින් වඩුදහස් ගණන් දයස්රියන් ඇත එහෙයින් එන්යාලදෙළසාමුණන් වප් ගන්නාවූ මහ බිමෙක ඒසාබිමක් වසා රත්හු ලස්සෙන් අතුරුවා දීමට කවරෙක් සමර්ථවේද යුක්තිකීමෙන් පැරදගියනමුත් රන්දී මෙන් මොහු පරදවා මාගේ උයන නොදෙම්මයි සිතා සිටානෙනි හෙපි එසේම නිත්පරබැවින් උයන නොපටම දින්වි දුන්ම මට රන් දුනමැනවැයි කීහ. ඒ අසා ඉතාසතුටුවූ සිටානෝ රාජකුමාර යන් හා උයනට ගොස් එහි විහාරයට නොහරම් නිස්ප්‍රයොජන ගස් මුලින්ම සිඳුවා හැර සඳුන් කපුරු හා සපු නා පනා අඹ දඹ දෙඹ ආදී මාහැඟි ගස් ඉතිරිකොට සැම උයන්බිම සමකරවා සිටා නන්ගේ ලියන්නන් මෙල්ලාගකවරුන්කැදවා මාගේ සත්මුත්තක පටන් දෙර නොහැර තුබූ අසවල් නිධානයෙහි පිධානය හැර එහි තුබූ මසුරන් ඇද මේ බිම ඇසිල්ලකින් පුරවයි ඒයමකළහ. ඒ අසා රජකුමර මොහු මේ කියන්නේ කිමෙක්ද? එකනිධානයෙක වැඩිව තිබේනම් දශලක්ෂයක් හෝ විසිලක්ෂයක් හෝ වැඩිවීනම් සියක්ලක්ෂයක් හෝ තිබෙයි, එච්චරකින් මෙච්චර බිමක් රත්හුලස් සෙන් ලස්ස සිටුවා පුරාලිය හැකිදැයි සිත සිතා උන්හ. සිටානන් ගේ මෙහෙවර ඇසුවාවූ ලක්ෂගණන් පිරිවරජනයන් වහා දිව ගොස් සත්පවුරු ඇතුළෙහි තුබූ ඒ නිධානයෙහි පිධානය හැරලා වෑලා යුවලතින් රත් මැන මැන ඔවුනොවුන් පරයා ඇද ඇ සිල්ලකින් අනූසාලක් පමණ උයනමැද සැලූහ. එකෙණෙහිම ඒ

හැම රන් ලක්‍ෂණයන් ජනයෝ මිටින් මිට ගෙණ ඒසාබිම කිසිව කුත් නොපෙණෙනසේ රන්හු ලක්සෙන් ලක්ස සිටුවසිටුවා බූමතුරුණ සේ වසාගෙණ යන්ට පටන්ගත්හ· ඒ හැම දැක සිටානෝද සක්විති රජය ලබනදවසක්සේ මහත්වූ සන්තොෂයෙන් පිණපිණා තමන් ගේ පිරිවරසිටුවරුන් ඇරගෙණ උයන විමසාබලනුවෝ සඳුන්ආදී ගසින් වැසී සිටි බිම රන් අතුටලිය නොහැක්කේය එසේවූකල මාගේ පින්කම අඩුවයිසේනම් නපුරැයි සිතා පිණෙහි ලොහ වැඩී හෙයින් සියලු රුක් සිසාරා වට මැණමැණ ඒ ඒ පමණවූ සෙසුබිම් වල ඒ මාරුවෙහි රන් පුරපුරා යන්නාහු මහවාසල්බිම තබා අනිකුත් හැම උයන්බිම රන්හු ලක්සෙන්ම සිටුවා වැසූහ· සිටානෝ ඒ වාසල්බිම රන්හු ලූ අඩුව දැක මෙතනද වසා රන්පුරවයි කීහ. එකොණෙහි ලියන්නෝ අවුත් සිටානන්වහන්ස තුඹගේ සත්වැනි මුත්තනුවන්වහන්සේ ඒ නිධානයෙහි තැබූයේ අටලොස්කෙළක් මසුරන්ය ඒ හැම දූත් මෙතනට ගෙණෙනලද, ඒ නිධානයෙහි අනික් අලෙවියක් නොවූනියාවට මේ ලේකම් අසාවදාළමැනවැයි කියා එම නිධානයෙහි සඞ්ග්‍රහකොට තුබූ තඹපත අකුරු පැවාහූය. එවිට සිටානෝ අනික් නිධානයකින් ගෙණවුත් පුරවයි කීහ· ඒ ඇසූ රාජකුමාරයෝ එසා සම්පත් වසනුපරිත්‍යාගයෙහි දෙම්නසකුත් නොව මහත් සතුටුසිත් ඇති නියාදැක සිටානෙනි යුක්තිකීමෙහුත් මිලඅමෙහුත් මා පරදවා තුඹම දිනුයේය එසේ තවතවත් මා බොහෝ කොට නොපරදවා මේ වහසල්බිම තොප උපකාරයෙන් ළට දෙව ඒ බිමට රන් නොගෙන්වව තොපගේ පිණෙහි මාත් ඒක් කොට ගණුවයි කීහ. සිටානෝද මා කරණ කටයුත්තෙක මෙවැනි ප්‍රසිඬවූ රජදරුවන් එක්විමෙන් දෙෂ නැතැයි දැන එහි රන් නොඅතුරුවයි කියා රාජකුමාරයන්ටම වාසල්බිම් හැර එසේවීනම් තොප අසීතිවූ රන් ලස්වගෙණ මට බිම අවකාශකොට දෙවයි· කීහ· එකල්හි රාජකුමාරයන්ගේ සේවකයෝ සියදහස්ගණන් ගොවිපෝරු ලා ලා හැද මිසුරන් උයනින් පිටත රැස්කොට බිම අවසර කළහ· එහි අනේපිඬුමහසිටානෝ විහාරකර්මාන්තයට පටන් ගෙණ අනන්තාපර්‍යන්තාවූ බුදුවරයන්ගේ සයනාස්ථානවූ අවිජහිත භූමියෙහි බුදුන්ට විසීමට නිසි විසිතුරු ගඳකිළියක් කරවා ඒ වටා සඞ්ඝාරාම රාත්‍රිස්ථාන දිවාස්ථාන චඞ්ක්‍රමණ මණ්ඩප පුෂ්කරණී විල් පතැස් පුෂ්පාරාම ඵලාරාම ආදිවූ සියලු ආරාමකර්මාන්තයන් දෙවියන්ගේද සහායෙන් දිව්‍යකර්මාන්තය හා විශ්වකර්මනිර්මිතයක්සේ ඉතාමනොහරකොට නිමවා ඒ වටා සාරදහසක් රියන් හා උසින් අටලොස්රියන් පමණවූ මහපවුර කරවා නොබෝදවසකින් නිමවූහ. ඒ පවුරඇතුළතම කරෙරුව යන වරුණරුක දෙරටුවට

ෂුදුරුව සිටිබැවින් "කරේරිකුටිය,, යි කියාද, එසේම "කොහො ම්බකුටිය,,යි කියාද, "සලලඝරය,,යි කියාද එකිනෙක ප්‍රාසාදයට ලක්‍ෂයක් ලක්‍ෂයක් වයකු විසඳ කළ ප්‍රාසාද සතරක්ද ඇත්තාහුය, එයින් සලලඝරය කොසොල්රජ කරවිය, සෙසුප්‍රාසාද අනේපිඬුමහසිටාණන්විසින්ම කරවිය, ඒ මධ්‍යයෙහිදු බුදුන්ටම කරවූ ගඳකිළිය සියක්ලක්‍ෂයක් මසුරන් වියදම්කොට කොළක් අගනාසේ කරණලද්දේය, ඒ සියලු විහාරකර්මාන්තම එක්නිධානයෙක පුරා තිබූ අටළොස්කෙළක් මසුරන් වියදමින් නිමියේය.

ඒ අනේපිඬුමහසිටාණෝ නම් කල්‍යාණමිත්‍රයන් බොහෝ ඇතිකෙණෙක, එහෙයින් අපගේ සිටාණන්ගේ පින්කමෙහි අපි අපිද එක්වම්හයි කියකියා විශ්වාසයන් ඔවුනොවුන් පරදවා කරණලද කර්මාන්ත හා උන්ගේ ධනපරිත්‍යාගය මෙතෙකැයි පමණ නැත, අවශෙෂවූ සත්‍වයන්විසිනුදු බුදුන්ගේ නම අසා අපිඅපිදු ඒ උතුමානන්ට යත්කාර කරම්හයි කියකියා සත්‍වයන් වෙනවෙනම කරවාපු කර්මාන්ත හා වෙනවෙනම කළාවූ ධනපරිත්‍යාගයද මෙතෙකැයි පමණ නැත, ජේතනම් රාජකුමාරයෝද සිටාණන් කරවන්නාවූ ඒ විහාරකර්මාන්තයෙහි පැහැද සිටක්හුගේ සම්පත් රජක්හට ඇයිද ඔහු දුන් මිල ඔහුගේ විහාරකර්මාන්තයටම පරිත්‍යාග කෙරෙම්යි සිතා නැගෙණහිර වාසල්භූමියෙහි එක්සියවිසිරියනක් දිගුපුළුල්යුත් සත්මාල්මහාමාලිගාවක් වාසල්කොට කරවා සෙසු දක්‍ෂිණ පශ්චිම උත්තර යන තුන්දිසායෙහි වාසල්ද එසේම මනොහර්කොට නිමවා කරවමින් බිමදී ගත් අටළොස්කෙළක් මසුරන් එම වෙහෙර සතරමහවාසල්කර්මාන්තයටම පරිත්‍යාගකළහ.

මෙසේ සියලු විහාරකර්මාන්ත නිමිකල්හි අනේපිඬුමහසිටාණෝ පළමු ප්‍රතිඥලෙසම බුදුන් පවරා යවූ ඉක්බිති වඩනා බුදුරජාණන් වහන්සේ යොදනින් යොදනෙහි එමසිටාණන් කරවූ විහාරයෙන් විහාරයෙහි සැතපි සැතපී පන්සාළිස්දවසකින් සැවැත්නුවරට වැඩිසේක.

සිටාණෝ විහාරය මුළුල්ලෙහි ධජ පතාක පුන්කළස් කෙසෙල් ගස් පිළිතොරණ රන්තොරණ ආදියෙන් දිවව්මනක්සේ සරහා තමන්ගේ පුතනුවන් සර්වාභරණයෙන් සරහා පන්සියයක් සිටුකුමරුවන් පාවාදී පස්පැහැයෙන් දිලියෙන පන්සියයක් ධජපෙළ හා සමඟ යවා ඔවුන් පස්සෙහි මහාසුභද්‍රාය චූලසුභද්‍රාය යන සිටුදූන්දෙදෙනා දෙව්කුමරියන්සේ සරහා සමවූ වයස්ඇති පන්සියයක් ස්ත්‍රීන් හා සමග පන්සියයක් රන්කළස් දී යවා ඔවුන්ට ඉක්බිතිව සිටාණන්ගේ අග්‍රවූ සිටුදියනියන් පන්සියයක් කුලස්ත්‍රීන්හා සමග සර්වාභරණයෙන් සරහා පන්සියයක් රන්පැන දී යවූහ සිටු

දුන්ට ඉක්බිතිව කොසොල්මහරජ්ජුරුවන්ගේ දියනියෝ සුමනා නම් රාජකුමාරිකාවෝ පන්සියයක් රජකුමරියන් පිරිවරා පන් සියයක් රථ නැගී සර්වාභරණයෙන් සැරහී ශක්‍රපුරයෙන් නික්මුණු දෙවඟනන් රූසක්සේ සුවඳමල්කරඬු ගෙණ එකපෙළට සැදී නික්මගත්හ. ඔවුන්ට පසුව පන්සියයක් ඇමතියන්ද සර්වාභරණයෙන් සැරහී මල්මිටි ගෙණ නික්මගත්හ. ඔවුන්ට ඉක්බිතිව මහනුවර වැසියෝ සියලු පූජාභාණ්ඩ ගෙණ ගණන් නැතිවම නික්ම ගියාහුය. ඒ ඇමදෙනම මෙසේ ගිසකල අනේපිඩුම්හසිටාණෝ පන්සියයක් සිටුවරුන් හා සමය අළුත් සුදුදුවලු පිළි හැඳ පූජාමගුල්වෙස් ගෙණ සුවඳමල් අතින්ගෙණ බුදුන් වඩනා පෙරමගට ගොස් දුටහ. එකල්හි මාගේ ස්වාමිදරුවූ බුදුරජානන්වහන්සේ මේ මහපිරිස් පළමුව පූජා පැවැත්වීමෙන් යෙදී නික්මුණු වේලෙහි තමන්වහන්සේ තරු පිරිවැරූ සඳසේ අනොපමවූ බුද්ධශ්‍රීන් ශොභාමානව විසිදහසක් රහතන්වහන්සේත් පිරිවරා සවණක්රුසින් දිලිහිදිලිහී මහපෙළහරින් නොයෙක් පූජාවිඳ විද අප්‍රමාණ විලාසශ්‍රීන් වැඩ ජේතවන මහවිහාරයට පැමිණිසේක. එවිට අනේපිඩුමහසිටාණෝ බුදුන් වැඳ ස්වාමිනි මේ වෙහෙර කෙසේ මම පිළිපදිම්දැයි විචාරා සිටි කල්හි බුදුරජානන්වහන්සේ "මහසිට මේ විහාරය මෙතනට පැමිණි නොපැමිණි හැම භික්ෂූන් උදෙසා සාඞ්ඝිකකොට දෙව,,යි වදාළබස් මුදුනෙන් පිළිගෙණ සිටාණෝ ස්වර්ණභිංකාරය අතින් ගෙණ "සතරදිගින් වඩිනා බුදුපාමොක් මහසඟහට මේ වෙහෙර සාඞ්ඝිකකොට දිනිම්,,යි කියා බුදුන්ගේ ශ්‍රීහස්තයෙහි පැන් වත්කළහ. එසේ මාගේ ස්වාමිදරුවූ බුදුරජානන්වහන්සේ දෙව්රම්වෙහෙර පිළිගෙණ එහි කරණලද ධර්මමණ්ඩපයෙහි පනවනලද බුද්ධාසන මස්තකයෙහි වැඩහිඳ:--

සීතං උණ්හං පටිහන්ති තතො වාලමිගානි ච
සිරිංසපෙ ච මකසෙ ච සිසිරෙ චා'පි වුට්ඨියො:—

යනාදින් ආවාසදානයෙහි අනුසස් සුදත්තගෘහපතියා සහිත මහපිරිසට එදවස්හි දෙශනාකොට බොහෝසතුන් සස්රින් මුදා වදාළසේක.

සැවැත්නුවරට වැඩි පළමුවෙනිදාම බුදුන්ට මෙසේ දෙව්රම් වෙහෙර පිළිගන්වා එදාපටන් අනේපිඩුමහසිටාණෝ දවස දවස් මහපූජා කිරීමෙන් නවමසක් මුළුල්ලෙහි අටළොස්කෙළක්ම ධන වියදමෙන් අප්‍රමාණ පූජා කළහ.

මේ විහාරභූමියනම් අනන්තාපරිමාණවූ සියලු බුදුවරයන්ටම ඒ ඒ කාලානුරූප පරිච්ඡෙදන් අයම්විත්තරින් වැඩ වැඩ සිටිනා මේ විහාරභූමිප්‍රදේශයෙහි අපරිමාණ ධන ඇති සිටුවරුන්විසින් නො

යෙක් ප්‍රකාරකෝට මෙසේම රනින් වසා මිල දී ගෙණ විහාරය කරවා පිළිගන්වාලීම ස්වභාවධර්මතාවෙක්මය.

අහෝ පින්කැමති ලොව ඇම සත්පුරුෂයෙනි අනේ සුදත්ත නම් ගෘහපතිවූ අනේපිඩුමහසිටාණන්ගේ මේ විහාරපින්කමෙහි කරණලද සියලු ධනපරිත්‍යාග හා ඇම විහාරකර්මාන්තයද වසි දහසක් රහතන්වහන්සේ පිරිවරා බුදුන් වැඩි ලීලා බුදුසිරි සියල් ලද සත්කෙළක් මිනිසුන් ඇති සැවැත්නුවර මහසෙනග හා එක් රු සපිරිවර රජදුන් සිටුදුන් ඇමදෙනම සැදී පැහැදී විසිතුරු ධජ පෙළ ආදී නොයෙක් පූජාභාණ්ඩ ගෙණ බුදුන් වඩනා පෙරමගට එදවස්හි යාම් ඊම් පූජාකිර්ම් බණ ඇසීම් ආදී වශයෙන් එහි පැවති තාක් පින්කම් සියල්ලද එදු රන්කෙණ්ඩිය අතින් ගෙණ බුදුන්ට ලංව නැමී සිටි අනේපිඩුම්හසිටාණන්ගේ සිත සතුටුවීමෙන් උපන් ප්‍රීතිසෞම්නස් ශ්‍රීවිභූතියද යන සියල්ලම වෙන වෙනම සිතූකල අනේ මෙතෙකැයි පමණනැත්තේය, එහෙයින් අප ඇමටත් මේ බණ අසා සතුටුවගිය කුශලානුභාවයෙන් එසේවූ බුදුසිරි දකිමත් එබඳු පින්කම් කිරීමත් එසේ කුශලනැත සතුටුසොම්නස් ලැබීමත් උපනුපන් ජාතිවල වාසනාවේවායි.

—××—

තවද ජේතවන විහාරයට තුදුරුව විසාඛා නම් උපාසිකාවවිසින් කරවා පිළිගන්වනලද පූර්වාරාමවිහාරප්‍රවෘත්තිකථාව කෙසේද යත්?.

ඒ විසාඛාවන්ගේ ඉපදීම් ආදී මහත් පින්බල ප්‍රකාශවූ සියලු ප්‍රවෘත්තිකථාවන් විස්තරවශයෙන් අසනුකැමැත්තන්විසින් රත්නාවලියෙහි විසාඛාවස්තුව හා පූජාවලියෙහි පූර්වාරාම පූජාකථාවෙන් අසා දතයුතු.

එසේ ශ්‍රවණීයවූ කුශලඵලවිශේෂඇති විසාඛාවෝ සැවැත්නුවර මිගාරසිටාණන් පුත් පූර්ණවර්ධනකුමාරයන් කරා සරණමගුල්ව ආපසු ඒ කුලයෙහි හැමදෙනාගේ මිථ්‍යාදෘෂ්ටි හරවා සම්‍යග්දෘෂ්ටි යහින්වූහෙයින් එම මයිල්වූ මිගාර නම් සිටුහුවිසින් විශාඛාවන්ගේ ගුණ සලකා තමන්ට මවුතනතුරෙහි තුබූ තැන්පටන් "මිගාරමාතාවෝය" යන නමින් ප්‍රසිද්ධව මේ බුදු සස්නෙහි ශ්‍රද්ධාසම්පන්න සියලු උපාසිකාවරුන්ට අග්‍රතනතුරු ලද්දන් සියලු සඞ්ඝයාවහන්සේට ම මවුතනතුරෙහි පිහිටා දවස තුන්වාරයක යන ගමන අතුරෙන් උදෑසන යනකල පෙරවරු භාගයෙහි වැලඳියයුතු බාද්‍යාදි විකෘති යද මධ්‍යාහ්නභාගයෙහි යනකල පස්වරු භාගයෙහි වැලඳියයුතු පානවර්ගයන්ද සවස්වේලෙහි යනකල මල්සුවඳපහන්තෙල් බෙහෙත් පස ආදී මේ සියල්ලම ඒ ඒ කලට නිසිලෙසම ගෙන්වා ගෙණ විහාරයට යන්නාහුය.

එසේ තුනුරුවන් කෙරෙහි මමත්වයෙන් යෙදී අප්‍රමාදව වසන ඒ විශාඛාවෝ එක්දවසක් බුදුන් දැක පසඟ පිහිටුවා වැඳ ස්වාමිවූ බුදුරජානන්වහන්ස මෙතැන්පටන් මාගේ ජීවිතාන්තය දක්වා බුදුවහන්සේකරා ආගන්තුකව යම් පමණ භික්ෂූහු වැඩියාහුවී නම් පළමුවම පැමිණිද අනික් දෙරකට නොවැඩ විසාඛාවන්ගේ දෙරටම හැමදෙනම අද සිඟා යවයි වදාරණ වරයෙක, තවද ස්වාමිනි මා දිවි පමණින්ම පන්සියයක් භික්ෂූන්වහන්සේට නිති දන් තාබා දෙනුකැමැත්තෙමි එසේවූ වරයෙක, තවද මේ බුදුසස්නෙහි ගිලන්වූ ස්වාමීන්වහන්සේලා ගිලන්පස පිණිස සිඟා මාදෙරට යවා වදාරණ වරයෙක, තවද ගිලනුන් බලා පිරිමසන යම් කෙනෙකුන් වහන්සේ ඇත්නම් ඒ හැමට මාගෙන්ම දන් දෙවාවදාරණ වරයෙක, තවද හැම දවස්ම මාගෙන් පන්සීයක් භික්ෂූන් හා සමඟ කැඳ අවුළුපත් වළඳවදාරණ වරයෙක, තවද වස්අන්තයෙහි අවුරුදුපතා වස්වාසික ලාභකොට පන්සියයක් අටපිරිකර පිළිගන්නාවූ වරයෙක, තවද හැමදෑම බෙහෙත් පස බෙහෙත්බඩු හැමදෙනාවහන්සේටම මාගෙන් පිළිගන්නා වරයෙක, තවද බුදුසස්නෙහි හැමදෙනාවහන්සේටම අවුරුදුපතා කඨිනසිවුරු දන් දෙනුකැමැත්තෙමි එසේවූ වරයෙක, යන මෙසේවූ අටවරයක් මට දෙවාවදාළමැනවැයි ආරාධනාකළහ. එවිට බුදුරජානන්වහන්සේ "සාධු සාධු විසාඛාව" යි තුන්ලක් වදාරා ඒ යාඥාකළලෙසම වර අටම දෙවාවදාළසේක.

මෙසේ අටවරයක් ලදින් අප්‍රමාණව මේ බුදුසස්නෙහි පින් ඇස් කළාවූ ඒ විසාඛාවන් වැදූ නිරෝගී පුත්තුම දශදෙනෙක, නිරෝගීවූත් වැනිවූ දූන් දශදෙනෙකැයි මෙසේ දූන් පුතුන් විසිදෙනෙකු විසිඅවුරුද්දක් ඇතුළතම වැදූහ, ඒ දරුවෝ විසිදෙනාද එසේම දරුවන් විසිදෙනා විසිදෙනා බැගින් වැදූහ, තවද ඒ මුණුබුරෝද එසේම විසිවිසිදෙනා වැදූහ, මෙසේ විසාඛාවන්ගේ කුසින් වැදූදරුවෝම විස්සෙක, මුණුබුරෝම සාරසියයෙක, මීමුණුබුරෝම අටදහසෙක, මොහු හැමදෙනම නිරෝගීහ, එසින් අකාලමරණයකට පැමිණියාවූ එකද දරුමුණුබුරෙකෙණෙක් නැත, තවද එක්සිය විසිවයස් දක්වා ඒ විසාඛාවන්ගේ ඉස නරකෙසකුත් නුදුටුයේය, දන්ත චලනයෙක්වේවයි ඇඟ රැලිදීමෙක් පමණුවත් ජරාවට කාරණයෙකැයි නොපෙනුනේමය, හැම දවස්ම දිවිදළින් ඔප නැගූ කාන්තරූපයක් වැනියාහ, සොළොස්හැවිරිදි යෞවනය ඇති කුලාංගනාවක් වැනියහ, මෙතෙක් දරුමුණුබුරන් පිරිවරා විහාරාදියට ඒ විසාඛාවන් නික්මයන කල නොහඳුනන්නෝ දරුමුණුබුරන්කාහෝ විසාඛාවන් කාහෝදැ දැනගන නොහෙන්නාහූය, ඒ වි

සාඛාවන් ගමන් යනකල දුටුදුටුවෝ අනේ යනකලම ඉතාම හොබනාදැයයි කියකියා බලාසිටිති, සිටිනාවේලෙහිද උන්ගේ සිටීමද ඉතා හොබනේයයි කියති. උන්වේලෙහි අනේ වැඳහුන්රූපම හොබනේයයි කියති, වැදහොත් වේලෙහිද අනේ වැදහොත්රූපම ඉතා හොබනේයයි කියති, මෙසේ සතරඊර්යාපථයෙහිම සොඳ මනා ප්‍රියකරුවූ රූපසම්පත්තියක් ඇතියාහ, තවද ඇතුන් පස්දෙනකුගේ බල ඇතියාහ, කොසොල්රජ ඒ අසා ස්ත්‍රියකටත් ඇතුන් පස්දෙනකුගේ බල ඇද්දැයි සිතා වීථිය මැද විසාඛාවන් එනගමන් බලා විමසනපිණිස ඇතෙකු කොහොලින් ඇන කුප්පවා ඉදිරියට ලිහුබඳවා යබුකල ගුගුරා දිවඑන ඇතු දක ඇත්පොඩිවකු දිටු සිංහධෙනුවකසේ බිය හයක් නැතුව සිට සොඬ අකුලා කට ලාගෙණ පෙනකඳු ගසගසා ලඟට අවුත් වැදගිය ඇතු දක මොහු දඩිකොට අල්වාගත්තිම්නම් ඇතු මියයෙයි එසේවිම නපුරුයි සිතා ඇඟිලිගස්සෙහි සොඬ ලාගෙණ මදක් මිරිකාලූහ, එවේලෙහි මහඅඬුවකින් කෙහෙල් මැඩලූවාසේ ඇතුගේ සොඬට මහත්වේදනාවිය, එකෙණෙහි ඇත් දිය සළා ඉලැත්තිලා මරණභයින් ගඬගඬා ආපස්සෙහි දිවපිය, ඒ ආශ්චර්යය දුටු රජපිරිස සාධුකාර දුන්හ, රජ්ජුරුවෝද සතුටුව විසාඛාවන්ට සතුටුපඬුරු යවූහ. මෙසේ ඇත්බලඇති අභිමඞ්ගලසම්මතවූ ඒ විසාඛාවන් හා ඔවුන් දරුමුණුබුරන් හැමදෙනාම සත්කෙළක් මිනිසුන්ගෙන් ගහණවූ සැවැත්නුවර හැමදෙනම තමතමන්ගේ පින්කමෙහි මඟුලෙහි කැඳවාගෙණ ගොස් කවා පොවා සත්කාරකරන්නාහුය.

මෙසේ සියල්ලෙන් ප්‍රසිද්ධව බුදුසස්නෙහි ඉතා ප්‍රසන්නව බුදුන්ගෙන් බණ අසන විසාඛාවෝ තමන්ගේ නවකෙළලක්ෂයක් අගණේ මේලපලඳනාව එක්දවසෙක බණ අසා යනවේලෙහි සිහිමදව ධර්මශාලාවෙහි තබා ගොස් නැවත පරීක්ෂාකොට එහි තුබුබව දැන සිහිමදව වත් විහාරයෙහි තුබුදැය බුදුන්ට පුදමියි කියා බුද්ධගෞරවයෙන් ඒ මේලපලඳනාව තමා පැළඳිමට නොගෙණ එම පලඳනාවෙන් එසේම විහාරයට ප්‍රයොජන නැතිහෙයින් එයට මිල ගෙණ විහාරයක් කරවා බුදුන්ට පූජකෙරෙම්යි සිතා ඒ මේලපලඳනාව රථයෙක තබා යම්කිසිකෙණෙක් මිලදී මේ පලඳනාව ගනමැනවැයි කියා මුළුනුවර ඇවිදුවා මිල දී හැරගන්නාතරම් අතික් ස්ත්‍රියෙක නැතිහෙයින් තුමූම නවකෙළලක්ෂයක් දී හැරගෙණ ඒ නවකෙළලක්ෂයක් මිල දී කිරියක් පමණ බිමක් ගෙණ සැවැත්නුවරට නැගෙණහිරදිග්භාගයෙහි "පූර්වාරාමය" කරවනකල එහි භාග්‍යවතුන්වහන්සේගේ වාසයට තිසි ගඳකිළිය එක් දහස්පන්සියයක් ටැම් හිඳුවා දෙමාල් මාලිගාවක් කොට කරවා

සත්මාලේ පන්සියයක් ගබඩාගෙවල් මතුමාලේ පන්සියයක් ගබ
ඩාගෙවල් යයි මෙසේ විසිතුරු දහසක් ගබඩා නිමවා රන්කොත්
පලඳවා එකලා මේ ප්‍රාසාදය පමණක් නොහොබනේයයි සිතා ඒ
ප්‍රාසාදයන්ද පන්සියයක් පමණ සුලුප්‍රාසාදයන්ද මහත්දීඝසාලා
පන්සියයක්ද කරවා නිමාකොට දියකළ සැටක් පැන් ගන්නා
මහත ඇති සතරන්මයවූ පාදෙනියද ලවා සැටසැටකළයබැගින්
පැන් ගන්නා සතරන්මය මහදියකළ සැටක් ලවා සෙසු රන්කො
තලා රන්සෙණ්ඩි හා රන්වලන් රදිවලන් සාංඝිකකොට ලවා මැ
විසියෙන් කැප වලදක් මගේ මේ විහාරසීමාව ඇතුළට ගෙණ වැද්ද
නොහෙත්වයි කීසේ නියෝගකොට මේ සියල්ලවත් තමන්ගෙන්
ම රුකවල් ලවා වටා සිටිසිටි පවුරු වාසල්දොරටු පැන්පොකුණු
උයන් ආදී සියලු කර්මාන්තය නවමසකින් නිමවා අසූමහසව්
වන් ඇතුළුවූ සතළිස්දහස්පන්සියඅසූඑක්නමක් පමණවූ බුදු
පාමොක් මහසඟපිරිසට ආරාධනාකොට මුළුනුවර ඇලලීයනසේ
කරණලද මහපූජාවෙන් බුදුපාමොක් මහසඟ වඩාගෙණවුත් දෑ
සක්ගබඩා වෙනවෙනම දිව්‍යවිමානසේ අලඞ්කෘතකොට සරහා
එකි දහසක් පමණ යහන්ද දහසක් පමණ බුඩාසනද පනවා ඒ
දහසක් ආසනමුදුනෙහි විසිතුරු රුවන්කර්මාන්තයෙන් දිලියෙන
දහසක් සේසත් නංවා ඇතුළෙහි විහාරමලුව කෙළවර දක්වා මා
හැඟි බුමුතුරුණින් බිම වසා වෙන වෙනම ඒ ශ්‍රියහත්ගබඩාගෙ
වලින් බුදුන්වම සුදුසුකොට සැදුලෙස බුදුන් අත පැන් වත්කොට
ඒ පූර්වාරාමවිහාරය පිළිගැන්වූවාහුය. එකල්හි බුදුරජානන්වහන්
සේ විසාඛාවන්ගේ පින්ලොභය ඉතාමහත්සේ දැකවදාරා මේ විහා
රදානයද මහත් උත්සවසේ දක්වා ඇගේ බුඩාලම්බණප්‍රීතිය අද වඩ
වමියි යන කාරණයෙන් ඒ මාලිගාව පිළිගෙණ මධ්‍යයෙහි වූ ශ්‍රී
යහන්ගබඩායෙහි පණවනලද බුඩාසනයෙහි වැඩහිඳ මෙසේම
දහසක් බුදුහු ව්‍යී දහසක්ගබඩාවල වැඩහිඳිත්වයි අධිෂ්ඨාන
කොට වදාළසේක් එකෙණෙහි දහසක්ගබඩාවල නිර්මිතබුද්ධවර
යන්වහන්සේලා සවණක් රැසින් දිලිහි දිලිහී වැඩහුන්සේක්ලාය,
එවිට විසාඛාවෝ බුදුහු කවර ගෙයක වැඩහුන්සේක්දෝහෝයි බලු
හුවෝ ඒ දහසක්ගබඩාවල දහසක් ගෞතම්බුදුන් දැක මහත්ප්‍රී
තින් පිණා මහා උදානයාගනා පතුරුවා ඇමගෙවල බුදුන්දෙක
සිත් එක්තෙනෙකත් සිටානොහී නැවත ඒ මහාප්‍රාසාදදොර
කඩම සිටියාහ.

එවිලෙහි විසාඛාවන්ගේ යෙහෙළිවූ එක්කුලස්ත්‍රියක් මේ පි
ණෙහි මමත් සමාදන්වෙමියි සිතා දහසක් අගනා පලසක් ගෙණ
ඔවුන් පෙරවම සිටි සඩ වීනි තුඹගේ මේ ගෙයි මාගේ මේ වස්ත්‍රය

බුමුතුරුණුකොට අතුරණු කැමැත්තෙමි අවසරයක් දුනමැනවැයි කිව, විසාඛාවෝ වස්ත්‍රය දැක මේ පිළිය එහි බුමුතුරුණටත් නො සෑහෙයි කිව්නම් මැ සිත කලකිරියෙයි එසේ කිරීම නුසුදුසුයයි සිතා නුවනින්ම ඒ කාරණය ඇට හඟවමියි සිතා බුහුණුතියෙනි තෙපිම මේ පායෙහි දහසක් ගබඩාවල බලා තෙල පිළියට අඩු පිළියක් දුටුනම් ඒ පිළිය ඉවත්කොට තොපගේ මේ පිළිය අතුට පින් පුරාගණුවයි කිය, ඒ ස්ත්‍රියද දහසක් ගෙවලවල අනාගිවූ බුමු තුරුණු බලා තමාගේ පිළිය හැමට අඩුසේ දැක නැවත අවුදින් මේසා මහත් පින්කමෙහි එක්වගනතුහුණුයෙමියි මහ හඬින් හඬ හඬා මලුයෙහිම සිටියාය, අනඳමහතෙරුන්වහන්සේ ඒ හඬන්නා දැක මේසා පූජාවෙහි කුමට හඬාද නැගෙණියෙනි විචාරා ඒ අඩ නකාරණය දැන තොපගේ පලස අතුරණතෙනක් මම දනිමියි වදාරා විසාඛාවන් නොසෑළකූතැනක් දැක සඳකඩපාන හා කියන ලද ඝනරත්මය පාදෙනිය අතුරෙහි පාපිස්නා බිසිකොට ලවා වදාළසේක.

මෙසේ මාහැඟිවූ පූර්වාරාමවිහාරපූජාව සාරමසක් මුළුල්ලෙහි නොකඩව පැවැත්වූවාහුය, එහි විහාරබිම ගත්තාවූ නවකෙළ ලක්‍ෂයක් ධනය, විහාරකර්මාන්තයට නවකෙළලක්‍ෂයක් ධනය, විහාරදානපූජාවට නවකෙළලක්‍ෂයක් ධනයයි මෙසේ සත්විසිකෙ ළලක්‍ෂයක් පමණ ධනසම්පත් ඒ එකම පූර්වාරාමවිහාරයටම තුණු රුවන් උදෙසා විසාඛාවන්ගෙන්ම පූජාකළාහුය·

මෙසේ මහපිණැති විසාඛාඋපාසිකාවෝ නම් මේ කල්පයට ලක්‍ෂ යක්වන කප්හි මත්තෙහි පියුමතුරා නම් බුදුන් සමයෙහිවූ ශ්‍රද්ධා සම්පන්න එක් උපාසිකාවක්ව ඒ බුදුන් ප්‍රමුඛවූ දහසක් මහසඟ නට මහදන් පවත්වා ඒ බුදුන් පාමුල්හි වැඳහෙව මතු ඔබවහන් සේ වැනි බුදුකෙණෙක්නට අග්‍රඋපස්ථායිකා වෙම්වායි ප්‍රාර්ථනා කොට එතැන්පටන් කල්ප ලක්‍ෂයක් මුළුල්ලෙහි දෙව්මිනිස්ලෝ දෙකෙහි හැසිරිමෙන් අපමණවූ දෙව්මිනිස්සැපත් විඳ අපහාගත්ව තුන්වහන්සේගේ කාලයෙහි භද්දියනුවර මෙණ්ඩක මහසිටානන් ගේ පුත් ධනඤ්ජයසිටානන්ගේ ගෙසි සුමනානම් දේවියකුස පිළි සිඳගෙණ මවුකුසින් බිහිවූ කල විසාඛාවෝයයි තබනලද නම් ඇතිව වැඩිවිය පැමිණිකල උපන් සත්හැවිරිදි කල ඒ භද්දියනම් නුවරට බුදුන් වැඩිපවත් අසා පන්සියයක් කුමාරිකාවන් හා සම ගම ඒ වඩනා පෙරමගට ගොස් බුදුන්ගේ පළමුවෙනි දැක්මෙහිම බණ අසා ඒ පිරිවර පන්සියයක් පමණවූ කුමාරිකාවන් හා සම ගම දහසක් නයින් බබලන සොවාන්ඵලයට පැමිණ උතුම් ආර්‍ය්‍ය ගුණයෙහි පිහිටා වසනුවෝ එයින් මෑතභාගයෙහි සැවැත්නුවර

මිගාරසිටාණන්ගේ පුත්‍රවූ පූර්ණවර්ධනකුමාරයන් හා විවාහමඞ්ගල් බන්ධනයෙන් බැඳී පතිකුලයට යනකල්හි ඇයනියන්ට පැලඳ යන සේ ධනඤ්ජයනම් පියමහසිටාණන්විසින් "මහාලතාපලඳනාව ය,,යි යන නමක් ඇති මහත් පලඳනාවක් කරවණුයේ එහි මහාඝ වයි රත්‍රන් සතරනැළියෙක එසේම උතුම් මුතු එකොළොස්නැළි යෙක විශිෂ්ටවූ පබළු දෙව්සිනැළියෙක අනගිමැණික් තිස්තුන් නැළියෙකැයි යන මෙසේ සඞ්ඛ්‍යාප්‍රමාණවිසින් නියමවූ මේ රත්න යන් හා අන්‍යවූද බොහෝ සප්තප්‍රකාර වර්ණසම්පන්නවූ උතුම් රත්නජාතීන්ම එක්කොට ලක්ෂයක් වටනා කර්මාන්තමිල දීමෙන් ශොභාමානව කරවනලද පෙරවගත්කල්හි හිසපටන් දෙපතුල් දක්වා සියලඟ වසා ඉතා දීප්තිමත්ව බබලන්නාවූ මුදුන්හි සර්වරත්න මයවූ දුර සිට බලන්නවුන්ට සජීව මයූරරාජයෙකුසේ ලීලොපෙ තව පෙනෙන්නාවූ මයූරරූපයකින් අලඞ්කෘතවූ ඇතුන් පස්දෙ නෙකුගේ බල දරන්නාවූ මහත් බල ඇති ස්ත්‍රියකම ධරන්නාවූ එසා මහත් පලඳනාවක් කරවා දීන.

පූර්වභාත්මය ලද්දාහු අටපිරිකර දන්දුන්කල එම කුශලානුභාව යෙන් ඍද්ධිමය පාසිවුරු ලැබී එහිභික්ෂුභාවයෙන් පැවිදිවීමයිස් අටපිරිකර දන්දුන් ස්ත්‍රීන්ටද මෙසේවූ මේලපලඳනාව ලැබීම්ත් ස්වභාවධර්මතාවෙක්මයයි දතයුතු, එහෙයින් මේ විසාඛාවෝද ගිය දවස අටපිරිකර දන්දුන්පිණිත් මෙසේවූ මේලපලඳනාවක් ලදහ, කාශ්‍යපබුදුන් සමයෙහි කිකීනම් රජ්ජුරුවන්ගේ කුඩාදූසඞ්ඝදාසීව පන්සිල් රක්‍ෂාකළ පිණිත් පඤ්චකල්‍යාණයෙන් යුක්තවූ උතුම් විශිෂ්ටවූ දුටුදුටුවන්ගේ නෙත්සිත් පැහැරගන්නා රූපශ්‍රීසම්පත්ති යක් ලදහ, පෙර බොරුවක් නොකී පිණිත් තමා හා සමවූ දූන් පුතුන් ලදහ, බෙහෙත්පස ගිලනුන්ට දන්දුන්නාවූ පිණිත් තුමූද නිරොගිව එසේම නිරෝගිවූ දරුමුණුබුරන් ලදහ, බුදුන්සඟුන්ට පොකිරි දන්දුන්පිණිත් ස්ත්‍රීව සිට ඇතුන්පස්දෙනෙකුගේ බල ඇතිවූහ, ගියදවස භික්ෂූන්ට ආරාධනා කොට සවහසනාශෙක්ම වලඳවනකල වලඳඅත්තයෙහි එක්බත් ආලෝපයක් වලඳවාලූ පි ණිත් පතිකුලයට යන දවස්හි දායාද සරක් දූන්පමණට වඩා එක් ලක්‍ෂවිසිදහසක් පමණ ගවයෝ ගාල්කඳ පැන වැගිර නික්ම ගියාහ,

මෙසේ පෙර කරණලද කුශලබලයෙන්ම සියල්ලෙන් අඩුනොවූ ඉතාම්හත් උදාරතර නොයෙක් සම්පත් ලදීන් එසා මහත් පලඳ නාවකින් ආත්මභාවයද අලඞ්කෘතකොට ගත ලොව කුශලඵල කැමති සියලු සත්ත්වද ලෝකයාවිසින් අපි අපිද විසාඛාවන්සේ ශ්‍රද්ධාදී ගුණනුවන ආයු රූප සැපබලයයන් නිතිදරුමුනුබුරුදසිදස්

ගවමහිෂ්‍යාදී සියලු සම්පත් ලබම්වයි ප්‍රාර්ථනාකරණයේ ලොකප්‍රසිද්ධව මේ බුද්ධොත්පාදයෙහි සෙසුසත්ත්‍වයන් නොකළ නොයෙක් පින්කම් කිරීමෙන් හා තමන් පැලඳි පලඳනාව පවා වියදම්කොට මිලගෙණ ඒ මිලයෙන්. එසා මහවිහාරයක් කරවා මේ ශාසනයෙහි සියල්ලට වැඩිතරම් බොහෝසම්පත් නිධානකිරීමෙන් අන්‍යස්ත්‍රියක් නොලද්ද අග්‍රඋපාසිකා තනතුරු ලදින් සොවාන්ඵල පැමිණ සසර ඉතිරව සිටි ජාතිගණනටත් හැම සම්පතෙන් අඩුනොව ජාතියෙන් ජාතියට වඩ වඩා තමා අලංකාරකොට සරහාගත් විසාඛාවන්ගේ මේ ප්‍රවෘත්තිකථාව අසා සතුටුවූ සිත් ඇති සත්පුරුෂයෙනි ලොව පින්කිරීම නම් මෙසේ ඉතායහපත්දෙයකැයි දැන ආදර උපදවා එසා දරුමුනුබුරුආදී මහසම්පත් පවා ලදින් එයින් ප්‍රමාද නොව දවස තුන්විටෙක විහාරයට එළඹ දන්දීමෙන් බණ ඇසීමෙන් සිල් රැකීමෙන් මෙසේ උපන් ආත්මය සඵලකොටගත්කල මේසා ඉතාස්වල්පතර සම්පත්ආදියක් ලදින් එයින් අපි පමාවන්ට කාරණ කිම්දැයි සලකා දැන දිවාරාත්‍රිදෙක්හිම අප්‍රමාදව කුශලකාරණයෙහි යෙදී වසනුවන්විසින් මතු උපනුපන්ජාතිවල ආයුරූප ශ්‍රීසම්පත්ආදිය නැතිකොට දුක් දෙන ප්‍රාණතිපාතක්‍රොධෙර්ෂ්‍යාදි පාපයෙන් දුරුව ඒ හැමසම්පත් ඇතිකොට දෙන නිත්‍යපඤ්චශීලාදී සිල් රක්ෂාකිරීමෙන්ද තමන් නිවන් දක්නා මෙදැතුරෙහි ඒ විසාඛාදීන්සේ හැමයෙන් අඩුනොව මහත් භවභොගසම්පත්තින්ගේ ලැබීමට කාරණවූ නොයෙක් ප්‍රභේද ඇති දානවස්තු මසුරුනොව දානලක්ෂණ දැනඇදින දන්දීමෙන්ද සසරින් ගොඩනැගී නිවන්පුර වැදීමටම කාරණවූ බුදුගුණතිලකුණුආදී භාවනා සිහිකිරීමෙන්ද මේ හැම කුශලාකුශලධර්මයන්ගේ විභාග දැනහැදින ගැන්මෙන් නුවණ වැඩීමටම කාරණවූ බණ ඇසීමෙන්ද මෙලෝ පරලෝ දෙකින්ම වැඩසාදාගැන්මෙන් තමතමන් ලද සියලු සම්පත් සාර්ථකකොටගැන්මෙහි උත්සාහ කටයුතු.

මෙසේවූ ජෙතවන පූර්වාරාම විහාර දෙක පිළිගෙණ අනාථපිණ්ඩිකවිසාඛාදී ශ්‍රද්ධාවන්තයන් නිසා පස්විසිවර්ෂයක්ම සැවැත් නුවර වාසයකළ බුදුරජනන්වහන්සේ එක්ඇතුළුවසක් දෙව්රමෙහි විසුවහොත් දෙවැනිවස පූර්වාරාමයෙහි වසනසේක.

මෙසේ ඒ විහාරද්වයෙක්හිම වාසයකිරීමෙන් අප්‍රමාණවූ දිව්‍යබ්‍රහ්මයන්ටද කොසලනරවරාදී මනුෂ්‍යයන්ටද යනාදී අප්‍රමාණ සත්වයන්ට මෙලෝ පරලෝ වැඩ දක්වා කරණලද අප්‍රමාණ සර්වඥශාසනා ඇතිහෙයින් මාගේ ස්වාමිදරුවූ මටම සරණවූ බුදුරජනන් වහන්සේ "ශාස්තෘ" නම් වනසේක.

එසේහෙයින් කියනලදි:—

දෙවයක්ඛමනුස්සානං ලොකෙ අග්ගඵලංදදං
දදන්තානං දමයන්තානං පුරිසාජඤ්ඤ තෙ නමො—ති.

ලෝවැඩ පිණිස කරණලද මේ ශ්‍රීසද්ධර්මාවවාදසඞ්ග්‍රහයෙහි මෙතෙකින් ජේතවනපූර්වාරාමවිහාර ප්‍රතිග්‍රහණයෙන් ලොකානුශාසනා කළ ප්‍රවෘත්තිකථාව කියා නිමවනලදී

—:0:0:—

මෙසේ මාගේ ස්වාමිදරුවූ බුදුරජානන්වහන්සේ සියලු දිව්‍යබ්‍රහ්මාදීන් හා අඞ්ගමගධ දෙරට වාසීවූද කාසීකොසොල් දෙරට වාසීවූද මිනිසුන්ට මෙලෝ පරලෝ වැඩ දක්වා අනුශාසනා කරමින් වැඩ වසනසමයෙහි දඹදිව මිනිසුන් අතුරේ පෙර බොරුවචන කියා මේ බොරුවීනම් මනු බුදුන් නොදකිමෝවයි කියා බොරුවෙන් ද්වූටගෙණ අනික් පිණකින් මිනිස්පිය ලදින් වසන මහපව්ටු මිනිසුන් නොයෙක් සියගණන් එක්කොටගෙණ අපිත් බුදුම්හ අපිත් බුදුම්හයි කියා නොයෙක් දෘෂ්ටිවිරූපවෙස් ගෙණ ලාභසත්කාර පිණිස ලොව මුළා ජනයන්ට වඤ්චාකරමින් ඇවිදිනාවූ "පූරණකාශ්‍යපය—මක්ඛලිගොසාලය—අජිතකෙසකම්බලය—කකුධකාත්‍යායනය-සඤ්ජයබෙල්ලට්ඨිපුත්‍රය—නිගණ්ඨනාථපුත්‍රය,, යි ප්‍රසිද්ධවූ පන්සියයක් පන්සියයක් පිරිස් ඇති මිථ්‍යාදෘෂ්ටිහු සදෙනෙක් වසූවාහුය.

ඔවුන් සදෙනාගේ ප්‍රවෘත්තිකථාවත් හා රත්හඳුන්හරපෑත්‍රය නිසා දක්වූ ප්‍රාතිහාර්ය්‍ය අරහයා බුදුන් ශ්‍රාවකයන්ට ශික්ෂාපද පැනවූකාරණයෙන් ඒ තීර්ත්‍ථකයෝ හැම අපගේ ප්‍රාතිහාර්ය්‍ය කිරීමට දැන් අවකාශයයි දැන අපිත් ප්‍රාතිහාර්ය්‍ය පාම්හයි කියා තමතමන්ගේ දෘෂ්ටිගතුවත් සමාදන්කරවා ලක්ෂගණන් වස්තුව්යදමෙන් සැවැත්නුවර වාසල්දොරටු හුදුරුව කොටගත් මණ්ඩපය සහ ඔවුන් හැම දෙනා විනාසපත්වූ පරිදි හා බුදුරජ අඹරුකමුලදී ප්‍රාතිහාර්ය්‍ය පානාසේකැයි යනු අසා එම තීර්ත්‍ථකයන්විසින් වඩවඩා මිලදීමෙන් සැවැත්නුවර අඹරුක් කප්පවා නැතිකළහෙයින් බුද්ධානුභාවයෙන් සුරතුරක් වැනි අඹරුකක් පැනන,ගිබව හා ඇසළම්ස මැදිපොහෝදිනයෙහි බුදුරජ යමාමහපෙරහරක් පානාසේකැයි යනු අසා මහපිරිස් රැස්වූ ක්‍රමය ඇතුළුවූ එදවස්හි පැවති යමක ප්‍රාතිහාර්ය්‍යආදි නොයෙක් කථාප්‍රවෘත්තිවිභාගය-විස්තරවශයෙන් අසනුකැමැත්තන්විසින් පූජාවලියෙහි ගණ්ඩබනම් රුක්මුලදී ලද යමකප්‍රාතිහාර්ය්‍යපූජාකථාවෙන් අසා දතයුතු.

මෙහි වතාන්ති එයින් ගුණාංශමාත්‍රයක් පමණ දක්වනුලැබේ.

එසේ ලොව අසාධාරණවූ බුද්ධානුභාවයෙන් හා දෙවානුභාවයෙන් කල්පාන්තවාතයෙන් ඉප්ලයන පරබලාපත්සේ තීර්ථකයෝ හැම දුරුව පරාජයවූකල්හි මාගේම ස්වාමිදරුවූ බුදුරජානෝ එදා දවස පස්වරු අනන්තාපර්යන්තවූ බුදුවරයන්ගේ යමාමහපෙළහර දක්වූ සත්පැයසමාරක් ගියතැන ඉකබිතිව හැමසත්වයන්ගේ සිත්සේ පැවැත්මෙන් වන සැපපහසු දීමට ඔවුනොවුන්ගේ උත්සවට නිසි කල් බලා ඊට හොබනා සුදුසුවේලෙහි බුද්ධසිංහාසනයෙන් නැගිටවදාරා සශ්‍රිකවූ සුගත්පාංසුකූලච්වරයනාධරා නැගුනැගු පත්ලෙහි මහජ්සුව් දක්ව දක්වා තෙමෙම විවෘතවූ දොර ඇති ගන්ධකුටියෙන් රත්නශල්ගුහාවෙතින් නිකුත් අභීතකෙසරසිංහරාජයක්හුගේ වික්‍රම අවික්‍රම කෙරෙමින් තිසි ශංකාවක් නැතිවම පිටත්ව ගඳකිළිනිසමත්තෙහි දිළිහිදිලිහී වැඩසිටිසේක. එකෙණෙහි උදයගිරිපර්වතයෙන් පැනනැගී හිරුමඬලින් නිකුත් සුවහස්ගණින් රැස්සේ ස්වාමිදරුවන්ගේ ශ්‍රීශරීරයෙන් නිකුත් බුදුරැස්සාද තුන්විටක් බුදුන් වට කරකැවී එයින් ගොස් එසා සැවැත්නුවර රත්පවක් අතුරත්නාසේ හැමතැනම හැමවස්තුම රන්වන්කොට එයින් ගොස් මුළුදඹදිවද ව්‍යාප්තව විසිතුරු රන්කැටපතක්සේ බබුලුවා එයින් ගොස් මෙසා සක්වලගල සිසාරා නූන්වාරයක් වට ඇවිද මුළුසක්වළ රන්මුහුදු කෙරෙමින් එයින් අහස්කුසට පැනනැගී සදෙව්ලොව හා සොළොස්බඹලොව සියලු දෙව්බඹුන්ගේ ශරීර හා නොයෙක් රත්විමන් හිරු දුටු කදෙළුපැනියන්සේ නිෂ්ප්‍රභාකෙරෙමින් ආලෝක පතුරුවා එයින් බැස අජටාකාශයෙහි ගැසී ගැසී සිටගත, ශ්‍රීපාදවලින් නිකුත් බුදුරැස්කඳ දෙලක්ෂසතළිස් දහසක් යොදුන් මෙසා ඝනකඩ මහාගොල්පොළොව රන්වන්රසයෙන්ම තෙමා රන්පොළොවසේ කෙරෙමින් යට සාරලක්ෂඅසූදහසක් යොදුන් දියපොළොවට වැද එසිදු රන්මුහුදසේ හැම දිය රන්වන්කෙරෙමින් එයින් යට නවලක්ෂසැටදහසක් යොදුන් වාපොළොවට බැස එසිදු හැමතැනම රන්වන්කෙරෙමින් එයින් යට අජටාකාශයෙහි ගැසී සිටගත.

මෙසේ මාගේ ස්වාමිදරුවන්ගේ එකම ශ්‍රීශරීරයෙන් නිකුත් බුදුරැසින්ම මෙසා මුළුතුන්ලොව ලක්ෂසුවිහස්ගණින් පහන් දැල්වූ පහන්රුකක්සේ ඉතා දිලිහී මහත් ශ්‍රීවත්තවූ නියාවට තමතමන්ගේ ශරීරාලෝකයෙන්ම තුමූ තුමූම දිලිහෙන ලොව එළිකරණ දෙව්බඹරත්විමන් පවා බුදුරැසින්ම රැඳිගිය නියාවට කාළවර්ණ පර්වතාදී ලොව හැම වස්තූන් රන්පර්වතාදියසේ රන්වන්වූ නියාවට නොයෙක් පැහැ ඇති හැමසත්වයන් රන්වන්ව එක්පැහැව ගිය නියාවට අනික් සුදුසුවූ උපමාවෙක් නොදත්මි දෙසියසතළිස් ගවු

දිග හා පුළුල දෙසියයක් ගවුඇති පාණ්ඩුකම්බලශෛලාසනය සහ ළසිවුර සතරපටත් වසාලූවාසේ මේසා මුළුතුන්ලොව සියලු සතුන් හා ගැම්පව්තාදී සියලු වසතුන් තමන්වහන්සේගේ අභිත්ධජනම් ලද එම සිවුරෙන්ම එදවස්හි වසා සරහාගෙණ වැඩසිටිසේක්ව නෑයි සිතාවි.

එසේ මාගේ ස්වාමිදරුවූ බුදුරජානන්වහන්සේ ගන්ධකුටිවාරයෙහි හැමලෙසින් දිලියෙන සඳමඬලක්සේ හිරමඬලක්සේ මුළුලොව සනහන අමාපිඬක්සේ නිවන්පඩක්සේ අඹාවිලක්සේ හැම්සතුන් සැනහීමෙන් ඉතා දීප්තිමත වැඩසිටිවේලෙහි ඒ බුඩවහිම දක්නට එති රැස්ව ආයාමකව්ස්තාරයෙන් දෙළොස්යොදුනක් හා වට සිසාරා සතිස්යොදුනක් මානයෙහි තලම්ටක් අහසට දමාලූකල ඉන් ඇටකුත් බිම වැටිගෙනාගැක්කාසේ ගහණව සිටියාවූ එසා මහපිරිසින් එවේලෙහි අනිකක් බැලූවෝ නැත අනිකක් සීතුවෝ නැත හැමදෙනම "අහො බුඩො අහො බුඩො,,යි යනාදීන් එකපැහැර කියමින් දෙහොත් මුදුන්දී සාධුනාද පූජාකිරීමෙන් බුදුසිරි දක්නට පටන්ගත්හ, එපමණක් මතු නොවෙයි, එසේ තුන්ලෝතිලකයක්සේ දිලිහි දිලිහී වැඩසිටිවේලෙහි මාහිමිවූ බුදුන්ගේ අදහස් දත් කෝටිගණන් ශ්‍රාවකයන්වහන්සේ පෙළින්පෙළ සැදී අවුත් බුදුන්ම සිසාරා විට රන්පලස් කඩතුරාවක් ඇද්දූසේ සැදී පැහැදී සිටගත්සේක, එකෙණෙහි දෙවියෝද අහසින් දිව පරසතු මල් වැස්වූහ, දසදහසක් සක්වළ සියලු දෙවියෝද ආකාශයෙහි විසිතුරු සිනියම් රෙදිකඩක් ඇද්දූසේ හැමසත්නට පෙනිපෙනී දෙහොත් මුදුන්දී පෙළින්පෙළ සැදී අහස්කුස වසා සිටගත්හ. එකල්හි අපබුදුරජානන්වහන්සේගේ අනුශාසනා ඇසීමෙන්ම අනාගාමිව සිටි ඍද්ධිසම්පන්නවූ සරණනම් එක්කුලස්ත්‍රියක් අවුත් බුදුන් වැඳ ස්වාමිනි මාවැනිවූ ස්වාමිදුවක සිටියදී තුඹවහන්සේ පෙළහර පාන්නේ කුමටද මම මෙහි පෙළහර දක්වම්යි කීය. එවිට බුදුරජ උන් ලවා සිංහනාද කරවනුකැමතිව තෝ කෙසේ පෙළහැරක් වාදුයි විචාළසේක. ස්වාමිනි මම මේ මහපොළොව දියපොළොවක් කොට සියක්දහසක් යොදුන් මහත්වූ දියකාවෙසක් මවාගෙණ එහි පූර්වසක්වළින් දිය යටින්නැලී පශ්චිමසක්වළින් නැගී මතුවෙමි එසේම පශ්චිමසක්වළින් ගැලී උතුරුසක්වළින් නැගෙමි එයින් ගැලී දකුණුසක්වළින් නැගෙමි වටසක්වළගල සිසාරා කර නග නගා සියදහස්ගණන් වාරයෙහි හැමට පෙණී පෙණී ඇවිදිම් එසේ ඇවිදිනේ නොයෙක් සුවහස්ගණන් වෙස් මවා ඒ ඒ තැන්හි හිස් නගා ඇවිදිම් එවිට තෙපි කවුරුදැයි විචාළ දෙව්බඹකෙණෙක් ඇත්නම් තිලෝගුරු බුදුන්ගේ පාදරජස් ඉස්මුදුනෙන් පිළිගෙණ

ඒ අව්‍යාදෘත්‍යශාසනයෙහි පිහිටි දුවණිමියි කියමි කීහ. බුදුරජාණෝ ඒ අසා තෝ එබඳු සෘද්ධිබල ඇතිබව මම්ත් දනිමි තෝ නැවති සිටු වයි වදාළසේක.

ඊට ඉක්බිතිව සුලුඅනේපිඬුමහසිටාණෝ අවුත් බුදුන් වැඳ සවමිනි මම මෙහි පෙළහරක් පාම්යි කීහ. තා පානාපෙළහර කියවයි වදාළකල්හි සවාමිනි මම ඇසිපිය හෙළා නොලන ඇසිල්ලෙහි අහසට පැනනැගී මේ මහපිරිස බලබ්ලා සිටියදී මාගේ මේ වෙස අන්තර්ධානකොට සත්ගව්සමාරක් අඟ උතුල් ඇති දෙලොස්ගව් අඟ රියන් ඇති ගව් අඟ වියත් ඇති සොළොස්ගව් අඟ මිණි ඔටුණු ඇති හතළිස්අටගව් මහබඹවෙසක් මවාගෙණ එකඟිල්ලක් ඔසවා දසදහසක්සක්වළ එකාලොකකෙරෙමින් දසඟිලි ඔසවා දසදහසක්සක් වළ මහත් ආලොක පතුරුවා මුළුඇන්ලොවටම ඇසෙනසේ මහත්කොට අත්පොළසන් දිදී සියලු දිව්‍යමනුෂ්‍යසෙනාව වෙවුල්වා සතවෙනි මම අන්කෙක් නොවෙමි තිලෝගුරු බුදුන්ගේ එක්තරා උපාසකයෙක්මි කියා හිම්බල ක්‍යමි කීහ.

ඊට ඉක්බිතිව සත්හැවිරිදිවූ චීරනම් රහත්සාමණේරිකෙණෙක් සුවහස්ගණින් භික්ෂුණීන් පිරිවරාගෙණ අවුත් බුදුන් වැඳ ඉතා කුඩා අතුල්සුන්දෙක ඉස්මුදුනේ තබාගෙණ සවාමිනි සවාමිදරුවන්ගේ මේ ශාසනයෙහි ලදබිලිඳුකලම රහත්වූ මාවැනි දුවක සිටියදී සවාමිදරුවෝ ප්‍රාතිහාර්‍ය්‍ය පානේ ඇයිද? ශ්‍රාවකයෝත් ප්‍රාතිහාර්‍ය්‍ය පානේ ඇයිද? මෙහි මම ප්‍රාතිහාර්‍ය්‍ය දක්වා මේ තීර්ථකයන් හා ඔවුන්ගේ ලබ්ධි ගත් ස්ත්‍රීපුරුෂසමූහයාද ලදැරියෝද පරදවා ජයගණිමින් මේ මහාපිරිස පහදවමියි කීය. එවිට සවාමිදරුවෝ ඔවුන් ගුණ හැම්දෙනාට පහළකරණ කරුණ ඇතිව තොප වයස් ඇති සෙසු කුඩාකෙල්ලෝ මවුන්ගේ තනයෙන් තවදක්වා තුඩ නොහැර කිරිබොන්නාහ එසේවූ තෝ කුමනපෙළහරක් දක්වන්නෙහි දැයි වදාළසේක. සාමණේරී දන්වන්නාහු සවාමිනි මිඩියගේ සවාමිදරුවන්ට දූනෝමය එසේඅවුවත් මම මෙරගල සක්වළගල හිමවුගල යන පර්වතතුණ ලාලිවටතුණක්සේ මෙතනම සිට මේ හැම්ට පෙණී පෙණීමාකරා හැදගෙණ සවාමිදරුවන්ගේ අභිමුඛයෙහි තබාලා මම රාජහංසධෙනුවෙසක් ගෙණ එක්පර්වතයකින් කිම්දබැස එක්පර්වතයකින් නැගෙමි නැවත ඒ පර්වතයෙන් කිම්ද අනික්පර්වතයෙන් නැගෙමි නැවත ඒ පර්වතතුණම ලාලිවටතුණක්සේ අහසටදමා ඛිඹ හිඳනොදී ලාලිකෙළිනම්වූ පෙළහරක් කෙරෙම්යි දූන්වූදැය. එකෙණෙහි එසා මහපිරිසින් සාධුකාර ඝුදුන් එකද සඛයෙක් නැත ඒ බුදුන් දරුබිළිඳුසුරතල් වච

නාය ආසා සනුට්ඨකදුලෙන් තුවින් නොතෙමු නොහැඬූ එකද කොණක් නැත දරුලදු හැම ස්ත්‍රීහුම් ඒ විළඹයෙන් ලය කාන්ථ කන්තවා වඩවඩා හඬන්ට පටන්ගත්හ. ඒ දැක මිත්‍රකුටුම්බිවූ සුව හස්ගණන් ස්ත්‍රීපුරුෂයෝ පැරදූ ඒ ඒ අග දිවන්ට පටන්ගත්හ එබ සට ස්වාමිදරුවෝද එබඳු පෙළහරක් තොපි පානාබව සැබෑම ය මේ මා පානා පෙළහරකැයි විචාළසේක.

ඊට ඉක්බිත්තෙන් සිවුපිළිසිඹියා මහරහත්බව ලත් සත්හැවිරිදිවූ චූඩසාමණේරයන්වහන්සේද මහරහත් සහපිරිස් පිරිවරාගෙණ පසුවනයතින් නැංගාවූ පිසුවිකැකුළක්සේ පැනනැගී අවුත් සිට ස්වාමිනි මම පෙළහැර පානෙමියි කීකල්හි ඒ සිවුපිළිසිඹියාපත් රහත් සාමණේරගුණයද මුළුපිරිසට හඟවනා පිණිස කොයේවූ පෙළහරෙක්දැයි විචාරාවදාළසේක. උන්වහන්සේද ස්වාමිනි මම පන්සියයක් යොදුන් උස ඇති හිමවුගලමුදුනෙහි සිට සියක්යොදුන් මහදඹගස අතින් ගෙණ ඇතෙකු පලඅත්තක් සලන්නාසේ දඹරුකාසොලවා දඹපල ගෙණවුත් මේ සතිස්යොදුනෙක පුරාසිටි මේසා පිරිසට ස්වාමීන්ගේ ආනුභාවයෙන් පැනනැගී අඹරුක අඹ කෑමෙන් දැන් මේ සතුටුවූවාසේ දඹ කවා සතුටුකරවමි, තවද ශක්‍රදෙවේන්ද්‍රයාගේ සියක්යොදුන් පරසතුගස කොබෝලිලඅත්තක් සලන්නාසේ සලා වගුරුවා ගවුදෙගවු සා මහත ඇති පරසතුමල්වැස්සක් වස්වා මේ මහපිරිස් විස්මයපත්කරවමි කීයේය.

ඊට ඉක්බිතිව අපබුදුරජානන්වහන්සේගේ මෙහෙණිවරශාසනයෙහි සෘද්ධිමත් ශ්‍රාවිකාවන් කෙරෙහි අගතැන්පත්වූ උපුල්වන් මහාස්ථවිරින්වහන්සේ දිව්‍යඅශ්වයන් සතරදෙනෙකු යෙදූචතුරඞ්ග දිව්‍යරථයක් මවා අශ්වවෙගයෙන් මහපිරිස දෙබෑකෙරෙමින් පෙළහර පා සිට පන්සියයක් මෙහෙණින්නන් පිරිවරා අවුත් බුදුන් වැඳ සිට ස්වාමිනි අපවැනියන් සිටියදී ලෝතුම්නෝ පෙළහර පානේ ඇයිදැ? එසේ ඇතිකල අප සෘද්ධිමතුන්කෙරෙහි අගපැමිණි මෙහි ප්‍රයෝජන කිමද? මේ දසදහසක්සක්වළින් රුස්වූ දෙවිබඹ සහිත හැම පිරිසට මම පෙළහර පාන්නෙමියි කීදැය. බුදුහු ඒ කවරපෙළහරෙක්දැයි විචාළකල්හි ස්වාමිනි මම මේ මහපිරිස බලාවලා සිටියදී ආකාශයට පැනනැගී ත්‍රි මා කරණ පෙළහරක් මේ බලුවයි තුන්ලෝ පුරා සිටි හැමපිරිසට දැඩහා කියාලා මාගේ මේ භික්ෂුණීවෙශය අන්තර්ධානකොට මේ බිම පුරා සතිස් යොදුනෙහි සිටි මනුෂ්‍යසේනාවස්ම මමද සතිස්යොදුනෙක සිටිනා චක්‍රවර්තිපිරිසක් මවාලා මම චක්‍රවර්තිරජවෙස් මවාගෙණ ආකාශයෙහිම සිට සත්රුවන් පිළිවෙලින්ම ස්වාමීන් අභිමුඛයට ගෙනෙයා ඒ විසතුන් සත්දෙනාගේ පූජාව පෙරදැරිකොට අව

වැනිව මම ඒ මිහපිරිස හා සමග ආකාශයෙන් බැස ස්වාමීන් වැද වැද සිට මහත් සක්විතිරාජ නම් පූජාවක් කෙරෙම්සිද කීදැය.

නැවත සෘද්ධිමතුන් කෙරෙහි අග්‍රවූ මුගලන්මහතෙරුන්වහන්සේද පන්සියක් සඟපිරිස් ගෙණ අවුත් බුදුන් වැඳගෙණ ස්වාමිනි මෙහි දක්වන පෙළහර මටම භාරය එසේම හැකිබවත් මේ දෙවිමිනිස් හැම දනිත්මැයි එහෙයින් මටම අවසර දෙවාවදාළමැනවැයි සැළකළසේක. ඒ කෙසේවූ පෙළහරෙක්දැයි වදාළකල්හි ස්වාමිනි මම එක්ලක්ෂඅටසැටදහසක් යොදුන් මහමෙර අතින් මැඩ උඳුඇටක්සා කුඩාකොට ගෙණ දත්හස්සේ සහවාගණිමි, එසේම හැමදෙනාබල බලා සිටියදීම දසදහසක්සක්වළ දසදහසක් මෙරගලත් එසේම මාකරා හැදගෙණ ඒ හැම වෙන වෙනම දත්හස්සේ සහවාගණිමි, තවද මෙසා මහපොළොව කළාලයක්සේ හකුළා ඇඟිලිහස්සේ තබාගණිමි, තවද මේ මහපොළොව කුඹල්සකක්සේ පෙරලා යට තුබූ අමෘතය සියලු සතුන්ට බෙදා දීලම්සි කියාද, තවද මේසක්වළ මහපොළොව සක්වළගල හිමවිගල සප්තකූටපර්වතයන් හා මෙරගල එක්අතකින් ඔසවාගෙණ මේසා සක්වළකලම්යි කියාද, තවද මේ මහපොළොව පරණලාපතක්සේ හැමටම පෙණී පෙණී ඔසවාගෙණ මහමෙරමත්තෙහි තබාලා මෙරගල කුඩදණ්ඩක්සේ අතින් ගෙණ පත්කුඩයක් හිසට අල්වාගෙණ සක්මන්කරණ මහණකෙණකුන්ගේ ලීලා දක්වා මේ හැම බල බලා සිටියදී සක්මන්කෙරෙම්යි කියාද, වෙන වෙනම තමන්වහන්සේ විසින් දක්වියයුතු ප්‍රාතිහාර්‍යනම් මේමේයයි ප්‍රකාශකොට දක්වූකල්හි මාගේ ස්වාමිදරුවූ බුදුරජානන්වහන්සේ සිංහසේනාවකගේ ගජිනා අසන සිංහරාජයකුසේ ශ්‍රාවකයන්ගේ පෙළහරසිංහනාද අසාවදාරා මුගලන්මහාස්ථවිරය මෙතැන ශ්‍රාවකයන් විසින් දක්වියයුතු ප්‍රාතිහාර්‍යයෙක් නොවෙයි කියා ලොව සම්බුද්ධවිනෙජනපුද්ගලයෝද වෙත්ව ඇතිබැවින් මෙතැන්හි අනන්තාපරිමාණ බුදුවරයන්සේ ලොවුතුරාබුදුවූ මාවිසින්ම දක්වූව මනා පෙළහරධුරයෙක ඒ අනිකෙක් උසුලාලිය නොහැක්ක ඒ බව මේ බුදුවූකල් තබා අහේතුකවූ ආජාණීය වෘෂභරාජන්ව උපන් කල පවා මා හදිනා ගැල් හැදලූ කෙණෙක් නැතැයි වදාරා:—

යතො යතො ධුරං ගරුධුරං යතො ගම්භීරවත්තනී
තදස්සු කණ්හං යුඤ්ජන්ති ස්වාස්සුදං වහතො ධුරං.
මනාපමෙව භාසෙය්‍ය න මනාපං කුදාචනං
මනාපං භාසමානස්ස ගරුභාරංව උබ්බරි
ධනඤ්ච නං අලබ්භෙසි තෙනෙව ත්තමනො අහූ.

යන මේ ගාථා දෙකින් කණ්හජාතකය හා නන්දිවිසාලජාතක
යෙන් බණ වදාරා මහණෙනි තෙපි හැමට එසේ පිළිවන්බැව් සෑ
බැමය එසේදවූවත් තෙපි සිටුව මාගේ සමත්‍රිංශත්බුද්ධකාරකධර්ම
යන්ගෙන් අද පසළොස්වන ධර්ම්ය සිඬවනා දවසය අද මා පානාවූ
පෙළහර මාසේවූ අනික්බුදුකෙණෙක්මුත් නිසිවක්හටත් විෂය
නොවෙයි, බුදුන්ගේ පාරමිතා නැමති මහකප්රුක අමාමහනිවන්
ඵල අද ලොවට දීමෙන් මහත්වූ ලෝවැඩෙක් වන දවසෙකැයි
වදාරා ගඳකිළිහිනිහිසමත්තෙන් ගන්ධමණ්ඩලමාලකයට බැස ආ
කාශය බලාවදාළසේක. එකෙණෙහි සක්දෙවුරජ මාහිමිතුමන්ගේ
පෙළහර දක්නට රැස්වූ ජනයන් හැම දෙනාටම ආතපාදියෙන්
වෙහෙසක් නොව සිත්සේ පෙළහර දක්නට; සඳමියි සිතා දිගින්
පුළුලින් දොළොස්යොදුන් අවටින් සතිස්යොදුන්තැන් පමණ තැ
න වසා සිටිනාසේ දිව්‍යමයවූ නිලුපුල්මණ්ඩපයක් මැවීය, ඒ මණ්ඩ
පයෙහි සියලු දිව්‍යකර්මාන්තයන් අහස සඳමඬල පෙණෙන්නාසේ
හැම සත්‍වයන්ටම විශෙෂයෙන් පෙණෙන්නේය, දසදහසක් රන්
මෙර රන්වැම් සැදුවාසේ තැනි ඒ මතුයෙහි එක්දහස්දෙසිය
තුන්කෙළපන්සාළිස්ලක්‍ෂසත්යොදනක් දිග ඇති මහාරුවන්සක්
මණද යට නියනලද ක්‍රමයෙන්ම මැවීගියේය, ඒ රුවන්සක්මණද
හැමසතුන්ටම ඉන්ද්‍රජාලයක් දෙවුදුතුරුපයක්හේ ප්‍රකාශව පෙණෙ
න්නේය, එවේලෙහි මහපිරිස එකපැහැර සාධුකාර දෙමින් ඔල්ව
රසන් දෙමින් අසුරුසන් දෙමින් උතුරුසළු හිසැසිසාරමින් කොල
මේ කිමෙක්ද? මේ කුමන පෙළහරෙක්ද? අනේ මෙවැන්නක්
පෙර දුටුවිරුවෝ කවුරුදැයි කියමින් අනිකක් බැලූවෝ නැත
අනිකක් සිතුවෝ නැත අහෝ සාධු අහෝ සාධුයි යන සාධුනාද
පැවැත්වීමෙන් මහත් උත්සවයට පටන්ගත්හ, එකල්හි මාගේ
ස්වාමිදරුවූ බුදුරජානන්වහන්සේ උදාගිරිමුදුන් පත් සරාහිරමඬ
ලසේ සතුන් ඇසිපිය නගා බලන ඇසිල්ලෙහි ඒ රුවන්සක්මණ
ට පැනනැගිසේක ඒ දැක අවීචියෙහි පටන් භවාග්‍රය අ[illegible]ා ලෝ
කුස් පුරා සිටි දිව්‍යමනුෂ්‍යාදී සියලු සේනාවම එකපැහැර සාධුකාර
දී දෙහොත් මුදුන් දුන්හ, එකෙණෙහි දසදහසක් ශක්‍රයෝද දස
දහසක් ශඞ්ඛධවනිපූජාවට පටන්ගත්හ, දසදහසක් සුයාම දිව්‍යරා
ජයෝද දසදහසක් දිව්‍යචාමරපවනින් බුදුන්ට සුවපහස් දෙමින්
පෙළසැදී සිටගත්හ, දසදහසක් සන්තුසිතදිව්‍යරාජයෝද හිරම
ඬුලුසේ දිලිසෙන දසදහසක් මැණික්තල්වැට ගෙණ එසේම පෙ
ළ සැදී සිටගත්හ, දසදහසක් සුනිර්මිතදිව්‍යරාජයෝද රන්කැට
පත් රිදීකැටපත් මැණික්කැටපත් ආදී නොයෙක් නොයෙක්

ධුජපෙළහර පඬක්හි ගෙණ පෙල පෙළ සැදී සිටගත්හ, දසදහසක් පරනිර්ම්මිතදිව්‍යරාජයෝද රන්කරඬු රුවන්කරඬු ආදී නොයෙක් මඟුල්පූජාපෙළහර ගෙණ පෙළ පෙළ සැදී සිටගත්හ, දසදහසක් සක්වළ සතළිස්දහසක් වරම්රජදරුවෝද තමන්ගේ දිව්‍යසේනාව හා සමග නොයෙක් පූජාපෙළහරයෙන් අවුත් පෙළපෙළ සැදී සිට ගත්හ, දසදහසක්සක්වළ දසදහසක් සහම්පතිමහාබ්‍රහ්මරාජයෝද සඳමඬුලූසේ දසදහසක් සේසත් ගෙණ අවුත් පෙළ සැදී සිටගත්හ, සෙසු සියලු දිව්‍යබ්‍රහ්මසේනාවද දිව්මල් දිව්සුවඳ ආදියෙන් බුදුන් පුදපුදා තුන්ලෝ පුරා සිටගත්හ, එකණෙහිම දෙතිස්මහාපූර්වනිමිත්ත නම්වූ බුදුන්ගේ අත්භූතපූජාවෝද බුදුවූ දවසේ සේම පහළ වූවාහුය.

එකණෙහි බුදුහු පීතකසිනසමාපත්තියට සමවැද සියොලඟින් බුදුරැස් හැර දසදහසක් සක්වළ අවීචිය පටන් භවාග්‍රය දක්වා ඒකාලෝකකෙරෙමින් හැම සත්හුම සිත්සේ මා බලත්වයි එසේම ඔවුනොවුනුදු විශෙෂයෙන් දකිත්වයි අධිෂ්ඨාණකොට ලොකවිවරණප්‍රාතිහාර්‍ය්‍යයක් කළසේක. එවිට සියලු සත්‍වයෝම එසේ දක්නට පටන්ගත්හ,බුදුරජානන්වහන්සේද කිඹුල්වත බන්ධුසමාගමයෙහි එදවස දැක්වූ යමකප්‍රාතිහාර්‍ය්‍යය මෙන් රුවන්සක්මණෙහි සක්මන්කෙරෙමින් නොයෙක් සමාපත්ති අනේකාකාරව සම්වැදී මෙන් ලොව අවශෙෂ ඍද්ධිමත්නට අවිෂයවූ බුදුවරයන්ටම විෂය වූ යමකමහපෙළහර දක්වා බණ වදාළවේලෙහි අසූකෙළදහසක් ප්‍රාණීහු අමාමහනිවන්පුර වැදී සැනහී ගියාහුය.

මෙසේ තුන්ලෝ පුරා සිටි දෙව්බඹආදී මසපිරිස හැම සතුන් සිත් බලා දැන හැඳින වැඩ සාදා කරණලද විශිෂ්ටවූ සර්ද්ධර්මානුශාසනාවත් ඇතිහෙයින් සර්ද්ධර්මරාජන්වූ මාගේ බුදුරජ "ශාස්තෘ" නම් වනසේක.

එසේහෙයින් කියනලදී.

දෙවමනුස්සානං ලොකෙ අග්ගඵලං දදං
දදන්තං දමයන්තානං පුරිසාජඤ්ඤ තෙ නමො—යි.

ලෝවැඩ පිණිස කරණලද මේ ශ්‍රීසර්ද්ධර්මාවවාදසඞ්ග්‍රහයෙහි මෙතෙකින් සැවැඩ්නුවර ගණ්ඩබ්බවෘක්‍ෂමූලයෙහිදී තීර්ත්‍ථකදමනය පිණිස දැක්වූ යමකප්‍රාතිහාර්‍ය්‍යකථාව කියා නිමවනලදී.

—:0:—

මෙසේ මාගේ ස්වාමිදරුවූ බුදුරජානන්වහන්සේ ප්‍රථම බොධියෙහි බුදුවූ සත්වනහවුරුද්දෙහි ඇසළමැදිපොහෝ ලද උත්‍රසළ නැකතින් තීර්ත්‍ථකමර්ද්දනය කොට රුවන්සක්මණදී අනන්තාපරි

යන්නාවූ බුදුවරයන්ගේ වංශානුගත චාරිත්‍රවූ පරිද්දෙන් යමාමහ්
පෙළහර දක්වා පූර්වබුදුවරයෝ කුමක් කළෝද්‍යෙහෝයි බලාවදාරා
මෙයින් ගොස් තව්තිසාභවනයෙහි ශක්‍රයාගේ පණ්ඩුකම්බලශෛ
ලාසනය පිළිගෙණ එහි වස්වැස අභිධර්මපිටකය දෙසූහයි දැන ඒ
බුද්ධවංශානුගත චාරිත්‍රධර්මය නොවරදවාම මමද කෙරෙම්යි යන
කාරුණයෙන් දෙව්ලොව නැගෙම්යි සිතා තව්තිසාදෙව්ලොව දිසා
ව බලාවදාරමින් සතිස්යොදනෙක පුරා සිටි නරනාරෙන්ද්‍රශ්‍රමණ
බ්‍රාහ්මණයතීශ්වර පිරිස් අභිමුඛයෙහිවූ සාඛාවිටපපුෂ්පඵලපල්ලවා
ලඞ්කෘත සුරද්‍රැම්ප්‍රතිභාගවූ සැවැත්නුවර වහසල්දොරට නුදුරුව
පිහිටි තරුණම්බ්‍රවෘක්ෂරාජයාගේ මූලයෙහි වැඩසිටි විශිෂ්ට චක්‍ර
ලක්ෂණදී අටොරාසියක් මඟුල්ලකුණෙන් සැදුම්ලත් දක්ෂිණශ්‍රීපාද
ය මිටිරියනක් පමණ උස නිරායාසයෙන්ම නගාවදාළසේක. එ
කෙණෙහි මාගේ සවාමිදරුවන් විසින් නොයෙක් ජාතිජාතිවල දෙ
නලද සයනාසන උපාහනදානාදි කුශලබලයෙන් අසූසාරදහසක්
යොදුන් උස ඇති යුගන්ධරපර්වතය හුයාපූ වේබඩඅගක්සේ සක්විති
රජක්හු දුටු චණ්ඩාලයකුසේ නැම්නැමී අවුත් සවාමිදරුවන්ගේ
ශ්‍රීපාදය මුදුනෙන් පිළිගත, දෙවැනිව වාමශ්‍රීපාදයද එසේම මිටි
රියන් පමණ උස ඔසවාවදාළසේක. එකෙණෙහි එක්ලක්ෂඅටසැට
දහසක්යොදුන් උස ඇති මහාමෙරුපර්වතරාජයාද එසේවූ ආදර
යෙන්ම නැමී ඒ ශ්‍රීපාදයද පිළිගත, මෙසේ මිනිස්ලොව පියවරෙක
යුගඳුරුමුදුනේ පියවරෙක මෙරමුදුනේ පියවරෙකැයි ශක්‍රභුවණ
යට තුන්පියවරකින් වැඩි මාගේ සවාමිදරුවූ බුදුරජානන්වහන්සේ
මිටිරියන් පමණට වඩා දෙවෙනිපදවාරය සිඳ ශ්‍රීපාදය අහුකොට
තබාවදාළසේකැයි නොසිතියයුතු,ගේ කුමක්හෙයින්දැයි කිවහොත්
බුද්ධවිෂය අචින්ත්‍යමය එසේ අචින්ත්‍යවූ බුදුන් විසින් අචින්ත්‍යව පූ
රණලද පාරමිතානුභාවයෙන් ජනිතවූ චක්‍රලක්ෂණබලයෙන් අසූ
සාරදහසක් යොදුන් යුගන්ධරපර්වතයද එක්ලක්ෂසැටඅටදහසක්
යොදුන් මහාමෙරුපර්වතයද ශ්‍රීපාද සමීපයට තුමූතුමූම නැමිනැමී
පිළිගත්තාහුය, ශාස්තෲන්වහන්සේ ශ්‍රීපාදයන් තබාවදාළකල්හි
ඒ පර්වතාග්‍රයෝ නැවත යථාස්ථානවලම පිහිටියාහුය.

එසේ මාගේ සවාමිදරුවූ බුදුරජානන්වහන්සේ අසූසාරදහසක්
යොදුන් ගෙවා ශක්‍රභවණයට තුන්පියවරෙකින් වැඩිබව කවර
විස්මයෙක්ද? මුළුලෝ විස්මයපත්වන මහත් මහිම ඇති ඒ අපසවා
මිදරුවෝ නුමුහුකළ පිණින් සසර ඇවිදිනාකළ පවා "ඛදිරඞ්ගා
ර, සාධිනජාතකාදී" නොයෙක් ජාති සහස්‍රවල දන්දෙමි දෙව්ලෝ
යෙම්යි යනාදි වශයෙන් සිතා පය නැගුකෙණෙහිම ගිනි පලා පිපි
පියුමෙන් දිව්‍යරථයෙන් පවා පය පිළිගත්තැවිනුදු, තවද ඔබ සර

ණ ශිඛාග්‍ර පවා යමාමහපෙළහර පාතාදවස්හි චක්‍රවාටමෙරුපර්‍ව තාදිය මාකරා ගැඳගෙණ මෙසේවූ පෙළහරක් පානෙම් ඡට අව සර අපට දුන මැනවැයි කියා යාඥාව සිටිබැවිනුදු, තවද ඔබවහන් සේගේ ශාසනයෙහි මදපිණක් කළ සතුන්ට පවා මේ මෙසේ යයි නොසිතිය හැකි මහත් කුශලඵල ඇතිවනබැවිනුදු, එසේ මේ ලක පත්වත් රජෙක් ගද්දුලෙන් කළ ඇතෙකු බලා තෝවත් මට පිට දේදැයි කී කෙණෙහි අවුත් පිට හිඳුවාගත්බැවිනුදු, දූත් සම තිස්පෙරුම් පුරා තුන්ලෝ මුදුත්පත් ලොවුතුරාබුදුවූකල තමන් වහන්සේ මවුකුස ඉපදීම් ආදී හැම බුදුමගුලෙහි නළුවකුසේ නටා සිටි මෙරගල නැමී ශ්‍රීපාදය පිළිගත්බව අමුතු විෂ්මයෙක් නොවෙයි ඔබකෙරෙහි ජාතිජාතිවල පවා විද්‍යමාණව පැවති ඇති ගුණයේ‍යක්මයයි කියා මම දත්බව මුත් මේ මෙසේයයි එකාන්ත යෙන් නොදත්මි, එසේවූ නොදතහැකි විද්‍යමාන අසාධාරණ බුදු ගුණ සිහිකිරීමෙන්ම අගෝ මාසිත උපදනා සංසාරතැවිල්ල පවා නිවී සැනහීයන්නේය එබදු සිත් සනහන අනන්ත ගුණ ඇති මා ගේම ස්වාමිදරුවූ බුදුරජානන්වහන්සේගේ මෙසේ මෙසේවූ සතුන් ලය කනියවූන ඉතා විෂ්මයව සිටි අනිකක්හට ඉතා විශෙෂවූ ගුණ නුභාව සිහිකිරීම තබා ඔබ ශ්‍රාවකවූ සැර්යුත්මුගලන් ආදී බුදු සව්වන්ගේ එසේවූ විශෙෂ ගුණානුභාව සිහිකිරීමෙනුදු ඔබගේ ශා සනයෙහි ඉතා මදපිණක් කළ සතුන්ට පවා එයින් වන විපාකය එසේ ඉතා විපුලිතරමහත්බව සිහිකිරීමෙනුදු අගෝ මාසිත සැන හී නිවීයන්නේය, එහෙයින් අනේ ලොව ඇම සත්හුම එසේවූ සිත් සැනහීමක්ම ලද්දහුවීනම් අපාදුක්නුදු මිදුනාහුනම්වෙත් දෙවු ලොව සැපද ලද්දහුනම්වෙත් එපමණක් මතු නොවෙයි නිවන් සැපදලද්දහුනම්වෙත්, එබඳුවූ සියලු ලෝවැඩටම කාරණ වන බුදු ගුණයද බුදුසව්ගුණයද කුශලඵලයද මෙසේ ලියා කියා මදක්වත් භාවිතාකල මෙම පිණින් උපනුපන් ජාතිවල සව්සත්නට අවබො ධයෙරෙම්වා ඔවුහුදු ලද ජාතිය සඵලවේමය.

ශක්‍රදෙවෙන්ද්‍රතෙම එසේ වඩනා බුදුරජානන්වහන්සේ දූක දිව්‍යසමූහයා සමග නොයෙක් දිව්‍යපූජාභාණ්ඩ ගෙණ පෙරග මන් ගොස් ආදර දක්වා වැද මෙසේ අපකාරා වැඩි ශාස්තෘන් වහන්සේ මා නිසාම වස්වසන අභිප්‍රාව ඇතිසේක් වනැයි දූත් මාගේ ශක්‍රපුරයෙන් කවරනම් තැනෙක බුදුරජහට සැපවිහා රවේද්දෙහෝයි පරීක්ෂාකරණුයේ තමාගේ එකපුණ්ඩරීක උයන මැද පිහිටි සියක්යොදුන් පරසතුමදුරාගසමුල පණ්ඩුකම්බල නම් ශෛලාසනයම උතුම්සේ දූක ඒ ආසනය දිග සැටයො දුන් පුළුල පණස්යොදුන් පමණවූ ඉතාමහත්ය අනේ වඩුදෙ

ලොස්රියත් පමණවූ බුදුන්ට හොබිද්දෙහෝ නොහොබිද්දෙහෝයි
සිතසිතා එසේද වූවත් ඊට වඩා උතුම්ආසනයක් දෙව්ලොවත් නැ
තිහෙයින් මුළුතුන්ලොවට උතුම්වූ බුදුන්ට මාගේ මේ උතුම්
ආසනය පිදීම සුදුසුයයි සිතා දෙසදෙව්ලොව දිව්‍යසෙනාව හා එක්ව
මහත් පූජාපෙළහරින් මහත් උත්සවයෙන් බුදුන් වඩාගෙණ
ගොස් පණ්ඩුකම්බලශෛලාසනය පිළිගැන්විය, එකෙණෙහි මා
ගේ ස්වාමිදරුවෝ දෙලොස්රියත් බුඩශරීරයෙන් පසළොස්යො
දුන් උස ඇති ඒ ආසනය මුල වැඩසිට ශක්‍රයා ආදිකොට ඇති ඒ
සියලු දිව්‍යසෙනාවට අහස්තුස නැගූ යන්ත්‍රපාතයක්සේ ඉතා උස්
ව පෙණී වදාළසේක. ඒ දැක සිසාරා සිටි දිව්‍යසෙනාව කර නගා බු
දුන්ම බලබලා විස්මය පත්ව සාධුකාර දුන්හ, මාගේ ස්වාමිදරුවූ
බුදුරජද ඇසිපිය නගා නොලන ඇසිල්ලෙහි ශක්‍රයා තමාගේ ආස
නය මහතැයි සිතූ සිත දිවසිත් දැකවදාරා මෙහි පළමුකොට බුඩා
නුභාව ප්‍රකාශකෙරෙම්යි සිතාවදාරා තමන්වහන්සේගේ සුගත්විය
තින් දිග නවවියත් පුළුල සවියත් සඟලසිවුර විදා සියලු දිව්‍යසෙ
නාව බලබලා සිටියදීම සතරපටින් පත්කොට හකුලාගෙණ එයින්
දිග දෙසියසතළිස්ගවු පුළුල දෙසියයක්ගවු උස සැටගවු වටින්
අටසියඅසූගවු පමණ ඇති එසා මහත් ආසනය වසා හෙලාලූසේක.
එවිට මහතෙලිසමක් කුඩාපුටුවක අතුට වසාලූවාසේ ඒ සතරප
ටක්ව සිටිය සඟලසිවුරෙන්ම ආසනය වැසීගියේය, හාත්පස්හි සිටි
දෙවියන්ට ආසනයෙන් කිසිවකුත් නොපෙණෙනහෙයින් බැලූබැලූ
අතම සඟලසිවුරම පෙණෙයි,එවේලෙහි ස්වාමිදරුවෝ පලඟ බැඳ
ආසනයෙහි වැඩහුන්සේක,එකල්හි බුදුන්ටම ආසනය හොබනේ
ය ආසනයටද බුදුහුම හොබනාසේක, බුදුන් න්සා ආසනය කුඩාවූ
යේත් නොවෙයි ආසනය නිසා බුදුහු මහත්වූසේකුත් නොවෙයි
අහෝ සාධුසාධු මෙසේ අචින්ත්‍යවූ බුඩවිෂයෙන් සියලු ලොව අභි
භවා මුළුසක්වළට නගාලූ මහාප්‍රදීපයක්සේ පණ්ඩුකම්බලශෛ
ලාසනමස්තකයෙහි දිලිහිදිලිහී මේ සක්වළපටන් දසදහසක්සක්
වළ මුළුල්ලෙහි සිටි දිව්‍යබ්‍රහ්මසෙනාවට විශෙෂයෙන් ප්‍රකාශව
පෙණෙනසේක—කීයේ මැනෝ·

තාවතිංසෙ යදා බුද්ධො සිලායං පණ්ඩුකම්බලෙ
පාරිච්ඡත්තකමූලම්හි විහාසි පුරිසුත්තමො.

දසසු ලොකධාතුසු සන්නිපතිත්වාන දෙවතා
පයිරුපාසන්ති සම්බුද්ධං වසන්තං නගමුද්ධනි·

න කොචි දෙවො වණ්ණෙන සම්බුද්ධස්ස විරොචති
සබ්බෙ දෙවෙ අධිගය්හ බුද්ධොවෙකො විරොචති-යි·

යත්‍රහෙයින් හාත්පසින් සාරසියයක් ගවු ආලෝක පැතිරෙ
මින් ශොභාමත්ව සිටි පරසතුරුකමුල පණ්ඩුකම්බලශෛලාස
නම ස්‍ථානකයෙහි තුන්ලෝ තිලකයක්සේ අතිශයින් දිලිහිදිලිහී
අචින්ත්‍යානොපම ශ්‍රීබුද්ධවිලාසයෙන් වැඩහිඳ එදවස්හි දසදහසක්
සක්වළින් රැස්වූ සියලු දිව්‍යබ්‍රහ්මයන්ගේ දිව්‍යශරීර දිව්‍යවස්ත්‍ර
දිව්‍යවුංරත්නමය ක්‍රීඩාභරණ රත්නාවයවූ දිව්‍යවිමානශ්‍රීශොභා සියල්
ලම මැඩපවත්වමින් එසේ කිසියම් ආභරණයකුත් නොපැලඳ වඩු
දෙලොස්රියන් පමණවූ රන්වන් බුඩශරීරය කාෂායවස්ත්‍රයකින්
එකාංශකොට වසාගෙණ තමන්වහන්සේම ඒ හැම අභිභවා වි
ශෙෂයෙන් දිලිහිදිලිහී සියල්ලෝ සිත්නෙත් පැහැරගැන්මෙන් ස
ඩම්ලීලායෙන් බබලමින් වැඩහුන් ඒ විලාසයට තරම්වූ සුදුසු අමු
තු උපමාවෙක් අනේ ලොව නැත්මය මගේ සිතට නොහැඟෙයි
නුවණැසට නොදුනෙයි මසැසටද නොපෙණෙයි එතකුදුඋවත්
අතික් වැඩියක් නැතිබැවින් සක්වළගලින් කුලපව්පෙළෙන් මැද
ව සිටි රන්මෙරක්සේ කුලගැතියන් පිරිවරා හුන් සක්විතිරජෙකු
සේ තරු පිරුවැරූ සඳමඬලසේ අහස්කුස දිලිහෙන හිරමඬලසේ
ප්‍රභාවගෙන් පිරිවැරූ ශක්‍රයාසේ බඹසෙන් පිරිවැරූ මහබඹුසේ
විශෙෂයෙන් බබලනසේකැයි ලොව හැම කියතුදු හෙද මෙහි නු
සුදුසු බැවින් ඒකාන්තයෙන් මම නොකියමි කියමි නම් ඔබසේම
දසපෙරුම් පුරා විදුරසුන් අරා පස්මරුන් මරා සකල ලොවුතුරා
බුදුව ඔබසේම් සමාමහපෙළහර දක්වා තුන්පියවරකින් දෙවු
ලෝ වැඩ දසදහසක්සක්වළින් රැස්ව හුන් අප්‍රමාණ දිව්‍යබ්‍රහ්ම
සෙනාව පිරිවරා ඔබසේම අඹපරසතුමුල දීග සැටයොදුන් පුළුල
පණස්යොදුන් උස පසළොස්යොදුන් පණ්ඩුකම්බලාසනාරූඪව
විජම්බණ දෙශනාවට සඩම්ලිලාවෙන්ම වැඩවුන් ලොවුතුරා බුදු
කෙණෙකුන්වහන්සේ නමක් මෙනැයි නිසැකින්ම කියමි නිසැ
කින්ම සිතමි, එසේ ලොව උපමාවශයෙනුදු නොදක්ක නොසිතී
ය හැකිසේ තුන්ගවු දෙලොස්ගවු උස රන්රුවන්කඳක් වැනි දෙ
විබඹශරීරවල නන්විසිතුරු රත්නාභරණ හා මාණික්‍යරත්නමය
ඔටුණුපෙළින් සියල්ලම හැදී සැරහී රත්නමයවූ කූටාගාරපවිත
විමාණතොරණ පඩකතිසේ පෙළ පෙළ හැදී සිටි ගණන් මෙතෙකැ
යි පමණ නැති දසදහසක්සක්වළ දෙව්බඹුන් පිරිවරා ඒ මැදව
රැස් නැති දහවල්තරුසේ ඒ හැම අභිභවා මාගේ ස්වාමිදරුවන්
ඒ වැඩවුන් විලාසයද දහම් නැමනී කැවපත ගෙණ නුවනැසින්
බැලීමෙන් අහෝ මාසිත් පිණවන්නේය එසේ හැමවේලෙහිම ධර්ම්
ය බලබලා ලය කතියකතියා මාසිත උපදනා බුඩාලම්බණප්‍රීති
තොමෝ අහෝ මෙතෙකැයි නොදත්තෙමි අනුන්ටද හගවාලිය

නොහැක්කෙමි, දුන් මුව නොපොහොනාබැවින්. එසේවුවද මේ කුශලබලයෙන් මතු උපනුපන්ජාතිවලම මේ බුදුගුණයම විශෙෂයෙන් ප්‍රකාශකෙරෙම්වා හැම සතුන් සිත් පුරවම්වා, මෙසේ මා ඇතුළු සියලු ලොව විශ්මයපත්වන උතුම් බුදුගුණය මා දෙමවුපියගුරුවරාදී හිතාහිත මැදහත් හැම සත්හුද අපසේම මෙම පින්බෙමලන් නිවන් ලබත්වා නොපිරිහෙත්වා.

එසේ මිනිස්ලොව ගණ්ඩබබ්වෘක්ෂාග්‍රයෙහි රුවන්සක්මණෙහි අනාඩානව තුන්පියවරකින් දෙව්ලොව වැඩිකල බුදුන් තුටුවුවා වූ සනිස්යොදගෙනක සිරි මහපිරිසට හිරගල හුනුකලක්හේ සඳගල හුනුකලක්හේ ලොව අන්ධකාරවිය එකල සත්‍වයෝ:—

ගතොනු චිත්‍රකූටං වා කෙලාසං වා යුගන්ධරං
කුතො දක්ඛෙම සම්බුඩං ලොකජෙට්ඨං නරාසභං.
පවිවෙකරතො ධීරො න ඉමං ලොකං පුනෙතිති
කුතො දක්ඛම සම්බුඩං ලොකජෙට්ඨං නරාසභං.

යනාදී ගාථා කියකියා අනේ අපබුදුහු සිතුකුළුපව්වට ගියසේක්දෝහෝ කෛලාශකූටපර්වතයට ගියසේක්දෝහෝ අපබුදුන් කවරදවසෙක දකුමෝදෝහෝයි යනාදී මහත්වූ විලාපයෙන් හඬාහෙණ මුගලන්මහතෙරුන්වහන්සේ කරා ගොස් ස්වාමිනි අපබුදුහු කොසිදැයි විචාළහ, ඒ කාරණය තමන්වහන්සේට විශෙෂයෙන් දැනෙතුදු නොකියා අනුරුඩමහතෙරුන් වහන්සේගේ ගුණ ප්‍රසිඬකෙරෙම්යි සිතා අනුරුඩමහාස්ථවිරයන් අතින් විචාරවයි වදාළසේක, එකල මහපිරිස ගොස් අනුරුඩමහතෙරුන්වහන්සේඅතින් විචාළහ, ඔබ වදුරණසේක් උපාසකවරුණි බුදුහු තව්තිසාභවනයෙහි වස්වැස දෙවියන්ට විජම්බණ දෙසන්ට වැඩිසේක තුන්මසක් දෙව්ලොව වැස වප්මස මැදිපොහෝලද මහාපවාරණදිනයෙහි මිනිස්ලොවට වඩනාසේකැයි වදාළසේක. එබස් අසා මහපිරිස අප බුදුන් දුටුදවසෙකමුත් නොයම්හයි කියා එම සනිස්යොදුන් බිම අතුරු නොදී කඳයුරු බැඳ උන්හ,එතැන්පටන් ඒහැම පිරයට ආකාශයම ගෙය විය, එකල සුලුඅනේපිඩුමහසිටාණෝ කියතුවෝ පින්වත් සත්‍වයෙනි මේ හැම මාගේ බුදුන් දක්නාතෙක් කිසියම් උකාලීයක් නොව බත්බුලත් වස්ත්‍රාභරණ හෝ නා හිඳිනා කිසියම් උපභොග පරිභොග වස්තුවක් නොසොයා මේ සියල්ලම මාගෙන් ගණුවයි කියා කාදවුරුමැද බෙර ලවා එතෙක් සත්‍වයන්ට ඒ තුන්මස මූළුල්ලෙහිම සියලු බත්බුලත් වස්ත්‍රාභරණ මල්සුවඳ කණ බොන බත්පැන් ගිනි දර දක්වා තමන්ගෙන්ම සපයා දුන්හ.

ඔවුන් අමිතභොගී සිටාණකෙණෙකුන් නොවෙයි, කෙසේ සපයා දුන්නුදයත්? බුදුන් රගතුන් දෙවියන්ගේ ආනුභාවයෙන්ම දුන්හයි දතයුතු.

ඒ තුන්මස මුළුල්ලෙහි මුගලන්මහතෙරුන් වහන්සේම ඒ මහපිරිසට බණත් වදාළසේක, සත්වයන් විචාරණ ප්‍රශනත් වදාරා හැමදෙනාවම කලකිරීමට අවකාශත් නොදී අනුශාසනා කළසේක, එසා මහපිරිස් මලමූත්‍රගන්ධයෙක් නොවී උතුරුකුරුදිවයිනා සත්වයන්සේම සියලු කුනපම මහපොළොවටම අන්තර්ධානවෙයි, දෙවියෝ ගන්ධමාදන පර්වතයෙන් සුවඳමඳපවන් මෙහෙයා හැම පිරිසම සුවඳපිඩක්සේ කොට හැමවේලෙහිම සනෙතාෂ කරවති, ඒ තුන්මස මුළුල්ලෙහි ඒසා මහපිරිස් ඔවුනොවුන්කෙරෙහි ඔවුනොවුන්ට ආක්‍රොශ පරිභව අවතොඥ එරුෂ අප්‍රිය නුසුදුසු වචනයෙක් වේවයි ඔවුනොවුන්ට නොසතුටුව අමෛත්‍රීන් බලනා බැල්මක් පමණකුදු නැත්තේය, හැමදෙනාම ඔවුනොවුන්කෙරෙහි ප්‍රෙම ඇතිව දරුවන් දෙමවුපියන් කලත්‍රමිත්‍රයන්සේ මෛත්‍රීයෙන්ම යෙදී වාසයකළහ, ඒ තුන්මස මුළුල්ලෙහි සියලු සත්වයන්ට ම කාමවිතර්කාදී පාපචෙතනාවෙක් තමාම නොවිය, මේ සියල්ලම බුඩානුභාවයෙන්ම වියයි දතයුතු.

මෙසේ බුඩානුභාවයෙන්ම සියල්ලෙන් ශොභමාණව සැදී පැහැදී මනුෂ්‍යයෝද බුදුන්ම පතපතා සිටිකල්හි එම බුඩානුභාවයෙන්ම රැස්වූ දසදහසක්සක්වළ දිව්‍යබ්‍රහ්මසේනාව පිරිවරා තුන්ලෝතිලකයන්ගේ දිලිහි දිලිහි පාණ්ඩුකම්බලශෛලාසන නැගී යටකී ක්‍රමයෙන් සඩමීලීලායෙන් යුක්තව වැඩහුන්කල්හි පෙර මිනිස්ලොවදී මෙම බුඩොත්පාදයෙහිම ශීල්වත්කෙණෙකුන්වහන්සේට එක් බත්සැන්දක් පිළිගන්වාලූ ඉඳුකනම් දුගියෙක් එම පිණින් ශක්‍රපුරයෙහි මහෙශාක්‍යවූ දිව්‍යරාජයෙක්ව ඉපද තමා ඇඟින් නිකුත් රසින් සියලු දෙවියන් අභිභවා වසන ඉන්දුකනම් වූ දිව්‍යපුත්‍රද, පෙර අබුඩොත්පාදයෙහි එබඳු ශීලසම්පන්නනැන් නොලැබ දෙලොස් යොදනක් මාණයෙහි කැටින් කැට ගස්වා ලිප් බඳවා දසදහසක් හවුරුදු මුළුල්ලෙහි මුළුදඹදිව යාචකයන්ට මහදන් දී පින් කළාවූ අඩකුරනම් රජෙක් එම පිණින් මහෙශාක්‍යදිව්‍යරාජව නොයෙක් ලක්ෂගණන් දිව්‍යඩගණවත් පිරිවරා වසන ඒ අඩකුරනම් දිව්‍යපුත්‍රද යන මේ දිව්‍යරාජයෝ දෙදෙන ඔවුනොවුන් හා එක්ව අත් වැල්බැඳගෙණ කථාකරන්නාහු අද බුදුරජානන්වහන්සේ පාණ්ඩුකම්බලශෛලාසනයෙහි වැඩහිඳ විජම්බණ වදාරණසේක ඒ විජම්බණ ඉතා දූඩ්දෙයෙක්ලු අප් දෙදෙන බුදුන්ට ලංව සිට සිත්සේ බණ අසම්හ දූන් ඇසිල්ලකින් බොහෝ! දෙවියෝ රැස්වෙති එකල

අපට අවසර නොලැබෙයි එහෙයින් අපි දෙදෙන පළමු ගොස් සම්පව සිදගණුම්හයි මන්ත්‍රණය කොටගෙණ ගොස් ඉන්‍ද්‍රකනම් දිව්‍යරාජ බුදුන්ගේ දකුණුදණමඬලට තුදුරුව ඉදගත, එකෙණෙහිම ශක්‍රපුරයට බුදුන් වැඩිබව අසා මාතෘ නම්වූ පුරුෂදිව්‍යරාජත්ව තුසිනාභවණයෙහි උපන් මහාමායාවූ මැතියන්වහන්සේ මපුතනුවන්වහන්සේගේ දහම්අමා මා සිත්සේ අද අසා ගන්නාවූ දවසෙක මේ කප් ලක්‍ෂය මුළුල්ලෙහි නොයෙක් ජාති කොටියෙහි ම විසින් ඔබට කළාවූ දරුසනාවෙහි ඵල විඳගන්නාවූ දවසෙක මහෞෂධ පණ්ඩිතවූකල මට දිව්‍යඖෂධයකින් සඞ්ග්‍රහකළසේක, වෙස්සන්තර රජවූකල උපන්විගසම සතුටුසිතින් මාමුහුණ බලා අම්ම දන්දෙන වස්තුවක් මා අත තබවයි යන මධුරබසක් කීදැය, මේ බුදුවනජාතියෙහිදු මාකුසින් උපන් කෙණෙහි සත්පියවරක් ඉදිරියට ගොස් මහත් ජයසිංහනාදකොට මා සිත සතුටුකළදැය, සෙසු ජාතිවලද මට කළ සුරතල් මෙතෙකැයි පමණ නැත, දැන් ලොවුතුරාබුදුව තුන්ලෝ මුදුන් පැමිණි සමයෙහි මට මිහිරිවූ විජම්බණ දෙසා නිවන්අමා දෙනසේකැයි සිතා ඉතා සතුටුව තුන්ගව්වු උස දිව්‍යශරීරයකින් සැටගැළක් පුරාලණ දිව්‍යාභරණයෙන් අලඞ්කෘතව විසිඅමුනක් සුවඳවිලවුන් දරා ලක්‍ෂකොටිගණන් දිව්‍යාළුමහ පිරිස් දිව්‍යසෙනාග පිරිවරා තුසීපුරයෙන් බැස සියලු දෙවියන්ගේ ශරීරප්‍රභා නිස්ප්‍රභාකොරෙමින් පුතනුවන්වහන්සේගේ ශරීරප්‍රභායෙන් එකාලොක කොරෙමින් අවුදින් සියලු දිව්‍යසෙනාවට පළමුකොට පුතනුවූ බුදුරජානන්වහන්සේගේ දක්‍ෂිණපාර්ශ්වයෙහි දෙහොත් මුදුන්දී සිටගත්හ.

එකෙණෙහි දසදහසක්සක්වළ සතළිස්දහසක් චරම්රජදරුචෝය දසදහසක් ශක්‍රදෙවෙන්ද්‍රයෝය දසදහසක් සුයම්රජහුය දසදහසක් සන්තුසිතරජහුය දසදහසක් සුනෙර්මිතරජහුය දසදහසක් පරනෙර්මිතරජහුය එක්ලක්‍ෂපණස්දහසක් මහාබ්‍රහ්මරජහුයයි යනාදිවූ සියලු දිව්‍යබ්‍රහ්මරාජසෙනාව ඔවුනොවුන් පරයා දිව අවුදින් වන්හ. මෙසේ මහානුභාවසම්පන්නා දෙවියන් එත් එත් අල්පේශාක්‍යදෙවියෝ පසු බැස බැස ගොස් සමහරු සක්වළගල මුදුනේ මදක් අවකාශ ලැබ ගැහැටී ගැහැටී සිටිති, සමහරු යුගන්ධරාදී සත්කුළුපව්වන් දක්වා පසු බැස එහිදු ගැහැටි ගැහැටි සිටිති, සමහර බලවත් දෙවියෝ පසුබැස යොදුන් ලක්‍ෂයක් දහසක් සියයක් පමණතැන් පසුබැස ගොස් ගැහැටි ගැහැටි සිටිති.

යට කී අඞ්කුරනම් දිව්‍යරාජතෙම පෙර තමාගේ දන් පිළිගන්නට සිල් රක්නා තැනක් නොලැබුනු අඩුවෙන් පසුබස්නේ මහානුභාව සම්පන්න දිව්‍යරාජයෝ එත් එත්ඔවුන්ට අවකාශ දීමෙන් පසුබැස

ගොස් තමා මසුරු නොව බොහෝදනවස්තු පරිත්‍යාගකළ මහ පින්බල ඇතිහෙයින් මදපිණින් දෙව්ලොව උපන්නාත්සේ ඉතාදුරුව නොගොස් වම්දනමඬලට සතළිස්අටගව් පමණ දුරුව හුන්නේය.

ඉන්ද්‍රකනම් දිව්‍යරාජතෙම පෙර තමා බුද්ධොත්පාදයෙහි සිල් රක්නාඑක්නමකට එක්බත්සැත්දක් වී නමුත් දන්දී කොට ගත් මාහැඟි කුශලබලයෙන් අඟලක් පමණ තැනුත් නොසෙල්වීම බුදුන්ගේ දකුණුදනමඬල සමීපව උන්තැනම සතුටු සතුටුව නිශ්චලවම හුන්නේය.

බුදුරජාණන්වහන්සේ ඒ දිව්‍යරාජයන් දෙදෙනාගේ කුශලබල විභාගය පළමුකොට මේ දිව්‍යසේනාවට හඟවා දනඵලය ප්‍රකාශ කොට හූනයගවෙතනාවෙහි පිහිටුවා පසුව විජම්භණ දෙසම්යී සිනාවදුරා දෙළොස්යොදනෙක හුන් අඞ්කුරනම් දිව්‍යරාජයාට අඞ්කුරයයි මහත්කොට මේ හැම දිව්‍යසේනාවට ඇසෙන පරිද්දෙන් හඬගාවදාළසේක. ඒ ශබ්දය සක්වළගල් පර්යන්තව බඹලොව ගසා සිටි සියලු දිව්‍යබ්‍රහ්මසේනාව අසා සියලු බණපිරිසම නිශ්ශබ්දව බුදුන් දසාව බලා හුන්හ. සැවැත්නුවර සනිස්යොදනෙහි පිරී සිටි මහපිරිසද බුදුන් අඞ්කුරයයි වදාළබස අසා එකෙණෙහි කෝල අප බුදුන්ගේ කටහඬ අනේ දූන් මේ ඇසීගියේයයි ඉතාසතුටුව හැම දෙනම නිශ්ශබ්දවව් කිය කියා දෙහොත් මුදුන්දී දෙව්ලොවදශාව බල බලා සිටියාහ.

එවේලෙහි මාගේ ස්වාමිදරුවූ බුදුරජානන්වහන්සේ—

මහාදනං තයා දිනනං අඞ්කුර දීඝමන්තරං
සුවිදූරෙ නිසින්නොසි ආගච්ඡ මම සන්තිකං.

යන මේ ගාථාව සියලු සතුන්ට ඇසෙනසේ වදාරා අඞ්කුරය පෙර තෝ දසදහසක් හවුරුදු දෙළොස්යොදනෙක ලිප් බඳවා මහදන් දුන්නෙහිය එහෙයින් මොබ අවුත් මේ ඉන්ද්‍රකයාසේම මා සමීපයෙහි බණ අසාහුණුවයි වදාළසේක. ඒ අසා අඞ්කුරනම් දිව්‍යරාජයා හුනස්නෙන් නැඟී බුදුන් වැඳ සිට:—

අයං සො ඉන්ද්‍රකො යක්ඛො දජ්ජා දනං පරිත්තකං
අතිරොචති අම්හෙහි චන්දො තාරාගණෙ යථා.

යන මේ ගාථාව කියා ස්වාමීනි පෙර මම අබුද්ධොත්පාදයෙහි මිනිස්ලොව ඉපද සිල් රක්නාතැන් නැතිබැවින් බොහෝදනවස්තු පරිත්‍යාගකොට දන් දී හඩුකුඹුරෙක යාලක් වපුට පැලක් ගත් නාසේ නොසිල්වතුන් විෂයෙහි බොහෝවූ පින්කම් කොට මෙසේ ස්වල්පවූ අනුභාවයක් ලදිම්, තෙල ඉන්ද්‍රකනම් දිව්‍යරාජයානෝ

සරුවූ කෙතක පැලක් වපුට ඵලක් ලබන්නාසේ ඔබවහන්සේගේ මේ බුද්ධොත්පාදයෙහිම සිල්වතුන්විසයෙහි ඉතාස්වල්පවූ පිණක් කොට අප්‍රමාණවූ මහානුභාව ලදින් අප හැම අභිභවා තරුමැද සඳක්සේ ස්වාමීනි තුමූම දිලියෙන්නේය.

එවේලෙහි බුදුහු ලඟ වුන් ඉන්ද්‍රකයන් බණවා ඉන්ද්‍රකය තෝ කළ පිණද කියවයි වදාළසේක. ඒ අසා හුන්ස්තනින් පැනනැඟී බුදුන්ට දොහොත් මුදුන්දී සිට ස්වාමීනි පෙර මම ඉන්ද්‍රකනම් දුඃඛිතයෙක්ව දෙරින්දෙර භික්ෂාචර්‍ය්‍යා කොට ඇවිදිනාහු එක්දෙරෙක සිඟා සිටි කල ඒ ගෙයි මිනිස්සු මා දැක මහත්කරුණාව උපදවා මට දෙන්ට බත්සැන්දක් ගෙණාහ, එවේලෙහිම ඔබවහන්සේගේ සස්නෙහි අනුරුද්ධනම් මහතෙරුන්වහන්සේද පසුව එම දෙරට සිඟාවැඩි සේක, මම එකල උන්වහන්සේ දැක මහත් සැදැහැයෙන්ම මා උදෙසා ගෙණෙන බත්සැන්ද ඔබපාත්‍රයටම පිළිගන්වාලීමි, එපමණ පිණින් මේ දෙව්ලොව උපන් මාගේ ශරීරයෙන් නිකුත් ප්‍රභා, හැම දෙවියන් මැඩගෙණ පවතිනලෙසත් මා අභිමුඛයෙහි හිඳගත හැකි දේවතාවෙකු නැතිහෙයින් එසේවූ මාගේ තේජස් හා පිරිවර මේ බලාවදාළ මැනවැයි කීයේය.

එවේලෙහි දානවිභාගානිශංස දක්වාවදාරණ බුදුරජානන්වහන්සේ:—

විචෙය්‍ය දානං සුගතප්පසත්ථං යෙ දක්ඛිණෙය්‍යා ඉධ ජීවලොකෙ
එතෙසු දින්නානි මහප්ඵලානි බීජානි වුත්තානි යථා සුඛෙත්තෙ

යනාදීන් දන් දෙන්නහුවිසින් තුන්සිත පිරිසිදුකොට දන් පිළිගන්ට නිසිවූ ශීලවන්තතැන් පින්කෙත් දැන හැඳින බලා විමසා දන් දීමෙන් මහත්ඵල වනබව ප්‍රකාශකොට දානානිශංසවිභාග දක්වා දිව්‍යමනුෂ්‍යයන්ට බණ වදාළකල්හි අඞ්කුරය ඉන්ද්‍රකය යන දිව්‍යරාජයෝ දෙදෙන සෝවාන්වූහ, අවශෙෂවූ බොහෝදෙවියෝ මාර්ගඵල ලදහ, සැවැත්නුවර සන්නිශ්‍රයාදනොහි පිරී සිටි මනුෂ්‍ය සෙනාවද ඒ පිරිස බුදුන් වැඩහිඳ වදාළ බණසේම විශෙෂයෙන් තමතමන්ට ඇසෙනහෙයින් දහම්රස විඳවිඳම බණ අසා බොහෝ දෙනා මාර්ගඵල ලදින් සතුටුව සාධුකාර දුන්හ, ඒ හැම දෙනාට බුදුරුව නොපෙණි බණ වදාරණශබ්දය පමණක් ඇසීගිය හෙයින් අනේ අපබුදුන්ගේ මිහිරිවූ කටහඬ දූන් ඇසූම්හයි යනාදිය කියකියා උත්සව කළහ.

එකල තිලෝගුරු බුදුරජානන්වහන්සේ සූවහස් පහන් දැල්වූ පහන්රුකක්සේ මුදුනෙහි දිලියෙන මහාප්‍රදීපයක්සේ දසදහසක් සක්වළ දිව්‍යසේනාව මධ්‍යයෙහි දිලිහිදිලිහී බුද්ධශ්‍රීම දක්වදක්වා

යට කියනලද ක්‍රමයෙන් සියල්ලන් සිත් නෙත් පැහැරගැන්මෙන් සඬම්මලීලාවෙන් වැඩ උන්කල්හි සංසාරයෙහි අපමණ ජාතිවල තමන්වහන්සේටම මැනිවූ මෙම බුදුවනජාතියෙහිදු දසළුකඩම සක් කුසින් උසුලා උපන්සතියෙන් ඒමහාමායාබිසෝනම් ලදමැනියන්වහන්සේ චුතව ගොස් තුසිතභවණයෙහි පූරුෂාතම් ලද්න් මාතෘදිව්‍යරාජව උපන් ඒ මැනියන්වහන්සේ ප්‍රධානවූ සියලු දිව්‍යසෙනාව දෙගොත් මුදුන්දී සිට සවාමිවූ බුදුරජානෙනි ඔබවහන්සේ දුටුදවස් පටන් හැම දෙවියෝම අභිධර්මාමෘතය කවර දවස් අපට දෙනසේක් දෝහෝයි ප්‍රාර්ථනාකෙරෙති, ඒ හැමගේ සිත් පුරා විජම්බණ දෙසාවදාළ මැනවැයි ආරාධනාකළහ.

එවේලෙහි බුදුරජානන්වහන්සේ ඒ මාතෘදිව්‍යපුත්‍රනම් ලද මැනියන්වහන්සේ ප්‍රධානවූ සියලු දිව්‍යබ්‍රහ්මසෙනාවගේ ඇස් නිමවමින් කන් නිමවමින් සිත් නිමවමින් බැණනැගි බසින් ශ්‍රීමුඛයෙන් නිකුත් සුවඳින් මුළුසක්වළ සුවඳකරඬුවක්සේ කෙරෙමින්, "කුශලා ධම්මා අකුසලා ධම්මා අව්‍යාකතා ධම්මා" යී යනාදීන් සප්ත ප්‍රකරණයකින් යුක්තවූ විජම්පිටකය හලලා අභිධර්මදෙශනාවට පවත්ගත්සේක· කෙසේදයත් ?

එදවස්හි මාගේ සවාමිදරුවූ බුදුහු අනන්තාපර්යන්තවූ බුදුවරයන්ගේ ඥානයටම විෂයවූ දිව්‍යබ්‍රහ්මාදී අන් කිසිවක්හටත් විෂය නොවූ පරමගම්භීර අභිධර්මයෙන් දෙවියන්ගේ නුවණට මෙපමණෙක් දෙශනාක්‍රීඩම සෑහෙයි සිතාවදාරා මොහොතක් කල් සිතියම්කඩක් විදපානාසේ සියල්ලටම දැනෙන පරිද්දෙන් උත්තානව දෙශනාකරණකල්හි දිව්‍යබ්‍රහ්මයෝ විශෙෂයෙන් දැන සතුටුව සාධුකාර දිදී මේ අභිධර්මයනම් මහත් ගම්භීර දැඩි දෙයෙකැයි පෙර ශ්‍රැතපරම්පරාවෙන් අසාදනුම්හ දැන් අපට ඉතා උත්තානව වැටහෙන්නේය අනේ අභිධර්මය ඉතා දැඩිදෙයෙක් නොවෙයි ඉතා මොලොක්දෙයෙකැයි සිතසිතා අසති, එකල බුදුහු දෙවියන්ගේ සිත් බලා අභිධර්මදෙශනාලීලාව ක්‍රමයෙන් දැඩිකරන්ට පටන්ගත්සේක, එවිට හැම දෙවිබඹනට ඡායාවෙක් පෙණෙන රූපයක්සේ ඇසෙන පමණ මුත් සකසා නොදැනෙයි සුහක් සුහක් දැනෙයි එසේදළුවත් මදින් මදින් සාධුකාර දිදී අසති, තවද එසේම දෙවිබඹුන්ගේ සිත් බලා දැඩිකොට ගම්භීරාකාරයෙන් දෙශනාකරවදාරණකල්හි සියලු දිව්‍යබ්‍රහ්මයෝම අඳුරුගෙයකට වන්නාසේ කිසිවකුත් නොදැනේය එවිට හැම දෙවිබඹුහුම මේ බුදුරජ වදාරන්නේ කිමෙක්දෝහෝයි සිත සිතා ගලක ඉන්නක් ඇන්නාසේ කිසිවකුත් නොදැන තුෂ්නිම්භූතව සිතියම ඇඳිරූපසේ සිටියාහුය, එවිට බුදුහු නැවත දෙවියන්ට දැනෙනසේ වදාරණකල්හි සාධුකාර දිදී අනේ පෙර

ගේම ගැඹුරු නොකොට වදාරණසේකැයි නැවත නැවතද වඩවඩාලා සංඛ්‍යාකාර දිදී අභිධර්මය මොලොකැයි කියකියා අසති, නැවත නැවතත් දෙව්බඹුන්ගේ සිත් බලබලා ක්‍රමක්‍රමයෙන් දැඩිකොට මෘදුකොට නොයෙක් ප්‍රකාරයෙන් දිවාරාත්‍රිදෙක්හිම සීඝ්‍ර ගතියෙන් වදාරණසේක. යේ කෙසේදයත්?

සෙසු ශ්‍රාවකයන් එකඅකුරක් කියාලනඇසිල්ලෙහි අනන්දමහතෙරුන්වහන්සේ අකුරු අටක් කියාලනසේක, ඒ අනඳසාමීන් එකඅකුරක් කියාලනඇසිල්ලෙහි ධම්සෙනෙවි සැරියුත්මහතෙරුන්වහන්සේ අකුරු අටක් කියාලනසේක, ඒ සැරියුත්මහතෙරුන් එකඅකුරක් කියාලන ඇසිල්ලෙහි බුදුහු අකුරු අටත් වදාරණසේක, එබැවින් ලොව මෙසේ සාමාන්‍යමනුෂ්‍යයන් එක්බසක් කියන ඇසිල්ලෙහි බුදුහු පන්සියදෙළොසක් බස් වදාරා නිමවනතුරම් මෙබඳු සීඝ්‍රවූ වාක්ලීලාවක් ඇතිසේක, මෙබඳු සීඝ්‍රවූ දෙශනා ඇති බුදුහු අප්‍රශූතනයට අතිසීඝ්‍රකොට වදාරණසේක, බුදුන් පෙරබත කළමනා බුඩකෘත්‍යය නිමවා පසුබත සදකඩපහණෙහි වැඩසිට ශ්‍රීපාදය සෝදා පයපිය වියලෙන අතුරෙහි එතනට රැස්වූ භික්ෂූන්වහන්සේට සංඝණිනි බුද්ධොත්පාදය දුලීභය මනුෂ්‍යත්වය ලැබගැන්ම දුලීභය ක්‍ෂණසම්පත් දුලීභය බණ ඇසීම දුලීභය ප්‍රව්‍රජ්‍යාව දුලීභය බුඩදශීනය දුලීභය අප්‍රමාදව ත්‍රිවිධශික්ෂාවන් සම්පාදනය කාවයි යනාදීන් දවසින්දවස වදුරන්නාවූ සුගතොවාදනම් සඞ්ක්‍ෂපදෙශනාවක් කාරණසේක ඒ දෙශනාව පොත්සඞ්ගායනා කරතොත් දික්සඟිය මැදුම්සඟිය පමණ වෙයි.

තවද මේ මිනිස්ලොවින් හවුරුදු සියයෙක්නම් ඒ දෙව්ලොවින් එකදවසෙක ඒ නියායෙන් බුදුන් ඒ තුන්මස මුලුල්ලෙහි සීඝ්‍රගතියෙන් නොකඩව වදාළාවූ අභිධර්මදෙශනාව විස්තරවශයෙන් පොත් සඞ්ගායනාකරත් මිනිස්ලොව සිට ඔබ වැඩහුන්දෙවුලොව පණ්ඩුකම්බලශෛලාසනය දක්වා පොත් ලියා ගොඩකරත් හොත් ඒ උස්තැනෙකැයි නොසිතමි. තවද මේ මිනිස්ලොව අවුරුදු සීයක් ඒ දෙවුලොවට දවසක් වනබැවින් මෙහි අවුරුදු සියයකට දෙවාර දෙවාරයක් එහි දෙවියෝ අනුභවකරන්නාහ එහෙයින් අපබුදුනු ඒ තුන්මසමුළුල්ලෙහි දෙවුලොවදීම වළඳනසේක්වීනම් බුදුනු නිරන්තරයෙන් වළඳනසේකැයි දෙවියෝ සිතන්නාහුයයි දැනවදුරා මිනිස්ලොවට අරුණු නැගෙන වේලෙහි තමන්වහන්සේම එක්වැනිවූ නෙම්මිත බුදුකෙනෙකුන් මවා ඒ අස්නේ හිඳුවා මාගේ දෙශනාලීලාවෙන්ම මේ බුදුහු විජම් දෙශනාකෙරෙත්වයි මේ දසදහසක්සක්වළ දිව්‍යබ්‍රහ්මසෙනාව අතුරෙන් කිසිවෙකුත් මා බැහැරගියබව නොදනිත්වයි අධිෂ්ඨාණ

කොට හිමාලපර්වතයට බැස එහි අනවතප්තවිල අනන්තාපරිමි
තවූ බුදුවරයන්ට නියතව තිබෙන සුගත්නම් මහතොවට බැ
ස නාළිකේරදීවටූ වළඳ මූඛ සොධනය කොට සැටයොදුන් රත්ගල්
තලාමුදුනෙහි කොළුවර පිහිටි සත්යොදුන් මහසල්ගසමුල වැඩ
සිට රත්වලාකඩෙකින් සඳම්ඩල වසන්නාසේ සුහත් මහා පාංශුකූ
ලචීවරය පෙරව වැඩසිටිකල්හි බුදුන්ගේ සිත හා සමග පාත්‍රාධ
තුත්වහන්සේ සවකීයඝ්‍යානයෙන් අහසැව පැනනැගී ගොස් ශ්‍රී
හස්තයෙහි පිහිටිකල්හි අසුරුසණක් කලින් උතුරුකුරුදිවයින
ට වැඩ දිව්‍යභොජන පිළිගෙණ නැවත හිමාලයට වැඩ එම සල්
රුකමුලම වැඩහිඳ වළඳුවදුරණසේක, එකල දම්සෙනෙවි සැ
රියුත්මහතෙරුන්වහන්සේ සැවැත්නුවරදී බුදුන් යමාමහපෙ
ළහර පෑදවස් බුදුසස්නේ පැහැද තමන්වහන්සේ ලඟ මහණවූ
පන්සීයක් පමණ වගුලිභික්ෂූන් ගෙණ සකස්පුරදෙරට ගොස්
එහි වස්වසනසේක් බුදුන් වළඳ අනාවනකල්හි සකස්පුර දෙරින්
වැඩ බුදුන් දක බුදුරජ වැලඳූපාත්‍රය සෝදා කළම්නා වත් කොට
වැද එකත්පස්ව හිඳ ස්වාමිනි ඊයේ පශ්චාත්භක්තයෙහි පටන්
අද අරුණුනැගෙණ මේ පන්සාළිස්පැය මුලුල්ලෙහි ඔබවහන්සේ
දෙසූ දෙශනා හා නෙම්මිතබුදුන් කළ දෙශනා මට වදාළ මැන
වැයි ආරාධනා කළකල්හි බුදුහු වදරණසේක් ශාරිපුත්‍රය දෙවියන්
ට කී ලීලාවෙන් දහුදු දෙශනාකෙරෙත්නම් එතෙක්ම කල් මේහි
පමාවෙයි එසේ ඇතිකල දෙවියන්ට කරණ දෙශනාවද පමාවෙ
යි එහෙයින් තොපට සංක්ෂෙපයෙන් කියම් විස්තරවශයෙන් ධරා
ගණුවයි වදරා ඊයේ මෙතෙක් දෙශනා කෙලෙම් අද මේතෙක්
දෙශනා කෙලෙම් නෙම්මිත බුදුහු මෙතෙක් දෙසූහයි සඞ්ක්ෂෙප
කොට ඇඟිල්ලකින් වදරා තොපගේ වගුලිම්හණුන් පන්සියයට
මේ විශෙෂයෙන් උගන්වව ඔව්හු ප්‍රඥාවන්‍යාහ මතු මාගේ ශාස
නයෙහි සප්තප්‍රකරණචාරි වන්නාහුයයි වදරා දෙව්ලෝ වැඩ
නෙම්මිතබුදුන් අන්තර්ධානකොට ඒ ආසනයෙහි පෙනී නෙම්මිත
බුදුන්ගේ දෙශනාසන්ධියෙහි පටන් අතුරු නැතිවම දිව්‍යසෙනාව
ට බණ වදරණසේක, එසේ බුදුන් දෙව්ලෝ වැඩිකල සැරියුත්ම
හතෙරුන්වහන්සේද සකස්පුරදෙරට වැඩ එහි වසන පන්සි
යක් වගුලිභික්ෂූන් කැඳවා ඇවැත්නි අපබුදුහු මනුෂ්‍යයන්ට නො
දනෙත හෙයින අභිධර්මනම් දෙශනා දෙවියන්ට දෙව්ලොවදී වද
රණසේක එයින් හිමාලයට වැඩිකල බුදුන්කරා දවස දවස මම
ගොස් ඉගෙණගෙණ එම් තොපි හැමදෙනම දවසින් දවස මාකෙ
රෙන් අසා ඉගෙණ මතු විජ්ඣිෂ්ටකයට ආචාරි වෙවයි කියා තමන්
වහන්සේ උගත් පරිද්දෙන් උගන්වනසේක, යථාක්‍රමයෙන්ම

බුදුරජ ඒ වස්තුන්මස මුළුල්ලෙහි විස්තරවශයෙන් අභිධර්මදේශනාව කළසේක. ඒ දේශනාව හා සමගම සැරියුත්සාමි ඉගෙණ තමන් අතවැසි පන්සීයක් භික්ෂූන්ට ඉගැන්වූසේක ඒ හැමදෙනාවහන්සේත් අභිධර්මය ඉගෑන්ම හා සමගම අමාමහ නිවන්පුර වැදී සෑනහීගියසේක.

ඒ පන්සියයක් භික්ෂූහු මෙම කප තුන්වැනිව බුදුවූ කාශ්‍යප බුදුන් සමයෙහි තිරිවවුලෝ පන්සීයක්ව ඉපද එක් ප්‍රාග්භාරයෙක වාසය කරන්නාහුය, එකල්හි එක්තරා මහතෙරහු දෙදෙනෙක් විජම්පිටකය නිමවා ඉගෙණ ඊට තුදුරු ප්‍රාග්භාරයෙක නිරන්තරයෙන් වාසයකෙරෙමින් දෙදෙනාවහන්සේ විජම්භනය සාකච්ඡාකොට පෘච්ඡාප්‍රතිපෘච්ඡාවශයෙන් අභිධර්මය පිරිවාණසේක ඒ අභිධර්මදේශනාශබ්දය අසා සිටි තිරිවවුලෝ පන්සියය එයින් මිය ගොස් ශබ්දමාත්‍රයක් ඇසූ එම පිණින් පන්සීයක් දෙවහන් පිරිවරා දෙව්ලොව ඉපද බුද්ධාන්තරයක් මුළුල්ලෙහි අපාය නොදැක දිව්‍යසම්පත් විඳ අපබුදුන් සමයෙහි දෙව්ලොවින් චුතව සැවැත්නුවර පන්සීයක් කෝලෙඹිකුලවල ඉපද විශ්වාසයෙන්ම ඔවුනොවුන් කෙරෙහි බැඳී එක්වම ශ්‍රීසම්පත් විඳ වැඩිවිය පැමිණ වග්බන්ධනයෙන් ඇවිදිනාහු බුදුන් යමාමහපෙළහර පානාද වස පැහැදී බුදුසසුන් වැද සැරියුත්සාමීන්කෙරෙහි මහණව එක්වම මහනාදම් පුරා එම අභිධර්මශබ්දය ඇසූ කුශලින් මෙසේවූ විජම්පිටකයත් දෙව්ලොව බුදුන් වදාරමින් වැඩසිටියදීම මිනිස්ලොව සිඳ නිමවා ඉගෙණ එම පිණින්ම නිවන්පුර වැදුනාහුය එහෙයින් ලොව පින් කැමති එව්බා පින්වත් සත්වයෙනි මෙසේ ධර්මය යන සංඥවක් නැතිවම ශබ්දය පමණක් ඇසීමෙන් සියලු සම්පත් ලත්කල ධර්මයයී දැන ආදර උපදවා ඇසීමෙහි ඵල ඉතා විශිෂ්ටයයී දැන ධර්මගුන සැලකීමෙන් වඩවඩා ආදර උපදවා බණ ඇසියයුතු.

මෙසේ ශබ්දමාත්‍රයක් කණ හුනු තිරිසන්සත්හු පවා අපායින් මුදා සියලු වැඩා පැමිණී වන මහිම ඇති උතුම් අභිධර්මදේශනාව මිනිස්ලොව ගණනායෙන් තුන්මසක්මුලුල්ලෙහි නිබඳම පවත්වා නිමවාවදාළකල්හි මාතෘදිව්‍යරාජන්ව උපන්නාවූ මෑනියන්වහන්සේ කෙළදහසක් කෙලෙසුන් නසා දහසක් නයින් ප්‍රතිමණ්ඩිතවූ සෝවාන්පෙළෙහි පිහිටා සියලු දිව්‍යසේනාවට පළමු කොට හූනස්නෙන් නැගී දෙහොත් මුදුන්දී සිට ස්වාමිනි අනන්තාපරිමාණ ජාතිවල මටම ප්‍රේමයෙන් මටම දරුව මටම බොහෝ සම්පත් දෙවූ මාගේ බුදුරජානන්වහන්ස පියුමතුරානම් බුදුන් දැක ප්‍රාර්ථනාකළතැන් පටන් මේ කල්පලක්ෂය මුළුල්ලෙහි ඔබ

අතීත් මෑතිකෙණෙකුත් නොසෙව්දෑය මමද අතීත් පුතකුකෙණෙකුත් නොසෙව්යෙම් දූත් මේ බුදුවන ජාතියෙහිදු තිඹුල්වන සුදෙවුන්රජහට අගබිසෝ මහාමායාදේවි යන මාතෘස පිළිසිඳ දස්දහසක්සක්වළ මහපොළෝ සක්වළගල් මෙරගල් කුළපව් නළුවන්සේ නටවා ලොව දෙතිස්මහාපූර්විනිමිති පහළකරමින් ඔබ මාතෘකුසින් උපන්වේලෙහිම දෙව්බඹුන් අතින් පවා මට වඳවා මා උතුම්කොටගත් මාගේ බුදුරජානන්වහන්ස මේ ලෝකයෙහි පුතුන් පතන්නාවූ ස්ත්‍රීහු ඔබ වැනිවූ පුතුන්ම ප්‍රාර්ථනාකෙරෙත්වා පෙර ජාතිජාතිවල මාවසින් පෙවූ තනකිරට වඩා දූන් ඔබවිසින් මා පෙවූ දහම්රසම ඉතාබෙහෙව ස්වාමීනි බුදුකෙණෙකුන්ට මවුවීමෙහි ආනිසංස දූන් ලදිමි ඔබ වැදූපිණිත්ම ස්ත්‍රීආත්මයෙන් ගැලවී මෙසේවූ පුරුෂාත්මයකුදු ලදිමි මතු සත්ජාතියකින් වඩා සසර නොඇවිදිමි ඒ සත්ජාතියෙහි දෙව්ලෝ බඹලෝ විනා අන් තැනෙක නූපදිමි එම පිණින් මාගේ සියලහිත් නිකුත් දිව්‍යශ්‍රීශොභාවෙන් මේ දසදහසක්සක්වළ දෙව්බඹුන් මැඩපවත්නා ලෙසද මේ බලාවදළමැනවැයි යනාදිවශයෙන් සියදහස්වචන කියා බුදුන්ට සතුතිකිර්මෙන් සාධුනාද පවත්වා නමස්කාරකළහ, සක්වළගැබ පුරා සිටි සෙසු දිව්‍යබ්‍රහ්මසෙනාව අතුරෙහුදු එම ධර්මදෙශනාවගේ කෙළවර අසූකෙළදහසක් පමණ අමාමහනිවන් දුටුවාහුය.

කීයේ මැනෝ.

තං දෙවදෙවො දෙවානං දෙවදෙවෙහි පූජිතො
ඉදසෙසි දෙවලොකස්මිං ධම්මං දෙවපුරක්ඛතො-යි·

අපබුදුන් බුදුව වැඩහුන් පන්සාළිස්හවුරුද්ද මුළුල්ලෙහි මෙසේ දසදහසක්සක්වළ දෙව්බඹහු රැස්ව තුන්මසක් නොකඩව බණ ඇසීමෙන් බුදුන් පිදූ මෙබඳු සමාගමයෙක් අතීත් කිසි කාලෙකත් නුවූයේය, මේ සමාගමයනම් අනන්තාපරිමාණ බුදුවරයන්විසින් එකිඑක්වාරයෙක්හිම ලබන්නාවූ ඒකාන්තධර්මසමාගමයෙක්මය.

මෙසේ දෙවාතිදෙවවූ බ්‍රහ්මාතිබ්‍රහ්මවූ මාගේම ස්වාමිදරුවූ බුදුරජානන්වහන්සේ යට කියනලද ක්‍රමයෙන් දෙවුලෝ වැඩ පණ්ඩුකම්බලශෛලාසනය පිළිගෙණ වස්තුන්මස අනූදවසක් මුළුල්ලෙහි අප්‍රමාණවූ විජම්බණදෙශනාවකින් දසදහසක්සක්වළින් රැස්වූ අප්‍රමාණ දිව්‍යබ්‍රහ්මසෙනාවට අප්‍රමාණව කාරණලද වශීභවූ සද්ධර්මානුශාසනා ඇතිහෙයින් "ශාස්තෘ" නම් වනාජේක ඒජේහෙයින් කියනලදී,

සදෙවකස්සමනුස්සානං ලොකෙ අග්ගඵලං දදං
දදන්තං දමයන්තානං පුරිසාජඤ්ඤ තෙ නමො–ති.

මෙතෙකින් මේ ශ්‍රීසද්ධර්මාවවාදසඞ්ග්‍රහයෙහි තුන්මසක්මුළුල්ලෙහි දෙව්ලෝ වැඩහිඳ අභිධර්මදෙශනාව කරවදාළ ප්‍රවෘත්තිකථාව කියා නිමවනලදී.

—※—

මෙසේ අපබුදුහු තව්තිසාභවණයෙහි ශක්‍රදෙවෙන්ද්‍රයාගේ පණ්ඩුකම්බලශෛලාසනයෙහි සත්වෙනිවස වස්වසා දසදහසක්සක්වළදිව්‍යබ්‍රහ්මසෙනාවට අභිධර්මදෙශනාකොට එවස්අන්තයෙහි මහාපවාරණදිනයට සද්දවසක් පමණ කල් ඉතිරිව තිබෙද්දී යට කීයමාම්හපෙළහර දක්නට රැස්ව සැවැත්නුවර සතිස්යොදනෙක පිරී සිටි මහපිරිස අපබුදුන් දැක මුත් අපි නොයම්හයි සහසීව සිට වප්මස පුරඅටවක් ලද පොහෝදිනයෙහි මුගලන්මහතෙරුන්වහන්සේකරා රැස්ව ස්වාමීනි අපි හැමදෙනම අපබුදුන් නොදැක්මෙන් අසූතුන්දවසෙක් වීය කවර දවසෙක මිනිස්ලොවට වඩනාසේක්ද? ඒ අපට නියම දැන වදාළමැනවැයි කීහ, ඒ අසා මුගලන්මහතෙරුන්වහන්සේ මම බුදුන්කරා තව්තිසාභවණයට නැගෙම්, නෙපි හැම ඒ බලාසිටුවයි කියා තමන්වහන්සේ සිටිතෙන්හිම වැද දෙලක්‍ෂසතළිස්දහසක්යොදුන් ඝණය ඇති මහපොළව කිම්ද ගොස් මහමෙරපත්ලෙහි දසදහසක්යොදුන් ත්‍රිකූට පර්වතයන් දරා සිටි මහාගල්පොළොව පලා පැන නැගී ඉන්ද්‍රනීලසාගරයෙහි දිලියෙන ප්‍රවාලාඞ්කුරයක්සේ දිලිහිදිලියී වැඩසිට මේතන පටන් මා නැගෙණසැටි සියලු සත්‍වයෝම විශෙෂයෙන් දකිත්වයි අධිෂ්ඨාණකොට එක්ලක්‍ෂඅටසැටදහසක්යොදුන් උස ඇති මහමෙරපත්ලපටන් විදුරුතොරපනයකින් සිදුරුකොට විද නැගෙන්නාසේ කිම්ද යාමෙන් නැගෙන්ට පටන්ගත්සේක, එවේලෙහි නීලවර්ණවූ මෙරපැත්තදිසාවෙහි පිහිටි කොදෙව් පන්සීයක් හා ජම්බුද්වීපවාසීවූ සියලු සත්‍වයන්ට ඉන්ද්‍රනීලමාණික්‍යයකින් රන්හුයක් අදනාසේ පෙණෙනසේක, එසේම රක්තවර්ණ මෙරපැත්තදිසාවෙහි පිහිටි අපරගෝයානද්වීපවාසී සත්‍වයන්ටද සවර්ණවර්ණවූ මෙරපැත්තදිසාවෙහි පිහිටි උතුරුකුරුද්වීපවාසීන්ටද සුභ්‍රවර්ණවූ මෙරපැත්තදසාවෙහි පිහිටි පූර්වවිදෙහද්වීපවාසීන්ටද යන මේ දෙදහසක් ක්‍ෂුද්‍රද්වීපවාසීන් සහිතවූ සතරම්හද්වීපවාසී හැමසත්‍වයන්ටම ඒ ඒ මාණික්‍යරත්නයන් විද රන්හුයක් අදනාසේ මෙර පලා වඩනාබව විශෙෂයෙන් ප්‍රකාශව පෙණෙනසේක, මෙසේ මහමේරුව සතරදිසාවෙහිවූ සතරම්හද්වීපවාසීන්ට සතර මහාපෙළහරක් එකපැහැර දක්වදක්වා අහස්හි නැගෙණ විදුලි

යක්සේ නොපැකිල වඩනා° මහතෙරුන්වහන්සේ දක සතුටුවූ සත්වයෝ අපමහතෙරුන්වහන්සේගේ පෙළහරක් බලව අපමහ තෙරහු අප බුදුන්ගේම අනුජාතපුත්‍රවූසේක කොල තෙලබල අප මහතෙරහු පන්සියක්යොදුන් උසඇති අර පෙණෙන පළමුවන උරගාලිඳයට නැගිසේක එසේම දෙවන ගරුඩාලිඳයට තුන්වන දහාවාලිඳයට සතරවන යක්‍ෂාලිඳයට පැනනැගිසේකැයි කියකියා බලාසිටිනාහු යොදනක්තැන් ගෙවා නැගිසේක දෙයොදනක් දසයොදනක් සියක්යොදනක් දහසක්යොදනක් ගෙවා නැගිසේක යුගන්ධරපර්වතමුදුන ගෙවා නැගිසේක අන් චාතුම්හාරාජික දෙව්ලොවත් පසුකොට මතුව නැගෙණසේක අහෝ මහමෙරමුදුනට ලංව නැගිසේකැයි යනාදි වශයෙන් කියකියා දෙඅත් මුදුන් දිදී සාධුකාර දිදී දූල්වූ ඇසිපිය හෙලාලිය නොහී දූල්ලූ කට පියාලිය නොහී නැගුනුස්ම හෙලාලිය නොහී ඉතාමහත්වූ සන්තොෂයෙන් අතිශයින් විස්මයපත්ව අසුරුසන් දෙමින් සාධුකාර දෙමින් දෙඅත් මුදුන් දෙමින් කොලමේ තිමෙක්දැයි කියමින් එම පෙළහර් න් මත්ව සතරමහාද්විපවාසීහුම බලාසිටිනාහුය, එකල්හි මාහිමිවූ මුගලන්මහතෙරුන්වහන්සේ මෙසේවූ මහපෙළහර දක්විමෙන් මුලුසත්වයන් විස්මයපත්කරවා මහමෙරමුදුන ගෙවා ගොස් එහි පහිටි සැටගව් උස පණ්ඩුකම්බලශෛලාසනයද කිම්ද ගොස් මාගේ ස්වාමිදරුවූ බුදුරජාණන්වහන්සේගේ ශ්‍රීපාදයෙහි තමන්වහන්සේගේ සිවුරුකණ ගැටෙණසේ ඉතාලංව තමන් ස්වාමිදරුවන්ට ඉතා පක්‍ෂපාතව ගැතිවූබඳ මුලුතුන්ලෝවැසියන්ට ප්‍රකාශව පෙණෙනසේ වැඳවැද සිටිකල්හි ඒ පෙළහර දුටු හැම සත්වයෝම අහෝ දසදහසක් සක්වළින් රුස්ව හුන් මෙසා මහත් දිව්‍යසෙනාවක් මැද තුන්ලෝ මුදුන් පත් අපබුදුන් ලඟටම අවුත් අපමුගලන්මහතෙරුන්වහන්සේ පෙණ්ගියසේ ඉතා විෂමයකැයි සතුටුව තුන්ලෝ පුරා වෙවුල්වා ඉතිරයනසේ සාධුකාරදුන්හ, මෙසේ දෙව්ලෝ පත් මුගලන් මහතෙරුන්වහන්සේ බුදුන්ට අනුව නැමී වැඳසිට ස්වාමිවූ බුදුරජාණෙනි ඔබවහන්සේගේ අසාධාරණවූ පෙළහරදැක්මෙන්හා මනොහරවූ ධර්මදෙශනා ඇසීමෙන් මහත්වූ මුලුදඹදිව සත්වයෝම මේ තුන්මසමුලුල්ලෙහි අපබුදුන් අද දකුම්හ සෙට දකුම්හයි සිතසිතා විඩාව ස්වාමිවූ බුදුන් දක්මෙහි ඉතාඅධිකතර ලොභිහ මිනිස්ලොවට වඩිනේ කවරදවස්ද කවරනම් තැනකටදැයි විචාළකල්හි මාගේ ස්වාමිදරුවූ බුදුරජානන්වහන්සේ මෞද්ගල්‍යායනස්ථවිරය මෙයින් සද්දවසක් ගියකල වප්මස මැදිපොහෝදවස් සංකස්සපුරදෙරට බස්මි තොප භ්‍රාතෘ ශාරිපුත්‍රස්ථවිරද එහිම වස්විසූහ මාගේ අනු

භාවයෙන් ඒ මහපිරිස සකස්පුරදොරටම රැස්කරවයි වදාළසේක,
එවේලෙහි මුගලන්මහතෙරුන්වහන්සේ නැවතත් බුදුන් වැඳ
අවසර ලබාගෙණ එසේම මෙරමුදුනෙන් වැද කිමිද බස්මින්
මහමෙරපත්ල්ට බැස එක්ලක්‍ෂවිසිදහසක් ගල්පොළොව හා
එපමණවූ පස්පොළොව කිමිද ගොස් සැවැත්නුවර මහපිරිස මැ
ද [සරාභිරමඩලක්සේ හැමදෙනාට පෙණී පැනනැගිසේක, ඒ
දුක මහපිරිය විෂමයපත්‍ව මහතෙරුන්වහන්සේට සාධුකාරපූජා
කොට වැඳ සවාමිනි අපබුදුහු කුමක් වදාළසේක්ද, කවරදවසෙක
දකුමෝද්දැයි විචාළහ, එවිට මහතෙරුන්වහන්සේ උපාසකජනයෙ
නි බුදුහු මිට සත්වෙනිදා සකස්පුරදොරට බස්නාසේක එහි රැස්
වියයුතුයයි වදාළසාල්හි මෙයට සකස්පුරදොර කෙතෙක්තැන්දැයි
විචාරා එසියවිසිගව් පමණ දුරුතැනෙකැයි වදාළකල්හි මනුෂ්‍යයෝ
සවාමිනි මෙතනට රැස්වූ බාලදරුවෝද ජරාදුබ්ලයෝද පයින්
යා නොහෙන ශ්‍රිවතුනයෝද ඉතාබෙහෙව ඔහු හැමදෙනම එ
තෙක්තැන් කෙසේ පලායෙද්දැයි විචාළහ, එබස් ඇසූ මහතෙර
හු උපාසකවරුනි ඒ ගමනින් කිසිවෙකුටත් කිසිපිඩාවක් නොව
බුඩානුභාවයෙන් හා මාගේ අනුභාවයෙන් ගමන එසුවෙයි එබැ
වින් ඉතාදුරකැයි නොසිතා හැම දෙනම නික්මෙත්වයි වදාළසේ
ක, ඒවචනය හා සමගම මියර බිඳී නික්මගත් මහවතුරක්සේ ම
හපිරිස එකවිටම සෙලවී නික්මුණාහ, එකෙණෙහි බුඩානුභාව
යෙන් මහප්රිස අහසින් යන සක්විතිපිරිසක්සේ කිසියම් පිඩා
වකුත් නැතිවම යන්නාහු සමහරු මුඛයෙහි තුබු බුලතට සුනුදම
න තිස්යොදුන්මග ගෙවා ගොස් සකස්පුරදොරදී කැවාහුය, කිය
කේ බැඳ බැඳ යන්නාහු ඔබ පැමිණිකල බැඳ නිමවුහ, එක්ක
ණක කණාභරණ සැවැත්නුවරදී පැලඳ අනික්කණෙහි කණාභ
රණ සකස්පුරදොරදී පැලඳනිමවුහ. තවද ඔවුනොවුන් පරයා
නික්මුණාහු එක්අතක් හස්තාභරණ පැලඳ අනික්අත ආභරණ
සකස්පුරදොර පැලැන්දහ, එසේ නික්මයන සත්සළයෙන් සුව
හස් අනනා මුතුහර කරට දමා කර බඳිනා පමාවෙන් යතුරු ගත්
වගන්වා ගොස් එහි පැමිණි අහනෝද ගණන් නැත්තාහ, එසේ
ම දත්මැද නොනිමෙනතුරුද මුහුණ තෙල් ගා නොනිමෙනතු
රුද ඇස අඳුන් ගා නොනිමෙනතුරුද රත්කැටපත් වමතින්
ගෙණ මුහුන බලබලා නොනිමෙනතුරුද සක්පත් කණක තබා
නොනිමෙනතුරුද එක්මලක් ඉස ගන්වා නොනිමෙනතුරුද දරු
වඩා යෙමියි දැත් දිගුකොට වඩා නොනිමෙනතුරුද එසා දුරු
මග ගෙවා සකස්පුරදොරට ගොස් එදදවස පැමිණි ස්ත්‍රීපුරුෂයෝ
මෙනෙකැයි පමණ නැත්තාහ, තවද එසා පිරිසෙහි මෙතෙකැයි

නිමවා කිය නොහැකි අනුරූපවූ නන්විසිතුරු ඒ ඒ කාර්ය්‍යයෙහි පවත්මින් සිටි සක්විතිපිරිසසේ එකෙණෙහි හැමදෙනම සැවැත් නුවරසිට තිස්යොදුන්මග ගෙවා පැනක් බී නොපියන ඇසිල්ලෙහි බුලතක් කා යොදු නොගන්නා දෑ තුරෙහි ඇසිල්ලකින්ම සිහිනෙන් ගිය ගමනක්සේ කිසිවෙහෙසක් නොව සකස්පුර දොරට මාගේ ස්වාමිදරුවූ බුදුන්ගේ ආනුභාවයෙන් පැමිණ උපන් සන්තොෂයෙන් උත්සවකෙළි කෙළ එහිම කඳවුරු බැඳ උන්හ.

ඉක්බිත්තෙන් බුදුරජානන්වහන්සේ වප්මස මැදිපොහෝදිනයෙහි පණ්ඩුකම්බලශෛලාසනයෙහිදීම වස් පවරා අනන්තයෙහි එදවස්ම ශක්‍රදෙවේන්‍ද්‍රය අප මිනිස්ලොව්ට ගිය මනාකලැයි වදාළසේක, එවේලෙහි සක්දෙව්රජද ගැත්තන්හුගේ ගෙයි ලැග ස්වාමිදරුවන්හු යනකල ගැත්තහුවිසින් කිසියම් සත්කාරයක් කොට පසුගමනත් කළමනාමය එසේහෙයින් මමද මාගේ බුදුන්ට ශක්තිපමණින් පූජාවක් කොට පසුගමන් යෙම්සි මාගේ පුරයට වඩනා ඇසළමැදිපොහොදා තුන්පියවරින් බුද්ධානුභාවයෙන් වැඩිසේක දූත් මාගේ පුරයෙන් මිනිස්ලොවට වඩනා ගමන දිව්‍යානුභාවයෙන් මහත්පූජාපෙරහරින් වැඩීම මනාමය එහෙයින් සත්වයන් සිත්සේ දෙව්ලෝ බඹලෝ නිවන්පුර සැපසේ වැදීමට උතුම් සද්ධර්මානුශාසනා නැමති සෝපානයක් සැදූ මාගේ බුදුරජානන්වහන්සේට මමද මේ දෙවුලොව සිට මිනිස්ලොවට වඩනාපරිද්දෙන් දිව්‍යසොපානමාර්ගයක් සදමියි සිතා මහමෙරමුදුනපවත් සකස්පුරදොර දක්වා විසිතුරු සත්රුවන්මයවූ රුවන්හිනක් මවා ඊට දකුණැලපසෙහි එසේම රන්හිනක් වම්ඇලයෙහිදු එසේම රිදීහිනක් මැවූයේය, එයින් බුදුරජ වඩනාපිණිස මධ්‍යයෙහි ඒ මැවූ සත්රුවන්හිනෙහි එක්පෙත්තක් රත්රන්මයය එක්පෙත්තක් රිදීමයය එක්පෙත්තක් ප්‍රවාලමයය එක්පෙත්තක් දැවානම්මයය එක්පෙත්තක් ලොහිතාඞ්කමයය එක්පෙත්තක් මසාරගල්ලමයය එක්පෙත්තක් ඉන්ද්‍රනීලමයය එක්පෙත්තක් සත්රුවන්මයය එහි, වෙනවෙනම නිර්මිතවූ දිව්‍යකර්මාන්තයෙන් හොබනා අසාධාරණ දිව්‍යසොපානතුනම ඉන්ද්‍රචාපසේ සත්වයන්ට විශෙෂයෙන් පෙණෙමය ඒ දූත මනුෂ්‍යයෝ කොල තෙල බල මේ කුමන පෙළහරෙක්ද? පෙර මෙසේවූ පෙළහරක් දුටුවෝ ඇසුවෝ කව්රුදැයි කියකියා දෙහොත් මුදුනෙහි තබාගෙණ තුන්හිනෙහි කර්මාන්තයන් නමන් අත් පත් දෙයක්සේ බලබලා සාධුනාදපූජා පවත්වා සිටිකල්හි මාගේ ස්වාමිදරුවූ බුදුරජානන්වහන්සේ පණ්ඩුකම්බලශෛලාසනයෙන් බැස බණ අසා සිටි දිව්‍යසෙනාවට පින් දී එම සියලු

දිව්‍යසේනාව පිරිවරා මෙරමුදුනෙහිවූ සත්රුවන්මය දිව්‍යසොපා නමස්තකයෙහි රුවන්ඇගෑයක් මුදුනෙහි අනේක වැටි දල්වා ඒ දිව්‍යමයවූ මහාප්‍රදීපයක්සේ දිලිහිදිලිහී දසදහසක්සක්වළමුළුල්ලෙහි දිව්‍යමනුෂ්‍යසමූහයන්විසින් පවත්වනදල නොයෙක් පූජා සත්කාරසම්මානයන් දකවදුරා සියලු ලොකධාතුගත සත්වයෝම සිත්සේ විශෙෂයෙන් ඔවුනොවුන් හා මා දකිත්වයි අධිෂ්ඨාණකළසේක, ඒ අධිෂ්ඨාණචිත්තය හා සමගම දසදහසක්සක්වළමුළුල්ලෙහි යටින් අවිචිය පටන් උඩින් භවාග්‍රය දක්වා එකාඞගණ විය, එකෙණෙහි දෙතිස්මහාපූර්වනිමිතිපූජාවෝද පහළවූහ, දසදහසක්සක්වළ සියලු සත්වයෝම ආකාශයෙහි සඳමඩල බලන්නාවුන්සේ බුදුරජානන්වහන්සේගේ දෙතිස්මහාපුරුෂලක්ෂණයන් හා අසූඅනුව්‍යඤ්ජනශ්‍රීශොභාවත් අත්ලෙහි තුබූදෑ විශෙෂයෙන් බලන්නාවුන්සේ තමතමන් සිත්සේ බලන්ට පටන්ගත්හ, එපමණක්මතු නොවෙයි දෙවියෝ මිනිසුන්ට පෙණෙති මිනිසුන් දෙවියන්ට පෙණෙති බ්‍රහ්මයෝ කුරුකුහුඹුවන්ට පෙණෙති කුරුකුහුඹුවෝ බ්‍රහ්මයන්ට පෙණෙති සුවහස්පහන් දල්වූ පහන්ගබඩාවක්සේ උඩින් යටින් බැලුවන්ට සකසා පෙණෙන්නාසේ මේ දසසහශ්‍රීලොකධාතුයෙහි සියලු සත්වයෝ ඔවුනොවුන් සිත්සේ බලන්ට පටන්ගත්හ, එවේලෙහි බුදුරජානන්වහන්සේ මධ්‍යයෙහි මැවූ රුවන්හින රුවන්පෙතිවල එකිනෙක ශ්‍රීපාදයෙන් ශ්‍රීපාදය තබතබා නැගු නැගු ශ්‍රීපාදයෙහි අටතුරාසියක් මගුල්ලකුණු සියලු සත්වයන්ට දක්වදක්වා අචින්ත්‍යානොපමවූ බුඩලීලාවෙන් බස්නට පටන්ගත්සේක, ඒ බලාසිටි සියලු සත්වයෝ මාණික්‍යමයවූ රුවන්කැටපත් පෙණෙන්නාසේ විශෙෂයෙන් දිලියෙන බුදුන්ගේ ශ්‍රීපාදයන් හා ඒ බුදුන් වඩනාලීලා දක සතුටුසතුටුව දන් අපබුදුරජානෝ සුරක්තවූ ශ්‍රීපාදය තෙල පෙණෙන රන්පෙත්තෙහි තැබූසේක අන්ත්ශ්‍රීපාදය රිදීපෙත්තෙහි තැබූසේක දැවාතපෙත්තෙහි තැබූසේක ඉඳුනිල්මැණික්පෙත්තෙහි තැබූසේක ලොහිතඞ්කපෙත්තට බටසේක මසාරගල්ලපෙත්තට බටසේක සත්රුවන්හිණිපෙත්තට බටසේක කොල තෙප තුමන බැල්මෙක්ද බුදුන් දකුණුපත්ල ඔසවන්නා අරබලව වම්පත්ල ඔසවන්නා අරබලව බුදුන්ගේ ශ්‍රීපාදයෙහි සක්ලකුණු බලව සුවහස් දවි පෙණෙන්නා අර බලව ජිද්‍රමුබ පෙණෙන්නා බලව ස්වස්තිකාදි අටොරාසියක් මගුල්ලකුණු වෙනවෙනම බලා ගැණගන්නැයි යනාදිවශයෙන් කියකියා දෙවියන්ගේ රුවන්හිනි පෙතිවල විසිතුරුද බලා එයට වඩා අපබුදුන්ගේ ශ්‍රීපාදවල මහිමම

අනේ බලවයි අපට හොබනේයයි කියකියා මුව නොපොහොනාසේ අපමණ සාධුනාද කෙරෙමින් නගාගත් ශ්‍රීයෙන් හැවූ කටින් දල්වූ ඇසින් බුදුසිරි බලබලා සිටිනාහුය.

එකල්හි ශක්‍රදෙවේන්ද්‍රද බොහෝ පක්ෂපාත හුදීජනයෙකුසේ බුදුන්ගේ සඟලසිවුර හා පාත්‍රය තමාගේ හිස්මුදුනෙහි තබාගෙණ දැණතින් ඒ සිවුර හා පාත්‍රය වසාගෙණ අනික්දෑතින් තමාගේ විජයතුරාසක තුඩ තබා පිඹපිඹ තුන්ලොවට ඇසෙන්සේ මහත් සඞ්ඛනාදයෙන් බුදුන් පුදපුදා බුදුන් වඩනට පෙරටව දෙදෙව්ලොව දෙවුපිරිස් එක්වම දකුණුපාර්ශ්වයෙහි රන්හිනෙන් බසින්ටවන, එසේම දසදහසක් ශක්‍රදෙවේන්ද්‍රයෝ දසදහසක් රන්පෙතිවල සැදීසිට දසදහසක් ජයතුරාසක් තුඩතුඩ තබා පිඹිමින් සංඛනාදපූජාවට පටන්ගත්හ, දසදහසක් සුයම්රජහුද දසදහසක් හිනිපෙත්වල සැදීසිට දසදහසක් මිණිචාමරපවනින් පූජාකරන්ට පටන්ගත්හ, දසදහසක් සන්තුසිතරජහුද දසදහසක හිනිපෙතිවල සැදීසිට දසදහසක්හිරමඬුලුසේ දිලියෙන දසදහසක් මිණිතල්වැට ගෙණ පූජාකරන්ට පටන්ගත්හ, දසදහසක් සුනිම්මිත රජහුද එසේම දිව්‍යමයවූ අනෙකප්‍රකාර පූජාභාණ්ඩ ගෙණ දසදහසක්හිනිපෙතිවල සැදීසිට පූජාකරමින් බස්නට පටන් ගත්හ, දසදහසක් පරනිම්මිතරජහුද දසදහසක් හිනිපෙතිවල සැදී මහත් උත්සාහවයෙන් බුදුන් පුදපුදා බසින්ට පටන්ගත්හ, දසදහසක් සහම්පතිමහාබ්‍රහ්මයෝ සදමඬුලුසේ, දසදහසක් සේසත් ගෙණ චාමරදිහිනෙහි දසදහසක්හිනිපෙතිවල සැදී බුදුන් පුදපුදා බස්නට පටන්ගත්හ, අවශෙෂවූ බ්‍රහ්මරාජයෝද රිදීමයවූ හිණිපෙති පාසා සැදී පුදමින් බස්නට පටන්ගත්හ.

එකල්හි දකුණැලයේ රන්හිණෙහි සකස්පුරදොරපටන් මෙර මුදුන දක්වාම එකාකාරයෙන් හිනිපෙත්තක් හිනිපෙත්තක් පාසා අතුරු නොදී සැදී සිටගත්තාවූ දිව්‍යසෙනාව පහන්ඇගෑයෙක පහන්පෙළක් දිලියෙන්නාසේ එකාකාරයෙන්ම පෙණෙන්ට වන්හ, වම්ඇලයේ රිදීහිනෙහිද එසේම හිණිපෙත්තක් හිණිපෙත්තක් පාසා අතුරු නොදී සැදීසිටගත්තාවූ බ්‍රහ්මසෙනාවද දිව්‍යමයවූ මහත් ප්‍රදීපසිඛාපඞ්ක්තියක්සේ එකාකාරයෙන්ම පෙණෙන්ට වන්හ.

මෙසේ දිව්‍යබ්‍රහ්මසෙනාව පිරිවරා මාගේ ස්වාමිදරුවූ බුදුරජාණන්වහන්සේ බස්නා මැද සත්රුවන්හිණෙහි පය ගානාවූ එකද දෙවියෙක් බඹෙක් නැත එසේ අතුල්‍යඅසහාය අචින්ත්‍යවූ පෙළහර කුදු සියලු සත්ත්වයන්ට දක්වදක්වා දිව්‍යබ්‍රහ්මසෙනාව මධ්‍යන්තරන් මෙරක්සේ සියලු ලෝ අභිභවා දිලිහිදිලිහී මුලුලෝ සාධුකාර දෙව

මින් හැම සතුන් සිත්නෙත් තාමන්වහන්සේකරාම පැහැරගැන්මෙන් අනොපම්වූ බුඩලිලායෙන් යෙදී යට කී ක්‍රමයෙන් බස්නාසේක, එකල පෙරටව පාසිවුරු ගෙණ රන්හිණෙන් බස්නා ශක්‍රදෙවෙන්‍ද්‍රයාට දිව්‍යබ්‍රහ්මසෙනාවගෙන් ගගණව අවකාශ නැතිහෙයින් දසදහසක්පංචශිඛදිව්‍යපුත්‍රයෝ තුන්ගව්පමණ ඇතිදසදහසක් බේළුවපාණ්ඩුවීණා ගෙණ සුවහස්ගණන් පැතින් සරහා ගවු පමණවූ දසදහසක් වේණා තතින් එකපැහැර හැම දේනාම බුදුගුණ ගායනාකෙරෙමින් පණස්පණස් යොදුන්තන්හිරහමඬුලු බැඳගෙණ පෙළපෙළ සැදී බස්නට පටන්ගත්හ, තවද දසදහසක් මාතලිනම දිව්‍යරථාචාරීහු දසදහස්ක් දිව්‍යඅශ්වයන් යෙදූ දසදහසක් වෛජයන්තාරථයානාවල් ගෙණ නොයෙක් ධජපතාකාදී පූජාපෙළහරින් අලඞ්කෘතකොට මෙසේ තමතමන්ගේ සුවහස්ගණන් දිව්‍යසෙනාව ගෙණ පෙළ පෙළ සැදී බස්නට පටන්ගත්හ, දසදහසක් පමණ ඓරාවන නම් දිව්‍යහස්තිරාජයෝද තෙතිස්තෙතිස්කුම්භස්තල හා එහිම වූ දළහා දළෙහි මැවූ පොකුණු හා පොකුණුවල මැවූ පියුම්හා පියුම්වල පෙතිවල සිට නටන දෙවගණන් හා සමග තුන්ලක්ෂතෙතිස්දහසක් දිව්‍ය ඇත්සොඬවල් උඩනගා තුන්ලක්ෂතෙතිස්දහසක් සේසත් අල්වා ගෙණ බුදුන්ම පුදමින් ආකාශයෙන් පෙළපෙළසැදී බස්නට පටන්ගත්හ,

මෙසේ අනෙකප්‍රකාරවූ නටනාට්‍යකාදීයෙන් හා ගී තිය ත්‍රියා දී වච්ණ ගගා දිවකුලල් පිඹපිඹ නොයෙක් පරද්දෙන් බුදුන්ම පුදපුදා අහසින් එදවස්හි බස්නා දෙවගනන් හා දිවනළුවෝ මෙතෙකැයි පමණ නැත්තාහ, මෙසේ නොයෙක් පූජාපෙරහරින් අහස්කුස මුදුල්ලෙහි දෙවියෝ මැවූ දිවමඬුලු දිවතොරණ රුවන්ඇගෑ පහන්ඇගෑ ධජ පුන්කලස් මෙතෙකැයි පමණ නැත්තාහ, බුදුගුණයුත් දහස්ගණන් ජයකාහළ තියනියා ජයකාහළම් පිඹපිඹ බස්නා දෙවියෝද පමණ නැත්තාහ, දහවල් අහස තරු පෙණී ගියහ, මහපොළොවෙන් සත්රුවන් ඉපිලගියාහ, මහමුහුද ගැළිසිටි සිය දහස්යොදුන් දිග ඇති මත්ස්‍යරාජයෝ ඉපිල පැනනැගී මේසා බුදුසිරි විඳවිඳ බලන්ට පටන්ගත්හ, එහි අනොපම්වූ බුදුසිරිපුද පෙළහර දැක්මෙන් හැම සතුන් ඇස් නිවීගිය කන් නිවීගිය සිත් නිවීගිය අහෝ බුදුබලනම් මෙසේවූ මහත් දෙයක්ල ලොකයෙහි හැම සතුන්විසින් වත් බලා නිමවාලිය නොහැක්ක සිතා නිමවාලිය නොහැක්ක එසේ අනනතවූ මාගේ බුදුරජාණන්වහන්සේගේ එබඳු සශ්‍රී හා බුඩමහිම හා ඒ බුඩානුභාව හා ඒ බුඩලීලා හා ඒ

සියලු බුද්ධපූජා දක සතුටුවගියා හැම සත්ත්වයෝම එදවස්හි අහෝ බුදුබව නම් මෙසේ ලොව හැමට වැඩි මහත් උතුම්දෙයෙකැයි දත එහි බලවත් ලොභ උපදවා නිසිවූ අවස්ථාවිශෙෂවූ බුද්ධකාරකධර්මයන් හා පාරමිතාභූමිවිභාග බුදුබව පැතීම ඉතා අවශ්‍යදෙයෙක යනාදි කාරණද සලකා ගත නොහෙන කිසිවක් නොදත් තෝ පබා ශ්‍රද්ධාවෙගයෙන් මෙහෙයනලද සිත් ඇතුව බුදුබවම පැතුවාහුය, එසේහෙයින් තුන්ලොව පුරා සිටි එසා මහපිරිසෙන් මමද බුදුවෙම්වයි මමද බුදුවෙම්වයි නොපැතුවාවූ එකද සත්ත්වයකුත් නැත ඒ සියලු සත්ත්වයෝම මමද බුදුවෙම්වා මමද බුදුවෙම්වායි කියකියා වෙන වෙනම ප්‍රාර්ථනා කළාහ.

මෙසේ තුන්ලෝ පුරා සිටි දෙව්බඹ සහිත හැම සත්නට බුදුබව උතුම්සේ හඟවා ඔවුනොවුන් ලවා බුදුබවම ප්‍රාර්ථනාකරවමින් අහස්කුස වසා සැදී පිරී සිටි දෙව්බඹපිරිස් සමගින් එම පූජා විඳිමින් ශක්‍රභවනයපටන් මිනිස්ලොව දක්වා රුවන්මය සොපානපඞ්ක්තියෙන් එදවස්හි මාගේ ස්වාමිදරුවූ බුදුරජානන්වහන්සේ අප්‍රමාණවූ බුදුසිරිදක්වදක්වා කුරුකුහුඹුවන් පටන් මහබඹුන් දක්වා ඇමසතුන් සිත්නෙත් පැහැරගැන්මෙන් නොයෙක් ශ්‍රීවිලාශයෙන් වැඩිලීලාවද, ඒ දක මිනිසුන් සහිත දෙව්බඹපිරිස් එකපැහැර තුන්ලෝ වෙවුල්වා සාධුකාර දීමෙන් දෙහොත් මුදුන්දී වැඳවැඳ බලබලා සැදීසිටි ලීලාවද යන නොයෙක් එහි පැවති බුදුසිරිපෙළහර හැම පුද වෙන වෙන සිහිමෙන් පින් පිරියන් නාසේ අහෝ මා සිතද පිරියන්නේය එසේ සිත පිරියන මේසා උතුම් සද්ධර්ම නැමති අමාවිලෙහි ගැලීමෙන් සිත සතුටුව දහම්රස විඳගන්නා මේ අත්බැව මා උපන් තැනපටන් ඉන්ද්‍රියවිකලයකට ද නොපණුවා මා වඩාරක්ෂාකොට සත්හැවිරිදිවයස්කල මෙසේවූ බුදුසස්නෙහි මහණකරවා මට සහායව සිටි දෙමවුපිය ගුරුවරාදී හිතාහිතමධ්‍යස්ථ හැමසත්නටද මටද මෙම කුශලබලයෙන්ම මෙසේ මෙසේවූ බුදුසිරිපෙලහර දක්මත් දහම්රස විඳගැන්මත් වාසනාවේවායි.

මෙසේ අප්‍රමාණවූ බුද්ධලීලාවෙන් අප්‍රමාණවූ පූජාපෙළහරින් අපබුදුරජානන්වහන්සේද අනන්තාපරියන්ත බුදුවරයන්සේ මාණික්‍යමය සොපානයෙන් බැසවදුරා සකස්පුර හැම බුදුන්විසින් අවිජහිතස්ථානවූ ගල්තලාමස්තකයෙහි දක්ෂිණශ්‍රීපාදය පළමුකොට පිහිටුවාවදාළසේක,ඒ ස්ථානය අචලචෛත්‍යස්ථානනම්විය.

මෙසේ මේ පොළෝතලයට පැමිණ දෙවාතිදෙවවූ බ්‍රහ්මාතිබ්‍රහ්මවූ මාගේ ස්වාමිදරුවූ බුදුරජානන්වහන්සේ රුවන්හිනමුල මධ්‍යම ප්‍රභාමණ්ඩලය සමගින් අෂ්ටාදශහස්ත ප්‍රමාණවූ ශ්‍රීබුද්ධකාය

කීත් අතිශයින් ශ්‍රීමත්ව තුන්ලෝ අභිභවා දසදහසක්සක්වළ ආලෝක පතුරුවාලීමෙන් මහගිනිකඳක්සේ දිලිහිදිලිහී ශ්‍රීබුද්ධවිලාසයෙන් වැඩසිටිවේලෙහි අපහිමිවූ දම්සෙනෙවි සැරියුත්මහතෙරුන්වහන්සේ බුදුන්පෙරටව ගොස් සිට බුදුන්ගේ ශ්‍රීපාදමූලයෙහි හිස තබා වැඳ නැගී ඝිරමඬලසේ දිලියෙන බුදුන්ගේ ශ්‍රීමුඛමණ්ඩලය බලා දෙහොත් මුදුනෙහි තබාගෙණ:—

න මෙ දිට්ඨො ඉතො පුබ්බෙ න සුතො උදකස්සචි
එවං වග්ගුවදො සත්ථා තුසිතා ගණිමාගතො—සී·

යනාදීන් බුදුරජාණන්ට සතුතිකරන්නාවූ සැරියුත්මහතෙරුන්වහන්සේ ලොව හැම සතුතිවචන ශ්‍රේෂ්ඨවචනෑ උපමා දක්වා කරණ සියලු ප්‍රශංසාවට බුදුරජම සුදුසුවූ ගුණානුභාමත්ම ඇතිබව හා තමන් අනුබුද්ධව මේ බුදුසස්නෙහි ව්‍යක්තකමින් අග්‍රප්‍රාප්තවූබව මුලු සත්තාව හඟවා අප්‍රමාණ වර්ණයෙන් සතුතිකොට මාගේ සවාමිවූ භාග්‍යවතුන්වහන්ස ඔබවහන්සේටම ගැතිවූබැවින් මාසේවූ භාග්‍යවතානයෝ නැත සවාමීනි අද ඔබවහන්සේගේ මේ බුද්ධශ්‍රී බලා සතුටුව බුදුවෙම්වයි නොපැතූ එකද දිව්‍යමනුෂ්‍යයකුත් නැත ඔබවහන්සේගේ පඤ්චක්ෂෙත්‍රවූ මේ දසදහසක්සක්වළ බ්‍රහ්මසෙනාව හා සනිස්යොදනෙක පුරා සිටි මේ මහපිරිසද කුරුකුහුඹුක්‍ෂුද්‍රප්‍රාණීන් පටන් මහමසුන් දක්වා සියලු තිරශ්චීනසත්‍වයෝද යන හැම සත්හුම සවාමීන් කෙරෙහි අභිප්‍රසන්නව බුදුබවම පැතූහ,සවාමීන්වහන්ස ඒ හැම සත්‍වයන්ගේම ප්‍රාර්ථනාසංසිද්ධිය කෙසේ වේද්දහෝයි විචාළසේක. එවිට අපබුදුරජ ශාරිපුත්‍රය බුදුවෙම්වයි පැතූ ඒ සියල්ලවුන්ටම බුදුබව සිද්ධවන්නේමනොවෙයි ව දුරා මේ ලෝකයෙහි සත්‍වයන්විසින් කළ මනා සියලු ප්‍රාර්ථනාවන් අතුරෙන් බුදුවෙම්වයි කියා බුදුබව ප්‍රාර්ථනාකිරීමනම් ව්‍යයි ඇති සත්‍වයන්ටත් නැතිසත්‍වයන්ටත් උතුම්ප්‍රාර්ථනාවෙක්මය බුදුවෙම්වයි ප්‍රාර්ථනාකොට පින් රැස්කළ අධිකවීයයි ඇතහොත් ලොවුතුරාබුදුබවම සාදගණිති මධ්‍යමවීයයි ඇතහොත් පසේබුදුබව සාදගණිති ලෝකයා හා සාධාරණවීයයි ඇතහොත් ශ්‍රාවකබොධිය සාදගණිති, එසේහෙයින් ශාරිපුත්‍රස්ථවිරය බුදුබව සියලු සත්‍වයන්විසින් ප්‍රාර්ථනාකළ මනාමය, තුන්තොටක් ඇති ගඟ පීනන්නවුන් අතුරෙන් පාතතොට බලා ගොස් වැරදගියහොත් නැගීසාදුතුතැනක් නැතිබැවි දුන වීරපුරුෂ මුදුන්තොට බලා පීනාපාත්වීනමුදු අනික් පාතතොටකිත්වත් ගොඩනැගීයන්නාසේ එකාන්තයෙන්ම බුදුබව පැතුවන්ට මේ තුන්බොධියෙන් එක්බොධියක් සිද්ධවන්නේමවෙයි, ඒ කාරණයෙන් අද මේ සියලු සත්‍වයෝම මා දුක සතුටුව මමද මමද බුදුවෙම්වයි කියා කරණලද

ප්‍රාර්ථනාව ඔවුනොවුන්ට සාර්ථකවූ උතුම් ප්‍රාර්ථනාවෙක්මයයි වදාරා එසේ බුද්ධාදි වීරපුරුෂයෝ දිව්‍යමනුෂ්‍යාදීන්ට ප්‍රියවන්නාහුමයයි යන කාරණ ප්‍රකාශකොට මෙසේ ධර්මදෙශනාකරවදාළසේක.

යෙ ඣානපසුතා ධීරා නෙක්ඛම්මූපසමෙ රතා
දෙවා'පි තෙසං පිහයන්ති සම්බුද්ධානං සතීමතං-යි

මේ ධර්මදෙශනාවගේ කෙළවර තිස්කෙළක් පමණ ප්‍රාණීහු අමාමහනිවන් දුටුවාහුය.

ඊට ඉක්බිතිව ධර්මරාජන්වූ භාග්‍යවත් බුදුරජානන්වහන්සේ එහිම වැඩසිට තමන්වහන්සේගේ ශාසනයෙහි සද්ධර්මානුශාසනායෙහි පිළිපැදීමෙන් ඇතුළත්ව සිටි කල්‍යාණපෘථග්ජනයාපටන් දකුණත්සව් ප්‍රථම අග්‍රශ්‍රාවකයන්වහන්සේ දක්වා ක්‍රමක්‍රමයෙන් ගුණානුවර්ණ වඩවඩා සිටි බුද්ධශ්‍රාවකයන්ගේ විශේෂගුණ ඇතිබවද අන්‍යතීර්ථකයන්ගේ ගුණ ශූන්‍යබවද ප්‍රකාශකොට දක්වාවදාරණ පිණිස එසා පිරිසෙහි රැස්ව සිටි සියලු කල්‍යාණපෘථග්ජනබහුශ්‍රුතපුද්ගලයන්ට විෂයවූ ගැඹුරු නොව වැටහෙන ප්‍රශ්නයක් පළමුකොට විචාරාවදාළසේක, ඒ ප්‍රශ්නය කල්‍යාණපෘථග්ජනයෝ විසඳූහ, ඊට ඉක්බිතිව සියලු පෘථග්ජනලෝකයාට අධිකතර ලොකොත්තරගුණයෙහි පිහිටි ආර්‍යශ්‍රාවකයන්කෙරෙන් සෝවාන් පුද්ගලයන්ගේද සකෘදාගාමිපුද්ගලයන්ගේද අනාගාමිපුද්ගලයන්ගේද රහත් පුද්ගලයන්ගේද ත්‍රිවිද්‍යාවන් දත රහත්වූ පුද්ගලයන්ගේද ෂඩ්අභිඥාවන් දත රහත්වූ පුද්ගලයන්ගේද සිව්පිළිසිඹියාවන් දත රහත්වූ පුද්ගලයන්ගේද දෙවැනි අග්‍රශ්‍රාවකවූ වමත්සව් මුගලන්මහතෙරුන්වහන්සේගේද ප්‍රථම අග්‍රශ්‍රාවකවූ දකුණත්සව් සැරියුත් මහතෙරුන්වහන්සේගේද යන මේ හැම බුදුසව්වන්ගේම ගුණ ඥාන ප්‍රමාණය දත බුදුරජ ඔවුනොවුන් අතින් විචාරාවදාළ ප්‍රශ්නයන් ඒ ඒ ශ්‍රාවකයෝම තමතමුන්ට විෂයවූ පරිද්දෙන් විසඳූහ, ඔවුනොවුන්ට වැඩිතරම්ව සිටි ශ්‍රාවකයෝ මිස අඩුතරම් ශ්‍රාවකයෝ ඒ ඒ ප්‍රශ්නවිසර්ජනයට අසමර්ථවූවාහුයි, එහෙයින් ඥානයෙන් අග්‍රවූ සැරියුත්සාමීන්ගෙන් විචාරාවදාළප්‍රශ්නය ඒ තෝරා කියන්ට ඒ හැම ශ්‍රාවක දෙව්බඹ මිනිසුන් අතුරෙන් සමර්ථවූ අන්කිසිකෙණෙක් නැත, ධර්මසේනාධිපති සැරියුත් මහතෙරුන්වහන්සේම සියුම්කරයකින් ඇඹුලදණ්ඩක් කපන්නාසේ නොපැකිලම ඒ පැනය තෝරා වදාළසේක.

නැවත බුදුහු බුද්ධඥානය අතිගම්භීරබව හා මොහුගේ නුවන ප්‍රසිද්ධ කෙරෙමියි සිතාවදාරා බුදුකෙණෙකුන් මුත් අන්කිසිවෙක්හු විසිනුත් දත යුත නොහැකි අතිගම්භීරවූ ප්‍රශ්නයක් විචාරාවදාළසේක

එවේලෙහි සැරියුත්මහතෙරුන්වහන්සේ බුද්ධිශයවූ ඒ ප්‍රශ්න
යෙහි අර්ථ දැනගත නොහී මූහුද පීනා ගොඩක් නොදක ඔබ්මො
බ ඇවිදිනා විරපුරුෂයෙකුසේ සද්ධර්මසාගරයට වැදී හළලා බලා
නොයෙක් ලෙසින් කල්පනාකොට දැනගත නුහුණුසේක, එවිට
මාගේ ස්වාමිදරුවෝ "භූතමිදං සාරිපුත්ත සමනුපස්සාමි" යනු වදා
රා මෙසේ අකුරු සතරකින් කියයම් නයක් දුන්සේක එසේ නය
දක්වා බුදුන් වදාළබසවත් ඒ හැම පිරිසින් හැඟියිය අන් කිසිකෙ
ණෙක් නැත මාගේ හිමිතුමන්වූ සැරියුත් මහතෙරුන්වහන්සේ
වදාළ නය වහා දැනගණ ඒ කාරණමාත්‍රයකින්ම බැස බුදුන් වදාළ
ප්‍රශ්නයෙහි අර්ථදක්ක එහි සියදහස්ලක්‍ෂකොටිගණන් නය දක්වදක්
වා ප්‍රශ්නය තෝරා කියන්ට පටන්ගත්සේක, එවේලෙහි අපභාග්‍ය
වතුන්වහන්සේ සැරියුත්සාමින්ගේ ඒ ප්‍රශ්නව්‍යාකරණයෙන් අති
ප්‍රසන්නව සාධුසාධු ශාරිපුත්‍රයයි වදාරා තෝ ඉතා සූක්‍ෂ්මවූ නයදන්
නා සූක්‍ෂ්මඥාණ ඇතියෙහිය එහෙයින් බුදුන්ගේ අදහස් නොවර
දවාම මේ තෝ කියන්නෙහිය මාගේ බුද්ධඥානයට අනුව පවත්නා
මහත්ඥානසම්පත්තියක් ඇත්තෙහි යයි යනාදීන් සැරියුත්සාමින්
ගේ ඥානමහත්ත්වය ප්‍රකාශකොට බුදුරජ වදාරා ස්තුතිකොට ව
දාළකල්හි,ඒ සැරියුත්මහතෙරුන්වහන්සේද බුදුන් වැඳ දෙහොත්
මුදුන්දී සිට සැලකරණසේක් ස්වාමීවූ භාග්‍යවතුන්වහන්ස කල්ප
යක් මුලුල්ලෙහි නොකඩව වස්නා වර්ෂාවෙහිදු මෙපමණ දියබි
න්දු මහාසමුද්‍රයෙහි වැටුනාහුය මෙපමණ දියබින්දු භූමියෙහි වැටු
නාහුය මෙපමණ දියබින්දු පර්වතවල වැටුනාහුයයි කියාම සියලු
වර්ෂාජලය බින්දුවශයෙන් ගණන් ලත්තබා දක්වන්නට මම
සමර්ථයෙමියි කියා තමන්වහන්සේගේ ප්‍රඥාමහත්ත්වය ප්‍රකාශ
කොට:—

ගඞ්ගාය වාලුකා ඛීයෙ උදකං ඛීයෙ මහණ්ණවෙ
මහියා මත්තිකා ඛීයෙ ලක්ඛෙන මම බුද්ධියා-යි.

යනුයෙන් සියලු ගඞ්ගාවල වැලිද සතරමහාසාගරයෙහි ජල
ස්කන්ධයද මහපොළව පස්ද යන මේසා මහත් වස්තු පවා මාගේ
නුවණට ලත්තබන්ට නොසෑහෙන්නාහුය ඒ හැම වස්තු ඉක්ම
වා මාගේ ප්‍රඥතොමෝ සිටිනියයි කියා ඥානගර්ජනා කිරීමෙන්
බුදුරජානන් අභිමුඛයෙහිම සිංහනාද කළකල්හි ප්‍රියපුත්‍රයෙකු
ගේ සොඳසුරතල ප්‍රියබස් අසන පෙම්බර පියානකෙණෙකුන්සේ
සිංහනාදවචනය භාග්‍යවතුන්වහන්සේ අසාවදාරා එසේය ශාරිපු
ත්‍රස්ථවිරය තාගේ ස්ඥානාවය එසේම මම දනිමියි වදාරා මේ
ශාසනයෙහි සියලු ඥානවතුන්කෙරෙහි සැරියුත්මහතෙරුන්ව

හන්සේම අගතැන්පත්කොට වදාළසේක.

මෙම ගීග

ලෝකනාථං ඨපෙත්වාන යෙ චඤ්ඤෙ අත්ථි පාණිනො
පඤ්ඤාය සාරිපුත්තස්ස කලං නාග්ඝන්ති සොළසිං.

මෙසේ සකස්පුරදොරදී සැරියුත්සාමීන් ලවා ප්‍රශ්නවිසර්ජනය
කරවා ඒ සැරියුත්මහතෙරුන්වහන්සේ නුවණවන්තයන්කෙරෙහි
අගතැන්පත්කොට වදාළ දවස්හිම මෛත්‍රීබෝසතානන්වහන්
සේද පැවිදිව නැවත අපබුදුන්කෙරෙහුදු විවරණපතුල්ලත් සේක
ඒ කෙසේදයත්?

මේ භද්‍රකල්පයකෙරෙන් සොළසාසඞ්ඛ්‍යකල්පලක්‍ෂයකින් ඔබ්
බෙහි බුදුවීමට නියතව්වරණශ්‍රී ලැබූතැන්පටන් ලොව උපනුපන්
බුදුවරයන් දක සියලු බුද්ධකාරකධර්මයන් පිරීමෙන් මෙම කප පස්
වැනිව බුදුවන මෛත්‍රීබෝසතානෝ මේ බුද්ධොත්පාදකාලයෙහිද
දෙව්ලොවින් චුතව අවුත් සැවැත්නුවරට තිස්යොදුන් පමණවූ
සංකස්සනම් නුවර මහත්භොගසම්පත් ඇති සිරිවඩ්ඩන ගෘහපති
මහාසාරයන්ගේ අගමෙහෙසුන් කුස ඉපද දසමස් ඇවෑමෙන් බි
හිව මහත් ඉසුරුසැපපෙරහැරෙන් වැඩී සියලු ශිල්ප ඉගෙණ
මවුපියදෙදෙනාගේ ඇවෑමෙන් සියලු දනාදසම්පත් ඹදින් මහ
පිරිවරින් වසනුවෝ අපබුදුරජානන්වහන්සේ දෙවොරොහණ
යෙන් බැස සංකස්සනම් නරවාරයෙහි වැඩසිට සැරියුත්සාමින් බ
ණවා විචාරාවදාළ ප්‍රශ්න තෝරා කීමෙන් සතුටුව බුද්ධකාරකධර්ම
යන් පිරීමෙන් මූත් බුදුවිය නොහැක්කැයි දන ගෘහවාසය සිඳ
එහෙයින් පැවිදුවෙමියි සිතා එදවස්ම ඥතිවර්ගයා හා මහත්
භොගස්කන්ධය හැර තමන්ගේ පිරිවර දහසක්පුරුෂයන් හා ස
මග පැවිදිව ලබනලද උපසම්පදා ඇතිව ත්‍රිපිටකබුද්ධවචනය ඉ
ගෙණ නොයෙක් සියගණන් භික්‍ෂූන්ට බුද්ධවචන උගන්වා වස
නුවෝ දක්‍ෂිණාවිභඞ්ගසූත්‍රදෙශනාසමාගමයෙහි මහාප්‍රජාපතීනම්
දේවිය දුන් වස්ත්‍රයුගලයක් තමන්වහන්සේට වස්සාග්‍රයෙන් පැ
මිණි කල පිළිසහල ලැබගෙණ ඉන් එක්වස්ත්‍රයක් අපබුදුන්ගේ
ගන්ධකුටියෙහි වියන්කොට බැඳ දෙවැනිවස්ත්‍රය කපා වියනකෙ
ළවර පන්තිකොට එල්වා පූජකළසේක. එකල්හි දනාතිසංස
කොටිප්‍රාප්තවූ අපභාග්‍යවතුන්වහන්සේ ඒ මෛත්‍රීබොධිසත්වභි
ක්‍ෂූන්වහන්සේගේ අධ්‍යාසය දනවදාරා භික්‍ෂුසඞ්ඝයාවහන්සේට
අඬගාවදාරා මහණෙනි තෙපි වස්ත්‍රයුගලයකින් බුද්ධපූජකළ ක්‍රම
යෙන් මේ භික්‍ෂුනම් බලව් මෙතෙම අනාගතයෙහිවූ මේ මහාභද්‍ර
කල්පයෙහිම මෛත්‍රී නම් බුදුවන්නේය මෙම බරණැස්නුවර නම්

යෙව හදාකපෙප මෙතෙත්‍රායෙන නාම සම්මාසම්බුද්ධො භවිස්සති" යනාදී ප්‍රකාශක්‍රමයෙන් බලා දතයුතු.

ලෝවැඩ පැණිස කරණලද මේ ශ්‍රීසද්ධර්මාවවාදසඞ්ග්‍රහයෙහි මෙතෙකින් අපබුදුරජනන්වහන්සේ සැවැත්නුවර ගණ්ඩම්බවෘක්‍ෂ මූලයෙහි යමාමහපෙළහර දක්වා බුද්ධානුභාවයෙන් දෙව්ලෝ වැඩ ශක්‍රයාගේ පණ්ඩුකම්බලශෛලාසනයෙහි වැඩහිද තුන්මසක් මුළුල්ලෙහි කරණලද අභිධර්මදෙශනාවෙන් දසදහසක්සක්වළින් රැස්වූ අප්‍රමාණ දිව්‍යබ්‍රහ්මසෙනාවට අප්‍රමාණ අනුශාසනානිර්මෙන් මාතෘදිව්‍යපුත්‍රාදීන්ට වැඩ සාදා බුද්ධානුභාවයෙන් හා දෙවානුභාවයෙන් නිර්මිත අප්‍රමාණ පූජාසත්කාර විදිමෙන් දස්දහසක් සක්වළ සියලු සත්‍වයන්ටම බුදුසිරි දක්වදක්වා රූපවිලාසයනුදු අප්‍රමාණ ලෝවැඩ සාදා දෙවොරෝහනයෙන් සකස්පුරදොරට බැස එහි වැඩසිට ලෝකානුශාසනාකළ ප්‍රවෘත්තිකථාව නිසා නිමවනලදී.

——:*:——

මෙසේ සත්‍වානුකම්පා ඇති බුදුරජනන්වහන්සේ තුරිතාතුරිතචාරිකාවශයෙන් දෙව්ලෙවද බඹලොවද මිනිස්ලොවද හැසිරිමෙන් දිව්‍යමනුෂ්‍යාදිවූ අප්‍රමාණ සත්තට අප්‍රමාණවූ සද්ධර්මානුශාසනා කළසේක. ඒ කෙසේදයත්?

තුරිතචාරිකාකිරීමෙන් සත්‍වානුග්‍රහකරණ අපභාග්‍යවතුන්වහන්සේ පැවිදිවෙස් ගෙණ තමන්වහන්සේකරා එන මහාකාශ්‍යපස්ථවිරාදීන් නිසා ඇසිල්ලකින් තුන්ගව්මග ගෙවා යාමෙන්ද අඞ්ගුලිමාලඅලවකාදීන් නිසා එසේම එසියවිසිගව්මගගෙවා යාමෙන්ද මහාකප්පින නරවරාදීන් නිසා එසේම සාරසියඅසූගව්මගයෙවා යාමෙන්ද ධනියස්ථවිරාදීන් නිසා දෙදස්අටසියයක්ගව්ද චූලොදරමහොදරාදීන් නිසා අනාවිපයෙහිද මහාබ්‍රහ්මාදීන් නිසා බ්‍රහ්මලොකයෙහිද මාතෘදිව්‍යපුත්‍රාදීන් නිසා දිව්‍යලොකයෙහිද එක්‍ෂණයෙහි පෙණීයාමෙන් ඔවුනොවුන්ට නොයෙක් ප්‍රාතිහාර්‍ය්‍ය හා ධර්මදෙශනාදිය කිරීමෙන් අප්‍රමාණවූ සත්නට වැඩ සාදුවදුලබව තුරිතචාරිකානම්වේ.

තවද අතුරිතචාරිකාවශයෙන් දනව් සැරිසරා වැඩ සත්‍වානුග්‍රහකරණ බුදුරජනන්වහන්සේ දඹදිව අන්තොමණ්ඩලය මධ්‍යමණ්ඩලය මහාමණ්ඩලය යන මණ්ඩලත්‍රයෙහි ගම්නියම්ගම්රාජධානිදනව් පිළිවෙළින් දවස යොදනක් අඩයොදනක් පමණ තැන් මග ගෙවා වැඩ පණ්ඩපාතචය්‍ර්යාදිවශයෙන් ලොකයාට අනුග්‍රහකෙරෙමින් හැසුරුණුබව අතුරිතචාරිකානම්වේ.

එයින් නවසියයක් යොදුන් පමණවූ මහාමණ්ඩලයෙහි යම්කා
ලෙක්හි භාග්‍යවතුන්වහන්සේ සැරිසරා වඩනාකැමතිසේක්වීනම්
වප්මස මැදිපොහෝ ලද මහාපවාරණදවස්හි පවරා ඊට දෙවෙ
නි පැළවිදිනයෙහි මහසඟපිරිවරින් නික්ම වඩනට පටන්ගන්නා
සේක, එකල්හි ඒ වඩනාතැනට වට හාත්පසින් සාරසියයක්ගව්
පමණ තැන මනුෂ්‍යපිරිසින් ගැහනව එකකොලාහලවෙයි, එසේ
මහපිරිස් ගහනබැවින් පළමුපළමුව ආවාහුම බුදුන් දැක සිත්සේ
ආරාධනාකිරීමට අවකාශ ලබති සෙසු මණ්ඩලදෙක්හි මිනුෂ්‍යයෝ
ද අනේකප්‍රකාර පූජාසත්කාර ගෙණ ඒ මහාමණ්ඩලයෙහිම රැස්
වන්නාහුය, එකල්හි බුදුරජානන්වහන්සේ ඒ ඒ ගම්නියම්ගම්ව
ල එක්දවසක් දෙදවසක් තුන්දවසක් බැගින් වැස ඒ මහජනයා
ගේ ආමිස පිළිගැන්මෙන් අනුකම්පාකොට එසා මහපිරිස්හි අද
හස් බලා ඔවුන්ගේ චරිතලෙස ධම්දෙශනාකිරීමෙන් ඒ රැස්වන
නාක් හැම සතුන්ට නිර්වාණගාමී කුශලධම්යන්ගේ වර්ධනය කර
වදුරා නවමසකින් ඒ මහාමණ්ඩලචාරිකාව නිමවා වඩනාසේක,
ඉදින් ඇතම් අවුරුද්දෙක වස් ඉටා විසූ තුන්මස ඇතුළත භික්ෂූන්
ගේ සමථවිදර්ශනාවෝ තරුණව අධිගම්ය නොලද්දාහුවීනම් යට
කියනලද ක්‍රමයෙන් මහාපවාරණයදවස්හි පවාරණය නොකොට
පවාරණය සඞ්ග්‍රහය දී ඉල්මස මැදිපොහෝදිනයෙහි පවාරණය
කොට පැළවිදවස්හි මහාභික්ෂුසඞ්ඝයාවහන්සේත් පිරිවරා නික්
ම සසියයක්යොදුන් පමණවූ මධ්‍යමණ්ඩලයෙහි කියනලද ක්‍රම
යෙන් යොදුන් සීමක් එකකොලාහලකෙරෙමින් සත්‍වයන්ට කුශල
රාසි සංවර්ධනයෙන් වඩනට පටන්ගන්නාසේක, එකල්හි සෙසු
මණ්ඩලදෙක්හි සියලු පූජාසත්කාරද ගෙණ ඒ මධ්‍යමණ්ඩලයට
රැස්වන්නාහුය, එසේ රැස්වූ මහජනයාට පළමුපරිද්දෙන්ම අනු
කම්පා කිරීමෙන් කුශලවර්ධනය කොට ලෝවැඩ සාදා අටමසකින්
ඒ මධ්‍යමණ්ඩලචාරිකාව නිමවාවඩනාසේක. ඉදින් භාග්‍යවත් බුදු
රජානන්වහන්සේ ඇතම් අවුරුද්දෙක දක්වනලද ක්‍රමයෙන් එක්වි
හාරයෙක සාරමසක්ම වස්වසා වාසයකොටවිනෙයජනයන්ට අනුශා
සනාකිරීමෙනුදු ශ්‍රද්ධාදී ඉන්ද්‍රියයෝ මුහුකුරානුවීනම් ඔවුන්ගේ ශ්‍ර
ද්ධාදී මහාඉන්ද්‍රියයන්ගේ මුහුකිරීම බලනසේක් එයින් ඔබ්බෙහි
අන්‍යවූද එක්මසක් හෝ දෙමසක් හෝ තුන්මසක් හෝ සාරමසක්
හෝ එහිම වාසයකරවදුරමින් ඒ විනෙයජනපුද්ගලයන්ට වැඩ සාදා
වදුරා ඊට ඉක්බිතිව මහසඟපිරිවරින් නික්ම තුන්සියයක්යොදුන්
පමණ අභ්‍යන්තරමණ්ඩලයෙහි දනව් සැරිසරා වඩනාසේක, ඒ වඩ
නා තැනටද හාත්පසින් ගවු සාරසියයක් පමණ තැන් එකකොලා
හලව රැස්වන මහපිරිස් සද්ධම්මානුශාසනාකිරීමෙන් නවත්ව න

වන්වා ඒ ඒ තන්හි දවසක් හෝ දෙතුන්දවසක් හෝ වැඩසිට පිණ්ඩපාතචර්‍ය්‍යාදිවශයෙන් සත්ත්වානුකම්පාකොට ඔවුනොවුන්ගේ චරිත බලා සද්ධර්‍මවර්‍ෂා වස්වවස්වා වඩිනට පටන්ගත්කල්හි ඉහිරිව සිටි මහාමණ්ඩලය මධ්‍යමණ්ඩලය යන මණ්ඩලදෙක්හිදු පූජාසත්කාර ගෙණවුත් ඒ හැම බුදුන් වඩනා අන්තෝමණ්ඩලයෙහිම රැස්වන්නාහුය, ඒ සියලු මහජනයාට මෙලෝ පරලෝ වැඩ දක්වා සද්ධර්‍මානුශාසනාපැවැත්වීම් ආදි වශයෙන් නිර්‍වාණගාමී කුශලමාර්‍ගය පාද සත්ත්වානුග්‍රහකොට ලෝවැඩ සාද සත්මසකින් හෝ සමසකින් හෝ පස්මසකින් හෝ සාරමසකින් හෝ අන්තෝමණ්ඩලචාරිකාව නිමවා වඩනාසේක.

මෙසේ මේ ත්‍රිවිධ මණ්ඩලයෙහි දනව් සැරිසරා වඩනා භාග්‍යවත් බුදුරජානන්වහන්සේ චීවරාදී යම් කිසි ප්‍රත්‍යයලාභයක් පිණිස වඩනාසේක් නොවෙයි අන්‍යවූ නොයෙක්කාරණ හේතුකොට ගෙණ අනන්තවූ බුදුවරයන්සේ ලෝවැඩ පිණිසම වඩනාසේක්මය. ඒ කෙසේවූදයත්?

ඒ ජනපදයෙහි වසන දුගිදුප්පත්ජනයෝද බාලළදරුවෝද ජරාජීර්ණ මහලු සත්ත්වයෝද අනෙකප්‍රකාර ව්‍යාධිපීඩිත සත්ත්වයෝද යන මොව්හු කවරදවසෙක කෙසේනම් අවුත් තථාගතවූ මා දක්නට සමර්ථවෙද්ද එහෙයින් මා දනව්සැරිසරා ගියකල්හි ඒ හැමදෙනා හා මහජනසමූහයෝ ඔවුනොවුන් සිත්සේ මා දැක වැඳපුදා බණ අසාගැන්මෙහි අවකාශ ලබන්නාහුය එහි සමහර කෙනෙක් සිත් පහදවාගෙණ කුශලගතප්‍රීතියෙන් කුසල් වඩාගන්නාහුය සමහරකෙනෙක් මාලාදි අනෙකප්‍රකාර පූජාවස්තුවෙන් පුදන්නාහුය සමහරකෙනෙක් බත්සැන්දක් පමණවත් භික්ෂාදනය දෙන්නාහුය සමහරකෙනෙක් මිථ්‍යාදෘෂ්ටිය හැර සම්‍යක්දෘෂ්ටි වන්නාහුය, එසේ සියලු කුශලධර්‍මයන්ගේ රැස්කිරීම ඔවුන්ට බොහෝදීර්ඝකාලයකට හිතසැප පිණිස වන්නේයයි දනව්දූරා ලොකසත්ත්වයන්කෙරෙහි පතළ මහාකරුණාවෙන් අපබුදුරජානන්වහන්සේද අනන්තාපරිමාණවූ බුදුවරයන්ගේ ප්‍රවෙනිධර්‍මය නොහැර දනව්සැරිසරා වඩිමින් මෙසේ සත්ත්වානුග්‍රහකළසේක.

තවද එපමණක් මතු නොවෙයි අන්‍යවූද ජංඝාවිහාරවශයෙන් ගමන්යාම හේතුකොටගෙණ ශරීරඵාසුව පිණිසද අර්ථොත්පත්ති කාරණ කල්බලන පිණිසද භික්ෂූන්ට ශික්ෂාපද පණවන පිණිසද ඒ ඒ තන්හි වසන්නාවූ ශ්‍රද්ධාවීර්‍යස්මෘතිසමාධිප්‍රඥා යන පඤ්චෙන්ද්‍රියයන්ගේ වැඩීමෙන් පින් මෝරා සිටි විනෙජනයන්ට චතුස්සත්‍යාවබොධය පිණිසද යන කාරණ සතරක් හේතුකොටගෙණ සියලු

බුදුවරයෝම දනව සැරිසරා වඩනාහුය, තවද එසේ ඇතිකල්හි
ඒ ඒ ජනපදද්යෙහි වසන සත්වයෝ බුත්සරණ යන්නාහුයයි කියාද
ධම්සරණ යන්නාහුයයි කියාද සඞ්ඝසරණ යන්නාහුයයි කියාද ම
හත් ධර්මානුශාසනාවෂ්ඨාවෙන් සිව්වණක් පිරිස් සන්තර්පිතයකෙරෙ
ම්යි කියාද යන මේ කාරණ සතරකින් හා තවද ඒ ඒ තන්හි වස
න සත්වයෝ ප්‍රාණාතිපාත අකුශලයෙන් දුරුවන්නාහුයයි කියාද
අදත්තාදාන අකුශලයෙන් දුරුවන්නාහුයයි කියාද කාමමිථ්‍යාචාර
අකුශලයෙන් දුරුවන්නාහුයයි කියාද මෘෂාවාද අකුශලයෙන් දුරු
වන්නාහුයයි කියාද සුරාපාන අකුශලයෙන් දුරුවන්නාහුයයි කි
යාද යන මේ කාරණ පසකින් හා තවද එසේම ඒ ඒ සත්වයෝ සු
ගතභාවාද උපදෙශ ලදින් ප්‍රථමධ්‍යානය ද්විතීයධ්‍යානය තෘතීයධ්‍යා
නය චතුර්ථධ්‍යානය ආකාශානඤ්චායතනධ්‍යානය විඤ්ඤාණඤ්චාය
තනධ්‍යානය ආකිඤ්චඤ්ඤායතනධ්‍යානය නෙවසඤ්ඤානාසඤ්ඤා
යතනධ්‍යානය යන මේ අෂ්ටසමාපත්තිලාභී වන්නාහුයයි කියාද
යන මේ කාරණ අටකින් හා තවද සෝවාන්මාර්ගය සෝවාන්ඵලය
සකෘදාගාමිමාර්ගය සකෘදාගාමිඵලය අනාගාමිමාර්ගය අනාගාමිඵල
ය අර්හත්මාර්ගය අර්හත්ඵලය යන මේසතරමගසතරඵලට සත්වයෝ
පැමිණෙන්නාහුයයි කියාද යන කාරණ අටකින් හා මෙසේ මෙ
සේවූ නොයෙක් කාරණ හෙතුකොටගෙණ සියලු බුදුවරයන්ගේ
බුදුසිරිත්ලෙස දනව් සැරිසරා ගම්නියම්ගම්රාජධානි පිළිවෙළින්
අවුරුදුපතා වඩිමින් ලොකානුශාසනාකොට බුදුව වැඩවූන් පන්
සාළිස් අවුරුද්ද මුළුල්ලෙහි මාගේ සවාමිදරුවූ බුදුරජානන්වහන්
සේද මෙසේ සත්වානුග්‍රහකළසේක.

මෙසේ ලෝවැඩ කිරීමෙන් බුදුව වැඩවූන් පන්සාළිස්හවුරුද්දෙන්
පළමුවන හවුරුදු බරණැස්නුවර ඉසිපතනාරාමයෙහි වස්වැසදෙව
න තුන්වන සතරවන හවුරුදු පිළිවෙළින්ම රජගහනුවර වේළුව
නාරාමයෙහි වස්වැස පස්වනහවුරුදු විසාලාමහනුවර කූටාගාරසා
ලාවෙහි වස්වැස සවනහවුරුදු කොසඹෑනුවර කොසම්බිය නම් ආ
රාමයෙහි වස්වැස සත්වනහවුරුදු සක්දෙවුරජහුගේ එකපුණ්ඩරී
ක නම් උයනෙහි පාණ්ඩුකම්බලශෛලාසනයෙහි වස්වැස අටවන
හවුරුදු සුංසුමාරගිරි නම් පර්වතයෙහි වස්වැස නවවනහවුරුදු කො
සඹෑනුවර ඝොෂකාරාමයෙහි වස්වැස දශවනහවුරුදු පාරලිවන
යෙහි පාරලි නාම හස්තීහුගෙන් උපස්ථාන ලදින් සළරුකතමූල
ගල්අස්නෙක වස්වැස එකොළොස්වන හවුරුදු නාලකනම් බමු
ණුගම නාලකාරාමයෙහි වස්වැස දොළොස්වනහවුරුදු වෙරඤ්ජා
නම් බමුණුගම නලේරුරුක්නම් කොසඹරුක්මුල්හි සාලාවෙක
වස්වැස තෙළෙස්වනහවුරුදු චාලියනම් පර්වතයෙහි දෙවියන්ගේ

ආරාධනාවෙන් වස්වැස තුදුස්වනහවුරුදු දෙව්රම්වෙහෙර වස්වැස
පසළොස්වනහවුරුදු කිඹුල්වත් නුවර නිග්‍රොධාරාමයෙහි මිණිගුහා
යෙක වස්වැස සොළොස්වනහවුරුදු අලව්නුවර වස්වැස සතළොස්
වනහවුරුදු රජගහනුවර වෙළුවනාරාමයෙහි වස්වැස පිටපිට දහ
නවහවුරුද්දක් දෙව්රම්වෙහෙර වස්වැස එසේම පිළිවෙළින් සාවු
රුද්දක් විසාඛාවන්ගේ පූර්වාරාමයෙහි මිගාරමාතුනම් ප්‍රාසාදයෙහි
වස්වැස අනික්තුන්හවුරුද්දෙහි අනිබද්ධවාසව ඒ බුදුව වැඩහුන්
පන්සාළිස්හවුරුද්ද ඇතුළත යට කී පරිද්දෙන් දවසදවස එකෙක
දෙකෙක දශයෙක සියයෙක දහසෙක ලක්‍ෂයෙක කොටියෙක
යනාදිවශයෙන් නොයෙක්වර නොයෙක්දෙශනාවෙන් සසරින්
ගොඩනැගුසත්වයන්හැර සුමනමාලාකාරසමාගමාදිවූ සූවිසිසමාගම
මයෙහි සූවිසිතෙනෙක වැඩහිඳ සූවිසිවාරයෙක වදාළාවූ සූවිසිධර්ම
දෙශනාවෙකින් සූවිසිඅසංඛ්‍යයක් සත්වයන් සෝවාන්කොට සූවිසි
අසංඛ්‍යයක් සත්වයන් සකෘදාගාමිකොට සූවිසිඅසංඛ්‍යයක් සත්වයන්
අනාගාමිකොට සූවිසිඅසංඛ්‍යයක් සත්වයන් රහත්කොට අමාමහ
නිවන් දක්වා ලෝවැඩ සාදා ශාස්තෘවූ බුදුරජානන්වහන්සේගේ පි
රිනිවන්පෑමට දශමාසයක් පමණකල් ඉතිරිව තිබැද්දී යට කියන
ලද ක්‍රමයෙන් අනිබද්ධවාසවූ අනන්තිම තුන්හවුරුද්ද අතුරෙන් කෙළ
වර පන්සාළිස්වෙනි වස විසාලාමහනුවර සමීපයෙහිවූ බෙළුවගමට
වැඩ වස්වසනකාලය සමීපබැවින් භික්‍ෂුසඞ්ඝයා කැඳවා එහි සෙ
නසුන් නොසෑහෙනහෙයින් හා භික්‍ෂාව දුර්ලභහෙයින් මේ භික්‍ෂූන්
ට සැපපහසු තැන් බලා වස්විසීමට තෙපි යවයි කියා අවසර් දුන
හොත් පුරුකතරතැන් යාමෙන් ඒ හැම මාගේ පිරිනිවන්පෑම
නොදක අපබුදුරජ අහෝ අපට පිරිනිවන්පානාබව නොදන්වූසේ
කැයි සිතා මහත්ම් පිළිසරවන්නාහුය සමීපතැන්වල වස්වසා විසී
මෙන් මාසයකට අටවරක් බැගින් මා දක්නට අවුත් බණ අසා සු
ගතොවාද ලබන්නාහුයයි යන නොයෙක්කාරණා බුදුඇසින්ම
දකවදාරා මහණෙනි තෙපි හැම මේ විසාලාමහනුවරම වස්වසව
මමද මෙහිම වස්වසමියි නියමකොටවදාරා එම බෙළුවගම්හිවූ වි
හාරයෙහි අපභාග්‍යවතුන්වහන්සේ වස්වසා වාසයකරණකල ක්‍රූ
රවූ මාරණාන්තික තද ආබාධයෙක් උපන, එවිට සිහිය මනාකොට
පිහිටුවා නුවනින් පිරිසිඳ දකවදාරමින් වෙහෙසීමක් නොව වෙද
නානුවර්තිවශයෙන් ඔබමොබ නොපෙරලී නිදුක්ව සමාධිබල
යෙන් ඒ රොගවේදනා ඉවසනසේක් මේ ලෝකයෙහි බලසම්පන්න
පුරුෂයෙක් යම්සේ පොකුණකට බැස හස්තපාදප්‍රහාරයෙන් මනා
කොට දුරුකරණලද දියසෙවෙල් චිරකාලයෙන් එක්විම වේද එ
සේම සමාධිබලයෙන් මැඩපවත්වාදුරුකළ දුඃඛවෙදනාවන් නැවත

අසම්පත් හැර ඉපදීම ධර්මතාවක් බැවින් ඒ රෝගයද එතාක්කල් නොඉපද ජීවිතසංස්කාරය පවත්නාසේ අධිෂ්ඨානකොට බුදුවනදා බෝමැඬදී අභිනවවිදර්ශනාව තැබීමසේ මහාවිපස්සනා වශයෙන් වේදනාව මැඬපවත්වා සමාපත්ති සමවැදීමෙන් මෙසේ ඒ ආබාධය උපස්ථායකයන්ටද නොදන්වාම ඉවසාවදාළසේක.

ඉක්බිති ඒ මහාභික්ෂුසංඝයාවහන්සේත් පිරිවරා අනුක්‍රමයෙන් සැවැත්නුවර ජේතවනාරාමයටම වැඩිසේක, බුදුරජානන්වහන්සේගේ පිරිනිවන්පෑමට පළමුවෙන් අග්‍රශ්‍රාවක දෙදෙනාවහන්සේගේ පිරිනිවන්පෑම හැම බුදුවරයන්ගේ කාලයෙහිම නියතධර්මතාවක්ම වනබැවින් එසේම දෙව්රම්ව පැමිණ බුදුන් වැඩවසනකල තමන්වහන්සේගේ පිරිනිවන්පෑම සතියකින්ම වන්නේයයි දැන අවසර ඉල්වූ සැරියුත් මහතෙරුන්වහන්සේගේ නාළකනම් ගම උපන්ගෙයිදී පිරිනිවන්පෑමට අවසරදී වදාරා නැවත චුන්දතෙරුන්වහන්සේ විසින් සැරියුත්සාමීන්ගේ ආදාහනකෘත්‍යය නිමවා ධාතු ගෙණවුත් භාග්‍යවතුන්වහන්සේට දක්වූකල්හි ශ්‍රීහස්තයෙන් ඒ ධාතු ගෙණ තෙරුන්වහන්සේගේ ගුණ ගාථා පන්සියයකින් වදාරා ජේතවනාරාමයෙහි ඒ ධාතු තබා චෛත්‍යය කරවා නැවත රජගහනුවරට වඩනා පිණිස අනදසාමීන්ලවා භික්ෂුසංඝයා රැස්කරවා ඒ මහාසඟපිරිවරින්ම රජගහනුවරට වැඩ මහජනයාට සද්ධර්මදේශනාකිරීමෙන් ලෝවැඩ වඩා වසනසේක් මුගලන්මහතෙරුන්වහන්සේගේ කළුගල්ලෙනදී පිරිනිවන්පෑමටද අවසරදී ඉක්බිති ඒ ධාතු ගෙණ චෛත්‍යය කරවා මහාභික්ෂුසංඝයාවහන්සේ හා සමග රජගහනුවරින් නික්ම අනුක්‍රමයෙන් ගඞ්ගාභිමුඛව උරුවෙලාවට වැඩ ඒ ගඞ්ගාතීරයෙහි භික්ෂුසංඝයා පිරිවරා වැඩහිඳ සැරියුත් මුගලන් දෙදෙනාවහන්සේගේ පරිනිර්වාණය ප්‍රතිසංයුක්තවූ ධර්මදේශනාකොට එයින් නික්ම මහාභික්ෂුසංඝයාවහන්සේත් පිරිවරා නැවතද විසාලාමහනුවරටම වැඩිසේක.

එහි භාග්‍යවතුන්වහන්සේද පෙරවරු පිඬුපිණිස වැඩ පස්වරු භාගයෙහි නැවතී වඩනාසේක් ආනන්දස්ථවිරයන්ලවා වැඩහිඳින සන්කඩ ගෙන්වාගෙණ චාපාලචෛත්‍යනම් විහාරට වැඩ එහි පනවනලද බුද්ධාසනමස්තකයෙහි වැඩහිඳ එකත්පස්ව හුන් අනඳ මහතෙරුන්වහන්සේට අඞ්ගාවදාරා ආනන්දය විසාලාමහනුවර ඉතාරමණීයය එහි පිහිටි උදෙනිචෛත්‍ය නම් විහාරයද ගෞතමකචෛත්‍ය නම් විහාරයද සත්තම්බකචෛත්‍ය නම් විහාරයද බහුපුත්තචෛත්‍ය නම් විහාරයද සාරන්දදචෛත්‍ය නම් විහාරයද මේ චාපාලචෛත්‍ය නාම විහාරයද යනාදී විහාරයෝත් ඉතාරමණීය

වත්නාහ, ආනන්‍දය යම්කිසිවෙක් විසින් සතරසෘද්ධිපාදයෝ භාවිතා කිරීමෙන් වඩනාලද්දාහුද නැවත නැවත කිරීම් වශයෙන් බොහෝකොට කරනලද්දාහුද යුක්තයානයක්මෙන් සිතා ඒ සතරසෘද්ධිපාදයෝ භාවිතාකරණලද්දාහුද පිහිටවන අර්ථයෙන් උතුම් වස්තුවක් මෙන් අධිෂ්ඨානවශයෙන් හාත්පසින් පුරුදුකිරීමෙන් මනාකොට පටන්ගන්නාලද වීර්‍ය්‍යයෙන් එම සතරසෘද්ධිපාදයෝ යහපතව වඩා පුරුදුකරණලද්දාහුද හෙතෙම කැමැත්තේවීනම් ඒ ඒ කලට නියමවූ ආයුෂ්කල්පය මුළුල්ලෙහි හෝ ශෙෂයක් හෝ සිටින්නේය, ආනන්‍දය තථාගතයන් විසින් ඒ සතරසෘද්ධිපාදයෝ එසේ භාවිතාකරණලද්දාහුය ඒ තථාගතතෙම කැමැත්තේවීනම් ආයුෂ්කල්පය මුළුල්ලෙහි හෝ ඉන් ශෙෂයක් හෝ සිටිනාසේකැයි වදාළසේක.

මෙසේ බුදුරජානන්වහන්සේ චාපාලචෛත්‍යනම් විහාරයෙහි වැඩහිඳ ආයුසංස්කාරයාගේ හැරීම පිණිස මහත් ඖදාරිකනිමිති ඕභාසකථාවන් අනඳමහතෙරුන්වහන්සේට දක්වාවදාළකල්හි උන්වහන්සේ එවිට පවිටුවූ මාරාවේශයින් ඇතිබැවින් ඉන් කිසිවක් නොදත්සේක, දෙවනතුන්වනුවටද බුදුරජ එසේ ඕභාසකථාවන් පවත්වාවදාළකල්හි මෙකලට නිසිවූ ආයුෂ්කල්පය මුළුල්ලෙහි වැඩසිටීම පිණිස යාච්ඤාකරන්ට අනඳමහතෙරුන්වහන්සේ නොදත්සේක.

ඉක්බිත්තෙන් භාග්‍යවතුන්වහන්සේ ආනන්‍දස්ථවිරයන්වහන්සේ නුදුරුතැන එක් රුක්මුලකට දිවාවිහාර පිණිස යවා එකලාව වැඩවුන්කල්හි පවිටුවූ මාරදෙව්පුත් අපභාග්‍යවතුන්වහන්සේකරා අවුත් එකත්පස්ව සිට දන්වනුයේ භාග්‍යවතුන්වහන්ස පිරිනිවන් පෑවදාළමැනව ඔබවහන්සේගේ අභිසම්බෝධියෙහි පටන් අටවැනි සතියෙහි අජපාලනම් නුගරුකමුල වැඩවුන්තැනට ගොස් සවාමිවූ භාග්‍යවතුන්වහන්සේ යමක් පිණිස පාරමිධර්මයන් පූරණලද්දාහුද ඒ කාරණයට පැමිණෙනලද්දේය සර්වඥතාඥානය ප්‍රතිවෙධය කරණලද ලෝකව්චාරණයෙන් ඔබවහන්සේට දැන් ප්‍රයොජන කවරේද? එහෙයින් භාග්‍යවතුන්වහන්සේ දැන් පිරිනිවන්පෑවදාරණසේක්වයි කියා මම ආරාධනාකෙළෙම් එකල්හි භාග්‍යවතුන්වහන්සේ මේ වචනය මට වදාරණලදී. ඒ කෙසේදයත්? පවිටු මාරය යම්තාක්කලකින් මාගේ ශ්‍රාවකවූ භික්ෂුභික්ෂූණී උපාසකඋපාසිකා යන සිව්වණක්පිරිස්හුම මේ ශාසනයෙහි මාර්ගවශයෙන් ව්‍යක්තවෙද්ද එසේ මාර්ගවශයෙන් මනාකොට හික්මෙද්ද දක්ෂවෙද්ද පිටකත්‍රයවශයෙන් බහුශ්‍රැතවෙද්ද එසේම ධර්මධරවෙද්ද

භානාහොත් පර්‍ය්‍යාප්ති ප්‍රතිවේධ බහුශ්‍රුතවීමෙන් එම ධර්ම දෙදෙනාගේ දැරීමෙන් ධර්මධරවෙද්ද ආය්‍යීධර්මයට අනුධර්මවූ විදර්ශනාභාවනා මාර්ගය පිළිපැදීමෙන් ධර්මානුධර්මප්‍රතිපන්නවෙත්හි යෙදෙත්ද සුදුසු පිළිවෙත්හි හැසිරීමෙන් සාමීචිප්‍රතිපදායෙහි යෙදෙද්ද අනුධර්මචාරීව ධර්මය අනුව හැසිරෙණ ස්වභාව ඇතිවෙද්ද ආචාය්‍යීවාද ඉගෙණ අනුන්ට දන්වන්නාහුවෙද්ද ·උපන් යම්කිසි පරප්‍රවාදයක් හේතු සහිතවූ කාරණ සහිතවූ වචනයෙන් සුනිග්‍රහිතයට නිග්‍රහකොට නිර්වාණමාර්ගය දක්වා ධර්මය දෙශනාකෙරෙද්ද ත්‍රිවිධශික්‍ෂා නැමැති ශාසනබ්‍රහ්මචය්‍යීාව ධ්‍යානාස්වාදවශයෙන් වෘද්ධියට පැමිණේද අභිඥාසමාපත්තිවශයෙන් සර්වාලිප්පුල්ලභාවයට මහත්බවට පැමිණේද ඒ ඒ දිශාභාගයෙහි පිහිටීම්වශයෙන් ශාසනය විස්තාරවේද බාහුජඤ්ඤ නම්ලද මහජනයාගේ අභිසමය වශයෙන් බොහෝසත්වයන්විසින් නිර්වාණධර්මය ප්‍රතිවෙධකරණලදද සර්වාකාරවශයෙන් යම්කලෙක විස්තීර්ණබවට පැමිණෙනලදද දෙවිමිනිසුන්කෙරෙහි ප්‍රසිද්ධවූ යම්පමණක් ලෝකයෙහි නුවනැතිදිව්‍ය මනුෂ්‍යාදීහු ඇත්තාහුද ඒ සියල්ලන්විසින් ඉතා මැනවැයි ප්‍රශංසා කරණලදද එසේ මාගේ බුද්ධශාසනය වර්ධනයවූකල්හි මම පරිනිවන්පානෙම්යි මට වදාළසේක, ඒ සිව්වණක්පිරිස්හුම දැන් එසේවූ ව්‍යක්තතාදී ඒ සියලු ගුණසම්පන්නව ඔබවහන්සේගේ ශාසනය විස්තාරවිය එබැවින් දැන් පිරිනිවන්පෑවදාළමැනවැයි දැන්විය·

මෙසේ මාරදෙව්පුත් දැන්වූකල්හි භාග්‍යවතුන්වහන්සේ තමන්වහන්සේගේ අනාවරණවූ බුද්ධඥානයෙනුදු ඒ මාරදෙවපුත් කීලෙසම ශාසනය විස්තාරවූබව දැනවදුරා එම්බල මාරය නෝ උත්සාහ නොකරව නොබෝකලකින් තථාගතයන්ගේ පිරිනිවන්පෑම වන්නේයයි වදාළසේක· එවිට වසවර්තීමාරතෙම ලද ලාභයක්මෙන් ඉතාසතුටුව එහිම අන්තර්ධානව ගියේය

මෙසේ අපබුදුරජානන්වහන්සේ චාපාලචෛත්‍යනම් විහාරයෙහිදී සිහිනුවණින් යෙදිවදුරා ආයුසංස්කාරය හැර නිම්ෂණයෙහිම දියපොළොව අවසන්කොට ඇති මේ මහාපෘථිවිතොමෝ කම්පාවිය, එකල්හි ආයුෂ්මත් ආනන්දමහතෙරුන්වහන්සේ භාග්‍යවතුන්වහන්සේ කරා ගොස් වැඳ එකත්පස්ව මාගේ ස්වාමිදරුවූ බුදුරජානන්වහන්ස දැන් මේ භයානකවූ පෘථිවිකම්පාවීමට කාරණ කවරේද?ඒ මට වදාල මැනවැයි ආරාධනාකලකල්හි බුදුරජානන්වහන්සේ ආනන්දය මේ මහාපෘථිවිය දියපොළොවෙහි පිහිටියේය දියපොළොව වාපොළොවෙහි පිහිටියේය යම්කලෙක වාපොළොව කම්පාවූයේවී නම් දියපොළොව හා මේ පස්පොළොවද කම්පාවෙයි මෙසේ ධාතුක්ෂොභවශයෙන්ද පින්වතුන්ගේ සෘද්ධානුභා

ධයෙන්ද කම්පාවෙයි, තවද මහබෝසතාණන්ගේ මව්කුස ඉපදීමෙන්ද එයින් නික්මීමෙහිද පුණ්‍යතේජසින් කම්පාවෙයි බුදුවීමෙහි ඥානතේජසින් කම්පාවෙයි මඟුල්ධර්මදෙශනාවෙයි සාධුකාරදානවශයෙන් කම්පාවෙයි ආයුසංස්කාරය හැරීමෙහි තථාගතචිත්තය හැකිලීමෙහි ඉවසාගතනොහී කරුණාස්වභාවශයෙන් කම්පාවෙයි පිරිනිවන්පෑමෙහි හැඬීම්වශයෙන් කම්පාවෙයි, මෙසේ ආනන්දය අටකාරණයකින් පොළොව කම්පාවීම වන්නේයයි මෙසේ කාරණා නියමකොට දක්වාවදාළකල්හි එපමණකින් ආයුෂ්මත් අනඳමහතෙරුන්වහන්සේ මේ ශාස්තෘවූ බුදුරජාණන්වහන්සේගේ ආයුසංස්කාරය හැරීමවනැයි දැන මහත්සේ කම්පාවීමට පැමිණිසිත් ඇතිව මාගේ ස්වාමිදරුවූ භාග්‍යවතුන්වහන්සේ දෙව්මිනිසුන් සහිත සියලු සත්වලොකයාට හිත පිණිස සැප පිණිස වැඩ පිණිස ලොකානුකම්පායෙන් ආයුෂ්කල්පය මුළුල්ලෙහිම ජීවත්ව සිටවදාළ මැනවැයි යනාදින් ආරාධනාකළකල්හි බුදුරජ වදාරණසේක් ආනන්දය දැන් එසේ තථාගතයාහුවට නිසි කාලය නොවෙයි මාවිසින් ඒ ආයුසංස්කාරයාගේ හැරීම් අරභයා මහත් නිමිත්තාභාෂ මහාකථාවන් පැවැත්වූකල්හි ඒ කාරණය දැනගතනොහී තෙපි තුෂ්ණීම්භූතව ප්‍රමාදවූයෙහිය එහෙයින් ආනන්දය මේ තොපකෙරෙහි පැවිති වැරදීම යයි වදාළසේක. ඒ ආයුෂ්මත් අනඳමහතෙරුන්වහන්සේ එසේම දෙවනතුන්වනවටද“ භන්තෙ භගවා කප්පං වා තිට්ඨතු,, යනාදීන් ආරාධනාකළකල්හි බුදුරජණන්වහන්සේ නැවත නැවතත් පළමුකොට වදාළලෙසම ආනන්දස්ථවිරයන්ට දැන්වූසේක එවිට විෂ පෙවූ සල්ලයකින් හෘදයවස්තු ප්‍රදෙසයෙහි විදීමෙන් වෙහෙසට පත් හස්තියෙකුමෙන් සිහිමුළාව කිසිවක්වත් කියාගත නොහී අනඳමහතෙරුන්වහන්සේ තූෂ්ණීම්භූතවූසේක. එකල්හි භාග්‍යවතුන්වහන්සේ ඔවුනොවුන් අස්වැසීමෙන් වදාරණසේක් ආනන්දය“ සබ්බෙහෙව පියෙහි මනාපෙහි නානාභාවො විනාභාවො,, යනුයෙන් ලෝකයෙහි සියලුම ප්‍රියමනාප වස්තූන්කෙරෙන් සත්වයන්ගේ වෙන්වීම මරණට පැමිණීම ම ස්වභාවකොට ඇත්තේයයි කියා මේ කාරණා මාවිසින් පළමුකොට කියනලද නොවේද එහෙයින් ලොව හැම සංස්කාරයන් අතුරෙන් එකස්වරූපයෙන් පවත්නා එකද වස්තුවෙක්නම් නැත එසේ එකස්වරූපයෙන් සිටිනා යම් ඒ කාරණයෙක් මෙහි කොයින් ලැබේද තවද ආනන්දය ප්‍රථමසම්‍යක්සම්බොධියෙහි පටන් අටවැනීසතියෙහි මාරදෙව්පුත් මාකරා අවුත් පිරිනිවන්පෑවදාළ මැනවයි දැන්වූ කල්හි මාගේ ශ්‍රාවකවූ සිව්වණක්පිරිස්හුම් සියලු

බුද්ධාංගභූමියෙහි සමත්වූ ත්‍රිවිධශික්ෂාශාසනය විස්තාරවූකල පිරිනි
වන්පාන්නෙමියි කියා මාවිසින් පළමුකොට අජපාලනම් නුගරුකමු
ලදීම ආයුසංස්කාරය හරණලද, එබැවින් මා රද්ධිපුත්‍රද මාගේ
සිව්වණක්පිරිස් විමසා බලා ත්‍රිවිධශික්ෂාශාසනයා ගේ විස්තාරබව
ට ගියවයි මමද බුදුඇසින් බැලූකල එසේම දක්මි හැම බුදුවර
යන්ගේ සිරිත්ලෙස මමද දැන් පිරිනිවන්පෑමට නිසිවූ ආයුෂයා
ගේ පස්වැනි කොට්ඨාසයට පැමිණ සිටිනෙමි එහෙයින් මේ පිරිනි
වන්පෑමට නිසි කලයයි දැන සිහිනුවණින් යෙදීම ආයුසංස්කාරය
හරණලද්දෙමි එසේ තථාගතයන්විසින් හරණලදදෙයක් නැව
ත නොගන්නාබවය,එසේවූ දෙයක් මෙහි නැත යන කාරණය ආ
නන්දය තෙපි නොදන්නෙහිදැයි යනාදීන් ශෝකසල්ලය උපුටාවදා
රා නවම්මස මැදිපොහෝදිනයෙහි මෙයින් තුන්මසක් ගියකල
පිරිනිවන්පාන්නෙමියි කියා චාපාලචෛත්‍යයෙහිදී මෙසේ සිහිනුව
ණින් යෙදී දසදහසක්සක්වළ මහපොළෝ කම්පාකිරීමෙන් ආයු
සංස්කාරය හැර එයින් නික්ම ආයුෂ්මත් ආනන්දස්ථවිරයන් සමග ම
හාවන කූටාගාරසාලාවට වැඩ එහි උපස්ථානසාලාවෙහි විසාලාම
හනුවර වසනනාක් සියලු භික්ෂූන් රැස්කරවා පනවනලද බුද්ධාස
නමස්තකයෙහි වැඩහිඳ භික්ෂුසඞ්ඝයාවහන්සේට අඬගාවදාරා "හ
න්දදානි භික්ඛවෙ ආමන්තයාමි වො භික්ඛවෙ වයධම්මා සබ්බෙ ස
ඞ්ඛාරා අප්පමාදෙන සම්පාදෙථ න චිරස්සෙව තථාගතස්ස පරිනි
බ්බාණං භවිස්සති,, යනාදීන් මහණෙනි සියලු සංස්කාරයෝම නස්
නාස්වභාවය ඇත්තාහ එහෙයින් තෙපි අප්‍රමාදවව් මෙයින් තුන්
මසක් ගියකල තථාගතපරිනිර්වාණය වන්නේයයි වදාළසේක. එ
කල්හි එහි රැස්වූනාක් පෘථග්ජන භික්ෂූන්වහන්සේලා කඳුළුධාරා
වන් දරාගත නොහී හඬන්ට වන්හ, රහත්වසිටි ක්ෂීණාශ්‍රවයන්ව
හන්සේලා වනාහි ධර්මසංවේගයට පැමිණියාහුය.

භාග්‍යවතුන්වහන්සේ පෙරවරු හැඳ පෙරව පාසිවුරු ගෙණවි
සාලාමහනුවරට වැඩ භික්ෂාටණය කොට වළඳාවදාරා ඉක්බිති ස
වස්වේලෙහි නුවරින් නික්ම වඩනාසේක් ඒ විසාලාමහනුවර වහ
සල්දෙර අභිමුඛයෙහි වැඩසිට නැවතත් විසාලාමහනුවර බලම්යි
සිතාවදාළසේක. ඒ ක්ෂණයෙහිම මහාපෘථිවිය කුඹල්සකක්සේ බු
ද්ධානුභාවයෙන් කරකැවී විසාලාමහනුවර බුදුන්ට අභිමුඛව සිටා
ගත; එකල්හි භාග්‍යවතුන්වහන්සේ එසේම වැඩසිට නාගාපලෝ
කන වශයෙන් බලාවදාරා ආනන්දස්ථවිරයන්ට අඬගාවදාරමින් ආන
න්දය මාගේ මේ විසාලාමහනුවර පශ්චිමදර්ශනය මෙයින් ඔබ්බෙ
හි තථාගතබැල්මක් නොවන්නේයයි වදාළසේක.

භාග්‍යවතුන්වහන්සේ කුමක්නිසා මෙසේ විසාලාමහනුවර බ
ලාවදූරණසේක්දයත්?

එනුවරවාසී සියලු ලිච්ඡවිරජදරුවන්ගේ තුන්හවුරුද්දකින් ව
නා විනාසයද එසේ ආසන්නමරණයට පැමිණි ඔවුන්කෙරෙහි ප
තළ මහාකරුණාවෙන් ඒ බලාවදාළතැනම නාගාපලෝකිතනම්
චෛත්‍යයක් කොට සුවඳමාලාදීන් පූජාකෙරෙති එසේ ඒ පිදීම
ඔවුන්ට බොහෝදීර්ඝකාලයකට හිතසැප පිණිස වන්නේයයි දැන
වදාරා අනුකම්පායෙන් එසේ නාගාපලෝකනය කළසේකැයි
දතයුතු.

මෙහි නාගාපලෝකනයනම්,ලෝවැසි මහජනසමූහයාගේ ශරීර
අස්ථීහු කෙළවරින් කෙළවර ස්පර්ශව නැඟරවැලින් බැදිසිටිනාහුය
පසේබුදුවරයන්ගේ ශරීරඅස්ථීහු අඞ්කුසයන්ගේ එක්විමුසේ එකි
නෙක කෙළවරින් කෙළවර ලග්නවීමෙන් බැදී සිටිනාහුය, ස
ම්‍යක්සම්බුද්ධවරයන්ගේ ශ්‍රීශරීරගත සියලු අස්ථීහු එසේ නොවෙයි
සංඛලිඛිතනම් ලද දම්වැල්සන්ධිසේ එකිනෙක අස්ථියෙන් අස්ථිය
බැදී ස්ථිරව සිටිනාහුය, ඒ කාරණයෙන් බුදුරජානන්වහන්සේ
යම්කිසි කරුණකින් ආපසු බලනු කැමතිසේක්වීනම් ශරීරාවයව
අඩ්යක් කරකවා ඇඹරී බැලීමට නොහැකිසේක එහෙයින් අසාධා
රණවූ බුද්ධානුභාවයෙන් මහාපෘථිවිය කරකැවී පිටිපසදසාව අභිමු
ඛයට පැමිණිකල සිටිසේම වැඩසිට බලාවදාරණසේක එසේ නැ
තහොත් කරඅඹරා ආපසු බැලිය නොහැකි නාගසම්මත හස්තිරා
ජයෙකුසේ සකල බුද්ධශරීරය ආපසුදසාවට අභිමුඛව කරකවාලී
මෙන් බලාවදාරණසේක, ඊට නාගාපලෝකනයයි යනු නාමෙකි.

මෙසේ විසාලාමහනුවර වහසල්දොරඅභිමුඛයෙහි වැඩසිට නා
ගාපලෝකනයකොට මහසඟ පිරිවරා බුදුරජ එයින් නික්ම ගොස්
භණ්ඩගාමයට වැඩ එහි බොහෝ භික්ෂුසඞ්ඝයාවහන්සේට ධර්මකථා
පවත්වාවදාරණසේක් ශීලයනම් මෙසේය සමාධියනම් මෙසේය
ප්‍රඥාවනම් මෙසේය විමුක්තියනම් මෙසේය ඒ ශීලයෙන් යුක්තව
වසන්නාහුගේ ශීලපරිභාවිතවූ සමාධිභාවනාව මහත්ඵලමහානි
සංස වන්නීය එසේ සමාධිභාවනාව මිශ්‍රවූ ප්‍රඥාවද මහත්ඵලමහානි
සංස ඇතිවන්නීය ඒ ප්‍රඥාව හා මිශ්‍රව පවත්නාවූ චිත්තයද මහ
ණෙනි මනාකොට කාමාශ්‍රවාදී සියලු ආශ්‍රවයන්කෙරෙන් මිදී පරි
ශුද්ධව පවත්නේයයි යනාදීන් ධර්මදේශනා කොටවදාළසේක.

මෙසේ භික්ෂූන්ට සද්ධර්මානුශාසනා කිරීමෙන් භණ්ඩග්‍රාමයෙහි අභි
ප්‍රායකාලයක් වාසයකොට මහසඟ පිරිවරා එයින් නික්ම හස්ති
ග්‍රාමය අම්බග්‍රාමය ජම්බුග්‍රාමය භෝගනගරය යම්යම් තැනෙක්හිද
ඒ ඒ තන්හි වැඩ භෝගනගරයෙහිවූ ආනන්දචෛත්‍යයෙහි අභිප්‍රාය

කාලයක් වාසයකොට ආනන්දය පාවා නම් නුවරට යම්හයිවදාරා ම
හසඟපිරිවරින් පාවා නම් නුවරට වැඩ එනුවර චුන්දනම් කම්මාරපුත්‍ර
යාගේ අඹඋයනෙහි වාසයකරණකල්හි එපවත් අසා කම්මාරපුත්‍රතෙ
ම සතුටුව තමාගේ අඹඋයනෙහි වූ විහාරයෙහි වාසයකරණ භාග්‍ය
වතුන්වහන්සේකරා ගොස් වැඳ එකත්පස්ව හිඳ මෙලෝපරලෝ
වැඩ දක්වා එහි සමාදන්වනසේ සිත ශික්ෂණයවනසේ සාධු සාධුයි
ප්‍රසංසාකරණසේ ධර්මදෙශනාකරවදාළකල්හි ඒ කම්මාරපුත්‍රතෙම
ඉතා සතුටුව දෙවෙනිදවස්හි බුදුපාමොක් මහසඟනට දන් දෙන
පිණිස ආරාධනාකොට වැඳ අවසර ගෙණ තමාගේ වාසස්ථානයට
ගොස් ප්‍රණීතවූ බොහෝ ඛාද්‍යභොජ්‍යයන් සම්පාදනයකරනුයේ ත්‍රි
කොටිපරිශුඬවශයෙන් සමහවූ ඉතාතරුණ නොවූ ඉතාජීණ් නොවූ
මෘදු සිනිඟු සූකරමාංශයක් පිසවනකල්හි දෙදහසක් ක්ෂුද්‍රද්වීප පිරි
වරවූ මේ සතරමහද්වීප වාසී දෙවතාවෝ පෘථිවිරසදිවඕජස් එහි
ප්‍රක්ෂේපකළාහුය.

ඉක්බිත්තෙන් භාග්‍යවතුන්වහන්සේ පිරිනිවන්පානා දවස්හි
පූර්වාණ්හකාලයෙහි මනාකොට හැඳපෙරව කයින් චීවරයහා අතින්
පාත්‍රය ගෙණ මහාභික්ෂුසඞ්ඝයාවහන්සේහා සමග කාරණලද ආරා
ධනා ඇති ඒචුන්දනම් ස්වර්ණකාරපුත්‍රයාගේ නිවෙසනයට වැඩ පන
වනලද බුඩාසනමස්තකයෙහිවැඩහිඳ චුන්දනම් ස්වර්ණකාරපුත්‍රයාට
අඬගාවදුරා චුන්දය තාවිසින් යම් සූකරමද්දවයක් පිළියෙළකරණ
ලදද එයින් මා වලඳවව අන්‍යවූ යම් ඛාද්‍යභොජ්‍යයෙක් ඇද්ද එ
යින් භික්ෂුසඞ්ඝයාවලඳවවයි වදාළසේක· බුදුරජ කුමක්පිණිස මෙ
සේ වදාළසේක්දයත්? දන්දෙන පිණිස පිළියෙළකරණලද ඒ සූකර
මද්දවයෙහි මේ සතරමහද්වීපයෙහි සියලු දෙවතාවන් විසින් බුදු
වනදෘ සුජාතාව දුන් කිරිබතෙහි දිවඕජස් බහාලූවාසේ දිවඕජස්
බහා බුදුන්ටම පරිනාම්‍ය කරණලද්දේය එබැවින් ඒ සූකරමද්දවය
වළඳා බුදුන් හැර දෙවිමිනිසුන් සහිතවූ සියලු ලෝකයාඅතුරෙන්
යම්කිසිවක්හු විසින් සෑපසේ ජීර්ණබවට පමුණුවාගත නොහැ
කිබව අනාවරණඥානයෙන් දැන මහාකරුණායෙන් බුදුරජ පරූ
පවාද මිදීම පිණිස මෙසේ වදාරා වලඳවා ඉතිරිසූකරමද්දවයත්
අන්කිසිවක්හට නොදී විනාසකරවයි වදාළසේක· ඒ ඇසූ කම්මා
රපුත් එසේය ස්වාමින්වහන්සැයිනියා ඒ සූකරමද්දවයෙන්ම බුදුන්
වළඳවා සෙසු ඛාද්‍යභොජ්‍යයෙන් භික්ෂුසඞ්ඝයා වළඳවා ඉක්බිති ඉති
රිවූ සූකරමද්දවය අනිකක්හට නොදිරණ හෙයින් ප්‍රාණීන් නැ
තිතැනක දම්මවා ඉක්බිති බුදුන්කරා ගොස් වැඳ එකත්පස්ව
හුන්නේය, එකල්හි භාග්‍යවතුන්වහන්සේ ඔහට මෙලෝපරලෝ

වැඩ දුක්විඳිම්ආදිවශයෙන් බණ වදාරා හුනස්නෙන් නැගී වැඩිසේක.

මෙසේ ඒ කර්මාරපුත්‍රයාගේ බත වළඳතිබිකල්හි බහුලවේදනා ඇති මාරණාන්තිකවූ ලොහිතපක්ඛන්දිකානම් ක්‍රූරආබාධයෙක් උපන්නේය, ඒ ආහාරය වැළඳුකාරණයෙන් උපන් රෝගයෙක් නොවෙයි එසේ නොවළඳ සිට රෝගය උපන්නේවීනම් ඉතා ක්‍රූරවූ වේදනා උපදනේය ඒ මෘදුසිනිඳු භොජනය වැළඳූබැවින් අධිකවේදනා නොවිය, පළමුව බේළුවගම්හි වස්වසා වසනකල උපන් මෙම රෝගය සමාධිබලයෙන් මැඩපවත්වාගෙණ ඉද්දිරියෙන් දශමාසයකට නූපදනාසේ පිහිටි සමාධිබලයද මෙකලට නිම්හෙයින් මෙදවස්හි ඒ රෝගයාගේ ඉපදීමදස්වභාධර්මතාවෙක්මයයි දතයුතු.

එවිට අපභාග්‍යවතුන්වහන්සේ සිහිනුවණින් යෙදී වෙහෙසීමක් නොව වෙහෙස ඉවසාවදාරමින් ආනන්දස්ථවිරයන් කැඳවා ආනන්දය කුසිනාරානුවරට යම්හයි වදාරා එහි රැස්වූනාක් මහාභික්ෂුසඞ්ඝයාවහන්සේත් පිරිවරාගෙණ අඩානමාර්ගයට පැමිණ වඩනාසේක් අතරමගදී මගින් පහව රුකක්මූලට වැඩ ආනන්දය මම කලානායෙමි එහෙයින් මෙහි හිඳිම් සඟළසිව්ර සතරපටකින් පනවයි වදාළසේක, එකල්හි අනඳමහතෙරුන්වහන්සේ සඟලසිව්ර එහි අතුටවදාළසේක, භාග්‍යවතුන්වහන්සේ එහි වැඩහිඳ ආනන්දය පිපාසිතයෙමි පැන් ගෙණෙව වළඳමියි වදාළකල්හි අනඳමහතෙරුන්වහන්සේ භාග්‍යවතුන්වහන්සේට මෙසේ දැන්වූසේක. ඒ කෙදයත්? මාගේ ස්වාමිදරුවූ බුදුරජානන්වහන්ස දැන් පන්සියයක් පමණ ගැල් මේ මාර්ගයෙහි ගෙණ ගියාහුය ඒ ගැල්සක් සපර්ශයෙන් බිම බිදී මේ අතික්ෂුද්‍රනදියෙහි ඉතා මඳදිය ඇලලී බොරවීමෙන් වහනයවන්නේය ස්වාමින්වහන්ස මේ කුකුත්ථනදීතොමෝ ඉතා නුදුරුය එහි දිය ප්‍රසන්නය මධුරය සීතලය මඩ නැතිව ඉතාරමනීයය මනාවබස්නා තොට ඇත්තීය එහෙයින් භාග්‍යවතුන්වන්සේ එහි පැන් වළඳ ජලස්නානයෙන් ශ්‍රීශරීරයද සිහිල්කරණසේක්වයි කියා මෙසේ යාඥකළසේක, භාග්‍යවතුන්වහන්සේ දෙවනතුන්වනවටද ආනන්දය පැන්ගෙණෙව වළඳනු කැමැත්තෙමියි වදාළකල ආයුෂමත් අනඳමහතෙරුන්වහන්සේ පළමුදැන්වූලෙසටම සම්පවූ උදකස්ථානය මහගැල් යාමෙන් කැළඹි බොරවූබවත් කුකුත්ථනදිය ඉතානුදුරුය රමණීයයයි යනබවත් දන්වා නැවත නැවතත් එසේ බුදුඅන ඉක්මවාගත නොහී එසේය ස්වාමින්වහන්සැයි කියා ප්‍රතිවචනදී පාත්‍රය ගෙණ ඒ ක්ෂුද්‍රනදිය යම්තැනෙක්හිද එතැනට උන්වහන්සේ පැමිණ ඇසිල්ලෙහි යට කියනලද ක්‍රමයෙන් ඇල

ලී බොරවශීය දිය බුද්ධානුභාවයෙන් පැහැදී ප්‍රසන්නවිය, එකල්හි ආයුෂ්මත් ආනන්දමහතෙරුන්වහන්සේ ආශ්චර්‍ය්‍ය අද්භූතවූ ඒකාරණය දැක ඉතාසතුටුව අතිශයින් විශ්මයපත්ව පාත්‍රයෙන් පැන් ගෙණවුත් බුදුන්කරා පැමිණ ස්වාමීන්වහන්ස දැන් ගැල් පන්සියයක් පමණ ධාමෙන් ඇලලී මඩ මිශ්‍රවශියාවූ සලිලොදකය එහි මා පැමිණි කල්හි පැහැදී ප්‍රසන්නවිය මේ තථාගතවූ ස්වාමීන්වහන්සේගේ බුද්ධානුභාවයෙක ආශ්චර්‍ය්‍යයෙක අද්භූතයෙකැයි ස්තුතිකොට පැන් වළඳ වදාළමැනවැයි ආරාධනාකළකල්හි භාග්‍යවතුන්වහන්සේ ඒ පැන් වළඳවදාළසේක. එකල්හි ආලාරකාලාමයන්ගේ ශ්‍රාවකවූ පුක්කුසනම් මල්ලපුත්‍රද එතනට පැමිණියේය. කෙසේ පැමිණියේදයත්? මල්ලරජදරුවෝ හැමදෙනම වාර බෙදා ගෙණ රජකරන්නාහුය ඔවුනොවුන්ට වාරය පැමිණෙනතාක් කල් ගෙසස්සෝ වෙළඳාම්කරති එබැවින් පුක්කුසනම් මල්ලපුත්‍රතෙම සාත්තුවාහකයන් හා ගැල්පන්සියයක් පෙරටව යවා පසුව සවීරතනමය යානෙක හිඳ කුසිනාරානුවරින් නික්ම පාවානම් නුවරට යනුයේ අතරමගදී ඒ වෘක්ෂමූලයෙහි ශෝභාමානව වැඩවුන් භාග්‍යවතුන්වහන්සේ දැක එතනට යොස් මනාව බුදුන් වැඳ පිළිසඳරකථා කොට එකත්පස්ව හුන්නේය, එකල්හි භාග්‍යවතුන්වහන්සේ ඕහට මෙලෝපරලෝ වැඩ දක්වාලීම්වශයෙන් බණ වදාළසේක. ඒ ධර්‍මදේශනාව අසා අතිප්‍රසන්නව දන්වනුයේ ස්වාමිවූ බුදුරජානන්වහන්ස ඔබවහන්සේගේ ධර්‍මශ්‍රවණයෙන් සතුටුවූ ඒ මම මා ගුරුවූ ආලාරකාලාමයන් කෙරෙහි පැවති මාගේ යම් ප්‍රසාදයෙක් ඇද්ද ඒ පැහැදීම ඔබවහන්සේගේ ධර්‍මදේශනා නැමැති මහාවාතයෙහි පොලාහැර විනාසකෙළෙම් එසේම සීග්‍රවූ උදකශ්‍රොත ඇති දේශනානැමැති ගඞ්ගාවෙහි බහාලිම් එසේ මා වරදවා ගත් දෘෂ්ටිය හැර දැන් ශුද්ධවූබැවින් අදපටන් ජීවිතාන්තය දක්වා ඔබවහන්සේගේ සරණයතවූ උපාසකයෙකැයි කියා මා භාග්‍යවතුන්වහන්සේ දරණසේක්වයි දන්වා ඉක්බිතිව ඒ පුක්කුස නම් මල්ලපුත්‍රතෙම සිඞ්ගීස්වර්‍ණයට බඳුවූ වර්‍ණ ඇති මටසිලුටුවූ මහත් සැනකෙළිදවස්හිම ඔහුව්සින් දැරියයුතුවූ මාහැඟි වස්ත්‍රදෙකක් ගෙන්වාගෙණ ස්වාමීවූ භාග්‍යවතුන්වහන්ස මේ රන්වන්වස්ත්‍රයුගලය මට අනුකම්පා උපදවා පිළිගෙණවදාළමැනවයි ආරාධනාකළකල්හි මෙයින් එක්වස්ත්‍රයක් මට දෙව එක්වස්ත්‍රයක් ආනන්දස්ථවිරයන්ට දෙවයි වදාළසේක, ඒ අසා ඒ පුක්කුසනම් මල්ලපුත්‍රතෙම එසේය ස්වාමීන්වහන්සැයි ප්‍රතිවචනදී එක්වස්ත්‍රයකින් බුදුන් පුදා එක්වස්ත්‍රයකින් ආනන්දස්ථවිරයන් පුදා ඉක්බිත්තෙන් ඒ මල්ලපුත්‍රතෙම බුදුන් වැඳ ප්‍රදක්ෂිණකොට අවසර ගෙණ ගියේය.

බුදුරජාණන්වහන්සේ එසේ කුමක් පිණිස වදාළසේක්දයත්? අනඳමහතෙරුන්වහන්සේ මෙබඳුවූ ලාභ ප්‍රතික්ෂේපකොට පැමිණි උන්වහන්සේගේම උපස්ථායකකෘත්‍යය මේදවසට මස්තකප්‍රාප්ත බැවින් පස්විසි වර්ෂයක් බුදුන්ට උපස්ථානකරන්නාවූ ආනන්දස්ථවිරතෙම බුදුන් සමීපයෙන් කිසි වක් නොලැබූසේකැයි යන අනුන්ගේ වචනාවකාශ සිඳිම හා ආනන්දස්ථවිරතෙම ඒ වස්ත්‍රය ගෙණ මටම පූදන්නේය ඔවුන් පිදූකල මල්ලපුත්‍රයා විසින් සංඝයාවහන්සේද පිදූවානම් වෙයි යන කාරණය පිණිස බුදුරජ එසේ වදාළසේක. ඒ බව දැන අනඳමහතෙරුන්වහන්සේද ඒ වස්ත්‍ර ලැබ බුදුන්ටම පිදූසේක.

බුදුරජ ඉන් එක්රත්වන්වස්ත්‍රයක් හැඳ එක්වස්ත්‍රයකින් රත්වන් බුදුබඳ් වසා පෙරවගත්කල්හි බලන්නාවුන්ට පහවූ ගිනිසිල ඇතිව දිලිසෙන ගිනිඅඟුරුරැසක්මෙන් ඉතාප්‍රසන්නව වැටහෙන්ට වන, ඒ දැක අනඳමහතෙරුන්වහන්සේ අතිශයින් විස්මයපත්වූ සිත් ඇතිව මාගේ ස්වාමිවූ බුදුරජාණන්වහන්සේ ස්වර්ණයෙහි ස්වර්ණයසේ බුඩශරීරය ඉතා දීප්තිමත්ව දැන් බබලන්නේය මෙ මහත් ආශ්චර්‍ය්‍යඅද්භූතයෙකැයි දැන්වූකල්හි බුදුරජ ඒ එසේය ආනන්දය යම් රාත්‍රියෙක්හි තථාගතයන්වහන්සේ නිරුත්තරවූ සම්‍යක්සම්බෝධියට පැමිණිසේක්ද ආනන්දය තථාගතයන්වහන්සේයම්රාත්‍රියෙක්හි අනුපදිශෙෂ නිර්වාණධාතුයෙන් පිරිනිවන්පෑවදූරණසේක්ද මේ දෙදවස්හි තථාගතශරීරය අතිශයින් පිරිසිදුවූ ඡවිවර්ණයෙන් දීප්තිමත්ව බබලන්නේය. ඒ කුමක්හෙයින්දයත්? ඒ දෙදවස්හි භාග්‍යවතුන්වහන්සේවිසින් වැළඳියයුතු ආහරයෙහි මේ සක්වළමුළුල්ලෙහි සියලු දෙවතාවෝ දිව්‍යඕජස් බහාලන්නාහුය එසේ දිව්‍යඕජස් එක්වීමෙන් ප්‍රණීතවූ ඒ මධුරභොජනය කුක්ෂිගතව ආහරරස සේවනයෙන් නැඟී රූපයාගේ ප්‍රසන්නබැවින් මනස සවැනිකොට ඇති චක්ෂූරාදී සඩෙන්ද්‍රියයෝ ඉතාදීප්තිමත්ව බැබලෙන්නාහුය. බුදුවනදැ අනේක කෝටිසතසහස්‍රජාතිවල වඩා පවත්වා ආ කෙලෙස රාසීන් අදම මාවිසින් ප්‍රහීනකෙළෙම් කියා බුදුන්ට බලවත් ප්‍රීතිසෞමනස් ඉපදීමෙන් සිත ප්‍රසන්නවෙයි එසේ සිත ප්‍රසන්නවූකල්හිදු සියලු බුඩශරීරයෙහි ලේ ප්‍රසන්නවෙයි ලේ ප්‍රසන්නවූකල්හි මනස සවැනිවූ චක්ෂුරාදී ඉන්ද්‍රියයෝ සදෙන අතිශයින් බැබලෙන්නාහුය, පිරිනිවන්පානාදැ දැන් අද මම නොයෙක් දහස්ගණන් බුදුවරයන් විසින් ප්‍රවිෂ්ටවූ අමාමහනිවන් පුරයට ප්‍රවිෂ්ටවෙමි කියා ආවර්ජනාකරණ බුදුරජානන් වහන්සේට බලවත් සතුටුසන්තොෂ ඉපදීමෙන් චිත්තය ප්‍රසන්න වන්නේය එසේ සිත ප්‍රසන්නවීමෙන්

ලේ ප්‍රසන්නාව ඡවි ප්‍රසන්නාව මනස සවැනිවූ ඉන්ද්‍රියයෝ අතශයින්
දීප්ති මත්ව බැබලෙන්නාහුය.

මෙසේ ආනන්දය ඒ දෙදවස්හි වැලඳූ ආහාරවිශෙෂයෙන්ද ඉතාබ
ලවත් සතුටුසතොතාෂයෙන්ද යන මේ දෙකාරණයෙන් බුද්ධශරීරය
විශෙෂයෙන් බැබලීම සියලු බුදුවරයන්ගේම ධර්මතාවෙක එහෙ
හින් ආනන්දය අදරාත්‍රියෙහිවූ පශ්චිමයාමයෙහි කුසිනාරානුවර
මල්ලරජදරුවන්ගේ උපවත්තන නම් සල්වනයෙහි සල්රුකදෙ
දෙනා අතුරෙහි තථාගතපරිනිර්වාණය වනබැවින් මාගේ ශරීරය
මෙසේ දිලියෙන්නේවෙයි වදාළසේක. එසේ හෙයින් සංගායනලදී
ධම්සඞ්ගායනාකාලයෙහි:—

සිඞ්ගිවණ්ණං යුගං මට්ටං දූකකුසො අභිහාරය
තෙන අච්ඡාදිතො සත්ථා හෙමවණ්ණො සසොභතා-ති.

නැවත භාග්‍යවතුන්වහන්සේ ආයුෂ්මත් අනඳමහතෙරුන්වහන්
සේට අඩයාවදූරා ආනන්දය කුකුත්ථනදිය යම්තැනෙක්හිද එත
නට යම්හයි වදූරා මහාභික්ෂූසඞ්ඝයාවහන්සේත් පිරිවරා කුකුත්ථ
නදියකරා වැඩ ජලසාටිකාව ගැඳ ගඟට බැසවදූරම්න් පැන්
සනහාවදූළසේක. එසේ භාග්‍යවතුන්වහන්සේ පැන්සනහන
කල්හි ඇතුළුනදීයෙහි මත්ස්‍යකත්ස්‍යපයෝද දෙගොඩ වැලිත
ලාභූමිභාගයෝද වනලැහැප්ද ආකාශයද යන ඒ සියල්ලම බුද
ශරීරයසේ ස්වර්ණවර්ණවිය, බුදුහු ජලස්නානයකොට පැන් වළඳා
හගින් ගොඩට වැඩ මනාව ගැඳපෙරව එම ගඞ්ගාතීරයෙහිවූ
අඹවනයට පැමිණිසේක, එකෙණෙහි අනඳමහතෙරුන්වහන්සේ
බුදුන්ගේ ජලසාටිකාව උදකපීලනයකරම්න් මඳක් පමාවූසේක,
භාග්‍යවතුන්වහන්සේ ඒ අඹඋයන්හි ආනන්දස්ථවිරයන් නොදුක
සම්පයෙහි සිටි චුන්දස්ථවිරයන්ට අඩයාවදූරා චුන්දය මම කලා
න්තයෙම් සැතපෙනුකැමැත්තෙමි තෙපි සඟලසිවුර සතරපටින් ප
නවයි වදූළසේක,එවිට චුන්දතෙරුන්වහන්සේ එසේය වහන්සැයි
ප්‍රතිවචනදී සඟලසිවුර එසේ පැනවූසේක, භාග්‍යවතුන්වහන්සේ
එහි දක්ෂිණපාර්ශ්වයෙන් සිහිනුවණින් යෙදී උට්ඨානසංඥ සිත්හි
කිරීමෙන් සිංහසෙය්‍යකළසේක, ආයුෂ්මත් චුන්දතෙරුන්වහන්
සේ වනාහි එහිම අභිමුඛයෙහි හුන්සේක සියලු භික්ෂුසඞ්ඝයාව
හන්සේද බුදුන් පිරිවරා වැඩහුන්සේක, එකල්හි අනඳමහතෙ
රුන්වහන්සේද බුදුන්කරා පැමිණ වැඳ ශ්‍රීපාදය සමීපයෙහි හුන්
සේක, එකල්හි භාග්‍යවතුන්වහන්සේ වදූරණසේක් චුන්දනම් ක
ර්මාරපුත්‍රයාහට ඔහුගේ පශ්චිමපිණ්ඩපාතය වළඳා තථාගතයන්
වහන්සේ පිරිනිවියේකැයි කියා කිසි විපිලිසරයෙක් ශඞ්කාවෙක්

ඉපදුනේවී නම් ඕහට දනානිශංස සෙස්සන්ටසේ නොවීමෙන් පුණ්‍යවිශෙෂයෙක් ලදනමුදු මනුෂ්‍යාත්මය දුලීබඩව එසේම වෑරදයාමෙන් අප්‍රාහප්ණීස යාමෙක් වෙයි එහෙයින් ආනන්දය නොපව්සිත් චුන්දනම් ඒ කර්මාරපුත්‍රයාගේ විප්ලිසරය මෙසේ දුරුකට යුත්තේය. ඒ කෙසේදයත්?

ඇවැත්වූ චුන්දය තාවිසින් දෙනලද පශ්චිමපිණ්ඩපාතය වළඳ තථාගතයන්වහන්සේ පරිනිර්වෙක්ද තාවිසින් ඒ පිණ්ඩපාතදනානිශංසසඞ්ඛ්‍යාත දෘෂ්ටධර්මසම්පරායික කුශලලාභය ලබනලද ඒ තාවිසින් පුණ්‍යවිශෙෂයෙක් ලද මේ මනුෂ්‍යාත්මයද මනාව ලද්දනම්වෙයි ඇවැත්වූ චුන්දය තාවිසින් මේ කාරණය භාග්‍යවතුන්වහන්සේගේ සම්මුඛයෙන් අසනලද්දේය සම්මුඛයෙන්ම අසා පිළිගන්නාලද්දේය, තථාගතයන්වහන්සේ යම් පිණ්ඩපාතයක් වළඳ නිරුත්තරවූ සම්‍යක්සම්බොධියට පැමිණෙනසේක්ද යම් පිණ්ඩපාතයක් වළඳ තථාගතතෙම අනුපදිසෙසනිර්වාණධාතුවෙන් පිරිනිවන්පෑනාසේක්ද මේ පිණ්ඩපාත දෙකම සමවූ ඵලවිපාක ඇත්තාහ සෙසුපිණ්ඩපාතදනයට වඩා මහත්ඵල මහානිශංසතර වන්නාහුය එසේ හෙයින් චුන්දනම් කර්මාරපුත්‍රය තාවිසින් ආයුසංවත්තනිකවූ-පෙ-ආධිපත්‍යය පිණිස පවත්නාවූ නිර්වාණය පිණිස පවත්නාවූ උතුම් කුශලය රැස්කරණලද්දේයයි කියා ආනන්දය ඒ පශ්චිමපිණ්ඩපාතය දුන් චුන්දනම් කර්මාරපුත්‍රයාගේ විපිලිසරය තොප විසින් මෙසේ දුරුකටයුත්තේය.

සුජාතාවවිසින් දෙනලද පිණ්ඩපාතදනය තථාගතයන්වහන්සේ සරාගසදොසසමොහකාලයෙහි වළඳ බුදුවූසේක්නොවේද චුන්දනම් කර්මාරපුත්‍රයාවිසින්දෙනලද පිණ්ඩපාතදනය වීතරාගවීතදොසවීතමොහකාලයෙහි වළඳනලද්දේය එසේ ඇතිකල කවරකාරණයකින් මේ පිණ්ඩපාතදන දෙක සමසමවූ ඵලවිපාක ඇතිවෙද්දයත්? පිරිනිවන්පෑම සමබැවින්ද සමාපත්තිසමවැදීම සමබැවින්ද අනුසස් සිහිකිරීම සමබැවින්ද සමවන්නාහුයි. කෙසේදයත්? භාග්‍යවතුන්වහන්සේ සුජාතාවවිසින් දෙනලද පිණ්ඩපාතය වළඳ උපාදි ශෙෂ නිර්වාණධාතුවෙන් පිරිනිවිසේක, චුන්දනම් කර්මාරපුත්‍රයාවිසින් දෙනලද පිණ්ඩපාතයවළඳ අනුපදිශෙෂ නිර්වාණධාතුවෙන් පිරිනිවිසේක, බුදුවනදවස්හිද සූව්සිකෙළලක්ෂයක් සමාපත්ති සමවැදුනුසේක, පිරිනිවන්පානාදවස්හිදු ඒ සියලු සමාපත්ති එසේම සමවැදුනුසේක, සුජාතාවවිසින් මෑතභාගයෙහි ඇගේ බත නුගරුකමුලදී එදවස්හී වැලඳුයේ රුක්දෙවියෙක් නොවෙයි අපමහබෝසත්තෙම ඒ කිරිබත වලඳ නිරුත්තරවූ සම්‍යක්

සම්බෝධියට පැමිණියේකැයි යනු ඇසුවාය ඒ ඇසූ සතුටින්ම මේ මට වූයේ ඒකාන්තයෙන් මහත්ලාභයයි සළකා සත්දවසක් නිරාහාරව බලවත් ප්‍රීතිසෞම්නස් උපදවාගෙණ වාසයකළාය, චුන්දනම් කර්මාරපුත්‍රයාහටද බලවත් ප්‍රීතිසෞම්නස් පහළවූයේය, මෙසේම පිරිනිවන්පෑම සමබැවිනුදු සමාපත්තීන්ගේ සමවැදීම සමබැවිනුදු ඒ පිණ්ඩපාත දෙක සමසම්වූ ඵලවිපාක ආනිසංස ඇතිවන්නාහුයි.

ඉක්බිත්තෙන් භාග්‍යවතුන්වහන්සේ ආනන්දස්ථවිරයන් කැඳවා ආනන්දය හිරණ්‍යවතී නම් ගංගාවගේ පාරම්තීරය යම්තැනෙක්හිද කුසිනාරානුවර් මල්ලරජදරුවන්ගේ උපවත්තනම් සල්වනය යම්තැනෙක්හිද එතනට යම්හයි වදුරා අඹවෙනෙහිවූ සිංහසෙය්‍යාවෙන් නැගී බුදුරජනන්වහන්සේ පළමුවෙන් බේළුවගම්හි වස් වසා වසන්කල බුද්ධශරීරයෙහි උපන් ආබාධදුඃඛවෙදනාව සමාධිබලයෙන් මැඩපැවැත්වූතැන් පටන් ඒ බුදුරජ නොබෝකලකින් පිරිනිවන්පානාසේකැයි යනු අසා එතැන්පටන් දශමාසයක් මුලුල්ලෙහි බුදුන් දන්නට දසදිගින් රැස්වූ භික්ෂූන් අතුරෙන් එයින් බැහැරව නික්මගිය එකද භික්ෂුනමකුත් නැත එහෙයින් එසේ ගණන් නැති මහාභික්ෂුසඞ්ඝයාවහන්සේත් පිරිවරා පාවානුවරපටන් තුන්ගව්මග ගෙවා කුසිනාරානුවරට පැමිණෙන අතරෙහි ලොකධර්මතාබැවින් බුදුබල පවා දුර්වලව පස්විසිතෙනක වැඩහිඳ මහත් උත්සාහයෙන් ශ්‍රීපාදයෙන්ම වඩනාසේක් හිරණ්‍යවතීනම් ගඟින් එගොඩ කුසිනාරානුවර මල්ලරජදරුවන්ගේ උපවත්තනම් සල්වනයට සන්ධ්‍යාකාලයෙහිවූ හිර ගලාවැටෙනවේලාවෙහි ප්‍රවිෂ්ටවූසේක.

එහි බුදුබල නම් කවරහයත්? සියලු ලෝකයාහා අසාධාරණවූ ඥානබල දශයක්හා කායබල දශයක් ඇතිසේක. මෙසේ දශබලධාරීවූ බුදුරජනන්වහන්සේගේ එසා මහත් කායබලයත් පවා චුන්දනම් කර්මාරපුත්‍රයාගේ පිණ්ඩපාතය වැළඳූතැන්පටන් පඩහගතපක්කිතෙතාදකයමෙන් පරික්ෂයවගියේය.

මෙසේ රෝගයතෙම සියලුම නිරෝගීබව මැඩපවත්වාගෙණ පැමිණිත්තේය එහෙයින් සියලු ලෝකයාහට සංවේගකරවූ ඒ කාරණය ප්‍රකාශකොට දක්වන්නාවූ අපභාග්‍යවතුන්වහන්සේ ආයුෂ්මත් ආනන්දස්ථවිරයන් කැඳවා ආනන්දය ශාලවෘක්ෂයන්දෙදෙනා අතුරෙහි උත්තරශීර්ෂකව මඤ්චකය පන්වව මම ක්ලාන්තයෙම් සැතපෙනු කැමැත්තෙමි වදාළසේක, එකල්හි අනඳමහතෙරුන්වහන්සේ එසේය ස්වාමීන්වහන්සැයි කියා ප්‍රතිවචන දී ඒ උයන්හි

රාජකුලයාගේ සයනමඤ්චකය ගෙණ එසේම පැනවූසේක, භා
ග්‍යවතුන්වහන්සේ යුගමශාලයන් අතුරෙහි උත්තරශීර්ෂකව පැන
වූ ඒ සයනමඤ්චකයෙහි නැවත නැගිනොසිටිනා සඤ්ඥාව සිත්හි
කිරීමෙන් දක්ෂිණශ්‍රීපාදය මස්තකයෙහි වාමශ්‍රීපාදය මදක් ඉක්ම
පසුනොකොට තබා ගොප්ඵසින් ගොප්මස ජානුවෙන් ජානුව
සංඝට්ටනයවනසේ තැබූකල්හි එක්වත්ව නිරන්තරයෙන් වේද
නා උපදනේය එයින් සිත එකාග්‍රනොවන්නේය එහෙයින් යම් සැ
තපීමක් එසේ ගැටීමක් අඵාසුවෙක් නොවේද එපරිද්දෙන් මතුවූ
ශ්‍රීපාදය ඉතාමදක් පසුව තිබෙනසේ තුබූකල්හි ඒ වේදනා නූපදී
ද සිත එකාග්‍රවේද සැතපීම ඵාසුවේද එසේවූ සිංහසෙය්‍යානම් ලද
තථාගතසෙය්‍යාවෙන් සැතපුනුසේක.

එකල්හි යුග්මශාලවෘක්ෂයන්ගේ මූලඵටන් අගදක්වා හාත්ප
සින් සුපුෂ්පිතවූ මලින් සැරසීසිටගත්හ, එපමණක් නොවෙයි ඒ උ
යන්හිවූ සියලු වෘක්ෂයෝම එසේ මනාකොට පිපිමලින් සැරහීසිට
ගත්හ, එපමණකුත් නොවෙයි දසදහසක්සක්වළ මුලුල්ලෙහි සි
යලු පුෂ්පඵලවෘක්ෂයෝ මනාකොට පිපිමලින් සැරසී සිටගත්හ ඵ
ලූපගවෘක්ෂයෝ ඵලගෙණ සිටියාහුය සියලු වෘක්ෂයන්ගේ කඳන්ව
ල කඳපියුම් පිපුනාහුය අතුවල ශාඛාපියුම් පිපුනාහුය වැල්වල ලි
යපියුම් පිපුනාහුය අහස්හි ආකාශපියුම් පිපී එල්බසිටියාහුය පො
ළෝතලය බිඳගෙණ දණ්ඩකසත්බුමුපියුම් පිපුනාහුය සියලු ම
හාසමුද්‍රය පඤ්චවර්ණපියුමෙන් වැසීගියේය, තුන්දහසක්යොදුන්හි
මාලපර්වතය ඝනබද්ධමොරපිඤ්ඡාරකලාපයක්සේ අතුරු නැතිව මල්
දම් ගවච්ජිකයක්මෙන් මනාපිළන්ඳයන් ආබද්ධමල්වටංසකයක්
සුපූරිත මල්කරඬුවක්මෙන් අතිශයින් රමනියවිය, දෙව්ලොව දෙ
ව්යෝද නන්දවනොද්‍යානයෙහි දිව්‍යමන්දාරාමල්ද සෙසු නානාදිව්‍යකුසු
මාදින්ද රත්කරඬු පුරාගෙණ චක්‍රවාටයෙහිද ත්‍රිදශපුරයෙහිද බ්‍ර
හ්මලොකයෙහිද සිට අනෙකප්‍රකාරවූ සුවඳමල් හා දිව්‍යමය සඳුන්
කළුවැල් තගර රත්සඳුන් ආදී නොයෙක් සුවඳසුණු රත්වන්කි
ඤ්ජල්කරේණුන් තථාගතශරීරයෙහිම වගුරුවාලීමෙන් බුද්ධපූජා
කළහ, එකෙණෙහි දසදහසක්සක්වළ දිව්‍යමයවූ සියතූර්‍යයෝ
මේ සක්විළෙහි රැස්ව අහස්හි නාදපවත්වන්ට පටන්ගත්හ, එ
සේම දිව්‍යමය සඞ්ගීති සක්වළගැබ පුරා ඉතිරයනසේ එකපැහැර
ගායනාකරන්ට පටන්ගත්හ, දීඝායුෂ්කවූ වරවාරණනම් එක්දිව්‍ය
පුත්‍රයෙක් පළමුයෙන්ම අපමහබෝසතානන්වහන්සේ මනුෂ්‍යපථ
යෙහි ඉපද බුදුවනසේකැයි යනු අසා ඊට සතුටුව ඒ බුදුමඟුලට
එක්වනු පිණිස පළමු මව්කුස පිළිසිඳගන්නාදා ගෙණ ගොස් පුද
මි සිතා මල්දමක් ගොතන්ට පටන්ගත්තේය, ඔහු සිත්සේ මල්

ගොතා නොනිම්හෙයින් ඒ පළමුවන බුදුමගුලට එක්වගත නොහී
ප්‍රමාදව එසේවීනම් දශමාසාර්ධමාසයක් වැස මව්කුසින් නික්
මෙනාදවස්හි ගෙණ ගොස් පුදම්යි කියාද මල්ගෙනීමෙන්ම ප්‍රමාද
බැවින් එකුන්තිස්හවුරුද්දක් ගිහිගෙයි වැස මහබිනික්මන් නික්
මෙන දවස්හි ගෙණගොස් පුදම් කියාද සාවුරුද්දක් ප්‍රධන්වීයා
කොට බුදුවනාදවස්හි ගෙණ ගොස් පුදම් කියාද ධම්මචක්‍රය දෙස
නාදවස්හි ගෙණ ගොස් පුදම් කියා දයමකප්‍රාතිහාර්‍ය්‍යපානාදවස්හි
ගෙණ ගොස් පුදම් කියාද බුදුවූ සත්වන හවුරුදු සැවැත්නුවර
ගණ්ඩබබරුක්මුලදී තිත්‍ථකදමනය පිණිස යමකප්‍රාතිහාර්‍ය්‍යපානා
දවස්හි ගෙණ ගොස් පුදම් කියාද දෙව්ලොව තුන්මසක් වස්වැස
දෙවෝරෝහනයෙන් බස්නාදවස්හි ගෙණ ගොස් පුදම් කියාද ආ
යුසංස්කාරය හරණදවස්හි ගෙණ ගොස් පුදම්කියාද පිරිනිවන්
පානාදවස්හි ගෙණ ගොස් පුදම්කියාද මෙසේ මහබෝසතානන්
වහන්සේගේ මව්කුස පිළිසිඳගැන්මෙහි පටන් අනුපාදිශෙෂනිර්වා
ණධාතුයෙන් පිරිනිවන්පෑම දක්වා පැවති මේ සියලුම බුදුමගුල්
අතුරෙන් එකිනෙක බුදුමගුලක් නිම්යේයයි යනු අසා ඊට දෙවැ
නි නොවැනිවූ බුදුමගුලට මෙයටත් වඩා මල් ගොතාගෙණ නැවත
යෙම්යි කියා මල් ගෙනීමෙන් ප්‍රමාදව අසූහවුරුද්දක් අතික්‍රාන්තව
පිරිනිවන්පානාදවස්හිද මල් ගොතන්නාවූ ඒ දිව්‍යපුත්‍රයා දැක සෙ
සු දෙවතාවෝ මෙසේ කිව්ල තොපි කවරක්හට පුදනා පිණිස මේ
මල්දම ගොතන්නෙහිද මේ අදදවස්හි බුදුරජානන්වහන්සේ අසූ
හවුරුද්දක් ආයුයිරිවලඳ කුසිනාරානුවර යමකශාලයන් අතුරෙහි
සයනමඤ්චකයෙහි දකුණැලයෙන් සිහිනුවණින් යෙදී නැවත නැ
ගී නොසිටිනා සිංහසෙය්‍යාවට දුන් පැමිණිසේක අද බලවපච්චූෂ
යෙහි පිරිනිවන්පානාසේකැයි කීවාහුය,ඒ අසා නැවත එම වරවාර
ණ දෙව්පුත් කියනුයේ අහෝ මේ කිමෙක්ද මහබෝසතානෝ අද
දවසම මවුකුස පිළිසිඳගෙණ අදදවසම මව්කුසින් නික්ම අදදව
සම මහබිනික්මන් නික්ම අදදවසම බුදුව අදදවසම ධම්වක්‍රය ප
වත්වා අදදවසම යමකප්‍රාතිහාර්‍ය්‍ය දක්වා අදදවසම දෙව්ලොවින්
බැස අදදවසම ආයුසංස්කාරය හැරඅදදවසම පිරිනිවන්පානාසේක්
ලූ දෙවෙනිදවස්හි කැදක් වලඳනා පමණ කල්වත් සිටියනුනු
සේක් නොවේද දශපාරමිධර්‍මයන් පුරා බුදුබවට පැමිණි ඒ උතුමා
නන්වහන්සේට මෙසේ වීම සුදුසුදැයි කියා මහත්විත්තවික්ෂේපයට
පැමිනා එසේවීනමුත් මිනිස්ලොව ගණනායෙන් අසූහවුරුද්දකට
වැඩිකලක් ගොතාගෙණවත් මා සිත්සේ නිමවාගත නුහුනු අඩාල
වූ මේ මල්දම කුඩාවීනමුදු කුශලය එයටත් වැඩිමහතැයි දැන මෙ
පම ණ මල්දම්ත්වත් බුදුන් දිව් ඇතිකලම පුදම් සිතා වහා ගෙණ

චූත් මේසා සක්වළතුළ අවකාශ නැතිහෙයින් චක්‍රවාටමුදුනෙහි සි
ට අහස්කුස වැසියන තරම් එසා මල්දම්න් බුදුන්ට පූජාකොළේය,
සෙසු දිව්‍යසමූහයෝද අනෙකප්‍රකාර දිව්‍යමයවූ අප්‍රමාණ පූජා ප
වත්වා චක්‍රවාටක්ෂුද්‍රවාටයදක්වා හැසිර පිරී ඔවුනොවුන් හස්ත
යෙන් හස්තය ග්‍රීවයෙන් ග්‍රීවය වැලඳගෙණ මහත් ශොකාතුරභව
ඝයෙන් සිට තුනුරුවන් ගුණ අරභයා දෙතිස්මහපුරිස්ලකුණු සව
ණක්රැස් දශපාරමිතාවන් පන්සියපණස්ජාතකයන් චූද්දසබු
ද්ධඥානයන් ඇතුළුවූ නොයෙක් බුදුගුණ කිය කියා ගායනාකිරී
මෙන් අවසන්හි හෙ සහාය හෙ සහායයි කිය කියා හාත්පස්හි අප්‍ර
මාණවූ පූජාකෝලාහල පවත්වන්ට පටන්ගත්හ.

මෙසේ දිව්‍යබ්‍රහ්මාදීන්විසින් ඒ දිව්‍යසඞ්ගීති පැවැත්වීම් ආදි වශ
යෙන් අහස්කුස වසා බුදුන් උදෙසා මහත්පූජොත්සව පවත්වමින්
සිටිකල්හි යමකශාලයන් අතුරෙහි දක්ෂිණපාර්ශ්වයෙන් වැදහොත්
අපභාග්‍යවතුන්වහන්සේ පෘථිවිතලයපටන් චක්‍රවාටය අවසන්ව
බඹලොව දක්වා අතුරු නොදී වතුරුමෙන් රැස්වූ එසා මහපිරිසව්
සින් අප්‍රමාණව පූජෝත්සව පැවැත්වීමෙන් කරණ මහත් උත්සාහ
ය දැකවදාරා ආනන්දස්ථවිරයන් කැඳවා ආනන්දය මේ පොළෝතලය
පටන් චක්‍රවාටපර්‍යන්තව අකනිට්ඨබඹලොව දක්වා සියලු ආකාශ
කුහරය වසා පුරා දුන් මේ රැස්වසිටි දිව්‍යබ්‍රහ්මාදීන් විසින් දිවමල්
දිවසුවඳ දිව්‍යතූර්‍ය්‍යසඞ්ගායනාදී අප්‍රමාණවූ මේ පූජෝත්සව දුන් මේ
බුද්ධපූජා පිණිස පවත්වන්නාහුය ආනන්දය මේපමණකින් භගවත්
මෙසෙවූ ආමිසපූජා පැවැත්වූ පමණකින්ම තථාගතවූ බුදුන් පිදුයේ
නොවෙයි එසේ ආමිසපූජාවෙන් මා පිදූ පමණකින්ම මට ගරුකාර
කොළේ නොවෙයි බහුමානකොළේ නොවෙයි පූජාකොළේ නො
වෙයි ආනන්දය දීපඞ්කරපාදමූලයෙහි වැදහෙව අෂ්ටධර්මසමොධාන
යෙන් යෙදි අභිනීහාරය කරන්නාවූ මාවිසින් මල්සුවඳ තූර්‍ය්‍යසඞ්ගී
ති ආදී යම්කිසි මේ ආමිසපූජාවක් ලබන පිණිස පාරමිතාවන් එකා
න්තයෙන් පූරණලද්දෙම් නොවෙමි එහෙයින් ආනන්දය මෙසේ ආමි
ස පූජාවෙන් මා පිදූ පමණකින්ම බුදුන් පිදුයේ නොවෙයි යම්කිසි
භික්ෂුභික්ෂුණී උපාසකඋපාසිකාකෙනෙක් ධර්මානුධර්මප්‍රතිපත්තියෙ
හි යෙදී වාසයකෙරෙද්ද ධර්මානුගතපිළිවෙත්හි යෙදී වාසයකි
රීමෙන් එසේ පුදනතැනැත්තහුම උතුම්පූජාවෙන් මා පුදනලදුයේ
නම් වෙයි ඒ කාරණයෙන් ආනන්දය තොපවිසින් ධර්මානුධර්මප්‍රතිපද
නාවී ලද නවලොකොත්තරධර්මයාගේ අනුධර්මවූ පූර්වභාගප්‍රතිපද
වය යන උතුම් ශීලාචාරසම්පන්නා ගුනාඞ්ගසමාදානාදියෙන් යෙදී
මෙන් භික්මියයුතුයයි වදාළසේක.

කවරකාරණයකින් බුදුරජානන්වහන්සේ සෙසුතන්හි එකම දිය

මෛත්‍රීයමාත්‍රකින් පමණවත් කරණලද බුඬපූජායෙහි විපාකය
මෙතෙකැයි කියා බුදුහුවණීහුදු බලා නිමවා වර්ණනාකොට ගත
නොහැකියයි වදාරා මෙහි මෙසේ මෙසා මහත්පූජාව ප්‍රතික්‍ෂේපක
ළසේක් දැයි කිවහොත් තමන්වහන්සේගේ සිව්වණක් පිරිස්හි පැ
වති අනුකම්පාවෙන්ද ශාසනයාගේ චිරාත්කාලයක් සිටීම කැමති
බැවින්ද අනාගමසෙයනවට පැමිණ මෙසේ වදාළසේකැයි කියා කා
රණ දක්වා ධර්මසඞ්ගායකාචාර්යයන් විසින් එහි අර්ථවර්ණනාකරණ
ලදී. ඒ කෙසේදයත්? ඉදින් භාග්‍යවතුන්වහන්සේ මෙසේ පිරිනි
වන්පානාතැනාදී ආමිසපූජාව වලකා ප්‍රතිපත්තිපූජාවම උතුම්කොට
නොවදාළසේක්වීනම් අනාගතයෙහි සත්‍වයෝ සිල් පුරණතැනාදී
ශීලපූරණයෙහි නොයෙදෙන්නාහුය සමාධි පුරණතැන සිත එකඟ
කොට ගෙණ සමාධිපූරණයෙහි නොයෙදෙන්නාහුය විදර්ශනා පූ
රණතැන පඤ්චස්කන්ධාදීන්ගේ උදයව්‍යය දර්ශනවූ විදර්ශනා ගැබ්
ගැන්වීමෙහි නොයෙදෙන්නාහුය උපස්ථායකඋපාසක උපාසිකා
වත් සමාදන්කරවාගෙණ ආමිසපූජා කිරීමෙහිම යෙදී සැරසී වාසය
කරන්නාහුය, මේ ආමිසපූජාව වනාහි එක්දවසක් පමණවත් එක
මකැදක් වල්දනකාලයක් පමණවත් මේ බුඬශාසනය දරාසිටු
වන්ට නොහැකිවන්නීය එහෙයින් මහාවිහාරය සදෘශවූ විහාර
දහසක්ද මහාචෛත්‍ය සදෘශවූ චෛත්‍ය දහසක්ද කිරීමෙන්වත්
ශාසනය පවත්වන්ට නොපිළිවන ඒ සියලු පින්කම් යමෙකු විසින්
කරණලදද ඒ ඕහටම වෙයි ඒ ආමිසපූජාව පිණිස ප්‍රාර්ථනාකොට
බුදුරජද බුදුවූසේක් නොවෙයි එහෙයින් මනාප්‍රතිපත්තිපූජාවම
තථාගතයින්වහන්සේට සුදුසුය වර්ණනීයය ඒ ප්‍රතිපත්තිපූජාවම ඒ
බුදුන් විසිනුදු ප්‍රාර්ථනාකරණලද්දීය එහෙයින් බුඬශාසනයාගේ
ස්ථිතියට ඕතොමෝ සමර්ථවන්නීය ඒ කාරණයෙන් යම් භික්‍ෂුකෙ
ණෙක් තමාවිසින් ගරුකටයුතුවූ බුඬ ධර්ම සඞ්ඝ ශික්‍ෂා ප්‍රතිසන්ථාර
අප්‍රමාද යන මේ සතැන්හි ගෞරව නැතිව බුදුන් පනවාවදාළ ශි
ක්‍ෂාපද ඉක්මවාද එක්විසිඅනේෂසනයෙන් ජීවිකාව කෙරේද හෙ
තෙම ධර්මානුධර්මප්‍රතිපත්තිපූජාවෙන් බුදුන් පුදන්නේ නොවෙයි,
යම් භික්‍ෂුකෙණෙක් තමාට වැඩ පිණිස පනවාවදාළ සියලුම ශි
ක්‍ෂාපද නැමති ජීතවෙලාන්තය ජීතසීමාවය ජීතකාලසූත්‍රය ඉතා
ස්වල්පමාත්‍රයක්වත් නොඉක්මවාද අනුශාසනාප්‍රඥප්තිවූ පරිද්දෙන්
ශික්‍ෂාපද රක්‍ෂාකෙරේද මෙතෙම යහපත්වූ ධර්මානුධර්මප්‍රතිපත්ති
පූජා වශයෙන් බුදුන් පුදන්නේම වෙයි, භික්‍ෂුණී සාමණේර සාම
ණේරී යන හැම පැවිදිතැන් විසිනුදු ප්‍රතිපත්තිපූජාවෙන් පිදීම මෙ
සේමැයි, යම් උපාසක කෙණෙක් පස්පව් කිරීමෙන්ද දශඅකුශල
කර්මපථසමාදානයෙන් යෙදී පව් කරන්නේවීනම් හෙතෙම ධර්මානු

ධර්මප්‍රතිපත්තිපූජාවෙන් බුදුන් පුදන්නේ නොවෙයි, යම් උපාසක කෙනෙක් සරණාගමනවීමෙන් තුන්සරණයෙහි පඤ්චසීලයෙහි දශශීලයෙහි පරිපූර්ණකාරීව සිල් රක්‍ෂාකෙරේද මාසයකට අටව රක් බැගින් පෙහෙවස් සමාදන්ව වාසයකෙරේද ශක්ති පමණින් දන් දෙන්නේද සුවඳපූජා මල්පූජා කෙරේද මව්පියන්ට උපස්ථාන කෙරේද ධාර්මික මහණබමුණන්ට උපස්ථානකෙරේද මෙතෙම තමන්ට නියමවූ ධර්මානුධර්මප්‍රතිපත්තිපූජාවෙන් මනාකොට බුදුන් පුදන්නේවෙයි, උපාසිකාවන් විසින් ධර්මානුධර්මප්‍රතිපත්තිපූජාවෙන් පිදීමද මෙපමණයි, ආනන්දය මෙසේ උතුම්වූ ප්‍රතිපත්තිපූජාවෙන් යම් කිසි භික්ෂුභික්ෂුණී උපාසකඋපාසිකාකෙනෙක් මා පුදන්නේ වීනම් හෙතෙම මාගේ ශාසන නැමැති අහසමුදුනේ පුන්සඳමඬල සේ බබලන්නේයයි මෙසේ ප්‍රශංසාකොට දක්වාවදාළසේක.

එසමයෙහි ආයුෂ්මත් උපවානස්ථවිරයන්වහන්සේ එසේ යමහල් දෙර සැතපුනු භාග්‍යවතුන්වහන්සේගේ අභිමුඛයෙහි සිට බුදුන්ට පවන් සලමින් සිටිසේක,එවිට බුදුහු දෙවතාවන්ගේ අභිප්‍රාව දැන මෙහින් තොප පහවෙවයි වදාළසේක,එකෙණෙහි උන්වහන්සේද තල්වැට අතින් තබා එකත්පස්ව සිටිසේක, ඒ දැක අනඳමහතෙරුන්වහන්සේ බුදුන් වැඳ භාග්‍යවතුන්වහන්ස මේ උපවානස්ථවිරයන්වහන්සේ ප්‍රථමබොධියෙහි පටන් උපස්ථායකව සමීපයෙහි හැසුරුණකෙනෙක දැන් කුමක් පිණිස බුදුරජ අභිමුඛයෙන් දුරු කළසේක් දැයි විචාළසේක, ආනන්දය අදරාත්‍රියගේ පශ්චිමයාමයෙහි මාගේ පිරිනිවන්පෑමයයි කියා තථාගතවූ මා දක්නා පිණිස දස දහසක් සක්වළින් මේ සක්වළට රැස්වූ දෙවතාවෝ ඉතාබෙහෙව මේ කුසිනාරානුවර සල්වනයට හාත්පස්හි දොළොස්යොදුන් පමණ තැනින් මහෙශාක්‍යදෙවතාවන් විසින් සපශීනොවූ කෙස්ලොම් අගක් අන්නාපමණවූ භූමිප්‍රදෙශයකුදු නැත, බුදුරජ සමීපයෙහිවූ කෙස්ලොම්අගක් අන්නාපමණ බිමක සියුම්වෙස් ගෙණ මහෙශාක්‍යදෙවියෝ දශදශදෙනා බැගින් සිටිනාහුය එයින් ඔබ්බෙහි එසා තැන විසිවිසිදෙනා බැගින්ද එයින් ඔබ්බෙහි එසේම තිස්තිස්දෙනා බැගින්ද ඔවුන්ට ඔබ්බෙහින් සතළිස්සතළිස්දෙනාහා ඔවුන්ට ඔබ්බෙන් සැටසැටදෙනා හා යනාදී ක්‍රමයෙන් සියුම්වෙස් ගෙණ දෙවතාවෝ සැදීසිටිනාහ, එසේ ගහණවීනමුදු ඒ හැම ඔවුනොවුන්ගේ හස්තපාදවස්ත්‍රඝට්ටනාදියෙක් නැතුවම බුද්ධගෞරවයෙන් සන්හිඳී සිටිනාහ, මෙසා මහත් දිව්‍යසමාගම ඔවුනොවුන් සිත්සේ තථාගතවූ මාගේ මුහුන දක්නාට අවකාශ නොලදින් කලකිරුණු සිත් ඇත්තාහ ස්වභාවයෙන්ම මහත්ශරීරයක් ඇතිව පාංශුකූලචීවරයක් පොරවගෙණ මා අභිමුඛයෙහි සිටි ,මේ උපවානස්ථවිර

ක්ෂීණාශ්‍රව බැවින්හා පෙරත් කාශ්‍යපබුදුන්ගේ ධාතුචෛත්‍යරක්ෂාවෙහි නියුක්ත මහානුභාවසම්පන්නදෙවතාවෙක් වූ බැවින් සෙසු දෙවියෝ පෘථග්ජනසත්වයන් විනිවිද දක්නාසේ තෙජස් අධික බැවින් මොහු විනිවිද දක්නට අසමර්ථවන්නාහුය ආනන්දය ඒ කාරණයෙන් මා අභිමුඛයෙන් පහකෙළෙම් මාගේ පුත්‍රයාගේ අන්තිසිද්‍යෙෂණෙක් නැතැයි වදාළසේක.

එකල්හි අනඳමහතෙරුන්වහන්සේ බුදුන් වැඳ මාගේ ස්වාමිදරු වූ බුදුරජානන්වහන්ස ඔබවහන්සේගේ පරිනිවන්පෑම දෙවතාවෝ කෙසේ සිත්හි කෙරෙද්ද කෙසේ ඉවසද්දැයි විචාළසේක, එවිට භාග්‍යවතුන්වහන්සේ වදාරණසේක් ආනන්දය මාගේ පිරිනිවන්පෑම අරභයා ශොකාතුරව දෑදෑසක්සක්වළින් රැස්වූ දිව්‍ය සමූහයා අතුරෙන් පෘථග්ජනික දෙවතාවෝ උපන් ශොක දරාගත නොහි මේ ප්‍රකෘතිපොළොව දෙවතාවන් දරන්ට නොහැකි බැවින් අහස්හි පොළෝමවාගෙණ එහි හඬාවළප්නාහු හිසකේ උනා විසුරුවාගෙණ ජිනනාවූ ප්‍රපාතවල වැටියන්නාහුය එතන මෙතන ඔබ්නොබ වැටී පෙරලී විලාප කියන්නාහු ඉතාකඩිනමින් අපබුදුරජ පිරිනිවන්පානාසේක් අහෝ ලොව නුවණැස් අතුරුදන්වන්නේයයි යනාදි නොයෙක්කාරණ අඳෝනා කියමින් දෙපය දිගු කොට එක්විටෙක ඉදිරියට වැටෙන්නාහුය එක්විටෙක පිටිපසට එක්විටෙක වමැළයට එක්විටෙක දකුණැලයට වැටිවැටි හඬා පෙරළෙන්නාහුය, නිශ්චලගුණයෙන් ශිලාස්තම්භවැනි පහවූ රාගදොම්නස් ඇති අනාගාමික්ෂීණාශ්‍රවදෙවතාවෝ සිහිනුවණ එලවා ශොකය ඉවසන්නාහු සියලු සංස්කාරයෝම අනිත්‍යවන්නාහුය එසේ නොවව ස්ථිරවස්තුවෙක් මෙහි කොයින් ලැබේදැයි කියා අනිත්‍ය සැළකීමෙන් ධර්මසංවෙගයට පැමිණෙන්නාහුයයි වදාළසේක.

ඉක්බිත්තෙන් ආයුෂ්මත් අනඳමහතෙරුන්වහන්සේ බුදුන් වැඳ ස්වාමීන්වහන්ස තථාගතශරීරයෙහි අප කෙසේ පිළිපදිමෝදැයි විචාළසේක, එවිට බුදුහු ආනන්දය තථාගතශරීරපූජාවෙහි තොපි ව්‍යාවෘත නොවව උත්සාහ නොකරව උත්තමාර්ථ නම්වූ රහත්ඵලයට පැමිණීමෙහි උත්සාහකරව එම ස්වකීයාර්ථ නම්ලද රහත්ඵලයෙහි යෙදෙව එම ආත්මාර්ථය සාදාගැන්මෙහි සිහියෙන් වෙන් නොව අප්‍රමාදව කෙලෙසුන් තවනවීර්‍ය්‍යයෙන් වඩාගෙණ කායජීවිත දෙක නොබලා ආත්මආලය හැර ප්‍රතිපත්තියම උතුම්කොටගෙණ වාසයකරව, ආනන්දය කාරණාකාරණ දන්නා පණ්ඩිතලක්ෂණවූ ක්ෂත්‍රියපණ්ඩිතයෝද බ්‍රාහ්මණපණ්ඩිතයෝද ගෘහපතිපණ්ඩිතයෝද ලොව ඇත්තාහුය ඔහුද තථාගතයන්වහන්සේ කෙරෙහි විශෙෂයෙන් ප්‍රසන්නසිත් ඇත්තාහ එහෙයින් ඔව්හු තථාගතශරීරපූජා කෙරෙති වදාළසේක.

එකල්හි ආනන්දස්ථවිරතෙම එකාන්තයෙන් ඒ ක්ෂත්‍රියාදීහු මා
විචාරති ඔවුන්ට කෙසේ මම ප්‍රතිවචන දෙම්දැයි සිතා මාගේ ස්වා
මිවූ තථාගතයන්වහන්සේ තථාගතශරීරයෙහි කෙසේ පිළිපැද්ද
යුතුදැයි විචාළසේක. ආනන්දය චක්‍රවර්ත්තිරජ්ජුරුවන්ගේ ශරීරයෙ
හි පිළිපදනාසේ තථාගතශරීරයෙහිද පිළිපැද්දයුතුය ආනන්දය
තථාගතචෛත්‍යය සතරමංසන්ධියෙක්හි කටයුතුයයි වදාළසේක.

ආනන්දය චෛත්‍යකිරීමට නිසි පුද්ගලයෝ ලෝකයෙහි සතර
දෙනෙක් වන්නාහුය, ඔහු කවරහයත්? තථාගතවූ අර්හත්සම්‍යක්
සම්බුද්ධය ප්‍රත්‍යෙකබුද්ධය තථාගතශ්‍රාවකය චක්‍රවර්ත්තිය යන මොහු
යි, ආනන්දය එයින් අර්ථවශයෙන් යම් යම් සත්ත්වකෙනෙක් තථාගත
චෛත්‍යය දැක මේ තථාගතවූ අර්හත්සම්‍යක්සම්බුද්ධයන්වහන්සේ
ගේ චෛත්‍යයයි ආදර උපදවා එහි මල්පහන් සුවඳදුම් පිදීමෙන්
හෝ ධජපතාක නැඟීමෙන් හෝ වැඳීමෙන් හෝ සිත සතුටුවීමෙන්
හෝ පින් රැස්කළාහු වී නම් ඒ හැම කාබුත් මරණින් මත්තෙහි
ස්වර්ගසඞ්ඛ්‍යාත දෙව්ලොව උපදනාහුය, ආනන්දය මේ පසේබුදුවර
යන්වහන්සේගේ චෛත්‍යයයි ආදර උපදවා එසේම පිදීමෙන් හා
සතුටුවීමෙන්ද බොහෝ සත්ත්වයෝ දෙව්ලොව උපදනාහුය, ආනන්දය
මේ තථාගතශ්‍රාවකයන්වහන්සේගේ චෛත්‍යයයි ආදර උපදවා
මල්පහන් ආදියෙන් පිදීමෙන්හා සතුටුවීමෙන්ද බොහෝ සත්ත්වයෝ
දෙව්ලොව උදනාහුය, ආනන්දය මේ චක්‍රවර්ත්තිරජහුගේ චෛත්‍ය
යයි ආදර උපදවා එහි මල්පහන් ආදියෙන් පිදීමෙන් හා සතුටුවී
මෙන්ද බොහෝ සත්ත්වයෝ දෙව්ලොව උපදනාහුය, ආනන්දය මෙ
සේ අර්ථවශයෙන්ම මේ බුද්ධාදී ශ්‍රෙෂ්ඨපුද්ගලයෝ සතරදෙන චෛ
ත්‍යකිරීමට සුදුසුවන්නාහුයි, නැවත බුදුහු වදාරණසේක් ආනන්ද
ය යම් කිසිකෙනෙක් පහන්සිතින් අසවල් විහාරය චෛත්‍යය
වඳිමහයි කියා චෛත්‍යවන්දනාව පිණිස ඇවිදිනාහුද ඒ හැම
ඒ ගමන් අතර කාලක්‍රියාකළහොත් නිසැකින්ම ස්වර්ගයෙහි උප
දනාහුයයි වදාළසේක.

ඉක්බිත්තෙන් ආයුෂ්මත් ආනන්දමහතෙරුන්වහන්සේ ස්වාමිවූ බුදු
රජාණන්වහන්සේ ස්ත්‍රීන්කෙරෙහි අපි කෙසේ පිළිපදමෝදැයි විචාළ
සේක. එවිට බුදුහු ආනන්දය ස්ත්‍රීන්ගේ නොදැක්මම පැවිදි තොපට
උතුම් ශාසනප්‍රතිපත්තියෙකැයි වදාළසේක, මෙසේ කුමක් පිණිස
වදාළසේක්දයත්? සෙනස්නට වැද දොර වසා ගේහුන් භික්ෂුතෙම
යම්තාක්කල් වාරයෙහි අවුත් සිටි ස්ත්‍රිය නොදක්නේද එතාක් ඔ
හුගේ ලොභය නූපදනේය චිත්තය චලිත නොවන්නේය දැක්ම
ඇතිකල්හිම ඒ දෙකාරණයෝ වන්නාහුය එහෙයින් ස්ත්‍රීන්ගේ
නොදැක්මම වදාළසේක. ස්වාමීන්වහන්සේ භික්ෂාදානාදී කෘත්‍යය

ස්ත්‍රීන්ගේ දක්ම ඇතිවූකල්හි කෙසේ පිළිපදිමෝදැයි විචාළසේක, අනාලාපය කථා නොකිරීම උතුමැයි වදාළසේක, එසේ කුමක් පිණිස වදාළසේක්දයත්? ඉදින් කඩුගත් අත් ඇතිව මා හා සමග කථාකළහොත් මෙහිම තාගේ හිස සිඳ හෙළමි කියා සිටි මිනිසෙකු හෝ ඉදින් මා හා සමග කථාකළහොත් මෙහිම තා පට පටයන අනුත්තරණ පවත්වා නාවිනාසකෙරෙමියි කියා සිටි යකින්නක් හෝ එක්ව පවත්වන කථාව හේතුකොටගෙණ එයින් එක් අත්බැවකම විනාශවෙයි අනන්තකාලයක් අපාදුක් විඳීමෙක් නැත එහෙයින් ඒ උතුම, ස්ත්‍රියක හා සිහිනුවණින් දුරුව කථාකිරීමක් ඇතිකල්හි විශ්වාසවන්නේය විශ්වාසය ඇතිකල්හි ඔතාර ඔතිනන සිත් ඇතිනැනැත්තේ ශීලභේදයට පැමිණ එයින් සතර අපාදුකට පැමිණෙණ් ජාතිජරාමරණාදි සියලු දුකින් නොමිදෙයි එහෙයින් කථා නොකිරීමම උතුම් ප්‍රතිපත්තියෙකැයි වදාළසේක. ඉදින් ස්වාමිවූ බුදුරජානන්වහන්ස යම් ස්ත්‍රියක් දවස හෝ විචාළානම් සිල් සමාදන්වීමට හෝ යාඥකළානම් බණ ඇසීමට හෝ කැමතිවූවානම් ප්‍රශ්නයක් හෝ විචාළානම් ප්‍රව්‍රජිතයන් විසින් කළමනා යම් බඳුවූ හෝ කාර්‍ය්‍යයක් පැමිණියේවීනම් එබඳු කථාකිරීමක් ඇතිවූකල්හි කථා නොකොට තුෂ්ණීම්භූතවීම නුසුදුසු බැවින් එකාන්තයෙන්ම කථා පැවැත්වීම යුතුවෙයි එබඳු කථා පවත්වන පැවිද්දන් විසින් කෙසේ පිළිපැද්ද යුතුදැයි පිළිවිසිව්ව මව්තනතුරෙහි තබාගැන්මට සුදුසු ස්ත්‍රියකෙරෙහි මාතෘචිත්තය පිහිටුවාගැන්මෙන් හා භගිනීත්වයට තරම්වූ ස්ත්‍රීන්කෙරෙහිද භගිනීචිත්ත සිත් පිහිටුවා ගෙණ මෙසේ සිහිනුවණින් යෙදී ස්ත්‍රීන් හා කථාකිරීම සුදුසුයයි වදාළසේක.

ඉක්බිත්තෙන් ආනන්දමහතෙරුන්වහන්සේ අහෝ අද එකාන්තයෙන් බුදුරජ පිරිනිවන්පානාසේකැයි සිතා බලවත් දෙම්නසට පැමිණ මෙසේ බුදුන්සමීපයෙහි සිට හැඬීම එසු නොවෙයි එක් පාර්ශ්වයකට ගොස් හැඬීමෙන් ශෝක තුනීකෙරෙමියි සිතා එයින් ගොස් මණ්ඩලමාලයට වැද අනුළුවැබෙන් එල්බසිට හඬමින් මම වනාහි සෝවාන්වූ බැවින් ශෛක්‍ෂයෙමි රහත් නොවූහෙයින් මත්තෙහි කළමනාකාරයුතු ඇත්තේම මාගේ ශාස්තෘවූ බුදුරජද පිරිනිවන්පානාසේක දැන් සෙටදවස පටන් කවරක්හට මුවදෝවන පැන් දෙම්ද කවරක්හට පාදධෝවනපැන් දෙම්ද කවරක්හුගේ පාදධෝවනය කෙරෙම්ද කවරක්හුගේ සෙනසුන්වත් කෙරෙම්ද කවරක්හුගේ පාසිවුරු ගෙණ අනුව හැසිරෙම්දැයි යනාදී නොයෙක් අඳෝනා කියමින් බොහෝ හැඬූසේක. එකල්හි භාග්‍යවතුන්වහන්සේ භික්ෂුසංඝයාමධ්‍යයෙහි ආනන්දස්ථවිරයන් නොදැක මහණෙනි

ආනන්‍දස්ථවිර කොයි ගියෝදැයි විචාරාවදාළසේක. ස්වාමිනි මණ්ඩ
ලමාලයට වැද අගුල්මැඩෙහි එල්බ හඬනසේකැයි දැන්වූකල්හි ඒ
අසා භාග්‍යවතුන්වහන්සේ එක්තරා භික්ෂුනමක් කැඳවා මහණ
තෙපි ගොස් මාගේ වචනයෙන් ආනන්දයා කැඳවවයි වදාළසේක.
එවිට උන්වහන්සේ එසේය වහන්සැයි කියා ගොස් එපවත් දැන්වූ
කල්හි අනඳමහතෙරුන්වහන්සේ බුදුන්කරා පැමිණ වැඳ එකත්
පස්ව හුන්සේක, එකල්හි භාග්‍යවතුන්වහන්සේ ආනන්දය තෙපි හ
ඬාවැලප සෝකකිරීමෙන් ප්‍රයොජන කිම්ද? ලොව සියලු ප්‍රියම
නාපයන්කෙරෙන් වෙන්වනබවය යන මේ කාරණය මාවිසින්
පළමුකොටම කියනලද්දේනොවේදැයි යනාදි වශයෙන්නොයෙක්
කාරණ දක්වාවදාරා ආනන්දය බොහෝ දීර්ඝකාලයක් තථාගතයන්
වහන්සේ තොපවිසින් මෛත්‍රීන් යුක්තවූ අප්‍රමාණ කායවාක්මනො
යන ත්‍රිවිධකර්මයෙන් අප්‍රමාදව හිතයෙන්ම උපස්ථානකරණලද්
දේය එහෙයින් ආනන්දය තෙපි කල්පලක්ෂයක් අභිනිර්හාරකරණ
ලද්දෙහිය පින් ඇත්තෙහිය එසේදළුවත් මෙපමණකින් නැහමක්
විස්වාසවව ප්‍රමාද නොව වීර්‍ය්‍යකිරීමෙහි යෙදෙව එසේ ඇතිකල්හි
වහාම නාශ්‍රවව ධර්මසඞ්ගායනාකාලයෙහි රහත්ඵලයට පැමිණෙන්
නේය මා වැනි බුදුකෙණෙක්නට කරණලද උපස්ථානය තොපට
නිස්ඵල නොවන්නේයයි යනාදී කාරණ ප්‍රකාශකොට පෘථිවිය
ප්‍රස්තාරකරන්නාසේ ආකාශය විස්තාරකරන්නාසේ චක්‍රවාටය උ
ප්‍රටන්නාසේ මහාමේරුව නගන්නාසේ ආයුෂ්මත් අනඳමහතෙරු
න්වහන්සේගේ ගුණය නොයෙක් පරිද්දෙන් භික්ෂුසඞ්ඝයාට දක්වා
වදාළසේක.

ඉක්බිත්තෙන් අනඳමහතෙරුන්වහන්සේ භාග්‍යවතුන්වහන්
සේට දන්වනසේක් ස්වාමීන්වහන්ස මෙනුවර වැනි සම්බාධවූ මේ
ක්ෂුද්‍රපුරයෙහි උජ්ජඞ්ගලනම්ලද විෂමපුරයෙහි සාඛාපුරයෙහි න
ගමක් පිරිනිවන්පානාසේක්වා අන්‍යවූ චම්පානුවරය රජගහනුවර
ය සැවැත්නුවරය සාකෙතනුවරය කොසම්බ්‍යනුවරය බරණැස්නු
වරය යන මේ ප්‍රසිඬ නගරයන් අතුරෙන් එක්තරා නුවරෙක පිරි
නිවන්පානාසේක්වා එහි ක්ෂත්‍රිය මහාසාලාදීහු බුදුන්කෙරෙහි ඉ
තාප්‍රසන්නාහු ඔව්හු තථාගතශරීරපූජාකරන්නාහුයයි ආරාධනා
කළසේක. එකල්හි බුදුරජ ආනන්දය ක්ෂුද්‍රනගරයයි එසේ නොකි
යව පෙර වූදෙයක් කියමි වදාරා තමන්වහන්සේ පූර්වයෙහි සුදර්ශ
නනම් චක්‍රවර්තිරජව දශවිධ ශබ්දයෙන් ඒකකොලාහලවූ සියලු
සම්පත්තියෙන් සම්ෘඬවූ දෙව්නුවරක් වැනි එකලට කුසාවතීනම්
රාජධානි නම් ලද එම කුසිනාරානුවරෙහි දිවසිරි වැනි රජසිරි විඳි
බව ප්‍රකාශකොට මහාසුදර්ශනසූත්‍රදෙශනාව නිමවාවදාරා ආනන්‍ද
ය තෙපි ගොස් කුසිනාරානුවර මල්ලරජදරුවන් මා දක්නට වහා

නැඳවච්චයිවදාළසේක. ඒ ඇසූ අනඳමහතෙරුන්වහන්සේ එසේය
ස්වාමීන්වහන්සැයි කියා භාග්‍යවතුන්වහන්සේට ප්‍රතිවචනදී මනා
කොට හැඳපෙරව පාසිවුරු ගෙණ තමන්වහන්සේ දෙවෙනිකො
ට අනික් භික්‍ෂුනමක් හා සමග කුසිනාරානුවරට වැඩ කිසිකාරණ
යකින් සන්ථාගාරනම් මන්ත්‍රණසාලාවෙහි රැස්ව බුදුන් වැඩිබවද
දනාදැනම සිටි මල්ලරජදරුවන් කරා පැමිණ එදවස් රාත්‍රියගේ
පශ්චිමයාමයෙහි බුදුරජ පිරිනිවන්පානා ප්‍රවෘත්තිය ඔවුන්ට දන්
වා වාසෙට්ඨය වහා නික්මෙව අපගේ නුවර පිරිනිවන්පානා බුදුන්
පශ්චිමකාලයෙහි අපි දක්නට නොහැකිවූම්හයි නැවත විපිළිසර
නොවුව මැනවැයි වදාළසේක, එකෙණෙහි ඒ ප්‍රවෘත්තිය ඇසූ සියලු
මල්ලරජදරුවෝද මල්ලරාජකුමාරයෝද මල්ලයෙහෙළිනියෝද
මල්ලප්‍රජාපතියෝද යන හැමදෙනම උපන්දුක් ඇතිව කිසියම් ස
තුටක් නැතුව චිත්තදුඃඛයෙන් දෘම්නසින් යුක්තව හඬමින් වලප
මින් යන්නාහු සමහරෙක් හිසකේපන විදුහැන්මෙන්ද සමහ
රෙක් හිස අත බැඳීමෙන්ද හඬති ජින්නප්‍රපාතයෙහි වැටීමෙන්
වැටි ඔබිනොබ පෙරලිපෙරලී හඬහඬා අහෝ ඉතාකඩිනමින් අ
පභාග්‍යවතුන්වහන්සේ පිරිනිවන්පානාසේකැයි යනාදී නොයෙක්
අදෝනා කියමින් එහැම ප්‍රදීපමාලාදිවූ පූජාසත්කාරයන් ගෙණ
සල්වනයට ගොස් අනඳසාමින්ට දන්වූකල්හි අනඳසාමීන්ගේ ද
ක්‍ෂතායෙන් වහා බුදුන් දක්වා නිමවන පිණිස ඒ සියලු රජද
රුවන් එකිනෙක කුලපරිවර්තිත වශයෙන් කුලසංක්‍ෂෙපව්පිසහා
ග වශයෙන්ද වෙන්වෙන්ව කොට්ඨාසකොටගෙණ බුදුන් දක්වන
වේලෙහි ස්වාමීන්වහන්ස පුත්‍රභාර්‍ය්‍යාවන් අමාත්‍යපරිවාර ජනයන්
සහිතවූ මෙනම් මල්ලරජතෙම මස්තකයෙන් ශ්‍රීපාදයන් වදනේ
යයි දන්ව දන්වා මෙම උපායෙන් ප්‍රථමයාමයෙහිම සැටදහසක්
මල්ලරජදරුවන් බුදුන් වදවා නිමවූසේක. එකල්හි භාග්‍යවතුන්
වහන්සේ ඒ මල්ලරජදරුවන්ට අනිත්‍යතාප්‍රතිසංයුක්තවූ ධර්ම්ම දෙ
ශනාකොට අවසර දෙවාවදාළසේක.

එසමයෙහි අසූකෙළක් ධන නිධානගතව තබවනු විසිඅමුණක්
දවස අයවෙමින් දශඅමුණක් ව්‍යයවන උදිච්චබ්‍රාහ්මණමහාසාර
කුලයෙන් බාහිර ශාසනයෙහි පැවිදිවූ සුභද්‍රනම් පරිබ්‍රාජකතෙම
එම කුසිනාරානුවර වාසයකරන්නේය හෙතෙම අදරැ පශ්චිමයාම
යෙහි යමකශාලාන්තරයෙහි බුදුන්ගේ පිරිනිවන්පෑම වන්නේයයි
යනු අසා තමා පෙර කොණ්ඩඤ්ඤ නම් මහතෙරුන් හා දෙබෑකෙ
ණෙක්ව එකඇල්කෙතෙන් නවඅග්‍රදානයක් දෙනකල්හි පළමු
කොටම එක්වගත නොහී අනභිමතිමෙන් අනභිමශ්‍රාවකවන
බැවින් බුදුන් දක්මෙහි හටගත් උත්සාහ ඇතිව බුද්ධෝත්පාදය

ලැබීම දුර්ලභයයි සිතා භාග්‍යවතුන්වහන්සේ කෙළවර දක ප්‍රශ්න විචාරණුකැමතිව ගොස් ඊට අවකාශයක් බලනුයේ අනඳමහ තෙරුන්වහන්සේකරා පැමිණ පින්වත්ආනන්දස්ථවිරයෙනි මම දෙතුන්රාජපරම්පරාවක් ඉක්මුණාවූ වයෝවෘද්ධ මහලු ආචාර්ය්‍යවරයන්ගෙන් අහින් සම්‍යක්සම්බුද්ධ තථාගතයන්වහන්සේ ලෝකයෙහි කිසිකලෙක්හි උපදනාසේකැයි යන මේ වචනය ඇසීමි ඒ තථාගතතෙම අද රාත්‍රියගේ පශ්චිමයාමයෙහි පිරිනිවන්පානාසේක්ලූ මාගේ ශංකාධර්මයෙක් ඇත ඒ කාරණය විසඳා බුදුරජ ධර්මදෙශනාකළසේක්වනම් මේ ලබ්ධිය හැර ඔබසරණ යෙමි එහෙයින් ආනන්දස්ථවිරයන්වහන්ස ඒ ශ්‍රමණභවත්ගෞතමයන්වහන්සේගේ දක්මට අවකාශ ලදීවිනම් ඉතායෙහෙකැයි දැන්වූයේය. ඒ අසා අනඳමහතෙරුන්වහන්සේ “අලං ආවුසො සුභද්ද මා තථාගතං විහෙඨෙසි,, යනාදීන් දන්වනසේක් මේ අන්‍යතීර්ථකයෝනම් තමන් ගත් දෘෂ්ටියම නොහැර ගන්නාහුය දෘෂ්ටිය හරවනපිණිස බොහෝකොට වදාරන්නාවූ භාග්‍යවතුන්වහන්සේට වෙහෙසවන්නේය දැන් ස්වභාවයෙන්ම ක්ලාන්තසේකැයි සිතාවදාරණසේක් ඈවැත්වූ සුභද්‍රය මෙතෙක්කල් තෝ ප්‍රමාදව සිට දැන් තථාගතයන්වහන්සේට වෙහෙස නොකරව භාග්‍යවතුන්වහන්සේ ක්ලාන්තයයි දැන්වූසේක. ඒ පරිබ්‍රාජකතෙම මේ භික්ෂුතම මට අවකාශ නොදෙනසේකැයි සිතා ප්‍රයොජනයක් ඇත්තාහු විසින් අනුවපැවැත්මෙත් නැවත නැවතත් යාඥාවියයුතු බැවින් දෙවනතුන්වනවටද එසේම අනඳසාමින්ට යාඥාකළකල්හි නැවත නැවතත් අනඳමහතෙරුන්වහන්සේ සමීපචාරයෙහි සිට එසේ වලකනවදාරණ ඒ ප්‍රවෘත්තිය බුදුරජ ප්‍රකෘතිශ්‍රොත්‍රයෙන්ම අසාවදාරමින්ම ඒ සුභද්‍රයාට වැඩපිණිස මහත් උත්සාහයෙන් විනෙජනානුකම්පා ඇති තමන්වහන්සේ වැඩිබැවින් කරුණාපරිභාවිතවචනයෙන් “අලං ආනන්ද” යනාදී ක්‍රමයෙන් ආනන්දය සුභද්‍රයා නොවලක්වව හෙතෙම යම්කිසිවක් මා විචාරන්නේවීනම් ඒ සියල්ල දැනගන්නා කැමැත්තෙන්ම විචාරන්නේය මා වෙහෙසන පිණිස විචාරන්නේ නොවෙයි ඕහට මම මදක් කීකල්හි හෙතෙම වහා දැනගන්නේය එහෙයින් ආනන්දය සුභද්‍රයාට මා දක්නට අවකාශ දෙවයි වදාළසේක. එකල්හි අනඳසාමීන් දුන් අවසරයෙන් බුදුන් දක්නට ගොස් වැද භාග්‍යවතුන්වහන්සේ හා සමග පිළිසඳරකථාකොට එකත්පස්ව හිඳ දන්වනුයේ භවත්ගෞතමයානන්වහන්ස පූරණකාශ්‍යප මක්ඛලිගොසාලාදීන්ගේ ප්‍රතිඥාවෝ නෛර්‍ය්‍යාණිකවේද්‍යහෝ නොවේද්‍යහොයි කියා අන්‍යතීර්ථකලබ්ධි ප්‍රතිසංයුක්තවූ ප්‍රශ්නයක් විචාළේය. එකල්හි භාග්‍යවතුන්වහන්සේ ඔවුන්ගේ ප්‍ර

භික්ෂු අතිශර්ථානිකභාව කථනයෙන් නොයෙදිමෙන්ද අවකාශ නැති බැවින්ද "අලං සුභද්‍ර" යනුවෙන් ඒ වචනය ප්‍රතික්ෂේපකොට වදාරා ඔහට සුදුසුපරිද්දෙන් ධර්මදෙශනාකරණසේක් සුභද්‍රය යම් ධම්විනයෙක්හි "සම්මාදිට්ඨි සම්මාසංකප්පෝ" යනාදී ආර්‍ය්‍යාෂ්ටාඞ්ගික මාර්ගය දක්නට නොලැබේද සෝවාන්වූ පළමුවෙනි ශ්‍රමණද එහි නැත්තේය දෙවෙනිවූ ශකෘදාගාමි තුන්වෙනවූ අනාගාමි සතරවෙනිවූ රහත්ශ්‍රමණද එහි නැත්තේයයි ප්‍රථමදෙශනාවෙන් මෙසේ අනියමයෙන් වදාරා නැවත තමන්වහන්සේ ශාසනය නියමකොට වදාරණසේක් සුභද්‍රය මේ ධර්මවිනයෙහි එම ආර්‍ය්‍යාෂ්ටාඞ්ගිකමාර්ගය දක්නට ලැබෙන්නේය මෙහිම සුභද්‍රය පළමුවෙනි සෝවාන්ශ්‍රමණද දෙවෙනි ශකෘදාගාමි ශ්‍රමණද තුන්වෙනි අනාගාමි ශ්‍රමණද සතරවෙනි රහත්ශ්‍රමණද ඇත්තේය, මෙයින් පිටත් අන්‍යවාදීහු තුමූ සෝවාන් ශකෘදාගාමි අනාගාමි අර්හත් යන මෙම මාර්ගඵල ඵලස්ථ වශයෙන් අටදෙනෙකුහු අන්‍යවූ සතරආර්‍ය්‍යමාර්ගයන්ගේ ප්‍රතිලාභය පිණිස විදර්ශනාභාවනා වඩා උත්සාහකරණ ආරබ්ධ විදර්ශකයන් සතරදෙනා හා යන මේ දොළොස්දෙනෙක්ව සිටි ආර්‍ය්‍යශ්‍රමණයන්ගෙන් හිස්වන්නාහුය; සුභද්‍රය මේ ශාසනයෙහි ශ්‍රමණයෝ තමතමන් පැමිණි මාර්ගඵලයන් අන්‍යකෙක් අතිකක්හට කියාදී ඒ සෝවාන්මාර්ගාදියට පමුණුවන්නේවේද ඒ ආරබ්ධවිදර්ශකව භාවනාදියෙහි යෙදී වසන්නාවූ තමන්ට ප්‍රගුණවූ කර්මස්ථානය කියාදී අතිකකු සෝවාන්මාර්ගාදිය පිණිස ආරබ්ධවිදර්ශක කරන්නේවේද සුභද්‍රය මේ ශාසනයෙහි ඒ වාදශවිධවූ භික්ෂුහු මනාවිහරණයෙන් එසේ යම්තාක්කල් වාසයකරන්නාහුවෙද්ද ඒ තාක්කල් රහතුන්ගෙන් ලොකය හිස්නොවන්නේයයි වදාළසේක.

නැවතද බුදුරජ වදාරණසේක් සුභද්‍රය එකුන්තිස්වයස්කල මම සර්වඥතාඥානසඞ්ඛ්‍යාත උතුම්කුශලපරියෙසනයෙන් පැවිදිවීම් ඒ පැවිදිවූතැන්පටන් සමාධිකවූ පණස්වර්ෂයෙක සුභද්‍රය උතුම් ආර්‍ය්‍යමාර්ගසඞ්ඛ්‍යාත අෂ්ටාඞ්ගිකමාර්ගයාගේම ප්‍රදෙසයක්ව සිටි විදර්ශනාභාවනා මාත්‍රයෙක්හිදු පැවැත්මෙන් හැසිරෙන්නාවූ එහෙයින් ප්‍රදෙසවර්තිවූද මාගේ ශාසනයෙන් පිටත් අතික් ශ්‍රමණයෙක් නැත ඒ ප්‍රථමශ්‍රමණවූ සෝවාන් ආදී මාර්ගඵලස්ථයෝද එහි නැතැයි වදාළසේක.

මෙසේ භාග්‍යවතුන්වහන්සේ ප්‍රශ්නවිසර්ජනයෙන් ධර්මදෙශනා කරවදාළකල්හි සුභද්‍ර නම් පරිව්‍රාජකතෙම ශ්‍රීපාදමූලයෙහි වැදහෙව භාග්‍යවතුන්වහන්ස ඔබවහන්සේගේ ධර්මදෙශනාව ඉතා ආශ්චර්‍ය්‍යය ඉතා අද්භූතය අනෙකප්‍රකාරයෙන් දෙශනාකරවදාළ ධර්

ශ්‍රවණයෙන් ප්‍රසන්නවූ මම භාග්‍යවතුන්වහන්සේද ධර්මය ද සඞ්ඝයා ද සරණයෙමි භාග්‍යවතුන්වහන්සේගේ සමීපයෙහි මට පැවිදිඋප සම්පදා දෙවාවදාළ මැනවැයි ආරාධනාකෙළේය. ඒ අසාවදාරා භාග්‍යවතුන්වහන්සේ සුභද්‍රය මේ ධර්මවිනයෙහි යම්කිසි අන්‍යතී ර්ථකයෙක් ප්‍රව්‍රජ්‍යෝපසම්පදාව කැමතිවූයේවීනම් සාරමසක් පිරිවස් වා බලා සාරමාසයාගේ ඇවැමෙන් ආරාධසිත් ඇති හෙවත් කැ මැතිවූ භික්ෂූහු ඔවුන් පැවිදිකෙරෙති වදාළකල්හි සුභද්‍රපරිබ්‍රාජක තියතුගේ ඉදින් ස්වාමීන්වහන්ස මේ ශාසනයෙහි ප්‍රව්‍රජ්‍යාව කැමති අන්‍යතීර්ථකයෝ එසේ සාරමසක් පරිවාස වසන්නාහුවීනම් මම වනාහි ස්වාමීන්වහන්ස සතර අවුරුද්දක් වසමි එතාක්කල් බලා සතුටුසිත් ඇති භික්ෂූහු මා පැවිදිකොට උපසම්පදාකරණසේක්වා යි කියා නැවතත් පැවිදි වීමට ආරාධනාකළකල්හි භාග්‍යවත් බුදු රජානන්වහන්සේ ආනන්දස්ථවිරයන් කැඳවා ආනන්දය සුභද්‍රයා පැවි දිකරවයි වදාළසේක. එකෙණෙහි එසේය ස්වාමීන්වහන්සැයි කියා ආනන්දමහතෙරුන්වහන්සේ ප්‍රතිවචනදී ඒ පරිබ්‍රාජකයා එක්පාර්ශ්ව යකට කැඳවා ගෙණ පැන්ලබුයෙන් දිය දී හිස තෙමවා තචපඤ්ච ක කර්මස්ථානය කියාදී හිසකේරවුලු කප්පවා කාෂායවස්ත්‍රයන් හඳ වා තුන්සරණ දී බුදුන් සමීපයට ගෙණ ආසේක, එවිට බුදුරජ උ පසම්පදාකොට කමටහන් ඉගැන්වූසේක, පශ්චිමශ්‍රාවකවූ හෙතෙ මේ කර්මස්ථානය ගෙණ එම සල්උයනෙහි එක්පාර්ශ්වයෙක සක්මන් කරමින් විදර්ශනා වඩා එකෙණෙහි සිව්පිළිසිඹියා හා සමග රහත් ඵලයට පැමිණ අවුත් බුදුන් වැඳ මහසඟමැද වැඩහුන්සේක.

එදවසම මධ්‍යමයාමය අතික්‍රාන්තව පශ්චිමයාමය පැමිණිකල්හි භික්ෂුසඞ්ඝයාවහන්සේට බුදුරජ අවවාද කරණසේක් ආනන්දස්ථවිර යන්කැඳවා ආනන්දය තොපට අපගේ ශාස්තෘන්වහන්සේ දැන් නැ ත එහෙයින් ශාස්තෘපාවචන ඉක්මිණැයි යන මෙසේවූ විපිළිසර යෙක් වන්නේය ආනන්දය ඒ එසේ දැක්කයුතුනොවෙයි ආනන්ද ය මාවිසින් තොපට යම් ධර්මවිනයෙක් දෙසනලදද අනව නලදද ඒ ධර්මවිනයතෙම තොපට මා ඇවැමෙන් ශාස්තෘනම් වනසේකැයි යන කාරණය දක්වාවදාරණසේක් "ආනන්දය ජී වත්ව සිටියාවූද මාවිසින් වනාහි මේ ලඝුකාපත්තිය මේ ගරු කාපත්තිය මේ සතෙකිච්ඡය මේ අතෙකිච්ඡය මේ ලෝකවජ්ජ ය මේ ප්‍රඥප්තිවද්‍යය මේ වරද පුද්ගලසම්පයෙහි ශුද්ධවන්නේ ය මේ වරද ගණයාසම්පයෙහි ශුද්ධවන්නේය මේ වරද සඞ්ඝයාස මීපයෙහි ශුද්ධවන්නේයයි කියා සප්තාපත්තිස්කන්ධවශයෙන් බන්ධ පරිවාරවූ උභතෝවිභඞ්ගමහාවිනයනම්වූ යම් විනයපිටකයෙක්

දෙසනලද්ද ඒ විනයපිටකය මා පිරිනිවිකල්හිද තොපට ශාස්තෘ
කෘත්‍යය සාදන්නේය, ජීවත්ව සිටිනාවූද මා විසින් මේ සතරසති
පට්ඨානය සතරසම්‍යක්ප්‍රධානය සතරඍද්ධිපාදය පඤ්චෙන්ද්‍රියය
පඤ්චබලය සප්තබොධ්‍යඞ්ගය ආර්‍ය්‍යඅෂ්ටාඞ්ගිකමාර්ගයයි කියා ඒ ඒ
ආකාරයෙන් මේ මේ ධර්‍මයන් විභාගකොට සූත්‍රපිටකය දෙසනලද්ද
ඒ සියලු සූත්‍රපිටකය මා පිරිනිවිකල්හිද තොපට ශාස්තෘකෘත්‍යය
සාදන්නේය, ජීවත්ව සිටිනාවූද මා විසින් මේ පඤ්චස්කන්ධය ද්වාද
ශායතනය අටළොස්ධාතුය චතුස්සත්‍යය ද්වාවිසිතින්ද්‍රියය නවහෙ
තුය චතුර්විධ ආහාරය සප්තස්පර්ශය සප්තවේදනාය සප්තසංඥාය
සප්තචේතනාය සප්තචිත්තයයි කියා එහිදු මෙතෙක් ධර්‍මයෝ කා
මාවචරයහ මෙතෙක්ධර්‍මයෝ රූපාවචරයහ මෙතෙක්ධර්‍මයෝ
අරූපාවචරයහ පරියාපන්නයහ අපරියාපන්නයහ ලෞකිකයහ
ලොකොත්තරයහයි කියා මේ ධර්‍මයන් විභාගකොට සූවිසිසමන්ත
පට්ඨාන අනන්තනය මහාපට්ඨානයෙන් ප්‍රතිමණ්ඩිතවූ යම් අභි
ධර්‍මපිටකයෙක් දෙසනලද්ද ඒ සියලු අභිධර්‍මපිටකය මා පිරිනිවි
කල්හිද තොපට ශාස්තෘකෘත්‍යය සාදන්නේය, මෙසේ අභිසම්බො
ධියෙහි පටන් පිරිනිවන්පෑම දක්වා පන්සාළිස්හවුරුද්ද ඇතුළ
ත දෙසනලද මේ සියලු ත්‍රිපිටකය පඤ්චනිකාය නවාඞ්ග
ධර්‍මස්කන්ධවශයෙන් මෙසේ ප්‍රභෙදගත මහත් අසූසාරදහසක් ධර්‍ම
ස්කන්ධයෝ තොපට අනුශාසනා පිණිස සිටිනාහුය මම එකලාව පි
රිනිවන්පාම්ය දූත් මම එකලාව හිඳ තොපට අවවාදානුශාස
නාකෙරෙම් මා පිරිනිවිකල්හි ශාස්තෘනම් ලද ධර්‍මස්කන්ධසඞ්ඛ්‍යාත
මේ අසූසාරදහසක් බුදුවරයෝ තොපට අවවාදානුශාසනාකරන්
නාහුයයි මෙසේ බුදුරජ බොහෝ කාරණ දක්වාවදාළසේක.

නැවත බුදුරජ භික්ෂූන්ගේ අනාගතචාරිය දක්වනසේක් ආන
න්දය දූන් මා ඇතිකල සියලු භික්ෂූහු ඔවුනොවුන්ට ආවුසො ආවු
සොයි කියා ආවුසොවාදයෙන්ම කථාකරන්නාහුය මාගේ ඇවෑ
මෙන් ඔවුනොවුන් මෙසේ කථාකටයුත්තේය. කෙසේදයත්? ආන
න්දය ස්ථවිරභික්ෂූන් විසින් නවකතරභික්ෂූන්ට නවකයයි නොකියා
ලොව ව්‍යවහාරනාමයෙන් හෝ ගොත්‍රයෙන් හෝ ආවුසොවාද
යෙන් හෝ කථා පැවැත්වියයුතුයි, නවකතර භික්ෂූන් විසින් ස්ථවිරවූ
ජ්‍යෙෂ්ඨතරභික්ෂූන්ට භන්තෙයි කියාහෝ ආයුෂ්මායි කියා හෝ භ
න්තෙ තිස්ස ආයුෂ්මා තිස්සයයි කියාහෝ මෙසේ ඔවුනොවුන්කෙ
රෙහි මෙයින් මතු කථා පැවැත්වියයුතුයයි වදාළසේක, ආනන්දය
සංඝතෙම කැමැත්තේවීනම් මා ඇවෑමෙන් ක්ෂුද්‍රානුක්ෂුද්‍රශික්ෂාපද
සමූහනයකෙරේවයි කියා එකාන්තයෙන් නොවදාරා විකල්පවචන
යෙන් මහාකාශ්‍යපස්ථවිර ධර්‍මසඞ්ගායනා කාලයෙහි දුෂ්කෘතාපත්ති

ශ්‍රමණයන ක්‍ෂුද්‍රානුක්‍ෂුද්‍රශික්‍ෂාපද නොහරණබව දැනවදාරම්නම්
ශික්‍ෂාගෞරවාදි සංඝගුණ ප්‍රකාශවන ප්‍රශ්ණ මෙසේ වදාළසේක,
ආනන්දය ඡන්නනම භික්ෂුහට ඔබ අවෑමෙන් බ්‍රහ්මදණ්ඩවම කටයු
තුයයි වදාළකල්හි ආනන්දස්ථවිර ස්වාමීන්වහන්ස බ්‍රහ්මදණ්ඩවම නම්
කවරේදැයි විචාළසේක. ආනන්දය ඡන්නභික්ෂූනම් යමක් කැමති
නම් ඒ කියන්නේයි හෙතෙම භික්ෂූන් විසින් කියයුතුනොවේයි අව
වාදකටයුතුනොවෙයි අනුශාසනාකටයුතු නොවෙයි කියා මේ බ්‍රහ්ම
දණ්ඩවමෙන් හෙතෙම හැරයයුත්තේයයි වදාළසේක.

නැවත භික්ෂුසංඝයාවහන්සේට අඩගාවදාරා බුදුව වැඩවුන්
පන්සාලිස්හවුරුද්ද මුළුල්ලෙහි දෙසූ සියලු ධර්මයෙහි ශඞ්කාවිමතී
යෙක් තොපට ඇද්දැයි විචාරාවදාළතැන ඒ සියලු ධර්මය සඞ්ඝරත්න
යකෙරෙහි මනාව පිහිටිබව දැන අනඳම්හතෙරුන්වහන්සේ වි
සින් ප්‍රශංසාකිරීමෙන් සියලු ධර්මය සර්වඥයන් අනූනව අනධිකව ප
වත්වනාබව ප්‍රකාශව්ය, එකල්හි සර්වලොකපූජ්‍යපූජනීය මාගේ
ස්වාමිදරුවූ බුදුරජානන්වහන්සේ භික්ෂුසංඝයාට අඩගාවදාරා “හ
න්‍දදානි භික්ඛවෙ ආමන්තයාමිවො වයධම්මා සඞ්ඛාරා අප්පමා
දෙන සම්පාදෙථ” යනුයෙන් පන්සාළිස්හවුරුද්ද මුළුල්ලෙහි සියලු
ලෝකයාහට දෙසනලද සියලු බුද්ධවචනයන් මේ එකම අප්‍රමාද ප
දයෙහිම ඇතුළත්කොට මේ පශ්චිම බුද්ධවචනයෙන් මුලුලෝවැසි
යන්ට අවවාදකොට ඒ කාරණයට පැමිණ තුෂ්ණිම්භූතවීමෙන් භා
ග්‍යවතුන්වහන්සේ ප්‍රථමධ්‍යානයට සම්වැදුනුසේක ඒ ප්‍රථමධ්‍යාන
යෙන් නැගී ද්විතියධ්‍යානයට සම්වැද ද්විතීයධ්‍යානයෙන් තෘතීයධ්‍යා
නයට සමවැද තෘතීයධ්‍යානයෙන් චතුර්ථධ්‍යානයට සමවැද චතුර්ථ
ධ්‍යානයෙන් නැගී ආකාසානඤ්චායතනසමාපත්තියට සම්වැද එ
යින් නැගී විඤ්ඤාණඤ්චායතනසමාපත්තියට සම්වැද එයින් නැගී
ආකිඤ්චඤ්ඤායතනසමාපත්තියට සම්වැද එයින් නැගී නෙවසඤ්ඤා
නාසඤ්ඤායතනසමාපත්තියට සම්වැද එයින් නැගී සඤ්ඤාවෙදයි
ත නිරොධසමාපත්තියට සමවැදුනුසේක ඒ සඤ්ඤාවෙදයිත නි
රොධසමාපත්තියට සමවන්කල්හි භාග්‍යවතුන්වහන්සේගේ ආශ්වා
සප්‍රාශ්වාස සංසිඳිනා එකල්හි ආයුෂ්මත් අනඳම්හතෙරුන්වහන්
සේ ඒ ආශ්වාසප්‍රාශ්වාසයන්ගේ නොවීම දැක ආයුෂ්මත් අනුරුද්ධස්ථවි
රයන්වහන්සේට ස්වාමිවූ අනුරුද්ධස්ථවිරයෙනි භාග්‍යවතුන්වහන්
සේ පිරිනිවිසේකැයි දැන්වූසේක,ඇවැත්වූ ආනන්දස්ථවිරය භාග්‍යව
තුන්වහන්සේ පිරිනිවන්පෑසේක් නොවෙයි සඤ්ඤාවෙදයිත නිරො
ධසමාපත්තියට සමවන්සේකැයි දැන්වූසේක, අනුරුද්ධස්ථවිරයන්ව
හන්සේ වනාහි භාග්‍යවතුන්වහන්සේ හා සමගම ඒ නිරොධස ම

පත්තියට සමවන්සේක් යම්තාක් නෙවසඤ්ඤානාසඤ්ඤායතනසමාපත්තීන්ගේ නැගීමද එතාක්තැන් සමවැදීමෙන් ගොස් දූත දුන් මේ භාග්‍යවතුන්වහන්සේ නිරොධසමාපත්තියට සමවන්සේක ඒ නිරොධසමාපත්තිය ඇතුළෙහි චිත්තය පවතිමින් සිටිකල්හි කාලක්‍රියා කිරීමෙක් නැතැපි දූත මෙසේ වදාළසේක.

ඉක්බිත්තෙන් භාග්‍යවතුන්වහන්සේ ඒ සඤ්ඤාවෙදයිත නිරොධසමාපත්තියෙන් නැගී අනුලොමක්‍රමය නිමවා ප්‍රතිලොමයෙන්ද සමවදනාසේක් නෙවසඤ්ඤා නාසඤ්ඤායතන සමාපත්තියට සමවැද එයින් නැගී ආකිඤ්චඤ්ඤායතන සමාපත්තියට සමවැද එයින් නැගී විඤ්ඤාණඤ්චායතන සමාපත්තියට සම්වැද එයින් නැගී ආකාසානඤ්චායතන සමාපත්තියට සමවැද එයින් නැගී චතුර්ථධ්‍යානයට සම්වැද එයින් නැගී තෘතීයධ්‍යානයට සමවැද එයින් නැගී විතීයධ්‍යානයට සමවැද එයින් නැගී ප්‍රථමධ්‍යානයටසමවැද එයින් නැගීමෙන් ප්‍රතිලොමය නිමවා නැවතද අනුලොමක්‍රමයෙන් විතීයධ්‍යානයට සමවැද එයින් නැගී තෘතීයධ්‍යානයට සමවැද එයින් නැගී චතුර්ථධ්‍යානයට සම්වැද නිවන්පුර වදනාවූ සද්ධර්මවරචක්‍රවර්ත්තිස්වාමිවූ භාග්‍යවත් බුදුරජානන්වහන්සේ මෙසේ සූවිසිකෙළලක්ෂයක් පමණ සමවත් සමවැදීමෙන් අන්‍යදෙශයකට යන පුරුෂයෙක් ඥාතිජනයා වැලඳගෙණ යනසේ ඒ සියලු සමාපත්තිසැප අනුභවකොට පැමිණි චතුර්ථධ්‍යානයෙන් නැගී ධ්‍යානසමනන්තරව ධ්‍යානාඞ්ගයන් ප්‍රත්‍යවෙක්ෂාකොට ඊට අනතුරුව භවාඞ්ගයට පැමිණ දුඃඛසත්‍යගත අව්‍යාකෘතචිත්තයෙන් පිරිනිවන්පෑවදාළසේක.

මේ ශ්‍රී සද්ධර්මාවවාදසඞ්ග්‍රහයෙහි මෙතෙකින් සන්තිකෙනිදාන කථාව කියා නිමවනලදී.

—:*:—

මෙසේ පිරිනිවිකල්හි ඒ පරිනිර්වාණය හා සමග මහාපෘථිවිකම්පාවීම්ආදී නොයෙක් කාරණ පහළවිය, එකෙණෙහි සහම්පතී මහාබ්‍රහ්මතෙම මේ ගාථාව කීයේය.

සබ්බෙව නික්ඛිපිස්සන්ති භූතා ලොකෙ සමුස්සයං
යථා එතාදිසො සත්ථා ලොකෙ අප්පටිපුග්ගලො
තථාගතො බලප්පත්තො සම්බුද්ධො පරිනිබ්බුතො-ති.

එකෙණෙහි ශක්‍රදිව්‍යරාජද මේ ගාථාව කීයේය.

අනිච්චා වත සඞ්ඛාරා උප්පාදවයධම්මිනො
උප්පජ්ජිත්වා නිරුජ්ඣන්ති තෙසං වූපසමො සුඛො-ති.

එකෙණෙහිම ආයුෂ්මත් අනුරුද්ධස්ථවිරද මේ ගාථාවන් වදාළසේක.

නාහු අස්සාසපස්සාසො ඨිතචිත්තස්ස තාදිනො
අනෙජො සන්තිමාරබ්භ යං කාලමකරී මුනි.

අසල්ලීනෙන චිත්තෙන වෙදනං අජ්ඣවාසයී
පජ්ජොතස්සෙව නිබ්බාණං විමොක්ඛො චෙතසො අහු-ති.

එකෙණෙහිම ආයුෂ්මත් ආනන්දමහතෙරුන්වහන්සේද මේ ගාථාව වදාළසේක.

තදාසි යං භිංසනකං තදාසි ලොමහංසනං
සබ්බාකාරවරූපෙතො සම්බුද්ධො පරිනිබ්බුතො-ති.

මෙසේ අපභාග්‍යවතුන්වහන්සේ පිරිනිවන්පෑතන්හි දසදහස් සක්වළින් රැස්වූ දෙවතාවන් සහිතවූ එසා මහපිරිසින් දෙව්නස් ප්‍රහීන නොකළබැවින් සොවාන්ශකෘදගාමිවූවන් හා පෘථග්ජනසඞ්ඝයෝ සකභාවයෙන් සිටිනට නොහැකිව යට කියනලද ක්‍රමයෙන් නානාප්‍රකාර විරූපවෙස් ගෙණ අහෝ බුදුරජ අතිසීඝ්‍රව පිරිනිවිසේක නුවණැස් ලොව අතුරුදන්වියයි යනාදී නොයෙක් අඳෝනා කියමින් හඬන්ටවන්හ, එසේම පහනොවූ රාගද්වෙෂ ඇති සමහර භික්ෂූහුද හිස අතබැඳගෙණ හඬමින් බුදුරජ පිරිනිවිසේක මෙයින් මතු අපට කවරෙක් අවවාදනුශාසනා කරන්නේද ධම්මදෙශනාකරන්නේද එහෙයින් අනාථවූ අපි මෙතැන්පටන් මනාපැහැ ඇති රන්කැඩපත්සේ සශ්‍රීකශොභාසම්පන්නවූ ශාස්තෲ මුඛමණ්ඩලය දක්නට නොලබම්හ දෙතිස්මහාපුරුෂලක්ෂණයෙන් හා අසූඅනුව්‍යඤ්ජනශ්‍රීශොභාවෙන් ප්‍රතිමණ්ඩිත ශ්‍රීසනරූපසම්පත් තිය දක්නට නොලබම්හ අහෝ බ්‍රහ්මස්වර මධුරොදාරවචන සම්පන්නවූ ධම්මදෙශනාශබ්දය අසන්ට නොලබම්හයි යනාදී වචන කියකියා හඬා වැළපුනාහුය, පහවූ රාගද්වෙෂ ඇති අනාගාමි රහත්හු සිහිනුවණින් යෙදී ඉවසීමෙන් "අනිච්චා වත සඞ්ඛාරා" යනාදී ගාථා කී ක්‍රමයෙන්ම ධර්මානුස්මරණයෙහි යෙදුනාහුය. භාග්‍යවතුන්වහන්සේ අරුණට පළමුව බලවපච්ඡූසයෙහි පිරිනිවන් පෑවදාළබැවින් පශ්චිමයාමයෙන් ඉතිරිව සිටි ඒ ස්වල්පකාලසඞ්ඛ්‍යාත රාත්‍රිශෙෂය ආයුෂ්මත් අනුරුද්ධමහතෙරුන්වහන්සේද ආයුෂ්මත් ආනන්දමහතෙරුන්වහන්සේද භික්ෂූන්ට අනිත්‍යතා ප්‍රතිසංයුක්ත ධර්මකථා පැවැත්වීමෙන් ඉක්මවන්නාහු ඇවැත්නි දෙවිබඹුන් සහිතවූ සියලු ලොව අසමවූ අප්‍රතිපුද්ගලවූ දශබලධාරීවූ වජ්‍රපර්වයක්සේ උතුම්දෙහයක් ඇති සම්‍යක්සම්බුද්ධයන්වහන්සේට පවා අයෝ

මේ බලවත් මානුෂමාර යන මරණස්වභාවය පැමුණුනේය හෙතෙම සියලු ලොව නායන්තේය ලජ්ජා නැත්තේය නොහසා නොගරණේය යනාදීවූ අනිත්‍යතායෙන් යුක්තවූ මේබඳුවූ ධර්මකථා පැවැත්වීමෙන්ම කාලාතික්‍රමණය කළාහුයි.

එසේ ඒ කථා පවත්වමින් සිටිකල්හි ඇසිල්ලකින් අරුණු නැංගේය, එකල්හි ආයුෂ්මත් අනුරුද්ධමහතෙරුන්වහන්සේ අරුණාග්‍රය දක ආයුෂ්මත් ආනන්දමහතෙරුන් කැඳවා ඇවැත්වූ ආනන්දය තෙපි ගොස් කුසිනාරානුවර මල්ලරජදරුවන්ට මෙපවත් දන්වවයි වදාළසේක, ඒ අසා ආනන්දමහතෙරුන්වහන්සේ පෙරවරුව පාසිවුරු ගෙණ තමා දෙවැනිකොට කුසිනාරානුවරට වැද එසමයෙහි සන්ථාගාර නම් සාලාවෙහි එ කටයුත්තෙන් ම රැස්වසිටි මල්ලරජදරුවන් කරා පැමිණ වාසෙට්ඨාදී මල්ලරජදරුවන්ට භාග්‍යවතුන්වහන්සේ පිරිනිවබව දන්වා තෙපි ඊට කල්දනිත්වයි වදාළසේක, ආයුෂ්මත් ආනන්දසාමීන්ගේ මේ වචනය අසා ඒ සියලු මල්ලරාජයෝද මල්ලරාජකුමරුවෝද මල්ලරාජයෙහෙලිණියෝද මල්ලප්‍රජාපතියෝද යට කියනලද ක්‍රමයෙන්ම මහත්දුකට පැමිණ හඬාවැලප අතිසීඝ්‍රව බුදුරජ අහෝ පිරිනිවසේකැයි යනාදී නොයෙක් අදෝනා කියන්නා කුසිනාරානුවර මල්ලරාජපුරුෂයන්ට අණකරන්නාහු. එසේවීනම් සියල්ලෝම සුවඳමල් ආදීයද සියලුම තූර්‍ය්‍යභාණ්ඩයන්ද සියලු තාලාවචරයන්ද රැස්කරවයි කියා පන්සියයක් වස්ත්‍රයුගලයන් හා ඒ පිරිනිවන්පැතැන කළම්නාතාක් සියලු පූජාවිධි සඳගෙණ උපවත්තනනම් සල්වනයෙහි භාග්‍යවතුන්වහන්සේගේ ශරීරයවූ තැනෙක්හිද එතනට පැමිණියාහුය එසේ පැමිණ බුද්ධශරීරයට සුවඳමල් ආදියෙන් පුදා අතිරේකතරව නෘත්‍යගීත පැවැත්වීමෙන් සත්කාර ගරුකාර බහුමාන කොට මහත්පූජා පවත්වන්නාහු විසිතුරු වෙට්ටිණාදීන් මණ්ඩලමාලය අලඞ්කාරකොට සරහා පිළියෙළකරන්නාහු මෙසේ පූජාවිධි පැවැත්වීමෙන්ම එදවස කාලාතික්‍රාන්තකළාහුය, එකල්හි කුසිනාරානුවර මල්ලරජදරුවන්ට මෙබඳු සිතිවිල්ලෙක් විය. කෙසේදයත්? භාග්‍යවතුන්වහන්සේගේ ශරීරය ආදාහනකරන්නට අදදවස අතික්‍රාන්තවගියහෙයින් නොපිළිවන සෙටදවස්හි මෙයට වැඩි අතිරේකතරවූ නෘත්‍යගීතවාදනයෙන් හා සුවඳමාලාදීන් පූජා පවත්වා ආදාහනකරම්හයි කියා මහත්පූජා පැවැත්වීමෙන් දවස ඉක්මගියහෙයින් මෙසේ දවසින් දවසට වඩවඩා පූජාසත්කාර පවත්වම්හයි කිය කියා එසේම පූජා පැවැත්වීමෙන්ම සදවසක් අතික්‍රාන්තකොට සත්වැනි දවස් පැමිණි කල්හි සියලු රටවාසී මනුෂ්‍යයෝද අනේකප්‍රකාර පූජාසත්කාරයන් හා ධජපතාකාදිය ගෙණ නොයෙක් සියලු සල්වනය අලංකාර

එකෙණෙහිම ආයුෂ්මත් අනුරුද්ධස්ථවිරද මේ ගාථාවන් වදාළ සේක.

නාහු අස්සාසපස්සාසො ඨිතචිත්තස්ස තාදිනො
අනෙජො සන්තිමාරබ්භ යං කාලමකරී මුනි.

අසල්ලීනෙන චිත්තෙන වෙදනං අජ්ඣවාසයී
පජ්ජොතස්සෙව නිබ්බාණං විමොක්ඛො චෙතසො අහු-ති.

එකෙණෙහිම ආයුෂ්මත් ආනන්දමහතෙරුන්වහන්සේද මේ ගාථාව වදාළසේක.

තදාසි යං භිංසනකං තදාසි ලොමහංසනං
සබ්බාකාරවරූපෙතො සම්බුද්ධො පරිනිබ්බුතො-ති.

මෙසේ අපභාග්‍යවතුන්වහන්සේ පිරිනිවන්පෑ කල්හි දසදහසක් සක්වළින් රැස්වූ දෙවතාවන් සහිතවූ එසා මහපිරිසින් දෙව්නාස් ප්‍රහිත නොකළබැවින් සොවාන්ශකෘදාගාමිවූවන් හා පෘථග්ජනසඞ්ඝයෝ සකභාවයෙන් සිටිනට නොහැකිව යට කියනලද ක්‍රමයෙන් නානාප්‍රකාර විරූපවෙස් ගෙණ අහෝ බුදුරජ අතිසීඝ්‍රව පිරිනිවිසේක නුවණැස් ලොව අතුරුදන්වියයි යනාදී නොයෙක් අඬදෝනා කියමින් හඬන්ටවන්හ, එසේම පහනොවූ රාගවෙෂ ඇති සඞ්ඝර භික්ෂූහුද හිස අතබැඳගෙණ හඬමින් බුදුරජ පිරිනිවිසේක මෙයින් මතු අපට කවරෙක් අවවාදානුශාසනා කරන්නේද ධර්මදෙශනාකරන්නේද එහෙයින් අනාථවූ අපි මෙතැන්පටන් මනාපැහැ ඇති රන්කැඩපත්සේ සශ්‍රීකශොභාසම්පන්නවූ ශාස්තෘ මුඛමණ්ඩලය දක්නට නොලබම්හ දෙතිස්මහාපුරුෂලක්ෂණයෙන් හා අසූඅනුව්‍යඤ්ජනශ්‍රීශොභාවෙන් ප්‍රතිමණ්ඩිත ශ්‍රීසතරූපසම්පත් තිය දක්නට නොලබම්හ අහෝ බ්‍රහ්මස්වර මධුරොදාරවචන සම්පන්නවූ ධර්මදෙශනාශබ්දය අසන්ට නොලබම්හයි යනාදී වචන කියකියා හඬා වැලපුනාහුය, පහවූ රාගවෙෂ ඇති අනාගාමි රහත්හු සිහිනුවණින් යෙදී ඉවසීමෙන් "අනිච්චා වත සඞ්ඛාරා" යනාදී යටකී ක්‍රමයෙන්ම ධර්මානුස්මරණයෙහි යෙදුනාහුය. භාග්‍යවතුන්වහන්සේ අරුණට පළමුව බලවපච්චූසයෙහි පිරිනිවන් පෑවදාළබැවින් පශ්චිමයාමයෙන් ඉතිරිව සිටි ඒ ස්වල්පකාලසඞ්ඛ්‍යාත රාත්‍රිශෙෂය ආයුෂ්මත් අනුරුද්ධමහතෙරුන්වහන්සේද ආයුෂ්මත් ආනන්දමහතෙරුන්වහන්සේද භික්ෂූන්ට අනිත්‍යතා ප්‍රතිසංයුක්ත ධර්මකථා පැවැත්වීමෙන් ඉක්මවන්නාහු ඈවැත්ති දෙවිබඹුන් සහිතවූ සියලු ලොව අසමවූ අප්‍රතිපුද්ගලවූ දශබලධාරීවූ වජ්‍රපර්‍යන්තයක්සේ උතුම්දෙහයක් ඇති සම්‍යක්සම්බුද්ධයන්වහන්සේට පවාඅයෝ

මේ බලවත් මෘත්‍යුමාර යන මරණස්වභාවය පැමුණුනේය හෙතෙම සියලු ලොව නසන්නේය ලජ්ජා නැත්තේය නොහසා නොගරණේයයි යනාදිවූ අනිත්‍යතායෙන් යුක්තවූ මෙබඳුවූ ධර්මකථා පැවැත්වීමෙන්ම කාලාතික්‍රමණය කළාහුයි.

එසේ ඒ කථා පවත්වමින් සිටි කල්හි ඇසිල්ලකින් අරුණුනැංගේය, එකල්හි ආයුෂ්මත් අනුරුද්ධමහතෙරුන්වහන්සේ අරුණාග්‍රයේදීම ආයුෂ්මත් අනන්දමහතෙරුන් කැඳවා ඇවැත්වූ ආනන්දය තෙපි ගොස් කුසිනාරානුවර මල්ලරජදරුවන්ට මෙපවත් දන්වවයි වදාළසේක, ඒ අසා අනන්දමහතෙරුන්වහන්සේ පෙරවරුම පාසිවුරු ගෙණ තමා දෙවැනිකොට කුසිනාරානුවරට වැද එසමයෙහි සන්ථාගාර නම් සාලාවෙහි එකතරයුක්තෙන්ම රැස්වසිටි මල්ලරජදරුවන් කරා පැමිණ වාසෙට්ඨාදී මල්ලරජදරුවන්ට භාග්‍යවතුන්වහන්සේ පිරිනිවබව දන්වා තෙපි ඊට කල්දන්නවයි වදාළසේක, ආයුෂ්මත් අනන්දසාමීන්ගේ මේ වචනය අසා ඒ සියලු මල්ලරාජයෝද මල්ලරාජකුමාරවෝද මල්ලරාජයෙහෙළිණියෝද මල්ලප්‍රජාපතියෝද යට කියනලද ක්‍රමයෙන්ම මහත්දුකට පැමිණ හඬාවැලප අතිසීඝ්‍රව බුදුරජ අහෝ පිරිනිවිසේකැයි යනාදි නොයෙක් අදෝනා කියන්නා කුසිනාරානුවර මල්ලරාජපුරුෂයන්ට ආඥාකරන්නාහු. එසේවීනම් සියල්ලෝම සුවඳමල් ආදිවූද සියලුම තූර්‍ය්‍යභාණ්ඩයන්ද සියලු තාලාවචරයන්ද රැස්කරවයි කියා පන්සියයක් වස්ත්‍රයුගලයන් හා ඒ පිරිනිවන්පැතැන කළම්නානාක් සියලු පූජාවිධි සදගෙණ උපවත්තනනම් සල්වනයෙහි භාග්‍යවතුන්වහන්සේගේ ශරීරය යම් තැනෙක්හිද එතනට පැමිණියාහුය එසේ පැමිණ බුද්ධශරීරයට සුවඳමල් ආදියෙන් පූජා අතිරේකතරව නෘත්‍යගීත පැවැත්වීමෙන් සත්කාර ගරුකාර බහුමාන කොට මහත්පූජා පවත්වන්නාහු විසිතුරු වෙළුම්ණාදීන් මණ්ඩලමාලය අලංකාරකොට සරහා පිළියෙළකරන්නාහු මෙසේ පූජාවිධි පැවැත්වීමෙන්ම එදවස කාලාතික්‍රාන්තකළාහුය, එකල්හි කුසිනාරානුවර මල්ලරජදරුවන්ට මෙබඳු සිතිවිල්ලෙක් විය. කෙසේදයත්? භාග්‍යවතුන්වහන්සේගේ ශරීරය ආදාහනකරන්නට අදදවස අතික්‍රාන්තවශ්‍යයෙහෙයින් නොපිලිවන සෙටදවස්හි මෙයට වැඩි අතිරේකතරවූ නෘත්‍යගීතවාදනයෙන් හා සුවඳමාලාදීන් පූජා පවත්වා ආදාහනකරම්හයි කියා මහත්පූජා පැවැත්වීමෙන් දවස ඉක්මගියයෙයින් මෙසේ දවසින් දවසට වඩවඩා පූජාසත්කාර පවත්වම්හයි කිය කියා එසේම පූජා පැවැත්වීමෙන්ම සදවසක් අතික්‍රාන්තකොට සත්වැනි දවස් පැමිණි කල්හි සියලු රටවාසී මනුෂ්‍යයෝද අනෙකප්‍රකාර පූජාසත්කාරයන් හා ධජපතාකාදිය ගෙණ නොයෙක් සියලු සල්වනය අලංකාන

කළාහුය, එසේම බ්‍රාහ්මණගෘහපතිමහාසාලයන් විසින් කරණ
ලද සත්කාරද මෙතෙකැයි කෙළවරක් නැත්තේය, දෙවතාවන්
විසින් කරණලද පූජාසත්කාරද පෘථිවිතලය පටන් බ්‍රහ්මලොකය
දක්වා අප්‍රමාණව්ය, එකල්හි කුසිනාරානුවර මල්ලරජදරුවෝ
අපි භාග්‍යවතුන්වහන්සේගේ ශරීරය නෘත්‍යගීතාදී මහත් පූජාසත්
කාර ගරුකාර බහුමාන කිරීමෙන් දක්‍ෂිණදිසාභාගයෙන් දක්‍ෂිණ
යට ගොස් ඇතුළුනුවරට නොවැද පිටතින් වඩාගෙණ ගොස් නු
වරට දකුණෙන් බුද්ධශරීරය දවම්හයි කියා නියම්කොටගෙණ ම
ධ්‍යමවයස් ඇති බලසම්පන්නවූ ප්‍රධානමල්ලරජඅටදෙ
නෙක් හිස් සෝද නාන්වස්ත්‍ර හැඳ බුද්ධශරීරය අපි ඔසවාගෙණ
යම්හයි කියා රන්වන්වූ බුද්ධශරීරය සර්වරත්නාවිභූෂිතවූ දිලියෙන
සුවර්ණපර්‍ය්‍යඞ්කය හා නඟන්නට උත්සාහකොට නොහැකිවූවාහුය
එකල්හි මල්ලරජදරුවෝ ආයුෂ්මත් අනුරුද්ධස්ථවිරයන්කරා පැමිණ
එපවත් විචාළනැන වාසෙට්ඨය තොපගේ අභිප්‍රාව අනිකෙක
දෙවතාවන්ගේ අභිප්‍රාව අනිකෙකැයි වදාළසේක, ස්වාමීන්වහන්ස
දෙවතාවන්ගේ අභිප්‍රාව කෙසේදැයි විචාළකල්හි වාසෙට්ඨය සම්බු
ද්ධශරීරය මහත්පූජාසත්කාරයෙන් ගෙණ දකුණෙන් නුවරට බාහි
රයෙන් යම්හයි සිතූ ඒ තොපගේ අභිප්‍රාවසේ නොව දෙවතාවෝ
උත්තරදිසාභාගයෙන් ගොස් උත්තරද්වාරයෙන් නුවර ඇතුළට,
වැද නුවරමධ්‍යයෙන් බුද්ධශරීරය ගෙණ ගොස් පූර්වද්වාරයෙන් නික්
ම ගොස් නුවරට පූර්වදිග මල්ලරජදරුවන්ගේ මකුටබන්ධනචෛත්‍ය
නම්වූද ශාලාවට පැමිණ එහි බුද්ධශරීරය ආදාහනකරණු කැමැත්
තේයයි වදාළසේක, ඒ ඇසූ මල්ලරජදරුවෝද එසේවීනම් වහන්ස
දෙවියන්ගේ ඒ අභිප්‍රාව ලෙසම වේවයි කියා සමසිත්වූවාහුය, එ
කල්හි කුසිනාරානුවර හැමතන්හි මල් ඇතිරියක් අතුට බිම වසා
ලූ වාසේ අහසින් වස්නාලද දිව්‍යමදාරාමල්වරුෂාවෙන් දණ පමණ
උස පිරීගියේය, ඒ සියලු නුවර වාසීවූද රට වාසීවූද මහජනසමූහ
යෝ මේ අපගේ බුද්ධශරීරයාගේ පශ්චිමදර්‍ශනයයි සිතා සුවඳමල්
ධජපතාකාදී නොයෙක්පූජා ගෙණ රැස්වූවාහුය.

ඉක්බිත්තෙන් මල්ලරජදරුවෝ අටදෙන බුද්ධශරීරය උසුලා ගෙ
ණ නික්ම යනකල්හි දෙවතාවෝද කුසිනාරානුවර මල්ලරජදරු
වෝද එසේ ගෙණ යනුලබන්නාවූ බුද්ධශරීරය දිව්‍යමයවූ මානුසික
වූ නෘත්‍යගීතවාද්‍යයන්ද මල්සුවඳ ආදියෙන්ද එකපැහැර පිදී
මෙන් මහත් සත්කාර කෙරෙමින් නුවරට උතුරෙන් ගෙණ ගොස්
උතුරුවහසල්දොරින් ඇතුළුනුවරට වැද නුවරමධ්‍යයෙන් යන්නා
හු එසේ මහත්පූජාසත්කාර වඩවඩා පැවැත්වීමෙන් සුවර්ණමණ්ඩක

යෙහි හොවා බුඩශරීරය ගෙණ යනකල්හි පෘථග්ජනදෙව්විනිස්සු ඒ දුක ස්වකීයභාවයෙන් සිටිනට අසමර්ථව හඬාවලප්නට පටන් ගත්හ, එකල්හි බන්ධුලමල්ලසේනාධිපතියාගේ භාර්‍යාවූ මල්ලිකා දෙවි තමාගේ ඒ ස්වාමිපුරුෂයාගේ කාලක්‍රියාවෙහි පටන් නොපැලඳ තුබූ විශාකාවන්ගේ මේලපලඳනාව වැනිවූ ඒ මහාලතාපලඳනාව ගෙණ මෙයින් බුදුන් පුදමි සිතා ඒපලඳනාව මැද පිරිසිදුකොට ගෙණ සුවඳපැනින් සොදාගෙණ දොරකඩ සිට එසේ බුඩශරීරය වඩාගෙණවුත් එතනට පැමිණිකල්හි ඒ බන්ධුලමල්ලිකාතොමෝ ස්වකීයපලඳනාව තමා අතින්ම පුදන පිණිස දරුවෙනි මේ සිවිණි මඤ්චකය පාත්කරවයි කියා පාත්කරවාගෙණ ඒ පලඳනාව බුඩශරීරයෙහි බහාපැලඳවූකල්හි සිරොධාතුවපටන් ශ්‍රීපතුල්දක්වා වැසී රන්වන් බුඩශරීරය සර්වරත්නාමයවූ ඒ පසාධනයෙන් පසාධිතව අතිශයින් දීප්තිමත්ව බැබලිගියේය, ඒ දුක ඉතා සතුටුසිත් ඇතිව ප්‍රාර්ථනාකරන්නාවූ ඒ බන්ධුලමල්ලිකාතොමෝ ස්වාමිවූ භාග්‍යවතුන්වහන්ස යම්තාක්කල් මම සංසාරයෙහි සෙස්සන් විසින් දක්නාලබම්ද ඒතාක්කල් උපතුපත්ජනිවල වෙන අමුතුපලඳනාවෙකින් කටයුත්තෙක් මට නොවේවයි සර්පලඳනාව පැළඳ අලඞ්කෘතවූවාක් මෙන්ම මාගේ ශරීරශොභාව ඇතිවේවයි කියා බුදුන් වැඳ ප්‍රාර්ථනාකළාය.

ඉක්බිත්තෙන් මල්ලරජදරුවෝ බුඩශරීරය උසුලාගෙණ නුවර මධ්‍යයෙන් නික්ම නුවරට පූර්වදිගින් මකුටබන්ධනශාලානම් රාජමඞ්ගල්‍යස්ථානයට පැමිණ එහි බුඩශරීරය තැබූවාහුය.

නැවත මල්ලරජදරුවෝ ආයුෂ්මත් අනඳසාමින්කරා පැමිණ ස්වාමිවූ ආනන්දස්ථවිරයන්වහන්ස බුඩශරීරයෙහි අපි කෙසේ පිළිපදිමෝදැයි විචාළාහුය, එවිට පින්වත් අනඳමහතෙරුන්වහන්සේ වදුරණසේක් වාසෙට්ඨය චක්‍රවර්ත්තිරජ්ජුරුවන්ගේ ශරීරය නාන්කසී සළුවෙන් පළමුව වෙළා එහි සියුම්ව තෙල් නොරඳනා බැවින් ගසානැගූ පුලුනෙන් දෙවනුව වෙළා නැවතත් එසේම නාන්කසී සළුවෙන් වෙළා නැවතත් එසේම පුලුන්පටින් වෙළා මෙම ක්‍රමයෙන්ම දහසක්පිළිපටින් දහසක් පුලුන්පටින් වෙළා සුවඳතෙල් පිරූ රන්දෙනක වඩා අනික් රන්දෙනකින් වසා සියලු සුගන්ධද්‍රව්‍යයන්ගෙන් චිතකය කරවා චක්‍රවර්තිරජ්ජුරුවන්ගේ ශරීරය දවන්නාහුය, එසේම වාසෙට්ඨය බුඩශරීරයෙහිද තොප විසින් පිළිපැද්ද යුතුයයි වදාළසේක ඒ ඇසූ වාසෙට්ඨාදී මල්ලරජදරුවෝ මැනවැයි ගිවිස බුඩශරීරයෙහිද ඒ කියනලද ක්‍රමයෙන් පිළිපැද රන්දෙනකට වඩාගෙණ දිගින් එක්සියවිසිරියනක් පමණවූ උසින් සත්විසිරියන්

ජමය සර්වඥධාතුද්‍රව්‍ය සම්මිශ්‍රවූ චිතකය කැර
නායෙන් රත්දෙන සහිතවූ බුද්ධශරීරය එ
ළුම්මිත්සුන්ගේ පූජාසත්කාර පැවත්වීමෙන්
යෙහි ආදාහනපූජාවට උත්සාහකරන්නාහු චි
ක් සියලු කටයුතු නිමවා සඳුන්දරසෑයෙහි
ප්‍රධානවූ මල්ලරජදරුවෝ සතරදෙනෙක්
ළු හැද ගිනි දල්වන්ට උසකාවන් දෙකක්
ණ හත් උත්සාහ කිරීමෙනුදු නොහැකි
ල්ම අටදෙනෙක සොළොස්දෙනෙක දෙ
ස් නොයෙක් මල්ලරජදරුවෝ එක්ව උල්
ණ දහස්ගණන් තල්වැට පවත්දීමෙන් කඹු
නොයෙක් ලෙසින් උත්සාහකොට චිතක
නොහැකිවූවාහුය, එකල්හි මල්ලරජදරුවෝ
රයන් තරා පැමිණ මීට කාරණ කිම්දැයි කියා
අසාධය මේ දෙවතාවන්ගේ අභිප්‍රායෙකැයි
වන්ගේ කුමන අභිප්‍රායෙක්දැයි විචාළකල්හි
ත් ආයුෂ්මත්වූ වහන්සේලා කෙරෙහි සිත්
යකකුලයෝ අසූදහසක් අසූදහසක් කුල
ව්ලොව උපන්නාහුය, එසින් ආයුෂ්මත් මහ
න්සේ කෙරෙහි සිත් පහදවාගෙණ සවර්ග
වෝ ඒ බුදුන් පිරිනිවීතැනට රැස්වූ සඞ්ඝප
සමාගමයෙහි තමන්ට කුලුපගවූ ඒ මහතෙ
න්හි වසනසේක්දෝහෝයි බලත්නාහු හි
නික්ම පාවානම් නුවරට වැඩ පිඩුසිගා වලඳ
රිවර පන්සියක්දෙනාවහන්සේ හා වඩනා
ග මහතෙරුන්වහන්සේ මෙහි පැමිණ බු
මුත් චිතකයෙහි ගිනි නොදල්වෙව්වයි කියා
ව වදාළසේක, මල්ලරජදරුවෝ ඒ අසා වහන්
ාභිප්‍රාය ලෙසම වේවයි දැන්වූවාහුය, අනෝ
න්වහන්සේ පන්සියයක් භික්ෂූන් පිරිපිරාගෙ
ත්ගේ පා වඳිමි කියා මග වඩනාසේක් උන්
න් කල්හි චිතකයෙහි ගිනි දල්වායත නො
නුභාව සම්පන්න භික්ෂූන් සිටිකල්හි දශබල
වදැයි කියා සමහරු සුවඳමිලාදින් ගත් අත්
ථාවූය සමහරු වීථිමාර්ග විසිතුරුව සදා වඩ
ථාවූය, එකල්හි ආයුෂ්මත් මහාකාශ්‍යපස්ථ
විනාරානුවර මකුටබන්ධනශාලානම් චෛත්‍ය

යට පැමිණ චීවරය ඒකාංශකොටගෙණ ඇඳිලිබැඳ චිතකයවට තුන්විටක් ප්‍රදක්ෂිණකොට ඒ ප්‍රදක්ෂිණකෙරෙමින්ම සිට ශ්‍රීපාදයන් මේ ස්ථානයෙහියයි සලකාගෙණ මහතෙරුන්වහන්සේ අභිඥපාදක චතුර්ත්ථධ්‍යානයට සමවැද එයින් නැගී චක්‍රලක්ෂණප්‍රතිමණ්ඩිතවූ බුදුන්ගේ ශ්‍රීපාදයෝ කප්පාසපටලයන් හා දහසක්පළිපට රත්දෙන සඳුන්දරසැය යන මේ සියල්ල දෙබෑකොටගෙණ මාගේ හිස්මුදුන්හි පිහිටත්වයි අධිෂ්ඨානකළසේක් ඒ චිත්තය හා සමගම පිළිපට ආදී සියල්ල දෙබෑකොටගෙණ වලාකාන්තරයෙන් උදාවූ පූන්සඳක්සේ ශ්‍රීපාදයෝ පිටතට නික්මුණාහුය, එකල්හි මහතෙරුන්වහන්සේ සුපිප්පරක්තොත්පලපියුම්දෙකක් වැනි හස්තයන් දිගුකොට රන්වන්වූ බුදුන්ගේ ශ්‍රීපාදවල ගොප්මස දෘඩකොට අල්වාගෙණ තමන්වහන්සේගේ හිස්මුදුන්හි පිහිටුවාගෙණ මාගේ ස්වාමිවූ ලෝකනායකයන්වහන්ස මේ ශ්‍රීපාදවලින් පෙර තුන්ලෝදුන් මහ ගෙවා මට පෙරගමන් වැඩිසේක දූන් මෑතාවශෙෂව වැඩසිට පවා මට පෙරගමන් කළසේක අහෝ මෙසේ මට අනුකම්පා ඇති භාග්‍යවතුන්වහන්ස මේ ඔබවහන්සේගේ පශ්චිමශ්‍රීපාදදර්ශනය මේ මාගේ පශ්චිමවන්දනාවයයි කියා නැවත නැවත උත්තමාඞ්ගයෙන් ශ්‍රීපාදසංඝනයකොට පන්සීයක්දෙනාවහන්සේ හා ශ්‍රීපාදයන් වැද සතුතිකොට බුදුන්ගේ රූපය වර්ණනාකරණසේක්.

ඔස්සිරීකතරෝ නාථෝ කෙතුමාලායලඞ්කතො,
දක්ඛිණාවත්තකෙසොසි නීලාමලසිරොරුහො,

යනාදී ගාථා සියයකින් රූපය වර්ණනාකොට මහතෙරුන්වහන්සේ වැදිකල්හි ශ්‍රීපාදයෝ රත්දෙන ඇතුළට වැද යථාස්ථානයෙහිම පිහිටියාහුය, ඒ ආශ්චර්ය්‍යය දක එහි රැස්ව සිටි සියලු භික්ෂූහුද සතුටුව නමස්කාරකළසේක්ලාය, මහජනසමූහයාද එකප්‍රහාරයෙන් නාද පවත්වා සුවඳමල් ආදීන් පූජාකොට නමස්කාරකළාහුය, එකල්හි භාග්‍යවතුන්වහන්සේගේ චිතකය තෙමේම ගිනි දල්වීගියේය, එකෙණෙහි කුමුදෝත්පල පුණ්ඩරීක සෞගන්ධිකාදිවූ කුසුමයෝ ආකාශයෙන් චිතකය පිට වැටුනාහුය, මේ ආදී නොයෙක් ආශ්චර්ය්‍යයෝ පහළවූහ; ආදෘශභාවත්නාවූ භාග්‍යවතුන්වහන්සේගේ ශරීරයෙහි කිසිවෙකත් අළු නොපෙණුනේය පූර්වයෙහි එකඝනවූ ශරීරය භාග්‍යවතුන්වහන්සේගේ අධිෂ්ඨානවශයෙන් දැසමන්කැකුළුමෙන්ද ශුද්ධමුතුමෙන්ද විසිරගියාහුය, දීර්ඝායුෂ්කබුදුන්ගේ ශරීරය රන්කඳක්මෙන් එකඝනවන්නේය අපභාග්‍යවතුන්වහන්සේ අල්පායුෂ්කවූයින් ලෝකානුකම්පා පිණිස මෙසේ සිතාව

දළසේක මම නොබෝකලක් සිට පිරිනිවන්පාම් මාගේ ශාසනය මෙපමණකින් හැමතන්හිම විස්තාරනොවූයේය එහෙයින් පිරිනිවන්පාතා මාගේ ධාතු විසිරයෙත්වා යමෙක් සර්ෂපමාත්‍රවූ ධාතුව කුදු ගෙණ චෛත්‍ය කොට පිදුයේවීනම් ඔහට ස්වර්ගෝත්පත්තිය වන්නේයයි සිතා ධාතු විසිරෙණසේ අධිෂ්ඨානකළසේක.

කෙතෙක් ධාතු විසිරගියාහුද? කෙතෙක්ධාතු විසිර නොගියාහුදයත්?

සතරදන්තධාතුය දෙඅකුධාතුය ලලාටධාතුයයි යන මේ සත් ධාතූහු විසිර නොගියාහුය සෙසුධාතූහු විසිරගියාහුය' එහි හැමට කුඩාධාතු සර්ෂපමාත්‍රවී මධ්‍යමධාතු කඩසාල්පමණවී මහත්ධාතු මුංපියලි පමණවී සිටියාහුය, එකල්හි චිතකයෙහි ගිනි සන්හුන එකල ආකාශයෙන් හා පොළොවින් ජලධාරාවෝ ප්‍රාදුර්භූතවූහ චිතකය පිරිවරා සිටි ශාලවෘක්ෂයන්ගේ ශාඛාන්තරයෙන් උදකධාරා නික්මුණාහුය කුසිනාරානුවර මල්ලරජදරුවෝද රත්කළ ර්දීකළ පුරාගෙණ සුවඳපැන් වත්කිරීමෙන් වහනචිතකයෙහි ගිනි නිවූවාහුය.

ඉක්බිත්තෙන් මල්ලරජදරුවෝ තමන්ගේ නුවරමැද සන්ථාගාරයෙහි සිව්දැනඳින් පිරිබඩගෙණ ලදපස්මල් ඉස රන්තරු රිදීතරු වෙන් විචිත්‍රවූ වියන් බැඳ මල්දම් රන්දම් රුවන්දම් එල්වා වට තිර ඇද සන්ථාගාරයෙහි පටන් බුදුන් ආදහනකළ ඒ මකුටබන්ධනනම් චෛත්‍යය දක්වා දෙපෙළ තිර ඇද අහස වියන් බැඳ ධජපතාකා නන්වා දෙපෙළ රත්කලස් තබ්බවා අඩුවැටපහන් නගා අලංකාරවූ හස්තිස්කන්ධයෙහි ධාතුසහිත රන්දෙන තබා සුවඳින් මලින් පූජාකොට මහත් උත්සවක්‍රීඩා කෙළිමින් දෙව්නුවරක් වැනි තමන්ගේ ඇතුළුනුවරට වැද සන්ථාගාරමධ්‍යයෙහි සප්තරත්නමය පර්යංකයෙහි ධාතු වඩා මත්තෙහි සේසත් නංගා කඩු ගත් යොධයන් පදනම වසා උරෙන් උර ගසා සිටුවා එයින් පිටත කුඹින් කුඹගසා ඇත්පෙළක් සිටුවා ඒ වටා කණින් කණ ගසා අශ්වයන් පෙළක් සිටුවා ඒ වටා සකින් සක ගසා රථපෙළක් සිටුවා එයින් පිටත උරෙන් උර ගසා යොධසෙනඟක් සිටුවා එයින් පිටත පෙළින්පෙළ ගසා දුනු ගත් සෙනඟක් සිටුවා මෙසේ වට යොදනක් මාණයෙහි සන්නාහගයනින් වැසුවාසේ අතුරක් නොදී සතුරන් නිසා රැකවල් ගත්හ.

මෙසේ මල්ලරජදරුවෝ ධාතුවලට රැකවල් ගන්වා උත්සවකෙළි කෙළිමින් මහත්පූජාවට පටන්ගත්තාහුය, එකල්හි රජගහනුවර අජාසත් රජ්ජුරුවෝ එපවත් ඇසූහ. කෙසේ ඇසූදයත්?

පළමුවෙන් අමාත්‍යයෝ බුදුන් පිරිනිවිබව අසා පෘථග්ජන ශ්‍රද්ධාවන්තයන්ගෙන් අපගේ රජ්ජුරුවන්ට වඩා බුදුන්කෙරෙහි ප්‍රෙම ඇති රජෙක් නැත මෙපවත් රජහට මේලෙසම කීවොත් හෘදය පැලී නැසෙන්නේයයි සිතා ඔරුතුණක් ගෙන්වාගෙණ චතුමධුරයෙන් පුරවා රජ්ජුරුවන්කරා ගොස් දෙවයන්වහන්ස ඔබවහන්සේට නපුරුවූ කාරණයක් දුටුම්හ ඒ නපුර අසාපියන පරිද්දෙන් සුදුකඩක් හැඳ නාසය හා කන්සිදුරු නොගැලෙනසේ තෙල ඔරුවෙහි ගැලීහොත් මැනවැයි කීවාහුය, එකල්හි රජ්ජුරුවෝ අමාත්‍යයන්ගේ වචනය අසා මැනවැයි පිළිගෙණ පළමුවන ඔරුවෙහි ගැලීහොත්කල එම ඇමති හිසකේ විදා පිට හෙලා අවමඟුල්වෙසක් ගෙණ රජ්ජුරුවන් පෙරටව සිට ඇඳිලිබැඳ රජ්ජුරුවන්වහන්ස ලොකනායකවූ අපඃඝාගෞතම බුදුහු කුසිනාරානුවරදී පිරිනිවන් පෑවදළසේකැයි කීවාහුය, රජ්ජුරුවෝ ඒ බස කණ හුනුවේලෙහි දෙකණ ගැසූ යහුල්දෙකක්සේ වෙවුලාගොස් බුදුන්කෙරෙහි උපන් ශොකාග්නියෙන් මූර්ඡාවූහ, රජ්ජුරුවන්ගේ සර්වාංගය රත්කරපු යකඳක්සේ කකියා ඔරුව පිරූ සිහිල් චතුමධුරය කකියවාපූ ලෝදියසේ සුරුසුරු යන අනුකරණ දක්වා හුණුවගියහ, එවේලෙහි අමාත්‍යයෝ රජ්ජුරුවන් ඒ ඔරුවෙන් ඔසවා දෙවෙනිඔරුවෙහි හොවාලූහ, එවේලෙහි රජ්ජුරුවෝ ශීතලෙහි ගැලීමෙන් සිහිඑලවාගෙණ අමාත්‍යයන් අතින් දරුවෙනි තොප කීවේ කුමක්දැයි විචාළහ, නැවතත් අමාත්‍යයෝ කියන්නාහු හිමි තොපගේ බුදුහු පිරිනිවන්පෑවදළසේකැයි කීවාහුය, ඒ අසා රජ නැවතත් විසංඥව ඒ ඔරුවද හුණුකෙළේය, නැවත අමාත්‍යයෝ රජ්ජුරුවන් තුන්වන ඔරුවෙහි හොවාලූහ, එහි ගැලී ආශ්වාද ලදින් නැවතත් ඇමතියන් අතින් දරුවෙනි තොප කීබස් කුමක්දැයි විචාළේය, දෙවයන්වහන්ස බුදුහු පිරිනිවන්පෑහයි කීවාහුය, ඒ අසාද රජ විසංඥවිය එවේලෙහි අමාත්‍යයෝ රජ්ජුරුවන් ඔසවාගෙණ පැන් සොළොස්කළයකින් ඉස් සෝදා නාවා සිංහාසනමස්තකයෙහි හිඳුවාලූහ, එවේලෙහි රජ්ජුරුවෝ ආශ්වාද ලදින් සුවඳ කවනලද මණිවර්ණිතිසකේවැටිය රන්පෝරුවක් වැනි පිටමැද හෙලාගෙණ ප්‍රවාලාඞ්කුරවැනිදෑතින් සියලෙහි පැහැර මතැතෙකුසේ මහහඬින් ගුගුරා වියරුහුණු පුරුෂයෙකුසේ අනතරවීපියට බට්කල්හි නාටකස්ත්‍රීහුද තථාගතවියොගයෙන් ශොකාතුර රජහුගේ විප්‍රකාරය දැක කම්පාවූ සිත් ඇතිව කඳුලෙන් තෙමියිය මුහුණු ඇතිව අඬමින් වලපමින් රජ්ජුරුවන් සමග නික්මුණාහුය, එකල්හි රජ්ජුරුවෝ නාටකස්ත්‍රීහු පිරිවරා නුවරින් නික්ම පළමුකොට වෙළුවනාරාමයට ගොස් මාගේ බුදුහු මියිකත ගුගුරුවා පළමුව පිළිගත් වෙහෙ

රයයි කිය කියා එතන හිඳ අඩා එයින් නැගී ජීවකාරාමයට ගොස් එහි තමන් පලමුව බුදුන් දුටු පැණ විචාළ ගඳකිළියට වැද එතන් හිදී අඩා එයින් නැගී ධම්මශාලාවෙහි බුදුන් වැඩහුන් බුද්ධාසනය වැලඳගෙණ වලප්නේ ස්වාමිනි භාග්‍යවතුන්වහන්ස මේ ස්ථානයෙහි වැඩහිඳ මට ධර්‍මදෙශනාකළසේක දෙශනා නැමැති නිර්‍මල සීතලොදකයෙන් මාගේ ශොකාග්නිය දුරුකළසේක ඔබවහන්සේගේ ධර්‍මදෙශනායෙන් මාගේ සොකසල්‍යය හැරියසේක ඔබ සරණගියාවූ මට කිසි වචනයක් නොවදාරන්නේ කවරේද? සෙසුදවස ඔබවහන්සේ භික්ෂුසඞ්ඝයා පිරිවරා දඹදිව සැරිසරා වඩිනා බව අසම් දුන් මම ඔබවහන්සේට නුසුදුසු අයුක්තප්‍රවෘත්තියක් ඇසීම් යනාදින් ගාථා සැටකින් භාග්‍යවතුන්වහන්සේගේ ගුණ කියා වැලප නැවත සිහි එලවාගෙණ දුන් මා හැඬීමෙන් කම්.නැත බුදුන්ගේ ධාතු ගෙණ බුදුන් දුටුවාසේ පුදම් සිතාලා මාගේ බුදුහු කොසීදී පිරිනිවිසේක් දැයි විචාරා කුසිනාරානුවරදීයයි අසා මාගේ බුදුන්ගේ ධාතු බලයෙන් ගෙණවුත් පුදම් සිතාලා එකෙණෙහිම රජගෙට දෙවෙනිව නොවැද අටළොස්කෙළක් පමණ මහසෙනග ගෙණ ලක්‍ෂගණින් ඇත්අස්ඇති රථඇති බලඇති ගෙණ මහමුහුදින් දිව් මහරළපෙළක්සේ දුරුමන ගෙවා දිව කුසිනාරානුවර කඳවුරුබැඳ හිදගත්හ.

තවද මෙපවත්අසා විශාලාමහනුවර සත්දහස්සත්සියදෙනෙකු පමණ ඇති ලිච්ඡවිරජදරුවෝද තමතමන්ගේ බලපිරිස් ගෙණ එසෙයින්ම දිවගොස් එම නුවර පිරිවරා හිඳගත්හ,මෙසෙයින්ම කිඹුල්වත්පුරයෙහි ශාක්‍යරජදරුවන් හා මහසෙනඟය අල්ලකප්ප නම් නුවර රජුන් හා මහසෙනඟය රාමනම් නුවර කොලියරජදරුවන් හා මහසෙනඟය වෙඨනම් නුවර රජදරුවන් හා මහසෙනඟය පාවෙය්‍ය නම් නුවර රජදරුවන් හා මහසෙනඟයයි මෙසේ සත් රාජ්‍යයෙක සත්සෙනඟක් හා රජදරුවෝ දිවගොස් නුවර සිසාරා සිටගෙණ ධාතු අපට එවන්නේය අපට එවන්නේයයි වෙනවෙනම වාසි කියා වහා යුඬකරන්නේය ධාතුහෝ අපට දෙන්නේයයි කියා ඉල්වත්නාහුය, එබස් අසා මල්ලරජදරුවෝ කියන්නාහු අපගේ නුවරදී පිරිනිවන්පෑවමැනවැයි කියා අපි බුදුන්ට ආරාධනාකළේත් නැත බුදුහු තමන්වහන්සේම අපගේ නුවරට වැඩ පිරිනිවිසේක තමතමන්ගේ නුවර යම් යම් රුවණෙක් උපන්නේනම් තමතමන්ට හිමිනියාසේම අපගේ නුවර උපන්නාවූ ධාතුරත්නය අපටම හිමිය තොපි කිරි බොනදූ අප් මෝරු නොපුම්භ තොපගේ මතු නොවෙසි අපගේත් ඇත්අස්රථබලසෙන් ඇත තොපගේ මතු නොවෙසි අපගේත් කඩු මුවහත් ඇතැයි යනාදීන් මත්වඩනා වහසිබස් කියා කලහ වැඩූහ.

ඉදින් යුඬවීනම් සත්නුවරක් තබා දඹදිව තෙසැටදහසක් රාජධානිවල රජසෙනඟ ආවත් ධාතු තුබූ නුවරහෙයිනුත් ලක්‍ෂගණන් රහතුන්ගේ අධිෂ්ඨානබලය ඇතිහෙයිනුත් සියලු දෙවතාවන්ගේ ආරක්‍ෂාබල ඇතිහෙයිනුත් කුසිනාරානුවර මල්ලරජහුම් ජයගණිත්මය.

එසම්යෙහි දඹදිව සියලු රජදරුවන්ට ශිල්පදුන් රාජගුරුවූ බිදිසෙන්වූවත් සමගිකිරීමෙහි කැමතිවූ ද්‍රොණනම් බ්‍රාහ්මණ ආචාර්‍ය්‍යතෙම කුසිනාරානුවර වසන්නේය හෙතෙම ඔවුන්ගේ විවාදය අසා මේ රජදරුවෝ භාග්‍යවතුන්වහන්සේ පිරිනිවන්පෑතැනදී කලහකරගත්තාහුනම් සුදුසු නොවන්නේය එහෙයින් මම මේ විවාදය සංහිඳුවම්යි සිතා සංග්‍රාමභූමියට ගොස් උන්නතස්ථානයක සිට මහත්ශබ්ද පවත්වා බණවර දෙකකින් ද්‍රොණගර්ජිතානම් ගර්ජිතාවක් කෙළේය, එහි පළමුවෙනි බණවරෙහි එකපදයකුත් නොඇසූවාහුය දෙවෙනිබණවර අන්තයේදී ඒ ශබ්දය අසා තෙල ඇසෙන්නේ අපගේ ආචාරීන්ගේ ශබ්දය නොවේදැයි කියා සියල්ලෝම නිශ්ශබ්දවූහ, එකල්හි මෙසේ කීයේය.

සුණන්තු භොන්තො මම එකවාක්‍යං
අම්හාකං බුද්ධො අහු ඛන්තිවාදෙ
න සාධු යං උත්තමපුග්ගලස්ස
සරීරභාගෙ සියා සම්පහාරො.

සබ්බෙව භොන්තො සහිතා සමග්ගා
සම්මොදමානා කරොමට්ඨභාගෙ
විත්ථාරිතා හොන්තු ජිනස්ස ථූපා
බහුජ්ජනා චක්ඛුමතො පසන්නා-ති.

මෙසේ ද්‍රොණබ්‍රාහ්මණතෙම කියනුයේ පින්වත්නි බුදුන් උදෙසා ඔවුනොවුන් හා යුඬ නොකරව බුදුහුනම් ක්‍ෂාන්තිවාදිසේක සියලු සතුන්ට සාධාරණසේකැයි යනාදීන් බණ කියා ගිවිස්සූයේය, ඒ අසා රජදරුවෝ සතුටුව එසේවිනම් ආචාරීනි තොපිම භාග්‍යවතුන්වහන්සේගේ ධාතු අටකොටසක් කොට බෙදුව මැනවැයි කීවාහුය, ද්‍රොණබ්‍රාහ්මණද රජදරුවන්ගේ ඒ වචනය අසා මැනවැයි කීයේය.

මෙපමණකින් භාග්‍යවතුන්වහන්සේගේ අභිප්‍රාවය සම්බන්ධවිය. කවර අභිප්‍රායෙක්දයත්? ත්‍රිවිධකාරණවක් නිසා බුදුහු කුසිනාරානුවරට මහොත්සාහයෙන් වැඩිසේක. හේ කවරේදයත්? භාග්‍යවතුන්වහන්සේ අතික්තෙනකදී පිරිනිවන්පෑකල්හි මහාසුදශීනසූත්‍ර

ය දෙසීමට අනෝතප්තහි නොවන්නේය කුසිනාරානුවරදී පිරිනිවන්පානාකල්හි දෙව්ලොවදී විඳියුතුවූ සම්පත්තියක් මිනිස්ලොවදී විඳපුබව ප්‍රකාශවූ බණවර දෙකකින් ප්‍රතිමණ්ඩිතවූ මහාසුදර්ශනසූත්‍රය දෙශනාකරමි ඒ දෙශනාව අසා බොහෝ ජනයෝ කුශලය නම් කටයුතුදෙයෙකැයි සිතන්නාහුය යන මේ එක්කාරණයෙක, අතික්‍රාන්තකදී පිරිනිවිකල්හි සුභද්‍රයා මා නොදක්නේය හෙතෙම බුද්ධවෛනෙයපුද්ගලවන්නේය ශ්‍රාවකයන්විසින් විනයනයකරන්ට නොහැක්කේය කුසිනාරානුවරදී පිරිනිවන්පානාකල්හි හෙතෙම මාකරා අවුත් ප්‍රශ්න විචාරා විසර්ජනාවසානයෙහි ශරණයෙහි පිහිටා මා සමීපයෙහි පැවිදිව උපසම්පදා ලදින් කර්මස්ථාන ගෙණ මා ධරමානකල්හිම රහත්බවට පැමිණ පශ්චිමශ්‍රාවකවන්නේයයි යනුද එක්කාරණයෙක, තවද අතික්‍රාන්තවරකදී පිරිනිවන් පෑකල්හි ධාතුබෙදීම නිසා මහත් කලහයක්ව ලොහිතනදීව පවත්නේය කුසිනාරානුවරදී පිරිනිවිකල්හි ද්‍රොණබ්‍රාහ්මණතෙම ඒ විවාදය සංසිඳුවා ධාතු බෙදාදෙන්නේයයි යන මේ ත්‍රිවිධකාරණවත් දැකවදාරා භාග්‍යවතුන්වහන්සේ මහොත්සාහයෙන් කුසිනාරානුවරටම වැඩිසේක, එකල්හි ද්‍රොණබ්‍රාහ්මණයාගේ වචනය අසා රජදරුවන්ගේ විවාදය සංසිඳිගියකල මේ ත්‍රිවිධකාරණවෝම සම්බන්ධවූවාහුය.

ඉක්බිත්තෙන් ද්‍රොණබ්‍රාහ්මණතෙම සමගිවූ රජදරුවන්ගේ මධ්‍යයෙහි සිට ධාතු වැඩූ රන්දෙනාය හැරියේය එකල්හි රන්වන්රශ්මීහු දිළිහිදිළිහී නික්මුණාහුය,ඒ දැක රජදරුවෝ විෂමයපත්ව කම්පාවූ සිත් ඇතිව කඳුළුධාරාවෙන් තෙමිගිය මුහුණු ඇතිව දෑහොත්මුදුන්දී සිට කියන්නාහු ස්වාමීවූ බුදුරජානන්වහන්ස පෙර ඔබවහන්සේගේ දෙතිස්මහාපුරුෂලක්ෂණයෙන් ප්‍රතිමණ්ඩිතවූ සවණක්රැසින් දිළිහෙන රන්වන්වූ ශරීරය දුටුම්හ දැන් වනාහි රන්වන්ධාතුහු අවශිෂ්ටවූවාහුය ස්වාමීනි මේ ඔබවහන්සේට සුදුස්සෙක් නොවෙයි කියා අඬාවැලපුනාහුය, එකල්හි ද්‍රොණබ්‍රාහ්මණතෙම ඒ රජදරුවන්ගේ කිසිප්‍රමාදයක්බලා දකුණුදළදාවහන්සේ සොරාගෙණ හිස්වෙළුම්හි සඟවා තිබූයේය එවේලෙහි සක්දෙව්රජ සියලු සතුන්ට ධර්මදෙශනාකළාවූ මුඛයෙහි ජාත දන්තධාතුවට පූජාකරන්ට මේ බමුණු සුදුසු නොවන්නේයයි සිතාලා සූක්ෂ්මවූ අතක් මවාගෙණ දන්තධාතුව ඔහු හිසින් සොරා ඇරගෙණ රුවන්කරඬුවකට වඩා ශක්‍රපුරයට ගෙණගොස් සිළුමිණි සෑයට වඩා අදදක්වාම පූජාකරන්නේය.

ඉක්බිති බමුණු ධාතු අටකොටසක් කොට මගධනැළියෙන් දෙනැළිය දෙනැළිය බැගින් අටද්‍රොණයක් ධාතු රජදරුවන්ට බෙදාදී

පසුව ඉස අතගාබලා දළදා නොදැක ශෝකකොට මටත්වඩා සොරෙක් ඇරගතැයි සිතා ලජ්ජාවෙන් කාටත් නොහඟවා ධාතු මිනූ ලාසය රජදරුවන්ට කියා ඉල්වාගත්තේය, එකල්හි පිප්ඵලිමෝර්ය රජදරුවෝද බුදුහු කුසිනාරානුවරදී පිරිනිවන්පෑබව අසා පළමු රජදරුවන් මෙන් යුද්ධයට සැරහී අවුත් ධාතු බෙදූගත් ප්‍රවෘත්තිය අසා තමන් පසුව ආ හෙයින් කිසිවකුත් කියාගත නොහී ආදහන ස්ථානයේ අඟුරු හැරගෙණ ගියාහුය.

මෙසේ ධාතු බෙදූ ඉක්බිත්තෙන් අජාසත්රජ්ජුරුවෝ තමන්ගේ ධාතු කොටස ගෙණ ඒ කුසිනාරානුවර පටන් රජගහනුවරට පස්විසියොදුන් මාර්ගය පුළුල අටඉස්බක්තැන් හෙර්තලයක්සේ තනා අන්තරන්තරයෙහි විචිසල්පිල් සඳු බුදුන්ගේ ධාතු සත්රුවන් මඩුවකට වඩා තමන්ගේ ආඥාක්ෂෙත්‍රයෙහි මනුෂ්‍යයන් රැස්කොට නොයෙක් ලෙසින් ධාතුපූජා කොට රන්රථයෙන් වඩාගෙණ ගොස් සත්හවුරුදු සත්මස් සත්දවසකින් රජගහනුවරට වැද මහත්වූ දාගබක් බඳවා එහි ධාතු වඩා ශක්තිපමණින් පූජාකළාහුය, සෙසුරජදරුවෝද තමතමන් ලත් ධාතුකොට්ඨාසයන් යථාශක්තීන් පූදපූද තමතමන්ගේ නුවරවලට ගෙණගොස් වෙනවෙනම දාගැබ් බඳවා මහත්වූ පූජාකළාහුය, ද්‍රෝණනම් බමුණානෝද ධාතු මිනූ කුරුණිය ගෙණ තමන්ගේ නුවර කුම්භනම් දාගබක් බඳවා තමන් ධන පමණින් පූජාකළාහ, පසුව ධාතු සොයා ආ පිප්ඵලිමොලිය නම් දෙනුවර රජදරුවෝ ධාතු නොලදින් මේ අපට ධාතුයයි ආදහනභූමියෙහි රැස්කොට තිබූ අඟුරු රන්කරඬුයෙන් වඩා මහපෙරහර්න් ගෙණගොස් අඞ්ගාරකුම්භථූපනම් දාගබක් බඳවා තමන් ශක්තිපමණින් පූජාකළාහුය.

කීයේමැනෝ.

එකො ථූපො රාජගහෙ එකො වෙසාලියං පුරෙ,
එකො කපිලවත්ථුස්මිං එකො ච අල්ලකප්පකෙ.

එකො ථූපො රාමගාමෙ එකො ච වෙඨදීපකෙ,
එකො පාවෙය්‍යකෙ මල්ලෙ එකො ච කොසිනාරකෙ.

එතෙ සාරීරිකා ථූපා ජම්බුදීපෙ පතිට්ඨිතා,
අඞ්ගාරකුම්භථූපම්හි දසථූපා භවන්තිමෙ.

දසථූපකථා නිමි.

——:x:——

මෙසේ මේ දසථූපයන් පිහිටියාපින් පසු මහාකාශ්‍යපස්ථවිරයන් වහන්සේ ධාතුවලට මත අන්තරාවන් දැක අජාසත්මහරජ හට දැන්

වූ කල්හි ඒ රජහු විසින් රජගහනුවර කරණලද අනෙකප්‍රකාර විසිතුරු කර්මාන්තයෙන් නිර්මිතවූ මහාධාතුනිධානකථාවෙහි විභාගද අපබුදුන් පිරිනිවි දෙසියඅටළොස්වන්නෙහි සකල ජම්බුද්වීපයෙහි එකච්ඡත්‍රනංවා රාජශ්‍රී ලත් මහානුභාවසම්පන්නවූ ධර්මාශොක රජහුවිසින් කරවනලද අසූසාරදහසක් චෛත්‍යකථාවන්ද එයින් මෑතභාගයෙහි ලක්දිව රජපැමිණි දෙවෙනිපෑතිස්ස දුටුගැමුණු නරවරාදීන් විසින් කරවනලද අනුරාධපුරයෙහි මහාචෛත්‍යාදි කථාවන්ද ථූපාවංශයෙහි ප්‍රකාශක්‍රමයෙන් බලා දතයුතු.

ලෝවැඩ පිණිස කරණලද මේ ශ්‍රීසද්ධර්මාවවාදසඞ්ග්‍රහයෙහි අපබුදුන්ගේ ස්කන්ධපරිනිර්වාණකථාව කියා නිමවනලදී.

## මතු වන ධාතුපරිනිර්වාණකථාව කෙසේදයත්?

සද්ධර්මගුණවර්ණනාපරිච්ඡේදයෙහිද සඞ්ඝගුණවර්ණනාපරිච්ඡේදයෙහිද දක්වනලද ක්‍රමයෙන් පර්‍ය්‍යාප්තිප්‍රතිපත්ති ප්‍රතිවේධ යන ත්‍රිවිධශාසනයම අන්තර්ධානවූකල්හි වෙසහමැදිපොහෝලද වෛශාඛයොගය යෙදුනුදවස් සියලු මේ ශ්‍රීලඞ්කාද්වීපයෙහි මහියඞ්ගනාදිවූ සුවහස්ගණන් මහදාකුස්වල පිහිටි නොයෙක් ධාතූන්වහන්සේ එක්ෂණයෙහිම ඒ ඒ දාකුස් හැර ආකාශයට පැනනැගී ගමන්ගත් නැකත්තරුපෙළක්සේ අනුරාධපුරයෙහි රුවන්වැලිමහසෑකුස දුටුගැමුණුරජ්ජුරුවන් කරවූ අසූරියන් මහාධාතුගර්භයෙහි මැද පිහිටුවූ කෙළක් අගනා රත්නමය යහන්හි පස්පැලක් පමණ ධාතූන්වහන්සේ හා එකතැනට පැමිණෙන්නේය. එකල් දක්වා ඒ දාකුස නැගූ සිංහතෙල්පහන් නොනිවීතිබී එදවස් ඒ පහන්ද නිවියෙයි, එවේලෙහි සියලු ලක්දිව ධාතූන්වහන්සේ එතැනින් අහස්කුසට පැනනැගී එකතුයක අමුණලු මුතුඇට පෙලක්සේ ඔවුනොවුන් පසුපස්සෙහි නික්ම මතිනාගදිවයින එදවස් දෙමිසිල් නාරජුන්ගෙන් පිළිගෙණ අපබුදුන් වැඩහිඳ බණ දෙසූ මිණිපලඟ මතුයෙහි රැස්වන්නේය, එයින් නොයෙක් කෙළගණන් දිව්‍යනාගරාජයන්ගෙන් පූජා ලදින් ඒ මිණිපලඟ හා සමග ආකාශයට පැනනැගී ගොස් බෝමැඩ අපබුදුන් මරසෙන් බිඳ බුදුවූ අපරාජිතභූමියට බස්නාසේක, එකෙණෙහි දිව්‍යලොක බ්‍රහ්මලොක නාගලොකාදී ඒ ඒ තන්හි පිහිටි ධාතූන්වහන්සේද අවශෙෂවූ ඒ ඒ කොදෙව්වල පිහිටි ධාතූන්වහන්සේද දඹදිව දශථූපාදී ඒ ඒ රාජධානිවල පිහිටි ධාතූන්වහන්සේද ඒ ඒ තැනින් පැනනැගී පියුම්විලක්කරා දිවන රාජහංසසමූහයක්සේ බුදුන්ගේ පශ්චිමදර්ශනනැමති මෙඝකාලයෙහි ගුවන්කුස පැනනැගී දිවන බලාකාපඞ්ක්ති,

යන්සේ ආකාශයෙන් බැස බෝමැඩ එම ධාතූන්වහන්සේ හා එක්වනසේක, එකල බුදුවූදවස්සේම පොළොව පලාගෙණ තුදුස්රියන් වජ්‍රාසනයෙක් පැනනැගී ඒ ධාතු පිළිගත්තේය එවේලෙහි සියලු ධාතූන්වහන්සේම ජීවමානවූ බුදුන්ගේ රූපය මවා ලලාටධාතූන්වහන්සේ ලලාටයෙහිම පිහිටනසේක, ඒ මතුයෙහි ඌර්ණරෝම ධාතූන්වහන්සේ පිහිටනසේක; අකුයෙහි අකුධාතූන්වහන්සේ පිහිටනසේක, සතරදළදාවහන්සේ සතරදන්තස්ථානයෙහිම පිහිටනසේක, ග්‍රීවාධාතූන්වහන්සේ ග්‍රීවයෙහිම පිහිටනසේක, දෙකෙළ පණස්ලක්‍ෂයක් පමණ කෙසධාතූන්වහන්සේ ඒ ඒ ස්ථාන නොවරදවාම පිහිටනසේක, නවඅනූදහසක් ලොමධාතූන්වහන්සේද ඒ ඒ ලොමකූප නොවරදවාම පිහිටනසේක, අවශෙෂවූ තුන්තර මෙහි විසුරුණාවූ බුදුන්ගේ දෙළසාමුණක් පමණ ධාතූන්වහන්සේද තමතමන්වහන්සේ පෙර පිහිටියාවූ ස්ථාන නොවරදවාම පිහිටනසේක.

ඉක්බිත්තෙන් දෙතිස්මහාපුරුෂලක්‍ෂණ හා අසූඅනුව්‍යඤ්ජන ලක්‍ෂණ පෙරසේම නිර්මිතවෙයි, එකල බුදුවූ දවස්සේම සියොලඟින් සවණක්රැස් හැර සියලු ලොකධාතු එකාලොකකරණසේක, එවේලෙහිද දසදහසක්සක්වළ දිව්‍යබ්‍රහ්මයෝ බුදුරැස් දැක අපබුදුන්ගේ ධාතුපරිනිර්වාණදිනය වන කෙළවර පාතා පෙළහර බලම්හයි නොයෙක් පූජාභාණ්ඩ ගෙණ අවුදින් බෝමැඩ සිසාරා තුන්ලෝ පුරා සිටගනිත්හ, එවේලෙහි ධාතුබුදුහු ආකාශයට පැනනැගී ගණ්ඩබබනම් වෘක්‍ෂමූලයෙහිදී පෑ යමකප්‍රාතිහාර්‍ය්‍යසේම මහාපෙළහර දක්වා නැවත ආකාශයෙන් බැස බෝමැඩ විදුරසුන් නැගී වැඩහිඳිනාසේක, එවේලෙහි ධාතුස්කන්ධයෙන් පැනනැගි තෙජොස්කන්ධයන් බෝමැඩපටන් බ්‍රහ්මලොකයට ඇවිලසිටගෙණ ධාතු ආදාහනවන්ට පටන්ගණී එවේලෙහි දසදහසක් සක්වළින් රැස්වූ දෙවියෝ අපබුදුන්ගේ මේ පශ්චිමදර්ශනයය අද ඵුත්වැනිවූ ධාතුපරිනිර්වාණයය බුදුකෙනෙකුන්ගේ නමක් කප් අසඞ්ඛ්‍යයකිනුත් ඇසිය නොහැක්ක දැක්ක නොහැක්ක එසේවූ බුදුහු අද අන්තර්ධානවෙති අහෝ ඛෙදය අහෝ ඛෙදය ලොකය ශූන්‍යවිය ශූන්‍යවියයි කියකියා අහස්කුස් පුරා සිටි දෙවියෝ මිහිමඬලෙහි කඳුළුධාරා හැමති වැසි වස්වති, එකල අබබිජුවටක්සා ධාතුවකුත් නොතිබී හැමධාතු ආදාහනවූ කල්හි ගිනිකඳ තෙමේම අන්තර්ධානයවෙයි එකෙණෙහි ඒ ඒ තන්හි පිහිටියාවූ දිව්‍යනිර්මිතාදී ප්‍රතිමාද ශිලාරූප කාෂ්ටරූප ලොහරූප රජතස්වර්ණරූපාදී සියලු බුද්ධප්‍රතිමාද අන්තර්ධානයවෙයි එකල දසදහසක්සක්වළ ආ

කාශයෙහි සිටියාවූ එක්ලක්ෂපණස්දහසක් මහාබ්‍රහ්මරාජයන් හා, අනූදහසක් කාමාවචරදිව්‍යරාජයන් බෝමැඩව බැස තමතමන් ගේ භොග පමණින් මහත්වූ දිව්‍යපූජා කරන්නාහු පරිනිර්වාණපූජා වශේෂ අප්‍රමාණවූ පූජාකොට යන්නාහුය.

මෙසේ සමස්තසත්වයන්ගේ වාක්විෂයාතික්‍රාන්තවර්ණිතවූ රූප විලාසයක් ඇති සුගතතථාගත ශිවඞ්කරවූ මාගේ බුදුහු ප්‍රථමබො ධියෙහි පටන් කුසිනාරානුවර මල්ලරජදරුවන්ගේ උපවර්තනනම් ශාලවනෝද්‍යානයෙහිදී පිරිනිවන්පෑම දක්වා පන්සාළිස්හවුරුද්ද මුලුල්ලෙහි සතරාමර සර්වලොකයාහට කරණලද අනන්තනායින් ප්‍රතිමණ්ඩිතවූ සද්ධර්මානුශාසනාවන් ඇතිහෙයින් සද්ධර්මවරචක්‍ර වර්තිස්වාමිවූ මාගේ බුදුහු "ශාස්තෘ" නම් වනසේක.

එසේහෙයින් කියනලදී.

දෙවයක්ඛමනුස්සානං ලොකෙ අග්ගඵලං දදං,
දදන්තං දමයන්තානං පුරිසාජඤ්ඤ තෙ නමො-සි.

ලෝවැඩ පිණිස කරණලද මේ ශ්‍රීසද්ධර්මාවවාදසඞ්ග්‍රහයෙහි මේතෙකින් දෙවන සම්බුද්ධගුණවර්ණනා පරිච්ඡේදය නිමවනලදී.

——❀——

මෙසේ දෙවෙනි සම්බුද්ධගුණවර්ණනාපරිච්ඡේදයෙන් අසාධාරණ බුදුගුණ වර්ණනාකිරීමෙන් රූපකායසම්පත් ප්‍රකාශකොට ලෝවැ ඩ දක්වා තදනන්තරව දක්වියයුතු ධර්මකායසම්පත්තිවිභාගයද මදක් මෙහි දක්වනුලැබේ. හේ කෙසේදයත්?.

සම්බුද්ධානං දුවෙ කායා රූපකායො සිරිධරො,
යො තෙන දෙසිතො ධම්මො ධම්මකායොති වුච්චති.

යනුහෙයින් සර්වධර්මාධිරාජවූ බුදුරජානන්වහන්සේගේ සුප්‍රතිෂ්ඨිතපාදලක්ෂණාදි දෙතිස්මහාපුරුෂලක්ෂණයෙන් බබලන රූපයම රූපකායනම්වෙයි, ඒ බුදුන් විසින් දෙශිතවූ ධර්මයම ධර්මකායනම් වෙයි, එසේ ද්විවිධවූ කායසම්පත්තීන් අතුරෙන් රූපකායයාගේ වි භාගය යට දක්වූ ක්‍රමයෙන්ම දතයුතුයි.

එහි නොදක්වූ ධර්මකායතෙම පර්‍ය්‍යාප්තිධර්මය ප්‍රතිපත්තිධර්මය ප්‍රති වෙධධර්මයයි කියා තුන්ප්‍රකාරවන්නේයි, එහින් පිටකත්‍රයධර්මය පර්‍ය්‍යාප්තිධර්මය නම් වෙයි, ස්‍රොතාපත්මාර්ගාදි සතරමග සතරඵලය යන අට හා නිර්වාණය යන නවලොකොත්තරධර්මයෝ සත්වයන් විසින් ප්‍රතිවෙධකටයුතු බැවින් ප්‍රතිවෙධධර්මයනම්වේ,ඒ නවලොකොත්ත රධර්මයට පැමිණෙන සත්වයන් විසින් භාවිතාකටයුතුවූ ශීලධූතාඞ්ග සමතවිදර්ශනා ආර්‍ය්‍යඅෂ්ටාඞ්ගිකමාර්ගාදිවූ සියලු පිළිවෙත් පිරිම

ප්‍රතිපත්තිධර්මයනම් වේ, ඒ සියලු මාර්ගපිළිවෙත් හා නවවිධවූ ලෝකොත්තරධර්මයන් ප්‍රකාශකොටවදාළාවූ පිටකත්‍රය පාළිධර්මය පර්යාප්තිධර්මනම් වේ, ඒ පර්යාප්තිධර්මය ධර්මවිනයාදිවශයෙන් නොයෙක් ප්‍රභෙද වේ. ඒ කෙසේදයත්?

සර්වලොකෛකනාථවූ භාග්‍යවතුන්වහන්සේ සර්වලොකයෙන් සියලු ලොකවල ආලොකපතුරුවා සර්වසත්ව ඥානමාරයුගා නිලවෙග ස්පර්ශයෙන් නිවීගිය මහාප්‍රදීපයක්මෙන් නිරුපධිශෙෂ නිර්වාණධාතුයෙන් පිරිනිවන්පෑ වදාළ කල්හි ඒපරිනිර්වාණ මඞ්ගල්‍යයට රැස්ව උන් සත්ලක්ෂයක් පමණ ගණප්‍රධාන මහාක්ෂීණාශ්‍රවයන්වහන්සේලාට සඞ්ඝස්ථවිරවූ ආයු බොහෝඇති මහාකාශ්‍යපස්ථවිරයන් වහන්සේ බුදුරජානන් වහන්සේ කෙරෙහි ගෞරව සිතින් හිමාලයට වැඩ බුදුන් පිරිනිර්වීකල මේ රුක මල්පරව වැගිරේවයි අධිෂ්ඨානකොට එහි වාසයකරණකල පිරිනිවි සත්වෙනි දිනයෙහි ඒ රුක මල්වැගිර තිබෙනබව දක දිවසින් බලා මාගේ ස්වාමිදරුවූ බුදුරජානන්වහන්සේ පිරිනිවන්පෑ සේකැයි දැන සංවේගව පන්සියයක් රහතුන්වහන්සේ පිරිවරා දෙවෙනි බුදුකෙනෙකුන් මෙන් සුර බඹ පුද විඳිමින් හිමාලයෙන් නික්ම වැඩ පාවානම් නුවර සිහා වළඳ කුසිනාරා නුවරට වඩනා මගට පැමිණ සිහිල් රුක්සෙවනක හැමදෙනාවහන්සේම සැතපී ඉක්බිති වඩනා පිණිස වැඩහුන් තැනදී කුසිනාරානුවරින් එන ආජීවකයාගෙන් බුදුන් පිරිනිවි බව අසා නියමකොට දැන පෘථග්ජන භික්ෂූන්වහන්සේලා හඬාවලප්නා කල්හි නමින් සුභද්‍රවූ ගුණයෙන් අභද්‍රවූ මහලු කල පැවිදිවූ හෙයින් වුඩ්ඪපබ්බජිතයයි ලද නම් ඇති අශ්‍රද්ධා දුර්ජන පාපි නපුරු මහණෙක් පූර්වයෙහි එක්දවසෙක ආතුමානම් නුවරට බුදුන් වැඩි කල්හි අකැපසමාදානයෙන් තමා සෑදූ කැඳක් නොවැළඳියයුතුයයි වදාළ බණට නොසතුටුව හිතෛෂීව වැඩපිණිස වදාළ බුදුබණට අනාදරකොට වෛරබැඳ එතැන්පටන් රොසයෙන් කිපී හුන්නේය, එදවස් බුදුන් පිරිනිවන්පෑහයි අසා සතුටුව එතැන්හි ශොකයෙන් වලප්නා ඒ හැම භික්ෂූන්ගෙන් එකී එකී නමක් සමීපයට ගොස් සතුටු සතුටුව ඔවුන් ඉදිරියට මදක් මුහුණ දිගුකොට හිස සල සලා බැම නටවමින් මදක් සිනා දක්වා ඇයි ඇවැත්නි දුන් නොපි කුමක් පිණිස හඬව්ද මේ කැපය මේ අකැපය මේ කළමනාදෙය මේ නොකළමනාදෙය මේ කාරියය මේ අකාරියයයි ඇම විටම අප ඇමටම කියා වෙහෙසදෙන්නාවූ මහමහණුහු පිටුදකපුමහ ඉන් අපි හැම මෙසින් මතු කැමැත්තක් කරමින, නොකැමැත්තක් නොකරමින, එසේ හෙයින් මෙතැන්හි අපි සතුටුවනා තැන කුමක්

පිණිස දේශිතස්වූද බුදුරජානන්වහන්සේගේ වචන නැමති ම්ලේඡී
බැඳි බොහෝ වෙහෙසවිඳ දූත් සැපසේ මිදීගියම්හ, අපි ඇම්දෙනා
සැපසේ අභිප්‍රායලෙස වසම්හයි කියකියා හඬන භික්ෂූන් සංසිඳුවා,
ඇවිදිනා ප්‍රවෘත්තිය මහාකාශ්‍යපස්ථවිරයන්වහන්සේ තමන්වහන්
සේම දූක වදූරා මෙබඳු පව්ටු භික්ෂූනුගේ කර තිබූ සිවුරුකඩා උදු
රාගෙණ හිස කාසාකඩක් සිසාරා වණ්ඩාලකොට තළමැතවැසිසිතා
නැවතත් සිතනසේක් බුදුන් පිරිනිවී ඇසිල්ලෙහි උන්ගේ ශ්‍රාවක
යෝ උනුන්ගේ සිවුරු උදුරන්ට වන්නාහුයයි තීර්ථකයෝ නින්ද‍
කරන්නාහුය එහෙයින් පසුව ඊට සුදුසු කාරිය දනිම්හයි සිතා
වදූරා සංසිඳිගොස් නැවත ධාතු බෙදනා පොසොන් පුරවිසෙනි දින
යෙහි එම මහාකාශ්‍යපස්ථවිරයන්වහන්සේ බුදුන් පිරිනිවී පළමුවන
සතියෙහි තමන්වහන්සේ හිමාලයෙන් නික්ම වඩනා ගමනේ
ආතුමානම් කුසිනාරානුවරට එනා අඩානමාර්ගයෙහි සැතපී හුන්තැ
නදී ආජිවක වචනය අසා හඬන භික්ෂූන්ට කියනලද ඒ පාප භික්ෂු
වචනය සිහිකර වදූරා එහි රැස්වූ සඞ්ඛ්‍යාපථාතික්‍රාන්තවූ මහාභික්ෂු
සඞ්ඝයාවහන්සේ මධ්‍යයෙහි ස්ථවිර භික්ෂූන්ට ආමන්ත්‍රණයකොට
ඒ පාපභික්ෂූනුගේ වචනයද ප්‍රකාශකොට කියමින් ඉදිරියේ දවස
මෙබඳු පාපි භික්ෂූහු මේ පාලිධර්මය වෙන වෙන පක්ෂ බලා සොයා
ගෙණ නොබෝ දවසකින් නසන්නාහුය, ඉදින් ධර්මවිනය සඞ්ගා
යනා කිරීමෙන් දීප්තිමත්කොට පිහිටියේ වීනම් බුදුන් වැඩසිටියාක්
වැනි යෙසි එබැවින් අපි ඇම රැසව ධර්මය පනාතිකොට තිබුව මැනව
එසේ නොකළහොත් අධර්මය දීප්තිමත්වෙයි ධර්මය පසුබසී අවිනය
දීප්තිමත්වෙයි විනය පසුබසී අධර්මවාදීහු බලවත්වෙති ධර්මවාදීහු
දුර්වලවෙති අවිනය වාදීහු බලවත් වෙති විනයවාදීහු දුර්වලවෙතියි
කීසේක, ඒ ඇසූ භික්ෂුසඞ්ඝයාවහන්සේ කියනසේක් මහාකාශ්‍ය
පස්ථවිරයන්වහන්ස එසේවීනම් ධර්මය පඩකපිකොට ගන්නාලෙස
සුදුසුවූ භික්ෂූන්වහන්සේ අදම තෝරාගත මැනවැයි කීහ, එබසට
මහාකාශ්‍යපස්ථවිරයන්වහන්සේ යහපතැයි ගිවිස එතැන්හි රැස්වූ
ගණනායක සත්ලක්ෂයක් මහාස්ථවිර සඞ්ඝයාවහන්සේ ප්‍රධාන නවා
ඞ්ගශාස්තෘශාසනප්‍රභේද පර්‍යාප්තිධර පෘථග්ජන ශ්‍රොතාපන්න සකෘ
දාගාමී අනාගාමී සුක්ඛවිදර්ශක සමථයානික මහානුභාවසම්පන්න
නොයෙක් කෙළකොටිගණන් භික්ෂුසඞ්ඝයාවහන්සේලා අතුරෙන්
ත්‍රිපිටක පර්‍යාප්ති ප්‍රභේදධරවූ චතුප්‍රතිසම්භිදාප්‍රාප්ත සාරසිය අනූ
නවනමක් පමණ භික්ෂූන්වහන්සේ තෝරාගෙණ ආනන්දස්ථවිර
යන්වහන්සේ රහත් නුවූ හෙයින් නැවත රහත්වූකල ඇතුළත්කට
යුතුයයි කියා පන්සියයට නමක් අඩුකළසේක.

ඉක්බිති කොතැන්හිදී ධම්සඞ්ගායනාකරමෝදැයි සාකච්ඡා කොට රජගහනුවරදී යහපතැයි නියමකළසේක, එකල්හි හැමදෙනාවහන්සේම කියනසේක් එසේවීනම් මේ හවුරුද්දෙහි කිසිකෙනෙකුන්වහන්සේත් රජගහනුවර වස්වසනු පිණිස නොයායුතුයයි කතිකාකොට භික්ෂූන්ට අස්වා දඹදිව සැරිසරා ඇවිද ඒ ඒ තැන්හි බුද්‍ධරජානන්වහන්සේගේ පිරිනිවන්පෑම නිසා ශොකයෙන් පිඩිතවූ මහජනයා අස්වසමින් රජගහනුවරට වැඩිසේක.

ආනඳමහතෙරුන්වහන්සේද බුද්‍ධරජානන්වහන්සේගේ පාසිවුරු ගෙණ භික්‍ෂුසඞ්ඝයාවහන්සේ විසින් පිරිවරණ ලද්‍දුව කුසිනාරානුවරින් නික්ම දනව් සැරිසරා වඩනාසේක් තමන්වහන්සේ පැමිණි පැමිණි ස්ථානයෙහි ස්වාමිනි ආනන්‍දස්ථවිරයන්වහන්ස සර්‍වඥයන්වහන්සේ කොයි තබලා වඩිනාසේක්දැයි යනාදී නොයෙක් අඳෝනා කියමින් මහහඬින් හඬා වලප්නා මහජනයාට අනුශාසනාකරමින් ක්‍රමයෙන් සැවැත්නුවරට පැමිණ එහි බුදුන්පිරිනිවී දිනයෙහිමෙන් මහජනයාගේ මහත් හැඬීම් වැලපීම් වූ කල්හි අනිත්‍යතාවෙන් යුක්ත ධම්කථාවෙන් ඒ මහජනයා සංසිඳුවා ජෙතවනාරාමයට වැද දශබලධාරීවූ බුද්‍ධරජානන්වහන්සේ විසින් වාසයකරණලද ගඳකිළියෙහි දොර හැර ගෙට වැද බුද්‍ධරජානන්වහන්සේ ජීවමානකාලයෙහි කළමනා සියලු වත් කොට බුදුන්ගේ සියලු ගුණ නැමති අමෘතරසය දත්බැවින් බුද්‍ධරජානන්වහන්සේ කෙරෙහි පිහිටියාවූ ප්‍රෙම ඇතිව ක්ෂීණාශ්‍රාවනොවූසෙයින් ලක්‍ෂගණන්ජාතිවලඔවුනොවුන්ට කරණලද උපකාරයෙන් උපන්නාවූ මොලොක් සිත්ඇතිසේක් වතාවත් කොට ඉක්බිත්තෙන් ගඳකිළියට වැද ස්වාමිනි බුද්‍ධරජානන්වහන්ස මේ ඔබවහන්සේ පැන්සනහනවේලාව නොවේද මේ ඔබවහන්සේ භික්ෂූන්වහන්සේට අවවාද දෙන වේලාව නොවෙද මේ සිංහසෙය්‍යාවෙන් සැතපෙන වේලානොවේද මේ ඔබවහන්සේ දැවිටි වලඳන වේලා නොවේදැයි යනාදිවූ ක්‍රමයෙන් අඬනසේක් එක්තරා දෙවතාවෙකු විසින් ස්වාමිනි ආනන්‍දස්ථවිරයන්වහන්ස ඔබවහන්සේ හඬනකල සෙස්සන් කෙසේ අස්වසනසේක් දැයි කියා සංවේග ඉපදවූ කල්හි ලය තදකොට ශොක දුරුකිරීමෙන් විහාරයෙහි සුන් බුන් තැන් සකස්කොට කරවා වස්වසන දවස සමීපවූ කල්හි ඒ හැම භික්‍ෂුසඞ්ඝයාවහන්සේම රජගහනුවරට වැඩිසේක.

ඉක්බිත්තෙන් එහි පන්ළනු පන්සියයක් රහතුන්වහන්සේ ඇසළමස පුරපසළොස්වක් දිනයෙහි පොහොයකොට අවපැළවිය දවස වස්වැස ඇවැත්හි බුද්‍ධරජානන්වහන්සේ විසින් සුන්බුන්තැන්

සංස්කිරීම්වශයෙන් විහාරපිරිමැස්වීම වර්ණනාකරණලද බැවින් අපි පළමුවනමස සුන් බුන් තැන් සංස්කරවා විහාරපිරියම්කරමින, දෙවෙනි මස රැස්ව ධර්මවිනය සංගායනා කරම්හයි කියා දෙවෙනි දවස් අජාසත් රජ්ජුරුවන්ට දන්වා උන්ගෙන් මිනිසුන් ගෙණ සර්වඥවචනයට පූජාකරණ පිණිසත් ශ්‍රමණ භවත් ගෞතම්යන්ගේ ශ්‍රාවකයෝ උන් විද්‍යමානකාලයෙහි ප්‍රතිපත්තිපූරා විහාරපිරියම් කළහ දැන් උන්වහන්සේ පිරිනිවී හෙයින් විහාර හැරපියා ඒ ඒ තැන පලාගියාහයි යන නින්දාවාදයෙන් ගැලවීම පිණිසත් හරණ ලද්දින් වැටිකඩලවගියාවූ අටළොස් මහාවිහාරයෙහි සුන් බුන් තැන් සංස්කරවා මිහරජ්ජුරුවෙනි විහාරපිරියම් නිමියේය, දැන් ධර්මවිනය සංගායනාකරම්හයි කීසේක, ඒ අසා රජ්ජුරුවන් විසින් යහපත ස්වාමීනි ධර්මසංගායනා කළමැනව මම මාගේ ආඥාචක්‍රය පවත්වමි ඔබවහන්සේලා විසින් ධර්මචක්‍රය පැවැත්වුව මැනව ස්වාමිනි අනිකුදු කළමනාකාර්‍ය්‍යයෙක් ඇත්නම් ඒ මට වදාළමැනවැයි ආරාධනා කළ කල්හි ධර්මසංගායනාකරන්නාවූ භික්ෂූන්වහන්සේට රැස්ව හිඳිනාවූ ස්ථානයක් වුවමැනවැයි කීසේක.

ඉක්බිත්තෙන් අජාසත් රජ්ජුරුවන් විසින් ස්වාමීනි කොතැන්හි කෙරෙම් දැයි විචාළ කල්හි වෛභාරපර්වතප්‍රාන්ත සමීපයෙහි සප්තපර්ණී ගුහාවාරයෙහි කරන්ට වටනේයයි වදාළසේක, ඒ ඇසූ රජ යහපතැයි ගිවිස විශ්වකර්මදිව්‍යපුත්‍රයා විසින් මවනලද්දක් වැනි මනෝඥකොට කරණලද භිත්ති ස්ථම්භ සෝපානමාලකාදියෙන් සමලංකෘතවූ අනේකප්‍රකාර මාලාකර්ම ලතාකර්මයෙන් විසිතුරුවූ ලෝකයෙහි සිත්කළුවූ වස්තූ ඇසිතාක් රැස්කොට නිර්මිතකළාක් වැනිවූ දක්නයුතු සාරභූෂණයන් ඇති මණ්ඩපයක් කරවා අනේකප්‍රකාර විලම්බක කුසුම්දාමයන් ඇති වියන් හා වටහිර බැඳ බිම නොයෙක් පැහැ ඇති සුවඳ මල්තනා අතුටලුවාක් වැනි විචිත්‍රකර්මාන්ත සිතියම් කොට ඒ ධර්මමණ්ඩපය බ්‍රහ්මවිමානයක්මෙන් සරහා ඒ මණ්ඩපමධ්‍යයෙහි පන්සියයක් භික්ෂූන්වහන්සේට වෙන වෙනම පන්සියයක් කැපපසතරණ ඇති ආසන පනවා දකුණුදිගට පිටලා උතුරුදිගට අභිමුඛකොට ස්ථවිරආසනයක්ද මණ්ඩපමධ්‍යයෙහි නැගෙණහිරට අභිමුඛකොට බුද්ධාසනයක් හා සමාන ධර්මාසනයක් පනවා ඒ ධර්මාසනමස්තකයෙහි දළකඩමයවූ විචිත්‍ර විජිනිපත්‍රයක් තබා ඒ මණ්ඩපය සිසාරා ඇත් අස් රථ පාබල ධනුඛඩ්ගකොන්තාදීන් සත් වළල්ලක්වට ආරක්ෂාලවමින් මගධෙශ්වර අජාසත්රජතෙම මහසඞ්ඝයාවහන්සේට පිළිවෙළින් පසහපිහිටුවා වැඳ දන්වනුයේ ස්වාමීනි මාවිසින් කළමනා කටයුතු කොට නිමිවනලදැයි දැන්වූහ.

එදවස් ආයුෂ්මත්අනඳමහතෙරුන්වහන්සේ භික්ෂූන්වහන්සේ විසින් ඇවැත්නි සෙට සන්නිපාතදිනයෙක් වන්නේය තෙපිද වූකලී ශෛක්‍ෂව මත්තෙහි කළමනාකටයුතු සහිතවව එසේහෙයින් තොපට ඒ සන්නිපාතයට මත්තෙහි කළමනා කටයුතු ඇතිව සිට යන්ට සුදුසුනොවෙයි ප්‍රමාද නොවවයි කීකල්හි උන්වහන්සේ බොහෝසේ එදා රාත්‍රියෙහි කායගතාසතිකම්සථානයෙන් කල්යවා අධිකකොට වඩනාලද වීය්‍යඇති බැවින් සකෘදාගාමිමාර්ගාදිවූ මාර්ගඵලවිශෙෂයක් උපදවාගන්ට අසමත්වූසේක, එබැවින් මෙසේ සිතූසේක, මම වීය්‍යසමත්වයෙහි යෙදෙමියි සිතා අළුයම් වේලෙහි සක්මණින් බැස ගෙට වැද ඇඳමත්තෙහි මදක්කල් ශැතපි කාය පිඩා සංසිඳුවාගණිමියි කාය ඇඳට නැමූසේක, එකල්හි අනඳමහ තෙරුන්වහන්සේගේ දෙපය බිමින් ගැලවීගියේය, ඉස කන්වසිනට නොපැමිණියේය, මේ දෑතුරෙහි කාමාශ්‍රවාදී සියලු ආශ්‍රවයන් නසා රහත්වූසේක.

ඊට දෙවෙනි දවස් හීලවලඳ ඉක්බිති සෙසු සියලු සථවිර භික්ෂූන්වහන්සේම පාසිවුරු තැන්පත්කොට තබා සන්ධ්‍යාවලාපටලසේ රත්පැහැඇති පාංශුකූලචීවරපෙරව මාණික්‍යමයවූ සහනාගසනාබහස්තිරාජයන් පරිද්දෙන් අජාසත් රජතෙම කරවා දුන් ධර්මමණ්ඩපයට රැස්ව මහලු පිළිවෙළ නොසික්මවා තමතමන්වහන්සේට පැමිණි ආසනවල වැඩහිඳිනාසේක් අනඳමහතෙරුන්වහන්සේට ආසනයක් තබා හුන්සේක, එතන්හි සමහර කෙනෙකුන්වහන්සේ මේ හස්න කාටදැයි විචාරා ආනඥසථවිරයන්වහන්සේටයයි කීකල්හි ආනඥසථවිරයෝ කොයිදැයි විචාළසේක, එකල්හි අනඳමහ තෙරුන්වහන්සේ අර්හත්ඵලයට පැමිණිබව දක්වනු කැමතිසේක් සෙසු සථවිරයන්වහන්සේ හා සමග නොගොස් ධර්මමණ්ඩපයෙහි ආනඥසථවිරයෝ කොයි ගියෝදැයි යන කථාව උපන්කල්හි දැන් මට එතනට යන්ට වේලාවන්නේයයි සිතා තමන්වහන්සේගේ ආනුභාවයෙන් පොළොව කිමිදගෙණ ගොස් තමන්වහන්සේට පැමිණි අස්නෙහිම හිඳ ඒ බව හැමදෙනාවහන්සේට දක්වූසේක, එකල්හි මහාකාශ්‍යපසථවිරයන්වහන්සේ ආයුෂ්මත්වූ අනඳමහතෙරුන්වහන්සේගේ මුඛපද්මය දැක වදාරමින්ම නටුයෙන් ගිලිහීගිය තාලඵලයක් වැනිවූද රන්පලසක් මත්තෙහි තබනලද ජාතිරඹන මාණික්‍යයක් බඳුවූද වලාකුල්නැත්තාවූ ආකාශයෙහි නැංගාවූ පූර්ණ චන්ද්‍රමණ්ඩලයක් බඳුවූද බාලාර්කරශ්මිස්පර්ශයෙන් සුපුෂ්පිතරේණුයෙන් රන්වන්වූ ගර්භඇති පද්මයක් බඳුවූද පිරිසිදුවූ ප්‍රභාසම්පන්නනායෙන්ම රහත්ඵලයට පැමිණිසේකැයි දැනවදාරා සෙසු භික්ෂූ

න්ට ආමන්ත්‍රණය කොට වදාරණසේක් පින්වත්නි ආනන්දස්ථවිර
යෝ අර්හත්ඵලයට පැමිණ විශෙෂයෙන් බැබලී සිටිනේය ඉදින්
බුදුරජානන්වහන්සේ ජීවත්ව වැඩඋන්සේක්වීනම් අද එකාන්ත
යෙන්ම මේ ආනන්දස්ථවිරයන්ට සාධුකාර දෙවාවදාරණසේක, ඒ
බුදුන් විසින් දියයුතු සාධුකාර අප විසින් පවත්වන්ට වටනේයයි
වදාරා හැමදෙනාවහන්සේම තුන්විටෙක සාධුකාරදෙවාවදාළසේක.

ඉක්බිත්තෙන් ඒ භික්ෂුසඞ්ඝයා මධ්‍යයෙහි මහාකාශ්‍යපස්ථවිර
යන්වහන්සේ භික්ෂූන්ට ආමන්ත්‍රණය කොට ඇවැත්නි කිමෙක්ද?
පළමුකොට විනය සඞ්ගායනාකරමෝද ධර්මය සඞ්ගායනාකරමෝ
දැයි විචාළසේක, එකල්හි අනුරුද්ධාදී ස්ථවිර භික්ෂූන්වහන්සේ
වදාරණසේක් ස්වාමිවූ මහාකශ්‍යපස්ථවිරයන්වහන්ස විනය නම්
සර්වඥශාසනයට ආයුෂයක් වැන්න විනය යම්තාක් කල් පවත්නේද
ඒතාක්කල් ශාසනයත් පවත්නේවෙයි එහෙයින් අපි පළමුකොටම
විනය සඞ්ගායනාකරම්හයි දැන්වූවාහුය, එකල්හි මහාකාශ්‍යපස්ථ
විරයන්වහන්සේ කවර භික්ෂුකෙනෙකුන් ප්‍රධානකොට විනය
සඞ්ගායනා කටයුතුදැයි අනුරුද්ධාදී ස්ථවිර භික්ෂූන්ගෙන් විචාළක
ල්හි ආයුෂ්මත් උපාලිස්ථවිරයන් ප්‍රධානකොට විනය සඞ්ගායනාකර
ම්හයි කීවාහුය, එකල්හි මහාකාශ්‍යපස්ථවිරයන්වහන්සේ විනය
විචාරණ පිණිස තමන්වහන්සේ විසින්ම තමන් සම්මන්ත්‍රණය කර
ණසේක් “ඇවැත්නි සඞ්ඝයා මා කියන්නක් අසනසේක්වා ඉදින්
සඞ්ඝයාගෙන් ප්‍රාප්තකල්ඇත්තෙම්වීම්නම් මම උපාලිස්ථවිරයන්
කෙරෙන් විනය විචාරම්”යි සඞ්ඝයාට අස්වා තමන් සම්මන්නනය
කළසේක, එකල්හි උපාලිස්ථවිරයන්වහන්සේද විනය විසර්ජනය
කරණ පිණිස තමන්වහන්සේ විසින්ම තමන් සම්මන්නනය කරණ
සේක් “ස්වාමිවූ සඞ්ඝයාවහන්සේ මා කියන්නක් අසනසේක්වා
ඉදින් සඞ්ඝයාවහන්සේගෙන් ප්‍රාප්තකල්ඇත්තෙම් වීම් නම් මම මේ
ආයුෂ්මත් මහාකාශ්‍යපස්ථවිරයන්වහන්සේ විසින් විනය විචාරණ
ලද්දෙම් විසර්ජනය කෙරෙම්”යි සඞ්ඝයාවහන්සේට අස්වා තමන්
සම්මන්නනය කළසේක.

මෙසේ සම්මන්නනය කෙරෙමින් මහාස්ථවිර භික්ෂූන්ට නමස්
කාරකොට අවසරගෙණ දන්තඛචිතවිජනිය අතින්ගෙණ පූර්වදිසාභි
මුඛව ධර්මාසනයෙහි වැඩහුන්සේක, එකල්හි ස්ථවිරආසනයෙහි
වැඩහුන් ආයුෂ්මත් මහාකාශ්‍යපස්ථවිරයන්වහන්සේ ඇවැත්වූ උපා
ලිස්ථවිරයෙනි ප්‍රථම පාරාජිකා ශික්ෂාපදය කොතැන්හිදී පනවනලද
දැයි ආයුෂ්මත් උපාලිස්ථවිරයන්ගෙන්විචාළසේක, එකල්හී උන්වහ
න්සේ ස්වාමීන්වහන්ස විසාලාමහනුවරදී පනවනලදැයි කීසේක,

කවර පුද්ගලයෙකු අරභයාදැයි විචාළකල්හි සුදින්නනම් කලන්දක පුත්‍රයන් අරභයායයි කීසේක, කවර වස්තුවෙක්හිදැයි විචාළකල්හි මෛථුනධර්මවස්තුවෙහි ප්‍රථම පාරාජිකා ශික්ෂාපදය පනවනලදැයි කීසේක, මෙසේ ආයුෂ්මත් මහාකාශ්‍යපස්ථවිරයන්වහන්සේ ආයුෂ්මත් උපාලිස්ථවිරයන්ගෙන් ප්‍රථම පාරාජිකාවට වස්තුවද විචාළසේක, පුද්ගලයාද විචාළසේක, ප්‍රඥප්තියද විචාළසේක, අනුප්‍රඥප්තියද විචාළසේක, ආපත්තියද විචාළසේක, අනාපත්තියද විචාළසේක, යම්සේ ප්‍රථම පාරාජිකාවට විචාරණලදද එසේම දෙවන තුන්වන සතර්වන පාරාජිකාවන්ටද වස්තුආදී සියල්ල විචාළසේක විචාළ විචාළදෙය උපාලිස්ථවිරයන්වහන්සේත් විසඳූසේක.

ඉක්බිත්තෙන් මේ සතරපාරාජිකාවෝ පාරාජිකාකාණ්ඩනමැයි සංග්‍රහයට නගා තෙරස සඞ්ඝාදිශෙෂයෝ තෙරස කාණ්ඩයයි නම් තුබුවාහුය, ශික්ෂාපදයෝ දෙදෙනෙක් වෙඅනියතැයි නම් තිබුවාහුය, ශික්ෂාපදයෝ තිස්දෙනෙක් නිස්සග්ගිපචිත්තියයි නම් තිබුවාහුය, ශික්ෂාපදයෝ අනූදෙන්දනෙක් පචිත්තියයි නම් තිබුවාහුය, ශික්ෂාපදයෝ සතරදෙනෙක් පාටිදෙසනීයයි නම් තිබුවාහුය, ශික්ෂාපදයෝ පන්සැත්තෑදෙනෙක් සෙඛියායයි නම් තුබුවාහුය, සප්තධර්මකෙනෙක් අධිකරණසමථයයි නාම් තුබුවාහුය, මෙසේ මහාවිභඞ්ගය සංග්‍රහයට නගා භික්ෂුනීවිභඞ්ගයෙහි ශික්ෂාපදයෝ අටදෙනෙකු මේ පාරාජිකාකාණ්ඩයයි නම් තුබුවාහුය, ශික්ෂාපද සතළොසක් සතාරස කාණ්ඩයයි නම් තුබුවාහුය, ශික්ෂාපද තිස්දෙනෙකු නිස්සග්ගිපචිත්තියයි නම් තුබුවාහුය, ශික්ෂාපදයෝ සැටසදෙනෙකු පචිත්තියයි නම් තුබුවාහුය, ශික්ෂාපදයෝ අටදෙනෙකු පාටිදෙසනීයයි නම් තුබුවාහුය, ශික්ෂාපදයෝ සැත්තෑපස්දෙනෙකු සෙඛියායයි නම් තුබුවාහුය, සප්තධර්මකෙනෙක් අධිකරණසමථයෝයයි නම් තුබුවාහුය, මෙසේ මේ භික්ෂුණීවිභඞ්ගයයි කියා සංග්‍රහයට නගා මෙම ක්‍රමයෙන්ම ඛන්ධකපරිවාරයෙහිදු තැබුවාහුය, මෙසේ උභතොවිභඞ්ගසහිතවූ ඛන්ධකපරිවාරයන් විනයපිටකයයි සංග්‍රහයට නගා ඒසියල්ලම මහාකාශ්‍යපස්ථවිරයන්වහන්සේ විචාළ විචාළදෙය උපාලිස්ථවිරයන්වහන්සේ විසඳූසේක, මෙසේවූ පෘච්ඡාවිසර්ජනාවසානයෙහි පන්සියයක් පමණ මහරහතුන්වහන්සේ ධර්මසඞ්ගායනාවට නැගී ක්‍රමයෙන්ම ගණසජ්ඣායනා කළසේක.

එසේ විනය සඞ්ගායනාකොට නිමිකල්හි මහාපෘථිවිය කම්පාවූසේක, එකල්හි ආයුෂ්මත්වූ උපාලිස්ථවිරයන්වහන්සේ දන්තඛචිත විජනිය අතින් තබා ධර්මාසනයෙන්බැස ස්ථවිරභික්ෂූන්වහන්සේලාට

වැඳ අවසරගෙණ තමන්වහන්සේට ප්‍රාප්ත ආසනයෙහි වැඩළුන් සේක.

**මෙම කීහ සද්ධර්මසංග්‍රහයෙහි.**

සතාසතසහස්සානි තෙසු පාමොක්ඛ භික්ඛවො,
ථෙරා මහාකස්සපො ච සඞ්ඝත්ථෙරො තදා අහු.

ලොකනාථො දසබලො සත්තාහපරිනිබ්බුතො,
දුබ්භාසිතං සුභද්දස්ස බුඩ්ඪස්ස වචනං සරං.

භික්ඛු පඤ්චසතෙ යෙව මහාඛීණාසවෙ වරෙ
උච්චිනිත්වා මහාථෙරො මහාසඞ්ගීති කාතවෙ,
වස්සානං දුතියෙ මාසෙ දුතියෙ දිවසෙ පන
රුචිරෙ පව්වයෙ තස්මිං ථෙරා සන්නිපතිංසු තෙ.

මහාථෙරොව අත්තානං විනයං පුච්ඡිතුං සයං,
සම්මන්නිපාලිත්ථෙරො ච විස්සජ්ජෙතුං තමෙවතු.

ථෙරා සනෙ නිසීදිත්වා විනයක්කම පුච්ඡිසො
ධම්මාසනෙ නිසීදිත්වා විස්සජ්ජෙසි තමෙව සො,
විනයං ඤාණමත්තෙන විස්සජ්ජිතකමෙන තෙ
සබ්බෙ සජ්ඣායමකරුං විනයෙ නයකොවිදූති.

මෙසේ විනය සඞ්ගායනාකොට නිමවා ඊට ඉක්බිතිව ධර්මය සඞ්ගායනාකරණු කැමති ආයුෂ්මත් මහාකාශ්‍යපස්ථවිරයන්වහන්සේ ධර්මසඞ්ගායනාකරන්නාවූ අපවිසින් කවරපුද්ගලයෙකුන් ප්‍රධානකොට ධර්මසඞ්ගායනා කටයුතුදැයි අනුරුද්ධාදි ස්ථවිරභික්ෂූන් අතින් විචාළසේක, එකල්හි උන්වහන්සේලා ආනන්දස්ථවිරයන් ප්‍රධානකොට ධර්මසඞ්ගායනා කරම්හයි කීවාහුය, ඉක්බිත්තෙන් ආයුෂ්මත් මහාකාශ්‍යපස්ථවිරයන්වහන්සේ ධර්මය විචාරණ පිණිස තමන්වහන්සේ විසින්ම තමන් සම්මන්නනය කළසේක, ආනන්දස්ථවිරයන්වහන්සේද ධර්මය විසර්ජනය කරණු පිණිස තමන්වහන්සේ විසින්ම තමන් සම්මන්නනය කළසේක, එසේ සම්මන්නනය කොට ආයුෂ්මත් ආනන්දස්ථවිරයන්වහන්සේ හුනස්නෙන් නැගී සිවුර එකාංශකොට පොරවාගෙණ ස්ථවිර භික්ෂූන් වැඳ අවසර ගෙණ ධර්මාසනයෙහි වැඩහිඳ දන්තඛචිතවිජනිය අතින් ගත්සේක, එකල්හි ථෙරාසනයෙහි වැඩහුන් මහාකාශ්‍යපස්ථවිරයන්වහන්සේ ඇවැත්වූ ආනන්දස්ථවිරය භාග්‍යවතුන්වහන්සේ විසින් බ්‍රහ්මජාලය කොතැන්හිදී වදාරණලදදැයි කියා ධර්මය ආනන්දස්ථවිරයන්ගෙන් විචාළසේක, එකල්හි උන්වහන්සේ විසඳනසේක් ස්වාමීනි රජගහ

නුවරටද නාලන්‍දාවටද මධ්‍යයෙහිවූ අම්බලට්ඨිකා නම් උයන්හි කරණලද රාජ මන්‍දිරයෙහිදීයයි දැන්වූසේක. කවර පුද්ගලයෙකු අරභයාදැයි විචාළකල්හි සුප්පියනම් පරිව්‍රාජකයාද බ්‍රහ්මදත්තනම් මානවකයාදැයි යන මේ දෙදෙනා අරභයා වදාරණලදැයි දැන්වූසේක. එකල්හි ආයුෂ්මත්වූ මහාකාශ්‍යපස්ථවිරයන් වහන්සේ ආයුෂ්මත් ආනන්‍දස්ථවිරයන් කෙරෙන් බ්‍රහ්මජාල සූත්‍රයට නිදානයද විචාළසේක. පුද්ගලයාද විචාළසේක. මෙසේ විචාරා ඊට අනතුරුව ඇවැත්වූ ආනන්‍දස්ථවිරයෙනි, ශ්‍රාමණ්‍යඵල සූත්‍රය කොතැන්හිදී වදාරණලදදැයි යනාදිය විචාළසේක—එකල්හි අනද මහතෙරුන්වහන්සේ ස්වාමීන්වහන්ස රජගහ නුවර ජීවකයන්ගේ අඹ උයන්හිදීයයි දැන්වූසේක කවරකු අරභයාදැයි විචාළකල්හි වේදෙහි පුත්‍රවූ අජාසත් රජ්ජුරුවන් අරභයා වදාරණලදැයි දැන්වූසේක. මෙසේ ආයුෂ්මත් මහා කාශ්‍යපස්ථවිරයන් වහන්සේ ආනන්‍දස්ථවිරයන්වහන්සේකෙරෙන් ශ්‍රාමණ්‍යඵලසූත්‍රයට නිදානයද විචාළසේක. පුද්ගලයාද විචාළසේක. මෙම ක්‍රමයෙන්ම බ්‍රහ්මජාලසූත්‍රාදි සූතිස් සූත්‍රයක් පමණ ඇති දීඝනිකාය විචාරා සඞ්ගායනාකොට මේ දීඝනිකායනමැයි කියා ගණ සජ්ඣායනාකොට ඉක්බිතිව ඇවැත්වූ ආනන්‍දස්ථවිරයෙනි, තොපනිශ්‍රිත තැන්වලට කියවා රක්ෂාකාරවයි කියා ආයුෂ්මත් ආනන්‍දස්ථවිරයන්ට භාරකළසේක. ඊට ඉක්බිතිව මූලපරියාය සූත්‍රාදී එක්සිය දෙපණසක් පමණ සූත්‍රයන් ඇති මජ්ඣිම නිකාය විචාරා සඞ්ගායනාකොට දම් සෙනෙවි සැරියුත් මහතෙරුන්වහන්සේගේ නිශ්‍රිතභික්ෂූන්ට මේ මජ්ඣිම නිකාය තොප විසින් රක්ෂාකරවයි කියා භාරකළසේක. ඊට ඉක්බිතිව ඕඝතරණ සූත්‍රය ආදිවූ සත්දහස් සත්සිය දෙසැටක් පමණ සූත්‍ර ඇති සංයුත්තනිකාය විචාරා සඞ්ගායනාකොට ස්වාමීන්වහන්ස මේ සංයුත්තනිකාය ඔබවහන්සේගේ නිශ්‍රිත භික්ෂූන්වහන්සේලාට කියවා රක්ෂාකරණසේක්වයි කියා මහාකාශ්‍යප ස්ථවිරයන් වහන්සේට භාරකළසේක. ඊට ඉක්බිතිව චිත්තපරියාදාන සූත්‍රයඅදිවූ නවදහස් පන්සිය සත්පණසක් පමණ සූත්‍ර ඇති අඞ්ගුත්තර නිකාය විචාරා සඞ්ගායනාකොට නිමවා මේ අඞ්ගුත්තර නිකාය ඔබවහන්සේගේ නිශ්‍රිත භික්ෂූන්වහන්සේලාට කියවා රක්ෂාකරණසේක්වයි කියා අනුරුද්ධස්ථවිරයන් වහන්සේට භාරකළාහුය. ඊට ඉක්බිතිව ක්ෂුද්‍රකපාඨය, ධම්මපදය, උදානය, ඉතිවුත්තකය, සුත්තනිපාතය, විමානවස්තුවය, ප්‍රේතවස්තුවය, ථෙරගාථාය, ථෙරීගාථාය, ජාතකය, මහානිද්දේශය, චූලනිද්දේශය, පටිසම්භිදාය, අපදානය, බුද්ධවංශය, චරියාපිටකය, යන ක්‍රමයෙන් පසළොස් [illegible] ත්සන්හිය විචාරා සඞ්ගායනාකොට නිමවා මේ [illegible]

ඊට ඉක්බිතිව ධර්‍මසඞ්ගණිය, විභඞ්ගය, ධාතුකථාය, පුද්ගලප්‍රඥප්තිය, කථාවස්තුය, යමකය, පට්ඨානය, යන මහා ප්‍රකරණයන්ගේ වශයෙන් සත්ප්‍රකාරවූ ප්‍රකරණයන් විචාරා සඞ්ගායනාකොට මේ අභිධර්‍මපිටකය නමැයි මෙසේ සඞ්ගායනාවට නැගූ සියල්ල මහාකාශ්‍යපස්ථවිරයන් වහන්සේ විචාළසේක. ඒ එසේ විචාළ විචාළදෙය ආනන්ද මහතෙරුන්වහන්සේ විසඳූසේක. ප්‍රවෂ්ඨාභිසජ්ජනයාගේ කෙළවර පන්සියයක් පමණ රහතන්වහන්සේ සඞ්ගායනාවට නැගූ ක්‍රමයෙන්ම ගණසජ්ඣායනා කළාහුය. ඒ ධර්‍ම සඞ්ගායනාවගේ අවසානයෙහි මහා පෘථිවිතොමෝ කම්පාවිය. එකල්හි ආයුෂ්මත් ආනන්දස්ථවිරයන් වහන්සේ දන්තඛචිතවීජනිය අතින් තබා ධර්‍මාසනයෙන් බැස ස්ථවිර භික්ෂූන් වැඳ අවසර ගෙණ තමන්වහන්සේට පැමිණි ආසනයෙහි වැඩහුන්සේක

මෙම කියනලද්දෙයමැයි.

අප්පං බහුස්සුතා නීතා කො සා රක්ඛ මහෙසිනො,
සම්මන්නිත්වාන අත්තානං ථෙරො ධම්මමපුච්ඡි යො.

තථා සම්මන්නි අත්තානං ධම්මාසනගතො සයං,
විස්සජ්ජෙසි තමානන්ද ථෙරො ධම්මමසෙසතො ති.

මේ සියලු බුද්ධවචන රසවශයෙන් ඒකවිධ වෙයි. ධර්‍ම විනය වශයෙන් ද්විවිධ වෙයි. ප්‍රථම මධ්‍යම පශ්චිම වශයෙන් ත්‍රිවිධවෙයි. පිටකවශයෙන්ද ත්‍රිවිධවෙයි. නිකාය වශයෙන්ද පඤ්චවිධවෙයි. අඞ්ග වශයෙන් නවවිධ වෙයි. ධර්‍මස්කන්ධ වශයෙන් අසූසාර දහසක් ස්කන්ධයෝ වන්නාහුයයි දතයුතු.

එහි සියලු ධර්‍මයම රසවශයෙන් එකවිධවූ පරිදි කෙසේද යත්?

සද්ධර්‍මාමෘත දායකවූ අප භාග්‍යවතුන් වහන්සේ සම්‍යක්සම්බොධියට පැමිණ යම් කලෙක අනුපාදිශෙෂ නිර්‍වාණ ධාතුයෙන් පිරිනිවන්පෑ වදාළසේක්ද මේදෑතුරෙහි පන්සාළිස් හවුරුද්දක් ඇතුළත දිව්‍ය මනුෂ්‍ය නාග යක්ෂාදීන්ට අනුශාසනා කරන්නාවූහෝ ප්‍රත්‍යවෙක්ෂා කරන්නාවූහෝ ඒ භාග්‍යවත් ලෝකස්වාමීන් වහන්සෙ විසින් යම් යම් ධර්‍මයක් වදාරණ ලදද අවබොධ කරණලදද ඒ සියලු ධර්‍මයම එකම විමුක්තියයි කියනලද සියලු දුකින් මිදීමවූ අමෘත මහා නිර්‍වාණයම රසකොට ඇත්තේය. මෙසේ ධර්‍මය රස වශයෙන් එකවිධවේ. ධර්‍ම විනය වශයෙන් ද්විවිධවූ පරිදි කෙසේද යත්? විනය පිටකයම විනය නම් වෙයි. අවශෙෂවූ සූත්‍රාභිධර්‍ම පිටකවය ධර්‍ම නම් වේමෙසේ ධර්‍ම විනය වශයෙන් දෙකොටස් වේ ප්‍රථම මධ්‍යම පශ්චිම වශයෙන් ත්‍රිවිධවූ පරිදි කෙසේද යත්?

අනෙක ජාති සංසාරං සන්ධාවිස්සං අනිබ්බිසං,
ගහකාරකං ගවෙසන්තො දුක්ඛා ජාති පුනප්පුනං.

ගහකාරක දිට්ඨොසි පුන ගෙහං න කාහසි,
සබ්බා තෙ ඵාසුකා භග්ගා ගහකූටං විසංඛිතං.
විසංඛාරගතං චිත්තං තණ්හානං ඛය මජ්ඣගා.

මේ ප්‍රථම බුද්ධ වචනයයි. සමහර කෙනෙක් යදා හවෙ පාතු භවන්ති ධම්මා යනාදී ඛන්ධකයෙහි උදාන ගාථාව ප්‍රථම බුද්ධ වචනයයි කියන්නාහුය. ඒ ගාථාතොමෝ බුදුවූ දවසට දෙවෙනිවූ පෑළවිය දිනයෙහි සර්වඥතාඥනයට පැමිණි සොමනස්ස ඥණයෙහි පිහිටා සිට ප්‍රත්‍යයාකාර ධර්මයන් සිහිකරන්නාවූ බුදුරජානන්වහන්සේට උපන් ප්‍රීති පහලකළාවූ උදාන ගාථායයි දතයුත්තීය.

මහාපරිනිර්වාණ කාලයෙහි භික්ෂූන්ට අවගාවදුරා "හන්දදානි භික්ඛවෙ වයධම්මා සංඛාරා අප්පමාදෙන සම්පාදෙථා"ති යනුවෙන් වදාළ යම් අන්තිම බුද්ධ වචනයෙක් ඇද්ද ඒ පශ්චිම බුද්ධ වචනයනම් වේ. 'මේ දෙකැතුරෙහි පන්සාළිස් අවුරුද්දක් ඇතුලත වදාරණලද නම් යම් බුද්ධ වචනයෙක් ඇද්ද ඒ හැම මධ්‍යම බුද්ධ වචන නම් වේ. මෙසේ සියළු ධර්මයම ප්‍රථම මධ්‍යම පශ්චිම වශයෙන් ත්‍රිවිධ වේ. පිටක වශයෙන් ත්‍රිවිධවූපරිදි කෙසේදයත්? සියළුම බුද්ධවචනය විනය පිටකය සූත්‍ර පිටකය අභිධර්ම පිටකයයිකියා තුන් ප්‍රකාර වේ. ඒ ප්‍රකාරණයන්ගේ ප්‍රභෙදය මෙහි ධර්ම සංගායනා ප්‍රවෘත්තියෙහි ප්‍රකාශවූ බැවින් ඒ පිටකත්‍ර විභාග දක්වූගාථා පාළි ක්‍රමය එම නයින් මෙහි දක්වනු ලැබේ. ඒ කෙසේදයත්?

තෙසු පාරජිකා කඩං පාචිත්තිය මථාපරං,
භික්ඛුනීනං විභඞ්ගංච මහාවග්ගා තථා පරො,
චූළවග්ගාච පරිවාරො විනය පිටකන්ති තං මතං.

මෙසේ ප්‍රකාරණ වශයෙන් පසක් වූයේ මේ විනයපිටක නම්වේ

චතුත්තිං සෙව සුත්තානි තිවග්ගා යස්ස සංගහො,
එස දීඝනිකායොති පඨමො අනුලොමිකො.

දියඩ්ඪ සත සුත්තන්තා චෙව සුත්තානි යස්ස සො,
නිකායො මජ්ඣිමො පඤ්ච දසවග්ග පරිග්ගහො.

සත්ත සුත්ත සහස්සානි සත්ත සුත්ත සතානිච,
ඞාසට්ඨි චෙව සුත්තන්තා එසො සංයුත්ත සංගහො.

නවසුත්ත සහස්සානි පඤ්චසුත්ත සතානිච,
සත්ත පඤ්ඤාස සුත්තානි සංඛ්‍යා අංගුත්තරෙ අයං.

ඛුද්දපාඨො ධම්මපදං උදානං ඉතිවුත්තකං,
සුත්තනිපාත විමානං පෙතවත්ථු මථාපරං.

ථෙර ථෙරිව ජාතකං නිද්දෙසො පටිසම්භිදා,
අපදානං බුද්ධවංසො චරියාපිටක මෙවච.
පණ්ණරසප්පභෙදෙයං නිකායො ඛුද්දකො මතො.

මෙසේ නිකාය වශයෙන් පසක් වූයේ සූත්‍රපිටක නම් වේ.

ධම්මසඞ්ගනි විභඞ්ගඤ්ච ධාතුකථා තථා පරං,
තතො පුග්ගල පඤ්ඤත්තිං කථාවත්ථුප්ප කරණං.

යමකං අථ්ඨානං ඉමෙ සත්තප්පභෙදතො,
අභිධම්මො ති පිටකං සම්මාසම්බුද්ධ දෙසිතං ති.

මෙසේ ප්‍රකරණ වශයෙන් සතක්වූයේ අභිධර්ම පිටකනම් වේ මෙසේ මේ ධර්මය පිටක වශයෙන් ත්‍රිවිධවූපරිදි දතයුතුයි.

එහි සියළු බුද්ධවචනයම නිකාය වශයෙන් පසක්වූ පරිදි කෙසේදයත්? දීඝනිකායය, මජ්ඣිමනිකායය, සංයුත්තනිකායය, අඞ්ගුත්තරනිකායය, ඛුද්දකනිකායයයි පඤ්චප්‍රකාර නිකායයන් අතුරෙන් දීඝනිකායාදී සතර සතරක් කොටම ගැණ අවශෙෂ සියළු විනයාභිධර්ම ඇතුළුවූ බුද්ධ වචනයෝ ඛුද්දකනිකායෙහිම ඇතුළත්කොට පස්නිකායක් වූබැව් දතයුතුයි.

මෙම කියනලදමැයි, පූර්වාචාරී වරයන් විසින්.

ඨපෙත්වා චතුරො පෙතෙ නිකායෙ දීඝ ආදිකෙ,
තදඤ්ඤං බුද්ධ වචනං නිකායො ඛුද්දකො මතො ති.

මෙසේ නිකාය වශයෙන් පඤ්චවිධ වේ.

මේ සියළු ධර්මයම අඞ්ග වශයෙන් නවවිධවූ පරිදි කෙසේදයත්? සූත්‍රය, ගෙය්‍යය, වෙය්‍යාකරණය, ගාථාය, උදානය, ඉතිවුත්තකය, ජාතකය, අබ්භූතධර්මය, වෙදල්ලයයි, කියා අඞ්ග වශයෙන් නව ප්‍රභෙද වේ. එහි භික්ෂුවිභඞ්ගය භික්ෂුනී විභඞ්ගයයි කියනලද උභතො විභඞ්ගය නිද්දේශය ඛන්ධක පරිවාරාදිවූද සූත්‍රනිපාතයෙහි මඞ්ගලසූත්‍ර නාලකසූත්‍ර තුවටක සූත්‍රයන්ද අන්‍යවූත් සූත්‍රය යන නම් ඇති යම් බුද්ධ වචනයක් ඇද්ද ඒ සියල්ලම සූත්‍රයයි දතයුතු. ගාථා සහිතවූ සියලු සූත්‍රය ගෙය්‍යයයි දතයුතු. විශෙෂයෙන්ම සංයුත් සඟියෙහි සියලුම සගාථක වර්ගය ඇතුලත්වේ. සියළු අභිධ-පිටකයත් ගාථා නොමැති සූත්‍රයන්ද අන්‍යවූද අවශෙෂ අඞ්ගඅට

හා සංග්‍රහනොවූ යම් බුද්ධ වචනයෙක් ඇද්ද ඒ සියල්ල වෙය්‍යාකරණයයි දතයුතු. ධම්මපදය, ථෙරගාථාය, ථෙරීගාථාය, සුත්තනිපාතයෙහි සූත්‍රයයි නම් නැති සුද්ධික ගාථාවෝද ගාථායයි දතයුත්තේය.

උපන් සතුටු සොම්නස් ප්‍රකාශ ගාථාවෙන් යුක්තවූ දෙඅසූ සූත්‍රාන්තයෝ උදානයයි දතයුතු. ඒ භාග්‍යවතුන්වහන්සේ විසින් මෙය වදාරණලදැයි යනාදි වශයෙන් පවත්නාවූ ද සූහතර සත සූත්‍රාන්තයෝ ඉතිවුත්තකයයි දතයුතු අපණ්ණක ජාතකාදිවූ පන්සිය පනස් ජාතකයෝ ජාතකයයි දතයුතු.

චත්තාරෝ මෙ භික්ඛවෙ අච්ඡරියා අබ්භුතා ධම්මා ආනන්දෙති යනා මේආදි නයප්‍රවෘත්තවූ සියළුම ආශ්චර්ය්‍ය අද්භූත ධර්ම ප්‍රතිසංයුක්තවූ සූත්‍රාන්තයෝ අබ්භූත ධර්මයෝයයි දතයුතු.

චූලවෙදල්ල මහාවෙදල්ල සම්මාදිට්ඨි සක්කපඤ්හ සංඛාරභාජනීය මහාපුණ්ණම සූත්‍රාදි සියල්ලම වෙදයද තුෂ්ටියද ලැබ ලැබ විචාරීමෙන් පහළවූ සූත්‍රාන්තයෝ වේදල්ලයයි දතයුතු. මෙසේ මේ ධර්මය අඞ්ගවශයෙන් නවවිධවේ. එහි ධර්මස්කන්ධ වශයෙන් අසූසාර දහසක්වූ පරිදි කෙසේදයත්?

වාසීතිං බුද්ධතො ගණ්හිං වෙ සහස්සානි භික්ඛුතො
චතුරාසීති සහස්සානි යෙ මෙ ධම්මා පවත්තිනො. යි

මෙසේ සියළු ධර්මස්කන්ධ ගණනායෙන්වූ අසූසාර දහසක් අතුරෙන් විනය පිටකයෙහිවූ ධර්මස්කන්ධයෝ විසිඑක දහසෙක. සූත්‍ර පිටයෙහි ධර්මස්කන්ධයෝ විසිඑක දහසෙක අභිධර්ම පිටකයෙහි ධර්මස්කන්ධයෝ හතලිස් දෙදහසෙකැයි මෙසේ ප්‍රකාශ ධර්මස්කන්ධ වශයෙන් අසූසාර දහසක් ප්‍රභෙද වේ එහි ඒකානුසන්ධික සූත්‍රය එක් ධර්මස්කන්ධයෙක යම් සූත්‍රයක් නොයෙක් අනුසන්ධි ඇත්තේද එහි අනුසන්ධි වශයෙන් හෙවත් සන්ධිගනනායෙන් ධර්මස්කන්ධ ගනනාවෝ වන්නාහුය. ගාථා බන්ධනවල ප්‍රශ්න විචාරීම එක් ධර්මස්කන්ධයෙක. එම ප්‍රශ්නයාගේ විසඳීම එක් ධර්මස්කන්ධයෙක අභිධර්මයෙහි එකී එකී තිකදුක භාජනිය එකී එකී චිත්තවාරය බැගින් වෙන් වෙන්ව සිටි චිත්තවාර භාජන ගණනාවෙන් එකී එකී ධර්මස්කන්ධ නම් වේ—විනය පිටකයෙහි වස්තු ඇත. ඒ ඒ ශික්ෂාපදයන්ගේ අතික්‍රම වස්තු මාතිකා ඇත. පදභාජනීය ඇත අන්තරාපත්ති ඇත අනාපත්ති ඇත එහි ඒ වස්තුආදීන් වෙන්වෙන් කොට දැක්වූ ඉති ශබ්දයා සම්බන්ධවූ තිකාරයෙන් ඡෙදව වෙන්කොට සිටියේ එක එක ධර්මස්කන්ධයෙකැයි දතයුතුයි.

මෙසේ මේ සියළු ධර්‍මස්කන්ධ වශයෙන් අසූසාර දහසක් ප්‍රභෙද වන්නේයි. මේ ආදි නොයෙක් ප්‍රභෙදඇති සියළු ධර්‍මයම සඞ්ගායනාකරන්නාවූ මහාකාශ්‍යපස්ථවිරාදිවූ භික්‍ෂුසංඝයා වහන්සේ විසින් මේ ධර්‍මය මේ විනයයි යනාදි ක්‍රමයෙන් ව්‍යවස්ථා කොට ධර්‍ම සංගායනා කිරීමෙන් සත් මසකින් නිමවනලදී. ඒ ධර්‍මසඞ්ගායනාවගේ කෙළවර අහෝ මහාකාශ්‍යපස්ථවිරයන් වහන්සේ විසින් දසබල ධාරීවූ බුදුරජානන්වහන්සේගේ උතුම් නෛර්‍යාණික ශාසනය පන්දහසක් අවුරුදු මුළුල්ලෙහි පවත්නාසේ සමර්‍ථකොට කරණලද්‍ද සිකියා උපන් සතුටුඇතිව සාධුකාර දෙන්නියක මෙන් දියපොළව අවසන්කොට ඇති මේ මහා පෘථිවි තොමෝ අනෙකප්‍රකාර යෙන් කම්පාවූවාය. පූර්‍වදිසාදි ඒ ඒ දිගට යෙමියත් කම්පාවූවාය. හාත්පසින් නැමී අත්බමරක් මෙන් විශෙෂයෙන් කම්පාවූවාය. එකල්හි අනිකුදු නොයෙක් ආශ්චර්‍ය්‍යයෝද පහළවූවාහුය එ ධර්‍මසඞ්ගායනාව පැවැත්වූ ස්ථවිර භික්ෂූන්වහන්සේලාද ආයුඃපමණින් වැඩසිට පිරිනිවන් පෑවාහුය. මෙම දක්වනලදමැයි පූර්‍වාචාර්‍යවරයන් විසින්—යාලොකෙ.

සතෙහි පඤ්චහිකතා තෙන පඤ්ච සතානිච,
ථෙරෙ හෙව කතත්තාච ථෙරිකාති පවුච්චති.

එවං සත්ත හි මාසෙහි ධම්ම සංගීති නිට්ඨිතා,
සබ්බලොක හිතත්ථාය සබ්බලොක හිතෙසි හි.

මහාකස්සප ථෙරෙණ ඉදං සුගත සාසනං,
පඤ්චවස්ස සහස්සානි සමත්ථං වත්තනෙ කතං.

අතීව ජාත පාමුජ්ජා සංධාරක ජලන්තිකා,
සඞ්ගීති පරියොසානෙ ඡධාකම්පි මහාමහී.

අච්ඡරියා නිවාහෙසුං ලොකෙ නෙකානි නෙකධා,
ථෙරෙහෙව කතත්තාච ථෙරිකායං පරංපරා.

පඨමං සංගහං කත්වා කත්වා ලොකහිතං බහුං,
තෙ යාව තායුකං ඨත්වා ථෙරා සබ්බෙව නිබ්බුතාති.

මෙසේ අනුබුඹවූ මහානුභාවසම්පන්න මහා කාශ්‍යපස්ථවිරාදී පන්සියයක් පමණ මහ රහතන් වහන්සේලම එක්ව වැඩහිඳ සත්මසක් මුළුල්ලෙහි සංගායනා කරණතරම් විවිධ විශෙෂතායෙන් බබලන සර්‍වඥශාසන සංඛ්‍යාත උතුම් ධර්‍මකාය සම්පත්තියක් ඇතිහෙයින් අචින්ත්‍යවූ මාගේ බුදුරජානන්වහන්සේ සාසනානම් වනසේක.

එසේහෙයින් කියනලදී

දෙව යක්ඛ මනුස්සානං ලොකෙ අග්ග ඵලං දදං,
දදන්තං දමියං තානං පුරිසා ජඤ්ඤ තෙ නමො ති.

## මල්වැඩ පිණිස කරණලද මේ ශ්‍රී සද්ධර්මාවාද සංග්‍රහයෙහිවූ පළමුවෙනි ධර්මසංගායනා කථාවකියා නිමවනලදී.

මේ පළමුවෙනි ධර්ම සංගායනාව මෙසේ කරවා බුද්ධ ශාසනය පවත්වාලීමෙහි සහායවසිටි අජාසත් මහරජතෙම සර්ව සමෘද්ධිසම්පන්න විසාලාමහනුවර ලිච්ඡවි රජදරුවන්ගේ ප්‍රතිබාහනය පිණිස පංචමහා ගංගාවන් අතුරෙන්ප්‍රධානවූ ගංගානම්නදියගේ ගෞතම නම් තීර්ථයට තුදුරුතන්හි පාටලීග්‍රාමයෙහි පාටලිපුත්‍ර නම්වූ මහත් නුවරෙක් ඇතිකොට බුදුන් පිරිනිවි කල්හි මහා ධාතු නිධානකළ ඉක්බිත්තෙන් රජගහනුවර හැරපියා ගොස් එම පැලලුප්නුවර විසූයේය. ඒ අජාසත් රජහට ඉක්බිත්තෙන් එම පැලලුප්නුවරම විසූ උදයභද්‍ර නම් රජය, අනුරුද්ධ නම් රජය, මුණ්ඩනම් රජය, නාගදාස නම් රජය, සුසුනාග නම් රජය, යන මේ මහ රජදරුවන් සන්දනොකු ඇවෑමෙන් රාජ්‍යාභිෂෙකයට පැමිණියාවූ කාලාසොක රජ්ජුරුවන්ට දසවෙනි අවුරුද්දෙහි එතනට බුදුන් පිරිනිවී අවුරුදු සියයක් ඉක්ම ගියකල්හි ආයුෂ්මත් කාකණ්ඩපුත්‍ර නම්වූ යස මහ තෙරුන්වහන්සේ වැදූරම් චාරිකා කොට ඇවිදිනාසේක් විසාලා මහනුවර වසන වජ්ජිපුත්‍රක භික්ෂූහු දසවස්තුවක් අමුතුවෙන් ප්‍රකාශකොට කියා එහි ඇවිදින්ය යනු අසා මෙසේ සිතූසේක. ඒ දස වස්තුවනම් කවරහයත්? යම්කිසි භගෙක ලාභගෙනණ තමා පරිහරණයකළ එනු යාවකාලික වස්තුවහා මිශ්‍රකොට වැලඳීමට වටනේය. සන්නිධි නොවෙසි යනු එකෙක, යාවකාලිකවස්තු පස්වරු ඉරනැමුනු දෑහලක් දක්වා වලඳන්ට වටනේය යනු එකෙක, පැවරී ඇවැත් ඇත්තේ කැපනොකළ භොජනය අන් ගමකදී වලඳන්ට වටනේය යනු එකෙක, මහාසීමාව ඇතුලත නොයෙක් ආවාසවල වෙනවෙනම පොහෝ පවුරුනු ආදිය කරන්ට වටනේය යනු එකෙක, ඇතුළු සීමාවෙහි සිටියවුන්ගෙන් ඡන්දයහා පාරිසුද්ධිය නොගෙන එක්ව පොහෝපවුරුණු ආදිය කොට පසුව ඒ භික්ෂූන්ගෙන් අනුමැතිය ගන්නට වටනේයයි යනු එකෙක, පූර්වාචාරිවරයන් කළාවූ කැප අකැප වස්තුයෙහි ඔවුන් කෙළේම යයි එසේ කැප අකැපට පැමිණ තමාටද කිරීම වටනේයයි යනු එකෙක, පැවරීම අඩමුස්සනාදි කැප නොකොට වලඳන්ට වටනේ

මෙසේ මේ සියලු ධර්මස්කන්ධ වශයෙන් අසූසාර දහසක් ප්‍රභෙද වන්නේයි. මේ ආදි නොයෙක් ප්‍රභෙදඇති සියලු ධර්මයම සඞ්ගායනාකරන්නාවූ මහාකාශ්‍යපස්ථවිරාදිවූ භික්ෂුසංඝයා වහන්සේ විසින් මේ ධර්මය මේ විනයයි යනාදි ක්‍රමයෙන් ව්‍යවස්ථා කොට ධර්ම සංගායනා කිරීමෙන් සත් මසකින් නිමවනලදී. ඒ ධර්මසඞ්ගායනාවගේ කෙළවර අහෝ මහාකාශ්‍යපස්ථවිරයන් වහන්සේ විසින් දශබල ධාරීවූ බුදුරජානන්වහන්සේගේ උතුම් නෛර්‍යාණික ශාසනය පන්දහසක් අවුරුදු මුළුල්ලෙහි පවත්නාසේ සමර්ථකොට කරණලද්ද සිකියා උපන් සතුටුඇතිව සාධුකාර දෙන්නියක මෙන් දියපොළව අවසන්කොට ඇති මේ මහා පෘථිවී නොයෙක් අනෙකප්‍රකාරයෙන් කම්පාවූවාය. පූර්වදිසාදි ඒ ඒ දිශට යෙමින් කම්පාවූවාය. හාත්පසින් නැමී අත්බමරක් මෙන් විශෙෂයෙන් කම්පාවූවාය. එකල්හි අතිකුදු නොයෙක් ආශ්චර්යයෝද පහළවූවාහුය එ ධර්ම සඞ්ගායනාව පැවැත්වූ ස්ථවිර භික්ෂූන්වහන්සේලාද ආයුඃපමණින් වැඩසිට පිරිනිවන් පෑවාහුය. මෙම දක්වනලදමැයි පූර්වාචාරීවරයන් විසින්—යාලොකෙ.

සතෙහි පඤ්චහිකතා තෙන පඤ්ච සතානිච,
ථෙරෙ හෙව කතත්තාව ථෙරිකාති පවුච්චති.

එවං සත්ත හි මාසෙහි ධම්ම සංගීති නිට්ඨිතා,
සබ්බලොක හිතත්ථාය සබ්බලොක හිතෙසි හි.

මහාකස්සප ථෙරෙණ ඉදං සුගත සාසනං,
පඤ්චවස්ස සහස්සානි සමත්ථං වත්තනෙ කතං.

අතීව ජාත පාමුජ්ජා සංධාරක ජලන්තිකා,
සඞ්ගීති පරියොසානෙ ඡධාකම්පි මහාමහී.

අච්ඡරියා නිවාහෙසුං ලොකෙ නෙකානි නෙකධා,
ථෙරෙහෙව කතත්තාච ථෙරිකායං පරංපරා.

පඨමං සංගහං කත්වා කත්වා ලොකහිතං බහුං,
තෙ යාව තායුකං ඨත්වා ථෙරා සබ්බෙව නිබ්බුතාති.

මෙසේ අනුබුද්ධවූ මහානුභාවසම්පන්න මහා කාශ්‍යපස්ථවිරාදී පන්සියයක් පමණ මහ රහතන් වහන්සේලාම එක්ව වැඩහිඳ සත්මසක් මුළුල්ලෙහි සංගායනා කරණතරම් විවිධ විශෙෂත්වයෙන් බබලන සර්වඥශාසන සංඛ්‍යාත උතුම් ධර්මකාය සම්පත්තියක් ඇතිහෙයින් අර්හත්වූ මාගේ බුදුරජානන්වහන්සේ සාසනානම් වනසේක.

එසේහෙයින් කියනලදී

දෙව යක්ඛ මනුස්සානං ලොකෙ අග්ග ඵලං දදං,
දදන්තං දම්මියං තානං පුරිසා ජක්ඛු තෙ නමො ඝී.

**ලෝවැඩ පිණිස කරණලද මේ ශ්‍රී සද්ධර්මාවාද**
**සංග්‍රහයෙහිවූපළමුවෙනි ධර්මසංගායනා කථාවකියා නිමවනලදී.**

මේ පළමුවෙනි ධර්ම සංගායනාව මෙසේ කරවා බුද්ධ ශාසනය
පවත්වාලීමෙහි සහායවසිටි අජාසත් මහරජතෙම සර්ව සමෘද්ධිසම්ප
න්න විසාලාමහනුවර ලිච්ඡවි රජදරුවන්ගේ ප්‍රතිබාහනය පිණිස
පංචමහා ගංගාවන් අතුරෙන්ප්‍රධානවූ ගංගානම්නදියගේ ගෞතම
නම් තීර්ථයට තුදුරුතන්හි පාටලීග්‍රාමයෙහි පාටලිපුත්‍ර නම්වූ මහත්
නුවරෙක් ඇතිකොට බුදුන් පිරිනිවී කල්හි මහා ධාතු නිධානකළ
ඉක්බිත්තෙන් රජගහනුවර හැරපියා ගොස් එම් පැලලුප්නුවර
විසුයේය. ඒ අජාසත් රජහට ඉක්බිත්තෙන් එම පැලලුප්නුවරම
විසූ උදයභද්‍ර නම් රජය, අනුරුද්ධ නම් රජය, මුණ්ඩනම් රජය,
නාගදාස නම් රජය, සුසුනාග නම් රජය, යන මේ මහ රජදරුවන්
සංදෙනෙකු ඇවෑමෙන් රාජ්‍යාභිෂෙකයට පැමිණියාවූ කාලාසොක
රජ්ජුරුවන්ට දසවෙනි අවුරුද්දෙහි එතනට බුදුන් පිරිනිවී අවු
රුදු සියයක් ඉක්ම ගියකල්හි ආයුෂ්මත් කාකණ්ඩපුත්‍ර නම්වූ යස මහ
තෙරුන්වහන්සේ වැදූරම චාරිකා කොට ඇවිදිනාසේක් විසාලා
මහනුවර වසන වජ්ජිපුත්‍රක භික්ෂූහු දසවස්තුවක් අමුතුවෙන් ප්‍රකා
ශකොට කියා එහි ඇවිදින්ය යනු අසා මෙසේ සිතූසේක. ඒ දස
වස්තුවනම් කවරහයත්? යම්කිසි භෙහෙක ලාගෙනණ තමා පරි
හරණයකළ එනු යාවකාලික වස්තුවහා මිශ්‍රකොට වැලඳීමට වට
නේය. සන්නිධි නොවෙයි යනු එකෙක, යාවකාලිකවස්තු පස්වරු
ඉරනැමුනු දැහලක් දක්වා වලඳන්ට වටනේය යනු එකෙක,
පැවරී ඇවැත් ඇත්තේ කැපනොකළ භොජනය අන් ගමකදී
වලඳන්ට වටනේය යනු එකෙක, මහාසීමාව ඇතුලත නොයෙක්
ආවාසවල වෙනවෙනම පොහෝ පවුරුනු ආදිය කරන්ට වට
නේය යනු එකෙක, ඇතුළු සීමාවෙහි සිටියවුන්ගෙන් ඡන්දසහා
පාරිසුද්ධිය නොගෙන එක්ව පොහෝපවුරුණු ආදිය කොට පසුව
ඒ භික්ෂූන්ගෙන් අනුමැතිය ගන්නට වටනේයයි යනු එකෙක,
පූර්වාචාරිවරයන් කළාවූ කැප අකැප වස්තුයෙහි ඔවුන් කෙළේම
යයි එසේ කැප අකැපට පැමිණ තමාටද කිරීම් වටනේයයි යනු
එකෙක, පැවරීම අඩමුකනාදි කැප නොකොට වලඳන්ට වටනේ

ය යනු එකෙක, නොලා තුම්බුනුකළ රනපිම වටනේය යනු එකෙක,
දනැති නිසඳුන් වටනේය යනු එකෙක, රන් රිදී මසු කහවනු
ආදි වස්තුව පිළිගන්ට වටනේය යනු එකෙක, මෙම කියනලද
මැයි. කප්පති සිඞ්ගිලොණකප්පො කප්පති ද්වංගුලකප්පො කප්පති
ගාමන්තරකප්පො කප්පති ආවාසකප්පො කප්පති අනුමතිකප්පො
කප්පති අචිණ්ණකප්පො කප්පති අමථිතකප්පො කප්පති ජළොගිං
පාතුං කප්පති අදසකං නිසීදනං කප්පති ජාතරූපරජතං යි.

මෙබඳු දසවස්තුවක් වජ්ජිපුත්‍රක භික්ෂූන් ප්‍රකාශ කෙරෙත්යි
යනු අසා යම් ඒ මාවැනි තෙරනු කෙනෙක් මෙබඳුවූ සර්වඥයන්
වහන්සේගේ ශාසන විපත්තිය අසඅසා නිරුත්සාහීව වැදහුන්නේ
නම් ඒ මට සුදුසු නොවන්නේය. එබැවින් මම අධර්මවාදීන්ට නිග්‍රහ
කොට ධර්ම ප්‍රකාශ කෙරෙම් සිතා දෙළොස් ලක්ෂයක් භික්ෂූන් මහ
වනවෙහෙර කූටාගාර ශාලාවට රැස්කරවා ඒ භික්ෂූන්වහන්සේලා
මධ්‍යයෙහි රේවතස්ථවිරයන් වහන්සේලවා සවාමිනි අහළුතුලා
පරිහරණයකොට වැලඳීම කැපද යනාදී ක්‍රමයෙන් පිළිවිසවා අන
දමහතෙරුන් වහන්සේගේ සද්ධිවිහාරිකවූ සර්වඥයන් දුටුවිරූ එක්
සිය විසිඅවුරුද්දකට ආයුඇති සර්වකාමි ස්ථවිරයන්වහන්සේලවා
ඇවැත්නි අහළුතුලා පරිහරණය කොට එදවස් පිළිගත් යාවකා
ලික වස්තූන්හා මුසුකොට වලඳන්ට නොවටනේය යනාදීන්
විනය විසර්ජනය කරවා ඒ දසවස්තූන්ම ධර්මයෙන් ශාස්තෘ ශාස
නයෙන් පහකොට නැවත ධර්ම විනය සංගායනා කරම්හයි කියා
ඒ දෙළොස් ලක්ෂයක් පමණ භික්ෂූන් අතුරෙන් ත්‍රිපිටකධාරී සිවු
පිළිසිඹියාපත් ක්ෂීණාශ්‍රවවූ සත්සියයක්දෙනා වහන්සේ තෝරා
ගෙණ විසාලාමහනුවර වාළුකාරාමයෙහි රැස්වහිද කාලාසෝක
රජ්ජුරුවන් විසින් කරණලද ආරක්ෂා සහාය ඇතිව සියළු ශාසන
මලය සුඩකොට මහාකාශ්‍යපස්ථවිරයන්වහන්සේ පරිද්දෙන් නැව
තත් පිටකවසයෙන්ද නිකායවසයෙන්ද අඞ්ගවසයෙන්ද ධර්මස්කන්ධ
වසයෙන්දැයි සියළු ධර්මවිනය සඞ්ගායනාකොට අටමසකින් නිමවා
ආයුප්‍රමාණින් වැඩසිට සියළු ක්ෂීණාශ්‍රවයන්වහන්සේලාම පිරිනිවන්
පෑවාහුය.

—: මෙම කියනලදමැයි පුරාතනයන් විසින් :—

අතීතෙ දසමෙ වස්සෙ කාලාසොකස්ස රාජිනො,
සම්බුද්ධ පරිනිබ්බාණා එකවස්ස සතං අහු.

තදා වෙසාලියා භික්ඛූ අනෙකා වජ්ජි පුත්තකා,
දසවත්ථූනි දීපෙසුං කප්පන්තීති අලජ්ජිනො.

යාළ්ලාදකා.

> සමෙන්ති සහස්සානි කත්තානෙන සත්තසතානි ච,
> පුබ්බකතං උපාදාය දුතියාති ච වුච්චති.
>
> යෙහි ථෙරෙහි සංගීතා සංගීති තෙසු විස්සුතා,
> සබ්බකාමී ච සාළ්හො ච රෙවතො ඛුජ්ජසොභිතො.
>
> යසො ච සාණසම්භූතො එතෙ සද්ධිවිහාරිකා,
> ථෙරා ආනන්දථෙරස්ස දිට්ඨපුබ්බා තථාගතං.
>
> සුමනො වාසභගාමී ච ඤෙය්‍යා සද්ධිවිහාරිකා,
> ද්වෙ ඉමෙ අනුරුද්ධස්ස දිට්ඨපුබ්බා තථාගතං.
>
> දුතියො පන සංගීතො යෙහි ථෙරෙහි සංගහො,
> සබ්බෙපි පන්නභාරා තෙ කතකිච්චා අනාසවා.
>
> සබ්බකාමිප්පභූතයො තෙපි ථෙරා මහිද්ධිකා,
> අග්ගික්ඛන්ධාව ලොකම්හි ජලිත්වා පරිනිබ්බුතා.යි—

මෙසේ ආනන්දස්ථවිරයන් වහන්සේගේ සද්ධිවිහාරික බුදුන් දුටු විරුසර්වකාමිස්ථවිරාදිවූ ළුසාල්හය, රෙවතය, සොභිතය, යසස, සානසම්භූතය යන බුද්ධ පුත්‍රයන් වහන්සේලා හා එසේම අනුරුද්ධ ස්ථවිරයන් වහන්සේගේ සද්ධිවිහාරිකවූ සුමණය, වාසභගාමිය යන බුදු දුටු දෙන්දනා වහන්සේද ඇතුළුවූ මහත් ඉද්ධ්‍යානුභාව ඇති සත්සියයක් පමන ක්ෂීනාශ්‍රවයන් වහන්සේලාම එක්ව වැඩහිඳ අටමසක් මුළුල්ලෙහි සංගායනා කරණසේ අසංඛ්‍යනසින්ම බබලන අනන්තප්‍රකාර සද්ධර්මානුශාසනා ඇති හෙයින් සඬ්ඛ්‍යරහිත නිසිනි කොතවූ මාගේ බුදුරජානන් වහන්සේ ශාස්ත්‍රෑනාම් වනාසේක. එසේ හෙයින් කියනකලදී—

> දෙව යක්ඛ මනුස්සානං ලොකෙ අග්ගඵලං දදං,
> දදන්තං දමයන්තානං පුරිසාජඤ්ඤුත්තමො.

මෙතෙකින් මේ ලොවැඩ පිණිස කරණලද ශ්‍රී සද්ධර්මෝවාද සංග්‍රහයෙහි දෙවෙනි ධර්මසංගායනා කථාව කියා නිමවනලදී.

මෙසේ ඒ කාලාශෝක රජු දවස එම රජහුගේ සහායෙන් ඉතා [illegible] ඇති යසමහාථෙරුන් වහන්සේ ප්‍රාසමග සත්සාන [illegible]සන් මිටින්කරණලද රාගාදි මලඇති ක්ෂීණාශ්‍රවයන් වහන්සේලා

එසේ වැඩහිඳ දසදහසක් පමණ පාප භික්ෂූන් ශාසනයෙන් පිටත් කොට නෛර්‍යාණික ධර්මයම තෝරා පරිශුද්ධකොට අටමසක් මුළුල්ලෙහි සංගායනා කිරීමෙන් පැවැත්වූ ස්ථවිරවාද නම්වූ බුදුන් විද්‍යමාන කාලයෙහි පටන් ආකාශ ගඞ්ගා ජලප්‍රවාහයක්මෙන් අනාවිලවූ ජාතිරඞ්ග මාණික්‍යයක්මෙන් පිරිසිදුවූ පද්ම පත්‍රය හා එක්නොවන්නාවූ ජල බින්දුවක්මෙන් අන්‍ය නිකාය වාසීන්ගෙ ධර්මය හා අමිශ්‍රව ලොකයාහට අමෘත මහා නිර්වාණ රසයම වහනයකොට දෙන්නාවූ පූර්ණ චන්ද්‍රයාමෙන් දෙව් මිණිසුන් සහිතවූ ලොකයා පිණවමින් අද දක්වාම පවත්නා අර්ථ කථා සහිත පිටකත්‍රය ධර්මයද පවතිමින් සිටියදී මහ බොධියෙන් කපානලද පිලලමෙන් එකල අධර්මවාදීහුයයි තෝරාහල දසදහසක් පමණ පාප භික්ෂූහු මහා සංඝික නම්වූ සද්ධර්මයට විරුද්ධ ආචාර්‍ය වාදයක් කළහ—ඊට ඉක්බිතිව විෂ වෘක්ෂයකින් නික්මුනාවූ පව සාඛාවක්මෙන් එමහා සංඝික නිකායෙන්ම භෙද කොටගෙණ ගොකුලිකය, එකව්‍යොහාරිකය, පඤ්ඤත්තිවාදය, බාහුලිකය, චෛතියවාදය යන මේ ආචාර්‍ය වාදයන් පසක් කළහ. ඉක්බිත්තෙන් එම පාප භික්ෂූහුම මහිංසාසකය, වජ්ජිපුත්තකය, ධම්මුත්තරියය, භද්‍රයානිකය, ඡන්නාගාරිකය, සම්මිතීනිකාය, සබ්බවාදිය, ධර්මගුත්තිකය, කස්සපිකය, සංක්‍රාන්තිකය, සූත්‍රවාදීය යන මේ එකොලොස් ආචාර්‍ය වාදයන් කළාහ—

මෙසේ ස්ථවිරවාදයෙන් සතලොස් වාදයෙකතොක් වෘක්ෂකණ්ඩයකින් නික්මුනාවූ ගිනිකඳක්මෙන් බුදුන් පිරිනිවී දෙවෙනි අවුරුදු සියයෙහි උපන්හ—එයින් මත්තෙහි ලාභ සත්කාරනිසා ගන්නාලද භික්ෂු වෙස්ඇති වෛදත්‍රයෙහි පරතෙරට පැමිණි ශාසනයෙන් පිහිට නොලැබ ගියාවූ අන්‍ය තීර්ථකයො බුදුන්ගේ ධර්මය තීර්ථක ධර්මයෙහි බහා එතීර්ථක ධර්මය බුද්ධධර්මය හා එක්කොට යොදාගෙන පෘථග්ජන ලොක්වාසීන් වඤ්චාකොට එ එ සත්වයන්ට කියා ඇවිදිමින් අඥාණ සත්වයන්ට වර්ණ ගන්ධ රස ආදියෙන් මීදුරු අඹ පල වැනිවූ කිම්පක්කනම් විෂ ඵලමෙන් අධර්මය ධර්මයලෙස දක්වා සර්වඥ වචනයයි ව්‍යවහාර කරණණාවූ භික්ෂු වෙසධාරී තීර්ථකයෝ හෙමවතය, රාජගිරිය, සිද්ධාර්ථකය, පුබ්බසෙලිකය, අපරසෙලිකය, වාජිරියය යන මේ ආචාර්‍ය වාද සයක් ඉපදවූහ—මෙසේ මේ සූවිස්සක් පමන ආචාර්‍ය වාදයෝ දඹදිව් උපන්හ—

එකල්හී බුදුන් පිරිනිවී දෙසිය විසිඅටවන වර්ෂයෙහි සියළු අන්‍ය තීර්ථකයෝ සැටදහසක් පමණ පිරිහුනු ලාභ සත්කාර ඇත්තා තුමූ තුමූම හිස මුඩුකොට කාෂාවස්ත්‍ර හැඳ පෙරව භික්ෂු වෙස ගෙණ විහාරවල ඇවිදිමින් උපෝසථ කර්මාදියට වැදීමෙන් නොසිල්වූ බුද්ධ

ශාසනයට අර්බුදමල ඉපදවූවානුය—එහෙයින් සියළු ජම්බුද්වීපයෙහි යහපත් භික්ෂුසංඝයා වහන්සේ සත්වුරුද්දක් උපොසථකම් නොකල සේක—එකලට ධර්මාශෝක රජනු රාජ්‍යාභිෂේකලත් පසළොස් වර්‍ෂයෙන් විය.—ඒ ධර්මාශොක රජතෙමේ බුද්ධශාසනය නෛර්මලව ශුද්ධ කොට එවත්වනු කැමතිව එකලට සංඝසථවිරවූ මොග්ගලිපුත්ත තිස්ස මහතෙරුන්වහන්සේ සුපිරිරුක්ලියෙන් ගැවසීගත් තමන්ගෙ උද්‍යානයට වඩාගෙණ ගොස් පිටතින් තුන් වලල්ලෙක රැකවල් ලවා තුමූම තෙරුන්වහන්සේගේ පා සොධා තෙල් ගල්වා වඩා හිඳුවා සවම්පයෙහි සතියක් මුළුල්ලෙහි වැස එම තෙරුන් වහන්සේගෙන් ආගම ධර්මය උගත්සේක—

කෙසේ ඉගැන්නුසේක්දයත්—අප බුදුහු සාරාසංඛ්‍ය කප් ලක්‍ෂයකින් මත්තෙහි සුමෙධ නම් තාපසව දීපංකර සර්වඥයන් වහන්සේ සවම්පයට පැමිණ හස්තප්‍රාප්තවූ නිර්වාන ධර්මය හැරපියා හවදුහීයව වැද සමතිස් පෙරුම්පුරා තුසීපුර පැමිණ දසදහසක් සක්වල දිව්‍ය බ්‍රහ්මයන්ගේ ආරධනාවෙන් කිඹුල්වත ඉපිද ක්‍රමයෙන් වැඩී මහාභිනික්මන්කොට බෝමැඩ වැඩහිද සවාසනා සර්වකෙලශයන් නසා සර්වඥතාඥානය සමධිගමයකොට ඉසිපතන මිගදායෙහිදි දම්සක් පැවතුම් සූත්‍ර දෙශනාකොට සියළු සත්වයන් සංසාර නමැති සාගරයෙන් ගොඩනගමින් සංසාර නමැති කාන්තාරයෙන් එතර කෙරෙමින් සංසාර නමැති බන්ධනයෙන් මුදමින් වෛනෙයජණ නැමති ඇඹුලවනය ප්‍රබොධ කෙරෙමින් ධර්මාමෘත වර්‍ෂාව වසවමින් පන්සාලිස් හවුරුද්දක් මුළුල්ලෙහි වැඩසිට සුවාසූ දහසක් ධර්මස්කන්ධයන් දෙසන්නාවූ සර්වඥයන් වහන්සේ විසින් ලොකයෙහි සද්ධර්මය හා සමානවූ ධර්මයක් උපදනාසේ දැක මහසුප් මහ තෙරුන් වහන්සේට සද්ධර්ම ප්‍රතිරූපකවූ සූත්‍රය දෙසූ පරිද්දැක්වූසේක.

සද්ධර්මය පරික්‍ෂාකොට ගතමනාපරිදි දක්මින් සංඝයා වහන්සේට මහා ප්‍රදෙශනම් සූත්‍ර දෙශනාවක් කලපරිදි දැක්වූසේක—අනාගතයෙහි සස්නට වදනාවූ පස් භයක් දැකගත්නා හෙයින් භයනම් සූත්‍ර දෙශනාවක් දැක්වූසේක. බුදුන් සූවිසි අසංඛ්‍යයක් දිව්‍ය මනුෂ්‍යයන් අමා මහ නිවනට පමුනුවා යමක සල්ගස් අතර ශතපි පිරිනිවීකල්හී මහසුප් මහ තෙරුන්වහන්සේ ප්‍රධානකොට ඇති පන්සියයක් රහතුන් වහන්සේ සර්වඥතාඥාන, අනාවරණ ඥාණ, මාර්ගඥාණ, ඵලඥාණ නැමති රුවන් ආකාරයෙහි උපන් දහම් රුවන් ගෙණ රුවන් දමක්මෙන් ගොතා සථවිරනිකාය නැමති රත්න මංජුසායෙහි නිධානකල පරිදි දැක්වූසේක—ඉක්බිති

මහා සංඝිකානිකායාදී සපත රස නිකාය වාසීහු භික්ෂූන් ඒ ඒ සූත්‍ර පදයෙහි තුනුවනින් අර්ථ වරදවාගෙණ අනෙක ප්‍රකාරව ලබ්ධි උපදවා උන් භූතකල පරිදි දැක්වූසේක—ඊට ඉක්බිතිව නෙම වනාදිවූ ෂට් නිකායවාසී භික්ෂු ප්‍රතිරූපක තීර්ථකයන් විසින් බුදුන්ගේ ධර්මය තීර්ථක ධමයෙහි බහා එක්කොට ඉයාදුනෙනා පෘථුජ්ජන ලොකයා වංචාකොරමින් අධර්මය ධර්ම ලෙසයෙන් දක්වා සර්වඥ සාසනය හෙදයට පමුනුවා සධර්මය හා සමානකොට වර්ණි පිටකාදී ග්‍රන්ථ කලපරිදි දැක්වූසේක.

ඉක්බිත්තෙන් මේ සියල්ලම ප්‍රභාස්වර රූපයෙන් සිටියාවූ සථවිර නිකාය නැමැති පූර්ණ චන්ද්‍ර මණ්ඩලයක්මෙන් නිකායාන්තර ලබ්ධි නැමැති අභ්‍ර මහික ධූම රජ රාහු යන පංචොපක්ලෙසයෙන් නොකිළුටුවූ අමෘත රශ්මියෙන් සත්ව නැමැති කුමුදු වනය ප්‍රබුද්ධවමින් සියළු ලොව සනහමින් පවත්නා පරිදි දැක්වූසේක—මෙපරිද්දෙන් ඒ මොග්ගලිපුත්තතිස්ස මහ තෙරුන් වහන්සේ රජ්ජුරුවන්ට සියළු සමයාන්තර ඉගැන්වූසේක—එ ධර්මාසොක මහරජ එසතිය ඇතුලත තමා සමීපයට ආවාවූ යක්ෂයන් දෙදෙනෙකු ලවා සියළු ජම්බුද්වීපයෙහි භික්ෂූන් වහන්සේ අශොකාරාමයට රැස්කරවා සත් වෙනි දවස් තෙරුන්වහන්සේ කැඳවාගෙන විහාරයට ගොස් තිරය ඇතුලෙහි තෙරුන්වහන්සේ හා පසුව එකත්පස්වහිද සමය විලබ්ධිඇත්තාවූ-භික්ෂූන් එක්තැනකටරැස්කරවා ඉන්එකිඑකී භික්ෂු සමූහයා සමීපයට කැඳවා ගෙන්වාගෙන ස්වාමීනි බුදුහු කවරවාදී සේක්දැයි විචාලේය—එකල්හි ආත්මය නිත්‍යයයි ගත් චතුර්විධ සාස්වතවාදීහු බුදුහු ශාස්වතවාදීවූ සේකැයි කීහ—එසේම ඇතැම් කෙනෙක් අනිත්‍යයහයි ගත් චතුර්විධ එකච්ච ශාස්වතවාදීහු බුදුහු එකච්ච ශාස්වතවාදී සේකැයි කීහ—එසේම ආත්මයානග අනන්ත ඇත්තේයයි කියාද නැත්තේයයි කියාද ගත්තාවූ චතුර්විධ අනන්තානන්තිකවාදීහුද එසේම තමතමන්ගේ ලබ්ධි විචාලකල ඒකාබා අනික් දෙයක් කියා විකෂේපකරන්නාවූ චතුර්විධ අමරාවික්ෂෙපිකවාදීහුද සියළු ලොකවාසීවූ සත්වයෝ කුසලාකුසලාදිවූ හේතුවක් නැතිව නිස්කාරණයෙන් උපන්නෝයයි ගත්තාවූ විවිධ අධිත්‍යසමුත්පන්නිකවාදීහුද ආත්ම සංඥ ඇත්තේයයි ගත්තාවූ සොළස ප්‍රකාර සංඥවාදීහුද ආත්ම සංඥව නැත්තේයයි ගත්තාවූ අෂ්ට ප්‍රකාර අසංඥවාදීහුද ආත්ම සංඥව ඇත්තේයයි කියාද නැත්තේයයි කියාද ගත්තාවූ අෂ්ට ප්‍රකාර නෙවසංඥ නාසංඥවාදීහුද මරනින් මතෙහි ආත්මයක් දෙයෙක් මතු උත්පත්තියෙක් නැතැයි ගත්තාවූ සප්ත ප්‍රකාර උච්ඡෙදවාදීහුද, මුඛය දක්වා

රුධිර පානයකොට සම්පූර්ණවකල චිත්ත නිවෘත්තිය වන්නාවූ ජළූකාවන්මෙන් රූප ශබ්දාදිවූ පංචකාම කොට්ඨාසය අනුභවකල කල්හි තෘෂ්ණා නිවෘත්තිය වන්නේය එම නිර්වාණයයි ගත්තාවූ පංචප්‍රකාර දෘෂ්ටධර්ම නිර්වාණවාදීහුද බඳුහු දෘෂ්ටධර්ම නිර්වාණවාදී සේකැයි කීහ—මෙසේ කීකල්හි ධර්මාශෝක රජ්ජුරුවෝ පළමු කොටම උගන්නාලද සමය ඇති බැවින් මොවුහු භික්ෂූහු නොවෙති මොවුහු අන්‍ය තීර්ථකයෝහයි දැන ඔවුන්ට සුදු පිළිදී සැටදහසක් තීර්ථකයන් සිවුරු හරවා දුරුකොට භික්ෂූන්වහන්සේද සමීපයට කැඳවා ස්වාමීනි බුදුහු කවරවාදීසේක්දැයි විචාරා මහ රජ්ජුරුවෙනි සර්ව ධර්මයන් සර්වාකාරයෙන් විභාගකොට කියනහෙයින් බුදුහු විභජ්ජවාදීසේකැයි කීකල්හි ස්වාමීනි බුදුහු විභජ්ජවාදීසේක්දැයි කියා මොග්ගලිපුත්තතිස්ස මහ තෙරුන්වහන්සේගෙන් විචාරා එසේය මහරජ්ජුරුවෙනි කීකල්හි ස්වාමීනි දැන් ශාසනය සුද්ධයට ගියේය භික්ෂුසංඝයා වහන්සේ පොහෝකරණ සේක්වයි කියා දුරු කොට හැරිය යුත්තන් හැර වට රැකවල් ලවා නුවරට වන්නාහුය—

ඉක්බිත්තෙන් ආයුෂ්මත්වූ මොග්ගලිපුත්තතිස්ස මහ තෙරුන් වහන්සේ සමගි සංඝයා හා එක්ව සමගි පොහෝකොට එසමාගමයෙහි සුසැට ලක්ෂයක් පමන භික්ෂූන්වහන්සේ මධ්‍යයෙහි පරවාදීන්ගේ වාද මඩිමින් බුදුන් විසින් දෙශනාලද මාතෘකාඇති කථාවස්තු ප්‍රකරණ නම් ධර්මයක් විස්තරකොට වදාරා ඒ සිවුසැට ලක්ෂයක් භික්ෂූන් වහන්සේගෙන් තෝරතෝරා ත්‍රිපිටක පර්‍යාප්තිධරවූ චතුප්‍රතිසම්භිදාප්‍රාප්ත ත්‍රිවිද්‍යාවෙන් යුක්තවූ දහසක් භික්ෂූන් වහන්සේ තෝරාගෙන අසෝකාරාමයෙහි රැස්වහිද ධර්මාශෝක රජ්ජුරුවන් විසින් කරණලද ආරක්ෂා ඇතිසේක් සියලු සාසනය සුද්ධකොට මහා කාශ්‍යපස්ථවිරයන් වහන්සේමෙන්ද යසස්ථවිරයන් වහන්සේමෙන්ද සියලු ධර්ම විනය සංගායනාකොට නව මසකින් නිමවූසේක—එකල්හි සාසනස්ථිතිය කාරනාකොට සාධුකාර දෙන්නියකසේ ධර්ම සංගායනා කෙලවර මහා පෘථිවිය කම්පාවිය එසියලු ක්ෂීණාශ්‍රවයන් වහන්සේලාත් ආයු පමනින් වැඩසිට පිරිනිවන් පෑවාහුය—මෙම කියනලදී—සද්ධර්ම සංග්‍රහයෙහි—

සම්බුද්ධ පරිනිබ්බාණා වෙච්චස්ස සතානිච,
අඨවීසති වස්සම්හි රාජාසොකො මහීපති.

වසන්තො තත්‍ථ සත්තාහං රාජුය්‍යානෙ මනොරමෙ,
සික්ඛන්තො සො මහීපාලො සම්බුද්ධ සමයං සුභං.

තස්මිං යෙවච සත්තාහෙ දූතෙහෙව මහීපති,
පෙසෙත්වාන තහිං භික්ඛු අසෙසෙන සන්නිපාතයි.

සත්තමෙ දිවසෙ ගන්ත්වා සකාරාමං මනොරමං,
කාරෙසි භික්ඛු සංඝස්ස සන්නිපාත මසෙසතො.

තෙමිච්ඡා දිට්ඨිකෙ සබ්බෙ පුච්ඡිත්වා අඤ්ඤ තිත්ථියෙ,
ඤත්වාසට්ඨි සහස්සානි උප්පබ්බාජෙසි භූපති.

සංඝො විසොධිතො දානි තස්මා සංඝො උපොසථං,
කරොතු භන්තෙ ඉච්චෙවං වත්වා ථෙරස්ස භූපති.

සංඝස්ස රක්ඛකං දත්වා නගරං පාවිසී සුභං,
සංඝො සමග්ගො හුත්වාන තදාකාසි උපොසථං.

මහා කස්සප ථෙරොව යසත්ථෙරොච කාරකං,
තථාතෙ ධම්මසංගීතිං තිස්සත්ථෙරොපි තං අකා.

කථාවත්ථුප්ප කරණං පරවාදප්ප මද්දනං,
අකාසි තිස්සත්ථෙරොව තස්මිං සංගීති මණ්ඩලෙ,

එවං භික්ඛු සහස්සෙන රක්ඛියාසොක රාජිනො,
අයං නවහි මාසෙහි ධම්මසංගීති නිට්ඨිතා.

තතියං සංගහං කත්වා කත්වාලොකහිතං බහුං,
තෙසාවත්තායුකං ඨත්වා ථෙරාසබ්බෙපි නිබ්බුතාති. යි—

මෙසේ මොග්ගලිපුත්තතිස්ස සඪිරාදි දහසක් පමන මහ රහතුන් වහන්සේ රැස්ව වැඩහිඳ නව මසක් මුළුල්ලෙහි සංගායනා කරණයේ අචින්ත්‍යානොපමෙය්‍යවූ දිව්‍ය මනුෂ්‍යාදීන්ට සිවන්කරවූ සර්වඥානුසාසනා ඇතිහෙයින් සමන්තභද්‍රවූ මාගෙ බුදුරජානන් වහන්සේ ශාස්තෘ නම්· වනසේක—එසේහෙයින් කියනලදී—

දෙව යක්ඛ මනුස්සානං ලොකෙ අග්ග ඵලං දදං,
දදන්තං දමයන්තානං පුරිසාජඤ්ඤ තෙනමො. යි.

ලොවැඩ පිණිස කරණලද මේ ශ්‍රී සර්වඥෝවාද සංග්‍රහයෙහිවූ
තුන්වෙනි ධර්මසංගායනා කථාව නිමි.

මෙසේවූ තුන්වෙනි ධර්මසංගායනාව නිමවා මිහිඳු මහ තෙරුන් වහන්සේට තාම්‍රපර්ණීද්වීපයට ගොස් එහි සාසනය පිහිටුවවයි උපාධ්‍යායයන් වහන්සේ විසිනුදු භික්‍ෂුසංඝයා වහන්සේ විසිනුදු කරණලද ආරාධනා ඇතිසේක් මට තාම්‍රපර්ණී ද්වීපයට යන්ට කල්දෝ කල්නොවේදෝයි පරීක්‍ෂාකොට තව කල් නොවෙයයි දැක යම්තාක් එයට සුදුසු කල් පැමිණේනම් එතාක් නැවත් බලම්හයි සිතා උපාධ්‍යායයන් වහන්සේ හා භික්‍ෂුසංඝයා වහන්සේ වැඳ සිල් මස අසොකාරාමයෙන් නික්ම ඉඨියශ, උත්තියය, සම්බලය, භද්‍රසාලය යන මේ ස්ථවිරයන් වහන්සේලා සතරදෙනා හා සංඝමිත්‍රාවන්ගේ පුත්වූ පැමිණෙනලද ෂට් අභිඥාඇති සුමන සාමණෙරයන් වහන්සේද සමග ඥාති සංග්‍රහය සඳහා රජගහනුවර සමීපයෙහිවූද ක්‍ෂිනගිරිනම් ජනපදයෙහි චාරිකා කරණසේක් සමසක් ඇවෑමෙන් වේදියනම් පුරයට පැමිණ එහි වසන්නාවූ වේදිය සිටුදුවූ තමන් වහන්සේගේ මෑනියන්වන වේදිය මහා දෙවිය දැක එබිසවුන්ද විසින් කරණලද වේදිසගිරි මහා විහාරයට වැද ඒ විහාරයෙහි මසක් වැස පොසොන් මස මැදි පොහෝ දිනයෙහි රුසව අපට තාම්‍රපර්ණී ද්වීපයට යන්ට කලැයි දැන ශක්‍රදේවේන්‍ද්‍රයන් විසිනුදු ආරාධනා කරණලදුව පඤ්චලාස අනානාම්වූ මහනවීමෙහි අභිප්‍රාය ඇත්තාවූ වේදිස මහා දෙවින් නැගනියන්ගේ පුතණුවන් හාසමග තමන්වහන්සේ ඇතුළුව සත්දෙනා වහන්සේ වේදිස පර්වතයෙන් ආකාශයට පැනනැගී නිර්මලවූ පැන්ඇති විලෙක්හි හංස සමූහයා විසින් පිරිවරණලද රාජ හංසයකුමෙන් ප්‍රසන්න ආකාශයෙහි බබලමින් ක්‍ෂණයකින් තාම්‍රපර්ණී ද්වීපනම්වූ මේ ලංකාද්වීපයට අවුත් සර්වඥයන් වහන්සේගේ පරිනිර්වාණයෙන් දෙසිය සතලිස් වැනිවූ අවුරුද්දෙහි ධර්මාසොක රජ්ජුරුවන්ගේ අභිසේකයෙන් අටලොස්වැනි අවුරුද්දෙහි දෙවෙනි පෑතිස්ස රජ්ජුරුවන්ගේ අභිෂේකයෙන් සත්වැනි මස තමන්වහන්සේ උපසම්පන්නාවූ දොලොස් වසක් ඇතිසේක් අනුකූලයන් සම්පූර්ණ බැවින් අනුරාධපුරයයි ප්‍රසිඬවූ නුවර නැගෙනහිර දිසාවෙහි නිල්වූ වනලැහැබකින් ගෙබිනාවූ සිහිල්වූ ඝනවූ ඡායාවන්ඇති විසිතුරු ගල් හා පවිත්‍රවූ සුදු වැලෙලින් ගැවසීගත් භූමිප්‍රදෙශ ඇති මධුරවූ සිහිල්වූ පැන් පොකුණු ඇති පූර්ව සර්වඥවරයන් තුන්දෙනා වහන්සේගේ පාද ලාඡනයෙන් පවිත්‍රවූ මිශ්‍රකනම් පර්වතයට බැස අම්බතලාපාෂාණයෙහි වැඩඋන්සේක—පරිනිර්වාන මංචකයෙහි සැතපුනාවූ බුදුරජානන් වහන්සේ විසින් ලංකාවාසී සත්වයන් පහදවා හිතවැඩ කිරීමෙහි සමර්ථයොයයි දෙව සමාගමයෙහිදී එම්හිඳු මහ තෙරුන්වහන්සේ ප්‍රකාශකොට දක්වා වදාළසේක්ද, එසේහෙයින් ලඞ්කාද්වීප ඕදු

කොනෙකුන් වහන්සේ සමානවූසේක් ලංකාවාසී දෙවියන් විසින් විශෙෂයෙන් පුදණලදුව සම්පත්ති ශ්‍රී අනුභව කොරෙමින් එඅඹ තලායෙහි වැඩලන්කල්හි එදවස් දෙවෙනි පෑතිස්ස රජ්ජුරුවෝ සියලු ලංකාවිපවාසීවූ සත්වයන් උත්සව කෙළිකෙළනාපරිද්දෙන් නක්ෂත්‍රඝොෂනය කරවා පුරවාසීවූ සත්වයන් නකත් කෙලි කෙල නට පටන්ගත්කල්හි තුමූ සතලිස් දහසක් පුරුෂයන් පිරිවරා මුව දඩයම්ට යනු කැමතිව සරහා පිලියෙල කරණලද්දාවූ නුවරින් නික්ම මිශ්‍රක පර්වතයට අභිමුඛව යන්නානු තෙරුන්වහන්සේ රජ්ජුරුවන්ට දක්වම්යි හින්මුව වෙසක් මවාගෙන රජ්ජුරුවන්ට නුදුරු තෙනක තනපත් අනුභව කරන්නාක්නුමෙන් ඇවිදිනාවූ දිව්‍ය පුත්‍රයා දැක මුවෙක්දෙහොයි සිතා දුන්අවිශ්ශිපතාව ප්‍රමාදව සිටි තැනතනානු විදින්ට තරම් නොවෙයි සිතා දුනුදිය අත පොලනා හඬින් තමන් බලා දුවන්නාවූ එ මුවා පසුපසෙහි දිවමින් අඹතලා වට නැගි එතනට පැමිනා අන්තර්ධානවූ එ දිව්‍යපුත්‍ර මුවා නොදක ඇතමෑත බලන්නාවූ රජ්ජුරුවෝ මා දකින්වයි සොඬුන් නොද කින්වයි අධිෂ්ඨානකොට තිස්ස තිස්ස මෙසේ එවයි වදරන්නාවූ මිහිඳු මහ තෙරුන් වහන්සේ දැක මේ ලංකාවිපයෙහි උපන් කිසි වෙක් තිස්සයයි කියා මාගේ නම අසවන්නේ නැත එසේහෙයින් මෙතෙම කවරෙක්දෙහොයි මනුෂ්‍යයෙක්දෝහෝ අමනුෂ්‍යයෙක් දෝහෝයි කියා සිතූසේක—එකල්හි තෙරුන්වහන්සේ අමනුෂ්‍ය යෙක් නොවනබව හඟවන පිණිස මහරජ්ජුරුවෙනි අපි සර්වඥ ශ්‍රාවකව ශ්‍රමණයම්හ තොප කෙරෙහි අනුකම්පායෙන් ජම්බුද්වීපයෙන් මේ ලංකාද්වීපයට ආම්හයි වදාලසේක—එහෙයින් කියනලදි—

සමණාමයං මහාරාජ ධම්මරාජස්ස සාවකා,
තමෙව අනුකම්පාය ජම්බුදීපා ඉධාගතා.යි—

එකල්හි රජ්ජුරුවෝ තෙරුන් වහන්සේගේ වචනය අස නැවත අදෘෂ්ට මිත්‍රවූ ධර්මාසොක රජ්ජුරුවන් විසිනුදු ලෙ:කයෙහි දනයුතු යම්කිසි පදාර්ථයක් ඇත්නම් ඒ සියල්ලම සර්වඥඥාන යෙන් විශෙෂයෙන් අවබොධකල බැවින් හා සර්වඥ [illegible] උපන්නාවූ අර්හත් ඵල සංඛ්‍යාත මොක්ෂය කෙලවරකොට ඇති බුදුනුයයි ගත් සවුනෙ දත් බුදුන්ද, තම්බා ධරන්නාවූ සත්වයන් සතර අපායෙහිදු සංසාර චාරිත්‍රයෙහිදු නොහෙලා ධරණ බැවින් ධර්මයයි ගත් නෛර්යාණික ධර්මයද, අෂ්ට සීලශ්‍රාමණ්‍යයෙන් ගැල පුනු බැවින් සංඝයායි ගත් අෂ්ටාර්‍ය පුද්ගල සංඝයාද යන තුනු රුවන් මම සරණනියෙමි ශාසනයුල හිලනාවූ බුදුරජානන්වහන්සේ ගේ සාසනයෙහි උපාසකබවට පැමිණියෙමි එසේහෙයින් නගරින් නම්වූ රජ්ජුරුවෙන් තෙපිදු මේ රත්නාත්‍රයෙහි සිත පහදවාගෙණ සැදැහැ ඇතිව සරණ සීලයෙහි පිහිටුව්යි කියා—

අහං බුද්ධඤ්ච ධම්මඤ්ච සංඝඤ්ච සරණංගතො,
උපාසකත්තං වෙදෙසිං සක්‍යපුත්තස්ස සාසනෙ.

ඉමෙසු තීසු වත්ථුසු උත්තමේසු නරුත්තම;
ත්වමපි චිත්තම්පසාදෙත්වා සඬ්ඝං සරණං වජාහි.යි—

යනාදී ක්‍රමයෙන් ලියා මෙසේ එවනලද නොබෝ කලෙක ඇසූ අස්න සිහිකෙරෙමින් ආයසීවූ සංඝයා වහන්සේ වැඩිසේක්දෝහෝයි සිතා එක්තෙහිම මහරජ අත තුබූ ආයුධ දමා සුවඳක් කථාකෙරෙමින් එකත්පසව හුන්නේය—ඉක්බිත්තෙන් තෙරුන්වහන්සේ සතලිස් දහසක් පුමීයන් අවුත් රජුරුවන් පිරිවරාගත් කල්හි තමන්වහන්සෙ හා කැටිව ආවාවූ අනික් සඳෙනාද දක්වා මොහු කවරද අවුදූයි විචාලකල්හි මහරජ්ජුරුවෙනි මාහාසමගම ආවාහු යයි කියා නැවත ජම්බුද්වීපයෙහි මෙබඳුවූ අන්‍යවූත් ශ්‍රමණයන් වහන්සේලා ඇද්දූයි හිවාලකල්හි ඇත මහරජ්ජුරුවෙනි දැන් ජම්බුද්වීපය කාසාවපජ්ජෝත බබලන්නේය. පුබ්බේනිවාසානුස්සතිඥානය, දිව්‍ය චක්ඛුරභිඥානය, ආශ්‍රවක්ෂයකරාභිඥානය යනමේ ත්‍රිවිද්‍යා ඇත්තාවූද; "එකොපිහුත්වා බහුධාහොති" යනාදීන් දක්වනලද ඉර්ධිවිධ ඥාන යට පැමිනියාවූද; "එවම්පිතෙ මනො ඉත්ථිපිතෙ මනො ඉත්ථම්පිතෙ මනො" යනාදීන් දක්වනලද අනුන් සිත පිරිසිඳ දක්මෙහි දක්‍ෂවූද, "සොදිබ්බාය සොතධාතුයා උභොසද්දෙසුණාති දිබ්බෙච මානුසෙච" යනාදීන් දක්වනලද දිව්‍යශ්‍රොත් ධාතු ඇත්තාවූද, සන්තාන ගත සියලු රාගාදී කෙලෙසයන් නැසූබැවින් අර්හත්නම්වූ සර්වඥ ශ්‍රාවකයන්වහන්සේ දඹදිව බොහො වසනසේකැයි වදාලසේක— නැවතද රජ්ජුරුවෝ ස්වාමීන්වහන්ස කවර මාර්ගයකින් වැඩිසේක් දූයි විචාලකල්හි මහරජ්ජුරුවෙනි අපි දියෙහුත් නොආමහ ගොඩිනුත් නොආමහයි වදාරා නැවත රජ්ජුරුවන්ගේ නුවන විසෙස පරීක්‍ෂාකරණ පිණිස ආසන්නව සිටි එක් අඹ රුකක්පෑ මහරජ්ජුරුවෙනි මේ කිනම් රුකෙක්දූයි විචාරා ස්වාමීනි මෙඅඹගසෙකැයි කී කල්හි මහරජ මේ අඹගස්හැර සෙසුත් අඹගස් ඇද්දූයි විචාලසේක ස්වාමීනි අනිකුත් බොහො අඹගස් ඇත්තේයි කීහ. එ අඹ රුක් ඇර මහරජ අන්‍යවෘක්ෂකෙනෙක් ඇද්දූයි විචාලකල්හි ස්වාමීනි අඹ නොවන්නාවූ වෘක්ෂයොත් ඇත්තාහුයයි කීහ. සෙසු අඹගසුත් අඹ නොවන ගසුත් හැර අන්කිසි ගසෙක් ඇද්දූයි විචාලසේක. ස්වාමීනි එදෙකින් පිටත්ව වෙන්වසිටියෙ මේගසම්වේදූයි කීකල්හි ශහපත් මහ රජ්ජුරුවෙනි තෝපි නුවනැත්තාහයි ප්‍රසංසාකොට නැවතද මිහිඳු මහ තෙරුන්වහන්සේ මහරජ තොපගේ නෑයෝ ඇද්දූයි විචාරා ස්වාමීනි බොහෝදෙන ඇතැයි කීකල්හි රජ්ජුරුවෙනි

තොපගේ නොනැසොත් ඇද්දැයි විචාරා ස්වාමීනි නැසත්ට වඩා
නොනැසෙයා බොහෝයයි කීකල්හි තොපගේ නැසනුත්හැර නොනැ
සනුත්හැර අන්කිසි කෙනෙක් ඇද්දැයි විචාලකල්හි ස්වාමීනි
එදෙපක්ෂයෙමම වෙන්ව සිටියේම මම වේදැයි කීකල්හි සහපත
රජ්ජුරුවෙනි ඉතා නුවනැතාව ප්‍රශ්ණ විසර්ජනා කල නියා
යහපතැයි ප්‍රසංසාකොට මේ රජ්ජුරුවෝ ධර්මයදනගන්ට සමර්ථයෝ
යයි දැන මැදුන්සහියෙහි' චූලහත්ථිපදොපම සූත්‍රාන්තදෙශනාව දෙශ
නාකොට සතලිස් දහසක් පුරුෂයන්හාසම්ග රජ්ජුරුවන් සරණ සීල
යෙහි පිහිටුවූසේක. එකල්හි රජහට බත්වඩන්නෙන ආනියාව
අසා තෙරුන්වහන්සේ විකාලභොජනයෙන් වැලකීබැව් දැනදැනත්
සදවාරය රක්නා සඳහා ආහාරයෙන් පිලිවිස තෙරුන්වහන්සේ
විසින් දැන් මෙවෙලේ පස්වරු නොවලදමහයි කීකල්හි එසේවීනම්
ස්වාමීනි නුවරට යම්හයිකියා දැන්දුහ මිහරජ තෙපි යව අපි මෙහිම
හිඳුම්හයි කීකල්හි එසේවීනම් ස්වාමීනි මෙකුමාරයා අපහා කැටිව
එත්වයි කීකල මේ කුමාරවූකලි අනාගාමි ඵලයට පැමිනියේය දැන්
නොබෝකලකින් මහනවන්නේයයි වදාලසේක.. ස්වාමිනි සෙට
උදෑසනම රථයක් එවම් එරථයෙන් නුවරට වැඩිය මැනවයි කියා
ආරාධනාකොටවැද අවසරගෙණ පඬුපලාස කුමාරයා එක් පාර්ශ්ව
යකට කැඳවාගෙණගොස් තෙරුන්වහන්සේගෙ නම්ගොත් විචාරා
තමන්ට යහළුව ධර්මාසොක රජ්ජුරුවන්ගෙ පුතනුවන් වහන්සේ
නියාව අසා එකානනයෙන් මටවූයේ මහත්වූ ලාභයෙකැයි සිතා
ඉතා සතුටුව නුවරට නික්මුනේය—එකෙනෙහි තෙරුන්වහන්සේ
පඬුපලාසයා රහත් කෙරෙමින් මහනකරවා සුමන සාමනෙරයන්
වහන්සේට කථාකොට සුමනයෙනි බණ අසන්ට කල් අඬගාවයි
වදාලසේක. කිමෙක්ද ස්වාමිනි සහශ්‍ර ලොකධාතුවට ඇසෙන පරිද්
දෙන් අඬගාම්ද නොහොත් මේසක්වලට ඇසෙන පරිද්දෙන් අඬ
ගාම්ද මේ ලඞ්කාවීපයට ඇසෙන පරිද්දෙන් අඬගාම්දැයි විචාල
කල්හි මේලඞ්කාවීපයට අසවමින් සබ්බ ශ්‍රවනයට කාලඝොෂා
කරවයි වදාලසේක.

එකල්හි සුමණ සාමනෙරයන් වහන්සේ ස්වාමීන්වහන්ස යහ
පතැයි පිලිගෙණ අභිඥාපාදක චතුර්ථධ්‍යානයටසමවැද එයින්නැගී
අදිෂ්ඨානකොට එකහවූ සිතින් පින්වත්නි මේ බණඅසන්ට කලැයි
තුන්විටෙක් සියලු ලඞ්කාවීපයට ඇසෙන පරිද්දෙන් බණට අඬගෑ
සේක—රජතෙම එහඬ අසා කිමෙක්ද කිසි උපද්‍රවයක් තෙරුන්
වහන්සේලා සමීපයෙහි ඇද්දෙහොයි සිතා එය විමසනු පිණිස
දූතයින් යැවූයේය— එකල්හි මිහිඳු මහ තෙරුන්වහන්සේ අටට කිසි

උපද්‍රවයක් නැත බුද්ධ වචනය කියනු කැමතිව ධර්මශ්‍රවණයට කාල ඝොෂා කරවීම් වදාලසේක- සාමණෙරයන්ගේ ඒ ශබ්දය අසා භූම්‍යස්ථ දෙවියො සාධුකාරදීම් වශයෙන් ශබ්ද ශ්‍රවණය කෙරෙවූවාහුය. මෙම් ක්‍රමයෙන්ම බ්‍රහ්මලොකය දක්වා ශබ්දය ඉතා උස්වපැන නැඟෙනය එශබ්දය හෙතුකොටගෙණ මහා දෙවතා සන්නිපාතයෙක් විය—මිහිඳු මහ තෙරුන්වහන්සේ මහත්වූ දෙවතා සන්නිපාතය දැක 'සමචිත්තසූත්‍රාන්ත දෙශනාව දෙශණාකලසේක. එධර්ම දෙශනාවගෙ කෙලවර අසංඛ්‍යයක් පමණ දෙවියන්ට ධර්මාභිසමය විය. බොහො නාග සුපර්ණයෝද සරණ ගියාහුය—එකල්හි දෙවෙනි පෑතිස්ස රජතෙම ඒ රාත්‍රියගෙ ඇවෑමෙන් තෙරුන්වහන්සේලා වඩණ පිණිස රථය යැවූයෙය රථාචාර්‍ය්‍යතෙම රථය එක් පාර්ශ්වයෙක තබා තෙරුන්වහන්සේකරා පැමින වහන්ස රථය ගෙනඑන ලද්දෙම් එයට නැගි වැඩිය මැනවයි දැන්වූයේය—තෙරුන් වහන්සේලා අපි රථයට නොනැගෙම්හ තෙපි යව අපි පසුව එමහයි වදාරා අහසට නැගිගොස් අනුරාධපුරයට පූර්ව දිසාභාගයෙහි ප්‍රථම චෛත්‍ය ස්ථානයට බටුවාහුය—ඒ චෛත්‍යය වනාහි තෙරුන්වහන්සේලා ප්‍රථමයෙන්ම අවතීර්ණස්ථානයෙහි කලබැවින් ප්‍රථම චෛත්‍යයයි කියනුලැබේ—ඒ රථාචාර්‍ය්‍යයාද තමන් එන්ට පලමුවෙන්ම වැඩ කහබාන් බැඳ සිවුරු පොරවන තෙරුන්වහන්සේලා දැක අතිශයින් තුටුපහටු සිත්ඇතිවගොස් රජහට දෙවයන්වහන්ස තෙරුන්වහන්සේලා වැඩිසේක්ලායයි දැන්වූයේය—එකල්හි රජතෙම තෙරුන්වහන්සේලා රථයට නැගී වැඩිසේක්ලාදැයි විචාලේය දෙවයන්වහන්ස රථයට නොනැගී මට පසුව නික්ම මට පෙරටුව වැඩමවා පූර්වද්වාරයෙහි වැඩසිටිනා සේක්ලායයි දැන්විය—රජතෙම එඅසා සතුටුව පෙරමගට ගොස් තෙරුන්වහන්සේලා වැඳ මිහිඳු මහ තෙරුන්වහන්සේ අතින් පාත්‍රය ලබාගෙණ මහත් පූජාසත්කාරයෙන් ස්ථවිරයන්වහන්සේලා නුවරට වඩාගෙනගොස් ඇතුළු රජගෙයි ආසන පනවා වැඩහිඳිනාසේ ආරාධනා කල කල්හි තෙරුන්වහන්සේ නිශ්චලව පනවාළු ආසනය දැක අප බුදුරජානන් වහන්සේගෙ ශාසනය සියලු ලක්දිව පෘථිවියමෙන් නිශ්චලව මතු පිහිටන්නේයයි සිතමින් වැඩලූසේක. එකල්හි පින්වත් රාජොත්තම තෙම තෙරුන්වහන්සේලා ප්‍රණීතඛාද්‍යභොජ්‍යයෙන් සවහස්තයෙන් වැලඳවූයේය. වලඳ ඉක්බිති තෙරුන්වහන්සේ පිරිවර සහිත රජහට ධර්මරත්න වර්ෂා වස්වනසේක් ප්‍රෙතවස්තු විමානවස්තු හා සත්‍ය සංයුක්තයෙන් බණ වදාලසේක. එධර්මදෙශනාව අසා අනුලා දේවීන් ප්‍රධානකොට පන්සියයක් ස්ත්‍රීනු සොවාන් ඵලයට පැමිණියාහුය. බණ වදාරා ඉක්බිති පස්වරු භාගයෙහි අමාත්‍යයො තෙරුන්

වහන්සේලා මහ මෙවුනු උයනට වඩාගෙනගොස් එදවස් එහි වැස්වූවාහුය—දෙවෙනි පෑතිස්ස රජද එරාත්‍රියෙහි ඇවෑමෙන් තෙරුන්වහන්සේ සමීපයටගොස් සැපසේ සයනයකලසේක්දැයි විචාරා එසේය මහරජයි කීකල වහන්ස භික්ෂුසංඝයා වහන්සේට ආරාම කැපද්දැයි පිලිවිස කැපය මහරජයි යනු අසා තුටුපහටු සිත් ඇති මහරජ සවර්ණභිංකාරයගෙණ මහතෙරුන් අත උදකපාතනයකොට මහමෙවුනා උයන පිලිගැන්වූයේය—එකෙනෙහි උදකපාතනයෙහු භූසමගම මහා පෘථිවිය කම්පාවිය—මිහිඳු මහ තෙරුන්වහන්සේ සත් දවසක් ධර්මදෙශනාකොට අටදහස් පන්සියක්දෙනා මාර්ගඵලයට පමුණුවා සෙසු තෙරුන්වහන්සේලා සමග මිහින්තලා පර්වතයටම වැඩිසේක—දෙවෙනිපෑතිස්සනම් රජද එහි පැමිනියෝය එකල්හි එදවස්ම අරිට්ඨනම් අමාත්‍යයාද පස්පනස් දෙනෙක් ජ්‍යෙෂ්ඨභ්‍රාතෘන් හාසමග රජ්ජුරුවන්වැද දෙවානන්වහන්ස අපි හැමදෙනම තෙරුන්වහන්සේගේ සමීපයෙහි මහනවනු කැමැත්තමහයි දැන්වූවාහුය—මහරජ ඒ අසා මැනවැයි ගිවිස තෙරුන්වහන්සේලාට ඔවුන් මහණකරණ පිණිස භාරකලකල්හි තෙරුන්වහන්සේලා එදවසම මහණ කලසේක—එ අරිට්ඨ කුමාරයන් ප්‍රධානකොටඇති ඇමදෙනම කරගෙහිදිම සකලකෙලසයන්සනා රහත්වූවාහුය. ඉක්බිත්තෙන් පින්වත් රජ මිහින්තලාවෙහි දෙතිසක් පමණ සීමා මාලකයන් හා අටසැටක් පමණ ගල්ලෙන් ඇතුළු විහාර කර්මාන්ත නිමවා විහාරය පිලිගන්වා ඇසල පුණුපොහො දිනයෙහි ආරාධනාකොට දෙශටක් පමණ රහතන් වහන්සේලා එහි වස්වැසෙවුයේය—එ බුද්ධ පුත්‍රයන් වහන්සේලා එහි වසමින් රජහට සංග්‍රහකලාහුය ඊට ඉක්බිතෙනන් ථූපාරාමයෙහි දකුණු අකු ධාතූන්වහන්සේ පිහිටුවන දවස් යමක ප්‍රාතිහාර්ය්‍ය දැක සතුටුව පැවිදිවූ රජ්ජුරුවන්ගේ මලනුවූ මත්තාභය නම් රාජ කුමාරයන් ප්‍රධානකොට දහසක් පුරුෂයන් හා ඇතුළු නුවරින් මහනවූ භික්ෂූන්වහන්සේලාත් සියල්ලම තිස්දහසක් පමන වූවාහුය එයින් පසුව දක්ෂිණසාඛා මහාබොධින්වහන්සේ පිහිටුවන දිනයෙහි පන්සියයක් පමන රාජකණ්‍යාවන් හා පන්සියයක් පමණ අන්තඃපුර ස්ත්‍රීන් හාසමග අනුලානම් රජබිසව සංඝමිත්‍රා සළුවිරීන් සමීපයෙහි පැවිදිව නොබොකලකින් සපිරිවරින් රහත් ඵලයට පැමිනියාය. රජ්ජුරුවන්ගෙ බෑනනුවූ අරිට්ඨනම් රාජකුමාරයාද පන්සියයක් පුරුෂයන් හාසමග තෙරුන්වහන්සේගේ සමීපයෙහි පැවිදිව නොබොකලකින් රහත්වූසේක—ඉක්බිත්තෙන් දෙවෙනි පෑතිස්ස රජ මිහිඳු මහ තෙරුන්වහන්සේ කරා පැමින ස්වාමින් වහන්ස ලඞ්කාවිපයෙහි බුද්ධසාසනය පිහිටනලද්දේදැයි විචාලේය එකල්හි මිහිඳු මහ තෙරුන්වහන්සේ වදාරණසේක් මහරජ බුද්ධ

ශාසනය පිහිටුවනලද්දේය. ශාසනයාගෙ මුල් තව නොබස්නාලද්ද
හුයයි වදාලසේක. ස්වාමීන්වහන්ස ශාසන මූලයෝ කවර කවර
කලෙක බස්නාලද්දහුනම් වෙද්දයි විචාලේය මහරජ යම්කලෙක්හි
ලක්දිව් දෙමවුපියන් කෙරෙහි උපන් දරුකෙනෙක් ලක්දිවදිම
පැවිදිව ලක්දිවදිම විනය ධර්මය ඉගෙණ කියාවන්නේවීනම් එකල්හි
මහරජ ශාසනයාගේ මුල්බස්නා ලද්දහුනම් වන්නාහුයයි වදාල
සේක—එවිට දෙවෙනිපෑතිස්ස රජ මිහිඳු මහ තෙරුන්වහන්සේට
වැඳ ස්වාමීන්වහන්ස ලංකාවාසී මෙබඳු භික්ෂූන් ඇද්දයි විචාලතැන
මහරජ අරිෂ්ට නම් භික්ෂුව ඒකර්මයෙහි බුහුටියයි වදාලසේක එකල්හි
මහරජ්ජුරුවෝ මෙහි ස්වාමීන්වහන්ස මාවිසින් කුමක් කටයුතුදයි
විචාරා මහරජ ධර්ම මණ්ඩපයක් කරන්ට වටනේයයි වදාලකල්හි
රජතෙම ස්වාමීන්වහන්ස යහපතැයි පිලිගෙණ මේඝවර්ණාභය
අමාත්‍යයාගෙ පරිවෙනස්ථානයෙහි ප්‍රථම මහා ධර්මසංගීති කාලයෙහි
අජාසත් මහරජනු විසින් කරවනලද ධර්ම මඩපයවැනිවූ මඩපයක්
රාජානුභාවයෙන් කරවා සියලු තාලාවචරයන් සවතිය සවතීය
සිල්පයෙහි යොදා ශාසනයාගෙ මුල්බැසීම මෑ බලමහයි කියා
නොයෙක් දහස්ගනන් පුර්ෂයන් විසින් පිරිවරණලදුව ථූපාරාමයට
පැමිණියේය එසමයෙහි ථූපාරාමයෙහි දහසක් භික්ෂූන්වහන්සේලා
රැස්වූවාහුය—මිහිඳු මහ තෙරුන්වහන්සේගේ ආසනය දක්ෂිණාභි
මුඛව පැණවූයේය මහා අරිෂ්ට තෙරුන්වහන්සේට ධර්මාසනය උතුරු
දිසාවට අභිමුඛව පනවනලද්දේය එකල්හි මිහිඳු මහ තෙරුන්
වහන්සේ විසින් කරණලද ආරාධනාඇතිව මහාඅරිෂ්ට තෙරුන්
වහන්සේ ස්ථවිර භික්ෂූන්වැඳ අවසරගෙණ තමන්වහන්සේට
අනුරූපව පැමිණි ධර්මාසනයෙහි වැඩඋන්සේක මිහිඳු මහ තෙරුන්
වහන්සේ ප්‍රමුඛවූ ෂටඅටනමක් පමණ ස්ථවිරයන්වහන්සේලාද
ධර්මාසනය පිරිවරා වැඩඋන්නාහුය රජ්ජුරුවන්ගෙ කණිෂ්ඨභ්‍රාතෘවූ
මත්තාභය තෙරුන්වහන්සේ ධුරගාහීව විනය උගනිමියි කියා
පන්සියයක් භික්ෂූන්වහන්සේලා සමග අරිෂ්ට තෙරුන්වහන්සේ
වැඩවුන් ධර්මාසනය පිරිවරා වැඩඋන්සේක සෙසු භික්ෂූන්වහන්සේ
ලාද රජ්ජුරුවන් සහිත සියළු රජපිරිසද තමතමන්ට ප්‍රාප්තස්ථාන
වල හැසිරනුන්නාහුය එකල්හි ආයුෂ්මත් මහා අරිෂ්ට තෙරුන්
වහන්සේ—"තෙන ඛොපන සමයෙන බුද්ධො භගවා වෙරඤ්ජායං
විහරති නළෙරුපුචිමන්දමූලෙ" යනාදි ක්‍රමයෙන් විනය නිදානය
වදාලසේක. එක්‍ෂණයෙහි අහස්හි මහත් නාද පැවැත්තේය. අකාල
විද්‍යුල්ලතාවෝ නික්මුනාහුය. දෙවියො එකපැහැර සාධුකාරදුන්නා
හුය දිය පොලව අවසන්කොට මහා ප්‍රථිවිය කම්පාවිය මෙසේ නො
යෙක් ප්‍රාතිහාර්ය පූජාපවත්නාකල්හි ආයුස්මත් මහා අරිෂ්ට තෙරුන්

විනයපර්‍යාප්ති ධර්‍මයෙහි සමර්‍ථවූ පුද්ගලතෙම බුදුසස්නෙහි පැවිදිලත් ශ්‍රද්ධාසම්පන්න සියළු කුලපුත්‍රතැන්වලට මාතෘපිතෘස්ථානයෙහි පිහිටාසිටින්නේවෙයි ඒ සියළු ශ්‍රද්ධාප්‍රවර්‍ජිතයන් වහන්සේලාගේ ප්‍රව්‍රර්‍ජාවද උපසම්පදාවද විනයපර්‍යාප්ති ධර්‍මධරයින් වහන්සේම අයිතිවන්නේය. එහෙයින් වත්තානුවත්ත ප්‍රතිපත්ති ආචාර අනාචාර ගොචර අගොචරවල දක්‍ෂබව හා අල්පෙච්ඡ ගුණ පුරනු කැමති තැන විසින් විනය පර්‍යාප්ති ධර්‍මය නිසා තමාගේ සීලස්කන්ධයන් මනාකොට ගුප්තව රක්‍ෂාකිරීම වන්නේය. මේ කැපයෙද අකැපයෙදැයි යනාදින් කුකුස් ස්වාභාව ඇති භික්‍ෂුන් වහන්සේලාට පිලිසරණවන්නේය සඟ මැදට පැමින නොපැකිල බුහුටිව ගනුදෙනු ව්‍යවහාරකරන්නේය. ප්‍රත්‍යර්‍ථිකයන්ම සහ ධාර්මිකවූ සුනිග්‍රහයෙන් නිග්‍රහ කරන්නේය. භාග්‍යවතුන් වහන්සේ විසින් සංවර මූලකාරණාවූ යම්යම් කුසලධර්‍ම කෙනෙක් වදාරණලද්දාහුද ඒ සියළු ධර්‍මයන්ට විනය මුල්වන බැවින් විනයධර පුද්ගලතෙම ඔවුන්ට ධර්‍මදායාද වන්නේය එයින් වදාරණලදමැයි බුදුන් විසින් පංචමෙ භික්ඛවෙ ආනිසංසා විනයධරෙ පුග්ගලෙ—පෙ—ජනොනාමෙනාති සි—නවද වදාරණලදී—“විනයො සංවරත්ථාය, සංවරො අවිප්පටිසාරත්ථාය අවිප්පටිසාරො පාමොජ්ජත්ථාය පාමොජ්ජං පීතත්ථාය පීතිපස්සද්ධත්ථාය පස්සද්ධිසුඛත්ථාය සුඛං සමාධත්ථාය සමාධි යථාභූත ඤානදස්සනත්ථාය යථාභූත ඤාණදස්සනං නිබ්බිදත්ථාය නිබ්බිදා විරාගත්ථාය විරාගො විමුත්තත්ථාය විමුත්තිවිමුත්ති ඤාණදස්සනත්ථාය විමුත්ති ඤාණදස්සනං අනුපාදපරිනිබ්බානත්ථාය-එප-යදිදං අනුපාදචිත්තස්ස විමොක්ඛොති”—එහි අර්‍ථනම්—විනයො, සබ්බ විනයනං තුන්ලොවට ඇසක්වැනිවූ බුදුරජානන් වහන්සේ විසින් පනවා වදාරණලද සියළුම ධර්‍මවිනය සංඛ්‍යාත පර්‍යාප්ති ධර්‍මයපොම; සංවරත්ථාය, කායාදිවාරත්‍රයාගේ සංයමය පිනිසවෙයි; සංවරො, එ සංයමයයි කියනලද වාරත්‍රයෙන් සිඩවන නොකොට සුතුමැලකීම; අවිප්පටිසාරත්ථාය, විපිලිසරනැතිවීම පිණිසවන්නේය අවිප්පටිසාරො, විපිලිසරයයි කියනලද කාංසාවිප්පෙ නැතිවීම; පාමොජ්ජත්ථාය, ප්‍රමොදය පිනිස වන්නේය; පාමොජ්ජං, එප්‍රමොදැයයි කියනලද තරුණ ප්‍රිතියවීම; පීතත්ථාය, මුහුකල ප්‍රීතිය පිනිස වන්නේය; පීති, ඒ ප්‍රීතියයි කියනලද ස්ථෙනනාසය; පස්සද්ධත්ථාය, ප්‍රස්ශ්‍රබ්ධිය පිනිස වන්නේය; පස්සද්ධි, ප්‍රශ්‍රබ්ධියයි කියනලද කාය චිත්ත දේදෙනාගේ සංසිඳීම; සුඛත්ථාය, සැප පිනිය වන්නේය; සුඛං, සැපයයි කියනලද කායික චෛතසික සුවය; සමාධත්ථාය, සමාධිය පිනිය වන්නේය; සමාධි සමාධියයි කියනලද සිත එකඟවීම; යථාභූතඤාණදස්සනත්ථාය, යථාභූත ඤාණ දර්‍ශණය පිනිස

වන්නේය; යථාභූත ඤාණදස්සනං, යථාභූත ඤාණදර්ශනයයි කියන ලද සියලු ධර්මයන්ගේ කාරණය ඒ ඒ සවභාවඇතිලෙස තත්වූ පරිද්දෙන් දැකීම; නිබ්බිදාය, නෛර්වේදය පිණිස වන්නේය; නිබ්බිදා, නෛර්වේදයයි කියනලද සසර කලකිරීම; විරාගත්ථාය, විරාගය පිනිස වන්නේය; විරාගො, විරාගයයි කියනලද සසර ආලය හැරීම; විමුත්තත්ථාය, විමුක්තිය පිනිස වන්නේය; විමුත්ති, විමුක්තියයි, කියනලද සියල්ලෙකෙරෙන් සිත මිදීම; විමුත්තිඤාණදස්සනත්ථාය, විමුක්තිඤාණ දර්ශනය පිනිස වන්නේය; විමුත්තිඤාණදස්සනං විමුක්තිඤාණදර්ශනයයි කියනලද උතුම් ඤාණ දර්ශනය; අනුපාද, පරිනිබ්බානත්ථාය, අනුපාද පරිනිර්වාණය පිනිස වන්නේය; අනුපාද පරිනිර්වාණය නම් තෘෂ්ණා දෘෂ්ටි වසයෙන් කිසිවක් සිතට නොගැනීමෙන් ංචිත්ත විමොක්ෂයයි කියනලද පරිනිර්වාණය වන්නේයයි කියා මෙසේ අමෘත මහා නිර්වාණයට පැමිනීම දක්වා වන්නාවූ සියළුම විනයපර්යාප්ති ධර්මානිසංසය ප්‍රකාශකොට වදාලසේක.

එහෙයින් මෙබඳු ආනිසංස මහත්ත්වය දක්වූ විනයපර්යාප්ති
ධර්මය පුහුණුකිරීමෙහි උත්සාහ කටයුතුමැයි.

මෙසේ සර්ව සත්වොපකාරව සිටිමේ ධර්මවිනය යෙහෙන් පවත්වා ගෙනඒම පිනිස සතරවන වාරයෙහි මෙම සිරිලක අනුරාධපුර නුවරදී අරිෂ්ට ස්ථවිර මහාමහෙන්ද්‍ර ස්ථවිරාදී අටශට නමක් ප්‍රමාන ත්‍රිවිද්‍යාදි ගුණසම්පන්න මහා ක්ෂීණාශ්‍රවයන් වහන්සේ ප්‍රධානකොට සැටඅට දහසක් පමන භික්ෂුසංඝයා වහන්සෙ ථූපාරාම විහාරයෙහි රැස්කොට් ධර්මසංගායනාවකාරවා ථූපාරාමනමචෛත්‍යය බඳවා අපරිමිත කුසල රාසි වර්ධනය කිරීමෙන් බුදුසසුන් බබුළුවා දෙවෙනිපෑතිස්ස නම් පින්වත් රජ සතලිස් අවුරුද්දක් දැනැමින් රාජ්‍යය කෙලේය. ඉක්බිති ඒරජ ඇවෑමෙන් ඔහු මල්මහානාගය යන නමින් ප්‍රසිද්ධවූ රජ අනුරාධපුරනුවර රාජ්‍යය කෙලේය—ඒරජ ඇවෑමෙන් උප රාජ මහානාගය, යටාලතිස්සය, ගොඨාභයය, කාවන්තිස්සය යන රජ තුමෝ සතරදෙන දරුමුනුබුරු පරම්පරාවසයෙන්ම පැමිණ රුහුණු මාගම් නුවර වැස දැහැමෙන් රජකලානුය.

බුදුන් පිරිනිවී තුන්සිය සැත්තෑසවෙනි වර්ෂයෙහි දුටුගැමුණු නම් රජ රාජ්‍යයට පැමින මිරිසවැටි විහාරයකරවා නවමහල් ලොවා මහා ප්‍රාසාදනම් පොහෝ ගෙය සමග විහාරයද කරවා රත්නවාලී චෛත්‍යනම් අසදෘශ වෙහෙර බඳවා සයකුණෙලක් පමන මහ

රහත් භික්ෂූන්වහන්සේ රැස්කරවා මහදං පවත්වා අප්‍රමාණවූ කුසල රාශි වර්ධනයෙන්යෙදී සූවිසි අවුරුද්දක් අනුරාධපුරනුවර දැහැමෙන් රාජ්‍යයකොට ආයු කෙළවර තුසීපුරනම් දෙව්ලොවට පැමිණියේය.

එසමයෙහිදු ලංකාද්වීපවාසී භික්ෂුසංඝයා වහන්සෙ බුද්ධ ශාසනයාගේ වර්ධනය හා ලොවැඩ පිනිස සියළු අටුවා කථා සහිතවූ පාළි ත්‍රිපිටක බුද්ධ වචනය මුඛපාඨ පරම්පරා වශයෙන් ගියේමෙන්ම පැවැත්වූවාහුය —මෙම කියනලදමැයි සද්ධර්ම සංග්‍රහයෙහි —

දෙවානං පියතිස්සොච සොලංකින්දො සුපුඤ්ඤවා,
චත්තාලීසතිවස්සානි රාජාරජ්ජමකාරයි.

තස්සච්චයා කණිට්ඨොසො මිත්තාභයො තිවිස්සුතො,
අනුරාධපුරෙරම්මෙ රජ්ජමකාසි ඛත්තියො.

උපරාජ මහානාගො යටාලොසො මහබ්බලො,
ගොඨාභයො මහාපඤ්ඤො, කාකවණ්ණොච විරියවා.

චත්තාරො තෙච රාජානො පුත්තනත්ත පරම්පරා,
ධම්මෙන රජ්ජං කාරෙසුං මහාගාමෙ මනොරමෙ.

සම්බුද්ධ පරිනිබ්බානා තීසුවස්ස සතෙසුච,
ඡසත්තාති මතික්කන්තෙ රාජාහු දුට්ඨගාමිනී.

දුට්ඨගාමිනී අභයො ලංකින්දො පුඤ්ඤපඤ්ඤවා,
චතුවීසති වස්සානි ලංකාරජ්ජ මකාරයි.

එවං පුඤ්ඤානි කත්වාන අනෙකානි මහීපති,
කායස්ස භෙද සප්පඤ්ඤො, තුසිතෙමුප පජ්ජථ.සි—

යනුවෙන් යථොක්ත ප්‍රකාරවූ දුටුගැමුණු මහරජ කරවාළු අසදෘශ මහා චෛත්‍යය පිහිටා සත්පනස් අවුරුද්දක් ගියකල්හි වලගම්අබා මහරජ මෙම ලංකාද්වීපයෙහි රජපැමිණ අභයගිරි මහා විහාරය කරවා එම විහාරයෙහි ධාතු සහිතවූ මහා ථූප ප්‍රමාණ මහා චෛත්‍යයක්ද කරවා මහාතිස්ස තෙරුන්වහන්සෙ ප්‍රමුඛවූ භික්ෂු සංඝයාවහන්සේට පිළිගන්වා අනෙකප්‍රකාර කුසලරාශි වර්ධනයෙන් යෙදී වාසය කරනුයේ එක් දවසක් ඒ වලගම්අබා මහරජ මහ විහාරයට ගොස් භික්ෂුසංඝයා වහන්සෙ වැඳ එකත්පසව හුන්නේය— එකල්හි භික්ෂුසංඝයා වහන්සෙ රජහට දැන්වනසේක් මහරජ සියළු අටුවා කථා සහිතවූ ත්‍රිපිටක බුද්ධ වචනය මුඛපාඨ ක්‍රමයෙන් බුදුන් පිරිනිවී තැන්පටන් පරම්පරා වශයෙන් පවත්වාගෙන අවුත් දැනුදු

එසේම මුඛපාඨ ක්‍රමයෙන්ම සිටීනේය. අනාගත කාලයෙහි වනාහි ලෝක ශාසන දෙක මෙම ක්‍රමයෙන්ම නොසිට පිරිහීමට පැමිනීම වන්නේය. එකල්හි අටුවාකථා පාලි සහිතවූ සියළු ත්‍රිපිටක බුද්ධ වචනයද පිරිහෙන්නේය. එහෙයින් දැන් මුඛපාඨයෙන් ගෙණආ අටුවාකථා පාලි සහිතවූ සියළු බුද්ධ වචනය පොත්වල ලියවියයුතු වන්නේයයි වදාලසේක—එවිට වලගම්අබා මහරජ දන්වනුයේ ස්වාමිවූ මහසංඝයා වහන්ස මෙතැන්හි මාවිසින් කුමක් කටයුතුද ඒ මට වදාලමැනවයි ආරාධනා කෙලේය—එකල්හි මහසංඝයා වහන්සෙ වදාරණසේක් මහරජ ධර්ම මණ්ඩපයක් කරවන්ටද ප්‍රසෘතක පර්ණ සම්පාදනය කරන්ටද වටනේයයි වදාලසේක—ඒ ඇසූ රජද මැනවැයි හිවිස මහවිහාරයෙහි ප්‍රථම මහා ධර්මසංගායනා කාලයෙහි අජාසත් රජහු විසින් කරවණලද ධර්මමණ්ඩපය වැනිවූ රාජානුභාවයෙන් විසිතුරු ධර්ම මණ්ඩපයක්කරවා සියළු ප්‍රසෘතකපර්ණ සම්පාදනය කොට මහානර්ඝ ආසන මණ්ඩපය මධ්‍යයෙහි පනවා ස්වාමිනි මාවිසින් කල මනාකාර්‍ය්‍ය සමුර්තිවීයයි මහසංඝයා වහන්සේට දැන්වූයේය—

එකල්හි භික්ෂුසංඝයා වහන්සෙ නොයෙක් ලක්ෂගනන් භික්ෂූන් වහන්සේලා අතුරෙන් ත්‍රිපිටක පර්‍ය්‍යාප්තිධර සිව්පිලිසිඹියාපත් ත්‍රිවිද්‍යාදි අනෙක ගුණ රත්නාලංකෘත භික්ෂූන්වහන්සේගෙන් නොයෙක් දහස්ගනන් භික්ෂූන් වහන්සෙ තෝරාගත්සේක—ඊට ඉක්බිතිව ඒ ස්ථවිර භික්ෂූන්වහන්සේලා තමතමන් වහන්සේලාට ප්‍රාප්ත ආසනවල වැඩහිඳ යම්සේ මහාකාශ්‍යප ස්ථවිර යශස්ථවිර තිස්ස ස්ථවිර මහෙන්ද්‍ර ස්ථවිර යන බුද්ධ පුත්‍රයන් වහන්සේලා ධර්ම විනය සංගායනා කරණලැබුවාක්මෙන් පිටකවශයෙන්ද නිකාය වශයෙන්ද අඞ්ග වශයෙන්ද ධර්මස්කන්ධ වශයෙන්ද ධර්මවිනය සංගායනා කලාහුද, එසේම ධමවිනය මුඛපාඨයෙන් ගෙන පොත්වල ලියනා භික්ෂුසංඝයා වහන්සෙත් පිටක වශයෙන්ද නිකාය වශයෙන්ද අඞ්ග වශයෙන්ද ධර්මස්කන්ධ වශයෙන්ද ධර්මවිනයයි කියනලද පාලි අටුවාකථාසහිතවූ ත්‍රිපිටක බුද්ධවචනය පොත්වල ලියා පස්වාදහසක්කල් මුළුල්ලෙහි බුද්ධශාසනයාගේ චිරස්ථිතියකොට පස්වෙනිවූ ධර්මසංගායනාවක් සදෘසව කලසේක - සියළු අර්ථකථා සහිත පිටකත්‍රය ධර්මය පොත්වල ලියා නිමිකල්හි අනෙකප්‍රකාරයෙන් මහා පෘථුවිය කම්පාවිය—මේ පිටකත්‍රය ලෙඛනය එක්අව්රුද්දකින් නිමීයේය—මෙම කියනලදමැයි සද්ධර්මසංග්‍රහයෙහි—

සම්බුද්ධපරිනිබ්බානා චතුවස්සසතෙපිච,
තෙත්තිංසති අතික්කන්තෙ රාජාහු වට්ටගාමිනී.

ලංකාවාසී භික්ඛුසංඝා පෙක්ඛමානො අනාගතං,
හානිං දිස්වාන සත්තානං තදා භික්ඛු සමාගතා.

තෙපිටකධරා සබ්බෙ පභින්නපටිසම්භිදා.
ඛීණාසවා වසිප්පත්තා විනයෙසු විසාරදා.

තස්මිං මහා විහාරෙව ථෙරා භික්ඛු සමාගතා,
පටිපාටියා සන්නිසින්නා ආසනම්හි සකෙසකෙ.

පිටකත්තය පාලිච තස්සාඅට්ඨ කථංචතං,
මුඛපාඨෙන ආනෙසුං පුබ්බෙභික්ඛූ මහාමතී.

සංගීතියා වුත්තනයා ථෙරාස පිටකත්තයං,
සබ්බසජ්ඣාය මකරුං තස්සඅට්ඨ කථංචතං.

චිරට්ඨිතත්ථං ධම්මස්ස සාසනස්සච වුද්ධියා,
පඤ්චවස්ස සහස්සානි සම්පත්තං වත්තනාකතං.

සජ්ඣායිතනයෙනෙව ථෙරාවිනයකොවිදා,
සබ්බං විනය පිටකං පොත්ථකෙසු ලිඛාපයුං.

සජ්ඣායිතනයෙනෙව ථෙරාසුත්තන්තකොවිදා,
සුත්තන්ත පිටකංසබ්බං පොත්ථකෙසු ලිඛාපයුං.

සබ්බම්පි ථෙරවාදඤ්ච සබ්බංසාට්ඨ කථානයං,
මුඛපාඨෙණ ආනෙත්වා පොත්ථකෙසු ලිඛාපයුං.

ලිඛිත්වා පරියොසානෙ අකම්පිත්ථ මහාමහී,
අච්ඡරියානි පාතුහෙසුං ලොකෙනෙකානි නෙකධා.

පිටකත්තයං ලිඛිත්වාන කත්වාලොක හිතං බහුං,
තෙයාවතායුකංඨත්වා ථෙරාසබ්බෙපි නිබ්බුතාති.යි—

මෙසේ මේ අටුවාකථා සහිතවූ සියළු පාලි ධර්මය පොත්වල ලියා ක්ෂීණාශ්‍රව මහාස්ථවිරවූ ඒ බුද්ධපුත්‍රයන් වහන්සේලා ආයු පමණින් වැඩසිට උපසිරහිත නෙර්වාන ධාතුයෙන් පිරිනිවන් පෑවාහුය. මෙසේ පිටකත්‍ර ධර්මය ලියවීම්ආදී අපරිමිත කුසලරාසි වර්ධනයෙන් යෙදී දොලොස්අවුරුද්දක් රාජ්‍යානුශාසනාකොට වලගම්අබාමහරජ ආයු කෙළවර දෙව්ලොව උපන්නේය—මෙම කියනලදමැයි—

වට්ටගාමිණි අභයො ලංකාරජ්ජ මකාරයි,
ඉති ද්වාදස වස්සානි පඤ්චමාසානි ආදිතො,

එවං පුඤ්ඤානි කත්වාන අනෙකානි මහීපති,
කායස්සභෙදා සප්පඤ්ඤො සග්ගංසො උපපජ්ජථ.යි—

මෙසේ මහානුභාව සම්පන්න මහරහතන් වහන්සේ ඇතිකල සිත්හිම පවත්වා ලෝකොපකාරව එසේ නැතිකල පොත්වල ලියා පැවැත්වීමෙහුදු පර්‍ය්‍යාප්ති අන්තර්ධානය දක්වා පවත්නා ධර්මකාය සම්පත්තියයි කියනලද ධර්මානුශාසනා ඇතිහෙයින් සර්වලොකෙක සරණවූ මාගේ බුදුරජානන් වහන්සේ ශාස්තෘනම් වනසේක.

දෙව යක්ඛ මනුස්සානං ලොකෙ අග්ග ඵලං දදං,
දදංතං දමයන්තානං පුරිසාජඤ්ඤ තෙනමො.යි.

මේ ශ්‍රී සද්ධම්මෝවාද සංග්‍රහයෙහි පිටකත්‍රය ධර්මය පොත්වල ලියා පැවැත්වූ ප්‍රවෘත්ති සංග්‍රහය කියා නිමවනලදී.

මෙසේ මේ යථොක්ත ප්‍රකාරයෙන් සියළු පර්‍ය්‍යාප්ති ධර්මයන් පොත්වල ලියාළු තැන්පටන් පන්සිය සොළොස් වර්‍ෂයක් අතික්‍රාන්තව ගියකල්හි මෙම ලක්දිව මහානාමනම් රජ රජ පැමින රාජ්‍යය කාරණ සමයෙහි දඹදිව මධ්‍යදෙසයෙහිවූ මහ බෝමැඩට නුදුරුවූ එක් ගමෙක බමුනු කුලයෙක්හි උපන් එක් බ්‍රාහ්මන මානවකයෙක් වූයේය—හෙතෙම සියළු සිල්පයෙහි විශාරදව වෙදත්‍රයෙහි පාර ප්‍රාප්තව දඹදිව ගම් නියම්ගම් දනවු නුවරවල ඇවිද යම්යම් තැනෙක පණ්ඩිත ශ්‍රමණ බ්‍රාහ්මණ කෙනෙක් වසනාහුද ඒ ඒ තන්හි ගොස් ඔවුන්හා සාකච්ඡාකොට පැණ පිළිවිස ඇවිදිනාහ—ඔහු විසින් විචාල ප්‍රශ්නයක් විසඳීමට සෙසෙකා නොහැකි වන්නාහුය සෙසුන් විසින් විචාලතාක් ප්‍රශ්න හේ තෙමේ විසඳන්නේය—මෙසේ සියළු දඹදිව හැසිර පැණ විසඳීමෙන් ජයග්‍රහනයකොට ඇවිදිනා ඒ බ්‍රාහ්මණ මානවකතෙම එක් දිනක් විහාරයකට පැමිනියේ එම විහාරයෙහි නොයෙක් සියදහස් ගණන් භික්‍ෂූන්වහන්සේලා වාසය කරන්නාහුය—ඒ භික්‍ෂූන්වහන්සේලාම සංඝස්ථවිරවූ ආයුෂ්මත් රෙවත ස්ථවිර නම්වූ පරවාද මර්දනයෙහි සමර්ථවූ සිව්පිළි සිඹියාපත් මහා ක්‍ෂීණාශ්‍රවයන් වහන්සේ කෙනෙක් වාසයකරණසේක. එකල්හි ඒ බ්‍රාහ්මණ මානවකතෙම දිවා රාත්‍රි දෙක්හිම මන්ත්‍ර පරිවර්තනයකොට සම්පූර්ණවූ පදව්‍යංජන පරිමණ්ඩලයෙන් හදුරන්නේය—ඉක්බිතෙතන් තෙරුන්වහන්සේට ඒ බ්‍රාහ්මණ මානවකයාගේ මන්ත්‍ර හදුරණ සබ්දය ඇසී මෙබඳු සිතිවිල්ලක් පහළවිය—මේ බ්‍රාහ්මණ මානවකතෙම මහත් ප්‍රඥ ඇත්තේය—ඔහු දමනය කරන්ට වටනේයයි සිතා බ්‍රාහ්මණ මානවකයා බනවා මෙසේ වදරණසේක් එම්බා ඔතැන්හි ගද්‍රභරාවයෙන් හඬන තෙල කවරෙක්

දැයි විචාරා වදාලසේක—එවිට බ්‍රාහ්මණමානවකයා තෙරුන් වහ
න්සේ කරා පැමිණ කියනුයේ පින්වත් ප්‍රව්‍රජිතයන් වහන්ස
ගඞ්ගරාවයෙහි අර්ථ කිමෙක්ද ඔබ ඒ දන්නාසේක්දැයි විචාළේය—
එකල්හි එසේය බමුණ දනිමියි එහි අර්ථ වදාලකල්හි ඉක්බිතෙන්
බ්‍රාහ්මණ මානවකතෙම වේදත්‍රයෙහි ඉතිහාස පඤ්චමයෙහි යම් යම්
ග්‍රන්ථිස්ථාන කෙනෙක්ඇද්ද යම් යම් පදකෙනෙකුන්ගේ අර්ථනය
තමා විසින් නොදත්තේද ඔහුගේ ආචාර්ය්‍ය ප්‍රාචාර්ය්‍යහුද නුදුටු යම්
යම් අර්ථයෙක් ඇද්ද එබදු නොරාගතනොහැකි ගැඹුරු අර්ථාන්විත
වචනයන් ගෙන ඒ සියල්ල මහතෙරුන් වහන්සේගෙන් විචාළේය.
තෙරුන්වහන්සේ සවභාවයෙනුදු වේදත්‍රයාගෙ පාරප්‍රාප්තව දන්
වනාහි සිව්පිලිසිඹියා ප්‍රාප්තයෙක්වීය ඒහෙයින් ඒ රේවත නම් මහ
තෙරුන්වහන්සේට ඒ ප්‍රශ්ණයන්ගේ විසඳීමෙහි භාරයෙක් නැත.
එහෙයින් පලමුකොට ඔහු විසින් විචාල ඒ සියළු ප්‍රශ්ණයන් විසර්
ජණයකොට නිමවා බ්‍රාහ්මණමානවකයාහට වදාරණසේක් පින්වත්
බ්‍රාහ්මණය තාවිසින්විචාරණලද බොහො පැණ මාවිසින්විසඳනලද්
දේය—මමද දැන් එක් ප්‍රශ්ණයක් තොප විචාරමි ඒ මාගේ ප්‍රශ්ණය
ප්‍රකාසකොට කියන්නෙහිදැයි විචාලසේක, එසේය පින්වත් ප්‍රව්‍රජි
තයන් වහන්ස විචාල මැනව ප්‍රකාසකොට කියමි කීයේය—එකල්හි
තෙරුන්වහන්සේ චිත්තයමකයෙහි මේ ප්‍රශ්නය විචාලසේක —යස්ස
චිත්තං උප්පජ්ජති න නිරුජ්ඣති තස්ස චිත්තං නිරුජ්ඣිස්සති
නුප්පජ්ජිස්සති යස්සවා පන චිත්තං නිරුජ්ඣිස්සති නුප්පජ්ජිස්සති
තස්ස චිත්තං උප්පජ්ජති න නිරුජ්ඣතීති—යනමේ ප්‍රශ්නය විචාරා
වදාලකල්හි බ්‍රාහ්මණතෙම ආදි මධ්‍යපර්‍ය්‍යවසාන කිසිවක් නොදක
යම්සේ ගිලගත් යම්කිසිවක් නගාහරින්ට හෝ ගිලගන්ට හෝ
නොහැකිව යමෙක් වෙහෙසෙන්නේවේද එමෙන් ඒ ප්‍රශ්නය විස
දන්නට නොහැකිව පින්වත් ප්‍රව්‍රජිතයන් වහන්ස මේ කිනම්
මන්ත්‍රයෙක්දැයි විචාලේය, බ්‍රාහ්මණය මේ බුද්ධ මන්ත්‍ර නමැයි වදාල
සේක—එකල්හි බමුනුතෙම පින්වතුන්වහන්ස මේ බුද්ධ මන්ත්‍රය
මට දෙන්ටහැකිදැයි විචාලේය, බ්‍රාහ්මණය අපවිසින්ගත් ප්‍රව්‍රජ්‍යාව
ගන්නාහට දෙන්ට පිලිවනැයි වදාලසේක් ඉක්බිතෙන් බ්‍රාහ්මන
තෙම මන්ත්‍රය පිනිස පැවිදි ඉල්වූයේය—ඒ තෙරුන්වහන්සේත්
බ්‍රාහ්මනයා පැවිදිකොට උපසම්පදා කලසේක ඉක්බිතෙන තෙරු
න් වහන්සේ සියළු ත්‍රිපිටක බුද්ධ වචනයද උගැන්වූසේක- එහැම
ඉගෙන ලොකයෙහි හිරසඳසේ අභිසයින් ප්‍රසිද්ධවූසේක—බුද්ධරජා
නන් වහන්සේගේමෙන් ගාම්භීරවූ ඝොසාසවරය ඇතිවනබැවින්
බුද්ධඝොෂයයි කියා උන්වහන්සේ ප්‍රසිද්ධවූසේක.

මෙසේ කියනලදැයි සද්ධර්ම සංග්‍රහයෙහි·

බොධි මණ්ඩ සමීපම්හි ජාතො බ්‍රාහ්මණ මාණවො
විජ්ජා සිප්පකලා වෙදී තීසු වෙදෙසු පාරගො,

සම්මා විඤ්ඤාත සමයො සබ්බවාද විසාරදො,
වාදත්ථී ජම්බුදීපම්හි ආහිණ්ඩන්තො විවාදිකො

විහාර මෙකං ආගම්ම රත්තිඤ්ච මතං දීතං,
පරිවත්තෙතාහී සම්පුණ්ණ පදංසු පරි මණ්ඩලං.

තත්ථෙකො රෙවතො නාම ථෙරො සද්ධම්ම කොවිදො;
මහා පඤ්ඤ, අයං සත්තො දමෙතුංවට්ටතීතිසො,

කොනුගද්‍රභ රාවෙන විරවන්තොති අබ්‍රැවි,
ගද්‍රභානං රවෙඅත්ථං කිංජානාසිතිආහතං

ආම ජානාමි වුත්තොසො ඔතාරෙසි සකම්මතං
වුත්තං වුත්තං වියාකාසි විරුද්ධං පිච දස්සයි

තෙනහිත්වං සකං වාදං ඔතාරෙසුංති චොදිතො,
පාළි පුච්ඡි මහාථෙරො අත්ථම්පස්ස නසොධිතා.

ආහකස්සෙස මන්තොති බුද්ධමන්තොති සොබ්‍රැවි,
දෙහීති වුත්තෙතානො වෙසං ධාරිනො දම්මිතං ඉති.

මොදිතො පබ්බජෙහීති මන්තත්ථාය සපබ්බජී,
කම්මට්ඨාන මදාථෙරො පබ්බ ජෙත්වායථාරහං

උපසම්පාදයිත්වාසො උග්ගණ්හි පිටකත්තයං,
අත්ථ පාකටො ආසිවසෙනුව සූරියොවසො

බුද්ධස්ස වියගම්භීර ඝොසත්තානං වියාකරුං.
බුද්ධඝොසොති ඝොසොහි බුද්ධොවියමහීතලෙතී සි—

මෙසේප්‍රසිද්ධවූ නැන් පටන් එභික්ෂූන්වහන්සේ බුද්ධ ඝොසත් තෙරුන්වහන්සේ නමැයි මුළුලෝ කයෙහි ප්‍රකාසවූසේක— එකල්හි එබුද්ධඝොස ස්වාමින්වහන්සෙ ඒ විහාරයෙහිදී ඤාණොදය නම් ප්‍රකරණ යක් කොට අභිධර්මයෙහි ධර්මසංගණියට අත්ථසාලිනීනම් අටුවා කථාවද— පිරිත් අටුවාකථාවද කරන්ට ආරම්භ කලසේක— එකල්හි ආයුෂ්මත්වූ රේවත තෙරුන්වහන්සේ ඒ දැක මෙසේවදාලසේකි ඇවැත්නවූ බුද්ධඝොෂයමෙහි අද දඹදිව පිට කත්‍රය පාලිය පමණක් ඇත ඒ අටුවාකථාද ආචාර්ය්‍ය වාදයොද නැත්තාහුයි සිංහල බසයෙහි අටුවාකථා හාආචාර්ය්‍ය වාදන්ඇතඑව්නාහි සංගීතිත්‍රයට ආරූඪවූ බුද්ධ

භාසිතය හා සාරිපුත්‍ර ස්ථවිරාදීන් විසින් කරණලද අර්ථකථාමාර්ගය
බලා යතිමනි සම්පන්න මිහිඳු මාහිමියන්වහන්සේ විසින් සිංහලභාෂා
වෙන් කරණ ලද හෙයින්ම සුඛවූ සිංහල අටුවා කථා සිංහල ද්වීප
යෙහි පවත්නේය තොපි එහිගොස් එ අටුවාකථා අසාපරීක්ෂාකොට
ගෙන මාගධභාෂාවට පරිවර්තනයකරවජ් අර්ථකථා නොමෝ සියළු
ලොකයාහටහිත සැපඑලවන්නේවේ මෙසේඋපාධ්‍යායයන්වහන්සේ
වදාල කල්හි එඅසා සතුටුවූ ආයුෂමත් බුද්ධඝොෂක භික්ෂූන්වහන්සේ
උපාධ්‍යායන්වහන්සේද භික්ෂුසංඝයාවහන්සේද වැඳ අවසරගෙන
ක්‍රමයෙන් අවුත් නැව්පට්ටනමට පැමිනිසේක. එකල්හි ශක්‍රදෙවෙන්ද්‍ර
තෙම දිව අමා අරළු ඵලයක්ද පත්හිදක්ද එබුද්ධඝොෂ ස්වාමින්වහ
න්සෙට ගෙනවුත්දී ශක්‍රභවනයටම ගියේය,--

එසින් උන්වහන්සේ නැව්නැගීඑඩනාසේක්මහාසමුද්‍රය මධ්‍යයෙහි
දී පරිපථයට පැමිණි ආයුෂ්මත් බුද්ධදත්ත ස්ථවිරයන් දැක කථා සල්ලා
පකොට එසින් නික්ම අවුත් ලංකා පට්ටනමට පැමින මෙහි මහා
නාම රජ රජ්කරණකල ක්‍රමයෙන් අනුරාධපුර මහාවිහාරයට පැමින
එහි භික්ෂූසංඝයාදැක මහා ප්‍රධානඝරයෙහි සංඝපාල ස්ථවිරයන්වහන්
සෙ සමීපයට ගොස් සියළු සිංහල අටුවා කථාද ථෙර වාදද අසාධර්ම
ස්වාමිවූ බුදුරජානන්වහන්සෙගේ මේ අභිප්‍රායයයි නියමකොට දැන
එවිහාරයෙහිසංඝසන්නිපාතය කරවා මෙසෙදැන්වූසෙක ස්වාමිවූ මහ
සංඝයාවහන්ස පිටකත්‍රයට අටුවාකථාකරන්ට මට පොත්දෙවාවදා
ලමැනවැයි යාඥකලසෙක—එකල්හි භික්ෂූසංඝයාවහන්සෙ උන්වහ
න්සේගේ සාමර්ථ්‍යභාවයවිමසනුපිණිස ගාථාවයක්දි තොපගේ සාම
ර්ථ්‍යභාවය මෙයින් දැක සියළු පොත් දෙම්හයි කීසෙක,—එකල්හි ආයු
ෂ්මත් බුද්ධඝොස ස්ථවිරයන්වහන්සෙ පිටකත්‍රය පාලියද අටුවාකථාද
දැක සලෙපතිඨායාති ආදිගාථාවෙහිඅර්ථ සංග්‍රහකොට විසුද්ධිමාර්ගනම්
ප්‍රකරණයක් කලසෙක—එකල්හි දෙවතාවෝ උන්වහන්සේගේ
නෙනක ප්‍රඥාභාවය මහජනයාකෙරෙහි ප්‍රකාසක රණු පිණිස ඒ
පොතඅන්තර්ධාන කලාහුය—එ බුද්ධඝොසතෙරුන්වහන්සේද දෙව
තුන් පොතක්කෙළේය එදෙවතාවෙම අන්තර්ධානකලහෙයින් තුන්
වෙනිවත් පොතක්කලසෙක—එකානෙහි දෙවතාවෝ අතුරුදන්ක
ලපොත් දෙකද දුන්නෝය—එකල්හි පොත් තුනෙකක්වූහ—ඉක්බි
තෙතන් ආයුෂමත් බුද්ධඝොස ස්ථවිරයන්වහන්සේ පොත් තුනම
ගෙන භික්ෂූසංඝයාවහන්සෙට දුන්සෙක—එකල්හි භික්ෂුසංඝයාවහ
න්සේ පොත් තුනම එකතුකොට කියවා ඒ පොත් තුනෙහිම
ග්‍රන්ථවසයෙන්වත්, පදවසයෙන්වත් අක්ෂරවසයෙන්වත්. ව්‍යංජන
වසයෙන්වත් අර්ථවසයෙන්වත් පූර්වාපර වසයෙන්වත් ථෙරවාද

ඩිලින්වත් පාලියෙන්වත් වෙනසක්නොව පොත් තුනෙහිම ග්‍රන්ථ අක්ෂරාදී සියල්ල එක් අයෙක් කලාසේ ඒකාකාරව තිබුණේය. එහෙයින් කියනලදී. සද්ධර්මසංග්‍රහයෙහි—

ඤාණොදයං නාමකත්වා පකරණං තදා,
ධම්මසංග නියාකාසි කාසිංසො අට්ඨසාලිනිං.

පරිත්තට්ඨකථං චෙව කාතුමාරභි බුද්ධිමා,
තංදිස්වාරෙ වතත්ථෙරො ඉදංවචනමබ්‍රවි.

පාලිමත්තම්පිඅනීධ නත්ථිඅට්ඨ කථාවසා,
තථාචරිය වාදමතීභින්නා රූපාන විජ්ජරෙ.

සීහලට්ඨ කථාසුද්ධාම හින්දෙනමතීමතා.
සංගීතිත්තය මි රූළ්හා සම්මාසම්බුද්ධදෙසිතා.

සාරිපුත්තාදි ගීතා හිකථාමග්ගංසමෙක්ඛිය,
කතා සීහල භාසාය සීහලෙ සුප්පවත්තති.

තංතත්ථ ගන්ත්වා සුත්වානං මාගධාය නිරුත්තියා,
පරිවත්තෙහි සාහොති සබ්බලොක හිතාවහා.

එවංවුත්තො ප සන්නාසො නික්ඛමිත්වා ත තොඉමං,
දීපමා ගම්මතස්සෙව රඤ්ඤොකාලෙ මහාමති.

මහාවිහාරං සම්පත්තො විහාරෙ සාධු සම්මතං,
මහාපධානඝරං ගන්ත්වා සංඝපාලස්ස සන්තිකෙ.

සීහලට්ඨ කථං සුත්වාථෙරවාදංච සබ්බසො,
ධම්මසාමිස්ස එසොව අධිප්පායොති නිච්ඡිය,

තත්ථ සංඝං සමානෙත්වා කාතුමට්ඨ කථං මම.
පොත්ථකෙදෙථ සබ්බෙපි ආහවීමං සිතුංවතං.

සංඝො ගාථාද්වයං තස්සදාසි සාමත්ථියංතව,
එත්ථදස්සෙ හිතංදිස්වාසබ්බදෙමාති පොත්ථකෙ.

පිටකත්තය පාලිංච සද්ධිං අට්ඨකථායසො,
විසුද්ධි මග්ගං නාමෙකා තං ගහෙත්වා සමාගතො.

තතොසංඝං සමූහෙත්වා සම්බුද්ධ මතකොවිදෙ.
මහාබොධි සමීපම්හි සොතංවාචෙතුමාරභි.

දෙවතා තස්සනෙපුඤ්ඤං පකාසෙතුං මහාජනෙ,
ඡාදෙසුං පොත්ථකංසොපි ද්වත්තික්ඛත්තුම්පි තං අකා.

වාචෙතුං තතියෙවාරෙ පොත්ථකෙ සමුද්ධටෙ,
පොත්ථකද්වය මඤ්ඤම්පි සණ්ඨපෙසුං තහිංමරූ.

වාචයිංසු තදාභික්ඛූ පොත්ථකත්තය මෙකතො,
ගන්ථතො අත්ථතො චාපිපුබ්බාපර වසෙනවා.

ථෙරවාදෙහි පාලිහි පදෙහි ව්‍යඤ්ජනෙහිච,
අඤ්ඤථත්තමහූනෙව පොත්ථකෙසුපි තීසුපි—

මෙසේ බුද්ධඝෝෂ ස්ථවිරයන්වහන්සේ විසින් කරණලද විසුද්ධිමාර්ග නම් ප්‍රකරණ තුනම එකතුකොට කියවා නිමිකල්හි අහස්හි මහත් නාදයෙන් හා විදුලිඑලියෙන් ගැවසීගත්තාය දෙවතාවෝ සාධුනාද පැවැත්වූවාහුය.

එසමයෙහි මහාවිහාරයෙහි නොයෙක් දහස්ගණන් භික්ෂූන්වහන්සේලා රැස්ව ඒ ආශ්චර්‍ය්‍ය අද්භූත කාරණය දැක සතුටු සතුටුව සාධුකාරදිදී නිසැකයෙන්ම මෙ භික්ෂූන්වහන්සේනම් මෛත්‍රී බෝධිසත්වයන්වහන්සේය යෙක්නොවැසිකියා නැවතනැවතද කියමින් ඝෝෂාකලාහුය ඒඇසූ මහානාමරජතෙම මහත්රාජානුභාවයෙන් යෙදී මහපිරිස් පිරිවරනලදුව නුවරින්නික්ම මහාවිහාරයටගොස් භික්ෂුසංඝයා වැඳ ස්වාමීන්වහන්ස යම්තාක්කලෙකින් ධර්ම ප්‍රකරණ කිරීම නිමාවටයෙද ඒතාක්කල් මාගේරජගෙයින් භික්ෂාව වලඳනසේක්වයිකියා ආරාධනාකලකල්හි තුෂ්ණීම්භාවයෙන් ඒබුද්ධඝෝෂ ස්ථවිරයන්වහන්සෙ ඉවසූසේක—ඉක්බිතෙතත් මහවිහාරවාසිභික්ෂු සංඝයාවහන්සෙ සිංහල අටුවාකථා පොත් හාසමග පිටකත්‍රයෙ පාලි පොත් දුන්සේක—එකල්හි ඒ ආයුෂමත්වූ බුද්ධඝෝෂ ස්වාමීන් වහන්සෙ එසියළු පොත්ගෙන මහවිහාරයට දක්ෂිණ දිසාභාගයෙහි ප්‍රධානඝර නම්වූ එක්ප්‍රාසාදයෙක්හී වසමිං සියළු සිංහල අටුවාකථා පෙරලා මූල භාෂානම්වූ මාගධික භාෂාවටනගා ඒ තුන්පිටකයට අටුවාකථා කරණසෙක් සමන්තපාසාදිකායෙහි කියනලද ක්‍රමයෙන් ත්‍රිවිධවූ සිංහල අටුවාපොත් ගෙණකලසෙක කොයෙවු සිංහල අටුවා පොත්දයත්—සිංහල භාෂායෙන්ලිවූ මහාඅටුවාකථාවද මහාපච්චරිය නම් අටුවාකථාවද—මහාකුරුන්ද කථාවදැයි යනමෙ අටුවාපොත් තුණ සිංහල අටුවාකථානම් වන්නාහුය එයින් මහ අටුවාකථාවනම් ප්‍රථම මහාධර්මසංගීතියට ඇතුලත්වූනහෙයින් මහාඅට්ඨකථානම්විය මහාපච්චරියඨකථාව නම් ඒ සිංහලභාෂායෙන් උළුම්පෙයයි කියණලද

පසුවරෙක්ඇත එපසුරෙහි නිදකරණලදබැවින් පච්චරිය අටුවාකථානම් විය—මහාකුරුන්දක කථාවනම් කුරුන්දිය නම් විහාරයෙක් ඇත. එවිහාරයෙහි හිඳ කලබැවින් කුරුන්දි අඨකථා නම් විය. මෙසේ තුන් ප්‍රකාරවූ අටුවාකථාවන් අතුරෙන් ආයුෂමත්වූ බුද්ධඝොෂ ස්ථවිරයන්වහන්සෙ කුරුන්දක කථායෙහි සිංහල භාෂාව පෙරලා මූල භාෂා නම්වූ මාගධ භාෂාවට නගා සියළුවිනය පාලියට අර්ථවූ සමන්තපාසාදිකානම් සත්විසිදහසක් පමණ ග්‍රන්ථයෙන් ප්‍රතිමණ්ඩිතවූ විනය අටුවාව කලසේක.

එහෙයින් කියනලදී.

විනයෙපාටවණ්ණාය සාසනස්සච වුද්ධියා,
මාගධාය සමාරද්ධා විනයට්ඨ කථාවයා.

සමන්තපාසාදිකා සා සබ්බසො පරිනිට්ඨිතා,
සත්තවීස සහස්සෙහි භණෙඨහි පරිමානතොති.

ඊට අනතුරුව සූත්‍ර පිටකයෙහි මහඅටුවා කථාව සිංහලභාෂායෙන් පෙරලා සුමඞ්ගල විලාසිනිනම්වූ දික්සඟි අටුවාවද—ඒසෙම ප්‍රපංචසුදනි නම් මැදුම් සඟි අටුවාවද—එසෙම සාරාර්ථ ප්‍රකාශිනි නම්වූ සංයුත් සඟි අටුවාවද—එසෙම මනොරථ පූරනි නම්වූ අඞ්ගොත්‍ර සඟි අටුවාවද ඛුද්දගොත් සඟියෙහි ඇතුලත් පංච දස ප්‍රකරණ යන්ම පිලිවෙලින්මවූ සද්ධර්මජොතිකානම් අටුවාවද—ධම්පදනම් අටුවාවද—උදාන නම් අටුවාවද—ඉතිවුත්තක නම් අටුවාවද—සූත්‍ර නිපාත නම් අටුවාවද—විමානවස්තුනම් අටුවාවද—ප්‍රේතවස්තුනම් අටුවාවද—ථෙරගාථානම් අටුවාවද—ථෙරිගාථා නම් අටුවාවද—ජාතක නම් අටුවාවද | ප්‍රතිසම්භිද නම් අටුවාවද—අපදාන නම් අටුවාවද බුද්ධවංසනම් අටුවාවද—නෙත් පවුරුණු අටුවාවද—ආදිවූ දියළු අර්ථකථා යථොක්ත ක්‍රමයෙන්ම පාලියට නගා කලසේක.

මෙම කියනලදී.

සුත්තන්තානං පාටවණ්ණාය සාසනස්සච වුද්ධියා,
මාගධාය සමාරද්ධා සුත්තං තට්ඨ කථාවසා.

චතුනිකායට්ඨ කථාසබ්බසො පරිනිට්ඨිතා,
ඡාසීති සහස්සෙහි ගන්ථෙහි පරිමාණතො.

ඛුද්දක නිකායට්ඨකථා සබ්බසො පරි නිට්ඨිතා,
සත්තාතී සත, සහස්සානි ගන්ථෙහි පරිමාණතොති.

ඊට අනතුරුව අභිධර්ම පිටකයෙහිවූ මහාපච්චරි අඨකථාවෙහි සිංහල භාෂාව පෙරලා මාගධ භාෂාවට නගා අත්ථසාලිනිනම් ධර්මසංගණී අටුවාකථාවද. එසෙම සම්මොහ විනොදනිනම් විභංග ප්‍රකරණ අටුවාකථාවද පරමත්ථදීපනි නම් පංචප්‍රකරණ අටුවාකථාවද. කියනලද ක්‍රමයෙන්ම පාලියට නගා කලසෙක—

එම කියනලදමැයි.

අභිධම්මං පාටවත්ථාය සාසනස්සච වුඩ්ඪියා,
මාගධාය සමාරද්ධා අභිධම්ම කථාවසා.

අත්ථසාලිනි නාමාදි සඞ්ඛයෙසා පරිනිට්ඨිතා,
තීහිසහස්ස මත්තානි ගන්ථානි පරිමානතොති.

මෙසේ පලමු ස්ථවිර ආචාර්‍ය්‍යවරාදීන් විසින් පාලනයකළ ක්‍රමය ගෙණ ථෙරවාද නැමැයි කරණලද සියල්ලම මාගධ භාෂාවෙන් පවත්නාසේ අටුවාකථා බුද්ධඝොෂ ස්වාමීන්විසින් උපදවාඑසේක්මය. ඒත්‍රිපිටකත්‍රයෙ අටුවාකථාවෙ බුද්ධශාසනයපවත්නාතාක් සියළු දෙශාන්තරවාසීන්ට හිතවැඩ සාදදෙන්නාහුය එසේ ලොකහිතවූ පිටකත්‍රයට අටුවාකථාකොට නිමිකල්හි අනෙකප්‍රකාරයෙන් මහාපෘථුවිය කම්පාවිය—මේ පිටකත්‍රයට අටුවාකථා කිරීම එක් අවුරුද්දකින් නිමාවිය.

ඉක්බිතෙතත් ආයුෂ්මත් බුද්ධඝොෂ ස්ථවිරයන්වහන්සේ මෙසේ ලක්දිව තමන්වහන්සේ විසින් කලමනා කටයුතු නිමවා, මධ්‍යමණ්ඩලයෙහි මහාබොධීන් වහන්සේ වඳනා කැමතිව භික්ෂුසඞ්ඝයා වැඳ අවසරගෙණ නැවත දඹදිවටම වැඩිසේක—මෙම කියනලදී- පුරාතනයන් විසින්—

සම්බුද්ධ පරිනිබ්බානා නවවස්ස සතෙසුච,
ඡප්පඤ්ඤාසා අතීතතෙත මහානාමො නරාධිපො.
ධම්මෙන දසවිධෙනෙව ලංකාරජ්ජ මකාරයි,

බුද්ධඝොසොති ඝොසෙහි බුද්ධොවිය මහීතලෙ,
ලංකාදීපං තදාගම්ම ලංකාදීප හිතාවහං-පෙ-
සංඝාකාථා චයංදත්වා සීහලඩ කථායච,
විසුද්ධිමග්ගං නාමාකා සංඝස්ස අනුමතතියා.

අථඋග්ගොසයි සංඝො තුඨහට්ඨො විසෙසතො,
නිස්සංසයං මෙතෙනායො ඉතිවත්වා පුනප්පුනං.

සද්ධම්මඨි කථාදාසි පොත්ථකෙ පිටකත්තයෙ,
හත්ථපූඤ්ඤරෙ චසමෙන්තානං සා විහාරෙද්ධුර භාගරේ.

පරිවත්තෙසි සබ්බාපි සීහලට්ඨ කථාතදා,
සබ්බෙසං මූලභාසාය මාගධාය නිරුත්තියා.

සත්තානං සබ්බභාසානං සා අහොසි හිතාවහා,
ථෙරීයා චරියාසබ්බෙ පාළිං විය තමග්ගහුං.

අථ කත්තබ්බ කිච්චෙසු ගතෙසු පරිනිට්ඨිතං,
වන්දිතුං සො මහාබොධිං ජම්බුදීප මුපාගමි.

භුත්වාවාවිය වස්සානි මහානාමො මහීපති,
කත්වාපුඤ්ඤානි චිත්‍රානි යථාකම්ම මුපාගමි.

පිටකත්ථ සංකත්වා කත්වාලොක හිතාබහුං,
සොයාවතා යුතකාංඛත්වා ථෙරොපි තුසිතංගතො.

ලංකාවාසී තදාභික්ඛු කතකිච්චා අනාසවා,
තෙයාවතා යුකාංඛත්වා සබ්බෙපි පරිනිබ්බුතා.යි—

මෙහි කියනලද ක්‍රමයෙන්ම පිටකත්‍රයට අටුවාකථා පොත් ලියවීම් ආදිවූ නොයෙක් විසිතුරු පින්කම් කිරීමෙන් මහානාමනම් රජ දෙවිසි අවුරුද්දක් රාජ්‍යානුශාසනාකොට කම්වූපරිද්දෙන් මිය පරලොව ගියහ—පිටකත්‍ර පාලියට උපකාරීව සිටි සියළු අර්ථ කථා ලියා ලොවැඩකල බුඬඝොස සාමීන්වහන්සේ දඹදිවුවැඩ ආයු පමනින් වැඩසිට මරණාවසානයෙහි තුසීපුරයෙහි උපන්සේක—එසමයෙහි ලංකාවාසි ඒ ක්ෂීණාශ්‍රවයන් වහන්සේලාද ආයුපමනින් වැඩසිට ලොවැඩකිරීමෙන් පිරිනිවන් පැවාහුය.

මෙසේ පිටකත්‍ර පාලියෙහි අර්ථවණ්ණනා කෙරෙම්සි සිතා කල්පලක්ෂයක් මුළුල්ලෙහි කරණලද ප්‍රාර්ථනා බලඇතිව ලබනලද ගාම්භීර ඥානයෙන්ම වණ්ණනාකටයුතුවූ උතුම් පිටකත්‍රය පාලි දෙසනාව දෙව් මිනිසුන් සහිත සියළු ලොකයාහට කරණලද ප්‍රමානාතික්‍රාන්තවූ අනුශාසනාවන් ඇතිහෙසින් දසවිධවූ ඥාණබලයක්ඇති මාගේ බුද්ධරජානන් වහන්සේ ශාස්ත්‍රෑනම් වනසේක.

ඒහෙසින් කියනලදී-

දෙව යක්ඛ මනුස්සානං ලොකෙ අග්ග ඵලං දදං,
දදංතං දමයන්තානං පුරිසාජඤ්ඤ තෙනමො.යි.

මේ ශ්‍රී සඬර්මෝවාද සංග්‍රහයෙහි පිටකත්‍රය පාලියට සියළු අර්ථකථා ලියාළු ප්‍රවෘර්ත්ති සංග්‍රහය නිමවනලදී.

මේ අටුවා කථා ලියා පැවැත්වූ තැන් පටන් සසියතුන් වර්ෂයක් අතික්‍රාන්තව ගියකල්හි, මහාසම්මත පරම්පරානුගත සූර්‍ය්‍යවංශ සම්භූත පරාක්‍රමබාහු නම් මහරජානෝ රුහුනු මායා පිහිටි යන තුන් රජයම එක්සත්කොට රාජ්‍යාභිෂෙකප්‍රාප්තව රාජාධිරාජ්‍ය සවදෙස දෙසාන්තරවල අසදෘස කීර්ති අඥ තෙජෝබල පතුරුවා පොළොන්නාරුනම් මහා පුරප්‍රවරයෙහි දැහැමින් රජකරවසනුයේ වලගම් අබා මහරජ දවස පටන් එක්වාදහස් එක්සිය අසූපස් වර්ෂයක් වනතුරු ලංකාවාසී සියළු භික්ෂුසංඝයා වහන්සේම තුන් කොට්සක්ව බෙදී වෙන්ව භින්නනිකායව ශාසනයපිරිහෙලමින් සිටිකල්හි පැවිදි වෙස්ගෙන අපාය මාර්ගවූ දුස්ප්‍රතිපත්ති පූරණයෙන් අපායභාග්වී ව්‍යසනයට පැමිනෙන කුලපුත්‍රයන් දැක කරුණාවෙන් මෙහෙයන ලද සිත්ඇතිව, කෙසේනම් මම මේ නෛර්‍ය්‍යාණිකවූ බුද්ධශාසනය දුස්ප්‍රතිපත්ති කිලුටුහැර සුප්‍රතිපත්ති වර්ධනය කෙරෙම්දෝහොයි සිතනුයේ විභජ්ජවාදීවූ භාග්‍යවත් බුදුරජානන් වහන්සේගේ ශාසන !තත්වය දන්නා දිඹුලාගල වනවාසී කාශ්‍යප ස්ථවිරයන් වහන්සේගේ සහාය ලදින් එම ස්වාමිපාදයන් ප්‍රධානකොටගෙන විචාරා නොයෙක් සියගනම් පාප භික්ෂූන් නිර්ධනයකොට සුදුපිලිදී ගිහිකරවා හැර ශාසනය නොමිලකොට පවත්වා විසිතුරු චෛත්‍ය සහිත ජේතවන විහාරය පූර්වාරාමය දක්ෂිණාරාමය උත්තරාරාමය වේළුවනාරාමය කපිලවිහාරය ඉසිපතනාරාමය කුසිනාරාමය ලංකාතිලක මහවිහාරාදි නොයෙක් මහවිහාරයන් කරවා එකොළොස් මහලකින් හා දහසක් පමණ ඇතුළුගබඩා ගෙවලින් හා නොයෙක් සියගනන් කූටාගාරයෙන් ප්‍රතිමණ්ඩිත විසිතුරු චිත්‍රකර්ම ලතාකර්මාදීන් සොභමාන උපොසථග්‍රහවූ මහාප්‍රාසාදයක් කරවා බොධි ථූප පිරිවෙන් ගෙවල් මණ්ඩප පන්තියෙන් සොභමානවූ අනෙකප්‍රකාර තරුවන කුසුම ගන්ධසම්මොදමාන කොකිලාදි පක්ෂි සමූහයා විසින් සෙවනය කරණලද පද්මොත්පල පුණ්ඩරීකාදීන් ගැවසීගත් සිහිල් දියඇති ජලාශ්‍රයෙන් ගැවසීගත් ජේතවන නම් මහ විහාරයකකරවා මහසංඝයා වහන්සේට පිලිගැන්වූසේක—එහි වසන නොයෙක් දහස්ගනන් භි ක් ෂු න් ව හ න් සේ ම සංඝස්ථවිරවූ ආයුෂ්මත් කාශ්‍යප ස්ථවිරයන් වහන්සේ භික්ෂුසංඝයා රැස්කරවා භික්ෂූන්ට ආමන්ත්‍රනයකොට ඇවැත්නි පිටකත්‍රයෙහි අටුවාකථාවල ප්‍රකාසව නොපෙනෙන ලීනාර්ථ ප්‍රකාසය පිනිස යම් අර්ථ වර්ණනා කෙනෙක් පූර්වාචාරිවරයන් විසින් කරණලදද ඒ සිංහල භාසාවෙන් ලියා තිබෙන බුද්ධඝොස සාමින්කල සියළු කථාවල ප්‍රකාසනොව සැඟවී තිබෙන ලීනාර්ථ වර්ණනාවල් සියළු දෙසාන්තරවාසි භික්ෂූන් වහන්

සේලාට අර්ථසංසිද්ධිය නොකරන්නේය කීසි ග්‍රන්ථිපදයෙක සිංහල භාසාවෙන් ලියනලද්දේය කිසිතැනෙක්හි මාගධික භාසාවෙන් ලියනලද්දේය. එහෙයින් භාසාන්තරයෙන් සම්මිශ්‍රව ආකුලව ලියන ලද ඒ ලිනාර්ථවර්ණනාවන් අපි භාසානතරය පහකොට අනාකුලව පරිපූර්ණ අර්ථ වර්ණනාවන් පාලි භාසාවෙන් කරමහයි දැන්වූසේක— එකල්හී භික්ෂූන්වහන්සේලා එසේවීනම් සවාමිවූ ස්ථවිරයන් වහන්සේ රාජාඥගෙණ අඥවත්‍රය කරණසෙක්වයි කීවානුය—එකල්හි පිරිවර සහිතවූ පරාක්‍රමබාහු මහරජ නුවරින් නික්ම විහාරයටගොස් මහාකාශ්‍යප ස්ථවිරයන්වහන්සේද භික්ෂුසංඝයා වහන්සේද වැඳ එකත්පසව හුන්නේය. ඉක්බිත්තෙන් ඒරජහට තෙරුන්වහන්සේ වදාරණසේක් මහරජ පිටකත්‍රයට අටුවා කථාවන්ගේ ලිනාර්ථයන් කටයුතුවන්නේයයි වදාලසේක—එවිට මහරජහු යහපත සවාමීන් වහන්ස මම කායසාමාග්‍රිය දෙමි භික්ෂුසංඝයා වහන්සේ චිත්ත සාමාග්‍රියෙන් විසවාසව ඒය එසේ කරණසේක්වයි ආරාධනාකොට ඉක්බිතෙනත් මහරජතෙම භික්ෂුසංඝයා වහන්සේ වැඳ අවසර ගෙණ නුවරටම ගියේය එකල්හි ස්ථවිර භික්ෂූන්වහන්සේලා වදාල ඉක්බිති පරාක්‍රමබාහු නරෙන්ද්‍රයන් විසින් කරණලද ප්‍රාසාදයෙහි රැසව වැඩහිඳ විනය පිටකාර්ථ කථාවූ සමන්තපාසාදිකා නම් විනය අටුවායෙහි අර්ථ වර්ණනාවට පටන්ගෙන මූලභාසාවූ මාගධික භාෂායෙන් සාරාර්ථදීපනී නම්වූ තිස්දහසක් ග්‍රන්ථඇති විනය ලිනාර්ථ වර්ණනාවක් කලානුය—ඒහෙයින් කියනලදී—

විනයේ පටවත්ථාය සාසනස්සච වුද්ධියා,
සංවණ්ණනා ස මාරද්ධා විනයට්ඨ කථාවසා

සාරත්ථදීපනී නාම සබ්බසො පරිනිට්ඨිතා,
තිංසසහස්ස මත්තෙහි ගන්ථෙහි පරිමාණතොති.

ඊටඉක්බිතිව සූත්‍රපිටකයෙහි දීඝනිකායෙහි අර්ථකථාවූ සුමංගල විලාසිනී නම් අටුවායෙහි අර්ථ වර්ණනාවට පටන්ගෙන මාගධ භාසායෙන්ම ප්‍රථම සාරාර්ථමංජුසා නම්වූ අර්ථ වර්ණනාවක්ද කලානුය — එසේම මජ්ඣිමනිකායාර්ථ කථාවූ ප්‍රපංචසූදනී නම් අටුවායෙහි අර්ථ වර්ණනාවට පටන්ගෙන මාගධික භාසායෙන් ද්විතිය සාරාර්ථමංජුසා නම් අර්ථ වර්ණනාවක් කලානුය—එසේම සංයුක්තකාර්ථ කථාවූ සාරාර්ථප්‍රකාසිනී නම් අටුවායෙහි අර්ථ වර්ණනාවට පටන්ගෙන මාගධ භාෂායෙන් තෘතීය සාරාර්ථ මංජුසානම් අර්ථ වර්ණනාවක් කලානුය—එසේම අඞ්ගුත්තරනිකායාර්ථ කථාවූ මනොරථපූරනී නම්

අටුවායෙහි අර්ථවර්ණනාවට පටන්ගෙණ මාගධික භාෂායෙන් චතුර්ථ සාරාර්ථමංජුසානම් අර්ථවර්ණනාවක් කලාහුය—එම කියනලදමැයි—

සුත්තන්තපාඨ වත්ථාය සාසනස්සච වුඩ්ඪියා,
සංවණ්ණනා සමාරද්ධා සුත්තන්තත්ථ කථාවසා.

සාරත්ථමංජුසානාම සබ්බසො පරිනිට්ඨිතා,
ඡන්නවුති සහස්සෙහි ගන්ථෙහි පරිමාණතොති.

ඊට අනතුරුව අභිධර්ම පිටකයෙහි ධර්ම සංගනියාර්ථ කථාවූ අර්ථසාලිනී නම් අටුවායෙහි අර්ථවර්ණනාවට පටන්ගෙණ මාගධ භාෂායෙන් ප්‍රථම පරමාර්ථප්‍රකාසිනී නම් මූලටීකාවක්ද අනුටීකාවක්ද කලාහුය—එසේම විභඞ්ගප්‍රකරණාර්ථ කථාවූ සම්මොහ විනොදනී නම් අටුවායෙහි අර්ථවර්ණනාවට පටන්ගෙණ මාගධික භාෂායෙන් ද්විතීය පරමාර්ථප්‍රකාසිනී නම් මූලටීකාවක්ද අනුටීකාවක්ද කලාහුය—එසේම පඤ්චප්‍රකරණාර්ථ කථාවූ පරමාර්ථදීපනී නම් අටුවායෙහි අර්ථවර්ණනාවට පටන්ගෙණ මාගධික භාෂායෙන් තෘතීය පරමාර්ථප්‍රකාසිනීනම් මූලටීකාවක්ද අනුටීකාවක්ද කලාහුය-ඒහෙයින් මෙහි කියනලදී—

අභිධම්ම පාඨවත්ථාය සාසනස්සච වුඩ්ඪියා,
සංවණ්ණනා සමාරද්ධා අභිධම්මත්ථ කථාවසා.

පරමත්ථප්පකාසිනී සබ්බසො පරිනිට්ඨිතා,
සත්තවීස සහස්සෙහි ගන්ථෙහි පරිමාණතොති.යි—

මෙසේ පරාක්‍රමබාහු නරෝත්තමයන් විසින් කරණලද ආරාධනා ඇති කාශ්‍යප ස්ථවිරයන්වහන්සේ නොයෙක් දහස්ගනන් ස්ථවිර භික්ෂූන්වහන්සෙ හාසමග උත්සාහ උපදවා ධර්මවිනය සංගායනාවක්වැනිව පිටකත්‍රයෙ අටුවාකථාවලට ටීකා අර්ථවර්ණනාකොට අවුරුද්දකින් නිමවූසේක—ඒ අර්ථවර්ණනාවගෙ කෙලවර පෘථුවි කම්පනාදි නොයෙක් ආශ්චර්‍ය්‍යයෝපගලවූවාහුය—මෙම කියනලදී-සද්ධර්මසංග්‍රහයෙහි-

සම්බුද්ධපරිනිබ්බානා වස්සසහස්සාතික්කමෙ,
සත්තාසීතිප්පවස්සෙ රාජාහුපරක්කමභුජො.

උළාරපුඤ්ඤ තෙජෙන කත්වා සත්තුවිමද්දනං,
පත්තරජ්ජාභිසෙකෙන සාසනෙජ්ජොත නත්ථිනා.

නිස්සාය සීහලින්දෙන යං පරක්කම බාහුනා,
කත්වා නිකාය සාමග්ගිං සාසනං සො විසොධිතො.

කස්සපො සො මහාථෙරො සඞ්ඝස්ස පරිනායකො,
දීපස්මිං තම්බපණ්ණිම්හි සාසනොදය කාරණො.

අජ්ඣෙසිතො නරින්දෙන සොපරක්කම බාහුනා,
සද්ධම්මට්ඨිතිකාමෙන කත්වා සාසන සංගහං.

පිටකට්ඨකථායාහං ලීනත්ථස්ස පකාසනං,
කතං සබ්බත්ථ භික්ඛූනං අත්ථං සාධෙති සබ්බසො.

දුවිඤ්ඤෙය්‍යසභාවාය සීහලාය නිරුත්තියා,
ගණ්ඨිපදෙසු නෙකෙසු ලිඛිතං කිංචිකත්ථචි.

මාගධිකාය භාසාය ආරභිත්වාපි කෙනචි,
භාසන්තරෙන සම්මිස්සං ලිඛිතං කිංචිදෙවච.

අසාරගණ්ඨිඨානාපි තත්ථෙව බහුදිස්සන්ති,
ආකුලංච කතං යත්ථ දුවිඤ්ඤෙය්‍යාපි අත්ථතො.

ඉතො අපරිපුණ්ණෙන තාදිසෙනෙත්ථ සබ්බසො,
කථාමත්තං විජානන්ති නානාදෙස නිවාසිනො.

භාසන්තරං තතො හිත්වා සාරමාදාය සබ්බසො,
අනාකුලං කරිස්සාමි පරිපුණ්ණවිනිච්ඡයං.

පිටකත්තය වණ්ණනා ලීනත්ථස්ස පකාසනා,
සාරත්ථදීපනීනාම සාරත්ථමංජුසාපිච.

පරමත්ථප්පකාසිනි නාම ථෙරෙහි භාසිතා,
සන්තානං සබ්බභාසානං සා අහොසි හි තාවහා.

පරක්කමභුජො නාම ලංකින්දුප්පඤ්ඤපඤ්ඤවා,
ධම්මෙන දසවිධෙනෙව ලංකාරජ්ජ මකාරයි.

කත්වාපුඤ්ඤානි නෙකානි පසන්නො රතනත්තයෙ,
ආයුමන්හි පරියොසානෙ යථාකම්මමුපාගමුං.යි—

දක්වනලද ක්‍රමයෙන් පිටකත්‍රය අට්ඨකථාවලට ලීනාර්ථ වර්ණනා ලියවීම්ආදි අනෙකප්‍රකාරවූ කුසල රාසි වර්ධනය කිරීමෙන් දැහැමින් රාජ්‍යානුශාසනාකොට අනතුරුව රත්නත්‍රයෙහි අති ප්‍රසන්නවූ ඒ පරාක්‍රම්බාහුනම් පින්වත් රජ ආයු කෙළවර කම්වූ

පරිච්ඡෙදන් පරලොකප්‍රාප්තවිය — පිටකත්‍රය පාලි අටුවාකථාවලට ලීනාත්ථවණ්ණනාකථාවන් මාගධිකභාසාවෙන්ම ලියාතිබෙකාර ලොවැඩකල මහාකාශ්‍යපස්ථවිරාදි කල්‍යාණපෘථග්ජනවූ ඒ ස්ථවිර භික්ෂූන් වහන්සේලාද ආයුෂ්මනින් වැඩසිට ලොවැඩකිරීමෙන් අනතුරුව කම්වූපරිච්ඡෙදන් පරලොකප්‍රාප්තවූවාහුය.

මෙසේ ලීනාත්ථවණ්ණනා සංඛ්‍යාත ටීකාකාරක මහාස්ථවිර භික්ෂූන්වහන්සේලා දහසක් පමණ රැසව හිඳ වණ්ණනාකොලේත් බුද්ධඝොෂක සාමීන් විසින් වණ්ණනාකරණලද අටුවාකථාවල ප්‍රකාශනොව සැඟවීසිටි අත්ථවණ්ණනාකථාවෝමය — එසේ කප්ලක්ෂයක් මුළුල්ලෙහි අත්ථවණ්ණනාකිරීමටම ප්‍රාර්ථනාකරමින් පැමිණි මහලුතුමන් විසිනුදු වණ්ණනාකොට නොනිමෙන අර්ථඇති පිටකත්‍රය පාලිදේශනාවකින් සියළු ලොකයාහටකරණලද ගාම්භීරාර්ථ අනුශාසනාඇති හෙයින්ද ඊබඳු කෘතාධිකාරවූ දක්ෂිණාශ්‍රවවූද මහස්ථවිර උතුමන් විසින් වර්ණනාකොට අර්ථනොනිමෙනහෙයින්ද දක්වාළු අර්ථමාර්ගීවල බලයෙන්ම මහාක්ෂිණාශ්‍රවයන් නැතිකලද පෘථග්ජන භික්ෂූන් වහන්සෙලා විසිනුදු වර්ණනාකොට ලොකයාහට අනුශාසනාකරණතරම් ප්‍රකාසව පෙනෙන නොයෙක් සද්ධර්මානුසාසනාවෙන් බබලන පාලිදෙසනාවිලාසයක්ඇතිහෙයින අනන්‍යවූද දෙසනාවිලාස ඇති ඒ මාගේ බුදුරජානන්වහන්සේ ශාස්තෘනම් වනසේක.

එසෙහෙයින් කියනලදි:—

දෙවයක්ඛ මනුස්සානං ලොකෙ අග්ගඵලං දදං,
දදන්තං දම්යන්තානං පුරිසාජඤ්ඤ තෙ නමො.යි—

මෙ ශ්‍රීසද්ධර්මාවාද සංග්‍රහයෙහිවූ පිටකත්‍රඅට්ඨකථාවලට ලීනාර්ථ
ලියාළු ප්‍රවෘත්තිකථාව නිමි.

---

තවද මෙ ත්‍රිපිටකත්‍රය පාලිධර්ම්ය අර්ථකථාසහිතව පතනිකොට සදම්න් දඹදිව පැවති ත්‍රිවිධ සංගායනාවටද මේ ලඞ්කාද්වීපයෙහි අනුරාධපුරනුවර ථූපාරාමයෙහි පැවති ධර්මසංගායනාව හා සෙසුත් නානාස්ථානවල පැවති අර්ථකථා පුස්තක සංගායනාවලටද ආරූඪවූ මෙම සද්ධර්මගුණවර්ණනා පරිච්ඡෙදයෙහි ප්‍රකාශවූ ක්‍රමයෙන්ම පිටකත්‍රයට දෙසනාපාලියට අර්ථකථාවෙනුය ටීකාසංඛ්‍යාත ලීනාර්ථකථාවෝය යනතුන්ප්‍රකාරවූ නොයෙක් නම්ඇති ධර්මප්‍රකරණයන්ගේ ඒ නාමයන් හැර අන්‍යවූද අනෙකප්‍රකාර නාමයෙන් ප්‍රසිද්ධවූ එම පිටකත්‍රය පාලිඅර්ථකථාආදීන්ගේම සංග්‍රහයවූ යශොධරා විසුද්ධිමාර්ගාදි අනෙකප්‍රකාර ධර්මප්‍රකරණයන් දැන් මෙකල්දක්වා නමිනමින්ගේ

භුවනපමනින් එසේ පදලීමෙන් අප බුදුරජානන්වහන්සේගේ ධර්ම
කායසම්පත්තිසම නොයෙක් ලෙසින් වර්ණනාකොට පැවැත්වූවා
හුය—ඒ කෙසේදයත්?—බුද්ධඝොෂසාමීන් විසින් කරණලද විසුද්ධි
මාර්ග අටුවාකථාවෙහි ලීනාර්ථයන් ප්‍රකාශකොට ධර්මපාලතෙරුන්
විසින් කරණලද සාරාර්ථමංජුසානම්වූ විසුද්ධිමාර්ගටීකාවය අනුරුද්ධ
නම් තෙරුන් විසින් පරමාර්ථය ප්‍රකාශකොට කරණලද අභිධර්මාර්ථ
සංග්‍රහය ඒ ලීනාර්ථප්‍රකාසකොට සාරිපුත්‍රස්ථවිරයන්වහන්සෙගෙ
සිස්‍ය සවාමින්විසින් කරණලද අභිධර්මාර්ථ විභාවිනීනම් ටීකාවය
ආනන්දතෙරුන්විසින් කරණලද සූක්ෂමාර්ථවිනිශ්චයවූ සච්චසංක්ෂෙ
පය ධෙමනම්තෙරුන්වහන්සේවිසින් කරණලද පරමාර්ථප්‍රකාසවූ
ධෙමනම් ප්‍රකරණය කාත්‍යායනතෙරුන්වහන්සේ විසින් කරණ
ලද සංඝනම් දීපවුත්තිකානම් ටීකාවය එසේම විමලබුද්ධිනම් ටීකා
වය බුද්ධරක්ෂිතතෙරුන් විසින් කරණලද ජිනාලංකාරය, මෙධඞ්කර
තෙරුන් විසින් කරණලද ජිනචරිතය, මහාබොධිතෙරුන් විසින්
කරණලද නිස්සයාර්ථකථානාම් සච්චසංක්ෂෙපවර්ණනාවය එසේම
පරමාර්ථවිනිශ්චයවර්ණනාවය, සාරිපුත්‍රස්ථවිරයන්ගේ සිස්‍ය සාමීන්
විසින් කරණලද සාරාර්ථසාලිණී නම් සච්චසංක්ෂෙපවර්ණනාවය හා
නොයෙක් ක්ෂුද්‍රප්‍රකරණයෝය, කාත්‍යායන තෙරුන් විසින් කරණ
ලද නෙත්තිප්‍රකරණය, ධම්මපාලතෙරුන් විසින් කරණලද ථෙර
ථෙරිගාථා අර්ථකථාවූ පරමාර්ථටීකාවය, එසේම පරමාර්ථදීපනී නම්
විමානප්‍රේතවස්තුන්ගේ වර්ණනාවය, ධම්මසිරිනම් තෙරුන්විසින්
කරණලද ඛුද්දසික්ඛය, සංඝරක්ෂිත තෙරුන් විසින් කරණලද සුබො
ධාලංකාරවර්ණොදය හා ඛුද්දසික්ඛටීකාවය, සම්බුද්ධවර්ණනාවය
බුද්ධසීහනම් තෙරුන් විසින් කරණලද විනය විනිශ්චයය, බුද්ධනාග
නම් තෙරුන් විසින් කරණලද කංඛාවිතරණීටීකාවය, සාගරමතී
නම් තෙරුන් විසින් කරණලද විනයසංග්‍රහවය, බුද්ධපිය තෙරුන්
විසින් කරණලද රූපසිද්ධිප්‍රකරණය, ශාක්‍යකුලතිලකවූ ගෞතම
ගොත්‍රඇති අප බුදුරජානන්වහන්සේ ජීවමානකාලයෙහි කොසල
බිම්බිසාර අජාතසත්‍රුආදිවූ රජදරුවො ජීවමාන බුදුන් කරා පැමිණ
බනඇසීමෙන් ලබනලද ධර්මකායසම්පත්තිඇතිව නොයෙක්ලෙසින්
ධර්මයපිදීමෙන් ආත්මාර්ථපරාර්ථසංසිද්ධිය කලාහුය. භාග්‍යවතුන්වහ
න්සේ පිරිනිවි පසු ජම්බුද්වීපාධිපති කාලාශොක ධර්මාශොකාදි නරෙ
න්ද්‍රයොත් සද්ධර්මකායසම්පත්තිප්‍රතිලාභයට පැමිනීමෙන් කතිවාය අක
ත්‍රිවාය මේමේයයි දැනඇදින අප්‍රමාණ කුසලරාසි වර්ධනයකලාහුය—
එසේම මෙම ශ්‍රීලඞ්කාධිපති දෙවෙනිපෑතිස්ස දුටුගැමුනු ශ්‍රද්ධාතිස්ස
මහාසෙන වලගම්බාහු කීර්තිනිස්සංක වීරබාහු වික්‍රමබාහුපරාක්‍ර
මබාහු ආදිවූ නොයෙක් පූර්වනරවීරවරයොද අනුරාධපුර පොලොන්

නරු පුරආදීයෙහි රජපැමිණ තමතමන් රජකරණකල මහවිහාරය
මිහින්තලා විහාරය අභයගිරි විහාරය ජේතවනය වේළුවනය ආදි
නොයෙක් සියදහස්ගනන් මහාවිහාරකරවාදී ඒ ඒ විහාරවල වසන
නොයෙක් දහස් ලක්ෂගනන් භික්ෂුසංඝයාවහන්සේට චීවරාදි සිව්පස
දානයෙන් උපස්ථානකරමින් සිංහතෙල් රත්නසුවර්ණභාජනවැනිවූ
බුද්ධපුත්‍රයන්වහන්සේලා ලවා අපබුදුරජානන්වහන්සේගේ ධර්මකාය
සම්පත්තිසංඛ්‍යාත සියළුම පිටකත්‍රය ධර්මයට පාලි අර්ථකථාදිය සහිතව
යථොක්ත ක්‍රමයෙන් පොත්වල ලියවා පවත්වා නොයෙක් ලෙසින්
වෛතුල්‍යවාදාදි අනෙකප්‍රකාර අධර්මාර්බුදඋපද්‍රවදුරුකොට නිර්මලව
චතුර්විධ සංගායනාරුල්‍යක්‍රමයෙන්ම අන්‍යූනව අනධිකව ධර්මකාය
සම්පත් දීප්තිමත්කොට බබුළුවා මහාවංසාදියෙහි ප්‍රකාශක්‍රමයෙන්
අප්‍රමාන කුසලරාසිවර්ධනයකිරීමෙන් උභයලොකාර්ථය හා ආත්මාර්ථ
පරාර්ථ සෑදීමෙන් රාජ්‍යසම්පත් අනුභවකලාහුය-එසින් මෑතභාග
යෙහිදු බෙලිගල්පුර දඹදෙනිපුර යාපව්පුර කුරුණෑගල්පුර ගඟාශ්‍රී
පුර ජයවර්ධනකොට්ටය හා මෙකලට පවත්නා සෙංඛණ්ඩශෛලාභි
ධාන ශ්‍රීවර්ධනපුරාදි තත්තත් නගරාධිවාසිවූ ආඥාතෙජොබලපරා
ක්‍රම ශ්‍රද්ධාප්‍රඥාදියගුණසම්පන්න කාලිංග විජයබාහු පණ්ඩිතපරාක්‍රම
බාහු බෝසත් විජයබාහු භුවනෙකබාහු පරාක්‍රමබාහු ද්විතීය තෘතීය
චතුර්ථ භුවනෙකබාහු ශ්‍රීපරාක්‍රමබාහු ප්‍රථම විමලධර්ම රාජසිංහ ද්විතීය
විමලධර්ම වීරපරාක්‍රම නරේන්ද්‍රසිංහ විජය රාජසිංහ මෙකල සියළු
සාසනොපකාරයට මුල්වසිටි අපගෙ කීර්තිශ්‍රීරාජසිංහ මහරජතුමා
නන් දක්වාම ඒ ඒ කලට රජපැමිනි නරොත්තමයන්' විසිනුදු
තමතමන් රජකරණකලැ නොයෙක් ලෙසින් පැමිණි සද්ධර්මවිනාස
කරණ නපුරු මිථ්‍යාදෘෂ්ටිකාදිවූ අනෙකප්‍රකාර ශාසනොපද්‍රව දුරු
කොට පාපයෙහි භයලජ්ජානැති අලජ්ජීන්ට නොයෙක් ලෙසින්
නිග්‍රහකොට භයදි ලජ්ජීසුපෙසල සික්ෂාකාමි සද්ධර්මානුපාලිත බුද්ධපුත්‍ර
යන්වහන්සේම තෝරාගෙණ බුදුරජානන්වහන්සේගේ ධර්මකාය
සම්පත් පැවැත්තීමෙහි නියුක්තවසිටි ඒ මහසංඝයාවහන්සෙ උදෙ
සා ඒ ඒ නුවරවල ග්‍රාමාරණ්‍යවිහාරකරවා පිලිගැන්වීමෙන් මහො
ඝසෙ පවත්වනා චතුර්විධ ප්‍රත්‍යය ප්‍රතිලාභයෙන් යෙදිවසන නො
යෙක් දහස්ගනන් බුද්ධපුත්‍රයන්වහන්සේ ලවා සර්වසත්වොපකාරවූ
ධර්මකාය සම්පත්තියම නෙර්මලව මනාකොට පැවැත්වීමෙන් සද්ධර්
යම ප්‍රද ධර්මාදයෙන් සුපරිසුද්ධ ආත්මභාවයෙන් යෙදීවසනුකැමති
ඒ ඒ රාජන්‍යජනයො තත්තත්කාල සමුපගත ධර්මවිනයධර මහසථ
විරයන්වහන්සේලා කෙරෙන් අනෙකප්‍රකාර සද්ධර්මානුශාසනා
රාජොවාද විසිතුරු නයින් බබලන ධර්මකථාඇසීමෙන් කර්ණාලං
කාරකොට සවකීය ආත්මලාභයාගෙ සඵලත්වයෙන් සන්තුෂ්ටව ඒ-

ඒ බුද්ධපුත්‍රයන්වහන්සේලා විසින්ම අමුතු හෙළබසින් රචනාකොට ඇස්වූ පූජාවලි සද්ධර්මාලංකාර හෙළ බොධිවංස ශාසනාවතාර සද්ධර්මරත්නාකර රාජරත්නාකර සාරාර්ථසංග්‍රහ ආදිවූ ඒ ඒ ධර්මප්‍රකරණ වඩ වඩා සතුටුව ඇසීමෙනුදු සවකීය සවකීය කර්ණාලංකාරකරමින් ඒඒ යතිතුමන් කෙරෙහිදු මහත්බැතිපෙම්වඩාගෙන නොයෙක් ලෙසින් ප්‍රසන්නාකාරදක්වා ධර්මයමපුද අප්‍රමානවූ කුසලරාසිවර්ධනය කිරීමෙන් දැන් මෙකල් දක්වා සපයර්ථාප්තිධර්මසංඛ්‍යාතවූ නොයෙක් ප්‍රභෙදඇති අප බුදුරජානන්වහන්සේගේ මේ උතුම් ධර්මකායසම්පත්තියම තමතමන් ලත් ජීවිතයේ සාරවත්කරවනලදි-තවද එසේම පවත්නා ආ සද්ධර්මගංගා ප්‍රවාහවූ බුදුරජානන්වහන්සේ ධරමානකාලයෙහිම "ධම්මදායාද භික්ඛවෙ භවථ මා ආමිසදායාද" යනාදී ධර්මදායාද සූත්‍රයෙහි භික්ෂුසංඝයාවහන්සේට ආමන්ත්‍රනයකොට මහණෙනි මා විසින් දෙසූ ධර්මයම තෙපි දායාදව ගිම්ව වාසයකරව් ආමිසසංඛ්‍යාත ලාභප්‍රත්‍යයට ගිම්නොවව් යනාදීන් ඒ වදාළ බුද්ධානුශාසනාව පිළිගත්බවට සුදුසු හෙයිනැ යලිදු බුද්ධගුණවර්ණනාපරිච්ඡෙදයෙහි දක්වනලද ක්‍රමයෙන්ම බුදුව සියළු බුද්ධකෘත්‍යයන් නිමවා කුසිනාරා නුවර සාලවනොද්‍යානයෙහිවූ ශ්‍රීයහන්ති වැදහෙව අප බුදුරජානන් වහන්සේ පිරිනිවන්පානාදිනයෙහි මහාපරිනිර්වාණ සූත්‍රාන්තකථායෙහි ආ ක්‍රමයෙන් සංඛ්‍යා පථාක්‍රාන්තව කුසිනාරානුවර රැස්වූ මහාභික්ෂුසංඝයාවහන්සේ අතුරෙන් අනුඨාණ සිංහසෙය්‍යාවෙන් සැතපුනු බුදුරජානන්වහන්සේට නුදුරු නොලංව තිරය ඇතුලත අනදසාමින් පශ්චිමකාව රැස්ව වැඩහුන් පන්සියයක් පමණ භික්ෂු සංඝයාවහන්සේට අඩගා වදාරා මහාපරිනිර්වාණසූත්‍රයෙහි ප්‍රකාශ ක්‍රමයෙන් මෙසේ වදාළසේක—හේකෙසේදයත්?—මහණෙනි මේ සියලු භික්ෂූන්අතුරෙන් එක් භික්ෂුවකටවත් බුද්ධරත්නයෙහි හෝ ධර්මරත්නයෙහි හෝ සංඝරත්නයෙහි හෝ මාර්ගයෙහි හෝ ප්‍රතිපදාවෙහි හෝ බුදුරජ සියල්ලදත්සේක්දෝහෝ නොවේදෝහෝයි යනාදිවශයෙන්ද මාදෙසූ සියලු ධර්මකායසම්පත්තියෙහි කිසියම්සැකයක් විමතියක් තොපට ඇත්තේවීනම් ඒහැම විචාරව් එසේ නොව මහණෙනි පසුව විපිළිසරනොවිඋම්නව් සාස්තෘන්වහන්සේ අපට සම්මුඛීභූතව වැඩවුන්කළ ඒ භාග්‍යවතුන්වහන්සේ සම්මුඛයෙන් මේ මේ කාන්සාවිමති කාරණා විචාරාදැනගන්ට අපි නොහැකිවූම් හයි යන පශ්චාත්තාපයට නොපැමිනෙවු යන මේවචනය විචාරා වදාළකල්හී ඒඇසූ සියළු භික්ෂුසංඝයාවහන්සේම බුද්ධභාෂිතයවූ බුද්ධධර්මයෙහි කිසිශාංකාවිමතියක් නැතිසෙයින් තුෂ්නීම්භූතව වැඩහුන්සේක, එකල්හි දෙවන තුන්වන වගටද භික්ෂුසංඝයාවහන්සේට අඩගාවදාරා එසේම විචාරා වදාලකල්හි මුවෙන් නොබැක

තුෂ්ණීම්භූතව කිසිවක් නොවිචාර වැඩහුන්සේක්ලාය. එකල්හි භාග්‍යවතුන්වහන්සේ නැවතත් භික්ෂුසංඝයාවහන්සේට අඬගා වදාරා මහණෙනි තෙපි බුදුන් සමීපයෙහි අපි පැවිදිවූමහ, අපි පරිභොගකරණ සිව්පසයෝ ශාස්තෘන්වහන්සේ සන්තකවන්නාහුමය එසේවූ අපි මෙතෙක්කල් ධර්මයෙහි උපන් කුකුස්විචාරා දුරුකොට ගතනොහීසිම අද මේ පශ්චිමකාළයෙහි පරිනිර්වාණමඤ්චකයෙහි සැතපී පිරිනිවන්පෑමට ඉතාආසන්නවූ බුදුරජානන්වහන්සේගෙන් විචාරීම නුසුදුසුයයි සිතා ඉදින් බුද්ධගෞරවයෙන් නොවිචාරා තුෂ්ණීම්භූතවූවාහුවිනම් මහණෙනි සබ්‍රහ්මචාරී සහායවිස්වාස සහිත භික්ෂූනමකට ධර්මයෙහි ඇති යම් සැකයක් විමතියක් දන්වා හෙවත් මාදෙසූ සියලු ධර්මයෙහි සාංකාවිමතිවූ කිසියම් දෙයක් ඇත්නම් සභාගික භික්ෂූහු ඔවුනොවුන්හා කරණ කථාවක්මෙන් නොබා විචාරණුවා එකල්හි මම එක භික්ෂුනමකට ඒ කාරණය ප්‍රකාශකොට කියම් ඒ භික්ෂූන්ගේ කථාව අසා සියල්ලොම ධර්මයෙහි සාංකාවිමති දුරුකරව් යන මේ බුද්ධවචනය අසාත් පන්සාලිස් අවුරුද්දක් මුළුල්ලෙහි දෙශනාකරවදාළ සියළුම ධර්මකායසම්පත්තියෙහි කිසිම සාංකාවිමතියෙක් එකම භික්ෂූනමකටවත් නැතිහෙයින් සියළු භික්ෂුසංඝයාවහන්සේම තුෂ්ණීම්භූතව වැඩහුන් කල්හි ආයුෂ්මත් ආනන්දස්ථවිරයන්වහන්සේ භාග්‍යවතුන්වහන්සේට දන්වනසේක් මාගේ ස්වාමිවූ බුදුරජානන්වහන්ස භික්ෂුසංඝයාවහන්සේ කෙරෙන් එකම භික්ෂුවකටවත් ස්වාමිවූ බුදුරජානන්වහන්සේගේ ධර්මයෙහි කිසියම් සාංකාවිමතියක් නැත්තේය එහෙයින් ස්වාමීන්වහන්ෂ මේ කාරණය ඇසුරුසන්ව පැවැත්විමට සුදුසු මහත් ආශ්චර්ය්‍යයක ස්වාමීන්වහන්ෂ මෙබඳු කාරණයක් පෙරනොඇසූ විරූහෙයින් අද්භූතය එසේහෙයින් මටම පිහිටවූ බුදුරජානන්වහන්ෂ මේ භික්ෂුසංඝයාකෙරෙහි මම ඉතා ප්‍රසන්නවූයෙමියි කියා අනද ස්වාමීන්විසින් බුදුන් සම්මුඛයෙහිම පහළකළ ප්‍රශංසාවට අනුරූපපරිද්දෙන්ද බුදුව පළමුවෙන්ම බ්‍රහ්මාරාධනාවෙන් ඉසිපතනෙට වැඩ වෙ මෙ භික්ඛවෙ යනාදීන් භික්ෂූන්ටම ආමන්ත්‍රනයකොට දෙශනාවට පටන්ගෙණ පන්සාලිස් අවුරුද්දක් ජීවත්ව වැඩහිඳ භික්ෂුසංඝයාවහන්සේ කෙරෙහිම සියළු ධර්මකායසම්පත් පිහිටුවා පිරිනිවන්පානාදිනයෙහි විචාරා වදාළ තැන තුෂ්ණීම්භූතවෙමින් ඒ දෙශනාකර වදාළ සියළු ධර්මකාය සම්පත්තියෙහි සාංකාවිමති නැතිබව ප්‍රකාශකොට ජීවමාන බුදුන් කෙරෙහිම තැබූ කායප්‍රතිඥවට සුදුසු හෙයින්ද ආදහන භූමියට රැස්වූ සත්ලක්ෂයක් පමණ ගණනායක මහාස්ථවිරප්‍රමුඛ සංඛ්‍යාපථාතික්‍රාන්ත මහාභික්ෂුසංඝයාවහන්සේ අතුරෙන් එකලට සංඝස්ථවිරවූ තෙරෂ ධූතගුණාදී අපරිමිත ගුණරත්න නිධිනිකෙතවූ ආයුෂ්මත් මහාකාශ්‍යපස්ථවිරප්‍රධාන සිවුපිළිසිඹියාපත් මහත් ගුණානුභා

සම්පන්නාවූ පන්සියයක් පමණ භික්ෂුසංඝයාවහන්සේ අජාසත් මහ රජහු සභායෙන් සංගීතිකථායෙහි දක්වනලද ක්‍රමයෙන්ම ප්‍රථම සංගායනාකිරීමෙන් සියළුම ධර්මය ප්‍රකාශිකොට ඒ භික්ෂුසංඝයාවහන්සේ විසින්ම ඔවුනොවුන්වහන්සේලාම නිර්මලව පවත්වනලෙස සියළු ධර්මය භාරවූ පසු එපරිද්දෙන්ම උන්වහන්සේලා පවත්වාගණ ආසේක. නැවත උපන් ධර්මවියවුල් නිසා පැවති දෙවෙනි ධර්මසංගායනා කාලයෙහිදු විශාලාමහනුවර රැස්වූ දොළොස්ලක්ෂයක් පමණ රහතන්වහන්සේ අතුරෙන් සබ්බකාමී ස්ථවිරයන්වහන්සේ හා යසනම් මහතෙරුන් ඇතුළුවූ සත්සියයක් රහතුන්වහන්සේලා කාලාශෝක මහරජ සභායෙන්ම නුවර වාළුකාරාමයෙහි රැස්ව වැඩහිඳ අටමසක් මුළුල්ලෙහි ධර්මසංගායනා කිරීමෙන් අප බුදුරජාණන්වහන්සේගේ ධර්මකාය සම්පත්තිය නිර්මලව පැවැත්තූසේක.

එයින් පසු තුන්වෙනි ධර්මසංගායනා කාලයෙහිදු පැලලුප් නුවර රැස්වූ සැටලක්ෂයක් පමණ භික්ෂුසංඝයාවහන්සේ අතුරෙන් මොග්ගලිපුත්තතිස්ස මහාස්ථවිරයන්වහන්සේ ප්‍රධානකොට ඇති දහසක් පමණ රහතුන්වහන්සේලා ධර්මාශෝකමහරජහු සභායෙන් එම නුවර අශෝකාරාමයෙහි රැස්ව වැඩහිඳ නවමසක්මුළුල්ලෙහි ධර්මසංගායනාකිරීමෙන් අප බුදුන්ගේ ධර්මකායසම්පත්තිය නිර්මලව පැවැත්තූසේක. එකළට සංඝස්ථවිරවූ මොග්ගලිපුත්තතිස්ස මහාස්ථවිරයන්වහන්සේගේ ප්‍රධාන ශිෂ්‍යවූ සර්වධර්මවිෂයප්‍රගුණාකරවීමෙන් දහසක් භික්ෂුසංඝයාවහන්සේට ජ්‍යේෂ්ඨවූ උපසම්පදාවූ තුන්අවුරුද්දක් ඇතුලතම පළමුසංගායනා දෙකට නැගූ අර්ථකථා සහිත ස්ථවිරවාද සියල්ලම උපාධ්‍යායන්වහන්සේගෙන්ම ඉගෙණ තමන්වහන්සේත් එක්ව තුන්වෙනි සංගායනාව පැවැත්තූ පසු ඒ සියලුම ධර්මකායසම්පත්තිය තමන්වහන්සේගේ සිත්හිම ධරාගෙණ මෙම ලංකාවට පැමිණි මිහිඳුමාහිමියානන්වහන්සේද ලංකාද්වීපයට බුදුකෙනෙකුන්සේ ප්‍රසිද්ධවූ අනෙකප්‍රකාර ඉර්ධිප්‍රාතිහාර්‍ය ධර්මදෙශනාදියෙන් ප්‍රසන්න රාජකුලාදියෙන් පැවිදිලැබ සැටදහසක් පමණ ලක්දිව භික්ෂුන්වහන්සේලා ඇතිවූකල්හි ඒමහාභික්ෂු සංඝයා අතුරෙන් අටසැටනමක් පමණ මහරහතුන්වහන්සේ හා දහසක් භික්ෂුන්වහන්සේද දෙවනිපෑතිස්ස මහරජානන්ගේ සභායෙන් ථූපාරාමවිහාරයෙහි රැස්ව වැඩහිඳ දශදිව පැවති ත්‍රිවිධසංගායනාක්‍රමයෙන්ම සියලු ධර්මයම සඞ්ගායනාකිරීමෙන් අප බුදුන්ගේ සියලු ධර්මකායසම්පත්තිය අපගේ මේ ලංකාද්වීපයෙහිදු පිහිටුවා නිර්මලව පැවත්තූසේක එයින් පසු එම මහාස්ථවිරපරම්පරාවෙන්ම ශ්‍රවණධාරණාදික්‍රමයෙන් සියලු ධර්මය නොහැර අඩුනොව අනධිකව කිසියම් මිථ්‍යාලබ්ධියකට මිශ්‍රනොකොට පවත්වා අවුත්

වලගම්අබාමහරජු දවස පන්සියයක් පමණ රහතන්වහන්සේලා රැස්ව වැඩහිඳ චතුර්විධ සංගායනාකළපරිද්දෙන්ම පොත්වල ලියා සියලු ධර්මයම පාළිය පාළියලෙසින් හා අට්ඨකථා සිංහලභාෂාවෙන්ම ලියා මතුකොට රක්ෂාකළසේක.

එතැන් පටන් එසේ ධර්මප්‍රකරණ පොත්වශයෙන් පැවති පිටකත්‍රධර්මය ලේඛනෝද්දෙසාදීවශයෙන් පවත්වා අවුත් මහානාම රජදවස මහවංශාදියෙහි ප්‍රකාශක්‍රමයෙන් බුද්ධඝොෂසාමීන්විසින් සිංහලභාෂාවෙන් තුබූ පිටකත්‍ර අටුවාකථා පාළිභාෂාවට නගා අටුවාකිරීමෙන් බුද්ධභාෂිත ධර්මකායසම්පත්තියම වර්ණනාකොටපැවැත්තූසේක. එතැන්පටන් එසේම සියලු ධර්මය සද්ධර්මභාජනවසිටි මහසංඝයාවහන්සේම පවත්වා අවුත් පොළොන්නරුපුර පරාක්‍රමබාහුමහරජදවස එම්මහරජසභායෙන් එහිරැස්වූ නොයෙක්සියදහස් ගනන් භික්ෂුසංඝයාවහන්සේට සංඝස්ථවිරවූ ආයුෂ්මත් අරණ්‍යක කාශ්‍යපස්ථවිරයන්වහන්සේ ප්‍රධානවූ දහසක් පමණ භික්ෂුසංඝයාවහන්සේ ඒ ජේතවනනාමගවිහාරයෙහි රැස්ව වැඩහිඳ පිටකත්‍ර අටුවාකථාවල අප්‍රකාශ ගාම්භීරාර්ථ සියල්ල වර්ණනාකොට සිංහලභාෂාවෙන් ලියාතුබූ ටීකාර්ථකථාපොත්ගෙණ පාළිභාෂාවට නගා දෙවනුවත් ටීකාර්ථකථාලියාත් අප බුදුරජානන්වහන්සේගේ ධර්මකාය සම්පත්තිය වර්ණනාකොට පැවැත්තූසේක. එසින්මැතභාගයෙහි ජයවර්ධනකෝට්ටෙහි ශ්‍රී පරාක්‍රමබාහු මහරජදවස සද්ධර්මරත්නාකරය කරණ කල්දක්වාම සියලු ධර්මය ලේඛනධාරණ පරිපුච්ඡා උද්දෙශවශයෙන් ඒ ඒ කළ පැවති ධර්මවිනයධර ව්‍යාකතබහුශ්‍රැත ශබ්දශාස්ත්‍රඥ ලෞකික ගුණරත්නාලඞ්කෘත සුමඞ්ගල වාගීශ්වර ධර්මකීර්ති ආදී භික්ෂුසංඝයාවහන්සේම ප්‍රශස්තරාජධර්මගුණකීර්ති පරිපාළිත ශාසනපක්ෂපාත නරේන්ද්‍රබලලදින් අන්‍යවූ නිකායන්තරයන් හා මිශ්‍රනොකොට සද්ධර්මය නොමිලව පවත්වාගත එනසේක, අනාගතයෙහි මෙසේ අපවැනි අල්ප ශ්‍රැත මන්ද බුද්ධිවත්වූවා සියළුම ත්‍රිපිටක පාළිඅට්ඨකථාවල බැස එහි ධර්මාර්ථවිදගන්නා තරම් දක්වා පිටකත්‍රධර්මයාගේම සංග්‍රහ ප්‍රභේද අනේකප්‍රකාර ධර්මප්‍රකරණයා නොයෙක් සන්නසහ ගැටපදද එසේම පිටකත්‍රධර්මයෙහි වැද හැසිරීමට විසිතුරු මාර්ගවූ නොයෙක් ප්‍රභේදව්‍යාකරණ ඡන්දස් නිඝණ්ඩු ඇතුලුවූ සද්ධර්මොපකරණයන් සහිතව රචනාකිරීමෙන් ධර්මකාය සම්පත්තිය ජොතිමත්කොට පැවැත්තූසේක.

එතැන්පටන් මෙතැන් දක්වාම ඒ ඒ කළට පැමිණි ධර්මවිනයධර මහාස්ථවිරාදී මෙකල ශාසනාභිවෘද්ධිය පිණිස සියම්දෙශයෙන් පැමිණි අපගේ උපාධ්‍යායවූ ශ්‍රී උපාලි ස්ථවිරයන්වහන්සේහා සාමි

චාය්‍ය්‍යවූ සරණඞ්කරාභිධාන පූර්වනාමෝපලක්‍ෂිත අපාචාය්‍ය්‍යන්වහන්සේද පය්‍ය්‍යාවදාතවූ බුද්ධපුත්‍ර භික්‍ෂුසංඝයාවහන්සේ විසිනුදු නෛය්‍ය්‍යාණික ශාසනයෙහි ධර්මගුණමහත්තාවය විශෙෂයෙන් දැනගැනීන ඒ ඒ කලට පැමිණි ශාස්ත්‍රධර්මාභිලාෂීවූ ශිෂ්‍යගණයාටද රජ යුවරජ ඇමති ආදීවූ ලෝවැසියන්ට·සඞ්ගීතාන්විත කථාගුණ විසේස පහළ කොට දීමෙන් හා විචිත්‍රනයින් බබලන තත්තත්කාලානුරූප ශ්‍රවනීයවූ සද්ධර්මානුශාසනාකිරීමෙන් තමතමන්ටද ලෝවැසියන්ටද අප්‍රමාණ කුසලරාසි වර්ධනයකොට විසීමෙන් අභිනව ධර්මප්‍රකරණව්‍යාඛ්‍යාණ නොයෙක් ගද්‍යපද්‍ය රචනාකිරීමෙනුදු අප බුදුරජාණන්වහන්සේගේ ධර්මකායසම්පත්තියම වර්ණනාකොටකාලානුරූපවසයෙන් දැන් මෙකල් දක්වාම ශ්‍රවනොත්ග්‍රහනාධාරණ ලේඛනාදිවසයෙන් පැවැත්වූසේක.

එසින්මත්තෙහිදු ලොව පහලවන බුද්ධපුත්‍රයන්වහන්සේ හා රාජරාජ මහ මාත්‍යාදීන් විසින් හිතකාමීවූ කුශලාර්ථීය විසින්ද මේ සියළු ධර්මය මෙතෙක්කල් පවත්වා පූර්වනරවරාදීන්විසින් ප්‍රමාණාතික්‍රාන්තවූ වීය්‍ය්‍යකිරීමෙන් හා ධනපරිත්‍යාගාදියෙන් මෙසේ පවත්වා ආ උතුම් ධර්මකාය සම්පත්තියකැයි දැන භක්තිප්‍රේමම උපදවා මෙහි දක්වූ පාළිපොත් අටුවාපොත් ආදි පිටකත්‍රයෙහි ඇතුලත්වූ මෙහි ප්‍රකාශ සියළු ධර්මප්‍රකරණයන්හා ශබ්දපාලි ධර්මෝපකාරීවූ නොයෙක් ශාස්ත්‍රපොත් විභාගවසයෙන් විමසාගෙණ තමතමාගෙ ශක්තිපමණින් ලියවා පැවැත්වීමෙන් හා ශ්‍රවනෝද්ග්‍රහධාරනාදිවසයෙන් ධර්මකාය මනාකොට පැවැත්වීමෙන් ස්වර්ගාපවර්ගසම්පත්ති ප්‍රතිලාභයටම උත්සාහකටයුතු.

මෙසේ දෙව්මිනිසුන් සහිත සියළු ලෝකයාහට වැඩපිණිස පිටකත්‍රපාලියෙහි ප්‍රකාශ සියලු ධර්මානුශාසනා හා තදනුගත ධර්මාර්ථදේසනාඇති අර්ථකථාචාය්‍ය්‍ය ධර්මකථික මහාස්ථවිරාදීන්ගේද ප්‍රමාණාතික්‍රාන්තවූ සද්ධර්මානුසාසනා ඇතිහෙයින් මාගේ ධර්මස්වාමීවූ බුදුරජානන්වහන්සේ ශාස්තෲනම් වනසේක—එහෙයින් කියනලදී.

දෙව සඞ්ඝ මනුස්සානං ලොකෙ අග්ග ඵලං දදං,
දදතං දමයන්තානං පුරිසාජඤ්ඤ තෙ නමො.

ලෝවැඩපිණිස කරණලද මේ ශ්‍රී සද්ධර්මාවාද සංග්‍රහයෙහි
මෙතෙකින් තුන්වන සද්ධර්මගුණවර්ණනා පරිච්ඡේදය
කියා නිමවනලදී.

මේ ප්‍රතිපත්තිශාසනනාමවූ ත්‍රිපිටකධර්මය පිරිහෙනක්‍රමයකෙසේ දයත්?—මේ කලියුගකාලයෙහි සත්වයෝ යහපත් ධර්මමාර්ගයෙන් දුරුව අධර්මයෙන් පැවතීමෙන් කල්යවන්නේය, එකල ලෝකපාල දේවතාවන්ගේ සිත්හි පවත්නා අවකරුණාභාවයදවෙයි එයින්ම චන්ද්‍රසූර්‍ය්‍යරාසීන් සහ නක්ෂත්‍ර තාරකාදීහු විසමවපවතිති, එසේ ඇතිකල්හි කලින්කලට ලෝකානුශාසකවූ රජදරුවන්ගේ චිත්තය කැලඹී සත්වකරුණාවද රාජධර්මයද හරිති ඔවුන් එසේ රාජ ධර්මයෙහි නො ප ව ත් නා ක ල් හි රාජඅමාත්‍යයෝද අසිකතර ශාස්ත්‍රව්‍යවහාර ක්‍රමයෙහි නොපැවති අධාර්මිකවෙති එසේ ඔවුන් අධර්මිෂ්ඨවූ කල්හි ජනපදාධිපතිහු අධර්මිෂ්ඨවෙති ඔවුන්ගේ අධර්මිකතාවෙන් ජනපදවාසිහු අධාර්මිකවෙති. මේ හැමදෙනාගේ අධර්මතාවෙන් වස්සවලාහකාදි දේවතාවෝ ප්‍රමාදව කාලට වර්ෂා නොපවත්වන්නාහුය, එළෙසට නොවස්නාකල්හි සස්‍යරෝපනාදියට කල් වරදන්නේය, කල්වරදවා කලාවූ හැමසස්‍යයෝ කලට නොපැසෙති, එකල්හි රාජ්‍යය දුර්භික්ෂවන්නේය—ඒ දුර්භික්ෂය නිසා සත්වයෝ කලට වේලාවට ආහරපානාදිය නොලැබ ශරීරශෝෂ උත්සන්නාවීමෙන් කලාන්තවන්නාහුය. එකල්හි භික්ෂාචාරයෙහි යෙදි වසන ශ්‍රමනබ්‍රාහ්මණාදීන්ට සිව්පසයෙන් උපස්ථානකොට ගතනොහෙති, එසේ ප්‍රත්‍ය නොලැබීමෙන් වෙහෙසෙන භික්ෂූහු අන්තේවාසිකාදී පිරිස්රක්ෂාකිරීමෙහි නොහැකිවන්නාහුය—එසේ ගුරුවරයන් කෙරෙන් පිහිට නොලබන අන්තේවාසිකයෝ ප්‍රත්‍යසෙවීමෙන් ඒ ඒ තැන සවච්ඡන්දකව ඇවිදිනාහෙයින් ගුරුවරයෙකුගේ අවවාදයෙහි පිහිටුවා උගතමනා පර්‍ය්‍යාප්ති ධර්මය පුහුණුකොට ටීකාඅට්ඨ අට්ඨකථාසහිතව දැරීමට නොපිළිවන්වෙති, පාලිවසයෙන් දරා ටීකා අට්ඨකථා ව්‍යවහාරයෙහි සමර්ථ නොවෙති—ඉක්බිත්තෙන් කල්යත් යත් පාලියද සැමදරන්ට අසමර්ථව ගාම්භීරවූ අභිධර්මපිටකය පළමුවෙන්ම පිරිහෙනකල පට්ඨානප්‍රකරණය පටන් යමකය කථාවත්ථු යයි විජම් පිටකය මෙසේ ප්‍රතිලෝමයෙන් කෙළවරවූ ප්‍රකරණය පටන් මූලාවසානකොට ක්‍රමයෙන් පිරිහෙයි මෙසේ අභිධර්මපිටකය පිරිහීගියකල්හිදු සූත්‍රවිනයපිටකවය පවත්නාතෙක් පර්‍ය්‍යාප්ති ශාසනය නොපිරිහුනේ නම් වෙයි—ඉක්බිති එයින් සූත්‍රපිටකය පිරිහෙනකල කෙළවර ප්‍රකරණාග්‍රයෙහි පටන් පිරිහෙන්නේ පළමුවෙන් අඞ්ගුත්තරනිකායෙහි ඒකාදසයෙහි පටන් ඒකකනිපාතය දක්වා ප්‍රතිලෝමයෙන් පිරිහෙන්නේය—ඊට ඉක්බිතිව සංයුත්ත නිකායතෙම චක්‍රපෙය්‍යාලක්‍රමයෙන් අගපටන් මූල ඕඝතරණසූත්‍රය දක්වා ප්‍රතිලෝමක්‍රමයෙන් පිරිහෙන්නේය—ඊට ඉක්බිති මජ්ඣිම නිකායතෙම ඉන්ද්‍රියභාවනායෙහි පටන් මූලපරියාය සූත්‍රය දක්වා

ප්‍රතිලෝමක්‍රමයෙන්ම පිරිහෙන්නේය—එම ඉක්බිතිව දීඝනිකාය තෙම දසුත්තර සූත්‍රය පටන් බ්‍රහ්මජාලසූත්‍රය දක්වා එසේම පිරිහෙන්නේය—එසේ පිරිහීගියකල්හි සූත්‍රපිටකය හැම පිරිහුණේනම්වේ. එතකුදු ලැවිත් භික්ෂූහු විනයපිටකය හා ජාතකපමණක්ම දරති ඉක්බිති විනයපිටකය පරලෝකාපේක්ෂා ඇත්තාවූ ලජ්ජී භික්ෂූහු දරති—ලාභ ලබනු කැමති ලාමක භික්ෂූහු සිතන්නාහු ගැඹුරු බනකීමෙන් අපකෙරෙහි කව්රු පහදිද්ද? එසේ බණකීමෙන් ප්‍රයෝජන කිම්ද? ඔවුන් සිත්ගෙන ලාභගන්නාපිණිස බණකියමහයි සිතා බොහෝසේ ජාතකබණ පුහුණුකොට ලෝවැසියන් සිත්ගෙන බණකියති. එසේ කල්යාමෙන් ඒ ජාතක බණ නිපුනව දරාගතනොහී පළමුකොට වෙස්සන්තර ජාතකය පිරිහෙයි එතැන්පටන් දසජාතකාදිය පිරිහී මුල අපණ්ණක ජාතකය දක්වා සියළු ජාතක පිරිහෙයි-එසින් ඉක්බිතිව භික්ෂූ විනයපිටකය පමණක් දරති-එතෙක් කල් ප්‍රතිපත්තිසාසනය පිහිටියේනම්වෙයි-නැවත ඒ විනය පිටකයෙහුත් පරිවාර ප්‍රකරණය පටන් ප්‍රතිලෝමයෙන් පිරිහෙමින් ගොස් ඛන්ධකවිභංගය දක්වා පිරිහී කංඛාවිතරනී ප්‍රකරණය පමණක් දරති එතැන්දක්වා ප්‍රතිපත්තිසාසනය පිරිහුණේ නම් නොවෙයි—ඒ කංඛාවිතරනිප්‍රකරණද පිරිහී මනුෂ්‍යලෝකයෙහි සතරපදයෙන් යුක්තවූ ගාථාවකින් වීනමුත් බුදුගුණයෙක් පවතීනම් ඒතාක් ප්‍රතිපත්තිශාසනය පවත්නේ නම් වේ—සම්දවංසක ශ්‍රද්ධාවන්ත රජෙක් බුදුගුණ අසන්ට උවමැනවැයි සිතා ධර්මකථිකකෙනෙකුන් විමසානොලැබ දහසින් බැඳි පියල්ලක් ඇතුපිට තබා බුදුබනින් ගාථාවක් පමණ දත් කෙනෙක් මේ දහසින් බැඳි පියල්ලගෙන බනකියවයිකියා නුවර බෙරලවාත් ධර්මකථිකයන් නොලැබ එසේ තුන්විටෙක බෙරලැවූ කල ඒ දහසින් බැඳි පියල්ලගෙන බණකියන්නාක්හු නොලැබ ඒ දහසින් බැඳි පියල්ලගෙනවුත් රජගෙයි කෝෂ්ඨාගාරයෙහිම තබන ලෙස පාවාදෙද්ද මෙසේ නොයෙක් උත්සාහකිරීමෙන් බනදන්නා කෙනෙකුන් නොලැබ ගතනොහෙන කල්හි පිටකත්‍රධර්මයයි කියනලද මේ ප්‍රතිපත්තිශාසනය අන්තර්ධානවූයේ නම් වේ-මේ දක්වූයේ ප්‍රතිපත්තිශාසනාන්තර්ධානයෙහි විභාගය වේ.

මෙසේ දසබලධාරීන්වහන්සේගේ පරිනිර්වාණයෙහි පටන් පන්දහසක්හවුරුදු මුළුල්ලෙහි ලෝවැඩ වඩා සියළු බුද්ධකෘත්‍යයන් සාදදීමෙන් බුද්ධාධිෂ්ඨානබලයෙන්ම පවතිනා මේ සියළු ධර්මකාය සම්පත්තියෙහි අපරිමිතවූ ගුණවිශේෂ මහිමදන්නා පින්වත් රජදරුවන් විසිනුදු එසේම සර්වඥපුත්‍රවූ භික්ෂුසංඝයාවහන්සේ විසිනුදු මහත් ආදර ගෞරව බහුමාන උපදවා මේ සියළු ධර්මය ලේඛණ

ශ්‍රවණෝද්ග්‍රහණධාරණාදිවසයෙන් පවත්වා රක්‍ෂාකොට ලොව්තුරා වූතුරා සම්පත් ලැබීමෙහි උත්සාහකටයුතුය.

මෙසේ තුන්වන පරිච්ඡෙදයෙන් ධර්මකාය සම්පත් වර්ණනා කිරීමෙන් ලෝවැඩ දක්වා ඊට අනතුරු එම සද්ධර්මභාජනවූ සංඝ ගුණ විශෙෂවිභාගද මදක් මෙහි දක්වනුලැබේ—මේදවනාහි සත් පුරුෂජනයන් විසින් සාවධානව ඇසියයුතු සද්ධර්මාධිරාජවූ භාග්‍යවත් බුද්ධරජානන්වහන්සේගේ ඖරස පුත්‍රබවට පැමිණි සංඝයාවහන්සේ සුප්‍රතිපන්නතාදි අපරිමිතවූ විශිෂ්ටවූ ගුණානුභාව ඇතිසේක—ඒ කෙසේදයත්?—

"සුපටිපන්නො භගවතො සාවකසඞ්ඝො උජුපටිපන්නො භගවතො සාවකසඞ්ඝො ඤායපටිපන්නො භගවතො සාවකසඞ්ඝො සාමීචිපටිපන්නො භගවතො සාවකසඞ්ඝො යදිදං චත්තාරි පුරිසයුගානි අට්ඨපුරිසපුග්ගලා එස භගවතො සාවකසඞ්ඝො ආහුනෙය්‍යො පාහුනෙය්‍යො දක්ඛිනෙය්‍යො අඤ්ජලිකරණීයො අනුත්තරං පුඤ්ඤක්ඛෙත්තං ලොකස්සාති".

—[ මෙහි අර්ථනම් ]—

භගවතො භාග්‍යවතුන්වහන්සේගේ සාවකසංඝො ශ්‍රාවකසංඝතෙම; සුපටිපන්නො, මනාපිළිවෙත්වූ උතුම් ශාසනපිළිවෙත් පිරීමෙන් පසු සසරදුකට නොපැමිණෙන හෙයින් නොනවත්නා පිළිවෙතැයි කියනලද අමෘතමහා නිර්වාණය අභිමුඛව සිටිබැවින් අනුලෝම්ප්‍රතිපත්තිවූ අපච්චනික පිළිවෙත නම්ලද තුසුදුසු පිළිවෙත් නොව සුදුසු පිළිවෙත්වූ බැවින් නෛර්වානයට අනුලෝමවසිටි උතුම් ධර්මානුධර්ම ප්‍රතිපත්තියට මනාකොට පැමිණියාවූ භාග්‍යවතුන්වහන්සේගේ අවවාදානුශාසනාවන් සකස්කොට අසන්නානු ශ්‍රාවකනාම් වනසේක—ඒ අනුශාසනාවූ පරිදෙදන් පිළිපැදීමෙන් ආර්‍ය්‍යභාවය සිද්ධකරදෙන හෙයින් ඒ ශ්‍රවනයද සක්කච්චශ්‍රවන නම්විය සකස්කොට බණඅසන ඒ බුද්ධශ්‍රාවකයන්වහන්සේලාගේ සමූහය ශ්‍රාවක සංඝ නම් වනසේක-නොහොත් ශීලදෘෂ්ටි ශ්‍රමණගුණසමූහයන්ගේ සමානභාවයෙන් සංඝ නම්විය, ආර්‍ය්‍ය ශීලදෘෂ්ටි ශ්‍රමණගුණයන්ගේ එක්වීමෙන්ම ශ්‍රාවකසංඝනම්වූසේක—අපිච—මෙහි නිස්පරියායෙන් ආර්‍ය්‍ය ශීලාදිය මහත්බැවින් ලෞකික ශීලාදිය කෙසේ ගැනේදයත්—හේ මෙසේ දතයුතු—"ස්වාක්ඛාතො ධම්මවිනයො යථානුසිට්ඨං පටිපන්නකාපි අපන්නක පටිපදං පටිපන්නකාපි සුපටිපන්නොතපි මජ්ඣිමාය පටිපදාය අන්තවයං අනුපගම්ම පටිපන්නකාය" යනාදීන් මනාකොට බුදුන් විසින් දෙසනලද ධර්මවිනය

දෙක්හී අනුශාසනාවන්වූ පරිද්දෙන් පිළිපන් බැවිනුදු අපණ්ණක නාමිලද නොවිරුද්ධ පිළිවෙත් පුරණ බැවිනුදු සුප්‍රතිපන්න සංඝනමැයි කියාද, කාමසැපය ආත්මකිලමථානුයෝගය යන අන්තවයට නොපැමිණ එයින් දුරුව මධ්‍යමප්‍රතිපදා නම්වූ සම්‍යක්දෘෂ්ටි ආදි ආර්‍ය්‍ය අෂ්ටාංගික මාර්ගයෙන් පිළිපැදීමෙන් කායවාක් මනෝ යන තුන්දොර පවත්නා වඞ්කකුටිලදෝෂයන් දුරුකරණ පිණිස පිළිපන් බැවිනුදු ඍජුප්‍රතිපන්න සංඝයා නමැයි කියාද විසුද්ධිමාර්ගයෙහි ප්‍රකාශබැවින් හා "හෙට්ඨිමකොටියා සරණගතඋපාසකො සොතාපත්ති ඵලසච්ඡිකිරියාය සුපටිපන්නො හොතීති"—යනුවෙන් යටත්පිරිසෙයින් තිසරණගත උපාසකතෙම ශ්‍රෝතාපත්ති ඵලයාගේ සාක්ෂාත් කිරීම පිණිස ආර්‍ය්‍යමාර්ගයට පිළිපන්නේවෙයි වදාළබැවින් ලෞකිකසීලයෙහි පිහිටි භික්ෂුසංඝයාද ශ්‍රාවකසංඝනම් වන්සේක.

භගවතො, භාග්‍යවතුන්වහන්සේගේ; සාවකසංඝො, ශ්‍රාවක සංඝතෙම; උජුපටිපන්නො, අවඞ්කඅකුටිලභාවයෙන් ඍජුවූ පිළිවෙතට පැමිණිසේක; ඤායපටිපන්නො, උපායපිළිවෙතට පැමිණිසේක; සාමීචිපටිපන්නො, සුදුසු පිළිවෙතට පැමිණිසේක; යදිදං චත්තාරි පුරිසයුගානි, යම් මේ සතරපුරුෂයුගලකෙනෙක් ඇද්ද ඒ පුරුෂයුගල වසයෙන් සතරක්ව සිටි පළමුවෙනි සෝවාන්මාර්ගයට පැමිණි පුද්ගලයා එම සෝවාන්ඵලයට පැමිණි පුද්ගලයාය යන දෙදෙනාගේ වසයෙන් යුගල එකෙක මෙම නයින් සකෘදාගාමි අනාගාමි අර්හත් මාර්ගඵලස්ථයන්ගේ වසයෙන් හැම එක්ව සතරයුගලයෙහිම පිහිටි පුරුෂපුද්ගලයෝ අටදෙනෙකි, එසේවූ අෂ්ටාර්‍ය්‍යපුද්ගලයෝ භගවතො; භාග්‍යවතුන්වහන්සේගේ; එස සාවකසංඝො, යුගලවිසින් වෙන වෙනවූ පුරුෂපුද්ගලයයි කියනලද මේ ශ්‍රාවකසමූහයා; ආහුනෙය්‍යො, දුරිනුදුගෙනවුත් දියයුතු සිව්පසය පිළිගන්ට සුදුසුහෙයින්ද; ඒ දායකයන්ට මහත්ඵලකරදෙන හෙයින්ද ආහුනෙය්‍ය නම් වන්සේක; පාහුනෙය්‍යො, අමුතුසරහාදෙන දානයන් පිළිගන්ට සුදුසුහෙයින්ද සතරදිගින් සතරඅනුදිගින් කල්යාමකින් ආප්‍රිය මනාප නෑමිත්‍රවූ ආගන්තුකයන්ට දෙනපිණිස මහත්සත්කාරයෙන් සපයනලද ආහරපානවර්ගාදිය පාහුනෙය්‍යයයි කියනුලැබේ; — ඒ හැම දැවෙන්ව ගොස් නොබෝකලකින් එන මිත්‍ර ආගන්තුකයන්ට නොදී සංඝයාවහන්සේටම දෙනබව එයට වඩා සුදුසුහෙයින් ඒ පාහුනය පිළිගන්ට සංඝයාවහන්සේ සුදුසුහෙයින් සංඝයාවහන්සේ හා සදිසවූ අමුතු සත්කාරයට සුදුසුකෙනෙක් ලොව නැතිහෙයින් ඒසඞ්ඝ නෙමේ බුද්ධාන්තරයක් ඉක්මුනුකල්හි හෝ කිසිකලෙක මහාකල්ප අසංඛ්‍යයක් ඉක්මගිය කල්හි හෝ දක්නට ලැබෙන සඞ්ඝයාවහන්සේම ආදර ගෞරව බහුමානාදි සර්‍වප්‍රකාරයෙන් සරහාදෙනදාන

යන් පිළිගන්ට සුදුසු හෙයින් පාහුණෙය්‍යනම් වනසේක; දක්ඛිණෙ
ය්‍යො, පරලොව අදහා දියයුතු දානය පිළිගන්ට සුදුසුහෙයින්ද ඒ
දක්ෂිණාසංඛ්‍යාත දානපිළිගැන්මෙන් ඔවුන්ට උදාරතර විපුලවූ
මහත්ඵලසංසිද්ධියවනහෙයින්ද දක්ඛිණෙය්‍ය නම් වනසේක; අඤ්ජලි
කරණීයෙය්‍යා, පින්කැමති සියලු ලොකයා විසින් දෙඅත් හිස්මුදුන්
පිහිටුවාගෙන කරණලද අඤ්ජලිකර්මසංඛ්‍යාත වැඳීමට සුදුසුහෙයින්
අඤ්ජලිකරණීය නම් වනසේක; ලොකස්ස, සර්වලෝකවාසීන්ගේ;
අනුත්තරං පුඤ්ඤක්ඛෙත්තං, අනික් සදෘශයක් නැතිහෙයින් අස
දෘශවූ සියළු කුසලධර්මයන්හට ගන්නා ස්ථානයටවනහෙයින් පුණ්‍ය
ක්ෂෙත්‍රවූ සංඝතෙම මේ ලෝකසත්වයන්ට නානාප්‍රකාර හිතසැප
ඵලවාදෙන නිරුත්තරවූ පුණ්‍යක්ෂෙත්‍ර නම් වනසේක; එහෙයින්
දෙව්මිනිස්සැපත්හා බඹලොවනිරාමිසසැපත්පතන්නාහුද රාගවෙස
මොහාදි පාපධර්මයන් කෙරෙන් දුරින්ම දුරුවූ අම්මාමහනිවන් සැප
පතන්නාහුද තුන්වෙනිකොට ගතයුතුමේ සඟසරණයමවෙති, අප
හැමගෙ අකුශලබලයෙන් දිවමන් බුදුරුව දක සිත්සැනහීමක් නො
ලබනනමුදු ඒ බුදුන්ගේ වෙසයගත්තාවූ මේ සඟරුවන් අප ඇස
පෙනෙන්නේ අපගේ මහත් භාග්‍යයෙන්දැයි සලකානතරම් මහිම
ඇත්තාවූ බුදුන් උපදනාට පළමුව ලොව පහළනොවන්නාවූ පස්වා
දහසින් ඔබෙබහි උපන් ලෝවැසියන්ට දක්නට නොලැබෙන්නාහ.
පැවිදිව තුමූ දුස්සීලව නරකයටයෙති නමුදු මොහු බුදුන් දරුවෝ
යයි ආදරඋපදවා සිහින්ම යෙදී වැඳුවුන්ට පිදුවවුන්ට අම්මාමහනිව
න්සැප නොවරදවාම දෙන්නාහ, පැවිදිවීමට පළමුවෙන්ම නො
යෙක් කුලභෙද ඇත්තාහු පවා බුදුසස්නෙහි මහනවූ තැන්පටන්
ඒ සියලුම ජාතිභෙදය හැර මහමායා දේවීන්වහන්සේට මුනුබුරුව
සුද්ධෝදනරජ්ජුරුවන්වහන්සේ මුතුන් තැන්හී තබා යසෝදරාදේ
වීන්වහන්සේ මවුතන්හි තබා ශාක්‍යවන්සෙහි උපන් බුදුරජානන්
වහන්සේ පියතන්හි තබා බුද්ධපුත්‍රවූ රාහුලකුමාරයන්වහන්සේ
ජේෂ්ඨභ්‍රාතෘතනතුරෙහි තබාගෙණ එක සර්වඥයන්වහන්සේගේ
උතුම් වන්සලදිම් සිටියහ සියලු පව්වලකන ලජ්ජාභයවැනි ධර්මයන්
දෙදෙනා දෙකොලවරලා තුමූ මධ්‍යයෙහි සිටියහ, පඤ්චඉන්ද්‍රිය නැ
මැති සොරුන් රැකනවතන සිහිනැමැති දොරටුපාලයන් ලදහ සීල
යවැනි මහත් පිහිටක් ලදහ එකහවූ සිත්ඇති සමාධිවැනි මහත්
නිධානයක් ලදහ, ප්‍රඥාවවැනි දුටුදුටු ආපදායෙහි මුලානොව නිසි
ලෙස යොදගතහැකි අවුසධයක් ලදහ, පඤ්චකාමවැනි ගර්හිතවූ
නින්දිත කුණුනොවලඳ දුරුකලහ, නිවන්වැනි මාහැඟි රසයක් වල
දන්ට පටනාගෙණ සිටියහ, සිතවැනි වඤ්චලවූ අතිදුෂ්කර ඡේදයක්
වසඟකරන්නට නිසිලෙසම සැදීසිටියහ, තන්හා නැමති යක්ෂනා

දුරුකරන්නාට සිටියහ, තුන්භවය පමණනාක් තන්හි පලල්ව සිටි
තණ්හාවනැමති මහගංගාව වියලවන්නටපටන්ගෙන සිටියහ, සසර
වැනි මහාසිරගෙයකින් නික්ම යන්නට පටන්ගෙන සිටියහ, ලාභ
සත්කාරාදිය පිණිස ලද ගුණ ප්‍රකාශනොකරන්නාහ, සඟුරුවන්
නැතිදුම් බුද්ධොත්පාදය නැතැයිකියන පරිද්දෙන් බුදුන්ටමඅවශ්‍යව
බුදුසසුන් පවත්නා රක්ෂාකිරීමෙහි නියුක්තව සිටියහ, සිංහතෙල්තබා
රක්නා රන්බඳුනක්සේ සද්ධර්ම නැමති සිංහතෛලය දරා රක්නා
උතුම් සඟුරුවනෙක නිධානරක්නා නාගයන්සේ සද්ධර්ම නැමති
මහානිධානයරක්නාහ රක්නටබැරි ඇතුපිරිමසා ජීවත්වනඇත්ගො
විවන්සේ පුරන්නට නොපිළිවන්වූ පිළිවෙත් පුරා තමනුත් රැකී ලො
වැසියනුත් රක්නාහ, රාජහසින්වල්වන්නාවුන්සේ සසරහසින්ම
වනාන්තරගතව යන්නාහ, ගුරුළුන්ට හයින් මහත් ගල්ගැලපිසා
සයනයකරණ නාගරාජයන්සේ සසරට හයින් මහත්වූ දහත්පිළි
වෙත්හී සෙදිවාසයකරන්නාහ—තවද ලොකයෙහි සියළුමනුෂ්‍යයෝ
තමන් විසූ ගමින්පිටතට නික්මයන්නාහුවීනම් එගමිහි පැවති තන්
හාවතුබුසේ තබා ශරීරය පමණක්ගෙනයන්නාහ, මාගේ ස්වාමිදරු
වන්ගේ පුත්වූ සඟුරුවන්වූකලි එක්තැනෙක්හී වැස අනික්තැන
කට වඩිනකල්හි පසුපසෙසහි හඬාඑන දූන් පුතුන් හා වෙන්වීම ඉව
සාගතනොහී හඬාඑන අඹුවක් නැත්හෙයින් හුන්විහාරාදි යම්කිසි
තැනෙක් ඇතහොත් රැසවතිබූ ගරුභාණ්ඩ ධාන්‍යොපකරණාදි සාං
ඝිකදෑ මිස තමන්සතුව කොටුපුරා රැස්කළ වී සාල් නැතිසෙයින්භා
ගේපුරා තිබූ රත්රන් අමුරන් නැතිහෙයින් ඇති දෙයක් නම් තුන්
සිව්රය යනාදීන් තමන්ගේ ශරීරයෙහිම දරාගන එනයනපරුම්
පිරිකරමය එහෙයින් අපේක්ෂාවක් නැතිවම යන්නාහ, තවද ගොදු
රුබිමින් ගොදුරුකායන පක්ෂිහු පවා නැවත මෙතනට එම්හයි
එතැන්හී තෘෂ්ණාවක් තබා යෙති, අප ස්වාමිදරුවානන්වහන්සේ
ගේ පුත්වූ සඟුරුවන්වූකලි හුන්තැන්හිදු සිඟා ලබන ආහරක් බැවි
න් යනතැන්හිදු සිඟාමලබන ආහරම බැවින් පාත්‍රයෙහි බහාළු ආහ
රක්ම හඳුනන බැවින් ලත්දෙයක්ම මිහිරිවන බැවින් නොලත් දෙ
යෙහි සිහිවිල්ලක් නැතිහෙයින් මල්කුසුම වනම්සාකයෙන් හමා
යන පවන මේවලහැර කොයටයෙම්ද යන සෝකයක් නොකොට
යන්නාසේ කිසිතැනෙක්හි ඇල්මක්වත් සොකයෙක්වත් නැත්තාහ
තමන්ට පැමිනි ගෝචරයක්ම ගන්නා ඉන්ද්‍රියයන්සේ මට දෙවසියන
බස්නැතිව සැදුහැඇත්තාවුන් දෙන්නක්ම පිළිගන්නාහ—ගොස්
පැමිණිතන්හී විහාරයෙක් ඇත්, එහිම වසන්නාහ එතනරුක්
මුලෙක් ඇත එහිම වසන්නාහ හෙද නැත හිස්බිම්හි සතුටින්ම නිඳි
නාහ ඒ එතන්හී මුතුදූල්එල්වූ රන්කන්කලම්යන්බැඳි සිරිගබඩා

සෙහි වසන ප්‍රීතිමත් රජකුමරුවන් සෙසින් විසුඹවූ සදරැස් නැමැති
මුතුදැල් එල්වූ විසිතුරු තරුපෙල නැමැති රන්කම්තල අහස්වියන්
බැඳ අභ්‍යාවකාශයෙහිම සැපසේ වාසයකරන්නාහ-ගම්කටවන්කල
අපි පැමිණියේ නමටයයි අමුතුසතුටක් නැත්තාහ අපවන්නේ වනා
න්තරයකටයයි වල්වන්කල දැහැනියක් නැත්තාහ—කාන්තාරමග
මිනිසුන් පොලොඹා කාවිනාසයට පමුනුවන යකුන්ටම නිවාසවූ
යක්ෂපුරයකට පැමිණි නුවනැති පුරුෂයෙම මම යහපත් පුරයකට
වන්නෙම්සී සතුටුනොවන්නාසේ සත්වයන් බඳනා පිණිස යක්වෙස්
හැර මිනිස්වෙස්ගත් සියළු දුකට කාරණාවූ ගැහැනුන්විසින් ගැවසී
ගත් ගමකට වන්නෙම්සී භයපත්ව සිත්සේ ඒඒ දිගනොබලා බිමට
නතුකල ඇස්ඇතිව උවදුරු ඇතැයි වියදඬු පමණ තැන්බලාගන
යන ගමනාදී ශාන්තඉරියව්වූ පැවැත්වීමෙන් දමනයකළ ඉඳුරන්
ඇති බැවින් ගමකට වැදුනෙම්සී සතුටක් නැත්තාහ—සක්විති
රජවන පිනැතිව මුළුසත්වල හැරපියා පැවිදිව අපහැරිය මුළුසක්
ලෙහි රජසැපත නැවත සිහිනොකරනසේ උතුම් පැවිදිසැපයක්
ඇතියාහ එබැවින් ගමක්හැර ගමකට යනකල්හි අපිහැර ආගම
යහපතැයි අපේක්ෂාවක් නොකරන්නාහ—ආඥසම්පන්නවූ රජහුගේ
මෙහෙවරට ගොස් මෙදවස්හිම එම්සී අවධිනියමකොට ගත් පුරුෂ
තෙම ඒ අවධිය නොවරදවන පිණිස දිවනගමන්හි අතරමග සම්ප
ත්තීන් සමෘඬවූ ගම්දුටද එහි සැතපෙම්සී යන අදහස් නැතිව මෙ
හෙවරට දිවන්නාසේ බුදුරජානනාවහන්සේගේ අවවාදනුශාසනා
කම්ටහන්ගෙන ඒ පිළිවෙත් පුරනුපිණිස විහාරයටම කල්නොවර
දවා සඟුරුවන්වහන්සේ මම පැමිණිගම යහපතැයි එහි ආලයක්
නොකරන්නාහ, කිඹුල්වත්නුවර වැනි උතුම් නුවරෙක ආලයහැර
නික්මගියා බුදුපියානන් වැනි දරුවෝය එබැවින් බිජුවටෙහි ඉපැද
වැඩී ඒ බිජුවට පැළුනුකල්හි එහි අපේක්ෂාවක් ආලයක්නැතිවම
මවපක්ෂෙහියන්නාවූ පක්ෂිපොතකයන්සේ ගම්හි ඉපැද වැඩී පැවිදිව
යනකල එගම්හි ආලයක් නැතුව යන මහනහු බුදුන්වදාල පිළිවෙ
ත් පසුපසෙසහිම යනබවමුත් ඒ හැර ගම්හී පවත්වන ආලයක් නැ
ත්තාහ—මේදේ මම කැමතිය මේදේ මම නොකමැතියයි කියා ගත
නොහැකි ඉතා ලදරුකුමාරතෙම මව අනිත්මුඛයෙහිතුබූ අහරක්ම
කා යැපෙන්නාසේ සැදූහැඇතියන් තමන්ට දුන් දානයකින්ම දිවි
පවත්වනබවමුත් මේ මිට යහපත මේ නපුරුයි යන බසෙක්හි රස
නොදන්නාහ, මෙබඳුවූ උතුම් නිරපෙක්ෂ ගුණඇති බුඹශාසන නැ
මැති රත්ගිරිගුහායෙහි වසන සිංහයින් බඳුවූ බුඹශාසන් නැමති ඡද්
දන්තවිල්තෙර වසන ඡද්දන්ත හස්තිපෝතකයන් බඳුවූ බුඹශාසන
නැමිනි චිත්‍රකූටපර්වතයෙහි ස්වර්ණහංසපෝතකයන් බඳුවූ බුඹශාසන

නැමතිරුවන්ආකාරයෙහි පහළවූමාහැඟිරුවන්බඳුවූ බුද්ධශාසනනමැ
තිසාගර කුක්ෂියෙහිඋපදනාවූ රුවන්බඳුවූ බුද්ධශාසනනැමති පරසතු
රුක්හි හටගත් මහත් මල්කැන්බඳුවූ බුද්ධශාසනනැමති බ්‍රහ්මවිමාන
යෙහි වසන බ්‍රහ්මකුමාරයන් බඳුවූ බුද්ධොත්පාද නැමති වසන්තකා
ලයට පිපි සැරහී ගිය මහසපුමල්පන්තියක් බඳුවූ උපමාවිසයාතික්‍රා
න්තවූ ගුණාලඞ්කාරයෙන් සියල්ලෝ සිත්ගෙන වසන බුදුරුවන්
පුත් සඟුරුවන්වහන්සේ සිඟාවැඩිකල කොටුයෙහි පුරාලූ වී සාල්
ඇතදගෙහි රත්රන් අමුරන්පුරා ඇතද හැමලෙසින් සිත්හි ගුනම
පිරුසිඟාසිටි එගෙවල ඇත්තවුන් දුන්දුන්සේම පිළිගන්නා බවමුත්
යටත්ව යාචකයන්සේ ඉල්වීමක්වත් බලාත්කාරයෙන් උදුරා හැර
ගැනීමක්වත් වඤ්චාවෙන් සොරාගැන්මක්වත් නොකරන්නාවූ මහ
තුන් විසින් දුරුකටයුතුයයි වදාළ එක්විසි අනෙස්නෙන් හා කුහන
ලපනාදීන් දුරුව මේ කැපයයි අනුදත්සේ දැහැමින් සෙමින් ලද
දෙයකින්ම ජීවත්වන්නාවූ අනුන්ගැතිවූ මිඩියදුන්කුඩුපුවා සතර
වරන් දෙවුරජුන් දුන් පාත්‍රයෙන් පිළිගත්තාවූ පියානන්වහන්සේ
කාලදෙයක්ම කරන්නාවූ යමක්කියම්හයි සිතුකළ තමන්ට ස්වාමිවූ
ලෝකස්වාමිවූ ධර්මස්වාමිවූ සම්මාසම්බුදුරජානන්වහන්සේ නොබි
නියයුතුයයි වැලකූ දෙතිස්කථාවට තුඩුනොලා නොබැන කියන්
නාවූ තමන්ටද තමන් වන් සස්නටද තුසුදුසසක් නොබැන තමන්
ටද අසන්නවුන්ටද ස්වර්ගමෝක්ෂසම්පත් බාධකවන තිරාශ්චීන කතුරු
වචනයන් නොබැන බුදුරජ ඇසුවද කීසේ යහපතැයි වදාරණපරිද්
දෙන් සුදුසුබස්කියන්නාවූ සතුන් පිළිවෙත් පුරණසේ වැඩිතරම්
වෛධර්ය්‍යඇති කණ්ඨදෙසීමෙන් හා ධර්මිෂ්ට කථාවක්ම බණවණවනාජ
කථාවකට තුඩනොපියවයි වදාළ අවවාද දිවි ගියාත් නොඉක්මවන්
නාවූ බෙලිකුස්හි මුතුමතිබෙයි නැතහොත්සිස්වනිබෙයි එහෙයින්ම
සඟුරුවන්වහන්සේ කියනසේක්වීනම් බනක්දහමක් ධාර්මිකකථා
වක්මය එසේනැත මුවෙන් නොබනනසේක, අධර්මකථාවට දුරි
න්ම දුරුසේක, මුලුලෝ සතුන් තුඩතුඩ වැකූගුණඇති කිසිකෙ
නෙකුන්හාත් විරොධයක්නැති කිසිසත්වකෙනෙකුත්ට දඬනයක්
නොකරණ මේ සියළු දුක්නැමති ගිනිගත් සසරෙහි නිවි සන්සිඳී
වසන මේ සංසාරබන්ධනය වැනි මහත් බැඳුම් එවා මුදහැර ගැලවෙ
නතරම් පිළිවෙත් ඇති නිවන්පුර වදනටම බුදුසස්නෙහි ඥතිවසිටි
බලන්නාවුන් ඇස් මීරිවෙණඇති සිතන්නාවුන් සිත් මිශ්‍රිගුණඇති
මිරනු ඇස්ගැසූ ගිනිගෙන දිලියෙන යකඩුවැනි සන්පුෂීයන් ඇසට
අමෘතපරිශේකයක්වැනි ශ්‍රුතමධුර විදග්ධනාධුර දෙකමුත් තුන්වෙනිව
සිටි ලොකයෙහි මුලාවෙන් නොහැසිරෙන බඹලොවයෙහ් බඹ
විමන්හි වැස භාවනාකරන් මහමුහුදුවැද දියපිරා ඉඳුනීලමිණිකාශ

ගුහායෙහි හිඳිනාසේ ජලගර්භයෙහි හිඳ භාවනාකරත් සිහිල්දිය
පිරුම්බඑගෙන්වා පාමුල්හි අඟහිකබල්කරත් ශ්‍රීසමද සඳමඬලු
ගෙන්වා පිටව සිහිල්දෙන පිටාවුකරත් ඔවුන් සිතූදෙයක් කරණ
පරිදෙන් මහත්වූ ඉර්ධිඇති අහසට ගැසූ අත්වැදගන්නා කිසිදෙ
යක් නැතිනාසේ කිසිවස්තූංවක්හි ලෝභවශයෙන් එක්වීමක් නැත්
තාවූ සත්ප්‍රශීජනයන්ට ගන්ධසාර වස්තුවක්වැනිවූ සංඝරත්නය
තෙම අප හැමටම අජීවැඩසාදදෙන සිතුම්නිරුවනක් වැනිවූ සීල
නැමති ආභරණ පැළඳ සීලනැමති සුවඳවිලේපැන් ඇඟගල්වා විසි
මෙන් සියළු ලොවට ප්‍රියවූ ශාසන පිළිවෙත් වැනි දුස්කරක්‍රියාවක්
කරණ මහත්වැරසැරඇත්තාවූ කලක්සේද එසෙනපුරයි කියනසේ
තුසුදුසුදැ නොකරණ නොකියන උතුම් ගුණයක් ඇත්තාවූ ශාන්
තවූ නිරවුල් නිවන්පුර වැද හැනගීමක් ඇත්තාවූ සිඟාවලදන
බතක්වැනි නිරවද්‍ය බතක් වලදන්නාවූ පාංසුකූල චීවරයවැනි නිර
වද්‍ය සිවුරක් පොරවන්නාවූ බුදුන්වැනි උතුම් පියානකෙනෙකුන්
ලද්දවූ ධර්මයවැනි ඇසියයුතු දෙයක් අසන්නාවූ විදර්ශනාවැනි භාව
නාකටයුත්තක් භාවනාකරන්නාවූ තිලකුනුවැනිසිහිකටයුතුදෙයක්
සිහිකරන්නාවූ මෛත්‍රීවැනි අමායෙක සිතගලන්නාවූ සරීරයාගේ
පිළිකුල්සවභාව සිහිකරණ කායගතාසති නැමති සිහියක් ලද්දවූ
ආහර පිළිසඳුවක් ලද්දවූ සපදානචාරිකාවක් වැනි මණ්භාරචාරිකා
වෙක හැසිරෙන්නාවූ කුසල් නැමති රෝපනය කටයුත්තක් රෝප
නයකරන්නාවූ ප්‍රාණාතිපාතවැනි නොකටයුත්තක් නොකරන්නාවූ
මුසාවාදනැමති නොකියයුක්තක් නොකියන්නාවූ සුරාමෙරවැනි
නොබියයුක්තක් නොබොන්නාවූ පඤ්චකාමනැමති ගරවිල්කානක්
කරින් උකා ගලවාහැරියාවූ නැටුම් නැමති විප්‍රකාරයන් නොබලන්
නාවූ ගීකීම්නැමති නිස්ප්‍රයෝජන සංසාරවිලාසයක් නොඅසන්නාවූ
ආත්මකලානතභාවයකට පමුණුවා දුක්දෙන අනතකිලමතානු
යෝග නැමති වධහුම්ද ගෙඩියකින් මිදීසිටියාවූ මල්සුවඳ විලේ
පනයක් නැමති ස්වශීවිසයක් ඇඟගෑමෙන් දුරුවූනාවූ උසසුන්
මහස්නෙහි නොහිඳිනාවූ රන්රිදී මසුකාභවන්නැමති තණ්භාවඩනා
අපථ්‍යදෙයක් වෙහෙරින්ම පිටත්කලාවූ විකාලභොජන නැමති
ගිනිගෙන දිලිසෙන ගගුලිමුඛයෙහි නොතබා දුරුකලාවූ දහම්වැනි
බුඹදුයාදවූ මිහිරිදෙයක් ලෝවැසියනටත් බෙදදී තුමූත් වලඳන්
නාවූ විනයවිනිශ්චයෙන් කරණ ශ්‍රේසනිශ්චයක් ඇත්තාවූ ශරියුත්
මුගලන් දෙඅගසව්වන්වැනි කුසයෙහි හොත්තන් ලද්දවූ මරණට
පවා භයනොවන වික්‍රමයක් ලද්දවූ බුදුන්වැනි සිහිකලමනාකෙනෙ
කුන් සිහිකරන්නාවූ සසරවැනි එතරවීමට දුස්කරතැනකින් සතුන්
එතරකරන්ට සිටියාවූ කාමොඝාදී මහවතුරුසතරෙහි නොගැලී පිහි

නත්ව සුදුසුවූ අධික වීර්‍ය්‍යඇත්තාවූ රාජ්‍යවැනි මහාඝයකින් නැලවී
සිටියාවූ දෙසැට මිථ්‍යාදෘෂ්ටි නැමති මහගිනිවලකින් පැන එතරට
ගියාවූ සසරපමනට මහත්වූ ව්‍යසනසාගරයෙහි ඇවිද වෙහෙසවිඳි
මින් විඩාවසිව බුද්ධසසුන් වැනි යහපත් පටුනුගමකට පැමිණියාවූ
තරුණභාවටම ගැතිකම්කොට අගතිව සිට නිදගස්වූ සාරාසංඛ්‍ය කප්
ලක්ෂයක් බුදුන්ම පතා ලද දරුවන්වූ පාපයෙන් ගැලපත්වවසන්නාවූ
බුදුන්ට දිව්‍යප්‍රඥවසන්නාවූ සක්විතිරජුන් ඇතිසමයෙහි උපදනා සත්
රුවන්සේ බුද්ධෝත්පාදයෙහිම උපන්නාවූ සද්ධර්‍මයාගේ නිධානයක්
වැනිවූ මහනෙනි මාකියන්න අසවයි කැඳවා කියන බණඅසන්නට
සුදුසුවූ ගුණමහිමඇති සඟුරුවන්හිමෙසේ මෙසේවූ නොයෙක් විද්‍ය
මාන ගුණයන් ප්‍රකාශකොට දෙවිමිනිසුන් සහිත සියළු සත්වලෝක
යාහට කරණලද උතුම් සද්ධර්‍මානුශාසනා ඇතිහෙයින් සද්ධර්‍මචක්‍ර
වර්ති ස්වාමිවූ මාගේ බුදුරජ ශාස්තෘනාම් වනසේක.

තවද ඒ මාගේ ස්වාමිදරුවූ බුදුරජානන්වහන්සේ එකිනෙක
නමකට නිත්‍යපිරිවර පන්සියය පන්සියය බැගින් ඇති අසූමහ සව්
වන් ප්‍රමුඛවූ හැම ශ්‍රාවකයන්වහන්සේගේ පූර්‍වප්‍රාර්ථනාවූ පරිච්ඡෙද
චරිතබලා අවවාදකොට මාර්‍ගඵලාදියට පමුනුවමින් ඒ ඒ තනතුරු
රුදීමෙන් වැඩසැදූසේක.

තවද මාගේ ස්වාමිදරුවූ සඟුරුවන්වහන්සේ සීලවිපත්තියෙහි
මහත් දෝෂාදිනව දක කායවාක් දුශ්චරිතයෙන් හා එක්විසි අනේ
ෂන කුහනලපනාදීන් දුරුව සීලසම්පත්තියෙහි මහානිසංසබව දක
නෙම්ලවූ චතුපාරිශුද්ධිසීලයෙන් සමන්විතව එම සීලයාගේම පිරිසිදු
බවද තෙරස ධුතගුණයෙන් හා ත්‍රිවිධසන්තෝෂයෙන් යුක්තව
චතුර්විධවූ ආර්‍ය්‍යවංශයෙහි පිහිටා අප්‍රමාදව වාසයකරණසේක—
මෙසේ ලෞකික ලෝකෝත්තරවසයෙන් විප්‍රකාරවූ සර්‍වශ්‍රාමණ්‍ය
ගුණරත්නාලඞ්කෘතවූ හෙයින්ම මුළුලොවවාසීන්ට පින්කෙත්වසිටි
සියළු සංඝයාවහන්සේ ලොව කෙසේ පහලවනසේක්දයත්? සංඝ
පිතෘවූ සම්‍යක්සම්බුදුවරයන්වහන්සේ ලොවඇතිඇතිකල ඒලොවු
තුරා බුදුන් සමීපයෙන්ම ලැබියයුතු ඒහි භික්ෂුභාව උපසම්පදය ත්‍රිවි
ධොවාද උපසම්පදය සරණාගමන උපසම්පදය යන නොයෙක්
ප්‍රභෙදගත උපසම්පදාවෙන් හා එම බුදුන්විසින්ම අනුදත් ක්‍රමයෙන්
පඤ්චවර්‍ගාදි සංඝයාවහන්සේ කෙරෙන්ම ලැබියයුතු දැන් මෙලොව
පවත්නා ඤත්ති චතුත්ථ කර්‍මවාක්‍යයෙන් පැමිණෙන උපසම්ප
දාය යන ක්‍රමය නොහැර උපසම්පදා භාවයට පැමිණි භික්ෂුහුම තම
තමන්ගේ පුද්ගල නාමයන් හැර සතරනම පටන් එක්වූ සංඛ්‍යාවක්
හා ගුණසමූහවූපරිච්ඡෙදන්ම සංඝනාම්වනසේක—ගේදවනාහි මතු

වර්ග පඤ්චවර්ග අතිරේක පඤ්චවර්ග්‍ය දසවර්ග්‍ය අතිරේක දසවර්ගීය විංශතිවර්ග්‍ය අතිරේක විංශතිවර්ගීයයයි කියාද නොයෙක් ප්‍රභේදඇති සේක— එහි සංඝාඥප්තිපිහිටුවා පාමොක් දෙසීමෙන් කාරණ උපෝසථකර්මය හා සංඝදානාදී ඇතම් සංඝකර්මානුරූපවසිටි භික්ෂූන්වහන්සේලා සතරනමට චතුර්වර්ග්‍යයයි යන නමෙකි, එසේ පවාරණකර්මය හා කඨිනචීවරදානලැබීම ප්‍රත්‍යන්තදේශවලදී උපසම්පදාව ආදී සංඝකර්මකිරීමට තරම්වූ භික්ෂුපස්නමට පඤ්චවර්ගී භික්ෂුසංඝයාවහන්සේයයි කියාද එසේම සයනමපටින් නවනමදක්වාම ලදයම් ගණනකට අතිරේක පඤ්චවර්ගී සංඝයාවහන්සේයයි කියාද, එසේම මධ්‍යම දේශයන්හිදී උපසම්පදාකිරීම ආදී නොයෙක් සංඝකර්මානුරූපවූ දසනාමට දසවර්ගීසඞ්ඝයාවහන්සේයයි කියාද, එකොළොස්නමපටින් දශනවනමදක්වා ලද යම් ගණනකට අතිරේක දශවර්ගී සඞ්ඝයාවහන්සේයයි කියාද, එසේම අබ්භානකර්මය ආදිවූ සියලුම සඞ්ඝකර්මකිරීමට සුදුසුවූ භික්ෂූන්වහන්සේලා විසිඑකනමට විංශතිවර්ගික සංඝයාවහන්සේයයි කියාද, එයින් ඉවත් විසිඑකනමපටන් නොයෙක් සියදහස් ලක්ෂකෝටිප්‍රකෝටි ආදිවශයෙන් රැස්වූ යම් භික්ෂූන්වහන්සේලාගේද, යම් යම් ගණනක් ඇද්ද අතිරේක විංශතිවර්ගික සඞ්ඝනාමිවනසේක— ඒ එසේවීනම් "අට්ඨපුරිසපුග්ගලා එසභගවතො සාවකසඞ්ඝො" යනු විදාළ ක්‍රමයෙන් ආර්යමාර්ගඵලයන්ගේම සාක්ෂාත්කෘතවශයෙන්පැමිණි අෂ්ටප්‍රකාර ආර්යපුද්ගලයෝම භාග්‍යවතුන්වහන්සේගේ ශ්‍රාවකසඞ්ඝ නම්වන හෙයින් දැන් මෙලොව විද්‍යමානවූ ලෞකික ශුද්ධශීල ප්‍රඥා ගුණසම්පන්න භික්ෂූන්වහන්සේලා කෙසේ ආර්යසඞ්ඝවූ සේක්ලාදැයත්? හේ මෙසේ දතයුතු.

පටිසම්භිදාමාර්ගයෙහිදී නිර්වාණමාර්ගවූ ආර්යමාර්ගය ප්‍රකාශකොට දක්වන භාග්‍යවතුන්වහන්සේ- "එසොව මග්ගො නත්‍ථඤ්ඤො දස්සනස්ස විසුද්ධියා" යනුවෙන් සොතාපත්තිමාර්ගාදිවූ ආර්යමාර්ගයෝම නිර්වාණපුරයට මාර්ගවන හෙයින් මේ මාර්ගනම්වෙයි වදාරා නැවත මහාසතිපට්ඨාන සූත්‍රාන්තදේශනායෙහිද "එකායනො අයංමග්ගො" යනුවෙන් සංසාරචාරී පෘථග්ජනවූ යොගාවචරයන් විසින් ඒ ආර්යමාර්ගයට පැමිණීම පිණිස එම මාර්ගයාගේ අවබොධය පිණිස පළමුකොට භාවිතාකටයුතුවූ සතිපට්ඨාන භාවනාමාර්ගයද එම ආර්යමාර්ගයන්ගේම පූර්වභාගමාර්ගනමැයිකියා දක්වාවදාළසේක මෙහිදු එමඅෂ්ටාර්යපුද්ගලවූ උතුම් ලොකොත්තර සංඝගුණ ප්‍රතිලාභයට මුල්ව සිටිසෙයින් පූර්වභාගවූ උතුම් මේ ශාසනයෙහි පිළිවෙත් පුරමින්ම වසනහෙයින්ද ඒ අෂ්ටාර්ය පුද්ගල සංඝපරම්පරානුගතව පිළිවෙල නොහැරම බුද්ධශාසන ප්‍රව්‍රජ්‍යාව ලදින් භික්ෂුභාවයට පැමිණිහෙයින්

දැයි යනාදී නොයෙක් කාරණයෙන් ශාසනාන්තර්ධානය දක්වාම මෙසේ ලොව ඇතිවන සීලසම්පන්නවූ සියලුම පෘථග්ජන බුද්ධපුත්‍රයන්වහන්සේලාද අෂ්ටාර්‍ය්‍යපුද්ගල සඞ්ඝනම් වනාසේක—මෙසේ අෂ්ටාර්‍ය්‍ය පුද්ගලසංඝයාවහන්සේයයිලද නම්ඇති අචින්ත්‍යානොපමෙය්‍ය අප්‍රමාණවූ ගුණරත්නාලඞ්කාරයෙන් සැරසී අනුබුද්ධඥානසම්පාදනාදියෙන් සර්වඥපුත්‍රවූ සඞ්ඝයාවහන්සේම සියලු බුදුවරයන්වහන්සේලාගේ පර්‍ය්‍යාප්ති ප්‍රතිපත්ති ප්‍රතිවෙධ වශයෙන් ත්‍රිවිධවූ ශාසනය පවත්වනසේක—ඒ කෙසේදැයි කිවහොත්?—

ක්ෂෙත්‍රයට අධිපතිවූ ස්වාමිපුරුෂයාතෙම ඔහට සදකාලයෙහි ක්ෂෙත්‍රයෙහිම රඳසිට ඒ කෙත රැකීම් දුෂ්කරහෙයින් ඔහුවිසින්ම හස්තපාදාදී අඞ්ගසම්පන්නභාවයෙන් තමන් වැනිවූ නොයෙක් පුරුෂයන් සිටුවා ක්ෂෙත්‍රසස්‍යයන් රක්ෂාකිරීමෙහි නියුක්තකොට යම්සේ ලෝකයෙහි ධාන්‍යාදීන් රක්නේද, එසේම සම්‍යක්සම්බුදුවරයන්වහන්සේලාද හැමසතුන්වෙත පතළ මහාකරුණාවෙන් නානානය නිපුන අනෙකාධ්‍යාසයානුකූල අර්ථව්‍යඤ්ජන සම්පූර්ණවූ ධර්ම්ම දෙශනා කිරීම් ආදී ක්‍රමයෙන් සත්වයන්ට චතුරාර්‍ය්‍යසත්‍ය ධර්ම්මාදී ප්‍රමාණාතික්‍රාන්ත ලෞකික ලොකොත්තර ගුණාවබොධයකොට එම ගුණරත්නාභරණයෙන් හා ශ්‍රමණවෙශයෙන් තමන් වැනිකොට සරසා සිටවනලද සඞ්ඝයාවහන්සේ නිසාම බුද්ධශාසනයාගේ පැවතීමද දශවිධවූ ඥාණබලාදී කෞශල්‍යඥාණ ඇති සම්‍යක්සම්බුදුවරයන්වහන්සේලාගේම ඉර්ද්ධිමහිමයකැයි සලකම්-එහි උත්ඝටිතඥ ඥෙයාදී උත්තමවූ සර්වඥවරයන්වහන්සේලාගෙන් බොහෝකලක් ආයු ඇතිව වැඩසිටි බුදුන්ගේ ශාසනය ඒ බුදුන් පිරිනිවී බොහෝකලක් නොපවත්නාහෙයින් බුදුන් ඇතිකලම මහණවූ සම්මුඛවසිටි ශ්‍රමණයන්වහන්සේලාහ දෙවනුව මහණකියයුත් භික්ෂුන්වහන්සේලා විනා එයින් ඔබෙහි තුන්වැනිවූ භික්ෂූතෙම වෙනකෙනෙකුන් මහණකරවා නිසඳීමෙන් ශාසනය වර්ධනකොට පවත්වන්ට නොපිළිවන්වනසේක—ඒ තුන්වැනිව පැවිදිලත් භික්ෂූන්වහන්සේලාගේ ආයුෂය පිරිහීමෙන් පසු බුද්ධශාසනය නොපවත්නේය.

මදකලක් වැඩසිටි අල්පායුෂ්ක බුදුවරයන්වහන්සේගේ ත්‍රිවිධ ශාසනය ඒබුදුන්පිරිනිවිකල්හි සඞ්ඝයාවහන්සේම අනුබුද්ධඥානය සිද්ධකොට පිළිවෙලින්ම අමුතු අමුතු කුලදරුවන් මහණකිරීම් කර්ම්මස්ථානදීම් ආදී ශාසනයෙහි කලවනාකරණතාක් ශ්‍රමණධර්‍ම්මයන් සිද්ධකොට ලොකශාසනාභිවෘද්ධිවර්ධනය කෙරෙමින් ධර්ම්මදෙශනා කොට ලොකශාසනාභිවෘද්ධිවර්ධනය කෙරෙමින් ධර්ම්මදෙශනාකොට හේතුඇති සත්වයන්ට සෝවාන් සකෘදාගාමි අනාගාමි අර්හත් මාර්ග

ඵල ප්‍රතිලාභයන්කරවමින් නිවන්දක්වා බුද්ධාධිෂ්ඨානයෙන්ම කෙළවරවූ කාලාන්තරය මුලුල්ලෙහි සඞ්ඝයාවහන්සේම පිළිවෙලින් ශාසනය පවත්වනසේක— එසේහෙයින් උග්ඝටිතඥවූ එදකලක් ජීවත්ව වැඩසිටි අපගේ භාග්‍යවත් සද්ධර්මගඞ්ගාප්‍රවාහ, සවණීතලාශ්මානවූ තිලොගුරු බුදුරජානන්වහන්සේගේ, මේ නෛර්‍යාණික ශාසනයද ඒ ධර්මතාවූ පරිද්දෙන් පිරිනිවී පන්දහසක් අවුරුදු මුලුල්ලෙහි විපරීතවූ අන්‍යදෘෂ්ටි ලබ්ධීන් හා මිශ්‍රනොකොට නිර්මලව සඞ්ඝයාවහන්සේම පවත්වනසේක-එසේ සර්වසත්වොපකාරවූ නෛර්‍යාණික සර්වඥ ශාසනයාගේ නොයෙක් ප්‍රභෙදත්වය දැනහැඳින රක්ෂාකිරීමෙන් පැවැත්වීමෙහි යෙදීවසන අනූනයප්‍රතිඥයදුරුකොට පක්ෂසෙවීමෙන් නොනැමෙණ වජ්‍රපර්වතයක්මෙන් ඍජුවූ අවඞ්ක අකුටිලප්‍රගුණඇති සුගතතථාගත සර්වඥ ඖරස පුත්‍රබවට පැමිණියාවූ බුද්ධභාසිත සද්ධර්මයාගේ ශ්‍රවණයෙන්ම චතුස්සත්‍යාවබොධවීමෙන් චතුස්සත්‍ය බුද්ධයයි කියාද, බහුශ්‍රැතවීමෙන් ශ්‍රැතබුද්ධයයි කියාද, මේආදී නොයෙක් ප්‍රභෙද ගුණවිශෙෂයට පැමිණිසිටි සියලුම අෂ්ටාර්‍ය්‍යපුද්ගල සඞ්ඝයාවහන්සේම එම ගුණයෙන් ලොව බබලනසේක—ශ්‍රැතබුද්ධවරයෝ නම් කවරහයත්?—බොහෝදේ ඇසූපිරූතැන් ඇතිව බහුශ්‍රැතව විසුද්ධවූ- බුද්ධාගමත් සිතට නැගී හැමසතුන්වෙත පතලාවූ කරුණා ශ්‍රද්ධාදී ගුණාභ ලද්දින් සත්ගුරුවරයන්ගේ ශික්ෂාවෙහි හැසිර නව ලොකොත්තර සද්ධර්මයවූ පරිද්දෙන් පිළිපැද තමන් ආශ්‍රයකළ අතවැසි ආදීන්ටද මෙලොව පරලොව දෙකින්ම වැඩවඩනුපිණිස අවවාදනුශාසනාකොට මසුරුනොව තමාදත් ධර්මාතීදිය අන්තේවාසිකයන්ට ප්‍රගුණකරවා ඔවුන් විසින් මතුමතුත් බුද්ධශාසනය වර්ධනකොට සත්පුරුෂ ජනයාට මෙලොවින් පරලොවින් වන අර්ථසිද්ධිය සම්පාදනයකොට ලෝවැඩවඩනා උත්සාහවඩනා උපදෙස්දෙමින්- තමා පළමුකොට සුදුසුගුණධර්මයෙහි පිහිටාසිට අනුන්ටඅනුශාසනා කරන්නෝවිනම් හේතෙම ලොවබබලන්නේයයි වදාරණලද උතුම් බුද්ධානුශාසනාව ආදී නොයෙක් බුද්ධානුශාසනා සිතතබාගෙණ පළමුව සවකීයාත්මය දමනයෙහියෙදීවසමින් ඉක්බිතිව ධර්මාන්තේවාසිකයා නිශ්‍රාන්තේවාසිකයා ප්‍රව්‍රජ්‍යාන්තේවාසිකයා උපසම්පදන්තේවාසිකයයි යන චතුර්විධවූ අන්තේවාසිකයන්ගෙන් සූත්‍රගෙය්‍යාදී ධර්ම පුහුණුකරගන්නා පිණිස එක්වවසන්නාවූ ධර්මාන්තේවාසිකයන්ට අසහාපිරිවානතැන් කියාදී සූත්‍රාභිධර්ම විනයස්කන්ධ ධාතුආයතන ඉන්ද්‍රියබල බොධ්‍යාඞ්ගධර්මයන් පුහුනුකරවීමෙහු නිසලබාගෙණ වාසස්කාරණ නිශ්‍රාන්තේවාසිකයන්ටද ඔවුන්ගේ වරද නිවරද ගුණෙහිව සෙවීමෙන් නිරන්තරයෙන් සුදුසුලෙස අවවාදනුශාසනාකොට ඔවුන් සත්පථයෙහි යොදා ඔවුන්ගේ මෛත්‍රීවිතානය තමා

කොරෙහි ආමිෂකාඞ්ක්ෂනපක්ෂියක්මෙන් අලවා ඔවුන් තමාළඟදෙසා විසීමට ප්‍රියමනාපභාවය වර්ණනයකරවීමෙන්ද—තමා විසින් පැවිදි කොටගත් පබ්බජ්ජාන්තෙවාසිකයන්ටද, එසේම උපසම්පදාන්තෙවාසිකයන්ටද සිවුපසය තමහට පැමිණෙන පමණින් අනූනව සංග්‍රහ කොට නිරන්තරයෙන් කළමනා වත්පිළිවෙත් ආදියද හස්තපාද පිට්ඨිසම්බාහනාදිවූ මෙහෙයන්ද භික්ෂාචාරාදිවූ ගමනාගමනයෙහි ඉදිරිපසු යාම්ඊම් දැහැටිදිය පෙරාදීම්ආදිවූ වත්තප්‍රතිවත්තප්‍රතිග්‍රහනයෙන් නොවෙනසව ඔවුන් තමන්වෙත ප්‍රියවාසයකරණයෙන් වැසවීමෙන්ද—තවද ලොව ඇත්තාවූම අතිජාත ශිෂ්‍යපුත්‍රය, අනුජාතශිෂ්‍යපුත්‍රය, අවජාත ශිෂ්‍යපුත්‍රයයි යන චතුර්විධ ශිෂ්‍යපුත්‍රයන්ද හැඳින ඔවුන්අතුරෙන් අතිජාත ශිෂ්‍යපුත්‍රයන්විසින් තමන්ටකියාලූ අවවාදයෙහි පිහිටා උභයලොකාර්ත්‍ථසිද්ධිය සම්පාදනයට ඒ කියාලූ සම්‍යක්වචනයන් නොපිරිහෙලා සිත්හී තබාගෙණ ඒවූපරිද්දෙන් වැඩසාදාගෙණ විසීමද—සහජාත ශිෂ්‍යපුත්‍රයන් හා ධර්මසාකච්ඡාදිවූ සාමීචිවචනයෙන් කථාකොට දෙපක්ෂයට දෙලොවින්ම වැඩවනසේ සන්තොෂවීමද—අනුජාත ශිෂ්‍යපුත්‍රයාගේ ශාස්ත්‍රාභිලාසික චිත්තය නොකළඹා කළකිරීමට නොපමුනුවා අර්ථාගමාදි යම්කිසි තැනක් විචාලකළ එහි ග්‍රන්ථිස්ථාන විසඳ පහසුකොට ශාස්ත්‍රාගමාදිය ඔවුන්ට පුහුණුකරවාලීමෙන් බහුමානභාජනව සිටීමද—අවජාත ශිෂ්‍යපුත්‍රයන්ට දෘෂ්ටධර්මසාම්පරායික අර්ත්‍ථසිද්ධියට හෙතුවූ වචනයන්ගේ කීමෙන් ප්‍රයෝජනනැති කරුණු දැනහැඳින ඔවුන්පිපිසිටි පියුම්පත්‍රයක් මුඛසන්තොෂය පමණදක්වා සිසිලසඳුන්මෙන් මියුරුවචනය කීමෙන් සිත්ගෙණ තමාකෙරෙන්ම උගතමනා ශාස්ත්‍රාගමාදිය ඉගෙණ ඔවුන්ගේ හෘදය නැමැති කතුරෙන් ගෞරව ගුණනැමැති උත්පලපත්‍රයන් ඡෙදනයකරන්නාක්මෙන් ගුරුන්ගේ ගුණමකු කොට තමාගේ නුවනින්ම ප්‍රගුණකළ ශාස්ත්‍රමෙන් සෙස්සන්ට හඟවමින් ඔවුන්ගෙන් බහුමානය උපදවනු පිණිස:—

වාමෙන සූකරො හොති දක්ඛිණෙන අජාමිගො
සරෙණ නෙලකො හොති විසාණෙන ජරග්ගවොයි.

යනුවෙන් ඒ ඒ තැන අනුවන ජනයන් විසම්පත්කරවමින් ගුරුන්ගේ පරාර්මුඛයෙහි පැමිණි වචනයන් සම්මුඛයෙහි නොකියා අනික්ඛියමින් උන්ගේ ඇතිතාක් සුදුසු ගුණඅගුණසේ සෙස්සන්ට ප්‍රකාශකොට හිතෙසිකමක් නොව හිතෙසි තමන් බැව් හඟවා වසති එහෙයින් ඔවුන්ට කිවමනා අවවාද ව්‍යඤ්ජනවචනාදිය තමාගේ නුවනින් පරීක්ෂාකොට තත්වූපරිද්දෙන් දැනගෙණ ඔවුන්ගේද

හිත්නොතලා සිහිනුවණින් සෙදී ගැලවී සිටිමද.—දානය සීලය ශ්‍රැතය ත්‍යාගය ප්‍රඥාය යන පඤ්චධර්මයන්ගෙන් යුක්තව ප්‍රතිඝය අනුනය යන පාපධර්මදෙදෙනාකෙරෙන් දුරුව ධර්මානුධර්ම ප්‍රතිපත්තිපූජාදීන් බුද්ධපූජාකොට ලෞකික ලෝකොත්තර සම්පත් සිද්ධකරණු පිණිස යෙහෙන්වසන්නාවූ ශ්‍රාවකයන්වහන්සේ ශ්‍රැතබුද්ධනම්වන සේක:—

**ශ්‍රැතබුදුවරයන්ගේ සහ අභිඥාදිවූ චතුර්විධ ශිෂ්‍යසූත්‍රයන්ගේ ප්‍රවෘත්තිකථාවෝ**

—නිමි.—

මේ බුද්ධශාසනයාගේ අවශානයෙහි මතුපහළවන පඤ්චප්‍රකාරවූ අන්තර්ධානකථාවන් අතුරෙන් ධාතුඅන්තර්ධානයාගේ සහ පර්යාප්ති අන්තර්ධානයාගේ විභාගය බුද්ධගුණ ධර්මවිභාගකොට දක්වූ පරිච්ඡේදදෙක්හි ඇතුලත්කොට දක්වූ බැවින් මෙහිදු දක්වියයුතුවූ— ප්‍රතිවේධ අන්තර්ධානය ප්‍රතිපත්තිඅන්තර්ධානය ලිඞ්ගඅන්තර්ධානයයි කියා ත්‍රිවිධවූ අන්තර්ධාන කථාවෝම මේ සඞ්ඝගුණ විභාගපරිච්ඡේදයෙහි ඇතුලත්කොට දක්වනු ලැබෙත්:—

—[ එහිප්‍රතිවේධ අන්තර්ධානය නම් කවරහයත් ]—

යටකියනලද ක්‍රමයෙන් නොයෙක් ප්‍රභෙදඇති සෝවාන්මාර්ගය ඵලය සකෘදාගාමි මාර්ගය ඵලය අනාගාමිමාර්ගය ඵලය අර්හත් මාර්ගය ඵලය යන මේ සතරමග සතරඵලයද අර්ථප්‍රතිසම්භිදාය ධර්මප්‍රතිසම්භිදාය නිරුක්තිප්‍රතිසම්භිදාය ප්‍රතිභානසම්භිදාය යන සිව්පිළිසිඹියාවන් ආදිවූ හැමලෝකොත්තර ගුණය විදර්ශනාවපටන් පිරිහෙණකල්හි සිව්පිළිසිඹියාවේ පටන් ක්‍රමයෙන් පිරිහෙන්නේය. මෙසේ ක්‍රමයෙන් මහත් ගුණධර්මයන් පටන් පිරිහීගත අවුත් සෝවාන්මාර්ගයට පැමිණීමක්වත් නැතිව පිරිහී එයින් නීලකසිණයටද, එයින් ප්‍රථමධ්‍යානයටද, එයින් කසිණපරිකර්මාදියයි යන ධ්‍යානානුලෝමයටද, එයින් නිමිත්තොත්පාදනයටදැයි මෙසේ ක්‍රමක්‍රමයෙන් පිරිහී මාර්ගඵලලත් හැම ශ්‍රාවකයන්ගෙන් කෙළවර අධිගමලද්දහුගේ ජීවිතය නැසීයාමෙන් අධිගම ශාසනය පිරිහුනේ නම් වේ.

**මේ ප්‍රතිවේධ ශාසනාන්තර්ධානයයි.**

ප්‍රතිපත්තිඅන්තර්ධානය නම් කවරහයත්?—මෙසේ කල්‍යාමෙන් සතරමග සතරඵලයට පැමිණ තුන්ලොව වැඩවඩා වැස ක්‍රමයෙන් පරමායු නෙවුනුකල්හී දූවීයෙහි උ න් ව හ න් සේ ලා ගෙ න් ලත්

කර්මස්ථානානුකූලකසිණපරිකර්මාදියකොට තුදුස්ආකාරයකින් චිත්ත
පරිදමනය කොරෙමින් ඉර්ධිවිකුර්වනසම්පාදනයද නිර්මිතෝත්පාද
නයද අභිඥාදියට පැමිණීමද ශ්‍රැතශූඩාදීයෙන් චිත්තය මෘදුකිරීමද
අධිෂ්ඨාන විකුර්වනාදිවූ දශවිධ ඉර්ධිසම්පාදනාදියද නොහැකිව
විදර්ශනාකිරීමට උපදෙශයක් නොලැබීමෙන් මාර්ගඵල උපදවන්ට
නොහැකිවෙති. එතකුදු උවත් උත්සාහ කිරීම සුදුසුයයි සිතා ප්‍රති
පත්තිශිලාදිවූ නොයෙක් ගුණධර්මයන් රක්‍ෂාකෙරෙමින් චිත්තට
හේතුඋවමනාවෙසිද්ධ ධ්‍යානභාවනාදියකෙරෙති. මෙසේ උත්සාහ
කිරීමෙන් ආලෝකමාත්‍රයකුත් නොලැබ කල්‍යවත් චතුපාරිශුද්ධිශී
ලයපමණක් රක්‍ෂාකෙරෙති, එසින්කල්‍යවත් භික්‍ෂුහු පිරිසිඳුව සිල්
රකිම්හ, භාවනාකරම්හ, මාර්ගඵලාධිගමයක් සිඩිකොට ගතනොහෙ
ම්හ, මේකලට ආර්යධර්මප්‍රතිවේධයක් නැත්තේයයි කුසිතව අපි
කොතෙක් උත්සාහ කළත් නොවන දෙයක් නොවන්නේමය, ඊම
වැයම්කෙරීමෙන් ව්‍යශනවිඳිමම්දැයි පාපිඅලජ්ජී හීනපුරුෂකුශිතා
ධ්‍යාශයෙන් ඔවුනොවුන් කෙරෙහි වරදනිවරදනොසොයා නොදුනී
මෙන් නිස්සංකාව ක්‍ෂුද්‍රානුක්‍ෂුද්‍ර ශික්‍ෂාපදයන් ඉක්මවා වරදට පැමි
ණෙනුයේ හෙතෙම නුවනමද බැවින් මේ මේ දමිණ සවල්පවරදක්
මය එසිනුදු උනුනුන්දෙස්ගන්වා කියා ගැලවීමට බුදුන්වදාල ධර්මඇ
තැයි වදාලලෙසම ඔවුනොවුන් පාමුල්හී දෙස්ගන්වා කියමින්
චිත්තාඅදහසින් සමගිව වෙහෙසෙති, එසින් කල්ගියකල සුඛිත මුදි
තාදිහු සවතීනවූ කායව්‍යශන විඳිමට නොපිළිවන්ව රූක්‍ෂප්‍රතිපත්ති
පිරීමෙහි ප්‍රමාදව වෙසෙති, එසේ ප්‍රමාදව වශන ඔවුන් දුටු අව
ශෙෂ භික්‍ෂූහු ප්‍රතිපත්ති රක්‍ෂාකෙරීමෙහි උත්සාහනොවඩනි. ඒරූක්‍ෂ
පිළිවෙත් පිරීමෙහි යෙදිවශන භික්‍ෂූහු රැදුවල් දෙක්හීම සම්පිශම
කල්නොසලකා නිදිවර්ජිත කිරීම්ආදීයෙන් ත්‍රිවිධදොෂයන්ගේ උත්
සන්නවීමෙන් නොයෙක් ව්‍යාධිඋපදවා ජීවිතවිනාශාදිවූ අනෙකව්‍ය
ශනවලට පැමිණෙනු දක කුශිතපක්‍ෂයෙහිසිට ආදීනවානිසංසනො
දක්නානු දිවිරක්‍ෂා සිල්රැකෙයි සිල්රැක්ක නිවන්දහම් සාධාගනහැකි
යයි කියමින් මෙහැම ආදීනව සිතිකොට පිළිවෙත් පිරිමෙහි උත්
සාහ නොකෙරෙති, එතැන්පටන් ක්‍රමයෙන් ප්‍රතිපත්තිශාසනය පසු
බැස බැස පිළිවෙලින් ගුරුවරලපදෙස් පිරිහීමෙන් ලොවනැතිවූ
කල්හී ප්‍රතිපත්තිශාසනය පිරිහුනේ නම් වේ:—මේ ප්‍රතිපත්තිඅන්තා
ර්ධානයනම්.

ලිඞ්ගඅන්තර්ධානය නම් කවරහයත්:—මේ බුද්ධශාසනය මෙසේ
පවතිමින් සිට පිරිහීමෙන් කල්යත් යත් භික්‍ෂූහු සිවුරුවලදීනාකල
ර්ම ශික්‍ෂාපද පැනවුලෙස සිවුරු නොවලඳින් හස්තපාදදිවූ ඉන්ද්‍රිය
සංයමයෙනි යෙදී සත්පුරුෂයන් හා විනයදන්නා ලඥාවන්ත උපා

සකලජනයන්ට සතුටුඋපදිනාසේ වාසයනොකරති, භික්ෂූහු පාත්‍රය උපුබ්බයෙහිලා ග්‍රීවායෙහි එල්වාගෙණ භික්ෂාවෘත්තියෙහිඇවිදිති එයින් කල්යත්යත් පාත්‍රය අත්ලෙහිතබාගෙණහෝ උරෙහි තබාගෙණ හෝ ලබුකබල් ගත් භිජුකයන්මෙන් භික්ෂාවෘත්තියෙහි ඇවිදිති වලඳිනා සිවුරුත් රඳගහනාකල විනයානුකූලලෙස සරුප්සැටියේ නොර දයි රදතත් ඔටුඇට පැහැයක්මෙන් මදක් කාෂාවණී හෙදකොට රඳුපමණකින්ම මදදූසි කියා සිවුරෙහි අගෞරවයෙන් කැපලෙස නොරඳම සිවුරුවලඳිති-තවද කල්යාමෙන් එපමණවත් රඳන්නො කොට කසෙඩහිදූවළුපමණක්සිඳහැර දියනනකින්තෙමා කලල්කොට වලඳිති එසින් කල්ගිය කල්හි නැවත දහවිලූපමණක්සිඳ පරිබ්‍රාජක යන්මෙන් වස්ත්‍රය දෙපටකොට හිනවට පටක් දවටා පටකින් උරය වසා පොරවගෙණ දඬබිමිටයනාවුන්මෙන් අපි භික්ෂූමහයි කියා ඇවිදිති—තවද කල්යත් යත් මෙපමණකිනුත් ප්‍රයෝජනකින්දූසි වස්ත්‍රය හැඳගෙණ කසාකඩරෙද්දක් බොටුවෙනි බැඳගෙණ හෝ හිසවසාගෙණ හෝ අපි භික්ෂූමහයි කියා ඇවිදිති—එපමණ භික්ෂු භාවයකින් පුත්‍රදාරාදීන් සහිතව තුමූ කැපයෙන් ජීවත්‍ව ගතනොහී කෘෂිවනිජ්ජාදිවූ අගාරිකවූ ගිහිකර්මාන්තයෙන් ජීවත්වෙති—එතැන් දක්වා ඔවුන්ට දන්දෙන්නාහු සංඝයා උදෙසා දක්ෂිනාව දෙද්ද එකල්හි ඒ දනය සංඝයා උදෙසා දුන්හෙයින් දායකයන්ට අසංඛෙය්‍ය අප්‍රමෙයය විපාකදෙන්නේයයි ආනන්ද ස්ථවිරයනවහන්සේට වදාරණ බුද්ධරජතෙම "භවිස්සන්ති ඛො පනානන්ද අනාගත මද්ධානං ගොත්‍රභුනො කාසාවකණ්ඨා පරමද්දුස්සීලා පාපධම්මා තෙසු දුස්සීලෙසු සංඝං උද්දිස්සදානං දස්සන්ති තදාපහං ආනන්ද සංඝගතං දක්ඛිනං අසංඛෙය්‍යං අප්පමෙය්‍යං වදාමි"—සංඝගත දානයෙහි අනුසස් මෙසේ මහත්බව ප්‍රකාශකොට වදාළසේක—නැවත කල්යත්යත් ඔහු සිතනකල අපි ප්‍රාණඝාතාදි අකුසල්ත් කරමහ, සිවප්ආදි කෘෂිකර්මාන්තාදියත් කරමහ, මෙසේ ශ්‍රමණවෙසයට පිටත් නොපනත් නුසුදුසු දෑ කෙරෙමින් බුදුන්ගේ අර්හධ්වජයවූ චීවරය කරබැඳගෙණ ඉඳ පවුපුරාගන්නේ කින්දූසි කියා බොටුවෙහි දවටාගත් කසාවරදි කඩකඩා කැලෑපිටදමා දැතින් හිසපිරිමැද ඉඳින් යහපතගත් වෙසයෙන් මිදීගියමහයි සව කීයවූ ගෘහයට ගොස් පුත්‍රදාරාවන්ට එපවත් කියා එතැන්පටන් තමන්ගේ පුත්‍රදාරාවන් රක්ෂාකොට ජීවත්වෙති, මෙසේ ශ්‍රමණවිසය ඉතා මදකුත් ලොවිනැතිවම නැතිවීමෙන් මහණවිසය යන ලිංගාන්තය පිරිහුනේ නම් වේ—මේ ලිංගඅන්තර්ධානනම්-

මෙසේ ලෞකික ලෝකෝත්තරවශයෙන් විප්‍රකාරවූ සර්වඥාමාත්‍ය ගුණයන් ප්‍රකාශකොට දෙවිමිනිසුන් සහිත සියලු ලෝකයාහට

කරණලද සර්වඥතාඥානාව ඇතිහෙයින් සර්වඥෙය්‍යත දන්නාවූ මාගේ බුදුහු ශාස්තෘනම් වනසේක -එසේහෙයින් කියනලදී.

දෙවානඤ්ච මනුස්සානං ලොකෙ අග්ගඵලං දදං,
දදන්තං දමයන්තානං පුරිසාජඤ්ඤ තෙ නමො-ති.

ලෝවැඩපිණිස කරණලද මේ ශ්‍රීසද්ධර්මාවවාදසංග්‍රහයෙහි
සංඝගුණවර්ණනා පරිච්ඡෙදය කියා
නිමවනලදී.

---

මෙසේ සතරවන පරිච්ඡෙදයෙන් සංඝගුණවර්ණනා කිරීමෙන් ලෝවැඩදක්වා ඊට අනතුරුව දක්වන ශීලකථාවන් අතුරෙහිදු යථොක්තප්‍රකාරවූ විශෙෂ ගුණවර්ණනාවෙන් ඇති විසුද්ධවූ බුද්ධාදි රත්නත්‍රයෙහි සරණයම සියලුසත්ත්වයන්ට පිහිටවන කාරණයෙන් සරණ නම් වෙයි එහෙයින්—සරණාගමන සීලයාගේ ප්‍රභෙද ප්‍රභෙදානිසංස වර්ණනාකථාවෝද මදක් මෙහි දක්වනු ලැබෙත් ඒ කෙසේදයත්—අසරණසරණ සරණගත වජ්‍රපඤ්ජරකරුණානිධානවූ භාග්‍යවත් ශාස්තෘන්වහන්සේවිසින් බරණැස ඉසිපතනාරාමයෙහිදී යසකුලපුත්‍රාදීන් පැවිදිකොට රහත්ඵලයට පමුනුවා ලීමෙන් බොහෝ සත්ත්වයන්ට හිතසැපපිණිස ධර්මදෙශනාකරණ සමයෙහි සියළු දිව්‍යමනුෂ්‍යාදීන්ට උපාසක භාවයෙන් හෝ පැවිදිලබනාවුන්ට ප්‍රව්‍රජිතභාවයෙන් හෝ පලමුකොටම සරණගමනවිධියෙන් මේ බු ද්ධ ස ත්ත ව බ ස් නා පි ණි ස—බු ද්ධං ස ර ණං ග ච්ඡා මි, ධ ම්මං සරණං ගච්ඡාමි, සංඝං සරණං ගච්ඡාමි යන මේ සරණාගමන සූත්‍රය බුදුන් විසින්ම වදාරණලදී එහි සත්ත්වයන්ට වන සියළු සංසාර භයද චිත්තොත්‍රාසයද කායික දුක්ඛවෙදනාවද සතරඅපායෙහි දුක්ඛයද යන මේ සියලුම දුක්නසන හෙයින් මේ බුද්ධාදී රත්නත්‍රයට සරණයයි යන නමෙකි—ඉදින් වෙන්වෙන්කොට ඒ තුනුරුවන් ගුණ සලකතහොත් ලෝකයාට සරණවූ සුපුෂ්පිත මහපියුමක් වැනි බුදුන්ද ඒ පියුම්හි උපදනා මධුර රසයවැනි ධර්මයද ඒ මධුර රසය පීමෙන් සතුටුවන භෘඞ්ගසමූහයා වැනි සංඝයාවහන්සේද යන තුනුරුවන් ගුණසිහිකරණ කල සීලසමාදානාදි හැමගුණයන් දෙසනාකොට එහි සත්ත්වයන් යොදා පැවැත්වීමෙහු ප්‍රාණඝාතාදි පාපකර්මයෙන් වන නොයෙක් අනිෂ්ටවිපාක ආදීනව දක්වා පවුකිරීමෙන් සතුන් වැළකීමෙහු හිතාහිත දැන සේවන අසේවනාදිවසයෙන් දුක්ඛය නසනහෙයින් බුදුහු සත්වයන්ට සරණනම්වනසේක-සසර කාන්තාරින් සත්ත්වයන් එතරකිරීමෙහු කිසියම් අස්වැසිමක් නැත්තාවූ

සත්ත්වයන් අස්වසාලීමෙන් සියළු සසරභයනසනහෙයින් ධර්මයද සත්වයන්ට සරණනම්වන්නේය—ලොකයා විසින් දන්දීමෙන් පූජාකිරීමෙන් පමුනුවනලද ස්වල්ප සත්කාරය පවා ඔවුන්ට මහත්ඵලානිසංස ඇතිකරණහෙයින් ප්‍රත්‍යක්‍ෂතුවූ අෂ්ටාර්‍ය්‍යපුද්ගල සංඝයාවහන්සේද සත්ත්වයන්ට සරණනම්වනසේක.

මෙසේවූ සරණගුණයෙන් යුත් තුනුරුවන් ගුණ විශෙෂ ත්‍රිවිධ රත්නබවද ගුරුගුණවර්ණනා පරිච්ඡේදවල දක්වනලද ක්‍රමයෙන් අසා දැන එසේ සිහිකිරීමෙන් පලමු සිත්හී පැවති දෘෂ්ටිදශකයද, ම්ලාවිවද අසැබෑවද, දුරුකොට බුද්ධාදිරත්නත්‍රයෙහි ප්‍රසන්නබවද, ගුරුත්වයද, සිත්හිවඩාගෙන සංසාරයෙහි ජාතිදුක් ආදිවූ සියළුදුකට භාජනව අනාථව දුකින්ම පීඩිතව හැසිරෙණ අපට සසර්කතරින් එතරවීමට උපදෙස් අවවාදදීමට බුදුන් ඇර අන්කෙනෙක් නැතැයි කියාද ඒ සසරින් එතරවීමට පර්‍ය්‍යාප්තියහිනාවූ නවලොකොත්තර ධර්මය හැර අන් පිහිටෙක් නැතැයි කියාද වන්‍දනමානනාදිවශයෙන් කරණලද සත්කාරය මහත්ඵලකිරීමට අෂ්ටාර්‍ය්‍යපුද්ගල සංඝයාවහන්සේ හැර අන් පිහිටෙක් නැතැයි සිතින් අදහාගෙන මට මේ රත්නත්‍රයෙහි සරණයම සරණයයි දැන සිත්හිතබාගෙන බුදුන් වදාළ පාලියවූපරිද්දෙන් බුද්ධං සරණං ගච්ඡාමි යනාදී බසිනුත් කියා රත්නත්‍රයෙහි සරණයාම සරණාගමන නම්වේ—ඒ සරණාගමනයතෙම ලොකොත්තර සරණාගමනය ලෞකික සරණාගමනයයි කියා ද්වි ප්‍රකාරවේ—එයින් ලොකොත්තර සරණාගමනය නම් සත්ත්වයාගේ අප්‍රමාදය හෙතුකොටගෙණ දුඃඛාදි චතුස්සත්‍යයන්ගේ අවබෝධ වීමහා සමගම සෝවාන්මාර්ගයට පැමිණික්‍ෂණයෙහිම සරණයට විරුද්ධ ක්ලෙශයන් සමුච්ඡෙද ප්‍රහානයෙන් නසා පැමිණිහෙයින් විනාශ නිර්වාණයට අරමුනුවීමෙන් රත්නත්‍රයෙහි අචලප්‍රසාද සිත් උපදවීමෙන් ලොකොත්තර සරණාගමනයන්ගේ පිහිටීමවන්නේය—මේ ලොකොත්තර සරණාගමනයාගේ ඵලානිසංස කෙසේදයත්? සෝවාන්ඵලය සකෘදාගාමිඵලය අනාගාමිඵලය අර්හත්ඵලයයි යනාමේ චතුර්විධවූ ශ්‍රමණඵලය විපාකඵල නම්වේ—සියළු සසරදුකින් මිදීම අනුසස් නම් වන්නේය. එබඳු ලොකොත්තර සරණාගමනයාගේ, කිලුටුබවෙක්වත් බිඳීමෙක්වත් නොමඇත්තේයි—ඒ කවරහෙයින්දයත්? භවාන්තරයෙහිද මේ ආර්‍ය්‍යශ්‍රාවකතෙම අන්‍ය ශාස්තෘකෙනෙකුන් අපට සරණසේකැයි නොකියන්නේය.

තවද මේ ආර්‍ය්‍යශ්‍රාවකතෙම රහත්නොව භවාන්තරගතවූයේද තමාගේ ප්‍රාණය පරිත්‍යාගකරන්නේ වී නමුත් අන් ප්‍රාණයක් නොනසන්නේය, සුරාපානාදියක් නොකරන්නේය, යේ මෙසේයි.

යම්සේ ජාතිසම්පන්න හංසතෙම කිරිහා ජලය මිශ්‍රකොට එන් කලත් ජලය තෝරාහැර එක්බිඳුවකුත් නොගෙන කිරිපමණක්ම පානයකරන්නේද — ඒ එපරිද්දෙන්ම ආර්‍ය්‍යශ්‍රාවකතෙමේද සුරාමිශ්‍ර කරණලද ක්ෂීරයක් මුඛයෙහි වත්කළකල කිරිපමණක්ම ගිලෙන බව මිස සුරාබින්දුවකුත් නොගිලෙන්නේය, මේ ලොකොත්තර සරණයාගේ ප්‍රභෙද නිසංසයයි — ලෞකික සරණාගමනය නම් පෘථග්ජන සත්ත්වයන්ට ශ්‍රද්ධාමූලික සම්‍යක්දෘෂ්ටිය හෙතුකොටගෙන සිද්ධවන්නාවූ සරණය ලෞකික සරණාගමනය නම් වන්නේය — හේද බුද්ධාදි රත්නත්‍රයෙහි ගුණමහත්තත්ත්වය ප්‍රඥාසම්පන්න සත්ත්වයන්ගේ සිතට නිසසාංකාව අරමුණුකොටගෙන සරණාගමනයන්ගේ කිළුටු කාරණයන්ගෙන් දුරුව ශ්‍රද්ධාමූලිකව පවත්නාවූ සම්‍යක්දෘෂ්ටිය දශ පුන්‍යක්‍රියාවස්තුයෙහි සිතසෘජුභාවය ලැබීම සරණාගමන නමැයි කියති, මේ සරණාගමනය වනාහි ආත්මසන්නියර්‍ය්‍යාතනය තත් පරායනතාය ශිෂ්‍යභාවූපගමනය ප්‍රනිපාතයයි කියා සතරවැදෑරුම් වන්නේය, එයින් ආත්මසන්නියර්‍ය්‍යාතනනම් - කිසියම්වනත පුරුෂයෙක් සිතනුයේ අදපටන් මාගේ ආත්මය තුනුරුවන්ට පරිත්‍යාග කෙලෙමියි කියා ආත්මය තුනුරුවන් විෂයෙහි පූජාකෙලෙමියකියා ආත්මපරිත්‍යාගයෙන් යෙදී “අජ්ජාදිං කත්වා අහං අත්තානං බුද්ධස්ස නිය්‍යාතෙමි”යි කියාද — අජ්ජාදිං කත්වා අහං අත්තානං ධම්මස්ස නිය්‍යාතෙමියි කියාද - අජ්ජාදිං කත්වා අහං අත්තානං සංඝස්ස නිය්‍යාතෙමියි කියාද යනමේ වචනයන් වාක්භෙදකොට කියා මාගේ ජීවිතය තුනුරුවන්ටම්පිදීම් පිදිමියි ආත්මපර්‍ය්‍යාත්තාව ජීවිතපර්‍ය්‍යාත්තාව බුදුන්ම සරණයෙමියි-බුදුන්ම මට සරණය රක්ෂාස්ථානයක නිලීන ස්ථානයක උතුම් පිහිටෙකැයි යනාදීන් ආත්මය පිදීමෙන් ගන්නාවූ ආත්මසන්නියර්‍ය්‍යාතනසරණාගමනයේ පිහිටන්නේනම්වේ-තත්පරායනතානම් අදපටන් මට තුනුරුවන් සරණය පිහිටයයිකියා “අජ්ජාදිං කත්වා අහං බුද්ධපරායනො අජ්ජාදිං කත්වා අහං ධම්මපරායනො අජ්ජාදිං කත්වා අහං සඞ්ඝපරායනො ඉති මං ධාරෙථ” යන මේ වචනයෙන් බුද්ධාදිවූ රත්නත්‍රය මට පිළිසරණයේකැයි කියා මෙසේ සරණගැන්මෙන් ආලවකාදීන්ටසේ තත්පරායන සරණාගමනය පිහිටන්නේයි — ශිෂ්‍යභාවූපගමනය නම් අදපටන් මම තුනුරුවන්ටම අතවැසිවීමියි කියා සාක්ෂිකොට මෙසේ ත්‍රිවිධරත්නයටම ශිෂ්‍යභාවයට පැමිනීමෙන් අජ්ජාදිං කත්වා අහං බුද්ධස්ස අන්තෙවාසිකො, අජ්ජාදිං කත්වා අහං ධම්මස්ස අන්තෙවාසිකො, අජ්ජාදිං කත්වා සංඝස්ස අන්තෙවාසිකො ඉති මං ධාරෙථ යන මේ වචනයෙන් බුද්ධාදි රත්නත්‍රයෙහි ශිෂ්‍යභාවයට පැමිණියෙමියිකියා සරණයගැනීමෙන් ශිෂ්‍යභාවූපගමන සරණාගමනයෙහිපිහිටන්නේය ප්‍රනිපාතය

නම් අදපටන් මම බුද්ධාදී තුනුරුවන්ට මමසරණයයි හිසවිඳිමි තුනුරුවන් සාරා එලඹෙමි තුනුරුවන් දක්නම සන්තුෂ්ටවෙමි අනික් ශාස්තෘකෙනෙකුන් වැඩදායක අනුශාසනාඇතිසේකැයි නොකියමි වෙන ශාස්තෘකෙනෙකුන්ට අඤ්ජලිසාමීචිකර්මයක් නොකරමි මේ බව හැමදෙනාම දනිත්වයි කියා ශාක්ෂිකොට බුද්ධාදී රත්නත්‍රයෙහි මහත් ආදරයෙන් යටත්ව නිවප්‍රවෘත්තියෙන් භක්තිඇතිව පැවතීමෙන් "අජ්ජාදිං කත්වා අහං අභිවාදනං අහං පච්චුට්ඨානං අඤ්ජලිකම්මං සාමීචිකම්මං බුද්ධාදීනං යෙව තිණ්ණං වත්ථූනං කරෝමි ඉති මං ධාරෙථ යන මේ වචනය කියා බුද්ධාදිවූ රත්නත්‍රයට ඉතා මහත් ආදරකරමින් සරණයගැන්මෙන් ප්‍රනිපාතනසරණාගමනයෙහි පිහිටන්නේය— එහෙයින් තුනුරුවන් සරණයන උපාසකකෙනෙකුන් විසින් හෝ උපාසිකා කෙනෙකුන් විසින්හෝ මෙකී සතරප්‍රකාරයන් අතුරෙන් එක් ආකාරයක් කරන්නාහු විසින් ත්‍රිවිධරත්නයෙහි සරණගතවූයේ නම් වේ-තවද යමෙක් මාගේ ජීවිතය ආත්මය බුදුන්ට පූජාකෙරෙමි චිත්තය පිදිමි ජීවිතප්‍රමානයෙන් තුනුරුවන් සරණගනිමි ජාතිප්‍රමානයෙන් තුනුරුවන් සරණගනිමියි භවප්‍රමානයෙන් තුනුරුවන් සරණගනිමි මට ත්‍රිවිධරත්නයම ප්‍රතිෂ්ඨාධාරය ත්‍රිවිධරත්නයම් රක්ෂාස්ථානය ත්‍රිවිධරත්නයම සියළු සසරභයින් මිදී සැඟවීමට නිසි නිලීනස්ථානය ත්‍රිවිධරත්නයම් පරමප්‍රතිෂ්ඨාධාරයයිකියා මෙසේ පිහිටීමද, ආත්මසන්නියාත්‍යතන සරණාගමන නම් වෙයි.

තවද ඒකාන්තයෙන්ම අන්‍යශාස්තෘවක්හුළුතුමැයි භක්තියෙන් නොගනිමි මාගේ සම්‍යක් සම්බුද්ධරාජෝත්තමයන්වහන්සේම දකිමි මාගේ ශාස්තෘන්වහන්සේමදකිමි මාගේ සර්වඥයන්වහන්සේම දකිමි මාගේ දිපද්‍යෙත්තමවූ මුනීන්ද්‍රයානන්වහන්සේම දකිමි මාගේ ලෝකනාථවූ අනධිවරශාස්තන්වහන්සේම දකිමියි යනාදීන් මේ වචනයන් කියා මහාකාශ්‍යපස්ථවිරයන්වහන්සේ විසින් ගත්තාවූ සරණය ශිෂ්‍යභාවූපගමන සරණාගමන නම් වේ

තවද "සො අහං විචරිස්සාමි ගාමාගාමං පුරාපුරං නමස්සමානො සම්බුද්ධං ධම්මස්ස ච සුධම්මතං" යනාදීන් ආලවකාදීන් විසින් ගත් සරණාගමනය තත්පරායන සරණාගමන නම් වේ.

තවද බ්‍රහ්මායුනම් බ්‍රාහ්මණතෙම ලොවුතුරා බුදුන් දැක තමා හුන් අස්නෙන් පැනනැඟී උතුරුසළුව ඒකාංසකොට බහාගෙන භාග්‍යවතුන්වහන්සේගේ ශ්‍රීපාදයුග්මයට පසඟපිහිටුවා වැඳ සිඹ සනහා දෑතින් දෙපතුල හසිහබා හිසපිසිමින් ස්වාමීන්වහන්ස මම බ්‍රහ්මායු බ්‍රාහ්මණනම් වෙමියි කියා තුන්විටෙක නමඅසවා කියමින්ද

ග්‍රාහාවූ සරණය ප්‍රනිපාත සරණාගමන නම් වේ—තවද නෑගෙස්ත්
කුලාචාරනිසා වැඳීමය රජ්ජුරුවන් ආදී ශ්‍රෙෂ්ඨයන්ට භයනිසා වැඳී
මය ගුරුවරයන්ට සිල්පඉගැන්වීම් පිණිස වැඳීමය යන මේ නමස්
කාර කිරීම හෙතුකොටගෙන සරණය පිහිටන්නේත් නොවෙයි
බිඳෙන්නේත් නොවෙයි යමෙක් වනාහි මුන්වහන්සෙ අග්‍රදක්ෂිණෙ
ය්‍ය සේකයනාදීන් බුඩාදි රත්නත්‍රයට නමස්කාරකරන්නේ වී නම්
සරණයෙහි පිහිටන්නේවෙයි එසේ පිහිටි සරණඇති සත්‍වතෙම
මිථ්‍යාලබ්ධි ඇත්තෙකු හට මූ මාගේ නෑකෙනෙකැයි කියාවත් උන්
කෙරෙහි භයෙන්වත් උගන්නා ශිල්පයක් නිසාවත් කරණලද නම
ස්කාරය නිසා සරණයෙන් පිරිහෙන්නේත් නොවෙයි-තවද ඤාති
වශයෙන් වැඳීම නම් යම්සේ ශාක්‍යවංශයෙහි ජාතවූ උපන් කෙනෙ
ක් හෝ 'කෝලියවංශයෙහි උපන් කෙනෙක් හෝ බුදුනු අපට
ඤාතිසම්බන්ධයක් ඇතිසේක, නෑකමින් ඉතිරිව සිටිනා තැනැත්හ
න්වහන්සේට නොවැඳීම යහපත්නොවන්නේයයි සිතා ශාක්‍යකෝ
ලියයෝ එපරිද්දෙන් වඳිද්ද ඔවුන්ගේ ඒ වැඳීමෙන් සරණය පිහි
ටන්නේනොවෙයි —යමෙක් සිතනකල මේ ශ්‍රමණ භවත් ගෞතම
යන්වහන්සේ ලොකපූජ්‍යසේක මහත්වූ ආනුභාව ඇතිසේක, එසේ
වූ මුන්වහන්සේට නොවැඳී කල්හී අනර්ථයක් පමුනුවාලනසේකැයි
සිතා භයින් වඳිද එසේ වැඳීමෙනුදු සරණපිහිටන්නේ නොවෙයි—
යමෙක් සිතනකල බුදුන්බෝධිසත්‍වකාලයෙහි පහළකළ යම්කිසිසිල්
පයක් උගත්තෙද ඒ බව සිහිකෙරෙමින් හෝ බුදුවූ කාලයෙහි
පහලකොට දුන් සිල්පයක් සිහිකොට හෝ නොහොත් "එකෙන
භොගෙ භුඤ්ජෙය්‍ය ද්වීහි කම්මං පයොජයෙ චතුත්‍ථඤ්ච නිධාපෙය්‍ය ආප
දාසු භවිස්සති" යනුවෙන් වදාරණලද අනුසාසනාවක් ඉගෙන හෝ
මුන්වහන්සේ මාගේ ආචාරින්වහන්සේයයි කියා වඳින්ද එසේ
වැඳීමෙන් සරණය පිහිටන්නේ නොවෙයි, තවද යමෙක් වනාහි
මේ සර්වඥයන්වහන්සේ සියළු ලොකවාසී සත්‍වයන් විසින් කරණල
ද සියළුම දානමානාදි සත්කාර පිලිගැන්මෙන් සියළු අභිවෘද්ධි වඩ
වඩා කිරීමෙන් සියළු සැපදෙනනාවූ අග්‍රදක්ෂිණෙය්‍යභාවයෙන් උත්
තම්වූ නිවන්සැපදෙන මෑනිකෙනෙකුන්වහන්සේයයි කියා මහත්වූ
සද්ධාචිත්තයෙන් නමස්කාර කෙරේද එසේම ධර්මයටද ආදර උපදවා
එබඳු බුදුරජානන්වහන්සේ කෙරෙන්ම පහලවූ උතුම් නෛර්‍යාණි
නික ධර්මයයි කියා නමස්කාරකෙරේද, එසේම සංඝරත්නයටද
ආදරඋපදවා එබඳු සද්ධර්මයට භාජනවූ සියළු ලොකයාහට පින්කෙ
ත්වූ සිටි මනාපිළිවෙත්හි යෙදීවසන බුද්ධපුත්‍රවූ උතුම් අෂ්ටාර්‍ය්‍යපුද්
ගල සංඝයාවහන්සේයයි කියා ආදරඋපදවා නමස්කාර කෙරේද
එසේවූ නමස්කාරකිරීමෙන් සරණගතවූයේ නම වේ, මෙසේ පිහිටි

සරණඇති තැමදෙනා විසින්ම යටකියනලද ක්‍රමයෙන් මිථ්‍යාදෘෂ්ටිගතයන් ආදි යිසිවක්හට මොහු අපගේ සියළු දුකට පිහිටවන්නේයයි දෘෂ්ටිවශයෙන් ආදරඋපදවා වැඳීමෙන් සරණකොට ගැන්මෙන් මෙළතුම් බුද්ධාදිරත්නත්‍රයෙහි සරණය බිඳීමටද නොපමුනුවා තුනුරුවන් ගුණනොදන්මෙනුත් සැකකිරීමෙනුත් ගුණ අගුණකොට සිතාගැන්මෙනුත් තුනුරුවන්ට අනාදරකිරීමෙනුත් සරනය කිළුටුවන හෙයින් එබඳු කිළුටුභාවයකටද නොපමුනුවා නුවනැත්තන් විසින් ලෞකිකසරණාගමනය රක්ෂාකටයුත්තේය—ඒ තුනුරුවන්ට අනාදරනම් කවරහයත්? බුදුන්ගේ ශාරීරිකධාතුපිහිටුවාකල දාගැබ් ආදියට ආසන්නව ඉඳ එහි ගොස් නොවඳීද චෛත්‍යය පේනතන්හී උරදෙකවසා පෙරවාසිටිද පත්කුඩාදිය ඉසට කොටයේද වහනනැගියේද පෙනෙන තැන සිට ස්නානය කෙරේද. මලමූත්‍රකොරේද යනාදිවශයෙන් බුදුන්ට අනාදර දැකිරීමය—බණඇසීමට කැඳවූකල්හි බණඅසනනාට නොයේද, ආදරඇතිව නොඅසාද කථාකොට අසාඉඳීද, සකස්කොට බණනොගනීද, ආදරඇතිව අනුන්ට නොකියාද යන මේආදිවශයෙන් ධර්මයට අනාදරකිරීමය භික්ෂූන් හුන්තැන්හී අවසරනොගෙන හිඳීද, අවසරනොගෙන බණකියාද, ප්‍රශ්ණවිසඳද, භික්ෂූන් ඇඟගැසීයේද, එසේම ඉඳීද, පිලියෙන් හෝ අතින් හෝ අකවටුගසාගන ඉඳීද, සහමැද දෙවුරවසා පෙරවගෙන ඉඳීද, කුඩපත් ඉසටකොට සිටීද, වහනනැගිසිටිද යන මේ ආදිවශයෙන් කරණ අනාදර එකනමකට කළ අනාදර සියළු සංඝයාවතන්සේට කළ අනාදර නම් වෙයි—ඒ සංඝරත්නයට අනාදර කිරීමය යන මේආදි ක්‍රමයෙන් පවත්නා අනාදර තුනුරුවන් විෂයෙහි කිරීමෙන් සරණාගමනාදිය කිලිටුභාවයට පැමිණීමෙන් මහත් ඵල මහානිසංස නැතිබවදැන එසේ කිලිටුභාවයටම නොපමුනුවා සරණාගමනය පිරිසිදුවම රක්ෂාකටයුත්තේය.

මෙසේරක්නාලෞකිකසරණාගමනයෙහි අනුසස්කවරහයත් සුගතියෙහි භවයේඋපදවා සම්පත්ලැබීමද සියලු භොගසම්පත් ලැබීමද එහි ඵලනම් වන්නේය, මෙම ලෞකිකසරණාගමනය සාවද්‍යඅනවද්‍ය වසයෙන් විප්‍රකාරවේ, එහි සාවද්‍යනම් වරදසහිතබවයි එසින් අනිෂ්ටවූ අපලවූ දුක්විපාකඇත්තේය, අන්‍ය ශාස්තෘආදීන්කෙරෙහි ආත්මපරිත්‍යාගකිරීමෙන් හෝ ඔවුන්ම සරණකොට පිහිටසිතාගැන්මෙන් හෝ අදපටන් මම අතවැස්සෙමි කියා ශිෂ්‍යභාවයට පැමිණීමෙන් හෝ යටත් නිව පැවතුන් දක්වා සරණයම සිතා වැඳීමෙන් හෝ සරණය බිඳෙන්නේය. එසේ ශාස්තෘ නම්ලද මිත්‍යාලබ්ධිඇත්තාවූන් විසින් පනවනලද ඒකාන්තයෙන් අධර්මවූ ඔවුන්ගේ

ධර්මයෙහිද ඒ ධර්මානුගතිපිළිවෙත්හි යෙදී වසන මහාශ්‍රාවකයන් කෙරෙහිද ආදර උපදවා ගුණවශයෙන් සිත්හි තබාගෙණ ආත්මපරිත්‍යාගාදිය කිරීම හෙතුකොටගෙණ සරණාගමනභෙදයවන්නේය, යම් කලෙක්හි ඔවුන්ගේ ගුණවශයෙන් කල්පනා නොකොට අන්‍යශාස්තෘන්හා ඉසුරුමත් රාජාදීන්කෙරෙහි යම්කිසිකාරණයකින් සරණවශයෙන් නොසිතා සහාය උපකාරාදියක් පතා ආත්මය පරිත්‍යාග කිරීමෙන් සරණභෙදය නොවන්නේය, එසේම යම්කලෙක්හි ගුණවශයෙන් කල්පනානොකොට සහාය උපකාරවශයෙන් සළකා තත්පරායන වීමෙනුදු සරණයනොබිඳෙන්නේය, එසේම යම්කලෙක්හි කිසිකෙණෙකුන්ගේ ගුණවශයෙන් කල්පනානොකොට යම්කිසි කර්මායතනාදි ශිල්පයක් උගන්නාපිණිස ශිෂ්‍යභාවයට පැමිණියේවේද එයින් සරණය නොබිඳෙන්නේය, යම් කලෙක්හි වන්‍දනාදිය කරණුයේ තීර්ථකාදීන් දක්ෂිණාර්හවශයෙන්ම කල්පනාකොට "අප විසින් කරණලද වන්‍දනාදිය ලැබීමෙන් මහත් ඵල සාදදෙන්නේය"යි සිතා වැඳීමෙන්ම සරණය භෙදවන්නේය, තීර්ථකයන්කෙරෙහි පැවිදිවූ මේඅපගේ නෑකෙණෙකැයිසිතා වඳනාහුගේ සරණය නොබිඳෙන්නේය, ලොකපූජ්‍යවූ රජතෙම නොවැඳීකල අනර්ථකරන්නේයයි භයින් වඳිනාහුගේද එසේම යම්කිසි ශිල්පයෙක්හි ශික්ෂාවන තීර්ථකයෙකුදු "මාගේ ආචාර්‍ය්‍යකෙණෙකැ"යි සිතා වඳිනාහුගේද සරණය නොබිඳෙන්නේය, එසේම යම්කිසිවෙක්හුගේ අන්‍යවූද බහුශ්‍රැතභාවාදිගුණයන්සළකා ගෞරව උපදවා වැඳීමෙනුදු සරණය නොබිඳෙන්නේමය, එහි අනවද්‍යවිපාකනැතිහෙයින් අඵලයි, කාලපරිච්ඡෙද නොකොට ගන්නාලද ඒ මේ සරණාගමනයතෙම ජීවිතාවසානය දක්වා පැවතීම වනබැවින් හා චුතවන ස්කන්ධයන්ගේ විනාශය හා සමකාල් පැවතීම ඇතිහෙයින්ද මරණය හා එක්ව බිඳීම වන්නේය.

ඒ ලෞකික සරණාගමනයාගේ භෙදය සාවද්‍යය නිරවද්‍යයයි කියා ද්විප්‍රකාරවන්නේය, එහි අනික් ශාස්තෘවක්හට ආත්මපරිත්‍යාගාදිය කිරීමෙන් සරණය බිඳීම සාවද්‍යනම්වන්නේය, මරණින් මතු සරණයාගේ බිඳීම නිරවද්‍යභෙදය නම් වන්නේය, . කාලපරියන්තව පිහිටාගත්සරණශීලයාගේ ඒ කෙළවරවූ කාලයෙන් මත්තෙහි යම් නොපැවැත්මෙක් ඇද්ද ඒ නොපැවැත්ම භෙදව්‍යවහාරයක් නැතද කාලපරියන්තව සමාදන්වූ ශීලයාගේ කෙළවරවූ ඒ කාලයෙන් මත්තෙහි නොපැවැත්ම මෙනැයි ප්‍රතිපත්තිසංග්‍රහයෙහි දක්වනලදී, එසේම මරණින් ඔබ්බෙහි සරණභෙදය ඇතිනමුදු මත්තෙහි උපදනා ජාතිවල සුචරිතකාරණ ඇතිවීමෙන් ජීවිතාන්තායදක්වා රක්ෂාකළාවූ සරණශීලයතෙම විශෙෂභාගී

වන්නේය, එහෙයින් මේ බුද්ධශාසනයෙන් පිටත් සසරදුකින් මිදෙනසේ නිවන්මග පා අනුශාසනාකරණ ලොව්තුරාබුදුන්හැර එසේ අනුශාසනාකරණ අන්‍යශාසනාවූ යම් කිසි දෙවිකෙණෙක් හෝ බුදුකෙණෙක් හෝ ලොව ඇතිසේ කැයි කියාද එසේම උතුම් නිවන්මග ප්‍රකාශවූ සද්ධර්මයෙක් ඇතැයි කියාද එසේම මනාපිළිවෙත් පුරණ උතුම් නිවන් මගට පැමිණීමට උත්සාහකරණ සැවිදිකෙණෙක් ඇතැයි කියාද සිතින් අදහාගෙණ කියනලද ක්‍රමයෙන් ජීවිතපරිත්‍යාගාදිය කොට යමෙක් සරණාගත්තේ වීනම් ඒක්ෂණයෙහිම උතුම්වූතුනුරුවන් සරණකොටගත් ඒ සරණය බිදෙන්නේයයි දතයුතු, ඒ කෙසේදැයි කිවහොත්, අපණ්ණක ජාතකදෙශනාවෙහි ආක්‍රමයෙන් අසාදතයුතු.

අප බුදුරජාණන්වහන්සේ ජේතවනාරාමයෙහි වැඩවසන සමයෙහි අනේපිඬුමහසිටානෝ තමන් යහලුපන්සියයක් පමණ අන්‍යතීර්ථකභක්තිගත්තවුන් කැඳවාගෙණ බොහෝමල්ගඳවිලවුන් තෙල් මී සකුරු ඈ බෙහෙත්බඩු සිවුරුපිළිආදිය ගෙන්වාගෙණ විහාරයටගොස් මල් සුවඳ ආදියෙන් බුදුන්ට පූජාකොට සංඝයාවහන්සේට බෙහෙත්බඩුසිවුරු පිළිගන්වා බුදුරජාණන්වහන්සේට සමීපව හුන්කල්හි ආකාශගංගාව බිමට බානසේ ඉතාමිහිරිවූ බ්‍රහ්මස්වරය විහිදුවා භාග්‍යවතුන්වහන්සේ බණවදාළසේක, ඒඅසා අන්‍යතීර්ථක ලබ්ධිගත්තාහු ඒ තීර්ථක සරණය හැර බුදුන් සමීපයෙහි සරණගතව අනේපිඬුමහසිටාණන් සමග විහාරයට අවුත් දන් දෙති, බණ අසති, සිල් රකිති, පෙහෙවස් වෙසෙති, එසේම ඔවුන් තුණුරුවන් කෙරෙහි පැහැද පින්කම් කරමින් වසන කල්හි බුදුහු සැවැත්නුවරින් නික්ම රජගහනුවරට වැඩිසේක, එකල්හි තීර්ථක ශ්‍රාවකයෝ බුද්ධාදිතුණුරුවන්ගේ සරණයබිඳ තීර්ථකසරණයම ගත්තාහුය, බුදුරජාණන්වහන්සේත් සත්අටමාසයක් ඇවෑමෙන් සැවැත්නුවර දෙව්රමටම පැමිණිසේක, එකල්හි අනේපිඬුමහසිටානෝ පෙරසේම තීර්ථකසරණ ගිය ඒ පන්සියයක් දෙනාගෙණ ගොස් බුදුන්දැක සුවඳ මල් ආදියෙන් පූජාකොට වැඳ එකත්පස්ව හිඳ ඔහු හැමදෙනා උතුම් සරණය බිඳ තීර්ථකසරණය ගිය බව දැන්වූකල්හි බුදුරජාණන්වහන්සේත් “එම්බා උපාසකවරුනි යටින් අවීචිමහානරකයහා මත්තෙන් භවාග්‍රය අවසන්කොට සරස අනන්තාපරිමාණ ලොකධාතුයෙහි ශීලසමාධ්‍යාදි ගුණරත්නයෙන් බුදුන් සමකෙණෙක් හෝ වැඩිතරම් කෙණෙක් හෝ නැතිහෙයින් නොයෙක් ලෙසින් බුද්ධාදිරත්නත්‍රයෙහි ගුණ ප්‍රකාශකොට මේ රත්නත්‍රයෙහි සරණ ගතාවූ අය අපායට නොගොස් සුගතියෙහි භවභොගසම්පත් ලැබිමද සරණාගමන ඵල නම් වෙයි වදාරණ බුදුරජාණන්වහන්සේ:—

යෙ කෙචි බුද්ධං සරණං ගතාසෙ න තෙ ගමිස්සන්ති අපායං
පහාය මානුසං දෙහං දෙවකායං පරිපූරෙස්සන්ති. යි—

යනාදීන් සරණාගමන ඵල ප්‍රකාශකොට යම්කෙනෙක් බුත් සරණ ගියෝද දහම් සරණ ගියෝද සඟසරණ ගියෝද ඒ හැම දෙව්ලොව ඉපදීම පමණක් නොවෙයි, ඒකාන්තයෙන් අමාමහනිවණුත් සිද්ධකරන්නාහුයයි වදාරා එසේවූ බුදුසරණයද්හිද අන්‍යතීර්ථිකයන් සරණගන්නාවූ තොපවිසින් ඉතා නුසුදුස්සක් කරණලද්දේය, එම්බා උපාසකවරුනි පළමුත් බොහෝ මිනිස්සු සරණනොවන නුසුදුසු අයගේ බස් සරණයයි අනුවණින් ගෙණ අමනුෂ්‍ය කාන්තාර මාර්ගයෙහි යක්ෂයන්ට ගොදුරුව මහත් විනාශයට පැමිණියාහුය, අවිරුද්ධවූ තෙපුල්ඇති මහ උතුමන්ගේ බස් නුවණැත්තාහු මැනවැයි ගෙණ එබඳු යක්ෂාධිගෘහීත කාන්තාර මාර්ගයෙහි සැපතට පැමිණියාහුයයි වදාළසේක, එවිට අතීතකථාව ශ්‍රවණයට කැමති අනේපිඬු මහසිටාණන් විසින් ආරාධිතවූ තිලෝගුරු බුදුරජාණන් වහන්සේ යටගිය දවස බරණැස බ්‍රහ්මදත්ත නම් රජ රජකරණ සමයෙහි පුරණලද බොධිසම්භාරඇති අප මහබෝසතාණන්වහන්සේ ශාර්ථවාහකුලයක ඉපිද වැඩිවිය පැමිණ වෙළඳාමින් ජීවත්වනුවෝ ගැල් පන්සියයක් බඩු පුරාගෙණ වෙළඳාමට නික්මුණු කල්හි එසේම ගැල් පන්සියයක් බඩු පුරාගෙණ අනික් ශාර්ථනායක වෙළෙන්දෙක්ද "මම පෙරටුව යෙමි"යි කියා පළමුව නික්ම ගොස් තමා නුවනමද හෙයින් මිනිසුන් හා ගොන් දහස ඇතුළුවූ සියල්ලම විනාශයට පැමිණිබවද යහපත්නුවණඇති ශාර්ථනායක වෙළඳතෙම පසුව යාමෙහි අනුසස් නුවණින් බලා නැවත නික්ම ගොස් තමන් නුවනැති හෙයින් අමනුෂ්‍ය උපද්‍රවයෙනුත්මිදී මහත් ලාභයට පැමිණ සියලු පිරිවර සහිතව අභිමතාර්ථසංසිද්ධියට පැමිණියේවේදැයි යනාදි අතීතකථා සියල්ලම ගෙණහැර දක්වා වදාරා එම්බා උපාසකවරුනි මෙසේ උතුම් නුවනැති පුරුෂයාගේ බස්අසා ඔහු භජනය කළ හැමදෙනාට සියලුම වැඩසිද්ධවීද එමෙන් සාරාසංඛ්‍ය කල්පලක්ෂයක් මුළුල්ලෙහි දානශීලාදි දශධර්මයන් පුරා පඤ්චමහාපරිත්‍යාගයන් කොට තොප සියල්ලවුන්ටම පිහිටවන පිණිස සකලක්ලෙශයන් නසා සර්වඥපදප්‍රාප්තවූ මාත් එසේවූ මාවිසින් ප්‍රතිවෙධකරණලද සියලු සංසාරදුඃඛය නසන්නාවූ සියලු සද්ධර්මයන් ඒ මාගේ ධර්මය අසා සකලක්ලෙශයන් දුරුකොට සුප්‍රතිපන්නතාදී ගුණගණාඞ්ගසඞ්ගතව සිටි සඞ්ඝරත්නයත් භජනය නොකොට රාග ද්වෙෂ මොහාදියෙන් වැලඳගත් නොයෙක් ලබ්ධිගෙණ ලොකායත ව්‍යාකරණ ශාස්ත්‍රඥහු යන මිථ්‍යාබස් ඇත්තාහුද ඔවුන් විසින් කියන ක්ලෙශවර්ධනය කරන්නාවූ ධර්මය යන වචනයන්ද මිථ්‍යාමාර්ග

සට පැමිණිසාවූ ශ්‍රාවකයන්ද සරණයයි ගෙණ භජනය කරන්නාවූ තොප හැමටම සතරඅපායෙන් ගැලවී නිවන් දක්නට සුදුසු කුශල ධර්මයන්ගේ ප්‍රතිලාභයෙක් නොවන්නේයයි යනාදින් චතුස්සත්‍යය දෙශනාකොට වදාලසේක, ඒ ධර්මදෙශනාවගේ කෙලවර ඒ පන්සියයක් උපාසකවරු සෝවාන්ඵලයට පැමිණියාහුය, මෙසේ සියලු සත්‍වයන්ට පිහිටවන ත්‍රිවිධරත්න සරණය දක්වා ලොකයාහට කරණලද උතුම් සද්ධර්මානුශාසනා ඇතිහෙයින් බුදුරජතෙම ශාස්තෘනාමීවනසේක, ඒ එසේමය, ලොකයෙහි සියලුම තීර්ථකයෝ කාමූපාදානයාගේ ප්‍රහාණියත් දෘෂ්ටිඋපාදානයාගේ ප්‍රහාණියත් සීලබ්බතුපාදානයාගේ ප්‍රහාණියත් යහපතැයි කියා ගත් ආත්මය යහපතැයි කියා ගත් ආත්ම උපාදානයෙන් වන දෘෂ්ඨක පඤ්චස්කන්ධවිභාගය තත්වූ පරිද්දෙන් සලකා මේ අනාත්මයයි කියා ගන්නා එකතීර්ථකයෙකුත් නැත, එබැවින් ඔවුන්ගේ වචනයත් ප්‍රතිපත්තියත් සත්‍වයන් නිවණට පමුණුවාලිමක් නැතිහෙයින් නෛර්යාණික නොවන්නේය, ඔවුන්ගේ වචනය ඇසුවාවූ ජනයාගේ ඒ ගුරුන් කෙරෙහි කළප්‍රසාදයත් ඔවුන් සසරදුකින් මුදන්නේ නොවෙයි, ඒ එසේමය, තීර්ථකශ්‍රාවකතෙම ප්‍රාණඝාතාදි පව් නොකටයුත්තේයයි කියා අවවාද කරන්නේවෙයි, ඒ ඇසූ ශිෂ්‍යතෙමේද "ප්‍රාණඝාතාදිය නොකරමි"යි කියා ප්‍රතිඥකරන්නේවෙයි, ඒ ගුරුශිෂ්‍ය දෙපක්ෂයෙහි ඇත්තෝම රාගාදි අකුසල් නසා නිවන් නුදුටු හෙයිනුත් සසර සත්‍වයන්ගේ ඉපදීම අක්මුල් නැතිහෙයිනුත් අවවාද කළාවූ ශාස්තෘතෙම ඉදින් සිංහව ව්‍යාඝ්‍රව දිවිව බලල්ව උපන්නේවේද, ඔහට ශිෂ්‍යව සිටි අය මුවව ඌරුව කුකුල්ව මූස්කව උපන්නාවුන් දැක "පෙර අපි ප්‍රාණඝාතාදි පව් නොකරණසේ මොවුන්ට අවවාද කෙළෙමහ"යි කියාද, "මොහු අප අවවාදයෙහි සිට අපට ප්‍රත්‍යාදියෙන් උපස්ථාන කෙළේවේදැ"යි කියාද, ස්වානති මෛත්‍රියක් වත් කරුණාවක් වත් නොකොට උන්ගේ මස්තකයට පැන නියපහුරෙන් පලා දුඹිකොට සල්ව සල්වා අල්වාගෙණ ලේ බී මස් කන්නේ හෝ වෙයි, නැවත ආචාරීහු මෘගසූකරාදි ඒ ඒ ජාතිවල උපන්කල සිංහ ව්‍යාඝ්‍ර දිවි ආදි සතුරු ජාතිවල උපන් ශිෂ්‍යයෝද එසේම අල්වාගෙණ "මොහු අපට සරණව උපදෙස් දුන් ආචාරීහුය"යි කියාද, "අප විසිනුත් ප්‍රාණඝාත නොකරණසේ ප්‍රතිඥදෙන ලදැයි"ද නොසලකාම මරාකන්නාහුය, එබැවින් ඔවුන්ගේ ප්‍රසන්නතාව නුනුවනින් සේදී උපදවාගත් අස්ථිරදෙයක්වෙයි, රා බී මත්වහොත් කැනහිලා කෙරෙහි බමුණා කළාවූ චිත්තප්‍රසාදය මෙනි, ඒ කෙසේදයත්?:—

පෙර එක් කැනහිලෙක් රාත්‍රියෙහි නුවරට පැමිණ රා පෙරා ලූ තැනින් රාමණ්ඩ කා මත්ව තෝරකැලයක හොත්තේය, ඉරු

උස්ව නැගිකල්හි පිබිද මෙහි විසීමද මිනිසුන්ට පෙණී පෙණී යාමද මට උවදුරුවන්නේය, ඒහෙයින් "එකෙකු වඤ්චාකොට ගෙණ අන්නැනකට යෙමි"යි සිතා හුන්නේ යන්නාවූ බමුණෙකු දුක "මොහු වඤ්චාකොට ගෙණ යායුතුය"යි සිතා බමුණානන්වහන්සේයයි හඬගා බමුණා ලඟට ආකල "මා මෙයින් පිටතට ගෙණ ගියහොත් තොපට කහවණු දෙසියයක් දෙමි"යි කියා ඒ කහවණු ලොභයෙන් මුළාවූ බමුණා විසින් කැනහිලාගේ දෙපතුල අල්වා උසුලාගෙණ ගත කල්හි සැඟවී යනගමන් තමා කැමති හෙයින් "එම්බා බමුණ කහවණු ලොව දමාපියන දෙයක්ද මෙතෙක් කහවණු දෙනමට අනදරකොට ගෙණයාම සුදුසුදැ"යි දන්වා "කෙසේ ගෙණයෙම්දැ"යි විචාළාවූ බමුණාට "උතුරු සලුවෙහි බැඳගෙණ යව"යි කීකල්හි මැනවැයි ගිවිස උතුරු සලුව අතුට ඒමත්තෙහි නොවා පොදියක්කොට බැඳ උරෙහි එල්වාගෙණ යනුයේ දකුණු විහසල් දොරසමීපයට පැමිණ "මෙහි තබම්දැ"යි විචාලකල "එම්බා බමුණ මෙබඳු තැනක කහවණු තබන්නෙක් ඇද්ද, තව ගෙණ යව"යි කියා කටුවල්ගහණයක් සමීපයට පැමිණිකල "මෙතන තබව"යි කීයෙන් තබා උතුරු සලුවගෙණසිටි බමුණාට කැනහිල්තෙම කියනුයේ "මා අසීති කහවණු මහනිධානයක් ඇත, ඒගැම් තොප දක්වනු නොකැමැත්තෙමි, එහෙයින් කහවණු බාරවූ දෙසියය පමණ වෙන්කොට ගෙණෙනතුරු මේ ඉර බලා සිටුව"යි කියා ලොභ මොහ දෙකින් මුළාවූ ඒ බමුණා එසේ සිටුවා වැටකෝවන යට වැද තමා කැමතිසේ ගියේය, ඉරබලාසිටි බමුණාගේ නලලින්ද දෙකියිල්ලෙන්ද ඩහදිය නික්මෙන්ට වන, ඒ දුටු රුක්දෙවියෙක් මේ ගාථායෙන් මෙසේ කීයේය.

සද්දහාසි සිඟාලස්ස සුරාපීතස්ස බ්‍රාහ්මණ,
සිප්පිකානං සතං නත්ථි කුතො කංසසතා දුවෙ

එම්බා බ්‍රාහ්මණය රාමතින් හොත් කැනහිලාගේ බස් සැබවයි ගන්ට කාරණා කිම, බෙල්ලන් සියයකුත් නැති ඕහට කහවණු දෙසීයයක් කොයින් ඇද්දැයි කීයේය, එමෙන්ම රාග ද්වෙෂ මොහාදීවූ අකුශලයෙන් හරිතවූ ධනලාභාදිය පිණිස බොරු කියන්නාවූ එහෙයින්ම ලොව වඤ්චාකරන්නාවූ මිථ්‍යාකල්පනාදියෙන් යෙදී වසන තීර්ථකවචනය සැබැවැයි සිතා ශිවභක්තික විෂ්ණුභක්තික යනාදි නොයෙක් ලබ්ධිගෙණ කිසිපිහිටක් නැතිදැම පිහිටැයි සිතා අපායභාග් නොවී සසරදුකින් මිදී නිවන් දක්නා කැමැත්තාවූ එම්බා සත්පුරුෂයෙනි බුද්ධාදිරත්නත්‍රයෙහි සරණගතව තුනුරුවන් සිතින් අදහා නිරන්තරයෙන් පූජාසත්කාරකොට රත්නත්‍රය සෙවි

නයෙන් උපාසකධර්මය අඩුනොකොට පැවතියයුත්තේය, මේ සරණගතවීමෙහි විපාක **වෙලාමසූත්‍රය කුමදනසූත්‍රයආදි** නොයෙක් තන්හි බුදුන් වදාළ පරිද්දෙන් අසා දතයුතු, මෙසේවූ සරණාගමන ප්‍රභෙදදීනවානිසංස ප්‍රකාශකොට දෙව්මිනිසුන්සහිතවූ සියලු ලොකයාහට කරණලද උතුම් සද්ධර්මානුශාසනාවන් ඇතිහෙයින් ලොකසරණවූ මාගේ බුදුරජතෙම ශාස්තෘනම්වනසේක, එහෙයින් කියනලදී.

දෙවයක්ඛමනුස්සානං ලොකෙ අග්ග ඵලං දදං,
දදන්තං දමයන්තානං පුරිසාජඤ්ඤ තෙ නමො—සී.

මෙතෙකින් ලෝවැඩ පිණිස කරණලද ශ්‍රී සද්ධර්මාවවාද සංග්‍රහයෙහි සරණවිභාගානිසංස වර්ණනාකථාවන් ප්‍රකාශවූ සරණාගමන පරිච්ඡෙදය කියා නිමවනලදී.

මෙසේ පස්වන පරිච්ඡෙදයෙන් සරණාගමනානිසංස කථාවන් වර්ණනා කිරීමෙන් ලෝවැඩ දක්වා ඊට අනතුරුව මෙහි දක්වියයුතු නිත්‍ය ශිලාදි නොයෙක් ප්‍රභෙදගත ශීලකථාවන් අතුරෙහි පූර්වොක්ත ගාථාවගේ "සබ්බපාපස්ස අකරණං" යනුයෙන් ප්‍රකාශවූ ප්‍රාණඝාතාදි සාවද්‍යකර්මයන්ගේ නොකිරීම හෙතුකොටගෙණ එම සියලු ශීලයම ප්‍රකාශවී නමුදු මේ මේ පාපකර්ම නොකොට දුරුකටයුතුයයි සර්වඥ ගෙවා දත් බුදුන් විසින්ම වලකනලද සියලු පව් නොකොට දුරුවීමෙන්ම පිරියයුතු විරතිසංඛ්‍යාත චාරිත්‍ර ශීලයම ප්‍රකාශව මෙහි පෙණෙන හෙයිනුත් අකතීවාවූ ඒ සියලු දුශ්චරිත අකුශලකර්මයන් කෙරෙන් දුරුවීම සත්වයාහට සියලු වැඩට කාරණයෙක් වනහෙයිනුත් පාපකර්මවිභාගාදීනාව සත්වයන්ට සුවසේම අවබෝධව එයින් දුරුවීමපිණිස ලොව නොයායුතු මාර්ගය පලමුකොට දක්වා යායුතුමාර්ගය දෙවනු දක්වන්නාසේ **මඞ්ගලසූත්‍රාදියෙහි** දුරුකටයුතුබාලයන් ප්‍රථමයෙන් දක්වා ඇසුරුයයුතු පණ්ඩිතසත්පුරුෂයන් නැවත දක්වූවාසේ මේ ශීලකථාව දක්වනතැනද අප විසින් පළමුකොටම දුරුකටයුතු අකුශලකර්මපථ ප්‍රභෙදදීනව ඵලභූමිවශයෙන් ප්‍රකාශකොට දක්වා තදනන්තරව එම අකුශලකර්මයන්ගේ විරතිසඞ්ඛ්‍යාත පඤ්චශීලාදිවූ ශීලධූතාඞ්ගකථාවන්ගේද සමාදානප්‍රභෙදානිසංස කථාවෝ දක්වනු ලැබෙත්? එහි අකුශලකර්ම නම් කවරහයත්.

පාපානි ලොභමොහෙහි දෙසමොහෙහි වා පුන,
සුඞ්මොහෙන වා යුත්තා චෙතනා පාපසඤ්ඤිතා.

පාපචෙතනාජාතානි වාරත්තයවසෙන ච,
අපුඤ්ඤකිරියවත්ථූනි දස හොන්තීති ද්පයෙ—සී.

යනුහෙයින් මේ ලොකයෙහි පාපනම්ලද අකුශලකර්මය නම්
ලොභමොහදෙදෙනාගේ එක්වීමෙන්ද ද්වෙෂමොහදෙදෙනාගේ එක්
වීමෙන්ද එකලාව මොහය හා එක්වීමෙන්ද යෙදුනු චෙතනාතොමෝ
පාපයයි යන නම් ලද්දු, හෙද කායාදි ද්වාරත්‍රයවශයෙන් පාපචෙතනා
යෙන් උපදනා අකුශලකර්මයෝ දශදෙනෙක් වන්නාහුයි, එසේ
කාය වාක් මනො යන තුන්දොරවශයෙන් දශප්‍රකාරවූවාහු දශඅකු
ශල කර්මපථයෝය, එම දශඅකුශලයන්ගේම විශෙෂප්‍රභෙදවූ නො
යෙක් නාමයෙන් ව්‍යවහාර සියලු අකුශලකර්මපථයන් අතුරෙන්
පඤ්චදුශ්චරිතය පඤ්චානන්තරියකර්මය ආර්‍යොපවාදාදිපාපකර්මලක්ෂ
ණය පඤ්චනීවරණය සර්වඅකුශලමූලය අකුසල් සිද්ධවීමට සම්පවසිටි
පාපධර්මයෝය ක්‍රොධාදි අවශෙෂ පාපධර්මයෝය අෂ්ටොත්තර ශතප්‍ර
භෙදවූ තෘෂ්ණාවය යනමොහු නොයෙක් කටුකවිපාක දුඃඛවිපාක
දෙන ඒකාන්ත අකුශලකර්මයෝ නම් වන්නාහුයි, සියලු කුසලා
කුශලකර්මයන්හි සාධාරණව සිටි සූත්‍රාන්තික පර්‍යායයෙන් දක්වූ
දෘෂ්ටධර්මවෙද්‍ය කර්මාදිකර්ම එකොළොසෙක, එසේම අභිධර්ම පර්‍යා
යෙන් දක්වූ කර්ම සොළොසෙක, ප්‍රතිසම්භිදාමාර්ගපර්‍යායයෙන් දක්වූ
කර්මසොළොසෙකැයි යනමේ සියලු කර්මවිභාගාදිතවානිසංස දක්වා
දෙව්මිනිසුන්සහිත සියලු ලොකයාහට උතුම් සද්ධර්මානුශාසනාඇති
හෙයින් අසාරණ කාරුණබලඇති මාගේ බුදුරජතෙම ශාස්තෘ නම්
වනසේක,

එහි දශඅකුශලකර්මයෝ නම් සත්වයාගේ කායද්වාරයෙන් සිද්ධව
නප්‍රාණඝාතය අදත්තාදානය කාමමිථ්‍යාචාරය යන තුන් අකුසලය
න්ද වාක්ද්වාරයෙන් සිද්ධවන මුෂාවාදය පෛශූන්‍යවචනය ඵරුෂවච
නය සම්ඵප්‍රලාපය යන මේ අකුශලයන් සතරදෙනද මනොද්වාර
යෙන් සිද්ධවන අභිද්‍යාවය ව්‍යාපාදය මිථ්‍යාදෘෂ්ටිය යන මේ අකුශල
යන් තුන්දෙනද යනමොහු දශඅකුශලයෝ නම් වෙති, එහි ප්‍රාණ
තිපාතය නම්, ලොකයෙහි ව්‍යවහාරවශයෙන් සත්වතෙම ප්‍රාණයයි
කියනුලැබේ, පරමාර්ථවශයෙන් ජීවිතෙන්ද්‍රිය ප්‍රතිබද්ධ සකන්ධසන්ත
තියය, ඒ පඤ්චස්කන්ධයන්ගේ පිළිවෙළහෙණ ඊට සත්වයයි යන
ප්‍රඥප්තිව්‍යවහාරමාත්‍රයෙක්මය, එසේවූ ජීවිතෙන්ද්‍රිය ප්‍රතිබද්ධ සත්ව
යාගේ රූපස්කන්ධය කෙරෙන් ජීවිතයගලවා වෙන්කිරීමම ප්‍රාණාති
පාත නම්, එම ප්‍රාණතිපාතයම ප්‍රාණවධය ප්‍රාණඝාතයයිද
කියන්නේය, හෙද මෙහි අඞ්ගවශයෙන් ජීවිතෙන්ද්‍රිය ඇති අන්කි
සිසත්වයෙක් බවය ඒ සත්වයාගේ ප්‍රාණය වෙන් කිරීමෙහි පැවති
සිත්ඇතිබවය එමපාපය කරන්නහුගේ කායද්වාර වාක්ද්වාරදෙදෙනා
කෙරෙහි සවැදෑරුම්ප්‍රයොගයන් අතුරෙන් එක්තරා ප්‍රයොග
යක්කර පවත්වනබවය එසේ පැවැත්වූ උපක්‍රම සඞ්ඛ්‍යාත එක්
ප්‍රයොගයකින් එවිටම හෝ පසුව හෝ ඒ සත්වයාගේ දිවිනැසී යා

බවය යන මේපස ඇත්තේය, මෙසේවූ අඞ්ගපස සම්පූර්ණවී මෙන් ඕහට ප්‍රාණාතිපාත අකුශලය සිඬවේ, එයින් එක්අඞ්ගය කුඩු අඩුවූ ඒ ප්‍රාණඝාතය අකුශලකර්මබවට නොපැමිනේ,

එහි සවැදෑරුම්වූ ප්‍රයොගනම් කවරහයත්, සාහසථික ප්‍රයොගය ආනත්තික ප්‍රයොගය නිස්සග්ගික ප්‍රයොගය ථාවර ප්‍රයොගය විද්‍යාමය ප්‍රයොගය ඍඬිමය ප්‍රයොගය කියා සවැදෑරුම්වන්නාහුය, එයින් යම්කිසිසත්වයෙකු තමාඅතින්මරන්නහුගේ අත්පාආදි ශරීර අවයවයකින් පැහැරීමහෝ කඩුතොටුතෙප්ආදියකින් පැහැරීම හෝ සාහත්ථික ප්‍රයොගය නම්වේ, මෙසේ විද මෙසේ ඇන කොටා මරවයි කියා අනුන්ට නියොග කිරීම ආනත්තික ප්‍රයොග නම්, දුරුතැන සිටි එකෙකුමරවන පිණිස කයින්වත් කායප්‍රතිබඬවූ දුනුආදියකින්වත් තෙප්ආදිය දමාවත් ගල්ආදිය ගසාවත් ශර ආදිය විදලාවත් මරන්ට කරණනොයෙක් ක්‍රියාවෝ නිස්සග්ගික ප්‍රයොගනම් වෙති, උගුළුලා බොරුවල් බිඳ උල් සිටුවා යතුරුදුනු තබා කෙමින් ආදිය සදා වැව්පොකුණු ආදියෙහි විෂයොදා කරණ නොයෙක් උපක්‍රම ථාවරප්‍රයොග නම් වේ, මන්ත්‍රජපකිරීමෙන් ජ්වරාතීසාරදාහාදිනොයෙක් රොග උපදවා මරන්ට කරන උත්සාහය විද්‍යාමය ප්‍රයොනම් වේ, කිපි බැලුපමණකින් කුම්භාණ්ඩයන් මරන්නාවූ වෙසමුණුරජ්ජුරුවන්ගේ ඇසමෙන් කර්මබලයෙන්සිඬවූ ඍඬියකින් සතුන්මරන්ට කරණඋපක්‍රමය ඍඬිමය ප්‍රයොගයනම් වේ,

මෙහි පළමුකොට කියනලද සාහත්ථිකප්‍රයොගය උද්දිස්ස අනුද්දිස්සවශයෙන් විප්‍රකාරවේ, ඒ කෙසේදයත්:—යම් සත්වයෙකු මරමියි කියා නියමකොට තෙප් ආදිය දමීමෙන්ද ශරයක් විදීමෙන්ද ඒ නියමකළ සත්වයාම මරණයට පැමිණියේ නම් ඕහට ඒ අකුශල කර්මය සිඬවෙයි, එසේ නියමකර මරන්ට සිතාගත් සත්වයා හැර අන් සත්වයෙකුට වැදීමළහොත් මරන්නහුගේ සිත්හි මොහු මරමියි යන සිත් කැතිවම වැදී මළහොත් අඞ්ගසම්පූර්ණ නොවන බැවින් ඕහට ප්‍රාණඝාතය සිඬ නොවේ, නියමයක් නොකොට ලද යම් කොයි සතෙකු වුවත් මරමියි සිතා ප්‍රයොගකළහොත් ඒ ප්‍රයොගයෙන් කොයි සතෙකු මළත් ඕහට ප්‍රාණඝාත අකුශලය සිඬවන්නේය, යම් සත්වයෙකු මරණ පිණිස පහරක් දුන්කල ඒ පහරින් එවිටම මළත් ඒ පහරම මුල්ව කල්යවා මළත් පහරදුන් එකාට පහරදුන් ඇසිල්ලෙහිම ප්‍රාණඝාතය සිඬවේ, මේ සාහත්ථිකකර්මයෙහි විභාගයි.

මරණලෙස නියමකොට අනුන්ට මෙහෙවර කිරීමය යන ආනත්තිකකර්මයද සවැදෑරුම් වේ, ඒ කෙසේදයත්.

වත්ථු කාලො ච දෙසො ච සත්ථඤ්ච ඉරියාපථො,
කරණස්ස විසෙසොති ඡ ආණත්තිනියාමකා.

එහි වස්තුව නම් මරණප්‍රාප්ත සත්ත්වයාගේ නියමකිරීමය, කාලය නම් පූර්වාහ්ණ අපරාහ්ණාදි කාලය නියමකිරීමය, දෙසනම් ග්‍රාමාරණ්‍යවීථිසන්ධි යනාදිය නියමකිරීමය, ආවුධ නම් කඩු තෙප් යනාදි ආවුධ නියමකිරීමය, ඉරියාපථ නම් මැරියයුතු එකාගේ හෝ මරණ එකාගේ හිඳීම් සිටීම් ආදි ඊර්‍ය්‍යාපථ නියමකිරීමය, ක්‍රියා විශෙෂ නම් විදීම කෙටීම ආදි මරණ ක්‍රියාව නියමකිරීමයයි මෙසේ සයාකාරයක් වේ, එසේම අසවල් එකා නියමකොට කිවහොත් එකිලෙසම ඔහු මැරීමෙන් ඒ මෙහෙවර කීඑකාටම ප්‍රාණඝාතය සිද්ධවන්නේය, ඔහු හැර අනිකක්හු මැරුවහොත් මෙහෙවර කීඑකාට අකුසල් සිද්ධනොවන්නේය, මේ මරණසත්ත්වයා නියමකිරීමෙහි විභාගයි.

පෙරවරු මරවයි කියාවත් පස්වරු මරවයි කියාවත් රාත්‍රියෙහි මරවයි කියාවත් දහවල් මරවයි කියාවත් නියමකලකල්හි එකිකල් වරදවා මැරුවහොත් මෙහෙවර කීඑකාට යටකීලෙසම ප්‍රාණඝාතය සිද්ධනොවෙයි, මැරුවහුටම අකුසල් සිද්ධවේ, මේ කල්නියමකිරීමෙහි විභාගයි.

ගමදීවත් නුවරදීවත් වනාන්තරයකදීවත් ගොඩකදීවත් දියකදීවත් මරවයි කියා මැරියයුතුතැන් නියමකොට මෙහෙවර කීකල්හි ඒ නියමකොට කීතැන් හැර අමුතුතැනකදී මැරුවහොත් ඒ මැරූඑකාට මිස කීවහුට ප්‍රාණඝාතය සිද්ධනොවන්නේය, මේ ස්ථානනියමයෙහි විභාගයි.

තොබින් මරවයි කියාවත් කඩුවෙන් මරවයි කියාවත් ආයුධය නියමකොට කීකල නියමකල ආයුධයෙන් මැරුවහොත් මෙහෙවර කීවහුට ප්‍රාණඝාත අකුශලය සිද්ධවේ, නොකී ආයුධයකින් මැරුවහොත් මැරුවහුටම අකුශලය සිද්ධවේ, මේ ආයුධ නියමකිරීමෙහි විභාගයි.

සිටියදී මරවයි කියාවත් ඉන්දදී මරවයි කියාවත් යන එන තැන් ආදි ඉරියව් මරණ එකාගේ හෝ මැරියයුතු එකාගේ හෝ නියමකොට කීකල එකීලෙසම නියමකල ඉරියව්වකදී මැරුවහොත් කීවහුට අකුශලය සිද්ධවේ, අනික් ඉරියව්වකදී මැරුවහුටම ප්‍රාණඝාතය සිද්ධවේ, මේ ඉරියව් නියමකිරීමෙහි විභාගයි.

විද මරවයි කියා හෝ කපා මරවයි කියා හෝ ඇනා මරවයි කියා හෝ මෙහෙවර නියමකළ කල ඒ ඇසූ පුරුෂයාද ඔහු කීලෙ

සම මැරුයේ වී නම් මෙහෙවර කී එකාටත් ඒ අසා මැරූ එකාටත් යන දෙදෙනාටම ප්‍රාණඝාතය සිද්ධවේ, කීසැටි වරදවා මැරුවහොත් ඒ මැරූ එකාටමුත් මෙහෙවර කීඑකාට ප්‍රාණඝාතය සිද්ධනොවන්නේය, ඉදින් යමෙකු මරන්නට කියා මෙහෙවර කීද ඒ මෙහෙවර ඇසූ පුරුෂතෙම අවුරුදුපනසකින්වත් සැටකින්වත්ඇත නියම කළලෙසම මරන්නේවේද මරන්ට නියොගකළ පුරුෂයා මෙහෙවර කී දවස්හිම උනේවීනම් ඕහට ප්‍රාණඝාත අකුශලය සිද්ධව සතර අපායෙහි උපදනේය, මේ ක්‍රියාවිශෙෂ නියමයෙහි විභාගයි.

මෙසේ අනුන් ලවාවත් අනුන්ට ව්‍යාජයෙන් පර්යායයෙන් කියාවත් වසවිෂ කා මියයවයි කියාවත් මරණයෙහි ගුණවර්ණනාකොට කීම්ආදියකින් වත් තමා විධානකොට හෝ අනුන් ලවා විධානකර වීමෙන් හෝ අනුන්ට පර්යායයෙන් කියා හෝ එසේම අනුන් ලවා කියවා හෝ මරණපිණිස මන්ත්‍රජපකිරීමෙන් හෝ එසේම අනුන් ලවා කරවා හෝ කාරණ නොයෙක් ප්‍රයොග අතුරෙන් එක්තරා ප්‍රයොගයකින් යට කියනලද ප්‍රයොගසය අතුරෙන් එක්තරා ප්‍රයොගයක් හා පස්අඞ්ගද සම්පූර්ණවීමෙන් පළමුවෙනි ශික්ෂාපදයාගේ භෙදය වේ.

භෙද අල්පඅකුශල්වූ ප්‍රාණඝාතයකුත් ඇත්තේය, මහත් අකුශල්වූ ප්‍රාණඝාතයකුත් ඇත්තේය, එහි කුරුකුහුඹුවන් ආදිවූ සවල්ප ප්‍රාණියෙකු මැරුව සවල්ප අකුශලය, ඊටත් මහත් සූනු සිකනල් මුගටි සාවුන් පටන් ක්‍රමක්‍රමයෙන් මහත් මහත් සත්වයන් මැරීමෙහි අකුශලයත් එසේම එකිනෙකාට වඩා මහත්වන්නේය, මේ සියල්ලවුන්ගේ ප්‍රාණයනැසීම ඒකාවිවරවුවත් මහත් සතුන් මරන්ට කරණ ප්‍රයොගය මහත් හෙයින් අකුශලයත් මහත් වන්නේය, මේ හැමටිමවඩා දුස්සීල පාපි නමුත් මිනිසෙකු මැරීමෙහි අකුශලය මහත් වන්නේය, ඒ දුස්සීල මිනිසෙකු මැරීමට වඩා ගෝශිලාදියෙන් යුක්ත එකක්හුගේ මැරීමෙහි අකුශලය මහත, ඊටත් වඩා අටසිල් රක්ෂාකරණ එකක්හුගේ මැරීමෙහි අකුශලය මහත, ඊටත් වඩා දශසිල් රකින මිණිසෙකු මැරීමෙහි අකුශලය මහත, ඊටත් වඩා ප්‍රථග්ජන භික්ෂුවකගේ මැරීමෙහි අකුශලය මහත, මේ හැමටම වඩා ශ්‍රොතාපත්ති සකෘදාගාමි අනාගාමි අර්හත් යන මේගුණවැඩි උතුමන් මැරීමෙහි ක්‍රමක්‍රමයෙන් අකුශලය මහත්වනබවදතයුතුයි.

මෙහි මරන්ට කරණ ප්‍රයොගයම වී නමුත් ගුණයෙන් මහත් අය මැරීමෙන්ද ප්‍රයොගය මහත්කොට කිරීමෙන්ද අකුශල් මහත්වේ, ශරීරප්‍රමාණ ගුණප්‍රමාණ ප්‍රයොග සමවීමෙනුදු කෙලෙසුන්ගේ මන්දතීක්ෂණභාවයෙන්ම අකුශලය අල්පවීමද මහත්වීමද දතයුතුයි.

මෙහි කුරුකුහුඹුවන් මැරීම ස්වල්ප අකුශලයයි කී වචනය ඊටත් වඩා මහත් සත්ත්වයන් මැරීමෙන් සිඬවන අතිමහත් අකුශලය බලා කියනලදී, එබැවින් ක්ෂුද්‍රවූ සත්ත්වයන් නසා සිඬවන අකුශලයත් ඔවුන්ගේ ශරීර සේ කුඩායයි නොසිතා නරකයට පමුණුවන හෙයින් මහත් අකුශලයයි දැන තමහට වැඩකැමති සත්පුරුෂයන් විසින් කුරුකුහුඹු ආදී ක්ෂුද්‍ර ප්‍රාණීන්ගේ ජීවිතය තමාගේ ජීවිතය මෙන් සලකා ප්‍රාණවධය නොකොට පළමුවෙනි ශීලයෙහි පිහිටිය යුතු, මෙම දක්වනලදී:—

ඛුද්දකානම්පි ජන්තූනං ජීවිතංපිච සබ්බථා,
ජානන්තා රක්ඛිතබ්බංව හිතකාමෙන අත්තනො,

එහි ප්‍රාණඝාතයෙන් දුරුවීම කැමැත්තන්විසින් මෙහි ප්‍රාණීන් ඇතැයි යන සංඥාඇතිව නොපෙරූ පැන් ප්‍රයොජනයට නොගත යුතු, ඒ පැන් විනාශකිරීමද නුසුදුසුයි, මේ දියෙහි ප්‍රාණීන් නැතැයි යන කල්පනා ඇතත් දිය නොපෙරා ගැන්ම වරදපක්ෂයෙහි ඇතුලත්බැවින් අකුශල්මයයි දැන ප්‍රාණවධයට භයඇත්තන්විසින් පැන් පෙරා ගතයුතුයි, මෙසේ දුරුකටයුතුවූ ප්‍රාණාතිපාත අකුශල කර්මය ලොභය ද්වෙෂය මොහය යන අකුශලයන් තුන්දෙනාගේ එක්වීමෙන්ම සිඬ වේ, ඒ කෙසේදයත්? මොහුගේ මාංශ අනුභව කරම්යි ලොභඋපදවා හෝ මස්විකුට ගන්නා මිළයෙහි ලොභ උපදවා හෝ තමා විසින් මැරීමෙන් හෝ අනුන් ලවා මැරවීමෙන් හෝ ඇතුලත් ගැන්ම සහ මෙබඳු ලාභයෙක් උපදනේයයි පැවති ලොභයෙන් හෝ යනාදිවශයෙන් ලොභසිත් උපදවා ප්‍රාණවධකිරීමෙන් ඒ පාපය ලොභය මුල්ව සිඬවේ, මොහුටම අනර්ථයක් කෙළේයයි බඬවෛරයෙන් හෝ දැන් අනර්ථකෙරේයයි බඬවෛරයෙන් හෝ මතු අනර්ථකරන්නේයයි බඬවෛරයෙන් හෝ එසේම මාගේ ප්‍රිය විශ්වාසයන්ට නපුරක් මොහු පෙර කෙළේය, දැන් කෙරෙයි, මතු කරන්නේයයි බඬවෛරයෙන් හෝ අප්‍රියවූ මාගේ සතුරන්ට පෙර මොහු වැඩඋපකාරයක් කෙළේය, දැන් කෙරෙයි, මතු කරන්නේයයි බඬවෛරයෙන් හෝ නොකැමැතිව ද්වෙෂයෙන් ප්‍රාණවධකිරීමෙන් ඒ පාපය ද්වෙෂයම මුල්ව සිඬවේ, ශතයාග සහස්‍රයාගයෙහි එකි එකී කුලයෙන් සතුන් සියය බැගින් ගෙණ දහසකින් මරා යාගකරන්නාහට පවිනැති මහත් කුශලයකැයි කියා මැරීමෙන්හෝ වධයට පැමිණියවුන්ට වධකිරීම වරද නැතැයි කියා හෝ රජ්ජුරුවන්ට රාජාමාත්‍යාදීන්ට ප්‍රාණවධකිරීම වරද නැතැයි කියා හෝ විෂඝොර සර්ප ගෝනුස්සා ආදීහුද මනුෂ්‍යයන්ට උපද්‍රවකෙරෙති, එබැවින් ඔවුන් මැරියයුතුයයිද මරන්නාහට වරද නැතැයි කියා හෝ

ඌරන් මුවන් කුකුලන් ආදි නොයෙක් සත්හු මනුෂ්‍යයන්ට උප කාර සඳහා උපන්නාහුය, එහෙයින් ඒ ඒ සතුන් මැරීමෙන් අකුසල් නැතැයි දෘෂ්ටියෙන් මැරීමෙන්හෝ යනාදිවශයෙන් මුළාව ප්‍රාණවධ කිරීමෙන් ඒ පාපය මොහය මුල්ව සිඹවේ, ලොභාදි අකු සලයන්ගේ එක්වීමෙන් ප්‍රාණාතිපාත කර්මය සිඹවනබව මේආදි ක්‍රමයෙන් දතයුතු.

මෙහි නිවරදිවිධිය නම්, මේ ප්‍රාණයෙක් නොවෙයි, මෙහි ප්‍රා ණීන් නැත්තේය යන කල්පනාව ඇත්තාහටද සිත්නැතිව නොද න්නාහටද මේ සත්‍වයා මරමි යන සිත්නැත්තාහටද උමතුආදීන් ටද ප්‍රාණාතිපාතසඞ්ඛ්‍යාත සතුන් නැසීමක් අන්පරිද්දකින් සෙද්‍රනු නමුත් අටුවාකථායෙහි නිවරදියයි දක්වූ බැවින් ඔවුන්ට යටකී අඞ්ගයන්ගේ අඩුබව හෙතුකොටගෙණ . ප්‍රාණඝාත අකුශලකර්මය සිඹනොවේ, මේ ප්‍රාණාතිපාත අකුශලකර්මයෙහි භෙදයි, එහි ආදීනව නම් කවරහයත්.

පාණාතිපාතො භික්ඛවෙ ආසෙවිතො භාවිතො බහුලීකතො නිරය සංවත්තනිකො හොති, තිරච්ඡාන යොනිසංවත්තනිකො හොති, පෙත්තිවිසයසංවත්තනිකො හොති, යො සබ්බලහු සො පාණාතිපාතස්ස විපාකො මනුස්සභූතස්ස අප්පායුකසංවත්තනිකො හොති.

යනාදීන් බුදුන් විසින් වදාළහෙයින් අනෙකාදීනව ඇති ප්‍රාණා තිපාත අකුශලය යම්කිසිවක්හු විසින් ආසෙවිතභාවිත බහුලීකෘත වශයෙන් පුරුදුකරණලදද ඒ සත්‍වතෙම නරකයෙහි ඉපිද නො යෙක්වාදහස් මුළුල්ලෙහි මහත් නරකදුක් විඳ එයින් මිදිගියකල තිරිසන් අපායෙහිද ප්‍රාමාණාතික්‍රාන්තවූ දුක්විඳ එයින් මිදිගියකල බලවත් දුකින්ගැවසීගත් ප්‍රෙතඅසුර අපාදෙක්හිදු ඉවසිය නොහැකි අනන්ත දුක්අනුභවකිරීමෙන් පව්ගෙවීගියකල කිසි පින්කම් සිදුර කින් මිනිසත්බවට පැමිණියේ වී නම් ශෙෂවසිටි එම ප්‍රාණාතිපාත අකුශලකර්මබලයෙන් මනුෂ්‍යදෙහය ශොභාඇතිපරිද්දෙන් නොව ශරීර අවයවයන්ගේ විපරීතවූ විරූපබවය ආරොහපරිනාහසම්ප න්නනොව කෘශවූ ශරීර ඇතිබවය ජවබලසම්පත්තියක් නැතිබවය සමව බිම නොවදනාවක්වූ පතුල් ඇතිබවය විරූපදර්ශනව දුටුවන්ට රිසිනොවන අප්‍රියබවය මෘදුමොළොක් නොව කෲරවූ අතුල් පතුල් ඇතිබවය සුවිපිරිසිදුකටක් නැතිබවය බලනැතිබවය විසාරදනොවන වචනඇතිබවය සියලුදෙනාට අප්‍රිය බවය හැමකල්ම භයින් තැතිගන්නා බවය අනුන් විසින් නැසියහැකි බවය එසේකළ උප ක්‍රමයෙන් මිය යන බවය පිරිවර මදබවය රුවනැතිබවය විවර්ණ

බවය බොහෝ රෝගපීඩා ඇතිබවය බොහෝ සෝක ඇති බවය ප්‍රියමනාපයන්ගෙන් වෙන්වනබවය ආයු මඳබවය යනාදි නොයෙක් අකුශලඵලවිපාකයෝ ඕහට ඇතිවන්නාහුය.

තවද ප්‍රාණාතිපාත පාපකර්මය කිරීමෙහි නියුක්ත පුද්ගලතෙම එම ආත්මභාවයෙහිම දඬුමුගුරු ආයුධවලින් පහරවැදීමෙන් නැසෙන්නේදවෙයි, එයින් චුතව ගොස් දක්වනලද ක්‍රමයෙන්ම සතරඅපායදුක් විඳ බොහෝදීර්ඝකාලයකින් එයින් මිදී අවුත් මනුෂ්‍ය ජාතියෙහි දවසින් දවසට වඩනා මහත් සම්පත් ඇති කුලයෙක්හි දක්නට නිසිසේ දුටුදුටුවන්ට සතුටුප්‍රසාද ඵලවන උතුම් ශරීරවර්ණ පොක්ඛරතායෙන් සමන්විතව උපන්නේ වී නමුදු එබඳු සම්පත් නොවලඳ තරුණවයසෙහිම එකාන්තයෙන් මරණයට පැමිණේ, එහෙයින් කියනලදී.

සබ්බොපභොගධනධඤ්ඤවිසෙසලාභී,
රූපෙන භො සමකරද්ධජසන්නිභොපි
සො යොබ්බනෙපි මරණං ලභතෙ අකාමං
කාමං සදා තු පරපාණ හරො නරො හි—සී.

එහෙයින් ප්‍රාණාතිපාත අකුශලකර්මය කළ සත්වයෝ අහස්හි සිටියාහු නමුදු සමුද්‍රමධ්‍යයට පැමිණියාහු නමුදු විදුරුපර්වතගුහාව කට වැදුනාහු නමුදු ඒ පාපකර්මයෙන් නොමිදෙන්නාහුය, හේ කෙසේදයත්.

පෙර එක් මිනිසෙක් කර්මාන්තයෙහි නොපවත්නා ගොණෙකු මරණපිණිස පිදුරු ලා ගිනි දල්වා මැරූයේය, හෙතෙම ඒ කර්මයෙන් අවීචිමහානරකයෙහි ඉපිද නොයෙක්වාදහස් පැසී මහදුක්විඳ එයින් මිදී ගියකල සියක්ජාතියක අහස්හිම පිදුරු ගින්නෙන් දදු මරණයට පැමිණියේය.

අන්‍යවූ ස්ත්‍රියක්ද බල්ලෙකුගේ ග්‍රීවයෙහි වැලිකලයක් බැඳ දියෙහි හිලා මරා ඒ පාපකර්මයෙන් අවීචියෙහිම ඉපිද අනන්තවූ දුක් අනුභවකොට එයින් මිදී ගියකල සියක්ජාතියක නැව් නැගී යනකල මුහුද මැදට නැව පමිණිකල්හි ඇගේ ඒ පාප කර්මබලයෙන් නැව නොගොස් බැඳුක්මෙන් සිටිබව දැක විමසා කාලකන්නිසලාකය ඇගේ නමටම පැමිණිහෙයින් එසේම කර වැලි බැඳ දියෙහි ගලනලදුව මරණයට පැමිණියාය.

අන්‍යවූද ගොපලුදරුවන් සත්දෙනෙක් ගොයෙකු තුඹසෙහි වන් බව දැක ඒ තුඹස සිදුරුමුඛ වසා සිට සත්දවසක් ගියකලහැරි

යාහුය. ඒ ගවපාලක දරුවන් සත්දෙන ඒ ගොයා නොමැරුබැවින් නරකයට නොගොස් දසසතරවාරයක පර්වතවිවරයට වැද ගල්පුවරුවෙන් වැසීගිය දොර ඇතිව සත්සත්දවස් නිරාහාරව දුකින්ම වැස ජීවිතය පමණක් රැකී නික්මිගියාහුය, මෙසේ ප්‍රාණාතිපාත පාපකර්මය කළාහු අහස්හි සිටිය නමුත් මුහුද මැදට පර්වතවිවරයට වත්තාහු නමුත් ඒ පාපයෙන් මිදීමක් නැත්තාහුය, මෙම වදාරණ ලද බුදුන් විසින්:-

> න අන්තලික්ඛෙ න සමුද්දමජ්ඣෙ
> න පබ්බතානං විවරං පවිස්ස.
> න විජ්ජතී සො ජගතිප්පදෙසො
> යත්‍රට්ඨිතො මුච්චෙය්‍ය පාපකම්මා'ති-සී.

## අදත්තාදානය නම්.

අනුන් සන්තක වස්තුව ඒ වස්තුව හිමියාගේ කයින් හෝ වචනයෙන් හෝ නොදීමෙන් ගැණීම අදත්තාදානනම්, ඒ කෙසේද කිවහොත්, යම් කිසි වස්තුවක් යමක්හු තුමූ කැමැති පරිද්දෙන් අනුභවකරණකල්හි ලොව ඇත්තෝ ඒ දැක අනුන්සන්තකදෙයක් මොහු අනුභව කරන්නේයයි නිඤුවක් නොකෙරෙද්ද, නීතිදන්නා අය විචාර දඬුවමක් ඔහුට නොපමුණුවද්ද, ඒවස්තුව ඔහු සන්තකවස්තුව නම් වන්නේය, එසේවූ වස්තුවක් අනුන් සන්තකයයි දැන දැන ඒ වටිනාදෙයකුත් නොදී යමෙක් හැරගන්නේ වී නම් ඔහුගේ ඒ හැරගන්නා ප්‍රයොගය පහළකරන්නාවූ හැරගන්නහුගේ කායවාර වාක්වාර දෙක්හි සෙදී පැවැත්නාවූ ඒ මේ චෙතනාව අදත්තාදාන අකුශල නම් වන්නේය, භේදවනාහි:-

> මනුස්ස භණ්ඩං තථාසඤ්ඤි ථෙය්‍යචිත්තං උපක්කමො,
> තෙනෙව භණ්ඩහරණං පඤ්චඅඞ්ගානි ථෙනි තෙ-සී.

යනුහෙයින් යමෙකු ඇරගන්ට සිතලු වස්තුව අනික් මිනිසෙකු අයිති බවය එසේ අනුන් අයිතියයි කියා තමාටත් සිතෙන බවය, හිමියන් නොවිචාරා නොකැමැතිසේ ඇරගණීම් යන කල්පනාඇතිබවය අනුන්ලවා හෝ තමාවිසින් හෝ ඇරගන්ට කරණ පඤ්චප්‍රකාරඋත්සාහ ප්‍රයොගයන් අතුරෙන් එක්තරා ප්‍රයොගයක් ඇතිබවය ඒ කළප්‍රයොගයෙන් අනුන්ට හෝ තමාට හෝ අයිති කොට ඒ වස්තුව ඇර ගැණීමය යන මේකාරණයන් පස්දෙනාගේ එක්වීමෙන් අදත්තාදාන අකුශලය සිඬවේ, එයින් එක්කාරණයකුදු අඩුවුව අදත්තාදාන අකුශලය සිඬනොවේ,

එහි අනුන් අයිති වස්තුව වඤ්චාවෙන් ගැණීමය යන ථෙය්‍යාව හාරය බලාත්කාරයෙන් ගැණීමය යන පසය්හාවහාරය සඟවා ගැන්මය යන පටිච්ඡන්නාවහාරය කල්පනාවශයෙන් නියමකර ගැන්මය යන පරිකප්පාවහාරය කුසපත් සලකුණු පමුණුවා ගැන්මය යන කුසාවහාරය යන මේ පඤ්චප්‍රකාර අවහාරයන් අතුරෙන් යමෙක් මහවනාන්තර බැදිතැන් ආශ්‍රයකොට එහි සැඟවිසිට කරණසොර කම්ද, උමංබිද අඳුරේ සැඟවිසිට කරණ සොරකම්ද, තරාදියෙන් පලමින් කරණ සොරකම්ද, තෙල්ආදිය මිනීමෙන් වස්තු හිමියන් ගේ සිත් බිඳුවා කරණ සොරකම්ද, වී ආදිය මිනීමෙන් ඉමවරදවා ගැන්මෙන් කරණ සොරකම්ද, සොරපණම් ආදිය දී කරණ සොර කම්ද, යනාදිවශයෙන් පඤ්චප්‍රකාර සොරකමුත් අදත්තාදාන නම් වෙයි.

යමෙක් බලාත්කාරකම් හඟවා ගම් පැහැරීම ආදිවශයෙන් අනුන්සන්තකදේ බලාත්කාරයෙන් උදුරාගැන්මද, ගතයුතු නිය මවූ අයබදු අමුතුවෙන් වඩවඩා ගැන්මද, ලොකනීතිවරදවා දඬ ගැන්මද, අදත්තාදාන අකුශල නම් වේ, මේ හැමතන්හිම වස්තුව තමා අයිතිකොට ගත්කල්හිම අදත්තාදාන අකුශලය සිඩවේ, යමෙක් අනුන්සන්තක දාසයෙකුවත් දාසියෙකුවත් ගොන්මිගොන් දෙනුන් කුකුලන් බල්ලන් බලළුන් ආදිවූ යම් කිසිසත්වයෙකුවත් වඤ්චාවෙන් ගණිමි යන සිත් ඇතිව කයින් කළප්‍රයොගයකින් හෝ වචනයෙන් කළප්‍රයොගයකින් හෝ සිටිතැනින් අඩලක් පමණ තැන්වත් ඈත් මෑත් කෙළේ වී නම් පසුව හැරපියා ගියත් අදත්තා දාන අකුශලය ඔහට සිඩවන්නේය, කෙත්වත් ස්ථාවර අවස්තු ආදී යම්කිසිවක් නිසා යුක්තායුක්ති නඩුවිනිශ්චයකිරීමක් පැමිණිතැන හිමි එකාට අහිමි කොට කීකල්හි හිමි පුරුෂතෙම ඒ අසා "මේලාභය මට සම්භනොවන්නේය"යි සිතා ඒ වස්තුයෙහි පැවතිඔහුගේ ආලය හැරපියේ වී නම් ඒ ආලය හැරපීම හා සමගම අයුක්ති කොට කී අයටද ඊට සහායව සාක්ෂි කී අයටද අදත්තාදාන අකුශ ලය සිඩවේ, ආරාම උද්‍යානාදි යම්තැනක තුබූ අනුන්සන්තක බඩු වක් දැක "ඒ බඩුව වඤ්චාකොට ගණිමි"යි සිතා බිමින් කෙසගක් පමණතැන් ඔසවාගත් කෙණෙහි හෝ ඈතකෙළවර මෑතකෙළවර ගෙවා පැමිණිකෙණෙහිම අදත්තාදාන අකුශලය සිඩවේ, එසේ ගෙණ නැවත තුබූලෙසම තබා ගියත් සසර විසීම ඇත්තානට ඒ පාපයෙන් මිදීම නැත්තේය, අනුන් අයිති කෙතකින් කරලක්වත් ගසකින් එලයක්වත් මල්කොලආදි කිසිවක්වත් සොරසිතින් කැටු වෙන් වෙන්කළ ඇසිල්ලෙහිම අදත්තාදාන අකුශලය සිඩවේ, යමෙක් අනුන්අයිති රන්පණම්ආදි යම්කිසිබඩුවක්දමා තුබූවාදැක

පයින් යටකිරීම්ආදි ප්‍රයොගයකින් යටිකෙළවරතුබුතැනට මතුකෙළවර පාත්වූ ක්‍ෂණයෙහිම අදින්නාදාන අකුශලය සිද්ධවේ, යමෙක් අනුන්කී මෙහෙවරකින් හෝ තමාගේ අභිප්‍රායෙන් හෝ අනුන් අයිති බඩුවක් ගෙණ "අසවල් තැනට ගෙණ ගොස් දෙමි"යි කියා ගෙණයනුයේ ඒ යමින් සිට අතර මගදී උපන් සොරසිතින් "මම ගණිමි"යි සිතා තමා හිස තුබුබඩුව කරට හෝ කරතුබුබඩුව හිසට හෝ ගත්තේ වී නම් එකෙණෙහිම අදින්නාදාන අකුශලය සිද්ධවේ; පසුව ඒ බඩුව අයිති හිමියන්ට ගෙණ ගොස් දුන්නත් ඒ අකුශලයෙන් මිදීමක් නැත්තේය, එසේම බඩුවක් ගෙණයනමිනිසෙකු හෝ ගොණෙකු හෝ දැක "ඒ බඩුව ඇර ගනිමි" යනසිතින් භය ගැන්වූකළ ඒ බඩුව දමාගේ නම් ඔහුගෙන් ඒ බඩුව අත්ඇරුණු විටම මොහු නොගත්තේ වී නමුත් අදින්නාදාන අකුශලය සිද්ධවේ; යමෙකුට නයට දුන්බඩුවක්වත් රක්‍ෂාකර තබන්ට දුන්බඩුවක්වත් ඉල්ලූකළ බඩුව ගත්එකා නොදෙන පිණිස වඤ්චාප්‍රයොග කොට "නොදෙමි"යි සිතා නම් බඩුව ඇත්තාහුගේ එහි පැවති ආලයත් උත්සාහයත් දෙවනු නොලැබෙයිම සිතා හැරපුකෙණෙහිම නය ගත්එකාට හෝ බඩුව රක්‍ෂාකළ එකාට හෝ අදත්තාදාන අකුශලය සිද්ධවේ, බොහෝ දෙනා එක්ව "යම්බඩුවක් හැරගණුම්හ"යි එක්සිත්ව කථාකොට සිටිකල්හි ඉන් එකෙක් ඒ බඩුව හැරගත්තේ වී නම් ඒ හැමදෙනාටම අදත්තාදාන අකුශලය සිද්ධවේ, තවද, යමෙක් බැම බිඳවත් ඇසින් තරුලාවත් හස්තපාද සංඥාවකින්වත් අන්සතුදෙයක් හැරගන්ට යමෙකුට මෙහෙ කළහොත් ඒ දැන ඔහුත් ඒ බඩුව හැරගති නම් ඒබැම බිඳීම් ආදි සංඥාකළ එකාට අදත්තාදාන අකුශලය සිද්ධවේ, තවද යමෙක් යමක්හට "අසවල්හුගේ බඩුව අසවල්තැන තිබුවා ඇරගන්ව"යි නියොග කොළේද ඒමෙහෙවර ඇසූවාවූ පුරුෂතෙම අවුරුදු පනසකින් සැටකින්වත් ඒ බඩුව එක තනයෙන් ගත්තේවේද එසේ ඇතිකල්හි මෙහෙවරකී එකාට එක විටම අදත්තාදාන අකුශලය සිද්ධව එදවස්හිම නැසීගියේ නමුත් සතර අපායෙහි උපදනේය, එසේ අනිෂ්ටවූ විපාකඇති අදින්නාදානයත් දුශ්ශීලමිනිසුන් සන්තකදේ ගැන්ම අල්පවූ අකුශලය, ගෝශීලාදීයෙහි යෙදිවසන එකක්හුගේ අයිතිදෙය හැරගැන්ම ඊටත්වඩා මහත් අකුශලය, තිසරණ පිහිටි කෙනෙකුගේ අයිතිදෙය හැරගැන්ම ඊටත් වඩා අකුශලය, පන්සිල් රක්නාකෙණෙකුගේ දෙයක් හැරගැන්ම ඊටත් වඩා මහත්අකුශලය, අටසිල්රක්නාකෙනෙකුන් අයිතිදෙය ගැන්ම ඊටත්වඩා මහත් අකුශලය, සාමණේරකෙණෙකුන්ගේ දෙය ගැන්ම ඊටත්වඩා මහත්අකුශලය, පෘථග්ජන භික්‍ෂුකෙණෙකුන්ගේ අයිතිදෙය ගැන්ම ඊටත් වඩා මහත් අකුශලය,

වත්‍ථු කාලො ච දෙසො ච සත්‍ථඤ්ච ඉරියාපථො,
කරණස්ස විසෙසොති ඡ ආණත්තිනියාමකා.

එහි වස්තුව නම් මරණප්‍රාප්ත සත්ත්වයාගේ නියමකිරීමය, කාලය නම් පූර්වාණ්හ අපරාණ්හාදි කාලය නියමකිරීමය, දෙසනම් ග්‍රාමාරණ්‍යවීථිසන්ධි යනාදිය නියමකිරීමය, ආවුධ නම් කඩු තෙප් යනාදී ආවුධ නියමකිරීමය, ඉරියාපථ නම් මැරියයුතු එකාගේ හෝ මරණ එකාගේ හිඳීම් සිටීම් ආදි ඊර්යාපථ නියමකිරීමය, ක්‍රියා විශෙෂ නම් විදීම කෙටීම ආදි මරණ ක්‍රියාව නියමකිරීමයයි මෙසේ සයාකාරයක් වේ, එසේම අසවල් එකා නියමකොට කිවහොත් එකීලෙසම ඔහු මැරීමෙන් ඒ මෙහෙවර කීඑකාටම ප්‍රාණඝාතය සිද්ධවන්නේය, ඔහු හැර අනිකක්හු මැරුවහොත් මෙහෙවර කීඑකාට අකුසල් සිද්ධනොවන්නේය, මේ මරණසත්ත්වයා නියමකිරීමෙහි විභාගයි.

පෙරවරු මරවයි කියාවත් පස්වරු මරවයි කියාවත් රාත්‍රියෙහි මරවයි කියාවත් දහවල් මරවයි කියාවත් නියමකලකල්හි එකීකල් වරදවා මැරුවහොත් මෙහෙවර කීඑකාට යටකීලෙසම ප්‍රාණඝාතය සිද්ධනොවෙයි, මැරුවහුටම අකුසල් සිද්ධවේ, මේ කල්නියමකිරීමෙහි විභාගයි.

ගමදීවත් නුවරදීවත් වනාන්තරයකදීවත් ගොඩකදීවත් දියකදීවත් මරවයි කියා මැරියයුතුතැන් නියමකොට මෙහෙවර කීකල්හි ඒ නියමකොට කීතැන් හැර අමුතුතැනකදී මැරුවහොත් ඒ මැරූඑකාට මිස කීවහුට ප්‍රාණඝාතය සිද්ධනොවන්නේය, මේ ස්ථානනියමයෙහි විභාගයි.

තෙබින් මරවයි කියාවත් කඩුවෙන් මරවයි කියාවත් ආයුධය නියමකොට කීකල නියමකල ආයුධයෙන් මැරුවහොත් මෙහෙවර කීවහුට ප්‍රාණඝාත අකුශලය සිද්ධවේ, නොකී ආයුධයකින් මැරුව හොත් මැරුවහුටම අකුශලය සිද්ධවේ, මේ ආයුධ නියමකිරීමෙහි විභාගයි.

සිටියදී මරවයි කියාවත් ඉන්දදී මරවයි කියාවත් යන එන තැන් ආදි ඉරියව් මරණ එකාගේ හෝ මැරියයුතු එකාගේ හෝ නියමකොට කීකල එකීලෙසම නියමකල ඉරියව්වකදී මැරුව හොත් කීවහුට අකුශලය සිද්ධවේ, අනික් ඉරියව්වකදී මැරුවහුටම ප්‍රාණඝාතය සිද්ධවේ, මේ ඉරියව් නියමකිරීමෙහි විභාගයි.

විද මරවයි කියා හෝ කපා මරවයි කියා හෝ ඇන මරවයි කියා හෝ මෙහෙවර නියමකල කල ඒ ඇසූ පුරුෂයාද ඔහු කීලෙ

සම මැරුයේ වී නම් මෙහෙවර කී එකාටත් ඒ අසා මැරූ එකාටත් යන දෙදෙනාටම ප්‍රාණඝාතය සිඹවේ, කිසැට වරදවා මැරුවහොත් ඒ මැරූ එකාටමුත් මෙහෙවර කී එකාට ප්‍රාණඝාතය සිඹනොවන්නේය, ඉදින් යමෙකු මරන්නට කියා මෙහෙවර කීද ඒ මෙහෙවර ඇසූ පුරුෂතෙම අවුරුදුපනසකින්වත් සැටකින්වත්ඇත නියම කළකලසම මරන්නේවේද මරන්ට නියොගකළ පුරුෂයා මෙහෙවර කී දවස්හිම උනේවීනම් ඔහට ප්‍රාණඝාත අකුශලය සිඹව සතර අපායෙහි උපදනේය, මේ ක්‍රියාවිශෙෂ නියමයෙහි විභාගයි.

මෙසේ අනුන් ලවාවත් අනුන්ට ව්‍යාජයෙන් පයඝ්‍රයෙන් කියාවත් වසවිෂ කා මියයවයි කියාවත් මරණයෙහි ගුණවණිනාකොට කීම්ආදියකින් වත් තමා විධානකොට හෝ අනුන් ලවා විධානකර වීමෙන් හෝ අනුන්ට පයඝ්‍රයෙන් කියා හෝ එසේම අනුන් ලවා කියවා හෝ මරණපිණිස මන්ත්‍රජපකිරීමෙන් හෝ එසේම අනුන් ලවා කරවා හෝ කාරණ නොයෙක් ප්‍රයොග අතුරෙන් එක්තරා ප්‍රයොගයකින් යට කියනලද ප්‍රයොගසය අතුරෙන් එක්තරා ප්‍රයොගයක් හා පස්අඟද සම්පූර්ණවීමෙන් පළමුවෙනි ශික්‍ෂාපදයාගේ භෙදය වේ.

හෙද අල්පඅකුශල්වූ ප්‍රාණඝාතයකුත් ඇත්තේය, මහත් අකුශල්වූ ප්‍රාණඝාතයකුත් ඇත්තේය, එහි කුරුකුහුඹුවන් ආදීවූ සවල්ප ප්‍රාණියෙකු මැරුව සවල්ප අකුශලය, ඊටත් මහත් සුනු සිකානල් මුගටි සාවුන් පටන් ක්‍රමක්‍රමයෙන් මහත් මහත් සත්වයන් මැරීමෙහි අකුශලයත් එසේම එකිනෙකාට වඩා මහත්වන්නේය, මේ සියල්ලවුන්ගේ ප්‍රාණයනැසීම එකවිවරවුවත් මහත් සතුන් මරන්ට කාරණ ප්‍රයොගය මහත් හෙයින් අකුශලයත් මහත් වන්නේය, මේ හැමටමවඩා දුස්සීල පාපි නමුත් මිනිසෙකු මැරීමෙහි අකුශලය මහත් වන්නේය, ඒ දුස්සීල මිනිසෙකු මැරීමට වඩා ගෝශීලාදියෙන් යුක්ත එකන්හුගේ මැරීමෙහි අකුශලය මහත, ඊටත් වඩා අෂ්ටසිල් රක්‍ෂාකරණ එකක්හුගේ මැරීමෙහි අකුශලය මහත, ඊටත් වඩා දශසිල් රකිනා මිණිසෙකු මැරීමෙහි අකුශලය මහත, ඊටත් වඩා ප්‍රථග්ජන භික්‍ෂුවකගේ මැරීමෙහි අකුශලය මහත, මේ හැමටම වඩා ශ්‍රොතාපත්ති සකෘදාගාමි අනාගාමි අර්හත් යන මේගුණවැඩි උතුමන් මැරීමෙහි ක්‍රමක්‍රමයෙන් අකුශලය මහත්වනබවදතයුතුයි.

මෙහි මරන්ට කාරණ ප්‍රයොගයම වී නමුත් ගුණයෙන් මහත් අය මැරීමෙන්ද ප්‍රයොගය මහත්කොට කිරීමෙන්ද අකුශල් මහත් වේ, ශරීරප්‍රමාණ ගුණප්‍රමාණ ප්‍රයොග සම්වීමෙනුදු කෙලෙසුන්ගේ මෘදුතීක්‍ෂණවශයෙන්ම අකුශලය අල්පවීමද මහත්වීමද දතයුතුයි.

මෙහි කුරුකුහුඹුවන් මැරීම ස්වල්ප අකුශලයයි කී වචනය ඊටත් වඩා මහත් සත්වයන් මැරීමෙන් සිද්ධවන අතිමහත් අකුශලය බලා කියනලදි, එබැවින් ක්ෂුද්‍රවූ සත්වයන් නසා සිද්ධවන අකුශලයන් ඔවුන්ගේ ශරීර සේ කුඩායයි නොසිතා නරකයට පමුණුවන හෙයින් මහත් අකුශලයයි දැන තමහට වැඩකැමති සත්පුරුෂයන් විසින් කුරුකුහුඹු ආදි ක්ෂුද්‍ර ප්‍රාණීන්ගේ ජීවිතය තමාගේ ජීවිතය මෙන් සලකා ප්‍රාණවධය නොකොට පළමුවෙනි ශීලයෙහි පිහිටිය යුතු, මෙම දක්වනලදි:—

ඛුද්දකානමපි ජන්තූනං ජීවිතංපිච සබ්බථා,
ජන්තූනා රක්ඛිතබ්බංව හිතකාමෙන අත්තනො,

එහි ප්‍රාණඝාතයෙන් දුරුවීම කැමැත්තන්විසින් මෙහි ප්‍රාණීන් ඇතැයි යන සංඥාඇතිව නොපෙරූ පැන් ප්‍රයොජනයට නොගත යුතු, ඒ පැන් විනාශකිරීමද නුසුදුසුයි, මේ දියෙහි ප්‍රාණීන් නැතැයි යන කල්පනා ඇතත් දිය නොපෙරා ගැන්ම වරදපක්ෂයෙහි ඇතුලත්බැවින් අකුශල්මයයි දැන ප්‍රාණවධයට භයඇත්තන්විසින් පැන් පෙරා ගතයුතුයි, මෙසේ දුරුකටයුතුවූ ප්‍රාණාතිපාත අකුශලකර්මය ලොභය ද්වේෂය මොහය යන අකුශලයන් තුන්දෙනාගේ එක්වීමෙන්ම සිද්ධ වේ, ඒ කෙසේදයත්? මොහුගේ මාංශ අනුභව කරම්යි ලොභඋපදවා හෝ මස්විකුට ගන්නා මිළයෙහි ලොභ උපදවා හෝ තමා විසින් මැරීමෙන් හෝ අනුන් ලවා මැරවීමෙන් හෝ ඇතුලත් ගැන්ම සහ මෙබඳු ලාභයක් උපදනේයයි පැවති ලොභයෙන් හෝ යනාදිවශයෙන් ලොභසිත් උපදවා ප්‍රාණවධකිරීමෙන් ඒ පාපය ලොභය මුල්ව සිද්ධවේ, මොහුටම අනර්ථයක් කෙළේයයි බද්ධවෛරයෙන් හෝ දැන් අනර්ථකෙරේයයි බද්ධවෛරයෙන් හෝ මතු අනර්ථකරන්නේයයි බද්ධවෛරයෙන් හෝ එසේම මාගේ ප්‍රිය විශ්වාසයන්ට නපුරක් මොහු පෙර කෙළේය, දැන් කෙරෙයි, මතු කරන්නේයයි බද්ධවෛරයෙන් හෝ අප්‍රියවූ මාගේ සතුරන්ට පෙර මොහු වැඩඋපකාරයක් කෙළේය, දැන් කෙරෙයි, මතු කරන්නේයයි බද්ධවෛරයෙන් හෝ නොකැමැතිව ද්වේෂයෙන් ප්‍රාණවධකිරීමෙන් ඒ පාපය ද්වේෂයම මුල්ව සිද්ධවේ, ශතයාග සහස්‍රයාගයෙහි එකී එකී කුලයෙන් සතුන් සියය බැගින් ගෙණ දහසකින් මරා යාගකරන්නාහට පවිනැති මහත් කුශලයකැයි කියා මැරීමෙන්හෝ වධයට පැමිණියවුන්ට වධකිරීම වරද නැතැයි කියා හෝ රජ්ජුරුවන්ට රාජාමාත්‍යාදින්ට ප්‍රාණවධකිරීම වරද නැතැයි කියා හෝ විෂඝොර සර්ප ගෝනුසු ආදිහුද මනුෂ්‍යයන්ට උපද්‍රවකෙරෙති, එබැවින් ඔවුන් මැරියයුතුයයිද මරන්නාහට වරද නැතැයි කියා හෝ

ඌරන් මුවන් කුකුලන් ආදි නොයෙක් සත්හු මනුෂ්‍යයන්ට උපකාර සඳහා උපන්නාහුය, එහෙයින් ඒ ඒ සතුන් මැරීමෙන් අකුසල් නැතැයි දෘෂ්ටියෙන් මැරීමෙන්හෝ යනාදිවශයෙන් මුළාව ප්‍රාණවධ කිරීමෙන් ඒ පාපය මොහය මුල්ව සිඬවේ, ලොභාදි අකුසලයන්ගේ එක්වීමෙන් ප්‍රාණාතිපාත කර්මය සිඬවනබව මේආදි ක්‍රමයෙන් දතයුතු.

මෙහි නිවරදිවිධිය නම්, මේ ප්‍රාණයෙක් නොවෙයි, මෙහි ප්‍රාණීන් නැත්තේය යන කල්පනාව ඇත්තාහටද සිහිනැතිව නොදන්නාහටද මේ සත්‍වයා මරමි යන සිත්නැත්තාහටද උමතුආදීන්ටද ප්‍රාණාතිපාතසඞ්ඛ්‍යාත සතුන් නැසීමක් අන්පරිද්දකින් සෙදුනු නමුත් අටුවාකථායෙහි නිවරදියයි දක්වූ බැවින් ඔවුන්ට යටකී අඞ්ගයන්ගේ අඩුබව හෙතුකොටගෙණ ප්‍රාණඝාත අකුශලකර්මය සිඬනොවේ, මේ ප්‍රාණාතිපාත අකුශලකර්මයෙහි හෙදයි, එහි ආදීනව නම් කවරහයත්.

පාණාතිපාතො භික්ඛවෙ ආසෙවිතො භාවිතො බහුලීකතො නිරය සංවත්තනිකො හොති, තිරච්ඡාන යොනිසංවත්තනිකො හොති, පෙත්තිවිසයසංවත්තනිකො හොති, යො සබ්බලහු සො පාණාතිපාතස්ස විපාකො මනුස්සභූතස්ස අප්පායුකසංවත්තනිකො හොති.

යනාදීන් බුදුන් විසින් වදාළහෙයින් අනෙකාදීනව ඇති ප්‍රාණාතිපාත අකුශලය යම්කිසිවක්හු විසින් ආසෙවිතභාවිත බහුලීකෘත වශයෙන් පුරුදුකරණලදද ඒ සත්‍වතෙම නරකයෙහි ඉපිද නොයෙක්වාදහස් මුළුල්ලෙහි මහත් නරකදුක් විඳ එයින් මිදීගියකල තිරිසන් අපායෙහිද ප්‍රාමාණාතික්‍රාන්තවූ දුක්විඳ එයින් මිදීගියකල බලවත් දුකින්ගැවසීගත් ප්‍රෙතඅසුර අපාදෙක්හිදු ඉවසිය නොහැකි අනන්ත දුක්අනුභවකිරීමෙන් පව්ගෙවීගියකල කිසි පින්කම් සිදුරකින් මිනිසත්බවට පැමිණියේ වී නම් ශෙෂවසිටි එම ප්‍රාණාතිපාත අකුශලකර්මබලයෙන් මනුෂ්‍යදෙහය ශොභාඇතිපරිද්දෙන් නොව ශරීර අවයවයන්ගේ විපරීතවූ විරූපබවය ආරොහපරිනාහසම්පන්නනොව කෘශවූ ශරීර ඇතිබවය ජවබලසම්පත්තියක් නැතිබවය සමව බිම නොවදනාවක්වූ පතුල් ඇතිබවය විරූපදර්ශනව දුටුවන්ට රිසිනොවන අප්‍රියබවය මෘදුමොළොක් නොව කෘරවූ අතුල් පතුල් ඇතිබවය සුවිපිරිසිදුකමක් නැතිබවය බලනැතිබවය විසාරදනොවන වචනඇතිබවය සියලුදෙනාට අප්‍රිය බවය හැමකල්ම භයින් තැතිගන්නා බවය අනුන් විසින් නැසියහැකි බවය එසේකළ උපක්‍රමයෙන් මිය යන බවය පිරිවර මදබවය රූවනැතිබවය විවණී

බවය බොහෝ රෝගපීඩා ඇතිබවය බොහෝ සෝක ඇති බවය ප්‍රියමනාපයන්ගෙන් වෙන්වනබවය ආයු මදබවය යනාදි නොයෙක් අකුශලඵලවිපාකයෝ ඔහට ඇතිවන්නාහුය.

තවද ප්‍රාණාතිපාත පාපකර්මය කිරීමෙහි නියුක්ත පුද්ගලතෙම එම ආත්මභාවයෙහිම දඬුමුගුරු ආයුධවලින් පහරවැදීමෙන් නැසෙන්නේදවෙයි, එයින් චුතව ගොස් දක්වනලද ක්‍රමයෙන්ම සතරඅපායදුක් විඳ බොහෝදීර්ඝකාලයකින් එයින් මිදී අවුත් මනුෂ්‍ය ජාතියෙහි දවසින් දවසට වඩනා මහත් සම්පත් ඇති කුලයෙක්හි දක්නට නිසියේ දුටුදුටුවන්ට සතුටුප්‍රසාද එලවන උතුම් ශරීරවර්ණ පොක්ඛරතායෙන් සමන්විතව උපන්නේ වී නමුදු එබඳු සම්පත් නොවලඳ තරුණවයසෙහිම එකාන්තයෙන් මරණයට පැමිණේ, එහෙයින් කියනලදී.

සබ්බොපභොගධනධඤ්ඤවිසෙසලාභී,
රූපෙන හො සමකරඩජසන්නිභොපි
යො යොබ්බනෙපි මරණං ලභතෙ අකාමං
කාමං සදා තු පරපාණ හරො නරො හි—සී.

එහෙයින් ප්‍රාණාතිපාත අකුශලකර්මය කළ සත්වයෝ අහස්හි සිටියාහු නමුදු සමුද්‍රමධ්‍යයට පැමිණියාහු නමුදු විදුරුපර්වතගුහාව කට වැදුනාහු නමුදු ඒ පාපකර්මයෙන් නොමිදෙන්නාහුය, කේ සෙසේදයත්.

පෙර එක් මිනිසෙක් කර්මාන්තයෙහි නොපවත්නා ගොණෙකු මරණපිණිස පිදුරු ලා ගිනි දල්වා මැරුයේය, හෙතෙම ඒ කර්මයෙන් අවීචිමහානරකයෙහි ඉපිද නොයෙක්වාදහස් පැසී මහදුක්විඳ එයින් මිදී ගියකල සියක්ජාතියක අහස්හිම පිදුරු ගින්නෙන් දද මරණයට පැමිණියේය.

අන්‍යවූ ස්ත්‍රියක්ද බල්ලෙකුගේ ග්‍රීවයෙහි වැලිකලයක් බැඳ දියෙහි ගිලා මරා ඒ පාපකර්මයෙන් අවීචියෙහිම ඉපිද අනන්තවූ දුක් අනුභවකොට එයින් මිදී ගියකල සියක්ජාතියක නැව් නැගී යනකල මුහුද මැදට නැව පමිණිකල ඇගේ ඒ පාප කර්මබලයෙන් නැව නොගොස් බැඳුණක්මෙන් සිටිබව දැක විමසා කාලකණ්නියලා කය ඇගේ නමටම පැමිණිහෙයින් එසේම කර වැලි බැඳ දියෙහි ගලනලදුව මරණයට පැමිණියාය.

අන්‍යවූද ගොපලුදරුවන් සත්දෙනෙක් ගොයෙකු තුඹසෙහි වන් බව දැක ඒ තුඹස සිදුරුමුඛ වසා සිට සත්දවසක් ගියකලතැරි

යාහුය, ඒ ගවපාලක දරුවන් සත්දෙන ඒ ගොයා නොමැරුබැවින් තරකයට නොගොස් දසසහරවාරයක පර්වතවිවරයට වැද ගල්පු වරුවෙන් වැසිගිය දොර ඇතිව සප්සත්දවස් නිරාහාරව දුකින්ම මැස ජීවිතය පමණක් රැකි නික්මිගියාහුය, මෙසේ ප්‍රාණාතිපාත පාපකර්මය කළාහු අහස්හි සිටිය නමුත් මුහුද මැදට පර්වතවිවරයට වන්නාහු නමුත් ඒ පාපයෙන් මිදීමක් නැත්තාහුය, මෙම වදාරණ ලද බුදුන් විසින්:-

න අන්තලික්ඛෙ න සමුද්දමජ්ඣෙ
න පබ්බතානං විවරං පවිස්ස.
න විජ්ජති සො ජගතිප්පදෙසො
යත්‍රට්ඨිතො මුච්චෙය්‍ය පාපකම්මා'ති-යි.

## අදත්තාදානය නම්.

අනුන් සන්තක වස්තුව ඒ වස්තුව හිමියාගේ කයින් හෝ වචනයෙන් හෝ නොදීමෙන් ගැණීම අදත්තාදානනම්, ඒ කෙසේද කිවහොත්, යම් කිසි වස්තුවක් යමක්හු තුමු කැමැති පරිද්දෙන් අනුභවකරණකල්හි ලොව ඇත්තෝ ඒ දැක අනුන්සන්තකදෙයක් මොහු අනුභව කරන්නේයයි නිඥාවක් නොකෙරෙද්ද, නිතිදන් නා අය විචාර දඬයක් ඔහුට නොපමුණුවද්ද, ඒවස්තුව ඔහු සන්තකවස්තුව නම් වන්නේය, එසේවූ වස්තුවක් අනුන් සන්තකයයි දැන දැන ඒ වටිනාදෙයකුත් නොදී යමෙක් හැරගන්නේ වී නම් ඔහුගේ ඒ හැරගන්නා ප්‍රයොගය පහළකරන්නාවූ හැරගන්නහුගේ කායවාර වාක්වාර දෙක්හි යෙදී පැවැත්නාවූ ඒ මේ චෙතනාව අදත්තාදාන අකුශල නම් වන්නේය, හේදවනාහි:-

මනුස්ස භණ්ඩං තථාසඤ්ඤී ථෙය්‍යචිත්තං උපක්කමො,
තෙනෙව භණ්ඩහරණං පඤ්චඅඞ්ගානි ථෙනි තෙ-යි.

යනුහෙයින් යමෙකු ඇරගන්ට සිතලූ වස්තුව අනික් මිනිසෙකු අයිති බවය එසේ අනුන් අයිතියයි කියා තමාටත් සිතෙන බවය, හිමියන් නොවිචාරා නොකැමැතිසේ ඇරගණිමි යන කල්පනාඇතිබවය අනුන්ලවා හෝ තමාවිසින් හෝ ඇරගන්ට කරණ පඤ්චප්‍රකාරඋත්සාහ ප්‍රයොගයන් අතුරෙන් එක්තරා ප්‍රයොගයක් ඇතිබවය ඒ කළප්‍රයොගයෙන් අනුන්ට හෝ තමාට හෝ අයිති කොට ඒ වස්තුව ඇර ගැණීමය යන මේකාරණයන් පස්දෙනාගේ එක්වීමෙන් අදත්තාදාන අකුශලය සිඹවේ, එයින් එක්කාරණයකුදු අඩුවූව අදත්තාදාන අකුශලය සිඹනොවේ,

එහි අනුන්අයිති වස්තුව වඤ්චාවෙන් ගැණීමය යන ථෙය්‍යාවහාරය බලාත්කාරයෙන් ගැණීමය යන පසය්හාවහාරය සඟවා ගැන්මය යන පටිච්ඡන්නාවහාරය කල්පනාවශයෙන් නියමකර ගැන්මය යන පරිකප්පාවහාරය කුසපත් සලකුණු පමුණුවා ගැන්මය යන කුසාවහාරය යන මේ පඤ්චප්‍රකාර අවහාරයන් අතුරෙන් යමෙක් මහවනාන්තර බැදිතැන් ආශ්‍රයකොට එහි සැඟවීසිට කරණසොර කම්ද, උමංබිද අඳුරේ සැඟවීසිට කරණ සොරකම්ද, තරාදියෙන් පලමින් කරණ සොරකම්ද, තෙල්ආදිය මිනීමෙන් වස්තු හිමියන්ගේ සිත් බිඳුවා කරණ සොරකම්ද, වී ආදිය මිනීමෙන් ඉමවරදවා ගැන්මෙන් කරණ සොරකම්ද, සොරපණම් ආදිය දී කරණ සොරකම්ද, යනාදිවශයෙන් පඤ්චප්‍රකාර සොරකමුත් අදත්තාදාන නම් වෙයි.

යමෙක් බලාත්කාරකම් හඟවා ගම් පැහැරීම ආදිවශයෙන් අනුන්සන්තකදේ බලාත්කාරයෙන් උදුරාගැන්මද, ගතයුතු නියමවූ අයබදු අමුතුවෙන් වඩවඩා ගැන්මද, ලොකනීතිවරදවා දඩ ගැන්මද, අදත්තාදාන අකුශල නම් වේ, මේ හැමතන්හිම වස්තුව තමා අයිතිකොට ගත්කල්හිම අදත්තාදාන අකුශලය සිඬවේ, යමෙක් අනුන්සන්තක දාසයෙකුවත් දාසියෙකුවත් ගොන්මීගොන් දෙනුන් කුකුලන් බල්ලන් බළලුන් ආදිවූ යම් කිසිසත්වයෙකුවත් වඤ්චාවෙන් ගණිමි යන සිත් ඇතිව කයින් කළප්‍රයොගයකින් හෝ වචනයෙන් කළප්‍රයොගයකින් හෝ සිටිතැනින් අඟලක් පමණ හැන්වත් ඇත් මැත් කෙළේ වී නම් පසුව හැරපියා ගියත් අදත්තාදාන අකුශලය ඔහට සිඬවන්නේය, කොත්වත් සථාවර අවස්තු ආදි යම්කිසිවක් නිසා යුක්තායුක්ති නඬුවිනිශ්චයකිරීමක් පැමිණිතැන හිමි එකාට අහිමි කොට කීකල්හි හිමි පුරුෂතෙම ඒ අසා "මේලාභය මට සම්භනොවන්නේය"යි සිතා ඒ වස්තුයෙහි පැවති ඔහුගේ ආලය හැරපියේ වී නම් ඒ ආලය හැරපීම හා සමනම අයුක්ති කොට කී අයටද ඊට සහායව ශාක්ෂි කී අයටද අදත්තාදාන අකුශලය සිඬවේ, ආරාම උද්‍යානාදි යම්තැනක තුබූ අනුන්සන්තක බඩුවක් දුක "ඒ බඩුව වඤ්චාකොට ගණිමි"යි සිතා බිමින් කෙසගක් පමණතැන් ඔසවාගත් කෙණෙහි හෝ ඇතකෙළවර මැතකෙළවර ගෙවා පැමිණිකෙණෙහිම අදිත්තාදාන අකුශලය සිඬවේ, එසේ ගෙණ නැවත තුබූලෙසම තබා ගියත් සසර විසීම ඇත්තානට ඒ පාපයෙන් මිදීම නැත්තේය, අනුන් අයිති කොනකින් කරලක්වත් ගසකින් එලයක්වත් මල්කොලආදි කිසිවක්වත් සොරසිතින් නටුවෙන් වෙන්කළ ඇසිල්ලෙහිම අදත්තාදාන අකුශලය සිඬවේ, යමෙක් අනුන්අයිති රන්පණම්ආදි යම්කිසිබඩුවක්දමා තුබූවාදුක

පසින් සටකිරීම්ආදි ප්‍රයොගයකින් යටිකෙළවරතුබුනැනට මතුකෙළවර පාත්වූ ක්‍ෂණයෙහිම අදින්නාදාන අකුශලය සිඬවේ, යමෙක් අනුන්කී මෙහෙවරකින් හෝ තමාගේ අභිප්‍රායෙන් හෝ අනුන් අයිති බඩුවක් ගෙණ "අසවල් තැනට ගෙණ ගොස් දෙමි"යි කියා ගෙණයනුයේ ඒ යම්න් සිට අතර මගදී උපන් සොරසිතින් "මම ගණිමි"යි සිතා තමා ශිස තුබුබඩුව කරට හෝ කරතුබුබඩුව හිසට හෝ ගත්තේ වී නම් එකෙණෙහිම අදින්නාදාන අකුශලය සිඬවේ, පසුව ඒ බඩුව අයිති හිමියන්ට ගෙණ ගොස් දුන්නත් ඒ අකුශලයෙන් මිදීමක් නැත්තේය; එසේම බඩුවක් ගෙණයනමිනිසෙකු හෝ ගොණෙකු හෝ දැක "ඒ බඩුව ඇර ගනිමි" යනසිතින් භය ගැන්වූකළ ඒ බඩුව දමාගේ නම් ඔහුගෙන් ඒ බඩුව අත්ඇරුණු විටම මොහු නොගත්තේ වී නමුත් අදින්නාදානා අකුශලය සිඬවේ, යමෙකුට තයට දුන්බඩුවක්වත් රක්‍ෂාකර තබන්ට දුන්බඩුවක්වත් ඉල්ලූකළ බඩුව ගත්එකා නොදෙන පිණිස ව්‍යාප්‍රයොග කොට "නොදෙමි"යි සිතා නම් බඩුව ඇත්තාහුගේ එහි පැවති ආලයත් උත්සාහයත් දෙවනු නොලැබෙයිම සිතා හැරපුකෙණෙහිම නය ගත්එකාට හෝ බඩුව රක්‍ෂාකළ එකාට හෝ අදත්තාදාන අකුශලය සිඬවේ, බොහෝ දෙනා එක්ව "යම්බඩුවක් හැරගණුම්හ"යි එක් සිත්ව කථාකොට සිටිකල්හි ඉන් එකෙක් ඒ බඩුව හැරගත්තේ වී නම් ඒ හැමදෙනාටම අදත්තාදාන අකුශලය සිඬවේ, තවද යමෙක් බැම බිඳවත් ඇසින් තරුලාවත් හස්තපාද සංඥාවකින්වත් අන්සතුදෙයක් හැරගන්ට යමෙකුට මෙහෙ කළහොත් ඒ දැන ඔහුත් ඒ බඩුව හැරගනි නම් ඒබැම බිඳීම් ආදි සංඥාකළ එකාට අදත්තාදාන අකුශලය සිඬවේ, තවද යමෙක් යමක්හට "අසවල්හුගේ බඩුව අසවල්තැන තිබුවා ඇරගන්ව"යි නියොග කොළේද ඒමෙහෙවර ඇසූවාවූ පුරුෂතෙම අවුරුදු පනසකින් සැටකින්වත් ඒ බඩුව එකනානයෙන් ගත්තේවේද එසේ ඇතිකල්හි මෙහෙවරකී එකාට එකවිටම අදත්තාදාන අකුශලය සිඬව එදවස්හිම නැසීගිය නමුත් සතර අපායෙහි උපදනේය, එසේ අනිෂ්ටවූ විපාකඇති අදින්නාදානයත් දුස්සිලම්නිසුන් සන්තකදේ ගැන්ම අල්පවූ අකුශලය, ගෝශිලාදීයෙහි යෙදීවසන එකක්හුගේ අයිතිදෙය හැරගැන්ම ඊටත්වඩා මහත් අකුශලය, තිසරණ පිහිටි කෙනෙකුගේ අයිතිදෙය හැරගැන්ම ඊටත් වඩා අකුශලය, පන්සිල් රක්නාකෙණෙකුගේ දෙයක් හැරගැන්ම ඊටත් වඩා මහත්අකුශලය, අටසිල්රක්නාකෙනෙකුන් අයිතිදෙය ගැන්ම ඊටත්වඩා මහත් අකුශලය, සාමණේරකෙණේකුන්ගේ දෙය ගැන්ම ඊටත්වඩා මහත්අකුශලය, පෘථග්ජන.භික්‍ෂුකෙණෙකුන්ගේ අයිතිදෙය ගැන්ම ඊටත් වඩා මහත් අකුශලය;

සෝවාන් සකෘදාගාමි අනාගාමි රහතුන්ගේ දෙය ගැන්මද, සඞ්ඝ සන්තකදෙය ගැන්මද, ධර්මසන්තක බුද්ධසන්තකදෙය හැරගැන්මද ක්‍රමක්‍රමයෙන් සරණගතයා පටන් බුද්ධාදි තුනුරුවන් සන්තකදෙය ගැන්ම දක්වා අකුශල් මහත්බව මහපොළොවේ පස්මෙන් අප්‍රමාණ බව දතයුතුයි.

තවද යමෙක් ජීවත්වනු සඳහාද අඹුදරු ආදින් රක්නා සඳහාද අනුන් සන්තක නුදුන් වස්තුව ගත්තේ වී නම් ඕහට අදින්නාදානය මොහය මුල්ව සිඩවේ, අනුන්සන්තකදෙයින් යමෙක් තමාට ප්‍රයෝජන නැතත් යටකියනලද ක්‍රමයෙන් නවආඝාත වස්තූන් හෙතුකොට ගෙණ වෛර උපදවා ගෙණ අනුන් සන්තක වස්තුව විනාශකරන්නාහට අදින්නාදානය ද්වේෂය මුල්ව සිඩවේ, නීති ශාස්ත්‍රයෙහි කීසේ "දුෂ්ට නිග්‍රහ කරමහ"යි කියා අනුන්සන්තක වස්තුව උදුරාගන්නා රජ්ජුරුවන්ටද රාජාමාත්‍යයන්ටද සොරුන් අයිති ද්‍රව්‍ය නොදෙන්නත් සන්තක දේ ගන්නාහටද පවිනැතැයි යනාදිවශයෙන් නොයෙක් දෘෂ්ටිගෙණ අනුන් සන්තක දේ ගන්නාහටද අදින්නාදාන අකුශලය මොහය මුල්ව සිඩවේ, මෙසේ ලොභාදි අකුශලයන්ගේ එක්වීමෙන් අදින්නාදාන අකුශලය නොයෙක් ප්‍රකාරයෙන් සිඩවේ, මේ අදින්නාදාන අකුශලයාගේ ප්‍රභෙදයි, එහි ආදීනව නම් කවරහයත්:—

"අදින්නාදානං භික්ඛවෙ ආසෙවිතං භාවිතං බහුලීකතං නිරය සංවත්තනිකං හොති, තිරච්ඡාන යොනිසංවත්තනිකං හොති, පෙත්තිවිසයසංවත්තනිකං හොති, යො සබ්බලහු සො අදින්නාදානස්ස විපාකො මනුස්සභූතස්ස මනුස්ස දෙශගතියසංවත්තනිකං හොති"—යනාදීන් බුදුන් විසින් වදාළ හෙයින් යමක්හු විසින් අදින්නාදාන අකුශලකර්මය ආසෙවිත භාවිත බහුලීකෘතවශයෙන් කරණලදද ඒ සත්වයෝ නරකදුඃඛාදි සියලු දුඃඛොත්පත්තියට නිසිව කළාවූ එම පාපකර්මබලයෙන් නරකාදි සතරඅපායදුක දක්වනලද ක්‍රමයෙන් අනුභව කිරීමෙන් ප්‍රමාණාතික්‍රාන්තවූ දීර්ඝකාලයක්හුගේ ඇවෑමෙන් පව් ගෙවී ගියකල කිසියම් පින්කම් සිද්ධරකින් මිනිසත් බවට පැමිණියානු නම් අවශෙෂවූ සියල්ලෙන් කුඩාවූ අදින්නාදාන පාපකර්මයතෙම නොයෙක් පරිද්දෙන් අසරණවූ ඉතාදිළිඳු දුගීබවට පමුණුවන්නේවෙයි, තවද:—

යථාරූපානං ඛො පාපකානං කම්මානං හෙතුරාජානො ආගුචාරිං චොරං ගහෙත්වා විවිධා කම්මකාරණා කාරෙන්ති"—යි වදාළ බැවින් ඒ අදත්තාදාන පාපකර්මසම්බන්ධි පුද්ගලතෙම මේ ආත්මභාව යෙහි කමුස්තිත වේවැල්පහර ලැබීම් ආදි නොයෙක් දුඃඛානුභාවයට

නිසිවූ ඒ පාපකර්මහෙතුයෙන් එම ජාතියෙහි ඕහට කසපහර වේ වැල් පහර දෙති, අඩ්ඪබාහුප්‍රමාණ දණ්ඩන් තලති, එසේම ඔහු අත් කපති, පා කපති, අත්පා කපති, කන්කපති, නාසා කපති, කන්නාසා කපති, මේ ආදී සියලු දුකට කාරණාවූ එම අදින්නාදාන පාපකර්මබලයෙන්ම නොයෙක් වර්ෂකොටි ශතසහශ්‍රවල ඝොරවූ නරක දුක් අනුභව කොට එයින් මිදී ප්‍රෙතයොනියෙහි ඉපිද එහි මහත්වූ සා පිපාස දුක් අනුභව කිරීමෙන් නොයෙක් අන්තඃකල්ප අතික්‍රාන්තව ගියකල හෙතෙම මිනිසත්බවක් ලද්දේ වී නම් එහිද ඉතා දිළිඳුව බැගෑපත්ව සාවකාව දුටුදුටුවන්ට නොරිසිවනසේ විරූපව නිඳු නපුරුවචන සියගණන් කිසා නැතිගන්වනු ලබමින් නොයෙක් කුණු රෙදිවැරලි ගොතා ඉනවට වසාගෙණ උකුණන් විසින් ගැවසීගත් හිස්ඇතිව රජස් දූලිවැකීගිය ශරීර ඇතිව ශොක පිරිසිව සිත් ඇතිව නිරන්තරයෙන් නොයෙක් අඳෝනා විලාප කිමෙන් විවෘතවූ මුඛ ඇතිව මනුෂ්‍යප්‍රෙතව වෙව්ලන බිඳුනු ශරීර යෙන් කබල්ගෙන් අත්ඇතිව දොර දොර සිඟා ඇවිදින්නේය, එහෙසින් කියනලදි පුරාතනයන් විසින්:—

යො යාචකො භවති භින්නකපාලහත්ථො
මුණ්ඩාධිගක්ඛරසතෙහි ච තජ්ජයන්තො,
භික්ඛං සදාරි භවනෙස කුචෙලවාසො
දෙහී පරත්ථ පරවිත්ත හරො නරො හි.

මෙසේ මෙලෝ පරලෝ දෙක්හිම සියලු දුක් පලකොට ඇති අදින්නාදානඅකුශලයෙහි යෙදුනු සත්වතෙම මිනිස්ලොව උපනුපන් ජාතිවලැ බොහෝවූ ධනධාන්‍යයන් නැතිබවය, භොගසම්පත් ඉතාමදබවය, නූපන්භොග නූපදිමය, උපන්භොග සථිරනොවීමය, කැමතිසේ පඤ්චකාම සැපයාගේ නොලැබීමය, රජ සොර දිය ගිනි. අප්‍රියෝය යන උපද්‍රවවලින් නැසෙනසුළු භොගසම්පත් ඇතිබවය, අසාධාරණ උතුම් ධනයන්ගේ නොලැබීමය, සියලු ලොකයාට යටත්වන නීචබවය, ඇතැසි යන වචනයාගේ ඇසීමක් නැතිබවය, හැමකල්හි දුකින්ම වාසයකරණ බවය යන මේ ආදීවූ අනන්තවූ අකුසලඵලවිපාකයෝ ඕහට ඇතිවන්නාහුය, මෙසේ සියලු දුකට භාජනවූ අදින්නාදාන අකුශලයාගේ ප්‍රභෙදදීනව මේආදික්‍රමයෙන් අසා දැන ඇඳින තමහට වැඩ කැමති සත්පුරුෂජනයන් විසින් අනුන් සන්තක සියලු වස්තුව ගිනි සෙයින් විෂ සෙයින් ඝොර විෂ සර්පයන් සෙයින් දුරින්ම දුරුකොට එයින් සුණුවතක් ද කඩතුල් පටක් පමණවූ ඉතා මදදෙයක් වත් තමනාමාත් නොගතයුතුයි, අනුන් ලවාත් නොගැන්විය යුතුයි, මෙම දක්වනලදමැයි:—

එවං අදින්නං ධනමාදියන්තො
දිට්ඨෙව ධම්මෙ නරකෙසු චාපි,
පප්පොති දුක්ඛං ව්‍යසනඤ්ච නෙකං
සදා පරස්සෙසු රතො නරොහි.

තතො අදින්නං පරිවජ්ජයෙය්‍ය
කිඤ්චිකච්චි සාවකො බුජ්ඣමානො,
නහාරයෙ හරතං නානුජඤ්ඤා,
සබ්බං අදින්නං පරිවජ්ජයෙය්‍ය—යි.

මේ අදින්නාදාන අකුශලයාගේ ආදීනවයි.

කාමමිථ්‍යාචාරය නම්, ක්ලේශකාමවශයෙන් හැසිරෙණ ලාමකවූ නින්දිතවූ කායද්වාරයෙන්ම සිඳුවන අකුශල කර්මපථයෙක්මය, සෙදවනාහි අනුන් සන්තක ස්ත්‍රියක් බවය මේ ස්ත්‍රිය අනුන්සන්තකයයි දැන මෛථුනසෙවනය කෙරෙමි යන සිත ඇතිබවය මගින් මග මෙහෙයන බවය ඉවසීමය යන මේ කාරණයන් සතරදෙනාගේ එක්වීමෙන් කාමමිථ්‍යාචාර අකුශලය සිඳවේ.

එහි අනුන්සන්තක පරස්ත්‍රිහු නම් කවරහුදයත්:—

“මාතුරක්ඛිතා, පිතුරක්ඛිතා, මාතුපිතුරක්ඛිතා, භාතුරක්ඛිතා, භගිනිරක්ඛිතා, ඤාතිරක්ඛිතා, ගොත්තරක්ඛිතා, ධම්මරක්ඛිතා, සාරක්ඛා, සපරිදණ්ඩා ධනක්කීතා, ඡන්දවාසිනී, පටවාසිනී, ඔදපත්තකිනී, ඔභතචුම්බටා, දාසි, භරියා, කම්මකාරිච භරියා, ධජාහටා; මුහුත්තිකා”ති—යි. මෙසේ පරස්ත්‍රිහුනම් විසිවැදෑරුම්වන්නාහුය, එසින් පුරුෂයන් හා අනාචාරයෙහි යෙදෙනු නොකැමැතිව මෑනියන් විසින් රක්නා ලද ස්ත්‍රිය මාතුරක්ඛිතා නම් වන්නිය, එසේම පියාණන් විසින් රක්නාලද ස්ත්‍රිය පිතුරක්ඛිතා නම් වන්නීය, මව්පිය දෙදෙනා විසින් රක්නා ලද ස්ත්‍රිය මාතුපිතුරක්ඛිතා නම් වන්නීය, බෑයා විසින් රක්නා ලද ස්ත්‍රිය භාතුරක්ඛිතා නම් වන්නීය, බුහුණිනියන් විසින් රක්නාලද ස්ත්‍රිය භගිනිරක්ඛිතා නම් වන්නීය, නෑයන් විසින් රක්නාලද ස්ත්‍රිය ඤාතිරක්ඛිතා නම්වන්නීය, ස්වකීය ගොත්‍රයෙහි ඇත්තන් විසින් රක්නාලද ස්ත්‍රිය ගොත්තරක්ඛිතානම් වන්නීය, ස්ත්‍රිය බාලකාලයෙහිම “මෑ මට භාර්‍ය්‍යාවන්නීය”යි කියා මල්පිළිපළඳවා හෝ යටත්පිරිසයින් මල්දමක් පමණවත් දීමෙන් නියමකරණලද ස්ත්‍රිය සාරක්ඛා නම් වන්නීය, මෙනම් ස්ත්‍රියලඟට ආවුන්ගෙන් මෙතෙක් දඩයයි සම්මතකරණලද ස්ත්‍රිය සපරිදණ්ඩා නම් වන්නීය, පුරුෂයා විසින් මිළදීගෙණ වාසයකරණලද ස්ත්‍රිය

ධනක්කීතා නම් වන්නීය, පුරුෂයා හා තමාගේ ප්‍රියයෙන් එක්ව වාසයකරණ ස්ත්‍රිය ඡන්දවාසිනී නම් වන්නීය, දෙමව්පිය ආදී නෑයන් විසින් මේ භාජනයේ උදකයමෙන් නොපදෙදෙනා වෙන් නොවෙන්වයි කියා මඟුල්කොට පාවාදෙනලද ස්ත්‍රිය ඔදපත්තකිනී නම් වන්නීය, පැන්තොට ආදී තැන්හි දක්‍ක දියදර අදනාපිණිස හිසදැඹු සුඹුලු බහවාපියා භාර්‍ය්‍යාකොටගෙණ වසන ස්ත්‍රිය ඔභතචුම්බටා නම් වන්නීය, දාසිව සිට ස්වාමියා කෙරෙහි වාසය කරණලද ස්ත්‍රිය දාසි නම් වන්නීය, තමාගේ ස්වාමියා කෙරෙහි වාසය කරණ ස්ත්‍රිය භාර්‍ය්‍යා නම් වන්නීය, මෙකීනාක් ප්‍රකාරයෙන් පිටතව ගෙයි මෙමෙහෙකොට වසන ස්ත්‍රිය කම්මකාරී භාර්‍ය්‍යා නම් වන්නීය, යුද්ධකොට දිනුනැතින් ගෙණනලද ස්ත්‍රිය ධජාහටා නම් වන්නීය, අවධිපරිච්ඡේද කොට මෙතෙක් දවසට මෙතෙක් මිළයයි මිළනියම කොට ගත් වෛශ්‍යා ස්ත්‍රිය මුහුත්තිකා නම් වන්නීය, යන මේ ස්ත්‍රීහු විසිදෙනම පරදූරාවෝ නම් වෙත්, මොවුන් විසිදෙනාකෙරෙන් පළමුකොට දක්වූ මාතුරක්ඛිතාදී ස්ත්‍රීන් අටදෙනා හා මාතෘ ආදී ඒ ඒ ආරක්ෂකයන්ගේ නියොගයෙන් අනාචාරයෙහි යෙදුනු පුරුෂයන්ට පාපකර්‍ම්ය නොවෙයි, එසේ නැතිවුන්ට පරදූරපාපකර්‍ම්ය සිද්ධවේ, ඒ ස්ත්‍රීන් අටදෙනාගේ ශරීරස්පර්ශයට හිමිවූ අනික් ස්වාමිපුරුෂයෙකු නැතිහෙයින් මාතුරක්ඛිතාදී ඔවුන් අටදෙනාම කාමමිථ්‍යාචාර පාපය සිද්ධ නොවේ, අවශෙෂ දොළොස්දෙනා හා අසද්ධර්මයෙහි පැවති පුරුෂයන්ටද ඒ ස්ත්‍රීන් දොළොස්දෙනාටද කාමමිථ්‍යාචාර පාපය යට කියනලද අඞ්ගයන්ගේ එක්වීමෙන්ම සිද්ධවේ, එය අදිත්තාද්‍යාන අකුශලය ගුණහීනයන් පටන් අධික ගුණ ඇති උතුමින් දක්වා පාපය මහත්වූවාසේ මෙහිද තිසරණය පඤ්ච ශීලය අෂ්ටාඞ්ගශීලය යනාදි ශීලගුණධර්මවල පිහිටා වසන ස්ත්‍රීන්හා අනාචාරයෙහි යෙදීමෙන්ද අකුසල් මහත්වනබව දතයුතුයි.

තවද මෙකී ස්ත්‍රීන් විසිදෙනාගේ යහපත්වූ ශරීරවර්ණශොභා වෙහිහා වස්ත්‍රාභරණ හස්තපාදාදියෙහි ආලය උපදවාද තමාට ප්‍රියවූ එබඳු රූපය, ශබ්දය, ගන්ධය, රසය, ස්පර්ශය යන පඤ්චකාම සෙවනයෙහි ආලය උපදවාද ඔවුන් හා කළ එක්වීම නිසා මෙවැනි ලාභ සත්කාර කීර්ති ප්‍රශංසා ස්ථානාන්තර ලැබීම හා සුවසේ ජීවත්වීම පිළිවනැයි කියා ඒ හැමතන්හි ලොභ උපදවා අනාචාරයෙහි යෙදෙන්නාහට මිථ්‍යාචාර අකුශලය ලොභය මුල්ව සිද්ධ වේ, පරස්ත්‍රීන් විසිදෙනා කෙරෙහිදු ඔවුන් රක්නා මව්පිය ආදීන් හා ස්වාමිපුරුෂයන් කෙරෙහිදු වෛර උපදවා "ඔවුන්ගේ මානනසම්"යන කල්පනාවෙන් අනාචාරයෙහි යෙදෙන්නාහට මිථ්‍යාචාර අකුශලය ද්වෙෂය

මුල්වූ සිඬ වේ, ගමෙක් එම ස්ත්‍රීන් විසිදෙනා අතුරෙන් මෙනම් මෙනම් ස්ත්‍රියක හා අනාචාරයෙහි යෙදීම වරදනැතැයි යනාදීන් තමාගේ සිත්සේම නොයෙක් දෘෂ්ටිගෙණ අනාචාරයෙහි යෙදෙන්නාහට මිථ්‍යාචාර අකුශලය මෝහය මුල්වූ සිඬ වේ, මෙසේ ලෝභාදි අකුශලධර්මයන්ගේ එක්වීමෙන් මිථ්‍යාචාරඅකුශලය නොයෙක් ප්‍රභෙද වේ, මේ කාමමිථ්‍යාචාර අකුශලයාගේ ප්‍රභෙදයි.

එහි ආදීනව නම් කවරහයත්:—

“කාමෙසු මිච්ඡාචාරෝ භික්ඛවෙ ආසෙවිතො භාවිතො බහුලීකතො නිරයසංවත්තනිකො හොති, තිරච්ඡානයොනිසංවත්තනිකො හොති, පෙත්තිවිසය සංවත්තනිකො හොති, යො සබ්බලහුසො කාමෙසු මිච්ඡාචාරස්ස විපාකො මනුස්සභූතස්ස සපත්තවෙර සංවත්තනිකො හොති”—යි. යනාදීන් බුදුන් විසින් වදාළහෙයින් යමෙකුවිසින් කාමමිථ්‍යාචාර අකුශලය ආසෙවිත භාවිත බහුලීකෘත වශයෙන් පුරුදුකරණලදද ඒ සත්වයෝ බොහෝ දීර්ඝකාලයක් මුලුල්ලෙහි නරකාදි සතරඅපාදුක් අනුභවකොට එයින් මිදීගියකල කිසියම් පින්කම්සිදුරකින් මිනිස්පියක් ලදහොත් ශෙෂව ඇති එම මිථ්‍යාචාර අකුශලකර්මවිපාකයෙන් උපනුපන් ජාතිවල තමාට බොහෝ සතුරන් ඇති බවය, සියලුදෙනාට අප්‍රිය බවය, ආහාර පානවස්ත්‍ර සයනාසනාදීන්ගේ නොලැබීමය, දුක්ම යෙදීමය, නයකරණබවය, දුකින්ම ප්‍රබුදිනාබවය, අපාය භයින් නොමිදෙනා බවය, ස්ත්‍රීව නපුංසකව උපදනා බවය, බොහෝ ක්‍රොධ ඇතිබවය, නොපිරිසිදු කටයුතු ඇතිබවය, ස්කන්ධය නැමී වැටී තිබෙනබවය, බිම නතුව යටිකුරුවූ මුහුණ ඇතිබවය, ස්ත්‍රිපුරුෂ දෙදෙනා ඔවුනොවුන්ට අප්‍රිය බවය, සම්පූර්ණවූ යහපත්වූ චක්ෂුරාදි ඉන්ද්‍රියයන් නැතිබවය, සම්පූර්ණ ලක්ෂණනැතිබවය, නිරන්තරයෙන් කුකුස් ඇතිබවය, හැමලෙසින්ම භය ඇතිබවය, ප්‍රියමනාපයන් කෙරෙන් වෙන්වෙන බවය යනාදි නොයෙක් අනිෂ්ට අකුශලවිපාකයෝ එම මිථ්‍යාචාර අකුශලයෙන් වන්නාහුය.

තවද පරදාරසෙවනයෙහි නියුක්තවූ පුද්ගලතෙම මේම ආත්මභාවයෙහිම ධනපැහැරගැණීම් වධහිංසාකිරීම් ආදි අනෙකප්‍රකාර දුඃඛයෙන් අභිභූතව මහත්වූ අනයව්‍යසනයටපැමිණ චවනෙයිමෙන් එයින් චුතව නරකයෙහි ඉපිද එහි නොසිසිලියහැකි මහත් නිරාදුක් අනුභවකොට ඉදින් යම්කිසිකලක මනුෂ්‍යාත්මය ලබන්නේ වීනම් සියක් ජාතියෙහි එම අකුසල්යෙන්ම ස්ත්‍රීබවට පැමිණේ, එබැවින් ලොකයෙහි ස්ත්‍රී නොවූ පුරුෂයෙකුත් නැත්තේමය, එසේම පුරුෂ

ණනාවූ සත්‍රියකුත්නැත්තේමය, එපමණක් මතු නොවෙයි, පණ්ඩක නපුංසකභාවයටද එම මිථ්‍යාචාර අකුශලයෙන්ම පැමිණෙන්නේය, එහෙයින් "පුරිසාති ඉත්ථියො වා ඉත්ථියො වා පුරිසා අභූතපුබ්බා නාම නත්ථි" යනාදින් මෙම ආදීනව දක්වා වදාරණලදී.

සුරාපානය කිරීමත් මිථ්‍යාචාර අකුශලයසේ කෙලශකාමයෙහි යෙදීම කැමැත්තන් විසින් සෙවනය කටයුතු පාපයක් වනබැවින් හා හෙද කෙලශකාම අකුශල්වූ කායදුශ්චරිතඅකුශලයම වනබැවින් ඒ සුරාපාන අකුශලයාගේ ප්‍රභෙදදීනවද මෙහිම දක්වනුලැබේ.

සුරාමෙරය නම්, සුර නම් වැද්දෙකු විසින් පළමුවෙන්ම දුටු බැවිනුද ඔහු විසින් ගෙණ ආ බැවිනුද මත්වනදෑට සුරායයි කියනු ලැබේ, හෙද වනාහි පිෂ්ඨසුරාය පූවසුරාය ඔදනීයසුරාය කිණ්ණපක්ඛිත්තසුරාය සම්භාරසංයුක්තසුරායයි කියා පඤ්චප්‍රකාරවේ, එම පඤ්චප්‍රකාර සුරාවන්ගේම විශෙෂවූ මෙරයද පුප්ඵාසවය ඵලාසවය ගුලාසවය මධ්වාසවය සම්භාරසංයුක්තකයයි කියා පඤ්චප්‍රකාර වේ, මෙසේ නොයෙක් ප්‍රකාරවූ සුරාමෙරයයි කියනලද යම් කිසිවක් බීපු කෙණෙකුන් කාපු කෙණෙකුන් මත්වනහෙයින්ද කටයුතු කාරියට පමාවන හෙයින්ද සුරාමෙරය අනුභව කරන්නාවූ චෙතනාවට පමාදඨාන යනු නමකි, ඒ සුරාමෙරය අකුශලය නම් වන්නේය, එහි පතක් පමණ සුරාබීම අල්ප අකුශලය, දෙපතක් පමණ බීම ඊටත් වඩා අකුශලය, කය වලිතකරවන්ට තිසි පමණ රා බීම ගම් පැහැරීම් මංපැහැරීම් කරන්නහුගේ සුරාපානය කිරීම මහඅකුශලයකි, ඒ එසේමැයි, සුරාපානයද යටකියනලද ක්‍රමයෙන් නොයෙක් ප්‍රකාරවූ සුරා අතුරෙන් එක්නරා රහමෙරක් බවය, බොනු කැමති සිත්ඇති බවය, බිමට කරණලද උත්සාහය ඇතිබවය, උගුරෙන් පල්ලේ වැටුනු බවය යන මේ අඞගයන් සතර දෙනාගේ එක්වීමෙන් හා ලොභාදී අකුශලයන් තුන්දෙනාගේ එක්වීමෙන්ම අකුශලකර්මපථබවට පැමිණේ, මේ සුරාපාන අකුශලයාගේ ප්‍රභෙදයි.

එහි ආදීනව නම් කවරහයත්, "සුරාමෙරය පානං භික්ඛවෙ ආසෙවිතං භාවිතං බහුලීකතං නිරයසංවත්තනිකං හොති, තිරච්ඡාන යොනිසංවත්තනිකං හොති, පෙත්තිවිසය සංවත්තනිකං හොති, යො සබ්බලහු සො සුරාමෙරය පානස්ස විපාකො මනුස්සභූතස්ස උම්මාදසංවත්තනිකො හොති"—යි යනාදින් බුදුන් විසින් වදාළහෙයින් යම්කිසිවෙකු විසින් සුරාපාන අකුශලය ආසෙවිත භාවිත බහුලීකෘතවශයෙන් සෙවනය කරණලදද හෙතෙම නරකාදී සතරඅපායෙහි ඉපිද නොයෙක් වාදහස් මුළුල්ලෙහි මහදුක් විඳ

පව් ගෙවීගියකල එයින් මිදී කිසියම් පින්කම්සභාගයකින් මිනිසත් බවක් ලදහොත් ශේෂවසිටි සුරාපානඅකුශලවිපාකයෙන් උපනුපන් ජාතිවලැ උමතුභාවයට පැමිණීමය, සිහිමුළාබවය, තුන්කල්හි පැවති කටයුතුකෘත්‍යයන්ගේ වහා දැන්මක් නැතිබවය, නුවනහීන බවය, අලසඇතිබවය, ජඩබවය, යෞවනමදාදියෙන් මත්වනබවය, කලමනාදෙයෙහි ප්‍රමාද බවය, මුළාබවය, පැනිගන්නා බවය, ඊර්ෂ්‍යා බහුල බවය, දුඛිබවය, ගොළුබවය, බිහිරි බවය, බොරුකියන බවය කේලාම් කියන බවය, පරුෂවචන කියන බවය, නිරාර්ථක සම්ප ප්‍රලාප දෙඩවන බවය, හැමවේලාවෙහිම අලස ඇතිබවය, කෘතොප කාර නොදන්නා බවය, ගුණනැති බවය, මසුරු බවය, දුස්සීල බවය, චණ්ඩබවය, ක්‍රෝධබහුල බවය, ලජ්ජානැති බවය, භයනැති බවය, මිථ්‍යාදෘෂ්ටිඇති බවය, මහත්නොවන බවය, ස්ථානොචිත ප්‍රඥාහීන බවය, පණ්ඩිතනොවන බවය, වැඩ අවැඩ දැන්මෙහි සමර්ථ නොවන බවය යන මේ ආදී නොයෙක් අනිෂ්ට ඵලවිපාකයෝ සුරාපාන අකුශලයෙන් ඇතිවන්නාහුයි—අපිච—යම් කෙනෙක් හලාහල විෂයක් වැනි සුරාමේරය පානයකරන්නාහුද ඔහු ඒ අකුශලයෙන් නරකයෙහි ඉපිද නොයෙක් වර්ෂකොටි සහස්‍රගණවල පැසී මහත් දුක්අනුභවකිරීමෙන් නැවත එයින් චුතව දුකසේ කිසිකලෙක්හි මනුෂ්‍යජාතියක් ලද්දාහු වී නමුදු උමතුවන්නාහුය, ලජ්ජානැතිවන්නාහුය, ඉතා බැගෑවූ දුඃඛිතවූ ශොකයෙන් පිරීගිය සිත් ඇති මහත් විරූපවූ ශරීර ඇතිවන්නාහුය, එහෙයින් මෙම කියනලදී පුරාතනයන් විසින්:—

උම්මත්තකා විගතලජ්ජගුණා භවන්ති
දීනා සදා ව්‍යසනසොක පරායනා ච,
ජාතා භවෙසු විවිධෙසු විරූපදෙහා
පීත්වා හලා හලවිසංව සුරං විපක්ඛා,—යි.

සුරාව දිව්‍යලොකමාර්ගගමන බාධාකිරීමට බැඳි මහත් පව්රක්වැන්න, රාගාදිකෙලෙසුන්ගේ උත්පත්තිස්ථානයට, තුන් භවයටම පිහිටය, බුද්ධාදි තුන්මහාපුරුෂයන් විසින් ගර්හිතය, කායාදි වාරත්‍රයෙන් සිද්ධවන සියලු දුශ්චරිතයන්ගේ සිද්ධවීමට කාරණය, තුන්ලෝවාසීන්ට පිහිටවූ උතුම් බුද්ධශාසනයද විනාශකරයි, එහෙසින් කියනලදී:—

තිදිවාවරණං තිමලප්පභවං
තිභවස්ස ගතිං තිජනාවමතං,
තිවිධස්සපි දුච්චරිතස්ස හිතං
තිභවුබ්භව සාසනනාසකරං—යි

මෙසේ මහත් ආදීනව ඇති සුරාපානයෙහි ආදීනව මෙයටවඩා කුමක් කියමොද කෙසේ කියමොද එහෙයින් කිව නොහැකි අනන්ත ආදීනව ඇත්තේයයි. නුවණැත්තන් විසින් දතයුතු, මේ සුරාපාන අකුශලයාගේ ආදීනවයි.

මුසාවාදය නම්, නැත්තාවූ අසත්‍යවූ යම්කිසිකාරණයක් ඇත්තක්ලෙසින් සත්‍යයක් ලෙසින් අනිකෙක්හට දැන්වීමයි, ලක්‍ෂණයෙසින් ඒ සත්‍යවූ නැති යම්කිසිකාරණයක් සත්‍යවූ සැබෑලෙසින් අනිකෙක්හට දන්වනු කැමැත්තාහුගේ කායවාක් ද්වාරදක්හි එසේම පවත්නා විසංවාදනපහළකරන්නාවූ චේතනාව මුසාවාදනම්, හේ කෙසේදයත්:—නැතිවූ හෝ ඇතිවූ හෝ යම් කිසිකාරණයක් අනුන්ට විපරීතකොට හඟවනුකැමති සිතින් කළදෙයක් නොකෙළෙම් කීමද නොකළ දෙයක් කෙළෙම් කීමද දුටුදෙයක් නුදුටුයෙම් කීමද නුදුටු දෙයක් දුටුයෙම් කීමද ඇසූ දෙයක් නො ඇසූයෙම් කීමද නොඇසූ දෙයක් ඇසූයෙම් කිමද යනාදික්‍රමයෙන් ඇසය කණය නාසය දිවය ඇඟය සිතයයන මේ සදොරින් ස්පර්ශවේදනාදියයෙන් දත්දෙය නොදත්තෙමියි කීමද නොදත්දෙය දත්තෙමියි කීමද නොසිතූදෙය සිතීමියි කිමද සිතූදෙය නොසිතීමියි කීමද සිනා පිණිසවත් කුඩාවූදෙය මහතැයි කීමද මහත්දෙය කුඩායයි කීමද උස්වූවන් මිටියයි කීමද මිටිවූවන් උසයයි කීමද යහපතුන් නපුරැයි කීමද නපුරු මිනිසුන් යහයතැයි කීමද මදනුවනඇත්තවුන් නුවන නැතැයි කිමද නුවනනැත්තවුන් නුවන ඇතැයි කීමද යන මේ ආදිවශයෙන් සතරඅඞ්ගයන්ගේ එක්වීමෙන් මුසාවාද කර්මපථය සිද්ධවේ

එහි සතරඅඞ්ගයෝ නම්, අභූතවූ මුසාවාදයක් බවය, එසේ ඇති නතු නැතිකොට වරදවා හඟවම් යන සිත්ඇති බවය, ඊට දක්වන නොයෙක් ප්‍රයොගයන් අතුරෙන් එක් ප්‍රයොගයක් ඇති බවය, ඒ ප්‍රයෝග දර්ශනශ්‍රවණවශයෙන් ලද්දහුට වන අර්ථය දැනීම යයි කියනලද මේ දැක්වූයේ සත්‍යයයි කියා සවභාවයෙන්ම බොරු දෙය සැබෑලෙසින්ම හැඟෙන බවය යන මේ කාරණා සතරදෙනාගේ එක්වීමෙන්ම මුසාවාද අකුශලය සිද්ධවේ, මෙයින් කාරණය කුඩු අඩුවූව මුසාවාද අකුශලය සිද්ධ නොවේ.

යමෙක් තමා සන්තක දෙයක් අනුන්ට නොදෙන සිතින් නැතැයිකීම ස්වල්ප අකුශලය, අනුන්ට වන වැඩක් නසන පිණිස බොරුශාක්ෂිකීම මහඅකුශලය, කියනලද ක්‍රමයෙන් ඇතිදෙයනැති කිරීමෙන් හෝ නැතිදෙය ඇතිකිරීමෙන් හෝ බසින් බොරුකියන්නාහමද මුඛවිකාරයෙන් හෝ අත්සන්කිරීමෙන් හෝ අකුරු

ලියාදීමෙන්හෝ අනිකෙකුට ඇඟවීමෙන් සිද්ධවන්නාවූ අකුශලයක, එහි ස්වල්පවූ දෙයට පමණක් බොරුකීමද ස්වල්ප අකුශලය, අඩ මස්සක් පමණ දේට බොරුකීම ඊටත් වඩා මහඅකුශලය, මස්සක් පමණ දේට බොරුකීම ඊටත් වඩා මහඅකුශලය, කහවණු භාගයක දේට බොරුකීම ඊටත් වඩා මහඅකුශලය, කහවණුවකට බොරුකීම ඊටත් වඩා මහත්අකුශලය, මෙසේ ලාභවශයෙන්ද අකුශලය ක්‍රමයෙන් මහත්වේ.

යමෙක් ජීවත්වීම හා අන් අත්ලස් ගැම්ම ආදි කිසියම් ලාභයක් සඳහා බොරුකියන්නේ වී නම් ඕහට මුසාවාද අකුශලය ලොභය මුල්ව සිද්ධවේ, යමෙක්හට කියනලද ක්‍රමයෙන් නවආඝාත වස්තූන් කාරණකොටගෙණ අනුන්කෙරෙහි කිපී නසමි යන සිතින් බොරුකියන්නේ වී නම් ඕහට මුසාවාද අකුශලය ද්වෙෂය මුල්ව සිද්ධවේ, යමෙක් ධර්මයහා එක්කොට බොරුකීම වරදනැතැයි කියාද මෛථුනසෙවනය සඳහා ස්ත්‍රීන් පොළඹාගන්නාපිණිස බොරුකීම වරද නැතැයි කියාද විවාහකාලයෙහි ඒ සිද්ධවනු සඳහා ජීවිතවිනාශවේ නම් දිවිරක්නා සඳහාද තමාගේ ධනයට විනාශයක්වේ නම් ඒ රක්නා සඳහාද කීතාක් බොරුවෙන් දෝෂනැතැයිකියාද බොරුකීම පව්නැතැයි කියාද නොයෙක් දෘෂ්ටිගෙණ බොරුකියන්නාහට මුසාවාද අකුශලය මොහය මුල්ව සිද්ධවේ, මෙසේ ලොභාදි අකුශලයන්ගේ එක්වීමෙන්ද මුසාවාද අකුශලය අනෙකප්‍රකාරව සිද්ධවේ, මේ මුසාවාද අකුශලයාගේ ප්‍රභෙදයි.

එහි ආදීනව නම් කවරහයත්, “මුසාවාදෙ භික්ඛවෙ ආසෙවිතො භාවිතො බහුලීකතො නිරයසංවත්තනිකො හොති, තිරච්ඡානයොනිසංවත්තනිකො හොති පෙත්තිවිසයසංවත්තනිකො හොති, යො සබ්බලහු සො මුසාවාදස්සවිපාකො මනුස්සභූතස්ස අභූතබ්භක්ඛානසංවත්තනිකො හොති”—යි යනාදීන් වදාළ හෙයින් මහත් ආදීනව ඇති මුසාවාදය යම්කිසි පුද්ගලකෙණකුවිසින් ආසෙවිත භාවිත බහුලීකෘතවශයෙන් පුරුදුකරණලදද ඒ සත්වතෙම නරකාදි සතරඅපායෙහි ප්‍රමාණාතික්‍රාන්ත කල්පකොටි ශතසහශ්‍රයක් මුළුල්ලෙහි මහදුක් විඳ එයින් මිදීගියකල යම්කිසි පින්කර්මසහායකින් මිනිසත්බවක් ලදහොත් ශෙෂව සිටි එම මුසාවාද අකුශලකර්මයෙන් උපනුපන් ජාතිවල ඔහුකෙරෙහි නැතිදෙෂ අභූතවචනයන් කියා නොයෙක් ලෙසින් වෙහෙසන්නේද වෙයි, ඉතා දුඃඛිත වෙයි, ජඩවෙයි, නුවණ්නැතිවෙයි, දුටුදුටුවන්ට අප්‍රියවෙයි, මත්ස්‍යයන්ටමෙන් දිවි නැතිවෙයි, කපිළමත්ස්‍යයාගේ දුර්ගඳවූ මුඛ ඇතිවෙයි, දරුවෝ නැතිවෙති, ඇතිවීනමුත් ගැනුදරුවෝම වෙති,

ඔවුන්ගේ දරුපුරතල් දක්නට අවකාශයක් නැතිවම ලදරුකළම මියපරලොව් යන්නාහුය, නොකීකරුවූ කී දෑ නොඅදහන නපුරුවූ පිරිවර ඇතිවෙයි, චක්ෂුරාදි ඉන්ද්‍රියෝ යහපත්සේ නැතිවෙති, දක්‍ෂවූ විශාරදකමක් නැති වෙයි, මියුරුවූ වචනකීමක් නැතිවෙයි, නොපිරිසිදුවූ විරූපවූ විෂමවූ දත් ඇතිවෙත්, ස්වභාවශරීරය නොව ඉතා ස්ථූල වෙයි, ඉතාමිටිබවහෝ නොහොත් අතිදීර්ඝ හෝ වෙයි, දුඃඛවූ ශරීරස්පර්ශහෝ ඇතිවෙයි, මෘදුනොවූ ලොහිතවර්ණ නුවූ දිවහා එසේ යහපත් ඇස් නැති වෙයි, ඉතාචපල වෙයි, මේ ආදිනොයෙක් අනිෂ්ටඅකුශල ඵලවිපාකයෝ, මුසාවාද අකුශලයෙන් ඇති වන්නාහුයි,

පෛශුන්‍යවචනය නම්, යමෙක් යම්කිසිවචනයක් කී කල ඒ වචනය ඇසුවහුගේ සිත්හි අනිකක්හට පැවති ප්‍රියමනාප භාවය නැතිකොට ශූන්‍යකෙරේද ඒ පෛශුන්‍යවචන නම් වේ, ඒ කෙසේ දයත්:- විස්වාසමිත්‍රව වසන්නවුන් කෙරෙන් එකෙක් එකෙකුට ජාතිආදියෙන් අඩුකොට නින්දා කරති යනු අසා හෝ නොමිහිරිසේ පරුෂකොට කියනු අසා හෝ ඔවුන් දෙදෙනා බිඳුවනු පිණිසවත් එසේ බිඳුවා තමාහා මිත්‍රකොට ගන්නා කැමතිවවත් අසවලා මෙනම් ජාතිදෝෂයක් තට කීහයි කියාද මෙසේවූ ගොත්‍රදෝෂයක් මෙනම් රොගයක් ඇත්තේයයි කියාද මෙ නම් නපුරු සිල්පයක් නපුරුකර්මාන්තයක් දන්නේයයි කියාද යනාදිවශයෙන් ඔවුනොවුන්ගේ තෙපුල් ඔවුනොවුන්ට කියා විස්වාසව වසන මිත්‍රයන් ඔවුනොවුන්හා බිඳීමෙන් වන කේලාම් වචනකීම පෛශුන්‍ය අකුශලයනම්.

යමෙක් යම් කිසිලාභයක් උපදවා ගන්නා පිණිස එහි පැවති ලොභයෙන් ඔවුනොවුන් බිඳුවනුපිණිස කවරප්‍රකාරයකින්වත් ඊට නිසි වචනයක් කියන්නේ වී නම් ඔහට පෛශුන්‍ය අකුශලය ලොභය මුල්ව සිද්ධවේ, යමෙක් නව ආඝාතවස්තූන් හෙතුකොටගෙණ උපන් වෛරයෙන්ද කිසියම් වරදක් නැතිනිවරදියන්ට විනාශ උපදවනුසඳහාද යනාදි වශයෙන් ඔවුනොවුන් බිඳීමට නිසිවචන කියන්නේ වී නම් ඔහට පෛශුන්‍ය අකුශලය ද්වෙෂය මුල්ව සිද්ධවේ, යමෙක් එසේ කේලාම් කියා ඔවුනොවුන් බිඳුවාලීම දෝෂනැතායි කියාද දුෂ්ටනිග්‍රහය සඳහා කීම දෝෂනැතැයි කියාද යනාදික්‍රමයෙන් නොයෙක් දෘෂ්ටිගෙණ කේලාම් කීමෙහි දෝෂනැතැයි කියා කියන්නේ වී නම් ඔහට පෛශුන්‍යවචන අකුශලය මොහය මුල්ව සිද්ධවේ, මේ පෛශුන්‍යවචන අකුශලයාගේ ප්‍රභේදයි.

එහි ආදීනව නම් කවරහයත්:—කේලාම් කීවාහු මියගොස් ඒ පාපකර්මයෙන් නරකාදිසතර අපායෙහි ඉපිද එහි නොයෙක් වාදහස්මුළුල්ලෙහි නොයෙක් දුක් අනුභව කොට එයින් මිදී කිසියම්

කලෙක මිනිසත් බවක් ලදහොත් උපන්නුපන්තැන විශ්වාසව ඉතා බැඳීසිටි ප්‍රියමිත්‍රයන් කෙරෙන් නිසිකාරණාසේම බැඳී වෙන්වීමය කිසිකලකත් ඔහුට අලුතුමිත්‍රසහායක් නොලැබීමය යනාදි නොයෙක් අකුශල විපාකයෝ පෛශුන්‍යවචන බිණූ අකුශලයෙන් වන්නාහුයි, මේ පෛශුන්‍ය අකුශලයාගේ ආදීනවයි.

ඵරුෂවචනයනම් යම්වචනයක්බිණූකල ඒවචනයබිණූතමාටද ඇසූඅනුන්ටද ඵරුෂව සිතට වැටහෙන සවභාවඇත්තේද ඒ ඇසීමෙන් කණට සිතට සැපඑළවන්නී නොවේද එසේවූ වාචානොමෝ ඵරුෂවචන නාම්, එසේ වාක්දොෂයෙන් යුක්තවූ නොකන්කළුවූ නොමිහිරිවූ ඇසුවන්ගේ වෛෂවඛනා සිත ඇලලිමට සුදුසුවූ අනුන්ට පිරිහෙලා ජාතිනම්ගොත් ආදිවශයෙන් අඩුතරවී කොට කෲරවූ රළුබස් කීම ඵරුෂවචනයයි දතයුතුයි.

හෙද යමක්හට ජාතිආදියෙන් ගටා බිණූකල ඒ රළුබස් අසනු නොකැමැතිව යමක් කිසි ද්‍රව්‍යයක් ඔහු දෙතියි කීයා හෝ එසේම අත්ලස් ලාභළපදනේයයි කියා හෝ යනාදිවශයෙන් ලොභ උපදවා අනුන්ගේ ජාතිනම්ගොත්ආදිය ප්‍රකාශකොට පිරිහෙලා කීම ආදිනොයෙක් ප්‍රකාර රළුබස් කීයන්නාහට ඵරුෂවචන අකුශලය ලොභය මුල්ව සිඬ වේ, එසේම යමෙක් නවආඝාත වස්තුන් කරණකොටගෙණ උපන්වෛරයකින් හෝ අනුන්ගේ ගුණකීර්ති වර්ණනා ලාභසත්කාරාදියෙහි නොසතුටුව ඉච්ඡාගත නොහී උපන් වෛරයකින්හෝ අනුන්ට අප්‍රියනොමිහිරිවූ රළුබස් කියන්නේ වී නම් ඔහට ඵරුෂවචන අකුශලය ද්වේෂයමුල්ව සිඬ වේ, යමෙක් දූෂ්‍යයන්ට දූෂ්‍යයහයි කීමෙනුදු චණ්ඩාලයන්ට චණ්ඩාලයහයි කීමෙනුදු දුෂ්ටයින්ට නිග්‍රහපිණිස නිඥකොට ඵරුෂවචන කීමෙනුදු ආක්‍රොශනොවෙතියි යනාදිවශයෙන් නාස්තිකදෘෂ්ටි ගෙණ අනුන්ට අප්‍රියවූ අමධුරරළුබස් කියන්නේ වී නම් ඔහට ඵරුෂවචන අකුශලය මොහය මුල්ව සිඬ වේ, මෙසේ ලොභාදි අකුශලයන්ගේ එක් වීමෙනුදු ඵරුෂවචන අකුශලය නොයෙක් ප්‍රභෙද වේ, මේ ඵරුෂවචන අකුශලයාගේ ප්‍රභෙදයි.

එහි ආදීනව නම් කවරහයත්:— අනුන්ට ඵරුෂවචන බිණූවාහු මියගොස් ඒ පාප කර්මයෙන් සතර අපායෙහි ඉපිද එහි නොයෙක් වාදහස් මුළුල්ලෙහි මහදුක් විඳ එයින් මිදීගියකල මිනිසත් බවක්ලදහොත් ඔහට මියුරුවූ ප්‍රියමනාප කර්ණරසායන වචනයක් නොඇසෙයි, තමාකලවරදක් නැතිවම දුටුදුටුවන් විසින් නොරිසිව කියනලද කර්කශවූ වචනයෝ අසනු ලැබෙයි, අසන්නවුන්ට නොමි

හිරිවූ කටහඬ ඇතිවීමය යනාදිවූ නොයෙක් අනිෂ්ට ඵලවිපාකයෝ පරුෂවචන අකුශලයෙන් ඇතිවන්නාහුයි, මේ පරුෂවචන අකුශලයාගේ ආදීනවයි.

සම්ඵප්‍රලාපය නම්, යම්වචනයක් කීකල තමන්ටද ඇසුවන්ටද කිසියම් අර්ථසිද්ධියක් වැඩක් නොවේද නිරර්ථකද නිෂ්ප්‍රයොජනද එසේවූ වචනකීම සම්ඵප්‍රලාප නම්, ඒ කෙසේදයත්:—යම්යම් වචනයක් ස්වභාව යනපත්ධර්මයෙන් පිටත්ද ඒ වචන කීහූවාවූ ඇසුවාවූ අනුන්ටද මෙලොවින් හෝ පරලොවින් හෝ කිසියම් වැඩක් නැති කාව්‍යනාටකාදි නිරර්ථක නිෂ්ප්‍රයොජන වචන කීම සම්ඵප්‍රලාපයයි දතයුතුයි.

හෙද යමෙක් ජීවත්වීම පිණිස ලාභඋපදවමියි සිතා කාව්‍ය නාටකාදි නොයෙක් සම්ඵප්‍රලාප දෙඩීමෙහුදු අභූතවචන රචනා කොට කීමෙහුදු අනුන්සිත්ගන්නාපිණිස කොයියම් ප්‍රලාපයක්වත් කීමෙහුදු යෙදුනේ වී නම් ඔහට සම්ඵප්‍රලාප අකුශලය ලොභය මුල්ව සිද්ධ වේ, යමෙක් අනුන් කෙරෙහි යට කියනලද ක්‍රමයෙන් නොසතුටු සිත්ඇතිව රූසපිරිසපමණ නොවනපරිද්දෙන් සියලු දෙනාවිසින් නින්දාකරණ පරිද්දෙන් හාත්පසින් පරිභූතකොට බෙනෙමියි සිතා ඉවසීමක් නැතිවම අනුන්ට පිරිහෙළීම පිණිස නිරර්ථක සම්ඵප්‍රලාප කියන්නේ වීනම් ඔහට සම්ඵප්‍රලාප අකුශලය ද්වෙෂය මුල්ව සිද්ධ වේ, යමෙක් කාව්‍යනාටකාදි ස්වරූප අනුන්ට මෙසේ හඟවමියි යන සිතින් හෝ අභිධාන සඞ්ඛ්‍යාත නම් උගන්වමියි කියා හෝ අනුන් විසින් අභිමත මෙවැනි මෙවැනි ආනුභාව ඇත්තෝද පවා අනිත්‍යතාවයට ගියාහුයයි යන කාරණය හඟවන සිතින් හෝ නොකියා කාව්‍යනාටකාදි නිරර්ථකවචනයන්ම පරාර්ථ කොටගෙණ පිළිවෙත්කොටගෙණ කිවමනා ඇසුවමනාදෙයක්සේ කාව්‍යනාටකාදි ප්‍රලාපකීමෙහුදු සම්ප්‍රලාපයක් එසේ කියමින් හෝ අසමින් හෝ හුන්නන් එව්ගස මලහොත් අපායෙහි උපදවන්නට නිසිවූ අසද්ධර්මයයි කියනලද ඒ කාව්‍යනාටකාදිය කීමද ඇසීමද කුසලැයි සිතාගෙණද නාස්තික දෘෂ්ටි ආදි නොයෙක් දෘෂ්ටිගෙණ ප්‍රලාප දෙඩීම අකුසල් නොවේය කියාද නිරර්ථක ප්‍රලාප දෙඩීමෙහි යෙදුනාහු නම් ඔවුන්ට සම්ඵප්‍රලාපඅකුශලය මොහය මුල්වසිද්ධවේ, මෙසේ ලොභාදි අකුශලයන්ගේ එක්වීමෙහුදු සම්ඵප්‍රලාප අකුශලය නොයෙක් ප්‍රභෙද වේ, මේ සම්ඵප්‍රලාපයාගේ ප්‍රභෙදයි.

එහි ආදීනව නම් කවරහයත්:—“පාපකං සුකතං නාම භාරත යුද්ධසීතාහරණවිසංයීතතං පාපකං පටිභාගං නාම දුබ්භාසිතයුත්තං කබ්බනාටකවිලම්බනාදි පටිසංයුත්තං”යි—යනුහෙයින් විජම්අටුවා

වෙහි පාපයයි කියනලද අසම්භින්න නිෂ්ප්‍රයෝජන ප්‍රලාපදෙඩීමෙන් යෙදී විසූ පුද්ගලතෙම එම අකුශලවිපාකයෙන් නරකාදි සතරඅපායෙහි ඉපිද එහිනොයෙක්වාදහස්මුළුල්ලෙහි මහදුක් අනුභවකොට එයින් මිදීගියකල මිනිසත්බවක් ලදහොත් උපනුපන් ජාතිවල අනුන් විසින් හෝ රවටන්ට නිසිවචන ඔහුකෙරෙහි ඇතිවෙත්, අනුන් විසින් නොඇදහියයුතු වචන ඇතිවෙත්, දුටුවන්ට අප්‍රිය වනසේ අසම්බන්ධවූ අවලක්ෂණ අඞ්ගප්‍රත්‍යඞ්ග ඇතිවීමය යනාදිවූ නොයෙක් අනිෂ්ට අකුශලවිපාකයෝ එම සම්ඵප්‍රලාප අකුශලයෙන් ඇතිවන්නාහුයි, මේ සම්ඵප්‍රලාප අකුශලයාගේ ආදීනවයි.

අභිද්‍යාවනම් කවරහයත්:—අනුන් අයිතිවූ දාස දාසි ඇත් අස් ගවමහිෂාදි සවිඤ්ඤාණක වස්තූන් හා කෙත්වත් මුතුමැණික් රන් රිදී ධාන්‍යාදි අවිඤ්ඤාණක වස්තූන් දැක මේ සම්පත් මට වුවොත් යෙහෙක, එහෙයින් මාසන්තකකොට ගන්නේ කෙසේදෝහොයි සිතීම අභිද්‍යා නම් වෙයි.

එහි යමෙක් එසේ ද්විප්‍රකාරවූ අනුන්ගේ සම්පත් දැක ලොභළප දවා "මේ සම්පත් මට වුවහොත් යෙහෙකැ"යි පතන්නේ වී නම් ඔහට ඒ අභිද්‍යා අකුශලය ලොභය මුල්ව සිද්ධවේ, එසේම යමෙක් අනුන්ගේ සම්පත් දැක "මේ සම්පත් ඔවුන්ට තරම් නොවෙයි තම හටවිම් සුදුසුය"යි කියා අනුන්කෙරෙහි නොසතුටුව ඒ සම්පත් පතන්නේ වී නම් ඔහට අනුන්අයිති සම්පත් මට වේවායන අභිද්‍යා අකුශලය ද්වෙෂය මුල්ව සිද්ධ වේ, යමෙක් අනුන්ට අයිති සම්පත් තමහට වේවායි පැතීමෙහි පාපයක් නැතැයිකියාද එයින් සත්වතෙම සතරඅපායෙහි නොඉපදන්නේයයි කියාද අනුන්සන්තක කෙත්වත් ගවමහිෂාදි සියලු සම්පත්තියෙහි ලොභඉපදවූවන්ට එයින් වරද නැතැයි කියාද යනාදිවශයෙන් නොයෙක් දෘෂ්ටිගෙණ අනුවණින් යෙදී පරසන්තකවස්තුයෙහි ලොභ උපදවන්නේ වී නම් ඔහට අභිද්‍යා අකුශලය මොහය මුල්ව සිද්ධවේ, මෙසේ ලොභාදි අකුශලයන්ගේ එක්වීමෙන් අභිද්‍යා අකුශලය නොයෙක් ප්‍රභෙද වේ, මේ අභිද්‍යා නම් අකුශලයාගේ ප්‍රභෙදයි.

එහි ආදීනව නම් කවරහයත්:-මෙකියනලද ක්‍රමයෙන් යමෙක් අනුන් අයිති වස්තුයෙහි ලොභකෙරේද හෙතෙම මරණින් මත්තෙහි නරකාදි සතරඅපාදුක් අනුභවකොට එයින් මිදීගියකල කිසියම් කුශලයකින් මිනිසත්බවට පැමිණියේ වී නම් එහිදු කිසියම් කාරියක් සිද්ධකොට ගන්නාබවක් කැමතිබවක් ඇතිකල්හි ඒ කාරණය ඔහට සිද්ධනොවීමය යනාදි නොයෙක් අනිෂ්ට අකුශලවිපාකයෝ එම අභිද්‍යා අකුශලයෙන් ඇතිවන්නාහුයි, මේ අභිද්‍යා අකුශලයාගේ ආදීනවයි.

ව්‍යාපාදය නම් කවරහයත්:—අනුන්ගේ ඓශ්වර්‍ය්‍යවිශිෂ්ටරූප ශ්‍රීආදි කුශල විශෙෂය දැක ඉවසියනොහී නොසතුටුව ඔවුන් නැසෙත්වයි කියාද ඔවුන් සම්පත් එසේ නැසෙත්වයි කියාද ඔවුන්හා සමග විශ්වාසයන් දැක නොසතුටුව ඔවුනොවුන් විරුඬවුවහොත් යෙහෙකැයි කියාද යනාදිවශයෙන් වෛෂවසඟව අනුන් හා ඔවුන් සන්තක සම්පත් ආදිය නැසේවයි කියා සිතීම ව්‍යාපාද අකුශලය නම් වේ.

හෙද යමෙක් අනුන්සන්තක සම්පතෙහි ලොභ උපදවා ඒ සම්පත් හිමියා විනාශව ගියකල තමහට ලාභවෙතියි සිතාගෙණ ඒ සම්පත් හිමියාගේ නැසීම යහපතැයි සිතන්නේ වී නම් ඔහට ව්‍යාපාද අකුශලය ලොභය මුල්ව සිඬ වේ, යමෙක් අනුන්ගේ ලාභ සත්කාරාදිය දැකීමෙනුදු ඇසීමෙනුදු ඉවසාගතනොහී ඔවුන්ට නොසතුටු වීමෙනුදු නවආඝාත වස්තූන් හෙතුකොටගෙණ කිපීමෙනුදු වෛෂවසඟව අනුන්ට කොපව සිතන්නේ වී නම් ඔහට ව්‍යාපාදඅකුශලය වෙෂය මුල්ව සිඬ වේ, ලොකයෙහි මැරූවන් මැරීමද හැවූවන්ට හැවීමද ගැසූවන්ට ගැසීමද වස්තුවිළුම්පනය කොට ගත්තවුන්ගේ වස්තුවිළුම්පනය කොට ගැන්මද අපකාර දෙෂකළවුන්ට එසේම අපකාර දෙෂකිරීම සවභාවධර්‍මයකැයි කියාද යනාදි වශයෙන් නොයෙක් කල්පනා සිතතබාගෙණ අනුන්ට වධහිංසා කිරීම සිතන රජ්ජුරුවන්ටද එසේවූ රාජඅමාත්‍යාදීන්ටද මැරූවන් මැරියයුතුයයි යනාදි විසින් විනාශනීතිශාස්ත්‍ර ඉගෙණ අනුන්ට අනර්‍ථ සිතනුවන්ටද නාස්තික දෘෂ්ටිගෙණ අනුන් නසිත්වයි යන කල්පනාවෙන් දෙෂනැතැයි සිතන්නාටද ව්‍යාපාද අකුශලය මොහය මුල්ව සිඬ වේ, මෙසේ ලොභාදි අකුශලයන්ගේ එක්වීමෙන් ව්‍යාපාද අකුශලය නොයෙක් ප්‍රභෙදවේ, මේව්‍යාපාද අකුශලයාගේ ප්‍රභෙදයි.

එහි ආදීනව නම් කවරහයත්:—මෙසේවූ ව්‍යාපාද අකුශලයෙහි ඇලී යෙදී වාසයකරණ සත්වතෙම රූපස්කන්ධභෙදයෙන්වූ මරණින් මත්තෙහි අපායෙහි ඉපිද එහි නොයෙක්වාදහස්මුළුල්ලෙහි මහ දුක් විඳ එයින් මිදීගියකල කිසියම් පින්කම් සහායකින් මිනිස්පියක් ලදහොත් උපනුපන් ජාතිවලැ අතිශයින්ම රුවනැතිවෙයි, විෂමවූ රොගපීඩා ඇතිවෙයි, අනුන්ට අප්‍රියවෙයි යනාදි නොයෙක් අනිෂ්ටවූ අකුශලවිපාකයෝ ව්‍යාපාද අකුශලයෙන් ඇතිවන්නා හුයි, මේ ව්‍යාපාද අකුශලයාගේ ආදීනවයි.

මිථ්‍යාදෘෂ්ටිය නම්, දානශීලාදි පින්කමින් සුගතිසම්පත් සිඬ නොවෙයි, එයින් ඵලනැතැයිකියාද ප්‍රාණඝාතාදි පාපයෙන් අපාය

සිද්ධනොවෙයි කියාද යට උපන් ජන්මයකුත් නැත මතු උපදනා ජන්මයකුත් නැත සියල්ලම නිත්‍යයයි කියා හෝ යනාදිවශයෙන් විපරීතකොට වරදවා නොයෙක් දෘෂ්ටිගැන්ම මිථ්‍යාදෘෂ්ටි නම්, ඒ කෙබඳු දැයි කිවහොත්:—මේමතුදක්වන නොයෙක් උපමාකථාවන් අසා එහි විභාග දතයුතු.

ගිලිනාකල මනොහරව මියුරුව ගිලපුකල මහත්දුක්දෙන බිලී බඳු කිංපක්ක නම් විෂඵලබඳු හලාහලවිෂ මිශ්‍රවූ ශාලිමංසොදනයක් සේ මනොඥව සිතට ඇටමෙන බැවින් එබඳු නපුරුවූ සිතින් පිරිමැද නුවනින් විමසාබලනකල ගතහැකි කිසියම් සාරයක් ගුණයක් නැති මිථ්‍යාදෘෂ්ටිගන්නාට අත්‍යන්ත ලොභඋපදනා බැවින් මිථ්‍යාදෘෂ්ටිඅකුශලය ලොභය මුල්ව සිද්ධ වේ, සූකරපොෂණය කරණ මනුෂ්‍යතෙම වියලීගිය අසුචිරාශියක් දැක සතුටුව උත්තරාසඞ්ගයෙහි පොදියක්කොට බැඳ හිසතබාගෙණ යනකල්හි මහවැසිවෙන් තෙමී හිස පටන් පාදය දක්වා බස්නා අසුචිරාශිය දුටු හිතෛෂී මිනිසුන් විසින් උම්මත්තකය මෙසේ මේ අසුචි කුමට අදනෙහිදැයි කීකල "තෙපි උම්මත්තකයව අපි අපගේ සූකරයන්ට බත්ගෙණ යෙමි"යි කියා තමා ගෙණයන අසුචි නොදමා ගෙණයමින් සිට ඒ නුසුදුසුයයි ගර්හාකොට යුක්තිකීවන්ට නොයෙක් නිග්‍රහ ඵරුෂවචන කීමෙන් සූකරපොෂණයෙහි නියුක්තවූ පුරුෂයාසේ යමෙක් මිථ්‍යාදෘෂ්ටික වී නම් හේ නරකයෙහි හෝ තිරිසන් ජාතියෙහි හෝ උපදනේය; මෙයින් පිටත් අන්තැනක නූපදනේය, මෙසේ නපුරුවූ මිථ්‍යාදෘෂ්ටි හැරියයුතුයයි කියන බණඅසා කාරණා උත්තර අසාද ඒ කීවන්කෙරෙහි කෝපයෙන්ගැටී අපට නිවන් සාදදෙන්නේ මෙම කාරණයෙනැයි යනාදි නොයෙක් දෘෂ්ටි කාරණා දක්වා විපරීත දෘෂ්ටිගන්නා මිථ්‍යාදෘෂ්ටි අකුශලය ද්වෙෂය මුල්ව සිද්ධ වේ, කිසිසේත් ජීවත්වන උපායක් නැතිව අනාථව ඇවිදිනා යහළුවෝ දෙදෙනෙක් සනවාවැහැරි දැක "යහළුව තෝද සනවාවැහැරි භාගයක් ගණුව, මමද භාගයක් ගණිමි"යි කථාකොටගෙණ සනවාවැහැරි දෙභාගයම බැඳගෙණ දෙදෙනම එක්වගොස් නැවත සනවා නූල් දැක "සබඳ මේ සනවාවැහැරිවලට වඩා සනවානූල් මිහා ඝීය මමද මේ සනවා වැහැරි දමා සනවානූ භාගයක් බැඳගෙණ යෙමි තෝද එසේ ගණුව"යි දැන්වූකල ඒ ඇසූ නුවණමද පුරුෂතෙම කියනුයේ "සබඳ මම බොහෝ දුරසිට මේ සනවාවැහැරි ගෙණ ආයෙමි, එහෙයින් මම නොහරිමි"යි කියා සනවාවැහැරි භාගයම උසුලාගෙණ නැවතත් එකව ගොස් සනාවාපිළී දැක එසේම කියා ඔහු නොගත්තාහෙයින් තමාම සනවාපිළිගෙණ පෙර උසුලාගත් භාරයම නොහැර ගෙණයන්නනු හා සමගම යනුයේ

පෙරසේම කපු දූත කපුනූල් දූත කපුපිළි දූත යකඩ දූත ලොහෝ දූත තඹ දූත රිදී දූත රන් දූත එකිනෙකට පළමු කීසෙසින්ම කියා ලූකල ඒ ඉෂ්ටමිත්‍රයාගේ බස් නොගෙණ "මම බොහෝ දුරකතර සිට ගෙණඑමින් පිඩිතවීමි, එහෙයින් මේ සනුවාවැහැරි මම නොදමාම ගෙණයෙමි තෝ තාගේ කැමැත්තක් ගෙණඑව"යි කී කල "එලබා යහලුව මාගේ බස් තෝ නොගන්නෙහි වී නම් මම කුමක් කෙරෙම් දැ"යි කියා රිදියට වඩා රන්රන් මහාර්‍ඝහෙයින් ඒ බව දත් ඒ නුවණඇති පුරුෂතෙම රිදීභාරය හැරපියා රත්රන් භාරය ගෙණ තමාගේ ගෙට ගොස් තමහටද තමානිසා වසන්නවුන්ටද දුකක්නොව කායික චෛතසික සුවයෙන් සතුටුවන පණ්ඩිතපුරුෂයාසේ නොව භිතෛෂීව කියමන් නොගෙණ සනුවාවැහැරි භාගයම උසුලාගෙණ තමාගේ ගෙට ගොස් ඒ තමා උසුලාගෙණ ආ භාරයෙහි කිසිම සාරයක් මහාර්‍ඝබවක් නැතිහෙයින් තමා ආශ්‍රය කොට සිටි ඇමදෙනා හා ශොකකිරීමෙන් අපමණදුකට පැමිණ වෙහෙසෙන අඥානපුරුෂයාමෙන් නොයෙක් කල්පසංඛ්‍යයකිනුදු දුල්හවූ මේ බුද්ධෝත්පාදයට සම්ප්‍රාප්තව එම බුදුන් විසින්ම රුවනැසිවදූරණලද එහෙයින්ම අනෙකප්‍රකාරරුවන්නාමයෙන් ප්‍රසිද්ධවූ චතුර්විධ සමෘතිප්‍රස්ථානය චතුර්විධ සම්‍යක්ප්‍රධානය චතුර්විධ ඍද්ධිපාදස පඤ්චෙන්ද්‍රිය පඤ්චබලය සප්තබොධ්‍යඞ්ගය ආර්‍ය්‍යාෂ්ටාඞ්ගිකමාර්ගය යනාදි විසින් දෙශිතවූ උතුම් ධර්මරත්නයන් දක්වා මේ මේ රත්න ගණුවයි කීකල එයට කිපී සම්‍යක් දෘෂ්ටිකවූ ධර්මාන්විත කල්‍යාණ මිත්‍රයන්ගේ බස්නොගෙණ එකාන්ත අධර්මයට මේධර්මයයි ගෙණ තමන්ටද තමන් අනුගතවූ පශ්චිමජනසමූහයාටද විනාශභාගිව නපුරුමිථ්‍යාදෘෂ්ටි ගන්නාන්ට ඒ මිථ්‍යාදෘෂ්ටි අකුශලය මෝහය මුල්ව සිද්ධවේ, මෙසේ ලොභාදී අකුශලයන්ගේ එක්වීමෙන් මිථ්‍යාදෘෂ්ටිඅකුශලය නොයෙක් ප්‍රභෙදවේ, මේ මිථ්‍යාදෘෂ්ටි අකුශලයාගේ ප්‍රභෙදයි.

එහි ආදිනව නම් කවරහයත්:—මෙසේ මහත් ආදීනව ඇති මිථ්‍යාදෘෂ්ටිගත්තානු මියගොස් ඒ පාපකර්මයෙන් අපායෙහිම උපදිති, එහි නොයෙක්වාදහස්මුළුල්ලෙහි දරුණුවූ මහත් දුක්විඳ එයින්මිදී ගියකල කිසියම් කුශලබලයකින් මිනිස්පියක් ලදහොත් මිථ්‍යාදෘෂ්ටි ඇතිවෙයි, නපුරු මිථ්‍යාකල්පනා ඇතිවෙයි, යහපත් සෘජුප්‍රතිපත්තිමාර්ගයෙහි පිහිටීම නොපිළිවන්වෙයි, එසේ සියලු පව්පඳුරක් වැනිවූ හැම සසරදුකට භාජනවූ මිථ්‍යාදෘෂ්ටිගෙණ වසනුවෝ සියලු වැඩ කාරණාවූ මනාඅදහස් ඇති කල්‍යාණමිත්‍රකෙනෙකුන් ලදින් ඔහු කීලෙස සම්‍යක් පිළිවෙතෙහි සිතපිහිටුවාගෙණ නුසුදුසු අධ්‍යාශයන්දුරුව ඒමිථ්‍යාදෘෂ්ටිභයන්දුරුව මිදීගියහොත් ඉතායයෙහෙක,

එසේ නොව හෙතෙමේ මිථ්‍යාදෘෂ්ටිය නොහැර සිටියේ වී නම් මඩ මැද වැටුනු ගලක්සේ සංසාරයෙහිම ඇලී අනන්තවූ මහදුක් විඳින්නේය, මහාපෘථිවිය හා සමන්කොට "තිපිට නොහිඳිමි"යි කියා අනේකවාරයෙහි අහසට පැන පෘථිවියෙහිම හෙන බාලදරුවන්සේ "සසරින් මිදෙන්නට නිසිපිළිවෙත් කරමහ"යි සිතා සසර දික්වන්නට නිසිවූ විපරීත පිළියමක් කරණකොට ගෙණ නූපන් අකුශලධර්මයෝ උපදිද්ද උපන් අකුශලධර්මයෝ විපුලභාවයට යේද්ද එබඳු දෙයක් මේ මිථ්‍යාදෘෂ්ටිය හා නොමදක්නා ලැබෙසි, මිථ්‍යාදෘෂ්ටික පුද්ගලයාහට නූපන් අකුශල් උපදී, උපන් අකුශල් විපුලභාවයට යෙයි, එසින් වදාළහ:—

"නාහං භික්ඛවෙ අඤ්ඤං එකධම්මම්පි සමනුපස්සාමි යෙන අනුප්පන්නා වා අකුශලාධම්මා උප්පජ්ජන්ති, උප්පන්නා වා අකුශලා ධම්මා භිය්‍යොභාවාය වෙපුල්ලාය සංවත්තන්ති, යථයිදං භික්ඛවෙ මිච්ඡාදිට්ඨි, මිච්ඡාදිට්ඨිකස්ස භික්ඛවෙ අනුප්පන්නාචෙව අකුසලා ධම්මා උප්පජ්ජන්ති, උප්පන්නා ච අකුසලා ධම්මා භිය්‍යොභාවාය වෙපුල්ලාය සංවත්තන්ති"—යි.

යමක් කරණකොටගෙණ නූපන් අකුශලධර්මයෝ නූපදිද්ද උපන් අකුශල ධර්මයෝ පිරිහෙද්ද එබඳු දේකුදු මේ මිථ්‍යාදෘෂ්ටිය හා නොමදක්නා ලැබෙසි, විපරීත දෘෂ්ටිඇති පුද්ගලයාහට නූපන් අකුශලධර්මයෝ නූපදිත් උපන් අකුශල ධර්මයෝ පිරිහෙත්, එසින් වදාළහ:—

"නාහං භික්ඛවෙ අඤ්ඤං එකධම්මම්පි සමනුපස්සාමි යෙන අනුප්පන්නා වා කුසලා ධම්මා නුප්පජ්ජන්ති, උප්පන්නා වා කුසලා ධම්මා පරිහායන්ති, යථයිදං භික්ඛවෙ මිච්ඡාදිට්ඨි, මිච්ඡාදිට්ඨිකස්ස භික්ඛවෙ අනුප්පන්නාචෙව කුසලා ධම්මා නුප්පජ්ජන්ති, උප්පන්නා වා කුසලා ධම්මා පරිහායන්ති"—යි.

තවද මාතෘඝාතක පිතෘඝාතක අරහන්තඝාතක ලොහිතුප්පාදක සංඝභෙදයයි කියනලද මේ පඤ්චානන්තරියකර්මය මහාසාවද්‍ය නම් වෙයි, මීටත් වඩා යම් නියත මිථ්‍යාදෘෂ්ටියක් ඇද්ද ඒ මිථ්‍යාදෘෂ්ටිය විශෙෂයෙන්ම මහාසාවද්‍ය වන්නේය, කාරණා කිමියත්:—

පඤ්චානන්තරිය කර්මය කළ සත්වයාට වනාහි කාලපරිච්ඡෙද ඇත්තේය, කල්පයක් මුළුල්ලෙහි නරකයෙහි පැසී කල්පාන්තයෙහි නරකදුකින් මිදියන්නේය, නියත මිථ්‍යාදෘෂ්ටි සත්වයාහට වනාහි එසේ කාලපරිච්ඡෙදයක් නැත්තේය, ඒ මිථ්‍යාදෘෂ්ටිය සසරට මුල්වන බැවින් සසරදුකින් මිදීමක් නැත්තේය, ඒ නියත

මිථ්‍යාදෘෂ්ටිකා පුද්ගලයාට මාර්ගඵලාධිගමයකට පැමිණීම තබා ස්වර්ගයෙහි ඉපදීම පමණකුත් නැත්තේය, කල්පවිනාශකාලයෙහි නරකයෙහි වසන්නාවූ සත්ත්වයෝ අපරාපරියවේද්‍ය කුශලකර්මවශයෙන් බ්‍රහ්මලෝකයෙහි උපදනාහුය, ඒ නියත මිථ්‍යාදෘෂ්ටිගත් සත්ත්වයෝ වනාහි කල්පවිනාශකාලයෙහි බ්‍රහ්මලෝකයෙහි නොඉපද පිටසක්වල නරකයෙහි උපදනාහුය, ඒ පිටසක්වල් නස්නාකල්හි ආකාශයෙහි එක්ප්‍රදෙශයෙක්හි කර්මානුරූපවූපරිද්දෙන් මහත් දුක්විඳිනාහුය, මෙසේ මහත්වූ ආදීනව ඇති මිථ්‍යාපිළිවෙත් පිරීමෙන් සසරින් උඩුකුරුවිය නොහී අනන්තවූ දුකට පැමිණෙත් මේ මිථ්‍යාදෘෂ්ටි අකුශලයාගේ ආදීනවයි.

මෙසේවූ ප්‍රාණඝාතාදි දශඅකුශලකර්මපථයන්ගේ ප්‍රභෙද හා එහි ආදීනව දැන හැඳින පව්කිරීමෙහි භයපත්ව තුනුරුවන්සේවනයෙන් උපාසකධර්මයෙහි පිහිටා අප්‍රමාදව වාසයකළ පෙර නුවනැති සත්පුරුෂ ජනයෝද ලොවට රජපැමිණි පින්වත් රජදරුවෝද දෙදෙව්ලොවට අධිපති ශක්‍රදෙවෙන්ද්‍රයෝද පවා තමතමාගේ ජීවිතවිනාශයට නිසිව පැමිණි එසා මහත් අන්තරායෙහිදු දිවිනොසලකාම පැමිණි අකුශලයන් කෙරෙන් දුරුව රක්‍ෂාකටයුතුවූ මේ විරතිශීලයම යහපත්ව රක්‍ෂාකළාහුය; ඒ කෙසේදයත්:—

මෙම ලඞ්කාද්වීපයෙහිවූ වකක නම් උපාසකයෙක් තම මවුන්ට වෙදකම් කරණ වෙදවරහු අළුත් සාමස් උවමනාවැයි කීහෙයින් බෑයන් විසින් මෙහෙයනලදුව ඇල්කෙතට ගොස් එහි පැලගොයම් කමින් සිටි සාවෙක් යුහුව යනුයේ මලක බැඳී කිරිකිරී යන ශබ්දයෙන් හැඬීය, ඒ අසා ඔහු මලින් ගලවා අතටගෙණ ඒ උපාසකතෙම සිතනුයේ ‘‘මාගේ මෑනියන්ගෙ දිවිරක්නා පිණිස මොහුගේ දිවි නැසීම මට නුසුදුසුය, එසේ හෙයින් මම මූ නොමරමි’’යි සිතා සෙසු සාවුන් සමග තෝ සැපසේ මේවල වාසයකරව’’යි කියා ඒ සාවා හැරපියා ගෙවලටම ගියකල්හි ඔහුගේ බෑතෙම ‘‘කිමෙක්ද තා විසින් සාවෙකු ලබනලද දැ’’යි විචාළේය, එවිට ඔහු කලකී සියල්ල නොවලහාම කීය, ඒ අසා ඕහට හෙතෙම පරිභව බිනූයේය, නැවත වකක නම් උපාසකතෙම මවු ළඟට ගොස් ‘‘මම උපන්තැන් පටන් සිටිතැන් දක්වා දැන දැන ප්‍රාණාතිපාත අකුශලයක් නොකෙළෙමි, ඒ සත්‍යවචනයෙන් මාගේ මේ මෑනියන්ගේ ලෙඩ පාසුවෙව’’යි කියා සත්‍යක්‍රියාකොට එකෙණෙහිම මවත් නිරොගිකරමින් සම්ප්‍රාප්තවිරතීන් යෙදී පැමිණි අකුශලය නොකොට දුරුවීමෙන් විරතිශීලයම රක්‍ෂාකෙළේය.

මෙසේ එබඳු පින්වත් සත්පුරුෂයෙකි ඒ උපාසකතෙමේ අනට පැමිණි සාවකු මිවුන්ගේ දිවිරක්නා පිණිසවත් නොමරා සම්ප්‍රාප්ත විරතීන්සෙදී සීලය රක්ෂාකළසේ තමහට වැඩකැමති නුවනැත්තන් විසින් එසේ උවිකිරීමට අවකාශයක් ලත් නමුත් එහි නොයෙක් ආදීනව සැලකීමෙන් එයින් දුරුව උතුම් ශීලගුණයම රක්ෂාකටයුතු.

තවද උතුරුවඩුන්නා වැසි උපාසකයෙක් ගවයෝ බානක් වල්මත්ව ගියහෙයින් ඔවුන් සොයා ගියගමන්හි උතුරුවඩුන්නා ගලට ගියේය, එකල්හි එහි සිටි පිඹුරෙක් ඒ උපාසකයා දැක අල්වා වෙළාගත, එවිට හෙතෙම තමා කරතිබුනු තියුනු මුවහත් ඇති කැත්ත සඳහන්ව “මේ කැත්තෙන් මොහු හිස කපාහැර මා දිවි රකිමි”යි සිතා නැවතත් මෙසේ සිතීය, “එසේ මොහුගේ ජීවිතය විනාශකළහොත් ඇඹිරලි වෙහෙර වසන පිඩගල බුද්ධරක්ඛිත තෙරුන්වහන්සේ සමීපයෙන් සමාදන්ව ගත් පඤ්චශීලය බිඳීයෙයි, එසේවීම නුසුදුසුය”යි සිතා නැවත නැවතත් බලවත් ජීවිතලොභයෙන් “මොහු හිස මේ කැත්තෙන් කපමි” යන සිත උපදනා බැවින් “කැත්ත ඇතිකල එසේවූ සිත උපදනේය, නැතිකල කුමට සිතේද”යි යන කල්පනායෙන් නොමරමි යන සිත උපන් විගසම කැත්ත ඈත බැද්දේ දමාගැසීය, එම ගුණානුභාවයෙන් එකෙණෙහි පිඹුරාත් ඔහු හැරගියේය, මෙසේ ඒ උතුරුවඩුන්නාවැසි උපාසකයා දිවි නොසලකා දුරුකටයුතුවූ අකුශලයෙන්දුරුව ශීලයම රක්ෂාකෙළේය, මෙසේ ඒ උපාසකද තමා සමාදන්වගත් සීලය සිඳකිරීමෙන් තමන් දිවි නොසලකා පැමිණි අකුශලයෙන් දුරුව සමාදානවිරතීන් ගෙදි සීලයම රක්ෂාකළාසේ දුකින් මිදී සියලු සැප විඳිනා කැමති සත්පුරුෂයන් විසිනුදු එසේ උවිකිරීමක් පැමිණිකල එසේ සමාදාන ආයතිසංවරවශයෙන් තම තමා පිළිවගත් ශීලයන් සිඳකොට ඒ ඒ අකුශලයෙන් දුරුව ශීලයම රක්ෂාකටයුතුයි.

තවද මෙම ලක්දිව අනුරාධපුරනුවර දූහැම්තිසස නම් රජ වටුමස් අනුභවකිරීමෙහි උපන් සිත්ඇතිව “අනිකක්නම මේ මාගේ අදහස දැන්වූයේ වීමි නම් නුවර හාත්පස්හි වටුවන් විනාශයට පමුණුවති, එහෙයින් නොකියමි”යි තුන්අවුරුද්දක් මුළුල්ලෙහි උපන් සිත ඉවසීමෙන් මහත් දුක් ආයාසවිඳ පසුව “පන්සිල්රක්නා මිනිසෙකු තෝරාගෙණ මාගේ මේ අදහස දැන්වීම සුදුසුය”යි සිතා එකලට “තිස්ස නම් උපාසකයෙක් පන්සිල් රකිති”යි අසා ගෙන්වා ඔහුගේ ශීලය පරීක්ෂාකරණුපිණිස ඔහු අතින්ම කුකුලෙකු මරා ව්‍යඤ්ජනපිණිස රාජඋපස්ථානයට ගෙණෙනලෙස නියොග කෙළේය, එසේ ඔහුනොකරණහෙයින් “රාජඥලෙස නොකළහොත් ඔහුගේ

හිස කප්පවම්"යි තරවටුයේම සලස්වා එසේත් නොමරණහෙයින් රහසින් නියමකොට දන්වා යවූකල්හි රාජපුරුෂයෝ ඒ උපාසකයාගේ හිස මුදුන්කොට බැඳ රතුමල්දම් පලඳවා හුනුහිස්පලං ගස්වා පිටිපසින් පිටිපසෙහි වධබෙරගස්වමින් ගෙණගොස් සොරුන් මරණ දංගෙඩියෙහි හිසතබවා නැවතත් කුකුළා අතට දී කියත් තාහු "එම්බල තිස්ස රජ ආඥාකළාවූ ලෙස කිරීමෙන් තාගේ දිවි රැකගෙණ නැවත සිල්සමාදන්වීම පිළිවන්මය, මිනිසත්බවක් මෙසේ ලැබගැන්ම ඉතා දුර්ලභදෙයක, එහෙයින් තෝ මේ කුකුළා මරා ව්‍යඤ්ජනයිස අපකීර්ලෙසම දැන්වත් කලමැනව, එසේ නොකළ හොත් තාගේ හිස කපමහ"යි කීවාහුය, ඒ අසා තිස්ස නම් උපාසකතෙම කියනුයේ "මේ ප්‍රාණඝාතය කිරීමෙන් මාගේ දිවිරැකීමට වඩා මියගාම මට ඉතා උතුම, එහෙයින් මොහු නොමරමි"යි කියා කුකුළා අතින් අල්වාගෙණ "කුකුලා මාගේ ජීවිතයට දිනිමි, තෝ සැපසේ වාසයකරව"යි කියා කුකුළා හැර විරතිශීලය මනාකොට රැකීමෙන් වන මරණයම කැමතිව දංගෙඩියේ හිස තබා හොත්තේය.

මෙසේ ඒ කුකුළාට අභයදුන් තැන කුකුල්ගිරි නම් විය, ඒ දුටු රාජපුරුෂයෝ ඔහු නොමරාම ගෙණගොස් ඒහැම ප්‍රවෘත්තියක් ඇතිලෙස රජහට දැන්වූ කල්හි මෙසේ ශිල්රක්නා ඒ පුරුෂතෙම විස්වාසවූ කල්‍යාණමිත්‍රකොට රාජ්‍යස්වයට ගෙණ ඔහටම තමාගේ ඇති අදහස් දන්වාලීමෙන් ඒ දැහැමිතිස්සනම් රජද දුරුකටයුතුවූ අකුශලයෙන් මෙසේ දුරුව රැක්කයුතු විරතිශීලයම මනාකොට රක්‍ෂාකෙළේය.

මෙසේ ඒ තිස්ස නම් උපාසකද ඒසාමහත් රාජභය පැමිණි තැන තමා අතට දුන් කුකුලා නොමරා ශීලයෙහි යෙදී වන මරණයම කැමතිවූයේත් පව්කරමින් අවුරුදු සියයක් ජීවත්වීමට වඩා ඇසිල්ලක්වත් සිල්රැක මියයාම උතුමැයි බුදුන් විසින් වදාරණ ලදැයි කියාද එයේම පින්වත් රජ තමන්ගේ ජීවිතාපිනාශවන තරම් උපන් රෝගය පවා තුන්අවුරුද්දක් ඉවසීමෙන් ප්‍රාණවධයෙන් දුරුව වාසය කෙළේත් පාපයෙහි කළ භයින් නොවේද එසේවූ පව් අපවිසිනුදු දුරුකටයුතුයයි සළකා ගනපත් නුවනඇති ඇමදෙනම අකුශලයෙන් දුරුව සගමොක් සැපලැබීමට උත්සාහ කටයුතුයි.

තවද ශක්‍රදෙවේන්ද්‍රතෙම මඝමානවකකාලයෙහි භූමිශෝධනයෙහි පටන් අනලස්ව බොහෝ පින්රැස්කිරීමෙන් හා ප්‍රාණඝාතාදි අකුශලයෙන් දුරුව පන්සිල් රකිමින් වසනුයේ මවුන්ට උපස්ථාන කිරීමය පියන්ට උපස්ථාන කිරීමය කුලජ්‍යෙෂ්ඨයන්ට එසේම උපස්ථාන ආදර කිරීමය සැබෑබස් කීමය මොලොක් බස්කීමය කේලාම්

නොකීමය මිසුරුසිතින් නොරව විසීමයයි යන මේ ගුණධර්මයන්
පුරා මරණින්මත්තෙහි තව්තිසාභවනයෙහි දෙදෙව්ලොවට අධිපති
ශක්‍රදේවේන්ද්‍රව උපන්නේය, එකල්හි තව්තිසා භවනයෙහි පූර්වදෙ
වවූ අසුරයෝ වසති, එහෙයින් සක්දෙව්රජ "මොවුන් හා එක්ව
රාජ්‍ය කිරීමෙන් ප්‍රයෝජන කිම්දැ"යි සිතා ඔවුන්ට රාපොවා මත්
වූවාහු මහමෙරපාතට දම්මවීය, එකල්හි ඔහු හැමදෙනම ඔවුන්ගේ
කුශලබලයෙන් නිපන් අසුරභවනයටම පැමිණියාහුය, ඒ අසුර
භවනය නම් මහාමේරුව යට තව්තිසාභවනය හා සමානවම පිහිටි
යේය, එහි දෙවියන්ගේ පරසතුගසමෙන් සිත්පලොල් නම් කල්ප
වෘක්ෂයෙක් පහළවිය, එහි මල්පිපිකල තව්තිසාභවනයෙහි පරසතු
කෙලියමෙන් අසුරයෝ එක්ව මහත් සතුටෙන් සැනකෙළිකෙළිති,
ඒ අසුරසභාව "රහසිව ශක්‍රතෙම අපට රාපොවා මත්කරවමින්
මහමෙරමත්තෙන් හෙලා අපගේ දිව්‍යපුරය ගත්තේය, ඔහු හා
සමග අපි යුද්ධකරමහ"යිකියා වැඹක් ඔස්සේ නැගෙන කුහුඹුරැලක්
සේ මහාමේරුව ඇසුරුකොටගෙණ නැංගාහුය, ඒ බව ඇසූ ශක්‍ර
දේවේන්ද්‍රතෙම මුහුදුපිටින්ම ගොස් ඔවුන් හා යුද්ධකොට පැරදුනේ
ඒ පනස්යොදුන් පමණවූ වෛජයන්ත නම් රථයානාවෙන් දකුණු
මුහුදුපිටින් දුවන්ට වන, එසේ දිවන රථය කොලහිඹුල්වනයට
පැමිණිකල ඒරථවේගයෙන් මගඅසල ඉඹුල්රුක් තල්ගස්සේ ඉදිර
වැටෙන්ට වන, එයින් ගුරුළුපැටියෝ මහහඬින් හඬාම වැටෙමින්
මුහුදුපිට පෙරළෙති, ශක්‍රදේවේන්ද්‍රතෙම ඒ හඬ අසා මේ කුමන
හඬෙක් දැයි විචාළතැන මාතලි දෙව්පුත් "නුඹවහන්සේගේ රථ
වේගයෙන් සිඳී වගුලකොලහිඹුල්වනයෙහි ගුරුළුපැටවුන්ගේ හඬ
ය"යි කීය, සක්දෙව්රජ ඒ අසා "අහෝ අපනිසා එසේ ගුරුළුපැට
වුන්ට දුකෙක් නම් නොවේවා, ඓශ්වර්ය්‍යනිසාවත් දිවිනිසාවත්
ප්‍රාණඝාත අකුශලය නොකරමහ, මොවුන් නිසා අපගේ ජීවිතය
අසුරයන්ටදී අපි ප්‍රාණවධයෙන් මිදෙමහ, එහෙයින් මාතලි නම්
රථාචාර්ය්‍ය රථය නවත්වා ආපසු කරකවව"යි කීයේය, එබස්ඇසූ
මාතලි දෙව්පුත් රථය නවත්වා ආපසු කරකවා අන්දිසාවකින් දෙව්
ලොවට යනසේ අභිමුඛකෙළේය, එකල්හි පසුපස්සෙහි ළුහුබඳවා
එන අසුරසේනාව ඒ නවත්වන්නාවූ රථය දැක "අනික් සක්වල
කින් දිව්‍යසේනාවක් අවුත් බලලදින් ශක්‍රයා ආපසු කරකැවී නැව
තත් අපකරාම එන්නේය"යි සිතා අසුරසේනාව භයපත්ව නැවති
ගොස් අසුරපුරයටම වැදුනාහුය, මෙසේ දෙව්ලෝ දෙකකට නායක
කවූ දෙසොලපනස්ලක්ෂයක් පමණ දිව්‍යාඞ්ගනාවන් පිරිවරා දසදහ
සක් යොදුන් ශක්‍රපුරයෙහි ප්‍රමාණාතික්‍රාන්ත දිව්‍යෛශ්වර්ය්‍යයට
පැමිණි ශක්‍රදේවේන්ද්‍රයා පවා ඒසාමහත් දිව්‍යසම්පත්තියන් තමාගේ

ජීවිතයත් නොසළකා ඒ හැමතන්හි පැවති ආලය හැර ප්‍රාණාති පාත අකුශලයෙන් දුරුවූයේත් පව්කිරීමෙහි නොයෙක් ආදීනව හා සිල්රැකීමෙහි මහානිසංස ඇතිහෙයිනි, එසේහෙයින් එබැවින් වත්නි තමහට වැඩකැමති සත්පුරුෂයෙනි තමතමන් විසිනුදු අප හැමටත් ඒ පව්කිරීමෙන් වන සතරඅපා දුක්අනුභව කිරීම් ආදී නොයෙක් ආදීනව හා එයින් වැළැකීමෙන් දිව්‍යසම්පත් ලැබීම ආදී ප්‍රමාණාතික්‍රාන්ත ආනිසංසකාරණයෝ ඒකාන්තයෙන් ඇතිවන්නා හුයයි නුවණින් යෙදී සැළකීමෙන් එසේම ඔවුනොවුන්ගේ ධන බඩු ජීවිතාදී සියල්ලම විනාශයට නිසිකාරණා පැමිණියේවී නමුත් ඒහැම නොසළකා අකුශලයෙන් දුරුව උතුම් ශීලගුණයම රක්‍ෂා කටයුතු.

තවද ලොකයෙහි කුශලාකුශලවිභාගාදී නොයෙක් කාරණා කාරණා දන්නා දෙව්මිනිසුන් විසින් මෙසේ පාපයෙන් දුරුව සිල් රක්‍ෂාකිරීම කුමන ආශ්චර්යයෙක්ද, දිව්‍යෛශ්චර්යය දූත ශක්‍රයාගේ අවවාද ඇසූ තිරිසන් සත්හුපවා අප්‍රමාදව ප්‍රාණාතිපාත අකුශලයෙන් දුරුව සීලගුණයම රක්‍ෂාකළාහුය, ඒ කෙසේදයත්:—

එම ශක්‍රදෙවෙන්ද්‍රතෙම පළමුවෙන් මිනිස්ලොව මඝමානවකව උපන්කල ඔහට භාර්‍ය්‍යාවසිටි පින්නොකර ප්‍රමාදවවිසූ සුජාතා නම් භාර්‍ය්‍යාතොමෝ තමා පින්නොකළහෙයින් එක්ව පින්කළ සෙසු භාර්‍ය්‍යාවන් හා සමග දෙව්ලොව නොඉපද එක්වනාන්තර යෙක්හි කඳුරැලියක කනකොකිනිව උපන්නීය, ශක්‍රදෙවෙන්ද්‍රතෙම දෙව් ලොව නුපන්බව දැන කොතනක උපන්නිදැයි බලනුයේ ඈ පින් නොකළහෙයින් තිරිසන් අපායෙහි කනකොකිනිව උපන්බව දැන එතනට ගොස් ඈගෙණ දිව්‍යලොකයට අවුත් රම්නීයවූ දිව්‍යපුරයද සුධර්‍මා නම් දිව්‍යසභාවද යනාදී දිව්‍යෛශ්වර්‍ය්‍ය සියල්ලම පෙන්වා අවවාද කොට පඤ්චශීලයෙහි පිහිටුවා නැවත එම කඳුරැලියටමඇර සක්දෙව් රජ දෙව්ලොවටම ගියේය, ඒ කොකිනීද එතැන්පටන් ඒ අවවාදලෙස සිල්රක්‍ෂාකරන්නීය, එකල්හි ශක්‍රදෙවෙන්ද්‍රතෙම ඒ කොකිනි සිල් රක්‍ෂාකරන්නට සමර්‍ථවන්නීදැයි පරීක්‍ෂාකරණු සඳහා මළ කුඩමස්සකු වෙශයෙන් ඈ ඉදිරිපිට වැදහොත්තේය, ඒදැක කොකිනී මළ මත්ස්‍යයෙක යනසිතින් තුඩින් ඉසඅල්වාගත, එවිට ඒ මත්ස්‍යයා වරල සොල්වා ලීය, ඒදැක ජීවිතය ඇති එකෙ කැයි සිතා ඇරපූවාය, එවිලෙහි ශක්‍රතෙම සිල්රක්‍ෂාකිරීමෙහි තී හැකිවන්නෙහියයි ප්‍රසංසාකොට උත්සාහ වඩාවයි කියා දෙව්ලොව ටමගියේය, ඒ කොකිනීද එයින්මියගොස් බරණැස කුඹල්කුලයක ඉපිද පූර්‍වඅභ්‍යාසවශයෙන් පිරිසිදුවම සිල්රක්‍ෂාකරන්නිය, ශක්‍රතෙම නැවතත් ඈගේ ප්‍රවෘත්තිය බලනුයේ මිනිස්ලොව උපන්බව දැන

එතනට ගොස් ගැලක් පුරා ගෙණගිය රන්තියඹරා රැසකින් සංග්‍රහකොට අප්‍රමාදව සිල් රක්නා පරිද්දෙන් නැවතත් අවවාදකොට දෙව්ලොවටම ගියේය, ඈද ඒ අවවාදලෙස අප්‍රමාදව සිල් රක්‍ෂාකිරීමෙන් බොහෝ පින්කම් රැස්කොට ආයුකෙළවර වෙපචිත්තිනම් අසුරරාජයාට දුවව උපන්නීය, සිල්රක්‍ෂාකළකුශලයෙන් විශිෂ්ටවූ රූපශ්‍රීන් යුක්තව පෙර පුරුදුතායෙන් සක්දෙව්රජහටම භාර්‍ය්‍යාව දෙකෙළපනස්ලක්‍ෂයක්පමණ දිව්‍යාඞ්ගනාවන්ට ප්‍රධානවඉපිද දිව්‍ය ශ්‍රීසම්පත් අනුභවකළේය.

එහෙයින් එම්බා පින්වත්නි තමහට වැඩකැමති නුවනැති සත්පුරුෂයෙනි මෙසේකිසිම කාරණාකාරණා විභාග දන්මක්නැති සියල්ලෙන් අධමනිශ්‍රිතවූ තිරිසන්ජාතියෙහි උපන් ඒ කනකොකින්න පවා දිව්‍යලොකසම්පත් දැක සතුටුව ශක්‍රයාගේ අවවාද අසාගත් පමණකින් අප්‍රමාදව තමන්ගේ ජාතිස්වභාවයෙන්ම සතුන් නැසීමහැර ජීවත්වීම පිණිස අන්කිසි උපායකුත් නැතිවම තිබියදී ප්‍රාණාතිපාත අකුශලයෙන් දුරුව ශීලගුණයම රක්‍ෂාකරමින් එම ශීලබලෙන් ඒසාමහත් දිව්‍යසම්පත්තියක් ලත්කල මෙසේ හැමලෙසින් එබඳුවූ අභව්‍යස්ථානවලින්නුත් මිදී යහපත් මනුෂ්‍යජාති ලදින් කාරණා කාරණා කුශලාකුශලයෝ නම් මේ මේ යයි වෙන්වෙන්ව සලකාගතහැකි උතුම් ප්‍රඥවත් ලදින් විභජ්ජවාදීවූ බුද්ධරජාණන්වහන්සේ විසින් සියලු කුශලාකුශලයන් විභාගකොට වදාළාවූ සද්ධර්මයත් අසා ප්‍රාණාතිපාතාදි අකුසල්කිරීමහැර ලොව ජීවත්වීමට නිසි ගොයිතැන් වෙළඳාම් ආදිවූ නොයෙක් උපාය කාරණාවලුත් ලොව ඇතිව තිබියදී ඒ කනකොකින්න සේ දිව්‍යලොකසම්පත් මසසින් නුදුටුවාහු තමුත් හැම දිව්‍යසම්පත්ආදිය නුවණැසින් මනාකොට දක්නා යහපත් මිනිසත්බව ලදින් ඒ ස්වර්ගසම්පත් ආදිය ලැබීමට නිසිවූ උතුම් ශීලගුණ පූරණයෙහි යෙදී පව්කිරීමෙන් දුරුවීමට උත්සාහ නොකරන්නාහු නම් තොපි හැමටම මෙසේවූ මිනිසත්බව ලැබුවායින් මෙබඳු බුදුබන ඇසුවායින් කවරප්‍රයොජනද මේ උතුම් බුද්ධොත්පාදයෙන් බබලන යහපත් මිනිසත්බව ලැබ ඒ කනකොකින්නට ඇතිවූ කල්පනාව පමණවත් නොව අනුවනින්ම යෙදී අකුසල්කිරීමෙහි යෙදීමෙන් මතු තොපි ඇම සසරින් මිදීම තබා සතරඅපායින් මිදී ගැලවීගැනීම පමණවත් කෙසේද, නිරන්තරයෙන් ප්‍රමාදව ප්‍රාණාතිපාතාදි මේ දශඅකුසල්හි යෙදී වාසයකළවුන්ට සතරඅපායම ස්වකීය ගෘහයක් වාසස්ථානයක් සමානය යන කාරණය හා ඒ පව්කිරීමෙන් දුරුව වාසයකළවුන්ට සදෙව්ලොව ස්වකීය ස්වකීය ගෘහයක් වැන්නායි යන බව තොපි ඇම නොඅසනලදද, හැම සතුන්වෙත පැතළ මහාකරුණාවක් ඇති බුදු

රජාණන්වහන්සේ මෙසේ සියලු කුශලාකුශලයන්ගේ විභාගාදී
නවානිසංස ප්‍රකාශකොටකීමෙන් මේ සියලු ධර්‍මය දෙශනාකළෙත්
හැම සතුන් සියලු දුකින් මුදා නිවන්දක්වනපිණිසමය, ඒ එසේ
මය, එසේ නොව අප හැම ඇතුලුවූ මේ සියලු ලොකයාකෙරෙන්
කිසියම් ලාභයක් ලැබගන්ටවත් යම්කිසි කාරණාවක් කරගන්නා
පිණිසවත් මේ ධර්‍මය බුදුරජ දෙශනාකර වදාළසේක් නොවෙසියන
කාරණයත් තෙපි ඇම ඇසූයේ නැද්ද, අපවිසිනුදු මේධර්‍මය තොප
කෙරෙන් උපදනා කිසියම් ලාභසත්කාරප්‍රසංසාදියක් ආශ්‍රයකොට
ඒනිසා මෙසේ ලියාකියා අමුතු සදන බණකුත් නොවෙයි, පිටකත්‍ර
යෙහි ප්‍රකාශව පෙනෙණන සද්ධර්‍මානුශාසනාවන් මෙසේ ප්‍රකාශකොට
දක්වීමෙන් එහි පිහිටීම හෙතුකොටගෙණ තෙපි ඇම මේ අක්
මුල්නැති සසර අනන්තකාලයක් මහදුක් විඳිනාහෙයින් ඒ දුකෙන්
මුදවනුපිණිස දයාවෙන් මෙහෙයනලද සිත් ඇතිව හිතෙසීව
කියන බණක් හෙයින් මෙහි මහත් ආදර උපදවා කවරතරම් කො
ණකුන් විසින් කෙබඳු බාධාවක් කළත් මදක්වත් පමානොව
නොනැවතී දුකසේ ලත් මේ බුද්ධොත්පාදයෙන් බබලන උතුම්
ක්ෂණසම්පත්තිය හා මේ බණඇසීම ආදි නොයෙක්කාරණා සාර්‍ථක
කොට ගන්නාපිණිස අකුසල් කිරීමෙන් දුරුවනු කැමති නුවනැති
සත්පුරුෂයන් විසින් යටකීයනලද ක්‍රමයෙන් ප්‍රාණඝාතාදි දශඅකු
ශලකර්‍මපථයන්ගේ අනෙකප්‍රකාරවූ ප්‍රභෙදදීනවකාරණයන් නො
යෙක්වර අසා දැන හැඳින ඒ ඒ පරිද්දෙන් සිතතබාගෙණ එහි
මෙලෝපරලෝ දෙක්හීම විඳින්දයුතු සතරඅපාදුක් ආදි අනන්තදුක්
අනුභවකිරීමෙන් වන ආදීනව කාරණා සිහිකිරීමෙන් භයඋපදවා
දුරුකටයුතුවූ ඒ අකුශලයන්කෙරෙන් ලොභාදි කිසියම් කාරණය
කින්ප්‍රාණාතිපාතඅකුශලයක්කරන්ට පැමිණිකල අපිඅපගේ ජීවිත
යම්සේ නොනස්නා කැමැත්තමෝද එසේම සියලුසත්වයෝත් තම
තමන්ගේ ජීවිතය නොනැසීමෙහි කැමැත්තාහුයයි යනාදී කාරණා
සැලකීමෙන් ප්‍රාණාතිපාත චෙතනාවෙන් දුරුව හැමසතුන් කො
රෙහි කරුණා මෙත් පතුරුවා වාසයකිරීමෙන් සිද්ධවන "අපරිමා
නානං සත්තානං අවෙරං දත්වා අභයං දත්වා" යනාදීන් වදාළ අප්‍ර
මාණවූ ආනිසංසයන් සිහිකිරීමෙන් සෙදී අනුන් විසින් මරණ
සතුනුදු හැකිවීනම් මැරීයනොදී අව්‍යාපාද සිතින් වාසයකිරීමය,
අදත්තාදානවශයෙන් අනුන් අයිති වස්තූන්ගේ පැහැරගැන්මක්
පැමිණිකල යම්සේ අපි අපසන්තකකිසිවකුත් නොනස්නා කැමැත්
තමෝද එසේම සියලු සත්වයෝත් තමතමන් සන්තක වස්තුව
නොනස්නා කැමැත්තාහුයයි යනාදි කාරණා සැළකීමෙන් යටත්
පිරිසයින් අනුන්අයිති දතඩනුල්පටක්පමණවත් තමන් නොගැන්

මෙන් හා අනුන් ලවා නොගැන්වීමෙන්ද අනුන්ගනනා දැන වැලකීමෙන් හා ඒ නස්නාතැන රක්ෂාකිරීමෙන් යෙදී ඔවුනොවුන් අසිතී වස්තු ඔවුනොවුන්ටම සවසපිරව පවතීවයි යන වැඩදැයි සිතින් වාසයකිරීමය, පරදාරසේවනයට නිසි පාපකර්මයන් කිරීමෙහි අවකාශයක් ලත්තැනද “අපි අපසනනක භාර්යාවන් රක්ෂාකිරීමෙහි තත්පරව යම්සේ යෙදී වසමෝනම් එසේම සෙස්සෝත් වසනනාහුය”යි දැන පරස්ත්‍රීසෙවනයෙන්දුරුව සවදාරා සන්තොෂයෙන් සතුටුවීමෙන් හා පරදාරසේවනයෙහි යෙදෙන්නාවූ සෙස්සන්ටද එහි නොයෙක් ආදීනව කියා වැලකීමෙහුදු අනුන්ගේ කුලවංශ රැකීමෙන් යෙදී අව්‍යාපාද සිතින් වාසය කිරීමය, ලොක යෙහි එසේම ක්ලේශකාමයෙහි හැසිරීම කැමැත්තන් විසින් සෙවනය කළයුතුවූ සුරාපානයක් පැමිණිතැන එයින් වන මෙලෝ පරලෝ දෙක්හිම නොයෙක් ආදීනව සළකා ඒ සුරාසෙවනයෙන් දුරුවීමය යන මෙසේවූ කායසුචරිත පිරීමෙන් ත්‍රිවිධවූ කායදුශ්චරිතයෙන් වෙන්වීමෙන්ද, මුසාවාද කීමට නිසිවූ යම්කිසි කාරණයක් පැමිණිතැන එසේ අසත්‍ය වචන කීමෙන් මෙලෝ පරලෝදෙක්හිම වන නොයෙක් ආදීනව සළකා සිනාපිණිසවත් බොරු නොකියා නිරන්තරයෙන් මුසාවාදයෙන් දුරුව සැබෑ බස් කීමය, කේලාම් කීමට නිසි අවකාශයක් ලත් තැනද එයින් වන මහත් ආදීනව සළකා එසේ ඔවුනොවුන්ගේ භෙදවීමට නිසි කේලාම් වචන නොකියා භෙදවූවන් සමගිවනසේ ඔවුනොවුන්ට ප්‍රියමනාප බස් කීමය, පරුෂ වචනයෙන් අනුන්ට නිසරු නිග්‍රහ කිරීමට නිසිවූ සිදුරුකාරණයක් පැමිණිතැන එසේවූ පරුෂ කීමෙහි දොෂ සළකා රළුබස් නොකියා හැමදෙනාට ප්‍රිය කන්කළු මියුරු වචන කීමය, නිස්ප්‍රයොජනවූ සම්ඵප්‍රලාප බිණීමක් පැමිණිවිටද නුවනින්ම යෙදී එයින් වන මහත් ආදීනව සැළකීමෙන් නිරර්ථකවූ නිස්ප්‍රයොජන සම්ඵප්‍රලාපයෙන් දුරුව අනුන්ටද තමන්ටද මෙලෝ පරලෝ දෙකින්ම වැඩ දායකවූ ලොකනීතිය ධර්මනීතිය දෙකටම නොවරදනාවූ යහපත්වූ ප්‍රයොජන වචන කීමය යන මෙසේවූ වචීසුචරිත පිරීමෙන් චතුර්විධවූ වචීදුශ්චරිතයෙන් වෙන්වීමෙන්ද, එසේම අනුවනින් යෙදී පැවතීමය යන අභිද්‍යාවද සියලු අකුශල මූලයයි යනාදි වශයෙන් එහි මහත් දොෂසළකා එයින් දුරුව අනුන්ගේ සම්පත් දැක “මේ මට වේවා”යි නොසිතා “උන්ට සපිරවේවා, ඒ සම්පතෙන් ඔහු නොපිරිහෙත්වා”යි යනාදි සිතීමෙන් අභිද්‍යාවෙන් දුරුවීමෙන් අලොභසිතින් යෙදී විසීමය, ව්‍යාපාදයෙහි මහත් ආදීනව සළකා එයින් දුරුව “සියලු සත්වයෝම ඔවුනොවුන් සමගිවීමෙන් ප්‍රියව වාසය කෙරෙත්වා, සියලුම වැඩෙන් සම්පතෙන් හැමසත්හුම නොපිරිහෙත්වා”යි යනාදි සිත් සිතීමෙන් ව්‍යාපාදයෙන් දුරුව අද්වෂ

සිතින් යෙදී විසීමය, මිථ්‍යාදෘෂ්ටියයි කියනලද විපරීතවූ නොයෙක් දෘෂ්ටිගැනීම නිවණට ඝනමග අහුරා අකුසල්ව සිටිබවද අපායදුකට මාර්ගයවූබවද නුවණින්ම සළකා "එබඳු නපුරුවූ මිථ්‍යාදෘෂ්ටියෙන් දුරුව සම්‍යක්දෘෂ්ටිවූවාහු ඒ පින්කමින් සුගතියෙහිම ඉපිද එහි දිව්‍යසම්පත් අනුභවකොට මිනිස් අත්බවෙ උපන්කල සම්‍යක්දෘෂ්ටි සම්‍යක්කල්පනා ඇතිවෙයි, තමාගේ ප්‍රාර්ථනාවූ පරිද්දෙන් තුන් බොධියෙන් එක්බොධියකට පැමිණ නවත්නේය"යි දැන සම්‍යක් දෘෂ්ටීමෙන් අමොහසිහින් යෙදී විසීමය යන මෙසේවූ මනොසුච රිත පිරීමෙන් ත්‍රිවිධවූ මනොදුශ්චරිතයෙන් වෙන්වීමෙනුද යනමේ ත්‍රිවිධසුචරිතය පිරීම හෙතුකොටගෙණ කාය වාක් මනඃ යන තුන් දෙරින් සිඹවන අපායමාර්ගවූ දශඅකුශලකර්මපථයන් කෙරෙන් දුරු වනු කැමති නුවනැති පුරුෂයන් විසින් මේ ලොකයෙහි ජීවත්වීම කැමැත්තන් විසින් දුරුකටයුතුවූ ප්‍රචණ්ඩ සිංහ ව්‍යාඝ්‍රාදීන්සේද භයානකවූ ප්‍රපාතාදියසේද උග්‍රවූ ඝොරවිෂඇති සර්පාදීන්සේද ත්‍රිවිධ දුශ්චරිත අකුසල් කිරීමෙන් දුරින් දුරුව දිව්‍යමනුෂ්‍ය සම්පත් හා නිවන්සැප ලැබීමට එකාන්තකාරණාවූ හෙයින් ස්වර්ගමොක්ෂදෙකට මාර්ගවූ ත්‍රිවිධ සුචරිත කුශලයන් මෙහි දැක්වූ ක්‍රමයෙන්ම පිරීමෙන් ඒ සියලු සගමොක් ලැබීමට අප්‍රමාදව උත්සාහ කටයුතු.

ලෝවැඩ පිණිස කරණලද මේ ශ්‍රීසද්ධර්මාවවාද සංග්‍රහයෙහි
මෙතෙකින් දශඅකුශල කර්මපථයන්ගේ
ප්‍රභෙදාදීනවානුශාසනාකථාවෝ දක්වා නිමවනලදී.

---

අනෙකප්‍රකාරවූ දශඅකුශලයන්ගේ ප්‍රභෙදාදීනව මෙසේ ප්‍රකාශ කිරීමෙන් දෙවිබ්‍රහ්මසුන් සහිත සියලු ලොකයාහට කරණලද උතුම් සද්ධර්මානුශාසනා ඇතිහෙයින් හැමසතුන්වෙත පතළ කරුණාඇති මාගේ බුදුරජාණන්වහන්සේ ශාස්තෘනම්වනසේක.

පඤ්චානන්තරිය අකුශලකර්මය නම් කවරහයත්?—මවුන් මැරීමය පියන් මැරීමය රහතුන් මැරීමය සංඝයාවහන්සේ බිඳුවාපීමය බුදුන්ගේ ශරීරයෙන් ලේ සෙල්වීමය යන මේ පස ආනන්තරියකර්ම නම් වෙත්, මාර්ගයට අනතුරුව ඵලයට පැමිණීම සේ නොමුළාව මවුන් මැරීම ආදි මේ අකුශලකර්ම කළ සත්වතෙම මරණානන්තරව නරකයෙහිම උපදනාහෙයින් මොහුආනන්තරිය කර්මනමැයි කියනු ලැබෙත්.

එහි මවු මැරීමයයි කියනලද මාතෘඝාතය නම් කෙසේද? –යම් කිසි කෙණෙකුන් විසින් මනුෂ්‍යජාති ඇති වැදූ මව මනුෂ්‍යව සිට මරම්"යි යන සිතින් දැන දැන දිවි ගැලවූයේ වී නම් හේ මාතෘඝා

තක කර්මය නම් වේ, එසේහෙයින් යමෙකු විසින් මනුෂ්‍ය ස්ත්‍රී වී තමුදු වැදූ මව හැර ඇතිකළ මව හෝ සුළු මව හෝ අමනුෂ්‍ය ස්ත්‍රීව සිටි වැදූ මව හෝ නැසීමෙන් ආනන්තරිය කර්මය නොවේ, යමෙක් තුමූ තිරච්ඡානව සිට මනුෂ්‍ය ස්ත්‍රී වූවූ මව නැසුයේ වී නම් හෙද ආනන්තරිය කර්මය නොවේ, ඕහට එයින් වන කර්මය ඉතා මහත්ව ආනන්තරියෙන් පැහැර සිටිනේය.

එසේම යමෙකු විසින් මනුෂ්‍යවූ ජානකපිතානම් තුමූත් මනුෂ්‍යව සිට නැසුයේ වී නම් පිතෘඝාතක කර්මය වේ, යම්සේ මිනිසත් බව සිටියහුගේ කුශලධර්මයන්ගේ තීක්ෂණ ප්‍රසන්න සුරභාවයෙන් ඉපදීම හෙතුකොටගෙණ ත්‍රිවිධ බොධිසත්වයන්ගේ ඒ ත්‍රිවිධබොධියට පැමිණීම යම්සේ නොවේද එපරිද්දෙන් මිනිසත්බව සිටියහුගේම අකුශලධර්මයන්ගේද තීක්ෂණ ප්‍රසන්න සුරභාවයට පැමිණීම වන්නේය, එසේනොවීමෙන් කර්මය තීක්ෂණ නොවනබව දතයුතු, ඉදින් වෛශ්‍යාවකගේ පුත්‍රයෙක්වේද, හෙතෙම "මේ මාගේ පියාණෝය"යි නොදන්න යමක්හුගේ සම්භවයෙන් උපන්නේද, හෙතෙම ඒ පුතනුවන් විසින් නැසුයේ වී නම් පිතෘඝාතක කර්මගණනටම පැමිණේ.

යමෙකුවිසින් යටත්පිරිසයින් සෝවාන්වහෝ ගිහිස්වභාවයෙහි සිටි මනුෂ්‍ය ජාතිඇති ක්ෂීණාශ්‍රවකෙණෙක් දූන දූන දිවිගැලෙව්යේවේද, මේ අරහන්තඝාතක නම්, අමනුෂ්‍යවූ රහත්නමක් හෝ මනුෂ්‍යජාති ඇතිව සෙසු මාර්ගඵලසම්ප්‍රාප්තවූ ආර්ය්‍ය පුද්ගලයන් හෝ නැසීමෙන් ආනන්තරිය කර්මය නොවන්නේය, එහෙයින් සෙසු නියම ආනන්තරිය කර්ම කළවුන්ට සේ ඕහට ප්‍රව්‍රජ්‍යාවද නොවලක්වනලදි, අකුශලකර්මය බලවත් වේ, තිරිසන්ජාතිඇති යමෙක් මනුෂ්‍යවූ රහත්නමක් නැසීමෙන් ආනන්තරිය කර්ම නොවේ, කර්මය වනාහි මහත්යයි දතයුතු.

මාතෘ පිතෘ ඝාතකද්වන තැන් **එලකමතුකගා** උපමායෙන් කර්මප්‍රභෙද දක්වූයේ, යම්සේද, එමෙන් මේ අරහන්තඝාතකයෙහි කර්මලක්ෂණය දතයුතුයි, යම් භික්ෂුකෙණෙක් දෙව්දත්තෙරුන් මෙන් ශාසනයළධර්මළබ්ධිනය කොට අපලොකනකර්මය, ඤත්ති කර්මය, ඤත්තිද්විතියකර්මය, ඤත්තිචතුත්ථකර්මයයි, කියනලද සතර ප්‍රකාර සංඝකර්මයන් අතුරෙන් එක්තරා සංඝකර්මයක් එකසීමාවක සතරනමින් අඩුනොව දෙපක්ෂව වෙන් වෙන්ව හිද කරන්නහු විසින් සංඝභෙද ආනන්තරීය කර්ම කෙළේ නම්වේ, අන්පරිද්දකින් නොවෙයි දතයුතු.

යමෙක් දෙව්දත්හුමෙන් මෙෂයෙන් දුෂ්‍යවූ තප්‍රරුවෙතනා වෙන් ජීවමාන බුදුන්ගේ ශරීරයෙහි මදුරුවෙකු බොන පමණවත්

ලේ උපදවූයේවීනම් ඔහට ඒ ලොහිතුප්පාදක ආනන්තරියකර්මයවේ, මෙහි ලේ ඉපදවීම නම් ශරීරය ඇතුලතම ලොහිතයාගේ එක්වීම කිරීමය, තථාගතයන්ගේ කිසිවක්හු විසින් සිඳ බිඳ පිය නොහැකි අභෙද්‍ය ශරීරයෙහි අනිකකුගේ උපක්‍රමයෙන් චර්මය සිඳ ලේ වගුරුවාලීමක් නැත, ක්‍රොධයෙන්ශරීරය ඇතුළතම එකතැනක ලේ කුපපවා එක්වීමයි, යමෙක් රෝගසමනය පිණිස ජීවකයන්සේ සම ඉරා කුණු ලේ හැර පහසුකලේවී නම් මේ ලොහිතුප්පාදකර්මය නොවේ, ඔහතෙම බොහෝ පින් රැස්කෙළේයයි දතයුතු, මේ පචානන්තරිය අකුශලකර්මයන්ගේ ප්‍රභෙදය.

ආයෙර්‍යාපවාද අකුශලකර්මයද පිලියම් නොලදහොත් මේ ආනන්තරිය කර්මයන් හා සමව දෙවන ජාතියෙහිම විපාකදීම හා නිවන් මගටද බාධාවන හෙයින් ගරුතර කර්මයක, හෙද එහෙයින් මෙහි දක්වනු ලැබේ.

එහි ආයෙර්‍යාපවාද අකුශලකර්මය නම් කවරහයත්, ලොකාග්‍රවූ බුද්ධ ප්‍රත්‍යෙක බුද්ධ ආර්‍යශ්‍රාවකයෝ ආර්‍යයෝ නම් වෙති, එහෙයින් යටත් පිරිසයින් ගිහිව වසන සෝවාන්වූ පුද්ගලයා දක්වා බුද්ධාදිවූ ඒ උතුමන්ට අනර්ථ උපදවනු කැමතිව යමෙකු විසින් අන්තිමවස්තුවෙන් හෝ ගුණ නැසීමෙන් හෝ කියනලද යම් මේ උපවාද ආක්‍රොශගර්හා එරුෂවචන කෙණෙක් ඇද්ද, ඒ හැම ආයෙර්‍යාපවාද අකුශල කර්ම නම්.

එහි යමෙක් එබඳු උතුමන්ට නොසතුටුව “: මොවුන්ට ශ්‍රමණ ධර්මයෙක් නැත. මොහු අශ්‍රමණයෝය”යි කියන්නේවී නම් ඒ අන්තිම වස්තුවෙන් උපවාද කළා නම් වෙයි, “මොවුන් කෙරෙහි ධ්‍යානයෙක්වත්, විමොක්ෂයෙක්වත්, මාර්ගයෙක්වත්, ඵලයෙක්වත්, නැතැ”යි කියන්නේවී නම් ගුණපරිධංසනයෙන් උපවාද කළා නම් වෙයි.

එහි පුත්‍රයන්ට වැඩ කැමතිව දෙමව්පියන් විසින් කියනලද ගර්හාවචනයෝද ආශ්‍රය කොට සිටිනා අන්තෙවාසිදීන්ට වැඩ කැමතිව ආචාර්‍ය උපාධ්‍යායන් විසින් ශික්ෂවන පිණිස කියනලද ගර්හාවචනයෝද උපවාද නොවන්නාහුයයි දක්වනලදී, යම් කෙනෙක් “මේ ආර්‍යකෙනෙකැ”යි දැන හෝ නොදැන හෝ ආර්‍යයන් වහන්සේ නම කට උපවාද බිනුව හොත් මෙහි ආර්‍යබවටම ප්‍රමාණ බැවින් ඔහට ආයෙර්‍යාපවාද අකුශලයවේ, මේ ආර්‍යයයි නොදන්නාවූ වෙෂයෙන් නපුරු සිත් නැත්තාහුගේ එහි උතුම් ගුණ ඇතිබව දැන ගන්නා පිණිස කියන වචනය ගුණපරිධංස නොවෙයි, එහෙයින් ඔහට ආයෙර්‍යාපවාද නොවන්නේයයි කියත්. ඒ මේ ආයෙර්‍යාපවාද

කර්මය ආනන්තරිය අකුශලකර්මයන් සදෘශවන බැවින් මහත් ගරුතර පාපකර්මයක, එසින් සුගති ගමනටද නිවන්මග ලැබීමටද අන්තරායවෙයි, එසේදවුවත් ඒ ආර්යෝපවාද අකුශලකර්මය තෙකිච්ඡ බැවින් පිළියම් සාධ්‍යය, එහෙයින් ආනන්තරිය කර්මයසේ අතෙකිච්ඡනොව ක්ෂමාකර ගැන්මෙන් අවි නැතිවේ, ඒ කාරණය ප්‍රකාශකරණ පිණිස මේ වස්තුව දක්වනලදී.

ඒ කෙසේදයත්?—එක්තරා ගමක එක් තෙරුන්නාන්සේ නමක් ලදරුභික්ෂුනමක් එක්ව දෙදෙනාවහන්සේ පිඬු පිණිස පැමිණියාහුය, ඒ උන්වහන්සේලා පළමුකොටම සම්ප්‍රාප්ත ගෙවලදීම කිණිස්සක් පමණ උණු කැඳ ලද්දාහුය, තෙරුන් වහන්සේගේ බඩ වාතරෝගයෙක් පහරන්නේය, එහෙයින් උන්වහන්සේසිතනසේක් "මේ කැඳ මට පිහිටය, එහෙයින් සිහිල්වීමට පළමුවෙන්ම වළඳමි"යි සිතා මිනිසුන් විසින් අවුළුපත් කැඳ පිණිස ගෙණ ආසේද දඬුකඩක් මත්තෙහි උන්වහන්සේ වැඩහිඳ එහි සැමටම ප්‍රකාශව පෙණී පෙණීම ඒ හුණුකැඳිත්ත වැලඳූසේක, අනික් උන්වහන්සේ ඒ දැක එයටපිළිකුල්ව "ක්ෂුධාඅභිභවූ මේමහලුතෙම එකාන්තයෙන් අපට ලජ්ජාවිය යුත්තක් කෙළේය"යි කීයේය, තෙරුන්වහන්සේ ඒ ගම්හී හැසිර ඉක්බිති විහාරයට ගොස් "මෙතෙම සෝවාන්ව සිටින භික්ෂුකෙණෙකැ"යි දැනම ඒ ලදරු භික්ෂුනමට වදාරණසේක් "ඇවැත්නි තොපට මේශාසනයෙහි පිහිටෙක්ඇද්දැ"යි විචාරාවදාළසේක, එකල්හී අනික් උන්වහන්සේද "ශාසනයෙහි පිහිට නම් දුක්ඛාදිචතුස්සත්‍යය දැනීම"යි සිතා "එසේය, ස්වාමීන්වහන්ස මම සෝවාන්යෙමි"යි දැන්වූසේක; එවිට තෙරුන්වහන්සේ උන්වහන්සේට කරුණා උපදවා වදාරණසේක් "ඇවැත්නි තොප විසින් මතු පැමිණිය යුතු සකෘදාගාමි මාර්ගාදිය පිණිස උත්සාහ නොකර තාවිසින් රහතුන්ට උපවාද කියනලද්දැ"යි කියා තමන්වහන්සේ ප්‍රකාශ කළසේක, අනික් උන්වහන්සේ තෙරුන්වහන්සේගේ එසේවූ කැඳිති වැලඳීම දැක "මෙතෙම ශ්‍රමණයන්ට සරුප් නොසරුප් හෝ ලොකව්‍යවහාර පමණවත් නොදන්නාසේකැ"යි යන අභිප්‍රායෙන් එසේ කී බැවින් ගුණපරිධංසනයෙන් ගර්හාකොට කීමට ක්ෂමාකරවදාළේ මැනව"යි කියා ක්ෂමාකරනත්සේක, ඒ ක්ෂමාකරගත් කාරණයෙන් උන්වහන්සේට ඒ කර්මයතෙම සකෘදාගාමී මාර්ගාදියට පැමිණීමට ආවරණ නොවූයේය, පළමුවෙන්ම උන්වහන්සේ අපායමාර්ගය පිහිටවිසෝවාන්වූ බැවින් ඒ අකුශලකර්මයතෙම උන්හන්සේගේ සුගති ගමනට බාධාකරන්නට අසමර්ථයි.

එහි අන්‍යවූද යම් කිසිවෙක් බුද්ධාදී ආර්යයන්ට වරදවා උපවාද කෙළේවී නම් ඔහු සිතින් එතුමන් කරා ගොස් උක්කුටුකයෙන් හිඳ

ඇඳිලි බැඳ ගෙණ "වහන්ස මම ඔබවහන්සේට මේනම් මෙනම් වචනයකින් පිරිහෙලා කීමි, ඒ මට ක්ෂමාකර වදාළමැනව"යි කියා ක්ෂමාකරගතයුතු, ඉදින් සෝවාන්සකෘදාගාමිමාර්ගයට පැමිණියාහු ද්වේෂය මුල්සිඳ නොනැසූ බැවින් රොස්ව කිපීමෙන් හෝ අනාගාමි රහත්හු හෝ ඔහට වැඩ කැමතිව ආයතිසංවරයෙහි පිහිටුවනු පිණිස ක්ෂමාකරගන්නාහු වීනම් උන්වහන්සේලා වසන ඒ විහාරයෙහි යම් භික්ෂුකෙණෙක් වසන්නාහුද උන්වහන්සේලා සමීපයට ගොස් වැඳඋක්කුටුකයෙන් හිඳඇඳිලි බැඳගෙණක්ෂමාකර ගතයුතු,

ඒ කෙසේද?—"වහන්ස මම අසවල් ආයුෂ්මතුන්ට මේනම් මෙනම් දොෂවචනයක් බිණිමි ඒ ආයුෂ්මතුන් වහන්සේ මට ක්ෂමාකරණසේක්වා"යි කියා මෙසේ කියන්නහු විසින් ක්ෂමා කරවා ගතයුතු.

තවද තමා වරදවා උපවාද කිහු ඒ ආර්ය්‍යයන් වහන්සේ යම් දිශාභාගයකට නික්මගියගමනක් ඇතිකල්හි අතවැසි ආදීන් යවාද ක්ෂමාකරවා ගන්ට වටනේයි, ඉදින් එකලාව එතනහැසිරෙන භික්ෂු නමක් වීනම් හෙතෙම වසනතැනක් ගියතැනක් නොපෙණේ නම් නුවණැති එක්භික්ෂුන්වහන්සේ නමක් සමීපයට ගොස් "වහන්ස මම අසවල් නම් ඇති ආයුෂ්මතුන් වහන්සේට මේනම් මෙනම් වචනයෙන්බිනීමි, ඒකාරණය සිහිකරන්නාවූ මටවිපිළිසර උපදනේය, ඊට කුමක් කෙරෙම්දැ"යි කියයුතු, එවිට උන්වහන්සේ කියනසේක් තෙපි එසේ නොසිතව, ඒ තෙරුන්වහන්සේ තොපට ක්ෂමාකරණසේක, තොප සිත සන්සිඳුවව"යි කියනසේක, ඒ වචනය ඇසූ ඔහු විසිනුදු ඒ ආර්ය්‍යයන්වහන්සේ ගිය දිශාවට අභිමුඛව ඇඳිලි බැඳ ගෙණ ක්ෂමාකරණසේක්වයි කීයයුතු, එසේ කිරීමෙනුදු පාපය නැතිවේ, ඉදින් පිරිනිවියේක්වී නම් පිරිණිවීමඩස්ථානයට හෝ පූජා කරණතැනට හෝ යම් තැනක සුසානයද එතනට ගොස් පළමුකීසේහිඳ ක්ෂමාකරවා ගතයුතු, මෙසේකළකල්හි ස්වර්ගගමනයටද නිර්වාණමාර්ගයට පැමිණීමටද ආවරණනොවේ, පව්නැතිප්‍රකෘතිස්වභාවම වේ, මෙහි ප්‍රකෘති නම් මෙසේ කළකල්හි තමාගේ සිත පහදනේය, "ඒ කර්මය ස්වර්ගයට නිර්වානයටද ආවරණනොවෙයි යන අභිප්‍රාය කැ"යිසමහරෙක්කියත්, මෙසේක්ෂමාකරගත්කල්හි ඒඅකුශලකර්මය ප්‍රයොගසම්පත්තියෙන් විපාකයාගේ ප්‍රතිබාහනය කළබැවින් අහොසිකර්මවශයෙන් හෙවත් විපාක නැති කර්මවශයෙන් විපාක නැති ස්වභාවටම පැමිණෙන ලද්දේය, එහෙසින් ස්වර්ගමොක්ෂ දෙකට ආවරණ නොවන්නේය"යි මෙසේ මෙහි අර්ථ ගතයුත්තේය, මෙසේ කිරීමෙන් පව්නැතිවීම වනාහි ආර්ය්‍යොපවාද පාපකර්මයාගේද එම ආත්මයෙන්ම විඳයුතු දෘෂ්ටධර්ම වෙදනීය කර්මයාගේද ස්වභාවධර්මත

වකි, යම් පාපකර්මයක්මෙසේ ප්‍රතිකර්මනොකරණලද බැවින් ප්‍රකෘති නුවූයේද ඒ පාපකර්මය මහාසාවද්‍යම්වේ, මහාසාවද්‍යවූ ආර්‍ය්‍යෝපවාද පාපකර්මය ආනන්තරීකර්මය සමානවේ, ඒ කෙසේදයත්?-සෙය්‍යථාපි සාරිපුත්ත භික්ඛු සීලසම්පන්නො පඤ්ඤාසම්පන්නො දිට්ඨෙවධම්මෙ අඤ්ඤං ආරාධෙය්‍ය එවං සම්පදමිදං සාරිපුත්තනවදාමීතං වාචං අප්පහාය තං චිත්තං අප්පහාය තං දිට්ඨිං අප්පටිනිස්සජ්ජිත්වා යථාභතං නික්ඛිත්තො එවං නිරයෙති.

යනුයෙන් බුදුරජතෙම යම්සේ ශාරිපුත්‍රය ශීලසම්පන්නවූ සමාධි සම්පන්නවූ ප්‍රඥාසම්පන්නවූ භික්ෂුතෙම ඉහාත්ම භාවයෙහිම රහත් බවට පැමිණේද, එපරිත්දෙන් යමෙක් ශ්‍රොතාපන්නාදි ආර්‍ය්‍යගුණ යෙහි පිහිටි නමකට උපවාද කොට පරිභව බැන ඒ පාපය එමජාති යෙහි ඒනම ක්‍ෂමාකොට සිත්ගෙණ සන්සිඳුවා නොගන්නේවී නම් හෙතෙම ආක්‍රොශවශයෙන් කියනලද ඒ උපවාද වචනය නොහැර ඒ චිත්තය නොහැර ඒ දෘෂ්ටිය නොහැර සිට කාලක්‍රියා කළහොත් හෙතෙම අහස දමනකැටය යම්සේ බිම හෙන්නේවේද එසේම නර කාදුකට පැමිණෙන්නේය"යි වදාළසේක.

මෙසේ මරණින්මත්තෙහි ආනන්තරියකර්මයන්සේ අපායදුකට පමුණුවනලද ආර්‍ය්‍යොපවාදයයි කියනලද ලොවුතුරා බුදුන් හා සෝවාන්මාර්ගාදි ආර්‍ය්‍යභූමියට පැමිණි දෙව් බඹ යක්ෂ ගිහි මිනිසුන් අතුරෙන් යම්කිසිකෙණෙකුට දැන දැන හෝ නොදැන හෝ නිසරු නිග්‍රහවූ පරුෂවචන බිනීම නොයෙක්ආදීනව ඇත්තේයයි දැන එබඳුවූ ගුණවත්නයන් කෙරෙහිද තුනුරුවන් විෂයෙහිද අනාදර නොකොට සත්පුරුෂ ජනයන් විසින් ආදර ගෞරව බහුමාන කිරීමෙන් සියලු දුකින් මිදී සියලුම සැප ලැබීමෙහි උත්සාහ කළමැනවි, මෙතෙකින් ආර්‍ය්‍යොපවාද පාපකර්ම විභාගාදීනව කියා නිමවනලදි

බුද්ධ ධර්ම සංඝ සඞ්ඛ්‍යාත තුනුරුවන්හි අනාදර කිරීමෙහි විශෙෂ කෙසේදයත්?-සේ මෙසේ දතයුතු,යමෙක් බුදුන්ගේ ශරීර ධාතු තුබූ දාගැබක් වඳිනට නොයේද, චෛත්‍යමලුවට නැගෙනකල කුඩ සේසත් ආදිය ඉසට කෙරේද, පය වහන්ලාගෙණයේද, වන්දනා කරණකල නොයෙක් දික් බලාබලා වඳීද, අනුන් හා කථාකරමින් වඳීද, පෙණෙන තැන දෙවුරවසා පෙරවා ගෙණ සිටීද, දාගැබට පෙණෙන තැන පය වහන්ලා ගෙණ සක්මන් කෙරේද, පෙණෙන තැන හිඳ සිට ස්නානය කෙරේද, පෙණෙන තැන හිඳ සිට මලමුත්‍ර කෙරේද, පෙණෙනසේ දාගැබටඋස්බිම සක්මන්කෙරේද, යටිමාලේ ධාතු පිළිම තබා තබා උඩ මාලේ වාසය කෙරේද, මෙකී අනාදර

කාරණයන් දක යමෙක් අවවාද කී කල්හි කිපේද යන මේ ආදී නොසරුප්දෑ කිරීම බුදුන් කෙරෙහි අනාදර කළා නම්වේය.

යමෙක් “ බණ අසන්ට වරෝ”යයි කාලඝොෂාකල කළ අඬලූ කල බණ අසන්ට නොගොස් බාලජයන් එක්වගිදිද, සෙසුකීනොකටයුතු කෙරේද, බණ අසන කල සතුටු සොම්නස් නොවේද, සකස්කොට නොඅසාද, අනුන් හා කථා කෙරේද, අවවාද, කීකල සතුටෙන් පිළිනොගණීද, යන මේ ආදී දෑ කිරීම ධර්මයෙහි අනාදර කළා නම්වේ.

යමෙක් සඟමැද අවසර නොගෙණ අනුන්ට බණ කියාද, අවසර නොගෙණ හිඳිද, නොවැඳ හිඳිද, අත්පා සල සලා හිඳිද, ඉතා ලංව හිඳිද සිටීද, ඉසට කළ කුඩආදිය නොහරීද, “මෙසේ නොකරව”යි කීකල ආදරයෙන් පිළිනොගණීද, යන මේආදීදෑකිරීම සඟුරුවන් කෙරෙහි අනාදර කළානම්වේ.

මෙසේ කරණලද අනාදර එක සඟුරුවනක් කෙරෙහිද කල මහ සංඝයා වහන්සේ කෙරෙහි කළානම්වේ, මෙසේවූ අනාදර තුනුරුවන් කෙරෙහි නොකොට වැඩ කැමති සත්පුරුෂයන් විසින් ආදර භක්ති උපදවා ශ්‍රද්ධායෙන් යෙදී උපස්ථාන කිරීමෙන් පින්රැස් කටයුතු.

මෙසේ ආනන්තරියකර්ම ප්‍රභෙදදීනව හා ආර්යෝපවාද අකුශල කර්ම ත්‍රිවිධරත්නයෙහි අනාදර විභාග ප්‍රකාශකොට දෙව් මිනිසුන් සහිත සියලු ලොකයාහට කරණලද උතුම් සද්ධර්මානු ශාසනා ඇති හෙයින් ධර්මාධිපතිවූ මාගේ බුදුරජ ශාස්තෘ නම් වන්නසේක, එසේ හෙයින් කියනලදී.

දෙවයක්ඛ මනුස්සානං ලොකෙ අග්ගඵලං දදං,
දදන්තං දමයන්තානං පුරිසාජඤ්ඤ තෙ නමො.

ලෝවැඩ පිණිස කරණලද මේ ශ්‍රී සද්ධර්මාවවාද සංග්‍රහයෙහි මේතෙකින් ආනන්තරිය ආර්යෝපවාද කර්මවිභාගාදීනව හා ත්‍රිවිධ රත්නයෙහි අනාදර විභාග දක්වා නිමනලදී.

පඤ්චනීවරණ ධර්මයෝ නම් කවරහයත්?—සියළුම සත්වයන්ට දෙව්මිනිස් සැපත් හා නිවන් සැප ලැබීමට නිසි පින්කම් කිරීමට අවකාශනොදී කුසල්මගවසා වලකා මුවහ කොට ආවරණව සිටිනා පාපධර්ම නම්ලද **කාමච්ඡන්දය ව්‍යාපාදය ථීනමිද්ධය උද්ධච්චකුක්කුච්චය විචිකිච්ඡාය** යන මොහු පඤ්චනීවරණයෝ වන්නාහුයි.

එහි කාමච්ඡන්දනීවරණය කෙසේදයත්?—චක්ෂුරාදි ඉන්ද්‍රියයන් විෂයවූ රූපය ශබ්දය ගන්ධය රසය ස්පර්ශය ධර්මය යන මේ ෂඩාලම්බනයන් කෙරෙහි පවත්නා ලොභය කාමච්ඡන්ද නම්වෙසි, ව්‍යාපාදනීවරණය කෙසේදයත්?-අනුන් කෙරෙහි සිතනොසතුටුබව ව්‍යාපාද නම්වේ, ථිනමිද්ධය නම් කෙසේදයත්?—චිත්තයාගේ සංකොචනය හැකිලීම ථින නම් කායඅකර්මන්‍යය හෙවත් කිසියම් කාරියකට කයයොමුනොවීම මිද්ධ නම්, මේ චිත්ත කාය දෙදෙනාගේ ඇකිලිම අලසභාවය හේතුකොටගෙණ නිදිමතවීම ථිනමිද්ධ නම්වේ.

උද්ධච්චකුක්කුච්චය කෙසේදයත්?-උස්ලියක බැඳි ධජයක්මෙන් නිරන්තරයෙන් චංචලව සිත එක අරමුණෙක නොපිහිටා සන්හුන් කමක් නැතිබව උද්ධච්චනම්, කළ නොකළ හැමදෙයටම තැවෙන බව කුක්කුච්ච නම්වෙසි, විචිකිච්ඡාව කෙසේදයත්?—බුදුහු ඇති සේක්දෝ හෝ සියල්ල දන්නාසේක් දෝ හෝ නොවේදෝ හෝයි, ධර්මය මනාකොට දෙසූදෙයක් දෝ හෝ නොවේ දෝ හෝයි, සංඝයාවහන්සේ මනායහපත් පිළිවෙත් පුරණසේක් දෝ හෝ නොවේදෝ හෝයි, පෙර මම වීම් හෝ නොවීම් හෝ මතු මම් වෙම්දෝහෝ නොවෙම් දෝ හෝයි, මම හෝ මම නොවෙම් හෝ කෙසේ මම වීම් හෝ කොයින් අවුදුමත්තේ කොයියෙසි හෝ සියලු දහම්හු පිණිස උපදිති හෝ එසේ නොවෙති හෝ සසර දුකින් මිදෙන පිළිවෙත් ඇති දෝ හෝ නැති දෝ හෝ යනාදි විසින් කාංක්ෂාවීමති ඉපදීමෙන් එක් තැනක පිහිටා නැති සවභාව විචිකිච්ඡා නම්වේ.

එහි එසේවූ කාමච්ඡන්දයතෙම සුභවූ රූපාදි නිමිති ආරම්මණයන් අනුවනින්යෙදි සලකන්නාහටම උපදනේයි, එහි අනුවනින්යෙදී සැලකීම නම් අනුපායෙන් අමාර්ගයෙන් යෙදී අනිත්‍යයෙහි නිත්‍යයයි කියාද, දුක්ඛයෙහි සැපයයි කියාද, අනාත්මයෙහි ආත්මයයි කියාද, අශුභයෙහි ශුභයයි කියාද, විපරීතකොට යම් සිහිකිරීමෙක් ඇද්ද, ඒ සිහිවිලිබහුලව පවත්නාහට ඒ කාමච්ඡන්දය උපදනේය, එහෙයින් අත්ථිභික්ඛවෙ සුභනිමිත්තං යනාදීන් කාමච්ඡන්දය උපනාක්‍රමය බුදුන් විසින් වදාරණලදී, ඒ නිත්‍යනොවූ අනිත්‍යසවභාව ඇති සියලුසංස්කාර ධර්මයෝම අනිත්‍ය වන්නාහුයයි කියාද, ජාතිජරාමරණාදි සියලු දුඃඛයන් දුක්ඛයයි කියාද, මේ දෙතිස්කුණපකොටසින් යුත් අනාත්මය අනාත්මයයි කියාද, දශ අශුභාදීන් අශුභයයි කියාද, ඒ ඒ කාරණයන්ගේ ඇති සවභාවම විපරීත නොකොට ඒවුපරිද්දෙන් නුවණින් යෙදී බහුලව සිහිකරන්නාහට නූපන්කාමච්ඡන්දය නූපදනේය, උපන්කාමච්ඡන්දය පහවන්නේය, අනාගතවූද කාමච්ඡන්දයාගේ පහවීමටනිසිකාරණයෙක් වන්නාහුයි.

ඔහු කවරෙක්ද?—උද්ධුමාතකාදි දස අශුභ උගන්නාහටද, එම අශුභ භාවනාවන්හි යෙදී වසන්නාහටද, චක්ෂුරාදි ඉන්ද්‍රියයන් සුපිහිතව රක්නාහටද, බත් අනුභව කරණවිට සතර පස් ආලොපයකට අවකාශ ඇතිකල්හි පැන් බීමෙන් දිවි රැකෙනකල්හි පමණ ස්වභාව දැන වැළඳීමෙන් යෙදී භොජනයෙහි පමණ දන්නාහටද, අශුභ භාවනාවෙහි ඇළුම් ඇති කල්‍යාණ මිත්‍ර සෙවනය ඇත්තාහටද, හිඳීම සිටීම ආදි හැම තන්හි දශ අශුභ නිශ්‍රිත සප්පාය කථා ඇත්තාහටද, කාමච්ඡන්දය පහව දුරුවන්නේයි.

නෙද ඡධම්මා කාමච්ඡන්දස්ස පහානාය සංවත්තන්ති යනාදීන් කාමච්ඡන්දයාගේ දුරුකිරීමද අර්හත්මාර්ගයෙන් මූලොච්ඡින්නාව නැසීමද බුදුන්විසින්ම වදාරණලදී.

ව්‍යාපාදයතෙම ක්‍රොධයෙන් ගැටීමට හිසි නිමිති අරමුණු යම් කිසිවක අයොනිසො මනස්කාරයයි කියනලද අනුවනින් යෙදී සැළකීම බහුලවීමෙන් යමෙක් යෙදුනේද ඔහට නූපන්ව්‍යාපාදයාගේ ඉපදීමද උපන්ව්‍යාපාදයාගේ බාහුල්‍යභාවයද වන්නේය, එසේ උපදනාද්වෙෂය පටිඝය යන මෙතෙක් නම් ඇති ක්‍රොධයාගේ සිතකෙනේ මිදීම වෙන්වීම මෙත්සිත් පැතිරීමෙන් හා නුවණින් යෙදි ආදිනවකාරණ සැළකීමෙනුදු වන්නේය, එහි මෛත්‍රිය නම් සියල්ලන්කෙරෙහි මෛත්‍රිය වඩා කරණ භාවනාවයෙන්ම උපචාරඅර්පනාවශයෙන්ම සිත එකහව සමාධියට පැමිණ ද්වෙෂය කෙරෙන් සිත මිදීමම මෙහි කියනලදී, මෙසේවූ මෛත්‍රියම එහි බොහෝකොට පවත්වන්නාහු කෙරෙන් ව්‍යාපාදය පහවන්නේ වෙයි.

අන්‍යවූද කාරණාසයකින් ද්වෙෂයදුරුවෙයි, හේකෙසේදයත්?—උද්දිස්ස අනොදිස්ස දිසාඵරණයයි කියනලද යම් සත්වකෙණෙකුන් නියමකොටගෙණ "ඔහු නිදුක්නිරෝගි වේවා"යි යනාදීන් මෙත් කිරීමය, එසේම නියම නොකොට සාමාන්‍යයෙන් මෙත් කිරීමය, දිශාභාගවශයෙන් මෙත් කිරීමය යන ආකාරයන් අතුරෙන් එක්තරා මෛත්‍රිභාවනාවක් උපන්නාහට හෝ එසේවූ භාවනා කරන්නාහට හෝ ද්වෙෂය පහවෙයි, යමෙකුකෙරෙහි පවත්නා ක්‍රොධය බලවත් නම් මෙසේ තෙමේම තමහට අවවාද කරණුයේ "තෝ මොහුට කිපී කුමක් කරන්නෙහිද, ඔහුගේ ශීලාදිගුණධර්ම නසන්ට හැකිද, තෝ තාගේ කර්මයෙන් අවුත් සිට තමාගේ කර්මයෙන් යන්නෙහි නොවේද, අනිකක්හට කිපීම නම් ගිනිඅඟුරුදිලි හෙන යවට අසූචි ආදිය ගෙණ අනිකෙක්හට ගැසීම සදෘශ වෙයි" සිතාද තමාසිත උපන්ක්‍රොධය නවතාගතයුතු, "මෙතෙමේද තට

කිපී කුමක් කෙරෙහිද, තාගේ ශීලාදිගුණ ධර්මනසන්ට මෙතෙම හැකිද, තමාගේ කර්මයෙන්ම අවුත් සිට තමාගේ කර්මයෙන්ම යන්නේය, අනිකෙක්හට ක්‍රොධ කිරීම නම් රජස්මිටක් ගෙණ උඩුසුළහට දූමීමක් වැන්න, එහෙයින් ක්‍රොධය ඔහුගේ මස්තකයෙහිම හෙන්නේය''යි කියා මෙසේ අනුන්ගේද ප්‍රව්කර්මබල සිහිකරන්නාහටද කියනලද ක්‍රමයෙන්ම තමාගේද අනුන්ගේද යන දෙපක්ෂයෙහිම කර්මබල සිහිකරන්නාහටද මෛත්‍රීභාවනාවෙන් යෙදී වසන කල්‍යාණමිත්‍රසෙවනය ඇත්තාහටද, හැමතන්හිම මෛත්‍රිය නිශ්‍රිත සැපකථා ඇත්තාහටද, ඒ නපුරුවූ ද්වෙෂය මැඩ පැවැත්වීම්වශයෙන් පහවීම හා අනාගාමිමාර්ගයට පැමිණීතැනමම එම ද්වෙෂය නැවත නූපදිනාසේ මූලොච්ඡෙණණවනැසීමවන්නේයයි වදාරණලදී.

**ථීනමිද්ධය** තෙමේ උකටලිබවය කය අලසබවය කය නොනැමෙනබවය භත්තසම්මද නම්වූ භොජනමූර්ඡාය භොජනපරිළාහය සිත හැකුවෙන ස්වභාවය යනාදි කාරණා හෙතුකොට ගෙණ චිත්තයාගේ, අනුවනින් යෙදීමෙන් උපදනේය, එසේ උපදනා ථිනමිඩය නම්වූ නිදිමත අරමුණුවල නුවනින් යෙදී සිත පිහිටුවා ලීමෙනුදු, බත් අනුභවකිරීමෙහි පමණ නොදන්න ආහාරහත්ථක තත්‍රවට්ටක අලංසාටක කාකමාසක භුත්තවම්මික බමුණන්සේ පමණ නොදන්න බත් අනුභව නොකොට දිව් පවත්නාසේ පමණ සලකා වලඳන්නාහටද, යම් ඉරියව්වකින් කල්යවනකල නිදිමත පැමිණියේ වීනම් එයින් අනික්ඉරියව්වකට කය පෙරලා පමුණුවන්නාහටද, රාත්‍රියෙහි චන්ද්‍රාලොකප්‍රදීපාලොකාදිය හා දහවල් සූර්‍ය්‍යාලොක සිහිකරන්නාහටද, අභ්‍යාකාශයෙහි වසන්නාහටද, නිදිමත දුරුකිරීමෙහි නියුක්ත කල්‍යාණ මිත්‍රසෙවනය ඇත්තාහටද, ඨානනිසද්‍යාදි ඒ ඒ තන්හි ධුතාඞ්ගනිශ්‍රිත සප්පායකථා ඇත්තාහටද, තදඞ්ගවිෂ්කම්භනප්‍රහානවිසින් නිදි දුරුවීම හා අර්හත්මාර්ගයෙන් මූලොච්ඡෙණණව නිදි දුරුවීම වන්නේයයි වදාරණලදී.

**උද්ධච්චකුක්කුච්චය**සිත සන්සිඳීමක් නැතිකල්හි අනුවනින් යෙදී සැළකීම බහුලවීමෙන් උපදනේය, එසේ සිත නොසන්හුන්කමින් හා අනුවනින් සැළකීමෙන් උපදනාඋද්ධච්චකුක්කුච්චය සමාධිභාවනායෙන් සිත එකඟකොටගෙණ නුවනින් යෙදී සැළකීමෙනුදු, එක්නිකායක් හෝ දෙකක් හෝ තුනක් හෝ සතරක් හෝ පස්නිකායම හෝ පාලිවශයෙන්ද අර්ථවශයෙන්ද උගන්නාහටද, කැපඅකැපදෑ විචාරීම බොහෝ ඇත්තාහටද, විනයස්වභාවයෙහි පුරුදුවීම වශීකතාභාවනායෙහි ප්‍රකෘතිඥණ ඇත්තාහටද, වැඩිමහළුස්ථවිරයන්වහන්සේලා කරා පැමිණෙන්නානටද, උපාලිස්ථවි

රයන් වැනි විනයධරකල්‍යාණමිත්‍රයන් සේවනය කරන්නාහටද, ස්ථානනිසද්‍යාදියෙහි කැපඅකැපනිශ්‍රිතසප්පායකථා ඇත්තාහටද, උද්ධච්චකුක්කුච්ච නම් නීවරණය පහවීම හා අනාගාමිමාර්ගයට පැමිණීමෙන් මූලොච්ඡිණ්ණව නැසීමද වන්නේයයි වදාරණලදී.

**විචිකිච්ඡා**තොමෝ කුශලාදි ධර්මයන් කෙරෙහි ඇතිදෝ හෝ නැතිදෝ හෝ යනාදිවශයෙන් කුකුස්කොට අනුවනින් යෙදී සැළකීම බොහෝවූවාහට එම විචිකිච්ඡාව උපදනේය, එසේ උපදනාවිචිකිච්ඡාව කුශලාදිධර්මයන්ගේ ඇතිස්වභාව නුවනින් යෙදී සිහිකිරීමේ යට කියනලද ක්‍රමයෙන් බහුශ්‍රැත වීමෙනුදු, තුරුවන් අරභයා බොහෝ ගුණවිශෙෂ විචාරා ඇසීමෙනුදු, විනයධර්මයෙහි ස්වභාව පුරුදුවීමෙනුදු, ත්‍රිවිධරත්නයෙහි ඔකප්පනියශ්‍රද්ධායයි කියනලද අධිමොක්ෂබහුලතායෙනුදු, ශ්‍රද්ධාධික කල්‍යාණ මිත්‍රයන් සේවනයෙනුදු, ස්ථානනිසද්‍යාදිහැමතන්හි තුනුරුවන්ගුණමිශ්‍රවූ සප්පායකථායෙනුදු, විචිකිච්ඡාවගේ සිතෙන් පහවීමද සෝවාන්මාර්ගයට පැමිණීමෙන් මූලොච්ඡිණ්ණව නැසීමද වන්නේයයි බුදුන්විසින් වදාරණලදී.

එහෙයින් එබඳු පින්වත නුවනැති සත්පුරුෂජනයෙනි මෙසේ දෙව්බඹමිනිස්සැප හා නිවන්සැප ලැබීමට නිසිකාරණාවූ පින්කම් කිරීමට අවකාශනොදී බාධාකරණ කාමච්ඡන්දාදි මේ පඤ්චනීවරණ අකුශලධර්මයන්ගේ ස්වභාවරූප ඒ ඒ නීවරණයන්ගේ ඉපදීමටද දුරුවීමටද සහායව සිටි සියලුකාරණයන් මෙහි ප්‍රකාශක්‍රමයෙන් දැන ඇඳින ජීවිතරක්ෂාව කැමතියන් විසින් හරණ ඝොරවිෂ සර්පාදීන්සේ අහිතසෙවනයන්කෙරෙන් දුරුව දිවිරක්නවුන්සෙවුනාහිතවූ ළබෙහෙත්ආදියසේ හිතවූ කාරණා සෙවීමෙන් යෙදී චණ්ඩවූ ව්‍යාඝ්‍රාදීන්ගෙන් ආකූල භයසහිතවූ මාර්ගයක්මෙන් මේ පඤ්චනීවරණ අකුශලධර්මයෙනුදු දුරුකටයුත්තාහුයි.

ලොවැඩපිණිස කරණලද මේ ශ්‍රී **සද්ධර්මාවවාදසංග්‍රහයෙහි** මෙතෙකින් පඤ්චනීවරණ අකුශලධර්මයන්ගේ ස්වරූප නිමවා දක්වනලදී.

**අකුශලමූල** නම් කවරහයත්? — සත්වයන්ට වන සියලු දුකට කාරණාවූ අපායමාර්ගයවූ සියලු අකුශලකර්මපථ සිද්ධවීමට මුල්ව සිටි **ලොභය ද්වේෂය මොහය** යන පාප චෙතනාවෝ තුන්දෙනම අකුශලමූලයෝ නම් වෙත්.

**තේකෙසේදයත්?— තීණිමානි භික්ඛවෙ අකුසලමූලානි, කතමානි තීනි?—ලොභො අකුසලමූලං දොසො අකුසලමූලං මොහො**

**අකුසලමූලං, ඉමානි ඛො භික්ඛවෙ තීනි අකුසලමූලානි**-යි මේ සූත්‍රයෙන් අකුශලමූලයෝ මෙසේ ප්‍රකාශකොට බුදුන් විසින් වදාරණලදී.

එහි ලොභය නම් ඇසින් දක්නාරූපය කණින් අසනශබ්දය, නාසයෙන් ඉඹිනසුවඳය දිවින් විඳිනාරසය කයින් වනස්ප්‍රර්ශය සිතින් සළකන යම්කිසිකාරණයක යන මේ චක්ෂුරාදිඉන්ද්‍රියයන් සඳෙනාට ගොදුරුවූ රූපාදීආයතනයන් සදෙනා යහපත්කොට සළකා ගන්නාසවභාව ඇත්තේය, වඳුරුලැහැවක්සේ එම අරමුණෙහි බලවත්ව සිත ඇලෙනසවභාව ඇත්තේය, හුණුකබලෙක බහාලූ ලේමුසුමස්ගඬුවක් සෙයින් නිරන්තරයෙන් දුරු නොකොට හැකිසවභාව ඇත්තේය, තෙල්මුසුදූලි සෙයින් සියලු සංස්කාර ධර්මයන් කෙරෙහිම ඇලීමෙන් ආසවාස උපදනාසවභාව ඇත්තේය,

මෙසේ සිත්හුගේ නොයෙක් අරමුණුවල ඇලීම ලක්ෂණවූ ලොභය උපන්විගස ඊටනිසි භාවනා ආදීනව කාරණාසිහිකිරීමෙන් දුරු නොකළහොත් යම් යම් තැනෙක වස්නා වර්ෂාජලය මුහුදටම පැමිණෙන්නාසේ ඒ ලොභසම්බන්ධිපුද්ගලයාද අපායදුකටම පත්ව න්නේ වෙයි, එහෙයින් මාරපාසවූ එබඳු ලොභයද මලමුත්‍රසේ නුවනැත්තන්විසින් දුරින්ම දුරුකටයුතු.

ද්වේෂය නම් තෙමේ දණ්ඩෙන් ගැසූ නයෙකු කිපෙන්නාසේ කිපෙනසවභාව ඇත්තේය, ක්‍රොධයාගේ පැතිරෙන සවභාව හා වනයක ගැසූ විෂයක්සෙයින් ඇතුලෙන් දවණ සවභාවඇත්තේය, රුක්සිදුරෙක පවත්නා ගිනිකඳක් වැන්න, ප්‍රමාදයක් බලා මර මිසි එක්ව ඇවිදිනා සතුරෙකු වැන්න, කිසිසේත් නොගතයුතු විෂමිශ්‍රවූ මුත්‍රයක් වැනිමය, එහෙයින් නුවනැත්තන් විසින් එබඳු ද්වේෂයද දරුණු විෂඇති සර්පයන්සේ ලංවියනොදී දුරකටයුතුමැයි.

මොහය නම් තෙමේ සිත්හුගේ අන්ධභාවයක් වැන්න, නුව නැති සවභාව වලකන්නේමැයි, ඒ ඒ අරමුණුවල ඇති සවභාව මුවහකොට යහපත්සේ හඟවයි, අන්ධකාරයක් වින්න, ඒ මුළා වීමයයි කියනලද මොහය අනුවනින් යෙදී සිහිකිරීමෙන්ම උප දනේය.

එසේවූ මෝහය කර්මානානයෙහි ඇලී පවත්නා ලොකයා විසින් නොසෙවියයුතු අන්ධකාරයසේ නුවනැත්තන් විසින් පණ්ඩිත සෙවන ධර්මශ්‍රවණ නුවනින් යෙදී සැළකීමආදි කාරණා සේවන යෙන් දුරුකටයුතු.

මොහුන් තුන්දෙනාට අකුශලකර්ම සිඬවීමට ලජ්ජාභය නැති කම සවමීප කාරණාවෙත්, එහි පාපකර්ම කිරීමෙහි ලජ්ජානැතිබව

යයි කියනලද අහිරිකය යන අකුශලධර්මයනම් අපවිත්‍රයට කැත නොව අනුභවකරණ ගංළුරෙකුසේ පව් කිරීමෙහි කිසියම් පිළිකුල්වීමක් ලජ්ජාවක් නැතිව පවුකරණස්වභාවය අකුසල් කිරීමෙහි ගිනිදුටු ඉටිසේ කුකුල්පත්සේ හැකිලීමක් නොව එහි පැතිර ව්‍යාප්තව පවත්නා ස්වභාවයෙකි.

පාපකර්ම කිරීමෙහි භය නැතිකමයයි කියනලද අනොත්තප්ප අකුශලධර්මයනම් නොයෙක් දුක් දෙන දුශ්චරිත අකුශලධර්ම කිරීමෙහි භයක් නැතිගැන්මක් නොව පානෙහි නොබා වැටෙන පළහැටියෙකුසේ අකුසල් කිරීමට භයක් නැතිව බුහුටිව පාපකර්ම කරණ ස්වභාව ඇත්තේය, යන මේ පාපධර්මයෝ දෙදෙන මෙසේ සියලු පව්කිරීමට ස්වමීපකාරණා වන්නාහුයි.

යම් සත්වකෙනෙකුගේ සිත්හි ලොභාදි පාපචෙතනාවක් ඉපද පාපයෙහි ලජ්ජා භය නැතිවීමෙන්ම ඕහට ඒ පාපය සිඬවන්නේය, යමක්හට පව් සිඬනොන්නේ වීනම් හෙද අමුතුකාරණයෙක් නොවෙයි, ලජ්ජා භය දෙදෙනාගේ ස්වමීපකාරණමය, එහෙයින් මිළිඳුපැනආදි නොයෙක් තැන පව් ලන්විය වැද්ද නොදෙන අර්ථයෙන් උස්පවුරට හා ගැඹුරු අගලට උපමාකොට ලජ්ජා භය දෙදෙනා දක්වනලද්දහුයි, එසේ සියලු වැඩට කාරණාවූ ඉෂ්ටමිත්‍රයන් වැනි ලිජ්ජා භය දෙදෙනාගේ සේවනයෙන් යෙදී සියලු අවැඩට කාරණාවූ දුෂ්ට අමිත්‍රයන් වැනි අහිරිකය අනොත්තප්පයයි කියනලද ලජ්ජා භය නැතිවීමෙන් දුරුව වැඩ කැමති නුවනැති සත්පුරුෂ ජනයන් විසින් අත්වැඩ පරවැඩ සැදියයුතු;

මෙසේ සියලු පව්කිරීමට මුල්වසිටි ලොභාදි අකුශල මූලයන් හා පව්කිරීමට සමීප කාරණාවූ අකුශලධර්මයන් දෙදෙනාගේ ස්වරූප දක්වා මෙසේ දෙව්මිනිසුන් සහිත ලොකයාට කරණ ලද උතුම් සද්ධර්මානුශාසනා ඇතිහෙයින් ධර්මධ්වජවූ මාගේ බුදුරජශාසනා නම් වනසේක.

ලෝවැඩ පිණිස කරණලද මේ **ශ්‍රී සද්ධර්මාවවාදසංග්‍රහයෙහි** මෙතෙකින් අකුශල මූලයන් හා අකුශලයට ආසන්නකාරණාවූ පාපධර්මයන්ගේ ස්වරූප දක්වා නිමවනලදී.

නවද සෙසු ක්‍රෝධ උපනාහආදි අකුශල ධර්මය නම් කවර හයත්,-ගේ මෙසේ දතයුතු, ක්‍රොධය උපනාහය මක්ඛය පලාසය ඉස්සාය මච්ඡරියය මායාය සාඨෙය්‍යය ථම්භය සාරම්භය මානය අතිමානය මදය පමාදය තණ්හාය විපරීතමනසිකාරය දුශ්චරිතය

චතුර්විධ විපර්‍යාසය චතුරාශ්‍රවය සතරතණ්හුප්පාදය පඤ්චචෙතොඛිලය ඡවිවාදමූලය සත්තානුසය අෂ්ටමිච්ඡත්තය නවතණ්හාමූලය අඨසත තණ්හාවය යන මොහු අකුශලකර්මයෝ නම්වෙත්.

**උපනාහ** නම් වෛර බැඳීමය, **මක්ඛ** නම් කෙළෙහිගුණ නොදැනීමය, **පලාස** නම් මහතුන්ට සරිසයි සිතීමය, **ඉස්සා** නම් ඇතිගුණ ඇතිඓශ්වර්‍ය්‍ය ඇතිනුවන අදිවූදෙය නැතිකොට කීමය, **මච්ඡරිය** නම් තමාගේ සියලු ඓශ්වර්‍ය්‍ය වෙන කෙණෙකුන්ට නොවේවයි සිතීමය, **මායා** නම් කළවරද සැඟවීමය, **සාඨෙය්‍ය** නම් නැතිගුණ ඇතිදෙයක් මෙන් සැඟවීමය, **ථම්භ** නම් නගුලිස ගිලි පිඹුරෙකුමෙන් උතුම් තැන්වලට නොනැමෙන ස්වභාවය, **සාරම්භ** නම් යම්කෙණෙකුන් එකක් කීකල මම දෙකක් කියම් කර මිසි කීමය, මානනම් සියල්ලන්ට වැඩිතරමයි සිතීමය, මදනම් ඓශ්වර්‍ය්‍යවිද්‍යා ආදියෙන් මත්වීමය, ප්‍රමාද නම් කළමනාකිවමනා දෙයෙහි සිහිනැතිවීමය, තණ්හානම් ලුණුපැන් බිපුඑකෙකුට පිපාස බොහෝ වන්නාක්මෙන් ආසාව මහත්වීමය,

විපරීතමනසිකාර නම් සැබවින්ම ඇති මේ දෙතිස්කුණපකොඨාසය පිළිකුල්කටයුතු කුණු කොටස්නුයි නොසිතා ස්ත්‍රීපුරුෂ හයි වරදවා සිතාගැම්මය, **දුශ්චරිත** නම් කයින් සිද්ධවන ප්‍රාණඝාත අදත්තාදාන කාමමිථ්‍යාචාර යන පව් තුනද, වචනයෙන් සිද්ධවන මුසාවාද පිසුනාවාච පරුෂවාච සම්ඵප්‍රලාප යන පව් සතරද, සිතින් සිද්ධවන අභිද්‍යානම්වූ අනුන්ගේ වස්තුව උන්ට කුමටද මටයයි සිතීමය, ව්‍යාපාද නම්වූ අනුන් නසන්ට සිතීමය, මිථ්‍යාදෘෂ්ටිනම්වූ මෙලොව නැත පරලොව නැත කර්ම නැත කර්මඵල නැත දෙවියෝ නැත බුදුහු නැත යනාදීන් සිතන්නාවූ මිථ්‍යාදෘෂ්ටියය යන මේ කාය දුශ්චරිත වචී දුශ්චරිත මනො දුශ්චරිත යනතුන් දුශ්චරිතය.

**චතුර්විධවිපර්‍යාශ** නම් සියල්ල නැසෙන අනිත්‍යයට නිත්‍යය නොනැසෙසි සිතා ගැම්මය, අපවිත්‍ර ශරීරයට පවිත්‍රයයි සිතාගැම්මය, සියලු දුඃඛයට සැපයයි සිතා ගැම්මය, මමය යන දෙයක් නැති නාමරූපයට මමය මාගේයයි සිතාගැම්මය,

**චතුරාශ්‍රව** නම් එනම් ආශ්‍රවය, භව ආශ්‍රව නම් ඉදිරි උපදන කර්මයය, දෘෂ්ටාශ්‍රව නම් මම ඇතැයි සිතාගැම්මය, අවිද්‍යාශ්‍රවනම් නුනුවනය, මොහු සතර අවීචියෙහි පටන් භවාග්‍රය දක්වා සසර අනන්තාපරිමාන සක්වලවල සත්වයන් ආශ්‍රය කොට පවතිනා හෙයින් ආශ්‍රව නම් වේ.

**සතරතණ්හුප්පාද** නම් සිවුරුපිළිසට ආසාවය, විහාරආසාවය, ගිහිව වසන්නවුන්ගේ වස්ත්‍රාභරණයෙහි ආසාවය, ග්‍රාම ක්ෂේත්‍රාදියෙහි ආසාවය, දිව්‍යලොක බ්‍රහමලොක ආදිවූ හැමතැන්වල උපදිනා ආසාවය, යන මොහු සතර තණ්හුප්පාද නම් වෙත්.

**පඤ්චචෙතොඛිල** නම් පළමු බුදුවරයෝ ඇද්ද නැද්දැයි සැක සිතීමය, ධර්මය කෙරෙහි සැක සිතීමය, සෝවාන් සෙදගැමි අනාගාමි රහතුන්වහන්සේ ඇද්ද නැද්දැයි සැක සිතීමය, සීල භාවනා ප්‍රඥ යන මේ තුනින් නිවන් සිඬවේද්‍ද හෝයි නොවේද්‍ද හෝ සැකසිතීමය, සංඝයාවහන්සේ කෙරෙහි කෝප සිතීමය, යන මොහු පඤ්චචෙතොඛිල නම් වෙති.

**විවාදසට මුල්සය** නම්, ක්‍රොධය, කෙලෙහිගුණ නොදන්මය, යහපත අයහපත කොට කීමය, නැතිගුණ ඇතිකොට ඇහවීමය, බොහෝ කැමතිවීමය, සිතාගත්තාම එකක් කොට සිතා අතනෑරීමය, යන මොහු විවාද මුල් සය නම් වෙති.

**සතතානුසය** නම්, ස්ත්‍රී ආසාවය, තද කෝපය, තද මිථ්‍යා දෘෂ්ටිය, තදසැකය, දෙවෙනි තැනක උපදින්ටආසාවය, මම උතුම යන මානය, තදවූ නොදන්මය, යන මොහු සිතෙහි වැදගන්නා අනුසය සත නම් වෙති.

**අඬම්වජනන** නම් මිථ්‍යා දෘෂ්ටියද, ගිනිගෙයි ඇල්මද, අනුන්ට විනාශ වේවයි සිතීමද, අනුන්ට නිග්‍රහ කරම්යි සිතීමද, බොරු කීමද, කේලාම් කීමද, රළුබස් කීමද, වැඩනැතිබස් කීමද, යන මේ මිථ්‍යා සිතිවිලි හා මිථ්‍යා වාචා සතරද, මිථ්‍යා කර්මාන්ත නම්වූ කයින් සිඬවන පව්තුන කිරීමද, අධර්මයෙන් ජිවත් වීමද යන මිථ්‍යාජිවයද, නූපන් පාපයන් උපදවන්ටත් උපන් පාපයන් වර්ධනය කරන්ටත් නූපන් කුසල් නූපදවන්ටත් උපන් කුසල්නැති කරන්ටත් උත්සාහ කිරිමයන මේ මිථ්‍යාව්‍යායාමයද, වැඩකැමති දෙය සිතෙහිතබා ඉඳීමද, පරසමය ඇත්තන්ගේ භාවනා කිරීමද, යන මොහු අඬම්වජනනනාම් වෙති.

**තෘෂ්ණාමූල් නවය** නම්, අසාවෙන් වස්තු සෙවීමය, ඒ වස්තු සොයා ලැබගැන්මය, ඒලත් ලාභයනිසා විනිශචයක් පැමිණීමය, විනිශචයනිසා ආලය ඇතිවීමය, ඒ ආලය මුල්ව මේ මාගේයයි සිතා තදවසයෙන් සිතාගැම්මද, ඒඑසේසිතා තමාට කොට ගැම්මය තමා සන්තකකොට ගත්කල මේ ලාභය වෙන කෙණෙකුට නොවේවයි සිතීමය, ඒ එසේ සිතා රැකවල් කිරීමය, ඒ රැකවල්මුල්ව දඬු මුගුරු ගැණීමය, යන මොහු නවය තෘෂ්ණාමූල නම්වෙති.

**එක්සියඅටක් තෘෂ්ණාභාව** නම්, යහපත් රූපයට ආසාවය, යහපත් ශබ්දයට ආසාවය, එසේ සුවඳට ආසාවය, රසයට ආසාවය, ස්පර්ශයට ආසාවය, සිතින් සිතූදෙයට ආසාවය, යන මේ ආසා සයක්හා එම කී සය ආසාවෙන් සිතූකල සයක්හා ඒ දුටු රූපය ඇසූ ශබ්දය ඉඹි සුවඳය වින්ද රසය වැලඳගත් ස්පර්ශය සිතාපු දෙය නොනැසෙසි කියා මිථ්‍යාදෘෂ්ටියෙන් සිතාගත් සයක් හා එසේම එම රූපාදිය දුටුකල ඇසූකල ඉඹුකල විඳිකල සිතූකල නැසුනුකල පරලොව ඉපදීමක් නැතැයි සිතා ගත්සයක් හා ඇතුලුව ආසාදහඅටක් හා තමාගේ රූපාදියට දහඅටක් හා ඇතුළුව තිස්හයෙක යටගියකාලයට තිස්හයෙක, පවතිනකාලයට තිස්හයෙක මතු එනකාලයට තිස්හයෙක, යන මේ හැම ඇතුලුව එක්සියඅටක් ප්‍රමාණ ප්‍රභේදඇති තෘෂ්ණාභාවය යනමොහු අකුසලධර්මයෝ නම් වන්නාහුයි.

මේ ක්‍රොධාදි සියලුපාපධර්මයෝ තම තමන්ගේ ස්වරූපයෙන්ම අකුසල නම් වෙති, ඔවුන්ගේම එක්වීමෙන් සිඹවන යම් යම් කර්ම කෙණෙක් ඇද්ද ඒ සියලු කර්මයෝත් අපාය මාර්ගවූ අකුශල කර්ම නම් වෙත්, එහෙයින් හිතබෙහෙත් සෙවනයෙන් උපන් රොග සන්සිඳුවන්නාගේ යහපත් කල්‍යාණපණ්ඩිතසෙවනයෙන් හා ධර්ම ශ්‍රවණයෙන් යොනිසොමනස්කාරාදියෙන් සෙද් සිත උපදනා නොයෙක් ආදීනව ඇති ඒ ක්‍රොධාදි පාපධර්මයන්කෙරෙන් දුරුව සියලු වැඩට සම්පතට කාරණාවූ උතුම් ගුණ ධර්මපිරීමෙහි තුව නැති සත්පුරුෂ ජනයන් විසින් අප්‍රමාදව උත්සාහ කටයුතු.

යම් කිසි සත්වකෙණෙක් ක්‍රොධාදි පාපධර්මයන්ගේ ආදීනව නොසලකා සත්වයන්කෙරෙහි නොසතුටුවඔවුන්ට හස්තපාදාදියෙන් හෝ ඛඩ්ග කුන්ත දඬුමුගුරු කැට කැබිලිති ආදියෙන් හෝ තලා වෙහෙසා දුක් දුන්නාහු වීනම්, ඔහු මිය එපවින් අපාදුක් අනුභව කොට මිනිස්අත්බවක් ලදකල විරූපව දුර්වර්ණව රූනැතිව අනුන් විසින් දක්නටපවා අප්‍රිය වේ, යම් සත්වකෙණෙක් අනුන්ලබනලාභයෙහි අනුන්කරණ සත්කාරයෙහි ගරුකාරයෙහි මානනයෙහි වන්දනායෙහි පූජායෙහි ඉවසිය නොහී ඔවුන් කළ පින්කමින් ඒ හැම ලබනලදැයි ක්ෂමා නොකොට ඊර්ෂ්‍යා කලේ වී නම් එ පවින් අපාදුක් අනුභවකොට මිනිස්අත්බවක් ලදකල ආනුභාව නැතිවෙයි, අප්‍රසිද්ධ වෙයි, හැමදෙනා විසින් ගර්හාකරන්නට නිසි වේ, යම් සත්ව කෙණෙක් තම තමන්ගේ ශක්තිභාග පමණකින් දන් නොදී තමාගේ ආත්මය පොෂ්‍යය කිරීමම පෙරදැරිව මසුරුකමින් යෙදී වාසය කෙරද්ද, ඒ පාපබලයෙන් එහෙතම අපාදුක් අනුභවකොට

මිනිසත්බවට පැමිණිකල සම්පත් නැති වෙයි, ඉතා දිළිඳුව අනුන් ආශ්‍රයකොට ජීවත්වේ, සීලවන්ත ගුණවන්ත තැන්කෙරෙහි නැඟී මසිල් බෑ බුහුනන් කෙරෙහි සරුනැතිව අගෞරවව අවනඩු කලානු වැන්දයුත්තන් නොවැඳ හුනස්නෙන් නැඟමිනාවුන් දැක හුන් තැනින් නැඟී නොසිටිමද මගින් පහළුවමනාතැන් දැක මගින් පහ නොවෙද, හිඳිනා ආසන සලසා දුනමනාතැන්වලට හිඳිනා අසුන් සලසා නොදී බහුමානකලවුන්ටබහුමානනොකොටගෞරවකළමනා වුන්ට ගෞරව නොකොට පිදියයුත්තන්ට නොපුදා අනාදරකළානු ඒ පාපකර්මයෙන් අපාදුක් විඳ මිනිස්අත්බව උපදනාකල චණ්ඩා ලාදිනීචකුලයෙහි උපදනේය, බුදුන් විසින් දේශනාකරවදාරණලද උතුම් නෛර්‍යාණික ධර්මයවූපරිද්දෙන් පින්පව් තෝරා බණකියනා පණ්ඩිතයන්කරා එළඹ වහන්ස කුසල්නම් කවරේද, අකුසල් කව රේද, සාවද්‍යනම් කිම, නිරවද්‍යනම් කිම, කුමක් සෙවියයුතුද, කුමක් නොසෙවියයුතුද, කුමක් කලකල බොහෝ කලකට අහිත යට දුක්ඛයට කාරණා වේද, කුමක් කලකල බොහෝකලකට හිත සැපපිණිස වේදැයි යනාදි ක්‍රමයෙන් නොවිචාරීමෙන් එසේ විචාරී මෙහි ආදර නොකිරීමෙන් විචාරා සම්‍යක්ප්‍රතිපත්තියෙහි නොපැව ත්මෙන් හෙතෙම අපායෙහි දුක් අනුභවකොට මිනිස්අත්බව උපන් කල අඬව කටයුතුනොකටයුතු නොදැනීමෙන් යෙදී නුවනැති වේ, කම්මං සත්තෙ විභජති යනාදීන් **චූලකම්මවිභඞ්ග** සූත්‍රාදියෙහි දේශනාකර වදාළක්‍රමයෙන් සියලුකර්මවිභාගය අසා දතයුසී.

මෙසේ සියලු පාපධර්මයන්ගේ ස්වරූප හා ඒ ඒ අකුශලකර්මය න්ගේ ආදීනව දක්වා දෙව්මිනිසුන්සහිත ලොකයාහට කාරණලද සද්ධර්මානුශාසනා ඇතිහෙයින් ධම්ධවජවූ මාගෙ බුදුරජ ශාසනානාම් වනසේක.

දෙවයක්ඛමනුස්සානං ලොකෙ අග්ගඵලං දදං,
දදන්තං දමයන්තානං පුරිසාජඤ්ඤ තෙ නමො ඝී

තවද සත්වයන් විසින් කරණලද කුශලා කුශල කර්මයෝ **සූත්‍ර පිටකයෙහි** එකලොස් ප්‍රභෙදයක්වන්නාහුයි, එහි සූත්‍රාන්තිකපර්‍යාය යෙන් දක්වූ එකොළොස්කර්ම කවරහයත්?—ඒ මෙසේ දතයුතු.

දෘෂ්ටධර්මවෙද්‍ය කර්මය උපපද්‍යවෙද්‍ය කර්මය අපරාපර්‍ය්‍යවෙද්‍ය කර්මය යද්ගරුකකර්මය යද්බහුලකර්මය යදාසන්නකර්මය කෘතත්වාත් කර්මය උපස්ථම්භකකර්මය උපපීඩකකර්මය උපඝාතකකර්මය යන එකො ළොස්ප්‍රභෙදයක් වන්නාහුයි

එහි දෘෂ්ටධර්මවෙද්‍ය අකුශලකර්මය නම් කෙසේද?—භූවනින් ආවර්ජනාකලමනා ප්‍රත්‍යයන්ගේ සන්තීරණසඞ්ඛ්‍යාත නියමකිරීමෙන්

උපදනා ගුණමධුරත්වය විඳ ගැන්මෙහි එක්වූ ශ්‍රද්ධාසිත කුශලපක්‍ෂයෙහිවූ ජවනචිත්තය නම් වෙයි, ආලෝකයට ප්‍රතිපක්‍ෂව සිටි අන්ධකාරය සේ ඇත්තාවූ යහපත් ගුණය තමාගේ චිත්තයට නිශ්චය කොට දැනෙමින් සිටියදීම නුවනැතිකම පෙරදැරිකොට සැළකීමෙන් දක්වනලද යහපත් කුශලජවනචිත්තයට විපරීතව පවත්නා අවිද්‍යාමිශ්‍ර අශ්‍රද්ධාසිත අකුශලජවනචිත්තය නම් වේ.

මේ ජවනයන් අතුරෙන් ලද්දාවූ ආවර්ජනාප්‍රත්‍යය ඇති යම් ජවනයෙක් බොහෝසේ සත්වරෙක එකජවනවීථියෙහි දීවේද, හෙවත් පවතීද, ඔවුන් ප්‍රඥාලක්‍ෂණවූ ප්‍රථමජවනචිත්තය ශ්‍රද්ධාව හා එක්ව එල්බසිටි ඇසිල්ලෙහි ඉපදුනු කර්මයෙක් ඇද්ද, ඒ කර්මය දෘෂ්ටධර්මවේද්‍ය කුශලකර්ම නම් වෙයි, අවිද්‍යාවයයි කියනලද අඥානය එක්ව එල්බ සිටි ප්‍රථම ජවනචිත්තය ක්ලේශවසඟවූ ක්‍ෂණයෙහි ඉපදුනාවූ කර්මය දෘෂ්ටධර්මවේද්‍ය අකුශලකර්මය නම්වේ.

මේ දෘෂ්ටධර්මවේද්‍ය කුශලා කුශලකර්මදෙකම එම ආත්මභාවයෙහිම විපාක දෙන්නාහුයි, එසේ විපාක නුදුන්නේ වීනම්, ඒ කර්මය අභාවකර්මබවට යේ, මෙපරිද්දෙන් පැවැත්තාවූ ජවනයන්ගේ සත්වන ජවන්චිත්තය උපපද්‍යවේද්‍ය කර්මය නම් වේ, ප්‍රථම ජවනයට හා සත්වනජවනයට අතර උපදනාජවන්හු පස්දෙන අපරාපර්‍යායවේද්‍යකර්ම නම්වේ, මෙසින් දෘෂ්ටධර්මවේද්‍යකර්මය ප්‍රවෘත්තිවශයෙන් විපාකදීම මිස අමුතුනැනක උපදවා විපාකදෙන සවභාවක් නැති හෙයින් ඉහාත්මයෙහිම විපාක නුදුන්නේ වී නම්, මත්තෙහි කිසිකලකත් විපාක නොදෙන්නේමය, ඇස්පිමක් නැතිබැදපුබිජුවට මෙන් විපාකනැතිබවට පැමිණෙන්නේයි, එහෙයින් අභාවකර්ම නම් වේ.

මෙසේ කුශලා කුශලදෙක්හිම සාධාරණවූ දෘෂ්ටධර්මවේද්‍ය කර්මයෙහි අකුශලපක්‍ෂයෙහි චිඤ්චමාණවිකාය සුප්‍රබුද්ධශාක්‍යය දේවදත්තය කෝකාලිකය නන්දගෝඝාතකය නන්දයක්‍ෂයයි යන මොවුන්ට දුන්නාවූ විපාකයෙමින් අකුශලවිපාක දෙන්නේයයි දතයුතුයි.

**උපපද්‍යවේද්‍යකර්මය** නම් කවරහයත්?—සත්වන ජවනචේතනාවෙන් උපදනාකර්මය උපපද්‍යවේද්‍යකර්ම නම්වේ, ඒ උපපද්‍යවේද්‍යයයි කියනලද දෙවනජාතියෙහි උපදවා ඵලදියයුතුවූ ඒ කර්මය කළසංඛ්‍යාහට මේ ආත්මභාවයෙන් චුතව ගියකල මිට දෙවනුව උපන්ජාතියෙහිම විපාකදෙන්නේය, එසේවූ පඤ්චානන්තරියකර්මයෝ අකුශලපක්‍ෂයෙහි උපපද්‍යවේද්‍යකර්ම නමි, ඉදින් කිසිපාපිවූ පුරුෂයෙක් මාතෘඝාතකකර්මයද පිතෘඝාතකකර්මයද අරහන්තඝාතකකර්ම

යද ලොහිතුප්පාදකකම්මයද සංඝභෙදකම්මයදැයි යනමේ ආනන්තරිය කර්මපසම කොළේද, හෙතෙම නියතගතිකම් කළහෙයින් එම ආත්මභාවයෙන් චුතව දෙවන ජාතියෙහි ඒකාන්තයෙන් නරකයෙහි ඉපිද කල්පයක් මුළුල්ලෙහි මහදුක් විඳින්නේය, ඒ දෙවන ජාතියේ විඳුයුතු අකුශලවිපාකයක්ඇති බොහෝකර්මයන් ඔහුවිසින් කරණලද්දනුවිනමුදු ඒආනන්තරියකර්ම පසින් නරකයෙහිඉපිද එක ආනන්තරියකර්මයක් විපාක දුන්කල්හි තුන්වන ජාතියෙහි ඉපිද විඳුයුතු පාපකර්මස්වභාවක් ඒ ආනන්තරිය කර්මයන් කෙරෙහි නැතිහෙයින් සෙසුආනන්තරියකර්මයෝ සතරදෙන එහිම අන්තර්ගත වී නමුත් එක එක ආනන්තරියකර්මයකට වෙනවෙනම විපාකදෙන්ට වෙන වෙනම ඉපදීමක් නැතිහෙයින් ඔවුන්ගේ විපාකදීමද නොහැකිවන්නානුය, මේ එම කර්මස්වභාවයයි දතයුතු, එහෙයින් මේඋපපද්‍යවෙද්‍යකර්මයද දෙවනජාතියෙහි මෙසේ කිසියම් කාරණයකින් විපාකදිගතනුහුනුයේ වීනම් මත්තෙහි කවරකලකත් විපාකනොදෙනබැවින් අභාවකර්ම නම් වේ, විපාකදීමක් නැතිහෙයින් අහොසිකර්ම නමැයි කියාද වේ.

යම්සේ වැද්දෙක් මුවදඩයමට ගොස් නිරන්තරයෙන් මුවන් හැසිරෙන තැනක තමා සැඟවී හිඳ දුණ්ඩ දුනුපිට ලාගෙණ සිටි කල්හි අභිමුඛයට පැමිණීමුවෙකු දැක ඇදනැතිව බලා දුන්න ඇද විදිසැරය ඉඳින්නොවරදිම වැදුනේ වීනම් ඒ මුවා ඒ ස්ථානයෙහිම වැටෙන්නේය, ඒ විදිසැරය වැරදීගියේ වී නම් ඒ මුවාද භයින් තැතිගෙණ මහාවනාන්තරයෙහි වැදීයාම මිස වැද්දාගේ ඊහීසැරයට ලංනොවන්නේය, ඒ වැදිතෙම කෙතෙක් ප්‍රයෝගකළේ විනමුත් භයගෙණ.දිවපු මෘගයා ඔහුට අසුකොට ගතනොහැක්කේය.

එසේ මේ ලොවම දක්නා දෘෂ්ටධර්මවෙද්‍යකර්මයහා දෙවන වර ඉපිද විඳුයුතු උපපද්‍යවෙද්‍යකර්මයාගේ විපාක නොහැරදීම ඒ කර්ම විපාකදීම කීලෙසම වූයේ වීනම් ඊසැරය නොවැරදීම වැදුනාක්මෙනි, එසේ නොවූයේ වීනම් වැරදීගිය ඊය නැවත ඒ මුවා කරා නොයන්නාසේ ඒ කර්මයද ඒ සත්ත්වයාකරා නොගොස් විපාකනැතිවනබව මේඋපමායෙන් දතයුතු, මේඋපපද්‍යවෙද්‍ය කර්මලක්ෂණයි.

වෙදනීයන්තු පාපජ්ජං පරියොසානමීරිතං,
පරිනිඨිත කම්මන්නා විපච්චති අනන්තරෙ.

මේ යථොක්ත දෘෂ්ටධර්මවෙද්‍ය කර්මයට නියමවූ පළමුවන ජවනචිත්තයහා උපපද්‍යවෙද්‍යකර්මයට නියමවූ සත්වන ජවනචිත්

තය යන සිත් දෙකහැර ඒ අතරසිටි දෙවෙනිසිතපටන් සවනසිත දක්වා එක්ව ඒසිත් හා උපදනා ජවනචිත්තයෝ පස්දෙනම අපරාපයඝීවෙදනකර්මයෝ නම් වෙත්.

ඒ පස්ජවනචිත්තයන්කෙරෙහි උපදනා අපරාපයඝීවෙදනකර්මය නම් කවරහයත්?—අපරාපයඝීවෙදනකර්මය කළාවූ සත්‍වයන්ට ඒ කර්මකළඑමජාතිය ඊට දෙවනජාතිය තුන් සතර පස් දසවැනි සියක්වැනි දහසක්ලක්‍ෂයක්වැනිද එයින් මත්තෙහිදු අසවල්වැනි ජාතියෙහි විපාක දෙයි යනනියමයක් නැත්තේය, ඒ අපරාපයඝීවෙදනකර්මය කළාවූ සත්‍වයෝ නිවන්නොදක්නාතෙක්ම මේ අතර අවකාශ දුටු යම්විටක ඒ කර්මඵලවිපාකය දෙන්නේමය, ඔහු නිවන් නොදුක සසරසිටිනාතාක්කල්මුළුල්ලෙහි දුන් දුන්යයි කියා අවකාශ බලා විපාකදෙන්ටම නියමව සිටීමමුත් අභාවකර්ම නොවන්නේමය.

ඒ කෙසේදැයි කිවහොත්?—මුවවැද්දෙක් සුනඛයෙකු ගෙණ දඩයමට ගියේ මුවෙකු දුක සුනඛයාට පෙන්වා නියොගකල කල්හි ඒසුනඛතෙම සමානවපපතුදිකයා හෙයින් පසුපස්සෙහි නොහැරම දුන්ගණීම්සි දුන්ගණීම්සිසිනා ලුහුබඳවා දුවන්නේ අවසරයක් ලත් විටම අල්වාමිස අතුරෙහි අලසව නොසිටිනේය, එපරිද්දෙන්ම මේ අපරාපයඝීවෙදනකර්මය කම්විපාකයත් නොනැසී මතුවිපාකදෙන්ට තිබෙනාපරිදි නම්, කිසිවෙක් තමා උපයානත් ධාන්‍යයක් කොටුවෙක්හි රැස්කොට තබාලා පමණක් ගෙණ ප්‍රයෝජන විඳිමින් අමුතුව අමුතුවත් උපයූධාන්‍යය කොටුවෙහිම රැස්කෙරේද, මදක් ප්‍රයොජනයට ගෙණ බොහෝව උපයා රැස්කරණබැවින් කොටුවෙහිලූ වී පිරුණුවනම තිබේද, එමෙන් අපරාපයඝීවෙදන කුශලාකුශලකර්මයෝද සමහරක් විපාක දුනත් බොහෝසේ කොටුවෙහි රැස්කළ ධාන්‍යයමෙන් මතුමත්තෙහිත් ලදලද අවකාශයක විපාක දෙන්ටම සිටියාහුය, එසේවූ ඒ අපරාපයඝීවෙදනකර්මයන්කෙරෙන් මිදුනු එකද සත්‍වයෙක් මේලොකයෙහි නැත්තේය.

සෙසානි වෙදනීයානි පරියායෙ පරෙ පතං,
ලඩාසෙවනතො පාකං ජනෙති සතිපච්චයෙ—යි

මේ අපරාපයඝීවෙදනකර්මලක්‍ෂණයයි.

සද්ගුරු කම්ය නම් කවරහයත්?—යම් කිසිවක්හු විසින් කරණලද්දවූ කුශලකර්මයට වඩා අකුශලකර්මය අධිකතරව ගුරුව තිබේද, අකුශලකර්මයට වඩා කුසලකර්මය හෝ අධිකතරව ගුරුව තිබේද, ඒ යද්ගුරුකර්ම නම් වේ.

ඒ වනාහි කුශලපක්‍ෂයෙහි ධාතුසහිතවූ දාගොප් බැඳීම ආදිවූ මහාකුශලයක් යමෙක් කොටගෙණ කුරුකුහුඹුවන් ආදිවූ ක්‍ෂුද්‍රප්‍රාණියකුගේ ජීවිතෙන්ද්‍රියෙන් තොරකෙරේද, අකුශලපක්‍ෂයෙහි යමෙක් පඤ්චානන්තරියකර්මය කොට අශුභචේතනාවකින් සුනඛාදි තිරිසනකුහට ආහාර ආලොපඅඹයක් දුන්නේවේද, මෙසින් මහාකුශලය දියමිදුනුනහි තුබුම්තුඇටක්පමණ විතමුත් අකුරෙක් හෝ ශගුලියක් හෝ දියපිට ඉල්පෙන්ට නොහැකිව ඇතුලෙහිම ගැලේද, එපරිද්දෙන්ම කුශලය පෙරහෙයින් එම පළමුව විපාකදෙන්නේය, අකුශලපක්‍ෂයෙහිදු පඤ්චානන්තරියකර්මය ගරුතර හෙයින් පළමුව විපාකදෙන්නේයි, මේ යත්ගරුකර්මලක්‍ෂණයි.

**යද්බහුලකර්‍මය** නම් කවරහයත්?—යමෙකුවිසින් කරණලද කුශලාකුශලකර්මදෙකින් යම් කර්මයක් බොහෝසේ කරණලද, ඒ කර්මය යද්බහුලකර්මනම්වේ.

හෙද වනාහි බොහෝකාලයක් ලද අවකාශයෙන් ආසෙවිත භාවිත බහුලීකෘතවශයෙන් වන්නේනේය, යමෙක් කුශලකර්මයෙහි බලවත්වූ සතුටු සන්තොෂ උපදවාද, අකුශලකර්මයෙහි බලවත්වූ ශොක සන්තාප උපදවාදමේද යත්බහුල කර්ම නමැයි දතයුතු.

යම්සේ මල්ලවයෝ දෙදෙනෙක් යුඩභූමියකට බැස යුඩකරණකල්හි එයින් බලවත්එකෙක් දුර්වලයා හෙලා නික්මේද, එප්රිද්දෙන්ම දුර්වලකර්මය මැඩපවත්වාගෙණ සෙවනයතුටු ආදිවශයෙන් බොහෝවූ කර්මය යද්බහුල වශයෙන් විපාකදෙන්නේයි, මේ යද්බහුල කර්මලක්‍ෂණයි.

**යදාසන්නකර්‍මය** නම් කවරහයත්?—යම්සේ ලදරුසත්වයෙක් කුශල්අකුශල් යන කර්මදෙක කෙලේද, එසින් ඔහුට මරණාසන්නයෙහි අකුශලයෙක් සිහිවීනම් අපාය දුකටම පැමිණෙන්නේයි, කුශලයෙක් සිහිවීනම් දෙව්ලොව ඉපිද දිව්‍යසම්පත් ලබන්නේය.

යම්සේ ලදරු මහලු ආදිවූ බොහෝ ගවයන් යම් ගවපාලයෙක් සවස රැස්කොට ගෙණවුත් ගාලෙහිලා ඉඳිදොර දඬුලමින් රැකවල් කොට ගොස් උදෑසන අඳුරින් ගවයන් තණබිම්ට හරිනපිණිස ගාලේ දොරටුව ඉඳිහැර දමූකල්හි එහි පුරාමසිටි ගවයන්ගෙන් බලවත් වෘෂභරාජයන් ඇතත් ඉඳිකඩට ලංව සිටි මහලුගවයෙක් හෝ ලදරු වස්සෙක් හෝ බලසම්පන්න වෘෂභයෙක් හෝ සිටියේවී නම් ඉඳිදොරසමීපව සිටි එකා පිටත්ව ගියකල සෙසුගවයන්ට නික්ම යන්ට අවකාශ පෙනෙන්නේය, එපරිද්දෙන්ම සත්‍වයා විසින්

කරණලද කුශල් අකුශල් කොපමණක් ඇතත් මරණාසන්නයෙහි සිත එල්බිම්වශයෙන් පැමිණිසිටියාවූ නිමිත්තට ආසන්නව සිටිනාවූ කුශල කර්මයක් හෝ අකුශල කර්මයක් හෝ ළඟම්වූ විපාක දුන් කල්හි මාර්ගඵලයට නොපැමිණියොත් සෙසු කුශලාකුශලකර්මයෝද විපාක දෙන්නාහුයි.

එහි කුශලා කුශලකර්මයෙන් මරණාසන්නයෙහි සිහිවන පරිදි කෙසේදයත්?—යමෙක් බඹලොවට ගතිනියතවූ මහත් පින්කමක් හෝ නරකයට ගතිනියතවූ ආනන්තරියකර්මයක් හෝ නොකළේද, ඔහුගේ ගති නියතමය, එසේ නොකොට සිරි යම් කිසිවෙක් මරණාසන්නකාලයෙහි තමාගේ ඇතිතාක් වස්තුයෙහි ලොභ උපදවා "මේ වස්තුව අනුන්ට නොවේවයි, අහෝ මම මෙයින් මිදී මිය පරලොව යෙමි"යි යනාදිවශයෙන් ඇතිවෙමින ඇතිවෙමින සම්පත නිසා ලොභාදි නොයෙක් පාපචේතනාවන් සිතීමෙනුදු "කුසල් නොකෙළෙමියි අකුශල් කෙළෙමියි පළමුකළතාක් අකුසල් සඳහන් කොට පශ්චාත්තාපයට පැමිණෙන හෙයිනුදු, වැන්දයුතු පිදියයුතු තුණුරුවන් විනා සෙසු දෙවතාදීන්ට භක්ති උපදවා මට සරණය පිහිටයයි සළකා වැඳීම්පිදීම් ආදිය කිරිමෙනුදු මිථ්‍යාදෘෂ්ටි ගැන්මෙනුනුදු, තමහට උපස්ථාන මෙහෙකරන්නාවුන් විෂයෙහිද ආහාරපානවර්ග වස්ත්‍රසයනාසන ගිලානප්‍රත්‍යය ආදීන් උපකාර කරන්නන්හා නොකරන්නන් විෂයෙහිද, තමා අයිතිවූතාක් වස්තුව නොකැමැත්තෙන් නුදුන්සේ ගන්නවුන් කෙරෙහිද, නොසතුටුව වෛරඋපදීමෙනුදු, අඹුදරු ආදීන් කෙරෙහි බලවත් ලොභ ඉපදවීමෙනුදු, යනාදි විසින් මරණාසන්නයෙහි කළතාක් අකුශලකර්ම ආසන්නවයේ, පිළිසිඳ විපාකදෙන්නේ අකුශලපක්ෂයෙහි ආසන්නකර්ම නම්, මෙසේ මරණමංචකයෙහි හෙව පරලෝ පිහිටට නිසිඋතුම් කුසල්දහම් ශක්තිඇතිදවටින් තමා පුරුදු නොකළ බැවින් හෝ ලොභාදීනොයෙක් අකුසලධර්මයන්ම පුරුදුවූ බැවින් කිසිසේත් පිහිටක් නොලැබ එහිදු අනුවනින්ම යෙදී නොයෙක් පව්වුසිතිවිලි මෙසේ සිතන්නායට නැවත නැවතත් අකුසල් වඩන්නේය, ඒ කෙසේදයත්?—

සවස්වේලෙහි මහත්පර්වතයෙහි ඡායාව පොළොව පැතිරයෙන ක්‍රමක්‍රමයෙන් ඉතා මහත්ව පවත්නේද, එසේම අනුවනින යෙදී සිහිකිරීම්ආදි නොයෙක් සිතිවිලි සිතානතුවනාමද බාලයන්ට අකුසල්ම වඩනේයයි දතයුතු, මේ අකුශල ආසන්න කර්මනම්.

කුසල්කිරීමෙහි යෙදී වාසය කළ නුවනැතිපණ්ඩිතපුරුෂයෙනම් මරණාසන්න කාලයෙහි නුවනින් යෙදී සිහිකරන්නේමය, ඒ

කෙසේදයත්?—යමෙක් මරණාසන්නයෙහි කියනලද ප්‍රකාර මහත් ගරුතරකර්ම හෝ ආසන්නපාපකර්ම හෝ නොකලහෙයින් ඔහුගේ සිත එල්බ නොසිටියහොත් තමාබාලකාලයෙහි පටන් සතතයෙන් කිරීමෙන් අභ්‍යාසකරණලද දානමයවූ පින්කමක් හෝ සීලමයවූ පින්කමක් හෝ නවගුණසිහිකිරීම් ආදී භාවනාමයවූ පින්කමක් හෝ ඇත්නම්, නිරන්තරයෙන් අභ්‍යාශකළහෙයින් මරණකාලයෙහිද සැපසේම සඳහන්වනහෙයින් එසේ කළ කුසල් සිහිකිරීමෙනුදු, තමාසන්තකව තුබුනාක් සියලුමවස්තුයෙහි ලොභ නූපදවා සතුටු සිතින් තුනුරුවන් පිදීමෙනුදු, එතනට පැමිණිසඟණටද යාචකයන්ටද සතුටුසිතින්ම දන්දීමෙනුදු ඥාතිආදීන්විසින් ඔවුන්ගේ මරණයට පළමුකොට සතුටුවන පිණිස වඩාහිඳුවූ පිළිමරූ දක්ව බුදුගුණසිහිකරමින් යෙදීමෙනුදු, එසේම කියනලද දහම්ගුණසිහිකිරීමෙන් හා එසේම වඩා හිඳුවා බණකියන සංඝගුණ සිහිකිරීම්ආදී වශයෙනුදු, වෙෂවෛර ඇතිනාක් දෙනාකෙරෙහි වෛර හැර සමා කිරීමෙනුදු, ආහාරපානවගීවස්ත්‍රයානාවල් මල් සුවඳවිලවුන් සෙය්‍යාවන් ආසන ලැගුම්ගෙවල් ප්‍රදීප ආභරණ ධනධාන්‍යාදී දියයුතුදානවස්තු ශ්‍රද්ධාසිතින්ම කර්මඵල සිතින් අදහා ලදපමණකින් දන් දීමෙනුදු, සුවඳදුම්පහන් ආදියෙන් තුනුරුවන් පිදීමෙනුදු, ප්‍රසන්නවූ සිතින්ම තුන්සරණ ගැන්මෙනුදු, පන්සිල් අටසිල් දශසිල්ආදිය සමාදන්වීමෙනුදු, තමාකළපින් අනුන්ට දීමෙනුදු, අනුන් කළපින්අනුමෝදන්වීමෙනුදු, නිවන්මඟදෙන බුදුන්දෙසූඋතුම්දහම් ඇසීමෙනුදු, තුනුරුවන්ගුණ සිහිකිරීමෙනුදු, මෛත්‍රීකරුණාමුදිතාදීවූ භාවනා සිහිකිරීමෙනුදු, තිස්දෙකක්පමණ කුණුකොටස් එක්වූ මේ ශරීරය පිළිකුල්සේ නුවනැසින් දැකීමෙනුදු, මේ ආත්මය ස්ථිර නොවනසේ සියලුදුක්පිඬක්සේ වසඟ නොවනසේ සිහිකිරීමෙනුදු, යනාදිවිසින් මෙසේ මරණාසන්නකාලයෙහි කල්‍යාණමිත්‍රසහායකින් හෝ තමූම හෝ සිහි එළවා කළනාක් කුශලකර්මයෝ මියයනජාතියට සමීපවූ ආසන්නභවයෙහි පිළිසිඳ ගන්වා ඒ ඒ ජාතිවල විපාකදේනුයි ආසන්නකුශලකර්මනම්.

මෙසේ මරණමඤ්චකයෙහි වැදහෙවද නුවනින් යෙදී සිහිකරණ පණ්ඩිතජනයන්ට කුසල් වඩනාපරිදි කෙසේදයත්?—සවස්වේලෙහි මහත් පර්වතයෙහි ඡායාව පෘථිවියෙහි පැතිරෙමින් යම්සේ වඩීද, එසේම නුවනින් යෙදී පූර්වයෙහි කළනාක් කුශල් හා එතැන්හිදු කළමනානාක් පින්කම් සිහිකොට එහි යෙදෙනපණ්ඩිතජනයාට බොහෝකුශල් වඩන්නේයයිදතයුතු, මෙසේහෙයින් ආසන්නකුශලකර්මය වන්නේය, මේයදාසන්නකුශලා කුශලකර්මලක්ෂණයි.

කෘතත්වාත්කර්මයනම් කවරහයත්?—මෙතී කර්මයන්හොරෙන් වෙන්ව සිටි නොදන්ම වශයෙන්කළාවූ කර්මය කෘතත්වාත් කර්ම නම්වේ, ඒ කර්මයවනාහි යම්සේ කුශලයෙහි හෝ අකුශලයෙහි හෝ පැමිණි විපාක දෙනකල කිසියම් උන්මත්තපුරුෂයෙක් දුනුහී ගෙණ තමා උමතුහෙයින් කොපමණවත් ඇද කොතනක කුම්කට කුමක්පිණිසවත් විදිනාබවක් නොසළකා හීශරයහරනේද, ඒ ශරය ගොස් හැදීමෙන් හෝ ලෙකින් හෝ ඇදනොව බැලීමෙන් හෝ යනමේ කිසිදෙයකිහුන් ගරුභාවයක් නැතිව නියමිනොව ශරය පැමිණේද, එසේ කෘතත්වාත්කර්ම විපාකයද නියමිනොව ගුරුභාවයක් නැතිව ලදයම්තැනෙක්හි අසාරව විපාකදෙන්නේය, අඥානභාවයෙන් යෙදී නොදන අසාරවශයෙන් චිත්තජාතවූයිහින් කළාවූ කුශලාකුශලකර්මයෝ එපරිද්දෙන් අගරුව විපාක දෙන්නාහුයි, මේ කෘතත්වාත්කර්මලක්ෂණයි.

ජනකකර්මය නම් කවරහයත්?—යම් කිසිවක්හු කුශලයක් කලකල ඒ කළාවූ කුශලානුභාවයෙන් පිරිසිඳුවූ ක්ෂත්‍රියවංශයක පිළිසිඳ දෙමින් යහපත්ලෙස ගැබපෙළහැර ලැබ උපන්නල්හිදු සත්කාර ලැබ එතැන්පටන් මත්තෙහි ජනකකර්මයෙන් උපන් එම ආත්මය පැවැත්වීමට අනික් කර්මවිපාකයක් පැමිණ වැඩෙනුයේ ආහාරවස්ත්‍රසයනාසනාදිවූ ඓශ්වර්ය ලැබගතනොහී අපර පක්ෂයෙහි සඳමඬලක්සේ ක්‍රමයෙන් අඩුඅඩුව අවුත් දුකසේ ජීවත් වන්නේය, මේ ජනකකර්ම කුශලප්‍රතිසන්ධිය නම් වේ.

යම් සත්වයෙක් අකුශලයක් කොට එයින් තමා දුක්ඛිතකුලයක හෝ හීනකුලයක හෝ දුසිතකුස හෝ පිළිසිඳගෙණ ඔවුන්හිරන්තරයෙන් වැඩමෙහෙවර කිරීමෙහි ව්‍යාපෘතවනකල්හි තැලිවැලි බොහෝ වෙහෙස විඳ ඔවුන් කනබොනවේලාවට කනබොනදෙයක් නොලැබ ක්ෂුධාවෙන් පීඩිතවනකල්හි එයිනුදු වෙහෙස විඳ මව්කුසින් බිහිවනකල එයට නිසිගෙවලආදිවූ සැපතෙක් කිසියම් උපකරණයක් නොලදින් පැමිණිකිසියම් තැනකදී ඉපිද සැපවූ තෙල්කිරි ආදි භොජනාදියත් සුදුසුලෙස නොලැබ දුක්ඛජීවිකාවෙන් වර්ධනය වෙමින් මව්පියන්ගෙන් ලබන්ට වෙනකිසිවක් නැතත් එයින් මතු ජීවිතපැවැත්මෙහි අනික් කර්මඵලයක් පැමින පූර්වපක්ෂයෙහි සඳමඬලසේ වස්ත්‍රාභරණ අන්නපානාදි සියල්ල ලදින් රාජාමාත්‍යාදින් සිත්ගෙණ වාසයකොට සිත්ගෙණ නන්තනාතුරු ලැබ උපභොගපරිභොගසම්පත් දසිදස්ගවමහිෂාදිවූ ඓශ්වර්යයම් ක්‍රමයෙන් වඩවඩා ලැබගෙණ සැපසේ ජීවත්වන්නේය, මේ ජනක කර්ම අකුශලප්‍රතිසන්ධි නම් වේ, මේ ජනකකුශලාකුශල ප්‍රතිසන්ධි ලක්ෂණයි.

**උපස්ථම්භකකර්මය** නම් කවරහයත්?—යම් කිසිවෙක් ප්‍රසන්න චිත්තයෙන් කුශලයක් කොට එයින් සුගතියෙහි ඉපිද ඒ කුශල කර්මයෙන් උපදනා නොයෙක්ඉසුරු විඳ ඒ ජාතික්ෂයව නැසීගිය කල්හි ජාතියෙහි සිට කොටගත්කුශල කර්මයකින් හෝ අපරාපර්‍යවේද්‍යකුශලකර්මයකින් හෝ දුර්වලව වැඩෙනගෙයකට දිරාගිය ටැඹක් හැර අමුතුදෙනටැඹක්සේ පූර්වයෙහි කරණලද කුශලකර්මයෙක් උපස්ථම්භව සුගතියෙහි ප්‍රතිසන්ධි දෙමින් සවගිසැප විඳුවන්නේය, මෙසේ නොයෙක් ලක්ෂගණන්හවුරුදු දිව්‍යමනුෂ්‍යලොක දෙක්හී ඉපිද සුගතියෙන් සුගතියට සැරිසරා ඇවිද දුගතියකට නොපැමිණ දිව්‍යමනුෂ්‍යලොකදෙක්හිම උපදවනුයේ පළමුවෙන් කළාවූ කුශලකර්මයට ආධාරවූවාක්මෙන් සුගතියෙහිම ඒ ඒ ජාතිවල පිළිසිඳ ගැන්මට උපකාරව දුගතියකට යානොදී සැපදෙනුයේ මේ කුශලය උපස්ථම්භකකර්ම නම්, මේ කුශලාකුශලඋපස්ථම්භකකර්මලක්ෂණයි.

**උපපීඩකකර්මය** නම් කවරහයත්?—පෙර තමා කළකුශලාකුශලකර්මයකින් පිළිසිඳගත්කල ආත්මය එහි පැවැත්වීමෙහි උපන්දුක්සැපදෙනකට එසේම පෙර කළකුශල් අකුසල්දෙකෙන් එකක් උදුව පීඩාකරමින් කලක් පවත්වන්නට නොදී බාධාකිරීමය, එහි කුශලකර්මයම විපාක දෙනකල අකුශලකර්මයෙක් කුශලකර්මය පෙරලා උපපීඩිතව ඔහු විපාක දීමට කුශලයට අවකාශ නොදෙයි, අකුශලකර්ම විපාක දෙන්ට වන්කල්හි කුශලකර්මයෙක් අකුශලකර්මය පෙලා පීඩාකොට විපාකදීමට අවකාශ නොදෙන්නේය.

යම්සේ වැඩෙන වෘක්ෂලතාදියක් ශස්ත්‍රාදියෙන් ඡේද්‍යභේද්‍යකල කල මනාකොට නොවැඩෙන්නාසේ කුශලවිපාකය දෙනකළ වෙන්ව එයටම අවකාශනොදී අකුශලයෙන් පීඩිත වෙයි, අකුශල විපාකය දෙනකල එයටම අවකාශනොදී කුශලයෙන් පීඩිත වෙයි, එහි විභාග **සුපබ්බතතයාගේ** අකුශල කර්මය පීඩිතවූ ක්‍රමයද, **චොරඝාතකයාගේ** කුශලකර්මය පීඩිතවූ ක්‍රමයද බලා දතයුතු, මේ උපපීඩක කර්මලක්ෂණයි.

**උපඝාතකකර්මය** නම් කවරහයත්?- කුශලකර්මයෙහි බලද අකුශල කර්මයෙහිබලද සමානව සිටිකල්හි මදක් එක කර්මයක් දුර්වල වීනම් ඒ කර්මය මැඩපවත්වාගණ දුර්වල කර්මවිපාකය දුරුකොට එයට අවකාශ නොදී තමාගේ විපාකයම දෙන්නේය, එයින් සුගතියෙහි උපදවා කුශලකර්මය විපාක දෙනකල්හි එහි සැපවින්ද

ෂනාදී අකුශලකර්මයෙක් යොමුව කුශලකර්මය නසා තමාගේ විපාකය දෙන්නේය, දුගතියට පමුණුවා අකුශලවිපාක දෙනකල්හි එක්කුශලකර්මයෙක් එල්බ සිට ඒ අකුශලකර්මය සිඳ තමාගේ විපාකදෙන්නේය, මේ උපඝාතකකර්මලක්ෂණයි, මෙයම උපච්ඡේදකකර්මය කියාද කියත්, බොහෝ ආයු ඇතිවෙන්ට නිසිකර්මයෙන් උපන්නාහටද මේ උපච්ඡේදකකර්මය පැමිණියේ වීනම් ආයුෂය එවිට සිඳුවන්නේය, ඒ කුමක් මෙන්ද?—

යම්සේ පුරුෂයෙක් අටඉස්බක්තැන් නික්මෙන වෙග දක්වා සැරයක් විදිද, ඒ සැරය ඔහුගෙන් පිටත්වූ ක්ෂණයෙහිම අන්පුරුෂයෙක් එතැන්හි සිට මුගුරකින් ගසා සැරය එතැන්හිම හෙලාද, එපරිද්දෙන්ම බොහෝ ආයුඇතිවෙන්ට නිසිකර්මයෙන් උපන්නාහුගේ ආයුෂය උපච්ඡේදකකර්මය පැමිණ සිඳ විනාශකරන්නේය, මේ උපච්ඡේදකකර්මලක්ෂණයි.

මෙසේ දක්වනලද්දවූ කර්ම එකොළොසින් දෙවෙනිව කී උපපද්‍යවේද්‍ය කර්මයන් හා තුන්වැනිව කී අපරාපර්‍ය්‍යවේද්‍යකර්මය යන මේ දෙකින් සත්‍වයා ඒ ඒ තැන පිළිසිඳ ගන්වමින් ඒ ඒ ජාති පැවැත්වීමට නිසිවිපාකයන් දෙන්නේය, පළමුවෙන් කී දෘෂ්ටධර්මවේද්‍යකර්මයෙන් ප්‍රවෘත්තිවිපාකය දීමම්ය ජාතිපිළිසිඳගැන්මෙක් කරන්ට නොහැකිවන්නේය, රහතුන්වහන්සේ වනාහි උපපද්‍යවේද්‍යකර්මයද අපරාපර්‍ය්‍යවේද්‍යකර්මයදැයි, යන මේ කර්මයෝ දෙදෙනම කර්මයන් ක්ෂය කරන්නාවූ අර්හත්මාර්ගයෙන්ම නසනලද්දහුමවෙති, දෘෂ්ටධර්මවේද්‍ය කර්මයක් ඇත්තේ වීනම් ඒ කර්මය තෙම රහත්බවට පැමිණියාවූ උත්තමයානන්වහන්සේලාටද විපාක දෙන්නේමය, යනමේකාරණය දක්වනුපිණිස අරහන්තානංහි උපපජ්ජවේදනීයඤ්ච අපරාපරිය වේදනීයඤ්චාති ඉමානි වෙකම්මානි කම්මක්ඛයකරෙණ අරහත්තමග්ගෙන සමුහතානි, දිට්ඨධම්මවේදනීයං අත්ථි, තං අරහත්තප්පත්තස්සා’පි විපාකං දේතියෙ’ව--යි කීහෙයින් මෙහි ඇති අර්ථයම සළකා දතයුතු, මෙසේ සූත්‍රපිටකයෙහි එකොළොස්ප්‍රකාර කර්මයෝ විභාග කොට දක්වනලද්දහුයි.

මෙසේ සත්‍වයන්විසින් කරණලද සියලු කර්මයෝම සූත්‍රපිටකයෙහි දෘෂ්ටධර්මාදිවශයෙන් එකළොස්ප්‍රභෙදයක් කොට සියලුම කුශලාකුශලකර්මවිභාග දක්වා දෙව්මිනිසුන් සහිතසියලුලෝකයාහට මෙසේ කරණලද අප්‍රමාණවූ උතුම් සද්ධර්මානුශාසනා ඇතිහෙයින් අනාවරණඥානඇති මාගේ බුදුරජානන්වහන්සේ ශාස්තෘනම් වනසේක.

එම්ම සියලු කර්මයෝම අභිධර්මපාඨයෙන් සොඩසවිධවූ පරිදී
කෙසේදයත්?—පාපලක්ෂණවූ සියලුඅකුශලකර්මයෝම ගතිසම්ප
ත්තිය උපධිසම්පත්තිය ප්‍රයොගසම්පත්තිය ගතිවිපත්තිය උපධිවිපත්
තිය කාලසම්පත්තිය කාලවිපත්තිය ප්‍රයොගවිපත්තිය කියා අට
දෙනකද, කුශලලක්ෂණවූ කල්‍යාණකර්මසමූහයෝද ගතිවිපත්
තිය උපධිවිපත්තිය කාලවිපත්තිය ප්‍රයොගවිපත්තිය ගතිසම්පත්තිය
උපධිසම්පත්තිය කාලසම්පත්තිය ප්‍රයොගසම්පත්තිය කියා දක්වන
ලද අටදෙනකුඇතුළුව කර්මයෝ සොළොස්දෙනෙක් වෙත්.

එහි විභාග කවරහයත්?—දුක්අනුභවකිරීමට නිසි පාපකර්ම
යක් ඇතිකල්හිම සුගතියෙහි කිසිම්කුශලබලයකින් යමෙක් උපදීද,
ඔහුගේ පාපකර්මය ගතිසම්පත්තීන් බාධිතව ඔහට විපාකනොදෙ
න්නේය.

යමෙක් පාපකර්මයෙන් දුසියකගේ බඩහෝ පිළිසිඳගෙණ රූප
ශ්‍රීන් යුක්තව උපධිසම්පත්තිව වැඩිවිය පැමිණ සිටියේද, එකල
ඔහුගේ ස්වාමිපුත්‍රතෙම රූපශ්‍රිය දැක ඔහට සතුටුව තමහට ජාතපුත්‍ර
යක්හුමෙන් සිතමින් සැපයෙන් වර්ධනය කොට භාණ්ඩාගාරිකයථා
නානතරාදිය කරවමින් එයට නිසිලෙස පරිහරණය කෙරෙයි,
මෙබඳු සත්වයාගේ ඇත්තාවූ පාපකර්මය උපධිසම්පත්තීන් බාධාව
විපාක නොදෙන්නේය.

යමෙක් මනුෂ්‍යයන් කෙරෙහි සුලභවූ ආහාරපානවස්ත්‍රාදීන් ඇති
කාලයෙහි ඉපිද ඔහුගේ පාපකර්මය කාලසම්පත්තීන් බාධාව විපාක
නොදෙන්නේය.

යමෙක් සම්‍යක්ප්‍රයොග නිසා ජීවත්වෙයි, යමක්හු සම්පයට
එළඹෙන්ට සුදුසුකල්හි එළඹෙයි, ලංවන්ට නුසුදුසුකල්හි පලාඑයි,
දුරුගමනකට සුදුසුකල්හි නික්ම යෙයි, අත්ලස්දීමට නිසිකල අත්
ලස්දෙමියි, සුදුසුකලෙක සොරකම් කෙරෙයි, මෙබඳුවූ සත්වයාගේ
ඇත්තාවූ පාපකර්මය ප්‍රයොගසම්පත්තියෙන් යටව විපාකනොදෙන්
නේය.

සුගතියෙහි උපන්නාවූ සත්වයාගේ පාපකර්මය ගතිවිපත්තිය
නිසා විපාකදෙන්නේය, යමෙක් දුසියක කුසපිළිද රූපශ්‍රීයක්
නැතිව උපදීද, ඒ පුරුෂයෙක් වීනම් ඇතුන් අසුන් ගව මහිෂ සුන
ඛාදීන් බලනසේ හෝ කොළමලවහන් ආදිය තබනසේ හෝ ඔහු
සලස්වති, ස්ත්‍රියක්වීනම් ඇත්අස් සුනඛාදීන්ට බත්පිසනසේ නින්
දිතවූ කර්මයක් සලස්වති, මෙබඳු සත්වයාගේ පාපකර්මය උපධිවිපත්
තිය පිණිස විපාක දෙන්නේය.

යමෙක් දුර්භික්ෂකාලයෙහි හෝ පිරිහෙන්නාවූ සැපඇති කාලයෙහි හෝ අනාථකල්පයෙහිකෙළවර මිනිසුන්කෙරෙහිහෝ උපදීද, ඔහුගේ පාපකර්මය කාලවිපත්තිය නිසා විපාකදෙන්නේය.

යමෙක් කියනලද ක්‍රමයෙන් ප්‍රයොග යොදනසේ නොදනීද එළඹීම නොඑළඹීම අත්ලස්දීම සොරකම් ආදිකර්මයන්ට නිසිනිසිවූ කාලයෙහි ඒ හැමකරන්ට නොදනීද, ඔහුගේ පාපකර්ම ප්‍රයොග විපත්තිය නිසා විපාකදෙන්නේය, මේ අනිෂ්ටාලම්බණඅෂ්ටකයයි.

යමෙක් ඉෂ්ටවූ යහපත් සැප අනුභවයට නිසි කුශලකර්මයක් ඇති කල්හිම ගොස් දුගතියෙහි ඉපිද ඔහුගේ කුශලකර්මය ගතිවිපත්තීන් බාධිතව විපාක නොදෙන්නේය.

යමෙක් කුශල බලයෙන් රාජරාජමහාමාත්‍යාදිවූ ලොකප්‍රසිද්ධ කුලයෙක්හි ඉපිද අඳ ගොළු බිහිරි කොරපිළිස්සල් ආදිවූ ඉන්ද්‍රියවිකලභාවයකට පැමිණිකල්හි ඔහට ස්වකීයවංශානුරූපවූ තරම් සුදුසුරජයුරජසෙනෙවිරත්භාණ්ඩාගාරිකාදිවූ ස්ථානාන්තරයකට නොපමුණුවති ඔහට ඒ කුශලය උපධිවිපත්තීන් බාධාව විපාකනොදේ.

යමෙක් බත්නැතිකාලයෙහිද සම්පත්තික්ෂයවන කාලයෙහිද, අනාථකල්පානනසත්වයන් කෙරෙහිද උපන්නේ වීනම් ඔහුගේ කුශලකර්ම කාලවිපත්තියෙන් බාධාව විපාකනොදේ.

යමෙක් කුශලකර්මයෙන් සුගතිභවයෙහි උපන්නේද ඔහට ඒ කුශලය ගතිසම්පත්තිය නිසා විපාක දෙන්නේය, රාජරාජමහාමාත්‍යාදිකුලයෙහි ඉපිද උපධිසම්පත්තියට පැමිණියේද එසේ රූපශ්‍රීන් ආත්මසමෘධියට පැමිණියෙකු දැක මොහුට රජයුවරජසෙනෙවිරත් ආදිවූඋතුම්තනතුරු සුදුසුය”යි කියා පමුණුවති, මෙබඳුසත්වයාගේ කුශලකර්මය උපධිසම්පත්තියපිණිස විපාකදෙන්නේය, යමෙක්සුදුසු කාලයෙහි තනතුරුවලට පැමිණ ධනවන්තමන්ත්‍රිවරුන්කරාගොස් සිත්ගෙණ මධුරවචනයන් කියා සෙවනය කොට සිට ඒ මන්ත්‍රිවරු කිපි කිසිවක්හට වධකිරීම් ආදියක් යොදනකල්හි තෙමේ ඔහු ඇස නොපෙණීම ඉවත්වේද ඒමන්ත්‍රීන් සත්වයන්ට ආපදාපීඩයක්පැමිණි කල්හි ගෙදරව ගමට රටටත් නොපෙණීම් අන්‍යරටකටහෝ අනික් දෙශයකට හෝ පලාගියේද සොරකම්ට සුදුසුතැන සොරකම් කොට වස්තු රැස්කෙරේද ඒ හැම වස්තු තමාකෙරෙන් පැහැරගැන්මක් පැමිණිකල්හි මියුරුවචනහා යාඥකිරීමෙන්අත්ලස්දීමෙන්වස්තුවට හානියක්විය නොදේද, තෙමේ සැපසේ ජීවත්වේද, මෙසේ ඒ ඒ ප්‍රයොගාවෙහි ප්‍රයොග සුදුසුලෙස යෙදීමෙහි සමර්ථවේද, ඔහුගේ කුශලකර්මය ප්‍රයොගසම්පත්තිය පිණිස විපාකදෙන්නේය.

සත්ත්වයන්ගේ සියළුකර්මයෝම මේ අභිධර්මපිටකයෙන් දක්වූ සොළොස්ප්‍රකාරකර්මලක්ෂණය නිමි.

මෙසේ අභිධර්මපිටකයෙහුදු අහුත්කර්මාදි දොළොස්ප්‍රකාරවූ ප්‍රතිසම්භිදාමාර්ගපිටකයෙහුදු සියලු කර්මවිභාග දක්වා දෙවිමිනිසුන්සහිත ලෝකයාට කාරණලද උතුම්සද්ධර්මානුශාසනා ඇතිහෙයින් කර්මප්‍රභෙදවශයෙන් අනෙක ප්‍රකාරවූ දෙශනාවිලාස ඇති මාගේ බුදුරජාණෝ නම් වනසේක, එහෙයින් කියලදී—

දෙවයක්ඛමනුස්සානං ලොකෙ අග්ගඵලංදදං,
දදංතං දමයන්තානං පුරිසාජඤ්ඤ තෙ නමො—යි.

මෙතෙකින් මේ ශ්‍රීසද්ධර්මාවවාද සංග්‍රහයෙහි සතර අපායදුක්ආදි සියළු දුකට පැමිණීමට කාරණාවූ එහෙයින්ම අපායමාර්ගවූ අකුශලකර්මවිභාගාදීනව දක්වා නිමවනලදී, මෙසේ සවන පරිච්ඡේදයෙන් ප්‍රාණඝාතාදි අකුශලකර්මපථ විභාගාදීනව ප්‍රකාශකිරීමෙන් ලෝවැඩ දක්වා තදනන්තරව එම අකුශලකර්මඵලභූමිවූ නරකය තිරිසන් අපාය ප්‍රෙතඅපාය අසුරඅපාය යනසතර අපායන්ගේ සවරූප මදක් මෙහි දක්වනු ලැබේ, එහි නරකය නම්—

සඤ්ජීවො කාලසුත්තො ච සංඝාතො චෙව රොරුවො,
තාපනො ච පතාපො ච මහාවීචි අථාපරො,
ඉච්චෙතෙ අට්ඨනිරයා මහාඝොරා භයානකා—යි.

යනුහෙයින් සඤ්ජීවය කාලසූත්‍රය සංඝාතය රෞරවය මහාරෞරවය තාපය ප්‍රතාපය අවීචිය යන මොහු ඝොරවූ භයානකමහත් දුක් ඇති අටමහනරකයෝ නම් වන්නාහුයි.

එහි පළමුවනනරකය කඩකඩකොට යමපල්ලන්විසින් සිඳිනලද් දුවූ නැවතනැවත කර්මබලයෙන් ජිවිතනැතිනොවනහෙයින් සංජීව නම්විය, ගිනිගෙණ දිලිහෙන කළුහුයගසා සතරැස් අටැස් සොළොස් කොට මහත්කුළුපමණ ගිනිගෙණ දිලිහෙන වෑයෙන් සස්නාලද සතුන් ඇතිනරකය කාලසූත්‍ර නම්විය, අයොමයපර්වතයෙන් සතුන් සුන්සුන්කොට මිරිකෙනනරකය සංඝාත නරක නම්වී, කිසේද යත්?—ඒ නරකයෙහි සත්ත්වයෝ නවයොදුන් පමණගිනිගෙණ දිලිහෙන යපොළොව කටීප්‍රදෙශය දක්වා ගැලී නිශ්චලව සිටිති, එකල්හි පූර්වදිශාභාගයෙන් ගිනිගෙණ දිලියෙනමහත් අයොමය පර්වතයක් නැගී අසනිඝොෂායෙසයින් ගර්ජනාකොරෙමින් අවුදු සතුන් සියුම් කොට වටත් තලනහෙයින් සුන්කොරෙමින් ගොස් පශ්චිම දිශාභාගයෙහි සිටී, පශ්චිම දිශාභාගයෙහුදු දක්ෂිණදිශාභාගයේ

හුදු උත්තරදිශාභාගයෙහුදු නැගී එනපර්වතයන්ගෙන් එසෙයින්ම මිරිකෙමින් යෙති, දෙදිසායෙන් දෙපර්වතයෙක් එකවිට අවුදු සතුන් උක්දඬුකලඹක්සෙයින් මිරිකාමය, එයින් ඒ නරකය **සංඝාත** නම්වී, නිරිසතුන්ගේ නව වනමුඛමාර්ගවලින් සියළු ශරීරයට වදනාගිනිජාලාහා ක්ෂාරධූමයෙන් ගුගුරා පස්නා සතුන් ඇතිනරකය **රෞරව** නම්වී, එසේම රක්තලෝහිතජ්වාලයෙන් පරිපූර්ණවූ බලවත් දුකින් ගුගුරා පස්නා සතුන් ඇතිනරකය මහාරෞරවනම්විය, ගිනිගෙණ දිලිහෙන යපොළොව එසේම දිලිහෙන සවුල්හී ඇවිනීඹිද නිශ්චලවපැසෙන නිරන්තරවූ ගින්නෙන් තැවෙනසතුන් ඇතිනරකය **තාප** නම්විය, මෙසේම නිරන්තරයෙන් ගිනිගෙණ ගිලිහෙන ආයුධයෙන් පැහැර දිලිහෙනයපර්වතයට නැඟුසතුන් කර්මජ්වාලයෙන් පැහැර උඩුපාදකොටගෙණ හෙලා පිච්ත්ය පොළොව යකබලින් නැගී දිලියෙන සවුල්හී හිසපටන් ගෙණ ඇවිනිබලවත් දුකින් පැසෙනසතුන් ඇති නරකය **ප්‍රතාප** නම්විය, අග්නිජ්වාලයෙහුදු දුක්ඛයෙහුදු සතුන්විසිහුදු අතුරුනැති අවීචි නම් විය, එහි ජ්වාලයෙන් අතුරුනැති පරිදි කෙසේදයත්?—පූර්වභිත්තියෙන් අග්නිජ්වාලා නැගී සියළු නරක මණ්ඩලය පුරාගෙණ ගොස් පශ්චිම භිත්තිය පැහැර විනිවිද එයින් පිටත සියක්යොදුන්තැන පැතිර සිට පශ්චිමභිත්තියෙන් නැගී යන අග්නිජ්වාලායෙහුදු එසේම සකලනරකමණ්ඩලය පුරාගෙණ ගොස් පූර්වභිත්තිය විනිවිද පිටත සියක්යොදුන්තැන් පැතිර සිටී, තුබූනැන් දිශායෙහිදු උඩද යටද එලෙසින්ම අග්නිජ්වාලා තොමෝ පවතිත්, මෙසේ සදිසාවෙන්ම නැගීඑන ෂඩ්විධවූ නිරාගිනිජාලාවන්ගෙන් නිරන්තරවන බැවින් ඒ නරකය අවීචි නම්වේමය.

දුක්ඛයෙන් නිරන්තරපරිදිකෙසේදයත් කායවාරයෙහි උපෙක්ෂාසහගතචිත්තයන් උපතුදු දුඃඛසහගතචිත්තයෙක්ම උපදී, එත කුදුළුවත් යම්ෂ් ජිහ්වාග්‍රහයෙහි එක්මධුබිඳුවක් තබා එක්තාම්‍රලොහෝ බිඳුවක් තුබූකල අනුදනතයම බලවත්වන බැවින් ඒ මීබිඳින් කම්නැත, එසේයින් කුම්භ්ඕනැදූසිඞ්චාරීම්ආදි උපෙක්ෂාසහගතචිත්තයන් උපතුදු දුක්ඛසහගතවිතතයාම බලවත්වන බැවින් දුක්ඛයම නිරන්තරය, තුබූසිත් ඇතදනැති, මෙසේ දුක්ඛයෙන් නිරන්තරවන බැවින් අවීචිනම්වේමය.

සතුන් විසින් අතුරුනැතිපරිදිකෙසේදයත්?—ඒ නරකාබ්භන්තරයෙහි සියක්යොදුන්තැන් තලෙක පිරුමල් තුබූ පිටිසෙයින් සතුන් විසින් නිරන්තරය, මෙතනසත්වයෝ ඇති මෙතනසත්වයෝ නැති හෙව හිඳ ඇවිද පස්නා සතුන්ගෙන් කෙළවරක්නැති යන්න

සත්වයන්ගේ සියළුකර්මයෝම මේ අභිධර්මපර්‍යායෙන් දක්වූ සොළොස්ප්‍රකාරකර්මලක්ෂණය නිමි.

මෙසේ අභිධර්මපර්‍යායෙනුදු අභුත්කර්මාදි දෙළොස්ප්‍රකාරවූ ප්‍රතිසම්භිදාමාර්ගපර්‍යායෙනුදු සියලු කර්මවිභාග දක්වා දෙව්මිනිසුන්සහිත ලොකයාට කරණලද උතුම්සද්ධර්මානුශාසනා ඇතිහෙයින් කර්මප්‍රභෙදාදිවශයෙන් අනෙක ප්‍රකාරවූ දෙශනාවිලාස ඇති මාගේ බුදුරජශාසනා නම් වනාසේක, එහෙයින් කියලදී—

දෙවයක්ඛමනුස්සානං ලොකෙ අග්ගඵලංදදං,
දදංතං දමයන්තානං පුරිසාජඤ්ඤ තෙ නමො—යි.

මෙතෙකින් මේ ශ්‍රීසද්ධර්මාවවාද සංග්‍රහයෙහි සතර අපායදුක්ආදි සියළු දුකට පැමිණීමට කාරණාවූ එහෙයින්ම අපායමාර්ගවූ අකුශලකර්මවිභාගාදීනව දක්වා නිමවනලදී, මෙසේ සවන පරිච්ඡෙදයෙන් ප්‍රාණඝාතාදි අකුශලකර්මපථ විභාගාදීනව ප්‍රකාශකිරීමෙන් ලෝවැඩ දක්වා තදනන්තරව එම අකුශලකර්මඵලභූමිවූ නරකය තිරිසන් අපාය ප්‍රෙතඅපාය අසුරඅපාය යනසතර අපායන්ගේ ස්වරූප මදක් මෙහි දක්වනු ලැබේ, එහි නරකය නම්—

සඤ්ජීවො කාලසුත්තොච සංඝාතො චෙව රොරුවො,
තාපනො ච පතාපො ච මහාවීචි අථාපරො,
ඉච්චෙතෙ අට්ඨනිරයා මහාඝොරා භයානකා—යි.

යනුහෙයින් සඤ්ජීවය කාලසූත්‍රය සංඝාතය රෞරවය මහාරෞරවය තාපය ප්‍රතාපය අවීචිය යන මොහු ඝොරවූ භයානකමහත් දුක් ඇති අටමහනරකයෝ නම් වන්නාහුයි.

එහි පළමුවනනරකය කඩකඩකොට යම්පලුන්විසින් සිඳිනලද් දුවූ නැවතනැවත කර්මබලයෙන් ජීවිතනැතිනොවනහෙයින් සංජීව නම්විය, ගිනිගෙණ දිලිහෙන කළුහුයගසා සතරැස් අටස් සොළොස් කොට මහත්කුළුපමණ ගිනිගෙණ දිලිහෙන වෑයෙන් සස්නාලද සතුන් ඇතිනරකය කාලසූත්‍ර නම්විය, අයොමයපර්වතයෙන් සතුන් සුන්සුන්කොට මිරිකෙනනරකය සංඝාත නරක නම්වී, කිසේ දයත්?—ඒ නරකයෙහි සත්වයෝ නවයොදුන් පමණගිනිගෙණ දිලිහෙන මපොළොව කටීප්‍රදෙශය දක්වා ගැලී නිශ්චලව සිටිති, එකල්හි පූර්වදිශාභාගයෙන් ගිනිගෙණ දිලියෙනමහත් අයොමය පර්වතයක් නැගී අසනිඝොෂායෙසසින් ගර්ජනාකෙරෙමින් අවුදු සතුන් සිසුම් කොට වටත් තලනහෙයින් සුන්කෙරෙමින් ගොස් පශ්චිම දිශාභාගයෙහි සිටී, පශ්චිම දිශාභාගයෙනුදු දක්ෂිණදිශාභාගයෙ

හුදු උත්තරදිශාභාගයෙහුදු නැගී එනපර්වතයන්ගෙන් එසෙයින්ම මිරිකෙමින් යෙති, දෙදිසායෙන් දෙපර්වතයෙක් එකවිට අවුදු සතුන් උක්දඬුකලඹක්සෙයින් මිරිකාමය, එයින් ඒනරකය **සංඝාත** නම්වී, නිරිසතුන්ගේ නව වනමුඛමාර්ගවලින් සියළු ශරීරයට වදනාගිනිජ්වලාහා ක්ෂාරධූමයෙන් ගුගුරා පස්නා සතුන් ඇතිනරකය **රෞරව** නම්වී, එසේම රක්තලෝහිතජ්වාලයෙන් පරිපූර්ණවූ බලවත් දුකින් ගුගුරා පස්නා සතුන් ඇතිනරකය මහාරෞරවනම්විය, ගිනිගෙණ දිලිහෙන යපොළොව එසේම දිලිහෙන සවුල්හී ඇවිනීහිද නිශ්චලවපැසෙන නිරන්තරවූ ගින්නෙන් තැවෙනසතුන් ඇතිනරකය **තාප** නම්විය, මෙසේම නිරන්තරයෙන් ගිනිගෙණ හිලිහෙන ආයුධයෙන් පැහැර දිලිහෙනයපර්වතයට නැඟුසතුන් කර්මජ්වාලයෙන් පැහැර ඌර්ධපාදකොටගෙණ හෙලා පිවත්ය පොළොව යකඩලින් නැගී දිලියෙන සවුල්හී හිසපටන් ගෙණ ඇවිනිබලවත් දුකින් පැසෙනසතුන් ඇති නරකය **ප්‍රතාප** නම්විය, අග්නිජ්වාලයෙහුදු දුක්ඛයෙහුදු සතුන්විසිහුදු අතුරුනැති අවීචි නම් විය, එහි ජ්වාලයෙන් අතුරුනැති පරිදි කෙසේදයත්?—පූර්වභිත්තියෙන් අග්නිජ්වාලා නැගී සියළුනරක මණ්ඩලය පුරානෙණ ගොස් පශ්චිම භිත්තිය පැහැර විනිවිද එයින් පිටත සියක්යොදුන්තැන පැතිර සිට පශ්චිමභිත්තියෙන් නැගී යන අග්නිජ්වාලායෙහුදු එසේම සකලනරකමණ්ඩලය පුරාගෙණ ගොස් පූර්වභිත්තිය විනිවිද පිටත සියක්යොදුන්තැන් පැතිර සිටී, තුබූනැන් දිශායෙහිදු උඩද යටද එලෙසින්ම අග්නිජ්වාලා තොමෝ පවතිත්, මෙසේ සදිසාවෙන්ම නැගීඑන ෂඩ්විධවූ නිරාගිනිජාලාවන්ගෙන් නිරන්තරවන බැවින් ඒ නරකය අවීචි නම්වේමය.

දුක්ඛයෙන් නිරන්තරපරිදි කෙසේදයත් කායවාරයෙහි උපෙක්ෂා සහගතචිත්තයන් උපතුදු දුඃඛසහගතචිත්තයෙක්ම උපදී, එන කුඩුලවත් යම්සේ ජිහ්වාග්‍රහයෙහි එක්මධුබිඳුවක් තබා එක්තාම්‍ර ලෝහෝ බිඳුවක් තුබූකල අනුදනතයම බලවත්වන බැවින් ඒ මීබිඳින් කම්නැත, එසේසින් කුම්භාණ්ඩසිඡිවාරීම්ආදි උපෙක්ෂාසහගතචිත්තයන් උපතුදු දුක්ඛසහගතචිත්තයාම බලවත්වන බැවින් දුක්ඛයම නිරන්තරය, තුබූසින් ඇතදනැති, මෙසේ දුක්ඛයෙන් නිරන්තරවන බැවින් අවීචිනම්වේමය.

සතුන් විසින් අතුරුනැතිපරිදිකෙසේදයත්?—ඒනරකාභ්‍යන්තරයෙහි සියක්යොදුන්තැන් නලෙක පිරුමල් තුබූ පිටිසෙයින් සතුන් විසින් නිරන්තරය, මෙතනසත්වයෝ ඇති මෙතනසත්වයෝ නැති හෙව නිද ඇවිද පස්නා සතුන්ගෙන් කෙළවරක්නැති යන්ත

න්ට ජීවියන් විසින් හුන්නන් විසින් හොත්තන් විසින් ආවරණ නැති, මෙසේ සත්වයන්විසින් නිරන්තරවන බැවින් අවීචිනම්වේමය.

මේ අටමහානරකයෝ සතරැස්වන්නාහුය, එකී එකී නරකයෙහි සතරසතරවාර ඒ අටමහානරකයෙහිම ඇතුළත්ව දිගපුළුල හා උසප්‍රමාණ සියක් සියක් යොදුන් පමණවන්නාහ, එකී එකී භිත්තිද ඝනපොළොවද යකඩලද ඝණිය නවයොදුන්පමණ ඇත්තාහ, ඒ හැම ප්‍රථම කල්පයෙහි පටන් නිරන්තර පවත්නා නරකගින් නොනන් අතුරුනැතිව දිලිහීදිලිහී හාත්පසින් ඊටහිනුදුසියක්යොදුන් තැන් පැතිරපවත්නාහ, අග්නිජ්වාලාඇත්තාහ, එහි උපන්නිරිසත්හුම ඉන්ධනකෘතාසඞ්ඛ්‍යාතදරකිය සාදන්නාහුයි, මේ අටමහනරකවල එකෙකීවාරයෙහි සතර සතර උත්සදනරකවන බැවින් සොළසක් සොලසක්ව උත්සදනරක එක්සියඅටවිස්සක්හා මහානරක අටහා සමග එක්සියසතිසෙක්වේය, ඒ අටමහානරකයෝ හාත්පසින් ඒ ඒ නරකවල උද්සදහා සමගද දසදහසක්ද පමණ යොදුන් වන්නාහුයි, මෙම කියනලදී ලොකදිපකසාරයෙහි:—

චතුක්කණ්ණො චතුද්වාරො විභත්තො භාගසො මිතො,
අයොපාකාරපරියන්තො අයසා පටිකුජ්ජිතො.

අබ්භන්තරං පනෙතෙසං විත්ථාරා ආයතා පිච,
උබ්බෙධාපිච අඤ්ඤඤ්ඤං සමානා පරිමාණතො.

යොජනසතං සතංයෙව භවන්ති විජානිය,
නවයොජනිකා භිත්ති පුථුලා උපරිපිච.

අයොකපල්ලංහෙට්ඨාපි අයොභූමිසුච තත්තකා,
සමන්තා උස්සදෙනෙව සබ්බංදස සහස්සකං,
දස සහස්සකංයෙව යොජනානං භවන්තිතෙ—යි.

මේ අටමහානරකවල ආයුෂ නම් කවරහයත්?—මිනිස්ලොව අනූලක්ෂයක් අවුරුදු පළමුකොට දුන්වූ සංජීවරනරකයෙහි එක්දවසෙක්වෙයි, ඒනිසායෙන් තිස්දවස් මස්කොට දොළොස්මස හවුරුදු කොට ඒ නිසාහවුරුද්දෙන් ඒ නරකයෙහි පන්සියයක් හවුරුද්දම ආයුෂය, මිනිස්ලොව තුන්කෙළසැටලක්ෂයක්හවුරුදු දෙවනකාලසූත්‍රනරකයෙහි එක්දවසක් වෙයි, ඒ නිසාදවසින් ඒ නරකයෙහි දහසක්හවුරුද්දම ආයුෂය, මිනිස්ලොව තුදුස්කෙළසතළිස්ලක්ෂසක්හවුරුදු තුන්වනසංඝාත නම් නරකයෙහි එක්දවසෙක් වෙයි, ඒ නිසාදවසින් ඒනරකයෙහි දහසක්හවුරුද්දම ආයුෂය, මිනිස්

ලොව සත්පණස්කෙළසැටලක්‍ෂයක්හවුරුදු සතරවන රෞරව නරකයෙහි එක්දවසෙක් වෙයි, ඒ නියාදවසින් ඒ නරකයෙහි සාරදහසක්හවුරුද්දට ආයුෂය, මිනිස්ලොව දෙසියතිස්කෙළ සතළිස්ලක්‍ෂයක්හවුරුදු පස්වන මහාරෞරව නරකයෙහි එක්දවසෙක් වෙයි, ඒ නියාදවසින් ඒනරකයෙහි අටදහසක්හවුරුද්දට ආයුෂය, මිනිස් ලොව දෙයානූකෙළසොළොස් ලක්‍ෂයක්හවුරුදු සවනතාපනම් නරකයෙහි එක්දවසෙක් වෙයි, ඒ නියාදවසින් තිස්දවස් මස් කොට දොළොස්මස්හවුරුදු කොට ඒ නියාහවුරුද්දෙන් ඒ නරකයෙහි සොළොස්දහස්හවුරුද්දට ආයුෂය, සත්වන ප්‍රතාප නරකයෙහි අන්තඃකල්පයකින් අඩියකට ආයුෂය අටවන අවීචිමහනරකය එක්අන්තඃකල්පයකට ආයුෂය.

එහි අන්තඃකල්පය කොපමණ කාලෙක්දැයි කිවහොත්?—එක් මහාකල්පයෙක් සංවර්තය සංවර්තස්ථායිය විවර්තය විවර්තස්ථායියයි සතරෙක් වෙයි, ඒ සතරම සතරඅසඞ්ඛ්‍යකල්ප නම් වන්නාහුයි, එහි අන්තඃකල්පයෙක් නම් අසඞ්ඛ්‍යකල්පවිස්සෙන් පමණ කල් වන්නේය, එක් අන්තඃකල්පයෙක් නම් ශස්ත්‍රයෙන් හෝ රෝගයෙන් හෝ දුර්භික්‍ෂයෙන් හෝ හැමසතුන් විනාශව ගියකල එහි රැකුනු සත්වයන්ගේ සිත්හි කුශලධර්මසමාදානයෙන් දශහවුරුද්දෙහි පටන් ගෙණ ක්‍රමයෙන් ආයු වැඩී ගොස් අසඞ්ඛ්‍යයට පැමිණ අධර්මසමාදානයෙන් ක්‍රමයෙන් දසහවුරුද්දකට බැස පළමුකීක්‍රමයෙන් තුන්සංවර්තයන් අතුරෙන් එකසංවර්තයකින් හැමසතුන් විනාශයට ගිය කල එහි රැකුනුසත්වයන්ගේ සිත්හි කුශලධර්මසමාදානයෙන් දශහවුරුද්දෙහි පටන්ගෙණ ක්‍රමයෙන් ආයු වැඩී ගොස් අසඞ්ඛ්‍යයට පැමිණ අධර්මසමාදානයෙන් ක්‍රමයෙන් දසහවුරුද්දකටබැස පළමුකීක්‍රමයෙන් තුන්සංවර්තයන් අතුරෙන් එකසංවර්තයකින් හැමසතුන් විනාශයට ගියකල්හි එක්අන්තඃකල්පයෙක් වෙයි, මේ පොළොව එක්යොදුන්තුන්ගව්වක් ඝණපමණකලි·

තවද අන්තඃකල්පයෙක් නම් දුනුසියයක් පමණඋසද එසේම දිගපුළුලද ගෙණ කොටුගෙයක් තනා ඒ කොටුගෙයි අබකොට කොටා පුරාගෙණ අවුරුදුසියයක් ගියකල එකිනෙක අබඇටයක් බැගින් ඇර දමා ඒ හැම අනනව ගියකල එක අන්තඃකල්පයෙක් වෙයි, යන මේ උපමාව **ගිහිවිනයෙහිද** දක්වනලදී, අන්තඃකල්ප විභාගය මෙසේ දතයුතු.

මේ අටමහානරකයෝ සිල්වත්නට වරදවාපු සතුන්හා කෛරාටික පුද්ගලයන් තවන්නාහ, බලවත්දුක්වනබැවින් ඝෝරයහ, තාප

අවගත්කල උපන්ගිනි නොනිවෙනබැවින් නිරන්තරවූගිනිසිළුඇති බැවින් මහත්භය උපදවන්නාහ, දක්නටද අසන්නටද නොනිසිවූ මහත්දුක් ඇත්තාහ, මෙහි මහාවීචිය පලල නවයොදුන් යකබලහා සමග තුන්සියඅටළොස්යොදුන, වටින් නවසියසූපනස්යොදුන ඔසුපත්හා සමග දසදහස්යොදුන් පමණය, එහි බොහෝකලක් දුක් විඳ පව්කලසත්වයෝ නරකයෙන් ගම්හසි සිතා පශ්චිමදිග සිටිකල පූර්වදිශාවෙහි දොර හළවාසේ පෙණෙසි, අතරෙහි ඡවලායෙහි මහත් දුක් විඳ එහි සම්ප්‍රාප්තවූකල දොරවැසීයෙසි, තුබුදෙදිශාවෙහිද මෙම්නියායි, මේ ආදිඅනෙකප්‍රකාර ඇති එක්සියසතිසෙක්වේ, පළමුකොට දක්වූ සඤ්ජීවාදි අටමහනරකයන් අතුරෙන් එකැකී නරකයක සතර සතරදිශායෙහි පව්කලසතුන්ගේ වරද නිවරද විචාරීමට නිසියමරජ්ජුරුවන් සතර සතරදෙනා බැගින් දෙතිස්යටරජ්ජුරුකෙණෙක්වන්නාහුය, එසේම යුක්තායුක්ති විචාරීමට සිරිගුත්තඅමාත්‍යයෝද සතර සතරදෙනා බැගින් දෙතිස්දෙනෙක් වන්නාහුය, එසේම පාපකර්මවූ පරිද්දෙන් සතුන්ට අනුශාසනා කරණ නිරයපාලයෝද බොහෝ යමරාක්ෂයෝද ඇත්තාහුය, ඔවුන්ගේම හැසිරීම් ඇති එකෙකී යමරජ්ජුරු කෙණෙකුන්ට යමලෝදශයක් දශයක් බැගින් වනහෙයින් සමොධානවශයෙන් එක්කොට බැලූකල යමරජ්ජුරුවන්දෙතිස්දේනාට යමලෝකයෝද තුන්සියවිස්සක් පමණ වන්නාහුයි; මෙම කීහ **ලොකදීපකසාරයෙහි**:—

ඉමෙසං පන අට්ඨන්නං නිරයානං චතුසු' පි,
දිසාසු යමරාජානො චත්තාරො ච භවන්තිහි.

සිරිගුත්තඅමච්චාපි තථෙව චතුරො සියුං,
යුත්තායුත්තං විචාරෙන්තා යථාකම්මානුසාසයං.

නිරයපාලකා චාපි බහුකා යමරක්ඛසා,
කරොන්තා කම්මකරණං විචාරෙන්ති භයානකා.

සමොධානවසෙනෙතෙ යමලොකාපි සබ්බථා,
විසාධිකාවතිසතං භවන්තීති විජානියා—සී.

මෙසේ ඇත්තාවූ යමරාජාදි ඇමදෙනාවිසින් බලවත්පාපකර්ම කළවුන්ගේ යුක්තා යුක්ති විචාරීමෙක් නැත ඔවුන් බලවත්ව කළ පාපකර්මබලයෙන්ම ඇතුළු නරකවල ඉපද එහි ආයුෂපමණින් ඝොරවූ අනන්තදුක්විඳ ඒ ඒ නරකවල ආයුගෙවී ගියකල පාපකර්ම නොගෙවුනහොත් නරකයන්ගේ පිළිවෙලින්ම එකිනෙකට දුක්විඳ ගොස් නරක ගෙවා සිටිකල කර්මබලයෙන් නැවත මූල මහානරක

යෙහිම උපදිත් එහෙයින් ඔවුන්නිසා කරවනපිනිගවයෙක් නැත, යම් යම්කෙනෙක් දුර්වලපාපකර්මයෙන් උපදින්නෝ ඇතුළුනරක වල නොසිපද පිටත උපදිති, මෙසේ පිටත උපන්නන් යමපල්හු දැක එසේ නරකයෙන් පිටත උපන්නාවූ අභිනව සතුන් යමරජහු සමීපයට ගෙණ ගියමැනවයි සිතා යමරජනුකරා ගෙණයෙත් යමප ල්හුනම් තමන් කළපාපකර්මයෙන් නරකයෙහි ඉපද පව්කළවුන්ට දුක් දෙන්නාවූ යමපල්හුනම්වෙත්, යමරජහුනම් විමානප්‍රෙතයෝයි ඔහු සමහරකාලෙක පාපබලයෙන් දුක් අනුභව කෙරෙති, සමහර කාලෙක පිටනරකයෙහි උපන් සතුන් විචාරා කුසල්කළවුන් සුගති යට පමුණුවයි, ඔහු එකෙකීනරකයෙහි සතර සතරදෙනා වෙත්, ඔහු සතරදෙනම ධර්මිෂ්ඨයහ, තමන් සමීපයට ගෙණ ආසතුන් මෙසේ විචාරති "ලෙඩදුක් ගන්නවුන් ජරාවට පැමිණ දුක්ගන්න වුන් ඉදිමී කුණුව වැදහොත් මිනී දුටුවාද කබල් ගෙණ සිහාත් ගොදුරු නොලැබෙණ මනුෂ්‍යප්‍රෙතයන් දුටුවාද මෙකීනාක් කාරනා දැක කුසල් නොකළාද" යනාදීන් කියා කළපින් ඇත්නම් සඳහන් කරවති, ඒ සඳහන් කරවූ කළ කුසල්කලසත්හු නම් තමන් කුසල් දහම් කළහෙයින් නරකයෙන් ගිලිහී සුගතියෙහි උපදිති, මෙසේ විචාළකල සඳහන් කොට ගතනුහුන යමරජ තෙමේම කළකුසල් සඳහන් කොට සුගතියට පමුණුවයි, එසේ සඳහන් කරන්ට නිසි කුශලයෙක් නැත්නම් "නරකයෙහි දුක්විඳින්ට නිසි මේ පව් කම් තොපගේ දෙමවුපියන් විසින් තොපට කළේත් නොවෙයි, මල්බෑයන් විසින් තොපට කෙළේත් නොවෙයි, සෙසුනෑයන් මිත්‍ර යන් තොපට කෙළේත් නොවෙයි, තොපම කෙළේය, එබැවින් තොප කළපව් තොපම එහි විපාක විඳුව"යි කියා රැහැනිව නිහඬු රුව කරබාගණිති, එකල්හි වටාසිටි යමපල්හු ඔවුන් නරකොට නරකයෙහි දෙපය ඔසවා හිස යටකොට බහාපියත්.

මෙහි අටවන මහාවීචිය අවයවභූතවූ ඉායුවිසින් වෙන් වෙන්වූ දසනරක නම් කවරහයත්?—අර්බුදය නිරර්බුදය අබබය අටටය අහහය කුමුදය සෞගන්ධිකය උත්පලය පුණ්ඩරීකය පදුමය යන මොහුයි.

එහි පළමුවන අර්බුදනරකයෙහි ආයුෂ කෙපමණෙකයත්?— අටලක්ෂයක් තලඇට එක්නැලියෙක් වෙයි, ඒනියාසතරනැලියෙක් එක්ලහස්සෙක් වෙයි, ඒ නියාසතර ලහස්සෙන් එක්ද්‍රොනයෙක් වෙයි, ඒ නියාසතරද්‍රොණයෙක් එක්මාණිකාවෙක්වෙයි, සතරෙක් බාරියෙක් වෙයි, ඒ නියා විසි බාරියෙක් එක්තිලවාහයෙක් වෙයි, ඒවාහයෙහි හාරසියනවකෙළසැටලක්ෂයෙක් තලඇට වන්

ණේය, මෙසින් තලඇටයක් මිනිසුන්ගේ ආයුගණනින් හවුරුදුසියයක් ගියකල හරනානියායෙන් හැරත් ඒ තලහැම ගෙවී ගියත් අර්බුදනරකයෙහි ආයු නොගෙවෙන්නේය, මේ පළමුවන නරකයෙහි ආයුෂයාගේ ප්‍රමාණමහත්බව දක්වූකල ගාලාදි ගණනින් කියත් එක්යාල්නවාමුනුසතරලහසෙක් වෙයි.

දෙවන නිරර්බුද නරකයෙහි මේ නියාවිසිගුණයකට වැඩිආයුෂය, එහිතල විසිගුණයක් වැඩුනුබැවින් විසිවාහයෙක් ප්‍රමාණවෙයි, යහලාදිගණනින් විසිනවයහල එක්මුනුතුන්පෑල්තුන්ලහසෙක, මේ දෙවන නිරර්බුදනරකයෙහි කී පමණතල එක්කොටගෙණ ඒ නියාවිසිගුණයකට වැඩි ආයුෂය තුන්වන අබබනරකයෙහි තලවාහගණනායෙන් සාරසියයක් වාහය, යහලාදිගණනින් පන්සියඅසූ එක්යහල සොළසමුනුඑක්පෑල්පස්ලහස්සෙක, මේ තුන්වන අබබ නරකයෙහි කී පමණතල එක්කොට ගෙණ ඒ නියාවිසිගුණයකට වැඩිආයුෂය සතරවන අටට නරකයෙහි, එහි තුල අටදහසක්වාහය, යහලාදිගණනින් එකොළොස්දහස්සසියසතළිස්සතරමුනුඑක්පෑල් එක්ලාසෙක, සතරවන අටටනරකයෙහි මෙකීපමණතල එක් කොට ගෙණ ඒ නියාවිසිගුණයකට වැඩිආයුෂය පස්වන අහහ නරකයෙහි, හේ එක්ලක්ෂසැටදහසක්වාහය, යහලාදිගණනින් දෙලක්ෂදෙපනස් දහස්සත්සියසත්විසිපසමුනු එක්පෑල්නවලාස් සෙක, පස්වන අහහනරකයෙහි කී පමණතල එක්කොට ගෙණ ඒ නියාවිසිගුණයකට වැඩි ආයුෂය සවනකුමුදනරකයෙහි, හේ තලතිස්දෙලක්ෂයක්වාහය, යහලාදිගණනින් සතළිස්සලක්ෂපණස් සාරදහස්පන්සියපන්සාලිස්යහලනවාමුණු සතරලහස්සෙක, සවන කුමුද නරකයෙහි මෙකී පමණතල එක්කොට ගෙණ ඒ නියාවිසිගුණයකට වැඩිආයුෂය සත්වන සෞගන්ධික නරකයෙහි, හේ තලස කෙලසතිස් ලක්ෂයක්වාහය, යහලාදි ගණනින් නවකෙළඑක්තිස් ලක්ෂඅතුදහස් නවසියනවයහල එකමුනුදෙපෑල් තුන්ලහස්සෙක, සත්වන සෞගන්ධිකනරකයෙහි මෙකීපමණතල එක්කොට ගෙණ ඒ නියාවිසිගුණයකට වැඩිආයුෂය අටවන උත්පල නරකයෙහි, හේ තල එක්නහුත විසිඅටකෙළක්වාහය, යහලාදිගණනින් එක්නහුත සයානූකෙළඅටලොස්දහස් එන්සියදෙයානූයහල සොළොස්අමුණු එක්පෑල්ලහස්සෙක, අටවන උත්පල නරකයෙහි මෙකීපමණ තල එක්කොම ගෙණ ඒ නියාවිසිගුණයකට වැඩිආයුෂය නවවන පුණ්ඩරීකනරකයෙහි, හේ තලපස්විසිනහුත සැටකෙලක්වාහය, යහලාදි ගණනින් සත්සිත්නහුත තෙවිසිකෙලතෙසැටලක්ෂ තෙසැටදහස් සසියසතිස් යහලසතමුනුදෙපෑල දසලහස්සෙක, නවවනපුණ්ඩරීක නරකයෙහි මෙකීපමණතල එක්කොටගෙණ ඒ නියාසිවිගුණයකට

වැඩිආයුෂය දශවෙනි **පද්ම** නරකයෙහි, ශේ තලපස්නින්නහුත දෙලොස්නහුතයක් වාහය, යහලාදිගණිනින් සත්නින්නහුත සුසාලිසනහුත දෙසැත්නෑකෙළ දෙසැත්තෑලක්ෂ දෙසැත්තෑදහස්එක්සිය සත්විසියහලතුදුස් අමුණු දෙපෑල්දෙලහස්සෙක.

මෙහි පළමුවන නරකයෙහි කීවාසේ මතුතුබූ නරකයෙහිදු මිනිසුන්ගේ ආයුගණිනින් හවුරුදුසියයක්සියයක් ගියකල එකෙකී තලඇට හරුත් ඒ නරකවලට ප්‍රමාණ නියමකොට දක්වූ තලරාසීනු ගෙවීයන්නාහුය, ඒ නරකවල එයට වැඩිමහත් නොගෙවෙන ආයුෂයක් ඇත්තාහුයයි දතයුතුයි.

මෙහි කෙළක්නහුතයක් නින්නහුතයක් යනගණනාවෝ කෙසේදයත්?—දසදසයෙක් සියයෙක්වෙයි, දසසියයෙක් දහසෙක් වෙයි සියක්දහසෙක් ලක්ෂයෙක් වෙයි, සියක්ලක්ෂයක් කොටියක් වෙයි, කොටිලක්ෂයෙක් ප්‍රකොටියෙක් වෙයි, ප්‍රකොටිලක්ෂයෙක් කොටිප්‍රකොටියෙක් වෙයි, කොටිප්‍රකොටිලක්ෂයෙක් නහුතයෙක් වෙයි, නහුතලක්ෂයෙක් නින්නහුතයෙක් වෙයි, නින්නහුතලක්ෂයෙක් හුත නහුතයෙක් වෙයි, හුත නහුතලක්ෂයෙක් බම්භයෙක් වෙයි, බම්භලක්ෂයෙක් විස්බම්භයෙක් වෙයි, විස්බම්භලක්ෂයෙක් අබබයෙක් වෙයි, අබබලක්ෂයෙක් අටටයෙක් වෙයි, අටටලක්ෂයෙක් අහහයෙක් වෙයි, අහහලක්ෂයෙක් කුමුදයෙක් වෙයි, කුමුදලක්ෂයෙක් සෞගන්ධිකයෙක් වෙයි, සෞගන්ධික ලක්ෂයෙක් උත්පලයෙක් වෙයි, උත්පල ලක්ෂයෙක් පුණ්ඩරීකයෙක් වෙයි, පුණ්ඩරීක ලක්ෂයෙක් කථානයෙක් වෙයි, කථානලක්ෂයෙක් මහාකථානයෙක් වෙයි, මහාකථාන ලක්ෂයෙක් අසංඛ්‍යයෙක් වෙයි, මෙසින් අසංඛ්‍යය අවසානවූ සංඛ්‍යාවන්ගේ ප්‍රමාණවිභාගයයි දතයුතු.

දක්වනලද ක්‍රමයෙන් ආයුෂප්‍රමාණආදිනොයෙක් විභාග ඇති අටමහානරකය ආදිනරකවල දුකට කවර අකුශලකර්ම කිරීමෙන් සත්වයෝ පැමිණෙන්නාහුදයත්?—යම් සත්වකෙණෙක් ද්වේෂ මෝහ දෙකින් අභිභූතව ප්‍රාණඝාත කරන්නාහුද අධර්මයෙන් ලොව වැසියන්ට දුක්දෙන රාජපුරුෂාදිහුද යම් සත්වකෙණෙක් අන්‍යොන්‍ය සතුරුව යුධකරන්නාහුද මන්පැහැරීම්වශයෙන් අනුන්ට දුක් දී අපරාධයෙහි හැසිරෙන සොරුද යන මේ සියල්ලෝ යට කියනලද ක්‍රම මහදුක් ඇති සඤ්ජීවනරකයෙහි ඉපද නොයෙක් දුක් අනුභව කිරීමෙන් පැසෙන්නාහුයි.

යම් සත්වකෙණෙක් දෙමව්පියන් කෙරෙහිදු ගුණවතනයන් කෙරෙහිදු ද්වේෂකළාහුද, ඔවුන් හා මුසාවාද කීවාහු කාලසූත්‍රනරක

යෙහි ඉපද කළුනුගසා යමරාක්ෂයෝ දඬුකඩක්මෙන් සසින්, අතිකෲරවූ කියත්වලින්නුදු කපමින් දුක් දෙන්නාහුයි.

යම් සත්ත්වකෙනෙක් එළුවන් කොටළුවන් මීවුන් සාවුන් මීයන් ඈ නොයෙක් නම් ඇතිසතුන් මැරුවාහුද හස්තපාදීන් අතුන්ට තලා වෙහෙස දුන්නාහුද ඒ සත්ත්වයෝද හස්ති අස්වදමනයෙහි යෙදී නොයෙක් ලෙසින් ඔවුන්ට දුක් දුන්නාහුද යන මොහු මහිෂාදි නොයෙක් නම් නොයෙක් විරූපශරීර ඇතිව සංඝාත නරකයෙහි ඉපද යටකියනලද ක්‍රමයෙන් මහත්දුක් අනුභව කරන්නාහුයි.

යම් සත්ත්වකෙනෙක් කූටසාක්ෂි කියන්නාහු කූටවෙළඳාම් කරන්නාහුද මායාසඨප්‍රයෝග ඇත්තාහුද ඒ සත්ත්වයෝ රෞරවනරකයෙහි ඉපද බලවත් සන්තාපයෙන් කායචිත්තදෙක තැවීමෙන් ඝෝරවූ නරක ගින්නෙන් දද නිරන්තරයෙන් ගිනිගෙණ දිලිහෙන ශරීරඇතිව භයානකහඬින්හඬමින් මහත්දුක්අනුභවකරන්නාහුයි.

යම් සත්ත්වකෙනෙකුන්විසින් බුද්ධ සංඝ ගුරුන් දුඃඛිතයන්අයිති වස්තු ගෙණ නසනලදද ඒ සත්ත්වයෝ මහාරෞරවනරකයෙහි ඉපද ඝෝරවූ මහත්දුක් අනුභවකෙරෙත්.

පරුෂවචනකියා ගුණවෘද්ධාදි වෘද්ධජනයන්ට වෙහෙසදුන්නාහුද සතර අගතියට ගොස් රටවැස්සන්ට වෙහෙස කළරජදරුවෝද කුශලාකුශලධර්ම නැතයනාදීන් උච්ඡේදදෘෂ්ටිගත්තාහුද යනමොහු තාපනරකයෙහි ඉපද මහත්නරකදුක් අනුභව කෙරෙත්.

එසේම නොයෙක් අකුශලකර්ම කොට ශාශ්වතාදි විපර්යාස දෘෂ්ටි ගෙණ පව්රැස්කළාහුද, ප්‍රතාපනම් නරකයෙහි ඉපද එහි තීක්ෂණගින්නෙන් දද මහත්දුක් අනුභවකරන්නාහුයි.

යම්සත්ත්වකෙනෙක් අධිමාත්‍රපාපයන් කාංශාවක්නැතිවමකරන්නාහුද මාතෘපිතෘඅර්හත්ඝාත ලොහිතුප්පාදසංඝභෙදගනපඤ්චානන්තරියකර්මය කරන්නාහුද බොධිසත්ත්වගුණධර්මයෙහිපිහිටි උතුමන් නසන්නාහුද අධිකගුණඇත්තන් මරා වෙහෙසදෙන්නාහුද දහගොප් බොධිවෘක්ෂ සිඳබිඳ දමන්නාහුද බුද්ධ ධර්ම සංඝයන තුනුරුවන් අයිති වස්තුන්පැහැරගන්නාහුද මිත්‍රද්‍රොහිනම්කළාහුද යම්ජනකෙනෙක් අවෛරවූ මිත්‍රයන්ටද අධිකගුණ ඇතිසතුන්ට භාර්යාවන් කෙරෙහිදු වරදවා පිළිපදනාහුද සුරාපානය කොට ගර්භපහරන්නාහුද ශාශ්වත උච්ඡේදදෘෂ්ටිගත්තාහුද, නොයෙක්ලෙසින් දුස්සීලව පව්රැස්කළාහුද, යන මේ සියල්ලෝ අවීචිමහානරකයෙහි ඉපද මහත් දුකින් පැසෙන්නාහුයි.

එහි උපන්සත්වයෝ ගව් දෙගව් තුන්ගව් යොදුන් පමණ ශරීර ඇත්තාහුය, දේවදත්තයන්ගේ ශරීරය සියක්යොදුන්පමණ විය, ඔවුන්ගේ ශරීරපෙණපිඬු වෙඬරුසේ තර නොවෙයි, මහනෙල්මල් ගබපෙත්තකිහුදු ගැසුව සිවිසමකඩා ගොස් ඇටමුලඹිස නොවෙති මෙසේ දුකටම භාජනව උපන්මොලොක්ශරීර ඇති දෙව්දත්හුගේ හිස අවීචිමහනරකය උඩින් වසා සිටි අයොමයගිනිගෙණ දිලිහෙන යකඩලෙහී බැමයෙන් උඩ ප්‍රවිෂ්ටව මණ්ඩකය වැදිපාදයෝ ගොප් මස් සන්ධිදක්වා එසේම දිලිහෙන යකඩමය භූමියෙහි ගැලී ඉතාතද වෙහෙස විඳිමින් සිටිකල්හි ගිනිගෙණ දිලිහෙන යපොළවින් මහත් යවුලක් නැගී ඒ සියලු ශරීරය විදගෙණ ගොස් හිස විනිවිද යකඩ ලෙහි වැදීසිටිනේය, එසේම පූර්වභිත්තියෙන් ගිනිගෙණදිලිහෙන යවු ලක් නික්ම හෘදමධ්‍යයෙන් වැදී විනිවිද ගොස් පශ්චිමභිත්තියෙන් වැදී සිටිනේය, දක්ෂිණභිත්තියෙහුදු එසේම යහුලක් නැගිගොස් දකුණැලයෙන් වැදී විනිවිද උතුරුභිත්තියෙහි වැදී සිටිනේය, හස්ත තලදෙකද දක්ෂිණඋත්තරභිත්තිදෙක්හි එසේම යවුල් ගසා නිශ්චල කොට සිටුවන ලද්දේය, මෙසේ ඒ නපුරු කල්පනාවෙන්ම නිශ්චල වූ බුදුන් කෙරෙහි වරදවා බොහෝ පව් රැස්කොට ගත්දෙව්දත් තෙම නරකයෙහි බොහෝ නිශ්චලවම දුක්විඳිමින් පැසෙන්නේය, මෙමද කීහ **ලෝකදීපකසාරයෙහි**:—

දෙවදත්තස්ස කායොතු සතයොජනමුච්චතෙ,
සීසං අයොකපල්ලෙ තු පවිඨං හමුකොපරි,
පාද යාව ගොප්ඵසන්ධි පවිඨා අයභූමියං.

තතොතාය භූමියා සඞ්කු යාව සීසාභිනික්ඛමි,
පුරත්ථිමාය භිත්තියා නික්ඛම්ම අයසඞ්කු ච.

විජ්ඣිත්වාන උරං තස්ස භිත්තියන් පච්ඡිමෙ හනි,
දක්ඛිණාය ච භිත්තියා නික්ඛම්ම අයසඞ්කු ච.

විජ්ඣිත්වා දක්ඛිණං පස්සං භිත්තියං උත්තරෙ හනි,
වෙපි හත්ථතලා විඩා දක්ඛිණුත්තරභිත්තියං.

එවං සො නිච්චලෙ බුද්ධෙ පරජ්ඣිත්වාන දුම්මතී,
නිච්චලො යෙව හුත්වාන පච්චති නිරයං භුසං—සී.

මෙසේ නරකයෙහි පැසෙනදෙව්දත්හු අරභයා මිලිඳුරජ නාග සේන සථවිරයන්වහන්සේගෙන් උභතොකොටිකප්‍රශ්නය විචාරණ තැන "බුදුරජ කරුණා ඥානදෙකම ඇතිසේක්දෝහෝ" යි යනාදී ක්‍රමයෙන් විචාළකල දෙව්දත්හු පැවිදි නොලදහොත් බොහෝපව්

රැස් කොට නිරයෙන් නිරයට ඇවිද අවීචියෙහිදු නොයෙක්වර පැසී විඳිනාදුක් සර්වඥතාඥානයෙන්ම දක්නා කරුණාවෙන් පැවිදිකොට දුක් අනාථව ගියකල මතු සට්ඨීසසර නම් පසේබුදුවනබවත් ප්‍රකාශ කොට ප්‍රශ්න විසඳූපරිදි මිලින්දප්‍රශ්නයෙන් අසා දතයුතු, එසේ හෙයින් බුදුරජ කරුණාඥාන ඇතැයි දතයුතු.

තවද මව්පියන් තලා මරා වෙහෙස දුන්නාවූ ලොහොකුඹිනරකයෙහි දිලිහෙන යගුලි මුඛයෙහි හෙලනලදුව පැසෙති, දරුගැජ් හෙලුවෝ බොහෝවාදහස් උඬුමුවහත්ව සිටි ක්ෂුරධාරානරකයෙහිදු පැසෙති, වෙතරණීනම් නරකයෙහිදු පැසෙත්, ශරීරබල භොග බල ආඥබලයෙන් සමන්විතව මේ නරනමැති දුර්වලයන්ට අතින් පහරදීම් ආදිවශයෙන් වෙහෙසුවන්ටද නානාප්‍රකාර ආක්‍රොශ තප්‍රරු පරිභව බැණ අනුන් වෙහෙසුවන්ටද නිරයපාලයෝ දිලිහෙන අසිසත්තිතෝමර භෙණ්ඩිවාල මුද්ගරාදි ආයුධගෙණ පැහැරවිද දුක් දෙති, ඔව්හු නැවත භෙණ්ඩිවාලප්‍රමාණ වෙත්‍රලතායෙන් ගැවසී ගත් කර්මබලයෙන් උපන් දුගීඛවෙත්‍රලතායෙහි නොයෙක්වා දහස් කඩකඩව කැඩී ඉක්බිති වෙත්‍රලතායෙන් ගැලවී දිලිහෙන තල්කඳ සා යකඩහුල්හි මිනිසුන්සේ ඇමිනී නොයෙක්වා දහස්පැසී ඉක්බිති යහුලින් ගැලවී කරමුවාත්වැනි දිලිහෙනපොකුරුපොන හී එසිතුදු නොයෙක්වාදහස් කඩකඩව කැඩී මහදුක් විඳ ඉක්බිතිව දිලියෙන දුම්නැගෙණ දුගීඛක්ෂාරොදකයෙහි දුක්විඳ ඉක්බිති දියයට ගියකල අස්වසෙක් පිහිටෙක් ඇතිද්‍යෙ හෝ ගැලී ක්ෂුරධාරායෙහි කඩකඩව කැඩී ඒ දුක් ඉවසාගතනොහී මහහඬින් හඬන්නාහු කාලක් උඩු නදියට ගෙණයනු ලැබෙති, එකල්හි නරකයෙහි සිටි යමපල්හු හිඳඹු ශස්ත්‍රාදීන් විදිති, එකල්හි මහහඬින් හඬත්; ඉක්බිති දිලියෙන යබිලි බහා නන්වා නගාගෙණ ගිනිගෙණ දිලියෙන යපොළව හොවා මුඛයෙහි ගිනිගෙණ දිලියෙන යගුලි බහාලත්

දන්නොදෙන මසුරනුදු අනුන් දෙන දන් වලකාපු තද මසුරනුදු මහණබමුණන්ට නින්දාපරිහාස බිනුවාහුද ඒ පාපයෙන් පස්වනක් පැනැඇති මහඇතුන් පමණ බල්ලෝ වටාගෙණ තුන්ගව් ශරිර ඇතිව උපන් නිරිසතුන් ලුහුබැඳ හීරුකොටගෙණ යපොළව හොවා පෙරදෙපසින් ලැම්ඩියේ ඇක්ම සිට ඇට තබා මහහඬින් හඬවහඬවා කති, මහත් ගැල්සක්පමණ තුඩුඇති ගිජුළිහිණි ලොහොතුඩින් ඇට විද ඇට මුල් කති, අතිභයානකවූ ලොහොතුඩු ඇතිකාවුඩෝද කත්.

සීලාචාරාදි ගුණසම්පන්න සත්පුරුෂයන්ට තලා වෙහෙස දී මිය ඒ පවින් නරකයෙහි දිලිහෙන තුන්ගව් උසශරීරඇතිව උපන් නන් යමපල්හු දිලියෙන නවයොදුන් යකබල්පිට දී ගිනිගෙණ දිලියෙන තල්කඳසා මුගුරෙන් පයපැහැර හුනුවින්සිපා සුංසුංකෙරෙත්.

අවකාශයක් ලදකලත් දෙමහ පූජාකරමහ විහාරහෝ කර වමහයි' කියා දූහැමින් එක්කොට තුබූවස්තු තමන් සිත්සේ වියදම් කොට එහි විනිශ්චයෙහි යෙදුනවුන්ට අත්ලස් දී මෙතෙක් මෙතෙක් ධන මෙනම් මෙනම් දේට වියදම් කොළෙමහයි කූට සාක්ෂින්ලවා කියවීමෙන් නිවරදිව ඒ ධන නසා මිය නරකයෙහි උපන්නන් යමපල්හු ගිනිගෙණ දිලියෙන ආයුධයෙන් පැහැර ශාලට නොවදිනා ගවයෙක්සේ වටා හීරුකොට දිලියෙනඅඟුරු වල එලති, ඔවුන් අඟුරුවල කටිප්‍රදෙශය දක්වා ගැලුනන් හිසමුදු නෝ මහත් යපැසින් අඟුරු උකා බහත් තුම්බූ කම්බලයෙන් තමන් හිස තුබූම අගුරු බහාලාගනිති, මේදුකින් නොයෙක්වාදහස් මහ හඬින් හඬා පැසෙති.

ආචාරගුණසම්පන්න සීලවන්තතැන්වලට තලාබැණ වෙහෙස දුන්නාහු මිය ඒ පවින් නරකයෙහි උපන්නන් භයානක යමපල්හු මහත්පර්වතහා ගිනිගෙණ දිලියෙන කපමුලුල්ලෙහි සිටිනාලෙහෝ කුඹුනරකයෙහි උඩුයටිකොට ගෙණ බහාලති, එහි නොයෙක් වා දහස්ගණන් පැසෙත්

පක්ෂීන්ගෙණ කර අඹරා මරා මිය එම්පාප කම්බලයෙන් නර කයෙහි උපන්නන් යමපල්හු දිලියෙන ලොහොයොත් කර බැඳ තුන්ගවුපමණවූ නිරිසතුන්ගේ ශරීර තමාකරා අඹරා කඩා කකිය නලොහොදියෙහි බහාලති, කැඩුකැඩුතැන් හටගණියි, මේ නියා යෙන් නොයෙක්වාදහස් පැසෙත්.

ශුඩවූ ශප්තවිධානය දෙවහයි අනුන් අහීන් අයති ගෙණ බොල්අකුරුපස්ආදිය මුසුකොටදී ඒ කම්යෙන් නරකයෙහි උපන් නාහු නොයෙක්කල් නරකයෙහි පැසී එයින් නික්ම මිනාකොට ඇති සිහිල් දියයස් පෙනෙන දියට පිපාස ඉවසානත නොහී පැන් බොමහයි බසියි, ඔවුන් බටකල ඒ නදිය දෙදියාවෙන් ඉවුරු බිඳ වැටී දිය ගැඹුරුවේසි, දිලියෙනා යබුනු වෙයි, ඒ යබුහු කම්බලයෙන් ගෙණ කැකල ශරීරෙ අධොභාගයෙන් නික්මෙයි, ඕහුවූ ඒදුක් අධි වාසනාය නොකොට හෙන්නෝ මහහඬින් හඬහඬා වලපින්.

අනුන්ගේ සවිඥානක අවිඥානක වස්තු සඞ්ගවෙජදදී කොට ගන්නාවූ භයානකවූ නිරයපාලයෝ අරණ්‍යයෙන් මුවන් හීරුකොට වටාගන්නා වැද්දන්සෙයින් ඉසුසහතිතෝමරාදි ගිනි ගෙණ දිලියෙනආයුධ ගෙණ දිරාහියපතක්සේ සිදුරුසිදුරුකොට මහහඬින් හඬව හඬවා විදිති එයින් මහත්දුක් අනුභවකෙරෙත්.

එලුවන් හූරන් ගෙරීන් මීවුන් මුවන් මසුන් මරා මස් විකුණ මින් පවිකලාහු මිය නරකයෙහි උපදිති, එසේ උපන්නන් දිලියෙන

ලොහොයොතින් ග්‍රීවයෙහි බැඳ ඇදගෙලා ලොහොපොළොව හොවා යමපල්හු නානායුධයෙන් කොටති, කඩකඩකොට කපති, යකඩමයපුවරුවෙහි මස්කපාරස් කෙරෙති, මෙසේ නොයෙක්වා දහස් පැසෙත්.

අනිචාරිව තමන්ගිම් සවාමිපුරුෂයන් හැර පරපුරුෂ සෙවනය කළස්ත්‍රීහුද පරස්ත්‍රීසෙවනය කළපුරුෂයෝද මහත්දුකීඛවූ වෙතරණිනම් නරකයෙහිද උසයොදුන්පමණවූ දිලියෙන සොළොස් අඟුල්කටු ඇති සිම්බලිවනයෙහිද ලොහොකුම්බු නරකයෙහිද පැසෙත්.

සවාමීන්කෙරෙහි සවාමීන්ගේ බෑයන්කෙරෙහි බුහුණන් සොහොයුරන් කෙරෙහි ලජ්ජානැතිව පැවති ස්ත්‍රීහු තාපනනරකයෙහි පැසෙයි, එහි තුන්ගවුශරීර ඇතිව පැසෙන්නියගේද දිව තුන්ගව්පමණ වෙයි, ඒ දිව යමපල්හු පිටතට හැද ශස්ත්‍රයෙන් කොටති, එක්හොරනැව් සාපණුවෝද වෙති, මෙසේ නොයෙක්වාදහස් පැසෙත්.

එලුවන්, හුරන්, මසුන්, මුවන්, සොරුන්, හෙරින්, මැරුවෝද කේලම් කියා උණුහුන්කෙරෙහි බිදුවාහුද එවියන් නරකයෙහි උපදිති, එසේ උපන්නන් යමපල්හු ගිනිගෙණ දිලියෙන සැතින් සිපා මිරිකති, දිරාගියපතක්සේ හීයෙන් විද සිදුරුකෙරෙති.

කුලුසටන් කොට කුලුදෙස් කියා මිය එපවින් නරකයෙහි උපදිති එසේ උපන්නන් යමපල්හු ගිනිගෙණ දිලියෙන යකුලෙන් ගසා සිපා මිරිකති.

බඩුයෙහි කූටයෙන් වරදවා අගය තුබුවෝ මිය ඒ පවින් නරකයෙහි උපදිති. එසේ උපන්නන් ගිනිගෙන දිලියෙන යකුලින් ඉස පැහැර විදිති, බිඳුනුනැතින් වැගුරුණු ඉස් මුල් නව සොදුන් දිලියෙන යකබොලහි කකියවා ඔවුන්ටම පොවති, ඉක්බිති ක්ෂාරොද නදියෙහි වැටි පැසෙති, කොක්නහනුද කවුඩුවෝද කැනහිල්හුද ගිජුහුද ලොහොතුඩින් හඬව හඬවා විදිති.

භසමුවන් පැමුවන් මරන්නෝද සේලිහිනියන් බැඳපෑ පක්ෂින් මරන්නෝද මිය ගොස් එපවින් නරකයෙහි ඉපද නානාප්‍රකාරනර කදුක් කම්කටුල් අනුභව කෙරෙත්.

රහපිවාහු මිය එපවින් නරකයේ තුන්ගවුශරිර ඇතිව උපදිති, එසේ උපන්නාහු යමපල්හු ගිනිගෙණ දිලියෙන යපොළව හොවා තුහඹතල්කඳන්සා ගිනිගෙණ දිලියෙනයකුලක් එක්අතක ගසති,

එහි ප්‍රචණ්ඩවායු ඇතිතෙතක නැගුම්බුයෙක එක්කොණක බැඳිවි
යනක් සෙයින් කම්පමානවූවාහු ගිනිගෙණ දිලියෙන නාඹිතල්ක
දන්සා යහුලක් දෙවන අත්හි.ගසති, එකල්හි ප්‍රචණ්ඩවාතයෙන්
කම්පිතවූවියක්සෙයින් කම්පමානවූවාහු ගිනිගෙණ දිලියෙන නාඹි
තල්කදන්සා යහුලක් එක්පයක ගසති, එකල්හි තුන්තැනෙක
බැඳිවියනක්සේ කම්පමානවූවාහු ගිනිගෙණ දිලියෙන නාඹිතල්කද
සා යහුලක් දෙවනපය ගසති, ඉක්බිති කුඹුරු උදුනෙක බැඳිසමක්
සෙයින් ශරීරය මැදින් අහසට පෙරෙවන්නාහු ගිනිගෙණ දිලියෙන
නාඹි තල්කදසා යහුලක් ලසමැද ගසා නිශ්චල කෙරෙති, මෙසේ
පඤ්චවිධ බන්ධනකර්මයෙන් නිශ්චලව වස්නාහු කුමක් රුස්වයි පිළි
විස පිපාසිතයෙමි වහන්සැයි කීකල ගිනිගෙණ දිලියෙන ලොහො
දිය ගෙන්වාගෙණ ලඟා කෙරෙත්, ඒ බලා දුක ඇස්මුවපියා ත්‍රාස
වූවාහු නොකැමැතිපරිද්දෙන් යමපල්හු ගිනිගෙණ දිලියෙන යකඩු
වෙන් මුව විවෘතකොට වත්කෙරෙයි, එකල්හි ඔහු තොල් දවා
දිවු දවා අතුනු දවා අතුනුබහන් දවා අධොභාගයෙන් නික්මයේ,
මෙසේ මහදුක් විඳ පස්නාහු වැලිදු කුමක් රුස්වයි පිළිවිස බඩසා
දුකින් පීඩිතයෙමි වහන්සේයි කීකල්හි යමපල්හු ගිනිගෙණ දිලි
යෙන යවට ගිනිගෙණ දිලියෙන ලොහො පැස බහාගෙණ ලඟ
කෙරෙත්, ඒ බලා බලවත් දුක් දොම්නස් ඇතිව ඇස්වුව පියා
නැතිගත්තාහු නොකැමැතිපරිද්දෙන්ම ගිනිගෙණ දිලියෙන යහ
ඩුයෙන් මුඛය විවෘතකොට එහි යවට බහාලති ඔහු තොල් දිවමුව
උගුර අතුනු අතුනුබහන් දවා අධොභාගයෙන් නික්ම යේ.

මෙසේ නොයෙක්වාදහස් මේ කර්මකටුල් විදී, සකියනදිග
සැලක බහාලූපඩරලාපතක්සෙයින් එක් තැනක නොසිට ලුණු
පිඩක්සේ සිත්විරෙනුව බලවත් දුක් දොම්නසින් නැවිනැවී තිස්වා
දහසකින් පැසී සැලපත්ලට බැස තිස්වාදහසකින් පැසී සැලමුවවි
මට නැගෙන බලවත් දුක්ඇති ලොහොකුඹුනරකයෙහි බහාලනු
ලැබේ. .

මේ හැම අකුශලකර්මයන්ගේ විපාක මුඛයවූ හෙවත් ප්‍රමුඛව ඒ
ඒ පාපකර්මයට දක්වූ කම්කටුල් විසින් කීයේය, බලවත්ව නො
යෙක් පව්කළසත්වයෝවූකලි මෙකීහැම්නරකවලම පිළිවෙළින් ඒ ඒ
නරකවල ආයුකීපමණින් පැසී කළ අකුශලකර්මය ගෙවී නොගිය
හොත් නැවත මහනරකයෙහිම බහාලනුලැබෙත්, ලොකයෙහි
සැපය මේ අයයයි කීයනලදී, ඒ අසඞ්ඛ්‍යාත සැපයක් නැතිහෙ
යින් නිරයනම්වූ නරකයන් අතුරෙන් මහානරකයෙහි එසේ බහල්
නලද පව්කළසත්වතෙම ගිනිගෙණ දිලියෙන අඞ්ගප්‍රත්‍යඞ්ග ඇතිව

බැගෑහඬින් හඬමින් ඔබිනොබ බලා දිවමින් යම්දුකක් අනුභවකෙරේද ඒ දුඃඛයාගේ ඒක දෙශමාත්‍රයක්වත් ප්‍රකාශකරන්නට කවරෙක් සමර්ථද නොහැකිමැයි;

තවද යම්නිරයක්හු අයෝමයවු වැලඳසිටින ගොදුන් ඝනය ඇති යකබල ඇතුලේහි වන්නිවෙගයෙන් දිලිහි පමණ නැති මුහුද දිය සතරදිගින් වඩබාමුඛයෙහි වැහුනුවතුර පැමිණි ඇඟිල්ලෙකින්ම විසලානම් ඒ නරකයාගේ ඇතුලෙහි පවත්නා ගෙමාලොක් ශරීර ඇති මහත්දුකින්පිඩිතවූ වකුලවූ තැනතැන පැකිළෙනවැටෙන කෙණෙහි කෙණෙහි මූර්ඡාව බලවත් සොකයෙන් කම්පිතව ඉතා බැගෑකොට ඒ ඒ දෑ බැන අසරණව නොයෙක් දෑ සිතන අසන්න තුදු වියින් නොඉවසියහැකි පමණනැති බලවත්වූ දුක කවරෙක් වර්ණනාකොට විස්තරයෙන් කියන්නේද නොහැකිමැයි.

අයෝමයවූ මහත්සොලොස් අඟුල්පමණ කටුඇති ගිනිසිලුපෙළින් වැලඳගෙන උසයොදුන් පමණඇති ඉඹුල්ගසට නිරිසතුන් නඟානපිණිස ඡණ්ඩවූ යමදූතයන් විසින් නැවත නැවත ආඥාකරමින් කෙවිටියට අගින් විදිනා තෙජ්දුනු ආදීන් පහරණ යකටුයෙන් පලන අඟපසඟ ඇතිව බැගෑහඬින් හඬමින් භයපත්ව කඳුළුමුසු මුහුනුඇතිව නැවතනැවත නැගෙන්නන් නැගෙමින් සිට මුහුන අඹරාගෙණ සමරාක්ෂයන්ම බලමින් වැලිඳු හසින් ඇස්පිසාගෙණ තමාගේ ශරීරය තමාගේ ශරීරයෙහිම සහවමින් අමුතුසැඟවෙන තැනක් නොලදින් වෙවුලා සිහිමුලාව යම්දුකක් අනුභවකෙරේද ඒ දුකට උපමානම් කවරක්වන්නිද?-මෙසේ නියරයෝ ඉතාදරුනුවූ තැදදුක් ඇත්තේය, එහෙසින් තථාගතවූ බුදුරජතෙම එහිදුකිමෙන් කෙළවර පැමිණිය හැකි නොවෙයි වදාළසේක, මෙහි; ප්‍රකාශවූසේ පිටකත්‍රයෙහි ආනරකදුක් අභිසංක්ෂෙපයක, අනෙකප්‍රකාරයෙන් ඒ ඒ නන්හී නරකදුක් දෙසූ බුදුරජතෙම මෙසේ වදාළ කල නරකදුක් විස්තරයෙන් වර්ණනාකොට දක්වන්ට කවරෙක් සමර්ථද?-ඒකාන්තයෙන් නොපිළිවන්මය.

යම්සේ ගිනිහාසඳුන් යනදෙදෙනාගේ ඒකාකාරයක්නොවේද, වෙනසම වේද්ද, එහෙසින් නරකගිනි හා මෙහිපවත්නා ගිනි,යන දෙදෙනාගේ වෙනසද එබඳුමැයි.

තවද යම්සේ තුන්සියයක් තෙජපහරින් ඇනවිදිනාලද්දහු ගේ වනාමූනත් සහියයක්ව නොසිහියහැකිසේ ඉදින් යම්බලවත් නොඉවසියහැකිදුකෙක් ඇද්ද ඒ දුක්නරකයෙහි දුකට සමනොව

තබැවින් තුන්දහස්යොදුන් හිමාල පර්වතය හා අබ ඇටක්යනමේ දෙක්හි සම බවක් නැත්තාසේ නරකදුකට තෙප්පහරතුන්සියය ලැබීමෙන්වනදුක සමනොවේ.

තවද යට කියනලද ක්‍රමයෙන් මහත්දුක් ඇති අවීචිමහානරකය අසූචිනරකය හලුනරකය කොලහිඹුල්නරකය අසිපත්‍රනරකය ක්ෂාරොදිකානම් නරකය අඟුරුපර්වත නරකය ලොහකුම්භනරකය කලඇත්නරකය ශිහන්යන්ත්‍රනරකය ආදී එක්සියසතිස්නරකයෝම දුකින්පමණනැති නොඉවසියහැකි භයානකඝොරදරුණු දුක් ඇත්තාහ. එහෙයින් ආසන්නවුනුදු එහෙයින් පවිකළසතුන් විසින් විඳුයුතු මහත්දුක් ඇත්තාහුයි, එබදුනරක දුකට පමුණුවන අකුශලකර්මාඑපරිච්ඡේදයෙහි දක්වනලදක්‍රමයෙන් නොයෙක්විහාගාදීනව ඇති පාපකර්මයන් අතුරෙන් එකෙකී කර්මයක්හුගේ විපාකද ඉතාබොහෝව මෙතෙකැයි කියන්නට නොපිළිවන. නොයෙක්වාදහස් මුලුල්ලෙහි සවකීප්‍රකාර දුක් ඇතිනරකවල දුඃඛස්පර්ශකොට විඳීමෙන්ම දතයුතුය, කියන්නෙකුදු එසේවූ නරකදුක් නිඃශෙෂකොට කියා හඟවාද නොහැකිමැයි.

තවද යමෙක් යමෙකුට ගිනිමැඩ ඉන්මෙන්ට තිබෙණබව දූන ගිනියයි, කීපමණින්ම ඇසුවනුගේ පාදය දන්නේ නොවෙයි, එබස් අසාවහාපය නොගෙණ ගිනිඇක්ම සිටියහුගේ පයදූ මනත් දුකට පැමිණෙන්නේය, එසේම බුදුපසේබුදු ආදිමහළතුමන්ගේ වචන නොගැන්මෙන් වින්නාවූ, මේ සියලුභයානක නරකදුක් දූන භයපත්ව එමලතුමන්ගේ වචන මනාකොට ගැන්මෙන් අත්පත් වන සවර්ගමොක්ෂසම්පත් මහත්බැව් සිතනබාගෙණ පවිදුරින්ම දුරුකොට හිතයෙන් කීබස් ගෙණ ගිනි නොමැඩීපුරුෂමෙන් තුව නැතිපුරුෂ සියලුනරකදුකින් ගැලවීමටම උත්සාහකටයුතු.

තවද සම්සේ කටුවෙන් විදිනලද්දහුට හිතෙල් බිඳුව හුණුව වැහිර යනාපමණ පිළියම් පිණිසවූ ගින්නෙන් දැවීම යම්තාක්කල්ද එපමණකල්වත් ඉවසීම යම්සේ උගහටද එසේවූ තැන නොයෙක් වාදහස් නරකයෙහි තීක්ෂණගින්නෙන් එකජ්වාලාවදදූ වෙහෙයෙන්නහුගේ දුක් මෙතෙකැයි පමණකොට කවරෙක් කියන්නේද එසේ එකගින්නක්ව නරකගින්නෙන්දූ වෙහෙසෙන ඒ ගිනිරැසක්හු කම්බලයෙන්ම මිය නොගොස් ජීවත්වීම අහෝ විසමය හා කර්මනම් දෙයත් ඉතාදරුණුබැව් නොසිතිය යුතුමය,

එසේ හෙයින් කර්මවිශෙෂය අචින්තය නොසිය යුතුයයි බුදුන් විසින්ම වදාරණලදී.

තවද ඉතාමඳවූ ස්වල්පතර සැපයක් පිණිසම ඇසිල්ලකින් සිඬවන අකුශලකර්මයක් කොට එ කර්මයාගේ ඵලවිපාක පමණක් නැති කල් කර්මඵලභූමියෙහිලා මෙබඳු මොහම් ඒ කාරණය සද්ධර්මයෙන්ම අසාබලා දූන උමතුවියරුනැති කාරණා කාරණාදන්නා මනුෂ්‍ය යතම මිනිස්වලාව ඇතිනාක් දුක් විඳිමින් පෙලිපෙලී සිට මිද ඇසිලක්වත් නපුරුපව් කිරීමෙහි ආදර නොකරන්නේ මැයි, මෙසේ යට කියනලද නරකදුක් සියල්ල විඳීම පාපයෙහි ඵලම්ය.

එහෙයින් පාපකර්මයන්ගේම ඵලභූමිවූ ඒ සියලු නරකදුකට භය ඇත්තවුන් විසින් පව්කිරීමෙහිදු භයලජ්ජා ඇතිව අකුශලකර්මකිරීමෙන් දුරින්ම දුරුව සියලුවැඩට කාරණාවූ පින්කම් කිරීමෙහි අප්‍රමාදව උත්සාහකටයුතු, මෙසේ ප්‍රමාණාතික්‍රාන්ත නරකදුක් අනුභවකිරීමෙන් දුකවිතවූ අකුශලකර්මබලවූ පරිද්දෙන් නොයෙක්දුක් විඳිනා සියලුසත්වයන් ඒ වූපරිද්දෙන් විශෙෂයෙන් දූන කාලකිරුණුසිත් ඇතිව දනශීලාදී අනෙකවිධ කුශලමාර්ග සෙවීමෙහියෙදී වාසයකාරණ සනාථ්සත්පුරුෂජනයෝ උතුම්අමෘතමහා නිර්වාණමාර්ගය සොයමින් එහි පැමිණ අතිභයානක නරකදුක්ආදි සියළුදුක් නැසීමෙන් නිවන් පුරට පැමිණෙත්වා.

ඉයි ච අමිතදුක්ඛා දුක්ඛිතෙ සබ්බසත්තෙ
අකුසලබලභූතෙ භූතතො සංවිදිත්වා,

විවිධකුසලමග්ගං මග්ගයන්තාසුසන්තො
පරමඅමතමග්ගං මග්ගයන්තා භවන්තු,

සියල්ලදත් බුදුන්විසින් පිටකත්‍රය ධර්මයෙහි ඒ ඒ තන්හි දෙශනාකොට වදාළ නරකදුඃඛයන්ගේ මේ දක්වූයේ සංක්‍ෂෙපමාත්‍රයෙක විස්තරාර්ථීන් විසින් **නිමිජාතකාදියෙහි** බලා දතයුතු, එම බුදුන් විසින්ම වර්ෂසියයක් වර්ෂදහසක් මුළුල්ලෙහි වදාළත් නොගෙවෙන එසාමන්තභයානක නරකදුක් බෝසත්කලද **නිමිරජව** තුමූමගොස් නිරයවල අනෙකප්‍රකාර දුක් විඳිනානිරිසතුන් මසැසින්ම බලා පාපකර්මාදි සියල්ලවිචාරා දූන ලොකයාහට නිරයදුක් දක්වා කරණලද අනුශාසනා ඇතිහෙයින්ද බුදුවූකල අනාවරණවූ සර්වඥතාඥානය වම පෙණීගිය එම නිරයදුක් ප්‍රකාශකිරීමෙන් දෙවිමිනිසුන් සහිත සියලුලොකයාහට කරණලදඋතුම් සද්ධර්මානුශාසනා ඇති හෙයින්ද කරුණාවට ආකරවූ මාගේ බුදුරජාණන්වහන්සේ ශාස්තෘනාමවන සේක, එසේහෙයින් කියනලද මැයි:-

දෙවසක්කමනුස්සානං ලොකෙ අග්ගඵලංදදං,
දදන්තං දමයන්තානං පුරිසාජඤ්ඤ තෙනමො-සි.

මෙතෙකින් මේ ශ්‍රී සද්ධර්මාවවාද සංග්‍රහයෙහි නරකදුඃඛවර්ණනා කියා නිමවනලදී, ලොවැඩපිණිස කරණලද මේ ශ්‍රීසද්ධර්මාවවාද සංග්‍රහයෙහි නිරයදුඃඛවර්ණනාවන්ට ඉක්බිතිව තිරිසන්අපායදුඃඛ වර්ණනා මදක් මෙහි දක්වනුලැබේ.

යම් සත්ත්වකෙණෙක් ඝොරවූ නරකයෙහි පැසීමට නිසිබලවත් වෙෂාධික අකුශලකර්ම නොකොට තිරිසන්යොනියෙහි උපදින්ට නිසි මොහයෙන් අන්ධව බාලජඩපුරුකල්පනායෙන් කටයුතු නොකටයුතු නොදන්න පිනාඪ්‍යාශයෙන් පාපකර්ම කළාහුද, යම් සත්ත්වකෙණෙක් ලොභද්වෙෂ මොහ අධිකව යටකීයනලදක්‍රමයෙන්ම කටයුතු නොකටයුතු නොදන්න බලවත් පාපකර්ම කොට නරකාදි සෙසු අපාදුක් බොහෝකලක් විඳ එයින් මිදී තිරිසන් අපායෙහිදු ඉපද දුක්විඳීමට නිසිව සිටියාහු වීනම් ඔහුද යනමේ හැමසත්හු තිරිසන් යොනියෙහි ඉපද එකාන්ත අහෙතුකයොනි වනබැවින් එහි දුක් විඳිනාහුයි.

එහි ඔවුන්ගේ අහෙතුයෙන්ම පිළිසිඳ ගන්නාබැවින් අහෙතුක ප්‍රතිසන්ධිවශයෙන් ඒ සියල්ලම එක විධයෙවියි, ස්වභාඇසින් දක්නට විෂය අවිෂය වශයෙන් විවිධවන්නාහුයි, ශරීර දික්ලුහුඬුමධ්‍යමවශයෙන් ත්‍රිවිධ වන්නාහුය, සූක්ෂ්මමධ්‍යම මහත්වශයෙනුදු ත්‍රිවිධ වන්නාහුය, බිජුවටෙහිදු වැදෑමස්හිදු ඩාදියෙහිදු ඖපපාතිකවද යන මේ චතුර්විධවූ උත්පත්ති භෙදයෙක් ඇත්තාහුය, සියලු තිරශ්චීනයෝ අපාදයෝය ද්විපාදයෝය චතුස්පාදයෝය බහුප්පාදයෝයයි සතරප්‍රකාරයෙක් වන්නාහුය.

එහි අපාදයෝනම් සර්පමත්ස්‍යාදීහුය, ද්විපාදයෝ නම් පක්ෂිජාතීහුය, චතුෂ්පාදයෝ නම් සිංහ දිවි මුව මහිසාදීහුය, බහුප්පාදයෝ නම් බොහෝපා ඇති ගෝණුසු ආදිසත්හුය, මේ සියලු තිරිසන්හුම ඔවුනොවුන්ට වෙහෙස කොට ගන්නා ස්වභාව ඇත්තාහ, එහෙයින් ඔවුන්ගේ රජහටද කිසිකලකත් සැපනැත, ඔවුන් අතුරෙන් ව්‍යාඝ්‍රද ඌරන් මරාකන්නේය, හූරුද සර්පයන් මරාකන්නේය, සර්ප ගෙමැඩියතුන් මරාකන්නේය, ගෙමැඩියන්හුද ක්ෂුද්‍ර ප්‍රාණීන් මරාකන්නේය, මෙසේ ගොඩවසනසත්හුද යම්සේ ඔවුනොවුන් අනුභවකරන්නාහුද එසේම දියෙහි වසනසත්හුද ඔවුනොවුන් ගොචර කොට ඇත්තාහුයි, එහි මහත් සත්හු ක්ෂුද්‍ර සතුන් අල්වාගෙණ

කන්නාහ, කුඩාසත්හුද අතික්ෂුද්‍රසතුන් අල්වාගෙණ කන්නාහ, ඒ කාරණයෙන් ඔහු හැමදෙනම නිරන්තරයෙන් සොකසහිතව පෙළෙමින් භයට පැමිණම යනාදි නොයෙක් ඉරියව් පවත්වන්නාහුයි.

මනුෂ්‍යයන් වසනතැන්වලට ඉතාදුරු ප්‍රදෙශවල වසන අනෙක ප්‍රකාර තිරිසන්සතුන් අතුරෙන් සම්පොතුමාංශඇට දත් අං ආදි ඒ ඒ ප්‍රයෝජන පිණිස මනුෂ්‍යයෝ අනෙකප්‍රකාරයෙන් බොහෝ සතුන් විනාශයට පමුණුවන්නාහුය, ඒ සත්හු වනාහි තිරිසන්භවයෙහිවූ සියලුදුක් පාපකර්මවූ පරිද්දෙන් අනුභව කෙරෙත්, එහෙයින් ගැලවී ගන්නට නොපිළිවන්වූ මහත්දුක් ඇති තීක්ෂණවූ බලයක් ඇති මහත්භය ඇති සිහින් උභවූ ධර්මසංඥ රාග ඇති සියලුම තිරිසන්ජාතිවල කර්මබලයෙන් ඉපද ධර්මයෙහි මුවනවූ ඉච්ඡාඇතිහෙයින් තිරච්ඡානනම්වූ ඒ හැමසත්හු මියගපත්ව නළම නාකටයුතා හැර සසරම සිතා සසරම හෙව නිරන්තරයෙන් අකුසල් වඩවඩා පුරානතිමින් වසන තිරිසන්සතුන්ගේ ජාතිගණන පවා දක්වීම් කාන්තාර්‍යවූ සියල්ලදත් බුදුනුදුවිසින් දුස්කරය එසේ කළ ඒ පැවති දුක් එක්කොට කවරෙක් වර්ණනාකරන්නේද නො හැකිමැයි.

මෙසේ මෙසේ දුක් හා ජාති මෙතෙකැයි පමණකොට ගතනො හැකි ඒ තිරිසත්සත්හු කුණුවූ මාංශයෙහිද ව්‍රනයෙහිද කකියන අසූචියෙහිද දුර්ගන්ධව පැනනැගී සිට අසූචිනා මිශ්‍රවූ මොලංකනද ගව රවල්ලේද කසලගොඩද වැසිකිලියෙහිද දෙනියෙහිද ගෙවල්හිද ග්‍රාමයෙහිද ක්ෂෙත්‍රයෙහිද පර්වතයෙහිද කඳුරැලියෙහිද ගල්ගුහායෙහිද පොළොව ඇතුළෙහිද ආකාශයෙහිද ජලයෙහිද යම්කිසි කුණු දෙසක්හිදු සියලු සතුන්ගේ ශරීර ඇතුලෙහිදු යනාදි නොයෙක් තැන උපදනාහුයි.

එසින් එකම්නිසෙකුගේ ශරීරයෙහි උපදනා පණුවන් කුල ගණනායෙන් අසූදහසක් කුලවල පණුවෝ ඇත්තාහුයි සෙසු තැන් කියයුතු කිම?-මෙසේ උපදනාතිරියන්ජාති අතුරෙන්, ඇසට නොපෙනෙන තිරිසතුන් පටන්ගෙණ පන්සියයක් යොදුන් දික් ඇති තිමිරපිඞ්ගලනම් මහමසුන් දක්වා අනෙකප්‍රකාර ඇතිව ඉපද කාමතෘෂ්ණා ගොචර තෘෂ්ණා පුරණයිතින් බොහෝපව් පුරාගෙණ මරණභයින් නිරන්තරයෙන් භයපත්ව සිට වැදිකෙවුල් ආදීන් විසින්ද ඔවුනොවුන්විසින්ද ජීවිතවිනාශයට පැමිණීමෙන් බොහෝ දුක් අනුභව කරන්නාහුයි.

මේ ආදි ක්‍රමයෙන් දුක් විඳිනා තිරිසන් සත්හු අනන්තබව එකොකී මිනිසෙකුගේ ශරීරයෙහි අසූදහසක් අසූදහසක් පණුවෝ ඇත්තාහුයයි වදාළහෙයින්ද එකතුඹසක වසන වෙයන් අපමණ හෙයින්ද මුහුදින් අල්ලා ගොඩලන කුඩාසතුන්ගේ රාශිය අපමණ හෙයින්දැයි යනාදිවශයෙන් තිරිසන් යොනියෙහි සතුන් අපමණ බව දතයුතු. තවද සියලු අසූචියට ආකාරවූ මේ ශරීරයෙහි වසන පණුකැලට වදනගෙයද වැඩීමටද ඛබරටද සිටීමටද ඇවිදීමටද හෙව සැතපීමටද ඔවුන්ට ගොදුරුද වැසිකිලිද ගිලන්හල්වද හොග ඓශ්වර්‍ය්‍ය අධිපත්‍යාදිය පැවැත්වීමට නිසිභූමිදමළ ශරීර දවන සොහොනද යන මේ ආදී සියලු කාරණයටම මේ ශරීරයම ස්ථාන වන බැවින් විදර්ශනඥානභාවනා පුරුදුකළාහු නුවනැසින් බලා මේ ශරීරයෙහි ආලය නොකෙරෙත්.

තවද අකුශල කර්‍මයන්ගේ භේදවශයෙන්ම අනෙකප්‍රකාරව සිටි තිරිසන් ජාතීන් අතුරෙන් සමහරසත්තකෙණෙක් දරුවන් ලබති; සමහර සත්කෙණෙක් උපදිති; සමහරෙක් ඇවිදිති, සමහරෙක් ගොදුරුකා ඇවිදිති, සමහරෙක් කාමසෙවනය කෙරෙති, සමහරෙක් හොවති, සමහරෙක් මරණයට පැමිණෙත්.

තවද අතිශයින්ම අසූචියෙහිම ඉපද එමම අනුභවකරණ සුලු සතුන්ගේ ස්වභාව සිතී මෙහුදු ඡර්දි උපදවන්නේය. එසේ සිතන්නවුන්ට පවා පිළිකුල් බව උපදවන සතුන්ගේ ප්‍රකාර කීමෙන් ප්‍රයෝජන කිම,-තවද ගවදෙනුන් ආදීහු අධිකතර හුණුදිය වත්කිරීම් ආදි නොයෙක් ප්‍රයොග කිරීමෙන් ඇඟසම්ලොලන දුකින් වෙවුලමින් යම් දුකකට පැමිණෙද්ද ඒදුකට උපමා කෙරේද?-තවද පක්ෂීහු ඇස්දෙක විදහ බිම්බලා එල්වා ගෙණ මරණ පිණිස ගෙනයන කල යම්දුකකට පැමිණෙද්ද?-දිවි ඇතිවම හුණුදියෙහි බහාලා පිසන කල යම්දුකකට පැමිණෙද්ද?-ඒ දුක් කවරෙක් පමණ කෙරේද?-තවද කිසියම් කලෙකවත් ගොඩනුදුටු එසේම නොසිඳුනු දියෙහි ඇලී වාසයකළ ප්‍රාණීන් කරුණානැති මිනිසුන් විසින් දිවිඇතිවම තිබියදී ගොඩට නඟා රූක්ෂවූ වියලිපස්හි දමනලදුව ගලින් මත්තෙහි වතුරුවා පයෙන් මිරිකීමෙන් වෙහෙස විඳ උපන්දුකින් හා සිත් තැවිලිදුකින් පීඩිතව බලවත් සාපිපාසදෙකින් පෙළිපෙළී ඉතා බැගෑව කොඳුරමින් මවුන් පියන්නෑයන් හා එක්වද ඇසිල්ලකවත් නොරකොට ගතනොහැකි දුක්ඛවෙදනා ඇත්තාහුයි.

තවද ලෙව්හි සක්හැබෙල්ල ගසනසත්හු යම්දුකෙක් ලබද්ද ඔවුන්ගේ ඒ දුක්ඛයෙහි අඹගයෙන් අඹගයකුදු දක්වන්නම නො

හැක්කෙම් තවද ඇතම් සත්කෙනෙක් දණ්ඩෙන්ද අඞ්කුශයෙන්ද කැම්පියෙන්ද පහර ලබමින් කෙවිටෙහුදු විළුඹෙහුදු අතිනුදු ඇන නැති ගන්වා බමවනලද්දාහු නොයෙක් රැහැණින් බඳනාලදින් තමන්ගේ සිත්සේ ඇවිදීමක් නොලැබ තමතමා කළකම්යෙන්ම බන්ධනාදි නොයෙක් දුකට පැමිණෙන ලද්දාහු තුමූ බලා ඇවිද්ද සිටද අහේතුක යොනිසේ සිටිබැවින් දුර්වල සත්ත්වයන්ටම සමගව ඔවුන් සිත්සේ බර උසුලති; යම්කෙනෙකුන්ගේ සියලු පැවතුම් අනුන් අසිතිද සිත්සේ හැසිරීමක් නැද්ද ඔවුන්ගේ දුක්ඛයාගේ ප්‍රමාණය ඔවුන්කෙරෙන් පිටත් කවරෙක් නම් දන්නේද?– තවද ඇතම් සත්ත්වකෙනෙක් රථධුරයෙහිද නඟුලෙහිද ගැල්හිද යනාදිවශයෙන් නොයෙක් ප්‍රකාර බර ඉසිලීමෙහි යොදාලද්දාහු වූත ඇතිකළ ඇතිවද බලනැතිවද නොලස්වසිටිකල්හි දණ්ඩෙන් කෙවිටෙන් වෙහෙසදී බමවනලද්දාහු ඉතා අධිකබරද එවිට මහත් ආයාසයෙන් උසුලන්නාහුයි, එකල්හි ඔහු "මේ බර උසුලන්නට නොපිළිවනැ"යි කියාද ග්‍රීෂ්මයයි කියාද බඩගිනියයි කියාද පිපාසායයි කියාද අධිකබරැයි කියාද යනාදිනොයෙක් අදෝනා කියන්නටවත් නොපිලිවන් මේ තිරිසන් යොනීයෙහි යම්සත්කෙනෙක් හට ශක්තිනැද්ද එසේවූ දුර්වලයන්ටද නොඉසිලියහැකිවූ මහාබරනගා උසුලන්ට අසමර්ථව සිටිකල්හි නැවත නැවත තලති, නැහැයෙහි රැහැණගෙණ අදිති, වාලධීයද හකුළුවාලා මිරිකති කෙවිටින් විදිති, විළුඹින් පහරති; වාලධීමූලය පතුය හොටය පිටය බඩය ඇලය යනාදීතන්හිදු ගින්නෙන් දවති, කන්කපති, අඞ්මුගුරු ආදීන් බමති, හැමපරිද්දෙන්ම පලහා දවති, කැවිමෙන් හිරිද ඇඳපියත්, එකල්හි ඔහු භයපත්ව නැගී සිටීමට අසමර්ථව හොත්තාහු යම්දුකකට පැමිණෙද්ද ඒ දුක් කවරෙක් කියාද?–තවද මේ තිරිසන්යොනියෙහි ලෝවැස්සන් විසින් මෙතෙම දෙවතාවාහනයයි කියා උතුම්කොට දක්වනලද රසයන් අතුරෙන් අග්‍රවූ කිරිද ඝෘතයන්ද දීමෙන් මවකසේයයි ආදරයෙන් පෝෂ්‍යකරණලද මිනිස්නට රක්ෂායෙහි සහාය බැවින් මනොඥයයි කියාද මඞ්ගලසම්මතයයි කියාද පවිත්‍රයහයි කියාද ශුභදෙන්නීයයි කියාද මොවුන් දුට හඬ ඇසුව ශරීරයෙහි අත්ළුව ඕහට යහපත් වන්නේයයි කියා යම් ගවකෙණෙක් ලෝවැසියා විසින් සලකනලදද එසේ මඞ්ගලසම්මතවූ ඔවුන්ගේ දුක් පමණකොට ගත නොහැකිකල ඒ තිරිසන් යොනියෙහි සෙසු සතුන් කෙරෙහි ඇතිදුක් කියයුතු කිම?–ඒ එසේ මැයි.

ලොකයෙහි මඞ්ගලසම්මතවූ ගවදෙන් ආදීහු කණුයෙහි පය බැඳ වට සිසාරා ගිනිකොට පිපාසිතවූවන් නැවත නොපියහැකිවූ ලුණුදිය පොවා විරෙවණව ගියකල අතිදුක්ඛයට හෙතුවූ ඉතාදුක

ගේ කුළුදිය පොවා මහත් දණ්ඩෙන් දයාකරුණා නැතිව තලා ජීව
දූහයෙන් දනුලබන ගොන් ගදන් ආදිහු මහත්දූහයෙන් විඩාව
මිරිකී පාපයෙන්වූ ඵලවිපාකවශයෙන් දක්නාහු විස්මනරව මරණ
භයින් භයපත්ව හඬ ඇතිව හඬන්නාහු දික්කොට නියඹුරු හුරු
ලන්නාහු මලානික බැගෑවූ මුහුණු ඇතිව ඔබ්මොබ බලමින් අප
මණ දුකින් තැවෙන්නාහුයි.

මෙසේ තිරිසන්යොනියෙහිලා ඇසීමෙහිදු දුස්කරවූ නොඉව
සිය හැකි යම්දුකෙක් අනුභව කෙරෙද්ද ඒ දුක්හි තමාගේ ලය
පැලියන්නාක්මෙන් ලොව සියල්ලන් විසින් අනුකම්පා කටයුතුවූ
බාළ බැව්හි පවත්නා යම් කරුණාවෙක් ඇද්ද ඒ කරුණාතො
මෝ තිරිසන් ජාතියෙහි පැමිණියවුන්ට මැයි, ඒ කාරණහෙයින්
කිසේදයි නුවනැත්තෙක් කියානම් හේ මෙසේ දතයුතු.

ඔවුන්ගෙන් මදමද ඇසිල්ලකුදු වෙන්විය නොහැකි තිරිසන්
යොනියෙහි පැටහු අසරණව ඉතාලදරුහෙයින් දුවිලව උපන්තැ
නම හොත්තාහු උදෑසනම නික්ම ගිංමෑනියෝ කුමකින් නොපෙ
ණේදෝ මාගේ පැටහු ඇතයන සිතිවිල්ලකුදු ඇට නැද්දෝහෝයි
සිතා කොඳුරමින් බැගෑවූ ඇස් ඇති මෑනියන්දිශාවට ඒ එනමගේ
ශරීරගන්ධය අසනපිණිස හිඹිනාහු සවස්වේලෙහි ගොඳුරුබිමින්
ආ මව දකිමින් ප්‍රීතියෙන් ඉපිළුණුබැවින් සතුටුව මව, අභිමුඛව
දිවෙති, එසේ දිවගොස් මාතෘප්‍රෙමයෙන් මව සිසාරා පනිමින් කන්
හා වාලධිය සනලීලායෙන් ඒඔවුන් බඩ සායබැවින් අපගේ මවයයි
සිතා කිරි බොන්නට ලඟවුවන් බාලදරුවන් විසින් ගිස් සලසලා
හැඹිම සෙනහයෙන් බලනකල්හි පුත්‍රප්‍රෙමය පවා හැර එම මව්
තොමෝ ඉතා රෞද්‍රවූ දූඩිබැවි පිහිටා එකොණෙහි අනිකකමෙන්
දරුපිළවුන් හඬව හඬවා චචලව වෙවුලමින් සිටියදී ඉඳින් කානම්
එසේවූ තිරිසන් ජාතියෙහි ඇති බිය මෙයින් මත්තෙහි කියයුතු
කිම? මෙසේ යම්තැනක දරුවන්ට මවකෙරෙන්පවා මහත්දුක්බව
පැමිණේ එසේවූ තිරිසන් යොනියෙහි දුක් කෙළවරක් නැත්තේය,
ඉතා මදවූ.හෝ ලජ්ජාවෙද්ද ධර්‍මය යන සිත පමණකුදු මේ නොකට
යුතුකැයි කියාද යන කිසියම් කල්පනාවෙක් ඔවුන්කෙරෙහි
නැත්තේය, එසේවූ තිරිසන් යොනියෙන් ගැලවීමක් කෙසේවේද?
මෙසේ ගැලවී ගැන්මට' නොපිළිවන්වූ නිරන්තරයෙන් උමෙහවූ
මහත්දුක් ඇති අන්‍යොන්‍යභක්‍ෂවූ ඝාතනකම්ක් නැත්තාවූ මොහ
නමැති දැලින් බැඳී මූලා බැවින් අනුවනින්ම වළඳනාලද සියලු
අනර්ථඅවැඩ එක්වූ රැසක් බඳුවූ තිරශ්චානය යන නම් ඇති මේ
භවාග සසර ඇවිදිනා චතුසසත්‍යය නොදත් යමත්පිරිසයින් සෝ

වාන් මාත්‍රයක්වත් නොලත් කෙලෙස් සහිත සත්ත්වයන්ට නොකැමැති පරිද්දෙන්ම තිරිසන්යෝනියට යාව නියතමය, එසේ නැත යන නිසැකයක් නැතිහෙයින් නොකැමැතිසේම තිරිසන් ජාතිවල උපදීම සසරප්‍රමාදව සිටිනා සත්ත්වයන්ට නිත්‍යයෙන්ම වන්නේයයි දැන නිරන්තරයෙන් සංවේගයට පැමිණ භයපත්වූ සිත් ඇතිසත්ත්ව තෙම මේ සියලු තිරිසන් අපායට යනමාර්ගවූ අකුශලකර්මපථ පරිච්ඡේදයෙහි ප්‍රකාශ සියලු පාපකර්මයන්ට මුල්ව සිටි සියලු අවැඩට මුල්වූ අවිද්‍යායයි කියනලද මෝහය දුරුකරණ පිණිස ඇඳි සාඩිස ගිනිගත්තෙක් ඒ ගිනිනිවන්ට වහාකරණ උත්සාහයක් මෙන් අප්‍රමාදව බණ ඇසීමෙන්හා ඒ දහම්වූපරිද්දෙන් සිතනබාගෙණ මෙබඳු සියලුදුකින් මුදා සියලුවැඩට පමුණුවන උතුම් බුද්ධානුශාසනා පිළිපැදීමෙන් අන්ධබාල අකල්‍යාණ සියලු වැඩ සාධාදීමට සභාගවූ අසත්පුරුෂජනසේවනයෙන් දුරුව කල්‍යාණපෘථග්ජනසේවනයෙන්යෙදී එබඳු මිත්‍රයන්ගේම සේවනභජන පයුරුපාසනාදිය කිරීමෙන් හා ඔවුන්කී අවවාද මුදුනෙන් පිළිගෙණ සද්ධර්මශ්‍රවණාදියෙන් අපායමාර්ගවූ සියලුඅකුශලයන්ට මුල්වූ මොහයදුරුකොට නුවනැති පණ්ඩිතබවට පැමිණ සෝවාන්ආදි මාර්ගඵල උපදවන පිණිස අප්‍රමාදව උත්සාහකටයුතු.

මෙසේවූ ප්‍රමාණාතික්‍රාන්තදුකින් ගැලවීගත් තිරිසන්ජාතිවල ඇතිසියලුම දුක් එකාන්තයෙන් දුක්වන්නේයයි දැන ඒ දුකින් මිදෙනුකැමති යහපත් සත්පුරුෂ ජනසමූහයෝම දානාදිපින්කම් කිරීමෙහි අප්‍රමාදවසෙදී ශ්‍රෙෂ්ඨවූ නිවන්පුරයටම පැමිණෙත්වා.

එවං තිරච්ඡානභවෙසු දුක්ඛං
දුක්ඛන්ති ඤත්වා ජනතා සුසන්තා,
පුඤ්ඤෙසු දානාදිසු අප්පමත්තා
පප්පොන්තු නිබ්බාණපුරංව සෙට්ඨං — සී.

ඇසූසත්තව සංවේග උපදනාසේ තිරිසන් ජාතිවල දුක්ප්‍රකාශ කිරීමෙන් දෙව්මිනිසුන් සහිත සියලු ලොකයාහට කරණලද සද්ධර්මානුශාසනා ඇති හෙයින් සවුනේ ගෙවා දත් මාගේ බුදුරජාණන්වහන්සේ ශාස්තෘ නම් වන සේක, එසේ හෙයින් කියනලදී:-

දෙවමනුස්සානං ලොකෙ අග්ගඵලං දදං,
දදන්තං දමයන්තානං පුරිසාජඤ්ඤ තෙ නමො — සී.

මෙතෙකින් මේ ශ්‍රී සද්ධර්මාවවාද සංග්‍රහයෙහි තිරච්ඡාන දුක්ඛවර්ණනා කථා නිමවනලදී, ලෝවැඩපිණිස කරණලද මේ ශ්‍රී සද්ධර්මාව

වාද සංග්‍රහයෙහි නිරවශ්‍යෙන දුක්ඛවර්ණනාවට ඉක්බිතිව ප්‍රේතදුක්ඛ වර්ණනා තොමෝ මදක් මෙහි දක්වනුලැබේ.

යම්සත්ත්වකෙනෙක් තමන්ගේ ශක්තිවූ පරිද්දෙන් භොගබල ප්‍රමාණින් දන් නොදෙන්නාහුද, ඊර්ෂ්‍යාබහුලද තමාගේ සම්පත් සඟ වන ස්වභාව ඇත්තේද ඔහුහැමදෙනද යම් සත්ත්වකෙනෙක් නර කාදී සතරඅපාද්‍යක් විඳීමට නිසි බලවත් පව්කළාහුද ඔහුද යන මේ සියල්ල ප්‍රේත අපායෙහි ඉපද එහි අනන්තදුක් අනුභව කෙරෙත්, එහි සත්ත්වයා අනන්තඅප්‍රමාණදුක් විඳ වෙහෙසීමෙන් රැස්කළාවූ සියලු සම්පත්තියෙහි ලොභයෙන් සිත බැඳුනු සත්ත්වයා මරණින් මත්තෙහි ප්‍රේතභවයට පමුණුවන්නාහු වීනම්, එසේවූ වස්තූන්ට සම්පත්තියෙක අප්‍රියෙක කියා ලෝවැසිතෙම කුමක්පිණිස කියාද ආදිමධ්‍ය අනන්තහැමතන්හිම මේ අප්‍රියෙක වැඩෙකැයි කියා සප යන සම්පත්තිහු ඒ ස්වාමියාට දුක්එලවන්නාහුයි, එහි ප්‍රේතයෝ නම් ස්වකීයවූ තමතමා විසින් කරණලද පාපකර්මයෙන් වැලකී ගිය බත්පැන් ඇතිව අලසනොව එක් තෙනක වැදහෙව සැතපීමක් නැතිව කෙසේ ආහාරයක් ලබම්දෝ හෝයි ඔබින්මොබ මොබින් ඔබ ඇවිදිනා හෙයින් ප්‍රේතයහයි ලද නම්ඇති ඔහු ක්ෂුධාපිපාස දෙකින් පීඩිතව මිරිකීගිය ඉතාකෘශවූ ශරීරය හා මහත්හිස් ඇත් තාහු එසේම දෘශ්‍යමානව පෙණෙනා ඇට සැකිලි ඇති තුනීවූ අතු රු ඇති මහපලඇට හා කොඳු ඇති ඇට ඇති අධිකතරබඩසා දුකින් පීඩිතහෙයින් පිටකොඳුඇටෙහි ඇලිපියා තිබෙන ඉතාවියලි ගිය බඩසම්ඇති මුහුනුකරාම ඉතා වියලීගිය ඉතා ලා ලබුවිලියක් සෙයින් රැලිහුනුහැකිලගිය පිඩිගැට ඇති ඇට සම්නහරම ඉතිරිව තිබෙන ශරීර ඇති ඉතාවලව තිබෙන ඇස් හා යටපාල ඇති දික්ව අවුල්වූ හිසකෙසින් අඳුරුව මුවහකරණලද මූහුනු ඇති ඉතාදික්වූ කර්කශ හිසලොම්හා ශරීරයෙහි ලොම් හා නියපොතු ඇති රෞද්‍රවූ භීෂණවර්ණව රැලිහුනු ශරීර ඇති ලොකයෙහි හැමරුව නැතිවිරූ ප වස්තු එක්කොට සැපිකළාක්වැනි ප්‍රේතතෙම පශ්චාත්තාප දුඃඛන් අතිශයින්ම වියලතලදද දුවුදුවුවන් විසින් ප්‍රත්‍යක්ෂයෙන් පෙණෙන ශ්‍රියා නැති දූකබලා සසරකලකිරීමට නිසිවූ නොවසන ලද රහස්පියෙස් ඇති කම්බලයෙන්ම බත්පිඩක් පැන්පිඩක් නො ලබා බඩගින්නෙන්ම පීඩිතව මහත්විඩාවෙන් සයනාය කරන්නා හුයි.

එසේ හොත් ප්‍රේතයන්ට නොයෙක්වාදහස් ගියකල ඔවුන් ගේම කර්මබලයෙන් ආසාවැඩිවීමට නිසිවූ ‘‘මොබ එව බත්කව පැන් බොව’’යි යන තුච්ඡවූ ප්‍රයෝජන නැති සිස්වූ ශබ්දයෙක් ඇසෙයි, එකල්හි ඒහඬඇසූ හැමදෙනම සතුටුව නැගිසිටිනාට අසමර්ථව බණ්

වැද මුඛයෙන් නික්මයෙයි, මුඛයෙන් වැද ලැමඩියෙන් නික්මයෙයි, ලැමඩියෙන් වැද උදරයෙන් නික්මයෙයි, උදරයෙන් වැද කලව යෙන් නික්මයෙයි, කලවයෙන් වැද සිහින් කකුලෙන් නික්මයෙයි, සිහින් කකුලෙන් වැද දෙපතුලෙන් නික්මයෙයි, එහි ඒ දුක් ඉව සාගත නොහී මහ හඬින් හඬහඬා, නොයෙක්වාදහස් මහදුක් අනු භව කෙරෙත්.

නොබඳ අය හා දඩනෙණ අධර්මයෙන් ගම්වැසියන්ට වෙහෙස දුන් ගම්ලද්දෝ එපවින් නරකයෙහි නොයෙක්වාදහස් දුක් විඳ එපවින් මිදී ගිය කල අවශෙෂ කර්මබලයෙන් මහදියමහදියකලසා අණ්ඩ ඇතිව ප්‍රෙතව උපදිති, හෙතෙම එත්යත් ඒ අණ්ඩයද සරි යෙන් උසුලාගෙණ ඇවිදින්නේය, හිඳිනේවී නම් එම අණ්ඩයෙහිම හිඳිති, ගිජුහුද උකුසෝද ලොහොතුඩු වැනි තුඩින් හඬව හඬවා විදිති, මෙසේ නොයෙක්වාදහස් මුළුල්ලෙහි මහදුක් අනුභව කෙරෙත්.

පරදාරකර්ම කොට මිය එපවින් නරකයෙහි ඉපද නොයෙක්වා දහස් නරකදුක් අනුභවකොට එයින් චුතව ප්‍රෙතයොනියෙහි ඉපද ඉසදක්වා ගැලීයන අසූචිවලෙහි ගී නොයෙක්වාදහස් මහදුක් අනු භව කෙරෙත්.

අසූචි කවයි කියා අනුන්ට බැණ මිය එපවින් නරකයෙහි ඉපද නොයෙක්වාදහස් නරකදුක් අනුභවකොට එයින් චුතව ප්‍රෙතව ඉපද අසූචිවලේ වැටී එම අනුභව කරමින් මහත් දුක් අනුභව කෙරෙත්.

ස්ත්‍රීහු තමන් ස්වාමියන් කෙරෙන් පිටත් සෙසුපුරුෂයන් හා අසද්ධර්මයෙහි යෙදී එපවින් නරකයෙහි ඉපද නොයෙක්වාදහස් නර කදුක් අනුභවකොට එයින් මිදී දිවිනැති ප්‍රෙතීව ඉපද ගිජුහුද උකු සෝද ලොහොතුඩුවැනි තුඩින් හඬව හඬවා විද මහදුක් දෙත්.

දේවගැතිකර්මකොට ලෝවැසියන්ට තොපගේ දුක් දුරලම් යනාදිසෙක්කීමන් ලොවනලවා කෑවාහු මිය එපවින් දුර්ගන්ධ විරූපවූ බැලියනොහැකි භයානක වේස ඇති ප්‍රෙතව ඉපද බඩසාගින්නේ හා පිපාසාවෙන් පීඩිතව මහදුක් විඳිත්.

සොරකම් කොට මිය නරකයෙහි ඉපද නොයෙක්වාදහස් නර කදුක් අනුභවකොට එයින් මිදී ගියකල හිස්නැතිකවන්ධ ප්‍රෙතව උපදිති, ගිජුහුද උකුසෝද ලොහතුඩු වැනි තුඩින් විද මහදුක් දෙත්, ඒ දුක්ඉවසාගත නොහී මහ හඬින් හඬ හඬා පැසෙති.

සිලවන්ත තැන්වලට නින්දාපරිභව බැණ එපවින් නරකයෙහි ඉපද නොයෙක්වාදහස් නරකයෙහි පැසී එයින් චුතව සූකරමුඛප්‍රේතව ඉපද කුස් පිපාසාදෙකින් පීඩිතව මහදුක් අනුභව කෙරෙත්.

කේලාම් කියා සඟුන් ඔවුනොවුන් කෙරෙහි බිඳුවා මිය එපවින් නරකයෙහි ඉපද පොළෝ එක්යොදුන් තුන්ගව්වක් වඩනාතාක් නරකයෙහි පැසී එයින් මිදී අවශෙෂවූ කර්ම්බලයෙන් ප්‍රේතව ඉපද විරූපවූ අවලක්ෂණ පූතිමුඛ අසුචිවැගෙන මුඛඇතිව එහි උපන් පණුවන් හා දුර්ගන්ධව බඩසාගින්නෙන් හා පිපාසයෙන් පීඩිතව නොයෙක්වාදහස් දුක් අනුභව කෙරෙත්.

බත්දෙන්නන් තොපට අසුචිවේවයි බැණ පිළිදෙන්නන් තෙලපිළී තොපට යපටවේවයි බැණ මිය ප්‍රේතයොනියෙහි ඉපද විරූපව අවලක්ෂණව සාපිපාසාදෙකින් පීඩිතව නග්නවූ ශරීරඇතිව මහත් දුක් අනුභවකෙරෙත්, ඔවුන්ට දිව්‍යභොජන දුනද ඒ හැම අසුචිවෙයි, දිව්‍යවස්ත්‍රලදද ගිනිගෙණ දිලියෙන යපට වෙයි.

අනුන්ට දෙන දානාදි උපකාර වස්තූන් දැක අසා දැන ලබන්නන්කෙරෙහි උපන් ක්‍රොධයකින් හෝ තමාගේ කැමතිලෙස අන්කෙණෙකුට පිරිනමා දෙනපිණිස හෝ තමාගේ සිත්සේ ඔවුන්ට නොදෙව මෝහට දෙව යනාදිවශයෙන් කියා අනුන් ලබන ලාභ වැලකූවාහු මිය එපවින් ප්‍රේතව ඉපද දුටුදුටුවන්ට ඉතා පිළිකුල් අප්‍රියතර අරූප වෙති, දියගත් ගිනිසේ කුසය ඇතුළත නිරන්තරයෙන් දිලියෙන ගිනිඇතිවෙති, මුඛය විවෘතකළකල පිටතට ගිනි නැගී දිලියෙයි, මුඛය පියාලූකල මුවගව ගිනිසිලූ පිටතට නික්ම නොගොස් ඇතුළුකුසම දිලියෙයි, යොදුන් පලල යොදුන් ගැඹුර පිරීයන ගඟෙහි හඬ අසා පැන් බොමිහයි සිතා ගඟට බටකළ තුබූ තුබූ පියවර ගිනිනැගී දැ කරව යෙයි, එහි පිනිබිඳුවක් සා දියවිකා කුත් ඇසට නොපැණෙයි, සිහිල් සෙවන කැමතිව රුක් සෙවනකට ගියකල ගිනිරැස් බඳු රැස් ශරීරයෙහි වදනේය, මෙසේ පිහිටක් අස්වැසීමක් නොලබන්නාහු මහදුක් අනුභව කෙරෙත්.

අසුචිවූ නොපිරිසිදු කායවාක් සමාචාරඇති පාපධර්මවූ රහසින් පවුකරණ අශ්‍රමණව ශ්‍රමණප්‍රතිඥ ඇති අබ්‍රහ්මචාරීව බ්‍රහ්මචාරීයෙමියි ලොවට හඟවන සිතඇතුළත නිරන්තරයෙන් උපදනා අකුශල ධර්මයන් විසින් ඇතුළතින් කුණුවූ සන්තානයන් කෙලෙසුන් විසින් මඩනාලද සිත්ඇති නිත්‍යයෙන් සංස්කාර කරන්ට නොහැකි කසල ගොඩක් බඳුවූ දුස්සීල භික්ෂුහුද දුස්සීල සාමණෙරයෝද සාමණෙරීහුද ශික්ෂමානයෝද යන මේ හැමට සිල්රක්ෂාකරණ යහපත් සිල්

ඇති තැන්යයි දෙනලද චතුර්විධ ප්‍රත්‍යයයි බලා ඒ ගුණධර්ම තමන් කෙරෙහි නැතිව ඒ ප්‍රත්‍යය භොජන විඳ මිය නරකයෙහි ඉපද නොයෙක්වා දහස් නරකදුක් අනුභවකොට එයින් චුතව ප්‍රේතව ඉපද සිවුරුද්ද කාබාතුද්ද පාත්‍රද ගිනිගෙණ දිලිසෙයි, එසේ තමන් දවන සිවුරු ආදිය පහකොට ගතනොහෙනුවෝ කල්පාන්ත ගිනි සේ කුස ඇවිල දිලියෙන බඩසාදුක් ඉවසාගතනොහී නොයෙක්වා දවස් මහදුක් විඳිත්.

ආවාසයෙහි ලොභව අනිකෙක්හට නොපැමිණෙවයි යනාදි විසින් මසුරුකොට මිය ඒ ගෙයි ප්‍රේතව ඉපද ඒ ගෙයි කසල උසුලනුවෝ මහදුක් අනුභව කෙරෙත්, සංඝරත්නය සන්තකවූ ලාභයෙහි මසුරුව පුද්ගලික පරිභොගයෙන් එකලාව ප්‍රයොජන විඳ මිය ප්‍රේතව විසීමට ගෙවල්නැතිව මහදුක් අනුභව කෙරෙත්, ගීකියා බෙරගසා නටා ඒ අකුශලකර්මයෙන් ප්‍රේතව උපන්නාහු බලනුවන්ට ප්‍රාසාද තොරණ අට්ටාල ගොපුරප්‍රාකාරාදීන් සශ්‍රීකවූ දෙව්නුවරක්සේ පැණෙනතැන අනුන්ට ගී කියා බෙරවයා නටනුවන්සේ පැණෙන්නාහු මහදුක් අනුභව කෙරෙත්, මවුපියන් කෙරෙහි ලජ්ජා භය නැතිව කල්යවූවෝද සෙසු බලවත් පව් කළෝද යන මොහු බලනුවන්ට පිපිගිය පියුමක්සේ පැණෙන බුරචක්‍රයෙන් හිස පටන්ගෙණ පයදක්වා කඩනුලැබෙත්, සකල ශරීරයෙන් බස්නා රුධිරයෙන් සියලු ශරීරය රත්සඳුන් කල්ක ගැල්වූවාසේ පැණෙති, මෙසේ මහහඬින් හඬහඬා පස්නාහු ගිකියනුවන් පැණෙත්, එසේ පැසෙනුවන්ගේ කර්මගෙව් ගියකල නැවතත් එසේ දුක්විඳීමට නිසි පවුකළාහු ඔවුන්ගේ කර්මබලයෙන්ම බලනුවන්ට පිපිසිටිපියුමක්සේ පෙණෙන ඒ බුරචක්‍රමාලාව දැක මට ලැබේද්‍යෙහෝයි පනා ඉල්වා ලැබගෙන ඔවුන් මුදුහැර පළමුසේම එයින් උපදනා මහදුක්විඳිත්, කලක් කුසල්කොට කලක් අකුසල් කොට ඒ කුශලුදු අකුශලුදු ඒ එකම ජන්මයෙක විපාකදෙන්නේ වී නම් පළමු තමා ප්‍රමාදව විටෙක අකුසලුදු විටෙක කුශලුදු කළපරිද්දෙන්ම ඇතම් දවසෙක ඇතම් විටෙක දිව්‍ය සම්පත් අනුභව කෙරෙති, ඇතම් දවසෙක ඇතම් වේලෙක ප්‍රේතව මහදුක් අනුභව කෙරෙත්, මෙසේ සුවදුක් මිශ්‍රව විඳිමින් වසනුවෝ විමානප්‍රේතයෝ නම් වෙත්.

තවද මෙසේ අනෙකප්‍රකාර දුක් ඇති ප්‍රේතලොකයෙහි ඉපද මහදුක් අනුභවකරණ ප්‍රේතයන් අතුරෙහි පාෂාණ ප්‍රේතවස්තුව නම් කවරනයත්?—හේ මෙසේ දතයුතු.

මේ ලඞ්කාවීපයෙහි රොහණවාසී සැටනමක් උමණ භික්ෂූන් වහන්සේලා එක්ව දඹදිව ජයමහාබොධිය වඳනාපිණිස දඹදිවට

පැමිණ ක්‍රමයෙන් දුරුකතරමග ගෙවා යන්නාහු මහාඅරණ්‍යයට පැමිණ එහි මංමුළාව ගොස් අන්පාරකට පැමිණ නියමමාර්ගයයි සිතා වඩනා භික්ෂූන්වහන්සේලා තුන්දවසක් මන්මුළාව ගොස් ඒ මහවනයෙහි එක්කොෂයක් පමණ තැන වැතිරගෙණ හොත් ප්‍රේතයෙකු දැක ගල්තලාවයයි සිතා හැමදෙනාවහන්සේම එයට නැගී මාර්ගක්ලාන්ත බැවින් ඒ ඒ තැන සැතපුණුසේක්ලාය, එකල්හි මහතෙරුන්වහන්සේ නැගීසිට විදර්ශනා භාවනායෙන් යෙදී සක්මන්කරණසේක් ඒ ප්‍රේතයාගේ හස්තපාද සන්ස්ථාන දැක මේ ප්‍රේතයෙක පර්වතයක් නොවෙයි දැන එකෙණෙහි භික්ෂූන් නැඟැවා "ඇවැත්නි මේ පර්වතයෙක් නොවෙයි, එව බස්ව"යි වදාළ කල්හි ඒ හැමදෙනාවහන්සේ වහා බැස්සාහුයි, එකල්හි ඒ ප්‍රේත මහත් උත්සාහයෙන් හිස නැගුයේය, මහතෙරුන්වහන්සේ ඒ දැක "දුනුපන්සියයක් පමණ භූමිප්‍රදෙශය වසාගෙණ වැදහොත් මහත් ශරීරයකින් සිටියි, සක්මන් කිරීම් ඈ ඉරියව් පෙරළීමක් නැතිව මහදුක් විඳිනා තා විසින් කවර අකුශලකර්මයක් කරණලද දැ"යි විචාළසේක.

එවිට ප්‍රේතතෙම දක්වනුයේ "ස්වාමීන්වහන්ස මම මිනිසෙක්ව පූර්වයෙහිවූ කාශ්‍යප බුදුන් කාලයෙහි සංඝසන්තක දෑ නැසීමි; එසේ සංඝසන්තක ආරාම කෙත්වත් නසා එපවින් මෙබඳු ප්‍රේතදුක් අනුභවකොට මේ ප්‍රේතභවයෙන් මිදී එම පවුබෙලෙන්ම නැවත අවීචි මහානරකයෙහි උපදින්නෙමි"යි දැන්වූයේය.

එවිට මහතෙරුන්වහන්සේ "එම්බා ප්‍රේතය තොප කුමක් කැමැත්තෙහි දැ"යි ඔහු විචාළකල්හි ප්‍රේතතෙම "පිපාසිතයෙමි මාගේ මුඛයෙහි පැන් වත්කළ මැනවැ"යි දැන්වීය, එකල්හි සැටනමක් පමණ භික්ෂූන්වහන්සේලා පාත්‍රසැටකින් ගඟින් පැන්ගෙණවුත් පෙරයම පටන් අරුණුනැගෙන කල් දක්වා නොකඩවම ඒ ප්‍රේතයාගේ මුඛයෙහි පැන් වත්කළාහුය, එසේ දියවත්කිරීමෙන් ඔහුගේ දිවාප්‍රමණවත් නොතෙමුනේය, තෙරුන්වහන්සේ විචාරණසේක් "එම්බල පින්වත මේ සැටනමක් එක්ව රාත්‍රිය මුළුල්ලෙහි පැන් වත්කිරීමෙන් කිසි ආස්වාදයක් ලබනලද්දෙහි දැ"යි විචාළසේක.

එවිට ප්‍රේතතෙම කියනුයේ "ස්වාමීන්වහන්ස ඉදින් මාගේ මුඛයෙහි සත්රැයක් මුළුල්ලෙහිදු දහසක් භික්ෂූහුදු නිබඳ පැන්වත් කරන්නාහු වී නමුත් දිව අග පමණවත් නොතෙමෙන්නේය, කොයින් කණ්ඨයට පැමිණෙන්නේද?—එසේ කල සැප කුමක්පිණිස ලබම්ද? ඉදින් තුබවහන්සේලා විසින් වත්කළ දිය මාගේ ග්‍රීවා

ඇති තැන්යයි දෙනලද චතුර්විධ ප්‍රත්‍යයයි බලා ඒ ගුණධර්ම තමන් කෙරෙහි නැතිව ඒ ප්‍රත්‍යය භොජන විඳ මිය නරකයෙහි ඉපද නොයෙක්වා දහස් නරකදුක් අනුභවකොට එයින් චුතව ප්‍රෙතව ඉපද සිවුරුදු කාබාහුදු පාත්‍රද ගිනිගෙණ දිලිසෙයි, එසේ තමන් දවන සිවුරු ආදිය පහකොට ගතනොහෙනුවෝ කල්පාන්ත ගිනි සේ කුස ඇවිල දිලියෙන බඩසාදුක් ඉවසාගතනොහී නොයෙක්වා දවස් මහදුක් විඳිත්.

ආවාසයෙහි ලොභව අනිකක්හට නොපැමිණේවයි යනාදි විසින් මසුරුකොට මිය ඒ ගෙයි ප්‍රෙතව ඉපද ඒ ගෙයි කසල උසුලනුවෝ මහදුක් අනුභව කෙරෙත්, සංඝරත්නය සන්තකවූ ලාභයෙහි මසුරුව පුද්ගලික පරිභොගයෙන් එකලාව ප්‍රයොජන විඳ මිය ප්‍රෙතව විසීමට ගෙවල්නැතිව මහදුක් අනුභව කෙරෙත්, ගිකියා බෙරගසා නටා ඒ අකුශලකර්මයෙන් ප්‍රෙතව උපන්නාහු බලනුවන්ට ප්‍රාසාද තොරණ අට්ටාල ගොපුරප්‍රාකාරාදීන් සශ්‍රීකවූ දෙව් නුවරක්සේ පැණෙනතැන අනුන්ට ගී කියා බෙරවයා නටනුවන් සේ පැණෙන්නාහු මහදුක් අනුභව කෙරෙත්, මවුපියන් කෙරෙහි ලජ්ජා භය නැතිව කල්යවූවෝද සෙසු බලවත් පව් කළෝද යන මොහු බලනුවන්ට පිපිගිය පියුමක්සේ පැණෙන බුරචක්‍රයෙන් හිස පටන්ගෙණ පයදක්වා කඩනුලැබෙත්, සකල ශරීරයෙන් බස්නා රුධිරයෙන් සියලු ශරීරය රත්සඳුන් කල්ක ගැල්වූවාසේ පැණෙති, මෙසේ මහහඬින් හඬහඬා පස්නාහු ගිකියනුවන් පැණෙත්, එසේ පැසෙනුවන්ගේ කර්මගෙවී ගියකල නැවතත් එසේ දුක්විඳීමට නිසි පවුකළාහු ඔවුන්ගේ කර්මබලයෙන්ම බලනුවන්ට පිපිසිටිපියුමක්සේ පෙණෙන ඒ බුරචක්‍රමාලාව දැක මට ලැබේවාහෝයි පතා ඉල්වා ලැබගෙන ඔවුන් මුදුහැර පළමුසේම එයින් උපදනා මහදුක්විඳිත්, කලක් කුසල්කොට කලක් අකුසල් කොට ඒ කුශලදු අකුශලදු ඒ එකම ජන්මයෙක විපාකදෙන්නේ වී නම් පළමු තමා ප්‍රමාදව විටෙක අකුසලදු විටෙක කුශලදු කළපරිද්දෙන්ම ඇතම් දවසෙක ඇනම් විටෙක දිව්‍ය සම්පත් අනුභව කෙරෙති, ඇතම් දවසෙක ඇතම් වේලෙක ප්‍රෙතව මහදුක් අනුභව කෙරෙත්, මෙසේ සුවදුක් මිශ්‍රව විඳිමින් වසනුවෝ විමානප්‍රෙතයෝ නම් වෙත්.

තවද මෙසේ අනෙකප්‍රකාර දුක් ඇති ප්‍රෙතලොකයෙහි ඉපද මහදුක් අනුභවකරණ ප්‍රෙතයන් අතුරෙහි පාෂාණ ප්‍රෙතවස්තුව නම් කවරනයත්?—හේ මෙසේ දතයුතු.

මේ ලඞ්කාද්වීපයෙහි රොහණවාසී සැටනමක් උමණ භික්ෂූන් වහන්සේලා එක්ව දඹදිව ජයමහාබොධිය වඳනාපිණිස දඹදිවට

පැමිණ ක්‍රමයෙන් දුරුකතරමන ගෙවා සන්නාහු මහාඅරණ්‍යයට පැමිණ එහි මංමුළාව ගොස් අන්පාරකට පැමිණ නියමමාර්ගයයි සිතා වඩනා භික්ෂූන්වහන්සේලා තුන්දවසක් මන්මුළාව ගොස් ඒ මහවනයෙහි එක්කොෂයක් පමණ තැන වැතිරගෙණ හොත් ප්‍රෙතයෙකු දැක ගල්තලාවයයි සිතා හැමදෙනාවහන්සේම එයට නැගී මාර්ගක්ලාන්ත බැවින් ඒ ඒ තැන සැතපුණුසේක්ලාය, එකල්හි මහතෙරුන්වහන්සේ නැගිට්සිට විදර්ශනා භාවනායෙන් යෙදී සක්මන්කරණසේක් ඒ ප්‍රෙතයාගේ හස්තපාද සංස්ථාන දැක මේ ප්‍රෙතයෙක පර්වතයක් නොවෙයි දැන එකෙණෙහි භික්ෂූන් කැඳවා "ඇවැත්නි මේ පර්වතයෙක් නොවෙයි, එව බස්ව"යි වදාළකල්හි ඒ හැමදෙනාවහන්සේ වහා බැස්සාහුයි, එකල්හි ඒ ප්‍රෙත මහත් උත්සාහයෙන් හිස නැගූයේය, මහතෙරුන්වහන්සේ ඒ දැක "දුනුපන්සියයක් පමණ භූමිප්‍රදෙශය වසාගෙණ වැදහොත් මහත් ශරීරයකින් සිටියි, සක්මන් කිරීම් ඈ ඉරියවු පෙරළීමක් නැතිව මහදුක් විඳිනා තා විසින් කවර අකුශලකර්මයක් කරණලද දැ"යි විචාළසේක.

එවිට ප්‍රෙතතෙම දක්වනුයේ "ස්වාමීන්වහන්ස මම මිනිසෙස්ව පූර්වයෙහිවූ කාශ්‍යප බුදුන් කාලයෙහි සංඝසන්තක දෑ නැසීමි; එසේ සංඝසන්තක ආරාම කෙත්වත් නසා එහෙයින් මෙබඳු ප්‍රෙතදුක් අනුභවකොට මේ ප්‍රෙතභවයෙන් මිදී එම පවුබෙලෙන්ම නැවත අවීචි මහානරකයෙහි උපදින්නෙමි"යි දැන්වූයේය.

එවිට මහතෙරුන්වහන්සේ "එම්බා ප්‍රෙතය තොප කුමක් කැමැත්තෙහි දැ"යි ඔහු විචාළකල්හි ප්‍රෙතතෙම "පිපාසිතයෙමි මාගේ මුඛයෙහි පැන් වත්කළ මැනවැ"යි දැන්විය, එකල්හි සැටනමක් පමණ භික්ෂූන්වහන්සේලා පාත්‍රසැටකින් ගඟින් පැන්ගෙණවුත් පෙරයම පටන් අරුණුනැගෙන කල් දක්වා නොකඩවම ඒ ප්‍රෙතයාගේ මුඛයෙහි පැන් වත්කළාහුය, එසේ දියවත්කිරීමෙන් ඔහුගේ දිවාග්‍රමණවත් නොතෙමුනේය, තෙරුන්වහන්සේ විචාරණසේක් "එම්බල පින්වත මේ සැටනමක් එක්ව රාත්‍රිය මුළුල්ලෙහි පැන් වත්කිරීමෙන් කිසි ආස්වාදයක් ලබනලද්දෙහි දැ"යි විචාළසේක.

එවිට ප්‍රෙතතෙම කියනුයේ "ස්වාමීන්වහන්ස ඉදින් මාගේ මුඛයෙහි සත්රැයක් මුළුල්ලෙහිදු දහසක් භික්ෂූහුදු නිබඳ පැන්වත් කරන්නාහු වී නමුත් දිව අග පමණවත් නොතෙමෙන්නේය, කොයින් කණ්ඨයට පැමිණෙන්නේද?—එසේ කළ සැප කුමක්පිණිස ලබම්ද? ඉදින් තුබවහන්සේලා විසින් වත්කළ දිය මාගේ ග්‍රීවාව

ඉක්ම ගියේ නම් ප්‍රේතාත්ම භාවයෙන් මම මිදුනේ වෙමි, සංඝ සන්තක දෙය ගැණීමෙහි පාපකර්මය මෙබඳු කටුකවූ මහත් දුක් ඵල ඕත්නේයයි දැන එයින්ම දුරුවිය යුතු, මාහා සමග සංඝසන්තක ද්‍රව්‍ය අනුභව කල නෑයෝද මාහා සමගම ප්‍රේතාත්ම භාවයට පැමිණියාහුය"යි දක්වා නැවත ඒ ප්‍රේතතෙම "ස්වාමීන්වහන්සේලා කවර කෙණෙකුන්ගේ ශිෂ්‍යයෝද නුඹවහන්සේලාගේ ආචාරීන් වහන්සේ කිනම් සේක්ද"යි ආදරයෙන්ම භික්ෂූන් විචාළේය, ඒඅසා මහතෙරුන්වහන්සේ ඒ ප්‍රේතයාට මෙසේ වදාළසේක:—

සක්‍යරාජකුලෙ ජාතො ජිනො ගොතමනාම ගොතමො,
අම්හාකං භගවා සත්‍ථා තස්ස සිස්සගතා මයං,
වන්‍දනත්‍ථං මහාබොධිං ලඞ්කාදීපා ඉධා ගමුනාති—යි.

මෙසේ "ශාක්‍යකුලයෙහි උපන් ගෞතම ගොත්‍රඇති පස්ම රුන් දිනූ ඒ භාග්‍යවත් ශාස්තෘන්වහන්සේගේ අපි ශිෂ්‍යයෝය, මහාබොධින්වහන්සේ වඳනා පිණිස ලඞ්කාවීපයෙන් නික්ම අවුත් මෙහි පැමිණියමහ"යි වදාළසේක, ඒ අසා හෙතෙම බුදුරජාණන් වහන්සේ ලොකයෙහි උපන්සේකැයි විස්මපත්ව "මම මෙතැන් පටන් සත්දවසක් ඉක්මගියකල්හි අවීචියෙහි උපදිමි, කාශ්‍යප බුදු රජාණන්වහන්සේගේ කාලය පටන් ගෞතම බුදුරජාණන්වහන්සේගේ කාලය දක්වා මෙද්දතුරෙහි මේ භූමිය සත්ගව් පමණ වැඩීමෙන් වර්ෂයන්ගේ අසඞ්ඛ්‍ය ගණන් බොහෝ ඉක්ම ගියාහුය, එතෙක්කල් මුළුල්ලෙහි ප්‍රේතලොකයෙහි පාපකර්මඵලවූ බොහෝ දුක් අනුභව කෙළෙමි, දැනුදු එම අකුශලකර්මශෙෂයෙන් අවීචියෙහි උපදිමි, ප්‍රමාදව ලොභමූලයෙන් උපදනා පාපකර්මය මෙසේ විපුලවූ මහත් දුකට සත්වයා පමුණුවන්නේය, මෙසේ සංඝසන්තකද නැසීම මහත් දොෂඵලවන්නේ වෙයි, යම් කෙණෙක් ඒ සංඝසන්තක ද රක්ෂාකිරීමෙන් ඔවුන්ට විපුලවූ ප්‍රමාණාතික්‍රාන්ත ගුණඵල වීමද මහත්බැව් එසේම දතයුතු.

නැවත ඒ ප්‍රේතතෙම දක්වනුයේ "ස්වාමීනි නුඹවහන්සේලා වඩිනාසේක්ලා, දැන් මාගේ ශරීරය අග්නිජ්වාලාවෝ නිරන්තරයෙන් දවන්නාහුය, එසේවූ මා දැක අප්‍රමාදව බුද්ධානුශාසනයෙහි යෙදෙනසේක්ලා ව"යි දන්වූ කල්හි ඒ භික්ෂූන්වහන්සේලා එයින් නික්ම වැඩියාහුය, එකල්හි ඒ ප්‍රේතයාගේ ශරීරයෙහි අග්නිස්කන්ධ නැගී දිලිනා, ඒ භික්ෂූන්වහන්සේලාද රාත්‍රිභාගයෙහි නික්ම ගව්පමණ මගගෙවා ගොස් සංවෙගයට පැමිණ හැමදෙනාවහන්සේම විශෙෂාධිගමයට පැමිණිසේක, පාෂාණ ප්‍රේතවස්තුව නිමි.

පාෂාණපර්වත ප්‍රේතවස්තුව නම් කවරහයත්?—ඒ මෙසේ දත යුතු, ළමම ලංකාද්වීපයෙහි වැසි ශ්‍රද්ධාසම්පන්න බොහෝ භික්ෂූන්වහන්සේලා එක්ව මහබොධිය වඳනා පිණිස දඹදිව ගොස් ක්‍රමයෙන් දුරුකතර මගයෙගවා අරණ්‍යයකට පැමිණියාහුය, එහි උන්වහන්සේලා මංමුලාව ඒ ඒ දිග බලා ඇවිද ඇත්පාරක් දක ඒ මාර්ගයට පැමිණ යන්නාහු සතරයොදුන් පමණ විස්තාර ඇති මහපර්වතයක් මුදුනෙහි අධිශරීරයක් ගැලී මහදුක් විඳිනා එක්තරා ප්‍රේතයෙකු දක මිනිසෙකැයි සිතා ඒ ප්‍රේතතෙම යම්තැනෙක්හිද එහි පැමිණිසේක්ලා, එසේ ඔහු කරා පැමිණ ඒ ප්‍රේතයා කෙරෙන් තෙරුන්වහන්සේ මග විචාරණසේක් "එම්බල සත්‍වය අපි සත්රෑයක් සත්දවාලක් මංමුලාව ඇවිදිමිහ, එහෙයින් පර්වතමධ්‍යයෙහි සිටම භික්ෂූන්ට මග්දන්ව"යි වදාළසේක. ඒ තෙරුන්වහන්සේගේ ඒ වචනය අසා ඒ ප්‍රේතතෙම මෙසේ දැන්වී, සත්රෑයක් සත්දවාලක් මංමුලාව තුඹවහන්සේලා හැමදෙන ඇවිදිනාහුය, මමවූකලී සතර බුද්ධාන්තරයක් මුළුල්ලෙහි මංමුලාව මේ පර්වතයෙහි අධිශරීරයෙන් ගැලී සිටිමෙනම්"යි දැන්වීය.

එවිට තෙරුන්වහන්සේ "එම්බල තෝ මෙසේ දීර්ඝකාලයක් කවරකාරණයකින් මං මුලාවූයෙහිද? පූර්වයෙහි තාවිසින් කවර පාප කර්මයක් කරණලදදැ"යි විචාළසේක.

මෙසේ විචාරණලද ප්‍රේතතෙම මහ තෙරුන්වහන්සේට දන්වනුයේ "ලොකනායකවූ කකුසඳ බුදුරජාණන්වහන්සේ ලොකයෙහි පහළවූසේක, එසමයෙහි මම මිනිසෙක්ව පාපකර්ම කොට මම මේ ප්‍රේතදුකට පැමිණ සතර යොදුන්පමණවූ මේ පර්වතමුදුනෙහි පවුබෙලෙන් උපන්මි, ඒ මට සතර බුද්ධාන්තරයක් ඉක්ම ගියේය, කවරකලෙක මාගේ පාපකර්ම ගෙවියේද්‍යහෝයි නොදනිමි"යි දන්වූකල්හි මහතෙරුන්වහන්සේ "එම්බල යහළුව බුදුවරයන් බුදුවූකාරණය කුමකින් දන්නෙහිදැ"යි විචාරා වදාළකල්හි මහ තෙරුන්වහන්සේට ඒ කාරණය දන්වන ප්‍රේතතෙම "බුදුවන මහ බෝසතාණන් මව්කුස පිළිසිඳගැන්මෙහිද බුදුවීමෙහිද දම්සක් පැවැත්වීමෙහිද ආයුසංස්කාරයාගේ හැරීමෙහිද පිරිනිවන් පෑමෙහිද බොහෝ විසම්පත් කාරණාපහළවූවාහුය"යි දන්වූකල එම ප්‍රේතයාකෙරෙන්ම ඒ විසම්පත් කාරණ කවරක්හුදැයි විචාරා වදාල තෙරුන්වහන්සේට ඒ කාරණා ප්‍රකාශකොට දන්වන ප්‍රේතතෙම මෙසේ දැන්වීය.

අහස්හිද ගල්පර්වත මස්තකයෙහිද ගල්වතලද පොළෝතෙලෙහිද දියෙහිද යන හැමතැන්හි එදවස් පියුම් පැනනැගුනාහුය, මම ඒ

කාරණයෙන් බුදුවරයෙක් ලොව පහළවූ වගදනිමි"යි දැන්වීය, ඒ අසා මහතෙරුන්වහන්සේ නැවතත් විචාරණසේක් "මෙසේ අතිශයින් කර්කශවූ පමණ නැතිමහදුක් බොහෝ වර්ෂ බුද්ධාන්තර ගණනක් මුළුල්ලෙහි කවර පාපකර්මයක්හුගේ විපාකයෙන් ලබනලද්ද"යි විචාළසේක.

ඒ තෙරුන්වහන්සේගේ වචනය අසා ප්‍රේතතෙම මෙසේ දැන්වීය. "ස්වාමීන්වහන්ස අතීතකාලයෙහි ලෝකනායකවූ කකුසඳනම් බුදුකෙණෙකුන් වහන්සේ ලොව පහළවූසේක, එසමයෙහි මම කෘෂිකර්මයෙන් ජීවත්වන එකෙක් වීමි, සංඝයා සන්තක කුඹුරක් සමීපයෙහි මාගේද කුඹුරවිය, ඒ කුඹුරු දෙකට අතරවූ ඉමනියරෙහි හිඳුව නලද ගල් මැඩ උදුරා නගාගෙණ සංඝසන්තක කුඹුරෙන් ඇතුල්කොටගෙණ ඒ සංඝසන්තක කුඹුරෙහි ගල්මැඩ මා විසින් සදනලද්දේය, මෙසේ සංඝසන්තක කුඹුරෙහි මාවිසින් වර දවා පිළිපැද එම අකුශල බලයෙන් මේ පර්වතමුදුනෙහි අර්ධශරීරයක් ගැලී සිටින ප්‍රේතව උපන්මි, උපන් තැනින් සෙල්වීමක් නැතිවම උපන් තැන්පටන් මේ සාදුක් විඳිමි, මේ දරුණුවූ කර්මාන්තයාගේ ඵලය බැළුව මැනව"යි කියා ඒ ප්‍රේතතෙම ආදරයෙන්ම භික්ෂූන්වහන්සේලා විචාරණුයේ "ස්වාමිවූ තුඹවහන්සේලා හැම දෙනාවහන්සේලා කවරකෙණෙකුන්ගේ ශිෂ්‍යයෝද්ද"යි විචාළේය, ඒ අසා මහතෙරුන්වහන්සේ ඒ ප්‍රේතයාට මෙසේ වදාළසේක:—

පූරෙත්වා පාරමීසබ්බා පත්තො සම්බොධිමුත්තමං,
ගොත්තෙන ගොතමො බුද්ධො තස්ස සිස්සගණාමයං-යි.

යනුයෙන් "සියලු පාරමීධර්මයන් පුරා සම්‍යක්සම්බොධියට පැමිණි ගෞතම ගොත්‍ර ඇති ගෞතම බුදුරජානන්වහන්සේගේ අපි ශිෂ්‍යගණයාවමහා"යි වදාළකල්හි ඒ ප්‍රේතතෙම මේ වචනය ප්‍රකාශකෙළේයි, "ලොකනායකවූ ගෞතම බුදුරජාණන්වහන්සේය"යි යනු සැබව, මම මෙයින් සත්දවසක් ඉක්මගියකල්හි මේ ප්‍රේතාත්මභාවයෙන් මිදී ගොස් අවීචිමහානරකයෙහි ඉපද එහි නොවිඳහැකි උපමා නොකොට හැකි මහාදුක් අනුභවකෙරෙමි, කකුසඳ බුදුරජාණන්වහන්සේගේ කාලයෙහි පටන් ගෞතම ශාසනාන්වහන්සේගේ කාලයදක්වා මෙදතුරෙහි පෘථිවීතොමෝ එක්ගව්වක් අඩුයතර යොදුනක් වැඩීගියකලැයි කියනලද වර්ෂගනනාවෙ බොහෝවූ අසඞ්ඛ්‍යයෝ ඉක්ම ගියාහුය, මෙසේවූ මහත් දුකින් කවරකලක මිදෙම්දෝ හො"යි කියා මෙසේ සංඝසන්තකද නැසීම මහත් දුක් එලවන්නේ වෙයි, යම් කෙණෙකුන් විසින් සංඝ

සන්තකද රක්නාහු වී නම් ඔවුන්ට හැමකල්හිම මහත් ගුණ ඵල වන්නේවෙයි, මෙසේ කර්මප්‍රත්‍යයෙන්ම අනාගතදුඃඛයෝ උපදනාහුයයි දූත පාපධර්මයන් හා එක්වීමක් නොව දුරින්ම දුරුකට යුත්තේය, පාෂාණශල්‍යමහාප්‍රේත වස්තුව නිමි. කාසීප්‍රේතවස්තු නම් කවරහයත්?- තාම්‍රපර්ණිද්වීපනම් මෙම ලක්දිවින් ශ්‍රද්ධාසම්පන්න බොහෝ භික්ෂූන්වහන්සේලා එක්ව මහාබොධිය වදනා පිණිස පළමුපරිද්දෙන්ම නික්ම ගොස් දඹදිව් පැමිණ අනුක්‍රමයෙන් නුවරවල්ගෙවා යමින් ඒ භික්ෂූහු මහ අරණ්‍යයට වැද එහි සත්දවසක් මංමුලාව ඇවිද උන්වහන්සේලාත් පළමුසේම හයනිමාගීයකට බැස යන්නාහු ගිනිගෙණ දිලියෙන යකඩමය නගුලෙක යෙදූ එසේම දිලියෙන මහත් යකඩමයගොන් ඇතිව සීසාමින් මහත් දුක් විඳ වෙහෙස විඳිනා එක්තරා කසී ප්‍රේතයෙකු දැක මිනිසෙකැයි සිතා තුදුරුතෙනක සිට ඒ මහ තෙරුන්වහන්සේ ඔහු අතින් මග විචාළසේක.

එවිට ප්‍රේතතෙම තෙරුන් වහන්සේට මෙසේ දැන්වීය, "නුඹවහන්සේලා ඇම සත්රැසක් සත්දවලක් පමණ මංමුලාවූහ මමවූ කලි, අතුරුකපක් මුළුල්ලෙහි මංමුලාවූයෙමි"යි කීය, ඔහුගේ ඒ වචනය අසා නැවත ඒ ප්‍රේතයා කෙරෙන්ම විචාරණසේක් "මෙසේවූ දීර්ඝකාලයක් කුමකින් තෝ මංමුලාවූයෙහිද එම්බල යහළුවූ තෝ කවරෙක්ද පූර්වයෙහි තාවිසින් කවර පාපකර්මයක් කරණලද්දු"යි විචාළසේක.

එයත් ඇසූ ප්‍රේතතෙම මෙසේ දැන්වීය, "පෙර කාශ්‍යපබුද්ධරජාණන්වහන්සේගේ කාලයෙහි මම සිසානාමිනිසෙක්ව මුඛයෙන් පාපකර්මයක් කොට මේ කසීප්‍රේතාත්මභාවයට පැමිණියෙමි, ඒ මම මේ බුද්ධාන්තරය මුළුල්ලෙහි කිසිවක් නොපිමි; නොකෑමි, නිඳීමක් සැතපීමක් නම් කොයින්ද?-රෑ දවල් දෙක්හි නිරන්තරයෙන් සීසාමින්ම ඇවිදිනෙමි, මෙසේ සීසාමින්ම ඇවිදිනා මගේ ශරීරය ගිනිගෙණ දිලිහෙන්නේය, නගුල්ද රාත්‍රියෙහි වියනගුල්ද ගොන්සීවැල්ද ගිනිගෙණ දිලියෙන්නාහුය, එසේ ගින්නෙන් දනුලබමින් වෙහෙසෙන ශරීරයක් ඇතිව දදු වෙහෙසී මහදුක් විඳිනා මේප්‍රේතලොකයට පැමිණීමට මේ මහා පෘථිවීතොමෝ සත්ගව්වක් වැඩීගියාය, මෙසේ බොහෝ වර්ෂගණනක් කායිකමානසික දුඃඛයෙන් අභිභූතව පෙලි පෙලී දනුලබමින් මහදුක් විඳිමි, පාපකර්මඵලය බැලුවමැනවැ"යි දැන්විය, ඒ ප්‍රේතයාගේ වචනය අසා තෙරුන්වහන්සේ ඔහු කෙරෙන් විචාරණසේක් "කෙබඳුවූ කටුක පාපකර්මයක් තාවිසින් මුඛයෙන් කරණලදද?-ඒ සියල්ල අසනු කැමැත්තෙමි ඒ මට කිවමැනවැ"යි දැන්වූසේක.

ඒ අසා ප්‍රේතතෙම මෙසේ දන්විය "හැමදෙනා වහන්සේ
එක්ව මාගේ වචනය අසුව මැනව, අතීතකාලයෙහි මවිසින් යම්
කර්මයක් කරණලදද ඒ කර්මය ප්‍රකාශකොට කියමි"යි කියා දන්ව
නුයේ "යටගියදවස කසී නම් නුවර කිකීනම් රජ්ජුරුකෙණෙක්
රාජ්‍යයකරන්නේය, ඒ රජ්ජුරුවන්ගේ ඒ නුවර නිසා කාශ්‍යප බුදු
රජානන් වහන්සේ වස්වසා වැඩහිඳ පවරා ඉක්බිති සත්වානුකම්පා
යෙන් දනව් සැරිසරා වඩනාසේක් එසමයෙහි අපවසනානමට
මහත් කරුණායෙන් පැමිණිසේක, එකල්හි ඒ ගම්හි වසන හැම
මනුෂ්‍යයෝම එක්ව කුල්මත්ව ශ්‍රාවක සංඝයා වහන්සේ සහිතවූ ඒ
කාශ්‍යප බුදුරජාණන් වහන්සේ වඩාගෙණවුත් දන්දෙන පිණිස
කලම්නාදද එක්ව කරන්නාහුය, එකල්හි මමද වියනගුල් ගෙණ
සිසානා පිණිස මනුෂ්‍යයන් එක්ව දන්දීමට නිසිදූකරණතැනින්
යන්නෙමි, එවිට මාදෘශ හිතෙෂී වැඩකැමති එක්තරා පුරුෂයෙක්
මට අනුකම්පායෙන් මේ වචනය දන්විය, ඒකෙසේද?-ලොකනාය
කවූ මේකාශ්‍යපබුදුරජානන්වහන්සේ අපකරාපැමිනිසේක,ඒපූජනි
යවූ බුදුන් හැමදෙනා එක්වමනාකොට පුදන්නාහුය, යහලුව තෝ
කුමක් පිණිස නොපුදන්නෙහිද"යි මෙසේ දන්වූකල්හි මම ඔහට
ක්‍රොධව මොහයෙන් විශෙෂයෙන් මුළාව වහාම නොකියයුත්තක්
කීමි, ඉදින් කාශ්‍යප බුදුරජාණන් වහන්සේ මාගේ කුඹුර සිසාදෙන
සේක් නම් එසේ ඇතිකල්හි මමද පුදමි, එසේ නැති නම් කුමට
පුදම්දැයි කීමි, මේ පරුෂවචණය කියා එයින් මිය එම පව්බෙලෙන්
මේ ප්‍රෙතාත්මභාවයට පැමිණ දුඃඛවෙදනාවන් විඳිමි, මෙසේ මහ
දුක් විඳිනා මාදෘශ සංවෙගයට පැමිණිසිත් ඇතිව යහපත් නුවනැති
නුඹ හැමදෙනාවහන්සේම සියලු දුකින් මිදීම පිණිස බුඩානු ශාස
නාවෙහි යෙදුනු මැනවැ"යි කියා ඒ ප්‍රෙතතෙම නැවත විචාර
ණුයේ "නුඹවහන්සේලා කවරකෙණෙකුන්ගේ ශිෂ්‍යයෝද ඒ මට
වදාළමැනවැ"යි දන්විය, එවිට තෙරුන්වහන්සේ වදාරණසේක:-

යොසො දසබලො සත්ථා වෙසාරජ්ජවිසාරදො,
ගොතෙතන ගොතමො බුඩො තස්සසිස්සගතාමයා-ති.

යනුයෙන් "දශබලධාරිවූ චතුවෛසාරද්‍යයෙහි විසාරදවූ ගො
ත්‍රයෙන් ගෞතම නම්වූ යම් ශාස්තෘවූ බුදුරජකෙණෙක් වූසේක්ද
ඒ බුදුරජාණන් වහන්සේගේ ශිෂ්‍යගතයෝ වම්හ"යි වදාළකල්හි
ඒ ප්‍රෙතතෙම තෙරුන්වහන්සේට මෙසේ දන්වූයේය, "ලොකනා
යකවූ ගෞතම බුදුරජාණන්වහන්සේ කෙණෙකැ"යි යනු සැබව
මෙතැන් පටන් සතියක් ගියකල්හි මම අවීචිමහානරකයට පැමි
ණෙන්නෙමි, කාශ්‍යප බුදුරජාණනවහන්සේහටද ගෞතම බුදුරජා
ණන්වහන්සේ යන ශාස්තෘන් දෙදෙනාවහන්සේට මෙදතුරේ මේ

පාපිවීතොමෝ සත්ගව්වක් උසනැතාය, වර්ෂයන්ගෙන් අසංඛ්‍යයෝ ඉක්මගියාහුය, එසේවූ බොහෝ කාලයක් ප්‍රෙතලොකයට පැමිණ දුක්විඳින මාගේ අකුශලකර්මවිපාකය ගෙවී නොගියේය, මෙසින් චුතව ගොස් අවීචිමහානරකයෙහි ඉපද පාපකර්මශෙෂය අනුභව කටයුතුය, අහෝ මොහය මුල්ව කරණලද පාපකර්මය මෙසේ ඉතාවිපුලවූ මහත් දුක්පලවත්තේයි, ගුණ අධික උතුමන් කෙරෙහි වරදවාලීම මෙසේ මහත්දෙෂයක් වන්නේවෙයි, එසේම ඔවුන් කෙරෙහි කරණලද සවල්පතර චිත්තප්‍රසාදයද මහත් සැපඵලවත්තේවෙයි, මේ වචනදෙෂයෙන් අනන්තවූ දුකට පැමිණි කාරණය දැන, වැඩසැපකැමති ඇමදෙනම වචනයෙන් අසත්‍යයෙන් දුරුවීමට උත්සාහකටයුතු, **කාශිප්‍රෙතවස්තුව නිමි.**

**අඪතණ්ඩුලනාළිප්‍රෙතවස්තුව නම්** කවරහයත්?-ඒ මෙසේ දතයුතු, මෙම ලක්දිව අනුරාධපුරයට තුදුරුවූ මිහිනතලා විහාරයෙහි වසන එක් භික්‍ෂූන්වහන්සේ නමක් බොහෝ භික්‍ෂූන්හා සමඟ තමන්වහන්සේගේ ගමට ගොස් එනගම්හෙනි පියාණන්හා එක්ව මිහිනතලා විහාරයට පැමිණ තමන්වහන්සේගේ පියාණන් පිණිස ආරාමිකයන්අතින් හාල්නැලියෙන් භාගයක් ගෙණ පින්පව්විභාග තමන් දන්නාහෙයින් සෙට දවස නැළිය පුරවා හාල්දෙමියි සිතා සංඝසන්තක හාල් නැලියෙන් භාගයක් ගෙණ ඒ භික්‍ෂුතෙම එදා රාත්‍රියෙහිම මිය පරලොව ගොස් ගමටද මිහිනතලාවිහාරයටද අතරෙහි සංඝසන්තකදෙය ගෙණ නැවතදී නිමවා නොගත් පව්බලෙන් ප්‍රෙතව ඉපද මහදුක් අනුභවකරන්නේය.

එකල්හි පිණ්ඩචාරීවූ එක භික්‍ෂූන්වහන්සේ නමක් ඒ මාර්ගයට පැමිණ වඩනාසේක් පශ්චිමයාමයෙහි ගිනිකඳක්මෙන් දිලියෙන්නාවූ ඒ ප්‍රෙතයා දැක වදාළසේක, එසේ දැක කම්පාවූ සිත්ඇති කරුණාවට ආකාරව සිටි ඒ භික්‍ෂූන්වහන්සේ ඒ ප්‍රෙතයාකෙරෙන්ම විචාරණසේක් "දීර්ඝවූ ශරීරයක් ඇති දුර්ගන්ධවූ ගිනිකඳක්මෙන් දිලිහී පෙණෙන ඇටසම්වැලදිමාත්‍රාවසිටි තෝකවරෙක්දැ"යි විචාළසේක, එවිට ප්‍රෙතතෙම කියනුයේ "ස්වාමීන්වහන්ස සාපිපාසයෙන් පීඩිතව දුඃඛිතවූ මම සවල්පවූ පාපකර්මයක් කොට මේ ප්‍රෙතලොකයෙහි උපන්මියි" දැන්වූයේය, ඔහුගේ වචනය අසා තෙරුන්වහන්සේ නැවතත් ඔහුවිචාරණසේක් "කායවාක්මනොයන මාරත්‍රයෙන් පූර්වයෙහි තාවිසින් කවරපාපකර්මයක් කරණලදද?-කවර අකුශලවිපාකයකින් ප්‍රෙත ලොකයට පැමිණියේදැ"යි විචාරා වදාළකල්හි ඒ තෙරුන්වහන්සේට ඒ ප්‍රෙතතෙම දන්වනුයේ "මම මීට පෙර ජාතියෙහි භික්‍ෂුනමක්ව මිහිනතලාවිහාරයෙහිම වාසය කෙළෙමි,

එකල්හි එයි පැමිණි මාගේ පියාණන්ට අනුභව කරණ පිණිස එක් වේලකට සෑහෙන පමණ සාලක් සොයා නොලැබ ඒ විහාරපිරිමැසිමෙහි ආරාමිකයින් අතින් සංඝසන්තකවූ සාලෙන් සෙට දවස නැළිය පුරවා දෙමියි සිතා නැළියෙන් භාගයක් ගෙණ සිතූලෙස දෙන්ට නොහැකිව එමරාත්‍රිභාගයෙහි කාලක්‍රියා කොට ප්‍රේතාත්මභාවයට පැමිණියෙමි"යි දන්වීය.

ඔහුගේ එම වචනය අසා තෙරුන්වහන්සේ ඔහට වදරණසේක් "ඒ භික්ෂූනම මම දනිමි, හෙතෙම සීලසම්පන්නය, බහුශෘතය, මෙබඳුසීල සම්පන්නවූ ශික්ෂාකාමී යහපත් තැන කවරකාරණයකින් දුගතියට පැමිණිසේක්ද"යි මෙසේ විචාළසේක, තෙරුන්වහන්සේගේ වචනය අසා ප්‍රේතතෙම නැවතත් තෙරුන්වහන්සේට දන්වනුයේ "ඒ භික්ෂූතෙම සීලසම්පන්නය, බහුශ්‍රැතය, බුද්ධසස්නෙහි ඇළුම් ඇතිසේක, එසේ වුවත් සංඝසන්තකදෙය ගැණීම ඉතා ආසන්නව සම්පහෙයින් එම ඵලවිපාකදීම් වශයෙන් පැසෙන්නේය, එබැවින් යම්කිසි සවල්පතර සංඝික භාණ්ඩයක් වී නමුත් සවල්පයයි සිතා සරුනැතිකමක් අවඥවක් නොකරන්නේයි, එසේ ප්‍රමාදවශයෙන් කළහොත් ඉතා සවල්පතර පාපකර්මයවී නමුත් විපාකකාලනම්වූ ඵලදෙන තැන ඉතාවිපුලවූ දුක්ඛඵලය පමුණුවා දෙන්නේය"යි ප්‍රේතතෙම කීකල්හී තෙරුන්වහන්සේ ඒ ප්‍රේතයාකෙරෙන්ම නැවතත් විචාරණසේක් "කවරනම් කුශලයක් කොට තාගේ මේ දුක්ඛයෙන් මිදීමවන්නේද"යි පිළිවිසිකල ඒ ඇසූප්‍රේතතෙම මෙසේ දන්විය, ඒ කෙසේද?–

මිහින්තලා පර්වතයපටන් යම්තාක් එගමද මේ අතර තුන්ගව්වක් පමණ ඇති මාර්ගයෙහි ගැලින් ගැලපැහැර සිටිනාසේ අතුරු නොකඩව ගැල් සඳ ඒ සියලු රථවල සාල් පුරවමින් ගෙණ ඉදින් සංඝයාවහන්සේට දන් දුන්නේ වී නම් එසේ ඇති කල්හි මම මේ ප්‍රේතාත්මයෙන් මිදෙමි"යි දන්වූයේය, "මෙසේ නැලියෙන් භාගයක් පමණවූහාල් දෙවන ජාතියෙහි දෙතගෙයින් විපුලව බොහෝ බවට පැමිණියේ වෙයි, ඉදින් මේදෙවනජාතියේවත් එසේ නුදුන හොත් මාගේ දුක්ඛයෙන් මිදීමත් දුර්ලභය"යි ප්‍රකාශකෙළේය.

ඒ අසා තෙරුන්වහන්සේ අළුයම් රාත්‍රිය ඉක්මගියකල්හි අනුරාධපුරයට ගොස් සද්ධාතිස්සරජ්ජුරුවන්ගේ ඉදිරියට පාත්‍රයගෙණ වැඩසිටිසේක, ඒ රජතෙම උන්වහන්සේ අතින් පාත්‍රය ලබාගෙණ නැවත තෙරුන් වැඳ වැඩිකරුණු විචාළේය, එවිට තෙරුන්වහන්සේ ඒ ප්‍රවෘත්තිය ප්‍රේතතෙම කී පරිද්දෙන් විස්තරකොට වදාළ

සේක, තෙරුන්වහන්සේගේ වචනය අසා **සද්ධාතිස්ස** නම් මහරජ තෙම ඒප්‍රේතයා දුකින් මුදනු කරුණා උපදවා කියනලද ක්‍රමයෙන්ම තුන්ගව්වක් පමණතැන් ගැල්පිළිවෙලින් සදා ඒ හැමගැල් සාලෙන්ම පුරා පින් කැමති රජතෙම ප්‍රේතයා සඳහන්කොට ඒ ප්‍රේතයා හට පින්අසිතිවෙවයි කියා දක්ෂිණෝදකපාතයෙන් භික්ෂුසංඝයාවහන්සේට දන්දෙවුයේය, එකෙණෙහි ප්‍රේතද පින්අනුමෝදන්ව ප්‍රේතාත්මභාවයෙන් මිදී දිව්‍යශ්‍රීසම්පත්ලදින් ඉක්බිතිව හෙතෙම රාත්‍රිභාගයෙහි පූර්වෝපකාර තෙරුන්වහන්සේ කරා අවුත් වැඳ එකත්පස්ව දසදික්හි ආලොකපතුරුවමින් දිලිහී සිටියේය, ඒ දැක කාරුණිකවූ තෙරුන්වහන්සේ විචාරණසේක් "සුවඳවිලවුන් ඇඟගල්වා උතුම්ක්‍රිටාභරණයක් දරා සියලුඅලඞ්කාරයෙන් සැරහී මෙතනට අවුත් සිටිනේ කවරෙක්දැ"යි විචාරා වදාළසේක, ඒ අසා දිව්‍යරාජතෙම ඒ තෙරුන්වහන්සේටදන්වනුයේ "ස්වාමීන්වහන්ස මම මීට පූර්වයෙහි දුකින් පීඩිතවූ ප්‍රේතයෙක් වීමි, එහි මහත් දුඃඛානුභවකරණ මාදෘශ කරුණාකරවූ නුඹවහන්සේ මහරජ්ජුරුවන් කෙරෙහි දන්වා උතුම්වූ මහත් සංඝදානය දෙවා ඒ සංඝයාවහන්සේලවා මාසඳහන්කොට පින්දෙවා මහරජද මහදන්දී එවේලෙහි මාඋදෙසා සඳහන්කොට පින්දින, මම ඒ දානපින්කම් අනුමෝදන්ව එම කුශලානුභාවයෙන් දුඃඛිත ප්‍රේතාත්මභාවයෙන් මිදී මෙසා දිව්‍යසම්පත්තියක් ලදිමි"යි ප්‍රකාශකෙළේය.

මෙසේ ප්‍රකාශකොට දන්වා නැවත අනන්තවූ කරුණාවට ආකරව සිටි ස්වාමීන්වහන්ස මම යම්සේ දිව්‍යසුවලදින් සතුටු වෙම්ද කැමතිසේ හැසිරෙම්ද එසේම මහා වීරවූ නුඹවහන්සේද සතුටුවනසේක්වා, කැමතිසේ හැසිරෙනසේක්වා"යි කියා තෙරුන් වහන්සේට ඒ දිව්‍යරාජතෙම දැන්වූයේය, **අඞ්ගණ්ඩුලනාළිප්‍රේත වස්තුවනිමි.**

**පතාකප්‍රේතවස්තුවනම්** කවරහයත්?-ඒ මෙසේයි, මේ ලඞ්කාද්වීපයෙහි රුහුණුරට දිසාවූ නම් එක්මහ දාගැබෙක් විය, ඒ චෛත්‍යය සනනකවූ පතාකයක් බැඳ තුබූතැනින් වාතයෙන් නගාගෙන ගොස් එක් කෙළෙඹි පුත්‍රයෙකුගේ ක්ෂෙත්‍රයෙහි වැටින, ක්ෂෙත්‍රහිමියාද ඒ ඒ තැන කුඹුරුබලා ඇවිදිනේ තමන් අයිති කුඹුරෙහි වැටී තිබූ පතාකවස්ත්‍රය දැක තුබූතැනින් නගාගෙණ එහිතුබූ අකුරුදැක ලොභසිතින් ඒ සිඳහැර වස්ත්‍රය පෙරවාගෙණ ගියේය, හෙතෙම තමාගේ ගෙවලටම ගොස් කල්යාමෙන් මිය පරලොවගොස් ප්‍රේතාත්මභාවයට පැමිණ ගිනිගෙණ දිලියෙන පටදහසක් දරමින් දිලිහී සජොතීභූතව ඇවිදිමින් මහදුක් විඳිනේය.

ඒ ප්‍රේතතෙම එක්දවසෙක මධ්‍යමරාත්‍රියෙහි එක්තරා භික්ෂූන්වහන්සේනමක් සමීපයට ගොස් සැපකැමතිව සිටියේය, උන්වහන්සේ එසේ සිටි ප්‍රේතයා දැක මෙසේ විචාළසේක,“සියලු ශරීරය හිස පටන් වැසීගොස් එසින් නැගෙණ ගිනිදැල්වලින් තැවි තැවී මහදුක් විඳිමින් මෙහි සිටිනා තෝ කවරෙක්දැ”යි විචාළ තෙරුන්වහන්සේට ප්‍රේතතෙම මෙසේ දැන්වීය, “ස්වාමීන්වහන්ස මම ප්‍රේතයෙක, ගිනිගෙණ දිලියෙන දහසක් යපට හිසවසා පෙරව නිරන්තරයෙන් තැවි තැවී ඇවිදිනෙමි”යි දැන්වීය, ඒ ප්‍රේතයාගේ වචනය අසා තෙරුන්වහන්සේ නැවතත් ඒ ප්‍රේතයා කෙරෙන් විචාරණසේක් “පූර්වජාතියෙහි කායාදි ද්වාරත්‍රයෙන් කවරපාපකර්මයක් තාවිසින් කරණලදද? කවරඅකුශලකර්මයකින් යපටින්ද මෙහෙසෙන්නේදැ”යි විචාරා වදාළකල්හි ප්‍රේතතෙම තෙරුන්වහන්සේගේ වචනය අසා නැවත උන්වහන්සේට දන්වනුයේ “ස්වාමීන්වහන්ස මම මේජාතියට පූර්වජන්මයෙහි මිනිසෙක්ව ඉපද බොහෝ ධනඇතිව විසුයෙමි, එකල්හි බොහෝ කුඹුරුබලා ඇවිදිනෙමි මේ දීඝානබවිහාර මහා චෛත්‍යයෙන් පතාකවස්ත්‍රයක් වාතවේගයෙන් ගෙණ ගොස් නොයෙක් ගවුගණනින් මත්තෙහිවූ මාගේ කුඹුරේ වැටින, ඒ වස්ත්‍රය දැක අහින්ගන්නෙමි එහිතුබූ අකුරුදැක ලොභසිතින් ඒ වස්ත්‍රය පෙරව ස්වකීය ගෘහයටම ගොස් ඉක්බිතිව කාලක්‍රියා කොට එමපාපකර්මයෙන් ප්‍රේතලොකයට පැමිණි මම දහසක් යපටින් හිසවසා පෙරව වැළඳගණිමින් ඒ දහසක් යපටින් මාගේ කය විශෙෂයෙන් තැවී දවන්නාහුය, එවිට කිසිඅස්වැසීමෙක් නැත, දුක්ඛයම නිරන්තරය, හිඳිමක් සැතපිමක් නැත, එසේවූ මට බත්පැන්නම් කොසින්ද?-මෙසේ අනන්ත දුක් අනුභවකරන්නෙමි, මරණය මට නොවන්නේය”යි දැන්විය.

ඔහුගේ ඒ වචනය අසා තෙරුන්වහන්සේ ඒ ප්‍රේතයාකෙරෙන්ම විචාරණසේක් “එම්බා සත්වය මාවිසින් තට කවරකර්මයක් කෙරෙම්ද?-කවරකාරණයකින් මේදුක්ඛයෙන් මුදම්ද?-තාපිණිස බුද්ධධර්මසංඝයන තුන්රුවන් විෂයෙහි ධජපූජා කෙරෙම්දැ’ යි විචාළසේක, එකල්හි ඒ ප්‍රේතතෙම තෙරුන්වහන්සේට මෙසේ දැන්විය, “ඉදින් දහසක් වස්ත්‍ර පතාක කොට මේ සාවූ චෛත්‍යයට පිදුව මැනව, එසේ ඇතිකල්හි මාගේ මේප්‍රේතදුකින් මිදීම වන්නේය”යි කියා ඒ ප්‍රේතතෙම එහිම අන්තර්ධානවිය, ඉක්බිත්තෙන් තෙරුන්වහන්සේ ඒ රාත්‍රිය පහන්වගියකල්හි වහාඋත්සාහකොට වස්ත්‍රසපයා පනසක් ලැබ දීඝානබචෛත්‍යයෙහි පුදා තෙරුන්වහන්සේ ඒ ප්‍රේතයා සිහිකොට පින්දුන්සේක. එකල්හි රාත්‍රිභාගයෙහි ප්‍රේතතෙම නැවත අවුත් තෙරුන්වහන්සේට මෙසේ දැන්විය, නුඹව

හන්සේ මාළුදෙසා කළපිත්තමෙන් මදක්කොට පින්දුන් හෙයින්
මාගේ ශිසමස්තකය පටන් අටඟුල් පමණ තැන්හි විවෘතව සෙල්වී
දහසක් යපටපත්ව ගියේය"යි දැන්වීය, තෙරුන්වහන්සේ නැව
තද වැඩ වස්ත්‍ර සපයා පනසක් ලදින් එසේම චෛත්‍යයට පුදමින්
පින්දුන්සේක, එයින් එදවස්ද අටඟුලක් පමණ යපටවල් නැලවී
මිදින, මෙම ක්‍රමයෙන් අනුන්මෙත පතළකරුණාවට ආකරවූ ඒ මහ
තෙරුන්වහන්සේගේ උත්සාහයෙන් මෙසේ ක්‍රමක්‍රමයෙන් පිළි
සපයා එම චෛත්‍යයට පූජාකොට පිළිදහසම සම්පූර්ණව ගියකල්හි
ශරීරයෙහි ධරාසිටි දහසක් යපටම සර්වාකාරයෙන්ම ගැලවී
ගියේය.

ඉක්බිත්තෙන් දෙවනදවස්හි නෙතෙම සියලු දිව්‍යාලඞ්කාර
යෙන් සැරසී අවුත් අර්ධරාත්‍රියෙහි මහතෙරුන් වැඳ ඉදිරියෙහි සිටි
යේය, තෙරුන්වහන්සේ දිව්‍යවිලාසයෙන් සිටි ඔහුඅතින් විචාරණ
සේක්:—

වණ්ණවා අභිරූපොසි සබ්බාභරණභූසිතො,
සුද්ධවසනො සුගන්ධොසි කොනුත්වමසි මාරිස-යි.

යනුවෙන් "එම්බාපින්වත් නිදුකානෙනි වර්ණසම්පන්නාවූ විශි
ෂ්ටරූඇති සර්වාභරණයෙන් සැරසී ශුද්ධවස්ත්‍රයක් හැඳ සුවඳවිල
වුන් ඇඟගල්වා බබලමින් සිටි තෝ කවරෙක්ද"යි විචාළකල
තෙරුන්වහන්සේගේ වචනය අසා දිව්‍යපුත්‍රතෙම මෙසේ දැන්වීය,
ස්වාමිනි මම මීට පූර්වයෙහි ගිනිගෙණ දිලියෙන දහසක් යපට දරා
සිට මහත්දුක් අනුභවකරමින් භයානකරූපව මම සිටියෙමි, මෙසේ
මහත්දුක් අනුභවකරන්නාවූ මා ඒ දුකින් ගොඩනගා මෙබඳු සැප
තෙක නුඹවහන්සේ මාපිහිටුවා ඇසේක, එසේ හෙයින් මාගේ මව්
පිය දෙදෙනාහා නෑයන් විසින් මාළුදෙසා සර්වාකාරයෙන් කළමනා
කටයුතු නුඹවහන්සේ මට සාධාදුන්සේක, දැන් මාගේ මේ දිව්‍යසැප
නුඹවහන්සේගේ මෛත්‍රීආනුභාවයෙන් ප්‍රේතභාවයෙන් මිදී ලදිමි"
යි ප්‍රකාශකෙළේය, දිව්‍යාත්මය ලදින් නුඹවහන්සේ වඳනට මෙහි
පැමිණි මම යම්සේ දුකින් මිදී සැපයෙහි සිටියෙම්ද එසේම මහාවී
රවූ නුඹවහන්සේද අග්‍රවූ සුවයෙහි යෙදී සිටිනාසේක්වයි කියා
නැවතද ඒ දිව්‍යපුත්‍රතෙම තෙරුන්වහන්සේට මෙසේ දැන්වීය,
"ස්වාමින්වහන්සේ උතුම් බුද්ධරත්නයෙහිද නිරුත්තරපුණ්‍යක්ෂේත්‍ර
සංඝරත්නයෙහිද වරදවා කරණලද ස්වල්පවූවත් පාපකර්මය අන
න්තවූ දුක් පමුණුවා දෙන්නේය, එසේම ත්‍රිවිධරත්නය විෂයෙහි
කරණලද ඉතා ස්වල්පවූද පූජාව ත්‍රිවිධසම්පත් සාධකවූ අනන්තඵල
දෙන්නේවෙයි, එහෙයින් බුද්ධාදි රත්නත්‍රය විෂයෙහි වරදවා පිළි

පැදීමෙක් කිසිකලෙකත් නොනටයුතුය, සර්වසම්පත්තීන් සාධන්නු කැමැත්තාංහු විසින් රත්නත්‍රය පිදීම්ආදි පින්කම් කිරීම සුදුසුයයි කියා ඒ දිව්‍යපුත්‍රතෙම තෙරුන්වහන්සේ වට ප්‍රදක්ෂිණකොට වැඳ අවසරගෙණ එකිම අන්තර්ධානව ගියේයි. පත්‍රකප්‍රේතවස්තුව කියා නිමවනලදී.

මහාදෙවවස්තුවනම් කවරහයත්?-ඒ මෙසේ දතයුතු, මෙම ශ්‍රී ලඞ්කාද්වීපයෙහි වස්තුග්‍රාමයෙහි ශ්‍රද්ධාසම්පන්නවූ දැහැමින් ජීවත්වන මහදෙව නම් උපාසකයෙක් වූයේය, හෙතෙම වනාන්තරයෙහි කෙතක්කොට එහි ශස්‍යයන් ඇතිවූකල එයට තුදුරුවූ කුටිපැලෙක ශස්‍යයන් රක්නා පිණිස ගොස් හොත්තේය, එකල්හි මධ්‍යමරාත්‍රියෙහි එක්තරා ප්‍රේතයෙක් බත්පැන් ඉල්වා හඬමින් මහාමාර්ගයෙහි යන්නේය, ඔහුගේ ඒ ශබ්දය අසා මහාදෙවනම් උපාසක හොත් තැනින් නැගී දුරින්ම සිට විචාරණුයේ ‘‘එම්බා යහලුව මේරාත්‍රියෙහි මිනිසුන් නැති වෙනෙහි බත්පැන් ඉල්වා විලාපකියමින් හඬන තෝ කවරෙක්ද’’යි විචාළේය, එවිට ඒ ප්‍රේතතෙම මේ වචනය දැන්වූයේය, ‘‘යහළුව මම වනාහි මසුරුකම් නැමති යක්ෂතෙම ආවෙසව පාපකර්මකොට ප්‍රේතලොකයට පැමිණි එක් ප්‍රේතයෙක් වීමි, මාසඳහන්කොට දන්දී පින්දෙනමාගේ කිසිනෑකෙණෙකුදු නැත, එහෙයින් මම අනාථවූයෙමි, මේ සෙස්සෝ වනාහි කැමති සේ අන්නපානවර්ගයන් කාබී ඇත්අස්රථයානාවල නැගී නොයෙක් දිව්‍යාලඞ්කාරයෙන් සැරසී සනාථව කැමතිසේ හැසිර ඇවිදිනාහුය’’යි දැන්වීය.

ඒ අසා මහාදෙවනම් උපාසකතෙම ඒ ප්‍රේතයාකෙරෙහිම විචාරණුයේ ‘‘සියලු සම්පත් ඔහුහැමදෙන කොයින් ලැබුවාහුද?-තෝ කුමක්නිසා කුමක්නොලබන්නෙහිද’’යි මෙසේ විචාළකල්හි ප්‍රේතතෙම උපාසකයාට මෙසේ දැන්වීය, ‘‘බොධිපීඨනම් ගම බොහෝ මනුෂ්‍යයෝ ආහාරපානවර්ගයන්දන්දී නෑප්‍රේතයන් සිහිකොට පින්පෙත් දෙන්නාහුය, ඒ නෑප්‍රේතයෝ එහිගොස් ආදරයෙන්ම පින්අනුමෝදන්වුවාහුය, එහෙයින් ඔහු හැමදෙනම ඉතාපිළිකුල් කටයුතුවූ ප්‍රේතාත්මභාවය හැර අතිශයින්ම ප්‍රවරවූ ශොභාසම්පන්න දිව්‍යශ්‍රීලද්දාහුයයි, එසේ සම්පත් ලදින් ඇවිදිනාහු ඔවුන් දැක හඬා වලපම්’’යි කියා මහාමාර්ගයේ යමින්ම සොකකරමින් නැවත නැවත යාච්ඤා නොයෙක් අඳෝනා කියා මෙසේ දැන්වූකල්හි උපාසකතෙම ඒ ප්‍රේතයාට මෙසේ දැන්වීය.

යම්කෙණෙක් මනුෂ්‍යදෙහය හැර ප්‍රේතලොකයට පැමිණියාහුද ඔවුන් සිහිකොට පින්දෙන්නාහු නැයෝද’’යි විචාළකල්හි ඒ

ප්‍රේතතෙම මහාදෙව නම් උපාසකයාට මෙසේ දැන්වීය, "මිනිස්පිය සිටිකල්හි ඔවුන්ගේ නෑයෝවත් නොනෑයෝවත් යම් ප්‍රේතකෙනෙකුන් උදෙසා දන්දී පින්දෙන්නාහුවී නම් ඉදින් ඒ ප්‍රේතයෝ පින් අනුමෝදන් වන්නාහුය, ඒ පින්පෙත් ඔවුන්කරා පැමිණෙන්නාහුය"යි ප්‍රේතතෙම දැන්වූකල්හි උපාසක්තෙම ඒ ප්‍රේතයාට මෙසේ දැන්වීය, "මම සෙට දවස සීලවන්තතැන්කෙරෙහි අන්නපානවස්ත්‍රාදි වස්තු දන්දෙම්, තෝ මතාකොට අනුමෝදන්වුවමැනව, මමද හෙතෙම ඒ දානයෙහි පින් ඔහු සිහිකොට දීන, ප්‍රේතතෙම එයින් පින් අනුමෝදන්ව එකල්හි දිව්‍යාත්මභාවයලද්දේය, එසේලත් දිව්‍යරූපයෙන්ම ඒ ප්‍රේතතෙම අවුත් නුදුරුව සිට පළමුසේම හෙතෙම අසල පැලකහොත් මහාදෙව නම් උපාසකයාට "එම්බා යහලුව කුමකින් සන්තොෂ කරන්නෙහිද?- ශ්‍රද්ධාසම්පන්නවූ කුසලඵලය නැගිබැලුව මැනව, යහපත් ඉෂ්ටමිත්‍රසහාය ලදින් උතුම් දිව්‍යසැපයට පැමිණියෙමි"යි ප්‍රකාශකෙළේය, ඉක්බිත්තෙන් උපාසකද ඒ ශබ්දය අසා පැලෙන් පිටතට නික්ම ඔහට මෙසේ දැන්වීය, "එම්බා යහලුව දුරුව සිටිනෝ කවරෙක්හිද?- මා සමීපයට ආමැනව, දිව්‍යාලඞ්කාරයෙන් අලඞ්කෘතව සිටි තොප දිටිමි, තෝ මා කරා ඊමට කුමකින් ලජ්ජාවන්නෙහිදැ"යි විචාළේය.

එවිට හෙතෙම කියනුයේ "යහලුව උපාසකය මම නග්නහෙයින් සෙසුසියලු සම්පත් සම්බවීනමුදු මට වස්ත්‍රයක් නැතිව ලජ්ජාවෙන් දුරුව සිටිමි"යි ප්‍රේතතෙම දැන්වීය, එකල්හි උපාසකතෙම මාගේ වස්ත්‍රයක් ඇති, මම තට දෙමි, වස්ත්‍රයගෙණ හැඳ මා සමීපයට එව"යි දැන්වීය, එසේ කීකල්හි ඒ ප්‍රේතතෙම උපාසකයාට මෙසේ කීයේය, "මෙසේ මාඅතට දෙන වස්ත්‍රසියයක් වී නමුත් මට නොපැමිණෙන්නේය, සීලවන්තතැන්කෙරෙහි දෙනලද යම්දානවස්තුවක් ඇද්ද ඒ හැම ප්‍රේතයෝ අනුභව කරන්නාහුය"යි දැන්වීය, එකල්හි උපාසක තෙම රාත්‍රිය ඇවෑමෙන් ආරාධනාකොට භික්ෂූන්වහන්සේලා අටනමක් වඩාගෙණවුත් සැපසේ වලඳවා ඉක්බිති එකිඑකී භික්ෂූනමකට පිළිදෙකක් බැගින් පූජාකොට උදකපතනය කිරීමෙන් ඒ ප්‍රේතයා උදෙසා පින්පෙත් දුන්නේය, එකල්හි ඒ ප්‍රේතතෙම රාත්‍රිභාගයෙහි සියලුදිගුන් ආලොක පතුරුවා සර්වාලඞ්කාරයෙන් බබලන දිව්‍යරූපයෙන් මහාදෙව උපාසකයාගේ ඉදිරිපිටසිට මෙසේ දැන්වීය, "මාගේ දෙමව්පියන්හා ඥාතිසාලොහිතයන් විසින් පවා කරන්නට දුස්කරවූ ඉතාදුෂ්කර කර්මයක් මාගේ යහළුවූ තෝ කෙළෙහිය, එහෙයින් මම උපකාරයක් කෙරෙමි"යි කියා ඔහු අත අල්වාගෙණ ගොස් නුගරුකක්මුල සුවර්ණයෙන් පිරිසිටි නිධානකුනක් දක්වා මේ හැම ගෙණ සැපසේ ප්‍රයොජන විඳුව, පින්

කම්ද කොට මට පින්පෙත්දෙව''යි කියා ඔහුගේ ගෙදරට පමුණුවා ඒ හැම අන්කිසිවක්හු විසින් නොගතයුතුසේ ආරක්ෂාකොට මහත් සෘද්ධිඇති ඒ දිව්‍යපුත්‍රතෙම අන්තර්ධානව ගියේය.

එහෙයින් තමහට වැඩ කැමති හිතෛෂීවූ ප්‍රඥාසම්පන්නජනයන් විසින් මසුරුමළ නැමති යක්ෂයා දුරුකොට හැමකල්හි දානයෙහි ඇළුම් ඇතිව වාසය කොට ඒ හැම්දෙනාද මහාදෙව උපාසකයාමෙන් මහත් වැඩට පැමිණෙත්වා, මෙබඳු ධර්මදේශනාවන් ඇසීමෙන් බොහෝජනයෝ දන්දී ඥාතිප්‍රේතයන් උදෙසා පින්පෙත් දුන්නාහුය, එහෙයින් කුශලකාමීවූ නුවනැත්තන් විසින් දැහැමෙන් සෙමෙන් දානවස්තු සපයා දන්දීමෙන් මෙසේ අත්වැඩ පරවැඩ සෑදීමෙහි අප්‍රමාදව උත්සාහකටයුතු, **මහාදෙව වස්තුව නිමි.**

තවද මෙසේ අනෙක ප්‍රකාරවූ දුක් ඇති ප්‍රෙතලොකයෙහිම තුන්ගව් පමණ උස ඇති ශරීරයෙහි ලේමස් නැතිව ඇට සැකිලි පමණව ඒ වසා සිටිනාසමකුදුනැතිව මහදුක් විඳිනා අට්ඨිසංඛලික නම් ප්‍රෙතයෝය, ඇටද නහරද වසාසිටිනා සමකුදු නැතිව කුණු මස් රැසක්සේ ඇඟඇති මාංශපිණ්ඩ ප්‍රෙතයෝය සියලු ශරීරයෙහි කඩුවැනි රොමඇතිව ඒ රොම අහසට නැගී නැගී සියලු ශරීරය විදජාලකවුළුවක්මෙන් සිදුරුකරණ කඩුවැනි ලොම්ඇති අසිලොම ප්‍රෙතයෝය නරවැනි ලොම් ඇති එම ලොමින්ම සියලු ශරීරය විදීනාලදුව බොහෝ දුඃඛගන්නා සූචිරොමනම් ප්‍රෙතයෝය යනාදී නොයෙක් නම්ඇතිප්‍රෙතයෝම උත්පත්තියොනිවශයෙනුදු අනෙකවිධ වන්නාහුයි, ඒමෙසේ දතයුතු:—

පෙතා බහුවිධා හොන්ති පරදත්තූපජීවිනො,
නිජ්ඣාමතණ්හිකා චෙව පෙතාච ඛුප්පිපාසිකා,
පංසුපිසාචකා චෙව කාලකඤ්ජාසුරාපිච-යි.

යනුහෙයින් ''නිජ්ඣාමතණ්හිකනම් ප්‍රේතයෝය ඛුප්පිපාසික නම් ප්‍රේතයෝය පාංසුපිසාචකනම් ප්‍රේතයෝය කාලකඤ්ජාසුරනම් ප්‍රේතයෝයයි කියාද ප්‍රේතයෝ මෙසේ උත්පත්තියොනිවශයෙන් නොයෙක්ප්‍රභෙද ඇතිවන්නාහුයි.

එහි නිජ්ඣාමතණ්හිකනම් ප්‍රේතයෝද ක්ෂුත්පිපාසනම් ප්‍රේතයෝද යනමේ සියලුම ප්‍රේතයෝ නොයෙක් බුධාන්තරවල ජීවත්ව සිටිනා ඉතා දීර්ඝආයුෂයක් ඇත්තාහුය, ඔහු නෑයන්විසින්ම දෙන ලද දානයක පින්පෙත් අනුමෝදන් වීමෙන් ඒප්‍රේතදුකෙන් මිදෙන්නාහුය, පාංශුපිසාචකනම්වූ යම්ප්‍රේතකෙණෙක් ඇද්ද ඔහු පාංශුයෙහිම ධරාසිටි ඉතාපිළිකුල්වූ සෙම්සොටුආදී පිළිකුල්දේම අනුභව

කොඃරමින් ඇවිදිනාහුය, බෙහෙත්මුලක් අතින්ගෙණ යම් කෙණෙක් අදෘශ්‍යමානව යන්නාහුවිනම් ඔවුන්ට ඖෂධ ආනුභාවයෙන් ඒ ප්‍රේතයෝ පෙණෙන්නාහුය, ඒ ප්‍රෙතයෝද, කාලකඤ්ච අසුරයොනි නම්වූ යම්ප්‍රෙතකෙණෙක් ඇද්ද ඔහුවනාගී සක්වල ච ච හෙයින් තුන් තුන් සක්වල එක්වූතැන අසූසාරදහසක් අසූසාර දහසක් යොදුන් පමණ විස්තාරායාම ඇති සක්වලගල්තුනට මැදිවූ අතුර හිරුසඳුරුස් කිසිකලකත් එහි නොපවත්නා මහත් ඝනඅඳුරු ඇති මහාමෙරුපර්වතය පවා එහි බහාලුවහොත් එණු පිඩක්සේ විරිවැගිරයන අධිකවූ සීත ඇති සියලු ශරීරය කපන්නට නිසිවූ ක්ෂාරොදක ඇති ලෝඇඳිරිමහානරකයයි ප්‍රසිඩ ඒ මහානරකයෙහිවූ සියලඟ අතිකනරකාරන් තබා සිඳියන්නාසේ කැපි යනක්ෂාරඋදකයෙහි ඉපද කතියන තබලෙක බහාලූ වෙඩරු පිඩක්සේ විරිවිරි වැහිරීමෙන් නොයෙක්වාදහස් මුළුල්ලෙහි දුක් අනුභවකොට එහි ක්ෂාරොදකයෙහිම වැගිර ගියකල නවදෙරින් ක්ෂාරොදකය ශරීරයට වැදී ඔවුන්ගේ සියලු ශරීරයම තියත්ආදියෙන් වෙහෙසදී කපනකලක් පරිද්දෙන් මහ දුක් විඳ ඒ දුකින් මිදී පහවයම්හයි සිතා ඇහිලි අග කුළුවැනි නිය ඇති අතින් සක්වලගල අල්වාගෙණ නැගී එසේ නැගෙන සෙස්සන් අඳුරුහෙයින් නොදැක ඔවුනොවුන්ගේ ශරීරවල අත්වැදී ගියකල ගන්නට නිසිදෙයක්යයි සිතා ඔවුනොවුන් ගන්නටයයි සිතා සක්වලගලින් අත්හැරපියත්, එකෙණෙහි නැවත හිස යටකොටගෙණ ක්ෂාරොදකයෙහිම වැගිරගියකල පළමුසේම නවදොරින් ක්ෂාරොදක වැද කැපීමෙන් බොහෝදුක් විඳිනාහුයි, මෙසේවූ ඒ කාලකඤ්චක අසුරයොනිය උපන් ප්‍රෙතයන්ගේ තුන්ගව්පමණ ශරීරවන්නේය, ඉදිකටුමල සිදුරසේ අතික්ෂුද්‍රවූ මුඛය විය, කකුළුවන්ගේ ඇස්වැනි පිටතට නික්ම තිබෙණ ඇස් ඇතිවෙත්, හිස මුදුනෙහි පිහිටා තිබෙණ ක්ෂුද්‍රමුඛය නික්ම තිබෙණ ඇස්වලින් දක්නාහුය, ඒ ප්‍රෙතයෝ යමක් කනබොන කල හිස නමාගෙණ කාබී පියන්නාහුය, ගිනිගෙණ දිලියෙන අයොමය මහාමුගුරුවලින් ඔවුනොවුන්ට මහත්දුක් උපදවා තලාගෙණ අන්‍යොන්‍ය ශරීරවල යමගුරු පහරෙන් නැතිගියපූයා අනුභව කරන්නාහු වෙති.

මෙසේ කාලකඤ්චකනම් අසුරයොනියෙහි ඉපද මහදුක් විඳිනා නියසිරිතවූ භයානක ස්වරූප ඇති ඒ ප්‍රෙතයොද ප්‍රෙත

යන් උදෙසාම දෙනලද දානය අනුමෝදන්ව ඒ අහෙතුකප්‍රෙත යොනියෙන් මිදෙත්, තවද මෙසේ අනන්තදුක් විඳිනා ඥාති ප්‍රෙතාදීන් නිසා දන් දී පින්පෙත්දීම සුදුසුපරිදි මේ මතු දක්වන කථාවෙන් අසා දතයුතු, ඒ කෙසේදයත්,—

එක්තරා බ්‍රාහ්මණයෙක් බුදුරජාණන්වහන්සේ කරා පැමිණ වැඳ එකත් පස්ව හිඳ විචාරන්නේ "ගෞතම ගොත්‍ර ඇති සව් බුදුරජාණන්වහන්ස අපි අපගේ මිය පරලොව ගියනෑයන් උදෙසා දන්දී පින්පෙත් දෙමහ, ඒ දානඵලය ඔවුන්ට පැමිණේද්දෝහෝ" යි විචාළේය. එකල්හි භාග්‍යවතුන්වහන්සේ ඕහට ඒ කාරණය ප්‍රකාශකොට දක්වා වදාරණසේක් "එම්බා බමුණ නරකයෙහිද තිරිසන් යොනියෙහිද මනුෂ්‍ය යොනියෙහිද දිව්‍ය යොනියෙහිද උපන්නාහට ඒ විගස එහි සන්නිහිතව පින්කම් අනුමෝදන්වන්නට නොපිළිවන්බවහා ඔවුන් විසින් අනුමෝදන් වූවද ඒ ඒ ජන්මවල සිට ජාතිය පෙරළී නැවතදෙව්ව දිව්‍යසම්පත් අනුභව කිරීමක් නොපිළිවන්බව ප්‍රකාශකොට ප්‍රෙතයන්ට එම ජන්මයෙහි සිට පින් අනුමෝදන්ව දිව්‍යව පෙරළී සියලු දිව්‍ය සම්පත් අනුභව කරන්නට පිළිවන් බවද එසේ මිය පරලොව ගිය ඥාතිප්‍රෙතාදීන් පිණිස දෙන දානයත් දුස්සීලයන්ට දන්දීමෙන් ඒ දානයෙහි පින්පෙත් ප්‍රෙතයන්ට නොපැමිණෙනබවද ඒ හැර. අඛණ්ඩාදිවශයෙන් යහපත්ව සිල්රක්නා ගුණිකිසි කෙණෙක්හට දුන් දානයෙහි පින්පෙත් නොමුළාව ප්‍රෙතයන්ට පැමිණෙන බවද එබඳු පින්කම් බලා එහි පින්පෙත් ප්‍රෙතයෝ ආදරයෙන්ම අනුමෝදන්වන බවද එම පුණ්‍යානුමෝදනා හෙතුබලයෙන් ඒ ප්‍රෙතයෝ එම ජාතියෙහිම සිට නිශ්‍රිත ප්‍රෙතයොනිය හැර සශ්‍රික දිව්‍යගතියට පෙරලී එහි ප්‍රමාණාතික්‍රාන්ත දිව්‍යසම්පත් අනුභව කරණබවද යනාදීන් ධර්ම දෙශනාකොට වදාළසේක.

ඒ අසා බ්‍රාහ්මණතෙම "ස්වාමිවූ බුදුරජානන්වහන්ස යම් තැනක නෑ ප්‍රෙතයො නැත්නම් ඔවුන් නිසා දුන් දානයේ පින්පෙත් කවුරු අනුමෝදන් වෙද්දෝහෝ" යි විචාළේය, එවිට බුදුරජාණන්වහන්සේ "එම්බා බමුණ යම් තැනෙක නෑ ප්‍රෙතයෝ නැතිවෙද්ද එබඳු තැනෙක් ලොව නැතැ" යි වදාළසේක.

මෙම කාරණය අරභයා මිළිඳුරජ නාගසෙනස්ථවිරයන් කෙරෙන් ප්‍රශ්න විචාරණනැත මෙසේ විචාළේය, ඒ කෙසේදයත්, "ස්වාමිවූ නාගසේනස්ථවිරයන්වහන්ස දන්දෙන්නාහු මියපරලොව ගිය නෑයන් උදෙසා දන්දී ප්‍රෙතයන්ට පින්පෙත් දෙත්

නාහු ඒ දානමය පින් ඔවුන්ට කෙසේ පැමිනේද්ද''යි විචාළේය, ඒ අසා නාගසේන මහතෙරුන්වහන්සේ "මහරජ එසේ දෙනලද දානමය කුශලය ස්ථානයෙහිම පැමිණෙන්නේය, අස්ථානයෙහි නොපැමිණෙන්නේය''යි වදාළසේක, ඒ ඇසූ මිළිඳුරජ ස්වාමීන්වහන්ස එහි කවරනම් තැනෙක් ස්ථානද කවරනම් තැනෙක් අස්ථානද''යි විචාළරජහට තෙරුන්වහන්සේ මෙසේ වදාළසේක, "යම්සත්වකෙණෙක් නරකයෙහිද තිරිසන් ජාතියෙහිද මනුෂ්‍යජාතියෙහිද දිව්‍යජාතියෙහිද උපන්නාහු විනම් ඒ ඇමදෙනම තම්තමන්ගේ බන්ධුමිත්‍රාදීහු කළපින්කම් සිහිකොට බලා අනුමෝදන්වීමට නිසිකාරණාඒ ඒ තන්හි නැතිහෙයින් මෙකීතැන් අස්ථානනම්වෙත්, එහෙයින්ඔවුන්කරාගොස් ඒ දානාදි පින්පෙත් නොපැමිණෙන්නේය, යම්ඤාතිසාලොහිතකෙණෙක් මිය පරලොව ගොස් ප්‍රෙතලොකයෙහිඋපන්නාහුද ඒප්‍රෙතයන්ට ස්ථානවශයෙන්මදානඵලය ගොස්පැමිණෙන්නේය,එහෙයින් ප්‍රෙතයෝම ස්ථානවෙති''යිවදාළසේක, ඒඅසා මිළිඳුරජතෙම නැවතත් තෙරුන්වහන්සේට දන්වනුයේ"ස්වාමිවූ නාගසේනස්ථවිරයන්වහන්ස ඒ දානය අනුමෝදන්වීමට ඉඳින් ඒ ස්ථානයට ඒ නෑ ප්‍රෙතයෝ නොපැමිණියාහු නම් කවරක්හු ඒ දානඵලය ප්‍රයොජන විඳිද්දයි''යි වදාළ රජහට තෙරුන්වහන්සේ වදාරණසේක් "මහරජ ඤාතිප්‍රෙතයන් නැති තැනෙක් නැත, එසේදවුවත් ඔවුන්ට නොපැමිණියහොත් ඤාතිප්‍රෙතයන් කෙරෙන් පිටත් සෙසු අන්‍යවූ ප්‍රෙතයෝ ඒ දානය අනුමෝදන්වන්නාහුය''යි වදාළසේක, එවිට මහරජ දන්වනුයේ "ස්වාමින්වහන්ස අන්‍යවූ ප්‍රෙතයෝද ඒ දානය අනුමෝදන්වීමට එහි පැමිණියාහුවීනම් කවරක්හු ප්‍රයොජන විඳිද්ද''යි විචාළරජහට රජ් දානඵලය දන්දුන් දායකයෝම අනුභවකරන්නාහුය''යි වදාළකල්හි මිළිඳුරජ ඒ අසා "ස්වාමිවූ නාගසේනස්ථවිරයන්වහන්ස මේ කාරණය උපමායෙන් හඟවා වදාලමැනවැ''යි දන්වූ කල්හි උපමායෙන් වදාරණසේක් "මහරජ මේ ලොකයෙහි සමහරකෙණෙක් තමන්ගේ නෑයන් දක්නාපිණිස යහපත්වූ ආහරපානවර්ගී සදගෙණ ඔවුන්කරා ගියකල ඒ නෑයෝද එහි සිටියාහුවීනම් ගෙණගියහැම උපකරණයෝ ඔවුන්ට පැමිණෙන්නාහුය, ඔවුන් එහි නැතහොත් මහරජ ගෙණගිය ආහාරපානවර්ගීයන් කුමක්කෙරේද්ද''යි විචාළකල "ගෙණගියාහුම අනුභවකරන්නාහුය, කුමට විනාශකෙරේද්ද''යි දන්විය, "එපරිද්දෙන්ම මහරජ ඤාතිප්‍රෙතාදීන්නිසා දුන්දානයාගේ ඵලය ඔවුන්කරා

නොපැමිණියෙහොත් අත්දුන් දායකයන්ටම ඒ දානඵලය පැමිණෙන්නේය"යි කියා ප්‍රශ්නවිසඳූකල්හි ඒ අසා සතුටුවූ මිළිඳුරජ ප්‍රශ්නවිසඳීමෙහි නාගසේනස්ථවිරයන්වහන්සේ ඉතා දක්‍ෂසේකැ"යි කියා ප්‍රශංසා කෙළේය.

මෙසේවූ නොයෙක් ප්‍රභේද ඇති ප්‍රේතයන්විසින්ම සියලු ලොව ගහණව බොහෝව වසනාපරිද් මේ මතුදක්වන කථාවෙන් අසා දතයුතු, ඒ කෙසේදයත්?—

අනුරාධපුරනුවර ථූපරාමවිහාරයෙහි සිට එක්වඩනා මහතෙර කෙනෙකුන්වහන්සේ නුවරට අහරසිගාවඩනාසේක් එකල්හි ථූපාරාමදොරටුවසමීපයෙහිසිටි ප්‍රේතියෙකුගේදරුවෝ දෙදෙනෙක් බලවත් බඩසාදුක් ඉවසාගතනොහී හොත්තාහු ඒවඩනා මහතෙරුන්දැක මෙසේදැන්වූවාහුය, "පළමුවෙන්ම ලදයම්කිසි කෑයුතුදෙයක්හැරගෙණ අනලස්වම ඇම්වඅපකරාඑනලෙස ස්වාමීන්වහන්සේ දැන්වූවහොත් යෙහෙකැ"යි කිවූය, මහතෙරහු ඒඅසා ඈ අපට නොපෙණෙයි, ඊට කුමක්කෙරෙම්ද"යි වදාළහ, ඒඅසා "වහන්ස මේ බෙහෙත්මුලගෙණ වදාළමැනව, එසේවූකල පෙණෙන්නිය"යි කියා මුලක්දී ඔවුන් මවගේ සළකුණු කීහ, මහතෙරහු බෙහෙත්මුලේ ආනුභාවයෙන් ගහණව සිටිප්‍රේතයන් දැක ගමනට අවකාශ නොලදින් මහත්උත්සාහයෙන් ඉතා කල් ආසනනාවෙලාවට දකුණුදොරටුයෙහි සකුරුහල්මුවරුවකරා වැඩ දරුවන්කී සලකුණෙන් ප්‍රේතිය හැඳින ඔවුන්කී හසුන් වදාළහ, එවිට ඒප්‍රේති "මාකෙසේ දුටුසේක්ද"යි විචාරා නිදරුවන්දුන් මේමුලේ ප්‍රභාවෙන් දුටුම්හ"යි වදාළහ, එවිට ප්‍රේති "මේමුල අතතිබුවහොත් ගහණව පෙණෙන ප්‍රේතයන්ගෙන් මගයාමට අවකාශ නොලැබ මේවහන්සේ සුන්බත්වෙතියි සිතා අතින් බේත්මුලහැරගත, එවිට ප්‍රේතයෝ නොපෙණුනාහ, මහතෙරුන්වහන්සේ වේලාතොවරද්දා සිගා අහරලැබූසේක, සියලුලොව ප්‍රේතයන්ගෙන් ගහණබව මෙයින් දතයුතු.

මෙසේ ලොව ගහණව වසන අප්‍රමාණවූ ප්‍රේතයන්ගේ සියලු දුඃඛස්කන්ධය යටකියනලද ක්‍රමයෙන් අප්‍රමාණ වන්නේය, එසේ ඔවුන්ගේ දුක් මෙතෙකැයි පමණ නැත්තාසේ ආයුෂයද අප්‍රමාණවන්නේය, ඔවුන්විසින් කරණලදපව් ගෙවියනතාක් අනෙකාකාර කම්කටුල් මහදුක් විඳිත්, ඒ කෙසේදැයි කිවහොත් මේ මතුදක්වනලද කථායෙන් අසාදතයුතු.

මේ කල්පයට දෙයානූකල්පයෙහි පුෂ්‍ය නම් සම්මාසම්බුද්ධරජා
ණන් වහන්සේ දවස බුදුපාමොක් මහසඟහට දන්වැට සරහා
දන්දෙනකල සමහරකෙණෙක් ශ්‍රද්ධායෙන්ම ඒදානය මහාකො
ට පවත්වා දෙව්ලොව උපන්නාහුය, සමහර කෙණෙක් අශ්‍රද්ධා
යෙන් දානයත් සිඳ පුත්‍රදාරාවන්ට තමතමන් කැමතිසේ දන්වැ
ට ගසාකා ඒපාපබලයෙන් එමකල්පයපටන් මේකල්පයදක්වා
අතුරෙහිවූ අනූදෙකල්පයක් මුළුල්ලෙහි නරකයෙන් නරකයට ඇවි
දීමෙන් නැවුතනැවත අපාදුක් විඳ කකුසඳ සම්මාසම්බුදුන්දවස
බොහෝ මනුෂ්‍යයෝ දන්දී නෑප්‍රෙතයන් උදෙසාපන්පෙත්
දීමෙන් ප්‍රෙතාත්මවලින් මිදී දිව්‍යසම්පත් ලදින් හැසිරෙන්නා
වුන් දැක ඒප්‍රෙතයෝ කකුසඳබුදුරජාණන්වහන්සේකරා අවුත්
"ස්වාමීන්වහන්ස තුඹවහන්සේ දවස අපට ආහරයක් ලැබේ
දොහෝයි පිළිවිස අපදවස නොලැබෙන්නේය,මතු කොනාගම
නම් බුදුකෙණෙක් පහළවෙති, ඔවුන්දවස විචාළමැන,,යි වදා
ළකල්හි ඒබුදුන්උපනාතාක් පොළොව සත්ගව්වක් උසවඩනා
තාක්කල් මුළුල්ලෙහි මහදුක් විඳ කොනාගමනම් බුදුරජාණන්
වහන්සේ දවසද පළමුපරිද්දෙන්ම පැමිණ වහන්සේදවස අපට
ආහරයක් ලැබේද්‍යෙහෝයි විචාරා ඒ කොනාගමනනම් බුදුරජා
ණන්වහන්සේ විසිනුදු අපදවස නොලබන්නේය මතු කාශ්‍යප
නම් බුදුකෙණෙක් පහළවෙති, ඔවුන්දවස විචාළමැනවැ"යි
වදාළකල්හි ඒ බුදුහුදු උපදනාතාක් පොළොව සත්ගව්වක් උස
වඩනාතාක්කල් මුළුල්ලෙහි මහදුක් විඳ කාශ්‍යපනම් බුදුරජා
ණන්වහන්සේ දවසද එසේම පැමිණ "වහන්සේදවස අපට
ආහරයක් ලැබේද්‍යෙහෝ"යි විචාරා ඒ කාශ්‍යපබුදුන්විසිනුදු "අප
දවස නොලැබෙන්නේය, මතු ගොතමනම් බුදුකෙණෙක් ලොව
පහල වෙති, එකල්හි මිට දෙයානූකපකින් යට තොපනෑවූ බිම්
බිසාර නම් රජෙක් රජපැමිණෙන්නේය, ඒරජ බුදුපාමොක් දන්දී
තොප සිහිකොට උදකපාතනයෙන් පින්දෙන්නේය, එකල්හි
තොපිහැම ප්‍රෙතාත්මවලින් මිදී දිව්‍යසැප ලදින් සතුටුවන්නා
හුය"යි වදාළකල්හි ඒ ප්‍රෙතයෝ සෙට ලබන දෙයක්මෙන් සතු
ටුව එනැත්පටන් පොළොව සත්ගව් උසවඩනාකලැයි කියන
ලද බුද්ධාන්තරය මුළුල්ලෙහි මහදුක් විඳ අපහාග්‍යවත් ගෞතම
බුදුරජාණන්වහන්සේ ලොව පහළවූකල්හි බිම්බිසාරනම් රජද
රජවිය, ඒරජ ඤාතිප්‍රෙතයන් උදෙසා දන්දී පින්දෙන කාරණ
යෙන් එම්රජගෙට එක්ව මහත්කොට ශබ්දපැවැත්වූ කල්හි
රජ ඒ අසා භයපත්ව බුදුන්කරා පැමිණ විචාළේය, එවිට බුදුරජා

ණන්වහන්සේ "මහරජ තොපට එයින් වකළපද්‍රවයෙක් නැත මේ දෙයානූකපතින් යට තොප නෑයෝ ප්‍රෙතලොකයෙහි උපන් නාහුය, ඔහු එක්බුද්ධාන්තරයක් තොපමපතා හැසිරෙන්නාහු තොපකෙරෙන් පින්පෙත් නොලැබ සොකයෙන් ශබ්ද පැවැත් වූවාහුය,, යි වදාළකල්හි ඒ බිම්බිසාරරජ බුදුපාමොක් මහසඟනට ආරාධනාකොට මහදන් සරහා අරොචිතකාලයෙන් වැඩීබුදුන් ප්‍රධානකොටඇති මහසංඝයාවහන්සේ රජගෙයි මනාකොට පවත්වනලද අසනවල වැඩහුන්කල ප්‍රෙතයෝද පින්අනුමෝදන්වන පිණිස එහි රැස්වප්‍රාකාරාදී ඒ ඒ තැන සිටියාහුය, බුදුරජාණන් වහන්සේ ඒදක ඔවුන් රජහට පෙණෙනසේ අධිෂ්ඨාන කළසේක, එහෙයින් ඒප්‍රෙතයො රජහට ප්‍රකාශව පෙණෙන්නාහ, ඒදක සොම්නස්වූ රජ මනාවූ ආදර ඇතිව මහදන්දී ඉදං මෙ ඤාතීනං හොතු සුඛිතාහොන්තු ඤාතයෝ යී යනමේ වාක්‍යය කියා ශාස්තෘ වූ බුදුරජාණන් වහන්සේට දක්ෂිණෝදකය පාතනය කළකල්හි ඒප්‍රෙතයන්ට එකෙනෙහිම සිහිල්දිය පිරිසිටි පස්පියුමෙන් සැදුම්ලත් පොකුණු පහළවිය, ඒදක සතුටුවූ රජ ආහාරපානවගීදිසියලුම දනවස්තු ක්‍රමක්‍රමයෙන් බුදුපාමොක්මහසඟනට දන් දීන ඒ ඒ දෑ දන්දුන් කෙණෙහිම ඒ ප්‍රේතයන්ට පහළවන්නේ ඒබව දැක අතිශයින් සතුටුවූ බිම්බිසාරරජහට අනුමෝදනාකරණපිණිස මේ ගාථාවන් දෙශනා කළසේක·

තිරොකුඩ්ඩෙසු තිඨන්ති සන්ධිසිංඝාටකෙසු ච,
ද්වාරබාහාසු තිඨන්ති ආගන්ත්වාන සකං ඝරං

පහූතෙ අන්නපානම්හි ඛජ්ජභොජ්ජෙ උපට්ඨිතෙ,
න තෙසං කොචි සරති සත්තානං කම්මපච්චයා.

එවං දදන්ති ඤාතීනං යෙහොන්ති අනුකම්පකා,
සුචිං පණීතං කාලෙන කප්පියං පානභොජනං,

ඉදං වො ඤාතීනං හොතු සුඛිතා හොන්තු ඤාතයො·
තෙච තත්ථ සමාගන්ත්වා ඤාතිපෙතා සමාගතා,

පහූතෙ අන්නපානම්හි සක්කච්චං අනුමොදරෙ,
චිරං ජීවන්තු නො ඤාතී යෙසං හෙතු ලභාමසෙ,

අම්හාකඤ්ච කතා පූජා දායකා ච අනිප්ඵලා.
න හි තත්ථ කසී අත්ථි ගොරක්ඛෙත්ථ නවිජ්ජති

වණිජ්ජා තාදිසී නත්ථි හිරඤ්ඤෙන කයාක්කයං,
ඉතොදින්නෙන යාපෙන්ති පෙතා කාලකතා තහිං.

උන්නමෙ උදකං වට්ටං යථා නින්නං පවත්තති,
එවමෙවඉතො දින්නං පෙතානං උපකප්පති,

යථාවාරිවහා පූරා පරිපූරෙන්ති සාරං,
එවමෙව ඉතො දින්නං පෙතානං උපකප්පති.

අදාසිමෙ අකාසි මෙ ඤාතිමිත්තා සඛා ච මෙ,
පෙතානං දක්ඛිණා දජ්ජා පුබ්බෙ කතමනුස්සරං.

නාහිරුණ්ණං,ව සොකො වා යාචඤ්ඤා පරිදෙවනා,
නතං පෙතානමත්ථාය එවං තිට්ඨන්ති ඤාතයො.

අයං ඛො දක්ඛිණා දින්නා සංඝම්හි සුප්පතිට්ඨිතා,
දීඝරත්තං හිතායස්ස ඨානසො උපකප්පති.

සොඤාතිධම්මො ච අයං නිදස්සිතො
පෙතානපූජා ච කතා උළාරා,

බලංච භික්ඛූන මනුප්පදින්නං,
තුම්හෙහි පුඤ්ඤං පසුතං අනප්පකන්ති.

තිරො කුඩ්ඩ සූත්‍රයි.

---

මේ තිරොකුඩ්ඩසූත්‍රධර්මදෙශනාව නිමවා වදාළකල්හි අසූහාරදහක්පමණප්‍රාණීහු සංවෙගසිත් ඇතිව අමාමහනිවන්පුර වැදුනාහුය එසේම දෙවනදවස්හිද තුන්වනදවස්හිද සතරවන දවස්හිද පස්වනදවස්හිද සවනදවස්හිද සත්වනදවස්හිද යන සතියෙහිම එතිඑකී ලෙස අසූහාරදහස අසූහාරදහස බැගින් පස්ලක්ෂඅටඅසූදහසක් පමණදෙන ප්‍රෙතලොකයෙහි අනන්ත දුක් ඇති ප්‍රෙතයන් අරභයා බිම්බිසාරරජහට දෙශනාකරවදාළ මේ සූත්‍රදෙශනාව අසා ප්‍රෙතලොකයනම් මෙබඳුනිස්සිරික තැනෙක සසර ප්‍රමාදව විසූවාහු එති අනන්තදුක් විඳිනාහුයයි දැන කලකිරීමට පැමිණිසිත්ඇතිව සසර උත්පත්තිමූලය සිඳුම්හයි දෘඪතරසමාදානයෙන් ඇසූධර්මයම ප්‍රත්‍යයකොටගෙණ ලොභාදි කෙලෙශයන්කෙරෙන් දුරුව අමාමහනිවන්පුර වැදී සැනහීයි යාහුය මෙසේ ප්‍රමාණාතික්‍රාන්තාතීක්ෂණවූ ඇසූවන්සිතුවන් ලබ

කාතියනතරම් ඒසාමහත්දුක් අනුභවකිරීමක් ඇති නොයෙක් අකුශලකර්මඵල අනුභවකිරීමට ස්ථානවූ සියලුප්‍රෙතලොකයෙහිවූ හැමදුක්ඛයන් ඇත්තේමයයි දැන ඒප්‍රෙතභවයෙන් මිදෙනුසඳහා දානය ශීලය භාවනාවය යනආදීනානාවූකුශලකර්ම රැස්කිරීමෙහි අප්‍රමාදව යෙදීමෙන් එම්බානුවනැතිසත්පුරුෂජනයෙනි අග්‍රවූ ශ්‍රෙෂ්ඨවූ කෙළවරක් නැතිදිව්‍යමනුෂ්‍යසම්පත්හා නිර්වාණසම්පත්අත්පත්කිරීමෙහි උත්සාහ කළමැනවි.

ඉතිච සකලපෙතෙ තිබ්බදුක්ඛානුභොගෙන
අකුසලඵලභූතෙ භූතතො සංවිදිත්වා,

තිවිධකුසලකම්මං සඤ්චයන්තා අනන්තං
තිවිධසුඛමනන්තං වායමෙ සෙට්ඨමග්ගානි

ප්‍රෙතලොකයෙහි ඒසාමහත්ප්‍රෙතදුක් ප්‍රකාශකිරීමෙන් දෙව්මිනිසුන් සහිත සියලුලොකයාහට එම්ප්‍රෙතභවයෙන් මිදී නිවන්පුරවදනාසේ කාරණලදඋතුම් සද්ධර්මානුශාසනා ඇතිහෙයින් අනුත්වෙත පතළකරුණාඇති මාගේ බුදුරජාණන්වහන්සේ ශාස්තෘනාම්වනසේක එසේහෙයින් කියනලදී:—

දෙවයක්ඛමනුස්සානං ලොකෙ අග්ගඵලං දදං,
දදන්තං දමයන්තානං පූරිසාජඤ්ඤ තෙ නමො—යි.

මෙතෙකින් මේ ශ්‍රීසද්ධර්මාවවාද සංග්‍රහයෙහි අසුරඅපායදුක්ඛයන් හා ප්‍රෙතදුක්ඛවර්ණනාවන් කියා නිමවනලදී, මේ ශ්‍රී සද්ධර්මාවවාද සංග්‍රහයෙහි අකුශලකර්මඵලභූමිවූ සතරඅපායන්ගේ ස්වරූප ප්‍රකාශවූ සවනපරිච්ඡෙදය නිමි.

මෙසේ සත්වනපරිච්ඡෙදයෙන් අකුශලඵල භූමිසඞ්ඛ්‍යාත සතරඅපායයන්ගේ ස්වරූපප්‍රකාශ කිරීමෙන් ලෝවැඩදක්වා තදනන්තරව යථොක්තආදීනවඇති එම්අකුශලකර්මවිරතිසඞ්ඛ්‍යාත පඤ්චශීලාදීන්ගේ සමාදානප්‍රභෙද ආනිසංසනාවෝද මෙහි දක්වනුලැබෙත්.

හෙදවනාහි එවං සරණගතෙහි පන උපාසිකො උපාසිකා ජනෙහි සීලෙපතිට්ඨාය යනාදීවිසින් උපාසක ජනාලඞ්කාරයෙහිද ප්‍රතිපත්ති සංග්‍රහයෙහිද ප්‍රකාශක්‍රමයෙන් නිත්‍යශීල උපොසථ ශීලයන්ගෙ සමාදානාදිය දක්වත්තේ යි. යථාක්‍රමයෙන් සරණගිය උපාසකොපාසිකා ජනයන්විසින් ඒ නිත්‍යශීල උපොසථශීලයෙහි පිහිටා සුදුසු ධූතාඞ්ගසමාදානයෙන් යෙදී සීලය පිරිසිදු

ෂකාවගෙණ පස්වෙළඳාමෙන් දුරුව දැහැමෙන් ජීවත්වීමෙන් උපාසක පද්වභාවයට පැමිණ දවසක් දවසක් පාසා දස ජන් ක්‍රියාවන් පූරා ස්වර්ගමොක්‍ෂදෙකට අනතරායකරවූ පාප ධර්‍මයන්කෙරෙන් දුරුව ලොවුතුරාසම්පත් සාධාගතයුතු.

ඒ උපාසකශීලයවනාහි නිත්‍යශීලවූ පංචශීලයහා දශශීලයද උපොසථශීලවූ අෂ්ටාංගශීලයද යනමේ දෙවැදෑරුම්වූ ශීලයන් අතුරෙන් පංචශීලයනම් සැවැත්නුවරනිසා දෙව්රම්හි වාසයකරණ භාග්‍යවත් බුදුරජාණන්වහන්සේ සාමණේරශික්‍ෂාපද නියමකරණපිණිස පාණාතිපාතා වෙරමණී සික්ඛාපදං සමාදියාමි, අදින්නාදානා වෙරමණී සික්ඛාපදං සමාදියාමි, අබ්‍රහ්මචරියා වෙරමණී සික්ඛාපදං සමාදියාමි, මුසාවාදාවෙරමණී සික්ඛාපදං සමාදියාමි, සුරාමෙරයමජ්ජපමාදට්ඨානාවෙරමණී සික්ඛාපදං සමාදියාමි, විකාලභොජනා වෙරමණී සික්ඛාපදං සමාදියාමි, නච්චගීත වාදිතවිසූකදස්සනා වෙරමණී සික්ඛාපදං සමාදියාමි, මාලාගන්ධවිලෙපන ධාරණමණ්ඩන විභූසනට්ඨානා වෙරමණී සික්ඛාපදං සමාදියාමි උච්චාසයන මහාසයනා වෙරමණී සික්ඛාපදං සමාදියාමි, ජාතරූපරජත පටිග්ගහණා වෙරමණී සික්ඛාපදං සමාදියාමි, යනමේ දශශීලශික්‍ෂාපදයෝ පනවා වදාරණලද්දාහුයී.

ඒදශශීලශික්‍ෂාපදයන් අතුරෙහි ප්‍රාණාතිපාතාදි පන්පව් අබුද්ධොත්පාද කාලයෙහිදු ලොව නුවනැත්තන් විසින් හැරියයුතු මහත්ලොකවද්‍යවූ පාපකර්මයන් බැවින් අපබුදුන් බුදුවූකලත් එම පන්පව් නොකරණලෙසම ශික්‍ෂාපදපනවා වදාළහෙයින් ප්‍රඥප්තිවද්‍යවූ ඒඅකුසලයන් කෙරෙන් දුරුවීම පංචශීලනම්වේ මේ පංචශීලය දක්වනතැන දශශීලයෙහි තුන්වෙනි අබ්‍රහ්මචරියා විරමනශික්‍ෂාපදයහැර පරදාරසෙවනයෙන් දුරුවනමන්අයිති භාර්යාවන්නිසා සතුටුවීමත් මෙහි බ්‍රහ්මචරියාව වනබැවින් කාමෙසුමිච්ඡාචාරාවෙරමණී සික්ඛාපදංසමාදියාමි, කියා මිථ්‍යාචාර අකුසලයෙන් දුරුවීම තුන්වෙනිකොට දක්වනලදි, ඒ පංචශීලය සමාදන්වන උපාසකජනයන් විසින් පළමුකොට තමාවිසින් සමාදන්ව ගත් සරණගමනයාගේ නොබිඳීම පරීක්‍ෂාකටයුත්තේය්, ඉදින් යම්කිසි අසත්පුරුෂසංසර්ගාදි යම්කාරනයකින් සරණය බිඳුනේවීනම් ඔහුවිසින් පළමුකොට සමාදන්වූ සරණය නැවතත් සමාදන් වියයුතු, සරණය නොබිඳුනේවීනම් පංචශීලය පමණක් සමාදන්වියයුතු, නමුත් සරණයඇත්තනුම වීනමුත්

නැවත සරණගාමී නිවරදිබැවින් ශීලසමාදානයට පූර්වයෙන් පිහිටායුත් සරණාගමන පූර්ණයෙන් තමාගේ චිත්තසන්තාන යෙහි පැවති විරුද්ධක්ලේශයන් පහවූ කල්හි පහවූපංචශීලයා ගේ විපුලතරඵල ප්‍රතිලාභයට හෙතුවනබැවින් සරණගමනය පූර්වාඞ්ගවව සමාදන්වීමයුතුයි මැයි. එසේ සමාදන්වන්නහුවිසි න්නුදු ශීලලක්ෂණ දන්නා භික්ෂුනමක් හෝ භික්ෂුණියකහෝ සාමණේර උපාසක උපාසිකාවකගෙණක්හෝ ලද්දේවී නම් ඔවුන් සමීපයෙහි බුදුන්කෙරෙහි ගෞරව උපදවාගෙණ සතුටු සොම් නසින් පිරිම සිත්වෙත් ඇතිව අජ්ජදිවසං තියාහෝ අජ්ජආදිංකත්වා කියා හෝ ඉමඤ්ච පඤ්චමාසෙ උතුම්හි සංවච්ඡරෙ කියාහෝ මෙ සේ කාලපරිච්ඡෙදනවත් උත්සාහ ඇතහොත් ආපාණකොටිකං කියා ජීවිතපර්යන්තවවත් සිල්දෙන්නාහු විසින් තමතමන්ගේ ස්වකීයභාෂාව කියාහෝ වාක්හෙදකොට පංචශීලය සමාදන්විය යුත්තේය, එසේ සීලදායක අන්කිසිකෙණකුත් නොලදහොත් තුමූම කියනලදක්‍රමයෙන් සමාදන්වියයුතු:—

උපොසථශීලයනම් යටකියනලද දශශීලයෙහි ප්‍රාණාතිපාතාදි පංච ශික්ෂාපදයන් හා විකාලභොජනවිරති ශික්ෂාපදය සවෙනිකොටගෙණ සත්වෙනිවූ නච්චගීතාදීන් විරමනශික්ෂාපදයද අටවෙනිවූ මාලාගන්ධාදීන් විරමනශික්ෂාපදයද යනමේදෙක අෂ්ටාඞ්ගශීලය දක්වනතැන සත්වෙනි එකම ශික්ෂාපදයක්කොට සමාදන්ව උච්චාසයන විරමනශික්ෂාපදය අටවෙනිකොට සමාදන්වන ලද ශීලය අෂ්ටාඞ්ගශීලයනම්වේ, ඒ ශීලයවනාහි අට්ඨඞ්ගසමන්නාගතොඛොවිසාඛෙ උපොසථොඋපවුත්ථො යනාදික්‍රමයෙන් උපොසථ සූත්‍රයෙහි දක්වා වදාළබැවින් උපොසථශීලයයි කියනුලැබේ, එහි ප්‍රාණාතිපාතාදි පස්පව්විභාගයද දශඅකුශලකර්ම පථප්‍රභෙදය කීතැන ප්‍රකාශක්‍රමයෙන් බලාදතයුතු?

අබ්‍රහ්මචරියා විරමනශික්ෂාපදාදි සෙසුශික්ෂාපදවිභාගය මෙහි දක්වනුලැබේ.

අබ්‍රහ්මචර්යාවනම් ස්ත්‍රීපුරුෂදෙදෙනාගේසමවාසසංඛ්‍යාත අසෙෂ්ඨචර්යාවය ඒමෛථුනයවනාහි අප්පස්සාදකාමා බහුදුක්ඛා බහුපායාසා බහුආදීනවා එත්ථභියො යනාදික්‍රමයෙන් නින්දිතවූ ගර්හිතවූ හීන ක්‍රියාවක් වනබැවින් ශ්‍රෙෂ්ඨනොවූ ප්‍රශස්තනූවූ ස්ත්‍රීපුරුෂයන්ගේ ලාමකචර්යාව අබ්‍රහ්මචර්යාවයයි කියනුලැබේ, අර්ථවශයෙන් වනාහි කායද්වාරයෙහි පැවති අසද්ධර්මප්‍රතිසෙවනස්ථානයෙහි මෛථුනසෙවනචෙතනාව අබ්‍රහ්මචර්යා නම්, එහි අසද්ධර්මප්‍රතිසෙවන

ඝාතනය නම් ස්ත්‍රීපුරුෂාදීන්ගේ තුන්ප්‍රකාරවූද විප්‍රකාරවූද මාර්ගයන්ගේ ප්‍රකෘතිමාර්ගය නොවදනාතැන අසද්ධර්මප්‍රතිසේවනස්ථාන නම් වේ, ඒ මාර්ගසේවනය නිර්මානයන අබ්‍රහ්මචර්‍ය්‍යාවෙන් වෙන් වීම ශ්‍රේෂ්ඨචර්‍ය්‍යා නම්.

විකාලභෝජනය නම්. වැළඳියයුතු අර්ථයෙන් භෝජනම්වූ කැඳබත්ආදිපෙරවරු වැළඳියයුතුසියල්ල යාවකාලිකවස්තූනම්, අර්ථවශයෙන් වනාහි ඒයාවකාලික වස්තූන්ගේ විකාලයෙහි වැළඳීමය යනාකායවාරයෙහි පැවැත්තාවූ විකාලයෙහි යාවකාලිකවස්තු අනුභවකරණයෙවනනාව විකාලභෝජනයයි දතයුතු.

නච්චගීතවාදිතවිසූකදස්සනා යන්නෙහි නච්චනම් තමානැටීමහා අනුන්ලවා නටවාලීමයි, ගීතනම් තමා ගායනාකිරීමහා අනුන්ලවා ගායනාකරවීමයි, වාදිත නම් බෙරආදිය ගැසීමහා අනුන්ලවා ගස්වාලීමයි, විසූකදස්සනනම් මෙකී නෘත්‍යගීත වාද්‍යයන්ගේ දැකීමහා ඇසීමද බ්‍රහ්මජාලසූත්‍රයෙහි හස්තිඅශ්වයුද්ධදැකීමහා එළුවන් කුකුලන්ආදීන්ගේ පොරසෙනග දැකීමය යනාදිවිසූළුදස්සනන් දුරුවීමවදාළබැවින් නෘත්‍යාදීන්ගේ දර්ශනශ්‍රවණයවනාහි සබ්බපාපස්සඅකරණං යනාදිනයින් පැවත්තාවූ භාග්‍යවතුන්වහන්සේගේ අනුශාසනාවට අනුලෝම්නොවන බැවින් නුසුදුසුබැවින් නොකටයුතුමය, මෙහි විසූකදර්ශනයෙන් ශ්‍රවණයද සංග්‍රහිතවිය එහෙයින් තමාහෝ අනුන්විසින්හෝ මෙහෙයනලද නෘත්‍යගීතාදිසියල්ල දක්නට හෝ අසන්නටහෝ පෙහෙවස්සමාදන්වූවාහට නොවටනේයයි කියනලදි, අර්ථවශයෙන් වනාහි නෘත්‍යාදිය තුමූ කිරීම අනුන්ලවා කරවාලීම මෙහෙයනලද දෙයක් දැකීම ඇසීමයයි කියනලද කායවචීද්වාරද්වයෙකින් පැවැත්තාවූ දුස්සීලයචේතනාව නච්චගීතවාදිතවිසූක දස්සනයයි කියනලදැයි දතයුතු.

මාලාගන්ධවිලේපනධාරණමණ්ඩනවිභූසනට්ඨානා යන්නෙහි මාලාශබ්දයෙන් කීයේ ගෙතූහෝ නොගෙතූ කීසියම්මල්ජාති ඇද්ද ඒසියල්ල මාලායයි දතයුතු, පෙහෙවස්සමාදන්වූවාහට අලංකාරපිණිස කයින් ඒ මල්ධැරීම නොවටනේයි, ගන්ධශබ්දයෙන් කියේ සුවඳකැවූ චූර්ණ සුවඳදුම්හා විලෙපනයෙන් පිටත් අන්‍යවූද යම්සුවඳජාතියෙක් ඇද්ද එහැම උනුතැන්පිරවීමද සුවඳවත් බන්ධනයද නොවටනේයි, විලේපනසබ්දයෙන් කීයේ ශරීරමුඛ ඡවිවර්ණය වඩනාපිණිස ගැල්වීමට අඹරා පිළියෙළකරණලද

මැට්කල්ක තලකල්ක කසාකල්කආදිවූ යම්කිසි මුඛ චූර්ණයෙන් ඇද්ද එසියලුජව්රාගකරණය විලෙපනනම්යැයි දතයුතු. එසියල්ල ජව්වර්ණවශයෙන් විභූෂණයද නොවටනේයි, එමෙසේ තුන්වැදුරුවූ මල්ගඳවිලවුන් යථාක්‍රමවූ ධාරණාදිවශයෙන් ලෝවැසි ජනතෙම කායචාරයෙහි පැවති දුස්සීල්‍යචෙතනාව හෙතුකොටගෙණ සෙවනයකරන්නේය, එමාලාගන්ධවිලෙපනයන්ගේ ධාරණයද මණ්ඩනයද විභූෂණයද යනමෙසියල්ල පෙරහව්ස්සමාදන්වූවාහට නොවටනේයි, සැරහීම්වශයෙන් නොවූවස න්නාහට මුඛයෙහි විවර්ණභාවය පහරණප්‍රර්සන්බෙහෙත්වසයෙන් සෙවනය කරන්නාහටද වරදනැති.

උච්චාසයන මහාසනයන්නෙහි උච්චාසයනනම් මධ්‍යමප්‍රමාණවූ පුරුෂයාගේ අතින් මිට්රියනින් උස්පාඇති සයනය උච්චාසයනයයි දතයුතු, ගෙද මධ්‍යම්ප්‍රමාණ පුරුෂයාගේ අතින් මිට්රියන් උස්පාඇති සයනය උච්චාසයනයයි දතයුතු, හේ මධ්‍යමප්‍රමාණපුරුෂයාගේ මිට්රියන්ප්‍රමාණය වනාහි දැන් මේ ලොව පවත්නා වඩුරියනෙන් රියනෙක, ඒ ප්‍රමාණය ඉක්මසිටි ආසන්දියයි කියනලද පාදවල වාලරූපපිහිටුවා කරණලද දික්සහලා පුටුව පර්‍යඞ්කනම්, එහෙයින් සයනග්‍රහණයෙන් ගත්පමණකුත් හිඳිනාආසනයක්හෝ සැතපෙන ආසනයක්හෝ ලැබ කැපඇතිරිලි අතුලේවී නමුදු උස්ආසනයද්හෝ නොවේද්දහෝයි පරීක්ෂාකොට පාදතලපටන් සයනයාගේ අටනියට කෙළවර දක්වා ඇසීන්දුටු ප්‍රමාණයෙන්හෝ හස්තප්‍රමාණයෙන්හෝ මැන නියමකොටගෙණ කියනලද ක්‍රමයෙන් ඉදිත් මිට්රියන්පමණ පාඇති කැපආසනයෙක් වීනම් වලංජනය කටයුතු, ගෙවත් හිඳීම් සැතපීම්වශයෙන් පරිභොගකටයුතු, කැපනැත්තේවීනම් දුම්යයුතු, මඤ්ච්ජමායංච සයෙථ සන්ථෙතෙ යනුවදාළබැවින් කැපඇතිරි අතුල බිම්හෝ නොඅතුලබිම්හෝ භාණ්ඩපණීඅතුට කරණලද ආසනාදියෙහි හිඳීම සැතපීම කටයුතුය, කප්‍රාල්පැදුරු ආදිය කැපඇතිරිස්සංග්‍රහයට ගියහයි දතයුතු, මහාසයනනම් කැපඇතිරිලිම්හත්බැවත් මහාසයනය සනසතරඟුලෙන් අධිකදික් ලොම්ඇති ගොනකාදිදු කැපඇතිරි අඳලඇඳදුටියයි දත්යුතු, එහිඅකප්පියාස්තරණයෝ නම් ගොනකො චිත්තිකා පටිකා තූලිකා විත්තිකා උද්දලොම් එකන්තලොම් කට්ටිස්සං කොසෙය්‍යං කුත්තකං හත්ථත්ථරකො අස්සත්ථරකො රථත්ථරකො අජිනප්පවෙණි කාදලිමිගපවරපච්චත්ථරණං සඋත්තරච්ඡදං උභතො

ලොහිතකූපධානං හී අනෙකප්‍රකාරවූ අකප්පිය ආස්තරණයන්අතු රෙන් යම්කිසි ඇතිරියක් අතුලසයනාසනයකහෝ යටත්පිරිසෙ යින් භූමියෙහිහෝ අතුට හිඳිනටහෝ සැතපෙන්නටහෝ පෙ හෙවස්සමාදන්වූවාහට නොවටනේය.

එකී ගොනකාදිආස්තරණයන් දක්නාකැමැත්තන් විසින් බ්‍රහ්මජාලසූත්‍ර වණ්ණනාදියෙන් බලාදතයුතු, අතිවශයෙන් වනාහි කායවාරයෙහි පැවති අකප්පිය උච්චාසයන මහාසයනයන් පරිභොගකිරීමය යනාදුස්සී ප්‍රභෙදනාව උච්චාසයන මහාසයනා යයි දතයුතු, යටකිනලද ක්‍රමයෙන් අනෙකාදීනවඇති ප්‍රාණාතිපාතාදි අකුශලයන්කෙරෙන් විරමනස්වභාවවූ උච්චාසයනාදීන් විරමනය අවසානවසිටි මේවිරතිශීලශික්ෂාපදයන් අටදෙනාගේ සමාදානය උපොසථශීලනම්වේ, ඒඋපොසථශීලය සමාදන්වන්නන්විසින් සෙටදවස පෙහෙවස් සමාදන්වෙමියි සිතා අද දවස මෙනම්මෙනම් දෙයක් කරවයි කියා දෙවෙනිදා පෙහෙවස් සමාදන්වසිට ගෙදරදොර කලමනා කටයුතු, විචාරීම නුසුදුසුබැවින් ආහාරාදිසියලුකටයුතු නොමුලාව කාරණලෙස විචාරා ඔවුනොවුන්ට භාරකොට පෙහෙවස් සමාදන්වනදා උදෑසනම යටකියනලද ක්‍රමයෙන් සීලලක්ෂණයන් දන්නා තැනක්කරා පැමිණහෝ නැතහොත් උපාසකශීලය තුමූම සමාදන්වීම වටනාබැවින් තුමූම හෝ පළමුකොට සරණගමනය සමාදන්ව අහංභන්තෙ අජ්ජ ඉමංචදිවසං ඉමංචරත්තිං කියාමේ ආදික්‍රමයෙන් කාලපරිච්ඡෙද කොට උපොසථං උපවසාමි අට්ඨඞ්ගසමන්නාගතං සීලං සමාදියාමි යනුයෙන් එක්කොට සමාදන්ව නැවතද ඒ ඒශික්ෂාපද නානාවිරති චෙතනාවනබැවින් වෙන්වෙන්වද සමාදන්වීම සුදුසු හෙයින් පාණාතිපාතා වෙරමණීසික්ඛාපදං සමාදියාමි—පෙ— උච්චාසයන මහාසයනා වෙරමණීසික්ඛාපදං සමාදියාමි යනමේ පාලික්‍රමය කියා හෝ පාලිය නොදන්නහුවිසින් සිකපද වෙන්වෙන්ව තමූතමාගේ භාෂාවෙන් කියාහෝ එසේත් නොපිලිවන්විනම් බුද්ධපඤ්ඤත්තං උපොසථං අධිට්ඨාමි කියා එක්කොට අධිෂ්ඨානකිරීම්වශයෙන් හෝ යනමේ එක්නරා ආකාරයකින්හෝ වාක්හෙදකොට සමාදන්වියයුතු, මෙසේ පෙහෙවස් සමාදන්වූ උපාසකඋපාසිකා ජනයන්විසින් සීලසමාදානයෙන් යෙදුනුනැත්පටන් අන්කෙණෙකුට හිංසාපීඩාවන කර්මාන්ත විධානනොකොට ප්‍රත්තේය,ගෙයි අයවියදම්ගණන් නොබලා ගෙටඅවුත් නිතිබන්ව ලදන භික්ෂූන්කෙණෙකුන්මෙන් , සංහිඳි හිඳ වළඳ විහාරයට

හෝත් බණඇසීමෙන්හෝ නොහොත් විවේකස්ථානයෙහි හිඳ බුදුන්ගේ ගුණ සිහිකිරීමය තමාගේ ශීලය සිහිකිරීමය යනාදිවූ අටසිත්අරමුණෙන් එක්අරමුණක් නිරන්තරයෙන් සිහිකොට සිතපිරිසිදු කරගත්තේය, මේ අෂ්ටාඞ්ගශීලය ලබනලාභ සත්කාර කීර්තිප්‍රශංසාදියක් නිසා රක්ෂාකිරී මෙතුන් සීලය කිළුටු වන්නේය.

තවද මෛථුනයෙනුත් සීලයකඩවන්නේය ඒ සප්තමෛථුනයනම් කවරහුදයත් මේපෙහෙවස් වසනඅතුරෙයි ස්ත්‍රීන්හා සමග අසද්ධර්මයෙහි නොපවතිනත් ස්ත්‍රීයවිසින් කරණලද ඇඟ ඉලිම්ඇඳියක් ඉවසීනම් මේත් එක මෛථුනයක එසේනොඉවසනත් ස්ත්‍රීන්හාඑක්වකථාසිනාක්‍රීඩා ආස්වාදය කෙරේද මේත් එක මෛථුනයක, මෙකීදෙයනොකරනත් තමාගේ දෘෂ්ටියෙන් ස්ත්‍රීයගේ දෘෂ්ටිස පැහැර බලාද ඇබැලිමෙන් ආස්වාදදියකෙරේද මේත් එකමෛථුනයක, එසේ නැවත කථාසල්ලාපරොදන ගායනාදි ස්ත්‍රියගේ ශබ්දය පිටිබිනකහෝ පවුරෙන්පිටතහෝ සිට අසාද ඒ ඇසූසබ්දය ආස්වාදකෙරේද සතුටුවේද මේත් එක මෛථුනයක, එසේනොකරනත් ස්ත්‍රියහාසංග පූර්වානුභූතකෙළි සිනා සිහිකොට ආස්වාදාදිය කෙරේද මේත් එක මෛථුනයක, එසේනැත දනඛශබ්දද පඤ්චකාමරසයෙන් සතුටුණුව වසන්නාවූ ගෘහපතිපුත්‍රාදීන් දැක ආස්වාදවශයෙන් සතුටුවේද මේත් එක්මෛථුනයක, එසේ ඉසුරුමතුන් දැක ඔවුන්ගේ සැප විඳීමට ආස්වාදනොකරනත් මේ රක්ෂා කරණශීලාදියෙන් ශක්‍රාදිදෙව්කෙනෙකුන්ගේ තනතුරට පැමිණෙමියි පතාද දිව්‍යසම්පත්තියට ආශ්වාදකෙරේද මේත් එකමෛථුනයක, මෙසේදක්වනලද සප්තවිධ මෛථුනයන් අතුරෙන් එකක්නම් ශීලයකඩවන්නේය සිදුරුවන්නේය, කිළුටුවන්නේය, එසේම පෙහෙවස්සමාදන්වූ උපාසිකාවන්විසිනුදු පුරුෂයන්ගේ ඇඟඉලිම්ආදිය මෙකීක්‍රමයෙන්ම ඉවසාසතුටුවන්නේවී නම් ඒසීලයද කඩවන්නේය, සිදුරුවන්නේය, කිළුටුවන්නේය, අනේකවූප්‍රකාරයකිනුදු පෙහෙවස්වසීම අනුදැනවදාරණලද්දී ඒකෙසේදයත් පාලියං කච්චි බහුමත්තුස්සා මත්තෙය්‍යා මගෙත්තායක පෙගෙත්තායක සාමඤ්ඤා බ්‍රහ්මඤ්ඤා කුලෙජෙට්ඨාපචායිනො උපොසථං උපවසන්ති පටිජාගරොන්ති පුඤ්ඤානිකරොන්තීති.

මෙහි අර්ථනම්, මනුෂ්‍යයෝ, මිනිසුන්කෙරෙහි බහුමත්තුස්සා බොහෝමිනිසුසු, මත්තෙය්‍යා පෙත්තෙය්‍යා, මව්පියන්පුදන්නාහුය

සාමඤ්ඤා බ්‍රහ්මඤ්ඤා, ශ්‍රමණබ්‍රාහ්මණයන් පුදන්නාහුය; කුලෙ ජෙට්ඨාපචායිනො, කුලදෙටුවන් පුදන්නාහුය; උපොසථං උපවසන්ති, මසකට අටවරක් බැගින් පොහෝදවස්වල පෙහෙවස් සමාදන්ව වසන්නාහුය; පටිජාගරොන්ති, පටිජගර නම් උපොසථකර්මය කරන්නාහුය; පුඤ්ඤානි කරොන්ති, තමාගේ සිතපිණවනගෙයින් පින්යයි කියනලදනම් ඇති අනාථවූද කුශලකර්ම කරන්නාහුයයි කියා පාලියෙහි ප්‍රකාශබැවින් පටිජගරොන්තියනාමෙපදයෙහි අර්ථවර්ණනාකරණ පූර්වාචාර්යවරයන් විසින් මෙසේ වර්ණනාකරණලද්, ඒ කෙසේද? පොහොයක් පොහොයක් පාසා පෙහෙවස් සමාදන්වන පින්කැමති සත්පුරුෂ උපාසක උපාසිකාජනයන් විසින් වඩවඩා කුසල්වඩන අධිකතරශ්‍රද්ධාවෙන් පොහොදිනවලට පූර්වාපරදවස්වලද පච්චුග්ගමනානුග්ගමන වශයෙන් උපොසථශීලය සමාදන්වියයුතුයයි කියා ප්‍රකාශකරණලදි, එසේ අනාථවූද පෙහෙවස් විසීමක් ඇත්තේය; ඒ කෙසේදයත්? :—

චාතුද්දසිං පඤ්චදසිං යාව පක්ඛස්ස අට්ඨමී,
පාටිහාරියපක්ඛඤ්ච අට්ඨඞ්ගසුසමාහිතන්ති.

යනාදි පාලියෙහි අර්ථවර්ණනාකළතැන පාටිහාරියපක්ෂයයි කියා දක්වූයේ භික්ෂූන්වහන්සේලා ශාසනපිළිවෙත් පුරමින් වස් ඉටා වාසයකරණ ඇතුළුතුන්මසය, ශ්‍රද්ධාසම්පන්න උපාසකජනයෝ ඒ වස්තුන්මාසයෙහි නිබද්ධපෙහෙවස් සමාදන්ව කුශලවර්ධනයෙහි යෙදී වසන්නාහුය, එසේ නොහැකිවූවන්විසින් මහාපවාරණයයි නම්ලද වක්මසපුරදෙපෝය පටන් පශ්චිමපවාරණනම්ලද, ඉල්මස පුරදෙපෝය දක්වා එක්මාසයක්පමණ නිබද්ධ පෙහෙවස් වස්තුන්මසයෝ මාසයක්හෝ අර්ධමාසයක් පමණ කාලයෙහිහෝ අධිෂ්ඨානකොට උපොසථශීලය රක්ෂාකිරීම උපාසකොපාසිකාජනයන්ට සුදුසුවන්නේමය, සෙසුආචාර්යයන් වහන්සේලාගේ මතයෙන් එක්වර්ෂයකට හෙමන්ත ග්‍රීෂ්ම වස්සාන යයි කියා සෘතුතුනෙක් වන්නාහුය, ඒ තුන්සෘතුයෙහිම එකිනෙක අර්ධමාසය අර්ධමාසයබැගින් පෙහෙවස් සමාදන්වීම වටනේයයි කියනලදී. උපොසථශීලශික්ෂා පදයන්ගේ සමාදානය පොහොදවස හැර සෙසුදවස්හි විරුද්ධදැයි කිවහොත් විරුද්ධනැත්තේය, ලොකයෙහි සනදිවසයයි කියා වෙන්වදවසක් ඇත්තේ නොවෙයි සනකෙළිකාලදවසට නියතනතෙක, එමෙන් උපොසථශීලය

සමාදන්වූදිනට පොහොදිනය යනුනමෙක, එහෙයින් ලෝකයෙහි අභ්‍යන්තරව කුශලරාශිවර්ධනය කරගන්නා කැමැති නුවනැත්තාන්විසින් පචම් අෂ්ටම් චාතුර්දශී පඤ්චදශී යනපොහෝ දිනවලට පූර්වාපරදවස්වල ප්‍රතිගත උපෝසථයයි කියා පෙහෙවස් සමාදන්වීමෙන්ද ප්‍රාතිහාර්‍ය්‍යපක්ෂයයි කියලද ඇසළමසපුරදෙපෝයෙහිපටන් වස්තුන්මසහෝ වක්මස දෙපෝයෙහි පටන් මාසයක්හෝ අර්ධමාසයක්හෝ උපොසථශීලය සමාදන්වන උපාසකොපාසිකා ජනයන්ගේ ශ්‍රද්ධාවීර්‍ය්‍යබල ප්‍රමාණයෙන් ඒ ඒ කාලපරිච්ඡේදවූලෙස පෙහෙවස් රක්ෂාකිරීමෙන්ද ධර්මශ්‍රවණාදිකුශල ධර්මයෙහි අප්‍රමාදව යෙදෙනසේ භාග්‍යවතුන්වහන්සේවිසින් මෙසේ අනුදැනවදාරණලදී, එහෙයින් දුකසේලත් ක්ෂණසම්පත් සඵලකොටගන්නාකැමැති නුවනැති සත්පුරුෂයන්විසින් ඍතුමාසපක්ෂ දිවසාදි වශයෙන් කාලපරිච්ඡේද නියමකොටගෙණ මෙසේ උපොසථාඞ්ගවශයෙන් රැක්කයුතුසීලය උපොසථශීලනම්වේ, එසේ කාලනියමකිරීමෙන්වත් තොරකොට ජීවිතාන්තය දක්වාවත් නියමකොටගෙණ සමාදන්ව රක්නාශීලය නිත්‍යශීලනම්වේ, ඒනිත්‍යශීලයයි කියා පඤ්චශීලයහා දශශීලය පමණක් ප්‍රකාශබැවින්හා තුන්වෙනි ධර්මසඞ්ගායනාකථායෙහි ධර්මාශොකමහරජ අනුසාරදහක් විහාරකරවා විහාරපූජාකාලය නියමකොට ඒතාක්කල් හැමදෙනම අෂ්ටාඞ්ගශීලය සමාදන්ව රක්ෂාකළයුතුයයි ආඥාකළහෙයින්ද අෂ්ටාඞ්ගශීලයට උපොසථශීලයයි ප්‍රකාශව පෙණනහෙයින්ද ප්‍රතිපත්තිසඞ්ග්‍රහයෙහි නිත්‍යශීලවශයෙන් අෂ්ටාඞ්ගශීලයාගේ රැකීම නිවරද්‍යබව ප්‍රකාශවී නමුදු විමසා බලා දතයුතුයි කියා උපාසකජනාලඞ්කාරයෙන් දක්වූයේවී නමුදු●ර්ට පළමුව වදාරණලද ප්‍රතිපත්තිසඞ්ග්‍රහයෙහි නිත්‍යශීලවශයෙන් රක්නාට අනුදත්දශශීලයෙහිම අෂ්ටාඞ්ගශීලයඇතුළත්ව සිටීහෙයින් විශුද්ධිමාර්ගයෙන් නිත්‍යශීලය දක්වූතැන දසවා යනවා ශබ්දයෙන් අෂ්ටාඞ්ගශීලයත් ඇතුළත්ව සිටිහෙයිනුත්දශශීලයෙන් ඡටත්ශික්ෂාපදයන් අෂ්ටාංගශීලයෙහි දක්නාට නැතිහෙයිනුත් භික්ෂූන්වහන්සේලාට අනුදත්වනයපිටකයෙහි නානිකබවෙ අනුපොසථෙ උපොසථො කාතබ්බො යනුයෙන් අනුපොසථදිනයෙහි පොහොය නොකටයුතුයයි කියා භික්ෂූන්ට ප්‍රතික්ෂෙපකළසේ පොහොදිනහැර සෙසු දවස්වල උපොසථශීලය සමාදන්නොවිය යුතුයයි යන ප්‍රතික්ෂෙපයකුත් නැතිහෙයිනුත්උපාසකජනයන්ගේ ශ්‍රද්ධාප්‍රමාණයෙන් අෂ්ටාංගශීලයද නිත්‍යසිලාදි වශයෙන් රක්ෂාකිරීම සුදුසුවන්නේයයි හඟිමු?

එහි සෙසු ශික්ෂාපදයන් යට කී හෙයින් ජාතරූප රජතාදීන් විරමණශික්ෂාපදයන්ගේ අර්ථය පමණක් මෙහි දක්වනු ලැබේ, ජාතරූප යන්නෙහි ජාතරූපනම් රත්රත්ය, රජතනම් රිදීය, ලෝහමාසක ජතුමාසකාදී යම් යම් තැනක ව්‍යවහාරයට යන මසුජාතියෙක් ඇද්ද රන් රිදී තඹ එක්කොට රූපගාකළ කහවනුද යනමේ සියල්ල තමා පිණිස දුන්තැන හෝ අස්වාමිකව තුබූ රන්රිදිආදි යම්කිසිවක් දැක තමාවිසින් ගැන්මෙන් හෝ අනුන්ලවා ගන්වාලීමෙන් හෝ මේ මිළය ස්වාමීන්ටවේවයි සම්මුඛවත් අසම්මුඛවත් කයින්හෝ වචසින්හෝ දුන් දෙයක් කායවාක්දෙකින් ප්‍රතික්ෂේප නොකොට කයින් වචසින් මනසින් යන තුන් දෙරින් වෙන්ව හෝ එක්ව හෝ පිළිගන්නේ ඉවසුයේවිනම් හෙතෙම රන් රිදී පිළිගත්තානම්වෙයි, ඒ ස්වර්ණාදීන්ගේ පිළිගැණීමෙන් විරමනයද දශවෙනි ශික්ෂාපදයාගේ අර්ථනම්වේ, කම් ප්‍රයොජනයයි කියනලද සියලුශික්ෂාපදයන්ගේ පිළිවෙලවූ පරිදි මෙසේ දතයුතු, ඒ කෙසේදයත් ?

සත්වයන්ගේ සියලුආරම්භයට ජිවිතෙන්ද්‍රිය මූලකාරණයවන බැවින්ද සත්වයන්ට ජීවිතය ඉතාප්‍රියමනාපබැවින් පළමුකොටම ප්‍රාණාතිපාතයෙන් විරමණශික්ෂාපදය වදාරණලදි, ඊටඉක්බිති ධනපැහැර ගැන්මද සත්වයන්ගේ ජීවිතහරණයමෙන් අප්‍රියබැවින් අදත්තාදානයෙන් විරමණශික්ෂාපදය වදාරණලදි, සත්වයන්ගේ ජීවිතහා ධනසම්පත් දෙක සත්‍රීන්ගේ ස්ත්‍රීආදියනිසා පරිත්‍යාග කරන්නාහුයයි දැන ඊටඉක්බිතිව අබ්‍රහ්මචරියා විරමණය හා කාමමිථ්‍යාචාරවිරමණ ශික්ෂාපදය වදාරණලදි, යථොක්තමේ කායදුශ්චරිතයන්ට අනතුරුව වාක්දුශ්චරිය දක්වනුපිණිස ඊට ඉක්බිතිව මුසාවාදවිරමණ ශික්ෂාපදය වදාරණලදි, සුරාපානය කායකර්මවීනමුදු ඒසුරාපානය කිරීමෙන් ප්‍රාණඝාතාදිමේ සියලුපාප සිද්ධවන්නේයයි දක්වනපිණිස ඊටඉක්බිතිව සුරාපානයෙන් විරමනයවදාරණලදි, ලෞකවද්‍යයන්ට අනතුරුව දක්වියයුතුවූ ප්‍රඥප්තිවද්‍යයන් අතුරෙහි පළමුකොට නිරොගිභාවාදියට කාරණාවූ භොජනකාලය ප්‍රකාශකොට විකාලභොජනයෙන් විරමනශික්ෂාපදය වදාරණලදි, ඊට ඉක්බිතිව කයින් සිද්ධවනඅනාචාරයන් අතුරෙහි මහත්වරදවූ නැටීමෙන් වැලකීමද ඊට ඉක්බිතිව වාචසික අනාචාරයන් අතුරෙහි මහත්වරදවූ ගීතීමෙන් වැලකීමද ඊට අනතුරුව ඒ නෘත්‍යගීතවයට අනුරූපවූ භෙරිආදීන්ගේ වැයීමෙන් වැලකීමද ඊටඅනතුරුව එම නෘත්‍යගීත

වාදීන්ගේ දර්ශනාදියෙන් වැලකීමද වදාරණලදී, ඊට අනතුරුව සපුෂ්පාරම්මණවූ මාලාගන්ධවිලේපනයන්ගේ යථාක්‍රමයෙන් ධාරණමණ්ඩණවිභූෂණයෙන් වැලකීමද ඊට ඉක්බිතිව ස්ථූලාරම්මණවශයෙන් සංස්කාරාරම්මණවූ උච්චාසයනමහාසයනයන්කෙරෙන් වැලකීමද අනතුරෙහි වනාහි කායවචී මනොකර්මභූතවූ රන් රිදී මසු කහවණු පිළිගැන්මෙන් වැලකීමද දශශීල ශික්ෂාපදයන්කෙරෙහි ඇතුලත්කොට වදාරණලද්දයි දතයුතු.

විසුද්ධිමග්ග පන සති වා උස්සාහෙ දසානි ගන්තුයෙන් විසුද්ධිමාර්ගයෙහි උපාසක නිත්‍යශීලය දක්වූතැන පළමුවෙන්ම ශාසනයට බස්නා උපාසකොපාසිකා ජනයන්ට හෙළුදීනවශයෙන් මේ දශශීලය දක්වූවහොත් හාත්පසින් තමාවෙලා හිඳුවාක්මෙන් සිතහුයේ කිසිවක් රක්නට උත්සාහ නොකරන්නේ හෝ රක්නේද ශීලභෙදයට පැමිණීමෙන් හා රන් රිදී මසු කහවණු පිළිගැන්මෙන් දුරුව ගෘහවාසයෙහි කටයුතු ව්‍යවහාර පරිමසාගැන්මහාරලෙසින් සිතන්නාවූ උපාසක ජනයන්ගේවශයෙන් උත්සාහයක් නැතුවම රැක්කයුතු පංචශික්ෂාපදකෙණෙක් නියමකොට වදාරණලද්දාහුයි. රක්ෂාකිරීම කිසිවක්විසිත්තුන් දුස්කරනොව පහසු බැවින් ඒ ප්‍රාණිපාතාදී පස්පවින් වැලකීම නිත්‍යසීලවශයෙන් පළමුකොටම වදාරා දෙවනු මේ ශාසනයෙහි හැසිරීම ගෙතුකොටගෙණ ශ්‍රද්ධාප්‍රඥාදි ගුණවැඩීමෙන් උත්සාහ ඇතහොත් නිත්‍යසීලවශයෙන් අෂ්ටාඞ්ගසීලයත් ඇතුලත්ව සිටි "ජෙෂ්ඨවූද දශසීලයම රක්නට අනුදත්බැවින් පින්වත් ජොතිපාලම්හතෙරුන්වහන්සේ විසින් එසේම ඒ සියලු සීලයන්ම නිත්‍යසිල උපොසථ නියමාදුවශයෙන් සමාදන්වීම සුදුසුලෙස වදාරා එම අර්ථය ප්‍රකාශකරන්නාහු විසින් වාසබද්ධාර්ථයන් පංචසීලයහෝ අෂ්ටාඞ්ග සීලයහෝ දශසීලයහෝ නිත්‍යවශයෙහුදු උපොසථාඞ්ගවශයෙන් සමාදන්ව රක්නට වටනාහෙයින් සියළු සීලය කල්‍යාණකරණු ලැබෙයි, දක්වනලදී.

එහි ප්‍රාණතිපාතාදි අකුශලයන්කෙරෙන් දුරුවීම ස්වභාවකොට ඇති නිත්‍යසීල උපොසථසීලයත් තමාගේ ජීවිතයෙහිදු අපෙක්ෂා නොකරන්නාහු විසින් බුදුන්කෙරෙහි ශ්‍රද්ධාපිහිටා ගැන්මෙන් අප්‍රමාදව මනාකොට රක්ෂාකටයුතු.

අපෙක්ඛං අකරොන්තෙනාන ජීවිතෙපි තථාගතෙ,
සද්ධාය අප්පමත්තෙන රක්ඛිතබ්බං වසාධුකං ඉති,

නියතලද බැවින් යම්සේ කිකීනම් සකුණිකාව ඇතුයේ පයින් සුනුවිසුණුව යත්තිවිනමුදු ජීවිත පරිත්‍යාගකොට තමාගේ බිජුවටම රක්නීද යම්සේ වැද්දන් විසින් පිරිවරණලද සෙමර ධෙනුව ජීවිතය ත්‍රිනලවනයක් මෙනුදු නොසිතන්නී කටු වනලැ හැබ්ඵාදියෙහි ලග්නවූ තමන්ගේ වාලධියම රක්නීද එපරිද්දෙන් දිවි නොසලකා සීලය රක්‍ෂාකටයුත්තේය, හෙද එක් ප්‍රිය පුත්‍රයෙක් ඇති මවසේ එක් ඇසක් ඇති මිනිසෙකුසේ අප්‍රමාදව රක්‍ෂාකටයුත්තේයි, මෙම නියනලදමැයි:—

කිකීව අණ්ඩං චමරීව වාලධිං,
පියංව පුත්තං නයනංව ඒකකං,
තථෙව සීලං අනුරක්ඛමානකා,
සුපෙසලා හොථ සදා සගාරවා—යි.

මෙසේ නිත්‍යසීලය හා උපොසථසීලය රක්‍ෂාකරන්නාහු මිසිනුදු:—

කණ්ඩා දිනම්භාවෙන භුජිස්සාදිගුණෙහි ච,
අවියුත්තං තථාහොති රක්ඛිතබ්බං තථා දරා

යනුහෙයින් ඒ ඒ සීලයන්ගේ ආදියෙහිවූ පළමුවෙනි ශික්‍ෂාපදය හෝ අන්තයෙහිවූ කෙලවර ශික්‍ෂාපදය හෝ බිඳුනේවිනම් ඒ සීලය කෙළවර සිඳීගිය වස්ත්‍රයමෙන් වූ හෙයින් කඩවූ සීලය නම් වෙයි, යම් සීලයක මධ්‍යයෙහි ශික්‍ෂාපයෝ බිඳුනාහු විනම් ඒ සීලය සිදුරුවූ වස්ත්‍රයමෙන් වූ හෙයින් ඡිද්‍රසීලය නම් වෙයි, යම් සීලයක පිළිවෙලින් එක්තැනක දෙතුන්ශික්‍ෂාපදයෙක් බිඳුනේවිනම් ඒ සීලය කාලරත්තාදි එක්තරා වර්ණයකින් විෂභාග වර්ණව පිටෙහි හෝ බඩෙහි හෝ සබලවර්ණයාවසේ හටගත් කැලැල් ඇති දෙනකමෙන් වූ හෙයින් සබලසීල නම් වෙයි, යම් සීලයක අතරතුරෙහි තැනින්තැන එකක්හැර එකක් බැගින් ශික්‍ෂාපදයෝ බිඳුනාහුවෙද්ද ඒ සීලය ශරීරය අතුරෙහි නානාවර්ණ විෂභාගබින්දුසේ කැලල් නැගී විචිත්‍රව ගියදෙනකමෙන්වූ හෙයින් කම්මාසසීල නම් වෙයි, මෙසේ දුරුකටයුතුවූ දෙෂඩහාවූ ඛණ්ඩය ඡිද්‍රය සබලය කල්මාසය යනමේ සතර අඩගයන්කෙරෙන් අඛණ්ඩ අඡිද්‍ර අසබල අකල්මාස වශයෙන් රක්නා ඒ සීලය නිර්වාණයට උපනිශ්‍රය බැවින් තණ්හානමැති ආසාවට දසවම සසර අනාදිමත්කාලයක් විඳිනාලද මහත් දුකින් තමා මුදා භුජිස්සය

යන නිදහස කරණහෙයින් භුජිස්සසීල නම් වෙයි, ප්‍රඥාවන්තයන් විසින් තෙපි රක්නා සීලය ඉතා යහපත ශ්‍රෙෂ්ඨයයි කියා ප්‍රශංසා කරණලෙස රක්නාසීලය විඤ්ඤුප්පසත්ථසීල නම් වෙයි, තණ්හාදෘෂ්ටි දෙකින් පරාමර්ෂණය නොකොට හෙවත් මේ ශීලය රැකීමෙන් ශක්‍රවෙම් රජවෙම් යනාදිවශයෙන් සසරැ විඳියුතු සම්පත් නොපනා තණ්හාවෙන් දුරුව මේ රක්නා සීලයෙන් ඵල ඇද්දැයි යනාදි ක්‍රමයෙන් සිහිකරණ දෘෂ්ටියක්හා මිශ්‍ර නොකොට මෙසේ තණ්හාදෘෂ්ටි දෙකින් වෙන්ව රක්නා ශීලය අපරාමට්ඨශීල නම් වෙයි, පිරිසිදුව රක්නා තමාගේ සීලය සිහිකිරීමෙන් සිත එකඟව උපචාරඅර්පිනා සමාධි උපදනාසේ රකිනා සීලයතෙම සමාධිසංවත්තනික ශීලනම්වෙයි, මෙකියනලද ඉදෘශඅඞ්ග සතරින් දුරුකොට භුජිස්ස විඤ්ඤුප්පසත්ථ අපරාමට්ඨ සමාධිසංවත්තනික යනමේ ගුණාඞ්ග සතර එක්කොට අෂ්ටාඞ්ගසමංවිතව පචසීලාදිවශයෙන් සමාදන්වනලද ඒ ඒ සීලයන්ගේ සියළු සික්‍ෂාපදයන් සර්වාකාරයෙන් නොබිඳිමෙන් හා ප්‍රමාදයකින් හෙදවූ ශික්‍ෂාපදකෙණෙක් ඇත්නම් සාමණෙර සීලයසේ එකක් බින් කල හැම සීලය නැතිනොව බිදුනු සික්‍ෂාපදය පමණක් සමාදන්වූතැන සියලු උපාසකසීලයන් සම්පූර්ණවනහෙයින් එසේ නැවත සමාදන්ව ප්‍රතිකර්ම කිරීමෙන් යහපත්ව පිරිසිදුකොට රක්නාලද සීලයතෙම කවර අර්ථයක් සාධානොදේද? සර්වාර්ථයන් සාධාදෙන්නේයි:—

වජ්ජිතං චතූහි දොසෙහි සමුපෙතං චතූහි ච,
ගුණෙහි රක්ඛිතං සීලං කං පත්‍ථං නසාධයෙති·

මෙසේ අඛණ්ඩාදිභාවයට පමුණුවමින් රක්‍ෂාකටයුතුවූ නිත්‍යසීලය හා උපොසථසීලය අම්නුවූ පව්ටු දුර්ජන පාපමිත්‍රසංසර්ගාදින් දුරුව ක්‍රොධාදි පාපධර්ම සිත්හි පැවතීමෙන්ද සීලය කිළුටුවන්නේය, ඒ එසේමැයි, නිත්‍යසීලාදිවශයෙන් සීලසමාදානයෙහි යෙදී වසන සත්‍වතෙම අනුන්ගේ වරදක් දැක ක්‍රොධ උපදවාද එපමණකිනුදු ඔහුගේ සීලය කිළුටුවන්නේය, එසේම සෙසු පාපධර්මයනුදු සිත්හි පැවතීම හෙතුකොටගෙණ තමාගේ සීලය කිළුටුවනහෙයින් සිල් පැහැරගන්නා සූහිස්යොධ නම්ලද එම ක්‍රොධාදි පාපධර්මයන් අකුශලකර්මපූර්ව්භාග පරිච්ඡෙදයෙහි ප්‍රකාශ ක්‍රමයෙන් බලාගෙණ එයින් තමාගේ සිත පිරිසිදුකොට සිල් පිරිසිදු කිරීමට උත්සාහ කළමැනාවි.

එහෙයින් අප මහබෝසතානන්වහන්සේ ක්ෂාන්තිවාදි තාපසව සංඛපාල නාගරාජව උපන්නැත්පවා කලාබු රාජාදීන්විසිනුදු භොජපුත්‍රාදීන්විසිනුදු නොයෙක් අනර්ථ කරණ කල්හි ඔවුන්කෙරෙහි කිපී බලන බැල්මක් පමණකුදු නොකළසේක, විධුරජාතකාදියෙහි සක්‍රාදිදෙවියන්පවා දිව්‍යලොකාදිය හැර අවුත් මෙහි උයන්ආදියෙහි පෙහෙවස් විසූවාහුයයි යනාදී ඒ ඒ ජාතකද මෙහි දැක්වියයුත්තාහුයි.

උපොසථසූත්‍රයෙහි පෙහෙවස් සමාදන්ව ක්‍ෂුද්‍රසුවිතර්ක දුරුකරන්ට වදාළපරිද්ද කෙසේදයත්? පෙහෙවස් සමාදන්ව සිට ඇතම්කෙණෙක්" අදදවස මම මෙනම් මෙනම් ඛාද්‍යයක් කෑමි, මෙනම් මෙනම් භොජනයක් අනුභවකෙළෙමි, සෙට දවස මම මෙනම් මෙනම් ඛාද්‍යයක් කන්නෙමි මෙනම් මෙනම් භොජනයක් අනුභවකරන්නෙමි" කියාද හෙතෙම ලොභසහගත චිත්තයෙන් යෙදී විසීමෙනුදු අන්‍යවූද කාමවිතර්කාදි ක්‍ෂුද්‍රසු විතර්කයන් කල්පනා කිරීමෙනුදු උපොසථසීලය කිළුටුවන්නේය, සීලය කිළුටුකරණ මේපාපධර්මයන් අතුරෙහි යම්කිසිපාප චෙතනාවකින් කිළුටුවූ නිත්‍ය සීලයහෝ උපොසථ සීලයහෝ මහත්ඵලමහත් ආනිසන්ස නොවන්නේය,

සංකිලෙස විසුද්ධං හි රක්ඛන්තො සීලවත්තනො,
විසං ජීවිතුකාමො'ව ආරකා නං විවජ්ජයෙ.

යම්හෙයකින් නිත්‍යසීලයහා උපොසථසීලය රක්නාකැමති සත්වතෙම ක්‍රොධඋපනාහාදි පාපධර්මයන් සිත්හි නූපදවාලීමෙන්හා උපන්පාපචෙතනා මැඩපවත්වාගැන්මෙන්ද කුසල්දහම් තුනුරුවන් පවත්නා යහපත්ගමෙක ප්‍රදෙශයක විසීමෙන්ද වැඩෙහි යොදන කලණමිත්‍රයන්හා එක්වීමෙන්ද සද්ධර්මශ්‍රවණයෙන්හා සුචරිතාධ්‍යාශයෙන් යෙදී වාසයකරන්නේ වීනම් හෙතෙම සර්වොපද්‍රවයෙන් මිදී ශරත්කාලයෙහි අහස දිලිහෙන හිරමඬලසේ බබලන්නේය.

විසුජ්ඣන්ති යථා සත්තා පහාය මලජල්ලිකා,
සංකිලෙසෙ විහායෙව වොදපෙ සීලමත්තනො.

තවද පෙහෙවස් වසන්නාහුගේ චිත්තය ඉදින් කිසියම් උපක්ලෙශ කෙණෙකුන්විසින් කිළුටුවූයේ වීනම් එකල්හි ඔහු

වීසිත් මාගේ සිත කිළුටුවූයේය, එහෙයින් සීලය නොපිරිසිදුයයි දැන ඒ සීලය පිරිසිදුකරණ පිණිස "ඉතිපිසො භගවා අරහං සම්මාසම්බුද්ධො,, යනාදීක්‍රමයෙන් බුදුගුණ සිහිකටයුත්තේය, මෙසේ තථාගතවූ බුදුන් සිහිකරන්නහුගේ සිත පහදනේය, ප්‍රීති ප්‍රමොද්‍යය උපදනේය, එකල්හි සිත්හි හටගත් කෙලශයෝ පහවන්නාහුවෙත්, ඒකෙසේදයි කිවහොත්– යම්සේ පුරුෂයෙක් තමාගේ හිස කිලුටුවූබව දැක ඊට නිසි ඇඹුල්කල්ක මැටිආදිය ගෙණ හිස උලා සටා ඔහුවිසින් කරණලද උත්සාහය හෙතුකොටගෙණ කිලුටුවූ හිස පිරිසිදුවේද? එපරිද්දෙන්ම මේබුද්ධානුස්මෘතිභාවනාව සිහිකිරීම හෙතුකොටගෙණ ඔහුගේ සීලය පිරිසිදුවන්නේය, මෙසේ බුද්ධගුණසිහිකරමින් වසනමෙතෙම ලොකාග්‍රවූ ශ්‍රෙෂ්ඨවූ බුදුගුණ සිහිකරමින් ශ්‍රෙෂ්ඨඋපාසකාඞ්ගයෙන්යෙදී ශ්‍රෙෂ්ඨවූ බුදුන්හාසමග වසන්නේ නම්වේ,

ඉදින් එසේම ශීලය කිළුටුවූවාහුවිසින් ස්වාක්ඛාතො භගවතා ධම්මොසන්දිට්ඨිකො" යනාදික්‍රමයෙන් පාලිධර්මයහා නවලොකොත්තරධර්මය සිහිකටයුත්තේය, එසේ ධර්මය සිහිකරන්නහුගේ සිත පහළවූපරිද්දෙන්ම කෙලශයෝ පවත්නාහුවෙත් ඒකෙසේදයි කිවහොත්? යම්සේ ශරීරය කිළුටුවූ පුරුෂයෙක් කුරුදුවැලිදියගෙණ ඇඟ උලාසටා සම්බොවනාදිවශයෙන් කාරණලද ඔහුගේ ව්‍යායාමය හෙතුකොටගෙණ කිලුටුවූ ශරීරයාගේ පිරිසිදුවීම වේද? එසේම මේ ධර්මානුස්මෘතිභාවනාව සිහිකිරිමෙන් සිත වැලඳගෙණ සිටි කෙලශයන් පහව්මෙන් ශීලය පිරිසිදුවන්නේය, හෙතෙම ධර්මඋපොසථයෙන් යෙදි ධර්මයහාසමග වසන්නේ නම්වේය.

එසේම ශීලය කිලුටුවූවාහු විසින් "සුපටිපන්නො භගවතො සාවකසංඝො" යනාදීක්‍රමයෙන් සංඝගුණ සිහිකටයුත්තේය, එසේම සංඝගුණ සිහිකරන්නහුගේ සිත ප්‍රීතිප්‍රමොද්‍ය ඉපදීමෙන් කෙලශයෝ පහවන්නාහුය, ඒකෙසේදයි කිවහොත්? යම්සේ කිලුටුවූ වස්ත්‍රය පිරිසිදුකරණුකැමති රජකතෙම දෙතුන්වරක උණුගැන්විමහා හලුගොමයාදි උපකරණත් ගෙණ සටා සොධා කරණලද ඔහුගේ ව්‍යායාමය හෙතුකොටගෙණ වස්ත්‍රය පිරිසිදුවේද එපරිද්දෙන්ම මේ සංඝානුස්මෘතිභාවනාව

සිහිකිරීමෙන් සිත වැළඳගත් කෙලෙශයෝ දුරුව සීලයපිරිසිදු වන්නේය, මෙතෙම සංඝඋපොසථයෙහි යෙදී සංඝයාහාසම ග වසන්නේ වෙයි.

එසේම තමතමන්ගේ සීලය පිරිසිදුකරන්නහුවිසින් තමාසමා දන්වූ සීලය මෙසේ සිහිකටයුත්තේය,ඒකෙසේදයත් ? මා සමා දන්වූ සීලය කෙළවරකින් නුබුන්බැවින් මාගේ සීලය අඛණ්ඩ ය, මැද ශික්ෂාපදයක් නුබුන්හෙයින් මාගේ සීලය අච්ඡිද්‍රය දෙතුන් ශික්ෂාපදකෙණෙක් නුබුන්හෙයින් මාගේසීලය අසබ ලය, එකක්හැර එකක් නුබුන්හෙයින් මාගේ සීලය අකල්මාස ය, තමා තණ්හාදාසභාවයෙන් මුදා නිවන්දක්වනහෙයින් මාගේ සීලය භුජිස්සය, නුවනැත්තන්විසින් ප්‍රසංශාකටයුතුහෙයින් මා ගේ සීලය විඤ්ඤුප්පසත්ථයි, සසර සම්පත් පැතීමක් නැතිහෙ යින් මාගේ සීලය අපරාමට්ඨයයි සිහිකිරීමෙන් සිත එකහව සමා ධිඋපදනාහෙයින් මාගේ සීලය සමාධිසංවත්තනිකයයි කියා අෂ්ටාංගයෙන් යුක්තව පිරිසිදුකොට රක්නාසීලය සිහිකිරීමෙන් ප්‍රීතිප්‍රමොද්‍යය හෙතුකොටගෙණ කෙලශයෝ පහවන්නාහුය, ඒකෙසේදයි කිවහොත්?— යම්සේ කිළුටුවූ කැඩපත තෙල්හලු හා අස්වලින්හෝ නිමදින්කරණ ලද්ධූනය කියන කොස්ස ගෙණ මැදීමෙන් පුරුෂයාවිසින් කරණලද ව්‍යායාමය හෙතු කොටගෙණ කැඩපතපිරිසිදුවේද? එපරිද්දෙන්ම මේ සීලානුස්සෘ තිභාවනාව මෙසේ සිහිකිරීමෙන් සිත වැලදගෙණ සිටි කෙලශ යො දුරුවූ ශීලය පිරිසිදුවන්නේය, මෙතෙම සිලඋපොසථ යෙහි යෙදී සීලයහාසමග වාසයකරන්නේවෙයි?

එසේම තමාගේ සීලය සිහිකරන්නහුවිසින් මහානුභාවස ම්පන්නදෙවතාවෝ සිහිකටයුත්තාහුයි, ඒකෙසේද? චාතුම්මහා රාජිකය තාවතිංසය යාමතුසිත නිම්මාණරති පරනිර්මිත වසව ර්තියන සදෙව්ලොවහා බඹලොව වසන ආනුභාව සම්පන්නවූ යම් යම් දෙවතාකෙනෙක් වූවාහුද- ඔහු යම්බඳුවූ ශ්‍රද්ධාවකින් සීලයකින් ශ්‍රැතයකින් ත්‍යාගයකින් ප්‍රඥාවකින් සමන්විතව මෙයින් චූතව ඒ ඒදෙව්ලොවඋපන්නාහුවේද්ද මටද එබඳුවූ ශ්‍ර ද්ධාවක් සීලයක් ශ්‍රැතයක් ත්‍යාගයක් ප්‍රඥාවක්ඇත්තේයයිකියා තමා ගේද ඒදෙවතාවන්ගේද ශ්‍රද්ධාවද සීලයද ශ්‍රැතයද ත්‍යාගයද ප්‍රඥාවද සිහිකරන්නහුගේ සිත පැහැද ප්‍රීතිප්‍රමොද්‍යය උපද නේය, එකල්හි සිත කෙලශ උපකෙලශයෝ පහවන්නේය,

ඒ කෙසේදයි කිවහොත්?- යම්සේ නොපිරිසිදුසුවර්ණය පිරිසිදු කරණුකැමති කර්මකාරතෙම උදුනනිසාද එළණුමැටිනිසාද ගුරුසුත්‍ර නිසාද පිඹිනාතලඅඬුව නිසාද ඒපුරුෂයාගේ ඊට කරණ ව්‍යායාමය නිසාදකිලුටුවූ සුවර්ණයාගේ පිරිසිදුබවවේද-එපරිද්දෙන්ම මේදෙව තානුස්මෘතිභාවනාව සිහිකිරීමෙන් කාමච්ඡන්දාදි පංච නීවරණයන් කෙරෙන් සිත පිරිසිදුවීමෙන් ඔහුගේ ශීලයද පිරිසිදුවන්නේය, මෙතෙම දෙවතාවන්ගේ ශ්‍රද්ධාදී ගුණධර්මයන් සිහිකොට තමා කෙරෙහිදු එබඳු ගුණ ඇතිහෙයින් දෙවියන්හා සමබවට පැමිණ දෙවතාඋපොසථයෙන් යෙදී වසනහෙයින් දෙවතාවන් හා සමග වසන්නේනම් වෙයි.

තවද උපොසථශීලය පිරිසිදුකරණුකැමැත්තහු විසින් තමා බුද්ධාදිරහතුන්හා සම සමව තබා මෙසේ සිහිකටයුත්තේය, "රහතුන්වහන්සේලා දිවිඇතිතෙක් ප්‍රාණාතිපාතයෙන් අදත්තාදන යෙන් අබ්‍රහ්මචරියාවෙන් මුසාවාදයෙන් රහමෙර පීමෙන් විකාල භොජනයෙන් නෘත්‍යගීතවාදිත විසූකදර්ශනාදීන්හා මාලාගන්ධ විලෙපනධාරණමණ්ඩන විභූසනට්ඨානයෙන් උච්චාසයන මහා සයනවල හිඳීමෙන් සැතපීමෙන් දුරුවූසේක්ලාය, මම අද මේ රාත්‍රිය මේ දවල ප්‍රාණාතිපාතාදි ඒ ඒ අකුශලයන්කෙරෙන් දුරුව උපොසථාඞ්ගය සමාදන්වූහෙයින් මේ ගුණයන් කරණකොට ගෙණ ඒ රහතුන්වහන්සේලාට අනුකූලව ආර්‍යඋපොසථයෙන් යෙදී වසනහෙයින් ඒ ශීලය විශෙෂයෙන් බබලන්නේයි.

සුපරිකම්මකතො ධොතො යථා වෙළුරියෝ මණි,
මහගෙසා ජොතිමා එවං සීලම්සස විරොචති.

මෙසේ බබලනුලබන්නාවූ ඔහුගේ ශීලයතෙම විපාකඵල යෙන් මහත්ඵල වන්නේය, විපාකානිසංසයෙන් මහානිසංසවන් නේය, විපාකාලොකයෙන් මහත්ජුතිකවන්නේය, විපාකවිප්ඵාරය මහත්බැවින් මහාවිප්ඵාරවන්නේයි.

ඒසීලය කොපමණමහත්ඵල වේද? කොපමණ මහානිසංස වේද- කොපමණ මහත්දීප්ති වේද? කොපමණ මහත්පැතිරීම වේදයි යතහොත්- සත්පුරුෂයෙක් අඞ්ගරටය මගධරටය කසීරට ය කොසොල්රටය වැදෑරටය මල්ලරටය චෙතියරටය වඞ්ගරටය කුරුරටය පඤ්චාලරටය මච්ඡරටය සූරසෙනරටය අස්සකරටය අවන්තිරටය ගන්ධාරරටය කාම්බොජරටය කියනලද දහසයක්

මහාර්ඝවලින් සැදුම්ලද්දාවූ සියලු දඹදිව හෙළිතලයක්සේ සම කොට ඒ හැමතැනම ඉන්පමණලස සත්රුවන් පුරා හැමතැනම ඒකාතපත්‍රව චක්‍රවර්තිරාජ්‍යය කරන්නේද? ඔහු එසේ ලද්දාවූ රාජ්‍යඓශ්වර්‍ය්‍යය එක්රැයක් එක්දවලක් විසූ අෂ්ටාඞ්ග ශීලයෂි තියනලද කුශලය සොළොස්භාගයක් කොට පසළොස් භාගයක් හැර එකභාගයක් ගත්කල ඒ භාගයටත් සමනොවන්නේය, එසේ සමනොවන්ට කාරණ කවරේදැයි යතහොත්? එත්රැයක් එක්දවලක් අෂ්ටාඞ්ගශීලය රක්‍ෂාකළාවූ ඒ පුරුෂ තෙම එම කුශලයෙන් මේ මනුෂ්‍යදෙහයාගේ නැසීමෙන් මත්තෙහි චාතුර්මහාරාජික දෙවියන්කෙරෙහි උපදනේය.

මේ මනුෂ්‍යයන්ට පනස්අවුරුද්දෙක්නම් ඒ දෙවියන්ට එක් දවසෙක, ඒ දවසින් තිසක් ඔවුන්ට මසෙක, ඒ මස්දෙළසෙක් ඔවුන්ට අවුරුද්දෙක, ඒ අවුරුදුගණනින් ඔවුන්ට පන්සියයක් අවුරුද්දට ආයුෂ වන්නේය, ඒ මනුෂ්‍යයන්ගේ අවුරුදුගණනින් අනූලක්‍ෂයක් අවුරුදුය, එහි උපන්නාවූ දෙවියන්ට ඇසටත් අමනොඥවූ අරමුණෙක් නොපෙණෙයි, කණටත් අමනොඥවූ ශබ්දයක් අසනුනැත, නාසිකාවටත් දුර්ගන්ධයක් ආඝ්‍රාණයක් නැත, දිවෙනුත් අමනොඥ රසයක් විඳිනුනැත, කයිනුත් අනිෂ්ටදෙයක් ස්පර්ශකරණුනැත, සිතට දුඃඛදායකවූ අරමුණක් සිතෙනුනැත, මෙසේ සදොරින්ම සැපවිඳිනාවූ ඒ දෙවියන්ගේ ඓශ්වර්‍ය්‍ය දුටුකෙණෙකුන්ට සියළු දඹදිවට ඉසුරු පවත්වා රාජ්‍යය කරන්නාවූ පළමුකී සක්විති රජ්ජුරුවන්ගේ ඓශ්වර්‍ය්‍ය ඉතා සවල්පයේක, යාචකයෙකුගේ ජීවිකාවෘත්තියක් වැන්න,.

නැවත මේ එකරැයක් එකදවලක් අෂ්ටාඞ්ගශීලය රක්‍ෂාකළාවූ පුරුෂතෙම එම කුශලයෙන් තෞතිසා දිව්‍යලොකයෙහි උපදනේය, ඒ දෙවියන්ට මනුෂ්‍යයන්ගේ සියයක් අවුරුදු එක දවසෙක, ඒ දවසින් තිස්දවසෙක් මසෙක, ඒ මසින් දෙළොසෙක් අවුරුද්දක, එයින් ඔවුන්ගේ ආයුෂය අවුරුදු දාසෙක, අවුරුදු දාසනම් මේ මිනිස්ලොව තුන්කෙළ සැටලක්‍ෂයක් අවුරුදුය;

ඒ එකදවසක් රක්‍ෂාකළාවූ මේ ශීලයෙන් යාම දිව්‍යලොකයෙහි උපදිති, ඒ දිව්‍යලොකයෙහි දෙවියන්ට මිනිසුන්ගේ ආයුගණනාවෙන් දෙසියයක් අවුරුදු එකදවසෙක, ඒ දවසින් තිහක්

මසෙක, ඒ මසින් දොළසක් අවුරුද්දක්කොට ඒ ගණනාවෙන් ඒ දෙවියන්ට දෙදහක් අවුරුදුය, ඒ අවුරුදු දෙදහනම් මිනිසුන්ට තුදුස්කෙළ සතළිස්ලක්ෂයක් අවුරුදුය.

ඒ එකදවසක් රක්ෂාකළාවූ අෂ්ටාඞ්ගශීලයෙන් තුෂිත දිව්‍ය ලොකයෙහිත් උපදීනී, මිනිස්ලොව සාරසියයක් අවුරුදු ඒ දෙවියන්ට එක්දවසෙක, ඒ දවසින් තිසක් මසෙක, ඒ මසින් දොළසක් අවුරුද්දෙක, ඒ අවුරුද්දෙන් හාරදහසක් අවුරුද්දට ආයුෂය, ඒ සාරදහස නම මනුෂ්‍යයන්ගේ ආයුෂගණනාවෙන් සත්පනස්කෙළ සැටලක්ෂයක් අවුරුදුය.

එකදවසක් රක්ෂාකළාවූ මේ අෂ්ටාඞ්ගශීලයෙන් නිර්මාණරති දිව්‍යලොකයෙහිත් උපදිති, මිනිස්ලොව අටසියයක් අවුරුදු ඒ දිව්‍යලොකයෙහි දෙවියන්ට එකදවසෙක, ඒ දවසින් තිස්දවසක් මාසයක, ඒ මසින් දොළසක් අවුරුද්දෙක, ඒ අවුරුද්දෙන් අටදහක් අවුරුද්දට ආයුෂය, ඒ අටදහනම් මනුෂ්‍යගණනායෙන් දෙසිය තිස්කෙළ සතළිස්ලක්ෂයක් අවුරුදුය·

තවද එක්දවසක් අෂ්ටාඞ්ගශීලය රක්ෂාකළාවූ ස්ත්‍රී පුරුෂ කෙණෙක් එම කුසලයෙන් පරනිර්මිතවශවර්ති දිව්‍යලොකයෙහි උපදනාහුය, මනුෂ්‍යගණනාවෙන් එක්දහස් සසියයක් අවුරුදු නම් ඒ දිව්‍යලොකයෙහි දෙවියන්ට එකදවසෙක, ඒ දවස් මස් කොට ඒ මස් අවුරුදුකොට ඒ අවුරුදුගණනාවෙන් ඒ දෙවියන්ට සොළොස්දහසක් අවුරුද්දට ආයුෂය, ඒ මිනිස්ලොව් ගණනින් නවසිය එක්විසිකෙළ සැටලක්ෂයක් අවුරුදුය.

මෙසේ අෂ්ටාඞ්ගශීලයෙන් සදිව්‍යලොකයෙහි උපන්නාවූ දෙවියන්ගේ ඓශ්වර්‍ය්‍යය කීමෙහි පමණක් නැතිනිසා බුදුහු ආයුෂපමණක් වදාළසේක, මෙබඳු ආයුෂ ඇත්තාවූ ඓශ්වර්‍ය්‍ය ඇත්තාවූ ඒ දෙවියන් දුටු අයට ඉනාපමණලස සත්රුවන් පිරූ දඹදිවට චක්‍රවර්තිරජ්‍යය කරන්නාවූ ඒ රජ්ජුරුවන්ගේ ඓශ්වර්‍ය්‍යය කෙසේ මහතැයි සිතේද?—දිළිඳුකෙණෙකුන් වැන්නැයි සිතම්;

තවද චන්ද්‍රසූර්‍ය්‍යදෙදෙනම මහමෙරවට ඇවිද යම්පමණ තැනක් ආලොකකොට ඇවිදිද්ද?—ඇතුළත සතරමහදිවයිනද දෙදහසක් කොදෙව්වලද සමුද්‍රයෙහිද ගොඩෙහිද යන හැමතැන්හිද වස්ත්‍රාභරණාදිවූ යම් ධනයෙක් ඇද්ද? යම් රන් මැනික්

නිල්මැණික්ජාතියෙක් ඇද්ද;—පණ්ඩුවන්විසින් සාරා ගොඩදමන ලද හටකනම්වූ රත්නජාතියෙක් ඇද්ද,—ඒ සියලු වස්තූහු චන්ද්‍රාලොකයට අබුව සිටි හැමතාරකාසමූහයාගේ ආලොකයමෙන්ම සොළොස්භාගයක් කරණලද අහොරාත්‍රිසඞ්ඛ්‍යාතත එක දවසක් විසූ අෂ්ටාඞ්ගශීලයාගේ පින්කම් කලාවයයන එක්භාගයකුත් අගනේ නොවෙයි, එහෙයින් සිල්වත්වූ සියලු ස්ත්‍රී පුරුෂයෝ අෂ්ටාඞ්ගයෙන් යුත් පෙහෙවස් සමාදන්ව රක්ෂාකොට සුඛවිපාක දෙන දානාදිකුසල් කිරීමෙන් අනින්දිතදිව්‍යලොකයෙහි උපදනාහුයයි යනමේ කාරණය භාග්‍යවත් බුදුරජානන්වහන්සේ විසින් වදාරණලදී.

චන්දො ච සුරියො ච උභො සුදස්සනා,
ඔභාසයං අනුපරියන්ති යාවතා,
තමොනුදා තෙ පන අන්තලික්ඛගා
නභෙ පභාසන්ති දිසා විරොචනා.
එතස්මිං යං විජ්ජති අන්තරෙ ධනං
මුත්තාමණිවෙළුරියච භද්දකං,
සිංගීසුවණ්ණං අථවාපි කඤ්චනං
යං ජාතරූපං හටකන්ති වුච්චති.
අට්ඨඞ්ගුපෙතස්ස උපොසථස්ස
කලම්පි තෙනානුභවන්ති සොළසිං,
චන්දප්පභාතාරගණාච සබ්බෙ
තස්මා හි නාරීච නරො ච සීලවා.
අට්ඨංගුපෙතං උපවස්සු පොසථං
පුඤ්ඤානි කත්වාන සුඛුද්‍රයානි
අනින්දිතා සග්ගමුපෙන්ති ඨානන්ති.

එහෙයින් එම්බාපින්වත් ලොව ඇමසත්පුරුෂයෙනි මෙසේ මහත්විපාකඇති අෂ්ටාඞ්ගසීලය රක්‍ෂාකරන්ට නොපට බැරිදෙයෙක් ඇද්ද-? ප්‍රාණඝාතනම්වූ අනුන්ගේ දිවිනැසීම ආයුධආදීනොයෙක් උපකරණ ගේණ මහත් ව්‍යායාමයෙන් කටයුතු දෙයක, ඒ ප්‍රාණඝාත මමනොකරමි සිතා ගන්නාසිතිවිලල එසේ උත්සාහයකින් කටයුතුදෙයක් නොවෙයි, නිදුකින් සිඬවන්නේය, අදත්තාදානයක් අනුන්සන්තකදෙයක් ඇරගැන්මක, එහෙයින් සොරා ඇරගණිතත් බලාත්කාරයෙන් ඇරගණ්තත් උත්සාහයෙන් ගතයුතුදෙයක, ඒ නොගණිමියි සිතාගැන්ම නිදුකින්ම සිඬවනදෙයක, අබ්‍රහ්මචර්‍ය්‍යාවෙන් ඉන්වතඋපදවහා ස්ත්‍රීන්ගේනුගුණ සිතාගන්නාකෙණෙකුට ඉන්වැලකෙමියි සිතාගැන්මත් නිදුකින් සිඬවනදෙයක, බොරුකීමනම් අනුන්ගේ වැඩත්නසයි, බොහෝදෙනාත් අප්‍රියකරයි, බොරුකීමෙන් නොකළහැකි පව්නැතැයි යනුහෙයින් බොහෝ අකුශලයන්ට මුල්ව සිටිනේය යනාදීන් සිතාගන්නා කෙණෙකුන්ට ඉන්වැලකීමත් දුක්නොවන්නේය, රහමෙරපීමනම් සියලුකටයුතු පමාකරන්නේය, විසරුළුලවන්නේය, භයලජ්ජාදෙක නැතිකරවන්නේය යනාදීන් සිතා ගන්නාකෙණෙකුන්ට ඉන්වැලකීමත් දුක්නොවන්නේය, විකාලභොජනයනම් පෙරවරුඅනුභව කිරීමත් එක්ක දෙවේලක අනුභවකිරීමය ඒදෙවේලක අනුභවකිරීමෙන් ව්‍යාධිඋපදවන්නේය, භොජනයට දෙවරක් ව්‍යවෘතකිරීමෙන් කටයුතුකාරිය නැසෙන්නේය, සිල්රක්‍ෂාකරණනිසා පෙරවරු බත් අනුභව කිරීමෙන් සවර්ගසම්පත්තිය සිඬවන්නේය යනාදිය සිතාගන්නා කෙණෙකුන්ට විකාලභොජනයෙන් වැලකීමත් දුක්නොවන්ය, නෘත්‍යයනම් වියරුවක් වැන්න, ගීනම් හැඬීමක් වැන්න, නෘත්‍යගීතවාද්‍යයෙන් කවරප්‍රයොජනයෙක්ද? මාලාගන්ධවිලෙපනාදිය පූජාකළහොත් නොයෙක් කෙළගණන් කප්මුලුල්ලෙහි දිව්‍යමනුෂ්‍යසම්පත්තිය සිඬවන්නේය, ඒනමා පරිභොග කිරීමෙන් කවරවැරුද්දෙක් සිඬවේද කෙරෙද්දයි සිතාගන්නාහට එයින්වැලකීමත් දුක්නොවන්නේය, නැවත උච්චාසයන මහාසයනයෙන් වැලකීමවනාහි මෙයිනලලටවඩා නිදුකැයි සිතන්නාවූ එම්බාසත්පුරුෂයෙනි තොපවිසින් මේබුඬොද්පාදකාලයෙහි මනුෂ්‍යත්මභාවය ලත්නැනදිම පොහොයෙන් පොහොය අෂ්ටාඞ්ගශීලය රක්‍ෂාකොට සසරබොහෝකලක් දිව්‍යමනුෂ්‍යසම්පත් විඳුමටත් නිවන්සම්පත් ලැබීමටත් සුදුසුකුසල් කටයුත්තේය,

බුද්ධොද්පාදකාලයට . පැමිණ බුදුන් වදාලබණ අසා අෂ්ටාඞ්ගශී
ලයෙන් ලබනඅනුසස් විභාග දැන නුවනැතිව මනුෂ්‍යව සිටි
නා නොපතබා .පෙර අබුද්ධොද්පාදකාලයෙහි ගෙයක් දොරක්
පානවර්ගයක් නැතිව නිරන්තරයෙන් ගොදුරු සොයා ඇවිදි
නා සාපිපාස සංසිඳුවාගත නොහෙන්නාවූ ඔවුනොවුන්කෙරෙ
හි භයින් සැඟවී ඇවිදිනාවූ තිරශ්චීනයෝ පවා චන්ද්‍රයාගේ
සම්පූර්ණතායෙන් පසළොස්වක් පොහෝදිනයහි දැන අෂ්ටාඞ්ගශී
ලය රක්ෂාකෙළේය, මෙබඳුජාතියෙක මෙබඳුනුවනැතිකමෙක
මෙබඳුරක්ෂාවෙක සිටිනානොපට බැරිකවරේද ? කවරඅලස්‍ය
කමෙක්ද දුස්සීලව සිටියාම පැමිණෙනනපුරත් සීලවත්විමෙන්
වන අනුසසුන් දැන නොපවසිත් අප්‍රමාදව අෂ්ටාඞ්ගශීලය රක්ෂා
කටයුත්තේය, පෙර අබුද්ධොද්පාදකාලයෙහි තිරශ්චීනයෝ අ
ෂ්ටාඞ්ගශීලය රක්ෂාකළ පරිදි මෙසේ අසා දතයුත්තේය.

පෙරදඹදිව මගධරට ආදීවූරටතුනකට අතුරෙහි එක්වනා
නතරයෙක් වූයේය, බුදුවීමට බොධිසම්භාර පුරා ඇවිදිනාවූ
අපමහබෝසතාණන් වහන්සේ මගධරට බමුණුකුලයක ඉපද
වැඩිවිය පැමිණීසේක් ගිහිසැපත් අනුභවකිරීමෙහි දොෂ දැන
ගිහිගෙන් නික්ම පැවිදිව ඒවනානතරයෙහි පන්සලක් කො
ට විසූසේක, උන්වහන්සේ වසනපන්සලට නුදුරුතැන එක්උ
නකැලයක තමාගේ භාර්‍ය්‍යාවහාසමග එක් කොබෝපක්ෂියෙක්
වසන්නේය, එක්තුඹසෙක සර්පයෙක් වසන්නේය, එක්වනලැ
හැබෙක කැනහිලෙක් වසන්නේය, එක්වනලැහැබක වලසෙ
ක් වසන්නේය, ඔහුසතරදෙනම කලින්කල අවුත් ඒතාපස
යන්වහන්සේගෙන් බණ අසති එකල්හි එක්දවසක් කොබෝ
තෙම භාර්‍ය්‍යාවසමග කැදැලෙන් නික්ම ගොදුරුපිණිස ගි
යේය, ඔහු පස්සේ යන්නාවූ පක්ෂිධෙනුව එක්උකුස්සෙක් අල්
වාගෙණ ගියේය, ඇ ඇඬුඅඬ අසා කොබෝතෙම අපසුබලන්
නේය, උකුස්සා අල්ලාගන්බව දුටුයේය, ඒදැක කොබෝතෙ
ම ඇගෙන් තමන් වෙන්වූනිසා රාගාග්නියෙන් දවනුලබන්
නාවූ ශරීරඅතිව මෙසේ සිතූයේය, " මේරාගය මට ඉතාදුක්
කෙරෙයි, මේරාගයට නිග්‍රහකොට ගොදුරට නොයමීයි, සිතා
තාපසයන්වහන්සේගේ සමීපයට ගොස් බණ අසා නිග්‍රහ
කොට පෙහෙවස් සමාදන්ව එකත්පසෙක හුන්නේය·

සර්පද ගොදුරු සොයමින් තමාවසන තුඹසින් නික්ම පසල්
ගමක ගෙරින් ගොදුරු කනතැන්හි ඇවිද්නේය, එකල්හි

ගම්දෙටුවාගේ සර්වාඞ්ගධවලවූ මඞ්ගල්‍ය වෘෂභතෙම ගොදුරුගෙණ එක්තුඹසක්මුල දනඔබා අත්මිටිගලමින් කෙළිත්තේය, සර්පතෙම ගොණුන්ගේ කුරඅඩින් භයගෙණ තුඹසට වදිනුට අවන්තේ ගොනාපය අසුව තිබුනේ ගොනා දෂ්ටකෙළේය, ගොන් එතන වැටී මළේය, ගම්වැස්සෝ ඔහු මළේයි යහු අසා සියල්ලම අවුත් අඩා වැලප පුෂ්පාදින් පුදා වළලා ගියේය, සර්පතෙම ඔවුන් ගියකල්හි නික්ම මාගේ ක්‍රොධය නිසා වෘෂභයාමරා මෙතෙක්දෙනා සොකයට පැමිණෙවිමි, මේ ක්‍රොධයට නිග්‍රහකොට මම ගොදුරට නොයමියි, අසපුවට ගොස් ක්‍රොධනිග්‍රහය පිණිස පෙහෙවස් සමාදන්ව එක්ප්‍රදෙශයක හොත්තේය?

කැණහිලාද ගොදුරු සොයා ඇවිදිනේ එක්මළඇතෙකු දක මහත් ගොදුරක් ලදිමියි වහාගොස් සොඬ ඩැහැ බැලිය ටැඹක්සේ ඉතා දැඩිව තිබුනේය, එහි ආස්වාදයක් නොලැබදළ ඩැහැ බැලිය, එත් ගලක්මෙන් දැඩිව තිබුයේය, බඩ ඩැහැ බැලිය, අටුපතක්සේ කිසිමොලොකක් නැතිවිය, නගුට ඩැහැබැලීය, මොලොකක්සේ ඉතාදැඩිවිය, මළමාගීය ඩැහැ බැලීය, එහි එළඟිතෙල් මුලක්සේ මොළොක්ව තිබුයේය, එතෙම ලොභයෙන් ඒමස් කණුයේ බඩඇතුළට වැද පිපාසිතකල්හි ලේබොමින් ක්ෂුධාවූ කල්හි මස් කමින් වැතිරෙනකල්හි අතුනුහෝ බඩවැල් අතුට වැතිරෙත්තේය, එතැන්පටන් එතෙම "ආහාරයත් පානයත් සයනයත් මෙහිම ඇත, අන්තැනකට ගොස් කුමක් කෙරෙම්දැ,,යි එහිම සිත් අලවා විසීය, දවස්ගණනකින් කුණ වියලෙනකල්හි මලමාගීයත් වැසිත, කැණහිල්තෙම බොහෝ කලක් දුක් විඳ උත්බැවින් එසිදුරට ඉසින් පැහැර නික්මිණ, සිදුර අහක්ව තිබුහෙයින්ද ශරීරය ඉදී බඩඇතුළෙහි උපන්උෂ්ණයෙන් ශරීරය මස් සිඳී පඩුවන්ව නික්මයන්ට මගක් නොලැබ උන්නේය, එක්දවසක් නොකල් මහවැස්සක් වට්ටුයේය, මලමාගීය තෙමී මොලොක්ව සිදුරු දක්වීය කැනහිල්තෙම බොහෝකලක් දුක් විඳ උන්බැවින් ඒසිදුරට ඉසින් පැහැර නික්මින සිදුර අහකව තිබුහෙයින්ද ශරීරය ඉදී තිබුහෙයින්ද සියලුරෝමයෝම මලමාගීයෙහිම ලග්නවිය ඒතෙම තල්අලයක්මෙන් ලොන්නැතිවම නික්මින, ඒකැනහිල්තෙම "මාගේ සිතෙහි උපන්ලොභය නිසාම මාවිසින් මෙතෙක්දුක් විඳිනාලද බැවින් ලොභයට නිග්‍රහකොට ගොදුරු අනුභව නොකරමි,,යි ලොභනිග්‍රහපිණිස පෙහෙවස් සමාදන්ව එක්පසෙක හොත්තේය.

වලසාද වනාන්තරයෙන් නික්ම මෙතෙක්කල් ගොදුරු ගන්නා තැනින් ගොදුරු නොගෙන අත්‍රිච්ඡාවෙන් මඩනාලද සිත් ඇත්තේ මලයරට පසල්ගමකට ගියේය, වලසෙක් ආය යි අසා ගම්වැස්සෝ දුනු දඬුආදිය ගෙණ ඔහු හුන්වනය වට කළෝය, ඔවුන් වටකළබව දැන ඒකැලයෙන් නික්මීන, එසේ යන්නාවූ ඔහු දැක දුනුදඬුමුගුරු ගෙණ තැලූහ, එසේම බිඳු හුළස් ඇතිව තමාලැග්ගනාතැනට ගොස් "මෙදුක්ඛය මට අත්‍රිච්ඡාවනිසා උපන, එට නිග්‍රහකොට ගොදුරට නොයම්"යි අසපුවට ගොස් අත්‍රිච්ඡාවට නිග්‍රහපිණිස පෙහෙවස් සමාදන් ව එක්ප්‍රදෙශයක හොත්තේය,

තාපසයන්වහන්සේද ජාතිය නිසා උපන්මානයෙන් ධ්‍යාන උපදවාගත නොහෙනබව පසේ බුදුරජානන් වහන්සේ දැක "මෙතෙම ලාමකසත්වයෙක් නොවෙයි, මේකල්පයේම බුදුවන බෝධිසත්වයෙක, ඔහුගේ මානයට නිග්‍රහකොට ධ්‍යානඋපදවා ගන්නා ආකාර කරම්"යි සිතා ඒතාපසයන්වහන්සේ පන්සල හුන්කල්හි හිමාලවනයෙන් තමන්වහන්සේ වැඩ ඒතාපසයන් වහන්සේ ඉන්නාරුක්මුල තිබුගල්පුවරුවක වැඩහුන්සේක, තාපසයන්වහන්සේද පන්සලෙන් නික්ම වැඩහුන්නාවූ පසේ බුදුන්වහන්සේ දැක උන්වහන්සේ කරා එළඹ "චණ්ඩාලවූ කාලකන්නිවූ ඉසමුඬුගෙන මාඉන්නාවූ පෝරුවේ කුමට උන්නෙහිදැ"යි කීසේක, එවිට පසේබුදුන්වහන්සේ වදාරණසේක් "එම්බල සත්පුරුෂය තෝ කුමට නිරාදරකරන්නෙහිදැ, මම ප්‍රතිවේධ කරණලද සත්‍යඥනඇති පසේබුදුකෙණෙක, තෝ මේ කල්පයෙහි සම්‍යක්සම්බුද්ධවන්නාවූ පාරමිතා පුරා ආවාවූ බෝධිසත්වයෙක, තෝ මෙතෙක්කල් ගියකල බුදුවන්නෙහිය, ඒජාතියෙහි සිද්ධාර්ථනම් කුමාරවන්නේය, ගෞතමනන් බුදුවන්නේ යනාදින් සියල්ල ප්‍රකාශකොට කියා එසේවූ තෝ මානනිශ්‍රිතකොට කුමට එරුෂබස් කියන්නෙහිදැ"යි වදාළසේක, ඒඅසා බොසතාණන්වහන්සේ "කවරදා කවරකලකද මා බුදුවන්නේ"යි යනාදින් සාමිචිකථා විචරවත් නොකළසේක, පසේබුදුන්වහන්සේද තාගේ ජාතියගේවත් මාගේ ජාතියගේවත් පමණ නොපිම දැන් දැනගණුව, ඉදින් හැකිවූනම් අහසට නැගී මාහාසමග උතුරුහිමවතට එව"යි තමන්වහන්සේ අහසට නැඟී තමන්වහන්සේගේ පාධූලිය ඒබෝසතාණන් වහන්සේගේ ජටාඅතුරෙහි විසුරවමින් අහසින් වැඩිසේක, තාපසයන්වහන්

සේ පසේබුදුන්වහන්සේ වැඩිකල්හි සිත කලකිරී "මුන්වහන්සේ විගත්ජ්වර ඇතුව සැඩපවන්වේගයෙන් සැඩපවන්කඳට දූමූ පුළුන්පෙදක්මෙන් අහසට පැන නැගී වැඩිසේක, මමජාතිමානේනිසා මෙබඳුමහොත්තමයාණන් වහන්සේගේ ශ්‍රීපාදයන් නොවැන්දෙමි, ප්‍රියකථාවකුත් නොකෙළෙමි, ජාතිමානය නම් අකුශලයක, ඒකවරක්හට කුමණවැඩක් සිදුකරන්නේද? ශීලාචාරයම උතුම්වන්නේය, මේමානය මෙසේ වැඩුනේවීනම් මාතරකයට ගෙණයන්නේය,,යි දැන "මේමානයට නිග්‍රහකොට ඵලාඵලයට නොයමි"යි පන්සලට වැද උපොසථවාසයෙන් කිහුණුභාවනාකොට පඤ්චාභිඥාවන්හා අෂ්ටසමාපත්තීන් උපදවා සක්මන්කෙළවර ගල්පෝරුවෙහි වැඩඋන්සේක.

කොබෝ පක්ෂියාආදිවූ සතරදෙනාද උන්වහන්සේගේ ශ්‍රීපාදය වැඳ එකත්පස්ව උන්නාහුය, බෝසතානන්වහන්සේ ඔවුන් සතරදෙනාකෙරෙන් වෙන්වෙන්ව "තෙපි පෙහෙවස් සමාදන්වන්ට කාරණ කිම්දැ"යි විචාළකල්හි ඔහු සතරදෙනම "අපි මෙනම් මෙනම් කාරණයකින් පෙහෙවස් සමාදන්වූමහ"යි කියා පළමුපරිද්දෙන් ඒ ඒ කාරණ ප්‍රකාශකොට කියා නැවත ඒ සතරදෙනම මහබෝසතානන්වැද "නුඹවහන්සේ ඵලාඵලයට නොගොස් කවරහෙයකින් පෙහෙවස් සමාදන්වූසේක්දැ"යි විචාළෝය, එසේ විචාළාවූ ඔවුන්ට තෝරා වදාරණ බෝසතාණන්වහන්සේ වදාරණසේක් "රාගාදි කිසිවක නැඹුණු සිත් ඇති පසේබුදුකෙණෙකුන්වහන්සේ මාගේ අසපුවට ඇවිත් මොහොතක් කල් වැඩ උන්නාවූ උන්වහන්සේ මා විසින් මිය ගොස් උපදිනාතැන්ද අනාගතයෙහි මාගේ ප්‍රවෘත්තියද බුදුවනජාතියෙහි මාගේ නාමගොත්‍රයද මා රක්ෂාකරන්නාවූ ධර්මයන්ද යනමේ සියල්ලම මට දන්වා වදාළසේක, එසේ ඇතිකල්හිත් සිත්හි උපන්මානයෙන් උන්වහන්සේගේ ශ්‍රීපාදයටත් නොවැන්දෙමි, ඒ උතුමන් වදාළ ප්‍රවෘත්තිය මා සිතට සැකහැර නොවිචාළෙමි, එසේ කළේ මාගේ ජාතිමානයනිසාය, එබැවින් ඒ මානනිග්‍රහ කරණ පිණිස ඵලාඵල සොයා නොගොස් උපොසථවාසයෙන් උන්නෙමි"යි වදාළසේක.

මෙසේ මහබෝසතාණන්වහන්සේ තමන්වහන්සේගේ උපොසථවාසය ඔවුන්ට කියා ඔවුන් උන්උන්ගේ වාසස්ථානයට ගමන්කරවා තමන්වහන්සේත් පන්සලට වැඩිසේක, ඒ තිරශ්චීන

යෝ සතරදෙනද බෝසතාණන්වහන්සේගේ අවවාද අසා ගුණ ධර්මයන් රක්ෂාකොට එයින් මිය දිව්‍යලොකයෙහි උපන්නාහුය බෝසතාණන්වහන්සේ ධ්‍යානලාභීහෙයින් බ්‍රහ්මලොකයෙහි උපන්සේක.

මෙසේ පෙර තිරස්චීනයෝපවා පෙහෙවස් රක්ෂාකොට තිවන් සැප සිඬකළෝය, මනුෂ්‍යජාතියෙහි උපන්නාවූ එම්බා සත්ත්වයනි තොපට කවර බැරිදෙයෙක්ඇද්ද? — එබැවින් අප්‍රමාදව අධ්‍යාශයිලය රක්ෂාකොට සතරඅපායෙහි නොඉපද සදිව්‍යලොකයෙහි ඓශ්වර්‍ය්‍ය විඳ කෙලවර අමාමහනිවන් දක්නට උත්සාහ සිතැතිව දිවා රෑ දෙක්හි සිල්රක්ෂාකළඅයට පැමිණෙනවිපාක කියා දක්වූහ, අඩපෝයක් රක්ෂාකළාවූ බොහෝදෙනාත් ලත් දිව්‍යෛශ්වර්‍ය්‍ය බුදුබණින් බොහෝසේ පෙණෙයි, එත් මෙසේ දතයුත්තේය.

යටගියදිවස දඹදිව බරනැස්නුවර සැදූහැඇති බ්‍රහ්මදත්ත නම් රජෙක්විය, ඒ රජතෙම අන්දිමය නිති පන්සිල් රක්ෂාකිරීමය පොහොය අටසිල් රක්ෂාකිරීමය යනමෙහි පමානූයේය, රජතෙම අමාත්‍යාදිවූ සෙසු නුවරඇත්තන් දානශීලාදියෙහි සමාදන් කරවන්නේය, ඔහුගේ පුරොහිත බ්‍රාහ්මණතෙම අත්ලස් ගන්නේය, සිමියන් අහිමිකොට අයුක්ති බණින්නේය, රජතෙම එක් පොහෝදිනයක් පැමිණිකල්හි උදැසනම තමතමන්ගේ අමාත්‍යයන් කැඳවා පෙහෙවස් වසවයි මෙහෙවර කීයේය, සෙස්සෝ සිල් සමාදන්වූවාහුය, පුරොහිතබ්‍රාහ්මණතෙම පෙහෙවස් සමාදන් නොවිය, දවල් අත්ලස් ගන්නේය, අයුක්ති කියා පෙහෙවස් සමාදන්නොවී රජගෙට ආය, රජතෙම තොපි සිල්සමාදන්වූදැ''යි අමාත්‍යයන් විචාරණුයේ "ආචාර්‍යයිනි තොපිත් සිල්සමාදන් වූදැ''යි පුරොහිතබමුණාණනින් විචාළේය, එතෙම "එසේය සිල් සමාදන්වීමි''යි බොරු කියා රජගෙන් බටුයේය.

එක් අමාත්‍යයෙක් මගදී ඔහුඅනින් නොගත් ශීලය ගනිම්''යි බොරුකීයේ ඇයිද්ද''යි කීය, එවිට බ්‍රාහ්මණතෙම කියනුයේ "මම වේලානොවරදවාම බත් කැමි. දැන් ගෙට ගොස් කට සෝදාදමා සිල් ඉටාගෙණ රෑ බත් අනුභවනොකොට සිල් රක්ෂා කරෙමි, එසේකල්හි මට අඩපෝයක් පිහිටන්නේය''යි කීය, ඒ අමාත්‍යද යහපතැයි ගිවිස ගියේය, පුරොහිතද එපරිද්දෙන් අඩ පොහොයක් සිල්සමාදන්ව හුන්නේය, මේ ඔහු රක්ෂාකළ ශීලය,

පොහොදිනෙක භික්‍ෂු සූත්‍ර කියන සභාවෙහි උන්
ති කියන්ට ආවාවූ සිල්වත් ස්ත්‍රියක් වේලා ආසනනාවූ
වසෝ දුන්ට ආරම්භකළාය, එවේලාවට බමුණාට පැසුනු
ගෙනාවාහුය, හෙතෙම ඈ පෙහෙවස් සමාදන්වූබව
අනුභවකොට පෙහෙවස් රක්‍ෂාකරව"යි අඹකෑත දුන්
නාමෙමෝ අනුභව කෙළෙය, බමුණු දුන් දත් මෙපමණය,
තෙම මෑතභාගයෙහි කෝසකීනම් ගඟාතීරයෙහි තුං
දිගපලලඇති අඹඋයනෙක දිලිසෙන්නාවූ විමානයක
ශ්‍රීයහනෙක නිදපිබිදියාක්මෙන් උපන්නේය උතුම්වූ
සොලොස්දහසක් දිව්‍යස්ත්‍රීහු පිරිවරා සිටියෝය. ඒ
ත්‍රියෙහි ඒ ඒ දිව්‍යඓශ්වර්‍ය්‍ය අනුභවකරන්නේය, විමාන
පත්බැවින් පෙරජාතියෙහි කළ අකුසලයට සුදුසුවූ දුක්
එබැවින් අරුණුනැගෙනකල්හි ඒ අඹවනයට වදනේය,
නයට වන්කල්හිම දිව්‍යාත්මභාවය නැතිවන්නේය,
උසඇති ප්‍රේතාත්මභාවය පහළවන්නේය, සියලුශරීරය
ල දත්නේය, හාත්පසින් මල් පිපුනු කැලයක්මෙන්
නේය, දෑතම ඒ ඒ ඇසිල්ලෙහිත් වන්නේය, ඒ ඇසි
බිම උදළුතැටිලිපමණවූ නියපොතු වන්නේය, ඒ නිය
කින් තමාගේ පිට පලා මස් උදුරාකමින් මහහඬින් මො
විඳිනේය, හිරු හසනගතවනකල්හි ඒ ශරීරය අනත
න්නේය, දිව්‍යාත්මභාවය පහළවන්නේය, දිව්‍ය ස්ත්‍රීහු ඇවි
රාගන්නාහුය, එතෙම මහාඓශ්වර්‍ය්‍යයෙන් දිව්‍යප්‍රසා
ැගෙන්නේය, මෙසේ පෙහෙවස් රක්‍ෂාකරණ ස්ත්‍රියට
දුන් විපාකයෙන් දොළොස්ගව් දිගපලලඇති අඹඋයන
ඒ අත්ලස් කෑ විපාකයෙන් පිටමස්පලා උපුටා කනුවිය,
ාගයෙහි විපාකයෙන් රාත්‍රියෙහි දිව්‍යසම්පත් අනුභව
ය.

ණැස්රජතෙම වස්තුකාම ක්ලේශකාමයෙහි දෙස දැක
ත් හැර තාපසව එම කොසකීනම් ගඞ්ගාතීරයෙහි
ත් අඹඋයනපාත පන්සලක් කොට වනමුල් ඵලාඵල
ාට වාසයකෙළේය, ඉක්බිති එක්දවසක් ඒ අඹඋය
කාලයක් පමණ මහතඇති විලිකුනු අඹගෙඩියක් ගඞ්ගා
ත් වැටී ඒ තාපසයන් දියනාන ගඟතොටසමීපයට ආය
ාපසයෝ දිය පිනාගොස් අඹගෙඩිය අසපුවට ගෙණ
තිත් කපා යපෙනපමණක් අනුභවකොට සෙස්ස

කෙහෙල් පතකින් වසා තිබ්බේය, මෙසේ අනුභවකොට අඹ ගෙඩිය නිමාවගියකල්හි දිව්‍යරසය අනුභවකලකල්හි බොධිසත්‍වව සිටද රසතෘෂ්ණාව නවත්වාගතනොහී අන් ඵලාඵලයක් අනුභවකරන්ට රුචිනැතිව ගන්තෙරට ගොස් අඹගෙඩියක් නොලැබ නොනැගී සිටිම්යි ගඟබලාගෙණ සත්දවසක්ම නිරාහාරව උන්නේය, සත්වෙනිදවස ඒ ගඞ්ගාවෙහි අරග්ගත්තාවූ දිව්‍යස්ත්‍රීතොමෝ සිතන්නී "මේ තාපසතෙම අඹඵලයක් නොලැබ මියන්නේය, ඔහු මලහොත් මට නින්‍දාවන්නේය"යි සිතා අවුත් ඒ බෝසතාණන්වහන්සේ වැඩහුන්තැන අහස සිටගෙණ:—

කිං ඣනෙසු කිමට්ඨිප්පායො එකො ඝම්මසි ඝම්මසි,
කිං පත්‍ථයානො කිං එසං කෙනඅත්‍ථෙනබ්‍රහ්මණාති·

යනාදීන් ඒ බෝසතානන්අතින් මෙබඳුඋෂ්ණවැල්ලෙන් කකීයන්නාවූ ගඞ්ගාතීරයෙහි මෙසේ නිරාහාරයෙන් සැතපීමට කාරණ කවරේදැයි විචාළිය, ඒ බෝසතානන්වහන්සේද:—

යථාමහාවාරිධරොකුම්භොසුපරිනාගවා,
තදූපමංඅම්බපක්කං වණ්ණගන්ධාරසුත්තමං.

සනාංදීන් තමන්වහන්සේ ගඟදියෙහි යන අඹඵලයගෙණ අනුභවකළතැන්පටන් ආහාරයකට රුචිනැතිබව දන්වා වදාළසේක, මෙසේ අඩපොහොයෙනුත් මෙබඳු විපාක ඇත්තේයයි දන්නා එම්බා සත්පුරුෂයෙනි නොපවිසින් අප්‍රමාදව උපොසථශීලය රක්‍ෂාකටයුත්තේය, එම් මෙසේ විපුලතරආනිසංසදායකවූ අෂ්ටාඞ්ගශීලය එක්දවසෙක පමණවිනමුත් සමාදන්ව රක්‍ෂාකිරීම හෙතුකොටගෙණ අපමණ ආනිසංස ඇතිවන්නේය, ඒ කෙසේ දයත් ?—

මේ මහාභද්‍රකල්පයට එකානුවනකල්පයෙහි එකුපොසථිකනාම ඍෂිවිරින්වහන්සේ පූර්‍වබුදුවරයන්කෙරෙහි කෘතාධිකාරඇතිව මහපින්ඇතිව ඒ ඒ භවයෙහි නිර්‍වාණසම්පත්තියට හෙතුවූ කුසල් රැස්කරන්නී විපස්සිනම්බුදුරජාණන්වහන්සේගේකාලයෙහි බන්‍ධුමතීනුවර එක්තරා කෙලෙඹියක්හට දසීව ඉපද වැඩිවිය පැමිණ හිමියන්ට මෙහෙකරමින් ජීවත්ව වසන්නීය, එසමයෙහි බන්‍ධුමතීරජතෙම පොහොයක් පොහොයක්පාසා පෙහෙවස් සමාදන්ව පෙරබත දනාදිපින්කම් කොට පස්වරු බණ අසන්නේය,

නුවරවාසී මහජනසමූහයාද එසේම කුසල්හි හැසිරෙන්නේය; එකල්හි ඒ සරදසියහට මෙබඳු සිතිවිල්ලෙක් විය, "දැන් මේරජද මහජනසමූහයාද පෙහෙවස් සමාදන්ව කුසල්හි හැසිරෙති එහෙයින් මම පොහෝදවස ස්වාමීන්ගෙන් අවසරගෙණ පෙහෙවස් සමාදන්වෙමි"යි සිතා ස්වාමීන්ට දන්වා අවසරගෙණ එක්දවසක් පිරිසිදුව පෙහෙවස් රක්ෂාකොට ඒ කුසලයෙන් එයින් චුතව නොනිසා දෙව්ලොව ඉපිද ඔබිනොබ ස්වර්ගයෙහිම සැරිසරා ඇවිදිමින් ලක්ෂයක්පමණ අවනඩගනාවන් කරණලද උපස්ථාන ඇතිව සුසැටවරක ශක්‍රදෙවේන්ද්‍රයන්ට මෙහෙසිකාව තෙසැටවරෙක චක්‍රවර්ති රජුන්ට අගබිසෝව උපන්තැන ස්වර්ණවර්ණවූ අප්‍රමානවූ දිව්‍යමනුෂ්‍යසම්පත් අනුභවකොට නිවන්රස වලඳනුකැමතිව මේ බුද්ධොත්පාදකාලයෙහි දෙව්ලොවින් චුතව සැවත්නුවර මහසිටුකුලයක ඉපද ප්‍රාඥබවට පැමිණ පටාචාරනම් ස්ථවිරියගේ සමීපයෙහි බණ අසා පැවිදිව විදර්ශනා වඩා ප්‍රව්‍රජ්‍යාධර්මය මුදුන්පත්කරගන්ට නොහැකිවූවාය, පටාචාර ස්ථවිරීතොමෝ ඈගේ චිත්තාචාරය දැන අවවාද දුන ඒ අවවාදයෙහි පිහිටා සිට සිව්පිළිසිඹියාභාසම්හග රහත්ව ප්‍රව්‍රජ්‍යාසුඛ විදින්නී මහත්ප්‍රීති උපදවාගෙණ උදානවශයෙන් මේ ගාථා කියනලදී:—

නගරෙ බන්ධුමතියා බන්ධුමා නාම ඛත්තියො,
දිවසෙ පුණ්ණමායං සො උපගච්ඡි උපොසථං.

අහං තෙන සමයෙන කුම්භදාසී අහු තහිං,
දිස්වා සරාජිකායෙතං එවාහං චින්තයිං තදා.

රජාපි රජ්ජං ඡඩ්ඩෙත්වා උපගංජි උපොසථං,
සඵලං වතතං කම්මං ජනකායො පමොදිතො.

යොනිසො පච්චවෙක්ඛිත්වා දුක්ඛඤ්ච දළිද්දතං.
මානං සංපහංසෙත්වා උපගංජි උපොසථං.

අහං උපොසථං කත්වා සම්මාසම්බුද්ධසාසනෙ,
තෙන කම්මෙන සුකතෙන තාවතිංසං අගච්ඡහං

තත්ථ මෙ සුකතං ව්‍යම්හං උබ්බං යොජනමුග්ගතං,
කූටාගාරවරූපෙතං, මහාසයනභූසිතං.

අච්ඡරාසත සහස්සානි උපට්ඨිස්සන්ති මං සදා,
අඤ්ඤෙ දෙවෙ අතික්කම්ම අතිරොචාමි සබ්බදා.

චතුසට්ඨිදෙවරජ්ජානං මහෙසිත්තමකාරයිං,
තෙසට්ඨිචක්කවත්තීනං මහෙසිත්තමකාරයිං.

සුවණ්ණවණ්ණා හුත්වාන සංසරාමි භවාභවෙ,
සබ්බත්ථ පවරා හොමි උපවාසස්සිදං ඵලං·

හත්ථියානං අස්සයානං රථයානඤ්ච කේවලං,
ලභාමි සබ්බමෙවෙතං උපවාසස්සිදං ඵලං,

සොවණ්ණමයං රූපිමයං අථොපි ඵලිකාමයං,
ලොහිතඞ්කමයඤ්චෙව සබ්බං පටිලභාමහං·

කොසෙය්‍යකම්බලියානි ඛොමකප්පාසිකානි ච,
මහග්ඝානි ච දුස්සානි සබ්බං පටිලභාමහං.

අන්නං පානං ඛාදනීයං වත්ථං සෙනාසනානි ච,
භොගෙ ච ඌනතා නත්ථි උපවාසස්සිදං ඵලං·

වරගන්ධඤ්ච මාලඤ්ච චුණ්ණකඤ්ච විලෙපනං,
සබ්බමෙතං පටිලභෙ උපවාසස්සිදං ඵලං.

කූටාගාරඤ්ච පාසාදං මණ්ඩපං හම්මියං ගුහං,
සබ්බමෙතං පටිලභෙ උපවාසස්සිදං ඵලං.

ජාතියා සත්තවස්සාහං පබ්බජිං අනගාරියං,
අඩ්ඪමාසෙ අසම්පත්තෙ අරහත්තමපාපුණිං·

එකනවුතෙ ඉතො කප්පෙ උපොසථමුපාවිසිං'
දුග්ගතිං නාභිජානාමි උපවාසස්සිදං ඵලං.

කිලෙසා ඣාපිතා මය්හං භවාසබ්බෙ සමූහතා,
නාගීව බන්ධනං ඡෙත්වා විහරාමි අනාසවං.

සාගතං වත මෙ ආසි බුද්ධසෙට්ඨස්ස සන්තිකං,
තිස්සො විජ්ජා අනුප්පත්තා කතං බුද්ධස්ස සාසනං.

පටිසම්භිදා චතස්සො ච විමොක්ඛාපි ච අට්ඨිමෙ'
ඡළභිඤ්ඤා සච්ඡිකතා කතං බුද්ධස්සසාසනන්ති.

තවද දවසින්භාගයක අඩඋපොසථයක් විසීමෙනුදු ලැබූ අනුසස් මෙසේ දතයුතු, අපබුදුහු සැවත්නුවර දෙව්රම්හි වැ

ධවසන සමයෙහි කොසාඹෑනුවර ඝොසකසිටාණෝය කුක්කුටසිටාණෝය පාවාරියසිටාණෝයයි යන සිටුවරුන් තුන්දෙනෙක් වූවාහුය, ඔවුන් වස්වසනකාලය සම්පවූකල්හි හිමවතින් අවුත් නුවර පිඩුපිණිස හැසිරෙන පන්සියයක් පමණ තාපසවරුන් දැක පැහැද වලඳවා ප්‍රතිඥගෙණ වස්සාරමස තමන්සමීපයෙහි වසවා නැවත වස්සානය පැමිණිකල වඩනාපිණිස ආරාධනාකොට යවූවාහුය, තාපසයෝද එතැන්පටන් අටමසක් හිමවත වැස සාරමසක් එහි සිටුවරුන් තුන්දෙනාගේ සමීපයෙහි වසන්නාහුය.

මෑතභාගයෙහි ඔහු හැම්දෙන හිමාලවනයෙන් නික්ම එන්නාහුය, අරණ්‍යයෙහි එක්මහනුගරුකක් දැක ඒනුගරුක මුල හුන්නාහුය, ඔවුන් අතුරෙහි ප්‍රධානතාපසතෙම සිතනුයේ "මේනුගරුකෙහි මහෙශාක්‍යදිව්‍යරාජයෙකු විසින් අධිගෘහිතවූයේ වන, හෙතෙම මේ ඍෂිගණයාට බොනපැනක් දුන්නේ විනම් මැනවැ"යි සිතුසේක, ඒසිතහාසමගා දෙවතාතෙම බොනපැන් දීන, නැවත තාපසතෙම නහනපැන් සිතුයේය, එකෙණෙහි නහනපැන් දීන, එකල්හි තාපස සිතනුයේ "මේදිව්‍යරාජයාවනාහි අපවිසින් සිතුසිතුලෙස සියල්ලම දෙන්නේය, ඒදිව්‍යරාජයා අපි දක්කමෝනම් ඉතායෙහෙකැ"යි සිතුක්‍ෂණයෙහි හෙතෙම නුගකඳ දෙබෑකොට පැනනැඟී දිව්‍යරාජවිලාසයෙන් සිටිනමා තවුස්පිරිසට දක්වූයේය, එකල්හි තාපසයෝ "දිව්‍යරාජය තොපගේ සම්පත් ඉතාබොහෝය, තොපවිසින් කවර පින්කමක්කොට මේ සම්පත් ලබනලද්දැ"යි විචාළාහුය.

එකල්හි ඒදිව්‍යපුත්‍ර "ස්වාමිනි මාතොවිචාළමැනවැ,,යි කිය නැවත නැවතත් "දිව්‍යරාජය තාකලකුසලය කියව,,යි විචාරණුයේනා මාවිසින් කරණලද කුශලකර්මය ස්වල්පබැවින් කියන්නට ලජ්ජායෙන් නොකැමැතිව ඉතාගැහැටව එසේ වීනම් අසව,,යි කියා කීයේය.

හෙතෙම ඊට පූර්වජාතියෙහි මිනිසෙක්ව බැළමෙහෙ සොයා ගොස් අනේපිඬුමහසිටාණන් සමීපයෙහි බැළමෙහෙයක් ලැබ එසින් ජීවිකාව කරන්නේය, එකල්හි එක් පොහෝදිනයක් පැමිණිකල්හි අනේපිඬුමහ සිටාණෝ විහාරයෙන් අවුත් බැළමෙහෙකරණ පුරුෂයාට අද පොහෝදිනබව කීයේ ඇද්දැ,,යි විචාළනැන ස්වාමීනි කිසිවක්හු විසිනුත් නො

කියනලද්දේය,,යි කීවාහුය, “එසේවීනම් ඹිගට සවස බත පිසුව මැනවැ,,යි දුන්විය, එකල්හි ඹිහට පමණක් සාල්නැළියක් ගෙණ බත් පිසුවාහුය, හෙතෙම දකවල් අරණ්‍යයෙහි කර්මාන්තකොට සංධ්‍යාකාලයෙහි අවුත් බත්එලවා දුන්කල්හි ක්‍ෂුධායෙමියි සිතා වහාබත් අනුභව නොකොට සෙසුදවස්වල මේගෙදර “බත් දෙව, මාළුදෙව,,යි කියා මහාකොලාහාලවන්නේය, අද හැමදෙනම නිශ්ශබ්දව හොත්තාහුය එකලාව මටපමණක් ආහාර එලවා දුන්නාහුය, මේකිමෙක්ද”යි සිතා “සෙසුඅය බත් අනුභවකළාහුද ?- නොකළාහුද? කාරණකිම්,,යි විචාළේය.

එකල්හි සිටානන්ගේ පිරිවරජනයෝ කියනනාහු “එම්බල බැළය මේගෙදර පොහොදවස්වල සවස බත්නොපිසන්නේය සියල්ලෝ පෙහෙවස් සමාදන්වන්නාහුය, යටත්පිරිසෙයින් මේගෙදර ලදරුවන්පවා මුඛසෝධවා චතුමධුර මුඛයෙහි බහාලවා අපගේ මහසිටුතෙම මෙසේ ලදරුවන් වීනමුත් උපොසථිකයන් කරවන්නේය, සුවඳතෙල්පහන් දිලියෙමින් සිටිකල්හි සයනගතවූ කුඩාමහත්දරුවෝ දෙතිස්කුණපකොට්ඨාශය කියන්නාහුය, තොපට වනාහි පොහොදවසබව කියන්නට සිහිනොවුම්හ, එහෙයින් තොපටම බත් උයනලද්දේය, ඒබත් අනුභව කරව,, යී කිවුය

එවිට දුගිතෙම “පෙහෙවස් සමාදන්වෙන්ට වටනේ වීනම් මමත් දැන් සමාදන්වෙමි,,යි කීය, එවිට සෙස්සෝ “මේකාරණය මහසිටුතෙම නොදන්නේය,,යි කීවුය, “එසේ වීනම් ඔහු විචාරව,,යි කියා ගොස් සිටාණන් විචාළකල්හි කියනුයේ දුන් බත් අනුභව නොකොට මුව සෝදා ඒඋපොසථශීලයන් ඉටාගත්තැ නැත්තේ අර්ධඋපොසථ කර්මයක් ලබන්නෙහිය,,යි කීයේක.

දුගීපුරුෂ ඒ අසා එසේ කෙලේය, දවලමුළුල්ලෙහි කර්මාන්තකොට රාත්‍රියෙහි බඩසායෙන් සිටි ඒදුගීපුරුෂයාගේ ශරීරයෙහි වාතයෝ කුපිතවූවාහුය, හෙතෙම රැහැණකින් බැඳ යොත්කෙළවර ගෙණ පෙරලා අදනේය, වෙදනාව ඉතාබලවත්විත මහසිටුතෙම ඒප්‍රවෘත්තිය අසා දඹුවැටපහන්ලවාගෙණ චතුමධුර ගෙන්නාගෙණ ඔහුගේ සමීපයට ගොස් “දරුව

තිමෙක්ද''යි විචාළහ, "ස්වාමිනි වාතය කුපිතවිය"යි දැන්විය, "එසේ විනම් දරුව නැගි මේ බෙහෙත් කව"යි කීහ, එවිට දුගීතෙම "ස්වාමිනි තුඹත් කන්නෙහිදැ,,යි විචාළේය, "අපට අපාසුවෙක් නැත, තෝ මේ චතුමධුරය කව,,යි කීහ, "ස්වාමිය පෙහෙවස් වසන්නාවූ මම දවසමුළුල්ලෙහි රක්නට නොහැකිවීමි මාගේ අර්ධඋපොසථකර්මයද විකාලභොජනයවේදැ,, යනභයින් නොකැමැතිවිය, සිටාණන්විසින් "දරුව මෙසේ නොකරව,,යි කියතුලබන්නේද ශීලභෙදභයින් බෙහෙත් අනුභවකරන්ට නොකැමැතිව වෙදනා උපදවමින් කල්යවා අරුණුනැගෙනකල්හි මලානිකව ගියමල්දමක්මෙන් කාලක්‍රියාකොට ඒනුගරුක එබඳුදිව්‍ය සම්පත්තියකින් යුක්තව උපන්නේය.

එහෙයින් මේකාරණය ප්‍රකාශකොට දිව්‍යපුත්‍රතෙම තාපසවරුන්ට තත්වූපරිද්දෙන් කියා ඒඅනේපිඩුමහසිටුතෙම "බුදුන් මමය මාගේය,, යනසිත් ඇත්තේය. ධර්මය මමය මාගේය යනසිත් ඇත්තේය සංඝයාවහන්සේ මමය මාගේය යන සිත් ඇත්තේය, ඔවුන් නිසා කරනලද අර්ධඋපොසථකර්මයාගේ ආනුභාවයෙන් මේසා මහත්දිව්‍යසම්පත්තියක් මාවිසින් ලබනලද්දේයි දැන්විය.

මෙසේ සීලසම්පත්තිය මහානිසංස ඇත්තේයයි දැන එක් ඇසක් රක්නා මිනිසෙකුමෙන් අප්‍රමාදව උපොසථසීලය රක්ෂාකළමැනව, කාලපරියන්තවූද ශීලයාගේ ඵලසම්පත් මෙසේ ඇතිවනකල කාලපර්‍යන්තනොව රක්ෂාකරනලද ශීලයාගේ ආනිසංස මහත්තත්වය මෙයටවඩා කුමක් කියමෝද? ජීවිතාන්තයදක්වා රක්ෂාකරණලද යම් නිත්‍යශීලයෙක් ඇද්ද? ආනිසංසවශයෙන් ඒශීලය ප්‍රකාශකොටකියන්ට බුදුරජව පොහොසත්වනසේක, මෙම කියන ලදමැයි:—

එවං මහානිසංසන්ති විදිත්වා සීලසම්පදං,
නයතං එකනෙත්තොවරක්ඛ සිලමුපොසථං.

කාලපරියන්තිකස්සාපි සීලස්සෙසො ඵලොදයො
අපරියන්තස්ස හි ඵලං කිං වක්ඛාමි ඉතොපරං.

ආපානකොටිකං යාව නිච්චසීලං හි රක්ඛිතං,
මුනින්දොව පහුහොති ඵලංතො තං විභාවිතුං.

මෙසේ අටවෙනි පරිච්ඡේදයෙන් නිත්‍යශීල උපොසථශීලයන්ගේ ප්‍රභේදානිසංස ප්‍රකාශකිරීමෙන් ලෝවැඩදක්වා තදනන්තරව දානාදි කුශලකර්මපථප්‍රභේදානිසංස කථාවෝද මෙහි දක්වනු ලැබෙත්.

දශකුශලකර්මයෝ නම් කවරහයත්?—දානය ශීලය භාවනාය අපචායනය වෙය්‍යාවච්චය පත්තිදානය පත්තානුමෝදනාවය බණ ඇසීමය බණ දෙසීමය දෘෂ්ටිය ඍජුකිරීමය යනමොහු දශකුශලකර්මයෝ නම් වෙත්, ඔහු තම්තමාසමංගිපුද්ගලයාට අනේකප්‍රකාරවූ පුණ්‍යඵල උපදවා දෙනබැවින්ද ඔහුගේ චිත්තසන්තානය පිණවා සතුටුකරණහෙයින්ද පින්ය යනමොහු සත්වයන් විසින් කරන්ට යුතුහෙයින් ඒ ඒ කුශලානිසංස කථාවස්තූහු ගණන්වශයෙන් දශයෙක්හුයි දශපුණ්‍යක්‍රියාවස්තූහුනම් වෙත්.

එහි දානයතෙම දශපාරමිතාවන්කෙරෙන් පළමුවන පාරමිතාවය, සතරසංග්‍රහවස්තූන්කෙරෙහි පළමුවන සංග්‍රහවස්තුවය, දාන ශීල භාවනායන තුන්පුණ්‍යක්‍රියාවස්තූන් කෙරෙහි පළමුවන පුණ්‍යක්‍රියාවස්තුවය, හැමබෝසතුන් හැසිරෙනමාර්ගය, හැමබුදුන්ගේ වංශය ඒ දානයනම් ධර්මදානය ආමිසදානයයි කියා ද්විප්‍රකාර වන්නේය, එහි බුදුන්වදාළපිටකත්‍රයෙන් එක ගාථාවක්වත් පුහුණු කොට මෙයින් මොවුන් සසරදුකින් මුදවම්යන කරුණාවෙන් ලාභසත්කාරාදියක් නොපතා අනුන්ට බණකීමද එසේම අනුන් ලවා බණ කියවාලීමද ධර්මදානනම් වන්නේය, භික්ෂූන්වහන්සේලාට දියයුතු චීවරපිණ්ඩපාතාදිවූ ප්‍රත්‍යයද කපිනපථිකපෞරාණිකාදීවූ යාචකයන්ට දියයුතුවූ ධනධාන්‍යගෝමහිස වස්ත්‍රාභරණදිය ආමිසදානනම් වන්නේය.

ඒ ද්විප්‍රකාරවූ දානයන්අතුරෙන් ධර්මදානයම ලොව උතුම්වන්නේය, ඒ ආමිසදානය අවිඤ්ඤාණක සවිඤ්ඤාණක වශයෙන් අති ප්‍රභේදගතව අනේකප්‍රකාරවී නමුදු දානවස්තූන්ගේ වශයෙන් දශවිධවේ, එහි දශවිධදානවස්තූහු නම් කවරහයත්?—

අන්නං පානං ඝරං වත්ථං යානං මාලාවිලෙපනං,
සෙය්‍යාවසථපදීපෙය්‍යං දානවත්ථු ඉමෙ දස--හි.

අන්නං, ශාලිව්‍රීහිආදි ශප්තවිධධාන්‍යයෙන් කළ ආහාරදානය; පානං, මධුමුද්‍රිකාදි පානවර්ගීදානය; වත්‍ථං, ඛොමකො සෙයතාදි වස්ත්‍රදානය; යානං, ඉද්දෙලිද්දෙල්කු නම් ආදියානාවාහන දානය; මාලා, ගෙතූ නොගෙතූ දැසමන්ආදී පුෂ්පදානය; ගන්ධ, කස්තුරි කර්පූරාදි සුගන්ධදානය; විලෙපනං, සඳුන් කසාගොරද කොකුම් ආදී විලෙපනදානය; සෙය්‍ය, හිසිච්මිලිකාදි දශවිධ සෙය්‍යදානය; ආවසථ, ආවාසදානය; පදීපෙය්‍යං, ප්‍රදීපයට හිතවූ පහන්වැටි පහන් තෙල්ආදිය හා ප්‍රදීපදානය යන; ඉමෙ, මොහු දසදානවත්‍ථු දශවිධවූ දානවස්තූහු නම් වෙත්.

මෙම ආහාරාදී දානවස්තූන්ගේ යහපත්වූ මනාත්වවන පෙර දුරිකොට ඇති යම් දීමෙක් ඇද්ද ඒ දීම දානයයි කියා අග්‍රදානයන් නොපැකිලදෙන ස්වභාවඇති බුදුවරයෝ වදරත්, එයින් කීහ සද්ධම්මෝපායනයෙහි:

අන්නාදිදානවත්‍ථූනං චාගො සුබුද්ධිපුබ්බකො,
යොතං දානන්ති දිපෙන්ති බුද්ධාදානයගදයිනො.

මෙසේ ලද්දනම්ඇති දානය පවත්වන දායකයන්ගේ වශයෙන් දානදාස දානසහාය දානපතියයි කියා තුන්දෙනෙක් වෙත්, එහි යමෙක් මධුරදෙයක් වලඳා අමධුරදෙයක් අනුන්ට දෙන්නේවීනම් හෙතෙම දානවස්තුව ස්වාමියෙකුමෙන් සිත, තමා යටත්ව දාසව සිට දෙනහෙයින් ඒ දානය දාසදානනම් වෙයි, යමෙක් මධුරවී නමුදු අමධුරවීනමුදු තමා වළඳනනියායෙන් අනුනට දෙන්නේවීනම් හෙතෙම දානවස්තුව තමා සමකොට යහළුවෙකුමෙන් සිතා දෙනහෙයින් ඒ දානය සහායදානය නම් වෙයි, යමෙක් යම් යම් දෙයකින් තමා යපි අනුන්ට මධුර කොට දන්දෙන්නේ වීනම් හෙතෙම දානවස්තුවට තමාහිමිව අධිපතිව සිට නොපැකිල දෙනහෙයින් ඒ දානය දානපතිනම් වෙයි;

තවද අවර්ෂිය ප්‍රදෙශවර්ෂිය සර්වත්‍රවර්ෂිය කියා දානය තුන්වැදෑරුම්වේ, එහි යම්කිසිතැනෙක්හි නොවස්නා වලාසෙයින් යමෙක් යම්කිසිවෙක්හට දන් නොදෙන්නේ වීනම් හෙතෙම අවර්ෂිනම් වෙයි, කිසිතැනෙක්හිම වස්නා වැසිවලාහෙයින් යමෙක් සමහරකෙණෙකුන්ට දන්දෙන්නේ වීනම් හෙතෙම

ප්‍රදේශවර්ජිතම වෙයි, හැමතැන්හි සතරමහාදිවයින එකපැහැ ර වස්නා මහවලාසෙයින් යමෙක් විභාගනොව සියල්ලටම දන් දෙන්නේ විනම් හෙතෙම සර්වත්‍රවර්ජී නම් වෙයි.

එහෙයින් දානපති හැමදෙනාකෙරෙහි මෙත් සිත් පතුරුවා සාධාරණව සියල්ලවුන්ට දන්දෙන්නාවුන් විසින් පූර්වචේතනාය මධ්‍යචේතනාය අපරචේතනාය යන තුන්සිත් පිරිසිදුකොට දන්දීම දානසම්පත් නම්, මෙම වදාරණලදමැයි බුදුන් විසින්:—

පුබ්බෙව දානා සුමනො දදං චිත්තං පසාදයෙ,
දත්වා අත්තමනො හොති එසා යඤ්ඤස්ස සම්පදා.

එහි ආදිමධ්‍යාවසාන චේතනාවන්ගේ ප්‍රභේදය කෙසේද යත් ?—දන්දෙනපිණිස දානවස්තුව දැහැමෙන් සෙමෙන් උපද වන්නාවූ කාලයෙහිද ඒ දානවස්තුව අනුන්ට දෙමයි සිතනකාල යෙහිද දන්පිළිගන්ට සුදුසුවූන් සොයන කාලයෙහිද යම්තාක් තමා අයිති දානවස්තුව පිළියෙළ කරගන්නාකොට සතුටු පිරි තමා ඔහු අනාව පමුණුවා තමාගේ අත අල්වාලීමද ඒතාක් හැම තන්හි සතුටුව දායකයාවිසින් පූර්වභාගචේතනාවෝ ලොභාදීන් ගෙන් පිරිසිදුකිරීම ආදිසිත පිරිසිදුකළා නම් වෙයි, දානවස්තුව තමා කෙරෙන් පිරිනමා අනිත්මුදු ගලවා අනුන්ට දෙන කාලයෙහි චේතනාව පිරිසිදුකිරීම මධ්‍යසිත පිරිසිදුකළා නම් වෙයි, තමා දුන් දානවස්තුවෙහි ආලය නොකොට "සාධු මැනව මා විසින් අග්‍රදානයක් දෙනලදැ"යි සොම්නස්ව නැවත නැවත සතුටුවීමෙ න් දිවිහිමියෙන් ඒ දානචේතනාවන් පිරිසිදුකිරීම අපරභාගසිත පිරිසිදුකළානම් වෙයි, මෙසේ තුන්ප්‍රකාරවූ සිත එකතුව පිරිසිදු කිරීමෙන් දානමයකුශලය සම්බන්ධවන්නේයි, මෙම කියනලදී. උපාසකජනාලඞ්කාරයෙහි:—

පුරිමා මුඤ්චනාචෙව පරාතිසෙසාපි චේතනා,
හොති දානමයං පුඤ්ඤං එවං සෙසෙසු දීපයෙති.

සෙසු ශීලාදි සියලු පින්කම්හි තුන්සිත පිරිසිදුකිරීමද මෙකී නයින් දතයුතු, යමෙක් තෙමේ දන්දේද අනුන් සමාදන් නොක රවාද හෙතෙම උපන්උපන්තන්හි බොග සම්පත් ලබයි, පිරි වර සම්පත් නොලබයි, යමෙක් තෙමේ දන්නොදේද අනුන් සමා

දන් කරවාද හෙතෙම උපන් උපන් තන්හි පිරිවරසම්පත් ලබයි, භොගසම්පත් නොලබයි, යමෙක් තෙමේ දන්දේද අනුන්සමාදන් කරවාද හෙතෙම උපන් උපන්තන්හි භොගසම්පතුදු ලබයි, පිරිවර සම්පතුදු ලබයි, යමෙක් තෙමේ දන්නොදේද අනුන් සමාදන් නොකරවාද හෙතෙම් උපන් උපන් තන්හි භොගසම්පතුදු නොලබයි, පිරිවරසම්පතුදු නොලබයි.

දන් දෙනුයේ බොහෝදෙනාට ප්‍රිය වෙයි, සත්පුරුෂ ජනයන්ගේ සමාගම ලබයි, ඔහුගේ යසසද දශදිශායෙහි පැතිර බඹලෝදක්වා නැගෙයි, ගිහිගේ වැසියන්ගේ ධර්මයෙන් පහ නොවෙයි, ශරීරභෙදයෙන් මත්තෙහි ස්වර්ගපදප්‍රාප්තවේ, මෙම වදුරණලදමැයි.

"පඤ්චිමෙ භික්ඛවෙ දානෙ ආනිසංසා, කතමෙ පඤ්ච? — බහුනො ජනස්ස පියොහොති, මනාපො සන්තො සප්පුරිසා භජන්ති, කල්‍යාණො කිත්තිසද්දො අබ්භුග්ගච්ඡති, ගිහිධම්මා අනපෙතො හොති, කායස්ස භෙදා පරම්මරණා සුගතිං සග්ගං ලොකං උපපජ්ජති, ඉමෙ ඛො භික්ඛවෙ දානෙ ආනිසංසාති"

ඒ දානයතෙම කාලවශයෙන් පඤ්චප්‍රකාරවේ, යමෙක් ආගන්තුකයාහට දේද ගමිකයාහට දේද ගිලනුන්හට දේද දුර්භික්ෂයෙහි දේද අග්‍රශස්‍ය අග්‍රඵලයන් පළමුකොට ශීලවන්තතැන් කෙරෙහි පිහිටුවාද යන මේ පස පඤ්චකාලදානයෝ නම් වෙත්, වදලේමැනෝ.

"පඤ්චිමානි භික්ඛවේ කාලදානානි, කතමානි පඤ්ච? — ආගන්තුකස්ස දානං දෙති, ගමිකස්ස දානං දෙති, ගිලානස්ස දානං දෙති, දුබ්භික්ඛෙ දානං දෙති, යානි තානි නවසස්සානි නවඵලානි තානි පඨමං සීලවන්තෙසු පතිට්ඨාපෙති, ඉමානි ඛො භික්ඛවෙ පඤ්ච කාලදානානීති"

යමෙක් චිත්තාහි සකස්කොට දන්දේද දානවස්තුවෙහිදු දන් පිළිගන්නාතැන් කෙරෙහිදු ගෞරව නැතිව දේද පරහස්තයෙන් දෙවාද අමාපියන දෙයක්සෙයින් කිසිකාලයෙක්හි දේද අනාගත භවයෙහි උපදනා කුශලඵලය නොඅදහා දේද යනමොහු පඤ්ච අසත්පුරුෂ දානයෝම වෙති. වදලේමැනෝ

"පඤ්චිමානි භික්ඛවෙ අසප්පුරිසදානානි, කතමානි පඤ්ච?— අසක්කච්චං දෙති අචිත්තීකත්වා දෙති, අපවිද්ධං දෙති, අනාගමනදිට්ඨිකො හොති, ඉමානි ඛො භික්ඛවෙ පඤ්ච අසප්පුරිස දානානී''ති.

යමෙක් දෙන දානවස්තුවට සත්කාරනොව බත් හාල් වී ආදි දෝෂසමන්විතව ආහාර දෙන්නේද ශීඝ්‍රනාස්නානහා හැඳිම්ආදි වශයෙන් පිරිසිදුනොකොට කොයිසම් තැනකවත් හිඳුවා කොයිසම් ආහරයක්වත් තබා පුද්ගලයාට සත්කාර නොකොට දන් දීමද අසක්කච්චදාන නම්වේ, ඒ නොකොට යමෙක් දෙයාධර්ම සංඛ්‍යාත දානවස්තුව පවිත්‍ර මධුරකොට දානප්‍රතිග්‍රහණයට සුදුසු තැන් සොයා ගෙණ දේද යටකී ක්‍රමයෙන් දානවස්තුවටද දන් පිළිගන්නා තැන්වලටද ගෞරව නැතිව දීම නොසකස්දීම නම් වේ. එසේනොව විසිතුරු ගෞරවයෙන් දේද දාසිදස් කම්කරු ආදීන්ලවා දෙවාපීම අසහත්ථදාන නම් වේ, එසේ නොදෙවා අත් මුල් නැති සසර මා අත්පා නැතිව උපන්ජාති කල් පමණනැති එහෙයින් සියඅතින් දුනමැනවැයි සිතා තමා අතින් දන්දේද හමුරුද්දෙන් ඵලදෙන හොඬලවැල්සෙයින් කිසිකලෙක්හි දන් දීම අනපවිද්ධදාන නම්වේ, එසේනොව නිරන්තරයෙන් දන්දේද අනාගතකුශලඵලය නොඅදහා දීම අනාගමනදිට්ඨකගත නම් වේ, එසේනොව මතුභවයෙහි මට කුසලඵල උපදනේයයි සිතා දන්දේද මේ සත්පුරුෂ දානනාම්වේ, වදාළේමැනෝ

"පඤ්චිමානි භික්ඛවෙ සප්පුරිසදානානි, කතමානි පඤ්ච?— සක්කච්චං දෙති, චිත්තීකත්වා දෙති, සහත්ථා දෙති, අනපවිද්ධං දෙති ආගමනදිට්ඨිකො දෙති, ඉමානි ඛො භික්ඛවෙ සප්පුරිසදානානී''ති.

යමෙක් ශ්‍රද්ධායෙන් දන්දේද සත්කාරකොට දන්දේද කාලයෙන් දේද මසුරුසිත් වැළඳ නොගැත්මෙන් දානවස්තුවෙහි පැවති ලොභය හැර අපරිග්‍රහිත චිත්තව දන් දේද තමාටද අනුන්ටද පීඩානොකොට දන්දේද යනමොහු පස්දෙන සත් පුරුෂදානනාම්වෙති, එහි ශ්‍රද්ධායෙන් යමෙක් දන් දුන්නේවී නම් ඔහට ඒදානය ඵලදුන්කල මහාභොගසම්පත් ඇතිවෙයි විශිෂ්ටවූ රූපශොභා ඇතිවෙයි, සත්කාරකොට දන්දීමෙන්ද එසෙයින්ම මහාභොග ඇතිවෙයි, ඔහුගේ පුත්‍රදාරදාසකම්කා

රාදිවූ සියල්ලෝ ඒ සර්වාඞ්ගවචනය ඇදහීම්විශෙෂයෙන් අසන්නාහුය, කාලයෙන් දන්දීමෙහුදු ඔහට මහාභොග ඇතිවෙයි, යුක්තප්‍රාප්තකාලයෙහි සම්පත් අනුභව කරන්නට නිසිවයස ඔහට උපදනාඅඤ්ඤයෝ විපුලවද උපදිත් මසුරුසිත් නොවදන් දුන්නේ මහාභොගද ඇතිවෙයි, උදාරවූ පචකාම ගුණපරිභොගයට සිතනැමෙයි, තමාටද අනුන්ටද වෙහෙසනොකොට දන් දුන්නේ මහාභොග ඇතිවෙයි, ඔහුගේ සම්පතට දියෙන් ගින්නෙන් රජුන්සොරුන්විසින් උපද්‍රව නොවේ, මෙසිද්ද සත්පුරුෂදානනම්වේ, වදාළේමැනෝ

"පචිමානි භික්ඛවෙ සප්පුරිසදානානි කතමානි පච? සද්ධාය දානං දෙති, සක්කච්චං දානං දෙති, කාලෙන දානං දෙති අනග්ගහිතචිත්තො දානං දෙති, අත්තානච පරච අනුපහච්ච දානං දෙති,,

යනාදිපාලික්‍රමය දතයුතු.

එක්සමයෙක්හි සුමනානම් රාජකුමාරිකාව පන්සියයක් රථපිරිවරින් ජෙතවනාරාමයට ගොස් පන්සියයක්පමණ කුමාරිකාවන් පිරිවරා බුදුන් වැද එකත් පස්ව හිද "භාග්‍යවතුන් වහන්ස නුඹවහන්සේගේ ශ්‍රාවකයෝ දෙදෙනෙක් ශ්‍රද්ධාවෙන් ශීලයෙන් ප්‍රඥාවෙන් සමනාගතවූවාහුය, ඔවුන්දෙදෙනා කෙරෙන් එක්කෙණෙක් තමාලදදෙයක් අනුන්ට බෙදාදී වලදති, එක්කෙණෙක් නොදී වලදති, මේදායකඅදායකදෙදෙනා දිව්‍යලොකයෙහි උපන්කල විශෙෂඇත්තාහුදැ,,යි විචාළේය.

එකල්හි බුදුරජ අපරිභොග දුස්පරිභොග අභ්‍යානතියොජන ශ්‍රද්ධාදෙය්‍යවිනිපාතන කුලදූෂනායත්ට නොපමුණුවා තමා ලද ප්‍රත්‍යය සාරාණීයධර්මයෙහි සිටදන්දුන්දායකයා දෙව්ලොව උපන්කල දිව්‍යවූ ආයුෂයෙන් දිව්‍යවූවර්ණයෙන් දිව්‍යවූ සැපයෙන් දිව්‍යවූයසසින් දිව්‍යවූ ආධිපත්‍යයෙන් සෙසුදෙවියන් අභිභවන ශක්‍රදෙවෙන්ද්‍රයාසෙයින් දන්නුදුන්නාහු අභිභවනය කොට දිලියෙනපරිදි ප්‍රකාශකොට වදාළහ.

"යො සො සුමනෙ දායකො සො අමුං අදායකං දෙවභූතො සමානො පචහිඨානෙහි අධිගණ්හාති, දිබ්බෙන ආයුනා දිබ්බෙන වණ්ණෙන දිබ්බෙන සුඛෙන දිබ්බෙන යසෙන දිබ්බෙන ආධිපතෙය්‍යෙන"යී.

ඒ දෙදෙනා මිනිස්ලො උපන්කල මානුෂක ආයුෂයෙන් මානු
මානුෂකවර්ණයෙන් මානුෂකසැපයෙන් මානුෂකයසසින් මානුෂක
ආධිපත්‍යයෙන් සෙසුම් නිසුන් අභිභවන චක්‍රවර්ති රජ්ජුරුවන්
සෙයින් දන්නුදුන් පුද්ගලයා අභිභවා දිලිසෙනපරිදි වදාරා ඒ
දෙදෙනා පැවිදිවූකලද දන්නුදුන් පුද්ගලයාට වඩා අග්‍රප්‍රත්‍යලා
භීව අතුන්ගේ ආරාධනාවෙන් බොහෝවූ චීවරපිණ්ඩපාතසේනා
සන ගිලානප්‍රත්‍යයයන සිවුපසදානයන් පරිභොගකරණපරිදි ව
දාරා එම දෙදෙනා රහත්වූකල ලොකොත්තරසම්පත්තියෙහි ව්
ශෙෂයක් නැතිපරිදි ප්‍රකාශකොට වදාළසේක.

මෙසේ දානය නිර්වාණප්‍රාප්තවනතැන් දක්වා අතිවිපුලවිශි
ෂ්ටඵලදායකවන්නේයි, "භික්ෂු මහණෙනි ඉදින් සත්වයෝ මාගේ
ම දානයෙහි ඵල දනිත්නම් දන් නොදී නොවළඳති, මසුරුමල
ඔවුන් ඇවිලගෙණ සිටිනේ නොවේ"යි එක ආලොපයකුදු ලද
හොත් බෙදූදී වළඳති ඉදින් ගන්නාකෙණෙක් ඇත්මැ',යි වදාළෝ
මනාපදානයන් දුන්නේ මනාපස්ථාන ලැබෙයි, අග්‍රදානයන් දුන්
නේ අග්‍රවූ ස්ථාන ලැබෙයි, වරදානයන් දුන්නේ වරපදප්‍රාප්ත
වෙයි, භාණ්ඩයන් බෙදනතැනදී උතුම් භාණ්ඩයන් ලැබෙයි,
ශ්‍රෙෂ්ඨදානයන් දුන්නේ ශ්‍රෙෂ්ඨපදප්‍රාප්තවෙයි, හෙ උපන් උපන්
තන්හි දීඝවූ ආයුෂයා මහත් යසස් ඇතිවෙයි, වදාළේමැනෝ
උග්‍රදෙව්පුත්‍රහට:—

මනාපදායී ලභතෙ මනාපං අග්ගස්සදාතා ලභතෙ පුනග්ගං,
වරස්ස දාතා වරලාභි හොති සෙට්ඨං දදෙ සෙට්ඨ මුපෙති ඨානං.

යො අග්ගදායී වරදායී සෙට්ඨදායී ච යො නරො,
දීඝායු යසවා හොති යත්‍ථ යත්‍ථූපපජ්ජති—යි.

තවද මේ ආමිසදානය මහා සංඝිකදානය පුද්ගලික දාන
යයි තියා දෙවැදෑරුම්වන්නේය, එසේවූ විප්‍රකාරදානයන් අතු
රෙන් සංඝිකදානය සත්වැදෑරුම්වේ, කෙසේදයත් ?—

බුදුන් ජීවමානකාලයෙහි එක් පාර්ශවයෙක්හි භික්ෂු සං
ඝයාවහන්සේද එක්පාර්ශ්වයෙක්හි භික්ෂුණී සංඝයාවහන්සේද
මැද ලොවුතුරාබුදුන්ද වඩාහිඳුවා චීවරපිණ්ඩපාතයෙන් දෙන්නා
වූ දානය පළමුවෙනි සංඝිකදානය නම් වන්නේය මේ දනට
සමවූ විපාකඇති අනික් ප්‍රත්‍යදානයක්නම් නැත්තේය·

බුදුන් පිරිනිවන් පෑ කල්හි භික්ෂුභික්ෂුණී සංඝයාවහන්සේ වඩා හිඳුවා ඒමැද ආසනයක ධාතු පිහිටුවා කලප්‍රතිමාවක් වඩා පිළිමය ඉදිරියෙහි පාත්‍රවලල්ලක පාත්‍රයක් තබා දක්ෂිණෝදිකාදි සියල්ලම පළමුවන් ප්‍රතිමාවට පවත්වා ඊට ඉක්බිති උභතොසංඝයාට දෙන දානය දෙවෙනි සංඝිකදානය නම් වේ.

එසේම භික්ෂුසංඝයා පමණක් වඩා හිඳුවා මැද ධාතුපිළිමයක් වඩා දෙන්නාවූ දානය තුන්වෙනි සංඝිකදානය නම් වෙයි, එසේම භික්ෂුණීසංඝයා වඩා හිඳුවා ධාතුපිළිමයක් වඩා දෙන්නාවූ දානය සතරවෙනි සංඝිකදානය නම් වෙයි, "මෙතෙක් භික්ෂූන්වහන්සේද මෙතෙක් භික්ෂුණීන්වහන්සේද සඟින්දෙවයි" ඉල්වාගෙණ දෙන දානය පස්වෙනි සංඝිකදානය නම් වෙයි, උපසම්පදා සතරනමකින් අඩුනොව සංඝයාවසන විහාරයට ගොස් "මම සංඝිකදානයක් දෙන්නෙමි, මට සංඝයා දුනමැනවැ"යි යටත්පිරිසෙයින් එකනමක්වත් ඉල්වාගෙණ දෙන්නාවූ දානය සවෙනි සංඝිකදානය නම් වෙයි, එසේම භික්ෂුණීසංඝයාවහන්සේගෙන් එක්නමක් ඉල්වාගෙණ දෙනදානය සත්වෙනි සංඝිකදානය නම් වේ.

මෙසේ සංඝිකදානය සත්වැදෑරුම් වේ, මේ සියලුම සංඝිකදානයෙහි විපාක පොළොව පස්මෙන් අප්‍රමෙයව වන්නේය, ඒ බුදුන් පිදුදෙය කුමක් කටයුතුදැයි යතහොත් ?—බුදුන්ට වත්පිළිවෙත් කොට පිළිදගණ යම්වහණෙක් ඇත්නම් ඕහට දියයුතුය, නොහොත් වලඳන්ට උන් මහසංඝයාටහෝ බෙදාදියයුතු වන්නේය, ගිතෙල් තෙල් ආදිය ගෙණ බුදුන්ට පහන් පිදියයුත්තේය, පිදු පිළි ගෙණ බුදුන්ට ධජයක්කොට බැන්දයුත්තේය.

මේ ශාසනය නැසීගොස් එතදවස කසාකඩක් අතෙහිහෝ බෙල්ලෙහිහො බැඳ අඹුදරුවන් ගෙණ කෘෂිවණික්කර්මාන්ත කොට "අපි මහනුම්හ"යි කියා ඇවිදිනා අයකුත් ඇත, එවැනි දුස්සීලයන්ටත් "සංඝික දෙම්හ"යි අශ්‍රාවකපුද්ගලසංඝයා සිතින් වෙන්නොකොට යම්කෙණෙක් සංඝිකකොට දානයක් දුන්නාහු වීනම් ඒ සංඝික දානයෙහි විපාකත් බුදුහු අසංඛෙය්‍ය අප්‍රමෙය්‍ය වෙතියි වදාළසේක.

සංඝිකදානය සංඝයාට ආදරකොට දීම පුළුවන්අයටම සිද්ධ වෙයි. වදුළුගෙහියින් "සංඝයාට දන්දෙම්හ"යි දානවස්තු සපයා වෙහෙරට සංඝයා පසහ පඬිටුවා වැඩ තමාගේ දානවස්තු පමුණුවා මහත්ය, "මේ සඟින් නමක්හෝ දෙනමක්හෝ දුනමැනවැ"යි යාච්ඤා කළකල්හි සංඝයා විසින් සාමණේරයෙකු දුනත් තමා දන්නා දුස්සීලනමක් දුනත් "මම දුස්සීලනමක් ලදිමි"යි "මම සාමණේරනමක් ලදිමි"යි දොම්නස් නොකටයුත්තේය, ධූතාංගධරකෙණෙකුන් මහතෙරකෙණෙකුන් ලදත් "මම ධූතාංගධරකෙණෙකුන් ලදිමි"යි "මහතෙරකෙණෙකුන් ලදිමි"යි සොම්නස් නොකටයුත්තේය, ඉදින් තමා සඟින් ලත් මහණුන් "අඩුතරම වැඩිතරමැ"යි සිතුවහොත් සංඝිකදානය සිද්ධනොවන්නේය, එබැවින් ලත් යම්කෙණෙකුන්වහන්සේට සැරියුත් මුගලන් දෙදෙනාවහන්සේටමෙන් පුෂ්පසුගන්ධාදියෙන් තමා ශක්තිපමණින් පූජාකොට ආදරයෙන් දන්දියයුත්තේය, ඉදින් එසේ සිතා ගෙණ දන්දෙන්ට පුළුවන් වී නම් එක්රහත් කෙණෙකුන්වහන්සේට දුන් දානයටත් වඩා සඟින්ලත් දුස්සීලකෙණෙකුන්ට දුන් දානයම වැඩිතරම් වන්නේය.

පුද්ගලිකදානයද තුදුස් වැදෑරුම්වේ, ඒ කෙසේදයත්?— සම්‍යක්සම්බුදුකෙණෙකුන්වහන්සේට දන්දීමය, පසේබුදුකෙණෙකුන්වහන්සේට දන්දීමය, රහතුන්වහන්සේකෙණෙකුන්ට දන්දීමය, රහත්ඵලය ප්‍රත්‍යක්‍ෂකිරීමට පිළිපන්කෙණෙකුන්ට දන්දීමය, අනාගාමිකෙණෙකුන්ට දන්දීමය, අනාගාමීඵලය ප්‍රත්‍යක්‍ෂකිරීමපිණිස පිළිපන්කෙණෙකුන්ට දන්දීමය, සකෘදාගාමිකෙණෙකුන්ට දන්දීමය, සකෘදාගාමිඵලය ප්‍රත්‍යක්‍ෂකිරීමට පිළිපන්කෙණෙකුන්ට දන්දීමය, සෝවාන්කෙණෙකුන්ට දන්දීමය, සෝවාන්ඵලය ප්‍රත්‍යක්‍ෂකිරීමපිණිස පිළිපන්කෙණෙකුන්ට දන්දීමය, සස්නෙන් පිටත් ධ්‍යානයෙන් රාගාදි අකුසල් සංසිඳුවා වසන්නකෙණෙකුන්ට දන්දීමය, පචශීල අෂ්ටාංගශීලාදියෙන් සිල්වත්වූ පෘතුග්ජනකෙණෙකුන්ට දන්දීමය, වැද්දන් කෙවුලන් ආදීවූ දුස්සීල මනුෂ්‍යයෙකුට දන්දීමය, බලු කුකුළුආදීවූ තිරශ්චීනයෙකුට දන්දීමයයි තියා තුදුස්වැදෑරුම් වන්නේය.

මෙයින් තිරශ්චීනයා රූපාදි විශිෂ්ටගුණ ඇතැයි සිතා ඔහුගේ බඩපුරා ආහාරයක් දුනහොත් ඒ දානයත් "මොහු පෝෂණයකොට වඩමි"යන සිතින්ද දෙන්නාවූ දානයත් හැර පිඩක්

දෙපිඩත් දිවයසී කියනලද අසම්පූර්ණ දානයත් හැර කුත්කුර කුක්කුටාදීන් අතුරෙන් යමක්හට මේ දානයෙන් මට පින් ඇතැයි සිතා ඔවුන්ගේ බඩපුරා ආහාරයක් දුනහොත් ඒ දානය දන් දුන්නාහට සියක්ජාතියෙහි ආයු ඇතිකරන්නේ වෙයි, සැප විඳුවන්නේ වෙයි, මෙසේ සියක්ජාතියෙහි වර්ණ ඇතිකරන්නේ වෙයි, බල ඇතිකරන්නේ වෙයි, නුවන ඇතිකරන්නේ වෙයි, මෙවැනි අනුසස් පසක් දෙන්නේ වෙයි. මෙසේම දුස්සීල මනුෂ්‍යයෙකුට දන් දුන්නේ ඒ දානය දහසක් ජාතියෙහි ආයුෂයද වර්ණයද සැපද බලද ප්‍රඥාද සිඬකරන්නේ වෙයි, මෙශ්සම ශාසනයෙන් පිටත් සිල්වත් මනුෂ්‍යයක්හට දනක් දුනහොත් ඒදානය ලක්‍ෂයක්ජාතියෙහි ආයුෂය වර්ණය සුඛය බලය ප්‍රතිභානය යනපස සිඬකරන්නේ වෙයි, මෙසේ ශාසනයෙන් පිටත් වීතරාගීකෙණෙකුන්ට දුනහොත් කෙලලක්‍ෂයක්ජාතියෙහි ආයුෂාදිවූ අනුසස් පස සිඬකරන්නේ වෙයි, මෙසේම සරණශීලයෙහි පිහිටා සිටි උපාසකයෙකුට දන්දුනහොත් ඒ දානය අසංඛෙය්‍ය අප්‍රමෙය්‍ය ජාතියෙහි මෙති විපාක දෙන්නේය, සරණගතව පන්සිල්රක්නා එකෙකුට දුන්දානය ඊට වඩා අප්‍රමෙය්‍ය විපාකවන්නේය, උපසම්පදකෙණෙකුට දුන්දානය ඊටවඩා අප්‍රමෙය්‍ය විපාකවන්නේය එසිනුත් වත්පිළිවෙත්හි මනාව පිහිටිහට දුන්නාවූ දානය ඊටත් වඩා අප්‍රමෙය්‍යවිපාක වන්නේය.

මෙසේ විදර්ශක ආරබ්ධ විදර්ශක ශ්‍රොතාපතතා සකෘදාගාමි ඵලයට පිළිවෙත් පූරන්නේය, සකෘදාගාමි අනාගාමිඵලයට පිළිවෙත් පූරන්නේය, අනාගාමි අර්හත්ඵලයට පිළිවෙත් පූරන්නේය, රහත්කෙණෙකුන්වහන්සේය, පසේබුදුන්වහන්සේය, ලොවුතුරාබුදුනුය යන මෙතෙක්දෙනාවහන්සේට දුන්දානය එක්කෙණෙකුන් වඩවඩා අප්‍රමෙය්‍ය විපාක වන්නේය.

යම්සේ දෙලක්‍ෂසතළිස්දහසක් යොදුන් ඝනඇති පොළොව කලවිටක්පමණතැන පසුත් අප්‍රමෙය්‍යවේද ?—ගව්වක් ගව්වක් පමණතැන පසුත් අප්‍රමෙය්‍යවේද ?—ඊටත්වඩා යොත්නක් පමණතැන පසුත් අප්‍රමෙය්‍යවේද ?—චක්‍රවාටපර්වතය අවසන් කොට ඇති මහපොළවේ පස් ඉතාම අප්‍රමෙය්‍ය වේද ?—එමෙන් සරණගතයාපටන් ලොව්තුරාබුදුන්දක්වා දුන්දානය ක්‍රමක්‍රමයෙන් ඊට ඊට වඩා අප්‍රමෙය්‍ය විපාක ඇතිබව දතයුත්තේය.

මේ දානයතෙම ප්‍රතිග්‍රාහකයන් නිසාම මහත්ඵලවීමක් නැති වම දායකයා නිසාත් මහත්ඵලවන්නාවූ එක් දානයක, දායකයා ගෙන්ම මහත්ඵලවීමක් නැතිව ප්‍රතිග්‍රාහකයන් නිසා මහත්ඵල වන්නාවූ එක්දානයක, ප්‍රතිග්‍රාහකයන් නිසාත් දායකයන් නිසාත් මහත්ඵල නැත්තාවූ එක්දානයක, දායකයන් නිසාත් ප්‍රතිග්‍රාහකයන් නිසාත් මහත්ඵලවන්නාවූ. එක්දානයකැයි සතරවැදෑරුම් වේ.

එහි යම් දනෙක දායකයෝ සිල්වත්වෙද්ද සුචිවූ චිත්ත සන්තාන ඇත්තෝද ප්‍රතිග්‍රාහකයෝ දුස්සීලයෝද පව්කරණ අයෙක්ද දානවස්තුවත් දැහැමෙන් සෙමෙන් ලත් වස්තුවවේද දායකයාගේ සිතත් ඉතා ප්‍රසන්නද මින් විපාක ඇතැයි දානඵලත් අදහා සිටියේද ඒ දායකයා නිසා මහත්ඵල වන්නාවූ දානය නම් වන්නේය, ඒ ජූජකබ්‍රාහ්මණයා දුස්සීලව ලාමකව සිටියදී ඔහට වෙස්සන්තර රජ්ජුරුවන් දන් දුන්තැන පොළොව කම්පාවිය, එසේ පොළොව කම්පාවන්ට කාරණවූයේ ජූජකබ්‍රාහ්මණයාගේ ශක්තියෙන් නොවෙයි, වෙස්සන්තර රජ්ජුරුවන්වහන්සේගේ සිල්වන්තකම නිසාමය.

යම් දනෙක දායකයෝ දුස්සීලද පවිත්‍රවූ චිත්තසන්තාන නැත්තෝද ප්‍රතිග්‍රාහකයෝ සිල්වත්වෙද්ද අලාම්කයෝද දානවස්තුවත් අධර්මයෙන් ලබනලද වස්තුවෙක්ද දායකයාගේ චිත්තයත් අප්‍රසන්නද දානඵලත් අදහා නොදෙද්ද ඒ දානය ප්‍රතිග්‍රාහකයා නිසා මහත්ඵලවන්නාවූ දානයක කැලණිගන්මෝදර වසන්නාවූ එක්කෙවුලෙක් දීඝසුමනනම් මහතෙරුන් වහන්සේට දුන්පිණ්ඩපාත දානය මා සතරඅපායෙන් ගොඩනගන්නේයයි, කීය.

යම් දානයක ප්‍රතිග්‍රාහකයෝ දුස්සීලයෝද දානවස්තුවත් අධර්මයෙන් ලබන වස්තුවෙක් වේද චිත්තයත් අප්‍රසන්නද දානඵලයත් අදහාගෙන නොදේද ඒ දායකප්‍රතිග්‍රාහකදෙදෙනා නිසා මහත්ඵල නොවන්නාවූ දානයෙක් නම් නොවන්නේය, වඩුන්නාවේ වසනවැද්දෙක් මලනෑකෙණෙකුන් නිසා පින්පෙත්කොට දුන්නේය, එක්දුස්සීලමහණෙක්හට තුන් වරෙක දන් දුන්නේය, ඒතුන්වරෙහිම ප්‍රේතයාට පින්නොපැමිණියේය, තුන්වාරෙම ප්‍රේතතෙම "දුස්සීලයෙක් මාගේ දන්

වොලෝයන්තේය”යි මොරගැය, ඒඅසා වැදිතෙම සිල්වත්කෙණෙකුන්වහන්සේට දන්දී පින්පෙත් දින, එකෙනෙහිම ප්‍රෙතයොනියෙන් මිදී දිව්සිරිලද්දේය

යම්දානයක දායකයෝත් සිල්වත්වෙද්ද ප්‍රතිග්‍රාහකයෝත් සිල්වත් වෙද්ද දානවස්තුවත් දැහැමෙන් ලබනලද්දේ වේද චිත්තයත් ප්‍රසන්නද කර්මඵලත් අදහාගෙන දේද ඒදානය දායකයන්නිසාත් ප්‍රතිග්‍රාහකයන් නිසාත් මහත්ඵලවන්නේය, බුදුන්ට අසදෘශමහාදන් දෙනකල්හි උපාසකවරුත් සිල්වත්ව සිට දන්දෙනහෙයින් ඒදායක ප්‍රතිග්‍රාහක දෙපක්ෂයනිසා දානය මහත් ඵලවිය,

එම්බා සත්පුරුෂයෙනි මෙසේ අසඞ්ඛ්‍යගතාන් ජාතියෙහි විපාකදීමට සමර්ථවූ මෙබඳුදානයෙක් බුද්ධශූන්‍යවූ අසඞ්ඛ්‍යගතාන් කල්පයන් අතුරේ යම් කිසිතැනෙකවත් බුද්ධශාසනයෙන් පිටත් අන්තැනෙකවත් මේ මගුල්සක්වලින් පිටත් අන්සක්වලකවත් බුදුන්ගේ බන නෑසූ අන්සත්‍වයක්හටවත් සිද්ධවන්නේ නොවෙයි, එබැවින් ඉදිරිසසර බොහෝකලක් දිව්‍යමනුෂ්‍යලොක දෙක්හි සැපවිඳුවන්නාවූ උත්කෘෂ්ට දානයට නොපව්සින් නිරන්තරයෙන් උත්සාහකටයුතු වන්නේය, එබැවින් නුවනැතිසත්පුරුෂයන් විසින් අජ්ඣත්තිකවූද බාහිරවූද අවිඤ්ඤාණක සවිඤ්ඤාණකසියලුවස්තූන්ගේ සාරත්‍වයක් නැතිබවද මෙය මාගේයයි කියාගතහැකිදෙයක් ලොව නැතිබවද දානමයකුශලයාගේ මහානිසංසබවද නුවනැසින් බලා මනාකොට සිතතබාගෙණ එක්වන් බණ ඇසීමෙන් දානලක්ෂණයන් දැන ඇඳින තම්තමාගේ ශක්තිවූ පරිද්දෙන් අප්‍රමාදව අන්දෙනදානවස්තුවෙහි පැවතිලොභයද දුරුකොට දන්ලබනප්‍රතිග්‍රාහකතැන් කෙරෙහි දූ ආදරගෞරව බහුමාන උපදවා විපුලතරවූ කර්මඵලවිශෙෂද සිහිකිරීමෙන් දානවස්තුපරිත්‍යාග කොට සියළු ලෞකික ලොකොත්තරසම්පත් සාදාගැන්මෙහි උත්සාහ කළමැනවි, දානානිශංසකථාවයි.

මෙසේ සංක්ෂෙපයෙන් දානානිසංස දක්වා තදනන්තරව සීලානිසංස කථාවෝද දක්වනුලැබෙත්, එහි සීලවිභාගානිසංස යට දක්වූහෙයින් මෙහි ආනිශංසමාත්‍රයක් දක්වනුලැබේ. ඒ කෙසේදයත්?-

සීලං සුඛානං පරමං නිදානං,
සීලෙන සීලො තිදිවං පයාති,
සීලං හි සංසාරමුපාගතස්ස,
තාණඤ්ච ලෙණඤ්ච පරායණඤ්ච.

අවස්සයො සීලසමො ජනානං
කුතො පනඤ්ඤ ඉධවා පරත්ථ.
සීලං ගුණානං පරමා පතිට්ඨා.
යථා ධරා ථාවරජඞ්ගමානං.

යනාදි දක්වූහෙයින් සීලයතෙම සියලුම උතුම්සැපයට කාරණය, සිල්ඇතිතැනැත්තේ සීලයකරණකොටගෙණ දෙව්ලොව වසන්නේය; , සීලයවනාහි සංසාරගතසත්‍වයාට රක්‍ෂස්ථානද වෙයි, නිලීනස්ථානද වෙයි, පිහිටනමුදු වෙයි, සියලුසත්‍වයන්ට මෙලෝ පරලෝදෙක්හි සීලය සමවූ අනික්අවස්‍යයෙක් පිහිටෙක් ඇත්තේ නොවෙයි, මේමහාපොළොව ලෙ:ව ඇති සියලූ ථාවරජඞ්ගමවස්තූන්ට ආධාර වේද, එසේම සීලය සියලුම ගුණයන්ට උතුම් ප්‍රතිෂ්ඨාවෙකැයි දූන අප්‍රමාදව ඇමදෙනා විසින් යටකියන ලද ක්‍රමයෙන්ම සීලවිභාගානිසංස දූන ඇඳින සීලපූරණයෙහි උත්සාහ කළමැනවි,

දානෙ සීලෙවයෙ වුත්තා ආනිසංසා අසෙසකා,
තෙ මත්දභාවනායාපි සංසිජ්ඣන්ති අසංසයං.
භාවනාබලයොගෙන බුද්ධභාවොපි සාධියො,
තදඤ්ඤං කා හි සම්පත්ති භාවනාය අසාධියා.

යනාදිවශයෙන් ප්‍රකාශවූහෙයින් දානයෙහිද සීලයෙහිද යම් යම් ආනිසංසයෙක් ප්‍රකාශවීද ඒසියලුම ආනිසංසයෝ නිසැකින්ම අසූරුසනක් පමණකල් විනමුත් භාවිතාකල මදවූ භාවනාමය කුශලයෙන් සමෘද්ධවන්නාහුය, එපමණක් මතුනොවෙයි' භාවනාබලයෙන්ම ලොවුතුරාබුදුබවපවා සිද්ධවනකල එයින් අන්‍යවූ කවරනම් සම්පත්තියක් භාවනාබලයෙන් සිද්ධ නොවන්නීද?- සියලුම ලෞකික ලොකොත්තර සම්පත් සිද්ධ වන්නේමය.

තවද යථොක්තක්‍රමයෙන්ම දානවස්තු සොයා සපයා ගැන් මෙහි පටන් දන්දීමදක්වාත් දුන්දානය මරණාසන්නය දක්වාත් නැවත නැවත ක්‍ෂයව්‍යයවශයෙන් හෝ සිහිකිරීමෙන් සොම්නස් වශයෙන්හෝ පවත්නාවූ සියලුපූර්වාපර චෙතනාවෝපවා මේ භාවනාමය කුශලයෙහිම ඇතුළත්වූකල තුන්සිත පිරිසිදුකරණ සෙසුසීලාදී කවරනම් කුසලයෙක් එහි එක්නොවේද ඒ සියලූ කුශලයෝම එක්වන්නාහු මැයි "යාවෙති කුසලධම්ම

චෛතසිකයන්ගේ එකඅරමුණෙහිසම පිහිටුවා කරණපරිකර්මභාවනානන්තරව උපදනා අර්පණාසමාධිතොමෝ භාවනානම්වේ.

අවික්ෂෙපලක්ෂණවූ වික්ෂෙප දුරුවීමම රසවූ කම්පාවක්නැති බව වැටහීම්කොට ඇති ඒ සමාධිය සමථයයි කියාද කියනු ලැබේ, ඒ සමාධිසඞ්ඛ්‍යාත සමථයෙහි සිත පිහිටුවා සිට රූපස්කන්ධාදීන්ගේ තත්ස්වභාවහා දර්ශනය හෙවත් රූපාදිය අශුභඅසාර විසින් දක්ම විදර්ශනානම්, ඒ සමථවිදර්ශනාදෙදෙනාගේ බලයෙන්ම අතීතාදි කාලත්‍රයෙහිවූ බුද්ධාදිසියල්ලන් විසින් නිවන්සෑදීම නියත ධර්මතාවක්හෙයින් නිවන්පුරවැද සැනසෙනුකැමති අප හැමදෙනාවිසිනුදු මේ භාවනාමාර්ගය පිළිපැදීමෙහි ආදරගෞරව බහුමාන උපදවා කියනලද ක්‍රමයෙන් නොයෙක් කර්මස්ථානයන් අතුරෙන් තමතමාට වැටහෙන කර්මස්ථානයක අප්‍රමාදව වීර්‍ය්‍ය වැඩීමෙන් යෙදී භාවනාවඩා නිවන්දක්මෙහි උත්සාහ කළමැනවි, තවද මෙසේ වඩනාලද භාවනාවෙහි අනුසස්නම්:—

සුනෙත්තො සත්තවස්සානි භාවෙත්වා මෙත්තමුත්තමං,
සත්තසංවට්ටකප්පෙසු නයිමං ලොකං පුනාගමි.
සංවට්ටෙ ච විවට්ටෙ ච බ්‍රහ්මලොකෙව සංසරි,
ඡත්තිංසක්ඛත්තුං දෙවින්දො ආසි තෙනෙව කම්මුනා.
අනෙකසතක්ඛත්තුං සො චක්කවත්ති මහායසො,
අසීති සුත්වාතිං අඤ්ඤං භාවනාවණ්ණනං වදෙ.

යම්හෙයකින් සුනෙත්‍රනම් ශාස්තෘතෙම සත්අවුරුද්දක් මෛත්‍රීභාවනාකොට සත්සංවර්තකල්පයක් මුළුල්ලෙහි මෙලොවට නොඅවුත් බ්‍රහ්මසිර්ම විත්දහ, මෙසේ සංවර්තසයිනම්වූ මහා කල්පයනැසීසිටීමෙහිද විවර්තසයිනම්වූ කල්පය හට ගැණී සිටීමෙහිද මහාකල්පනම්වූද සතරඅසංඛ්‍යකල්පගණනයෙන් විසිඅටඅසඞ්ඛ්‍යකල්පයක් මුළුල්ලෙහිම බ්‍රහ්මලොවම සැරිසරා ඇවිද අප්‍රමාණවූ බ්‍රහ්මසම්පත් අනුභවකොට නැවත එම භාවනා කුශලානුභාවයෙන් සතිස්වරෙක ශක්‍රදෙවෙන්ද්‍රවිය, නොයෙක් සිය ගනන්වාරයෙහි මහායස පිරිවරඇති චක්‍රවර්තිරජවියයි අසාද එයින් අන්‍යවූ කවරනම්භාවනානි සංසවර්ණනාවක් කියම්ද?—
තවද:—

අනිච්චානත්තසඤ්ඤායො චෙතනාතොපි මහප්ඵලා,
නාසංඵලම්භනත්තං කො පසදසඤ්ඤ පවණ්ණයෙ.

යනාදී කීහෙයින් සුනෙත්‍රශාස්තෘන්වහන්සේ මෛත්‍රී භාවනාව වඩා එම කුශලයෙන් සියඅටඅසංඛ්‍යකල්පයක විඳි බඹසුවද දෙව්ලෝ මිනිස්ලෝ හැම රජසුවද පිදීමෙහි පැවතිතාක් සියළු ලොභය සියලූම භවතණ්හාව ඉතා මඳකලක් භාවිතාකළ අනිත්‍යාදිතිලකුණු භාවනාබලයෙන් අතුරුදන්ව නැතිවනහෙයින් ඒ මෛත්‍රීභාවනාවම වඩා අනිත්‍යාදී තිලකුණුභාවනාවෝම මහත්ඵල ඇත්තාහුය, ඔවුන්ගේ ඵලමහත්බව ප්‍රදෙශිකඥණයෙහි සිටි කවරෙක් වර්ණනාකෙරේද?—

තවද තමා ආශ්‍රය කළතාක්දෙය දවාම නැතිකරණ ඉතා මඳවූද ගිනිසෙයින්ම තිලකුණුභාවනාවෝ භාවිතාකළාහුගේ සිත්හී පැවති භවත්‍රයගතවූ නොයෙක් දහස්ගණන් කප් මුළුල්ලෙහි විඳියුතු බ්‍රහ්මලොකසැපආදි සියල්ලෙහි පැවති තණ්හාව නැතිකොට දවමින් උපදනාහුයි.

එහි භවත්‍රයගත සියලුසත්ව සංස්කාරධර්මයෝම ඇතිව නැතිවනහෙයින් අනිත්‍යයහ, උත්පත්තිවිනාශදෙකින් පෙළෙන බැවින් දුක්ඛයහ, මමය මාගේයයි ගතහැකි කිසියම් එකද වස්තුවෙක්නැති බැවින් අනාත්මයහයි සිත්හි උපදනාභාවනා බලයෙන් සත්වයාය සංස්කාරය යනදෙතැන්හි ඇළුම් නැතිබව ස්වභාවකොටඇති නිවන්මග දෙනමේභාවනාවෝ මෛත්‍රීයම වඩා විශිෂ්ටයෝයි වේලාමදුනයෙහිපටන් උභතො භාගවිමුක්ත්‍යවූ බුදුපසේබොක් මහසඟනට දෙනලදදනයද, ඇතුළුවූ සියලුම දනඵල වදූරා එසියලුදනයටම වඩා සිටිශීලයද එයටද වඩාසිටි සීලයද එයටද වඩා සිටි මඳවූකලක් පැවැත්නාවූ මෛත්‍රීභාවනාඵලයද වදූරා ඒමෛත්‍රීභාවනාවට වඩා අසුරුසතාක් පමණකලෙක්හිදු සිත්හි පැවැත්වූ අනිත්‍යසංඥාව මහත් ඵලයයි තුන්ලෝවැසියන්ට පිහිටවූ නිවන්දෙන ලොකනායකවූ මුනිරජ වදාළේය.

එහෙයින් සංසාරනැමැති භයඞ්කාරවූ සියළුදුක් ඇතිනරකයෙන් මිදෙනුකැමැතිසත්වතෙම මෙසේ මහත්වූ අචින්ත්‍යවූ ගුණඇති අනිත්‍යදුක්ඛඅනාත්මයන තිලකුණුසංඥාවෝ හැමවේලෙහිම වඩන්නේයි, මෙසේ කර්මස්ථානනැමැති ජයස්ථානයෙහි සිත පිහිටුවා සිට සතුරන්වැනිවූ නොයෙක් දුකට පමුණුවන යටකියනලද කාමච්ඡන්දාදි පංචනීවරණයන් නැමැති සතුර

න් බිඳ කාමසුඛයෙහි කෙලෙසකාම සංග්‍රාම සමස්තාභිතාම ජය කොටගෙණ රූපනාමති ගරුවූ මහත්බර හැර අරූපබ්‍රහ්ම ලොකයෙහිදු ඇළුම් හැරපියා නිශෙසසවූ භවත්‍රය තුන්ලොව චචලය, සිටිසේ නොසිටිනේයයි දැන උත්සාහවීර්‍ය්‍ය කොට සත්තිස්බොධිපාක්ෂිකධර්මනම්වූ කායානුපස්සනාදි සතරසතිපට්ඨානය සතරසම්‍යක්ප්‍රධානය සතරඍද්ධිපාදය පඤ්චෙන්ද්‍රිය පඤ්චබලය සප්තබොධ්‍යඞ්ගය ආර්‍ය්‍යඅෂ්ටාඞ්ගිකමාර්ගයයි යනාදී බුද්ධකාරකධර්මයන් වඩා බොධිපාක්ෂිකධර්මයන්ගේ භාවනාබලයට පැමිණිසත්වතෙම විගතවූ මරණඇති ජරානැති රොගනැති සොක නැති එහෙයින්ම මදවූද කෙලශසංග්‍රාමයකුදු නැති අනවරාග්‍ර සංසාරයහා නොගැනී ඉක්ම සිටි නිත්‍යවූ සුවකෙළවරක්නැත්තාවූ විරවූ බුදුපසේබුදු ආදිමහොත්තමයන් විසින් පැමිණියාවූ සුලභනොවූ අත්භූතවූ අසදෘශවූ ඉතාසාන්තවූ නිවන් පුරය උතුම්ශ්‍රෙෂ්ඨ සම්පත්තිය නොවරදවා මාගේ පින්වත නුවනැත්තන් ශ්‍රවණයකර නිවන්පුර වදු, භාවනාවිභාගානිසංසවර්ණනාවයි.

---

මෙසේ සංක්ෂෙපයෙන් භාවනාවිභාගානිසංස දක්වා ඊට ඉක්බිතිව අපචායනානිසංසවිභාග දක්වනුලැබේ, ඒකෙසේද යත්?—

මානං පරිච්චජිත්වාන උප්පාදෙත්වාන ගාරවං,
ගුණං උපපරික්ඛිත්වා උපකාරඤ්ච තාදිසං.

යනාදී කීහෙයින් යම්සත්වකෙණෙක් සිත්හි උපදනා මානය දුරුකොට විද්‍යමානවූ ශීලාදිගුණයක්වත් තමහටවූ උපකාරයක්වත් පරීක්ෂාකොට සිතින් ගෞරව උපදවාගෙණ බුද්ධාදිශ්‍රෙෂ්ඨගුණවන්තයන් කෙරෙහිද දෙමව්පියආදි මදවූත් උපකාරවූවන් කෙරෙහිද ශ්‍රද්ධාචෙතනා කෘතොපකාර සැලකීමෙන් ප්‍රඥගෞරවාදි ගුණයෙන් යුක්තව සිතින්ම ගෞරව උපදවා පූජාවස්තුවකින් පූජාකරන්නේ විනම් එමකුශලානුභාවයෙන් දවසින් දවසට වඩනා මහාසම්පත්ඇති මහත් ආඪ්‍යවූ ස්වභාවයෙන්ම නිසැකව සත්වයන්විසින් වඳනට නිසිව උතුම්වංශයක හෙතෙම උපදනේයි, එසේ පිදියයුත්තන් දැන ඇඳින පිදුනැනැත්තේ පරලොව යම් යම්තැනක උපන්නේ වීනම් ඒඒතන්හි සියල්ලන්විසින් පූජ්‍යවූශ්‍රෙෂ්ඨවූ ස්ථානනතුරුද ලබන්නේයි?—

තවද පැහැදීමට සුදුසු ගුණඇති යමෙක් මනාව පැහැදී ප්‍රසංසාකරණලදද ඒකුශලබලයෙන් හෙතෙම උපනුපන්නැන යහපත් අඞ්ගප්‍රත්‍යඞ්ගඇතිව දුටු දුටුවන්ට සතුටුඑළවන විශිෂ්ටරූපශ්‍රීයා ඇතිවන්නේය, පූර්වජාතියෙහි කළඋපකාර සලකන ගුණඇති සත්වයාවිසින් මේජාතියෙහි කෘතෝපකාරනොසලකන අධමයකුහට වීනමුත් කරණඋපකාරය ඔහුගේ පූර්වපින්බෙලෙන් නිෂ්ප්‍රයොජනනොව ඉතාමහත්ඵල ඇතිවන්නේය, පෙර අනුන්කරණලද උපකාර නොසලකන අකෘතඥයාවිසින් මෙලොව කෘතොපකාර ගුණඇතියකුහට වීනමුත් කරණලද මහත්පර්වතප්‍රමාණ උපකාරයපවා ඔහුගේපව්බෙලෙන් පරමාණුවක්සේ ස්වල්පව වැටගීමෙන් නිෂ්ප්‍රයොජනවේ, එහෙයින් නුවනැතියන්විසින් කෘතොපකාරගුණ දැන ඇදින ඉතාමදව කළඋපකාරයක් වීනමුත් සැලකීමෙන් ඔවුන්ට කළමනා ප්‍රත්‍යුපකාරය තමතමා ශක්තිපමණින් කළමැනවි.

තවද නුවනින් යෙදී පින්කල තැනැත්තේ ඒ කුසලඵලය විඳිනාකල්හිදු නුවනින් වෙන්නොව ඉතාමහත් නුවනැතිවීමෙන් ලදසම්පත් සාර්ථකවේ.

තවද යමෙක් තෙමේත් ශිලාදි ගුණයෙන් යුක්තව අතිශයින් ශීලාදිගුණයෙන් විශිෂ්ටවූ ලොවුතුරාබුදුන්හා බුදුසව්වන් පුදන්නේ වීනම් ඒකුශල ඵලය බුදුන්මුත් අනිකකුවිසින් නොදතහැකි නොකියහැකි ඉතාවිපුලමහත්ඵල ඇතිවන්නේය,

තවද ශීලාදිගුණයෙන් වැඩිසිටියන් දැන ඇදින සතතයෙන් වඳනා සුලලනුට ආයුෂය ශරීරවර්නය ශැපය බලය යන සතරධර්මයෝ වඩනාහුයයි කියාද එකම මලක් පුදා අසූකෙළක් කප්නුළුල්ලෙහි දුගතියට නොගොස් සුගතියෙහිම සැරිසරා සැපවින්දෙමියි කියාද පිදියයුත්තන්ට පිදීම උතුම්මඟුලැයි කියාද මඞ්ගලසූත්‍රාදී නොයෙක්තැන නොයෙක්පරිද්දෙන් වදාරණලදී, බුදුන්කෙරෙහි හෝ ධර්මයකෙරෙහිහෝ සංඝයාකෙරෙහි හෝ ආදරයෙන් එකාවිටකවූද දෙඅත්නගා එක්කොට කරණලද නමස්කාරමය කුශලයතෙම ඕහට වනසියලුම සසර දුක්නැමති ගිනි නිවා නිවන්සම්පත් සාධන්ට සමර්ථවේ, ඉතා දුර්වලව බිඳෙනසුළුවූ ඒකාන්තයෙන් දැමියයුතුවූ නිඃසාරවූ මේතුච්ඡ ශරීරයෙන් වැඳීම් පිදීම් ආදිවශයෙන් කළමනාතාක් මහත්සාරඵලවූ උතුම්නිවන්සැප දෙනපින්කරන්ට පිළිවන් වින

ම එසේවූ පින් නොකොට සිත් ඇතිකවරෙක් ප්‍රමාදවේද? — නොපමාවන්නේමැයි.

තවද පිදියයුත්තන් පිදීමෙහි ඵල කෙසේදැයි කිවහොත්? සුමනමාලාවස්තුආදි වස්තූන්හා අපදානවිමාන වස්තුආදියෙන් අසා දතයුතු, සුමේධනම් බුදුන්ට කිණිහිරිමල්තුනකින් පිදුවිදනඩර යෙක් එම්පින්බෙලෙන් තිස්දහසක් කප්මුළුල්ලෙහි කිසියම් දුගතට නොපැමිණ දෙව්ලෝමිනිස්ලෝදෙක්හි සැරිසරා ඇවි දමින් මහත්සැප අනුභවකරණුයේ පන්සියයක්වර ශක්‍රදෙවෙන්ද්‍රව තුන්සියයක්වර චක්‍රවර්ත්තිව අසංඛ්‍යයක්වර දඹදිවට අගරජව අපමණශ්‍රීසම්පත් විඳ මේ බුද්ධොත්පාදයෙහි උතුම්නි වන් සම්පතුදු ලද්දේය.

කිසියම්වස්තුවකින් තුප්දු වෛදියපර්ගයෙහිවූ ඉන්ද්‍රශාලා ගුහාචාරයෙහි භික්ෂුසංඝයාවහන්සේ පිරිවරාවැඩහුන් බුදුන් දු ක සිත පහදවා ආදරගෞරව දක්වූ බකමූහුණු පක්ෂියෙක් බුදුන්කෙරෙහිත සංඝයාකෙරෙහි කළචිත්තප්‍රසාද කුශලඵල යෙන් කප්ලක්ෂයක් මුළුල්ලෙහි දුගතියකට නොගොස් දෙව් මිනිස්සැප විඳ කෙළවර සොම්නස්නම් පසේබුදු වන්නේය, ධර්මරත්නයෙහි කරණචිත්තප්‍රසාද ඵලයවූකලි ධර්මශබ්දමාත්‍රය නිමිත්තග්‍රහණයකොට දෙව්ලොව උපන් මණ්ඩූකදිව්‍යපුත්‍රයා ගේ වස්තුව ආදිනොයෙක් වස්තුකථාආදීයෙන් අසා දතයුතු, මේ ශාසනයෙහි අනුරුධනම් මහතෙරුන්වහන්සේට ඉඳුකනම් දුගියෙක් තාමාපිණ්ඩිස මෙහෙයු බත්සැන්දක් පමණ පූජා එම්පි න්න් දෙව්ලොව ඉඳුකනම් දිව්‍යපුත්‍රව ඉපද සරුනැත හිඳුවූ බිජුවටින් විපුලතරඵලලද්දාසේ උතුම්පින්කෙත්හි පිදුහෙයින් සෙ සුපින්කම්වලින් දෙව්ලෝඋපන් හැමදෙවියන් අභිභවා දිලිහි දිලිහි ගෙනතම අනොපමවූ දිව්‍යශ්‍රීසම්පත් විඳිනේය' මෙසේ තුණුරුවන් ආදිපිදියයුත්තන් පිදීමෙහි මහානිසංසබව දත ඇදින එම්බා පින්වත් තමහට වැඩකැමති සත්පුරුෂජනයන් විසින් අප්‍රමාදව බුද්ධාදිපිදියයුත්තන් දත හැඳින තමතමාශක් ති පමණින් මල්පහන්ආදි පූජාවස්තුවෙන් පූජා වන්දනාමානාදිවශ යෙන් පින්රැස්කළමැනවි' පූජානිසංසවර්ණනාවයි.

---

මෙසේ අපචායනානිසංසයයි කියනලද පූජානිසංස සංක්ෂෙ පයෙන් දක්වා ඊට ඉක්බිතිව වෛයාවච්චානිසංසය දක්වනු ලැබේ:—

ආපදාසු සහායානං ලාභා ඉච්ඡිතසිද්ධියා,
පරිවාරසම්පදාචෙති වෙය්‍යාවච්චඵලං මතං
සීලාදිගුණවන්තානං දානාදිකිරියාසුචා,
වෙය්‍යාවච්චා හි සම්භූතං කොඵලං වණ්ණයිස්සති·

යනාදීහීගෙයින් වෙය්‍යාවච්චයයි කියනලද ගිලනුන්ටහා ගුණවතුන්ට උපස්ථානමෙහෙ කිරීමෙහි නියුක්ත සත්වයාහට යම්කිසි විපත්තියක් පැමිණි කල්හි ඊටසහායයන්ගේ ලැබීමය කැමතිඅර්ථයක් සිඩවීමය බොහෝපිරිවරසම්පත් ලැබීමය යන මේ ආනිසංසයෝ ඇතිවන්නාහුයි, එසේ රෝගීන්ටද ගුණවතුන්ටද නොයෙක් පූජාසත්කාරදානාදිපින්කම් කරණතැන්හිද මනාකොට සිත පහදවා කරණලද මෙහෙයෙන් නිපදනාකුසලානිසංසය කවරෙක්වර්ණනා කෙරේද?—ඔහුට ඉතාමහත්ඵල වන්නේමැයි.

"යමෙක් රෝගීන්ට උපස්ථාන කෙරේද?—හෙතෙම මට උපස්ථාන කළානම් වෙයි, කියා මහාකරුණාඇති බුදුන්විසින් විශෙෂයෙන් වර්ණනාකරවදාරණලදි, එසේ රෝගීන්ට කරණඋපස්ථානයත් ලොව සියලුම දතමනාදෑ අතැඹුලක්සේ දත් අනාචාර්‍ය්‍යවූ ලොකාග්‍රබුදුන්ට කරණඋපස්ථානයත් සමවිමට කාරණ කිමයත්?— තථාගතවූ බුදුරජවනාහි අනුන්ට වනවැඩක් තමන්වහන්සේටම වනවැඩක්මෙන් සිතනසේක' එසේහෙයින් "රෝගීන්ට මෙහෙකිරීමද බුදුන්ට මෙහෙකළානම් වෙති,, යනු ආශ්චර්‍ය්‍යනොවෙයි, ගිලනුන්ට උපස්ථානකිරීම බුදුරජ අනුදත්හෙයින් හෙතෙම බුදුන්ගේ වචනය පිළිගැන්මෙන් උපකාරීහෙයින් බුදුන්ටම මෙහෙකළානම් වෙයි, එසේහෙයින් එබඳු විපුලතර මහානිසංසවූ ඒ කුසලානිසංසය බුදුන්හැර වර්ණනා කරන්නටහෝ සිතන්නටහෝ කවරෙක් සමර්ථවේද?—නොහැකිමැයි

බිදෙන සුළුවූ නිස්සාරවූ මේ කුණුශරීරයෙන් කළමනාඋතුම් කුශලය කිරීමට අවකාශ ලැබ උමතුවියරුනොවූ සිත්ඇති කවරෙක් නොකරන්නේද?—නුවනැති සත්වතෙම කරන්නේමැයි, මෙසේ අප්‍රමෙය්‍යවූ මහානිසංස ඇති චෛත්‍යවිහාරවත්පිළිවෙත් කිරීමෙහිද ගිලනුන්ටහා ගුණවතුන්ට කළමනා සියලු උපස්ථානයෙහිද අප්‍රමාදව යෙදීමෙන් නුවනැත්තන්විසින් අත්වැඩ පරවැඩ සැදීමෙහි උත්සාහකළමැනවි, වෙය්‍යාවච්චානිසංස වර්ණනා වයි—

මෙසේ සීලාදිගුණවතුන්ටහා ගිලනුන්ට කරණ උපස්ථාන යෙහි විහාරචෛත්‍ය වත්පිළිවෙත්පිරීමෙහිද ආනිසංස සංක්‍ෂෙප යෙන් දක්වා තදනන්තරව පත්තිදානනම්වූ පින්දීමෙහි ආනිසංස වර්ණනාව දක්වනුලැබේ.

අත්තත්ථමනපෙක්ඛිත්වා පරත්ථං ඊයතෙ යතො,
කාරුණිකානං ඤාණයොගා පත්තිදානං විසෙසිතං.
යෙ ආනිසංසා නිද්දිට්ඨා දානෙ මානප්පභාසිතා,
සබ්බෙසස්වතෙසබ්බෙ පත්තිදානෙපි වෙදියාති.

යනාදිකිහෙයින් යමෙක් අනුන්වෙත පතළකරුණාවෙන් හා කෘතොපකාර සැළකීමය යන ගුණදෙදෙනාගේ එක්වීමෙන් යෙදී තමහට වනවැඩ නොබලා අනුන්ට වැඩපිණිස යම්පින් කමක පින්පෙත් දීමෙක් ඇද්ද,—ඒ ප්‍රාප්තිදානයයි කියනලදී, සර්වධර්මයන් සර්වාකාරයෙන් දත් තථාගතයන්විසින් දානයෙහි යම් අනුසස්කෙණෙක් විස්තරකොට වදාරණලදහුද,—ඒහැම අනු සස්හු විශෙෂයෙන්ම මේ ප්‍රාප්තිදානනම්ලද පින්දීමෙහිද දත යුත්තාහුයි

තවද තමාකල උපකාරයට නැවත ප්‍රත්‍යුපකාරකරන්ට සමර්ථවූ එකක්හට ප්‍රතිකාරයෙහි නැලූනාවූ ආසාවටම දැසව සිටි ලොකයෙහි කවරෙක්නම් උපකාර කරන්නේද,—නොකරන් නේමැයි, තමාකල පාපකර්මබලයෙන් මියගොස් ප්‍රෙතව උපන් හටද මෙලොව ව්‍යසනයට පැමිණි දුක්පතුන්හටද කරුණා උ පදවා අනුකම්පායෙන් උපකාරකරන්නේ ඉතා දුර්ලභයි, ඒ ප්‍රෙතයෝවූකලි ඥාතිමිත්‍රාදීන්විසින් අන්දී පින්පෙත්දුන්කල පරී ක්‍ෂාකොටගෙණ ඒ පින් අනුමෝදන්වූවාහු විනම් ඒ අනුමෝද න්වීමහා සමග ඇසිල්ලකින් ඔවුන්ට දිව්‍යසම්පත් නිසැකයෙන් ම පහළවේ, ඒ කාරණය සැරියුත්මහතෙරුන්ගේ මව්ප්‍රේතදුව පිණිස දුන් පින්පෙතින් දතයුතුමැයි.

වීර්‍ය්‍යයෙන් ප්‍රත්‍යය සපයා ජීවත්වනමිනිසුන්ට ඔවුනොවුන් ගේ වීර්‍ය්‍යයෙන් උත්කෘෂ්ටවූද ලාමකවූද සතරපසයෝ සුවසේ ලැබෙන්නාහ, එහෙයින් මනුෂ්‍යජාති ඇත්තවුන්ට දන්දීම පිළි වන්මය, ප්‍රෙතයෝ නොයෙක් වර්ෂශතසහශ්‍රයෙහිදු නොයෙක් අ තුරුකප්වලද පිපාසයෙන් පිඩිතව හැම්ලෙසින් සොයා වෙහෙසී ඇවිද්නමුත් කිසියම්ආහාරයක් ආස්වාදයක් නොලබන්නාහුයි,

එසේ තම තමන්ගේ කර්මදෝෂයෙන්ම ඒ මහත් දුක්නැමැති සාගරයෙහි ගැලී අපරිමිතවර්ෂකෝටිශතසහස්‍රවල අනන්තදුඃඛිත ඔවුන්ගේ ඒසියළුදුක් දුරුකොට දිව්‍යසම්පත්තියෙහි පිහිටුවන කරුණාවෙන් සියල්ල දත් බුදුන්විසින් ප්‍රේතයන්ට පින්දෙනක්‍රමය වදාළලෙස අසා දැන යමෙක් නොකරන්නේද,— ඔහුට වඩා, කරුණානැත්තෙක් ලොව ඇත්තේ නොවෙයි, එහෙයින් දුකට පැමිණි ප්‍රේතයන් උදෙසා පින්පෙත් දීමෙන් ඔවුන්ට එකණෙහිම සිද්ධවන දිව්‍යසම්පත්තූද තමතමන්ට සිද්ධවන පත්තිදානමය පින්කමද සිද්ධකිරීමෙන් වන අත්වැඩ පරවැඩ කැමති නුවනැති සත්පුරුෂජනයෙනි කුශලධර්මය මුත් අනික් පිහිටක් නැති බව දැන ආදර උපදවා තමතමා ශක්තිපමණින් සියලු පින්කම් කිරීමෙන්ද ප්‍රේතදුකින් වෙහෙසන ඥාතිප්‍රේතාදීන් සිහිකොට ඒ සියළු පින්පෙත් දීමෙන්ද ආත්මාර්ථපරාර්ථසැදීමෙහි උත්සාහ කළමැනවි, පත්තිදානානිසංස වර්ණනාවයි· මෙසේ පින්දීමෙහි විභාගානිසංස සංක්ෂේපයෙන් දක්වා ඊට ඉක්බිතිව අනුමෝදනා විභාගානිසංසයද දක්වනුලැබේ, හේ කෙසේදයත්,—

ඉස්සාව්‍යාපාදමච්ඡෙරං විහිංසාවාපි නාසිය,
ගුණරාසීතචිත්තායං අනුමෝදතිමෝදකො·

යත්ථාගතොමහෙසක්ඛො සුරූපොභොගවාපිච,
දීඝායුකොසදාහට්ඨො හොතිපුඤ්ඤානුමෝදකො·

යනාදී කී හෙයින් අනුන්විසින් කරණලද කුසලයෙහි පින් අනුමෝදන්වනතැනැත්තේ සිත්හිඋපදනා ඊර්ෂ්‍යාමාත්සර්‍ය්‍ය විහිංසාවිතර්කාදිය දුරුකොට ශ්‍රද්ධාප්‍රඥාදි ගුණසම්පන්න සිත්ඇතිව පින්අනුමෝදන්වේද· එසේ අනුන්ගේ පින් ආදරඇතිව අනුමෝදන්වූ ඒ සත්ත්වතෙම උපනුපන්ජාතිවල මහෙසාක්‍යව ප්‍රධානව යසපත්රුඇතිව වස්තුඇතිව හැමකල්හි සතුටුසිත්ඇතිව බොහෝකල් ආයුඇතිව වසන්නේ වෙයි.

තවද වස්තුආලයක්නොව සිව්පනස්කෙලක් ධනවියදමින් දෙව්රම්වෙහෙර කරවා ඉක්බිති ධර්මරාජන්වූ බුදුන්ප්‍රමුඛකොට ඇති සංඝයාට පූජාකරණපිණිස දක්ෂිණෝදක දෙන්නට රණ් කෙණ්ඩියගත්අත්ඇති සුදත්තමහසිටුහුගේ ශ්‍රීසොභාවදක මේ දනය ආශ්චර්‍ය්‍යයයි කියා බොහෝසේ ප්‍රීතිවාක්‍ය පවත්වමින් පින්

අනුමෝදන්වූ කථාවකැයි කියනලද. දෙවියටසමාරක් පමණවූ මද මිලයකුදු නුදුන් එක්මානවකයෙක් ඒ සතුටුව අනුමෝදන්වූ පින්බලෙන් ඒ දායකයාට අධිකවූ පින්ඵලරසක් ලද්දේයි-

මෙසේ අමුතු කිසියම්උත්සාහයකුත් නොකොට යම්කිසිධනයකුත්නොදී පහන්සිතින් අනුමෝදන්වූපමණකින් සිද්ධවන පාසුවෙන් මනාකොටගතහැකි මේ පින්කම නොකොට මුලාව ඇවිදිනා මූර්ඛවූ ජනතෙමේ නැවත මහත්සෝකයට පැමිණේ-එබව දත් නුවනැති සත්පුරුෂජනයෙනි මේ නිරායාසපින්කමෙහි සිත් අලවා අනුන්කළපින් තමන්ට දුනද නුදුනද පින්කම් කළවුන් කෙරෙහිදු ඒ පින්කම්හිදු ආදරබුහුමන් උපදවා ප්‍රසංසාකොට සතුටුසිතින්ම පින් අනුමෝදන් වියයුතු-

පත්තානුමෝදනා විභාගානිසංස වර්ණනාවයි.

——:——

මෙසේ පුණ්‍යානුමෝදනා විභාගානිසංසය දක්වා ඊට ඉක්බිතිව ධර්මශ්‍රවන විභාගානිසංසයද දක්වනුලැබේ-ඒ කෙසේදයත්.

සද්ධම්මංසුතමානස්ස යොහි අත්ථානුසාරිනො,
පමොදො තිබ්බලද්ධස්ස දලිද්දස්සාපි නත්ථිසො.

පඤ්ඤවාසුතමානොහි සද්ධම්මං බුද්ධදෙසිතං,
සුගම්භීරංවිතත්ථං මධුරං අමතංවිය.

ලභතෙ පරමංපීතිං දෙවින්දෙනාපි දුල්ලභං,
තදෙවාලංඵලංතස්ස මාහොතුපරලොකිකං

යනාදී කීහෙයින් සතුන්වෙත පතලමහාකරුණාඇති බුදුන් විසින් හැම්සත්නට වැඩපිණිස දෙසූ උතුම් සද්ධර්මය අර්ථානුසාරීව අසමින් ඒ අර්ථයන්අනුවම නුවනමෙහෙයා සිහිකරණ්නහුට උපදනා යම් ප්‍රීතියෙක්ඇද්ද, එබඳු ප්‍රීතියෙක් මහනිධානලත් දිලිඳු දුක්ඛිතයෙකුට්වීනමුත් නොවන්නේය-

තවද බුදුන්විසින් දෙසිතවූ ඉතා ගැඹුරුවූ ඒකාන්තසත්‍යවූ අමාසේ මියුරුවූ සදහම්අසන නුවනැතිතැනැත්තේ දෙදෙව්ලොවට අධිපති ශක්‍රයාවිසිනුදු ලබන්ට දුර්ලභවූ විශිෂ්ටප්‍රීතිසැප ලබන්නේය-ඕහට පරලොවවන විපාකඵලය නැතද ඒ ධර්මශ්‍රවන යම ප්‍රීතිසැපයම ප්‍රමානවන්නේය-

තවද ගිනිගෙණදිලියෙන යවටකට ලංනොවන මැස්සන් සේ බනඇසීමෙන් ධර්මයධරාසිටිසිනට කෙලෙස්නැමතිමැස්සෝ නොවදිත් බනඇසීම එසේවූද මහානිසංස ඇත්තේය—තවද මේ ශාසනයෙහි ධර්මයාගේ ගැන්ම බනඇසීමනැතිවනොවෙයි. දහම් අසානොගැන්මෙන් අර්ථපරීක්ෂාකිරීමනොවෙයි. අර්ථපරීක්ෂාකිරීම නැතිනැත්තේ තමහටවත් අනුන්ටවත් හිතවූ වැඩදායක ප්‍රතිපත්තිපිරීමෙහි සමර්ථනොවේ· ඒ පිලිවෙත්පිරීම නැතිකල්හි කිසිකලෙකත් ධර්මය නොපවත්නේය. එසේම බනඇසීම නැතිකල්හි පිටකත්‍රධර්මය නොපවත්නේය; එහෙයින් ප්‍රවරසද්ධර්මයාගේ ශ්‍රවනයකිරීමම උතුම්වන්නේය—ශාස්තෘවූ බුදුරජානන් වහන්සේ විසින් මනොප්‍රනිධානයෙහි පටන් විසතාසංඛ්‍යකල්ප ලක්ෂයක් මුලුල්ලෙහි මහත් උත්සහයෙන් පාරමිධර්ම පූරණයකොට බුදුව සද්ධර්මය අපකරා පමුනුවනලද්දේය, ඒ ධර්මයඇසීම නැතිව අපහැමටවන පිරිහීමත් ධර්මයාගේ නොපවැත්මත් දැන ඇඳින ආදරඋපදවා යම්හෙයකින් නොපමාව බුදුරජධර්මයනිසා අපවෙනුවෙන් මහත්දීර්ඝකාලයක් කරණලද වීර්‍ය්‍යවිසෙසයද බලා සිහිකරමින් අමෘතමහානිර්වාණපුරප්‍රවෙසවීම පිනිස ඇමදෙනා විසින් සද්ධර්මය ඇසියයුතුයි—යම් බනඇසීමක් ඇසූජාතියෙහි පටන් නුවනවඩන්නේද, සද්ධර්මය බොහෝකලක්සිටීමට කාරනාද, එසේවූ සද්ධර්මශ්‍රවනයාගේඑල පමනකරන්නට බුද්‍ධනොවූ කවරෙක් සමර්ථවේද?–

එසේ බනඇසීම මහත්ඵල මහානිසංස ඇතිබැවින් එකනෙහි දිව්‍යරාජ්‍යසාදගන්ට පිලිවන්වීනමුදු ඒ දිව්‍යරාජ්‍යහැර ලොව්තුරාබුදුන්කෙරෙන් පහලවූධර්මයම සිතහෙලා ආදරඇතිව ඇසියයුතු—ඒ ධර්මරාජන්වූ බුදුන්විසිනුදු සිටිපියෙහිමවැඩසිට ඇසීමෙන් ගරුනැත්හීතුබු මහිමඇති ධර්මයක දෙව් බඹ මුනිආදීන් විසිනුදු, ආදරබුහුමන්උපදවා ඇසූධර්මයකැයි යනාදිවසයෙන් ධර්මයේ මහත්තත්වය ශ්‍රවනමයකුසලානිසංසවිශේසය සැලකීමෙන් එබාපින්වත් නුවනැතියෙනි කප්අසංඛ්‍යගණනකිනුදු ලැබගතනොහැකි දුලබවූ සද්ධර්මයඅසා ආත්මාර්ථපරාර්ථ සංසිද්ධියෙහි උත්සාහ කලමැනවි—

සද්ධර්මශ්‍රවනානිසංස වර්ණනාවයි.

—— ඃ ——

මෙසේ සංසේපයෙන් සද්ධර්මශ්‍රවනානිසංසයදක්වා තදනන්තරව ධර්මදේසනානිසංසවර්ණනාව දක්වනුලැබේ·

දූරදූරකනෙත්තාදී දානංදත්වා අනෙකසො,
චිරවිරියෙන යෙ ලද්ධං ධම්මංදේසේති සබ්බසා·

* අඤ්ඤතරපෙක්ඛායසොලොභං සක්කාරාදීනි අත්තනො,
හිතජ්ඣාසයතොඑව සත්ථුනිච්චං කරොවසො·

සබ්බදානං ධම්මදානංජිනාති ජිනොබ්‍රවීදෙසයීදෙකවරො දෙසෙතාදුල්ලභොපිච—යනාදී කීහෙයින් අපරිමිත කල්පකෝටි සතසහස්‍රවල පුත්‍රදාරාවන්හා ඇස් ඉස් මස්ආදී ආධ්‍යාත්මික බාහිර වස්තුදානාදී සමතිස්පෙරුම්පුරා බුදුවූ තථාගතයන්වසින් අවබොධකරණලද උතුම් සද්ධර්මය යමෙක් තමහට වන ලාභ සත්කාර කීර්තිප්‍රසංසාදී කිසිවක් නොපතා හිතාධ්‍යාසයෙන්ම ධර්මදෙසනා කෙරෙද හෙතෙම ප්‍රවරලොකශාස්තෘකෘත්‍ය කරණ්ණෙම්වෙයි පස් මරුම්බිඳ දිනූහෙයින් ජිනනම්තථාගතතෙම ධර්මදානය සියළුදානයට උතුම්යයිවදාරා ඒ ධර්මයදෙසනානාවුන් කෙරෙහි යටකීගුණයෙන්යුක්තවූ යහපත් බනකියනනා කුදු ලොව දුලීභයයිවදාලො-

තවද යම්වස්තුවක් දන්දුන්කල ඒවස්තුව විනාසවීමෙන්හෝ පිළිගත්තහුගේ මරනින්හෝ ඒකාන්තයෙන්ම ප්‍රතිග්‍රාහකයා කෙරෙන් ඒ වස්තුව වෙන්වේමය. දෙසනාවසයෙන් යමෙකුට දෙනලද ධර්මදානයවනාහි මෙලොව පරලොව දෙක්හිම ඔහට සියළුම අභිවෘද්ධිවැඩට කාරණවෙයි—තවද ලෝකසත්වයන් අතුරෙහි අල්පරජස්කවූ, හෙවත් මඳවූ රාගාදිකෙලෙස්රජස් ඇති ශ්‍රද්ධාදී ගුණසම්පන්නසත්වයොද බොහෝසේ විද්‍යමානවම ඇත් තාහට ඒ ඇමදෙනම තමන් ඇදිග බනකියනතරම් ධම්මකථික කෙණෙකුන්ගේ නොලැබීමෙන් නිර්වාණයට නොපැමිණ සිටි නාහුයී—එහෙයින් ශබ්දලක්ෂණාදී පරිඥුණයෙන්හා ගෞරවවස යෙන් සකස්කොට සද්ධර්මය නොවරදවා තත්වූපරිද්දෙන් ඉගෙන තුමුත් සෙසසත්තුත් සසරින්මුදනකාරුණාවද සද්ධර්මයමෙසේ මා විසින් කියනලද්දේ අනුන්ගේ සිත්හි ධර්මයපිහිටුවා බොහෝක ලක් පවත්නේයයි යන සද්ධර්මගෞරවයද සිත්හි පිහිටුවාගෙණ සිහිනුවනඑලවා බනකියන්නේයි. තමාතොදත් නොවුනත්දෙ යක් වරදවා අනුන්ට නොකියන්නේයි· ශාස්තෘවූබුදුරජද කිසිම ලාභසත්කාරාදියක් සිතා පතා ලොකයාහට දහම්දෙසූසේක්නො වෙයි-ඒ බුද්ධකෘත්‍යමෙන්පවත්නේ ආමිසගරුකනොව ධර්මගරුක පක්ෂීනතෙමෙ පරවැඩපිණිස දහම් දෙසන්නේයි—නුවනින් සිහි කිරීමය අනුන්ටකරණ ධර්මදෙසනාය, යනමේදෙක මාර්ගඥණයට හෙතුවන්නාහුයයිකීයා මාර්ගදන්නා බුදුන්විසින්ම වදාරණලදී—

* අඤ්ඤතරනෙථා යනුදු තිඛාතිබේ·

ප්‍රත්‍යුත්පන්නධර්මයන්ගේ ස්වලක්‍ෂණ සාමාන්‍යලක්‍ෂණ වශයෙන් තත්වූපරිද්දෙන් දුක්මය සංසාරයෙහි ආදීනව මුහුකලු විදර්ශනාඥානයෙන් දුක්මය චතුස්සත්‍යයන්ගේ අධිගමය යන මාර්ගඥානයද යනමෙකීනාක් ගුණවිශේෂ සියල්ල අනුන් විසින් කරණ ධර්මදෙසනාවඈසීමෙන්ම උපදාගනුවත්—යම් ධර්මදේසකයෙක් කීලෙස ගුණඞ්ගසම්පන්නාව සියලු සම්පත්තීයට කාරණවූධර්මය අනුන්ට දෙසාද, ඕහට මේසාසනයෙහි සියලුසම්පත් ඵලකොට සම්භවන්නාහුයි. මෙසේ මහානිසංසදවූ ඉතා දුලීභ සද්ධර්මයදෙසන්ට සමර්ථව ද යමෙක් නොදෙසානම් ඔහුගේ ජීවිතය ඉතා නිස්ඵලයි. එබැවින් අත්වැඩ පරවැඩකැමති නුවණ නැතියන් විසින් යථොක්ත ධර්මානිසංස සැලකීමෙන් ධර්මදානයෙහි ආදරඋපදවා තමතමාගේ නුවනපමණින් අනුන්ට බහනියා අකුසලයෙන්මුදා කුසලමාර්ගයෙහි යොදා ලොව්ලොව්තුරාසම්පත් සැදීමෙහි උත්සාහ කළමැනවි—

ධර්මදෙසනා විභාගානිසංස වර්ණනාවයි.

——ඃ——

මෙසේ ධර්මදෙසනා විභාගානිසංසදක්වා ඊටඅනතුරුව දෘෂ්ටිජ්ජුකර්මවිභාගානිසංසයද දක්වනුලැබේ—ඒ කෙසේදයත්-පසංසාසරණගමණානුස්සතීනං දිට්ඨිජ්ජුකම්මනො ගධත්තාතෙසංවසෙන තප්ඵආනිසංසො වෙදිතබ්බො—යනාදී කීහෙයින් ප්‍රසංසානිරීමය සරණගමණය අනුස්සතිය යනමේ ත්‍රිවිධවූ පින්කම්හු දෘෂ්ටිජ්ජුකර්මයයිකියනලද සම්‍යක්දෘෂ්ටියෙහි ඇතුලත්හෙයින් ඒ ත්‍රිවිධකුසලකර්මයන්ගේ විභාගානිසංස ප්‍රකාසක්‍රමයෙන් දෘෂ්ටිජ්ජුකර්මයෙහිද විභාගානිසංසය දතයුතු—

තවද ප්‍රත්‍යනුමොදනාවෙහිද, ධර්මදෙසනාවෙහිද, යම් යම් අනුසස්කෙණෙක් කියනලද්දහුද ඒ සියලු ආනිසංසයෝද සුදුසු පරිද්දෙන් සංපහංසනසංඛ්‍යාත ප්‍රසංසායෙහිද යෙදියයුත්තාහුයි—යමෙක් බුද්ධසරණයෙද දහම්සරණයෙද සඟසරණයෙද, ඒ සත්වයාගේ මරණටපැමිණීමෙහිද සරණගනහෙයින් පිඩාකිරීමෙක් නොවන්නේයි-සිහිකටයුතුවූ දසවිධඅනුස්සතින් අතුරෙහි ගෞරව සහිතව සසරදුක් නසනුකැමති සත්වතෙම නිරන්තරයෙන් ඒ අනුස්සතින් සිහිකරන්නේයි-තවද දානාදී යම්කිසි කුසලධර්මයෙක්ඈද්ද ඒසැමතැන්හි දන්දීමෙහිද සිල්රැකීමෙහිද භාවනාකිරීමෙහිද ඵලානිසංස ඇත යනාදිවසයෙන් පවත්නා උතුම් සම්‍යක්දෘෂ්ටියෙන් සිත පිරිසිදුවූයේවීනම් ඕහට, මහත්ඵල මහානිසංස ඇත්තේයි—

මේ මෙහි දෘෂ්ටිජ්ජුකර්මයෙහි විභාගානිසංස වර්ණනාවයි.

දසමෙවං පතප්පඤ්ඤවත්ථූනං විසුං විසුං සම්පරිවත්තිතො
ඵලං සමග්ගභූතා නමසෙසතොකථං කථෙසිතෙසං මුනිනංඵ
ලොදයං—යනාදී නිසෙයින් මෙසේ දානාදී දසපුණ්‍යක්‍රියාවස්තූන්
ගේ විභාගානිසංස වෙන් වෙන්ව වර්ණනාකොට මුනීශ්වරවූ බුදු
රජතෙම නිරවශේෂවඑසු ඒ දසපුණ්‍යක්‍රියාවන්ගේද යම් ඵලො
දයෙක්ඇද්ද ඒ ආනිසංසලාභය නිධිකණ්ඩසූත්‍රයෙහි විසෙසයෙන්
වර්ණනාකොට වදාලසේක—ඒ කෙසේදයත්—

යස්සදානෙනසීලෙන සඤ්ඤමෙනදමෙනච,
නිධීසුනිහිතොහොති ඉත්ථියාපුරිසස්සවා,

චෙතියම්හිචසංඝෙවා පුග්ගලෙඅතිථීසුවා,
මාතරිපිතරීචාපි අථොජෙට්ඨම්හිභාතරි.

ඒසොනිධිසුනිහිතො අජෙය්‍යොඅනුගාමිකො,
පහායගමනීයෙසු ඒතංආදායගච්ඡති.

මෙසේ නවවෙනිපරිච්ඡෙදයෙන් දානාදී දසකුසලකර්මපථාදී
න්ගේ විභාගානිසංස ප්‍රකාශනීර්මෙන් ලෝවැඩදක්වා තදනන්ත
රව එම කුසලකර්මඵලභූමිවූ, ලෞකික ලොකොත්තරසම්පත් ප්‍ර
කාශකථාවෝද මෙහි දක්වනුලැබෙත්—එහි ලෞකිකසම්පත්තිනු
නම් කවරහයත්-ගෘහපති මහාසාල සම්පත්තිය, බ්‍රාහ්මණ මහාසා
ල සම්පත්තිය, ක්‍ෂත්‍රිය මහාසාල සම්පත්තිය, ප්‍රදෙස රාජ්‍යසම්ප
ත්තිය, චක්‍රවර්තිරාජ්‍ය සම්පත්තිය, දිව්‍යරාජ්‍ය සම්පත්තිය, යනාදී
වසයෙන් අනෙකප්‍රකාරවනනාහුයි—එයින් මනුෂ්‍යලොක සම්ප
ත්නම්-යම් සිටුකුලයෙක සතලිස්කෙළක් ධන නිධානකොටතබා
දවස දවසපාසා මුනක් කහවනු වැයවෙමින් දසාමුනක් කහවනු
අයවන්නේය. මේ ගෘහපති මහා සලසම්පත්නම්වේ—යම් බ්‍රාහ්ම
ණකුලයෙක, අසූකෙලක් ධනනිධානකොටතබා දවස දවස දසා
මුනක් කහවනු වැයවෙමින් විසිඅමුනක් කහවනු අයවන්නේය-
මේ බ්‍රාහ්මණ මහාසාල සම්පත්නම්වේ—යම් රජකුලයක සියක්
කෙලක් ධන නිධානගතව දවස දවස විසිඅමුනක් කහවනු වැය
වෙමින් සතලිස්අමුනක් කහවනු අයවන්නේය මේ ක්‍ෂත්‍රිය
මහාසාල සම්පත්නම්වේ—ප්‍රදෙසරාජ්‍යසම්පත්නම්, දෙයොදුන්
තුන්යොදුන් විසියොදුන් තිස්යොදුන් සතලිස්යොදුන් පනස්යො
දුන් සැට සැත්තෑ අසූ අනූයොදුන් එක්සියවිසියොදුන් ප්‍රමානවූ
ඒ ඒ රටවල රජකරණ රජදරුවන්විසින් අනුභවකටයුතුවූ උදාර
තර රාජ්‍යසම්පත්තිහුයි—චක්‍රවර්ති රාජ්‍යසම්පත්නම්—සතරමහ

අවසිනෙත් හා ක්‍ෂුද්‍රදීප දෙදහසකින් ප්‍රතිමණ්ඩිතවූ සියලුම් චක්‍රවාටාභ්‍යන්තරයෙහි ඓශ්වර්‍ය්‍යාධි ප්‍රත්‍යයකරණාවූ චක්‍රවර්ති රජ්ජුරුවන් විසින් අනුභව කටයුතුවූ සම්පත්තියයි ඒ චක්‍රවර්තිරාජ්‍ය සම්පත් මෙසේ දතයුතු—

අන්තොජනස්මිං බලකායෙධම්මිකාය රක්ඛාවරණගුත්තියා සංවිධානං යන්නෙහි—අන්තොජනයයි කියනලද ඒරජහුගේ පුත්‍රදූරාවන් සීලසංවරයෙහි පිහිටුවම්ං වස්ත්‍රගන්ධමාල්‍යා භරණදියෙන් ඔවුන්ට සඞ්ග්‍රහකොට සවෝපද්‍රවයෙන්වලකා රක්‍ෂාකිරීම ධාර්මිකරක්‍ෂා වරණගුත්තිනමේ—එසේම බලකායයයි කියනලදසේනාවටද කල්නොඉක්මවා බත් වැටුප්ආදියදී අනුග්‍රහ කිරීමෙනුදු අභිෂේකලත් රජදරුවන්ටද යහපත් අජානීය අශ්වයන් ආදී මාහැඟිරත්න දීමෙනුදු අනුයුක්ත ක්‍ෂත්‍රියයෝයයි කියනලද. ඒක්වයෙදීවසන රජදරුවන්ට සුදුසු යානවාහනදීමෙන්ද. බ්‍රාහ්මනයන්ට අන්‍නපාන වස්ත්‍රාදීවූ දියයුතුදූනවස්තු දීමෙනුද, ගෘහපතීන්ට බත්බිජුවට නගුල්ගොන් මීගොන් ආදී කෘෂිකර්මෝපකරණදීමෙන්ද' එසේම නිගමග්‍රාමදනවූ වැසියන්ටදබත් බිජුවට ආදියෙන් සග්‍රහකිරීමෙනුද. සතුටුකරවිය යුක්තායුයි—

සමිතපාප බාහිතපාපමහන බමුණන්ට ශ්‍රමණපරිෂ්කාරදීමෙන් සත්කාරකිරීමය. මෘගපක්‍ෂීන්ට අභයදානයදී අස්වැසීමය අධර්මක්‍රීම වැලකීමය, ධනනැත්තාවුන්ට ධනදීමය, ශ්‍රමනයන් කරා පැමිණීමය, ප්‍රශ්ණවිචාරීමයයි කියා මෙසේ දසවධවූ සක්විතිවත් පූරාපෙහෙවස් සමාදන්ව ප්‍රාසාදයාගේ මතුමහල් තෙලෙහි ශ්‍රියහන්ගතවහුන් චක්‍රවර්තිරජහට රථකාරවිලෙන් චක්‍රවර්තිරත්නය පහළවන්නේය.

ඒ චක්‍රරත්නයෙහි ඉන්ද්‍රනීලමාණික්‍යමය නාභියවෙයි සත්රුවන්මයවූ දහසක්අරවෙති සුරක්තවූ සිනිඳුවූ ප්‍රවාලමය නිම්වලළුවෙයි සන්ධ්‍යාරාග සශ්‍රීරිකරක්ත ජාම්බූනදස්වර්ණමයනෙමි සන්ධිවෙති ඒනිම්වලළුව පිටස්වභාවයෙන් පිඹිනාවස් කුලල්මෙන් ඇතුලතින්සිදුරුවූ විචිත්‍රජීද්‍රම්බලිකාවෙන් පවත්ගෙන දක්‍ෂවාද්‍යයන් විසින්වයනලද පඤ්චාංගිකතූර්‍ය්‍යනාදයක් මෙන්මධුරණද පවත්ණමනහර ප්‍රවාල දඬුවැට සියයෙක්වෙයි, එප්‍රවාලයෂ්ටි මස්තකයෙහි තිරිමුහුද අලලාපැනනැගී පෙනබුබුළු පන්තියක් මෙන් අතිධවල ධවලාත පත්‍රසියයෙක්වෙයි ඒදෙපසරත්න දුමාතුබඩරන්කොනත දෙසියයෙක්වෙති නාභිපතාලියගේ උභතො පාර්ශවයෙහි සිංහමුඛදෙකෙක්වෙයි ඒසිංහමුඛදෙකෙන් තරු

ණතාලස්කන්ධප්‍රමාණ සඳරුස්කලඹගේ සෝභමාන මුතුලෑල්කඳු දෙකෙක්ලඹදෙයි එමුක්තාලතිකාග්‍රයෙහි ලගිරුමඬලදෙකක්සේ පලස්හුවට දෙකක්බබලයි—

මෙසේ දිව්‍යරත්නමය සර්වාලංකාරයෙන් සොභමානවූ ඒ චක්‍රරත්නය කරන්නෙක්හෝ කරවන්නෙක්හෝ ලොවඇත්තෙ නොවෙයි කර්මප්‍රත්‍යනැමති සෘතුයයි කියනලද චක්‍රවර්තිභාවයට පමුනුවනදෘනද මංසංසමාද ප්‍රත්‍යහෙතු නැමති සෘතුයෙන් පහළවන්නේය

යටකියනලද ක්‍රමයෙන් දශවිධවූ සක්විතිවත්පුරා පූරපසලොස්වක් පොහොද්න අෂ්ටාංගසීලය සමාදන්ව රජතමාගේසීලය ආවර්ජනා කරමින් හුන්කල්හිසම්පූර්ණවූ සඳමඬලයේ හිරමඬලයේ සොභාමත්ව නැගෙන්නාවූ යථොක්ත චක්‍රරත්නයදක්නේයඒචක්‍රරත්නයෙහි මධුරනාද දෙලොස්යොදනක්තැන්ඇසෙයිතුත්යොදනක් ආලෝකපැතිරෙයි—ඒදුටුමහජනයා විසින් කුල්මහ සඳමඬලටඅනුවම නැගිහෙයින් මේද මෙතිවළදූවූයේ සඳමඬලෙක්දෙ හිරමඬලෙක්දෙහොයි කියා අහිසයින් කුතුහලඋපදවා බලමින්සිටියදිම නුවරමස්තකයෙන් අවුත් රජ්ජුරුවන්ගේ අන්තඃරයට පැදුම්දෙසඉතා උස්නොවුඉතා මිටිනොවූ මහජනයා විසින් මල්සුවඳ ආදීයෙන් පූජාකිරීමට සුදුසුආකාශප්‍රදේශයෙහි චක්‍රරත්නය අක්ෂාගතස්වරූපයෙන් නිශ්චලවසිනේය—ඒචක්‍රරත්නයට අනුවම හස්තිරත්නය පහලවන්නේය ඒහස්තිරත්නය කාලප්ලනාදී කිසිවක්නොව රිදීපර්වතයක්මෙන් සර්වාංගධවල සප්තාංග ප්‍රතිෂ්ඨිත ඉර්ධිමත් ආකාස චාරීවූහස්තිසිංහාවෙහි මනාවනික්මුනාවූද මනයෙන්යුක්තවූ උපොසථ කුලයෙන්හෝ ෂද්දන්තකුලයෙන්හෝ එන්නේය. උපොසථකුලයෙන් එන්නේවීනම් සියල්ලට ජෙෂ්ඨහස්තිතෙම එන්නේය ෂද්දන්තයෙන් එන්නේවීනම් හැමට කනිෂ්ඨහස්තිතෙම එන්නේය. එහස්තිවාහනාරූඪව රජතෙම දෙලොස්යොදනෙක පැතිර සිටිපිරිසගෙන පෙරවරුනික්ම සියළු ජම්බුද්වීපයෙහි හැසිර අවවාදකොට දවල්බත්ටස්වකීය රාජධානියටම එන්නේය.

මෙසේ හස්තිරත්නය පහලවූ ඉක්බිති ප්‍රවාලාන්කුරයෙන් වලඳනාලඳ තිරිමුහුදකරලපතරසේ ශශිකවූරත්වූ ඛුරහා මුඛඇති චන්ද්‍රමරීචි සමූහයක්සේ පිරිසිදුවූ සිනිදුවූ ධවලවූසහව හැසිරීමට මටවසම්පූර්ණවතිබෙන ශරීරඇති කපුටුකරක්මෙන් කළුහිස් ඇතිසරියේ කපාසිටුවනලද මුදුන තමුදු මොලොක් සියුම්මට් සිළුවූ කෙළින් නැගිකෙස් ඇත්තාවූයව සදිසමුඛහාදි සර්වලක්ෂණ

යෙන් සම්පූර්ණවූ වලාහකනම් අශ්වරාජයෙක් ශෛන්ධවකුලයෙන් අවුත් සරහා පිළියෙලකරණලද මඟුල්අසල සිටියේය— එකල චක්‍රවර්තිරජතෙම අශ්වරාජයාදැක පලමුපරිද්දෙන්ම රුවන්උරසැත කිංකිණිදැල් රන්මුකරසු ත්‍රිකූසංගෘහීතලිආශණසත් ආසන පටපියඑසවරිආදිවූ නොයෙක් ශෑරඝුම්වලින්ද සරසා ඒ අසුපිටට පැනනැගී ප්‍රවරගාසමඟ සුලූසකලවටකොට ඇවිද පෙරවරු මේ නිමවීමට පලමුවෙන්ම තමාගේ රාජධානියට එන්නේය—

මේ අශ්වරත්නය පහලවූ ඉක්බිති සතරරියන්පමන දිගඇති ගැල්වැඹක්පමනවූ වටඇති දෙකෙලවර කෙම්කෙලවරින් නික්මෙන්නාවූ ඉතා පිරිසිදු මුතුලැල්කඳින්හා රන්පිඩුම්දෙකතින් ශෑරහුනාවූ සුවාසූදහසක්පමන මැනික්පිරිවරකොටඇති තාරකා පිරිවැරූ පූර්ණචන්ද්‍රයාගේ ශ්‍රීසමූර්තියට ස්පර්ධාකරන්නාක්වැනිවූ මාණික්‍යරත්නය වෙපුල්‍යපර්වතයෙන් එන්නේය-ඒ මාණික්‍යරත්නය මුතුසහලෙලකතබා උනදඬුපරම්පරාවෙන් ශැටරියනක් පමන ආකාශයට නඟනලදකල්හි රාත්‍රිභාගයෙහි වටින් යොදනක් පමනවූ සියලුඅවකාශය අරුණුනැගෙණවේලාවක්මෙන් ඒකාලෝකවෙයි· ඒවේලෙහි ගොවිහු සීසෑම්ආදිවූ ගොවිකර්මාන්තකෙරෙහි වෙළෙන්දෝ සල්පිල්සදති ඒ ඒ කර්මාන්තදන්නාවූ සභයෝ දවල්යයිසිතා තමතමන් කරණ මෙහෙකරණ්නාහුය· යටත්පිරිසෙයින් කුරුකුහුඹුවන්පටන් හැම වස්තූන් දක්නාහුය—

මෙසේ මාණික්‍යරත්නය පහලවූඉක්බිති චක්‍රවර්තිරජ්ජුරුවන්ට පචකාමශැපයට විසෙසකාරණවූ සකලජන නයනාමෘත භාගප්‍රසන්න රූපලාවනසම්පත්තියෙන් රමනීයවූ රත්නාන්කුරයෙන් මවනලද රූපයක්බඳුවූ කප්රුකකින්උපන් දිව්‍යසලුවෙන්හා මිණිඔටුනුආදිවූ සිව්සැටආභරණයෙන් සැරහී එහි මුක්තෝපුනීලපත්මරාගවෛඩූර්‍ය්‍යාදි රත්නාකිරනාංකුරයෙන් මිශ්‍රවූ තමාගේ සරීරකාන්තියෙන් දෙලොස්රියනක්තැන් එකපැහැර බබුළුවන්නාවූ සියක්වටගසානැංගු ප්‍රඵුල්ලනටවඩා සියදහස්ගුණයෙන්අධිකවූ මෘදුස්පර්ශඇතිවූ චක්‍රවර්තිරජහට සීතාවස්ථාවෙහි උෂ්නවූ උෂ්නාවස්ථාවෙහි සීතලවූ මනාස්පර්ශදෙන හැමකලිහිම සකස්කොට අඹරණසඳ අළුත් සිව්දැගඳහා එක්කොටයොදනලද සඳුන්සුවඳවැනිවූ සරීරසුගන්ධඇති ඒ ක්ෂණයෙහිපිපුනු මහනෙල්මල් සුවඳක්වැනිවූ ඉතා මනෝඥවූ මුඛසුගන්ධයෙන්යුක්තවූ දක්ෂ ගාන්ධර්වයන්විසින් ගායනාකරණලද වීනානාදයකටබඳුවූ මිහිරි කටහඬඇතනාවූ ලක්ෂ්මීයටබඳුවූ ශ්‍රී සෞභාග්‍යඇති සරස්වතියට

බඳුවූ හුවනඇති අරුන්ධතියටබඳුවූ පතිව්‍රතාගුණයෙන් යුක්තවූ ස්ත්‍රීරත්නයෙක් උතුරුකුරුදිවයිනින් එන්නීය. නොහොත් මද්‍ර රට සාගලනුවර මද්‍රරජ්ජුරුවන්ගේ කුලයෙන් ගෙණෙනලද අගමෙහෙසුන්බිසවකට මෙබඳු රූපශබ්දගන්ධරසස්පර්ශ සමෘද්ධිය පහලවන්නේය. මෙසේවූ ස්ත්‍රීරත්නය පහලවන්නේය —

මෙසේ ස්ත්‍රීරත්නය පහළවූඉක්බිති පලමුවෙන් රජ්ජුරුවන්ට වස්තුරාශිය වර්ධනයකරණ ධූරයෙහිසිටියාවූ අනල්පවූ උපභෝග පරිභෝග වස්තුඇත්තාවූ ගොවිකුලයෙහි උපන්නාවූ සිටාණන්ට චක්‍රරත්නානුභාවසහිතවූ කර්ම්විපාකයෙන් උපන්නාවූ දිවස් පහලවන්නේය. ඒ දිවසින් පොළෝඇතුලෙහි යොදනක්පවත ගැඹුරෙහිතුබූ නිධාන දක්නේය—ඒ සිටුපුත්‍ර තමාගේ දිවසසමෘද්ධියදැක සතුටුවූසිත්ඇතිවගොස් රජ්ජුරුවන්වහන්ස ඔබවහන්සේ වස්තුසෙවීමට උත්සාහ නොකළමැනව මම වස්තුයෙන්කලමනා කටයුතු සැපසේ සිඬකරන්නෙමියි රජ්ජුරුවන්ධනයෙන්පවරා රන්මසුපිරුනු මහාශාලක්ගොඩනඟාගෙණ මහරජ්ජුරුවන්වහන්ස මෙපමනක් සෑහෙන්නෙදැයිකියා තමාගේ සමර්ථය දක්වන්නේය—මෙබඳුවූ ගෘහපතිරත්නය පහළවූඉක්බිති සක්විතිරජ්ජුරුවන්ගේ ප්‍රධානපුත්‍රවූස්වභාවයෙන්ම ප්‍රසන්නඥානයෙන යුක්තවූ ස්වානොචිතප්‍රඥාඇති සංවිභාගසීලිවූ සියලු කාර්‍යවිධානයෙහි සමර්ථවූ රාජකුමාරයාහට ඒරජහුගේ කුසලානුභාවය නිසා ඔහුගේ පූර්වකර්මානුභාවයෙන් පරසිත් දන්නානුවන පහලවන්නේය, ඒපරචිත්තඥාණයෙන් දෙලොස්යොදනෙක පැතිරසිටි පර්ෂදයේසිත් හසර දැන ලංකළමනා කෙනෙකුන් ලංකරන්නටද දුරුකළමනා කෙනෙකුන් දුරුකරන්නටද නිස්සන්දේහ ඒ ඒ තනතුරුවලට පමුනුවන්ටද රජ්ජුරුවන්ට හිතයනනිශ්චය කරන්නටද සමර්ථවන්නේය—මෙබඳු පරිනායකරත්සංඛ්‍යාතවූ රාජකුමාරයාද තමාගේ ආනුභාවදැක සතුටු සිත්ඇතිව ගොස් මහරජ්ජුරුවන්වහන්ස ඔබවහන්සේ සැපසේ රාජ්‍යශ්‍රී අනුභවකොට වදාළමැනව මම සේනාවට අවවාදඅනුසාසනා කරමියි සේනාව විචාරීම ආදිවූ සියලු කටයුතු මටභාරයයි රජ්ජුරුවන්ට ආරාධනා කරන්නේය—

මෙසේ මේ සප්තවිධරත්නයෙන් සමන්විතවූ චක්‍රවර්තිරජතෙම වාමහස්තයෙන් ස්වර්ණභිංකාරය ගෙන දක්ෂිණ හස්තයෙන් චක්‍රරත්නයට පැන්ඉස පවත්තතුභවං චක්කරතනං අභිවිජිනාතුභවං චක්කරතනං සතුවෙන් ආරාධනාකළකල්හි ඒ වචනානන්තරයහා සමග චක්‍රරත්නය ආකාශයට පැනනැගී තියනාළද ක්‍රමයෙන් මධුරනාදපතුරුවමින් නික්මයන්නේය —

ඒ චක්‍රරත්නය හා සමග චක්‍රවර්තිමහරජ සර්වාභරණයෙන්
සැරහී හස්තිරත්නය අශ්වරත්නය යානවාහනදෙකින් කැමති
වාහනයකට පැන නැගී එසේම සර්වාභරණයෙන් සැරහුනාවූ දෙව
ඟනන්හාසමාන විශෙෂ රූපශෝභාවෙන් විරාජමානවූ මනහර
පුරඟනන්හා එසේම අනේකාලංකාරයෙන් විභූෂිතව තල්වැට
චාමරවිජිනිපත් පුන්කලසයෙන් කෝල්පිල් කඩ කුඩකොඩි සේ
සත් මගුල්කඩුආදිකොටඇති නොයෙක් මඟුල්පෙරහරගත්තාවූ
පරිවාරජනයන්ද එපරිද්දෙන්ම අනෙකවිධ කර්මාන්තයෙන් විචිත්‍ර
පරදුකුස්පායන්ආදිවූ නානාවර්ණසන්නාහයෙන් අලංකෘතව අනෙ
කප්‍රකාර ආභරණප්‍රභායෙන් දිලිසෙමින් අභින්ගත්තාලද ඛඩ්ග
කුන්තතෝමර චන්ද්‍රචක්‍රභෙන්ඩිවාලාදිවූ විවිධායුධයන්සේ විදුළුදළු
ම සහශ්‍රප්‍රභාවෙන්හා නයනලද නොයෙක් දහස්ගනන් ධ්වජ
පතාකයෙන් ප්‍රතිමණ්ඩිතවූ තමන්ගේ මහසෙනග හා සමග අභ
සින්අවූත් සිටගත්තාවූ යුවරජසෙනෙවිරත් ඇපාමාපාආදීවූ මණ්ඩ
ලිකවරුන්හා එපරිද්දෙන්ම පෙල පෙල සැදී වෙන වෙනඅවුත්
රැස්වෙමින් සතලිස්යොදනක්පමනතන්හි අතුරනොහැර දිව්‍ය
සේනාවක්මෙන් සැරහී සිටගත්තාවූ මහසෙනග පිරිවරා තරු
පිරිවරණලද පූර්ණචන්ද්‍රයාසේ දිලිහිදිලිහී ආකාශයෙන් නික්මෙ
න්නාහ.

එසඳ රජ්ජුරුවන්ට අභිමුඛව දිව්‍යාඞ්ගනාවන්හාසමානවූ සැට
දහසක්පමන නාටකස්ත්‍රීහු ආකාශයෙහි දිව්‍යලීලායෙන් නටා
ගෙණයෙති. උන්ට අභිමුඛව එසේම දෙවඟනන් හා සමානවූ
සැටදහසක්පමන පුරඟනාවෝ වේනුවීනා ඇලවන්නී වහිවස්
දඬු ඒකවජ්ද්‍රමනිපර්විජයාඅවනී ඔතනූනතිරි පටසිරිවිත්‍රකොල
ස්වරආදියෙන් මධුර ස්වර පතුරුවා ගායනානාද කෙරෙමින් නික්
මෙන්නාහ——එසේම දෙවිකුමරුවන්බඳුවූ සැටදහසක්පමණ
ගාන්ධර්වපුත්‍රයෝ නොයෙක්ලෙසින් සැරහී ඉදිරිවසිට, ගැටබෙර
පතාබෙර තුඹබෙර මහබෙර පොකුරුබෙර රොදුබෙර එකැස්
බෙර දුදුගුබෙර ඇඳුරුබෙර තලප්ප රවිරඳුම් තම්මැට්ට තිසාන
ආදිවූ අනෙකප්‍රකාර භෙරිඝොෂාවෙන් එකකෝලාහල කෙරෙ
මින් නික්මෙන්නාහ—

මෙසේ සරාජිකපර්ෂත්හාසමග නික්මුනාවූ ඒ චක්‍රරත්නයේ
බලයෙන් මහාමේරුපර්වතය පහකොට මහාසමුද්‍රයමතුපිටින් සත්
දහසක් යොදුන්පමනඇති පූර්වදෙහයටගොස් ඒ පූර්වදෙහ
යෙහි දීගින්පුළුලින් දෙලොස්යොදනක් පමනඇති වටින් සතිස්

යොදනක්පමණතැන්හි පැතිරසිටිනා එකීදවාසයකරන්ටයොග්‍යවූ පානවග්ඇති සිනිඳු සෙවනින්හා සිහිල්දියෙන් සම්පූර්ණවූ පවිත්‍රවූ සමතලා රම්‍යභූමිප්‍රදෙසයෙක්හි චක්‍රරත්නය අහුරක්ගෑසුවාක් මෙන් සිටිනේය—ඒ සලකුනෙන් සියලුසත්‍වයෝ හිමවබෑස සැප සේ කැමතිපරිද්දෙන් ස්නානභෝජනාදිය කෙරෙමින් වාසය කරන්නාහුය—මෙසේ චක්‍රවර්තිරජ්ජුරුවන් වංසයට පැමිනිකල් හි පූර්වවිදෙහයෙහි. යම් රජදරුකෙනෙක්ඇත්නම් ඔහු හැමදෙනම සතුරුසේනාවෙක් ආවාහුයයිසිතා තමන්ගේ සේනාව යුධයට නොසරහන්නාහුමය. එයට කාරනා කවරේදයත් තමන්ගේ ආනුභාවයෙන් සියලු සතුරන් දමනයලනෙහයින් අරින්දමයයිනාමින් ප්‍රසිඬවූ ඒ චක්‍රරත්නයාගේ උත්පත්තිය හා සමග සතුරු සංඝවෙන්· ඒ චක්‍රවර්තිරජ්ජුරුවන්උදෙසා ආයුධයක් ඔසවාගන්ට සමර්ථවූ සත්‍වයෙක්නම් කිසිතැනෙකත් නැත්තේමය—

මේ චක්‍රරත්නයාගේ ආනුභාවයෙන් වන්නේය—එසේ හෙයින් කියනලදී—

චක්කානුභාවෙන හිතස්ස රඤ්ඤෝ අරීඅසෙසා දමථං උපෙන්ති;
අරින්දමං නාම නරාධිපස්ස තෙනෙව තං වුච්චති තස්ස චක්කං හි.

එසේහෙයින් සියලු දරුවෝ තමතමන්ගේ රාජ්‍ය ශ්‍රීසමෘඬියට සුදුසු පඬුරුගෙණ ඒචක්‍රවර්ති රජ්ජුරුවන්කරා එළඹ තමන් ගේ තිරුළු කුළුම්භි රුස්නැමැති අභිෂේක ජලයෙන් ඒරජ්ජුරුවන්ගේපාද පූජාවකොට මහරජ්ජුරුවන්වහන්ස මෙසේ වැඩියමැනව තුඹවහන්සේ වැඩියාවූ ගමන ඉතායහපත්වූ ගමනෙක මේරාජ්‍යය තුඹවහන්සේසන්තකය එසේ හෙයින් අනුසාසනාකොට වදාළමැනවැයි. ඒචක්‍රවර්තිරජ්ජුරුවන්ට තමන් විසින් කළමනාකටයුතු කෙසේකරම්දැයි විචාලකල්හි චක්‍රවර්ති රජමට අවිරුද්දක් පාසා මෙතෙක්අය පඬුරුදෙවයි නොකියන්නේය එකක්හුගේ වස්තුවළදුරා අතිකක්හට නොදෙන්නේය වැලිත් ආකාශයෙහි දේවේන්ද්‍රලීලාවෙන් පත්මාසනයෙන් වැඩහිද තමාගේ ධර්මරාජන් බවටද සුදුසුවූනුවනින් පරීක්ෂාකොට බැනනැහිමසමග මුඛයෙන් නිකුත් යොදනක්දිවන මහනෙල්මල් සුවඳ සරීරයෙන්නික්මුනු සතරගව්වෙක පැතිරසිටිනා දිවසඳුන්සුවඳහා මුසුකොට මියුරුකටහඬින් මෙසේ කියන්නේය

එබාපින්වත් සත්‍වයෙනි ප්‍රානවධනොකරව අනුන්සන්තක වස්තූනොගනුව කාමමිථ්‍යාචාර නොකරව බොරුනොකියව

රා නොබොව තොපතොපගේ භුක්තිවූ පරිද්දෙන්ම රජ්‍යශ්‍රීඅනුභවකරවයි අවවාදකොට ඉක්බිති චක්‍රරත්නය ආකාශයට පැන නැඟී නැගෙනහිර සමුද්‍රයට බට කල්හි ඖෂධගන්ධයක් ආඝ්‍රාණකොට පෙනයහීය අකුළුවන්නාවූ නාගරාජයෙක්හුමෙන් ඇති ලගියාවූරලපතර ඇතිව පසුබස්නාවූ සමුද්‍රජලය යොදනක් පමණතැන් පසුබැස වෛඩූර්‍ය්‍යමයවූ භිත්තියක්මෙන් සිටිනේය ඒඇසිල්ලෙහිම මහසමුද්‍රයෙහි විසිරසිටියාවූ අනෙකප්‍රකාරවූ රත්නසමූහයා දක සතුටුවූ රජපිරිස කැමතිපරිද්දෙන් සත්රුවන් උකාගත්කල්හි එචක්‍රරත්නය පෙරලානික්මෙන්ට පටන්ගන්නේය එකල සේනාව ඉදිරිවයෙති රජ්ජුරුවන් මධ්‍යයෙහියෙති චක්‍රරත්නය හැමටපසුව යන්නේය එසමුද්‍රජලයද චක්‍රරත්නයා පසුගමන් කරන්නාක්මෙන් අවුත් නිම්වලලු කෙළවර ගැසෙමින් ගොඩටම එන්නේය මෙසේ පූර්වසමුද්‍රපර්‍ය්‍යන්තවූ පූර්වදිශාව ජයගත්තාවූ සක්විතිමහරජතෙම චක්‍රරත්නය විසින් දක්වනලද මාර්ගයෙන් දක්ෂිණදිශාභිමුඛ දසදහසක්යොදුන් ඇති ජම්බුද්වීපයගෙනපලමු පිරිද්දෙන් දක්ෂිණ සමුද්‍රයට බැස අහසට නැගී සත්දහසක් යොදුන්පමන ඇති අපරගෝයානයද පලමුපරිද්දෙන් ජයගෙන බස්නාහිරි සමුද්‍රයෙන් අහසට නැගී අටදහසක් යොදුන්පමන ඇති උතුරුකුරු දිවයින පලමුකීපරිද්දෙන් ජයගෙන උත්තර සමුද්‍රයෙන් අහසට නැගෙන්නේය.

මෙසේ චතුස්සමුද්‍රවේලා පර්‍ය්‍යන්තවූමහා පෘථිවිමණ්ඩලය ජයගත් චක්‍රවර්තිමහරජතෙම මාගේ රාජශ්‍රීසමෘද්ධිය දක්නාපිණිස පණ්ණාසමත තුන්සියයක් යොදුන්පමන උසඇති ආකාසතලයට පැන නැගී සුපුෂ්පිතවූ පත්මෝත්පලපුණ්ඩරීකවනයෙන් විසිතුරුවූ සයංජාතමහවිල් සතරක්මෙන් පන්සියයක්ෂුද්‍රද්වීප පිරිවරකොට ඇතිසතරමහ ද්වීපය චක්‍රරත්නානුභාවයෙන් මේරු යුගන්ධරාදීන්වන ආවරණයක් නැතිව චිත්තසන්තෝෂයෙන් බලාසිට ක්‍රමයෙන් තමාගේ රාජධානියටම එන්නේය,

මෙපමනකින් චක්‍රවර්තිරජ්ජුරුවන් විසින් සමුද්‍රපර්‍ය්‍යන්තවූ මුළුපොලොව ඓශ්වර්‍ය්‍යාධිපත්‍යයට පැමිණියේනම්වේ මෙසේ චක්‍රවාට පර්වතයකිම් කොටමුහුද කෙළවරකොටසිටි සක්වලගැබඓශ්වර්‍ය්‍යාධිපත්‍යයට පැමිණි චක්‍රවර්ති රජ්ජුරුවන්ගේ දිව්‍යඟනාවන්මෙන් විසිෂ්ටවූරූපශ්‍රී ඇති අනේකප්‍රකාර විසිතුරු සත්‍රිආභරණයෙන් ශෘංගාරවූ සම්පූර්ණවූ චන්ද්‍රමණ්ඩලානුසාර සිත්කළු මුහුණුඇති සුරක්තවූ බිම්බඵලසදිසවූ දන්තාවරණඇති නොමඳ

ලසමසහිත අවිවරදන්තපන්තිඇති නිල්වූනේත්‍රයෝ
සම්පන්න අභිනීලවංක බැමසඟලවරින්හා මනාවහට
ණී සමසහිත පයෝධරා ලංකාරතිකරණකනක රජ
කර්මනිර්මිත විචිත්‍රමෙවුල්දම් පැලඳී ඇත්සොඬවට බඳු
තෝරුයුගලාදී සර්වාවයව ලක්ෂණශ්‍රී සොභාධර නා
දිතාදී දක්ෂවූප්‍රියභාෂන භාසීන නාටකස්ත්‍රීහු අනුසාර
වත්නාහුය,

ජුරුවන්ගේ පුත්‍රයන්දහසම ප්‍රධානපරිනායක රත්න
ශ්ඨ පුත්‍රරත්නය වන්නේය—දෑලොස්යොදනක් තැ
නොහැර දිව්‍යගාන්ධර්ව ශ්‍රේණිවසේ හැසිරසිටි පචාශී
ණිව වන්නේය පස්විසියොදනෙක හැසිරසිටි බ්‍රාහ්ම
යවන්නේය—අටසාලිස් යොදනෙක හැසිරසිටි සර්වංහ
තපචාසුධ සන්නාධ අනේකප්‍රකාරවේ සධාරිවූ අනු
ක හැසිරසිටි අමාත්‍ය මණ්ඩලයවන්නේය—පන්සියයක්
ැන හැසිරසිටිනා මහසෙනඟ වන්නේය.

ස් චක්‍රවර්තිරජහට හාත්පස්හි සතරදිසාවෙහි අනූස
දහසක් පමණ සංඛ්‍යවටගිය බලකාය වන්නේයි—මේ
නප්‍රකාර ශ්‍රීසම්පත් සමූහයෙන් දීලියෙනාවූ සම්ප
ක්‍රවර්තිසම්පත් නම්වේ—මෙසේවූ චක්‍රවර්තිසම්පත්
මනුෂ්‍යසම්පත්තියටද ත්‍රිවිධබුද්ධානුශාසනා ප්‍රතිග්‍රහන
කුසල ධර්මයෙහි හැසිරුනුස්ත්‍රයෝ පැමිණ ප්‍රමාණ
වූ නොයෙක් මනුෂ්‍යලෝකසම්පත් අනුභව කර

ස් සියළු සත්‍වයන් මෙසා සියළු මනුෂ්‍යලෝක සම්පත්
නුවනසේ කරණලද අනේකප්‍රකාර විසිතුරු සද්ධර්මානු
ැතිහෙයින් ශාක්‍යකුලතිලකවූ මාගේස්වාමිදරුවූ බුදුරජ
වනසේක

දිව්‍යරාජ්‍ය සම්පත්නම් කවරහයත් පොලොතෙලෙ
දෙසාලිස් දහසක්යොදුන් ගියතැන යුගන්ධර පර්වතය
ආකාසප්‍රදේශයෙහි චාතුර්මහාරාජික දිව්‍යලෝකය
ල දක්වාමපිහිටියේය, ඒචාතුර්මහාරාජිකායෙහි ඇතු
බිගහැර සෙසු සියළුතැන සුවර්ණරංජිත මානික්‍යමය
ත් අතුරු නැත්තේය—සතරවරම් රජදරුවන්ගේ
මය දිව්‍යනගරය ඒයුගනදුරු මුදුනෙහිවිය—ඒදිව්‍යලෝ

කයෙහි දෙවියෝ මනුෂ්‍යගණනායෙන් අනූලක්‍ෂයක් අවුරුදුදි
ව්‍යසම්පත්අනුභව කෙරෙති: දිව්‍යරාජසම්පත්නම් තාවතිංසය
යාමය තුසිතය නිර්මාණරතිය පරනිර්මිත වසවර්තියයි කියනල
ද දිව්‍යලෝකවල දිව්‍යරාජයන්විසින් විඳුනු දිව්‍යසම්පත් වන්
නේය ඒචාතුර්මහාරාජික දිව්‍යලෝකයෙහිපටන් දෙසාලිස්දහ
සක් යොදුන්ගියතැන මහමේරුමුදුනහාසමවූ ආකාශප්‍රදෙස
යෙහි තව්තිසාදිව්‍යලෝකය සක්වලගලදක්වා පිහිටියේය මේ
රුමස්තකය ඉන්ද්‍රනීලමාණික්‍යමයය එහිපිහිටි පිටිනුවර හැර
මැදපිහිටිශක්‍රපුරය ඇතුලත පූර්වද්වාරයෙන් පශ්චිමද්වාරයට දස
දහසක්යොදුන දක්‍ෂිණද්වාරයෙන් උත්තරද්වාරයට දසදහසක්
යොදුන දහසක්රුවන්දොරටුවෙන්හා සප්තරත්න ප්‍රාකාරවල
යෙන් පරික්‍ෂිප්තකනක රජතෙන්ද්‍ර නීලස්ඵටිකාදනෙකප්‍රකා
රවිමාන මාලායෙන් සමලංකෘතය

එනුවරට පූර්වදික්හි සප්තරත්නප්‍රාකාර ගෝපුරයෙන් වටකරණ
ලද දහසක්යොදුන් නන්දනවනනම් උද්‍යානයෙක්ඇත ඒඋද්‍යා
නයටත් නුවරටත් දෙඅතුරෙහි පනස් පනස් යොදුන්නන්දානම්
චූලනන්දානම් පොකුනුදෙකෙක්ඇත ඒ පොකුනුතීරයෙහි කද
ලි කදලි මුවසම්සෙයින් ස්පර්ශදෙන්නාවූ නන්දානම් චූල
නන්දානම් රුවන්ගල්තල දෙකෙක් ඇත—දක්‍ෂිණදික්හි සප්ත
රත්නප්‍රකාර ගෝපුරයෙන් පරික්‍ෂිප්ත පන්සියයක්යොදුන් ඵාරු
සකනම් උද්‍යානයෙක්ඇත· ඒ උද්‍යානයටත් නුවරටත් දෙඅතු
රෙහි පනස් පනස් යොදුන් භද්‍රානම් සුභද්‍රානම් පොකුණුදෙකෙ
ක්ඇත, ඒ පොකුනුතීරයෙහි· ස්පර්ශදෙනනාවූ පනස් පනස්
යොදුන් භද්‍රානම් සුභද්‍රානම් රුවන්ගල්තලාදෙකෙක්ඇත-පශ්
චිම දික්හි සප්තරත්නප්‍රකාර ගොපුරයෙන්පරික්‍ෂිප්ත පන්සිය
යක්යොදුන් චිත්‍රලතානම් උයනෙය්ඇත· ඒ උයනටත් නුවර
ටත් දෙ අතුරෙහි පනස් පනස් යොදුන් චිත්‍රානම් චූලචිත්‍රානම්
පොකුනු දෙකෙක්ඇත. ඒ පොකුනුතිරයෙහි කෙහෙල්මුවසන්
සෙයින් මුඛ ස්පර්ශදෙනනාවූ පනස් පනස් යොදුන් චිත්‍රානම් චූල
චිත්‍රානම් රුවන්ගල්තලා දෙකෙක්ඇත—

උතුරුදික්හි සප්තරත්නප්‍රකාර ගෝපුරයෙන් පරික්‍ෂිප්ත පන්
සියයක්යොදුන් මිශ්‍රකනම් උයනෙක්ඇත-ඒ උයනටත් නුවරටත්
දෙඅතුරෙහි පනස් පනස් යොදුන් ධර්මානම් චූලධර්මානම් පො
කුනු දෙකෙක්ඇත-ඒ පොකුනුතීරයෙහි ශුභස්පර්ශදෙනනාවූ ප
නස් පනස් යොදුන් ධර්මානම් චූලධර්මානම් රුවන්ගල්තලා දෙ
කෙක්ඇත-ඒ නුවරට ප්‍රාචිනොත්තරකර්ණයෙහි සප්තරත්නප්‍රකා

ර ගෝපුරයෙන් පිරික්ෂිප්ත සත්දහස්යොදුන් මහාවනනම් උය
නෙක්ඇත ඒ උයනහා නන්‍දනම්උයනඅතුරෙහි සත්රුවන්මය
දහසක් කූටාගාරගෙවලින් සොබිතාවූ සියක්යොදුන්පමන පුර
නන්‍දනම් පොකුරණක්ඇත——

ඒ පුරවරමැද රත්නමය ධජපන්තීන්උජ්වලිතවූ සප්තරත්න
මය සත්සියයක් යොදුන් උසඇති වෛජයන්තනම් ප්‍රාසාදයෙක්
ඇත–ඒ ප්‍රාසාදයෙහි හාත්පසින් නගනලද සවර්නයෂ්ටියෙහි ඉන්‍ද්‍ර
නීලමානික්‍යමය ධ්වජයොවූහ ඉන්‍ද්‍රනීලමානික්‍යමය යෂ්ටියෙහි
සවර්නමයධ්වජයොවූහ ප්‍රවාලමය යෂ්ටියෙහි මුක්තාමය ධ්වජයො
වූහ–මුක්තාමයයෂ්ටියෙහි ප්‍රවාලමයධ්වජයොවූහ. සර්වරත්නමය
යෂ්ටියෙහි සර්වරත්නමයධවජයොවූහ එහි බිම් ඉන්‍ද්‍රනීලමානික්‍ය
මය වෑම් සතරංශයහ. කෝතුඹු ජේකඩ රිදීමයය. වහලපන්ති
ප්‍රාවාලමයය. මුත්තෑස් ගොතෑස් සත්රුවන්මයය. පලසේ මිනිර
න්මයය. එහි සියයක්පමන මහල්ඇත. එකි එකී මාලෙහි සත්
සියයක් සත්සියයක් බැගින් ශැත්තෑදහසක් රුවන්ගබඩා ඇත.
එකිඑකී ගබඩාවෙහි සත් සත් දිව්‍යඟනාවන්බැගින් සාරලක්ෂ
අනූදහසක් ඕහට වලලහවූ දෙහනො වෙසෙති. එකි එකී දිව්‍ය
ඟනාවන් මල්සුවඳපලඳවා සරහන සත් සත් පරිවාරස්ත්‍රීන්බැගි
න් සුනිස්ලක්ෂ තිස්දහසක් පිරිවර දිව්‍යඟනාවෝ වෙසෙති. මෙ
සේ ඒ එක වෛජයන්ත නම් මහපායෙහිම එකුන්සතලිස්ලක්ෂ
විසිදහසක්පමන වලලහ දෙවතාවෝ වෙසෙති. ඒ ප්‍රාසාදයට පූර්
දික්හි සර්වරත්නප්‍රාකාර ගෝපුරයෙන් පරික්ෂිප්ත ඒකපුණ්ඩරීක
නම් උද්‍යානයෙක්ඇත. ඒ උද්‍යානයෙහි බොලපස්යොදුන් වට
පසලොස්යොදුන් උස පනස් පනස් යොදුන් කඳඇති පාරිච්ඡත්‍ර
කනම් දිව්‍යවෘක්ෂයෙක්ඇත ඒවෘක්ෂයෙහි ශාඛාග්‍රයද සතරසා
ඛාවද පනස් පනස්යොදුන් මූලපටන් ශාඛාග්‍රයට සියක්යොදුන
පූර්වදික් ශාඛාග්‍රයපටන් පශ්චිමදික්ශාඛාග්‍රයට සියක්යොදුන්
දක්ෂිනදික් ශාඛාග්‍රයපටන් උත්තරදික් ශාඛාග්‍රයයට සියක්යොදු
න ශාඛාමණ්ඩලය තුන්සියයක්යොදුන ඒවෘක්ෂයසුපුෂ්පිතකල්හි
කුසුම්ප්‍රභා පනස්යොදුන්තැන් පැතිරසිටිසුවඳ, සියක්යොදුනෙ
හි පැතිරසිටි ඒවෘක්ෂමූලයෙහිදිග ශැටයොදුන් පුළුල පනස්යො
දුන් බොලපසලොස්යොදුන් උන්කලම නාභියදක්වා ගැලීයන්
නාවූ නැගිසිටිකල හෙරිතලයක්සේ සමව තැමතිකැමති සෘතු
වක්දෙන බන්ධුජීවකුසුමදල ආස්තරණයක්සේ රත්වූ පඬුකම්බ
ලනම්වූ ශෛලාසනයෙක්ඇත හැමසර්ඥවරයො එහිවැඩහිඳ
විජව්දෙශති

ඒප්‍රාසාදයට උතුරුදිග. සුධර්‍මානම්දෙව් සභාවෙක්ඇත් ඒ
භූමිය ඉන්ද්‍රනීලමාණික්‍යමයය· භිත්තිස්ඵටිකමාණික්‍යමයය.
සථම්භසුවර්ණමයය ඝටිකා, රජතමයය· ව්‍යාඝ්‍රපන්තිප්‍රවාලමයය
දුවගෝනැස්මුත් තැස්සව්රත්නාමයය, අනාතස්ජදනය ඉන්ද්‍රනී
ලමාණික්‍යමයය, බහිස්ජදනය, සුවර්ණකනකමයය ස්තූපිකාව, ර
ජතමයය' ආයාමවිස්තාරයෙන් තුන්සියක් තුන්සියක්යොදුන, වට
නවසියක්යොදුනඋසපන්සියක්යොදුන,දෙදෙවුලොවඑයටවඩනා
රම්‍යතැනෙක්නැත, දෙවතාවෝ ඒසභාවෙහිරැස්වනකල පාරි
ච්ඡත්‍රකකුසුම්ඔත්සවයට රැස්වෙත්මය, විනිස්චයට රැස්වෙත්
මය, භික්ෂුන්වස්ලැබෙනකල රැස්වෙත්මය. පවුරුණුකලද රැස්
වෙත්මය, දෙවියෝදවස්පතා පාරිච්ඡත්‍රකවෘක්ෂයට ගොස්බලත්
නාහු, එහි පත් විලිකුණුකලම්ද. දවසකින් වැම්මෙසිතියා, උත්
සවක්‍රීඩාකෙරෙති, පත් වගුළුකලම්ද දවසකින් අන්කුරලහී·
සතුටුවකෙලිති අංකුර මූකලම්දදවසකින් කැකුළුගනී සතුටුව
කෙලිති කැකුළුගත්කල මදදවසකින් මුකුලිතවෙයි, සතුටුව
කෙලිති මුකුලිතවූකල මදදවසකිං සුපුෂ්පිතවෙයි' සතුටුව උත්
සවක්‍රීඩාකෙරෙති, ඒවෘක්ෂය සුපුෂ්පිතකල්හි මල්බිදිනාතිසා වෘ
ක්ෂයට නැගෙණ නෑනෑයෙක්නොදඇත, මල්කතුරුගෙන අතු
නමන ක්‍රත්‍යයෙක් නොමඇත, මල්බිදලනාපෙට්ටි පුළුඑලවන
ක්‍රත්‍යයෙක්නොමඇත, එක්සුලහෙක්නැගී මල්තුවට්ටුයෙන් ගල
වයි එක්සුලගෙක් මල්ගෙනසිටවි, එක්සුලහෙක්මල්සුවඳ, සුධ
ර්‍මානම් දෙව්සභාවටගෙනවද්දි, එක්සුලහෙක් එහිමල්පරණ
ලා හැමඅනෙනයෙයි, එක්සුලහෙක් එහිපෙති කෙසරුකෙමිර
දවමින් මල්අතුරෙයි, මධ්‍යයෙහි ධර්‍මාසනයෙක්වෙයි' ඒධර්‍මාසන
මස්තකයෙහි යොදනක් උසරත්න පර්‍යංකයෙක්වෙයි, ඒපර්‍යං
කමස්තකයෙහි තුන්යොදනක්වෙයි. උස දිව්‍යශ්වෙතච්ඡත්‍රයෙක්
වෙයි ඒධර්‍මාසන සමීපයෙහි ශක්‍රදේවරාජයාගේ අස්නෙක්
වෙයි ඉක්බිතිදෙතිස් දිව්‍යපුත්‍රයන්ට අසුන්පනවති ඉක්බිති ම
හානුභාවදෙවියන්ට අසුන්පනවති සෙසුදෙවියන්ට පරසතුමල්
කෙම්ම අසුන්වෙයි. එහිසුගන්ධමකරන්දරේණු කනිකාමඩල
යෙහි පැහැරබැස දේවතාවන්ගේ තුංගවූඋසඇති කනකවනී
ශරීරයලාක්ෂාරස පඤ්ජිකයක්මෙන් තවරයි, ඒධර්‍මාසනයෙහි ස
නම්කුමාරණම් මහාබ්‍රහ්ම අවුත්හිඳබනතියයි, බනදනනා
රහත් මහතෙරකෙනෙක්හෝ ගොස්හිඳ බනතියති සක්දෙවිර
ජහෝ බනතියයි, සනත්කුමාරණම් මහබ්‍රහ්ම බනතියනකල
පඤ්චසිඛදිව්‍ය පුත්‍රයාගේ වේසයගෙනහිඳ බනතියා කුමක්ප්‍රශ්නිය
දයත් ඒපඤ්චසිඛනාම් දිව්‍යපුත්‍රයා තුන්ගව්වක්පමන රත්කඳක්සේ

දිලියෙනනාවූ ආත්මභාව ඇත්තේය. දහසක්හැල්පමන පලදනා පැලඳ යෙලයාලක් ශුවඳ කලලින් විලවුන්ගෙන රත්වූදිව්‍යමය පිළිඇඳරක්ත කුඬලාභරණාදීන් විභූසිතව, ඉසෟක්පස්කොඬයක් කෙටබැඳ ඇවිදිනේය. හැමදේවතාවන්ට ප්‍රියය, එසේහෙයින් ඌගේ වේසයගෙණ ඉඳ බනතියති.

දේවතාවන් සුධර්මානම් දෙව්සභාවෙහි රැස්වනනාම, ධෘත රාෂ්ට්‍ර නම් වරම්මහරාජයා කෙලලක්ෂයක් රජතපලගහා කනකමය අඩයටිගත්ගාන්ධර්ව දිව්‍යරාජයන්පිරිවරා පූර්වදිසාහි ආරක්ෂා ගනනී——විරූළ්හකනම් මහරාජයා කෙලලක්ෂයක් මාණික්‍යපල ගහා රජතමය අඩයටිගත් කෙලලක්ෂයක් කුම්භාඬයන් පිරිවරා දක්ෂිනදිග්හි ආරක්ෂාගනනී——විරූපාක්ෂනම් මහාරාජයා ප්‍රවාල පලගහා කනකමය අඩයටියත් කෙලලක්ෂයක් නාගභවයන් පිරිවරා පශ්චිමදික්හි ආරක්ෂාගනනී——වෛශ්‍රවනනම් මහාරාජයා කෙලලක්ෂයක් මාණික්‍ය පලගහා කනකමය අඩයටිගත් කෙලලක්ෂයක් යක්ෂගවයන්පිරිවරා උත්තරදික්හි ආරක්ෂාගනනී.

මෙසේ ආරක්ෂාගත් දේවතාවන්ගේ කුසුමොත්සව ක්‍රීඩාසාරමසකින් නිමකී ප්‍රථිවීතලයෙහි පටන්ගෙණ කල්පවෘක්ෂ දිව්‍යාභනාවන්නිසා දේවතාවන් ඔවුනොවුන්හා කරණ යුඬශක්‍රදේවේන්ද්‍රයා සන්සිඳුවයි, දේවතාවන්ගේදූද, පුත්හූද ඕපපාතිකව ඇකයෙහිඋපදිති, පාදපරිචාරිකාවෝ යහන්හි උපදිතිඔවුන් පලඳනා පලඳවා සරහන දේවතාවෝ යහනසිසාරා උපදිති මෙහෙකරණ දෙවතාවෝ ඇතුළුවිමානයෙහි උපදිත් ඔවුන් නිසාකරණ විනිස්චයෙක්නැත. යම්කෙනෙක් යම් දෙදෙනෙක් හුගේ සීමාන්තරයෙහි උපනෙනානම් ඔවුන්ත්සා විනිස්චයකොරෙති ඒශක්‍රදෙවරාජයා අසා යුක්තිනිස්චයකොටදෙයි, මෙසේ විනිස්චයද ඒසුධර්මානම් දෙව්සභාවෙහි පවත්නි භික්ෂූන්වස් ලැබෙන දවසුත් රැස්වෙත්මය පවරණදවස් රැස්වූදෙවතාවෝ අදකොයි ගොස් කාකෙරෙහි පවරමෝ දෙහොසී කතාකෙරෙති ඔවුන් කෙරෙන් බොහෝසේ ශක්‍රදෙවරාජයා පොහොහුදිව සිතටහො ලක්දිවටහො ගොස්පවරා දුගොප්මහබොවදී සෙසුදෙවතාවෝපාරිචජ්ජනක කුසුමාදිවූ දිව්‍යකුසුමහා දිව්‍යචඳුන චූර්නගෙන තම තමන්ගේ ඊප්සිතස්ථානයට ගොස් පවරා මහබෝවදිති. ශක්‍රදෙවරාජයා දෙවතාවන් රැස්වන පිණිස මාගේ එක්ෂිවිසිරියන් විජයොත්තරසංඛය එකවරෙක ණාදකෙරෙවයි තුසිතහා පැවති ඒසංඛනාදය සියළු දසදහසක්යොදුන් ශක්පූරයෙහි පැතිරසාරමසකින් සත්හිඳෙයි.

මෙසේ විචිත්‍රවූ ශක්‍රපුරයෙහි ඒකරාජ්‍යකරණාවූ ශක්‍රදේවරාජයා උද්‍යානක්‍රීඩාවට යනවේලෙහි· ධෘතරාෂ්ට නම්මහාරාජයා පැදුම්දිග සක්වලමෝවිට තමාගේසේනාව පිහිටුවා රජතමය ඛඩ්ගධාරී කෙළලක්ෂයක් ගාන්ධර්ව දිව්‍යභටයන් පිරිවරා, හාත්පසින් කෙළලක්ෂයක්තන්හි රජතදණ්ඩදීපිකාධාරී අත්ඇති ශ්වේත වස්ත්‍රාලංකාරයෙන්ශෝභී ශ්වේත අශ්වරාජයකු පිටටපැන නැගී යුගන්ධරමුදුනෙහි ප්‍රාචීනදික්හි ආරක්ෂා ගනී —විරූඪ්හක නම් මහාරාජයා දකුණු සක්වල මෝවිට තමාගේ සේනාව පිහිටුවා අසිතෝමර ගන්නී ලෝත්පලදලාකාර ඛඩ්ගධාරී කෙළලක්ෂයක් කුම්භාණ්ඩ දිව්‍යභටයන් පිරිවරා හාත්පසින් කෙළලක්ෂයක්තන්හි මනිමයදණ්ඩදීපිකාධාරී අත්ඇතිව නීලවස්ත්‍රාලංකාරයෙන් ශෝභී නීල අශ්වරාජයකු පිටටනැගී යුගන්ධර ගල්මුදුනෙහි දක්ෂිණදික්හි ආරක්ෂා ගන්නී —විරූපාක්ෂ නම් මහරාජයා පැලදිග සක්වලමෝවිට තමාගේ සේනාව පිරිවරා ප්‍රවාලමය ඛඩ්ගධාරී කෙළලක්ෂයක් නාගභටයන් පිරිවරා හාත්පසින් කෙළලක්ෂයක් තන්හිප්‍රවාලමය දණ්ඩදීපිකාධාරී අත්ඇතිව රක්තවර්ණ වස්ත්‍ර රක්තවර්ණාලංකාරයෙන් ශෝභී ප්‍රවාලවර්ණවූ අශ්වයකු පිටටනැගීයුගන්ධර ගල්මුදුනෙහි පශ්චිම දික්හි ආරක්ෂා ගනී —වෛශ්‍රවණනම්මහාරාජයා උතුරුදිග්සක්වල මෝවිටෙහි තමාගේ සේනාවසිටුවා කනකමය ඛඩ්ගධාරීකෙළලක්ෂයක් යක්ෂභටයන් පිරිවරා හාත්පසින් කෙළලක්ෂයක්තන්හි කනකමය දණ්ඩදීපිකාධාරී අත්ඇතිව ස්වර්ණ වස්ත්‍රාලංකාරයෙන් ශෝභී ස්වර්ණවර්ණ අශ්වයකු පිටටනැගී යුගන්ධරගල් මුදුනෙහි උතුරුදික්හි ආරක්ෂාගනී—

සුධර්මා නම් ගාන්ධර්ව දිව්‍යපුත්‍රයෙක් සර්වනන්ද නම් භේරියක්කරලා අටසැටදහසක් භේරීන්විසින් පිරිවරණලදුව නොයෙක් දහස්ගනන් දිව්‍යනාටකයන්හා සමග අවට පනස්යොදුන් තන්හි මඬුළුබැඳ ප්‍රාචීනව ක්‍රවාටමස්තකයෙහි ගායනා කෙරෙති –

තිඹරු ගාන්ධර්වදිව්‍යපුත්‍රයෙක් ඒකප්‍රමුඛ නම් භේරියක්කරලා අටශටදහසක් භේරීන්විසින් පිරිවරණලදුව නොයෙක් දහස් ගනන් නාටකයන් හා සමග අටපනස්යොදුන් පමනතන්හි මඬුළු බැඳ දක්ෂිණ චක්‍රවාලමුඛවට්ටියෙහි ගායනාකෙරෙයි—ඒක්ප්‍රමුඛ නම් ගාන්ධර්ව දිව්‍යපුත්‍රයෙක් මහාභාණ්ඩ නම් භේරියක්කරලා අටසැටදහසක් භේරීන්විසින් පිරිවරණලදුව නොයෙක්දහස්ගනන්

දිව්‍යනාටකයන් හා සමග අවට පනස්යොදුන්තැන්හි මිඬුළුබැඳ පශ්චිම මුඛවට්ටියෙහි ගායනාකෙරෙයි—පංචසිඛ නම් ගාන්ධර්ව දිව්‍ය පුත්‍රයෙක් පූර්ණස්වරණම් හෙරියක්කරලා අටශතදහසක් හෙරීන් විසින් පරිවරණලදුව නොයෙක් දහස්ගණන් දිව්‍යනාටකයන් හා සමග අවට පනස්යොදුන් තැන්හි මඬුළුබැඳ උතුරුසක්වල මුවට්ටසිට ගායනාකෙරෙයි—

මෙසේයිත් සතරපාර්ශ්වයෙහි සතරවරම් මහරාජයන්විසින් ගත් ආරක්ෂා ඇතිව හාත්පසින්දක්ව කළද නෘත්‍යගීතවාදනාදීන් දක අසා සතුටුවෙමින් ශක්‍රදේවරාජයා උද්‍යානක්‍රීඩාවට යන්නේය ඇතම්කලෙක්හි විශ්වකර්මනිර්මිත නාරිවාහනඇති රත්න මණ්ඩපයකින් යෙයි—ඇතම්කලෙක්හි දිව්‍යඅසවයන් දහසක්යෙදූ පංචවර්ණ ධ්වජපන්තින් යැවසීගත් යෙලසියයක්යොදුන් වෛජයන්තනම් සත්රුවන් රථයකින් යෙයි—ඇතම්කලෙක්හි ඓරාවනනම් හස්තිරාජයාගේ දිග යෙලසියයක්යොදුන් උස අනූයොදුනක බොල පස්යොදුන ඔහුගේ තෙතිස්කුම්භයෙක්වෙයි එකි එකි කුම්භයෙක්හි දිගින් පනස් පනස් යොදුන් සත් සත් දලෙක් වෙයි එකී එකී දලෙන්හි සත් සත් පුෂ්කරණීහුවෙති. එකි එකී පුෂ්කරණීයෙක්හි සත් සත් නෙළුම්ලියවෙයි එකි එකී ලියෙක්හි සත් සත් පියුම්වෙයි එකි එකී පියුමෙක්හි සත් සත් පෙතිවෙයි. එකි එකී පෙතෙක්හි සත් සත් සම්මුඛනත්පිරිවරා සත් සත් දෙවඟනාසිට නටති. මෙසෙයින් ශදී ඇත්රජ්ජපිට දිග පනස්යොදුන් උස පසළොස්යොදුන් රත්නමණ්ඩපයෙක්වෙති. මණ්ඩපයෙහි සුදර්ශනනම් මහාකුම්භයෙහි දෙලොස්යොදුන් රත්නමණ්ඩපයෙක්වෙයි ඒ මණ්ඩපයෙහි සුවාසුදහසක් රත්න ස්ථම්භවෙයි. එකි එකි ස්ථම්භයන්වැලදී සත් සත් රත්නකුසුමලතාවෙයි. උඩද අනේකසහශ්‍ර මාලාදාමලතිකාවෙයි. අතරතුරෙහි සත්රුවන්මය ධ්වජපන්තිවෙයි ඒ ඒ ස්ථානයෙහි ලම්බමානමාණික්‍යමය කිංකිණිකජාලාවෙයි ඒජාලාවෝ වනමාරුතයෙන් පහරණලදකල්හි පංචාංගිකතූර්‍යනාදයෙන් නාදකෙරෙති. ඒ මණ්ඩපයාගේ අවට මාණික්‍යමයවෙදිකාවෙයි පිටත ආයුධගත් අත්ඇතිව අටවිසි යක්සෙනෙවියෝ සිටිති. ඒ වෙදිකාවෙන් ඇතුලත දේවරාජයාකෙරෙ වලලභවූ මහානුභාව දෙව්යොසිටිති—

.දෙපාර්ශ්වයෙහි දෙතිස්කුම්භපිහිටි රත්නමණ්ඩපයෙහි දෙතිස්දෙව් රජ්ජුහිඳිති, මධ්‍යයෙහි සුදර්ශනනම් මහාකුම්භයෙහිපිහිටි දෙලොස් යොදුනක් රත්නමණ්ඩපයෙහි යොදනක්පමන මාණික්‍යපර්‍ය්‍යංකයෙහි තුන්යොදනක්උස රුවන්සේසතට ගැලක්පමන ආභරණ

පැළඳ ගෑලක්පිරූ සුවඳගල්වා අහසගිරිවෙහෙර හා තෝබුදෙ
කක් පැලඳ මහවැලිගඟ හා මුත්හරක් කරලා මෙසේ සර්වාභරණ
යෙන් විභූසිතව ශක්‍රදේවේන්ද්‍රයා හිඳිනේය ශක්‍රදේවරාජයාගේ
සුධර්මා නම් භාර්‍ය්‍යා දිව්‍යාභරණයෙන්සර්ජිතව නොයෙක් ලංකා
ගණන් දිව්‍යාඞ්ගනාවන් පිරිවරා අභිමුඛයෙ හිඳිනීය, එපරිදෙ
න්ම සුජාතා නම් භාර්‍ය්‍යාද නන්‍දා නම් භාර්‍ය්‍යාවද චිත්‍රා නම් භාර්‍ය්‍යා
වද දිව්‍යාභරණයෙන් සර්වසර්ජිතව දිව්‍යාඞ්ගනාවන් පිරිවරා දක්ෂිණ
පාර්ශ්වයෙහි වාම පාර්ශ්වයෙහි පිටිපස්සෙහියැයි යන තුන්දිසා
වෙහි හිඳිති. වලලුහවු දෙයාශූදහසක් සත්දෙව්දු සර්වාභරණ
විභූසිතවරත්නාසටිකා ආදීවූ පානීය භාජනගෙණ සිටිති, නො
යෙක්දහස් දිව්‍යකන්‍යාවෝ පූර්ණකලස්ගෙණ පිරිවරා සිටිති
නොයෙක් දහස් සුරසුඳුරියො වාද්‍යරභස්‍යෙහි නවති අලම්බුසාදි
වූ ප්‍රධාන දිව්‍යනාටක ස්ත්‍රීන්කෙරෙහි ගඞ්ගාරාණම් දෙව්දුවක්
මහාවිනා නම් වීනාවක්ගායනා කෙරෙමින් සිටි, ඒ වීනාවට ප
රිවාරශැට දහසක්වීනා තෙමෙනාදකෙරෙ——සුයාම නම් සුර
සුඳුරියක් සුන්දරාරව නම්වංශියක් පිඹ පිඹ සිටි එවඞ්ශයට ප
රිවාර ශටදහසක්වංශ තෙමෙම නාද කෙරෙයි අභිරූපියා නම්
දෙව්දුවක් මධුරස්සර නම් නකුලවීනාවක් ගායනා කෙරෙමින්
සිට ගඟනි එවිනාවට ශටදහසක් පරිවාර වීනාතෙමෙම නාද කෙ
රෙයි මනිමෙඛලා නම් දෙව්දුවක් විජයොත්තරණම් සංඛයක්
පිඹ පිඹ සිටි එම්සංඛයට පරිවාර ශටදහසක් සංඛ තෙමෙම නාද
කෙරෙයි——මනොහරණම් දෙව්දුවක් ප්‍රතිබිම්බ නම් මුදඟබෙ
රියක් ගසගස සිටි ඒබෙරියට පිරිවර ශටදහසක් බෙරිතෙමේ
ම නාදකෙරෙයි——අතිවෘත්තිකනම් දෙව්දුවක් ආනන්ද ජනක
නම් මෘදඞ්ගබෙරියක් ගස ගසාසිටි එබෙරියට පිරිවර දහසක්
බෙරිතෙමේම නාදකෙරෙයි——නන්‍දා නම් දෙව්දුවක් කොල
ස්වරණම් වීණාවක්ගායනා කෙරෙමින් සිටි එවිනාවට පරිවාර
ශටදහසක් කොලස්වරවීනා තෙමේම නාද කෙරෙයි——මනො
හරීනම් දෙව්දුවක් දිසාප්‍රමුඛ නම් එකවජ්‍ර බෙරයක් ගස ගසා
සිටි එබෙරියට පරිවාර ශටදහසක් එකවජ්‍ර බෙරිතෙමේම
නාදකෙරෙයි——යාමනන් දෙව්දුවක් චිත්‍රස්සාරණම් පටහයක් ගස
ගසාසිටි එපටහයටපරිවාරශටදහසක් පටහතෙමේම නාදකෙරෙයි
ඝොරස්සරණම් දෙව්දුවක් මධුරස්සරණම් මණිපර්වතයක් ගස
ගසාසිටි, ඒමනිපර්වතයට පරිවාර ශටදහසක්මනි පර්වතතෙමේ
නාදකෙරෙයි——සර්වාඞ්ගශොභනානම් සුරසුන්දරියක් ජ්‍රවිඝොෂා
නම් මහාබෙරියක් ගසගසා සිටි ඒබෙරියට පරිවාරශැටදහසක්
බෙරිතෙමේම නාදකෙරෙයි——

මෙසේහින් නොයෙක් දහස්ලක්‍ෂ සුරසුන්දරීහු නානා නාම යෙන් විසිෂ්ටවූ ආතත විතත ඝනය සුසිරය, යන පංචාංගික තූර්‍ය්‍ය නාදයන් ගෙණහස ගසා සිටිති එකී එකී තූර්‍ය්‍යයට පරිවාර ෂැට දහසක් තූර්‍ය්‍යතෙමේම නාදකෙරෙයි, මෙසේහින් දෙදෙව් ලොව්දේවතාවන් අනුගතව ලෝකපාලයන් විසින් ගත්ආරක්‍ෂා ඇතිව අටවිසි යක් සෙනෙවියන් පමුනුවන දිව්‍යසෙනා ව හා සමග සත්රුවන්මයකල සාදිසලිලභාජන දරාඅඩු තුන්කෙලක් පුරස්ත්‍රීන් විසින් පිරිවරණලදුව සුවිසිකෙලක් දිව්‍යනාටකයන්ගේ නෘත්‍යගීතවාද්‍යයෙන් සන්තුෂ්ටවෙමින් උද්‍යාන ක්‍රීඩාවට ගොස් ඒකපුණ්ඩරීකනම් උද්‍යානයට වැදවාක් විසය නොවනනාවූ උද්‍යානශ්‍රී අනුභව කෙරෙමින් රීසිහුනු කලක්එහි වැස නැවත වෛජයන්තනම් ප්‍රාසාදයට යන්නේය—

මෙසේවූ දිව්‍යරාජශ්‍රී සම්පත්තියට පැමිණ ශක්‍රදිව්‍යරාජද තුන් කෙලශට ලක්‍ෂයක් අවුරුදු මුළුල්ලෙහි දිව්‍යසම්පත් අනුභවක කරන්නේහී—මේශක්‍රසම්පත්ආදි දෙදෙව්ලොව දිව්‍යසම්පත්ති යටද බුද්ධානුසාශනාවන්ගේ ශ්‍රවනධාරණාදීයෙහි යෙදුනසත්ව යෝ පැමිණ එහිනොයෙක් දිව්‍යසම්පත් විඳිනාහුයි—තවද—

ඉතොප්පභූතිදෙවෙසු, රාජ්ජානංවිභවොපන,
නසක්කාහොතිවන්නෙතුං අබුධෙනයතොතතො,
තණ්ණුත්තානුමානෙන විඤ්ඤෙය්‍යොව සුබොදයො—

යනුහෙයින් මෙතැන්පටන් යාමදෙව්ලොව ආදී සෙසු දිව්‍ය ලෝකවල දිව්‍යරාජයන්ගෙ දිව්‍යසම්පත්වනාහී යම්හෙයකින් බුදුනොවූ අන්‍යසිවක්හු විසින් වර්‍ණනාකරන්ට නොහැකිවේද එහෙයින් එහි ආයුසය පමනදක්වූකල ඒක්‍රමයෙන් සියළුසම්පත් ද, එකිනෙකට වැඩිගියබවබලා අනුමානයෙන් සියළු දිව්‍යසැ පය පහලවීම මහත්බවදත යුත්තේය—එහි තුන්වෙනි යාම නම් දෙව්ලොව උපන්නාවූ බුද්ධානුසාශනා ශ්‍රවනධාරණ දියෙ හියෙදුන සත්වයොමිනිස්ලොව ආයුගනනින් තුදුස්කෙල සත ළිස්ලක්‍ෂයක් අවුරුදු එහි දිව්‍යසම්පත් අනුභවකොට ඒසියළු දිව්‍යසම්පත්තියෙනුදු අලංකෘතවනනාහුයී—එසේම සතරවෙනි තුසිපුර දෙව්ලොව උපනනාහු විසින් ලොවආයුගනනින් සත් පනස්කෙල සැටලක්‍ෂයක්අවුරුදු එහි දිව්‍යසම්පත් අනුභවකොට ඒසියළු දිව්‍යසම්පත්තියෙනුදු අලංකෘතවනනාහුයි—එසේ ඒප ස්වෙනි නිර්මානරති දෙව්ලොව උපනනාහු එම්මිනිස්ලොව ආයු ගනනින් දෙසියසතළිස් ලක්‍ෂයක්අවුරුදු එහිදිව්‍යසම්පත් අනු භවකොට ඒසියළු දිව්‍යසම්පත්තියෙනුදු අලංකෘත වන්නාහුයි—

එසේම සවෙනි පරනිර්මිත වසවර්තිදෙව්ලොවඋපන්නාහු එහි මිනිස්ලොව ආයුගණනින් නවසිය එක්විසිකෙළ ශැටලක්ෂයක් අවුරුදු එහි දිව්‍යසම්පත් අනුභවකොට අප්‍රමාණවූ ඒ දිව්‍යසම්පත්තියෙහුදු තෙමෙම අලංකෘතවන්නාහුයි—

මෙසේ බුද්ධානුශාසනාශ්‍රවනයෙන් දසකුසලධර්මයෙහි හැසුරුණු සත්ත්වයෝ සදෙව්ලොව නැවත නැවත අනුලොමප්‍රතිලොම වසයෙන් ඉපද බොහෝ දීර්ඝකාලයක් රූපශබ්දගන්ධරස ප්‍රෂ්ටව්‍ය සංඛ්‍යාත දිව්‍යවූ පංචකාමශුප අනුභවකෙරෙමින් සතුටුවන්නාහුයි-

මෙ සදෙව්ලොව දිව්‍යසම්පත් මහත්බැව් කෙසේදයි නිව හොත්—

සයොගසුභෙට්ඨිමසුඛං චක්කවත්තිසුඛෙනහි,
පානිමත්තකපාසානං හිමවන්තං නරංමතං.

යන්හෙයින් දෙව්ලොවඅතුරෙහි හැමටපානවූ චාතුර්මහාරාජිකයෙහි හැමටඅඩු ඉතා දිළිඳු දුක්පත් දෙවියකුගේ දිව්‍යශැප ඓශ්වර්යශැප යටකියනලදක්‍රමයෙන් මිණිස්ලොව අතිවිස්තරවසයෙන් චක්‍රවර්තිරාජ්‍යශැපයහා සඳිසකොට උපමාකරත්හොත් තුන්දහසක්යොදුන් හිමාලපර්වතයටඅවුත් ලාක්ෂාස්වල්පගල්කැටක් උපමාකිරීමවැන්න· එහෙයින් සදෙව්ලොව දිව්‍යසම්පත් උපමාවකින්වත් නොදක්වියහැකි මහත්බව දතයුතු-මේ සියළු දිව්‍යසම්පත්තීන්ටද බුද්ධානුශාසනා ශ්‍රවනධාරණාදියෙහි යෙදුනු සත්ත්වයෝ පැමිනෙන්නාහුයි—ඒවරූපංකාම භවසම්පත්තිං අනුභවිත්වා රූපභවසම්පත්තිම්පි අනුභවිතුකාමෙන උපාසකජනෙන—යනාදී උපාසකජනාලංකාරයෙහි කී හෙයින් මෙබඳුවූ උපමාවිසයාතික්‍රාන්ත අග්‍රවූ පංචකාමසම්පත් අනුභවකොට රූපභවසම්පත්තියද අනුභවකරණුකැමති උපාසකොඋපාසිකා ජනයන් විසින්—

පියොචගරූභාවති යොවත්තාවචනක්ඛමො,
ගම්භීරඤ්චකථංකත්තා නොචට්ඨානෙනියොජකො-ති

මේආදි කල්‍යාණගුණ සමන්විත යහපත් කල්‍යාණමිත්‍රයෙකු කරා පැමිණ විසුද්ධිමාර්ගයෙහි කී ක්‍රමයෙන් චරිතානුකූල කර්මස්ථානයන්ගෙණ කායට භාවනාවිභාගානිසංස කී තැනද· ප්‍රකාසක්‍රමයෙන් කාමච්ඡන්දය, ව්‍යාපාදය, ථිනමිද්ධය· උද්ධච්චකුක්කුච්චය, විචිකිච්ඡාය, යන පංචනීවරණ අකුසලධර්මයන් පහකොට විතර්කවිචා

රය ප්‍රීතිය. සුඛය සිත එකග්‍රතාවය යන පඤ්චාංගයෙන්යුක්තවූ
ප්‍රථමධ්‍යානාදිය වැඩියයුතු—එහි ප්‍රථමධ්‍යාන ද්විතීයධ්‍යාන තෘතීයධ්‍යා
න යනමොවුහු හීන මධ්‍යම ප්‍රණීතවසයෙන් තුන්තුන් මෙතුන්ධ්‍යාන
යන් හැවූවො බ්‍රහ්මපාරිසද්‍යාදී නවබඹතෙලෙහි උපදීත්ප්‍රකාර
වේ—

ඒ කෙසේදයත්—ප්‍රථමධ්‍යානය උපන්පමනකින් ආසේවිත
භාවිතනොකලේ වසීප්‍රාප්තනොවූයේ. හීනනම්වේ. බහුලීකෘත
වසයෙන් වඩාවසීභාව අපරිපූර්ණව එකෙක් දෙකෙක් වසීතිප්‍රා
ප්තකලහොත් මධ්‍යම්වෙයි—පඤ්චවසිතාප්‍රාප්තකල මහත් ප්‍රණීත
නම්වෙයි· එහි පඤ්චවසිතාවෝ නම්—ආවර්ජණය, සමාපජ්ජණය,
අධිට්ඨාණය, උට්ඨාණය, පච්චෙක්ඛනයයි යන මොහුයි—එයින්
ප්‍රථමධ්‍යානය හීනවබැවූ නොපිරිහුන ධ්‍යානව කාලක්‍රියාකොට
බ්‍රහ්මපාරිසද්‍යනම් බඹලොව උපදීත් එසේම මධ්‍යමව හැවූ
වො බ්‍රහ්ම පොරොහිතනම් බඹලොව උපදීත්—ප්‍රණීතව බැවූ
වොමහා බ්‍රහ්මනම් බඹලොව උපදීත්—මේ බඹලොව තුනම
සම බිමකවූතුන්රටක්සේ සමව පිහිටියාහුයි——ද්විතිය ධ්‍යානය
ද කියනලද ක්‍රමයෙන් තුන්ප්‍රකාරව හැවුවො එසේම පිළිවෙළින්
ප්‍රථමධ්‍යාන භූතලයට මතුයෙහිවූ පරිත්තාභය අප්පමාණාභවය
ආභස්සරයයන තුන්තලයෙහි උපදීත් මේතුන්තලයද, පලමුනී
තුන්තලයසේ සමානතලයි——තෘතීයධ්‍යානයද කියනලද ක්‍රම
යෙන් හැවුවො එසේම ද්විතීයධ්‍යාන තුන්තලයටමතුයෙහි පිහි
ටි——පරිත්තසුභය—අප්පමාණසුභය—සුභකිණ්ණකය යන තුන්
තලයෙහි එසේම පිළිවෙළින් උපදීත්, මේ තුන්තලයද පලමුනී
වාසේම සමාන තලයි—චතුර්ථධ්‍යානය සංඥාවිරාගභාවනා ව
සින් ප්‍රථක්ජනයන්ට උත්පත්තිස්ථාන විසින් සද්ධාදි ඉන්ද්‍රි
යන්ගේභේද වසින් හැවූවොමෙකී නවතලයෙන් මතුයෙහි පිහි
ටි' වෙහප්ඵල නම් බඹලොව ආදිකොටඇති මතෙහිවූ සත්තල
යෙහි උපදීත්——මේ සත්තලයෙහි ආදිවූ බ්‍රහත්ඵලනම්ලද වේ
හප්ඵල අසඤ්ඤසත්තදෙතලය පලමුකීවාසේම සමානව පිහිටි බැ
වූයේය——මේ දෙතලයෙන් මතෙහි, අවිහය, අතප්පය, සුද
ස්සය, සුදස්සිය, අකනිෂ්ඨය යනපඤ්චසුද්ධාවාසය, ඒයට එයටම
තුව වූයෙය——අනාගාමීයන්ටම වාසස්ථානයෙහින් සුද්ධාවාස නම්
එහි ප්‍රථුජ්ජන සත්වයොනූපදිත්. සෙසුබඹලොවල උපදින්මය
පඤ්චසුද්ධාවාසයෙන් මතුයෙහි අරූපධ්‍යාන භූවූවොඋපදනා ආකා
සානඤ්චායතනය——විඤ්ඤාණඤ්චායතනය— ආකිඤ්චඤ්ඤායතනය——
නෙවසඤ්ඤානාසඤ්ඤායතනය, යනසතර අරූතලයද, එයට
එයට මතුමතුයෙහි වූයේය, මේසතර අරූතලයෙන් මතුයෙහි

සත්වාවාසයක් නැතිහෙයින් අජටාකාසනම්වේ—චතුර්ථධ්‍යානයෙ
හි භවාඞ්ග සිත්නැති උවහොත් යෙහෙකැයි සිතාස
ඥා විරාග භාවනාකලාහු, අසඥසත්වයන් කෙරෙහි උපදිති
ඔවුන්ට සිත් නොවූපදි—මිනිස්ලොවදී හෙව කාලක්‍රියා කලාහුවී
නම් අසඥබ්‍රහ්මලොව උපනදිහොවිති—හිඳ කාලක්‍රියා කලාහුවී
නම් එහිදුහිඳිති—සිටකාලක්‍රියාකලාහු වී නම් සිටිති—එදෙව්ලො
ව පිළිමරුවැතිවීය—එහිඋපදනො කම්වාදීක්‍රියාවාදී තීර්ථකය
හ ඔහු මෙසේ වරදවාගෙණ උපදීත්—නාස්ති හෙතුක අක්‍රි
යා ක්‍රියාවාදීතීර්ථකයෝවූකලි අපායෙම්ස අනික්තැනක නොඋප
දිති. නරකයතිතියතයි—චතුර්ථධ්‍යානවඩා භාවනාකල බුඩාංකු
ශාසනාවෙහි පිහිටි බුද්ධශ්‍රාවකයොද සවෙති වෙහප්ඵලනම්
බ්‍රහ්මලොව උපදීත්—එමව චතුර්ථධ්‍යානය හුවූඅනාගාමිහුවූකල සර්ධා
ඉන්ද්‍රිය අධිකවුවහොත් ආයුෂ්ගුණානුභාවයෙන් පංචසුද්ධාවාස
යන් අතුරෙන් සැමටපාත අව්හනම් බ්‍රහ්මලොවඋපදීත්—වීර්‍යඉ
න්ද්‍රිය අධිකවුවහොත් අතප්පනම් බ්‍රහ්මලොව උපදීත්· සතිඉන්ද්‍රිය
අධිකවුවහොත් සුදස්සනම් බ්‍රහ්මලොව උපදීත්. සමාධිඉන්ද්‍රිය අධි
කවුවහොත් සුදස්සිනම් බ්‍රහ්මලොව උපදීත්, ප්‍රඥාඉන්ද්‍රියඅධිකවුව
හොත් අකනිෂ්ඨනම් බ්‍රහ්මලොව උපදීත්, අරූපධ්‍යාන සතරින්
ආකාසානන්තායතනය හුවූවෝ ආකාසානන්තායතන බ්‍රහ්මලො
ව උපදීත්. විඥානානන්තායතනය හුවූවො විඥානන්තායත
න බ්‍රහ්මලොව උපදීත්. ආකිංචඥායතනය හුවූවො ආකිංචඥා
යතනබ්‍රහ්මලොව උපදීත්. නෙවසංඥානාසංඥායතනය හුවූවො
නෙවසඥා නාසංඥායතන බ්‍රහ්මලොව උපදීත්—යටකියනලද
අසඥසත්වනම් බ්‍රහ්මලොව රූපස්කන්ධය පමන උපදිසෙසු වෙද
නාදී සතරකද නොඋපදීත්—හැමට මතුයෙහිවූ අරූපල සත
රෙහි උපන්බ්‍රහ්මා රූපස්කන්ධය, තුපදී ඉතිරිවෙදනාදී සතර
කඳඋපදී මෙදෙනැතින් ජටන උපදනාසත්නට පංචස්කන්
ධම උපදී—

මේ විසිබ්‍රහ්මලොව සත්හු ධ්‍යානවඩා භාවනාකොට උපදිත්මය.
පුරුෂයො ධ්‍යානභාවනාකොට උපදිත්මැයි—යටකී කාමභවයෙහි
ලං ස්ත්‍රීන්ට ස්ත්‍රීන්ද්‍රිය උපද්දී පුරුෂයන්ට පුරුෂේන්ද්‍රිය උපද්දී බ්‍රහ්ම
ලොව උපන්කලවනාහි ඉන්ද්‍රියදෙකම නොඋපද නොඋපදී. එබැ
වින් බ්‍රහ්මලොව ස්ත්‍රීහ පුරුෂයහ යන වෙනසෙක්නැත. හැමදෙ
න එකාකාරවෙත්—එසිත්වූනව කාමාවචරභවයෙහි උපන්කල
ස්ත්‍රීන්ට ස්ත්‍රීන්ද්‍රියවෙයි· පුරුෂයන්ට පුරුෂේන්ද්‍රියවෙයි—අසංඥසත්වය
නම් බ්‍රහ්මලෙ උපන් බ්‍රහ්මු වස්ත්‍රාභරණයෙන් ශුද්ධ රූපකාය
ඇතිවෙති· ආදුසඤසනුත් අධිකවෙත්· තුබුපසලොස්රූබ්‍රහ්මලොව

උපන් බඹහු චක්‍ෂුරාභරණයෙන්සැදුනු රූපකායද ඇතිවෙති. උද්‍යානවිමාන ආයුවර්ණයශසආදි ප්‍රත්‍යාදිහුත් අධිකවෙත් - අරූතලවල උපන් බඹහු ආයුසයආදීප්‍රත්‍යාදීන් අධිකවෙත්: රූපබ්‍රහ්මතලයෙහි චක්‍ෂුරින්ද්‍රිය ඇතිවෙයි. ඒ චක්‍ෂුව ආශ්‍රයකල විඥාන ඇතිවෙයි. ශේ දර්ශනානුත්තරියවූ බුද්ධරූප දක්නාසඳහායි—ශ්‍රෝත්‍රෙන්ද්‍රියද ඇතිවෙයි. තදාශ්‍රයවූ ශ්‍රොත්‍රවිඥානයද ඇතිවෙයි ශේ ශ්‍රවණානුත්තරියවූ ධර්මශ්‍රවණයසඳහායි-අවශිෂ්ටවූ ඝ්‍රාන නිමිත්තාද්‍යහු ලක්‍ෂණමාත්‍රාව ඇතිවෙත්—තදාශ්‍රයවූ ඝ්‍රාණෙන්ද්‍රිය ජිව්හෙන්ද්‍රිය කායෙන්ද්‍රිය යන මොහු නොඋපදනාහුයි: ඒ ඉන්ද්‍රියයන තුන්දෙනාගේ නොවීමෙන් තදාශ්‍රවිඥානද නොඋපදී: ඒ බඹහු බුදුන් ඇතිකලඅවුත් බුදුන්දක්නාහ බණඅසනනාහ. එසේ නැතිකල ධ්‍යාන සමාපත්තීන් තපස්වීන්සෙයින් වාසයකෙරෙත්—රූපතලවල උපන් ප්‍රථුජ්ජනයෝනම් රූපාරූප අෂ්ටසමාපත්ති උපයති. ආර්‍ය්‍යයෝවීනම් මතුමතුයෙහිවූ මාර්ගඵල උපදවත්: මේ එකුන්විසි බඹතලයෙම උපන් ආර්‍ය්‍යයෝ යට යට නොඋපදිත් මතුමතුයෙහිම උපදිත්—වේහප්පලය අනතිෂ්ටය නෙවසංඥා නාසංඥායතනය යන භවසීමයෙහි උපන් ආර්‍ය්‍යයෝ එයින්බැහැර අමුතුතැනක නොඋපදිති ඒහිමසිට නිරුපධිශෙෂ නිර්වාණධාතුවෙන් පිරිනිවෙත් ප්‍රථුජ්ජනසත්ත්වයෝ පචසුඛාවාසහැර තුබුසවිසිතලයෙහි උපදීත්—උන්මත්තකයෝ තමන්ගත්පැස අසුචිගෙණ බහාලත්මය. සත්රුවන්ලද ඒ ගෙණ බහාලත්මය. එසේම උන්මත්තයන් ගත් පැසක්වැනි ප්‍රථුජ්ජනසත්ත්වයෝ කලක් සතරඅපායෙහි උපදනට නිසි අසුචිවැනිවූ අකුශලකර්ම සිද්ධකෙරෙත්. සමහරකලක සුගතියඋපදනට නිසි සත්රුවන්වැනි යහපත් කුසලකර්ම සිද්ධකෙරෙත—

බඹලොව ආයුස කොපමනෙක්දයත් —විසිබඹතලයෙහිආදිවූ ප්‍රථමධ්‍යානතලතුනින් බ්‍රහ්මපාරිසද්‍යයෙහි. කපින් තුනින්එකකට ආයුසය. බ්‍රහ්මපොරොහිතය කපින් භාගයකට ආයුසය. මහාබ්‍රහ්මතලයෙහි කල්පයකට ආයුසයි-ද්විතියධ්‍යානතල තුනින් ආදි පරිත්තාභා නම් තලයෙහි කල්පදෙකකට ආයුසය-දෙවන අප්පමාණාභානම්තලයෙහි සතරකල්පයකට ආයුසය-තුන්වන ආභස්සර තලයෙහි අටකල්පයකට ආයුසයි-චතුර්ථධ්‍යානතල සත ආදිවූ වෙහප්ඵලයෙහිදු අසංඥසත්යෙහිදු පන්සියයක් කල්පයට ආයුසයි-සුද්ධාවාස පසින්ආදිවූ අවිහතලයෙහි දහසක්කල්පයකට ආයුසය-දෙවන අතප්පනම්තලයෙහි දෙදහසක්කල්පයටආයුසය-තුන්වන සුදස්සනම්තලයෙහි සාරදහක්කල්පයට ආයුසය-සතරවන සුදස්සීනම්තලයෙහි අටදහසක්කල්පයට ආයුසය-පස්වන අකනි

භව තලයෙහි සොළොස්දහසක්කල්පයට ආයුසයි-අරූ තලසතරින් ආකාසානඤ්චායතනයෙහි විසිදහසක්කල්පයට ආයුසයි-විඤ්ඤාණඤ්චායතනයෙහි සතලිස්දහසක් කල්පයට ආයුසය-ආකිඤ්චඤ්ඤායතනයෙහි සැටදහසක්කල්පයට ආයුසය-නෙවසඤ්ඤා නාසඤ්ඤා යතනයෙහි සුවාසූදහසක්කල්පයට ආයුසයි—

එවංවිධෙනෙක විභූතිසාරෙ කාමෙභවෙරූප භවෙතථෙරපි.
පජොතිසීලාදිගුණෙනයෙන කොනාමතස්මිංනබුධොපමජ්ජෙ.

යම්හෙයින් මෙබඳුවූ අනෙප්‍රකාර සම්පත්සාරයෙන් සෝභමානවූ කාමභව රූපභව යන තුන්තැන්හි සියළුසම්පත්තියට සත්වතෙම යම් සීලාදි ගුණධර්මයන් පූරණයක් හෙතුකොටගෙණ පැමිනෙන්නේවීනම් ඒ සීලාදිගුණධර්ම පූරණයෙහි කවරනම් ප්‍රඥයෙක් ප්‍රමාදවන්නේද, නොපමාවන්නේමැයි—

මෙසේ සංක්ෂෙපයෙන් ලෞකිකසම්පත් ප්‍රකාශවූ කාමභව රූපභව අරූපභව විභාගානිසංසදක්වා ඊට ඉක්බිතිව ලොකොත්තර සම්පත්විභාගද මදක් මෙහි දක්වනුලැබේ-ඒ කෙසේදයත්-උපාදානස්කන්ධසංඛ්‍යාත ලොකතොඋත්තරන්ති, උත්තිණ්ණාති වා ලොකුත්තරාති එවං ලද්ධනාමසම්පත්ති—එබැවින් සියළු සසර දුකට මූලකාරණවූ පංචස්කන්ධසංඛ්‍යාත ලොකයෙන් සත්වයා එතරවූවාහුනුයි කියා හෝ ලොකොත්‍රයයි මෙසේලදනම්ඇති සම්පත්තිතොමෙ ලොකොත්තර සම්පත්තිනම්වේ—ඕතොමෙ ශ්‍රාවකබොධිය ප්‍රත්‍යෙකබොධිය සම්‍යක්සම්බොධියයි කියා තුන්වැදෑරුම්වේ—තවද—

ඣායීනොඅම්තාභාවෙ පීතිබක්ඛාමහිද්ධිකා,
බ්‍රහ්මානොකොසුඛංතෙසං නමූතිවනනායිස්සති-

යනාදී කී හෙයින් ධ්‍යාන සම්පන්නවූ ප්‍රමාණාතික්‍රාන්ත ශරීර ප්‍රභායෙන් දිලියෙන ප්‍රීතියම්ආහාරවූ බ්‍රහ්මරාජයො ඒකාන්තයෙන් මහත් ඍද්ධ්‍යනුභාව ඇත්තාහුය· ඔවුන්ගේයසශපආදී සියලල බුදු නොවූ අනිකෙක් වර්ණනාකෙරෙද නොහැකිමැයි—බ්‍රහ්මලොක අතුරෙන් පාත බඹලොව ත්‍රිභාග කල්පයට ආයුසය මතෙහි බඹලොව අසූසාරදහසක්කල්පයට ආයුසයි—කල්පයනම්—සතර ගවු දිග පුළුල උසඇති කොටුවෙක. සෙවනසෂීපපුරා එයින් වශී සියයක් සියයක් ගියකල එතිනෙක හැරදමා යම්තාක්කලකින් ඒ සියළු සෂීපරායිය ගෙවීගියේවීනමුත් අවුරුදු නොගෙවතහෙ

සිත් එයටවඩා කල්පය දික්වන්නේයි එහෙයින් ඉතා දික්වූ ආයු සයෙන් දනයුතුවූ මහත්ඔවුන්ගේ ඒ සියළු සම්පත් මේ කුනුශරීරයෙන් ඉතා මදකාලෙකින් ශෑදියයුතුබැවින් එහි නොපමාවියයුතු. නොයෙක් කල්ප,සියදහස්ගණන් පවත්නා යම් බ්‍රාහ්මණකෙනෙකුන්ගේ මනොමයවූ ආයුෂආදි සියල්ලෙක්ඇද්ද, ඔවුන්ගේ ඒ සුඛාග්‍රයට කවරනම් උපමාවක්වීද, නොවන්නේමැයි—මෙහි යම් කුසලයෙක් නිවන්ශපදේද ඒ කුශලය ශ්‍රෙෂ්ඨවෙයි: යම්කුසලයෙක් බඹලොව උදුරවූ බ්‍රහ්මශසදේද· ඒ කුශලය මධ්‍යමනම්වෙයි: යම් කුශලයෙක් කාමලොව උපදවා සවල්වූ පචකාමශපහා අන්‍යවූද සියළු හිතශප සාධාද්දේද. ඒ කුසලය හීනවෙයි—තවද—

සුදුල්ලභං බුබ්බුලදුබ්බලංඉමං,
සරීරමෙවං විධපුඤ්ඤසාධකං
අපුඤ්ඤකම්මෙසු පයොජයංජනො,
සිමන්තරුමුඛා පතිතොවසො මියො.

යනාදී කීහෙයින් අතිසයින් දුලීහවූ, දියබුබුළුසේ ඉතා දුර්බලවූ' මේකුනුශරීරය, මෙබදුපින්කතත් ශෑදීමට හේතුවේද පනිටවේද, ඒශරීරය අකුසල්නිර්මෙහි යොදන සත්‍වතෙම මහමෙර මුදුනෙන් ගැලවීවැටුනු සත්‍වයාමෙන් නැවත සෝකයට පැමිණෙන්නේයි, යම්සේ සෂ්ප්‍රමාණවූ බිජුවටින් සියගණන් ශාඛා ප්‍රශාඛාදීන් බබලන මහත්තිල්මේකුලටබඳු උපමාඇතිව, නුගරුකය හටගන්නේවේද, එපරිද්දෙන් පරමාණුවක්සේ' ඉතා මදවූ පින්කමින්, විපුලතරමහත්ඵල දෙන්නේයයි, දුන ප්‍රඥතෙම්කුසලය ස්වල්පයයි, අවඥනොකරන්නේය යනුභාවයි— ලොකොත්තර සම්පත්නම් කවරහයත්—

උපාදානක්ඛන්ධසංඛාත ලොකතො උත්තරන්ති
උත්තිණ්ණාතිවා ලොකුත්තරංති එවංලද්ධනාමාසම්පත්ති—

ඝූබැවින් රූපවේදනා සඤ්ඤාසංඛාර විඤ්ඤාණයන පචස්ඛන්ධලෝකයෙන් එතරවෙත්නුයි එතරවූවාහුනුයි කියාහෝ මෙසේ උතුම්ලෝකොත්තර ගුණධර්මයට පැමිණි ඒබුධාදි සියලූ ආය්‍යීයන්ගේ ගුණසම්පත්තිය ලෝකොත්තර සම්පත්නම්. එසම්පත් තොමෙ ශ්‍රාවකබොධිය, ප්‍රත්‍යෙකබොධිය, සම්‍යක්සම්බොධිය ය කියා තුන්වැදෑරුම්වේ—එහි ශ්‍රාවකබොධියනම් ශාස්තෲවූබුදුරජනන් වහන්සේගේ ධර්මදේශනාවත් ශ්‍රවනානතයෙහි, උපන් බැවින් ශ්‍රාවකයොයයි මෙසේ ලදනම්ඇති ඒ ශ්‍රාවකයන් විසින්

ශ්‍රොතාපත්‍යාදි මාර්ගපිළිවෙළින් ගොස්දුඃඛසමුදය, නිරොධමා
ර්ගයන්, චතුස්සත්‍යයන්ගේ අවබොධවීමෙන් පැමිණියයුතු ස
මපත්තියයි — ඒඑසේමැයි — විසුද්ධිමාර්ගයෙහි කියනලද ක්‍රම
යෙන් ශ්‍රොතාපත්තිමාර්ගය වඩා ප්‍රිථිවිච්ඡිත්තිවශා, පාපකර්මසමුච්ඡෙ
ද ප්‍රහාණයෙන් නසා පහකරණලද අපායගමන්ඇති· සත්ත
ක්ඛත්තු පරමවූයෙ ශ්‍රොතාපන්නනම්වේ — ඒසොවාන් පුද්ගල
තෙම චත්තාරි ඒකබීජය කොලංකොලය සත්තක්ඛත්තු පරමයයි
කියා තුන්වැදෑරුම්වේ — එහි එක්වරෙක උපදනාබිජුවම ය
සේ භවයෙහි එකමජාතියෙක පිළිසිඳගෙණ එපමණකින් මහ
එතෘෂ්ණාභාව හකුළුවාගෙණ; එයින් දෙවෙනිවූ ජාතියෙක මි
ණිස්ලොව නොයිපද එමජාතියෙහි හෝ අනික් දිව්‍යජාතියෙක
හො රහත්බවට පැමිණීමෙන් දුක්අන්තකොට සත්හිඳියන
සොවාන් පුද්ගලතෙම ඒක බීජනම්වනසේක — භවයෙහි දෙව
රක්හො තුන්වරෙකහො, පිළිසිඳගෙන සතරවෙනිවූ ජාතියෙහි
හො අනික් දිව්‍යජාතියෙකහො රහත්බවට පැමිණීමෙන් දුක්
අන්තකොට සත්හිඳියන සොවාන් පුද්ගලතෙම, කොලංකො
ලනම් වනසේක — එසේම භවතෘෂ්ණා නොසිඳිදු බැවින් මෙ
මනුෂ්‍යලොකයෙහිම සත්ජාතියක් ඉපදීමම්ස එයින් පිටත්අටවෙ
ජාතියෙක මිණිස්ලොව නොයිපද වාසනාබලවූ පරිදෙන් රහ
ත්බවට පැමිණීමෙන් සියළුදුක්අන්තකොට සන්සිඳියන සො
වාන් පුද්ගලතෙම සත්තක්ඛත්තු පරමනම් වනසේක —

මෙසේ තුන්ප්‍රකාරවූ සොවාන්පුද්ගල යන්ගේම, මෙහිජා
තිප්‍රමාණ දක්වූසේ, මනුෂ්‍යලොකයෙහි උපදනා ජාතිගනන්මය
සදෙව්ලොව බඹලොව ඒ සොවාන්තෙම උපදනාජාති එයට අ
ධිකතරවනනාහුයි, — ඒ කෙසේවේදයි කිවහොත් — විසාඛානම්
උපාසිකාවොද, අනේපිඬුමහසිටානොද, සක්දෙව්රජද යනමෙතු
න්දෙන, ඔවුන්ගේ භවතෘෂ්ණාව බලවතර බැවින්, සදෙවුලො
ව අනුක්‍රමයෙන් ඉපද, ඒඑදෙවුලොව ආයුශ්‍රීප්‍රමානයෙන් මහත්
වූ දිව්‍යශ්‍රීසම්පත්හා සමාපත්තිසැප අනුභවකොට පරණිර්මිත
දිව්‍යලොකයෙහිසිටබඹන උපදවාගෙණ. බඹලොඋපදනා, සුබ්‍ර
පාරිසද්‍ය බඹලොපටන් අනුක්‍රමයෙන් ගොස් උලාරවූ ප්‍රීතිශ
ප අනුභවකොට, සුභකීර්ණකතලයට පැමිණ, එහිසිට මාර්ගභා
වනා වැඩීමෙන් අනාගාමිඵලයට පැමිණ, එයින් ගොස් පචසු
ඬාවාසයෙහි උපදනාහු, අනුක්‍රමයෙන් ඉපද ඒ එබඹතලවලද
ආයු ප්‍රමාණයෙන්ම, මහත් විපුලතරවූ, සමාපත්තිශැප අනුභව
කොට ගොස් කල්ප සොලොස්දහසකට ආයුසඇති අකනිටා
බඹතලයෙහි ඉපද. අර්හත්මාර්ගයවඩා සකල ක්ලෙශයන් නසා

සිත් එයටවඩා කල්පය දික්වන්නේයි එහෙයින් ඉතා දීර්ඝවූ ආයුසයෙන් දනයුතුවූ මහත්බවුන්ගේ ඒ සියළු සම්පත් මේ කුහුශරීරයෙන් ඉතා මදකාලෙකින් සැදියයුතුබැවින් එහි නොපමාවියයුතු. නොයෙක් කල්පැසියදහස්ගණන් පවත්නා යම් බ්‍රාහ්මණකෙනෙකුන්ගේ මනොමයවූ ආයුසැපආදි සියල්ලෙක්ඇද්ද, ඔවුන්ගේ ඒ සුඛාග්‍රයට කවරනම් උපමාවක්වීද, නොවන්නේමැයි—මෙහි යම් කුසලයෙක් නිර්වාණසැපදේද ඒ කුශලය ශ්‍රෙෂ්ඨවෙයි: යම්කුසලයෙක් බඹලොව උදාරවූ බ්‍රහ්මසැපදේද· ඒ කුශලය මධ්‍යමනම්වෙයි: යම් කුශලයෙක් කාමලොව උපදවා සවල්වූ පචකාමසැපහා අන්‍යවූද සියළු හීනසැප සාධාදේද. ඒ කුසලය හීනවෙයි—තවද—

සුදුල්ලභං බුබ්බුලදුබ්බලංඉමං;
සරීරමෙවං විධපුඤ්ඤසාධකං
අප්පඤ්ඤකම්මෙසු පයොජයංජනො,
සිමන්රුමුඛා පතිතොවසො මියො.

යනාදී කීයහයින් අතිසයින් දුලීහවූ, දියබුබුළුසේ ඉතා දුර්බලවූ' මේකුහුශරීරය, මෙබදුපින්කන් සැදීමට හේතුවේද පහිටවේද, ඒශරීරය අකුසල්කර්මෙහි යොදන සත්වතෙම මහමෙර මුදුනෙන් ගැලවීවැටුනු සත්වයාමෙන් නැවත සෝකයට පැමිණෙන්නෙයි, යම්සේ සර්ෂප්‍රමාණවූ බිජුවටින් සියගණන් ශාඛා ප්‍රශාඛාදීන් බබලන මහත්නිල්මේකුලටබදු උපමාඇතිව, නුගරුකය හටගන්නේවේද, එපරිද්දෙන් පරමාණුවක්සේ ඉතා මදවූ පින්කමින්, විපුලතරමහත්ඵල දෙන්නේයයි, දන ප්‍රඥාතෙමකුසලය සවල්පයයි, අවඥානොකරන්නේය යනුභාවයි—ලොකොත්තර සම්පත්නම් කවරහයත්—

උපාදානක්ඛන්ධසංඛාත ලොකතො උත්තරන්ති
උත්තිණ්ණාතිවා ලොකුත්තරංති එවංලද්ධනාමාසම්පත්ති—

යුබැවින් රූපවේදනා සඤ්ඤාසංඛාර විඤ්ඤාණයන පචස්ඛන්ධලෝකයෙන් එතරවෙත්නුයි එතරවූවාහුනුයි කියාහෝ මෙසේ උතුම්ලෝකොත්තර ගුණධර්මයට පැමිණි ඒබුඩාදි සියලු ආර්‍යයන්ගේ ගුණසම්පත්තිය ලෝකොත්තර සම්පත්නම්. එසම්පත් තොමෝ ශ්‍රාවකබොධිය, ප්‍රත්‍යෙකබොධිය, සම්‍යක්සම්බොධිය ය කියා තුන්වැදෑරුම්වේ—එහි ශ්‍රාවකබොධියනම් ශාස්තෘවූබුදුරජනන් වහන්සේගේ ධර්මදේශනාවන් ශ්‍රවනානන්තයෙහි, උපන් බැවින් ශ්‍රාවකයොයයි මෙසේ ලදනම්ඇති ඒ ශ්‍රාවකයන් විසින්

ශ්‍රොතාපත්තාදි මාර්ගපිළිවෙළින් ගොස්දුක්ඛසමුදය, නිරොධමා
ර්ගයන්, චතුස්සත්‍යයන්ගේ අවබොධවීමෙන් පැමිණියයුතු ස
මපත්තියයි —ඒඑසේමැයි— විසුද්ධිමාර්ගයෙහි කියනලද ක්‍රම
යෙන් ශ්‍රොතාපත්තිමාර්ගය වඩා ප්‍රතිච්ච්ඡිතිවජා, පාපකර්මසමුච්ඡෙ
ද, ප්‍රහාණයෙන්නසා පහකරණලද අපායගමන්ඇති· සත්ත
ක්ඛත්තු පරමවූයෙ ශ්‍රොතාපන්නනම්වෙ—ඒසොවාන් පුද්ගල
තෙම වන්නාහි ඒකබීජය කොලංකොලය සත්තක්ඛත්තු පරමයයි
කියා තුන්වැදෑරුම්වේ—එහි එක්වරෙක් උපදනාබිජුවට ය
සේ භවයෙහි එකමජාතියෙක පිළිසිඳගෙණ එපමණකින් මහ
එතණ්හාභාව හකුළුවාගෙණ; එයින් දෙවෙනිවූ ජාතියෙක මි
ණිස්ලොව නොඉපද එමජාතියෙහි හෝ අනික් දිව්‍යජාතියෙක
හො රහත්බවට පැමිණීමෙන් දුක්අන්තකොට සන්හිඳියන
සොවාන් පුද්ගලතෙම ඒකබීජනම්වනසේක— භවයෙහි දෙව
රක්හො තුන්වරෙකහො, පිළිසිඳගෙන සතරවෙනිවූ ජාතියෙහි
හො අනික් දිව්‍යජාතියෙකහො රහත්බවට පැමිණීමෙන් දුක්
අන්තකොට සන්හිඳියන සොවාන් පුද්ගලතෙම, කොලංකො
ලනම් වනසේක— එසේම භවතණ්හා නොසිඳිදු බැවින් මෙ
මනුෂ්‍යලොකයෙහිම සත්ජාතියක් ඉපදීමමිස එයින් පිටත්අටවෙ
ජාතියෙක මිණිස්ලොව නොඉපද වාසනාබලවූ පරිද්දෙන් රහ
ත්බවට පැමිණීමෙන් සියළුදුක්අන්තකොට සන්සිඳියන සො
වාන් පුද්ගලතෙම සත්තක්ඛත්තු පරමනම් වනසේක—

මෙසේ තුන්ප්‍රකාරවූ සොවාන්පුද්ගල යන්ගේම, මෙහිජා
තිප්‍රමාණ දක්වූසේ, මනුෂ්‍යලොකයෙහි උපදනා ජාතිගනන්මය
සදෙව්ලොව බඹලොව ඒ සොවාන්තෙම උපදනාජාති එයට අ
ධිකතරවනනාහුයි,—ඒ කෙසේවෙදයි කිවහොත්— විසාඛානම්
උපාසිකාවොද, අනේපිඩුමහසිටානොද, සක්දෙව්රජද යනමෙතු
න්දෙන, ඔවුන්ගේ භවතණ්හාව බලවතර බැවින්, සදෙවුලො
ව අනුක්‍රමයෙන් ඉපද, ඒඑදෙවුලොව ආයුශ්‍රීප්‍රමාණයෙන් මහත්
වූ දිව්‍යශ්‍රීසම්පත්හා සමාපත්තිසැප අනුභවකොට පරණිම්මිත
දිව්‍යලෝකයෙහිසිටවධනන උපදවාගෙණ. බඹලොඋපදනා, සුබ්‍ර
පාරිසද්‍ය බඹලොපටන් අනුක්‍රමයෙන් ගොස් උලාරවූ ප්‍රීතිශ
ප අනුභවකොට, සුභකිනීකතලයට පැමිණ, එහිසිට මාර්ගභා
වනා වැඩීමෙන් අනාගාමිඵලයට පැමිණ, එයින් ගොස් පචසු
ධාවාසයෙහි උපදනාහු, අනුක්‍රමයෙන් ඉපද ඒ එබඹතලවලද
ආයු ප්‍රමාණයෙන්ම, මහත් විපුලතරවූ, සමාපත්තිශැප අනුභව
කොට ගොස් කල්ප සොලොස්දහසකට ආයුසයඇති අකනිට්ඨා
බඹතලයෙහි ඉපද අර්හත්මාර්ගයවඩා සකල ක්ලෙසයන් නසා

රහත් ඵලයට පැමිණ එහි ආයුෂ පමණින්සිට පිරිනිවන් පානාහුයි. එසේම අසද්ධර්මානුශාසනා වන්ගේ ශ්‍රවණයෙන්, භාවනාමාර්ගයවඩා හොත් සමහරකෙනෙක්, රාගද්වේෂ මෝහයන අකුසලයන් තුනීබවනරණණාවූ, සකෘදාගාමි මාර්ගයට වඩා සකෘදාගාමි වන්නේය— ඒසකෘදාගාමි පුද්ගලතෙම ප්‍රතිසන්ධි වශයෙන්, මේමිනිස්ලොවට එක්වරෙක ඒනුයි, හෙවත් එක්ජාතියක් මෙහිඋපදනාබැවින් සකෘදාගාමිනම්වනසේක— එහිසමහර පුද්ගල කෙනෙක්, මිණිස්ලොව ආදිකොට ඇතිකාමභවයෙහිදී, සකෘදාගාමිඵලයට පැමිණෙන්නේය, සමහරපුද්ගල කෙනෙක් බ්‍රහ්මපාරිසද්‍යාදීරූප භවයෙහිදී, සකෘදාගාමි ඵලයට පැමිණෙන්නේයි, සමහර පුද්ගලකෙනෙක් ආකාසානංචායතනාදී අරූපභවයෙහිදී, සකෘදාගාමි ඵලයට පැමිනෙන්නේය,

මෙසේ තුන්භවයන්ගේ වශයෙන්, සකෘදාගාමිතෙම තුන්ප්‍රකාරවේ—තවද සද්ධර්මානුශාසනා වන්ගේ ශ්‍රවණයෙන් එසේම භාවනාවඩාගොස් කාමරාගව්‍යාපාද අකුසලයන් නිරවශෙෂව, සමුච්ඡේද ප්‍රහාණයෙන් නසනනාවූ අනාගාමි මාර්ගයවඩා අනාගාමි නම් වන්නේය;— ඒඅනාගාමිතෙමවනාහි ප්‍රතිසන්ධිවශයෙන් මේ කාමාවචරලොකයට නොඑනුයී, හෙවත්අනාගාමි වීමෙන්පසු මේ මිණිස්ලොව ඉපදීමක්නැත්තුයි, අනාගාමි නම් වනසේක කොහිඋපදනාසේක්දයත්— හෙතෙමභාවිතා කළාවූ ශ්‍රද්ධාය වීර්‍ය්‍යය ස්මෘතිය සමාධිය, ප්‍රඥාය, යන පංචප්‍රකාරවූ, ම් නාඉන්ද්‍රියයන්ගේ එකිනෙකට අධිකවසිටි ගුණානුභවය හෙතුකොටගෙණ කෙලෙසුන්කෙරෙන් සුධසත්වයන්ගේ ඉපදීමටස්ථානවූහෙයින් සුද්ධාවාසයයිලදනම්ඇති බ්‍රහ්මලොකවලඋපදනානැනැත්තේ ශ්‍රද්ධාවඅධිකව භාවනා වැඩීමෙන් අවිහනම්බඹලොවඉපද එහි ආයුපමනින් කල්පදහසක් මුළුල්ලෙහි බ්‍රහ්මසම්පත් විඳිනේය— එසේමවීර්‍ය්‍යවඩා භාවනාකිරීමෙන් අනාගාමිවූනැනැත්තේද අතප්පනම් බඹලොවඉපද එහිකල්පදෙදහසක් මහත්ප්‍රීතිශපවිදිනේය එසේමසිහියවඩාගොස් භාවනාකිරීමෙන් අනාගාමිවූ නැනැත්තේද සුදස්සනම්බඹලොවඉපද එහිකල්පසාරදහසක් මුළුල්ලෙහි ඉතාවිපුලවූ ප්‍රීතිසපවිදිනේය— එසේමචිත්තයාගේ එකාග්‍රතාව වැඩීමෙන් භාවනාකොට අනාගාමිවූ නැනැත්තේද සුදස්සීනම්බඹලොවඉපද එහිකල්පඅටදහසක්මුළුල්ලෙහි ඉතාඋදාරවූ බ්‍රහ්මසම්පත් විදිනේය, එසේම ප්‍රඥාවවඩාගොස් භාවනාකිරීමෙන් අනාගාමිවූනැනැත්තේද අකනිට්ඨබඹලොවඉපද එහිකල්ප සොලොස්දහසක් මුළුල්ලෙහි මහත්උදාරතරවූ බ්‍රහ්මසම්පත් අනුභව කරන්නේය—

මෙසේ ඒ අවිහාදී පඤ්චබ්‍රහ්මතලයෝ කෙලෙසුන්කෙරෙන් මිදී සුද්ධවූ අනාගාමි රහත් ගුණප්‍රතිලාභයුත් අනූනය ප්‍රතිඝය යන ලොභදෙෂයන්ගේ නොවීමෙන් පිරිසිදු බ්‍රහ්මයන්ටම වාසස්ථානවූහෙයින්ම සුද්ධාවාස නම්විය—මේ පඤ්චබ්‍රහ්මතලයන් අතුරෙහි ප්‍රථමතලවාසීහු අල්පවූ මඳකලක් එහිවැස තමන්ගේ වාසස්ථානය නොහැර කල්පදහසක්ම වසනහෙයින් අවිහ නම්විය- දෙවෙනිතල වාසීහුද කිසිවකින් තැවීමෙක් නැතිහෙයින් අතප්ප නම්විය. තුන්වෙනිතල වාසීහුද පරමසුන්දරවූ රූපශ්‍රීඇතිබැවින් සැපසේ ප්‍රියනේත්‍රයෙන් දකින්නුයී· සුදස්ස නම්විය—සතර වෙනිතල වාසීහුද එසේම අතිසයින් පිරිසිදුවූ දර්ශන ඇතිබැවින්ම සුදස්සී නම්විය,, පස්වෙනි තලවාසීහුද සියල්ලෙන්වැඩි උත්කෘෂ්ටවූ ශ්‍රෙෂ්ඨ සම්පත් ඇතිබැවින් මොවුන්ගේ සම්පත් කනිෂ්ඨභාවයක් නැත්තුයී; අකනිට්ඨ නම්වියයිදතයුතු—මේ පස්මහ තලවාසී සීලඋපදනා අනාගාමි බ්‍රහ්මරාජයොවනාහි—

අන්තරා පරිනිබ්බායීය, උපහච්ච පරිනිබ්බායීය; අසංඛාරපරිනිබ්බායීය, සසංඛාරපරිනිබ්බායීය; උද්ධංසොතො අකනිට්ඨගාමියයි කියා පචප්‍රකාර ප්‍රභෙදව රහත්ඵලයට ඒ ඒ බ්‍රහ්මලෝකවලදීම පැමිණීමෙන් සවාසනා සකලක්ලේශයන් නසා පිරිනිවන්පානාහුයි—එසේ ඒ ඒ බ්‍රහ්මලෝකවල අනාගාමි බ්‍රහ්මයන්ගේ නියමවූ ආයුසය දෙබාගව බෙදුකලවේ. මධ්‍යයට නොපැමිණ පූර්වභාගය නොඉක්ම සිටිකලම සකලක්ලේශයන්ගේ පරිනිර්වාණයයි කියනලද රහත්බවටපැමිණි බ්‍රහ්මරාජතෙම අන්තරාපරිනිර්වායී නම් වේ—ඒ අන්තරාපරිනිර්වාණයද මෙසේ ත්‍රිවිධවේ—

ඒ කෙසේදයත්—කල්පදහසකට ආයුඇති අවිහනම් බ්‍රහ්මලොව උපන් සමහර අනාගාමිකෙනෙක් උපන්දවස්හිම රහත්බවට පැමිණෙන්නේ හෝ වෙයි; එසේ නොපැමිණියහොත් පලමුවෙනි කල්පයාගේ මස්තකයෙහිහෝ පැමිණෙන්නේවෙයි, හෙතෙම පලමුවෙනි අන්තරාපරිනිර්වායීනම්වේ—අන්‍යවූ සමහර අනාගාමිකෙනෙක් මෙසේත් කල්ප දෙසියයකින් මත්තෙහි රහත්නොවූයේවීනම් කල්ප සාරසියයකින් මත්තෙහි රහත්බවට පැමිණෙන්නේය—මෙතෙම තුන්වෙනිවූ අන්තරාපරිනිර්වායීනම්වේ· පස්වෙනි කල්පසියයක් ඉක්මවංගොස් ආයුසයාගේ පශ්චිමභාගයට පැමිණ රහත්බවටපැමිණ අනාගාමීතෙම උපහච්චපරිනිර්වායීනම්වේ—අතප්පාදී සෙසු බ්‍රහ්මලොක සතරෙහිද අනාගාමීන්ගේ රහත්බවටපැමිණීමෙහි විභාග මෙසේනායින්ම දතයුතු—යම්කිසි තැනක උපන්නැනැත්තේ සංස්කාරධර්මයන් සහිතවූ ප්‍රයොග

සහිතවූ මහත්උත්සාහයෙන් කල්‍යාණව දුකසේම රහත්බවට යම් පැමිණීමෙක්ඇද්ද ඒ සසංඛාරපරිනිබ්බායී නම්වේ—එසේ කිසියම් සසංඛාරයක් ප්‍රයොගයක් නොගෙන අල්පොත්සාහයෙන් කල්‍යාණවීසක්නොවූ සුවසේම රහත්බවට යම් පැමිණීමෙක්ඇද්ද ඒ අසංඛාර පරිනිබ්බායීනම්වේ—මොහු සතරදෙනම පඤ්චසුද්ධාවාසයෙහි දක්නාලැබෙත්—උද්ධංසොත අකනිට්ඨගාමීවූ අනාගාමී තෙමවනාහි අවිහයපටන් යථාක්‍රමයෙන් දෙවුලොසතරෙහිම ඌර්ධ්‍වස්‍රොතව මතුමතුටගොස් ඉපද ඒ ඒ තන්හි ආයුපමනින්ම උදුරතර ප්‍රීතිසුඛඅනුබවකිරීමෙන් සුඛව අකනිෂ්ඨයෙහි ඉපද කියනලදක්‍රමයෙන්ම රහත්බවටපැමිණ එහිම පිරිණිවන්පානේය: එහෙයින් මෙතෙම උද්ධංසොත අකනිට්ඨගාමීවූ අනාගාමිනම්වේ—

—මේ අනාගාමි ආර්‍ය්‍යයන්වහන්සේගේ විභාගය—

යටකියනලද ක්‍රමයෙන්ම සද්ධර්මානුශාසනාවන් ශ්‍රවණයෙන් භාවනාමාර්ගපිළිවෙළින් ගොස් සමහරකෙනෙක් අර්හත්මාර්ග වඩා නිරවශෙසව සකලක්ලෙශයන් ප්‍රහීනකොට ක්ෂීණවූ ආශ්‍රවයන්ඇති අග්‍රදක්ෂිණෙය්‍ය අර්හත් නම්වනසේක: මෙසේ ශ්‍රොතාපත්තිමාර්ගාදි මාර්ගප්‍රතිපත්තිපිළිවෙළින්මගොස් අවබොධකටයුතුවූ දුඃඛාදි චතුරාර්‍ය්‍යසත්‍යයන් දැනගැනීම ශ්‍රාවකබොධියයි කියනුලැබේ—පසේබුදුවරයන්වහන්සේ ලෝකයෙහි කෙසේ බබලන සේක්ද යත්—

මනුස්සත්තංලිඞ්ගසම්පත්ති විගතාසවදස්සනං,
අධිකාරොඡන්දතාඑතෙ අභිනීහාරකාරණා.

යනුහෙයින් මනුෂ්‍යත්මභාවයය පණ්ඩක නපුංසක ස්ත්‍රීභාවයයන් මිදී පුරුෂාත්මයලැබීමය බුද්ධප්‍රත්‍යෙක බුද්ධ ආර්‍ය්‍යශ්‍රාවක යන් කිසි ලොකොත්තර පුද්ගලකෙනෙකුන්ගේ දැක්මය එතැන්හි ජීවිත පරිත්‍යාගය බුදුවීමෙහි තියුනුවූ අදහස් ඇතිවීමය යනමේ පඤ්චධර්මසමොධානයෙන්යුක්තවූ පසේබොසතුන්ට ප්‍රථමාභිනිහාර නම්වූ පලමුවෙනි විවරණය ලැබෙන්නේය· එසේ විවරණලැබ පසේබුදුවනනාවූ බොධිසත්වවරයො දෙයාසංඛෙය්‍ය කල්ලක්ෂයක් මුළුල්ලෙහි අඛණ්ඩනාව පාරමිධර්මයන් යටකියනලද ක්‍රමයෙන්ම පූරණයකොට අඩදිවිමිලද යම්නැතක ක්ෂත්‍රිය බ්‍රාහ්මණ ග්‍රහපති සංඛ්‍යාතවූ තුන්වංශයන් අතුරෙන් එක්තරා වංශයකඉපද මිණිසත්බවලදින් වැඩිවිජපැමිණ පාරමිතාබලෙන්ම වාසනානු

තුලව ඇසදුටු අනිත්‍යලක්‍ෂණාදියක් අරමුණුකොටගෙනලත් කර්ම
ස්ථානයෙන් සකලකෙලෙසයන්නසා නානාස්ථානවලදීම ස්වයම්බුද්ධ
වූ පසේබුදුබවට පැමිණෙනසේක්ලාය එසේබුදුවන පසේබුදුවර
යෝ බුද්ධොත්පාදකාලයෙහි නූපදනාහුය—එතකුදුළුවත් ලෝ
වුතුරාබුදුන්ගේ ඉපදීමටම සුදුසුවූ විවර්ත, කල්පයෙහිම අවුරුදු
ලක්‍ෂයකටවැඩිවූහෝ අවුරුදුසියයකට අඩුවූහෝ විපරීතකල්හැර
මධ්‍යස්තවූ සුදුසුවූ කාලයෙහිම උපදනාසේක්ලාය එසේඋපදනා
ලොවුතුරාබුදුන්මෙන්මුළුලොවට නිවන්අමාරසබෙදූදී ඔවුන් සස
රින් ගැලවියනොහී පසේබුදුව ස්වයම්භූඥාණයෙන්ලත් නිවන්පුර
යටඅමුතුඑක්ප්‍රාණියකුව්වරත් පමුණුවාලීමට අසමර්‍ථව තමන්වහ
න්සේලාවිදිනාවූ අර්‍ථරසයම ප්‍රතිවේධකරණසේක්ලාය ධර්‍මරසය
ප්‍රතිවේධකිරීමට අසමර්‍ථවූවාහුය-ලොකොත්තරධර්‍මය ප්‍රඥප්තියට
නගා සෙසසන්ට අවබෝධවනසේ විශේසයෙන් දේසනාකිරීමට
අසමර්‍ථයහ හෙතුමක්මෙද—මූගපුරුෂයෙක් මහත්විසිතුරු ස්වප්
නයක්දක අනුන්ට තත්වූපරිද්දෙන් කියවියන අභිප්‍රාඇත්තේවී
නමුත් තමා ගොළුහෙයින් කර්නරසායතකොට කියාඋගන්
වාගත නොහෙන්නේය තවද වනචරකයෙක් කිසියම්දවසෙ
ක තමාවසනවනයෙන් නික්මඅවුත් මහත්නුවරකට පැමිණි
කල් ක්‍ෂුධායෙන්පීඩිතව ඇවිදිනාඔහුදක සුවපත්පුරුෂයෙක් ත
මාගේගෙටකැඳවා ඛාද්‍යභොජ්‍යාදීන් සහිතවූ රසමසවුලෙන්යුක්
තවූ ආහාරය ඔහුයපෙනපමනක් අනුභවකරවූයේද නැවත
ඒවනචරකතෙම වනයටවන්කල සෙසුවනචරකයො ඔහුමනු
ෂ්‍යපථයට පැමිණ අනුභවකල ආහාරයෙහි කවරරසයෙක්දැයි
විචාලකල්හි තමානුපුරුදුහෙයින් මෙවැනිමධුරරසයකායි සහ
වාකියන්ට යම්සේසිතේද එමෙන්නොහැකි වන්නේද එමෙන්
සත්වයන් සිත්ගෙන තමන්දත්නිවන්රසය ප්‍රකාසකොට ධර්ම
දේසනාකරන්ට සමර්‍ථසම්බුද්ධනොවී පසේබුදුව නොපිලිවන්බව
ප්‍රවෙනිචරිතයක්සෙයින් ලොකසත්වයන්ට නොවීනායයි කියන
ලද උතුම් ධර්මාභිසමයකරන්ට නොහැකී එතකුදුළුවත් සියළු
ඉද්ධිසමාපත්ති සිවුපිළිසිඹියා ප්‍රභෙදාදියට පැමිණෙන්නාහුමැයි
ගුණවිසෙසලත් වසයෙන්ම ලොවුතුරාබුදුන්ට අඩුව ශ්‍රාවක
යන්වහන්සේට වැඩිගරම්සිටිගුණ විශ්වසඇත්තාහුය—

එහෙයින් අනුන්පැවිදිකරවා ක්‍ෂුද්‍රසික්‍ෂාපදයොයයි කියන
ලද අභිසමාචාරික ශික්‍ෂාවන් ප්‍රගුණකරවා සිත්හිගටගතනා
කෙලශයන්ගේ තුනුකාරවාලීමමුත් ඔවුන්ගේසමුච්ඡේද ප්‍රහාන
වසයෙන් අවසානයට පතුවා ගතනොහෙතනාහුය—තවද උද්දෙ
සවසයෙන් පොහොයකරනනාහුද, අජ්ජඋපොසථො ධනාවච

සහිතවූ මහත්උත්සාහයෙන් කල්‍යාණව දුකසේම රහත්බවට යම් පැමිණිමෙක්ඇද ඒ සසංස්කාරපරිනිර්වායී නම්වේ—එසේ කිසියම් සසංස්කාරයක් ප්‍රයොගයක් නොගෙන අනුත්සාහයෙන් කල්‍යාණවීසක්නොව ශීඝ්‍රම රහත්බවට යම් පැමිණිමෙක්ඇද ඒ අසංඛාර පරිනිබ්බායිනම්වේ—මොහු සතරදෙනම පංචසුද්ධාවාසයෙහි දක්නාලැබෙත්—උද්ධංසොත අකනිට්ඨගාමිවූ අනාගාමි තෙමවනාහි අවිහයෙපටන් යථාක්‍රමයෙන් දෙවුලොසතරෙහිම ඌර්ධ්වශ්‍රොතව මතුමතතටගොස් ඉපද ඒ ඒ තන්හි ආයුපමනින්ම උදුරතර ප්‍රීතිසුඛඅනුභවකිරීමෙන් සුඛව අකනිෂ්ටයෙහි ඉපද කියනලදක්‍රමයෙන්ම රහත්බවටපැමිණ එක්සම පිරිණිවන් පානේය: එහෙයින් මෙතෙම උද්ධංසොත අකනිට්ඨගාමිවූ අනාගාමිනම්වේ—

## —මේ අනාගාමි ආර්‍යයන්වහන්සේගේ විභාගය—

යටකියනලද ක්‍රමයෙන්ම සද්ධර්මානුශාසනාවන් ශ්‍රවනයෙන් භාවනාමාර්ගපිළිවෙලින් ගොස් සමහරකෙනෙක් අර්හත්මාර්ග වඩා නිරවශෙසව සකලක්ලෙශයන් ප්‍රහීනකොට ක්‍ෂීණවූ ආශ්‍රවයන්ඇති අග්‍රදක්‍ෂිනෙය්‍ය අර්හත් නම්වනසේක: මෙසේ ශ්‍රොතාපත්තිමාර්ගාදි මාර්ගප්‍රිළිවෙලින්මගොස් අවබොධකටයුතුවූ දුක්ඛාදි චතුරාර්‍යසත්‍යයන් දැනගැනීම ශ්‍රාවකබොධියයි කියනුලැබේ— පසේබුදුවරයන්වහන්සේ ලෝකයෙහි කෙසේ බබලන සේක්ද යත්—

මනුස්සත්තංලිඞ්ගසම්පත්ති විගතාසවදස්සනං,
අධිකාරොඡන්දතාඑතෙ අභිනීහාරකාරණා.

යනුහෙයින් මනුෂ්‍යත්මභාවයය පණ්ඩක නපුංසක ස්ත්‍රීභාවයයන් මිදී පුරුෂාත්මයලැබීමය බුද්ධප්‍රත්‍යෙක බුද්ධ ආර්‍යශ්‍රාවක යන් තිසි ලොකොත්තර පුද්ගලකෙනෙකුන්ගේ දැක්මය එතැන්හි ජීවිත පරිත්‍යාගය බුදුවීමෙහි තියුනුවූ අදහස් ඇතිවීමය යනමේ පංචධර්මසමොධානයෙන්යුක්තවූ පසේබොසතුන්ට ප්‍රථමාභිනීහාර නම්වූ පලමුවෙනි විවරණය ලැබෙන්නේය· එසේ විවරණලැබ පසේබුදුවනනාවූ බොධිසත්වවරයො දෙයාසංඛෙය්‍ය කල්ලක්‍ෂයක් මුළුල්ලෙහි අඩුනොව පාරමීධර්මයන් යටකියනලද ක්‍රමයෙන්ම පූරණයකොට දඹදිව්හිලද යම්තැනක ක්‍ෂත්‍රිය බ්‍රාහ්මණ ග්‍රහපති සංඛ්‍යාතවූ තුන්වංශයන් අතුරෙන් එක්තරා වංශයකඉපද මිණිසත්බවලදින් වැඩිවියපැමිණ පාරමිතාබලෙන්ම වාසනානු

කුලව ඇසදුටු අනිත්‍යලක්ෂණාදියක් අරමුණුකොටගෙනලත් කර්‍ම ස්ථානයෙන් සකලකෙලසයන්නසා නංනාස්ථානවලදීම ස්වයම්භූ වූ පසේබුදුබවට පැමිණෙනසේක්ලාය එසේබුදුවන පසේබුදුවර යෝ බුද්ධොත්පාදකාලයෙහි නූපදනාහුය—එතකුදුළුවත් ලොවුතුරාබුදුන්ගේ ඉපදීමටම සුදුසුවූ විවර්ත, කල්පයෙහිම අවුරුදු ලක්ෂයකටවැඩිවූහෝ අවුරුදුසියයකට අඩුවූහෝ විපරීතකල්හැර මධ්‍යස්තවූ සුදුසුවූ කාලයෙහිම උපදනාසේක්ලාය එසේඋපදනා, ලොවුතුරාබුදුන්මෙන්මුළුලොවට නිවන්අමාරසබෙදූදී ඔවුන් සස රින් ගැලවියනොහී පසේබුදුව ස්වයම්භූඥාණයෙන්ලත් නිවන්පුර යටඅමුතුඑක්ප්‍රාණියකුව්වරත් පමුණුවාලීමට අසමර්ථව තමන්වග න්සේලාවිදිනාවූ අර්ථරසයම ප්‍රතිවේධකරණසේක්ලාය ධර්මරසය ප්‍රතිවේධකිරීමට අසමර්ථවූවාහුය-ලොකොත්තරධර්මය ප්‍රඥප්තියට නගා සෙසසන්ට අවබෝධවනසේ විශේසයෙන් දේසනාකිරීමට අසමර්ථයහ හෙතුමක්මෙහු—මූගපුරුෂයෙක් මහත්විසිතුරු ස්වප් නයක්දක අනුන්ට තත්වූපරිද්දෙන් කියවියනා අභිප්‍රාඇත්තේවී නමුත් තමා ගොළුහෙයින් කර්නරසායනකොට කියාළගත් වාගත නොහෙන්නේය තවද වනචරකයෙක් කිසියම්දවසෙ ක තමාවසනවනයෙන් නික්මඅවුත් මහත්නුවරකට පැමිණී කල් ක්ෂුධායෙන්පීඩිතව ඇවිදිනාඔහුදක සුවපත්පුරුෂයෙක් ත මාගේගෙටකැඳවා ඛාද්‍යභොජ්‍යාදීන් සහිතවූ රසමසවුලෙන්යුක් තවූ ආහාරය ඔහුයපෙනපමනක් අනුභවකරවූයේද නැවත ඒවනචරකතෙම වනයටවන්කල සෙසුවනචරකයො ඔහුමනු ෂ්‍යපථයට පැමිණ අනුභවකල ආහාරයෙහි කවරරසයෙක්දැයි විචාලකල්හි තමාතුපුරුදුහෙයින් මෙවැනිමධුරරසයකායි සඟ වාකියන්ට යම්සේසිතේද එමෙන්නොහැකි වන්නේද එමෙන් සම්‍යක් සිත්ගෙන තමන්දත් නිර්වාණරසය ප්‍රකැසකොට ධර්‍ම දේසනාකරන්ට සම්‍යක්සම්බුද්ධනොවී පසේබුදුව නොපිළිවන්බව ප්‍රවෙනිවරිතයක්සෙයින් ලොකසත්වයන්ට නෙවිනායයි කියන ලද උතුම් ධර්මාභිසමයකරන්ට නොහැකී එතකුදුළුවත් සියළු ඉද්ධිසමාපත්ති සිවුපිලිසිඹියා ප්‍රභෙදාදියට පැමිණෙන්නාහුමැයි ගුණවීසෙසලත් වසයෙන්ම ලොවුතුරාබුදුන්ට අඩුව ශ්‍රාවක යන්වගන්සේට වැඩිගරම්සිටීගුණ විශේසඇත්තාහුය—

එහෙයින් අනුන්පැවිදිකරවා ක්ෂුද්‍රශික්ෂාපදයොයයි කියන ලද අභිසමාචාරික ශික්ෂාවන් ප්‍රගුණකරවා සිත්හිගටගනනා කෙලශයන්ගේ තුනුකරවාලීමමුත් ඔවුන්ගේසමුච්ඡෙද ප්‍රහාන වසයෙන් අවසානයට පත්වා ගතනොහෙනනාහුය—තවද උපෙද ස්වසයෙන් පොහොයකරනනාහුද, අජ්ජඋපොසථො ආනවව

නායපමන තීමෙන් පොහොසත්කාරණාවූ ඒ පසේබුදුවරයන් වහන්සේලා හිමාලයෙහි ගන්ධමාදන පර්වතප්‍රාන්තයෙහිවූ දීඝ හිගොඩෙහිතවගනනා සියළුමල්ජාතිපිපී ශරහිසිටි මංජූසක නම් වෘක්ෂමූලයෙහි රුවන්මළුයෙහි රැස්වැඩහිද කමටහන්විචාරා පොහොයකොට සත්වානුග්‍රහබුද්ධියෙන් ගම්නියම්ගම්දනව් රාජධානි ආදියෙහි හැසිරෙමින් ලොවැඩකරණාහුය ඒදූකදිව්‍ය මනුෂ්‍යාදීහුද අබුද්ධෝත්පාදකාලයෙහි ලදගෙහීන් ඝනාන්ධකාරයෙහිලද පහන්ආලෝකයක්සේද මහසායෙහිලද මධුරභෝජනයක්සේද අසාධ්‍යරෝගයෙහිලද දිව්‍යඖෂධයක්සේද ඉතාසතුටුව දක්ෂිණාසෙවණාගජණ පහිරුපාසණාදියෙන්යෙදී අප්‍රමාණවූ සර්වලෞකිකලොකොත්තර සම්පත්තිප්‍රතිලාභයට මූලකාරණවූ දානසීලාදිකුසලරාසිවර්ධනය කරණාහුයි—

මෙසේවූ පසේබුදුවරයන් වහන්සේලාගේද ප්‍රවෘත්තිතොමො මෙහෙස්දතයුතු—සර්වලොකාග්‍රවූ සම්‍යක්සම්බුද්ධ සර්වඥරාජෝත්තමයානන්වහන්සේ කෙසේලොව පහළවනසේක්දයත්—ඒසම්‍යක්සම්බුද්ධවන මහාබොසතානො පාරමිතාභූමියෙහි හැසිරෙණකලපවා විසිණවූ ශ්‍රද්ධාප්‍රඥාදීගුණනුභාවයන් හෙතුකොටගෙණ අනේකප්‍රකාර ලෝවැඩකිරීමෙන් සියළු ලොවබබුළුවා අතුන්ට වැඩපිණිසම දානසීලාදීවූඅප්‍රමාන කුසලසම්භාරයන්රැස්කොට මෙහිම සම්බුද්ධගුණවර්ණාපරිච්ඡේදයෙහි ප්‍රකාශක්‍රමයෙන්ම අෂ්ටධර්මසමොධානයෙන්යෙදී විවරශ්‍රී නියතවලත්තැන් පවත් ප්‍රඥාධිකවූයේවීනම් සාරාසංඛ්‍යෙය කල්පලක්ෂයක්හෝ ශ්‍රද්ධාදිකවූයේ වීනම් අටාසංඛ්‍යකල්පලක්ෂයක්හෝ වීර්‍ය්‍යාධිකවූයේවීනම් සොළසාසංඛ්‍ය කල්පලක්ෂයක්හෝ සමත්‍රිංශත්පාරමිධර්මයන් පූරණයෙන්එහි මස්තකප්‍රාප්තව තුසිපුරපැමිණ දසදහසක්සක්වල දිව්‍යබ්‍රහ්මාදීන්ගේ ආරාධනාවෙන් මිණිස්ලොව මවුකුස්හි පිළිසිඳගෙන එයින් බිහිවෙනකල්හිද බ්‍රහ්මාසුරාදීන්ගේ රණ්දුල් දිවදුහුල්සහිතවූ හස්තතලක්‍රමයෙන් භූමියටපැමිණ එකනෙහිමන්රුනතරවූ උත්තරදිසාභිමුඛව සත්පියවරක්ඔසවාවැඩ අග්ගොහමස්මිලොකස්ස යනාදීන් තමන්වහන්සේමලෝකයෙ අග්‍රබවප්‍රකාසකොට ප්‍රීතිවාක්‍යපවත්වා ඉවෙන්ම මාරබලවිධ්වංසනයකොට පෙරයම්සත්වයන්ගේ පෙරවිසූකඳපිළිවෙලදනනානුවනලැබ මධ්‍යමයාමයෙහි දිවඇස්පිරිසිදුවීමහා සත්වයන්ගේ චුත් උත්පත්තිදෙක දන්නාඤානයද අනාගතාංශඥානයදලැබ පශ්චිමයාමයෙහි පටිච්චසමුප්පාද ධර්මයන් විමසාබලනුවො ඒකානතයෙන් දුක්ඛිතවූ මේලෝවැසිතෙම තෛලෝකයෙහිඉපදම ලැබීමද ජීවත්වනු ලැබීමහිද මියයනුලැබීමත්ද නැවත

නැවතත්එසේම චුතවීමද ඉපදීමද දුකසේමවන්නේයයි දැන එසේදඇතිකල්හි මේදුකඛයෙන් එතරවීම අවිද්‍යායෙන් නොවන්නේය, එහෙයින්—ජරාමරණසඞ්ඛාත යනාදික්‍රමයෙන් ප්‍රතීත්‍යසමුත්පාදමුඛයෙන් විදර්ශනාවටඅභිනිවෙසව මහත්වනගහනයක් සිදුත්ට ත්සානසීලයෙහි පොරොවමුවහත්කරනනාක්‍රමෙන් කෙලෙස්ගහනයසිඳ හරිණට ඤාණනැමති පරසුව තියුණුමුවහත්කිරීමෙන් බුඩ්ධභාවයටහෙතුවූ ධර්මසම්පත්තීන්ගේ පරිපාකයටගියබැවින් සර්වඥතාඥාණාධිගමයපිණිස විදර්ශනා ගැබ් ගන්වනසේක් අතරතුරෙහිනානාප්‍රකාර සමාපත්තිවලටසමවැද චිත්තකායදෙදෙනාගේ යථාස්වභාවය ශලකීමෙන් අනිත්‍ය දුක්ඛ අනාත්මයන ත්‍රිලක්ෂණයටනගා අනුපදධර්මවිදර්ශනාවසයෙන් අනේකප්‍රකාර වොහාරා සඞ්ඛාරධර්මයන් සම්මර්ශනයෙන් සතිස්කෙලලක්ෂයක් මුඛයෙන් අනුස්වරණවාරය විස්තරකොට එහිම භාවප්‍රඥාණසංඛ්‍යාත විදර්ශනාඥාණය ඥාණයතීක්ෂණශූරභාවයටපැමිණ උට්ඨානගාමිණි, භාවයෙන් පවත්නාකල්හි යම්කලෙක එචිත්තය ආර්යමාර්ගයගාඑක්ව සැටෙමින් පවත්නේද එකල්හි ශ්‍රොතාපත්තාදී මාර්ගපිලිවෙලින්ගොස් එක්දහස්පන්සියයක්පමන කෙලසයන්සමුච්ඡේද ප්‍රහානයෙන්ම ක්ෂයකිරීමෙන් අග්‍රමාර්ගඥාණයෙන් සම්‍යක්සම්බොධියට පැමිනෙනසේක— ඒඅග්‍රලාභයාගේ ප්‍රතිලාභක්ෂණයපටන් අන්‍යවූද දසබලවතුවේසාරද්‍යාදි අසාධාරණ අපරිමිත ඒසියළුබුදුගුණයොද එකල්හි හස්තගතවූ වාහුනම්වෙත්.

මෙසේ සර්වඥපදප්‍රාප්තබවට පැමිණි සම්මාසාමංසබ්බධම්මානං බුජ්ඣනතො බොධනතොවා සම්මාසම්බුඩො යනුහෙයින් සර්වධර්මයන් තමන්වහන්සේම මනාකොට අවබොධකලබැවින්හා එසේම අනුන්ටද අවබොධකලබැවින් සම්මාසම්බුඩනම් හැම්ගුණයෙන් දෙව්බඹසහිතවූ සියලුලොකයාහට අග්‍රප්‍රාප්තව සකලලොකාර්ථයන්සිඩියට කත්‍රැවීමෙන් ලොකගුරුවූ තුම්ලෙව්හිම පතලබහලාන්ධකාර විධ්වංශනසමර්ථමහා ප්‍රදීපයක්සේ සත්වලොකයෙහිපැවති මොහාන්ධකාරදුරු කිරීමටහෙතුවූ බුඩඥාණනැමති මහාප්‍රදීපාලොකයක් ධරාගත් තිලොගුරුසම්බුදුරජානන්වහන්සේද තමන්වහන්සේට සමඅධික කිසිකෙනෙකුන් ලොකයෙහි නැතිහෙයින් අසහාය අචින්තියව මහමේරුවටවැඩි අතික් පර්වතයක්නැත්තාසේ භවාග්‍රයටවැඩි අතික්උස්තැනක් නැත්තාසේ යුගාන්තගින්නටවැඩි අතික්ගිණිකඳක්නැත්තාසේ යුගාන්තවාතයටවැඩි අතික්ප්‍රචණ්ඩවාතයක්නැත්තාසේ එසේමකෙලෙස

යක්සත්වල එකපැහැරගලාසිටි ගුණානනසාගරයටවැඩි අනික් උදකස්කන්ධයක්නැත්තාසේ සියළුලෝකයහට විශෙෂයෙන්වැඩි තරම්වසිටි එසාමගත් ඉඩීක්‍රෘණකරුණ ගුණානුභාවයකින් ලොවැඩමකිරමෙන්, ලෞකිකලොකොත්තර සම්පත්තිප්‍රදයෙන් සකලප්‍රාණීන්සතුටුකරවා තමන්වහන්සේම විශෙෂයෙන් ලොවබබලනසේක—

මෙසේවූ ලොවුතුරාබුදුබව තොලවරකොටඇති මේසියලු ලොකොත්තර සම්පත්තියට පැමිනෙනුකැමති සත්පුරුෂජනයන් විසින් මෙසෙදසවෙනිපරිච්ඡෙදයෙන් කුසලකර්මඵලභූම්වූ ලෞකිකලොකොත්තරසම්පත් ප්‍රකාසකකිරීමෙන් ලොවැඩදක්වා තදනන්තරව සියලුලොවැඩවීමෙහි රාජධර්මයම මූලකාරණාවන බැවින් රාජධර්මවිභාගාදී නවාතිසංසප්‍රකාශකකථාවොද මෙහිද ක්වතුලැබෙත්—ලෝවැඩවීමෙහි රාජධර්මයම මූලකාරණාවූ පරිදි කෙසේදයත්——යම්කලෙක්හි රජදරුවො අධර්මිෂ්ඨවෙද්ද එකල්හිරාජපුරුෂයො අධර්මිෂ්ඨවෙත් රාජපුරුෂයන්අධර්මිෂ්ඨවූකල බ්‍රාහ්මණගෘහපතීහු අධර්මිෂ්ඨවෙත් බ්‍රාහ්මණගෘහපතීන් අධර්මිෂ්ඨවූකල නිගමවාසීහුද ජනපදවාසීහුද අධර්මිෂ්ඨවෙත් නිගම්ජනපදවාසීන් අධර්මිෂ්ඨවූකල විසමවචන්ද්‍ර සූර්‍ය්‍යයොප්‍රවෘත්තවෙත් විසමවචන්සූර්‍ය්‍යයන්පවත්නාකල විෂමවනක්ෂත්‍ර තාරකාරූපයො ප්‍රවෘත්තවෙත්—විසමවනක්ෂත්‍රතාකාරූපයන් පවත්නාකල විසමවරාත්‍රින්ද්‍රිවයො ප්‍රවෘත්තනයකෙරෙත් විසමරාත්‍රින්ද්‍රිවසයන් පවත්නාකල විසම කෙරෙත් විසමවමාසාර්ධමාසය පවත්නාකල විසමවඍතුසංවත්සරයො ප්‍රවෘත්තනයකෙරෙත් විසමඍතුසංවත්සරයන් පරිවර්තනයකලකල විසමවාතහමයි විසමවාතහැමූකල දෙවතාවෝප්‍රකුපිතවෙත් දෙවතාවන්කුපිතවූකල වරුෂාසම්‍යක්ධාරායෙන් වර්ෂනයකොරෙ වරුෂාසම්‍යක්ධාරායෙන් නියමලෙස නොවස්නාකල සස්‍යයොවිසමපාකීවෙත් සස්‍යයන්විසමවපැසෙනකල එවිසමවපැසෙනසශ්‍යපල පරිභොගකරණමනුෂ්‍යයො අයුමදවෙති රුවනැතිවෙති බලනැතිවෙති බොහොරොගපීඩාඇත්වෙත්—මෙම්වදාලහ බුදුහු—

ගුන්නංචෙතරමානානං ජිම්හංගච්ඡතිපුංගවෝ,
සබ්බාතාජිම්හංගච්ඡන්ති නෙත්තෙජිම්හෙගතෙසති·
එවමෙවමනුස්සෙසු යොහොතිසෙට්ඨසම්මතො,
සොචෙවඅධම්මංචරති පගෙවඉතරාපජා.
සබ්බංරට්ඨංදුඛංසෙති රාජාචෙහොතිඅධම්මිකො,
යස්මිංහීකාචෙසමයෙ රාජානොඅධම්මිකාහොන්ති·

යනාදී— යම්කලෙක්හි රජදරුවෝ ධර්මිෂ්ඨවෙද්ද ධර්මිෂ්ඨ වූකල රාජපුත්‍රයෝ 'ධර්මිෂ්ඨවෙත් රාජපුත්‍රයෝධර්මිෂ්ඨවූකල යථොක්තක්‍රමයෙන් බ්‍රාහ්මණගෘහපතිකයෝද නිගමවාසී ජනපදවාසීහුද ධර්මිෂ්ඨවෙත් ඒහැමධර්මිෂ්ඨවූකල සමවචන්ද්‍රසූර්‍ය්‍යයෝ පවතිත් එසේහෙයින්ම නක්‍ෂත්‍රතාරකාරූපයෝද රාත්‍රින්දිවයෝද මාසාර්ධමාසයෝද ඍතුසංවත්සරයෝද විසමනොව සමවපවතිත් එකල්හිවිසම්වාත නොහමයි. දෙවියෝ, කුපිතනොවත් සම්‍යක්ධාරායෙන් නියමලෙස වර්‍ෂාකෙරෙයි සමව පැසනසශ්‍යයෝ ඇතිවේ සමව පැසෙනසශ්‍යඵල අනුභවකරණ මනුෂ්‍යයෝ දිර්ඝායුෂ්කවෙති බලවත්වෙති රූපශ්‍රීවර්‍ණිත ඇතිවෙත් රෝගවිධානැතිවෙත්— මෙමවදාළහ බුදුනු—

ගුන්නංචෙතරමානානං උජුංගච්ඡතිපුඞ්ගවො
සබ්බාතාඋජුංගච්ඡන්ති නෙත්තේඋජුගතෙසති
එවමෙවමනුස්සෙසු යොහොතිසෙට්ඨසම්මතො
සොචෙවධම්මංචරති පගෙවඉතරාපජා
සබ්බංරට්ඨංසුඛංසෙති රාජාචෙහොතිධම්මිකො
යස්මිංහිකාලෙසමයෙරාජානො ධම්මිකාහොන්ති

යනාදී—එහි රජදරුවෝනම් කවරහයත්—

ප්‍රථමකල්පයෙහිඋපන් මහජනයාගේ සම්මතයෙන්මවූහෙයින් මහාසම්මතනම්වූ රජහුපටන් කපිලවස්තුපුරයෙහි රජපැමිණි සුද්ධොදනනරවරාවසානවූ අසම්භින්නවපැවති එකවංසප්‍රසූත සත්ලක්‍ෂ සත්දහස් සත්සිය සතානුවක්පමනවූ රාජන්‍යනයෝද ඊටඉක්බිති බුදුන්ධරමානකාලයෙහිවූ අජාසත්රජපටන් ධර්මාසෝකරාජාවසානව දඹදිවරජපැමිණි සත්දෙනෙක්පමණවූ රාජන්‍යන්දනයෝද—සද්ධර්මරාජන්වූ බුදුන්පිරිනිවිදුම් මේලක්දිවට පැමිණි විජයරජපටන් මෙකලටරජපැමිණි අපගේනිත්‍යශ්‍රීරාජසිංහාභිධාන රජතුමානන්දක්වා ලංකාධිපතිවූ එක්සියසූවාසූදෙනෙක්පමනවූ රාජන්‍යයෝද රජදරුවෝනම්වෙත් ඔහුකවරඅර්ථයකින් රජවූවාහුදයත්—චතූහිසංගහවත්ථූහි ජනංරංජයන්ති රාජා—යනුහෙයින් යම්කෙනෙක්භෝගයක් කැමතිවූනම් ඔවුන්ට ඒ භොගදීමෙන් රංජනයකරවීමයයන දානයෙන්ද යම්කෙනෙක්ප්‍රියවචන කැමතිවූනම් ඔවුන්ටප්‍රිය වචනකීමෙන් රංජනයකරවීමයයන ප්‍රියවචනයෙන්ද යම්කෙනෙක්තමන්ට අනර්ථයක් උපන්කල්හි ඊටසහායකැමති වූනම් ඔවුන්ටපිහිටවීමෙන් රංජනයකරවීමයයන අර්ථචර්‍ය්‍යාවෙන්ද යම්කෙනෙක් එකඅස්නෙහිඅිඳිම්ආදිය කැමතිවූනම් ඔවුන්ගේ ඒඅභිප්‍රාසම්පාදනයෙන් සතුටුකරවීමයයන සමානාත්මතායෙන්ද යනමේසතරසං

ග්‍රහවස්තුවෙන් ජනයන්හට් කෙරෙහි නොවෙනස්ව හැසිරෙණසේ අනුග්‍රහකරවණහෙයින් අනුජීනාමවශයෙන් රාජනම් වූවාහුයි—ඔවුන්ගේ රාජධර්මයනම්කවරහයත් දසරාජධර්මයයි— දසරාජධර්මයහා නොයෙක්රාජධර්මවිභාග සර්වාකාරයෙන් ඒ ඒ සූත්‍රාර්ථකථා ජාතකාවලප්‍රකාශවිය විස්තරාර්ථීපින්විසින් ඒ ඒතැන්හි බලාදතයුතු—මෙවනාහි එක්දෙශයක්දක්වනුලැබේ—එනොසේ දයත්—

ශවත්නුවරනිසා දෙව්රම්හිවසන බුදුරජාණන්වහන්සේ එක්දවසෙක බනඅසන්වන කොසොල්මහරජහට අඩගාවදූරා මිහරජ රජදරුවන්විසින් දසරාජධර්මයෙන් රාජ්‍යයකලමැනව යම්සමයෙක්හිරජ්ජුරුවො අධර්මිෂ්ඨවුවහොත් එසමයෙහිරාජපුත්‍රයොද අධම්මිෂ්ඨවෙත්යනාදි යටකියනලදක්‍රමයෙන් අගොනුත්තරයෙහිවූ චතුෂ්කනිපාතයෙහි රාජෝවාදසූත්‍රයෙන් අවවාදකොට අපායවයාමෙහිආදීනවද සුගතියටයාමෙහි අනුසස්ද වදූරා පචකාමයනම් ස්වප්නයටබඳුඋපමාඇත්තේයයි යනාදීකාමයෙහිආදිනව විස්තරකොටවදූරා තවදපාලිජාතකඅට්ඨවාවෙහිවූ සතලිස්වන නිපාතයෙහි තෙසකුන්ජාතකයෙහුදු ධර්මදෙශනාකකරණසේක්—

වඩ්ඪනාසංහරොනත්ථි ලවගාහොනවිජ්ජති,
යුද්ධංනත්ථිජයොනත්ථි සබ්බමඩ්ඪ පරායනා.

යනාදිවසයෙන් ධර්මදේශනාකරණසේක් තවදමහරජ මරණුකෙරෙහි හැමසත්නුවිශ්වාසයෙක්වත් අත්ලස්දීකියා කවරගැන්මෙක්වත් යුද්ධකොට දිනිමෙක්වත්නැත එහෙයින් සියළුමයතයො මරණපත්විමෙන් මෘත්‍යුමාරයාම පරමප්‍රතිෂ්ඨාකොටඇත්තාහ එසේමියපරලොව යනනාවූසත්‍යාට තමාවිසින්කරණලද කුසලකර්මයවිනා අනික්පිහිටෙක්මනම් නැත ඒකාරණයෙන්ඉතාස්වල්පවූ ශපයක්පිණිස කුසලකරණයෙහි ප්‍රමාදවීම නුසුදුසුය අප්‍රමාදවධර්මයෙන් රාජ්‍යයකරව පූරාතනඅඹුඩොත් පාදකාලයෙහිපවා රජදරුවෝ නුවනැත්තාවුන්ගේ අවවාදයෙහිපිහිටා දැහැමින්රාජ්‍යයකොට දිව්‍යලෝකයටගියායෙවෙදැයි වදූරා ඒකොසොල්රජවිසින් ආරාධිතවූ බුදුරජානන්වහන්සේ ඉකුත්වත්දක්වාවදාළසේක—

යටගියදවසබරණැස කරණ බ්‍රහ්මදත්තනම්රජෙක් දරුවන් නැතිහෙයින් දෙවතාආරාධනාකොට එයිනුත් දුදරුකෙනෙකුන් නොලැබ නැවතපක්ෂින් තුන්දෙනකුලැබ පුත්‍රව්‍යවහාරයෙන්

පොශ්‍යයකරවා ඔවුන්මගත් තුවනැතිබවදුන රාජධර්මයවිචාරණු කැමතිව පලමුව වෙස්සන්තරණම් පක්ෂියානන්සමීපයට ගොස් ඔවුන්ස්වර්ණපීඨයෙක වඩාහිදුවා—

වෙස්සන්තරන්තංපුච්ඡාමි සකුනංභද්දමත්ථුතෙ,
රජ්ජංකාරෙතුකාමෙන කිංසුකිච්චංකතංවරන්ති.

යනමෙගාථාවෙන් රාජධර්මයවිචාලාවූ එබ්‍රහ්මදත්ත රජහට සර්වානර්ථයට මූලකාරණවූ ප්‍රමාදයෙහි ආදීනව—

තතොඃකිච්චානිකාරෙය්‍ය තංවතංආහුඛත්තිය—

යනාදීන් රාජධර්මය ප්‍රකාශකොට කියායනනාහු රජ්ජුරුවන් වහන්ස රජදරුවන්විසි රාජධර්මයන් තුන්දෙනෙකු කෙරෙහි පිහිටියයුතු එයින් පළමුකොටම රජදරුවන් විසින් බොරුකීමෙන් දුරුවියයුතුය මුසාවාද කියණරජදරුවන්ගේ රාජ්‍යයෙහි ත්‍රිත වෘක්ෂලතාදියෙහි ඕජානැති වන්නේය, ගොයන්ආදිසශ්‍යයන් කරණභූමියෙහි රසඔජවද සත්රියනක් පාඬබස්නේ එකල සත්වයන් අනුභවකරණණාවූ ආහරයෙහිද තෙල් මී සකුරු ආදියෙහිද ඖසධයෙහිද රසඔජවද නැත්තේය එසේඔජගුණ නැත්තාවූ ආහාරාදිය අනුභවකලාවූ සත්වයො බොහො ව්‍යාධිපීඩා ඇතිවනනාහුය තවද මුසාවාදකියන රජ්ජුරුවන්ගේ රාජ්‍යයෙහි දියෙන් ගොඩින් උපදනාවූ යම්කිසි ලාභයෙක් ඇත්නම් ගේද නූපදනේය 'එසේ වස්තුනූපන් කල්හි රජදරුවෝ දිළිඳුවනනාහ එකලරජදරුවෝ සේවකාදීන්ට සංග්‍රහකරන්ට නොහැකිවෙත් සංග්‍රහවක්නැති ඒරජදරුවන්ට සියලෙලාම ආදරනොකරණ්ණාහ එහෙයින් මහරජ්ජුරුවන්වහන්ස මෙසේ නිරොජස්කවූ බොරු ජීවිතයපිණිසත් නොකියයුතු වන්නේය—ශබ්දබසනම් මධුරවූරස ඇත්තේය එහෙයින්ම රසායනයක් සමානයයිදුන රුක්‍කායුත්තේය, තවද මේ මුසාවාදයනම් සත්වයන්ගේ අවශේෂ වූ යම්ගුණයෙක්ඇද්ද ඒසියඑගුණද නැතිවනදෙයක විපත්ති කෙලවරකොට ඇත්තේය චුතිචිත්තායටදෙවන චිත්තවාරයෙහි අවීචිමහනරකයට පමුනුවන්නේය වෙතියරජ් ඒඅසා ඉඩීකතු භාවයක්ඇතිවසිටපවා කීමුසාවාදයෙන් නරකයට ගියේය එහෙසින් මුසාවාදයෙන් වැලකීය යුතුවන්නේය.—තවද රජදරුවන් විසින් පළමුකොට නිපිමිඤවභාවවූ ක්‍රොධය දුරුකටයුතු වන්නේය, සෙස්සන්ගේ ක්‍රොධයවනා මුදුන්පැමිණීමක්නැත රජදරුවො වචනාහුවූධහෙයින් කිබැඑපමණකිහුත් අනුන්ටවිනාස වනයෙයින් වහාමුදුන් පැමිනෙයි ඒකාරණයෙන් සෙසුවිණිසුත්

වචඩා අතිසඨින්මකොපය දුරුකටයුතු වන්නේස, ක්ෂාන්තිමෛත්‍රියෙන් දයායෙන්යුක්තව එකපුතකු ඇතිමවකමෙන් ප්‍රිසිදර්ශනයෙන් ලොකවාසීන්ට අනුශාසනා කටයුත්තේය, අධිකවූක්‍රොධඇතිරජහට උපන්යසසහෙතෙම සපිරකොට ගතනොහෙති තවද චූලධම්මපාල ජාතකයෙහි මහාප්‍රතාපනම්රජතෙම තමාගේප්‍රියවූ පුත්‍රයාමරා ඒපුත්‍රසොකයෙන්ලැපැලිමියගිය බිසවතෙරෙහි තෙමේද සෝකකොට ලැපැලිමිය තුන්දෙනම එනමසොකයට පැමිණියහ එසේහෙයින් රජ්ජුරුවන්විසින්, පලමුකොටම මුසාවාදයෙන් වැලකියයුත්තේය දෙවෙනිව ක්‍රොධයෙන්වැලකියයුත්තේය—

තවද රජ්ජුරුවන්වහන්ස රජදරුවන්විසින්නම් නිරන්තරයෙන් ක්‍රීඩාසීලිනොවිය යුතුය සිහිපත්ඇතිවම රාජ්‍යපරිපාලනයකටයුතුය කෙලියෙහිවිදග්ධවූ චචලවූසිත් ඇතිව අමාත්‍යසචිවකටයුතු විචාරන්නේවිනම් ඒතෙමතමහටඋපන් යසසපිරකොටගතනොහී නසාපියන්නේය—එකෙසේදයී නිවහොත්— සරභඟ ජාතකයෙහි පොරොහිතයාගේ බස්ගෙන කිසවච්ඡ තාපසයන්ට ද්‍රොහකොට රාජ්‍යහාසමගනැසී තුමූද සහප්රිවරින්ගොස් කුකකුලනම් නරකයෙහිඋපන්හ තවද මාතඞ්ගජාතකයෙහි මෙජ්ඣනම්රජතෙම බමුනන්ගේබස්ගිවිස මාතඟතාපසයන්ට පීඩාකොට රාජ්ජවාසීන්හාසමග විනාසයටපැමිණ නරකයෙහිඋපන්නේය——තවද ඝතජාතකයෙහි දසබෑරජදරුවෝ මොහයෙන්මුලාව කණ්හදීපායනතාපසයන්ට පීඩාකොට වාසුදෙවකුලය නැසූහ එසේහෙයින් අපරික්ෂාකාරී රජදරුවෝ තමන්ටපැමිණි යසසපිරකොට ගතනොහෙති එසේහෙයින් රජදරුවන්විසින්නම් පලමුකොට මුසාවාදය දුරුකටයුතුවන්නේය දෙවෙනිවක්‍රොධයදුරුකටයුතු වන්නේය තුන්වෙනිව ක්‍රීඩාසීලිව රාජ්ජපරිපාලනයෙහි ප්‍රමාදබව දුරුකටයුතුවන්නේය-මේතුන්කාරණයෙන් දුරුවසිට රාජ්ජවාසීන්ටකලමනා අනුශාසනාකිරීම යනමාවිසින් කියනලද මේසියල්ලම රජදරුවන්ගේ වෘතසමාදානයෙකැයි පුරානැතතුව නැතෙත්තා කියන්නාහ එසේහෙයින් රජ්ජුරුවන්වහන්ස මීටපලමුව ඉදින්නුඹවහන්සේ රාගාදිවසයෙන් පස්වාත්තාපයට නිසිවූ යම්අකුසලකම්මයක් කලසේක්වීනම් මෙයින්මතු එබඳුක්නොකලමැනව තවදප්‍රමාද වාසයඇති රජහුගේ සියළුම භෝගයෝ විනාසයට පැමිනෙනනාහ—ඊටකාරණා කිමයත්—

මහරජ්ජුරුවන්වහන්ස සිරිය කාලකන්නිය යනමොහුදෙදෙනා අතුරෙන් ශ්‍රිනොමොකියනනී යම් සඬයෙක්නොමොකියනනී.

උට්ඨානවීර්‍ය්‍යඇතිව අප්‍රමාදව කුසල්කෙරෙද පරසන්තක වස්තු දැක ලොභ නූපදවාද එසේවූ සත්වයාකෙරෙහි යමාඅභිරමනය කරණ්නේයයිකිව· එසේහෙයින් රජ්ජුරුවන්වහන්ස තුඹවහන් සේ සියලලවුන්කෙරෙහිම මෛත්‍රිඇතිව සියල්ලටම රක්‍ෂාස්ථාන වූවමැනව කාලකන්නියට අවකාසනොදී ශ්‍රීයට වාසස්ථානවූව මැනව—දෙදෙවුලොව දෙවියන්ට අධිපති ශක්‍රදේවේන්ද්‍රයොපවා එසේවූ උට්ඨානවීර්‍ය්‍යයෙහි අප්‍රමාදව දෙදෙවුලොව දෙවියන් ස මග කච්ඡාඨානම් ආශ්‍රමප්‍රදෙසයටගොස් සරභංග සෘෂීන්කෙරෙන් ප්‍රශ්ණවිචාරා ධර්මයඇසූහ-කාශ්‍යප සර්වඥයන්වහන්සේගේ ශාසන ය පසුබස්නාදැක තමන්ගේ අනුභාවයෙන් මහජනයා නැතිග ත්වා ඒ ශාසනය බොහොකලක් පවත්නාපරිද්දෙන් කලහ· මෙසේ උට්ඨානවීර්‍ය්‍යාදිය කාලමනාදෙයෙක්මය—

තවද චාතුර්මහාරාජිකයෙන් යට අණ්ඩජ ජලාබුජ සංසේදජ ඕපපාතිකසංඛ්‍යාතවූ චතුර්විධයොනියෙහි උපන්නාවූ දෙවතාවොද බ්‍රහ්මසමූහයාද සදෙවුලොව දෙවියොද යනමේ සියළු දෙවතාවො බලවත්වූ කුසලඅදහස්ඇති එබඳුරජදරුවන්හා සමාන ජීවිකාවෙන් ජීවත්වන්නාහ· එකුසල්සිත්ඇති රජදරුවො දානාදීවූ පින්කම්කොට දෙවියන්ට පින්දෙන්නාහ ඒ දෙතාවො ඒ පින් අනුමොදන්ව අවැවූයසපිරිවරින් වැඩෙන්නාහ· එසේදිව්‍ය ඓශ්වර්‍ය්‍යයෙන් අභිවෘද්ධියටපැමිණියාවූ ඒ ඒ දෙවතාවො ඇමවේලෙහිම වීර්‍ය්‍යකොට කුසල්කරන්නාවූ අප්‍රමාදව වාසයඇති එබඳුවූ රජදරුවන්ට ධර්මිකවූ වරණගුප්තියකෙරෙමින් ජායාවක් මෙන් අනුවපවත්නාහ—එසේහෙයින් මහරජ තුඹවහන්සේවූකලී දසකුසලධර්මයෙහි අප්‍රමාදව නිද්‍රිතනොව සියළුකාරියකලමනා නොනැවත ඒ ඒ රාජකාර්‍ය්‍ය විචාරාපරීක්‍ෂාකොට තුඹවහන්සේට ප්‍රත්‍යක්‍ෂව වැටහුනුදෙයකටම නිග්‍රහසංග්‍රහදෙකක්කලමැනව මේ ලොකයෙහි අලසවූ වීර්‍ය්‍යමදසත්වයො පැවිදිවගතනොහෙන්නාහ· තුඹවහන්සේඑසේනොව සියළුකාර්‍ය්‍යයෙහි අප්‍රමාදව වීර්‍ය්‍යඇතිවූව මැනව-මහරජ්ජුරුවන්වහන්ස මා විචාල රාජධර්මය මාවිසින් පල මුකොටම මුසාවාදය දුරුකටයුතුයයි යනාදින් යම් මේ ව්‍රත කොට්ඨාසකෙනෙක් කියනලද්දූහුවිනම් එහි පැවැත්තමැනව. ඒ ආචාරව්‍රත්‍යම තුඹවහන්සේට අවවාද අනුශාසනා වන්නේය· මෙසේ මේ ධර්මයෙහිපවත්නා රජතෙම තමන්ගේ මිතුරන්ට ශප දෙන්ටත් සතුරන්ට දුක්දෙන්වත් සමර්ථයයියනාදීන් ධර්මදෙශනා කලකැල්හි ඒඅසා සතුටුවූ මහජනසහිත මහරජ ඒ වෙස්සන්තරණම් පක්‍ෂියාට මහත් සත්කාරසම්මානකොට ඉක්බිති කුඩලී

නම් ලිහිනියවම්පයටගොස් පළමුපරිච්ඡෙදන්හි මධ්‍යමධ්‍යයෙහි වූ සුවර්ණපීඨයෙහි හිඳුවා රාජධර්මය විචාරනනාහු—

සක්ඛිසිත්වංකුණ්ඩලිවංඤ සිඛත්තියබන්ධුනි
රජ්ජංකාරෙතුකාමෙන කිංසුකිච්චංකතංවරන්ති-

යනමේ ගාථාවෙන් කුණ්ඩලිනීනම් පක්ෂිධෙනුවකෙරෙන් රාජධර්මයවිචාරණාවූ බ්‍රහ්මදත්තනාම් රජතෙම රාජ්‍යයකරණුකැමති රජදරුවන් කවර කෘත්‍යයක්කිරීම උතුම්දැයි විචාලතැන කුණ්ඩලිනිතොමෝ—

වෙවතාතපදකානි යෙසුසබ්බංපතිට්ඨිතං,
අලද්ධස්සචයොලාභො ලද්ධස්සඅනුරක්ඛනා-

යනාදී ගාථා එකලොසකින් සියළුම රාජධර්මය පදවයෙක්හිම ඇතුලත්කොටදක්වා තියත්හි: මහරජ්ජුරුවන්වහන්ස යම් කාරණාදෙකක සියළු අණීජාතකයහා හිතශපපිහිටියේවීනම් එසේවූ කාරනාපදදෙතකවෙත: ඔහු කවරහයත්-පෙර නොලබනලද ලාභයාගේ ලැබීමය ලබනලද ලාභය නැසියනොදී රක්ෂාකිරීමය යනමේ දෙකෙක්වන්නේය. එසින් නූපන්ලාභය පදවුම්බැරරුම්නොවෙයි උපන්ලාභය සොරුසතුරුආදින්ගෙන් නැසීමට නොදී රක්ෂාකිරීම බැරරුම්වන්නේය. සමහරකෙනෙක් සම්පත් උපදවායෙනත් යසතිසාප්‍රමාදව මානයඋපදවාගෙණප්‍රාණඝාතාදී පවුකෙරෙමින් ප්‍රසිද්ධවූ සොරකම්කෙරෙමින් අපරීක්ෂාකාරීව රට කොල්ලකා ඇවිදිනාකල්හි ඔහු රජදරුවොඅල්වාගෙණ මහත්වූ විනාසයට පමුනුවනනාහ: නොහොත් රූපාදීවූ පචකකොට්ඨාසයෙහි ඇළුම්ඇතිව ප්‍රමාදව නුනුවනින් වස්තුනිමාගියකල්හි දුක්පත්ව ඉතා බැගෑව රෙදිවැරලි හැඳගෙන කබලක්ගත් අත්ඇතිව දොරසිගාඇවිදිනේය—ප්‍රව්‍රජිතයන්වහන්සේත් ග්‍රන්ථධුරවිදර්ශනාධුරයෙහි යෙදිමෙන් ලාභසත්කාරඋපදවා කලකින් ප්‍රමාදව ගිහිභාවයට පැමිණෙනසේක, සමහර තපස්වීනකනෙක්ධ්‍යානඋපදවා සත්සිහිමුලාසෙන් නාපුරු රූපාලම්බනයක බැඳී ඒ ධ්‍යානයෙන් පිරිහෙනසේක-මෙසේ ලත්යසලාභාදිය රැකීම දුෂ්කරය යමෙක් ලාභසත්කාරාදිය උපදවා අප්‍රමාදවසිට කුසලකර්මයෙ යෙදිවසත්නේවීනම් ඔවුන්ගේ යසස සුක්ලපක්ෂයෙහි කලාවෙන් කලාවට වැඩීයන සඳමඩලමෙන් අභිවෘද්ධියට පැමිණෙන්නේය—එහෙයින් මහරජ්ජුරුවන්වහන්ස නුඹවහන්සේ අප්‍රමාදව ප්‍රයොගසම්පත්තියෙහිසිට දැහැමෙන්සෙමෙන් රජකෙරෙමින් නුඹවහන්සේටඋපන් යසස් නොනසා රැකකමැනව—

තවද යමෙක් දූකෙළියෙහි ලොල් නොවූ කෛරාටිකනොව
පුෂ්පගන්ධමාල්‍යාදියෙහි ලොල් නොව තුඹවහන්සේ අධිනිධනධා
න්‍යාදිය, සුරක්ෂිතවරුකව තිබෙන්නේවිනම් එබඳුවූ තුඹවහ
න්සේට අමාත්‍යවියයුතුය· යම්සේරථාචාර්‍ය්‍යයෙක් මාර්ගයෙන්
වන පීඩාදුරුකරණ පිණිස සියළු වස්තුවහාසම්ග රථයනොන
සාරුකගෙන තිසි කැමතිමගින්ගොස් ක්ෂේමභූමියට පමුනුවාලී
මෙන් රක්නේද එමෙන් තුඹවහන්සේගේ වස්තුසමූහ තුඹවහ
න්සේ රක්නාවූ සමර්ථවූ අමාත්‍යයෙක් විනම් එසේවූ අමාත්‍යයා
ම තුඹවහන්සේට අමාත්‍ය නම් වන්නේය, ඔහුලවා භාණ්ඩාගාර
ගෙයි කාර්‍ය්‍යකරවූවමැනව, අතුළුරජගෙවසන හැමදෙනම හි
රණ්‍යසුවර්ණාදියෙන් සංග්‍රහනොලද්දාහුනම් ඒකාරණයෙන්
ඒවස්තුන්හානිවීමෙන් මහත්විනාස පැමිණෙන්නේය, ඇතුලේ
හිනවසයෙන් කලමින්නුනායන් පිටතටපතල වන්නේය එහෙයින්
තුඹවහන්සේ ඇතුළුරජපිරිස සංග්‍රහයෙන්සිත්ගෙන මාගේ මේ
තෙක්වස්තුඇතැයි තුමූමසම්පත්පරීක්ෂාකොටගෙණ අසවල්තැ
නමේතෙක්දැනිධානවිය ඉන්දූනයන් මෙතකැයිතුටුව ප්‍රත්‍යක්ෂ
යෙන්දතමැනවි තුමූනොදූන අනුන්බස්ගෙන වස්තුශහවිමත්
නායදීමත් නොකලමැනව-

තවද ඒ ඒතැනින් උපදනාඅයද ඔවුනොවූන්ට දියයුතුවූඅ
යද තුමූම්දූනගත දූනමැනව යුද්ධයෙහිහෝ නෛවකර්මයෙහි
හෝ අන්‍යවූසෙසුරාජකාරීයෙහිහෝ මොහුවිසින් මෙනම්දෙය
ක්කරණලද, මොහුවිසින් මෙනම්දෙයක් නොකරණලදැයියන
මේසියල්ලත් තුඹවහන්සේම, දතමැනව අනුන්ගේබස් අදහා
නොගතමැනව-

තවදමංපැහැරීම් උමංකැනීම් ආදීවූනිග්‍රහයට තිසිනොයෙක්
දෙසකාරයකුගෙනාවුත් දක්වාළුැනැ ඔහුගේදෙස විචාරානිය
මකොට පූරාතනයන්විසින් නියමකොට නිග්‍රහයට තබනලද
දඩනයපරීක්ෂාකොට දෙසානුරූපවූ නිග්‍රහකරණසේක් යමෙක්
තුඹුනනාවූ පරසේනාව බඳුවාදීලාද බිඳීගියසිය්සෙනග සිටුවණු
ව සමර්ථදනොලත් රාජ්‍යයත් ඇරදීලත්ට යොග්‍යද ලත්රාජ්‍ය
යත් ස්ථිරකොටලන්ටසමර්ථද යමෙක්හුවිසින් ජීවිතපරිත්‍යාගකො
ට කාර්‍ය්‍යකරණලදෙදවේද එබඳුවුවන්ට මහත්සත්කාරසම්මාන
දීමෙන්සංග්‍රහකරන්නේයි එසේඇතිකල්හි ඒරජගෙයි සියළුරා
ජකාරියෙහි සෙසෙසාද කලමනාකාරියකවල් එකලසංග්‍රහබලා
නොපමාවසිත්දී කරණ්ණාහ තවද සියළුජනපදවාසීන්ට වන්
නාවූ අභිවෘද්ධියත් රටරැක්මත් මෙසෙමෙසේ වියයුතුයයි ප

රීක්‍ෂාකොට කුමුම්දුන ඒවූපරිද්දෙන්ම ඔවුන්ටඅනුසාසනාකළමැ
නව රාජනියොගයෙන් ඒ ඒකාර්‍යධුරවලයෙදීසිටිනා අධර්මිෂ්ඨ
ඝතාපුෂ්ඨයෝ අත්ලස්ගෙන ධාර්මිකවූ සව්භාවිනිශ්චයබිඳ තුඹව
හන්සේගේධනයද සියළුරටද විනාසකරණ්ණාහුය, එහෙයින්
අප්‍රමාදව තුමූමරාජ්‍යවාසීන්ගේ යුක්තිවිචාරා අනුශාසනාකලමැ
නව--- අපරීක්‍ෂාකාරීව කිසිවක්සූහුව නොකලමැනව අනුත්ල
වාත්නොකරවූවමැනව පරීක්‍ෂානොකොට ඡන්දද්වසයෙන්අග
තියටගොස් කරණලදකාරියෙන් මෙලොවමපස්වැතතාපයටත්
පරලොවනරක ගින්නෙන්තැවීමටත් කාරනාවන්නේය එහෙයින්
හැමතැනම පරීක්‍ෂාකාරීවකලමැනව තවද තුඹවහන්සේගේසි
ත කුසලයෙඉක්ම පාපයෙහිපවත්නේද එකල්හිසෙසු සත්වයන්ගේ
සිත ඉතාබලවත්පාපයෙහි පවත්නේය, එහෙයින් ඒපාපයෙහි
සිතහලමැනව විනිස්චාසොනයෙහි සිටිකල මොහුවිසින් මිනිස
කුනසනලද සන්ධිච්ඡේදියහො කරණලදූසිතියා සොරකුගෙ
නදක්වූකල ක්‍රොධවසයෙන්ගෙණ යුහුවඹවූන් අනුන්ට හිංසාපී
ඩානොකලමැව නිවරදියනුන් වරදකලවූන්සේදක්වති එහෙයි
න් එදෙපක්‍ෂයෙ බස්විචාරා තුඹවහන්සේටම සබැවිමෙන් වර
දදුන රාජපරම්පරාගත ක්‍රමයෙන්ඔහට කලමනාදඩ නිග්‍රහක
ලමැනව කොපඋපන්කල ලයසිහිල්වහියේනම් එකල්හි විනිශ්
චයමඩලයෙහිද සියළුරාජකාරිය විචාල යුක්තේය,---

තවද මම පෘථිවීස්වරයෙහිසිටියා මහජනයා කායදුශ්චරිතා
දීවූ අවධෙහි නොයෙදුවමැනව තුඹවහන්සේගේ විජිතයෙහි
මනුෂ්‍යාදී හැම්සත්නට දුක්ඛොත්පත්තියක් නොවෙවයි යම්සේ
අධර්මිෂ්ට රජදරුවන්ගේ විජිතයෙහි මනුෂ්‍යයො කායදුශ්චරි
තාදී පවුකොට නරකයෙහි උපද්දද එපරිද්දෙන් තුඹවහන්සේ
ගේ රාජ්‍යවාසීන්ට නරකොත්පත්තියනොකොට යම්සේ දුක්නො
විඳ ශපවිදිද්ද එසේවූ යහපතක්ම කලමැනව--තවද යම් පෘථිවී
ස්වරයෙක් ලොභයවූවමනා අනතානුවාදදීවූහයින් නිර්භීතව ඒ
කිසිවෙක්හි සාංකානොකොට යෂ්ටිඅග්‍රයෙන්වෙන්වූ අන්ධයෙකු
මෙන් අකුසනැති ප්‍රචණ්ඩ හස්තියකුමෙන් තමන්ගේ අභිප්‍රායෙයෙ
ක්හි හැසිරීමෙන් ස්වච්ඡන්දාරවසයෙන් යමක් කැමැතෙනාවිනම්
ඒ ඒ දෙයම කෙරේද ඔවුන්ගේ සියළුභොගයො විනාසවන්නා
හුය. ඕහට ඒ භොගවූව්‍යසනය මහ දුක්ඛයයි කියනුලැබෙයි--
එහෙයින් දෙහරජ්ජුරුවන්වහන්සේට මා විසින් යටකියනලද්දාවූ
සියළු රාජධර්මයෙහි පිහිටියමැනව. ඒ රාජධර්මයෙහි දක්‍ෂව අන
ලසව කුසල්කොට දුස්සීලවූසත්වතෙම තමා නරකයෙහි මහත්වූ
දුකට පමුනුවනහෙයින් සුරාපානාදී පාපකර්ම දුරුකොට වෙහ

ලෞකික පාරලෞකික සියළු වැඩට කාරණවූ සීලාචාරාදි ගුණ
සම්පන්නව රාජධර්මාදියෙහිපිහිටා රජකලමැනවැයි අවවාද කො
ට ධර්මදෙසනාකලාය. ඒ අසා සතුටුවූ මහජනසහිතවූ බ්‍රහ්මදත්ත
රජතෙම කුඩලිනම් ලිහිණියට බොහෝ සත්කාරසම්මානකොට
ඉක්බිති—තවද ධර්මය අසනුකැමැත්තාවූ ඒරජතෙම ජම්බුකපඬිත
නම්වූ ශිරාපක්ෂිරාජයා සව්මීපයටගොස් එපරිද්දෙන්ම සවර්ණපීඨ
යක වඩාහිඳුවා ප්‍රශ්ණවිචාරණාවූ බ්‍රහ්මදත්තනම් රජතෙම—

පුච්ඡාමහාසිකොසිකං කුඩලිනිචතතෙවජම්බුකං,
ත්වංදූනිවදෙහිජම්බුක බලානංබලමුත්තමන්ති-

මෙසේ රජ්ජුරුවො මහබෝසත්තානන්අතින් ප්‍රශ්ණවිචාරණයෙ
සෙසු දෙදෙනාඅතින් විචාලශැටියෙ නොවිචාරා රාජධර්මයද උතු
ම් බලයද කියවසිකියා විශෙෂකොට විචාලහ—එකල්හි මහබෝ
සතානො එසේවීනම් රජ්ජුරුවෙනි එසේවිනම් කම්යොම්‍ා අසව
තොපට සියළුරාජධර්මය කියම්සීකියා දීක්කලඅත දහසින්බදපිය
ලලක් තබන්නක්හුමෙන් ධර්මදෙශනාකරණසේක් මහරජ්ජුරු
වෙනි සත්වලොකයෙහි මහත්වූ අධ්‍යාශ ඇති පුරුෂයාකෙරෙහි
පචවිධවූ බලයෙක් වන්නේය, එයින් කායබලය ඉතා මහත්වී
නමුත් ලාමක වන්නේය, ඊට කාරණ කවරේදයත්?—අඥනබල
බැවිනි, ඉදින් කායබලය මහත්වී නමුත් ඒ බලයට වඩා කැට
කිරිලිබලය අල්පනොවන්නේය,ඇත්බලයවූකලි අඥනබලබැවින්,
මරණප්‍රාප්ත විය, කැටකිරිලිතොමෝ තමාගේ ප්‍රඥසාමර්ථයෙ
න් හස්තිරාජයා ජීවිතක්ෂයට පැමිණවුව, එහෙයින් හැම්තන්හි
කායබලය ප්‍රයොජන නැත, අඥනයන්ගේ කායබලය ආත්ම
වධයපිණිස වන්නේය, එහෙයින් කායබලයටවඩා හිරණ්‍යසුව
ර්ණාදිවූ භෝගබලය ඉතා මහත්වන්නේය, ඒ භොගබලයට වඩා
භෙදයට නොපමුණුවන්නාවූ මනාත්‍රණය ඇති සෞරවියක්මනා
සිත් ඇති සංසුං අමාත්‍යමණ්ඩලය ඇතිව වසනලදබලය යුධ
යොග්‍ය බැවින් පූර්වබලයට වඩා ඉතාමහත්වන්නේය, බ්‍රාහ්මණ
වෛශ්‍යක්ෂුද්‍රකියනලද ත්‍රිවිධකුලයන් ඉක්මසිටි ක්ෂත්‍රියකුලවංශ
යෙන් ජාතිසම්බන්ධ ඇතිබව යටකී සෙසු ත්‍රිවිධබලයන්ට වඩා
ඉතාමහත් වන්නේය, ජාතිසම්පන්නයෝම ශුද්ධවන්නාහ, සෙසු
සත්වයෝ ශුද්ධනොවන්නාහ, යම් මේ චතුර්විධබලයට නුවනැත්
තාවූ සත්වතෙම පැමිණියේවීනම් ඒ සියලුමබලයට වඩා ප්‍රඥ
බලයම ඉතා ශ්‍රෙෂ්ඨවන්නේය, ඒ ප්‍රඥබලයෙන් යුක්තවූ සත්වතෙ
ම ඉතාමහත් අභිවෘද්ධියට පැමිණෙන හෙයින් ප්‍රඥවම අග්‍රවන්
නේය, ප්‍රඥනැති පුද්ගලතෙම සත්රුවතින් සම්පූර්ණවූ ප්‍රතිබිම්බ

ලය ඉදින් ලද්දේවී නමුත් ඔහු නොකැමතිපරිද්දෙන්ම බලාත්කාරයෙන් අනික් ප්‍රඥාසම්පන්නයෙක් රාජ්‍යභාරය පිළිපදනේය, අඥානසත්වතෙම ලබනලදයසස්සරක්නට වේයයි තමාගේ කුසල සන්තානව පරම්පරාවෙන් පැවතආ රාජ්‍යයට පැමිණෙන්ට වේවයි අසම්භවන්නේය, නුවණමඳව ජාතිසම්පන්නයනිසා කුලසන්තානකවූ රාජ්‍යය ලැබත් සියළුරාජ්‍යශ්‍රීන් යුක්තවත් ජීවත්විගතනොහි උපායෙහි අදක්ෂබැවින් දුක්පත්වන්නේයයි මෙසේමහබෝසත්තානෝ නොයෙක් කාරණයෙන් අඥානයාගේ අගුණකී, දූන් ප්‍රඥාවට ප්‍රශංසාකරනනාහු මෙසේ කීහ—

මේ ලෝකයෙහි උතුම් ප්‍රඥාඇති සත්වතෙම බහුශ්‍රුතබැවින් කාරණාකාරණහා යුක්තායුක්ති විශේෂයෙන් නිශ්චය කරන්නේය, නැවත කීර්තිඝෝෂාවටත් පැමිණෙන්නේය, ලාභසත්කාරයන් වඩනේය දුක් උපන් කල්හිද උපායෙහි දක්ෂබැවින් නිර්භීතව සැපයට පැමිණෙන්නේය.

යම් සත්වයෙක් අශකුසලකර්මපථවිභාගයෙහි දක්ෂද වීර්‍ය්‍ය කරන්ට සුදුසුතැන්හි වීර්‍ය්‍යකෙරෙද කුශලසිතව ඒ ඒ දෙයකරන්ට නිසිතන්හි ඒ ඒ කාර්‍ය්‍ය කෙරෙද එසේවූ යහපත් පුද්ගලයාහට කර්මඵල සමෘද්ධවන්නේය—ලාභයසසැපආදී සියළුවැඩට ආකාර නොවූ සියළුම දුකට ආකරවූ දුශ්ශීලක්‍රියාවෙන් යුක්තපුද්ගලයන් සේවනය කරනනාවූ කුසලකර්මකරණකාලයෙහි කලකිරීමැලිව උකටලිව කරනනාවූ මෙබඳු පුද්ගලයාහට කර්මවිපාක සිද්ධනොවන්නේය සදෙව්ලොව නූපදනේය—අනිත්‍යභාවනාදිවශයෙන් යුක්තවූ යහපත් සිල්වත්පුද්ගලයන් සේවනයකරනනාවූ කුසල් කරණතැන නොකලකිරී මැලිනොව කාර්‍ය්‍යකරනනාවූ පුද්ගලයාහට ඒ කර්මවිපාකය සමෘද්ධවන්නේය; මහත්වූ ඓශ්වර්‍ය්‍යයට පැමිණෙන්නේය—

තවද මහරජ්ජුරුවන්වහන්ස යෙදියයුතුකාරණයෙහි යෙදීම් සංඛ්‍යාතවූ සියලුවැඩට කාරණව සිටි ප්‍රඥාකොට්ඨාසයද රැස්කරණලදවස්තුව රක්ෂාකිරීමද යන මේ දෙකහා පළමු මාවිසින් කියනලද සියළුකාරණයන් සේවනය කලමැනව, මාකී අවවාද සිත් තබාගෙණ නුඹවහන්සේගේ ගෙයි වස්තුව රකිමින් ජීවත්වුව මැනව; නිෂ්කාරණයෙහි වස්තුව නොනැසුවමැනව, නුවණමඳ පුද්ගලතෙම නිෂ්කාරණයේ සියළුවස්තුව අවිද්‍යානැමැති ගින්නෙහි දවා නැතිකොට පසුව දුගීබවට පැමිණෙන්නේය, යම්සේ උනපතු බටපතුආදියෙන් කරණලද්දාවූ ගෙය මුළු දහා දිරා ස්

මහාදිවූ ප්‍රතිෂ්ඨාවක් නැතිබැවින් වැටීයද ඒපරිද්දෙන් අඥාන සත්ත්වතෙම නිෂ්කාරණයේ වස්තුව නසා අපායෙහිඉපද මහත් දුක් අනුභවකිරන්නේයයි මෙසේ මහබෝසතානෝ මෙතෙක් කාරණ දක්වා යටකියපාලදක්‍රමයෙන් කායබලය වස්තුබලය යහපත් අමාත්‍යමණ්ඩලබලය උතුම් ජාතිසම්පන්නාබලය ප්‍රඥාබලය යන මේ පංචවිධවූ බලයන් නොයෙක් පරිද්දෙන් වර්ණනාකොට නැවතද ඒ සියළුබලයන්ට වඩා ප්‍රඥාබලය උසස්කොට සඳමඬලයෙහි හඳනාසේ ප්‍රකාශකොට දින් ගාථා දශයකින් අවවාදකරන්නාහු මෙසේ කීහ—

ධම්මං චර මහාරාජ මාතාපිතූසු ඛත්තිය,
ඉධ ධම්මං චරිත්වාන රාජ සග්ගං ගමිස්සසි.
ධම්මං චර මහාරාජ පුත්තදාරෙසු ඛත්තිය—පෙ—
ධම්මං චර මහාරාජ මිත්තාමච්චෙසු ඛත්තිය—පෙ—

ධම්මං චර මහාරාජ වාහනෙසු බලෙසු ච—පෙ—
ධම්මං චර මහාරාජ ගාමෙසු නිගමෙසු ච—පෙ—
ධම්මං චර මහාරාජ රට්ඨෙ ජනපදෙසු ච—පෙ—
ධම්මං චර මහාරාජ සමණබ්‍රාහ්මණෙසු ච—පෙ—

ධම්මං චර මහාරාජ මිගපක්ඛීසු ඛත්තිය—පෙ—
ධම්මං චර මහාරාජ ධම්මො චිණ්ණො සුඛාවහො,
ඉධ, ධම්මං චරිත්වාන රාජ සග්ගං ගමිස්සසි.
ධම්මං චර මහාරාජ සඉන්දදෙවා සබ්‍රහ්මාපිච,
සුචරිතෙන දිවංපත්තා ධම්මං රාජමාපමාදෙති—

මහරජ්ජුරුවන්වහන්ස උදෑසනක්සේනැයි දෙමවුපියන්ට දැහැටි පැන්දීම්ආදිවූ සියළු වතාවත් කොට කැඳ අවුළුපත් බුලත් ආදිවූ දෙය අනුභව කරවා ශරීරසන්තර්පනය කොට පස තෙල් ගා අතපය මැඩීමආදිවූ ශරීරපරිහරණය කරෙමින් මාතෘපිතෘඋපස්ථාන කරන්නාවූ තුඹවහන්සේ ධර්මයෙහි හැසුරුණමැනව—රජ්ජුරුවන්වහන්ස දෙමවුපියන්ට මෙහෙකිරීම් සංඛ්‍යාතවූ කුශලකර්ම ධර්මය මේ මනුෂ්‍යලෝකයෙහිදී කොට පරලොව ස්වර්ගෝත්පත්තියට උත්සාහකළමැනවි—මහරජ්ජුරුවන්වහන්ස දූ දරුවන් අකුශලයෙන්වලකා කුසලයෙහි පිහිටුවා ශිල්ප උගන්වා වැඩිවිය පැමිණිකල්හි සුදුසුවූ කුලයන්හා ආවාහවිවාහ කොට උන්උන්ට සුදුසු ගවමහිස වස්ත්‍රාභරණාදී වස්තුදීමෙන් දරුවන් කෙරෙහි හැසුරුණමැනව—

සාමාන්‍ය අන්තඃපුරස්ත්‍රීන්ට හා බිසෝවරුන්ට සම්මාන නොකෙරෙමින් උන්හික්ම නොපැවත, සියළුඓශ්වර්‍ය්‍ය උන්ගේ විධානයට හරිමින් උතුම්වූ වස්ත්‍රාදිය දෙමින් අග්‍රමහෙසිකාවහා අන්තඃපුරස්ත්‍රීන්කෙරෙහි ධර්මයෙහි හැසුරුණමැනව—මහරජ්ජුරුවන්වහන්ස යාළුවිස්වාසයන්හා අමාත්‍යයන්හා අවශේෂවූ සියළුසත්ත්වයන්ට දනප්‍රියවචනය අර්ථචර්‍ය්‍යසමානාත්මතායයි කියනලද සතර සංග්‍රහ කෙරෙමින් මට සිළුටුවූ ප්‍රිය තෙපුල් කීමෙන්හා එකී වචන නොකීමෙන්හා මුසාවාදදීවූ චතුර්විධ වාක්දුශ්චරිතයෙන් සියළුජනයා නොසටා ඔවුන්කෙරෙහි ධර්මයෙහි හැසුරුනමැනව මහරජ්ජුරුවන්වහන්ස හස්ත්‍යශ්වාදී වාහණයන්ටහා සේනාවට දියයුතු වැටුප් වියදම් ආදිවූ සියල්ල දීමෙන්හා සත්කාර සම්මාන කිරීමෙන්ද හස්ත්‍යශ්වාදීන් වෘද්ධඅවස්ථාවෙහි කර්මාන්තයෙහි නොයොදා ඔවුන්කෙරෙහි ධර්මයෙන් හැසුරුණමැනව—මහරජ්ජුරුවන්වහන්ස රාජ්‍යවාසීන්ටහා ජනපදවාසීන්ට නිෂ්කාරණයෙහි පීඩාකොට උන්කෙරෙහි ක්‍රොධසිත් නොඅලවා ජනපීඩා නොකොට සියළු සත්ත්වයන්කෙරෙහි මෛත්‍රී පතුරුවන්නාවූ තුඹවහන්සේ රටවැස්සන්හා දනව්වැස්සන්කෙරෙහි හැසුරුණමැනව——මහරජ්ජුරුවන්වහන්ස ධාර්මිකවූ ශ්‍රමණබ්‍රාහ්මණයන්ට චීවරපිණ්ඩපාතසේනාසන ගිලානප්‍රත්‍යයයි කියනලද චතුර්විධප්‍රත්‍යය දීමෙන් ඔවුන්කෙරෙහි ධර්මයෙහි හැසුරුණමැනව—රජ්ජුරුවන්වහන්ස සියළු මෘගසූකරාදීවූ චතුෂ්පාදයන්හා පක්ෂිසමූහයන්ට අභය දීමෙන් මෘගපක්ෂීන්කෙරෙහි ධර්මයෙහි හැසුරුණමැනව—මහරජ්ජුරුවන්වහන්ස සාමාන්‍යයෙන් සියළු සත්ත්වයන්කෙරෙහි මෛත්‍රීපැතිරීමෙන් හැමදවසම ධර්මයෙහි හැසුරුණමැනව,—මනාකොට පුරුදුකරණ ලද්දාවූ දනසීලාදීවූ සුචරිතසංඛ්‍යාතවූ කුසලධර්මය සදිව්‍යලොකයෙහි උපදවා මහත් දිව්‍යසැපත් වැලදීමෙන් සැප එලවන්නේය, එසේ හෙයින් මහරජ්ජුරුවන්වහන්ස මේ මනුෂ්‍යලෝකයෙහිදී කුශලධර්මයෙහැසිරී ස්වර්ගගාමීව ගොස් දිව්‍යශපත් අනුභවකලමැනව— මහරජ්ජුරුවන්වහන්ස ශක්‍රදේවේන්ද්‍රයන් ප්‍රධානකොට ඇති දෙවියන් හා සහම්පතිමහාබ්‍රහ්මයා ප්‍රධානකොට ඇති සියළුබ්‍රහ්මයෝ මනුෂ්‍යලොකයෙහිදී කරණ ලද්දාවූ කායසුචරිතාදීවූ උත්තම සුචරිතයෙන් දිව්‍යබ්‍රහ්මලෝක සංඛ්‍යාතවූ ස්වර්ගයට පැමිණ එහි යසස් සමෘද්ධිය අනුභවකරන්නාහ, එසේ හෙයින් මහරජ්ජුරුවන්වහන්ස තුඹවහන්සේ ජීවිතපරිත්‍යාගකොටත් කුසලධර්මයෙහි අප්‍රමාදව වූවමැනවැයි මෙසේ දසවිධවූ රාජධර්මය කියා මත්තෙහිත් අවවාද කරන්නාවූ මහබෝසතානෝ මෙසේ කීහ:—

මහරජ්ජුරුවන්වහන්ස තුඹවහන්සේ මාවිසින් කියනලද්දාවූ අවවාදය සීන තබාගෙණ හැමකල්හිම නුවනැත්තාවූ සත්ත්වයන් සේවනය කොට කලතණාගුණයෙන් සමන්විතවූ සියළුකාර්‍ය්‍යාකාර්‍ය්‍ය තුමූම දැන සියළුරාජධර්මය සම්පූර්ණකොට ඉගෙණ මාවිසින් අවවාදඅනුසාසනාකළාවූ පරිද්දෙන් පිළිපැද්ද මැනවැයි මෙසේ මහබෝසතාණෝ ආකාශගඞ්ගාව ගෙණහැරපානා කලක් මෙන් සර්වඥලීලාසයෙන් රජ්ජුරුවන්ට ධර්මදේසනා කළහ, මහජනයෝ මහබෝසතාණන් වහන්සේ කෙරෙහි පැහැදව සත්‍රාභරණයෙන් පූජාකොට බොහෝ සත්කාරසම්මාන කළහ, දහස්ගණන් සාධුකාරනාද පැවැත්වූහ,—බ්‍රහ්මදත්තරජ්ජුරුවෝද බොහෝ සතුටුව මහබොසතාණන් වහන්සේට රාජ්‍යයෙන් පවරා නොයෙක් සත්කාරසම්මානකොට ඒඅවවාදයෙහි පිහිටා සිට දැහැමෙන්රාජ්‍යය කොට ආයුකෙළවර ස්වර්ගපරායනවූහ, බොසතාණන් වහන්සේගේ රාජෝවාදධර්මය රාජ්‍යපරම්පරාණුගතව සතලිස්දහසක් අවුරුදුමුළුල්ලෙහි පැවැත්තේය.——මෙසේවූ මේරාජධර්මය දැන ඇදින දැහැමෙන් රාජ්‍යය නොකොට අධර්මයෙන් රජකළ පුරාතනනොයෙක් රජදරුවෝ ආත්මවධාදිවූ මහත්අනයව්‍යසනයටපැමිණියාහුයි,-ශෙකෙසේදයත්—

මෙසේ එකලොස්වන පරිච්ඡේදයෙන් රාජධර්මවිභාගානිසංස ප්‍රකාශකිරීමෙන් ලොවැඩදක්වා තදනතරව ඒසියළුරාජධර්මයෙහි පිහිටා ලෝවැසියන්ට හා තම තමන්ට වැඩසැදීම කැමැති රජදරුවන්ට යුවරජසෙනෙවිරත් ආදිනොයෙක් ඇමතිවරුද ධර්මිෂ්ඨසහායවනබැවින් ගෘහපතිනම්ලද ඒ ඇමතිආදීන් විසින්පුදු පිළිපැදියුතු ධර්මාඞ්ගීය දැනහැසිරෙණ පිණිස ගෘහපතිධර්මව්‍යාඛ්‍යානිසංස කථාවෝද මදක් මෙහි දක්වනුලැබේත්—එහිගෘහපතිහු නම් පූර්වජන්මවල කරණලද කුසලානුභාවයෙන් මහත් සිටුසම්පත් ලදින් වසනනාවුන්හා රජදරුවන්කෙරෙ එසේ මනොසෙක්යස තනතුරුආදිය ලදින්හෝ නොලදින්හෝ ගෘහවාසයෙහි වසනනාහු නම් වෙත්—ඔවුන්ගේ ධර්මයනම් කවරහයත්—දෙමව්පියගුරුවර පුත්‍රදාරාදාසි දාසමිත්‍රාමාත්‍යශ්‍රමණබ්‍රාහ්මණාදීන්දැන ඇඳින මනාව පවතිමින් අත්වැඩපරවැඩ දෙක්හියෙදී දෙලොවින්ම වැඩවනසේ ගෘහවාසයෙහි විසීම ඒගෘහපතීන්ගේ ධර්මනාම්නව්, හෙදවනාහි ගෘහපතිධර්මප්‍රකාශක සූත්‍රාර්ථකථාදියෙහි ආනුමයෙන් මෙහි දක්වම්හ,—ඒකෙසේදයත්-

සිඟාලොවාදකාදීහි සුත්තන්තෙසාහිභිතෙසිනා,
උභොලොකපජායෙති පටිපත්තිපකාසිතා.
ගහට්ඨානං පතිට්ඨාය තත්ථධම්මෙමතපච්චය,
එසිතබ්බාතථා තෙසං තෙසජ්ඣත්ති ධම්මතො.

භගවතාහි චත්තාරො කම්මකිලෙසා පහාතබ්බා, චතුහිඨානෙහි පාපකම්මං නකාතබ්බං ඡච භොගානං අපායමුඛානි වජ්ජෙතබ්බානි චත්තාරො අමිත්තා පරිවජ්ජෙතබ්බා චත්තාරො මිත්තා සෙවිතබ්බා ඡද්දිසා පටිච්ඡාදෙතබ්බාති ඝරාවාස වසන්තානං කුලපුත්තානං ඉධලොකපරලොකසඞ්ඛාතෙසු ද්විසු ලොකෙසු දණ්ඩදුග්ගතිභයානං විජයනතො උභොලොක ජයායෙති පටිපත්ති පකාසිතා.—

යනාදික්‍රමයෙන් ගෘහිසතුන්වෙත පතළම්භකරුණාව ඇති භාග්‍යවතුන්වහන්සේ විසින් සිඟාලෝවාදසූත්‍රාදී නොයෙක් තැන්හී මෙලෝ පරලෝ දෙක්හි වනසියළුභය දුරුවීමෙන් ජයාභිවෘද්ධිනවන පිළිවෙත්ප්‍රකාශ කිරීමෙන් ගෘහවාසීන්ට හිතපිණිස ධම්මෙනපච්චයාජිසිතබ්බා යනාදීප්‍රතිපත්ති වදාරණලද්‍ද, එහි ආදීයෙහිම පඤ්චිමානි භික්ඛවෙ වණිජ්ජා උපාසකෙන අකරණීයා, කතමා පඤ්ච?-සත්ථවණිජ්ජා සත්තවණිජ්ජා මංසවණිජ්ජා මජ්ජවණිජ්ජා විසවණිජ්ජා, ඉමා ඛො භික්ඛවෙ පඤ්චවණිජ්ජා උපාසකෙන අකරණීයාති—යනුවදාළ බැවින් ධර්මානුශාසනාවෙහි පිහිටි ගෘහපතිසංඛ්‍යාත උපාසකජනයන් විසින් නොකොටයුතුවූ පරහිංසාවට කාරණාවූ ශස්ත්‍රවෙළඳාමයයි කියනලද ආයුධභාණ්ඩ ස්වහස්තයෙන් කිරීමෙන් හෝ අනුන්ලවා කරවාලීමෙන්හෝ යම් කිසිප්‍රකාරයකින් ලදින්හෝ ආයුධවිකිණීමය; අනුන්දුස්කිරීම ස්වභාවවූ සත්වවෙළඳාමයයන මිනිසුන්විකිණීමය, වධයට කාරණාවූ මාංශවෙළඳාමයයි කියනලද සූනබාදීන්මෙන් මෘග සූකරාදීන්මෙන් පෝෂ්‍යය කොට වඩා මස්සපයා ඒමාංශවිකිණීමය,—ප්‍රමාදයට කරණාවූ රාවෙළඳාමයයි කියනලද සුරාමෛරය සපයා විකිණීමය,—සත්වහිංසාවට හේතුවූ විෂවෙළඳාමය—යන මේ පස්වෙළඳාම සාවද්‍යහෙයින් උපාසකවරුන් විසින් නොකොටහැරීමම වදාරණලදී,—එසේ නොකොටයුතුවූ මේපස්මිථ්‍යා වෙළඳාමෙන් දුරුව—ධම්මෙනසමෙනාති යනුවෙන් දැහැමෙන් සෙමෙන් ප්‍රත්‍යය සපයා දිවිපැවැත්වීම වදාළහෙයින්—ධම්මෙන යනපදයෙන් ප්‍රකාශවූ ඒපස්වෙළඳාමෙන් අන්‍යවූද අධර්මක්‍රියා අධර්මලාභ අධර්මජීවිකාවන් දුරුකොට ධර්මයෙන් වෙන්නොව ධර්මානුකූලව කරණකියන ගොවිතැන් වෙළඳාම් ආදියෙන් ප්‍රත්‍යය සපයාගැන්මද සමෙනයනපදයෙන් ප්‍රකාශවූ යහපත් කායසමාචාරාදිවූ සුචරිතයෙන් බුද්ධාදිආර්‍යයන් විසින් පිළිකුල්නොවූ යම් කිසි ජීවිතෝපකරණ සපයා ගැන්මෙක්ඇඳ

එයින් ප්‍රත්‍යය සපයා ගැත්මද නිවරදිහෙයින් යථොක්තක්‍රමයෙන්ම දැහැමෙන් සෙමෙන් ප්‍රත්‍යය සපයාගෙණ ඒලදප්‍රත්‍යය තමුන් ධර්මානුකූලව පරිභොගකිරීමද එම්පදාජීයෙහි ඇතුලත්කොට පෙණෙනහෙයින් ගෘහස්ථොපාසකපාසිකා ජනයන්විසින් සුදුසුසේ එහි පිළිපැදැමැණව, ගෘහවාසීන් ධර්මානුපරියෙසනපරිභොගවශයෙන් ප්‍රත්‍යය සම්පාදනය කිරීම මෙසේ දතයුතු.— එහි දැහැමින් ප්‍රත්‍යය සෙවීම ප්‍රව්‍රජිතයන්ටපවා දුස්කර නැත ගෘහස්ථයන්ට දුෂ්කරබව කියනුමනවරද? එනකුදුළුවත් තමහට වැඩකැමැතියන්විසින් භාග්‍යවතුන්වහන්සේ වදාළපිළිවෙත්හි හැසිරීමෙන්ම ප්‍රත්‍යය සෙවිය යුත්තේය, එසේ බුදුන් වදාළලෙස පිළිපැදීම ඇතිකල්හි දැහැමින්ම ඒප්‍රත්‍යයෝ ඔහට සමුපීථවත්, ඒ මෙසේ දතයුතු.

එක්සමයෙක්හි අපභාග්‍යවතුන්වහන්සේ රජගහනුවර වේළුවනාරාමයෙහි වාසයකරණසේක, එසමයෙහි එක්දවසක් අළුයම්හි ලොව බලාවදුරා "අදදවස ගිහිධර්මය ප්‍රකාශකොට ධර්මදෙසනාවක් කරම්යන කරුණවෙන් ඒකලාව පා සිවුරු ගෙණ වදුරාඒනුවරට වැඩ සිගාලකනම් ගෘහපතිපුත්‍රයාට අඩගා වදුරා "ගෘහපතිය ගිහිව වසනතොපවිසින් චතුර්විධකර්මක්ලෙසකෙනෙක් දුරුකටයුත්තාහුය, සතරකාරණයකින් පාපකර්මනොකටයුතුය, වස්තුන්ගේ විනාශවීමට නිසිකාරණයදෙකෙක් හැරියයුත්තාහ, අමිත්‍රයෝ සතරදෙනෙක් දුරුකටයුක්තාහුය, මිත්‍රයෝ සතරදෙනෙක් සේවනයකටයුක්තාහ, ෂට්දිසාවෝ වැසියයුක්තාහුය, එසේඇතිකල්හි ගෘහවාසයෙහි වසනනාවූ කුලපුත්‍රයන්ට මෙලොපරලො දෙක්හිම වනනාවූ දණ්ඩමුත්ථරාදී නොයෙක් භයහා දුර්ගතිභයආදීවූ නොයෙක්භයොපද්‍රව දුරුවීමෙන් ජය ගැණීමපිණිස මේකාරණයෝ වනනාහුයයි කියා දෙලොවම හිතවැඩ සාධනපිළිවෙත් මෙසේ පළමුකොට සංක්‍ෂෙපයෙන්වදාරා නැවත ඒගෘහපතියාගේ ආරාධනාවෙන් විස්තරකොට වදාළසේක—ඒසතරකර්මක්ලෙශයෝ නම් කවරහයත්—

පාණාතිපාතො අදින්නාදානං මුසාවාදොචවුච්චති,
පරදාරගමනංචෙව නප්පසංසන්ති පණ්ඩිතා ති,

එහි පාණාතිපාතය අදත්තාදානය කාමමිථ්‍යාචාරය මුසාවාදය යනමේපාපකර්මයන්ගේ කිරීමට නුවනැත්තෝ තින්දු නොකෙරෙති, ඒපාපකර්ම හේතුකොටගෙණ සත්වයෝ තමතමන්ගේ ප්‍ර

නිබඳවූ ජාතාවමෙන් ජාතියක් ජාතියක්පාසා එක්වම එහුබඳවා යනකර්මයකෙලෙසනහෙයින් ඔහු කර්මකෙලෙශයෝනම්වෙත්, ඒපාපකර්මයෝ කියනලදක්‍රමයෙන් නොයෙක් ආදීනව ඇතිහෙයින් දුරුකටයුත්තාහුයි, සුරාපානයෙහි ආදීනව මතුපහළවනහෙයින් මෙහි නොදක්වනලදී.—පාපකර්මසිඛවන සතරඅඞ්ගයෝ නම් කවරහයත්?—

ඡන්දා දෙසා භයා මොහා යො ධම්මං අතිවත්තති,
නිහියති තස්ස යසො කාලපක්ඛෙව චන්දිමාති.

මෙහි ඡන්දාගතිය දෙසාගතිය භයාගතිය මොහාගතියයන මේසතරඅගතීන් අතුරෙන් යමෙක් මෙතෙම මාගේ මිත්‍රයයි කියාහෝ නෑයෙකැයි කියාහෝ මට අත්ලස්දීනැයි කියාහෝ ඡන්දාදිවශයෙන් අහිමියන් හිමිකෙරේද මේතෙම ඡන්දයෙන් අගතියට ගොස් පව්කරන්නේනම් වෙයි.—යමෙක්තෙම මට වෛරඑකෙකැයි කියාප්‍රකෘතිවෛරවශයෙන් හෝ ඒක්ෂණයෙහි උපන් ක්‍රොධවශයෙන්හෝ අහිමියන් හිමිකෙරේද හිමියන් අහිමියන් කෙරේද මෙතෙම ද්වේෂයෙන් අගතියට ගොස් පව්කරන්නේ නම්වේ—යමෙක්තෙම රාජවල්ලභයෙකැයි කියාහෝ විෂමනිශ්‍රිතයෙකැයි කියාහෝ මට අනර්ථ කරන්නේයයි කියාහෝභයපත්ව අහිමියන්හිමිකෙරේද හිමියන් අහිමිකෙරේද මෙතෙම භයින් අගතියට ගොස් පව්කරන්නේ නම්වෙයි—යමෙක් වනාහි තෙමෙතුවනාඑදව මෝහයෙන් මුලාබැවින් යම්කිසිකටටඅවක් කියා ඇතිලෙස යුක්තිවිනිශ්චය නිරීමෙහි අසමර්ථව අහිමියන් හිමිකෙරේද හිමියන් අහිමිකෙරේද මෙතෙම මෝහයෙන් අගතියට ගොස් පව්කරන්නේ නම්වෙයි.

මෙසේ කිසිවක් බෙදනුයේ මෙතෙම මාගේ මිත්‍රයෙක නෑයෙක යනාදී වශයෙන් ප්‍රෙම උපදවා අධිකකොට දේද මෙතෙම මටවෛරයයි ද්වේෂවසයෙන් අඩුකොට දේද මෝහයෙන් මුළාබැවින් දුන්නුදුන්අය නොදැන කිසිවක්හට අඩුකොට කිසිවක්හට අධිකකොට දේද මෙතෙම මෙය නුදුන්කල්හි මට අනර්ථදකරන්නේයයි භයපත්ව කිසිවක්හට අධිකව දේද මෙතෙම යථාක්‍රමයෙන් ඡන්දාදිසතරඅගතීයට ගොස් පව්කරන්නේ නම්වෙයි—මෙසේ සතරඅගතීයෙන් අගතියට ගොස් ස්වභාවධර්මය ඉක්මපැවතීමෙන් පව්කරන්නේද ඔහුගේ යසපිරිවරසියල්ල කෘෂ්ණපක්ෂයෙහි සඳමඬලමෙන් පිරිහෙන්නේයි.

මෙසේ භාග්‍යවතුන්වහන්සේ විසින් වදාරණලද වචනය සිහිකිරීමෙන්හෝ ස්වභාවයෙන් පව්කිරීමෙහි මැදහත් කමින් හෝ මේසතර පව්වූකාරණයන් යම්හෙයකින් ආර්‍ය්‍යශ්‍රාවකතෙම දුරුකරන්නේවේද එහෙයින් සතරකාරණයකින් හෙතෙම පාපකර්‍මනොකරන්නේ වේයි, මේද වදාරණලදමැයි බුදුන්විසින් — යතො ඛො ගහපතිපුත්ත අරියසාවකො නෙවඡන්දාගතිං ගච්ඡති, නදොසාගතිංගච්ඡති නමොහාගතිං ගච්ඡති, නභයාගතිං ගච්ඡති,ඉමෙහිඛො චතුහිඨානෙහි පාපං කම්මං න කරොතීති තස්සෙවං චතුහිඨානෙහි පාපංකම්මං අකරොන්තස්ස හිරඤ්ඤසුවණ්ණ දාසිදාසමච්චාදීනං ථුතිඝොසවසෙන වුඩ්ඪිඑව ආකඩ්ඪිතබ්බාතොභාජ්-

ඡන්දාදොසා භයා මොහා යො ධම්මං නාතිවත්තති,
තස්සයසොආපූරති සුක්කපක්ඛෙව චන්දිමාති,

ගෘහපතිපුත්‍රය මෙසේ මේසතරඅගතියෙන් අගතියට ගොස් පව්නොකරණ ඒපුද්ගලයාගේ හිරණ්‍යස්වර්‍ණ දාසිදාසාදිවස්තු වර්‍ධනවී මහාමිත්‍රාමාත්‍යාදීන්ගේ ස්තුතිඝොෂාවන්ගේ වශයෙන් ඔහට අභිවෘද්ධියම වන්නේය පිරිහීමක් නොවන්නේය,—තවද එසේ ඡන්දයෙන් වෙෂයෙන් භයින්මෝහයෙන් යමෙක් අගතියට ගොස් පාපකර්‍ම නොකරන්නේද ඔහුගේ යසපිරිවරආදි සියල්ලම පූර්‍වපක්‍ෂයෙහි චන්ද්‍රමණ්ඩලයමෙන් සම්පූර්‍ණවන්නේය,- තවද ඉහලෝකයෙහිම වස්තූන්ගේ විනාසවීමට අවැඩට නිසිකාරණසය නම් කවරහයත්—සුරාමෙරයපානයකිරීමය නොකල්හි වීථිආදියෙහි ඇවිදීමය නෘත්‍යගීතාදිය දක්නටයාමය දුකෙලිම්වටයාමය පාපමිත්‍රයන්හා එක්වීමය අලසවීමය යනමේ කාරණයෝ සදෙන මේලොවම වස්තුවිනාසවීමට අවැඩට නිසිකාරණහෙයින් දුරුකටයුතුයයි වදාළසේක,

භාග්‍යවතුන්වහන්සේ මෙසේ මෙසුරාසෙවනාදි කාරණයන් සත්වයන්ට වනසැපවලකනපිණිස දුරුකිරීම වදාළසේක් නොවෙයි, මහාකාරුණිකබැවින් ඒ සුරාපානාදිඅකර්ත්තව්‍යවල යෙදීම් වශයෙන් ඒඒකාරණහෙතුකොට ගෙණ වන්නාවූ නොයෙක් ආදීනව සර්‍වඥතාඥානයෙන් දක වදාරා එයින් සත්වයන් ගලවනපිණිස වදාළසේක, සුරාමෙරයපානයෙන් මේජන්මයෙහි වනආදිනව කවරහයත්:—උපයා තුබූධනය විනාස කෙරෙයි කලහ වඩයි, අක්‍ෂිරොගාදි ඒඒරොගයන්ට ක්‍ෂෙත්‍රයය, සුරායෙන්මත්ත මව්පියාදීන්ට පවාදණ්ඩනිග්‍රහකිරීම් ආදිවශයෙන් නොයෙක් අකර්‍තව්‍ය කරණබැවින් මහත්අයස් අකීර්ත්ති උපදවයි, ලජ්ජා

හය උපදනට හීසිනැත ලජ්ජාභයදෙක නසයි, සිරුළුවැඩට කාරණවූ ප්‍රඥව දුර්ගකොට අඥණකෙරෙයි, මෙසේ ඒපුද්ගලයාවිසින් එම්ජාතියෙහි දුක්සංයුක්ත ආදීනවසයෙක්වේ, රාත්‍රිභාගයෙහි වීථිආදියෙහි ඇවිදීමෙහි ආදීනව කවරහයත්? නොකල්හි ඇවිදිනේ නොහීනාකල නොයෙක්වරද පැමිණීමෙන් ආත්මයද රැකගතනොහෙයි, තමා බැහැරගියහෙයින් අඹුදරුවෝද රැක්‍ෂානොගී කැමතිසේ හැසිරෙත්, තුමුන් අඹුදරුවොත් පිටත හැසිරෙණබවදුන ඔහුගේ ගෙපල සිස්වෙයි සම්පතද රැකගත නොහෙයි-අනිකෙකුකල වරදෙකවීනමුත් අසවල්පුෂී රාත්‍රිභාගයෙහි ඇවිදිදැයයි ඔහුකෙරෙහි ශකකරන්ට නිසිවෙයි-නොකල වරද විදිනත් ඔහුකෙරෙහි පිහිටයි. තුහුතට්ටුසජ් යක්‍ෂොපද්‍රවාදී නොයෙක් දුක්ඛකාරණයන් පූර්වාඞගම්වෙයි—මෙසේ නොකල්හි වීථිආදියෙහි ඇවිදීමෙහි ආදීනව සයෙක්වෙයි.

බොහෝදෙනා එක්ව ක්‍රීඩා පවත්නාස්ථානවල නෘත්‍යාදීන් දක්නට යාමෙහි ආදීනව කවරහයත්?—නැටුම් ගී ආදිය ඇති තැනට යෙමි. මල්සුවඳ පිලි අන්නපානාදිය සපයාගැන්මෙහුත් එහි කිපදිනක් ප්‍රමාදව බලාසිටිනාහෙයිනුත් ඒ ඒ කලට තමා විසින් කලමනා ගොයිතැන් වෙළඳම්ආදි ප්‍රයොජනකටයුතු පිරිහීමෙන් අර්ථහානිවීමය, ගේහැර පිටතට ගියහෙයින් රන්රිදී මුතු රන් ධාන්‍යද්‍රව්‍යහා කෙත්වත්වල තුබූ පොල් පුවක් අඹ කොස්ආදී ඵලාඵල ආදියෙහි රැකවල්නැතිබව දුන සොරු ගෙණයාමද ගී නැටුම්ආදියපිණිස යාමෙහි ආදීනවයි, දුකෙන් වස්තුහානිවෙයි, රැස්කළධන විනාසවෙයි, සබයෙහි මොහු කීබස නොගන්නේය, මිනිසුන්විසින් නින්දාවට පැමිණෙයි, ආවාහවිවාහකරනෙනා නො කැමතිවන්නාහුය, මෙසේ දූකෙළීමෙහි ආදීනව සයෙක්වේ, පාප මිත්‍රයන්හා මිතුව විසීමෙහි ආදීනව කවරහයක්ද-යම්කෙණෙක් දූ කෙළි කැමතිවෙද්ද ඔහුහා මිත්‍රවන්නාහ, යම්කෙණෙක් ස්ත්‍රීධූර්ත් වෙද්ද ඔහුහා මිත්‍රවන්නාහ, යම්කෙණෙක් රා සොඬහුද ඔහුහා මිත්‍රවන්නාහ, යම්කෙණෙක් ඇතිසේ නොදක්වා වචාවෙද්ද ඔහු හා මිත්‍රවන්නාහ, යම්කෙණෙක් අභිමුඛයෙහි වචක වෙද්ද ඔහු හා මිත්‍රවන්නාහ, යම්කෙණෙක් පව්කිරීමෙහි භයනැතිව සාහසිකක්‍රියා කෙරෙද්ද ඔහුහා මිත්‍රවන්නාහ, මෙහි පාපමිත්‍රයන්හා එක්ව වාසයකළ පුරුෂතෙම ග්‍රාම්‍යසූකරාදීන් අසුචියට දුවන්නා සේ මේ පාපමිත්‍රයන් කැටිවම ඇලෙන්නේය, මෙසේ පාපමිත්‍රයන්හා මිතුවීමෙහි ආදිනව සයෙක් වෙයි.

අලසවීමෙහි ආදීනව කවරහයත්?—යමෙක් දැන් ඉතා සීත යයි කියා තමාවිසින් කළමනා කෙත්වත්ආදියෙහි කර්මාන්ත නො

කරන්නේද ඉතා උෂ්ණයයි කියා කර්මාන්ත නොකරන්නේද ඉතා සවස්ව ගියේයයි කර්මාන්ත නොකරන්නේද ඉතා උදෑසනයයි කර්මාන්ත නොකරන්නේද ඉතා ක්ෂුධායෙමියි කර්මාන්ත නොකරන්නේද ඉතාපිපාසයෙමියි කර්මාන්ත නොකරන්නේද මෙසේ අලසභාවයෙන් යුක්තවූවාහට නූපන්සම්පත් නූපදී· උපන්සම්පත්වස්තු විනාශයට පැමිණෙයි, මෙසේ අලසවීමෙහි ආදීනව සයෙක්වේ—මෙතෙකින් ඉහලොකයෙහි භොගවිනාශකරණ කාරණ සයක් දක්වනලදී·

තවද දුරුකටයුතු අමිත්‍රයෝ නම් කවරහයත් ?—

අඤ්ඤදත්ථුහරොමිත්තො යො ච මිත්තො වචීපරො,
අනුප්පියඤ්ච සොභාහ අපායෙසු ච යොසඛා·

යනුහෙයින් අඤ්ඤදත්ථුහරය වචීපරමය අනුප්පියභාණිය අපාය සහාය යන මොහු සතරදෙන මිත්‍රයන්සේ හඟවන ඒකාන්ත අමිත්‍රයෝ නම් වූත්, ඔවුන්අතුරෙන් මිත්‍රයාගේ ගෙට අවුත් දුනද නුදුනද ඒකාන්තයෙන් යම්කිසිවක් දුනත් ගෙණයන අඤ්ඤදත්ථුහරනම් අමිත්‍රයා සතරකාරණයකින් හැඳිනියයුතුවේ— මිත්‍රයාගේ ගෙට සිස්අතින් අවුත් හඳනාපිළිඅඳ යම්ම වස්තුයෙක යහපතැයි කියා හැරගෙණ බලුණහෙයින් නොපි මෙ වස්තුය කැමතියාදැයි විචාරා ඒ වස්තුාදිය දුන්නුදුන්සේ ගෙණයේද-දෙසි, දෛඩන් ආදී ඒමද උපකරණදෙයක් මිත්‍රයාගේ ගෙට ගෙණවුත්දී ඔවුන්ගෙන් බොහෝදේ පතාසිටීද තමහට භයක් වූකල දසයෙකුමෙන් ඔහුගේ ගෙහි කටයුතු කරන්නේද හැම දම ප්‍රේමයෙන් නොකරන්නේද තමහටවන ප්‍රයොජනයසලකා සේවණයකෙරේද-යනමේ සතරකාරණයන් වස්තුගෙණයන මිත්‍රලෙසයෙන් ආදිමිත්‍රයා දතයුතු—

තවද සතරකාරණයකින් වචීපරමවූ මිත්‍රප්‍රතිරූපක අමිත්‍රයා හැඳිනියයුතුවේ—යමක් මිත්‍රයා අවුත් ඉල්වූකල පළමු නොපි නොආහ ඒ කාලයෙහි නම් අප දුනනම්හයි· අතීතදෙසින් සංග්‍රහ කරන්නේද—දෙවනු එව එව්ට අපගේ සසහදිය සමුර්ධවෙයි. නොපකැම්තිදෑ ඒකාලයෙහි දෙමහයි අනාගතදෙසින් සඞ්ඝීන් සංග්‍රහකෙරේද—තාවකාලිකකොට ගැල් නැගුල් පිලිසත් ආදිය කිසිවක් ඉල්වූකල ඇතිවතිබැඳිත් නැතිසේ ව්‍යසනදක්වා කියා මූලාකෙරේද—යනමේ සතරකාරණයෙන් වචනයම උතුම් කොටඇති අමිත්‍රයා ඇඳිනියයුතුවෙද සතරකාරණයකින් අද

යස් බලබලා අනුකූලවූ ප්‍රිය වචනකියන අමිත්‍රයා දතයුතුවේ-ප්‍රාණඝාතාදි පාපකර්මහයි විචාළ කීකල ඔහු කැමතිබවදන යහළු ඒකලමනාමයයි කියත්තේද යහපතක්කර්මහයිකීකලත් එසේම කියත්නේද—මෙසේකීවක්මඅසා වැඩඅවැඩ පරීක්‍ෂාකොට යහපත නපුරුඇතිසේ නොකියන පාපමිත්‍රයා අභිමුඛයෙහි ගුණකියාද පිටතදී අගුණකියාද යනමේ සතරකාරණයෙන් අනුකූලව බස්කියන අමිත්‍රා ඇඳින්නයුතු—

තවද සතරකාරණයකින් අපායට ගෙණයන්ට සහායවූ අමිත්‍රයා දතයුතුවේ—සුරාමේරය පානයසඳහා යහළුවන්නේද රාත්‍රිභාගයෙහිවීථියෙහිඇවිදීමටයහළුවන්නේද-ගීතනැටුම් බලනසඳහා යහළුවන්නේද—දූකෙළිනාසඳහා යහළුවන්නේද-යනමේ 'සතරකාරණයෙන් අපායට ගෙණයන පාපමිත්‍රයා ඇඳිනියයුතු—මෙසේවූ මේ අමිත්‍රයෝ සතරදෙනම දුරුකටයුත්තාහුයි-ඒ කෙසේදයත්-

ඒතේඅමිත්තේචත්තාරෝ ඉතිවිඤ්ඤායපණ්ඩිතෝ,
ආරකාපරිවජ්ජෙය්‍ය මග්ගංපටිභයංයථා ති.

තමාකෙරෙන් කිසිවක් ගෙණයන අමිත්‍රයාද අනුකූලව බස්කියන අමිත්‍රයාද අපායට ගෙණයන අමිත්‍රයාද යනමේ සතරදෙන දැනහැඳින සොරුන්විසින් ව්‍යාඝ්‍රාදීන්ආකූලවූ මාර්ගයසේ විෂඝෝරසර්පයන්සේ මේ ඒ පාපමිත්‍රයන් දුරුකටයුතු—මේපාපමිත්‍රයෝ සියළු අනර්ථයට මුල්වසිටි බාලයෝනම්වෙත්, ඔවුන් අනේක උපද්‍රවවෙයි—බුදුන්විසිනුදු මහණගියන්සේ නළදඬුතණපිදුරුත්ආදීකලවූ ගෙහි ඇවිළි ගින්වෙනසිටි කළුදෙරබායෙන් යුක්තවූ ප්‍රාසාදකූටාගාරයක් දවාද එසේම යම් භයෙක් උවදුරෙක්වේනම් බාලයන්විසින් වෙයි. පණ්ඩිතයන්විසින් නොවෙයි. පණ්ඩිතයෝ සතුරුහුනම් වැඩෙක්ම සාදති බාලයා මිත්‍රවූහුනම් විනාසම කෙරෙතියි වදාළබැවින්—පාපමිත්‍රයන්හැර පණ්ඩිතවූ ඉෂ්ටමිත්‍රයන් දැන සෙවියයුතු—

තවද හිරනැගෙණහාක් නිද්‍රාකිරීමද පරදාරසේවනයද අනුන්ට වෛර ඉපදවීමද තමහටද අනුන්ටද අනර්ථයට අවැඩ කටයුතු කිරීමද පාපමිත්‍රයන් ඇතිබවද කෛරාටිකබවද මිනිස්නට විනාස මුල්කාරණයගා ලාමකවූ කායවාක්සමාචාරද නොගියම්නා තැනට යාමද ධූර්තස්ත්‍රීන් සේවනයද දූකෙළිනා රා බොන පුරුෂයන්හා එක්වීමද ගීතනැටුම්කරායාමද පණ්ඩිතසේවනයෙන් දුරුබාලඅශුණසේවනයද සතතයෙන් සුරායෙන් මත්වීමදයන මේ

තෙක්කාරණයෙන් යුත්පුරුෂයා සදහේප්පිරිහෙයින් ගෘහවාසයට නොනිසිවේ—තවද සතරකාරණයකින් මනාසිත්ඇතිසුහෘද්මිත්‍රයෝ සතරදෙනෙක්වනනාහුයි—ඔහු කවරහයත්—

උපකාරොචයොමිත්තො යොචමිත්තොසුඛෙදුක්ඛෙ
අත්ථක්ඛායීචයොමිත්තො යොචමිත්තානුකම්පකො—

උපකාරමිත්‍රය සුවදුක්දෙකෙහි සමවපවත්නාමිත්‍රය වැඩකියනමිත්‍රය අනුකම්පාඇතිමිත්‍රය යනමොහුයි එහිසතරකාරණයෙන් මනාසිත්ඇති උපකාරමිත්‍රයා ඇඳිනනා යුතුවේ—මත්වහෝ විෂමුවජාවාදී නිසිවතිත්මිත්‍රයා ප්‍රමාදවූකල ඒඒදුතින්මිදෙනානත් ඔහු රක්නේද—මිත්‍රයා මුලාවූබව දැන කිසිවෙක් ඔහුගේවස්තු ගෙණයේද්‍යෙහෝයි සිතාසම්පත් රක්නේද—භයත්පැමිණිකල්හි පිහිටවත්නේද—මෙවැනිමාගේ කටයුත්තක් ඇතැයිගනාද් යමක්ඉල්වා ආකල ඔහුඉල්වූවිවරට දීවූතක් දෙන්නේද—යනමේ සතරකාරණයෙන් උපකාරවූ මනාසිත්ඇති මිත්‍රයා දතයුතු—තවද සතරකාරණයකින් සුවදුක්හිසමවූ මිත්‍රයා ඇඳිනනායුතුවේ, ඒ කෙසේදයත් තමාගේරහස් නොහගවා මිත්‍රයාට කියාද—මිත්‍රයාගේරහස් අනුන්ටමදකුත් නොකියාරකීද—ආපදයක්වූවිට මිත්‍රයා නොහැර එක්වව්දගනීද—තමාගේ ජීවිතයපරිත්‍යාගකොට මිත්‍රයාරකීද—යනමේ සතරකාරණයෙන් සමානසුවදුක් විඳිනාමිත්‍රයා ඇඳිනනායුතු

තවද සතරකාරණයකින් වැඩටනිසිබස්කියන මිත්‍රයාඇඳිනනායුතුවේ—ඒකෙසේදයත්—පනිවාආදී පව්කරණුනොදී අවවාදකියා මිත්‍රයාඑයින් වලකාද—යහපත්කලමනා දනාදිපින්කම් කියාඋගන්වාද—මිත්‍රයා නොඇසූ සහමොක් ශපසාදන බණඅසවාද—ස්වර්ගයටයන්ට නිසිපිලිවෙත්කියාද—යනමේ සතරකාරණයෙන් වැඩට වැටෙනනක් කියන මනාසිත්ඇති මිත්‍රයා ඇතිමිත්‍රයා ඇඳිනනායුතු—තවද සතරකාරණයකින් අනුකම්පා ඇතිමිත්‍රයාඇඳිනනා යුතුවේ—මිත්‍රයා අනාථවදුප්පත්වගිය කල තමහට්වූවාක්මෙන් දොම්නසට පැමිණේද—මිත්‍රයාසුවපත්වූකල තමාලදශපතක්මෙන් සතුටුවේද—අගුණකියනු අසාමගේ මිත්‍රයාකෙරෙහි එවැනිනුගුණ නැතයනාදිය කියාවලකාද—ගුණකියනුඅසා මාගේ මිත්‍රයාගේ ඇතිගුණමයයනාදීන් ගුණකියමින් සතුටුවේද—යනමේ සතරකාරණයෙන් අනුකම්පාඇතිමිත්‍රයා ඇඳිනනායුතු—මෙසේවූ මේමිත්‍රයෝ සතරදෙනසේවණයකටයුත්තාහුයි—ඒකෙසේදයත්:—

එවංචත්තාරො මිත්තෙතාඉති විඤ්ඤායපණ්ඩිතො,
සක්කච්චංපයිරුපාසෙය්‍ය මාතාපුත්තංවඔරසන්ති.

මෙසේ මේසතරවැදෑරුම්වූ මිත්‍රයන් ඇඳින මෙබඳුපණ්ඩිතවූ
සත්පුරුෂයන්ගේ සමාගම මෙලෝපරලෝදෙක්හි සියළුවැඩටද
නිවන් සම්පතටද කාරණයයිදැන මවුපියන්කෙරෙහි පවත්නා
සේ ඒඉෂ්ටමිත්‍රයන් කෙරෙහි පැවතම්වුන් නිබසවළතතරනො
කියා කිඅවවාද මුදුනෙන් පිළිගෙණ ඒඅවවාද නොවරදවා පිළි
පැදඹවුන් නොසතුටුවන්නට නිසිවරදක් මනාකොට දිවිහිම්යෙ
න් මිත්‍රභෙදනොවනෂට්යෙ වාසයකොට නොදැනකලවරදකි
න්හෝ භෙදයන්ගේ බසින්හෝ දෙම්නස්වූවක් හැඟුනීනම්
කලවරද නොකලෙම් නොකියානොදැන කෙලේම් මෙයින්මතු
නොකෙරෙම් කියාද කොළහොත් හෙදපිණිස නිබස ගිවිස්වා ව
හා කැමා කරවා දෙම්නසසිතින්හරවා පෙරසේම වාසයකොට
දෙලොවින්ම වැඩසාදගත යුතු

මෙසේ දක්වනලදක්‍රමයෙන් පාපමිත්‍රයන් දුරුකොට පණ්ඩිතවූ
ඉෂ්ටමිත්‍රයන්හා එක්ව ධර්මිෂ්ඨවවසන බුද්ධානුශාසනාවෙහි පිහිට්
උපාසකවරුන් විසින් දෙම්පියන්කෙරෙහිද ඇඳුරුවන්කෙරෙ
හිද මිත්‍රයන් කෙරෙහිද දසිදසුන් මෙහෙකරුවන්කෙරෙහිද සිලා
චාරාදිගුණසම්පන්න ශ්‍රමණබ්‍රාහ්මණයන්කෙරෙහිද පවත්නා විධි
ද බුදුරජනන්වහන්සේ වදාළාරද්දෙන් පිළිපැද දෙලොවින්ම
වැඩසාදගතයුතු—ඒ කෙසේදයත්—

මාතාපිතා දිසාපුබ්බා ආචරියාදක්ඛිණාදිසා,
පුත්තදාරාදිසාපච්ඡා මිත්තාමච්චාචඋත්තරා.

දාසකම්මකරාහෙට්ඨා උද්ධංසමනබ්‍රාහ්මණා,
එතාදිසානමස්සෙය්‍ය අලමත්තොකුලේගිහීති

යනමේ ගාථාවෙන් ෂට්දිසාප්‍රතිච්ඡාදනයකොට වදාරණ
සේක් දෙම්වුපියො තමාටපූර්වයෙන් උපකාරවූහෙයින් පූර්වදිගනා
ම දෙම්වුපියොයයිකියාද තමාවිසින්කරණලද වතුනමානාදියට
සුදුසුහෙයින් දකුණුදිගනම් අචාය්‍යීවරයොයයිකියාද ස්වාමිපුරුෂ
යාට පසුව පවත්නාහෙයින් පශ්චිමදිගනම් අඹුදරුවෝයයිකියා
ද තමා යම්කිසි දුකකට පැමිණිකල එතරකරණහෙයින් උතුරු
දිගනම් නෑයන්හා මිත්‍රාමාත්‍යයෝයයිකියාද ස්වාමියාහට යටකනව
පවත්නාහෙයින් යටදිශාවනම් දසිදස කම්කරුවන්හා පිරිවරජන

ණයාශයිතියාද සීලාදි ගුණධර්මයෙ තමාට උත්තරීතරව උසස්වසිටි හෙයින් උඩදිසාව නම් සීලාදිගුණසම්පන්නාවූ ශ්‍රමණබ්‍රාහ්මණයයි කියා දසදිසාවන් ප්‍රතිච්ඡාදනයකොට හෙවත් සතරදිනය උඩය යටය යන ෂට්දිසාවෙන් තමාට යම්කිසි උපද්‍රවයක් නොවන්නේද එපරිද්දෙන් ෂට්දිසානම්ලද දෙමව්පියෝය ගුරුවරයෝය අඹුදරුවෝය නෑයන්හා මිත්‍රාමාත්‍යයෝය දාසිදාස්කම්කරුවන්හා පිරිවරජනයෝය ශ්‍රමණබ්‍රාහ්මණයෝය යනමේ සියල්ලන්කෙරෙන්හෝ මෙලෝපරලෝදෙකින් අවඩනොව වැඩක්වනසේ ඇමදෙනාවිසින් ඔවුනොවුන්කෙරෙහි පත් පස් කාරණයකින් සංග්‍රහකලමැනවි—

එහි දරුවන්විසින් දෙමව්පියන්උපස්ථානකටයුතු පස්කාරණයනම් කවරහයත්—දසමසක් කුසින්උසුලා බිහිවූතැන්පටන් රුදුවල්දෙක්හි මහදුක්විඳ ප්‍රේමයෙන් පිලිකුල්නොව මුඛයෙන් සෙන්සොටු මලමුත්‍රහැරදමා නහවා අඳුන් තෙල්ගා අතපයහඹා මවුපියන්විසින් රක්නාලද්දෙමි උපකාරයට නිසිකොට මමදුන් මව්පියදෙදෙනා මහළුඅවස්ථාවෙහි උනුපැන්ගෙණ පා සෝදා නහවා කැඳබත්ආදීන් රක්‍ෂාකෙරෙම්යිද-මාගේ කටයුතුතිබියදීත් දෙමව්පියන්ගේ ඒ ඒ කටයුතුකෙරෙම්යිද-මව්පියන්ගේ කුලවංශ නොනසා පවත්වම්යිද-දරුවන්විසින් දෙමව්පියන්ට කලමනාතාක් කටයුතු නොපිරිහෙලාකොට දායාදභාගයෙහි හිමිවෙම්ද-මෙසේ දෙමව්පියන් ඇතිකල ඔවුන්සිත්ගෙණ වාසයකොට මලකල දන්දී පින්පෙත්දෙම්යිද-මෙසේ මේ පස්කාරණයෙන් දරුවන්විසින් සංග්‍රහකරණලද දෙමව්පියෝ පුත්‍රයාට කාරණපසකින් අනුකම්පාකෙරෙත් කීසේයයත්-පාපකර්මකරන්ටනොදී හික්මවති-යහපත් කුසලකිරීමෙහි යොදවති-සිල්පයෙහි හික්මවති-ඹිහට සුදුසු වයස රජදරුවෝ දුනාදීවූ පින්කම්කොට දෙවියන්ටපින් දෙනානාහා ඒ දෙවතාවෝ ඒ පින් අනුමෝදන්ව දිව්‍යවූ යස පිරිවරින් වැඩෙනනාහා එසේදිව්‍යඓශ්වර්යයෙන් අභිවෘද්ධියට පැමිනියාවූ ඒ දෙවතාවෝ ඇමවේලෙහිම වීර්යකොට කුශල්කරන්නාවූ අප්‍රමාදව යසඇති එබඳුරජදරුවන්ට ධාර්මිකවූ රක්‍ෂාවරණගුප්තියකෙරෙමින් ඡායාවක්මෙන් අනුවපවත්නාහ—එහෙයින් මහරජ තුඹවහන්සේවූකලි දසකුසලධර්මයෙහි අප්‍රමාදව නිඳිතනොව සියළුකාරියකලමනා නැවත ඒ ඒ රාජකාර්යවිචාරා පරීක්‍ෂාකොට තුඹවහන්සේට ප්‍රත්‍යක්‍ෂව වැටහුනුදෙයකටම නිග්‍රහ සංග්‍රහදෙක කලමැනව· මේ ලෝකයෙහි අලසවූ වීර්යමද සත්වයෝ පැවිදිවනතනොහෙනනාහ තුඹවහන්සේ එසේනොව සියළු කාර්යයෙහිඅප්‍රමාදව වීර්ය ඇතිවූවමැනව—

මහරජ්ජුරුවන්වහන්ස මා විචාළ රාජධර්මය මා විසින් පළමු කොටම මුසාවාදය දුරුකටයුතුයයියනාදීන් යම්සේ ව්‍රතකොට්ඨාස කෙනෙක් කියනලද්දුහුවීනම්· එහි පැවැත්තමැණව ඒ ආචාරව්‍රත යම තුඹවහන්සේට අවවාදඅනුශාසනාවන්නේය. මෙසේ මේ ධර්මයෙහි පවත්නා රජතෙම තමන්ගේමිතුරන්ට ශපදෙන්ටත් සතුරන්ට දුක්දෙන්ටත් සමර්ථයයියනාදීන් ධර්මදෙශනාකළකල්හි ඒ අසා සතුටුවූ මහජනසහිතමහරජ ඒ වෙසන්තරනම් පක්ෂියාට මහත් සත්කාරසම්මානකොට ඉක්බිති කුඩලිනම් ලිහිණියාසවම් පයටගොස් පළමුපරිද්දෙන්ම මඩපමධ්‍යයෙහිවූ ස්වර්ණපීඨයෙහි හිඳුවා රාජධර්මයවිචාරන්නාහු——

සක්කිච්චංකුඩලිනි මංඤසිඛත්තිබන්ධුනී,
රජ්ජංකාරෙතුකාමෙන කිංසුකිච්චංකතංවරනති·

යනමේ ගාථාවෙන් කුඩලිනිනම් පක්ෂිදෙනුවකෙරෙන් රාජධර්මයවිචාරනනාවූ බ්‍රහ්මදත්ත නම් රජතෙම රාජ්‍යයකරණුකැමති රජදරුවන් කවරකෘත්‍යයක්කිරීම උතුම්දැයි විචාලතැන කුඩලිනි තොමෝ—

ද්වෙවතානපදකානි යෙසුසබ්බංපතිට්ඨිතං,
අලද්ධස්සචයොලාභො ලද්ධස්සඅනුරක්ඛනා·

යනාදී එකලොසකින් සියළුම රාජධර්මය පදවයෙක්හි ඇතුලත්කොටදක්වානියතනී මහරජ්ජුරුවන්වහන්ස යම්කාරණ දෙකෙක සියළු අර්ථජාතයහා හිතශප පිහිටියේවී නම් එසේවූ කාරණ දෙකෙක්වෙත්—ඔහු කවරහයත්-පෙර නොලබනලද ලාභයාගේ ලැබීමය ලබනලද්ලාභයා නැසියනොදී රක්ෂාකිරීමය යනමේදෙක වන්නේය. එසින් නුපන්ලාභය පදවුන්බැරැරුම්නොවෙසි උපන් ලාභය සොරුසතුරුආදීන්ගෙන් නැසීමටනොදී රක්ෂාකිරීම බැරැරුම්වන්නේය සමහරකෙනෙක් සම්පත් උපදවාගෙනත් යසනිසා ප්‍රමාදව මාණයඋපදවාගෙණ ප්‍රාණඝාතාදී පව්කෙරෙමින් ප්‍රසිඩවූ සොරකම් කෙරෙමින් අපරීක්ෂාකාරීව රට කොල්ලකා ඇවිදිනාකල්හි ඔහු රජදරුවෝ අල්වාගෙණ මහත්වූව්නාසයට පමුණුවනනාහ, නොහොත් රූපාදිවූ පචකාමකොට්ඨාසයෙහි ඇළුම්ඇතිව ප්‍රමාදව නුහුවතින් වස්තුනිමාගියකල්හි දුක්පත්ව ගුතාබැගැව් රෙදීවැරලිහැඳගෙණ කබලක්ගත් අත්ඇතිව දොර සිගාඇවිදින්නේය—ප්‍රව්‍රර්ජිතයන්වහන්සේත් ග්‍රන්ථධුරවිදර්ශනාධුරයෙහියෙදිමේත් ලාභසත්කාරඋපදවා කලනිත්ප්‍රමාදව ගියි

භාවයට පැමිණෙනසේක. සමහර තපස්වීකෙනෙක් ධනහළාද
වා සත්සිහිමුලායෙන් නපුරුරුපාලම්බණයෙහිබැදී ඒ ධනයෙන්
පිරිහෙනසේක. මේසේ ලත්යසලාභාදිය රැකීම දුස්කරය යමෙක්
ලාභසත්කාරාදියඋපදවා අප්‍රමාදව කුශලකර්මයෙහි වසන්නේ
වීනම් ඔහුගේ යසස ශුක්ලපක්ෂයෙහි කලාවෙන්කලාවට වැඩිය
න සඳමඬලමෙන් අභිවෘද්ධියටපැමිනෙන්නේය-එහෙයින් මහරජ
ප්‍රරුවන්වහන්ස බුද්ධඅගන්සේ අප්‍රමාදව සතකලතුගෙනදෙති-
ප්‍රනම නාසමුයෙහි සියළුසම්පතට හිමිකොටපිහිටුවා දැයාදදෙති—

යනමේ පස්කාරණයකින් දෙමව්පියන්විසින් දරුවන්ට අනු
කම්පාකටයුතුය-මේතෙකින් දෙමව්පියන්විසින් දරුවන්ටක්ෂෙම
වෙයි-නිභීතවෙයි. උපද්‍රානොවෙයි-සිෂ්‍යයන්විසින් ගුරුවරයන්ට
පස්කාරණයකින් උපස්ථානකටයුතු-කීසේයයත්-දුරින්ම එන්නාවූ
ගුරුන්දක සිෂ්‍යයන්විසින් උත්තැනින්නැගීසිට පෙරමගටගොස්
අතනිබූහිසිවක්ගැරගෙණ සුරකිකොටතබා ආසනපනවාදී හුන්
කල පවත්සලා පයසෝදවා තෙල්ගා සුවදුක්විචාර්මෙන්හා නො
මැලිව හැදෑරීමෙන් ඇස්වීමෙන්ද තොසග ගුරුන්කරාඑළඹ කල
මනා උපස්ථානකිරීමෙනුද ගුරුන්කි බස්අවවාද නොඇදහීමෙන්
විශෙසයට නොපැමිණෙනහෙයින් ඇදහීම්වසයෙන් ඇසීමෙනුද
අනෙතවාසිකයාවිසින් ගුරුන්ටකලින්ම හුනුපැන් සිහිල්පැන් ආ
දීය දී මෙහෙකිර්මෙනුද ආචාරීන්ලඟ මදක් තියවාගෙණ බොහො
ව හැදෑරීමෙන් මනාව සිලපළනැන්මෙනු. යනමේ පස්කාරණ
යෙන් සිෂ්‍යයන්විසින් උපස්ථානකරණලද ආචාරිවරයො පස්කාර
ණයකින් සිෂ්‍යයන්ට අනුකම්පාකටයුතු—හෙ කෙසේදයත්—

මේ ශටියෙ හිඳුව මේශටියේ සිටුව මේශැටියේ කවපොවක
රව පව්වුම්නුයන් දුරුකරව පණ්ඩිතමිත්‍රයන් සවිපයට එළඹෙව
යනාදි සියළු ආචාරඋගන්වා හික්මවීමෙන්ද සිෂ්‍යයන්ට උගත්
වනශාසනුඋත්සිතව තැගෙණනාත් අර්ථයෙන් පාලියෙන් ප්‍රයො
ජනකොටදක්වා උගැන්වීමෙන්ද. සිෂ්‍යයන්ගේ නෑයන්හා මිත්‍ර
මාත්‍යයන් ඉදිරියෙහි ඔවුන්ගේ ගුණණුවණ යහපත් මාළුයන්ශා
සනුහැම උගතව්‍යක්තය බහුස්‍රැතයදුන් මාහා සරි බවටපැමිණි
යේය, මෙසේ සිහිකරවනනාදීන් කියාඔවුන් පිහිටකරවීමෙන්ද,
සිෂ්‍යයන්ගියගිය දිසාවෙහි යම් යම් ලාභසත්කාරාදියක් උපන
හොත් ඒහැමආචාරීන් විසින්ම කලානම්වෙයි ගුණකියනනාවූ ම
හජනද අසවල් ආචාරීන්වහන්සේගේ පාදෙව වැතුඹු මේඅනවැ
සිනමැයි, පලවූකොටආචාරීන් වහන්සේගේගුණ කියනනාහු
ය. සිෂ්‍යයාට බ්‍රහ්මලෝක ප්‍රමාණඋසමහත් ලාභයක්උපනද ඒ

හැම ආචාර්‍ය්‍යසන්තකමය, එසේ ශිල්පශික්මවාලීමෙන් ගියගිය අග පූජ්‍යවනසේ රක්‍ෂාකැරවීමෙනැ යන පස්කාරණයෙන් ගුරුවිසින් ශිෂ්‍යයන් කෙරෙහි අනුකම්පාකටයුතු—මෙතෙකින් ගුරුන්විසින් ශිෂ්‍යයන්ට ක්‍ෂෙමවෙයි. නිර්භයවෙයි. උපද්‍රවනොවෙ—

කුලපුත්‍රයන්විසින් ශුත්වියත් සංඝරත්නයට පස්කාරණයකින් උපස්ථාන කටයුතු—කෙසේදයත්—දුටුකල ආදරඋපදවා හුනස්නෙන්නැගී පෙරමගටයාම වඳනාඅංජලිකර්මකරණු පැන්පරහා දහැවිටිදඬු කැපකරදීම්ආදිවූ මෛත්‍රීන්යුක්ත කායකර්මයෙනුදු ස්වාමීණි පාසු අපාසු තිමෙක්ද රෝගදුක්නැඅද යමක්කැමතිනම් ඒ මට වදාලමැණවැයි යනාදීන් ආදරගෞරවසහිතවූ මෛත්‍රීන් යුක්ත වචීකර්මයෙනුදු අපගේවහන්සේ නිදුක්නිරෝගිවනසේක්වයි සත්නෙහි උකටලිනොව ගුණනුවන වඩින්වයි යනාදී මනොකර්මයෙනුදු තමාගේගෙට සඟුරුවන්වඩිනා දුර දුටුකල දොරනොවසා ගෙයිනැතැයිනොකියා වැඩිබවට දොම්නස්නොව මෙවෙනි සිල්වතුං අපගේගෙට වැඩියේය ශපතඝප්‍රීතිඋපදවා කුළුනුවනින්යෙදී ආදරදක්වා අනපාත්‍රයඇත ඒ ගෙණ ඇතුළුගෙට වැඩියේ යහපතැයි ගෙටඅවුත් අසුන්පනවා වඩාහිඳුවා පත්ලසොධා පත්සලා දහනිවා පැන්පිපාසවිචාරා කැමතිළව පැන් වලඳවා ගෙයි මහසඳපවත්වනනම් වලඳවා නිසසබඳකොට වැඩි අදහස්දන ඒ කටයුතු ශාවිමෙනුදු තමන්ගේ විභවහිබූපරිඡෙදෙන් සතරපසයෙන් උපස්ථානකිරීමෙනුදු මේ පස්තැන්හිකල දුනුයන්විසින් උපස්ථානකරණලද සඟහු පස්කාරණයකින් කුලදරුවන්කෙරෙහි අනුකම්පාකෙරෙත්—කිසේයයත්—පවිටුකර්මයෙන් වැලකීමෙනැ,යහපත් දනසීලාදී කුසලකර්මයෙහි පිටුවාලීමෙන්ද හැමසත්තුම සුවපත්වෙත්වයි අනුකම්පාකිරීමෙනැ නොඇසූනාක්බණකියා ඇස්වීමෙනැ, ඇසූබණ ග්‍රන්ථස්ථානනොලා උගන්වා පිරිසිදුකිරීමෙනැ, ස්වර්ගයෙහි ඉපදීමට මගදක්වීමෙන්ද, යනමේ පස්තැන්හි සඟුරුවන්විසින් උපාසකවරුන්කෙරෙහි අනුකම්පා කටයුතු—මෙතෙකින් සඟුරුවන්විසින් උපාසකවරුන්ට ක්‍ෂෙමවෙයි, නිර්භයවෙයි, උපද්‍රව නොවෙ—

මිත්‍රයන්විසින් මිත්‍රයන්ට පස්කාරණයකින් උපස්ථානකටයුතුවෙත්—කෙසේදයත්—මිත්‍රයා යමක්ඉල්ළුවත් නොඉල්ළුවත් තමාකෙරෙහිඇතිදෑ නොසඟවාදීමෙනැ, ප්‍රියවූ කම්කළුවචන කීමෙනැ, ඔවුන්ට වැඩවැඩෙන කල්පනානාක්කටයුතු නොපිරිහෙලා කිරීමෙනැ, මිත්‍රයන්ට අනාදරනොකොට ගෞරවනම්‍ය කෙරෙහින් තමන්හා සමකොට තිබීමෙනැ, මිත්‍රයන්ට බොරුනොකියා වචනොකොට ශැබැබස්කීමෙනැ, යනමේ පස්කාරණයකින් මිත්‍ර

යන්විසින් අනුකම්පාකරණලද මිත්‍රයෝ කාරණපසකින් මිත්‍රයන් කෙරෙහි අනුකම්පාකෙරෙත්—කිසේදයත්—ප්‍රමත්තයන් රැකීමෙතු, ප්‍රමත්තවූවන්ගේ සම්පත්රැකීමෙතු, භයටපැමිණිකල පිහිටවීමෙතු, අපදුණියක්වූව්ට නොහැරීමෙතු. මිත්‍රයාගේ දරුමුණුබුරන්කෙරෙහි ගරසර තමුප්‍රේම ඇතිවීමෙතු, යනමේ කාරණපසකින් මිත්‍රයන්විසින් අනුකම්පාකරණලද මිත්‍රයො කාරණපසකින් මිත්‍රයන්කෙරෙහි අනුකම්පා කෙරෙත්—මෙතෙකින් මිත්‍රයන්විසින් මිත්‍රයන්ට ක්ෂෙමවෙයි, නිර්භයවෙයි, උපද්‍රව නොවෙ—

ස්වාමීහුවිසින් පස්චිමදිසාසංඛ්‍යාත භාර්‍ය්‍යාවන්ට 'පස්පරිච්ඡෙදකින් අනුකම්පාකටයුතුවෙ—කිසේදයත්—කතාකරණවිට දැසින්ට කියන්නාක්මෙන් මෙසේවර තෙලකරව යනාදීන් වෙහෙස දී නිසරුකොටනොකියා සබඳ්‍යදව මාතෙහිසසමාතෙ යනාදී ප්‍රියමනාපවූ සම්භාවිත වචනයෙන් කථාකිරීමෙතු, සෙසුස්ත්‍රීන්හා අනාචාරයෙහි නොහැසිරීමෙතු; තමාගේගෙයි ඇතිනාන්සියළු ශ්‍රීසුරුසම්පත් දක්වාදීමෙන්ද, වස්ත්‍රාභරණාදී අලංකාරදීමෙතු, යනමේ පස්කාරණයෙන් ස්වාමියාවිසින් අනුකම්පාකරණලද භාර්‍ය්‍යාව විසිනුදු ස්වාමියාකෙරෙහි පස්කාරණයකින් අනුකම්පාකටයුතු—ඒ කෙසේදයත්—තමන්ස්වාමින්ට බත් කැඳ පූ ව්‍යංජනාදි පිසනකල මණාකොට තැන්පත්කොට කිරීමෙතු, දැසිදැසයනුදු සෙසුගෙයි මෙහෙකරුවනුදු සෙසු ජනයනුදු නොකලකිරුවා ඔවුන් හැමදෙනා ප්‍රියවචනයේ භක්තිකරණපරිච්ඡෙදන් සංග්‍රහකිරීමෙතු, තමස්වාමින්හැර සෙසුපුරුෂයන්හා අසද්ධර්මයෙහි නොපැවැත්මෙතු, උපයාරැස්කොට ගෙයිතුබූ ධනධාන්‍යාදී සම්පත් වියදම්කොට නොනසා රැකදක්වාදීමෙතු, සියළුකලමනාකටයුතු අලසනොව උත්සාහඇතිව ශපවීමෙතු, යනමේ කාරණපසින් භාර්‍ය්‍යාවවිසින් ස්වාමිපුරුෂයාකෙරෙහි අනුකම්පාකටයුතු—මෙතෙකින් භාර්‍ය්‍යාවන් කෙරෙන් ක්ෂෙමවෙයි· නිර්භයවෙයි, උපද්‍රව නොවෙ—

ස්වාමීහුවිසින් දැසිදැසයො පස්කාරණයකින් අනුකම්පා කටයුතු—ඒ කෙසේදයත්—ඔවුනොවුන්ගේ බලයට වයසට තරමට සුදුසුශැට්යේ පිලිවත් කර්මාන්ත කරවීමෙතු, ඔවුනොවුන්ට දුනමනා බත් වැටුප්වියදම් නොසිටුවාදීමෙතු, දැසිදස්ආදීන් ලෙඩකල ඔවුන්ට කර්මාන්තවිධානනොකොට ඒ ඒ රෝගයට සුදුසු පිලියම් කරවීමෙතු, මධුරවූ ආපූර්වූ කනුබොනුදෑලඳීන් තමා පමන අනුභවනොකොට නොසඟවා ඔවුන්ටත්බෙදාදී අනුභවකිරීමෙතු, ඔවුන්මෙහෙකොට දුර්වලවූකල්හිද ඔවුන්ගේ මගුල්ආදී

එක්තරා කටයුත්තක් ඇතිකල්හිද මෙහෙනොහෙන ඒ ඒ කටයුත්තා උවමනාවිචාරා වී සාල්ආදී උපකරණදී ඇර්මෙතු, යන මේ පස්කාරණයෙන් ස්වාමිහු විසින් අනුකම්පාකරණලද දසිදසුන් විසිනුදු ස්වාමින්කෙරෙහි පස්කාරණයකින් අනුකම්පාකටයුතු- ඒ කෙසේදයත්—අලුයම තමන්ස්වාමින්ගේ කලමනාතාත්කර්මාන්ත සලකා පලමුකොටනැගිසිට සිටීමෙතු, හැම්කටයුතුනිමවා පෙරයම ස්වාමිහු ශතපුනුකල ශතපීමෙතු, ස්වාමිහු තුදුන්දෙය සොරානොගෙණ දුන්දෙය ගැන්මෙතු, තමන්කරණනාක් කර්මාන්ත නොවරදවා පසුනොකොට එයින්ලබනලාභ අඩුනොවනාසේ කිර්මෙන්ද, තමන් ගියනාක්තැන ස්වාමින්ගේ ගුණකියමින් අපි අප දුසබව නොදන්නාන්වැනාහම්හ දෙමවුපියන්ගේ ගෙහි වසන්නාන්වැනාහයි යනාදී කීමෙන්ද, යනමේ පස්කාරණයෙන් දසිදසයන්විසින් ස්වාමින්කෙරෙහි අනුකම්පාකටයුතු-මෙසේහින් දසිදසයන්විසින් ක්ෂෙමවෙයි, නිර්භයවෙයි, උපද්‍රව නොවෙ—

පණ්ඩිතොසීලසම්පන්නො ජලංඅග්ගීවභාසති,
භොගෙසංහරමානස්ස භමරස්සෙවඉරීයතො·
භොගාසන්නිචයංයන්ති වම්මිකොවුපචීයති,
එවංභොගෙසමාහත්වා අලමත්තොකුලෙගිහී-

යනුවදාලබැවින් යටකියනලදක්‍රමයෙන් සීලයෙන් සමන්විතවූ ප්‍රඥාවන්නාවූ පුද්ගලතෙම ඝණාන්ධකාරයෙන්යුක්තවූ රාත්‍රියෙහි පර්වතමස්තකයෙහි දිප්තිමත්ව බබලනනාවූ මහ ගිනිකඳක්මෙන් දිප්තිමත්ව බබලන්නේය. අනුන්ටද තමාටද පීඩානොකොට ධර්මයෙන් වස්තුන්රැස්කරණණාහට ඔවුන්ගේ වස්තු මහත්බහුලභාවයට පැමිනෙන්නේය· ඒ කුමක්මෙන්දයි කිවහොත් යම්සේ භෘංගතෙම පුෂ්පයන්ගේ වර්ණගන්ධාදීන් නොනසමින් තුඩුයෙන් හා පක්ෂපත්‍රයෙන් මකරන්ධයන්ගෙන චක්‍රප්‍රමාන මධුපටලයන් කරන්නේවේද එමෙන් වස්තුන් රැස්වන්නේයි—තවද යම්සේ වේයන්විසින් අනුක්‍රමයෙන් බඳනාලද තුඹස යම්සේවඩීද එමෙන් කලනනම්තුවූ ඒ කුලපුත්‍රයාගේ වස්තූහු ක්‍රමක්‍රමයෙන් රැසව මහත්වනානාහුයි· එසේ ඇතිකල්හි හෙතෙම ගෘහවාසයෙහි වසන්ට සමර්ථවන්නේයි. එසේ රැස්කරණලද භොගසම්පත්තියෙහි පිළිපදනාවිධි කෙසේදයත්—

චතුධාවිභජෙභොගෙ සවෙමිත්තානිගන්ථති
එකෙනභොගෙභුඤ්ජෙය්‍ය විහිකම්මංපයොජයෙ
චතුත්ථංචනිධාපෙය්‍ය ආපදාසුභවිස්සතීති-

යනුමෙවත් භොගයෙහි පිළිපදනාශවී වදාලකුම්යෙන් ඇති තාක්භොගයන් සතරකොටසක්කොට බෙදා එයින් එක්කොටසක් අනුභවයට ගතයුතුය. දෙකොටසක් ගොයිතැන් වෙළදාම් ආදී කර්මාන්තවල යෙදියයුතුය. සතරවනකොටස යම්කිසි අපදාර්ථයක් පැමිණිකල වියයුතුයයිනියා සහවාරක්ෂාකටයුතුයයි වදාලසේක — මෙසේ දෙලොවෙහි පරිච්ඡේදයෙන් ගෘහපති ධර්මානුශාසනාකථාවත් ප්‍රකාශකිරීමෙන් ලෝවැඩදැක්වා තදනන්තරව සර්වසාධාරණවූ සාමාන්‍ය සධර්මානුශාසනාකථාවේද මෙහි දක්වනුලැබෙත් — ඒ කෙසේදයත් — සර්වජගදනුකර ශාස්ත්‍රාවූ බුදුරජානන්වහන්සේ ජේතවනාරාමයෙහි වැඩවසනසමයෙහි දෙවතාවො මනුෂ්‍යකථාපහලකොට බුදුරජ මගුල්වදාරණසේකැයි කියා ලොවමංගලකෝලාහලය පහලවූතැන්පටන් දෙලොස්හවුරුදක්මුළුල්ලෙහි ඔවුනොවුන්අතින් විචාරා මගුල් තෝරාකියන්ට කිසිකෙනෙකුන්නොලැබ දසදහසක් සක්වලදෙවියෝම මේ මගුල්සක්වලටරැසව දෙව්රම්හිවසන බුදුන්කරාපැමිණ —

බහූදෙවාමනුස්සාච මඞ්ගලානිඅචින්තයුං
ආකංඛමානාසොත්ථානං බ්‍රෑහිමඞ්ගලමුත්තමං.

යනමේ ගාථාවෙන් එක්තරා දෙවතාවෙකුවිසින් බොහෝ දෙවියොද මනුෂ්‍යයොද මගුල්සිතනනාහුය ඔවුන්ගේ ශක දුරුකොටමගුල් වදාලමැනවැයි ආරාධිතවූ බුදුරජානන්වහන්සේ —

අසෙවනාචබාලානං පණ්ඩිතානඤ්චසෙවනා,
පූජාචපූජනීයානං එතංමඞ්ගලමුත්තමං.

යනාදීන් මෙලෝපරලෝදෙකින් වැඩටකාරණවූ මගුල් වදාරණසේක් — සියළුම අනර්ථයනවූත් සියළුමඅවඩට කාරණව බාලසේවනය නොකිරීමත් ප්‍රඥසේවනය කිරීමත් පිදියයුතුවූ බුදුපසේබුදුසවුවන්ට පිදීමත් සියළුම ලොව්ලොවුතුරාවැඩටකාරනාහෙයින් මගුල් —

තවද මධ්‍යදේශාදිවූ යම් දේශයක සිවුවනක්පිරිස් වෙසෙත්නම් දානාදි දසපින්කිරීමත් පවතීනම් තෙවලාබුදුවදන් පවතීනම් එසේවූ නිසීයනන විසීමත් බුඩාදීන්අරභයා පෙරකල පින් ඇතිබවත් යම්කෙනෙක් පන්සිල්පමනකුත් සිල්නොරකීමෙහි ආදිනවසලකා පන්සිල්පමනක්උවත් අෂ්ටාහසීලාදියඋවත් රක්නාකිරීමත් අනන්තාදිවශපක් සාදදීලනහෙයින් මගුල —

තවද බොහෝ අඥපිරුතැන් ඇතිබවත් අකුශලකර්මපථ විරහිතබැවින් නිරවද්‍යවූ මුනිකාරසුවර්ණකාරාදී අගාරියශිල්පය චීවරච්චාරණසිබ්බනාදී ප්‍රව්‍රජ්‍යාවට නිසි අනගාරියශිල්පය යනමෙ දිප්‍රකාර ශිල්පදක්ෂමත් ශික්ෂිතවුවොත් ප්‍රාණඝාතාදී දසඅකුශලකර්මපථයන්කෙරෙන් දුරුව දානමානාදියෙහි ගැසිරීමත් පැවිදිවූවොත් සිවුපිරිසිදු සිල්පිහිටීමත් මුසාවාදාදි චතුර්විධ වාක්දුශ්චරිතාදියෙන් දුරුව නිර්වාණමගනිවන් ඉදනහෙයින් ඒත් මගුල —

තවද දෙමවුපියොනම් වදූපුදරුවන්ට ඉතා උපකාරිහෙයින් පිටතකෙලපියා ආ දරුවන්දක ඇඟමැලි පස්පිස හිස සිඹපියා උපදවාපූසෙනේහය අවුරුදු සියයක්වූවත් දසක්ලවත් මුළුල්ලෙහි බිම්බාතොනබා මවුපියදෙදෙනා කරින් උසුලාත් ගෙවාලිය නොහැකිහෙයින් දෙමවුපියන්ට නැවිම් හිස්සේදීම් කැවීම්පෙවීම් ආදියෙන් උපස්ථානකොරෙද්ද ඒ උපස්ථානකිරීමත් අඹුදරුවන්ට කලමනා දානසීලසමාදාන ප්‍රියවචන වස්ත්‍රාභරණාදි ධාර්මිකවූ සංග්‍රහකිරීමත් අකුශලකර්මපථයන්කෙරෙන් දුරුව නිසිව නිදහදී නිරවුල්කර්මාන්තකිරීමත් නොකිරීමය කල්ඉක්මවා කිරීමය නපුරුකොට කිරීමය ඇලිමැලිව කිරීමය යනාදියනැතිව කල්දූත නිසිලෙසින් නොමැලිකොටගත්තාවූ සිවප්‍රාදිවූ කර්මාන්ත කීර්මත් මෙලෝපරලෝදෙක්හි වැඩට කාරණහෙයින් මගුල —

තවද ආමිසදාන ධර්මදානවශයෙන් විප්‍රකාරවූ දානයෙත් දස කුසලධර්මයෙහි හැසිරීමත් මවුපක්ෂ පියපක්ෂයෙන් සත්වන කුල පරම්පරාවපටන් පැවතආ නෑයන්අතුරෙන් දුක්පත් නමාසවම්පයට ආ නෑයන්ට බලපමනින් බත්පිල්ආදිය දීමෙත් සංග්‍රහකිරීමත් පොහොදවස් නොවරදවා පෙහෙවීම ගුරුන්වතුත් කුලදෙටුවන්ට මෙහෙකිරීම් මල්වතු පැන්පොකුණු උයන්ගොනටු අඹලම් හේදඬුආදියකිරීමත් දෙලොවින්ම වැඩවකාරණහෙයින් මගුල —

තවද පාපයෙහිආදීනව සලකා මේ අපගේජාතියට අපගේ නරමට නොනිසියයිදූත පවිත්වැලක්මත් මෙබඳුපාපයක් මෙවක්පටත් නොකරමිහයි කියාලා පවුනොකිරීමත් රාබීමත්වූවාශූ කාරණනොදූත මවුපියන්කුලදෙටුවන් බුදුපසේබුදු මහරහතුන් වූවත් නොහඳුනනා හෙයිනුත් මෙලොවම වියරුවෙස්ගෙන ඇවිද පරලොව අපායදුක් විඳිනහෙයින්ඒ රාපීමත්වැලක්වත්, කරණ පින්කම් සකස්කොට කිරීමනොකඩව සතතයෙන් කිරීම්

නොවැළිව වීර්‍ය්‍යඇතිව නිරිමයයන මෙසේපින්කම්හි නොපමාවීමි
ත් සියළු වැඩටකාරණහෙයින් උතුම්මගුල—

තවද ගෞරවකලමනා බුඬාදි රත්නත්‍රයෙහිද මවුපියන්ආ
දී වෘර්ධයන්කෙරෙහිද වන්දනමානනාදී වසයෙන් කරන්නාවූ
ගෞරවයෙන් ගුණෙන් නුවනින්නමා වැඩිතරම්වීනමුත් නිහත
මානීව ගුරුත්වතුන් දෙමවුපියන්ආදීවූ වෘර්ධයන්කෙරෙහිද යථා
ත්වූපැවතුම් ඇතිබවත් යථාබල යථාලාබ යථාසාරුප්පවසයෙන්
තුම්වැදෑරුම්වූ ත්‍රිවිධ සන්තොසයෙන් සතුටුවනබවත් මදක්වූව
ත් බොහොවූවත් අනුන්තමහටකල උපකාරදන්මත් යම්කලෙ
කසිත උඩඟුවෙද කාමවිතර්කාදීන් විසින් මඩනාලදුවවේද එක
ල්හි කල්‍යාණමිත්‍රයන් සමීපයට එලඹ තදනුරූපවූබන ඇසීමත්
දෙලොවින්මවන සියළු වැඩටකාරණ හෙයින්මගුල—

තවද අනුන්ගේ අපරාධවරද සහනය කිරීම්ආදී ක්‍ෂමාල
ක්‍ෂණවූ ඉවසීමත් කාරණදක්වා කීයා අවවාදකරණකල්හි
ගුණාගුණ සිහිකිරීම්වසයෙන් චිත්තවික්‍ෂෙපයට නොපැමින ය
හපතැයිකීයා වරදපිලිගන්නාබවත් සංහිඳුවනලද කෙලසයන්
හා වඩනාලද ප්‍රඥාසීලසමාධ්‍යාදිගුණයන් ඇති ශ්‍රමණයන්ගේ
දකීමත් පෙරයමහෝ අර්ථයමහෝ සුත්‍රාභිධර්මයෙන් ඔවුනොවුන්
හාකරණ්ණාවූ සාකච්ඡාවත් විචාරීමත් සියළු වැඩටකාරණාහෙ
යින් මගුල—

තවද යම්කෙනෙක්හට චක්‍ෂුරාදී සදෙරට විසයවූ ඉෂ්ටරූ
පාදිසාරමුනෙහි ඇලීමුන්අනිෂ්ටවු දෙයෙහි ගැටීමත්නොවේද.
එසේවූඉන්ද්‍රිය සංවරයහෝ කෙලෙසුන්තවන වීර්‍ය්‍යයහෝ යන මේ
දෙකින් සමන්විතයන්කෙනෙක් මෙවුන්දම්න් වැලැක්කේද සෙ
සුත් ශ්‍රමණධර්මයෙහියෙදී වෙසෙද්ද ප්‍රතිවේධය පසුකොටත්
පර්‍ය්‍යාප්ති ප්‍රතිපත්තිදෙක්හි යෙදීවෙසෙද්ද ඒසියළු ශාසනබ්‍රහ්ම
චර්‍ය්‍යාවත් දුක්ඛසමුදය නිරොධමාර්ගනාමයන චතුරාර්‍ය්‍යසත්‍යයන්
ගේ දක්මත් පඤ්චගතිවානයයි දනනාලද තෘෂ්ණායෙන් නික්මු
නුහෙයින් නිවනැයිකියනලද නිර්වාණපුරයට පැමිණීමත් සියළු
මදුකින් මිදෙනහෙයින් මගුල

තවද යම්කෙනෙක් ලාභයක්වත් යසසක්වත් ප්‍රසංසාවක්
වත් ශපයක්වත් ලදින් එමවැඩිතරම් සාරයක්සේ සිතා උඩඟු
නොවෙද්ද නැවතඅලාභයකටහෝ අයසකටහෝ නින්දවකට
හෝ දුක්කටහෝ පැමිණ අනිත්‍යතාව ශලකීමත්ධර්මානුස්ම

ර්ණයෙන් යෙදී වෙහෙසෙනනොවේද එසේ අෂ්ටලෝක ධර්මයෙ
න් යම්කිසිවක්හුගේසිත කම්පානොවේද එසේවූ ක්ෂීණාශ්‍රවණ
යාගේසිත අර්හත්මාර්ගඥානයෙන් උපුටාහරණලද ශෝකනැ
මති හුල්ඇතිහෙයින් සොකපීඩානැතිවේද ඒ ක්ෂීණාශ්‍රවයාගේසි
ත මාර්ගඥානයෙන් දුරුකරනලද රාගද්වෙෂ මොහාදිපාපධර්මයන්
ඇතිහෙයින් නිකෙලසවූ රහතන්ගේ එසේනිශොක නිකෙල
සිවූවත් දෙව්බඹසහිත සියළු ලෝවැසියන්ට අග්‍රදක්ෂිනෙය්‍යව
න බැවින් මගුල—

ශාස්ත්‍රෘවූබුදුරජ අසෙවනාචබාලානම් යනාදි ගාථාදසයකින්
මෙසේ මගුල් තිස්අටක් වදාලසේක—මෙම්ගලසූත්‍රය දෙසනාව
වදාළකල්හි දෙවියො කෙලලක්‍ෂයෙක් රහත්වූහ අසංඛ්‍යයක්
සොවාන්ආදී මාර්ගඵල ප්‍රාප්තවූහ—දෙවතාදවස් බුදුහු අනඳමහ
තෙරුන්කැඳවා ආනන්දයෙනි ඊයේරාඑක් දෙවතාවෙක් මාක
රාඅවුත් මගුල්විචාලෙය මම ඔහට මගුල්අටතිසක්කිම් ආනන්ද
ය මේමංගලසූත්‍රය ඉගෙනගෙන භික්ෂූන්ට උගන්වයි වදාළසේක'
උන්වහන්සේත් ඉගෙනසෙසු භික්ෂූන්වහන්සේට ඉගැන්වූසේ
ක එහෙයින් එවකපටන් මෙවකදක්වාත් මෙවක්පටන් පංචා
දහස මුළුල්ලෙහි මේසූත්‍රය ප්‍රයොජන වන්නේ—එහෙයින් ලො
වනැත්තාවුන් විසින් නුවනනැති අඥාණබාලජනයන්ට එක්නො
ව යහපත්නුවනැත්තාවුන් භජනයකොට ඊදියයුක්තවුන්පුද
සුදුසු පියෙසපෙරකලපින් ඇතිබැවින් තමාගපත්ව නිරවද්‍යසි
ල්පභූගැන්මෙත් බොහො ඇසූපිරූතැන්ඇති බැවින් පිලිවෙති
න් සත්නාහොබවා කියන බසෙක්ඇත්නම් යහපත්ව කියමින්—

දෙම්ව්පියන්ට උපස්ථාන කිරීමෙන් අඹුදරුවන්ට සංග්‍රහකි
රීමෙන් නිරවද්‍යවූ කෘෂිවනික්ආදිය ඇරවීමෙන් ධනධාන්‍යසම්
පත් ඇතිවදන්දීමෙන් භොගයෙහි සාරයගෙන සීලසංරක්ෂන
යෙන් ජීවිතසාරය හැරගෙන නෑයන්ට සංග්‍රහකිරීමෙන් ස්වප
ක්ෂසහිතකරවමින් නිරවද්‍යවිමෙන් අනුන්හිනකරමින් පව්න්වැළැ
ක්මෙන් පින්පීඩාත්නැතිව රාමෙරෙහා දුරුවීමෙන් තමාටවන පීඩා
ත්නසා නොපමාවිමෙන් කුසල්දහම්වඩමින් පිනටසිත්නැමුනු බැ
වින් ගිහිශපත්හැර මහනවූ බුඩාදීන් කෙරෙහි ගෞරවත් ඇතිව
උඩනවාසය ශාසනානුරූප නොවනබැවින් කොතැන්කෙරෙහිත්
යටත්වූ පැවතුම් ඇතිවවත් පිලිවෙත් සාරවසතර පසයෙහි වාදස
විධවූ ආයෂ්සනොනාසයඇති බැවින් ප්‍රත්‍යයෙහි ලොල්බවහැර
කල උපකාරදන්මෙන් සත්පුරුෂව පින්කම්හි මැලිබ්‍යවක් ඇ
ත්නම් ධනඇසීමෙන් දුරුකොට ක්‍ෂමාවපෙරදැරිකොට ගෙන

සියළු උවදුරු නසා සිතරුබැවින් සියළු වැඩට තිසිව ගුණඇත්තා
වූන්ගේ දුක්ම නිසා උන්ගේ අනුශාසනාවෙන් තමාත් ගුණඇ
තිව කුසල් විෂයෙහි උපන් ශක්ති ඇත්නම් හුවනැත්තාවූන්හා කු
ඨා කිරීමෙන් ඒදුරුකොටගෙණ සිවුපිරිසිදු සිල්පිරිපීමෙන් සීල
සුද්ධිය සපයාගෙණ සමථාභියොගයෙන් චිත්තවිසුද්ධිය උපදවා
දෘෂ්ටිවිසුද්ධිය ආදියනැතිව ඥාණදර්ශන විසුද්ධිය සපයන්ට බැරි
බැවින් ලක්ෂණාදී විසින් නාරූපයතිශ්වයාදී විසින් සෙසුවිසුද්ධින්
සපයාගෙන මාර්ගීප්‍රතිවෙලින් ප්‍රඥාස් ඔහත්ව ඵුලගෙතිත් මහමෙර
සොලවාලිය නොහැක්කාමෙන් අෂ්ටලොකධර්මනැමැති පවනින්
නොවෙවුලා නිශොකවීමෙන් නිකෙලෙස්වීමෙන් හැමතැන්හි
ශනාපරදනාසේ ආත්මභාවය සාර්ථක කටයුතු

මේ මංගලසූත්‍රය දෙසූ දෙවනදවස්හි ශාස්තෘවූබුදු රජානන්
වහන්සේ මංගලසූත්‍රයෙන් සත්වයන්ට වන අභිවෘද්ධිකාරණායම
වදාළසේක එහෙයින් පිරිහීමවන අවඩකාරණා විචාරමහයි නි
යා දසදහස්සක්වල දෙවියෝ මේ එක්සක්වලකට රැස්වකොස්
ලොමි අගක්සෘතැන දසවිසීතිස්පනස්ශටසත්‍යඅසූදෙන බැගින්
හැසිරසිටිමහපිරිස් මැදශක්‍රදෙවේන්ද්‍රයාගේ නියොගයෙන් එක්
දෙවියෙක් භාග්‍යවතුන් වහන්සේකරාපැමිණ—

පරාභවන්තංපුරිසංමයං පුච්ඡාමගොතමං
භගවන්තංපුට්ඨුමාගම්ම කිම්පරාභවතො මුඛං.

යනාදි එකක් අතුරුකොටඇති ගාථාවෙන් අවඩකාරණා විචා
ලාවූ ඒදිව්‍යපුත්‍රයාහට—

සුවිජානොභවංහොති සුවිජානොපරාභවො
ධම්මකාමොභවංහොති ධම්මදෙස්සිපරාභවො.

යනාදී ගාථාදෙළොසතින් ඔහු විචාළපූච්ඡාගාථාවන් එකිනෙ
කට අනතුරුව සත්වයන්ට පිරිහීම්වන අවඩකාරනා ප්‍රකාශකො
ට පුද්ගලාධිෂ්ඨානයෙන් වදාරණසේක් යම්පුද්ගලයෙක් දසකුස
ලධර්මපථයන් කැමතිවේද ප්‍රාණීනාකෙරේදඅසා පිලිපදනේද ඔ
හුගේ ඒප්‍රතිපත්තියදුකීමෙන්ද ඇසීමෙන්ද හෙතෙම වැඩට පැ
මිණෙනා තැනැත්තේයයි ශාපසේම දනහැකිවෙ එදසකුසල ධර්
යන් යමෙක් නොකමැත්තේද අසාපිලිපැදීමක් නැත්තේද ධර්
යනොකමැතිවූ ඔහුගේ එදුශ්ප්‍රතිපත්තිය දුක අසා මෙතෙම
පිරිහෙන අවැඩටපැමිණෙන තැනැත්තෙත්යයි ශපසේඛහුගේ

ස්වභාවයෙන්ම සිතදතහැකිවෙයි යනමේ පළමුවෙනි පිරිහීම්කාරණය වදාරණබුදුහු එපිරිහීමට පැමිණෙන පුද්ගලයාහට පූරණකාශ්‍යපාදි නොසත්පුරුෂයන් කායාදිද්වාරත්‍රයෙන් පාපකර්මකරණ අසත්පුරුෂයො ප්‍රියවෙත් ඒපිරිහෙන පුද්ගලබුද්ධාදීන්හා අනාථපිණ්ඩිකාදීන්හුන් කායාදීකර්ම්මඇති සත්පුරුෂයන්තමහට ප්‍රියමනාපයන් නොකරන්නේයි නොහොත් නොසෙවුනේයි, යටකීපූරාණකාශ්‍යපාදී අසත්පුරුෂයන්ගේ දෙශට මිතහජ්‍රිණිසහො කායාදිය අසංවරවූඅසත්පුරුෂයන්ගේ, ස්වභාකම්වූ අකුශලකර්ම්මප්‍රථයොයන අධර්ම්ය කැමතිවෙයි, යනමේකාරණානුන ඒපුද්ගලයාහට දෙලොව අවඩවනකාරණයයි වදාරා

තව්ද තුන්වෙනිවූ පිරිහීම්කාරණය වදාරණබුදුහු යම් සත්ත්වයක් නිදනසුළුද හෙවත්හුන්තැනත් සිටිතැනත් හොත්තැනත් නිදන්නේමවේද සභාසීලිවගන සංඝනිකාගෙහිඇලිම සභාතිශ්‍රිත ස්වභාඇතිව එකට්වෙහිමඇලී නැවතනැවත යෙදී වියත්කලම නානාත්හි වියස්තෙජස්නැතිව ගිහිදහෙවත් ගිහිවවසන් නේ ගිහිකම්හො, පැවිදිවූයේ පැවිදිකම්හො අනුන් විසින් මෙහෙයතු ලබන්නේම් කිසිකලෙක කෙරේද පටන්ගනීද ස්වභාවයෙන්කුසීතද අතීයයින් ජාතිඅලසව හුන්තැනින් සිටිතැනින් හොත්තැනින් තමාගේබලයෙන් අතික්‍රමියවූවස් නොකරේද සෙසන් විසින් මේ අලසයයි දතයුතුවේද. රථයටබඳජයමෙන් ගිත්තාව දුම්මෙන් ක්‍රොධයම සලකුනුව පෙරදූරිව ඇතිහෙයින් වෛෂවරිතවවහා තිපනසුළුද ඔහට නිදනසුළුබව දෑඩනසුළුබවද උත්ථානවීර්‍යනැතිබව කුසීතබව තිපනබව් යනමෙපරිහානි කාරණයයි වදාරා—

තව්ද සතරවෙනිවූ පිරිහීම්කාරණය වදාරණබුදුහු යම්ක්ෂත්‍රියාදී කිසිවෙක් ශරීරශෛථිල්‍යයෙන් දිරාමහළුවූ යෞවනය ඉක්මගිය අසූඅනූවයස්ඇති සියඅතින් කම්මාන්තකිරීම නොහැකි වැදූමවූපියන් පොහොසත්ව සිට පොසනය නොකරේද ඔහට ඒ මවුපියන්ට උපස්ථානඋපකාර නොකිරීම පරිහානි කාරණයයි වදාරා—

තව්ද පස්වෙනිවූ පිරිහීම්කාරණය වදාරණබුදුහු ක්ෂත්‍රියාදී යම් කිසිවෙක් පිටත්කරණලද පවුඇති ක්ෂීණශ්‍රමණයකුහො සත් සිඳුවනලද පවුඇති ශ්‍රමණයකුහො නොහොත් බමුණුකුලයෙහි උපන් බ්‍රාහ්මණකුහො පැවිදිලත් ශ්‍රමණයකුහො අන්කිසිවක් ඉල්වනයාචකයකුහෝ මුසාවාදකීමෙන් වඤ්චාකෙරේද හෙවත් වඤ්චත්

ස කැමත්තක් වදාළමැනවයි පවරා ඉල්වූතැනයො දෙමිනියා නොදීමෙන්හෝ ඔවුන්ගේ ආසාව වලකාපීම ඕහට පැවර්මෙන් ගුණහාවුපුද්ගල මෙලොව නින්දාවවද පරලොව දුගීගතියෙහිම් හන්දුකවද පැමිණබොහෝදුක්විද. එයින් චුතවමුසාවාදයෙන් රවටා වචාකල එසත්වතෙම මිනිසත්බවට පැමිණියෙවේද, ඔහු විසින් මෙගොයනලද ගොවිතැන් වෙළඳාම් විපත්තිවීමෙන් ආසාව සිදෙන්නේයි, එහෙයින් පිරිහීමට වන්නේයයිවදාරා—

තවද සවෙනිපිරිහීම් කාරණය වදාරණබුදුහු යම්පුද්ගලයක් හට තුෂ්ටිජනනයෙන් විත්ත නම්වූ රත්‍රංජිදි මිනිරුවන් ඇත්තේද කාවුනු සහිතවූ නොයෙක් සූපව්‍යංජනයෙන්යුක්ත බොජනයන් ඇත්තේද එපුරුෂම්පුරුවූ බොජුන්තමා අඹුදරුවන්ට නොදීපිලිසන් තෙනකශහවිනිද ඒකලාව අනුභවකෙරේද ඕහට ඒමිහුරුරසයෙහි ගිජුමසුරුබව නොයෙක් නින්දාපරිභවයටද දුගතියට පැමිණීමටද, හෙතුවනහෙයින් පිරිහීමටද කාරණයයිවදාරා—

තවද සත්වෙනි පිරිහීම්කාරණය වදාරණබුදුහු යම්සත්වයෙක් ජාතිය හෙතුකොටගෙණ මානයෙන් තදව මම ජාතිසම්පන්නයෙමියි මානයඋපදවා එයින් තදවවාතය පිරිසිටි සම්පයියක් මෙන් ඉදිමුනු සවභාවඇත්තේ කිසිවක්හටත් නොනැමේද රන් රුවන් ආදීධන ඇත්තේමියි ධනයහෙතුකොටගෙන නීතියෙ යෙන්ම ධනනිසාඋපන්මානයෙන් තදවූයේද උත්තම ගොත්‍ර ඇත්තෙමියි ගොත්‍රයහෙතුකොටගෙන එසේම මානයෙන්තදද සවකීයතමාගේ නෑයන්ටත් අවනම්බුකෙරේද ශාක්‍යවිඩුඩභයාට මෙන් ජාතියෙන්නුත්තදද. මේදිළිඳුයයි ධනයෙනුත් තමාවැඩි යයිදක්ක සාමිවපමනකුත් නොකරේද ඕහට ඒනැයොපරිහව බැවින් නින්දාකෙරෙත් මෙසේ වස්තුවසයෙන් චතුර්විධවුලක්ෂණහෙයින් එකම මානයුත් යපොක්භයහට පිරිහීම්වන්නේයයි වදාරා

තවද අටවෙනිපිරිහිම්කාරනය වදාරණබුදුහු යමෙක් ස්ත්‍රීන් විසයෙහි ඇළුණේද තමාගේ සියළු සම්පත්දීන් නැවත නැවත මාගම්සිත්ගන්නේද රාබීමෙහිලොල්ව තමාසතුසියලලදීන් රාබීමෙහිඇළුණේද හිනකඩඋගස්තබාත් දුකෙලියෙහි ලොල්වුයේද ලදලද යම්කිසිවක් ඒඒ තැනවදීමෙන්නසාද එත්‍රිවිධකාරණය ඔහටධනහානියෙන්හා නින්දායෙන්හා දුගතියඉපදීමෙහු පිරිහීමට කාරණයයි වදුරා—

තවද නවවෙනිවූ පිරිහීම්කාරණය වදාරනබුදුහු යමෙක් ස්වකීය භාර්‍ය්‍යාවන් හේතුකොටගෙණ නොසතුටුවූයේ වෛශ්‍යාවන්කෙරෙහි දක්නාලැබෙද එසේම අනුන්අයත් පරස්ත්‍රීන්කෙරෙහිදක්නා ලැබෙදයනමේ විප්‍රකාරය ඔහට ධනහානිවීම්ආදී පිරිහීමට කාරණයයිවදාර—

තවද දසවෙනිවූ පිරිහීම්කාරණය වදාරණබුදුහු ඉක්මගිය යෞවනයඇති අසූඅනූවයස්ඇති පුරුෂයෙක් තිඹිරිඵලවැනි තන ඇතිලඳරියක කාලනවසයෙන් තමාගෙන ඒද ගෙනොවුඇව ඊර්ෂ්‍යාවෙන්නොනිදාද ලඳරියගේ මහලුභාකාමරතියක් සහ වාසයක්නොවන හෙයින් ලඳරුවකුපතාදැයිහොයි ඊර්ෂ්‍යාවෙන් ඇරක්නේ නොනිදන්නේය හෙතෙම යම්හෙයකින් කාමරාගයෙන්හා ඊර්ෂ්‍යාවෙන්දතු ලබන්නේ පිටතකලම්නා කර්මාන්තද නොයෙදීමෙන් ඔහටපිරිහීමට ඒ කාරණයවන්නේයයි වදාරා

තවද එකොළොස්වෙනිවූ පිරිහීම්කාරණ වදාරණබුදුහු මත්ශ්‍යමාංශ සුරාවෙහිලොල්වූ තෘෂ්ණාඇති ඒමත්ශ්‍යමාංසාදිය නිසා ධනසම්පත්පස්මෙන් විසුරුවාත් නසන සුළුවූස්ත්‍රියකහොත්වද එස්ත්‍රීයවැනි ධූර්තවසම්පත්නසන පුරුෂයකුහො ඔස්මුද්‍රාආදිය දී ගෘහවාසයෙහිහො කර්මාන්තකිරීමෙහිහො වෙළඳාම්ආදියෙහි හො ඉසුරුබැව්හිතබාද හෙවත් එහියෙහිනියුක්තයා කෙරෙද හෙතෙම ඒධූර්තවවස්තුනසන පුරුෂයාගේ දොසයෙන්ධනය ක්ෂයවීමට පැමිණියේවෙයි එහෙයින් ඔහටපිරිහීමට ඒ කාරණයවන්නේයයිවදාර—

තවද දොළොස්වන පිරිහීම්කාරණය වදාරණබුදුහු පළමුවෙන් රැස්කොටතබනලද භොගයක්නැතිහෙයින්ද, අයඉපදීමට නිසිතැනක් නොවීමෙන්ද, මදවූඋපභොග පරිභොග වස්තුවක්ඇති මහත්වූභොග තෘෂ්ණාඇතිලදදෙයකින් සතුටුනොවන ක්ෂත්‍රියයෙක්වූයේද ඒ ක්ෂත්‍රියජාතිඇති අල්පභොගවූ මහාතන්හා ඇත්තෙක් ඒතණ්හාව හෙතුකොටගෙන උපායෙන්නොයදී වැරදිවරදවා ආපිලිවෙනින් තමාසතුකවූහෝ තමාටනොලැබෙණ අනුන්අයිතිවූහෝ රජබවපතාද එසේ ඒ රාජ්‍යයපැතීමෙන් උත්සාහකිරීමෙන් ඒඅල්පභොගයය සොධාදීත්වදීමෙන් රාජ්‍යයට නොපැමිණම නසනහෙයින්ඔහටපිරිහීමට ඒකාරණයවන්නේයයි වදාළකල්හි ශක්‍රදෙවේන්ද්‍රයාගේ නියොගයෙන් ශාස්තෲවූබුදුන්ට අභිමුඛවතුදුරුනොලන්වසිට පිරිහීම්කාරණාවිචාලඒදිව්‍යපුත්‍රතෙම තෙළෙස්වෙනි පිරිහීම්කාරණය නොවිචාරා මෙසේමාවිසින් එනි

ර්නක ශතසහශ්‍රයක් පිරිහීම්කාරණ විචාලෙන්විත මුත් බුදුරජ එ
තාක් පිරිහීම්කාරණ වදූරණශේක්මය මෙව්වාරිමෙන්කිව මෙකී එ
කම අභිවෘද්ධිකාරණයකුත් නැත ඒසියල්ල විනාසමුඛකාරණයන්
දූතනොවිචාරා තුෂ්නිම්භූතව ඒආඛ්‍යානයදක් භාග්‍යවතුන්ව
හන්සේ—

එතෙපරාභවෙලොකෙ පණ්ඩිතොසමවෙක්ඛිය,
අරියොදස්සනසම්පන්නො සලොකංභජතෙසිවන්ති·

යනමෙ අවසානගාථාවෙන් කාරණ කාරණ වැඩඇවඩ මේ
මේයයි විමසනනුවනින් යුක්තප්‍රඥාවඇති පණ්ඩිතතෙම සත්‍යලො
කයෙහිවූ යථොක්තප්‍රකාර මෙතෙව්සක්පමන පරිහානිකාරණ
යන් නුවනැසින්බලා පරීක්ෂාකොටදූන ආර්‍යමාර්ගය එලාදිනමය
ට පැමිණියේ ආර්‍යනොවනත් මේපරාභවමුඛයයි කියනලද අකා
රණයෙහි නොපවත්නාහෙයින් ආර්‍යවූ මේපිරිහීම්කාරණයන්ද
නනා යම්නුවනකින් දුරුකෙරේද ඒ දක්‍ෂණවූ ඥණයෙන් යුක්ත
වූපුද්ගලතෙම නිරුපද්‍රවවූ උතුම්දෙව්ලොව සේවනයකරන්නේය
හෙවත් දිව්‍යලොකසම්පත්තියට පැමිණෙන්නේයයි වදාලසේක-
මේධර්මදේශනාවගේ කෙළවරළපංසංවේගාතුරුපපරිදේශත්සො
වාන්සෙදෑගාමිමයින් නොස් සංඛ්‍යපථාතික්‍රාන්තදෙවතාවෝ සස
ර දුකින්මිදීගියහ—

මෙසෙ සමස්තසත්වයන්ට සර්වාර්ථසිද්ධියටකාරණවූ අටතිසක්
මගුල්කථාවත් ප්‍රකාශනිරිත්මිඤ සියළු අවඩකාරණාවසිටි තෙවි
සක්පමන පරිහානිකථාවත් ප්‍රකාශකොට දූක්වීමෙන්ද සණ
රාමර සර්වලෝකයාට කරණලද සර්වසාමාන්‍ය සද්ධර්මානුශාසනා
ඇතිහෙයින් සර්වජනප්‍රියංකර මාරජනභයංකර වරිධර්මචක්‍රඇති
දේවාතිදේවවූ මාගේබුදුහු ශාස්තෘනම් වනසේක—එහෙයින්
කියනලදී—

දෙවයක්ඛමනුස්සානං ලොකෙඅග්ගඵලංදදං,
දදන්තංදමයන්තානං පුරිසාජඤ්ඤතෙනමො.

ලොවැඩපිණිස කරණලද මෛත්‍රයධර්මාවවාද සංග්‍රහයෙහි
සාමාන්‍ය සද්ධර්මානුශාසනා ප්‍රකාසවූතෙලෙස්වන පරිච්ඡේදයකි
යා නිමවනලදී—

---

කියනලද නොයෙක් අසංඛනයිබ්බලන මෙසේමෙසේවූ විශි
ඨ විශේෂ අනේකප්‍රකාර සද්ධර්මානුශාසනාකථාවන් ඇතිහෙයිනු
ත් ග්‍රන්ථබාහුල්‍යවීමෙන්වන ග්‍රන්ථභීරුකයන්ගේ කුසීතභාවය
හරණ පිණිස අපවිසින්දැනදැනද මෙහිනොදක්වූ නොයෙක් සද්
ධර්මශාසනාකථාවන් ඇතිහෙයිනුත් අපවැනිපුහුදුන්ගේ නුවනින්
තබා ශාරිපුත්‍රස්වාමීන්වැනිමහනුවනැතිමහාපිනැති ලොකොත්තර
ගුණයෙහිඅගතැන්පත් මහළුතුමන්විසිනුදු නොදතහැකිඅසාධාර
නවූඅනන්තා පරිමාන සද්ධර්මානුශාසනා කථාවන් ඇතිහෙයිනුත්
සවුසනනට සරණවූහැමසතුන්වෙත පතලමහාකරුණාවක් ඇත්
තාවූ අනුන්පිණිසම මහදුක්වින්දවූ සතුන්පිණිසම දසපෙරුන්පි
රුවාවූ ශාරිපුත්‍රස්වාමීන්වැනි ජේෂ්ඨපුත්‍රයන්ලද්දවූ අනඳසාමීන්
වැනි උපස්ථායකයන් ලද්දවූ සද්ධර්මයවැනි ගුරුංලද්දවු සද්ධර්මය
වැනි මිහිරිරසයක් ලොවැසියන්ට බෙදුදුනාවූ බුදුබවවැනි
මහත්තනතුරක්ලද්දවූසර්වඥතාඥානයවැනිඥානයක්ලද්දවූසත්ත
බොධ්‍යඞ්ගයන් වැනිසත්රුවන්ලද්දවූ නිවන්වැනික්ෂෙම පුරයක්
ලද්දවූ මධ්‍යමප්‍රතිපත්තිවැනි නිවන්මගවනක්ලද්දවූ වජ්‍රාසනය
වැනිආසනයක්ලද්දවූ දෙතිස්මහපුරුෂලක්ෂණවැනි ලක්ෂණලද්දවූ
ශක්‍රයාවැනි බ්‍රහ්මයාවැනි මෙහෙකරුවන්ලද්දවූ අනේපිඬුමහසි
ටානන්වැනි විශාඛාවන්වැනි උපාසකපිරිස්ලද්දවූ සසරනැමැති
මහාකාන්තාර රතරණයට දිව්‍යරථයක්වැනිවූ හැම්ගුණෙන් හැම
නුවනින් හැමරුවින් හැමපිනින් මැවිසිටිමද හැමසත්නටද මවු
පියවූගුරුවරවූ මටම පිහිටවූ මටමසරණවූ මාගේස්වාමිදරුවූ
අපමහගෞතම බුදුරජානන්වහන්සේ——

ඉතිපිසොභගවා අරහංසම්මාසම්බුද්ධො විජ්ජාචරණසම්පන්නො
සුගතොලොකවිදූ අනුත්තරොපුරිසදම්ම සාරථිසත්ථා දෙවමනුස්සා
නං බුද්ධොභගවාති——යනමෙ නවඅරහාදි බුදුගුණයෙහි සත්
වෙනිවූසත්ථායන ශාස්තෘගුණෙන් යෙදුනුසේ කැසිදතයුතු-එසේ
හෙයින් කියනලදී——

දෙවයක්ඛමනුස්සානං ලොකෙඅග්ගඵලංදදං
දදන්තංදමයන්තානං පුරිසාජඤ්ඤතෙනමො.

ශාස්තෘවූ අපතිලොගුරුගෞතම බුදුරජානන්වහන්සේ ජීව
මානකාලයෙහි කොසලබිම්බිසාර අජාතශත්‍රුනරවරාදි ලොවැ
සියන්වයො එදිවමන්බුදුන්ගේ රූපශ්‍රීදර්ශන සද්ධර්මශ්‍රවනාදියෙන්
යෙදි නොයෙක් කුසලරාසිවර්ධනයෙන් තමතමන්ලද ජීවි
තාදිය සඵලකොටගත්හ, එබුදුන්පිරිනිවීපසු ධර්මශොක දුටුගැ

මූ ස්‍ව පරාක්‍රමබාහු ආදිනරවරයොහුද නෙර්මිත බුඩරූපදර්ශන
ධර්මශ්‍රවණාදිවසයෙන් නොයෙක්වැඩසැදූහ—එයින් මෑතභාග
යෙහිපූ ලංකාධිපතිවූ දඹදෙනි පරාක්‍රමබාහුය යාපවුනුවර බුව
නෙකබාහුය, කෝට්ටයේ ජයවර්ඩනශ්‍රිපරාක්‍රමබාහුය, මෙමනුවර
නරෙන්‍ද්‍රසිංහය, යනනරොත්තමයෝද ලජ්ජින්වහන්සේට බලය
දී නොයෙක්ලෙසිං සංග්‍රහකොට තමතමන්ගේ සඬර්මානුරූප
වූපරිද්දෙන් බුදුසසුන්පවත්වා නොයෙක්ලෙසින් ශ්‍රිදන්තධාතුපූ
ජාදක්නිරිමෙහුත් තමතමන්දවස පැමිණි ඒඒයතිතුමන් විසින් අමු
තුහෙළබස රචනාකොට ඇස්වුමහපූජාවළිය සඩර්මාලංකාරය
සඬර්මරත්නාකරය සාරාර්ථසංග්‍රහය යන ධර්මප්‍රකරණයන්ද සාද
රව ශ්‍රවනයකිරීමෙන් කර්ණාලංකාරකොට අවශෙෂලංකාවාසීන්
ද ඒ ඒධර්මප්‍රකරණ ශ්‍රවණයකිරීමෙහියොදූ ධර්ම්දූනයද පවත්වා
ලීමෙන්ද අප්‍රමාණවූ කුසලරාසි වර්ධනයකලාහ—එසේමමෙක
ලට රජපැමිණි ප්‍රවර මහාසම්මත රාජවංශපරම්පරානිර්ධ නිතකත
දක්ෂිණ මධුරාපුරඋදසාම ලොදිතසගශ්‍රාශෘප්‍රති භාගධීරවීර සා
රාචාර ශ්‍රඬාදිගුණකර අනීත්දිත්‍රාගසම්පන්න ශ්‍රිනිවාසජනනය
නරජසායන රූපලාවන්‍යශ්‍රිසාරවිරාජිත පූත්‍යඉඩීතේජොබල ප
රාක්‍රම අතුල්‍ය අසදෘශඈති ගම්භිරප්‍රවරොදූර කුසලඵල සමුද්හ
වදසබල ශාසනාධාරවූ—ශ්‍රීමත් කීර්ත්තිශ්‍රිරාජසිංහාභිදූන අප
මහරජතුමානෝද පෙරමහපිනැති මහරජුන්සේ මමද බුදුසසු
න්වවාගෙණ රජකෙරෙමියන උදාරතරරාජාභිමාන උපදවාගෙ
න ත්‍රිවිධරතනාභිපාලනයිත් ඇතිව අපරිමිතකුසලරාසි වර්ධනය
කෙරේමින් ශ්‍රිවර්ධනපූරයෙහි වසනුයේවා—පලමුකොටම්ශ්‍රිදන්ත
ධාතුපූජාවට පටන්ගෙණ දර්ශනීයසර්ශයිලමය යික්තීසම්භභූ
මිකම් නෙර්මිතවූදිව්‍ය මන්දිරප්‍රතිභාග විචිත්‍රචිත්‍රකර්මානනාජව
ලිත සවර්නරජතකර්මනෙර්මිතාසන චාරකවාටෝප සෝභිතවූ
දෙමහල් ප්‍රාසාදයක් කරවා සුරෙන්ද්‍රාක්‍රිව ප්‍රතිභාගරක්ත නීල
මනිමුක්තාදිමාහැඟිවූ රුවනින්ම අතුරුනැති විසිතුරු අඩදෙ
රියන්ප්‍රමානවූ සණරන්කරඬුවක්ද තදනෙත්‍රාගධවූ එසේමමාහැ
භිරත්නමය කරඬුදෙකක්ද කරවාදිව්‍යපූරයක්මෙන් සවකීයශ්‍රිවර්
ධනපූරප්‍රවරයදඅලංකෘතකොට ලංකාවාසිනොයෙක් ජනසමූහයද
රැස්කරමින් අපරිමිතවූ පූජොත්සවයෙන් ජිනවරශ්‍රිදන්තධාතූන්ව
හන්සේ එහිවඩාදර්ශණ ප්‍රතිලාභයෙන් දිවමන්බුදුන්දුටුවාසේම අති
ශයින් සන්තුෂ්ටවලද ජීවිතයසඵලකොටගෙණ අවසේස ලං
කාවාසීන්ටද මුනිවරශ්‍රිදන්තධාතුන් වහන්සේදක්වාලීමෙන් වි
ශෙෂයෙන් සතුටුකරවා ලෝවැඩදකිරීමෙන් මුක්නාමාතික්‍ය භිර

ණ්‍යසුවර්ණ මාණික්‍යවස්ත්‍රාභරණ ග්‍රාමක්‍ෂෙත්‍ර දාසිදාස ගොමහි ෂ හස්ත්‍යශ්වාදී අනේකප්‍රකාර පූජාවස්තූන්පූදාවා ද ලදසම්පතද සඵලකොටගෙන පෙරපැවති නොයෙක්පූද සිරිත්නොකඩව වඩවඩා පැවැත්වීමෙන්හා අලුතු අලුතුද නොයෙක්පූද සිරිත්පැවැත්වීමෙන්ද අනේක කෝටිසතසහශ්‍ර සංඛ්‍යපරිමිත සුමනචම්පක නාගකනිකාර කෙතකී සෞගන්ධිකාදි පුෂ්පපූජායෙන්හා සතතොජ්වලිත සුගන්ධතෛල ප්‍රදීපධූපසුරභිසුගන්ධ තුර්‍ය්‍යඝොෂසාදි නොයෙක් පූදපෙලහරින් චතුරත්නයපුදන සක්විතිරජක්හුගේ සාදරසතතයෙන් පිදීමෙන් අප්‍රමාදවූ කුශලරාසින්වර්ධනය කොටගෙන—

තවද දිවමන්බුදුරුව නොදුටුමෙන් දෙම්නස් ලොකයා සොමනස්වනතරම් මහත්ශෛලමයවූ බුදුරුවකුදුකරවතු පිණිස සිලාකොට්ටකාදීන් රැස්කරවා නුවරටපූර්වෂග පෙරත්කර්මාන්ත පවත්ගෙණකොට අඩාලුවතුබු ඒපර්වතයවසා කරණලදේද දෙමහල්ප්‍රාසාදයාගේ ඇතුලත්හි වඩු නවරියන් ශෛලමයසර්වඥප්‍රතිමාවක්කරවා රණ්පතින්වසා බොහොධන පරිත්‍යාගයෙන් විහාරපිත්කම සමුර්ධග්‍රාමක්‍ෂෙත්‍රාදි නොයෙක් පූදසිරිත්පවත්වා තමන්වද ලංකාවාසීන්ද බොහොකුසලරාසි වර්ධනයකොටගෙණ නැවත නැවතත් එසේමනොයෙක්තැන, අභිනවවිහාර ජීනබිම්බාදීන් කරවාලිමෙන්හා ජරාවාසගත විහාරප්‍රකෘති කර්මකරවා දිවමන්බුදුන්ඇතිසේ ලක්දිව නානා ස්ථානවල බුඩපූජාවදපවත්වාලීමෙන් අප්‍රමාණවූ කුශලරාසිවර්ධනයකොට ගෙන—

තවද එවකට හැමසතුන්ගේම පින්කෙත්වූ සංඝයාවහන්සේද සියළු ලක්දිවනැතිහෙයින් ශ්‍රීමත්හස්මානැගිපඬුරු දෙසාන්තරයවා අයොධ්‍යාපුරයෙන් ප්‍රවරොපාලිමිහා ස්ථවිරාදි මහසංඝයාගෙන්වා මහවංසයෙහි ශාසනාභිවෘද්ධිපරිච්ඡේදයෙහි ප්‍රකාශක්‍රමයෙන් නොයෙක් දහස්ගනන් කුලදරුවන් මහන මහළුපැවිදිකරවා සිවුපසදනයෙන් සග්‍රහකොට ශබ්දශාස්ත්‍රාදියෙහි දක්‍ෂකරවා ධර්මධර විනයධරවිමෙන් අලුතුධර්මධර වංශකඛනාගදපදකදියද උපදවනසේ දක්‍ෂකරවා පර්‍ය්‍යාප්තිප්‍රතිපත්ති ශාසනවයද මතුබොහෝකලක් ලක්දිව සුවිසිර්වපවත්නාසේ ඇතිකෙරෙමින් මෙසේද තමන් දවස වර්ධනයකොට පවත්වාගත් විසුඩබුඩාදීත්‍රිවිධරත්නොදයෙන් පිරිසිදුකරණලද සුපරිසුඩවූ ආත්මභාවයෙන් යුක්තව සුරණිරාදීත්සතුටුකරමින් දානසීලාදී දසපිත්ක්‍රියාවන් නිරතුරුව පුර පුරා තුනුරුවන් පුදපුදා මහතොසින් පිණ පිතා රජසිරිවිඳිනාවූ නෛනදිගන්තර ව්‍යාප්තකීර්ත්තිප්‍රබන්ධඇති කීර්තිශ්‍රී

රාජසිංහාභිධාන මහාරජතුමානන් විසින් සාදරයෙන් කරනලද ආරාධනා ඇති——සර්ධාසීලධූත වෘතාල්පෙච්ඡතාරණ්‍යවාසී සල්ලේඛ ප්‍රවෘර්තිඥානති මෛත්‍ර්‍යුපෙක්ෂාදි ලෞකික ගුණරත්නාලංකෘත ජිනවරශාසනොපකාරීවූ සරණංකරාභිධාන සංඝරාජමහාස්ථවිරසාමින් ධර්මාන්තෙවාසිවූ රක්ෂිතපොෂිත විමලසීලාචාර සම්පන්න ධෘතිස්මෘති බහුශ්‍රුතවිචක්ෂණ සුශික්ෂිතවිපුලතර සර්ධාවීයෙත්තොපායකෞසල්‍ය විසුද්ධ බෞද්ධාගමයෙහි දක්ෂචිත්‍රකාව්‍යකාරකඡන්දස්අලංකාර වෛයාකරණාදී නෛකශාස්ත්‍රාද්භූත ව්‍රතාල්පෙච්ඡතාදී ජ:ඛිද්‍රතපොගුණ ගනාභරණ විභූසිතව තමන් හෙරණ පැවිදිකාලයෙහිපටන් යථාශක්තින්ආමිස ප්‍රතිපත්තින් බුදුන්පුදනුවෝ රාජරාජමහාමාත්‍යාදීන්ගේ සහායෙන් රිදිවිහාරය, පතලිවිහාරය, වැලිගලවිහාරය, ඇතුළුවූවිහාර කර්මාන්තකරවා ඒ ඒ විහාරසලස්සාතිරෙකවිසහශ්‍ර ප්‍රමානසයනාසපිති නිසිදනාසචරූප ජිනවරාශේඛ ප්‍රතිබිඹරූප අභිනවදිලි පාන්සිතියන් වසහයන්ද කරවාලිමෙන්හා දර්සණීය සොභමානවූ වඩුදෙලොස්රියන් නවරියන් උසප්‍රමාන චෛත්‍යවයක්හා සංඝාරාම පුෂ්පාරාම ඵලාරාමාදි නොයෙක් කර්මාන්තද කරවා බත්මල්පහන්ආදී ආමිසපූජාපැවැත්වීමෙනුදු සූත්‍රාභිධර්මවිනය සංඛ්‍යාතපිටකත්‍රයෙහි විද්‍යමානපෙල අටුවාටීකාසන්න ගැටපදදිනොයෙක් පොත්පතුදුලියවා ධර්මරක්ෂාකොට පැවැත්විමෙන්හා සත්තිරෙක ත්‍රිසත්‍යවක්ප්‍රමාන සර්ව්‍රාත්‍රි ධර්මදේසනාවන්කොට ධර්මදනයදීමෙන්හා බොහො සිෂ්‍යගණයාශබ්දශාස්ත්‍ර ධර්මවිනයෙහි හික්මවාල්මෙන්හා මහාසතිපට්ඨාන සූත්‍රව්‍යාඛ්‍යානයද මහවංසාභිධාන සඞ්ඛ්‍යාමහාකාව්‍ය බන්ධනයදසහ අන්‍යවූද ධර්මප්‍රකරණකිරීම්ආදී වසයෙන් ප්‍රතිපත්තිපූජාවෙනු, බුදුන්පිදීමෙන්යෙදී ආත්මාර්ථපරාර්ථ සංසිද්ධියෙහි අප්‍රමාදව වසන්නාවූ මුණිවර ශාසනාභිවෘර්ධිවර්ධනයෙහි නිරතාභිලාසී ප්‍රතිපත්තිකාමී තපොගුණගවෙසිත සාරගුණවිභූසිත, ධීරජනනිසේවිත, සාධුගුණසමන්විත, ජිනශාසනරත්නාකරයෙහි, ප්‍රාදුර්භූතරත්නාන්කුර ප්‍රතිභාගවූ, සිඬාර්ථබුද්ධරක්ෂිත නවින්නාමොපලක්ෂිත ප්‍රවරූපොසථාරාම යතීශ්වර මහාස්ථවීරයන් වහන්සේ යටින් අවීචියෙහිපටන් උඩින් භවාග්‍රයදක්වා සරසිං අනන්තාපර්යන්තලොකධාතුයෙහි ව්‍යාප්තව පවත්නාවූ අර්හත්වාදී නවගුණපදයන් අතුරෙන් සත්‍යායන අක්ෂරවයෙන් ප්‍රතිමණ්ඩිතවූපදයගෙණ ශ්‍රිබුද්ධවර්ෂයෙන් දෙදහස්තුන්සියසොලොස්වන්නෙහි, ශ්‍රීලංකාධිපතිවූ කීර්තිශ්‍රීරාජසිංහනාම පෘථිවීශ්වරයානන් ප්‍රභූත්වකොටඇති සම්පත්ලංකාවාසීන්ට වැඩපිණිසනොයෙක් ධර්මාර්ථකථාවන් සත්‍යායනඅක්ෂරවයෙන් ශබ්ද

යෙහි අන්තර්ගතකොට වර්ණනාතිරීම් වශයෙන් තෙලෙසක්පම
න පරිච්ඡෙදයෙන් ප්‍රතිමණ්ඩිතවූ මේ ශ්‍රීසද්ධර්මාවවාද සංග්‍රහනම්වූ
ධර්මප්‍රකරණයකොට සම්පූර්ණකළසේක.

සබ්බපරිනිබ්බානා දිසහස්සතිසතෙපන,
සොලසෙහායනෙපත්තෙ ලංකාදීපෙමනොරමෙ.

කිත්තිස්සිරිරාජසීහරඤ්ඤෙ රජ්ජංසුසොභනං,
කරොන්තෙතවාපිධම්මෙන සිරිවඩ්ඪනපුරෙවරෙ.

සුද්ධාපිවෙරතොනිච්චං සද්ධාදිගුණභූසිතො,
අද්ධාරඤ්ඤවසන්තායො බුද්ධොවාදංසරංසදා.

අප්පිච්ඡාදීගුණිච්ඡන්තා පිගුච්ඡන්තාමහිච්ඡතං,
සුසික්ඛන්තාවසික්ඛාසු ජීවිතංවසදූදරො.

වෙය්‍යාකරණෙසුසබ්බ වචනෙසුචවිසාරදෙ,
පටිපත්තිමෙවපූරෙන්තො සද්ධම්මගරුකොතථා.

යථාකෙරච්චනෙදූච තථාලංකාරෙවරෙ,
සරණංකරාභිධානොසි සංඝරාජතිවිස්සුතො.

තස්සසිස්සසුත්තාධීරො සිද්ධත්ථබුද්ධරක්ඛිතො,
භූසිතොවීහිනාමෙහි සීලාචාරගුණාකරො.

සුද්ධබුද්ධාගමෙදක්ඛො සද්ධොසුද්ධදසාධනො,
ලද්ධපඤ්ඤාබලොබුද්ධ සාසනුඩ්ඪිකරොවරො.

බහුස්සුතොමහුස්සාහො ජිනසාසනවුද්ධියා,
සෙවිතොභූරිසිස්සෙහි විස්සුතොගුණනිස්සිතො.

සීලංසීලෙනපාලෙන්තො පාලෙන්තොජිනසාසනං,
ජීවිතංවියආජීවං සරන්තොචනිරන්තරං.

පාරාවාරම්භාරාව රිචොරුකිත්තිපෙසලො,
සද්දසත්ථෙසුනෙකෙසු සිප්පෙසුචවිසාරදෙ.

එවංපිරගුණුපෙතො ථෙරොපිරබුද්ධිමා,
පවරුපොසථාරාමෙ යතීසරවරෙමිදං.

සද්ධම්මත්ථිකාමෙන සද්ධම්මාවාදසංගහං,
අකාසිසකභාසාය හිතත්ථායමපිසාධුකං

ධම්මොපවත්තතුචිරං සුගතප්පසන්නො,
සංඝොපිචෙව භවතුසාධු සදාසමග්ගො.

දෙවොපවස්සතුජනා සුඛිතාභවන්තු,
පාලෙන්තුලොකමපිධම්ම සමෙනභූපා.

චිරංතිට්ඨතුසද්ධම්මො දෙවොසම්මාපවස්සතු,
ලොකංපාලෙන්තුරාජානො සුඛිතාහොන්තුපාණිනො —

— නිමි —

මෙසේ අපවිසින් ශ්‍රී සද්ධර්මාවවාදසංග්‍රහනම්වූ මේ එකම ධර්මව්‍යාඛ්‍යානකථාවෙහි දක්වනලද පළමුවන ධර්මානිසංසවර්ණනා පරිච්ඡේදයෙහි — ප්‍රකරණ මහාකථාවත් හා ධර්මානිසංසවර්ණනා කථාවොය — සද්ධර්මශ්‍රවණකථාවන්ගේ විශේෂ මහත්තත්වයහා ශ්‍රවණානිසංස ත්‍රිවිධසික්ෂානිසංස කථාවොය — දෙවන සම්බුද්ධගුණ වර්ණනාපරිච්ඡේදයෙහි බාහිරනිධානයෙහි මාතෘපොෂකධර්මාදි නොයෙක් ධර්මකථාවොය — මහානිධානයෙහිවූ සත්අසංඛ්‍යයක් ඇතුලත ලොවපහලවූ එක්ලක්ෂ පස්විසිදහසක් බුදුවරයන්දක සිතින් බුදුබවපැතුශටි ප්‍රකාශ කථාවොය — අතිදූරෙනිධානයෙහි වූ නවාසංඛ්‍යයක්ඇතුලත ලොවඋපන් තුන්ලක්ෂ සතාසූදහසක් බුදුවරයන්දක වාක්භෙදප්‍රාර්ථනාවෙන්ම බුදුබවපැතුශටි ප්‍රකාශ කථාවොය — දුරෙනිධානයෙහිවූ සාරාසංඛ්‍යකල්පලක්ෂයක්ඇතුලත ලොවඋපන් සූවිසිබුදුවරකෙනෙකුන්දක සූවිසිමහාපූජාවක්කොට කායවාක්ප්‍රනිධානය මුදුන්පත්වූශටි ප්‍රකාශ කථාවොය — අවිදූරෙ නිධානයෙහිවූ වෙස්සන්තරරජවීමපටන් බුදුවිමදක්වාපැවති බෝසත්චරිතයද ප්‍රකාශ කථාවොය — සන්තිකෙනිධානයෙහිවූ සත්සති සවුශටිහා පනස්වෙනිදා මීහිපිඬුවලඳ අවශේෂදවස්වල බෝමඩ වතුදුරුවූ සේනානීනම් නියම්ගම පිඬුපිණිසහැසිරෙමින් බ්‍රහ්මාරධනාවෙන් ඉසිපතන්වැඩ ප්‍රවර්තිකථාවොය — එහි ධර්මචක්‍රය දෙසීමෙන් පස්වගමහනුන්හා සකලපිරිසිටි දෙව්බඹපිරිසට වැඩසාද යසකුලපුත්‍රාදීන්හා භද්‍රවර්ගිග රජකුමරුවන් පැවිදිකොටයවා තුන්බෑජටිලාදීන් දමනයෙන් පැවිදිකොටගෙණ රජගහනුවරට වැඩ බිම්බිසාරණරවරාදීන්ට වැඩසැදූ ප්‍රවෘර්තිකථාවොය — අග්‍රශ්‍රාවකාදි එසිදහසක් රහතුන්පිරිවරා කිඹුල්වත්පුරටවැඩ සුඬොදන

නරවරාදී සියළුම්බන්ධූන්ට වැඩසැලූ ප්‍රවර්තිකථාවොය—ශවත් නුවර ජේතවන පූර්වාරාමවිහාරප්‍රතිග්‍රහණයෙන් සත්වානුග්‍රහකොට ගණ්ඩම්‍රෘක්ෂමූලයෙහිදී යමකප්‍රාතිහාර්‍ය්‍යදක්වා තීර්ථකදමනයෙන් දෙව්ලෝවැඩි ප්‍රවෘත්තිකථාවෝය—තුන්මසක් මුළුල්ලෙහි දෙව් ලොවැඩහිඳ අභිධර්මදෙසනාකොට දෙවොරොහනයෙන් සකස් පුරදොරටපැමිණි ප්‍රවෘත්තිකථාවෝය—ශරියුත්සාමීන්ලවා ප්‍රශ්න විසර්ජනයෙන් සතුටුවූ මෛත්‍රීබොසතානන්වහන්සේගේ බුදුවීමට විවරණශ්‍රී දෙවාවදාල ප්‍රවෘත්තිකථාවෝය—දෙවුලොබඹලොව මිණිස්ලොවචාරිකාකොට ලොවැඩකල ප්‍රවෘත්තිකථාවෝය—පන් සාලිස්වසක් තිබඩාතිබඩවසයෙන් වස්වැස සත්වානුකම්පාකොට ශවැත්නුවරදී ලෝකධර්මතාවයෙන් අනසවුදදෙනාවහන්සේගේ පිරිනිවන්පෑමට අවසරදෙවාවදාරා විසාලාමහනුවර පාවාල චෛත්‍යනම් විහාරයටවැඩ ආයුසංස්කාරහැරවදාරමින් භික්ෂුසංඝයාවහන්සේලාරැස්කොට තුන්මසකින්වන පිරිණිවන්පෑම් දක්වා ඒ භික්ෂූන්ට අප්‍රමාදව ධර්මයෙන්අවවාදකල ප්‍රවෘත්තිකථාවෝය—පාවානම්නුවර චුන්දනම්කර්මාරපුත්‍රයාගේ අඹඋයනටවැඩ ඒ කර්මාරපුත්‍රයාවිසින් දෙවෙනිදිනයටකල ආරාධනාවෙන් ඔහුගේගෙට වැඩ පිණ්ඩපාතප්‍රතිග්‍රහනයෙන් එමදසවස්හි දුරුකතරමගගෙවා කුසිනාරානුවර සල්උයනටවැඩි ප්‍රවෘත්තිකථාවෝය—ප්‍රථමයාමයෙහි සියළුම මල්ලරජදරුවන්ට අනිත්‍යතාප්‍රතිසංයුක්ත ධර්මදෙසනාකොට අවසරදීයවා මධ්‍යමයාමයෙහි සුභද්‍රපරිබ්‍රාජකයන් විනයනයකෙරෙමින් පශ්චිමයාමයෙහි භික්ෂූන්ට අනාගතයපැධර්ම දෙසනාකරවදාළ ප්‍රවෘත්තිකථාවෝය—බලවපච්චූසයෙහි පිරිණිවී පසු තුන්සතියමුළුල්ලෙහි පැවති සියළු පූජප්‍රවෘත්තිකථාවෝය—ධාතුබෙදු ප්‍රවෘත්තියහා මිණිස්ලොව දෙව්ලොව නාලොව ඒ ධාතුවඩා පූජපවත්නා ප්‍රවෘත්තිකථාවෝය—

නැවත ඒ සියළු ධාතූන්වහන්සේලාම බොමැඩඑකව ධාතු පරිනිර්වාණයවීමෙහි ප්‍රවෘත්තිකථාවෝමය—තුන්වන සද්ධර්මගුණ වර්ණනාපරිච්ඡේදයෙහි-ප්‍රථම ධර්මසඟායනාවෙහි පැවතිසියළු පිටකත්‍ර ධර්මාර්ථකථාවෝය—එසේම දෙවෙනි ධර්මසඟායනාවෙහි පැවති ධර්මාර්ථ කථාවෝය-එසේමතුන්වෙනි ධර්මසඟායනාවෙහි පැවති ධර්මාර්ථකථාවෝය—එසේම ථූපාරාමයෙහි සතරවන ධර්මසඟායනාවෙහිපැවති ධර්මාර්ථකථාවෝය—වලගම්අභාමහරජදවස අවුරුඅදක්මුළුල්ලෙහි පොත්වලලියාපිහිටුවාළු එම සියළු ත්‍රිපිටක ධර්මාර්ථකථාවෝය—මහානාම රජදවස බුද්ධඝොසසාමීන්විසින් ලියා පිටකත්‍ර අර්ථකථාවෝය—පොළොන්නරු පරාක්‍රමබාහු මහරජදවස

මහාකාශ්‍යපස්ථවිරාදී දහසක් භික්ෂූන්වහන්සේරැස්ව ලියාළ පිට කත්‍ර ටීකාපිකථාවෝය—රජබල පෙරදූරිව මහාස්ථවිරවරාදී මහ සංඝයාවහන්සේවිසින් මෙකල්දක්වාම සද්ධර්මයපවත්වාආ ප්‍රවර්ති කථාවෝය—

මේසියළුම පර්‍යාප්තිධර්මයාගෙ අන්තර්ධාන කථාවෝය—සත රවනසංඝගුණවර්ණපරිච්ඡේදයෙහි—සුප්‍රතිපන්නතාදි ලෞකික ලෝකොත්තර වසයෙන්දිප්‍රකාරවූ සංඝගුණවර්ණකථාවෝය—අසීතිමහශ්‍රාවකයන් වහන්සේලාගෙ ප්‍රවර්තිකථාවෝය—ශ්‍රැතබුද්ධවරයන්ගෙ ප්‍රවර්යහා අභිජාතාදිචතුර්විධවූ සිෂ්‍යපුත්‍රයන්ගෙ ප්‍රවෘර්තිකථාවෝය—ප්‍රතිවෙධ අන්තර්ධාන කථාවෝය-ප්‍රතිපත්ති අන්තර්ධාන කථාවෝය—ලිඟඅන්තර්ධාන කථාවෝය-පස්වනස රණගමන පරිච්ඡේදයෙහි—සරණප්‍රභෙද කථාවෝය—සරණාගමන ප්‍රභෙදකථාවෝය—ලෝකොත්තර සරණාගමනානිසංස කථාවෝය—පෘථක්ජනසත්වයන්ගේ ලෞකිකසරණගමනවීමසී ආත්මනියාතනාදි චතුර්විධවූ සරණාගමන ප්‍රභෙදයහා එහි භෙදදීනවානි සංසප්‍රකාස කථාවෝය—සවනඅකුශල කර්මපථපරිච්ඡේදයෙහි දසඅකුසලකර්මපථ ප්‍රභෙදදීනව කථාවෝය—පච දුශ්චරිත ප්‍රභෙදදීනවකථාවෝය.පචානන්තරියකර්මප්‍රභෙදදීනවකථාවෝය—ආයෙෂ්පවාද ප්‍රභෙදදීනව කථාවෝය—

තුනුරුවන්හිකරණලද අනාදර විභාගාදිනවකථාවෝය—පච නීවරණ පාපකර්මවිභාගාදිනව කථාවෝය—සර්වාකුසලමූල ප්‍රභෙදදීනව කථාවෝය—කුසලා අකුසලකර්මදෙක්හි සවිම්පඬසිටි ධර් ප්‍රභෙදදි කථාවෝය—අවශෙෂවූ ක්‍රොධාදිපාපකර්ම ප්‍රභෙද කථාවෝය-සූත්‍රපර්‍යායයෙන්දක්වූඑකොලොස්කර්ම ප්‍රභෙද කථාවෝය-අභිධර්මපර්‍යායයෙන් සොඩසවිධවූද මාර්ගීපරියායෙන් චාදසවිධවූද කර්මප්‍රභෙද කථාවෝය—සත්වන අකුසලකර්මඵලභූමි වර්ණනාපරිච්ඡේදයෙහි—නිරයදුක්ඛ වර්ණනාකථාවෝය—තිරශ්චීනදුක්ඛ වර්ණනාකථාවෝය—අසුරාපාය සහිතවූ ප්‍රේතදුක්ඛවර්ණනා කථාවෝය—අටවන සීලවිභානිසංස වර්ණනාපරිච්ඡේදයෙහි—නිත්‍යසීලවූ පචසීල දසසීලයන්ගේ සමාදානක්‍රමයහා සික්ෂාපදඤ්ඤ පිලිවෙලරක්නාක්‍රම ප්‍රකාශකථාවෝය—නොයෙක් ප්‍රභෙදඇති උපොසථ සීලයන්ගේ සමාදානක්‍රමයහා ඒහැමසීලානිසංස කථාවෝය නවවන කුසලකර්මපථ වර්ණනාපරිච්ඡේදයෙහි—දානවිභාගානිසංස කථාවෝය—සීලවිභාගානිසංස කථාවෝය—භාවනාවිභාගානිසංස කථාවෝය—පූජාවිභාගානිසංස කථාවෝය—වෛයාවච්චවිභාගා

නිසංස කථාවොය—පින් දීමෙහි විභාගානිසංස කථාවොය—පුණ්‍යා
නුමොදනා විභාගානිසංස කථාවොය—ධර්මශ්‍රවනවිභාගානිසංස
කථාවොය—ධර්මදෙසනා විභාගානිසංස කථාවොය—ත්‍රිවිධපුණ්‍යකර්ම
යෙහි විභාගානිසංස කථාවොය—ශක්‍රසම්පත්හා සදෙව්ලොවදි
ව්‍යසම්පත්විභාගවර්ණනා කථාවොය—බ්‍රහ්මපාරිසද්‍යාදී විසිබඹත
ලෙහිම ආයුසාදී ඒ ඒ බ්‍රහ්මලොකසම්පත් වර්ණනා කථාවොය—
ශ්‍රාවකබොධිප්‍රත්‍යෙකබොධියසම්‍යක්සම්බොධියකෙලවරකොටඇ
ති ලෝකොත්තරසම්පත් වර්ණනාකථාවොය— එකොළොස්වනරාජ
ධර්මවර්ණනාපරිච්ඡෙදයෙහිදක්වනලද,රාජධර්මවිභාගාදිනවානිසංස
සතරසංග්‍රහවස්තුප්‍රකාශකථාවොය—තෙසකුනජාතකයෙහිප්‍රකාශ
වූනොයෙක් රාජධර්මානුශාසනා කථාවොය—අධර්මිෂ්ඨරජදරුවන්ටම
අනභිවෘද්ධියහා ධර්මිෂ්ඨ රජදරුවන්ටවන අභිවෘද්ධිකාරණප්‍රකාශක
ථාවොය—අප්‍රමාදධර්මානුශාසනා කථාවොය—දොළොස්වන ගෘහ
පති ධර්මවිභාගවර්ණනා පරිච්ඡෙදයෙහි—ගෘහපතිසංඛ්‍යාත අම්මා
ත්‍යසිටුවරුආදි ගෘහවාසයෙහි වසනසියල්ලවුන්ට අගතිගාමිනො
ව දෙලොවින්වැඩවනා පිළිවෙත්හා ඔවුනොවුන්ට වැඩවනසේ
දැහැමෙන් ප්‍රත්‍යයසපයාගෙණ පාපකර්මයන්හා මේලොවම
වස්තුවිනාසවන කාරණා පාපමිත්‍රානුරුකෙරෙමින් කල්‍යානමිත්‍ර
සේවනයෙන්යෙදී දෙමව්පියගුරුවර ශ්‍රමණබ්‍රාහ්මන මිත්‍රාමාත්‍ය
පුත්‍ර දුරදූසී දූසාදීන්දුනා ඇදිනමනාව ඔවුනොවුන් වෙනස්නො
වනලෙස පිළිපදිනාක්‍රම ප්‍රකාශවූකථාවොය—දැහැමින්වස්තුරැස්
කිරීමත් වස්තුබහුලවීමහා එහිමනාවපිළිපැදීමෙන් ස්වර්ගමොක්ෂ
සම්පත්ශෑදියයුතු බවප්‍රකාසවූ ධර්මානුශාසනා කථාවොය—තෙ
ළෙස්වන සාමාන්‍යධර්මානුශාසනා වර්ණනාපරිච්ඡෙදයෙහි—
මඟලසූත්‍රයෙහි ප්‍රකාසසියළු වැඩටකාරණවූ අටතිසක්මඟල්‍ය
කථාවොය—පරාභවසූත්‍රයෙහි ප්‍රකාසසියළු අවඩටමකාරණව
සිටිනදොළසක් පමනපිළිනිම් කාරණ කථාවොය—

— ශ්‍රී සද්ධර්මාවවාද සංග්‍රහ පොත්වහන්සේ නිමි. —

# දැන්වීමයි.

ශ්‍රීසද්ධර්මාවවාද සංග්‍රහ නම්වූ මෙම ග්‍රන්ථය මධුරමනොහර සද්ධර්ම නැමති ප්‍රදීපාලෝකයදල්වා මෝහනැමති අන්ධකාරය දුරුකිරීමට සහායවූ අනේකවිධ ධර්මකොට්ඨාසවලින් යුක්තකොට ගලපනලද්දකි. මෙය ශ්‍රීවර්ධනපුර උපෝසථාරාමයෙහි වැඩවිසූ වැලිවිටපිණ්ඩපාතික සරණඞ්කර සඞ්ඝරාජ මහාස්ථවිරස්වාමිපාදයන්වහන්සේගේ ශිෂ්‍යවූ සිද්ධ ශ්‍රී බුද්ධරක්ෂිත මහාස්වාමිපාදයන් විසින් ලඞ්කාවාසී සියළු බුද්ධභක්තිකයන්ගේ සද්ධර්මෝද්ග්‍රහණයපිණිස සිංහල භාෂාවෙන් ලියනලදී. සම්බුද්ධධර්මය පහසුවෙන් ඉගෙණගන්නන්ට අතිවිපුල ප්‍රයෝජනවූ මෙම ධර්මප්‍රකරණය පරිච්ඡේද තෙලෙසකින් යුක්තබවද මෙම පොතට උපමතා සංඥාපත සූචිපත්‍රාදියදයොදා පිටු (**580**) කින් යුත් මෙම්පොත්වහන්සේ මුද්‍රණය කර නිමවී තිබේ—

තවද මෙමපොත නැවත අච්චුගැස්වීම් අයිතිවාසිකම් පහත නම්පේන මටම තබාගත්බවද, අපේ සීල්මුද්‍රය නැති පොතක් දකින්ටලැබුනොත් නීතිමාර්ගයෙන් අච්චුපමුණුවනබව දතයුතුයි—

මේමපොත් කොළඹ ග්‍රන්ථප්‍රකාශ යන්ත්‍රාලයෙහි ජේ. ඩී. ප්‍රනාන්දුගෙන්ද කැළණියේ ශාස්ත්‍රාධාර යන්ත්‍රාලයෙන් සහ සෑම පොත්කඩවලින්ද ලබාගතහැකිය.

ඈම්. අයි. පෙරේරා.



